# මහාවංශය
## සිංහල

### සංස්කරණය

පළමුවන පරිච්ඡේදයේ සිට 101 වන පරිච්ඡේදය දක්වා අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන් වහන්සේ සහ බටුවන්තුඩාවේ පඬිතුමන් විසින් සකස් කරන ලද මහාවංශය ඇසුරෙන් ද,

එතැන් සිට 1922 දක්වා කොටස ඩී. එච්. ඇස්. අබේරත්න වියතුන් විසින් සම්පාදනය කරන ලද සිතියම් සහිත සිංහල මහාවංශයේ උප ග්‍රන්ථය ඇසුරින් ද,

1923 සිට 1948 දක්වා කොටස පන්ඩිත ආචාර්ය නන්දදේව විජේසේකර වියතුන්ගේ ප්‍රධාන කර්තෘත්වයෙන් සංස්කෘතික අමාත්‍යාංශය මගින 1986 දී මුද්‍රණය කරන ලද මහාවංශය නූතන යුගය, ප්‍රථම භාගය ඇසුරෙන්ද බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන මගින් සංස්කරණය කරන ලද බව කෘතඥතා පූර්වකව සටහන් කරනු කැමැත්තෙමි.

*Non-Commercial Distribution*

# මහාවංසය

ගුණයෙන් මහත්වූ බුඬබුඬශ්‍රාවකයන්ගේ පරම්පරාව හෝ ඓශ්වය්‍ර්‍යාදියෙන් මහත්වූ මහාසම්මත නරෙන්‍ද්‍රාදීන්ගේ පරම්පරාව මහාවංශ නම් වේ. මේ ප්‍රකරණයද කී උභයවංශයෙන් සඞගෘහිත හෙයින් අභෙදෙපචාරයෙන් මහාවංශ නම් වේ.

මේ මහාවංශය අනුරාපුර මහාවිහාර බද දික්සඳසෙනෙවියා පිරිවෙන් මාහිමි මාහානාම මහතෙරුන් විසින් ප්‍රාරම්භකොට කරණලදී. ඒ මහානාම තෙරුවන්වහන්සේ විසින් ප්‍රාරමහකොට කරණලදී. ඒ මහානාම තෙරුන්වහන්සේ විසින් සිංහල අටුවා පොත්හි පැවැති වංශකථාව ගෙණ ශුඬ මාගධිභාෂායෙන් කරණලද්දේයයි මහාවංශ ටිකායෙහි කියනලදී. එහි "මහාවිහාරවාසීනං වා මහත්තං පොරාණථකථං එත්ථහි සීහල භාසං හිත්වා මාගධික භාසාය පවකඛාමීති අධිප්පායො" මහාවංසයෙහි දෙවෙනි ගාථාවෙන් මේ වංසයතෙම පුරාතනයන් විසින් කරණලද්දේත් කිසිතැනෙක ඉතා විස්තරකරණලද්දේය, කිසිතැනෙක අතිසංක්ෂේප කරණලද්දේය, නොයෙක් පුනරුක්ත දෝෂ ඇත්තේයයි පෙණෙයි. දීපවංසය සඳහා මෙසේ කියන ලද්දේයයිද සැලකෙයි; එහි වනාහි මහාවංසාගතවූ කිසියම් කථාවක් ඉතා විස්තරවශයෙන්ද කිසියම් කථාවක් අති සංක්ෂේපයෙන්ද කියනලදී. පුර්වයෙහි කියනලද කථා නැවත නැවත කීමෙන් නොයෙක් පුනරුක්තයෙන්ද යුක්තව පෙණේ. එහෙයින් පුරාතනයන් විසින් කළ මහාවංසයයි කියන ලද්දේ දීපවංසය සඳහායයි හැඟෙන නමුත් ටීකායෙහි පුරාතනයන් විසින් කියනලද මහාවංස කථාරම්භාදිය දක්වනු පිණිස දීපවංස පාඨද උදාහරණ කොටත් "අයංහි ආචරියො එත්ථ පොරාණනං කතමහි සීහලථ කථා මහා වංසෙ අතිවිත්ථාර පුනරුත්තදොස භාවං පහාය තං සුඛග්ගහණ දීපයොජන සහිතං කත්වාව කරෙසි" යනාදීන් සිහලාත්ථකථා මහාවංසයෙන්ම ගෙණකළබැව් කියනලදී. මේ මහාවංසයට ඇතුළත් බොහෝ කථා සමන්ත පාසාදිකාදි අටුවාවලත් දක්වා තිබේ.

කලින් කල නොයෙක් නොයෙක් ප්‍රකරණවල ලියවී පැවත ආයෙන් එසේ ලියනලද සිංහල පොතෙක්හි ප්‍රවෘත්තිය ප්‍රධානකොට මහානාම ස්ථවිරයන් වහන්සේ විසින් මහාවංශ ග්‍රන්ථය කළබැව් දැන ටීකාචාරීන් විසින් එසේ සඳහන් කරණලදැයි සැලකිය යුතුයි. ඉන්පසු පැවති සියල්ල ශ්‍රැතියෙන් හා ප්‍රත්‍යක්ෂ දැනීමෙන් අන්තර්ගත කරණලදී.

Non-Commercial Distribution

මේ ප්‍රකරණය මහාවංසය චූලවංසය කියා දෙකක් වසයෙන් බොහෝතැන ව්‍යවහාරයි. ඒ මෙසේයි, මහානාම ස්වාමීන් විසින් ඒ කාලයෙහි රජකළ මහසෙන් රජු රාජ්‍යප්‍රවෘත්තිය දක්වා ලියා තබනලදී. නුමුත් එයින් මහාවංස කථාව අවසාන නොවනහෙයින් සතිස්වන පරිච්ඡේදය ලියා සත්තිස්වන පරිච්ඡේදය ආරම්භකොට එහි මහසෙන් රජහු පවත් ලියා එය පරිච්ඡේදයක් වසයෙන් අවසන් නොකළ බව එතන්හි පරිච්ඡේදාවසාන ගාථාදිය නැති හෙයින් හැඟේ. එතකුදුවුවත් එතන්හි "මහාවංසො නිට්ඨිතො" යනු පෙණෙයි. එය මෙතාක්ම එලෙස ලියාගෙණ එන හෙයින් එතෙකින් මහාවංසය නිෂ්ඨිතය එතැන් පටන් සියක් වෙනි පරිච්ඡේදය දක්වා ලියනලද පොත චූලවංසයයි ඇතැම් කෙනෙක් විසින් සලකා එසේම සමහර පොත්වල පළමු වෙනි පරිච්ඡේදය පටන් සත්තිස්වන්නේ මහසෙන් රජු පවත් දක්වා ලියනලද පොතෙහි කියා තිබෙන යමක් සාධකවසයෙන් ගෙණහැර දක්වනකල "තෙන වුත්තං-මහාවංසෙ" කියාද සත්තිස්වෙනි පරිච්ඡේදයෙහි සිරිමෙවන් රජහු පවත් පටන් ලියනලද පොතෙහි යමක් ගෙණහැර දක්වනවිට "තෙන වුත්තං චූලවංසෙ" කියාද සඳහන් කිරීම පෙණේ. මීට කරුණ "මහාවංසො නිට්ඨිතො"යි ලියනලද්ද පමණයයි හඟිමු.

පූජාවලි අවසානයෙහි "ලක්දිව රජකළ ඔටුනුපළන් රජදරුවන් සඳහන් කිරීමෙහි පළමුවන විජය රජය, උපතිස්සය" යනාදීන් දක්වා "මහසෙන් රජයයි මහාවංසයෙහි ඔටුනුපැළඳ රජකළාවූ රජුන් තෙසැටදෙනෙකු හා චූලවංසයෙහි සිරිමෙවන් රජය" යනාදීන් දක්වා "පරාක්‍රමබාහුයයි සුලුවස රජකළ අනූදෙනෙකු හා මෙසේවූ රජ එක්සිය පණස්තෙදෙනෙක් සිරිලක රජකලහ"යි කියනලදී. මෙයින්ද "මහාවංසො නිට්ඨිතො" යන වාක්‍යය ලියනලද ස්ථානයෙන් මෑත සඳහන්කළ සිරිමෙවන් නරනිඳු ආදී රජදරුවෝ චූලවංසයෙහි රජහුයයි කියනලද්දාහුය. රජුන්ගේ වංස වසයෙන් බෙදතහොත් පියරජහු මහාවංසයටත් පිත්‍රජහු චූලවංසයටත් ඇතුළත්කොට බෙදීම නොහැකිවේ. තවද සිංහල රාජවලියෙහි "සුලුවංස යන මවුපක්ෂයත් පියපක්ෂයත් දෙකින් එකක් සූය්‍ර්‍යවංශයෙන් කලක තිබෙයි" කියාද "එකක් ශ්‍රී මහාබෝධිය ගෙණ වසත් එකක් දළදාව ගෙණවසත් කලබැගෑණිව තිබීමෙන් පැවත එන නිසාත් සංඝරත්නය සෘධිමත් තෙරවරුන් නැති නිසාත්" යනාදියත් දක්වා මහවස සුලුවස දෙක බෙදීමට මේ හේතුයයි කියනලදී. සූය්‍ර්‍යවංසයෙන් මාතෘපක්ෂාදී එක්පක්ෂයක්වීම සඳහා ඒ ඒ රජදරුවන්ගේ මාතෘ පිතෘ ගෝත්‍රයන් පරීක්ෂාකර බැලුකලද එය එසේම සිද්ධනොවේ. ශ්‍රී මහා බෝධිය ගෙණ කථාවෙන් යුක්ත වංශය මහාවංශය කියාත් දළදාව ගෙණ වංශය චූලවංශය කියාත් වෙන්කිරීමටද කරුණු නොපෙණේ. කුමක් හෙයින්දයත් දළදාව බුද්ධශාරීරික ධාතු චෛත්‍යයකි, ශ්‍රීමහාබෝධිය

Non-Commercial Distribution

පාරිභෝගික චෛත්‍යයකි, සංඝරත්නය සෘද්ධිමත් තෙරවරුන් නැති නිසාය යන්නෙහි මහසෙන් රජහුගේ කාලයෙන් පසු එසේ බැව් ප්‍රකාශ බැවින් සාධක වශයෙන් හැඟෙන නමුත් වලගම්බා මහරජානන්ගේ කාලයෙන් පසු මහසෙන් රජු දක්වා අතරත් එබඳු කල් පෙණෙන හෙයින් එය සර්වප්‍රකාරයෙන් සිද්ධ නොවේ. තවද ඇතැම් කෙනෙකුන් විසින් මහත්වූ තේජෝබලාදියෙන් යුක්තවූ මහරජුන්ගේ ප්‍රවෘත්ති කථායුක්ත කාණ්ඩය මහාවංශය කියාද, තේජෝබලාදියෙන් හීනවූ රජුන්ගේ ප්‍රවෘත්තිකථා යුක්ත කාණ්ඩය චූලවංශ යයි කියාද නම්වීයයි සලකණලදී. ඒත් තත්වයයි නොහඟිමු, කුමක්හෙයින්ද යත්, මහසෙන් රජහුගෙන් පසු කාලයෙහිත් මහාවිජයබාහු මහා පරාක්‍රමබාහු ආදී රජවරු කිසිසේත් තේජෝබලාදියෙන් විජය පණ්ඩුවාසුදේව පණ්ඩුකාභයාදි රජුන්ට හීනයයි නොකියහැක්කාහ. මහාපරාක්‍රමබාහු නරෙන්‍ද්‍රයා ජම්බුද්වීපයෙහි රජුන්ද මැඩ පවත්වා අසදෘශාකාරයෙන් ලොකසාශනාහි වෘද්ධිකාරිව ලංඛකාරාජ්‍යය කරවීය. එහෙයින් ඒ කරුණද මහාවංස චුලවංස වශයෙන් දෙකක් කොට බෙදීමෙහි සාධක නොවේ. මෙබඳු නාමව්‍යවහාරයක් පැවතීමට හේතුව නම් මහානාම ස්ථවිරයන්වහන්සේ විසින් තත්කාලික රජහු අවසන්කොට කරණලද පොත අවසානයෙහි "මහාවංසො නිට්ඨිතො" යි තිබෙන එකම වාක්‍යයි හැඟේ.

ඒ මේ වාක්‍ය නිසා පැවැති ව්‍යවහාරය කොපමණ බලවත්ව පැවතීද යත් - අප විසින් මේ මහාවංසයේ ටීකාරහිත මහත් කාණ්ඩය ශුද්ධ කරන්ටද එයින් පිටපතක් කොට සිංහල පොතක් කරන්ටද ආරම්භ කිරීමෙහි අඬක යෝජනා සිංහල භාෂා රීත්‍යාදිය දක්වා මේ මේ ක්‍රමයෙන් පොත සම්පාදනය කිරීම ලක්දිව් වැස්සන්ට මාහැඟි ප්‍රයෝජන වේදැයි සභාගී මිත්‍රාදීන්ගේ මත පරීක්ෂාකරණ පිණිස මුද්‍රඬකිත පත්‍ර සතරක් ඒ ඒ මිත්‍රවරයන් කරා යවනලදී. ඒ ලැබූ මිත්‍ර දෙදෙනෙකු විසින් "මහාවංස" යයි අපේ නාම යෝජනාව අපාත්‍ථිකොට "අපට ලැබුනේ චූලවංසයෙහි කොටස්" යයි ලියා එවනලදී. මෙසේ මේ ව්‍යවහාරය සමහරුන් අතරේ බලවත් වීනමුත් මහසෙන් රජහුගේ කාලයෙන් පසු මහාවංස කථාව ලියූ විචක්ෂණාචාර්‍ය්‍යවරයෝ එබඳු ව්‍යවහාරයකින් මූඪත්වයකට හෝ භ්‍රමයකට සම්ප්‍රාප්ත නුවූහ. ඒ කෙසේද යත් "මහාවංසො නිට්ඨිතො"යි ලියා තිබුන තැනින් පසුව ආරම්භකොට තිබෙන්නේ "අසාධු සඞ්ගමෙනෙවං" යනාදී ගාථාවෙනි; එයින් ආරම්භ කොට සත්තිස්වෙනි පරිච්ඡේදය නිමවා අවසානයෙහි "ඉතිසුජනප්පසාදසංවෙගත්‍ථාය කෙතෙ මහාවංසෙ සත්තරාජකො නාම සත්තතිං සතිමො පරිච්ඡෙදො" කියා තිබේ. යම් හේතුවකින් මහාසෙන නරෙන්‍ද්‍රයාගෙන් පසු කාලයෙහිවූ මහීපතීන්ගේ ප්‍රවෘත්තිකථා සහිත ශාසන ප්‍රවෘත්‍යාදිය සඞ්ග්‍රහ කරණ කාණ්ඩය චූලවංසයයි ඒ ආචාර්‍ය්‍යවරයන් විසින් සලකණ ලද්දේවී

Non-Commercial Distribution

නම් පරිච්ඡේදාවසානයෙහි "ඉති සුජනප්පසාදසංවෙගත්ථාය කතෙචූලවංසෙ" යි ලියනු යුතුවන්නේයි. එසේ නොලියා මහාවංස යන නාමයම ලියා තිබෙන්නේ චූලවංසයයි සැලකීමට හේතු නැති බැවිනි.

ඉන්මතු සියක්වෙනි පරිච්ඡේදය දක්වාද සියලුම පරිච්ඡේදාවසානයෙන්හි මහාවංස යන නාමයම ලියනලදී. එහෙයින් "චූලවංස" යන නමැත්තාවූ පොතක් අප විසින් නොදක්නාලදී. මේ මහාවංසයේ ආරම්භය පටන් සත්තිස් වන පරිච්ඡේදයෙහි මැද දක්වා මහානාම ස්ථවිරයන්වහන්සේ විසින් රචනා කරණලදී. එපමණ දුරට කරණලද ටීකාවද ඒ ගාථාරචනාවෙහි සුබධියද තද්භාවයද දැනගැන්මට ප්‍රයෝජනව තිබේ.

ඉන් මත්තෙහි තිස්සත්වෙනි පරිච්ඡේදය එක ආචාර්‍ය්‍යී කෙනෙක් කළබව සිතිය හැකිවේ. අටතිස් එකුන්සාළිස්වන පරිච්ඡේද දෙකේ වාක්‍ය යොජනාදිය ඒකාකාරයෙන් පෙණේ. ඉන් මෑත කුමාරධාතුසේන රජහුගේ කථාව පරිච්ඡේදයක් කොට අන්‍ය ආචාර්‍ය්‍යීකෙනෙකුන් විසින් කරණලදින් එයින් ගාථා දෙකක් තුණක් පමණ ශේෂව තිබියදී පරිච්ඡේදය අපවත්වූ බව සිතිය යුතුයි. ඒ අපවත්වූ පමණ කුමාරධාතුසේන රජහුගේ ප්‍රවෘත්ති විස්තරයි. ඉන් මෑත එකුන්සාළිස්වන්නේ චොරනාග රජහුගේ කථා ප්‍රවෘත්තිය පරිච්ඡේදාවසානය දක්වා ගාථාබන්ධනයේ ක්‍රමයෙන් එපමණක් අන්‍යවූ එක් ආචාර්‍ය්‍යීකෙනෙකු විසින් කළ බැව් සිතිය යුතුයි. ඉන් මෑත දෙසාළිස්වන පරිච්ඡේදය අන්‍ය ආචාර්‍ය්‍යීකෙනෙකුන් විසින් බඳිනලද්දේයයි සිතියයුතුසේ අලඞ්කාර සහිතව පෙණේ. ඊට අනතුරුව පරිච්ඡේද දෙකක් එක්වීයයි සිතිය යුතුසේ තෙසාළිස්වන්න නැතිව සූසාළිස්වන්න පෙණේ. ඒ පරිච්ඡේද දෙක එක්වීමෙන් තෙසාළිස්වන්න ඌනවීයයි සිතියහැකි. සූසාළිස්වන්න පටන් පණස්වෙනි පරිච්ඡේදය අවසන්කොට එකාකාර අලඞ්කාර යුක්තබව සිතිය යුතුව තිබේ. ඉන් මෑත එක්සැටවෙනි අදියර දක්වා මහා විජයබාහු මහරජානන්ගේ ප්‍රවෘත්ති කථාව හා චතුරාජචරියාව සඞ්ග්‍රහ කරණලද ගාථා බන්ධනය වැඩියක් අලඞ්කාරානුගතව තිබේ.

අටසාළිස්වන්න ආදියෙහි කිසි තැනක 48-10 "උපොසථං උපවසති සඞ්ඛං දීපජනෙහි සො" යනාදී ගාථාවල අනුෂ්ටුප් ඡන්දස ඉක්මෙන ලෙස නවාක්ෂරොපලක්ෂිත පාදබන්ධනයද පෙණේ. ඒ ගාථා වශයෙන් බඳනලදැයි හඟිමු.

මෙසේ යම්කිසි විශේෂ පෙණෙන ඒ යෝජනා වසයෙන් සපණස්වෙනි පරිච්ඡේදාවසානය දක්වාත් ඉන් මෑත් එක්සැටවෙනි පරිච්ඡේදය දක්වාත්

Non-Commercial Distribution

ආචාර්‍ය්‍ය- දෙනමක් විසින් කරණලද ගාථාබන්‍ධනයයි සිතිය යුතුයි. එහි මහා විජයබාහු මහරජානන්ගේ ජීවිතකථාව අලඞ්කාර සහිත මනෝඥ පරිද්දෙන්ද ඉතා පැහැදිලි වශයෙන්ද පෙණේ.

සැටදෙවෙනි අදියර පටන් විහාරකාරාපන නම් අටසැත්තෑවෙනි අදියර දක්වා පොත එකාචාර්‍ය්‍ය පරම්පරාවක කීප නමක් කළ ලෙසද ඒ කාණ්ඩයට අයිතිවූ මහාපරාක්‍රමබාහු නරේන්ද්‍රයන්ගේ චරිත්‍රකථාව එම මහරජාණන් රාජ්‍යානුශාසනා කරන කල්හිම ගාථාබන්‍ධනයෙන් කළබවද සිතිය යුතුයි. පණ්ඩුරථ විජය නම්වූ සත්සැත්තෑවන පරිච්ඡෙදාවසානයෙහි,

"ඉති ජයති විචිත්‍රා න න්‍ත විකක න්ති සාරො
ධරණිපති කුලගෙහා සො පරක්කන්තිබාහු,
අනය නය විචිත්‍රො පෙත චිත්‍තප්‍පවාරො
වහති ධරණිමෙකො සො චිරං සාගරන්‍තං"යි

බඳිනාලද මේ පද්‍යයෙහි "ජයති, වහති" යන ක්‍රියා වර්‍තමාන වශයෙන් යොදා තිබෙන හෙයින් එය ශඞ්කාරහිතව හැඟේ. එහි සඳහන්වූ ද්‍රවිඩ යුද්ධ කථාව ඒ ඒ තැන යුඬකරණ අමාත්‍යයන් විසින් වාර්‍තා වශයෙන් ලියා එවනලද ලියුම් බලාගෙණ ඒ ප්‍රවෘත්ති සඞ්ග්‍රහ කළ බව ඒ ඒ යුද්ධ කළ ගම්වලද නුවරවලද නම් හා ද්‍රවිඩ යුද්ධසේනා පත්‍යාදීන්ගේ නම්ද සම්පූර්ණයෙන් කියා තිබෙන බැවින් හැඟේ. තවද ඒ කාණ්ඩය මහාවංසයේ අනික් සියලුම කාණ්ඩවලට වඩා සංස්කෘත පද්‍යබන්‍ධන රීතියට ඉතා ආසන්න ලෙස බන්‍ධයකොට තිබේ.

පැරකුම්බා කුමරහුගේ උත්පත්ති සඞ්ඛ්‍යාත කුමාරොදය වර්‍ණනාවද රඝු වංසයෙහි අජ්කුමාරයාගේ උත්පත්තිය වර්‍ණණනා කළ විධියෙන් කළ බැව් පෙණේ.

ඒ කාණ්ඩයට අන්‍තර්ගතවූ දෙසැත්තෑවෙනි පරිච්ඡෙදයෙහි 340 වෙනි ගාථාවේ "මං විය ත්‍වං අනසසිත්‍වා පරක්කම මහිභුනො" කියා ප්‍රථමාර්‍ථයෙහි ෂෂ්ඨිතියා විභක්තිය යෙදීමෙන් අපූර්‍වවූ විභක්ති භේදයක් පෙණේ. එබඳු වෙනත් විශේෂ කිසිතැනක දකිනු ලැබේ. නම් දැක්වීමේදී කිසිතැනක නවාක්‍ෂර ගාථාපාදාදිය පෙණේ. ඊලඟ එකුන් අසූවන අදියරෙහි පූර්‍වොක්ත විහාරකා රාපනාදියෙන් යම් කිසිවක් නැවත සඞ්ග්‍රහකරණලද හෙයින් ඒ පරිච්ඡෙදය අන්කෙනෙකු විසින් කළ බව සැලකිය යුතුයි. එසේත් ඒ කළ පණ්ඩිතවරයා විසින් ඒ පරිච්ඡෙදාවසානය නොකොට තිබීමෙන් වෙන කෙනෙකු විසින්

*Non-Commercial Distribution*

එය සමාප්තකළ බව ලියා තිබෙන ඉතා පරණ පොත්වල ඒ පරිච්ඡේදාවසානයෙහි ගාථා දෙකක් ඉතිරිව තිබියදී කුණ්ඩල කීපයක් ගසා නවත්වා නැවත "නමො තස්ස භගවතො" යනාදි පාඨය යොදා පොත ලියා තිබෙන බැවින් හැඟේ.

එතැන් පටන් අසූසත්වෙනි පරිච්ඡේදය අවසන්කොට ඇති කාණ්ඩය එකාකාරව හැඟේ. ඒ කාණ්ඩය ඊට පූර්‍වවූ අනන්තර කාණ්ඩය පමණ මනොහර නොවන නුමුත් කාව්‍යශාසත්‍රාදියෙහි දක්ෂයන් විසින්ම කළ බැව් සිතිය යුතුයි. එහි අසූසත්වන පරිච්ඡේදාවසානයෙහිවූ පද්‍යයේ අන්තිම පාදය මෙසේයි. "භුවමපි අභිනියාතෙසි තසෙසව රාති" මෙහි යති භ්‍රංශයක් පෙණෙන පරිද්දෙන් යම් කිසි තැනක ඡන්‍දොලක්‍ෂණදියේ වෙනස්බැව් ප්‍රකාශයි. ඉන් මෑත දෙයානුවන පරිච්ඡේදයේ මධ්‍යය දක්වා එකාකාර ක්‍රමයුක්තව පෙණේ. ඒ භාගය ඉතා මධුරවූ පද්‍යබන්‍ධනයෙන් මනෝහරව තිබේ.

සත්තිස්වෙනි පරිච්ඡේදය පටන් මේදක්වා දඹදෙණි නුවර පරාක්‍රමබාහු මහරජානන් කාලයෙහි ධම්මකීර්ත්ති නම් එකම ආචාර්‍ය්‍යකෙනකු විසින් කරණ ලද්දේය යන ඇතම් පණ්ඩිතයන්ගේ කීම ලෙස විශ්වාසකරන්ට පද්‍යබන්‍ධන රීතිය සෙවූ කල නොහැකි වේ. ධම්මකීර්ත්ති ආචාර්‍ය්‍යවරයා විසින් ඒ කාලය අවසන්කොට පොත සකස් කෙළේයයි සිතිය හැකිවේ. ඉන් මෑත සියක්වෙනි පරිච්ඡේදයේ කීර්ත්ති ශ්‍රීරාජසිංහනරෙන්‍ද්‍රයන්ගේ චරිත්‍රකථාවේ අර්ධයක් දැක්වූවාවූ කාණ්ඩය එම මහරජානන්ගේ කාලයෙහි සෙංකඩගල නුවර විසූ ස්ථවිර කෙනෙකු විසින් ඒ මහරජානන්ගේ ආරාධනාව කරණකොටගෙණ කළ බව එම කාණ්ඩයෙහි සඳහන්ව තිබේ. එයින් දඹදෙණිනුවර විසූ පරාක්‍රමබාහු මහරජානන්ගේ චරිත්‍රයෙන් මෑත නරෙන්‍ද්‍රසිංහ මහරජානන්ගේ කාලය දක්වා රාජ පරම්පරා කථාව සම්පූර්‍ණයෙන් ලියා නොලැබී යම් යම් ලිපි ආදියෙන් දුකසේ සොයා ලියූබව හැඟේ. ඉන් පූර්‍වපරිච්ඡේද සියල්ලම මහාකාව්‍ය සර්‍ග බන්‍ධනය පිණිස අලඞ්කාර ශාස්ත්‍රයෙහි කියන පරිද්දෙන් මුලපටන් එකම අනුෂ්ටුප් ඡන්‍දසේ අෂ්ටාක්ෂර පාදයුක්ත වෘතතවලින් බන්‍ධනය කොට පරිච්ඡේදාවසානයෙහි අන්‍යවෘතතයකින් පද්‍යයක් හෝ දෙකක් හෝ පමණ බන්‍ධනය කොට සර්‍ග සමාප්තිය දක්වා තිබේ. මේ කාණ්ඩයෙහි එසේ නොව තැනින් තැන අන්‍යවෘත්ත යෙදීමෙන් පරිච්ඡේදයෙක බොහෝතැන භේද කොට තිබේ. ඡන්‍දොලක්ෂණනොසලකාම ගාථාබන්‍ධනය කළාක් මෙන් හැඟේ. ව්‍යාකරණ ලක්‍ෂණදිය බොහෝ තැන විරුද්ධවීමෙන් හා පුනරුක්තාදියෙන් කියනලද වාර්‍ත්තාව නුමුත් තත්වූ පරිද්දෙන් හඟිනු නොහැකිසේ පෙණේ. ඒ ගාථා බන්‍ධනය කළ කාලය නම් ලඞකාද්වීපයෙහි

පැවති නානාවිධ ශාස්ත්‍ර හා ත්‍රිපිටකයේ අභිවෘද්ධිය සීතාවක රාජසිංහ රජහුගේ කාලයෙහි පසුබැස්මට ගියායින් පසු යහපත් වර්ධනයක් නැතිව තිබී වර්ධනයට ආරම්භ කරණ අවස්ථාවයි.

එහෙයින් ඒ රාජචරිත්‍රය මෙපමණ දැනගන්ට පුළුවන් පමණින් ගාථා බන්ධනය කොට තැබූ බව ඉතා සමතීතාවක් කොට සිතිය යුතුවනු පමණක් නොව වර්තමාන කාලික ජනයාට බලවත් ප්‍රයෝජනයකි. කීර්ති ශ්‍රී රාජසිංහ නරේන්ද්‍ර චරිත්‍රයෙන් භාගයක් හා රාජාධිරාජසිංහ මහරජානන්ගේ චරිත්‍රයද ශ්‍රීවික්‍රම රාජසිංහ රජහුගේ ප්‍රවෘත්ති කථාවද තවත් වෙන ස්ථවිර කෙනෙකු විසින් කරණලදී. එය සියක්වෙනි පරිච්ඡේදයේ අන්තිම කොඨාසය හා අවසාන පරිච්ඡේදයෙහි තිබෙන ගාථා එකුන්තිසක් පමණයි. ඒ කොටසත් ව්‍යාකරණ ඡන්දෝලක්ෂණාදියෙන් ඌනව තිබේ. මෙතෙකින් මහාවංස නම්වූ ලඞ්කාකථා මහා ප්‍රකරණය නිමවනලදී.

පරිච්ඡේදොනනානදිය මෙසේයි.

මෙහි එකුන් සාළිස්වන පරිච්ඡේදය අවසන්වූ තැන එක්සාළිස්වන පරිච්ඡේදය ගළපනලදී. එයින් සතළිස්වෙනි පරිච්ඡේදය නැතිවූ බව හැඟේ. අප විසින් ලඞ්කාවේ නානා ජනපදවලින් සපයනලද පොත් එකොළසක් පමණ බලන ලද නුමුත් ඉන් එකකවත් සතළිස්වන පරිච්ඡේදයක් නොපෙණේ. එකුන් සාළිස්වන පරිච්ඡේදයෙහි සීගිරිකසුප් රජහුගේද, මුගලන් රජහුගේද චරිත සඞ්ග්‍රහ කරණලදී. එක්සාළිස්වන පරිච්ඡේදයේ කුමාරධාතුසේන කීර්තිසේන සීව ආදී රජ නවදෙනකුගේ චරිත්‍ර සඞ්ග්‍රහ කරණලදී. පූජාවලී, රාජ රත්නාකර, සිංහල රාජවලි ආදියෙහිද, ගිරි කසුබ්රජහට අනතුරුවූ, මුගලන්, කුමාරදාස, කීර්තිසේන ආදී පිළිවෙළින්ම රාජපරම්පරාව සඞ්ග්‍රහ කොට තිබේ. ඉන්නිසා එකුන් සාලිස්වන පරිච්ඡේදයේ අවසානයෙහි කියනලද මුගලන් රජානන්ටද එක් සාළිස්වන පරිච්ඡේදයේ ආරම්භයෙහි කියනලද කුමාරධාතුසේන මහරජානන්ටද අතර වෙනයම් රජකෙනෙක් ලඞ්කාරාජ්‍යය නොකළ බවත් එබඳු රජකෙනෙකුන්ගේ රාජචරිත්‍රයක් ලියා තිබුන පරිච්ඡේදයක් අභාවයට නොගිය බවත් ශංකාරහිතව හැඟේ. කවර කථාවක් අභාවයට ගියේදයත් ? ලඞ්කාද්වීපයෙහි රාජ්‍ය සමෘද්ධිකරණයෙන්ද ශාසන ශෝධන වශයෙන්ද ශාස්ත්‍රවර්ධන වශයෙන්ද බොහෝ කටයුතු කළ නරේන්ද්‍රයන් අතුරෙන් එක එක රජකෙනෙකුන්ගේ චාරිත්‍රයට පරිච්ඡේද කීපයක් වශයෙන් සඞ්ග්‍රහ කරණලදී. කුමාරදාසයයි ලෝක ප්‍රසිද්ධ කුමාරධාතුසේන නමින් මහාවංසයෙහි කියනලද නරේන්ද්‍රතෙමේ ජනකීහරණදි කාව්‍යබන්ධන කළාවූ අටළොස් මහා විහාරයක් කරවා අටළොස්

Non-Commercial Distribution

මහ වැවක් බැන්දවු ධම්මසඞ්ගායනාවක්ද කරවු විස්තර වශයෙන් දීඝීකොට කියයුතු චරිතයක් ඇති මහරජ කෙනෙකි.

ඒ සඳහා රාජරත්නාකරයෙහිද පැරකුම්බාසිරතෙහිද කියනලද ප්‍රශංසා වලින් එය හැඟෙන්නේ නමුදු මහාවංශයෙහි එක්සාළිස්වන පරිච්ඡේදයෙහි මුල ගාථා තුනකින් ඒ මහරජානන්ගේ චරිතය කියනලදී. එහෙයින් ඒ මහ රජානන්ගේ චරිතය ප්‍රකාශ කරණලද පරිච්ඡේදයක් අභාවයට යාමෙන් සතළිස්වන පරිච්ඡේදයෙහි ඌනතාවවීයයි සිතිය යුතුයි. එසේත් එක්සාළිස් වන පරිච්ඡේදයෙහි කුමාරධාතුසේන නම් රජහුගේ චරිතය සංක්ෂේප කොට කියනලද්දක් සේ ඒ ගාථා තුනෙන් වැටහේ. එය පරිච්ඡේදයක් අඩුවූ පොත බලා ශුද්ධකරන්නාවු යම් කිසි පණ්ඩිත කෙනෙක් විසින් ගැළපෙනසේ යොදන ලද්දේයයි සිතියයුතු. එක්සාළිස්වන්න අඞ්රාජක නම්වූ නමුත් රජ නවදෙනෙකුගේ චරිතය පෙණෙන හෙයින්ද කුමාරධාතුසේන රාජචරිතය විස්තරය අපවත්වීයයි හැඟේ. ඊලඟ තෙසාළිස්වෙනි පරිච්ඡේදයක්ද නොපෙණේ. දෙසාළිස්වන පරිච්ඡේදයෙහි වනාහි අග්බෝ සුලු අග්බෝ යන නරෙන්ද්‍ර දෙදෙනෙකුගේ චරිත දක්වනලදී. තදනන්තරවූ සඞ්ඝතිස්ස රජහුගේ චරිතයසූසාළිස්වන පරිච්ඡේදාරම්භයෙහි කියනලදී. එහිදු පරිච්ඡේදද්වය අතර අන්‍යවූ රාජ චරිතයක් නොපෙණේ. දෙසාළිස්වන පරිච්ඡේදයෙහි කියනලද සුලුඅග්බෝ රජ තෙමේ මහාශ්‍රාද්ධාශයෙන් යුක්තයෙකි; එහෙයින් ඒ නරේන්ද්‍රයා විසින් කරණලද පින්කම් සඞ්ග්‍රහ කොට බන්ධනය කරණලද පරිච්ඡේදය තෙසාළිස් වෙනිව තිබී අභාවයට ගියේයයි සිතිය යුතුයි. එසේ ලඞ්කාරාජපරම්පරාව දක්වන වෙන පොත්වල පෙණෙන පරිද්දෙනුත් මෙහි රාජපරම්පරා කථාවේ ඌනත්වයක් නොවන හෙයින් මේ වංසකථාවේ අසම්පූර්ණත්වයක් නොපෙණේ. සතළිස් සත්වෙනි පරිච්ඡේදයද නැති, අටසාළිස්වන පරිච්ඡේදය පෙණී තිබේ එසේ වී තිබෙන්නේ මානවම්ම රජුගේ චරිතයෙන් අවසානවන සත්සාළිස්වන පරිච්ඡේදයේ අවසාන ගාථා කීපයක් කිසියම් පරිද්දෙකින් නැතිවීමෙන් අටසාළිස්වන පරිච්ඡේදයෙහි සඞ්ග්‍රහයට පැමිණි අග්‍රබෝධි රජුහුගේ චරිතය හා මිශ්‍රවීමෙන් සත්සාළිස් අටසාළිස්වන පරිච්ඡේද දෙක එකට ලියවීමෙනි. ඒ දෙකෙන් සත්සාළිස්වන්නේ අඩුවූ ගාථා කීපය නැති තැනයයි හැඟෙන තැනින් පරිච්ඡේදය වෙන්කොට දක්වලදී. අටසාළිස්වන්නෙහිද කසුප් රජහුගේ චරිතයෙන් ස්වල්පයක් අඩුවූ බව පෙණේ. හෙද අප විසින් දක්වා ඇති.

ඉන් මෑත එක්සැතෑවෙනි පරිච්ඡේදය අඩුවී තිබේ. ඒ ගැණ හැඟෙන්නේ නම් එක්සැත්තෑවෙනි දෙසැත්තෑවෙනි පරිච්ඡේද දෙක එකතුවී එක්සැත් තෑවෙනි පරිච්ඡේදයේ අවසාන ගාථා කීපයක් අපවත්වූ බවයි. එහි පරාක්‍රම

Non-Commercial Distribution

බාහු මහරජානන්ගේ ප්‍රථමාභිෂෙකයේ අවසාන වර්‍ණනාවෙන් ස්වල්පයක් අඩුවූ බව පමණක් හැඟෙන නුමුත් ඒ රාජචරිත්‍රයේ ඌණත්‍වයක් නොපෙණේ.

අනූවෙනි පරිච්ඡේදයෙහි බලවත් විශේෂයක් පෙණේ. එනම් එහි සපණස්වෙනි ගාථාව දක්වා කොයි පොත්වලත් සමානභාවය පෙණෙන නුමුත් සත්පණස්වෙනි ගාථාව පටන් සූසැටවෙනි ගථාව දක්වා පොත් දෙකොටසක දෙයාකාරයක තිබේ. ඒ එසේවී තිබෙන්නේ පුරාණව තිබුනු ඒ ගාථා කීපය අභාවයට පත්ව තිබුනාවූ පොතක් බලාගෙණ ඉන් මත්තට මහාවංශකථාව ලියන්ට ආරම්භ කළ ආචාර්‍ය්‍යකෙනෙක් විසින් ඒ අඩුවූ ටිකත් සිංහලෙන් ලියා තිබුනු යම් කිසි පොත්වල අනුසාරයෙන් පූර්‍ණකිරීමට ගාථාබන්‍ධනය කළ නුමුත් ඒ ගාථා කීපය අඩු නැතිව තිබුනු පොතක් වෙන තැනක තිබී ලැබුන හෙයින් ඒ පරම්පරාදෙකේම පොත් ලියවීගණ ආනිසායයි සිතම්හ. ඒ දෙයා කාරයෙන් ගාථාශුද්‍ධියෙන් වඩා යහපත් අර්‍ථාන්‍විත ගාථා ඇති ඉතා පුරාණ පොත්වලින් ලැබුනු ගාථා පිළිවෙළ අපේ පොතේ යොද අනික් පරම්පරාවේ තිබෙන ගාථා කීපය අධොලිපි වශයෙන් යොදලීමු. පොත බලන්නන් විසින්ද එයින් අනවද්‍ය පරම්පරාව මෙයයි නිශ්චයකරණු ලැබෙවා.

වන්‍නිභුවනෙකබාහු ආදි කොට ජයවර්‍ධනකෝට්ටෙයෙහි විසූ ශ්‍රී පරාක්‍රමබාහු මහරජානන්ගේ කාලය දක්වා සෙංකඩගල නුවර විසූ ශ්‍රී කීර්‍තිශ්‍රීරාජසිංහ මහරාජනන්ගේ කාලයෙහි ගාථා බන්‍ධනය කරණ ලද රාජචරිත්‍රයන්හි අසම්පූර්‍ණත්‍වය පෙණේ. එය සිංහල රාජවලි පොත්වලද අනාකූල සම්පූර්‍ණත්‍වයකින් නොපෙණේ. එසේත් ඒ පරිච්ඡෙදයන් මෑතකාලේ කරණලද හෙයින් කිසි ඌනත්‍වයක් නැතිව තිබේ. සියක්වෙනි පරිච්ඡේදයෙන් මත්තෙහි ලියනලද ගාථා ස්වලපයේ පරිච්ඡේදවසානයක් නොපෙනෙණ නුමුත් ඒ එකසිය එක්වෙනි කොට යෙදූයෙමු. නුමුත් අවසානය නොපෙණෙන හෙයින් අපේ වාක්‍යයන්හි පරිච්ඡේදයක් වශයෙන් සඳහන් නොකළෙමු. ප්‍රවෘත්තිවිශේෂ - ද්වීපවංශයෙහි වනාහි බුදුන් පිරිනිවීමෙන් අවුරුදු සියයක් ගිය කල්හි කළ ද්වීතීය ධර්‍මසඞ්ගීතිය විසාලා මහනුවර කූටාගාර ශාලාවෙහි කරණලද්දේයයි කියනලද්දේ නුමුත් මෙහි වාලුකාරාමයෙහියයි කියනලදී. මෙහි කීම අටුවාදිය හා සමවේ "කප්පති සිංගිලොණ කපෙපා" යනාදීන් බුද්‍ධදේශානාවට විරුද්‍ධව දශවස්තුව ඉපදවූ වජ්ජිපුත්තක භික්‍ෂූන් විසින් කරණලද මහාසඞ්ගීතියෙහි ප්‍රවෘත්තිය ද්වීපවංශයෙහි පමණ මහාවංශයෙහි විස්තර වශයෙන් නොපෙණේ. ඔවුන් විසින් අභිධර්‍මයද පරිවාරපාඨයද පදභාජනියද තවත් ඇතැම් ජාතකාදියද හැරදමා ධර්‍මාසඞ්ගායනා කළබැව් දැක්වීමෙහිලා ද්වීපවංශයෙහි මහා-වංශයෙහි නොකියනලද විස්තර රාශියක් කියනලදි.

මෙහි පෙණෙන රාජපමපරාවෙහි ගණතිස්‍ස නම් රජකෙනෙක් සිංහල රාජාවලිය ආදියෙහි කියනලදී. රාජාවලියෙහි ගණතිස්‍ස රජතෙමේ

Non-Commercial Distribution

පණ්ඩුකාභය රජහුගේ පුත්‍රයයිද හෙතෙම පණ්ඩුකාභය රජහට ඉක්බිත්තෙන් සතළිස් හවුරුද්දක් රජකෙළේයයිද කියනලදී. අභය පණ්ඩුකාභය යන නරෙන්ද්‍ර දෙදෙනා අතර රාජශුන්‍යවූ සතළොස් හවුරුද්දට ඉක්බිත්තෙන්යයි රාජරත්නාකරයෙහි කියනලදී. එතකුදුවුවත් දීපවංශයෙහිද මහාවංසයෙහිද අභය රජහට ඉක්බිත්තෙන් සතළොස් හවුරුද්දක් ලඞ්කාද්වීපය රාජශුන්‍යව තිබුනු කල පණ්ඩුකාභය කුමාරයා රජවූ බවද ඔහු ඇවෑමෙන් ඔහුපිත් මුටසීව කුමාරයා රජවූ බවද කියනලද හෙයින් ඒ අතර ගණතිසස නම් නරෙන්ද්‍ර යෙක් නුවූබැව් ප්‍රකාශයි. එසේත් පණ්ඩුකාභය රජහුගේ කාලය සැත්තෑහවුරුද්දක් කියනලද හෙයින් ඒ අතර තවත් රජකෙනෙක් රජකළ කාල යත් සමග එපමණ හවුරුදු ගණන් වීයයි සිතියයුතුසේද වැටහේ.

බුද්ධ වර්ෂ 656 පමණ කාලයෙහි ලඞ්කාරාජ්‍ය කළ ගජබාහු නරෙන්ද්‍රතෙමේ පියරජ කල සොළීරජහු විසින් ලඞ්කාවෙන් හැරගෙණ ගිය සිරවහල් දොළොස්දහස පොලිත් සමග ගෙණෙන පිණිස නීලයෝධයා කැටිව යගද වෙන් මුහුදුදිය දෙබේ කොට පිටිපතුල් නොතෙමා සොළීරට ගොස් වැලිමැඩ දියගැණීම් ආදී වික්‍රම කොට සොළීරජහු බියගන්වා එහි ගෙණයනලද සිංහලයන්ට පොළී පිණිස සොළීන්ගෙණ සූවිසිදහසක් සිරවාලුන් ගෙණයේයයි සිංහල රාජවලියෙහි කියනලදී. ඒ සඳහාම පැරකුම්බාසිරිතෙහි උරතෙලේ ගෑ සඳුන් නොමකා මුහුද පීනා එතර ගියේයයි කියනලදී. බුද්ධ වර්ෂ 1670 ව පමණ කාලයෙහි රජකළ දෙවෙනි ගජබා මහරජානන් සඳහා පැරකුම්බා සිරිතේ එය කියනලදසේත් සිතිය හැකිවේ. මහාවංසයෙහි ඒ රජ දෙදෙනාගේම චරිතයන්හි එබන්දක් සඳහන් නොවේ. ධාර්ම්මික ශ්‍රීසඞ්ඝබෝධි නරෙන්ද්‍රෝත්තමයාගේ චරිතය මහාවංශයෙහි සඞ්ග්‍රහකළ තන්හි ඒ නරෙන්ද්‍රතෙම මගියාට හිස දෙනු කැමතිව හිඳගණ මෙළේය. එකල මගීතෙම හිස කපාගෙණ ගියේයයි කියනලද්දේ වීනමුත් අතතනගලු වංශයෙහි ඒ නරෙන්ද්‍ර තෙම හසි ගලවා මගියා කැඳවා දුන්නේයයි කියනලදී. කුමාරධාතුසේන නමින්ද කුමාරදශ නමින්ද ප්‍රකාශවූ මහරජානන් කල සඞ්ඝමිත්‍ර නිකායවාසී දුෂ්ට ශ්‍රමණයෙක් නිල්වතක් පෙරවගෙණ රාත්‍රිභාගයෙහි වෙශ්‍යාවාශයට ගොස් ආරාමයට එනකල්හි දුටුවන් විසින් විචාළකළ ඒ වෙශයම වර්ණනාකිරීම් ආදියෙන් බුද්ධශාසනයට අපරාධකළබව ශාසනාවතාරාදියෙහි කියා තිබෙන නුමුත් එය මහාවංසයෙහි සඳහන්ව නොපෙණේ. හෙද අප විසින් පරිච්ඡේදෙනත්‍වය දැක්වූ තන්හි සඞ්ග්‍රහකොට තිබී ඒ සඞ්ග්‍රහ කළ පරිච්ඡේදය අපවත් වීමෙන් වූ ඌනත්‍වයකැයි සිතිය යුතු. මේ ආදියෙන් වෙන පොත්වලින් දතහැකිවූ කිසියම් ලඞ්කාරාජ්‍යශාසන ප්‍රවෘත්තීන්ගේ ඌනත්‍වයක් පෙණේ.

සවෙනි භුවෙනකබාහු නරෙන්ද්‍රයානන්ගේ කාලෙයෙහි රාමඤ්ඤාදී රටවල බුද්ධශාසනය අසුද්ධව සඞ්ඝයාගේ සඞ්ඝ කර්ම්මාදියද අපිරිසිදුව තිබුනහෙයින් ධවල ගජපති රාමඤ්ඤ මහරජානන් විසින් රාම දූත චිත්‍ර දූත යන නමැති

Non-Commercial Distribution

රාජ දූත දෙදෙනකු සමග නැව් දෙකකින් ස්ථවිර විසිදෙනමක් හා සාමණේරවරයෝද භුවනෙකබාහු මහරජානන් වෙත සුවර්ණපත්‍ර රාජසන්දේශදී එවන ලද්දහ. එයින් චිත්‍රදූතයා නැගී ආවාවූ නැව යොගාභිධාන නදි මුඛයෙන් නික්ම මාසයක් ගෙවෙන්ට පළමු කොළඹ තොට පත්විය. රාමදූතයා නැගී ආවාවූ නැවින් ආ ස්ථවිරාදීහු වැලිගම්පටුනට පත්වූහ. ඒ කාලයෙහි ගුරුවී නම් එක් සිංහලාමාත්‍යයෙක්තෙම භුවෙනකබාහු මහරජානන්ට විරුඬදමරිකයෙක්ව වැලිගම විසූසේය. ඔහු සමග යුද කරුණු පිණිස මහරජාණන්ගේ මල්කුමාරතෙම යොධාරූඪවූ බොහෝ නැව් කැටි කොට ගෙණ වැලිගම් තොට පත්විය. එකල ගුරුවී නම් දමරිකතෙම ඒ කුමරු හා යුද කරුණු නොහැකිව බියෙන් වල්වන, ඔහුගේ පක්ෂයෙහි ජනයන් විසින් වැලිගම හා ජයවර්ධනපුරය අතර මාර්ගීක ජනයන්ට අන්තරාය කරණහෙයින් ඒ රාජ කුමාර තෙමේ රාමාත්‍ය රටින් වැඩි සඞසයා හා රාජදූතාදීන්ට අවසර නොදී ටිකකල් එහිම වැස්වීය; ඉන්පසු අවසර ඇතිව ජයවර්ධනපුරයට ඒ ස්ථවිරයෝ පැමිණ ඊට පූර්වභාගයෙහි කොළොම්තොට පැමිණ ජයවර්ධන පුරප්‍රාප්ත ස්ථවිරාදීන් හා කැටිව භුවනෙකබාහු මහරජානන් විසින් කරණලද සත්කාර ලබාගෙණ ලඞකාඞීපවාසි සඞසයාගෙන් ලබාගන්ට අභිමතවූ උපසම්පද කර්මය කල්‍යාණිනදියෙහි සැදූ උදකුකෙඛප සීමායෙහිදී සමෘඬ කොට ගෙණ රමණ රට ගොස් සිතගජති මහරජාණනන්ගේ සත්කාරයෙන් ඒ රටේ උපසම්පද දී කර්ම කොට බුඬශාසන වර්ධනය කළෝය යන මේ ප්‍රවෘත්තිය කල්‍යාණි ප්‍රකරණයෙහි විස්තරවශයෙන් ආනුමුත් ඒ ගැණ කිසිවක් මහාවංසයෙහි ප්‍රකාශනොවේ. ඒ භුවනෙකබාහු මහරජානන්ගේ චරිතකථාවෙහි ඒ මහරජානන් කාලයෙහි එබඳු දමරිකයෙකුගෙන් වියවුලක් පැවැති බැව් හෝ මහාවංශයෙහි නොපෙණේ. එසේවූයේ නම් ඒ කාණ්ඩය ගාථාබන්ධන කරණ කාලෙය් ඒ ප්‍රවෘත්ති ලියනලද ලිපි නොලැබුන බැවිනැයි හඟිමු. මෙසේ මහාවංසයෙහි නොපෙණේ. මෙසේ මහාවංසයෙහි පෙණෙන රාජචරිත්‍රාදියට වෙනස්වූ යම්යම් ප්‍රවෘත්තිවෙන පොත් වල පෙණෙතුදු, එහි නොකියනලද ප්‍රවෘත්ති යම් යම් පොත්වලින් දකින්ට ලැබෙතුදු ලංකාවේ මහාවංසයේ තත්වූපරිද්දෙන් සඞග්‍රහ කරණලද රාජ චරිත්‍රාදිය ඇති වංසකථා පොතක් වෙනරටක නැතිසේ බොහෝ පණ්ඩිතයන් විසින් සලකන ලදී. කස්මීර රාජතරඞගිණී ආදිය මෙපමණ ශුඬලෙස සඞග්‍රහ නොකරණලද බැව්ද ප්‍රකාශයි. දඹදිව ප්‍රවෘත්ති දැනගැන්ම පිණිසද මේ පොතක මහෝපකාරියි.

මේ කාලයෙහි ලඞකාවෙහි රාජනීති පවත්වන්නාවූ අධිකරණ නායකාදීන් විසින්ද පුරාණ ලඞකාචරිත්‍ර දැනගන්නා පිණිස මහාවංශයෙහි සඞගෘහිත ප්‍රවෘත්ති අවබෝධ කටයුතුයි. ලංකාවේ ආගම ප්‍රවෘත්ති රාජචරිත්‍රාදිය අව බෝධ කරුණු කැමැත්තන් විසින් සර්වප්‍රකාරයෙන් මේ ග්‍රන්ථය අවබෝධ කටයුතුයි.

Non-Commercial Distribution

ඒ බැව් සැලකූ ජෝර්ජ් ටර්නර් නම් ඉංග්‍රීසි මහතානන් විසින් මෙය ඉංග්‍රීසි භාෂාවට නගුණු පිණිස මහාවංශය හා එහි ටීකාවද සපයාගෙණ සෙංකඩගල නුවර පුෂපාරාම හයගිරි යන උභයවිහාරවාසීවූ සමත්ථ ස්ථවිරයන්ගේ උපකාර ලබාගෙණ ටීකාව ඇතිතාක් දුර, එනම් සතිස්වෙනි පරිච්ඡේදය දක්වා ඉංග්‍රීසියට නගා ටීකා රහිත පරිච්ඡේදයන්ද ඉංග්‍රීසියට නගන අදහසින් තව පරිච්ඡේද දෙකක් ශුඬ කරන්නට උත්සාහකොට සම්පූර්ණයෙන් ශුඬ කරණු නොහැකිව අශුඬස්ථාන අශුඬත්‍වය හා ඌනත්‍වය හැඟෙනසේ සලකුණු යෙදා සංක්‍ෂෙපයෙන් ඒ පරිචෙඡද දෙකෙහි භාවයද ඉංග්‍රීසියට නගා මුද්‍රාඞකරණය කරවන ලදී — එයින් දඹදිව සහ ලඞකාවීපයේ ඉතා වැදගත් ආගම ප්‍රවෘත්ති රාජ චරිත යුරෝපීය පණ්ඩිතයන්ටත් දැනගන්නට ලැබුන හෙයින් අපරභාගයෙහි ප්‍රවෘත්ති දැනගන්ටත් ඒ පණ්ඩිතයන්ගේ මහත් අභිලාසයක් තිබෙන හෙයින්ද, ලංකාවාසී ශාස්ත්‍රාදග්‍රහණයෙහි නියුකත්තයන්ගෙත් එබඳු අභිලාසයක් තිබෙන හෙයින් ද මෙම පොත සිංහලට නඟාගැන්මෙහි අභිලාසය ඇත්තාවූ ඇතැම් සුධීන් විසින් එසේ කරන්ට උත්සාහකළ නුමුත් ටීකාවක් නැතිව බොහෝ කල් අතින් අතට ලිවීමෙන් හා අන්තරායෙන් ඌනත්‍වාදිය වීමෙන් ආකුලවූ පොත ශුඬ කරගැන්මම ඉතා උගහට බැවින් එය ප්‍රපඤ්චත්‍වයට පත්ව තිබෙන කලැ වර්‍ෂ 1871 කේදී දොන් අන්‍ද්‍රීස් ද සිල්වා බටුවන්තුඩාවේ පණ්ඩිතයානන් විසින් ඒ පොතේ තත්‍වාවබෝධයට යොගත්‍යාවනසේ ශුඬ කොට දෙවනාගරාක්‍ෂරයෙන් මුද්‍රාඞ්කණය කරවා දෙන පණිස සර් විලියම් හැන්රි රොබින්සෝන් ලඬෙශ්වරවූ උතුමානන්ගෙන් ඊට උපකාර ඉල්වනලදී. ඒ ඉල්ලීම සැලකියයුතු බැව් ඒ උතුමානන් විසින් සඳහන්කර තිබෙන කල්හි, වර්‍ෂ 1874 අති වංශාධිපති සර් විලියම් හෙන්රි ග්‍රෙගොරි ලඬෙකශ්වරයානන් විසින් මේ කටයුත්තේ ප්‍රයෝනත්වය සලකා එංගලන්තයෙහි පාලි සංස්කෘතාදිය පුහුණුකළ පණ්ඩිතවරයන්ගේ මත පරීක්‍ෂා කොට ඒ මතානුකූලව මේ කටයුතත කරවනු කැමැතිවූයේ මෙහිසඳහන්කළ පණ්ඩිතයානන් කැඳවා මේ පොත වරදින් ආකුල බැවින් තත්‍වාවබෝධය නොකළහැකි බැව් එහි ස්වභාව දන්නා උගතුන්ගෙන් මට දැනගන්ට ලැබී තිබෙයි, එහෙයින් ප්‍රථමයෙන් ප්‍රයෝජනයට පවත්වන්ටත් නැවත ඉංග්‍රීසියට නංවා යුරෝපීය ජනයන්ටත් ප්‍රයෝජන වනසේ පවත්වන්නටත් අභිප්‍රාය කරණලද්දේය. මෙසේ ව්‍යාකුල වූ පොතක් ශුඬකිරීමෙහි එකම පණ්ඩිතකෙනෙකුගේ මතයෙන් සම්පාදනයට වඩා දෙදෙ නෙකුගේ මත සංසන්‍දයෙන් කිරීම යෝග්‍යය ඒ ගැණ උඹ හැර මා විසන් සලකණ ළද පණ්ඩිතවරයා සුමඞගල නායක උන්නාන්සේය, උන්නාන්සේත් සමග පොත බෙදගෙණ සුඬ කොට සිංහලටත් පොතක් ලියා දෙන්ට හැකිදැයි විචාළවිට යෙහෙකැයි උත්තරදුන් හෙයින් මෙහි සඳහන් කළ හික්කඩුවේ සුමඞ්ගලාභිධාන නායකස්ථවිරයන් කැඳවා බටුවන්තුඩාවේ පණ්ඩිතයානන් සමග මහාවංශය ශුඬ කොට සිංහලට පොතක් ලියාදීම කරණු හැකිදැයි

Non-Commercial Distribution

විචාළවිට මාවිසින් නිබඳ කරණුලබන කටයුත්තක්ව තිබෙන්නේ අභිනව භික්‍ෂු ආදීන්ට ඉගැන්වීමය, මේ කාලයෙහි එම කටයුත්ත බහුලවශයෙන් කෙරෙණ හෙයින් මට තිබෙන අවකාශ කාලය ඉතා ස්වල්පය, එසේවී නුමුත් භවත් ලඬෙකශ්වරයානන්ගෙන් පතිවුඩ වෙන මෙය ලොක ශාසනඋභයටම ප්‍රයෝජනවත් කටයුත්තක් හෙයින් අවකාශ ඇති පමණින්
ශාසනඋභයටම ප්‍රයෝජනවත් කටයුත්තක් හෙයින් අවකාශ ඇති පමණින්
කරණු කැමැතියයි උත්තරදුන් හෙයින් නැවත දෙදෙනාම කැඳවා මේ පොතේ සතිස්වෙනි පරිච්ඡෙදය දක්වා ටීකාව සහිතවූ කාණ්ඩය ජෝර්ජ් ටර්නර් නම් මහතුන් විසින් ඉංග්‍රීසියට නගා තිබෙන හෙයින් දතයුතුදේ සාමාන්‍යයෙන් ඉංග්‍රීසි පණ්ඩිතයන්ට දැනගන්ට ලැබී තිබෙයි, එතැන් පටන් ටීකාවක් නැතිව තිබෙන අන්තිම දක්වා වූ කාණ්ඩය ඉක්මනින් දැනගණු කැමැති නිසා ප්‍රථම කොට එය ශුඬ කොට සිංහල කටයුතුය. පූර්වභාගය නැවත කළහැකියයි නියම කොට ඒ ගැණ ආණ්ඩුව විසින් කටයුතු වියදම් මේ බටුවන් තුඩාවේ පණ්ඩිතමහත්මයා සමග ගණුදෙනු වශයෙන් කරගණිමුය, මේ පණ්ඩිත දෙපල විසින්ම පොත ප්‍රසන්න පරිද්දෙකින් බෙදගෙණ ශුඬ කොට එක්කෙනෙක් ශුඬකළ කාණ්ඩයද සිංහලකළ කාණ්ඩයද අනික් පණ්ඩිතවරයාටත් පෙන්නා නැවත මතසංසන්‍දනය කොට අවසන්කිරීමෙන් පොත කළමැනවැයි වර්‍ෂ 1874 ටේ මැයි මස 21 වෙනි දින නියෝගකරණලදී. ඒ නියෝගය පිළිගත් අප විසින් පොතේ ශුඬිය සොයන පිණිස නානාප්‍රදේශවල මහාවංශය පිට-පත්කර තිබෙන පොත් බලනු පිණිස සත්කෝරලයෝ රිදීවිහාරය,සෙංකඩගල නුවර. ගිරිවායේ මුල්ගිරිය, මාතර, ගාල්ල, බෙන්තොට, පානදූරය, සල්පිටිකෝරලය යනාදි ස්ථානවලින් සපයනු හැකි තරම් පරණ පොත් එකොළසක් සපයවා එයින් සයක් බොහෝසෙයින් එකාකාරව පෙණුනනිසා පසක් හැරදමා පොත් සයක් නොහැර අනික් පසෙනුත් අභිමතයක් විටින්විට ගණිමින් සංසන්‍දනය කර බලන්ට ගතිමු. ඒ පොත් අතුරෙන් රිදීවිහාරයෙන් ගෙන්වාගන්නාලද පොත වර්‍ෂ සියයකට වැඩි කල් ගිය පොතකැයි සිතියයුතුසේ පරණව තිබේ. අම්පිටියේ විහාරයෙන් ගෙන් වනලද පොතද කොලොන්නාවේ විහාරයේ තිබී ලබාගත් පොතද අවුරුදු සියයකට ආසන්න ලෙස පරණයි. ඒ පරණ පොත්වල ලියවී තිබෙන්නේ අනූවෙනි පරිච්ඡෙදයෙහි 103 වෙනි ගාථාව දක්වායි. අන්තිම කාණ්ඩය කීර්‍ත්ති ශ්‍රී රාජසිංහ මහරජානන් කාලයෙහි කරණලද්දකි. මේ සියල්ලෙන් බලාත් ඌන පූරණයකරණු නොහැකි තැන් අන්‍ය ග්‍රන්ථවල පෙණෙන කාරණානුසාර යුක්තියුක්තාදිය සලකා පූරණය කෙළෙමු. නොයෙක් පිටපත්වල පෙණෙන නානාපාඨයන් අතුරෙන් අතිශයෙන් යුතුසේ වැටහෙන පාඨ යෙදූයෙමු. මේ පොත අනුපදිකවශයෙන් සන්නකිරීමෙන් ලඬකා කථාව ඉගෙණගන්නන්ට ප්‍රයෝජන නොවන හෙයින් භාවබොධක සිංහල ව්‍යාඛ්‍යානයක් කිරීම යහපතැයි ලඬෙකශවරාදී උත්තමයන්ගේ මතානුකූලව එසේ කෙළෙමු. පොතේ පාඨසෝධනය කොට යනත්‍රශාලාවේ අන්තිම

Non-Commercial Distribution

ලඟට අඩකණයකළායින් පසු මේ මේ අශුද්ධවද ඌනත්වයෙන් යුක්තවද තිබෙන ගාථා යම් කෙනෙක් විසින් පිළිගත යුතුසේ ශුද්ධකොට නම සඳහන් කොට එවුවොත් ඒ පිළිගතයුතු නම් සතුතිකොට අපේ ශුද්ධියට වඩා හොඳයයි නම සංඥපනයෙහි සඳහන් කරණ බැව් කියා කාණ්ඩ දෙකක් ලක්රිවිකිරණේ ප්‍රසිද්ධකරවූයෙමු. නමුත් ඉන් එක ගාථාවක්වත් කිසිකෙනෙක් විසින් ශුද්ධ කොට දැක්වීමක් නොකරණලදී.

අපේ සිංහලකිරීමෙහි බොහෝ තැන බ්‍යඤ්ජනාර්ථයම නොදක්වා ආදි මධ්‍යාවසාන වශයෙන් පෙණෙන භාවය ප්‍රධාන කොට අර්ථ දැක්වූ බවද ගාථාබන්ධසුඛය පිණිස යොදනලද යම් යම් වචන නැති කලද සිංහලාර්ථය මනාලෙස ගැලපෙන තන්හි එසේ පෙණෙන තත්ශබ්දදිය හා පාදපූරණදිය පිණිස යොදනලද නිපාතයද යම්කිසි තැන නොගන්නාලදහ; එය පණ්ඩිතයන් විසින් සැලකිය යුතුයි. පරිච්ඡේද ගාථා සංඛ්‍යාව පෙන්වන ඉලක්කම් සිංහල සන්නයෙගිදූ යොදනලද හෙයින් එයින් ගාථාවර්ථාවබෝධය ඵාසු වේ. ප්‍රමාදදියෙන් වූ ඌනත්වාදියක් දක්නා පණ්ඩිතයෝ ඉවසමින් නැවත පූරණ දියෙහි අනුකූල වෙත්වා.

" දෙෂා කෘතෞ සුමතයො මම කො'පිචෙත් ස
යුෂමාභිරත්‍ර කෘපය විනිවාරණීයඃ
ආතීඃ බගඃ සමවලොක්‍ය සවර්ගබාධාං
නිඃශකතිකා අපි කුවනති යතඃ සමනතාත්."

මේ ශ්ලොකය වාසවදත්තාව්‍යාඛ්‍යාවෙන් ගන්නා ලදී.

Non-Commercial Distribution

## සංස්කාරක සටහන

සිංහල මහා වංශය නාමයෙන් හඳුන්වන්නේ සිංහලයේ ආදි තමයා යයි වැඩි දෙනකුන් පිළිගන්නා විජය රජුගෙන් ආරම්භ වන මහා සම්මත රාජ වංශයේ කථා පුවතයි. මහාවංශය යන වචනයේ අර්ථය උත්තම පරම්පරාව යන්නයි.

ක්‍රි: පූ: 543 විජය රජුගේ පටන් ක්‍රි: පූ: 303 මහාසේන රජු වන තෙක් වූ වසර 240 ක කාල පරිච්ඡේදය පරිච්ඡේද 37 කින් යුක්තකොට සංගෘහිත කොටස මහා වංශය නමින් පිළිගැනෙයි.

ක්‍රි: පූ 304 කිත්සිරිමෙවන් රජුගෙන් ආරම්භව ක්‍රි: ව 1153 1 වන පරාක්‍රමබාහු රජු අවසන් කොට ඇති වසර එක්දහස් හාරසිය පනස් හතක දක්වා කාලය පරිච්ඡේද 42 කින් සංගෘහිත කොටස චූළවංසය වසයෙන් පිළිගැනෙයි.

ක්‍රි: ව: 1186 11 වන විජයබාහු මහ රජුගේ පටන් 1357 V වන පරාක්‍රමබාහු රජු අවසන් කොට ඇති වසර 171 ක කාලය පරිච්ඡේද 09 කින් සංගෘහිත කොටස ඊළඟ කොටස වසයෙන් පිළිගැනෙයි.

ක්‍රි: ව: 1357 තුන්වන වික්‍රමබාහු රජුගේ පටන් 1798 ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා ගැනෙන වසර 441 කාලය පරිච්ඡේද 11 කින් සංගෘහිත කොටස ඊළඟ කොටස වසයෙන් පිළිගැනේ.

ක්‍රි: ව: 1798 න් ආරම්භව 1935 න් අවසන් වන සේ සංගෘහිත කොටස, ඊළඟ කොටසට ද, 1935 සිට 1979 දක්වා ආචාර්ය නන්දදේව විජේසේකර වියතුන්ගේ ප්‍රධාන කර්තෘත්වයෙන් ලියැවී ඇති කොටස නූතනම කොටස වසයෙන් පිළිගැනෙති.

මෙසේ මහා වංශ චූළවංශ වසයෙන් දැක්වුනද සාමාන්‍ය ව්‍යවහාරයෙහි පවත්නේ මේ සියල්ල මහා වංශය යන නමිනි.

මෙයට අමතරව ඩී. එච්. ඇස් අභයමරත්න මහතා විසින් විජය රජුගේ පටන් එංගලන්තයේ V වන ජෝර්ජ් රාජ සමය දක්වා ලිඛිත මහා වංශයක් ද පළවී ඇත.

Non-Commercial Distribution

අපගේ මෙම සංස්කරණය මෙම ග්‍රන්ථ සියල්ල පරිශීලනය කරමින් කරන ලද බව ඒ ඒ ග්‍රන්ථකර්තෘ සියලු විද්වතුන් හමුවේ කෘතඥතා පූර්වකව සඳහන් කරනු කැමැත්තෙමි.

ආදිතම මහරජු විජය රජුගේ පටන් ක්‍රිඃ වඃ 1948 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් ශ්‍රී ලංකාව නිදහස් වීම දක්වා වූ කාල පරිච්ඡේදය එකම ග්‍රන්ථයක් වසයෙන් කියවීමට හුදී ජනයන්ට ඇති අපේක්ෂාව මෙම සංස්කරණයෙන් යම්තමින් හෝ පිරිමැසෙන්නේ නම් එයින් අපි සතුටට පත්වෙමු. අපගේ එක් පරමාර්ථයක් නම් එම පහසුව පාඨකයාට ලබා දීමයි.

අතිපූජ්‍ය සිප්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමියන්, බටුවන්තුඩාවේ පඩිමතුන්, යගිරල ශ්‍රී ප්‍රඥානන්ද, පහතරට නායක හාමුදුරුවන්, ආචාර්ය නන්දදේව විජයසේකර වියතාණන් ප්‍රධාන වියත්ගණයා සහ අභයසිංහ මහතාද මෙහිදී අපගේ ගෞරවයටත් ප්‍රසාදයටත් පත්වන්නාහ.

මෙම සිංහල මහාවංසය සකස් කිරීමේදී විශාල මෙහෙවරක් කිරීමට සිදුවිය. එහි දී අපට ඉතා හිතින්ම සහාය වූ පාලිත ලියනගේ මහතා ද, විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාද ඉතසිතින් සිහිපත් කරමි. පරිගණක අක්ෂර යෙදූ තනුජ දයාල් පෙරේරා මහතා සහ රුවිනි පැස්කුවල්, ගීතා ස්වර්ණමාලී මෙනවියන්ටද, පිටකවරය හරවත් මෙන්ම ඔපවත් කළ විජේබණ්ඩාර මහතාටද, ඉතා ටික දවසක් තුළ දර්ශනීය ලෙස මුද්‍රණය කටයුතු කළ මුද්‍රණාලයේ අධිපති තුමන්ට හා සියලු සේවක මහත්ම මහත්මීන්ටද අපගේ කෘතඥතාවයත්, පුන්‍යානුමෝදනයත් හිමි කරම්හ.

මෙයට - ලෝ සසුන් වැඩකැමති

**කිරම විමලජෝති ස්ථවිර**
අධ්‍යක්ෂ,
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල - දෙහිවල.

*Non-Commercial Distribution*

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | රා.ව.මාස | දවස |
|---|---|---|---|---|---|---|
| | | | **8 වන පරිච්ඡේදය** | | | |
| 38 | - | - | පණ්ඩුවාස දේවගේ සම්ප්‍රාප්තිය | | | |
| 38 | 17 | 3 | පණ්ඩුවාස දේවගේ රාජ්‍යය. | 40 | 30 | |
| | | | **9 වන පරිච්ඡේදය** | | | |
| 40 | 19 | | ලක්දිව රාමගොණ-අනුරාධ-උරුවෙල ආදී ගම් පිහිටීම | | | |
| 40 | 23 | 4 | අභය රජුගේ රාජ්‍යය | 70 | 20 | |
| | | | පණ්ඩුකාභය කුමරු වැඩීම | | | |
| | | | රාජ්‍ය ශූන්‍ය වූ වකවානුව | 90 | 17 | |
| | | | **10 වන පරිච්ඡේදය** | | | |
| 45 | 1 | | පණ්ඩුකාභය කුරමරුගේ යුද්ධය | | | |
| 50 | 77 | 5 | පණ්ඩකාභය රජවීම | 107 | 30 | |
| | | | **11 වන පරිච්ඡේදය** | | | |
| 47 | 1 | 6 | මුටසීව රජුගේ රාජ්‍යාභිෂේකර | 177 | 60 | |
| 49 | 42 | 7 | දෙවන පැතිස් රාජ්‍යාභි ෂේකය | 237 | 40 | |
| | | | දෙවන පැතිස් රජුගේ දෙවන අභිෂේකය | | | |
| | | | **12 වන පරිච්ඡේදය** | | | |
| 50 | 1 | | ප්‍රත්‍යන්ත දේශයන්හි බුදු දහම පිහිටුවීම | | | |
| | | | **13 වන පරිච්ඡේදය** | | | |
| 53 | 20 | | මිහිඳු හිමියන්ගේ ලංකාගමණය | | | |
| | | | **14 වන පරිච්ඡේදය** | | | |
| 57 | 19 | | මහා මහින්ද හිමියන්ගේ අනුරාධපුරය ප්‍රවේශය. | | | |
| | | | **15 වන පරිච්ඡේදය** | | | |
| 59 | 5 | | මිහිඳු හිමියන් දහම් දෙසීම. | | | |
| 61 | 48 | | සිව් බුදුවරයන් මහමේනා උයනට වැඩිය කථාව | | | |
| 69 | 16 | | අනුරාධපුරයේ මහා සීමා බන්ධනය | | | |
| | | | **16 වන පරිච්ඡේදය** | | | |
| 72 | 18 | | චෛතියගිරි විහාර ප්‍රතිග්‍රහණය | | | |
| | | | **17 වන පරිච්ඡේදය** | | | |
| 73 | | | ධාතු ආගමන කථා | | | |
| | | | **18 වන පරිච්ඡේදය** | | | |
| 77 | | | මහා බෝ ශාඛා ග්‍රහණ දී කථා | | | |

*Non-Commercial Distribution*

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | රා.ව.මාස දවස |
|---|---|---|---|---|---|
| | | | **19 වන පරිච්ඡේදය** | | |
| 81 | 6 | | සිරිමහබෝ ලක්දිවට වැඩමවීමේ විස්තර කථා | | |
| | | | ධර්මාශෝක රජු විසින් මහබෝ රත්නට එවූ කුලයෝ | | |
| | | | **20 වන පරිච්ඡේදය** | | |
| 86 | 6 | | දෙවන පෑතිස් රජු කාලයාත්‍රා කිරීම | | |
| | | 8 | උත්තිය රජු රජවීම | 277 | 10 |
| 87 | 34 | | මිහිඳු මහරහතන් වහන්සේගේ පිරිනිවීම | | |
| | | | **21 වන පරිච්ඡේදය** | | |
| 89 | 1 | 9 | මහා සිව රජු රජවීම | 287 | 10 |
| 89 | 4 | 10 | සූරතිස්ස රජු රජවීම | 197 | 10 |
| 89 | 10 | 11 | සේනය - ගුත්තික යන දෙදෙනා | 307 | 22 |
| 89 | 12 | 12 | අසේල ගේ රාජ්‍ය කාලය | 329 | 10 |
| 89 | 14 | 13 | එළාර රජු රජවීම | 339 | 44 |
| | | | **22 වන පරිච්ඡේදය** | | |
| 91 | 1 | | දුටු ගැමුණු කුමරුගේ පිළිවෙළ කථාව | | |
| 93 | 38 | | දුටු ගැමුණු කුමරාගේ උත්පත්ති කථාව | | |
| 94 | 73 | | තිස්ස කුමරුගේ උත්පත්ති කථාව | | |
| | | | **23 වන පරිච්ඡේදය** | | |
| 98 | | | දශ මහා යෝධයන්ගේ පහළවීම පිළිබඳ කථා. | | |
| | | | **24 වන පරිච්ඡේදය** | | |
| 101 | 13 | | කාවස්තිස්ස රජුගේ නිධාන ප්‍රාප්තිය | | |
| 102 | | | දුටු ගැමුණු-තිස්ස දෙදෙනාගේ යුද්ධය | | |
| | | | **25 වන පරිච්ඡේදය** | | |
| 105 | 1 | | දුටු ගැමුණු දෙමළුන් හා යුද්ධයට නික්මීම. | | |
| 108 | 70 | | දුටු ගැමැණු රජුගේ විජයග්‍රහණය | | |
| | | | **26 වන පරිච්ඡේදය** | | |
| 111 | 1 | | දුටු ගැමුණු ලංකා රාජ්‍යය එක්සේසත් කිරීම | 383 | 24 |
| | | 14 | දුටු ගැමුණු රජුගේ රාජ්‍යාභිෂේකය | | |
| 111 | 5 | | ඵේප්‍රෙත්තාභය යෝධයාගේ පැවිදිවීම | | |
| 112 | | | මිරිස වැටි විහාරය කරවීම | | |
| | | | **27 වන පරිච්ඡේදය** | | |
| | | | මහ බෝ පුද | | |
| 114 | | | දුටුගැමුණු රජු සඳහා පෙර කියනලද වාක්‍ය ඇසීම. | | |
| 113 | | | ලෝවා මහාපාය පිහිටුවීම | | |


Non-Commercial Distribution

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | රා.ව.මාස | දවස |
|---|---|---|---|---|---|---|
| | | | **28 වන පරිච්ඡේදය** | | | |
| 116 | 1 | | මහා සෑය සඳහා උපකරණ සම්පාදනය | | | |
| | | | **29 වන පරිච්ඡේදය** | | | |
| 119 | 1 | | මහා සෑය කරවීමේ ආරම්භය | | | |
| 119 | 3 | | ථූපාරම්භයෙහි සැණකෙළිය පූජා | | | |
| | | | **30 වන පරිච්ඡේදය** | | | |
| 123 | 17 | | මහා සෑය කරවීම. | | | |
| 126 | 8 | | ධාතු ගර්භ රචනා විස්තරය | | | |
| | | | **31 වන පරිච්ඡේදය** | | | |
| 128 | 1 | | ධාතු නිධානෝත්සව විස්තර | | | |
| | | | **32 වන පරිච්ඡේදය** | | | |
| 135 | 1 | | දුටුගැමුණු රජුගේ නිධන ප්‍රාප්තිය | | | |
| | | | **33 වන පරිච්ඡේදය** | | | |
| 139 | 3 | | සාලිරාජකුමාරයාගේ ප්‍රවෘත්තිය | | | |
| 139 | 4 | 15 | සද්ධාතිස්ස රජුගේ රාජ්‍යාභිෂේකය | 407 | 18 | |
| | | | සද්ධාතිස්ස රජුගේ පින්කම් | | | |
| 139 | 18 | 16 | ථූලත්ථන රජුගේ රාජ්‍යාභිෂේකය | 425 | | 01 |
| 139 | 24 | 17 | ලජ්ජිතිස්ස රජුගේ අභිෂේකය | 425 | 9 | 08 |
| 140 | 24 | 18 | ඛල්ලාටනාග රජුගේ අභිෂේකය | 434 | 6 | |
| 140 | 24 | 19 | වළගම්බා රජුගේ පළමුවන අභිෂේකය | 440 | 5 | |
| 140 | 32 | 20 | පුල්ලහත්‍ථ | 441 | 3 | |
| | | | බාහිය | 444 | 2 | |
| | | | පණයමාර | 446 | 7 | |
| | | | පිළයමාර | 453 | - | 07 |
| | | | දාඨිය | 453 | 2 | |
| 142 | 80 | 21 | වළගම්බා රජුගේ දෙවන රාජ්‍යාභි ෂේකය | 455 | 12 | |
| | | | අභයගිරි තැනීම හා ත්‍රිපිටකය ලිවීම | | | |
| 144 | 1 | 22 | මහසිළු මහ තිස් | | | |
| | | | **34 වන පරිච්ඡේදය** | | | |
| 145 | | | මහසිළු මහ තිස් රජුගේ පින්කම් | 467 | 14 | |
| 145 | 18 | 23 | චෝරනාග රජුගේ රාජ්‍යය | 482 | 12 | |
| 145 | 25 | 24 | කුඩාතිස් රජුගේ රාජ්‍යය | 494 | 3 | |
| | | 25 | අනුලා බිසව යටතේ | | | |
| 145 | 30 | | සිව බලත් | 497 | 1 | 02 |
| 145 | 33 | | වටුක දෙමළ | 499 | 1 | 02 |
| 145 | 5 | | දර කැටි තිස් | 499 | 1 | 01 |
| | | | නිලිය බමුණා | 500 | 1 | 06 |

Non-Commercial Distribution

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | රා.ව. | මාස | දවස |
|---|---|---|---|---|---|---|---|
| 146 | 14 | | අනුලා බිසව | 501 | | 04 | |
| 146 | | 26 | මකලන් තිස් | 502 | 22 | | |
| | | | ඔහුගේ පින්කම් | | | | |
| 146 | | 27 | භාතිකාභය රජුගේ රාජයය | 524 | 28 | | |
| | | | ඔහුගේ පින්කම් | | | | |
| 147 | 9 | 28 | මහාදෘඨී මහා නාග | 552 | 12 | | |
| | | | ඔහුගේ පින්කම් | | | | |

## 35 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 150 | 1 | 29 | ආමන්ඩ ගාමිනී අභය | 564 | 9 | | |
| 150 | 9 | 30 | කර්ණ රාජනු තිස්ස | 573 | 3 | | |
| 150 | | 31 | චූලාභය තිස්ස | 576 | 1 | | |
| 150 | 15 | 32 | සීවලී කුමරිය | 577 | 04 | | |
| 150 | 14 | | රාජ්‍ය සූන්‍ය කාලය | 577 | 03 | | |
| 157 | 14 | 33 | ඉලනාග රජුගේ රාජ්‍ය කාලය | 580 | 06 | | |
| 152 | 49 | 34 | චණ්ඩමුඛසිව රජුගේ රාජ්‍යකාලය | 586 | 8 | | |
| 152 | 16 | 35 | යසලාලක තිස්ස | 594 | 7 | 8 | |
| 152 | 26 | 36 | සුභ නම් බලත් | 602 | 6 | | |
| 152 | 16 | 37 | වසභ (වැහැප්) | 608 | 44 | | |
| 155 | 112 | 38 | වංක නාසික තිස්ස | 652 | 3 | | |
| 155 | 116 | 39 | 1 වන ගජබා ගැමුණු | 656 | 22 | | |
| 155 | 123 | 40 | මහල්ලක නාග | 678 | 6 | | |

## 36 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 156 | 1 | 41 | දෙවන භාතිය තිස්ස රජ | 684 | 24 | | |
| 156 | 6 | 42 | කණිට්ඨතිස්ස | 708 | 28 | | |
| 156 | 18 | 43 | චූළ නාග | 736 | 2 | | |
| 156 | 21 | 44 | කුඩ්ඩනාග | 738 | 1 | | |
| 156 | 23 | 45 | පළමුවන සිරිනාග | 739 | 19 | | |
| 157 | 22 | 46 | වෝහාර තිස්ස | 757 | 22 | | |
| 157 | 43 | 47 | අභයනාග | 779 | 8 | | |
| 158 | 54 | 48 | දෙවෙනි සිරිනාග | 787 | 2 | | |
| 158 | 63 | 49 | විජය නොහොත් විජයිඳු | 789 | 1 | | |
| 158 | | 50 | 1 සංඝතිස්ස | 790 | 1 | | |
| 158 | 2 | 51 | දැහැමි සිරිසඟබෝ | 794 | 2 | | |
| 159 | 72 | 52 | ගෝඨාභය | 796 | 13 | | |
| 160 | | 53 | දෙටුතිස් රජු රාජ්‍යය | 809 | 10 | | |
| 161 | | 54 | මහසෙන් | 819 | 27 | | |
| | | | ඔහු විසින් මහා විහාරය නැසීම ආදී ප්‍රවෘත්ති. | | | | |

Non-Commercial Distribution

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | ක්‍රි.ව.මාස දවස |
|---|---|---|---|---|---|
| | | | **37 වන පරිච්ඡේදය** | | |
| 162 | 1 | 54 | මහසෙන් රජවීම | | |
| 165 | 53 | 55 | සිරිමෙවන් රජවීම | 845 | 301 |
| | | | ඔහු කළ නන් වැදෑරුම් පින්කම් | | |
| | | | දළදව ලක්දිවට ගෙන ඒම | 854 | 310 |
| 167 | 100 | 56 | 1. දෙටුතිස් රජවීම | 873 | 329 |
| 167 | 105 | 57 | බුද්ධදස රජවීම | 882 | 338 |
| | | | ඒ රජු කළ පුදුම පිළියම් | | |
| | | | කුෂ්ට රෝගියා පිළිබඳ පුවත | | |
| 171 | 179 | 58 | 1. උපතිස්ස රජවීම | 911 | 367 |
| | | | ඒ රජ කළ නොයෙක් පින්කම් | | |
| 173 | 210 | 59 | මහානාම රජවීම | 953 | 409 |
| | | | බුද්ධඝෝෂ පුවත | | |
| | | | අටුවා පාලි භාෂාවට නැගීම | | |
| | | | **38 වන පරිච්ඡේදය** | | |
| 175 | 1 | 60 | සොත්ථිසේන රජවීවම | 431 | 975 |
| 175 | 10 | 61 | ඡත්තගාහක රජවීම | 431 | 975 |
| 175 | 22 | 62 | මිත්තසේන රජවීම. | 976 | 432 |
| | | 63 | පඬු රජවීම | 977 | 433 |
| | | | ධාතුසේන කුමාර ප්‍රවෘත්ති | | |
| 176 | 29 | 64 | පාරින්ද රජවීම | 982 | 438 |
| 176 | | 65 | කුඩා පාරින්ද රජවීම | 985 | 411 |
| 176 | | 66 | තිරිතර රජවීම | | |
| 176 | | 67 | දඨිය රජවීම. | 1001 | 457 |
| 176 | | 68 | පිඨිය රජවීම. | 1001 | 460 |
| 176 | 35 | 69 | ධාතුසේන රජවීම | 1004 | 460 |
| | | | ඒ රජු දෙමළුන් සමග කල යුධ | | |
| | | | රජු පිළිබඳ ශෝකාකුල පුවත් | | |
| | | | **39 වන පරිච්ඡේදය** | | |
| 181 | 1 | 70 | 1. කාශ්‍යප රජවීම | 1022 | 478 |
| | | | කාශ්‍යප මුගලන් යුඩය. | | |
| 182 | 28 | 71 | 1. මුගලන් රජවීම | 1010 | 432 |
| | | | දඹදිවින් කේශධාතුව ගෙණ ඒම. | | |
| | | | **40 වන පරිච්ඡේදය** | | |
| 184 | 1 | 72 | කුමාර ධාතුසේන රජවීම. | 1058 | 513 |
| 184 | 4 | 73 | කිත්සෙන් රජවීම. | 1067 | 522 |
| 184 | 6 | 74 | සීව රජවීම | 1067 | 522 |
| 184 | 4 | 75 | 2. උපතිස්ස රජවීම. | 1068 | 524 |
| | | | සීලාකාල, කසුබ් යුඩය | | |

Non-Commercial Distribution

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | ක්‍රි.ව.මාස දවස |
|---|---|---|---|---|---|
| 183 | 44 | 76 | සීලාකාල රජවීම | 1070 | 524 |
| 183 | 45 | 77 | දඨාපභූති රජවීම | 1083 | 537 |
| 183 | 46 | | දඨාපභූති, මුගලන්, යුද්ධය. | | |
| 183 | 47 | 78 | 2. සුළු මුගලන් රජවීම. | 1084 | 537 |
| | | | 79 කීර්ති ශ්‍රී මේඝ | | |
| 183 | 49 | 80 | මහානාග රජවීම. | 1104 | 556 |

## 41 වන පරිච්ඡේදය

| | | | | | |
|---|---|---|---|---|---|
| 189 | 3 | 81 | 1. අග්බෝ රජවීම | 1107 | 568 |
| 189 | - | 82 | වෛතුල්‍යවාදීන් පැරදවීම | | |
| | | | 2. කුඩා අග්බෝ රජවීම. | 1141 | 601 |
| | | | කලිඟු රජු මෙහි පැමිණ පැවිදිවීම | | |

## 42 වන පරිච්ඡේදය

| | | | | | |
|---|---|---|---|---|---|
| 193 | 1 | 83 | 2. සංඝතිස්ස රජවීම. | 1151 | 611 |
| | | | 5 රජු සහ මුගලන් සෙනෙවි අතර යුද්ධය | | |
| 193 | 20 | 84 | දල මුගලන් රජවීම. | 1151 | 611 |
| | | | සඟතිස් රජුගේ ඇමතියා | | |
| 194 | 28 | 85 | අසිග්ගාහක ශිලාමේඝ රජවීම. | 1157 | 617 |
| | | 86 | 3. අග්බෝ රජවීම. | 1166 | |
| 195 | 73 | 87 | 2. දෙටුතිස් රජවීම. | 1167 | |
| 196 | 95 | 88 | 3. අග්බෝ නැවත රජවීම | 1168 | 626 |
| 198 | 118 | 89 | 1. දඨෝපතිස්ස රජවීම. | 1184 | |
| | | | රජුසහ කාශ්‍යප රට පෙලූ සැටි | | |

## 43 වන පරිච්ඡේදය

| | | | | | |
|---|---|---|---|---|---|
| 200 | 1 | 90 | 2. කසුප් රජවීම. | 1196 | 641 |
| 201 | 36 | 91 | 1. දප්පුල රජවීම. | 1208 | 650 |
| | | | දප්පුල රජුගේ සංඝ ගෞරවය. | | |
| 203 | 30 | 92 | 2 දඨෝපතිස්ස රජවීම | 1208 | 650 |

## 44 වන පරිච්ඡේදය

| | | | | | |
|---|---|---|---|---|---|
| 204 | 2 | 93 | අග්බෝ රජවීම | 1217 | 658 |
| 206 | 42 | 94 | දත්ත රාජ්‍යයෙහි පිහිටුවීම | 1233 | 674 |
| 206 | 45 | 95 | හත්‍ථදාඨ රාජ්‍යයෙහි පිහිටුවීම | 1235 | 676 |

## 45 වන පරිච්ඡේදය

මාණවම්ම දඹදිවට පලායාම.
මාණවම්ම නරසීහ රජුට පක්ෂව
සටන් කිරීම.
මාණවම්ම දඨෝපතිස්ස සටන

Non-Commercial Distribution

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | ක්‍රි.ව.මාස දවස |
|---|---|---|---|---|---|
| | | | මාණවම්ම නැවත දඹදිව් යාම | | |
| 210 | 62 | 96 | මාණවම්ම රජවීම. | 676 | 1235 |
| | | | **46 (48) වන පරිච්ඡේදය** | | |
| 211 | 66 | 97 | 5. අග්බෝ රජවීම. | 1270 | 711 |
| 212 | 20 | 98 | 20 කාශ්‍යප රජවීම. | 1270 | 717 |
| | | 99 | 1. මිහිඳු රජවීම | 1282 | 724 |
| 213 | 43 | 100 | 6. අග්‍රබෝධි සිලා මේඝ රජවීම | 1285 | 727 |
| 214 | 67 | 101 | 7. අග්බෝ රජවීම | 1325 | 766 |
| 217 | 120 | 102 | 2. මිහිඳු රජවීම | 1331 | 772 |
| | | | **49 වන පරිච්ඡේදය** | | |
| 220 | 1 | 103 | 2. දප්පුල රජවීම | 1351 | 792 |
| 222 | 39 | 104 | 3. ශිලාමේඝ රජවීම | 1356 | 797 |
| 222 | 44 | 105 | 8. අග්බෝ රජවීම | 1360 | 801 |
| | | | ඒ රජු මවුට කළ උපස්ථාන | | |
| 223 | 66 | 106 | 3. දප්පුල රජවීම | 1372 | 812 |
| 224 | 84 | 107 | 9. අග්‍රබෝධි රජවීම | 1388 | 828 |
| | | | **50 වන පරිච්ඡේදය** | | |
| 225 | 2 | 108 | 1. සේන රජවීම | 1391 | 831 |
| | | | පඬිරජ රට පෙළන්නට වීම | | |
| | | | සේන රජු කළ පින්කම් | | |
| | | | **51 වන පරිච්ඡේදය** | | |
| 230 | 2 | 109 | 2. සේන රජවීම | 1411 | 851 |
| | | | යුද පිණිස දඹදිවට සේනා යැවීම | | |
| 234 | 73 | 110 | 1. උදය රජවීම | 1446 | 885 |
| | | | **52 වන පරිච්ඡේදය** | | |
| 238 | 2 | 111 | 4. කාශ්‍යප රජවීම | 1457 | 896 |
| | | | ඒ රජු විසින් කළ ශාසන ශුද්ධිය | | |
| 239 | 37 | 112 | 5. කාශ්‍යප රජවීම | 1446 | 913 |
| | | | **53 වන පරිච්ඡේදය** | | |
| 242 | 1 | 113 | 3. දප්පුල රජවීම | 1484 | 923 |
| 242 | 4 | 114 | 4. දප්පුල රජවීම | 1484 | 923 |
| 242 | 10 | 115 | 2. උදය රජවීම | 1496 | 934 |
| 243 | 28 | 116 | 3. සේන රජවීම | 1499 | 937 |
| 243 | 38 | 117 | 3. උදය රජවීම | 1508 | 945 |
| | | | **54 වන පරිච්ඡේදය** | | |
| 245 | 1 | 118 | 4. සේන රජවීම | 1516 | 953 |
| 245 | 7 | 49 | 3. මිහිඳු රජවීම | 1519 | 956 |
| 247 | 63 | 120 | 4. සේන රජවීම | 1535 | 972 |

Non-Commercial Distribution

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | ර.ව. මාස දවස |
|---|---|---|---|---|---|
| | | | **55 වන පරිච්ඡේදය** | | |
| 249 | 1 | 121 | 4 මිහිඳු රජවීම | 1545 | 981 |
| | | 122 | 12 සතුරු වියවුල් නිසා රට අරාජික වීම | | |
| | | | **56 වන පරිච්ඡේදය** | | |
| | | | 1 වික්‍රමබා රජවීම | 1581 | 1029 |
| 251 | 7 | 123 | 7 කීර්ති රජවීම | 1593 | 1041 |
| 251 | 7 | 124 | 8 මහාලාන කීර්ති රජවීම | 1596 | 1041 |
| 251 | 10 | 125 | 11 වික්‍රම් පණ්ඩි රජවීම | 1593 | 1044 |
| 251 | 13 | 126 | 13 ජගත්පාල රජවීම | 2597 | 1047 |
| 251 | 15 | 127 | 16 පරාක්‍රම පණ්ඩු රජවීම | 1601 | 1051 |
| | | | **57 වන පරිච්ඡේදය** | | |
| 252 | 2 | 128 | 2 ලොකේශ්වර රජවීම | 1603 | 1052 |
| 255 | 78 | 129 | 31 විජයබාහු රට එක්සත් කොට රජවීම | 1609 | 1059 |
| | | | **58 වන පරිච්ඡේදය** | | |
| 256 | | | 1. වියබාහු සොළීන් සමග කළ යඬ පොළොන්නරුවේ සටන් වලින් සොළීන් පැරදවීම | | |
| | | | **59 වන පරිච්ඡේදය** | | |
| 259 | | | 1. විජයබාහු රජුගේ ඥාති සංග්‍රහ | | |
| | | | **60 වන පරිච්ඡේදය** | | |
| 262 | | | රාමඤ්ඤ රටින් උපසම්පදාව ගෙණ ඒම රටේ ශාසනයේ ද දියුණුවට වැඩ කිරීම. | | |
| | | | **61 වන පරිච්ඡේදය** | | |
| 267 | 5 | 130 | 1 ජයබා රජවීම | 1114 | 1659 |
| 269 | 54 | 131 | 1. වික්‍රමබාහු රජවීම මාණාභාරණාදීහු රට ගැනීම සටන් කිරීම | 1116 | 1661 |
| | | | **62 වන පරිච්ඡේදය** | | |
| 271 | | | පරාක්‍රමබාහු කුමාරුගේ ළදරුකාලය | | |

Non-Commercial Distribution

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | ක්‍රි.ව. | මාස | දවස |
|---|---|---|---|---|---|---|---|
| | | | **63 වන පරිච්ඡේදය** | | | | |
| 276 | 35 | 132 | 1 ගජබාහු රජවීම<br>38 පරාක්‍රමබාහු කුමරුගේ<br>තරුණ කාලය | | | | |
| | | | **64 වන පරිච්ඡේදය** | | | | |
| 278 | | | පරාක්‍රමබාහු කුමරුගේ උසස් සිතුවිලි | | | | |
| | | | **65 වන පරිච්ඡේදය** | | | | |
| 281 | | | පරාක්‍රමබාහු කුමරු සෙනෙවියා මැරීම | | | | |
| | | | **66 වන පරිච්ඡේදය** | | | | |
| 284 | | | පරාක්‍රමබාහු කුමරු පළායාම<br>පරාක්‍රමබාහු කුමරු ගජබා රජු කරා යාම | | | | |
| | | | **67 වන පරිච්ඡේදය** | | | | |
| | | | පරාක්‍රමබාහු රුහුණ බලා පිටත්වීම | | | | |
| 295 | 133 | | 1. පරාක්‍රමබාහු රුහුණේ රජවීම | | | | |
| | | | **68 වන පරිච්ඡේදය** | | | | |
| 297 | | | 7 පරාක්‍රමබාහු ගොවිතැන දියුණු කිරීම | | | | |
| | | | **69 වන පරිච්ඡේදය** | | | | |
| 300 | | | 6 පරාක්‍රමබාහු සේනා බලය වැඩි කිරීම | | | | |
| | | | **70 වන පරිච්ඡේදය** | | | | |
| 302 | | | 1. පරාක්‍රමබාහු ගජබා රජු සමග කළ සටන්<br>සටන් නැවැත්වීම | | | | |
| | | | **71 වන පරිච්ඡේදය** | | | | |
| 318 | | | 2. මාණාභරණ, පරාක්‍රමබාහු සමග සටන ඒම | | | | |
| | | | **72 වන පරිච්ඡේදය** | | | | |
| 320 | | | පරාක්‍රමබාහු 2. මාණාභරණ සමග කළ සටන්<br>රට එක්සත් කළ 1. පරාක්‍රමබාහු රජවීම | 1703 | 1153 | | |

*Non-Commercial Distribution*

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | ක්‍රි.ව. | මාස | දවස |
|---|---|---|---|---|---|---|---|
| | | | **73 වන පරිච්ඡේදය** | | | | |
| 336 | | | 1. පරාක්‍රමබාහු රටෙත් ශාසනයෙත් දියුණුවට කළ වැඩ | | | | |
| | | | පොළොන්නරුව කරවීම | | | | |
| | | | **74 වන පරිච්ඡේදය** | | | | |
| 344 | | | සුගලා බිසව සටනට ඒම | | | | |
| | | | රට ඇතුළේ වියවුල් | | | | |
| | | | 199 පොළොන්නරුවෙහි දළදා මැදුරක් කරවීම | | | | |
| | | | **75 වන පරිච්ඡේදය** | | | | |
| 355 | | | රුහුණේ සටන් | | | | |
| | | | 1. පරාක්‍රමබාහු රුහුණ ජයගැනීම | | | | |
| | | | **76 වන පරිච්ඡේදය** | | | | |
| 365 | | | අරමණ රටට යුද පිණිස සේනා යැවීම | | | | |
| | | | කුලශෙකර රජු සමග කළ සටන් | | | | |
| | | | **77 වන පරිච්ඡේදය** | | | | |
| 371 | | | පඬිරට නිරවුල් කිරීම | | | | |
| | | | **78 වන පරිච්ඡේදය** | | | | |
| 386 | | | භික්ෂූන් සමගි කොට කරවූ ශාසන ශුද්ධිය | | | | |
| | | | විහාර, ආරාම කරවීම | | | | |
| | | | **79 වන පරිච්ඡේදය** | | | | |
| 392 | | | උයන්. පොකුණ කරවීම | | | | |
| | | | **80 වන පරිච්ඡේදය** | | | | |
| 396 | 1 | 134 | 2 විජයබාහු රජවීම | 1736 | 1186 | | |
| 396 | 16 | 135 | 6 මිහිඳු රජවීම | 1737 | 1187 | | |
| 396 | 18 | 136 | කීර්ති නිශ්ශංක රජවීම | 1737 | 1887 | | |
| 397 | 26 | 137 | 1 වීරබාහු රජවීම | 1747 | 1196 | | |
| 397 | 28 | 138 | 11 වික්‍රමබාහු රජවීම | | | | |
| 397 | 29 | 139 | චොඩ ගංග රජ වීම | 1747 | 1196 | | |
| 397 | 31 | 140 | ලීලාවතී | | | | |
| | | 141 | සාහස මල්ල රජ වීම | 1751 | 1200 | | |
| 397 | 33 | 142 | කල්‍යාණවතී | 1753 | 1202 | | |
| 397 | 41 | 143 | ධර්මාශෝක රජ වීම | 1759 | 1208 | | |
| 397 | 43 | 144 | අණිකංග රජ වීම | 1760 | 1209 | | |

*Non-Commercial Distribution*

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. | ක්‍රි.ව. | මාස | දවස |
|---|---|---|---|---|---|---|---|
| 397 | 44 | 145 | ලීලාවතී (2. වර) රජ වීම | 1760 | 1209 | | |
| 397 | 47 | 146 | ලෝකේශ්වර රජ වීම | 1761 | 1210 | | |
| 398 | 49 | 148 | ලීලාවතී (3. වර) රජ වීම | 1762 | 1211 | | |
| 399 | 53 | 149 | පරාක්‍රම පඬි රජ වීම | 1763 | 1211 | | |
| | | | මාඝ රජ විම | 1896 | 1214 | | |

### 81 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 400 | 10 | 150 | 3 විජයබා රජ වීම | 1787 | 1232 | | |
| | | | 9 දළඳ පුද පැවැත්වීම | | | | |

### 82 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 404 | 1 | 151 | 2. පරාක්‍රමබාහු රජවීම | 1796 | 1236 | | |
| | | | 9 දළඳ පුද පැවැත්වීම | | | | |

### 83 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 407 | | | ඒ රජ රටේ වියවුල් සංසිඳවීම. | | | | |
| | | | යුද පිණිස පැමිණි චන්ද්‍රාභානු පැරදවීම. | 1801 | 1246 | | |

### 84 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 410 | | | 2. පරාක්‍රමබාහු රජු රටේ ද ශාසනයේද දියුණුවට කළ වැඩ | | | | |

### 85 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 412 | | | 2 පරාක්‍රමබාහු රජු වෙහෙර විහාර කරවීම | | | | |

### 86 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 418 | | | දේවප්‍රතිරාජ ඇමති ලවා වෙහෙර විහාර කරවීම. | | | | |
| | | | ශ්‍රීපාදස්ථානය සකස් කරවීම. | | | | |

### 87 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 421 | | | 2. පරාක්‍රමබාහු රජු පුත්‍රයන්ට දුන් අවවාද | | | | |
| | | | මහා සඞ්ගයා විජයබා කුමරුන් වණ්ණා කිරීම. | | | | |

### 88 වන පරිච්ඡේදය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 426 | | 152 | 4 විජයබාහු විසින් රජවීම | | 1829 | | |
| | | | අභිෂේක උත්සවයක් පැවැත්වීම. | | | | |
| | | | චන්ද්‍රභානු පැරදවීම | | | | |
| | | | පොළොන්නරුව ගොඩ නැගීම. | | | | |

*Non-Commercial Distribution*

| පිටුව | පෙළ | රජ | ප්‍රවෘත්තිය | බු.ව. ක්‍රි.ව.මාස දවස |
|---|---|---|---|---|
| | | | **89 වන පරිච්ඡේදය** | |
| 431 | 9 | | 4. වන විජයබාහු සිය පියා පොළොන්නරුවට කැඳවා අභිෂේක උත්සවය පැවැත්වීම | |
| | | | දළ දා පා දා තැන්පත් කිරීමේ පුණ්‍යොත්සවය | |
| | | | දහම්කොට උපසම්පද කර්මය | |
| | | | **90 වන පරිච්ඡේදය** | |
| 435 | 14 | 152 | සිව්වන විජයබාහු රාජ්‍ය පදප්‍රාප්තිය | 1829 |
| | 30 | 153 | පළමුවන බුවනෙකබාහු රාජ්‍යාභිෂේකය | 1831 |
| | 48 | 154 | තුන්වන පරාක්‍රමබාහු රාජ්‍යාභිෂේකය | 1842 |
| | 56 | 155 | වත්හිමි බුවනෙකබාහු රාජ්‍යාභිෂේකය | 1847 |
| | 76 | 156 | සිව්වන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍යාභිෂේකය | 1849 |
| | 87 | 157 | වන්නි බුවනකෙබාහු රාජ්‍යාභිෂේකය | රාජ්‍ය වර්ෂය දක්වා නැත |
| | 105 | 158 | ජයබාහු රජුගේ රාජ්‍යප්‍රාප්තිය | රාජ්‍ය වර්ෂය දක්වා නැත |
| 440 | 108 | 159 | සතරවන බුවනෙකබාහු රජුගේ රාජ්‍යප්‍රාප්තිය | 1890 |
| | | | **91 වන පරිච්ඡේදය** | |
| 441 | | 160 | පස්වන පරාක්‍රමබාහු රාජ්‍යප්‍රාප්තිය | 1894 |
| | | 161 | තුන්වන වික්‍රමබාහු රජයට පැමිණීම | රාජ්‍ය වර්ෂ නොදක්වන ලදී |
| | | 162 | පස්වෙනි බුවනෙකබාහු ප්‍රභුරාජ | |
| | | 163 | දෙවෙනි වීරබාහු රජුගේ රාජ්‍යය | |
| 442 | | 164 | සවෙනි ශ්‍රී පරාක්‍රමබාහු රජුගේ රාජ්‍යාභිෂේකය | 1953 |
| | | | **92 වන පරිච්ඡේදය** | |
| | | | ජයබාහු රජ පටන් සත්වෙනි රජ ප්‍රවෘත්ති | |
| 443 | 1 | 165 | දෙවෙනි ජයබාහු රජ රාජ්‍යශ්‍රීයට පැමිණීම | 2005 |
| | | 166 | සවෙනි බුවනෙකබා රජුගේ රාජ්‍යප්‍රාප්තිය | 2007 |
| | | 167 | සත්වෙනි පරාක්‍රමබාහු රාජ්‍යප්‍රාප්තිය | 2014 |
| | | 168 | අටවැනි පරාක්‍රමබාහු රාජ්‍යප්‍රාප්තිය | රාජ්‍යවර්‍ෂ දක්වා නැත. |
| | | 169 | පස්වැනි විජයබාහු රාජ්‍යප්‍රාප්තිය | රාජ්‍යවර්‍ෂ දක්වා නැත. |
| | | 170 | සත්වෙනි බුවෙනකබාහු රාජ්‍යප්‍රාප්තිය (මේ රජවරුන්ට එක් සැත්තෑහවුරුද්දක් අතීතාන්ත) | රාජ්‍යවර්‍ෂ දක්වා නැත. |
| 444 | | 171 | වීර වික්‍රම රජුගේ රාජ්‍ය ප්‍රාප්තිය | 2085 |
| | | | **93 වන පරිච්ඡේදය** | |
| 445 | | 172 | මායාදුනු රජුගේ රාජ්‍යය | 2124 |
| | | 173 | සීතාවක රාජ්‍යසිංහ රජුගේ රාජ්‍යය | |

*Non-Commercial Distribution*

| පිටුව | පෙළ රජ | ප්‍රවෘත්තිය | බු.ව. ක්‍රි.ව.මාස දවස |
|---|---|---|---|
| | | සම්බුද්ධ ශාසනය විනාශ කිරීම (මේ රජවරුන්ට පනස්වසක් ගතවූහ) | |
| | | **94 වන පරිච්ඡේදය** | |
| 446 | 174 | පළමුවන විමලධම්සූර්ය රාජ්‍යාභිෂේකය දළදා මන්දිරය කරවීම. | 2135 |
| | | **95 වන පරිච්ඡේදය** | |
| 48 | 175 | සෙනරත් රජුගේ රාජ්‍ය පදප්‍රාප්තිය | 2163 |
| | | **96 වන පරිච්ඡේදය** | |
| 450 | 176 | දෙවෙනි රාජසිංහ රජුගේ රාජපදප්‍රාප්තිය | 2170 |
| | | **97 වන පරිච්ඡේදය** | |
| 453 | 177 | දෙවන විමලධම් සූර්ය රජු රජවීම | 2222 |
| | 178 | ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍යපදප්‍රාප්තිය | 2444 |
| | | **98 වන පරිච්ඡේදය** | |
| 457 | 179 | ශ්‍රී විජය රාජසිංහ රාජ්‍ය පදප්‍රාප්තිය | 2277 |
| | | **99 වන පරිච්ඡේදය** | |
| 462 | 180 | කීර්ති ශ්‍රී රාජසිංහ ප්‍රදප්‍රාප්තිය | 2290 |
| | | **100 වන පරිච්ඡේදය** | |
| 471 | | ශ්‍යාමදේශයෙන් භික්ෂූන් වැඩමවීමට රාජදූතයන් යැවීමාදී ආගමික කටයුතු | |
| | | **101 වන පරිච්ඡේදය** | |
| 485 | 181 | ශ්‍රී රාජාධිරාජසිංහ මහරජුගේ රාජාභිෂේකය | 2323 |
| | 182 | ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ රාජ්‍යප්‍රාප්තිය | 2341 |
| | | එම රජුගේ පරතෙර ප්‍රාප්තිය | 2359 |

*Non-Commercial Distribution*

# උප ග්‍රන්ථය

## ප්‍රතිකාල් ආණ්ඩුකාරවරු

1. පේද්‍රු ලෝපෙස් ද සූසා
2. ජැරෝම් ද අසවේදෝ
3. ප්‍රැන්සිස්කෝද මැන්සස්
4. මානුවෙල් හෝමස් මස්කරිඤැඤැස්
5. නුඤ්ඤා අල්වාරස් පෙරේරා
6. කොන්ස්තන් තීනු ද සා නාරඤ්ඤැ
7. ජෝර්ජ් ද අල්බුක්රැක්
8. කොනස්තන් තීනු ද සා මස්කරිඤ්ඤැස්
9. දොන් ජෝර්ජ් ද අල්මේදා
10. දියෝගු ද මේලෝ
11. අන්තෝනියෝ මස්කරිඤැඤැස්
12. පිලිප්පේ මස් කරිඤ්ඤැස්
13. මානුවෙල් මස්කරිඤ්ඤැ හෝමන්
14. ප්‍රැන්සිස්කෝද මේලෝ ද කස්ත්‍රෝ
15. අන්තෝනියෝ ද සූසා කොන්තිඤෙත්‍රා.
16. අන්තෝනියෝ ද මේර්ෂල් මැන්සෙස්

## ලන්දේසි ආණ්ඩුකාරවරු

| | වාසය නගරය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|---|
| 1. වෙල්ලැම් ජකො බේසන් කොස්තර් | ගාල්ල | 1640 | 03 | |
| 2. ජාන් නැසිස් | ගාල්ල | 1640 | 08 | |
| 3. ජෝඅන් මත්සුයකර් | ගාල්ල | 1646 | 05 | |
| 4. යාකොබ්ෆින් කැතැන්ස් තැයින් | ගාල්ල | 1650 | 02 | |

Non-Commercial Distribution


| | | | |
|---|---|---|---|
| 5. අද්‍රියන් ෆන්දර් මැයිදන් | කොළඹ | 1653 | 10 |
| 6. රෙක්ලොෆ් පත් හුන්ස් | කොළඹ | 1660 | 05 |
| 7 යාකොබ් හුස්කර් | කොළඹ | 1663 | 12 |
| 8. ලෝරන්ස් ෆැන්ෆැයිල් | කොළඹ | 1680 | 12 |
| රෙක්ලොෆ් ෆන් හුන්ස් (දෙවෙනිවර) | කොළඹ | 1664 | 11 |
| 9. තෝමස් පන්රේ | කොළඹ | 1690 | 01 |
| 10. පවුලස් ද රූ | කොළඹ | 1695 | 01 |
| 11. හැරන්ද ෂේර් | කොළඹ | 1697 | 02 |
| 12. මන්ත්‍රී සභිකයෝ | | 1702 | 11 |
| 13. මෙස්තර් කොර්නේලියස් ජොහැන්නස් සීමොන්ස් | | 1703 | 5 |
| 14. හැන්දෙක් බැකර් | කොළඹ | 1707 | 12 |
| 15. මෙස්තර් අයිසෙක් අගොස්තීන් රම්ප් | කොළඹ | 1716 | 12 |
| 16. ආනෝල්ඩ් මෝල්ඩ් | කොළඹ | 1723 | 6 |
| 17. ජොහානස් හාර්ටැම්බර්ග් | කොළඹ | 1724 | 1 |
| 18. ජාන් පවුලස් ස්කාගන් | ගාල්ල | 1725 | 8 |
| 19. පේත්‍රුස් පොයිස්ක් | කොළඹ | 1726 | 9 |
| 20. ස්තීපත්‍රුස් පැර්සොලයිස් | කොළඹ | 1729 | 9 |
| 21. හල්තේරස් වවුතර | යාපනය | 1732 | 9 |
| 22. යාකොබ් ක්‍රිස්තියන් සිලූත් | කොළඹ | 1732 | 12 |
| 23. දිදෙක් පන් දොම්බැරක් | කොළඹ | 1734 | 1 |
| 24. ජාන් මක්කර් | ගාල්ල | 1736 | 6 |
| 25. ගෙස්තස් වෙලම්බරොන් පන්දුන් හොප් | කොළඹ | 1736 | 7 |
| 26. වෙලම් බ්‍රෑනින්ක් | කොළඹ | 1740 | 3 |
| 27. දානියෙල් ඕවබ්රේක් | කොළඹ | 1742 | 1 |
| 28. ජුලියස් පලත්තයින් හෝල්නැස් | කොළඹ | 1743 | 5 |
| 29. යාකොබ්ද ජොන්ක් | යාපනය | 1751 | 2 |
| 30. හැරන් ෆන් ප්‍රිලන්ඩ් | කොළඹ | 1751 | 3 |
| 31. ජොවාන් ගිඩියන් ලෝතන් | කොළඹ | 1752 | 9 |
| 32. ජාන් ස්කෙදූර් | කොළඹ | 1753 | 3 |
| 33. ලොබාන් ජාන් බරොන් පන් ඇත් | කොළඹ | 1762 | 11 |
| 34. අන්තෝනි මොයාර්න් | යාපනය | 1765 | 5 |
| 35. ඊමන් විල්ලැම් ප්ලෑක් | කොළඹ | 1765 | 9 |
| 36 විල්ලෑම් යාකොබ් පන්ද ග්‍රාප් | කොළඹ | 1785 | 2 |
| 37. ජොවාන් ගැරාර්ක් පන්එන්ගල් බෑක් | | 1794 | |

Non-Commercial Distribution

# බ්‍රිතාන්‍ය යුගයේ ආණ්ඩුකාරවරු

| | | |
|---|---|---|
| 1. | ෆ්‍රෙඩ්‍රික් නෝර්ත් | 1798-1812 |
| 2. | සර් රොබර්ට් බ්‍රවුන්රිග් | 1812-1820 |
| 3. | සර් එඩ්වර්ඩ් බාන්ස් | 1820-1822 |
| 4. | සර් ජේම්ස් කැමල් | 1823-1824 |
| 5. | සර් එඩ්වර්ඩ් බාන්ස් | 1824-1831 |
| 6. | සර් රොබට් විල්මට් හෝර්ටන් | 1831-1837 |
| 7. | සර් ජේම්ස් ඇලෙක්සැන්ඩර් ස්ටුවර්ට් මැකැන්සි | 1837-1841 |
| 8. | සර් කොලින් කැමල් | 1841-1847 |
| 9. | වෛයි කවුන්ට් ටොරින්ටන් | 1847-1850 |
| 10. | සර් ජෝජ් ඇන්ඩර්සන් | 1850-1855 |
| 11. | සර් හෙන්රි ජෝර්ජ් වෝඩ් | 1855-1860 |
| 12. | සර් චාර්ල්ස් ජස්ටින් මැකාර්ති | 1860-1863 |
| 13. | සර් හර්කිවුලස් ජෝර්ජ් රොබින්සන් | 1865-1872 |
| 14. | සර් විලියම් හෙන්රි ග්‍රැගරි | 1872-1877 |
| 15. | සර් ජේම්ස් රොබට් ලෙඩෙන් | 1877-1883 |
| 16. | සර් ආතර් හැමිල්ටන් ගෝඩන් | 1883-1890 |
| 17. | සර් ආතර් ඇලිබෑන්ක් හැව්ලොක් | 1890-1895 |
| 18. | සර් ජෝසප් වෙස්ට් රිජ්වේ | 1896-1903 |
| 19. | සර් හෙන්රි ආතර් බ්ලේක් | 1903-1907 |
| 20. | සර් හෙන්රි මැකලම් | 1907-1912 |
| 21. | සර් රොබට් චාමර්ස් | 1913-1916 |
| 22. | සර් ජෝන් ඇන්ඩර්සන් | 1916-1918 |
| 23. | සර් විලියම් හෙන්රි-මැනිං | 1918-1925 |
| 24. | සර් හියු චාල්ස් ක්ලිපඩ් | 1925-1927 |
| 25. | සර් ජේම්ස් හර්බට් ස්ටැන්ලි | 1927-1931 |
| 26. | සර් ග්‍රීම් තොම්සන් | 1931-1933 |
| 27. | සර් එඩ්වඩ් ස්ටබ්ස් | 1933-1937 |
| 28. | සර් ඇන්ඩෘෘ කොල්ඩ්කොට් | 1937-1944 |
| 29. | සර් හෙන්රි මන්ස්මේසන් මුවර් | 1944-1949 |
| 30. | සෝල්බරිසාමි අග්‍රාණ්ඩුකාරතුමා | 1949-1954 |

*Non-Commercial Distribution*



මහා පරාක්‍රමබාහු රජතුමා

Non-Commercial Distribution

නමෝ තසස භගවතෝ අරහතෝ සමමා සම්බුදධසස

# මහා වංශය

## සිංහල

### පළමුවෙනි පරිච්ඡේදය

1 ශුද්ධවංශයෙහි උපන් (සකල ක්ලේශයන් කෙරෙන්) අත්‍යන්ත
2 පාරිශුද්ධ වූ සර්වඥයන් වැඳ නොඅඩු නොයෙක් පරිච්ඡේද ඇත්තා වූ
මහාවංශය කථනය කරන්නෙමි. මේ වංශතෙම පුරාතනයන් විසින්
3 කරණ ලද්දේ නමුත් කිසි තැනෙක්ම ඉතා විස්තර කරන ලද්දේ ය.
නොයෙක් පුනරුක්ත දෝෂ ඇත්තේ ය. ඒ දොසින් තොර කරණ
ලද්දා වූ (හෙයින්ම) සුවසේ ග්‍රහණධාරණ කට හැකි වූ ප්‍රසාදසංවේග
4 ජනක වූ පරම්පරායාත වූ ද ඒ මහා වංශය (කථනය කරන්නෙමි
සජ්ජනයෙනි තෙපි) ප්‍රසාද උපදවන්නා වූ තන්හි එසේම සංවේග
ජනක තන්හිද පහන් සිත් හා භයකම්පා උපදවමින් ශ්‍රවණය කරව්.

5 මහාවීර වූ අපගේ සර්වඥතෙම පූර්වයෙහි දීපංකර නම් වූ
සම්බුදුන් දැක ලෝකයා දුකින් මුදනු සඳහා සම්‍යක්සම්බෝධිය පිණිස
6 ප්‍රාර්ථනා කළ සේක. ඉක්බිත්තෙන් එම සම්බුදුන් හා කොණ්ඩඤ්ඤ
7 නම් බුදුන් ද මංගල නම් බුදුන් ද, සුමන නම් බුදුන් ද, රේවත නම්
බුදුන්ද, සෝභිත නම් බුදුන් ද, අනෝම දස්සි නම් බුදුන් ද, පදුම නම්
බුදුන් ද, නාරද නම් බුදුන් ද, පදුමුත්තර නම් බුදුන් ද, සුමේධ නම්
බුදුන් ද, සුජාත නම් බුදුන් ද, පියදස්සි නම් බුදුන් ද, අත්ථදස්සි නම්
බුදුන් ද, ධම්ම දස්සි නම් බුදුන් ද, සිද්ධත්ත නම් බුදුන් ද, තිස්ස නම්
8 බුදුන් ද, එසේම ඵුස්ස නම් බුදුන් ද, විපස්සි නම් බුදුන් ද, සිඛී නම්
9 බුදුන් ද, වෙස්සභූ නම් බුදුන් ද, කකුසන්ධ නම් බුදුන් ද, කෝණාගමන
10 නම් බුදුන් ද, කාශ්‍යප නම් බුදුන් ද, යන සූවිසි සම්‍යක් සම්බුද්ධයන්
11 ආරාධනා කොට උන්වහන්සේලා විසින් සියලු (''සමත්‍රිංශත්)
12 පාරමිතාවන් පුරා උතුම් වූ සම්‍යක් සම්බෝධියට පැමිණ උතුම් ගෞතම
නමින් බුදුව සත්වයන් දුකින් මුදන්නේ ය''යි සම්‍යක් සම්බෝධිය
පිණිස ප්‍රකාශ කරණ ලද්දේ ය. ඒ මහාමුනි තෙමේ මගධරට උරුවෙල්
13 දනව්වෙහි බෝ මුලදී වෙසඟපුර පසළොස්වක්හි උත්තම වූ
සම්බෝධියට පැමිණියේ ය. ඒ සර්වඥවසී තෙම උතුම් වූ විමුක්ති සුඛය
වින්දේ ඒ මධුරභාවය ද දක්වන්නේ සත් සතියක් මුළුල්ලෙහි වාසය
14 කළ සේක. ඉක්බිත්තෙන් බරණැසට වැඩ ධර්ම චක්‍රය පැවැත් වූ

Non-Commercial Distribution

15 සේක. එහි වස් වසනසේක්ම සැට නමක් රහත් කළ සේක.
සර්වඥතෙමෙ ධර්ම දේශනා කරණු පිණිස ඒ භික්ෂූන් යවා
ඉක්බිත්තෙන් (ඔවුනොවුන්) යහළු වූ භද්‍රවර්ගික රජදරුවන් තිස්
16 දෙනෙක් (සෝවාන් පලාදිය දීමෙන්) හික්මවා කාශ්‍යපාදී ජටිලයන්
දහස දමනය කරණු පිණිස ඔවුන් නුවණ මුහුකරවමින් හේමන්ත
කාලයෙහි උරුවෙල් දනව්වෙහි වාසය කළ සේක.

17 ශත්‍රැමර්දනය කරණශීලී වූ සර්වඥතෙම උරුවෙල් කසුප්
නම් ජටිලයාගේ මහා යාගය එළඹ සිටි කල්හි තමන් නොඊමෙහි
18 වූ ඔහුගේ ඉච්ඡා වාරය දැන උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය
ගෙණවුත් අනවතප්ත නම් විල සමීපයෙහි දී වළඳා තෙමේ සවස්
19 වේලෙහි සම්‍යක් සම්බෝධියෙන් නව වන මස දුරුතු පුර
20 පසළොස්වක්හි ලංකාද්වීපය ශුද්ධ කරණු පිණිස ලක්දිවට පැමිණි
සේක. සර්වඥයන් වහන්සේ විසින් ලංකා තොමෝ සසුන් බබලන
තැනෙකැයි ද යකුන් විසින් පිරුණු ලක්දිව යක්ෂයන් බැහැර කටයුතු
21 යයි ද දන්නා ලදී. ලංකාද්වීපයෙහි මනෝරම්‍ය වූ ගං ඉවුරෙහි තුන්
22 යොදුන් දිගු එක් යොදුන් පුළුල් වූ රම්‍ය වූ මහා නාග වන නම්
උයනෙහි යක්ෂයාගේ යුද්ධ භූමියෙහි ලක්දිව් වැසි යකුන්ගේ මහා
නිසාචර සමාගමය ප්‍රසිද්ධ විය.

23 ඒ මහා යක්ෂ සමාගමයට පැමිණි සර්වඥතෙම එහි සමාගම
24 මැද ඔවුන්ගේ හිස්මතුයෙහි මහියංගනය ථූපයාගේ ස්ථානයෙහි
25 අහස්කුස වැඩ සිටි සේක්. ඔවුන්ට භය ජනක වූ වර්ෂාවාතාන්ධ-
කාරාදිය මැවූ සේක. බියෙන් පෙළුනා වූ ඒ යක්ෂයෝ නිර්භය වූ
26 තථාගතයන් වහන්සේ ගෙන් අභය ඉල් වූහ. අභයදායී වූ තථාගතයන්
වහන්සේ ඉතා භයින් පීඩිත වූ ඒ යකුන්ට මෙසේ වදාළ සේක.
27 "යක්ෂයෙනි, තොපගේ මේ භය හා දුක් මම පහ කරන්නෙමි. තොපි
සමගිව මෙතන්හි මට හිඳිනා තැනක් දෙන්නහුද ?
28 නොමදෙන්නහුද ?" "නිදුකානෙනි, නුඹ වහන්සේට මේ සියලුම
ලක්දිව දෙම්හ. අපට අභය දුන මැනවැ"යි ඒ සියලුම යක්ෂයෝ
29 තථාගයන් වහන්සේට කිවූය. ඔවුන්ගේ බියද ශීතද අන්ධකාරය ද
නසා ඒ දුන් භූමියෙහි පත්කඩ අතුට එහි වැඩ හුන් සර්වඥතෙම
30 එතැනින් ඒ පත්කඩ ගිනි ගෙන දිලියෙන්නක් කොට හාත්පසින්
විශාල කළ සේක. ග්‍රීෂ්මයෙන් පීඩිත වූ ඒ යක්ෂයෝ බියපත්ව
(ලක්දිව) අන්තයෙහි හාත්පසින් සිටියෝ ය. ඉක්බිත්තෙන් සර්වඥයන්
31 වහන්සේ ඔවුන්ට රම්‍ය වූ ගිරිදිවයින් මෙහි ළඟා කළ සේක. උන්
එහි වත් කල තිබුන තන්හි තැබූ සේක. සර්වඥතෙම ඒ පත්කඩ හැකුළු
සේක. (එකල්හි දෙවියෝ සර්වඥයන් වහන්සේ කරා පැමිණියෝ

Non-Commercial Distribution

32 ය. ඒ සමාගමෙහි ශාස්තෘන් වහන්සේ ඔවුන්ට ධර්ම දේශනා කළ
සේක. නොයෙක් කෙළ ගණන් සත්ත්වයන්ට සෝවාන් ඵලාදියෙන්
ධර්මාවබෝධ වූයේ ය. සංඛ්‍යාපථාතීත සත්ත්වයෝ තිසරණ පන්සිල්
පිහිටියෝ ය.

33

සමන්තකූට පර්වත වාසී වූ මහා සුමන නම් දෙව් රජතෙම සෝවාන්
34 පලයට පැමිණ පූජාර්හ වූ සර්වඥයන් වහන්සේගෙන් පූජනීය වූ කිසිවක්
35 ඉල්ලීය. සත්ත්වයන් කෙරෙහි හිත වූ නීල නිර්මල කේශවත් වූ සර්වඥතෙම
හිස පිරිමැද කේශයන් අත් ලක් පමණ ප්‍රදානය කළ සේක. ඉක්බිත්තෙන්
36 හෙතෙම එය ස්වර්ණමය වූ උතුම් කරඬුවකින් ගත්තේ සර්වඥයන් වහන්සේ
වැඩහුන් තැන්හි කරන ලද්දා වූ අයම්විතරින් සත් රියන් වූ අවටින් එක්
37 විසි රියන් නන් වැදෑරුම් රුවන් රැසෙහි තබා හෙතෙම ඉන්ද්‍ර නීලමය
38 වූ ථූපයකින් වසා නමස්කාර කෙළේ ය. (නැවත) "සර්වඥයක් වහන්සේ
පිරිනිවි කල්හි ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ගේ ශිෂ්‍ය වූ මහත් සෘද්ධි
ඇති සරභූ නම් ස්ථවිර තෙම දර සෑයෙන් සර්වඥග්‍රීවාස්ථිධාතුව සෑයෙන්
39 රැගෙණ (මෙහි) ගෙණවුත් එම චෛත්‍යයෙහි තබා භික්ෂූන් විසින්
පිරිවරණ ලද්දේ මෙදෝවර්ණ පාෂාණයෙන් වස්වා දොළොස් රියන් උස
දා ගැබක් කරවා වැඩි සේක."

40

41 දෙවනපෑතිස් මහරජාණන් සහෝදර උද්ධ චූළාභය නම්
කුමාරතෙම අද්භූත වූ ඒ චෛත්‍යය දැක වස්වා තිස් රියන් උස් වූ
42 චෛත්‍යයක් කරවී ය. එහි සිට දෙමළුන් මඩනා දුටුගැමුණු රජතෙම
ඊට අසූ රියන් කඤ්චුක චෛත්‍යයක් කරවීය. ඒ මේ මහියංගන
43 ථූපයතෙම මෙසේ පිහිටියේ ය. [1] නිර්විකාර ප්‍රඥාසම්පන්න මහත් වීර
පරාක්‍රම ඇති ධර්මයට ඊශ්වර වූ සර්වඥයන් වහන්සේ මෙසේ මේ ද්වීපය
මනුෂ්‍යයන්ට යෝග්‍ය කොට උරුවෙල් දනව්වට වැඩි සේක.
<u>මහියංගනාගමන කථා නිමි</u>.

44

පස්මරුන් දිනූ මහත් කරුණා ඇත්තා වූ සියලු ලෝ වැස්සන්ගේ
45 වැඩෙහි ඇලුනා වූ ශාස්තෘ වූ සර්වඥයක් වහන්සේ සම්‍යක් සම්බෝධියෙන්
පස් වෙනි වස ජේතවනවිහාරයෙහි වැඩ වසන සේක්, මහෝදර නාගය
46 එසේම චූලෝදර නාගය යන පිරිස් සහිත වූ නාගයන්ගේ මිණිපළඟ
47 හේතු කොට එළඹ සිටියා වූ යුද්ධය දැක, බක්මස අමාවක් පොහෝ දින
48 උදය කාලයෙහි ම උතුම් වූ පාසිවුරු ගෙණ නාගයන්ට අනුකම්පා
පිණිස නාගදීපයට වැඩි සේක. එකල්හි මහත් සෘද්ධි ඇති ඒ මහෝදර
49 නම් නාග තෙමේ මුහුද පන් සියයක් යොදුන් අයම් නාග භවනයෙහි

---

1. සර්වඥයන් වහන්සේ මහියංගනයට වැඩියා වූ කථා වස්තුව හා එහි පසුව දාගැබ
පිහිටි ප්‍රවෘත්තිය ගළපන ලදී.

Non-Commercial Distribution

රජ වී. උහුගේ නැගණි තොමෝ කන්වඩමන් නම් පව්වෙහි නා රජහට
50 දෙන ලද්දී ය. උහුගේ පුත්‍ර තෙම චූළෝදර නම්. උහුගේ මෑණියන් පිය
51 වූ නා රජතෙම උතුම් වූ මිණිපළඟ මෑණියන්ට දී කාල ක්‍රියා කෙළේ ය.
52 එසේ හෙයින් මයිල් නාරජු හා බෑණනුවන්ගේ යුද්ධය තෙම එළඹ සිටියේ
ය. පර්වත වාසී වූ ද ඒ නාගයෝ මහත් සෘද්ධිමත් වූහ, සමිද්ධි සුමන නම්
53 දෙව් තෙමේ ද ජේතවනයෙහි පිහිටි තමන් යහපත් භවනය වූ කිරිපලුරුක
54 බුද්ධානුමතියෙන්ම ගෙණ ඡත්‍රාකාරයෙන් සර්වඥයන් මත්තෙහි දරන්නේ
ඒ පෙර විසූ ස්ථානයට ආයේ ය. ඒ දෙවිතෙම අනතුරු බැවෙහි
55 නාගදීපයෙහි මනුෂ්‍යයෙක් විය, හෙතෙම කිරිපලුරුක පිහිටි තන්හි
බොජුන් වළඳන පසේ බුදුවරයන් දුටුයේ ය. ඒ දැක සිත් පැහැද පාත්‍රයන්
56 ශුද්ධ කිරීමෙහි ශාඛාවන් උන්වහන්සේලාට දුන්නේ ය. ඒ කර්මයෙන්
හෙතෙම මනෝඥ වූ ජේතවනයෙහි දොරටුකොටු පස ඒ රුකෙහි උපන.
57 හෙතෙම පසුව ඉන් පිටවූයේ ය. දේවාති දේව වූ සර්වඥතෙම ඒ
58 දෙවියාගේ අභිවෘද්ධිය ද බලා හිත පිණිස ඒ දෙවියා ද වෘක්ෂය ද මෙහි
පැමිණ වූ සේක. මෝහාන්ධකාර නසන්නා වූ සර්වඥ තෙම එහි යුද්ධ
මධ්‍යයෙහි අහස වැඩ හුන්නේ ය. ඒ නාගයන්ට භය එලවන්නා වූ
59 අන්ධකාරයක් මවා පෑ සේක. (සර්වඥයන් වහන්සේ) බියෙන් පෙළුන ඒ
60 (නයින්) අස්වසන් නේ ආලෝකයක් පැතිර වූ සේක. සර්වඥයන් දැක
සතුටු වූ ඒ නාගයෝ සර්වඥයන් වහන්සේගේ පා වැන්දෝය. පස්
මරුන් දිනූ සර්වඥ තෙම සමගි කරන්නා වූ ධර්මයන් ඔවුන්ට දේශනා
61 කළ සේක. සතුටු වූ ඒ දෙදෙන ම මිණිපළඟ සර්වඥයන් වහන්සේට
62 ප්‍රදානය කළහ. ලෝකනායක වූ ශාස්තෘ තෙම එහි බැස අස්නෙහි
වැඩ හිඳ, ඒ නාග රාජයන් විසින් දිව්‍යාහාරපානයෙන් සතපන ලත්
63 සේක් දිය වැසි වූ ද ගොඩ වැසි වූ ද අසූ කෙළක් නයින් තුන් සරණයෙහි
ද සීලයෙහි ද පිහිට වූ සේක. මහෝදර නම් නාගයාගේ මයිල් වූ මණි
අක්ඛික නම් වූ කැලණියෙහි නා රජ තෙම යුධ කරණු පිණිස එහි
64 ගියේය. සර්වඥයන් පළමු මෙහි වැඩි කල සද්ධර්ම දේශනාව අසා
සරණ සීලයෙහි පිහිටියේ එහි දී (මෙසේ) තථාගතයන් වහන්සේට
65 ආයාචනා කරන්නේ, "ස්වාමීන් වහන්ස ! මේ තෙමේ නුඹ වහන්සේ
66 විසින් අපට කරණ ලද මහත් වූ අනුකම්පාවෙක, නුඹ වහන්සේ මෙහි
නොපැමිණිසේක් නම් අපි සියල්ලෝ අලුවම්හ. පුණ්‍යෝදය ඇත්තා වූ
67 තථාගතයන් වහන්සේ, මා කෙරෙහි ද වෙන් වශයෙන් නුඹ වහන්සේගේ
කරුණාව වේවා නැවත මෙහි ආගමනයෙන් මාගේ වාස භූමියට වඩිනා
68 සේක්වා" යි කීයේය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම් භාවයෙන් මෙහි
ආගමනය ඉවසා රාජායතන චෛත්‍යය එහිම පිහිට වූ සේක. ලෝක
69 ස්වාමී තෙම ඒ කිරිපලු රුක ද මහරු මිණි පළඟ ද නමස්කාර කරණු
පිණිස නා රජුන්ට ප්‍රදානය කළ සේක. "නාග රාජයෙනි ! මාගේ

Non-Commercial Distribution

70 පරිභෝග චෛත්‍යය වඳිවු, නාගයෙනි ! එය තොපට වැඩ පිණිස ද සැප පිණිස ද වන්නේය" යන මේ ආදි වූ අනුශාසනා නාගයන්ට වදාරා ලෝකානුකම්පාකාරී වූ සර්වඥයන් වහන්සේ ජේතවනයට ම වැඩිසේක.

**නාගදීපාගමනය නිමි.**

71

එයින් තුන් වෙනි වර්ෂයෙහි ඒ මණිඅක්ඛික නම් නාග රාජ තෙම
72 එළඹ සංඝයා සහිත තථාගතයන් වහන්සේට නිමන්ත්‍රණය කෙළේය.
සර්වඥතෙම සම්‍යක්සම්බෝධියෙන් අට වෙනි වර්ෂයෙහි ජේතවනයෙහි
73 වාසය කරණ සේක් ලෝක ස්වාමී වූ පස්මරුන් දිනූ මුනීශ්වර තෙමේ
භික්ෂූන් පන් සියයක් විසින් පිරිවරණ ලද්දේ දෙවෙනි දවස භක්ත
74 කාලය ආරෝචනා කළ සිවුර පොරවා පාත්‍රය (ශ්‍රී හස්තයෙන් ගෙණ ඒ
කැළණි දෙස වූ මණිඅක්ඛික (නාරජහු) නිවෙසට වැඩි සේක. කැලණි
75 සෑය පිහිටි තන්හි කරණ ලද රත්න මණ්ඩපයෙහි සංඝයා ද මාහැඟි වූ
76 පළඟෙහි තමන් වහන්සේ ද වැඩහුන් සේක. සමූහය සමඟ වූ නා රජ
77 තෙමේ සොම්නස් වූයේ දිව්‍ය වූ ඛාද්‍යාදි භෝදයෙන් සංඝයා සහිත වූ
සර්වඥයන් සන්තර්පණය කෙළේය. ලෝකානුකම්පා ඇත්තා වූ ලෝක
නායක වූ සර්වඥ තෙම එතන්හි ධර්ම දේශනා කොට අහසට නැගි (වැඩ)
78 සමන්කුළු මතුයෙහි පා සටහන දැක්වූ සේක. සංඝයා සහිත වූ සේක් ඒ
පර්වත පාදයෙහි සැපසේ දිවා විහරණය කොට දිගාවැවට වැඩි සේක.
79 ලෝකස්වාමී තෙම සංඝයා සමඟ වූ සේක් එහි චෛත්‍ය ස්ථානයෙහි
80 වැඩ හිඳ ස්ථානය ගෞරවයට පැමිණීම පිණිස සමාධියට සමවන් සේක.
81 ස්ථානා ස්ථාන දැන්මෙහි ප්‍රවීණ වූ මහා මුනි තෙමේ එතැනින් නැඟිට
මහ මෙවුනා උයන පිහිටි තැනට වැඩි සේක. ශ්‍රාවක සංඝයා සහිත වූ
ලෝකස්වාමී තෙම මහ බෝ පිහිටි තන්හිද එසේම (සමාධිය) අර්පණය
කළ සේක. එසේම ථූපාරාමයෙහි දාගැබ පිහිටි තන් (සමාධියට සම
82 වන් සේක) ඉක්බිත්තෙන් සමාධියෙන් නැගිට ශෛල චෛත්‍යය පිහිටි
83 තැනට වැඩ ගණාධිපති වූ අවබෝධ කළ සර්වාර්ථ ඇති සර්වඥතෙම
සමග ආවා වූ දේව සමූහයයන්ට අනුශාසනා කොට එතැනින් දෙව්රම්
වෙහෙරට වැඩි සේක. මෙසේ ඉතා මහත් දයා ඇත්තා වූ ලෝකයට
84 ප්‍රදීපයක් බඳු වූ ප්‍රමාණ රහිත ප්‍රඥා ඇති ලෝකස්වාමී තෙම ලංකාවාසී
ජනයාගේ අනාගතාර්ථය බලමින් එකල්හි ලංකාවෙහි වූ දේව නාග
සමූහාදීන්ගේ වැඩ ද දක්වමින් මේ යහපත් දිවයිනට තුන් වරක් වැඩි
සේක. ඒ කරණ කොට ගෙණ මේ ද්වීපය ධර්ම නමැති පහනින් බැබළුම්
ඇත්තා වූ සජ්ජනයන් විසින් බුහුමන් කරණ ලද්දේය.

**කල්‍යාණාගමණ නිමි.**

මෙතෙකින් හුදීජනයා පහන් සංවේග පිණිස කළ මහාවංශ තථාගතාභිගමන නම් වූ පළමු වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# දෙ වෙනි පරිච්ඡේදය

1 මහා මුනි නම් වූ සර්වඥ තෙම මහා සම්මත රජහුගේ වංශයෙහි
2 උපන්, කල්පාරම්භයෙහි මහා සම්මත නම් නරේන්ද්‍රයෙක් වූයේය.
3 රොජය, වරරොජය, එසේම කල්‍යාණ නම් ඇත්තා වූ (කල්‍යාණය,
වරකල්‍යාණය යන) දෙදෙනෙක, උපොසථය, මන්ධාතුය, චරය, උපචරය
යන දෙදෙනෙක, චේතියය, මුචලය, මහා මුචල නමැත්තේය, මුචලින්දය,
4 සගරය, සාගර දේව නමැත්තේ ය, භරතය, භාගිරථය, රුචිය, සුරුචිය,
ප්‍රතාපය, මහා ප්‍රතාපය, එසේම පණද නම් වූ (පණාදය, මහා පණාදය
5 යන) දෙදෙනෙක, එසේම සුදර්ශනනෙරු නමැත්තා වූ (සුදර්ශනය,
මහාසුදර්ශනය, නෙරුය, මහානෙරුය, යන ) පශ්චිම වූ දෙදෙන දෙදෙන
6 යයි මහා සම්මත රජුහුගේ දරු මුනුබුරු රජ දරුවෝ වූහ, අසංඛ්‍යයුෂ්ක
7 වූ මේ අට විසි මිහිපල්හු කුසා වතිය, රජගහය, මියුළුය යන පුරයන්හි
8 විසූහ. ඉක්බිත්තෙන් ඒ රජුන්ගේ පරම්පරානුගත වූ රජ දරුවන් සියයක්
ද, සපණ ක් ද, සැට දෙනෙක් ද, අසූ සාර දහසක් ද, ඉන් මෑත වූ
9 සතිස් දෙනෙක් ද, දෙතිස් දෙනෙක් ද, අට විසි දෙනෙක් ද, ඉන් මෑත
වූ දෙවිසි දෙනෙක් ද, අටළොසෙක, සතළොසෙක, පසළොසෙක,
10 තුදුසෙක, නව දෙනෙක, සත් දෙනෙක, දොළසෙක, ඉන් අන්‍ය වූ පස්
විස්සෙක, යළිත් පස් විස්සෙක, දොළසෙක නැවතත් දොළෙසක, නව
11 දෙනෙක, මඛාදේවාදී අසූ සාර දහසෙක, කලාර ජනකාදි අසූ සාර
12 දහසෙක, ඔක්කාක රජහු දක්වා සොළසෙක මේ මුනුබුරු රජහු රාශි
වශයෙන් වෙන් වෙන් පුරයෙහි කැමති පරිද්දෙන් රාජ්‍යානුශාසනා කළහ.
ඔක්කාක රජහුගේ දෙටු පුත් වූ උක්කාමුඛ නම් රජෙක් විය. නිපුරය,
13 චන්දිමන්තුය, චන්ද්‍රමුඛය, සිරි සංජයය, වෙස්සන්තර මහරජය, චාමිය,
සිංහ වාහනය, ස්වරය යන මොහු ඔහුගේ දරු මුනුබුරෝ ය. සිංහ
14 ස්වර රජහු දරු මුනුබුරු රජුන් දෙයාසූ දහසෙක, ඔවුන් ගේ අන්තිම
15 රජ ජයසේන නම් විය. මොව්හු කිඹුල්වත් පුරයෙහි ශාක්‍ය රජහු යයි
16 ප්‍රසිද්ධ වූහ. සිංහහනු නම් මහ රජ තෙම ජයසේන රජහුගේ පුත්‍ර වූයේ
17 ය, ජයසේන රජහුගේ දියණි තොමෝත් යසෝධරා නම් විය. උහුගේ
අංජන නම් කුමාරයෙක, නම් වූ මිහිපතියෙක් විය, උහුගේ අංජන නම්
කුමාරයෙක, යළිත් කච්චානා නම් වූ කුමාරියෙකැයි දරු දෙදෙනෙක්
වූහ. ඒ කච්චානා කුමාරිකා තොමෝ සිංහහනු නම් රජහුගේ මෙහෙසි
18 විය, ඒ යසෝධාරා නම් කුමාරිකා තොමෝ අංජන නම් ශාක්‍ය රජහුගේ
මෙහෙසී විය. අංජන නම් ශාක්‍ය රජහුගේ මායා ය. ප්‍රජාපති යයි දූන්
20 දෙදෙනක් වූහ. දණ්ඩපාණිශාක්‍ය ය, සුප්‍රබුද්ධ ශාක්‍ය යයි පුත්‍රයන්
දෙනෙක් ද වූහ. සිංහහනු නම් ශාක්‍ය රජහට වනාහි පුත්‍රයෝ පස්
21 දෙනෙක් ද, දූන් දෙදෙනෙක් ද, වූහ. සුද්ධෝදනය, ධෝතොදනය,

Non-Commercial Distribution

සුක්කෝදනය, අමිතෝදනය[1] යයි මේ පංච පුත්‍රයෝ ය. අමිතාය,
22 ප්‍රමිතා යයි මේ දියණි දෙදෙනා ය. අමිතා තොමෝ සුප්‍රබුඬ නම්
ශාක්‍ය රජ හට මෙහෙසිය විය. ඒ මෙහෙසියට භද්දකච්චානය, දෙවදත්ත
23 යයි දරු දෙදෙනෙක් වූහ. මායාය, ප්‍රජාපතී යයි සුඬෝදන රජහුගේ
මෙහෙසී දෙදෙනෙක් වූහ. සුද්ධෝදන මහ රජහට දා ඒ බිසවගේ පුත්‍ර
තෙම ඒ සර්වඥ වූයේ ය. මහා මුනි වූ සර්වඥ තෙම සියලු ක්ෂත්‍රියයන්ගේ
මුදුන් වූ ආවාහ විවාහාදියෙන් අසම්භින්නව මෙසේ පැවැති මහා සම්මත
වංශයෙහි අන්තිම ජාතියෙහි උපන් සේක.

24 බෝධිසත්ව වූ සිඬාර්ථ නම් කුමාරයාහට භද්දකච්චානා නම්
කුමාරිකා තොමෝ මෙහෙසි විය. ඒ මෙහෙසියගේ පුත්‍ර තෙම රාහුල
25 නම් වූයේ ය. බිම්බිසාර කුමාර තෙමේ ද සිඬාර්ථ කුමාර තෙමේ ද
යහලු වූහ. ඒ දෙදෙනාගේ පිය රජහු දෙදෙනම යහලුම වූහ.
බෝධිසත්ත්ව තෙම බිම්බිසාර රජහට පස් අවුරුද්දක් වැඩි වයස් ඇත්තේ
26 විය. වයසින් එකුන් තිස් හවුරුදු වූ බෝධි සත්ව තෙම (බුඬත්වය
පිණිස) අභිනිෂ්ක්‍රමණය කෙළේ ය. සයඅවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට
27 ක්‍රමයෙන් සම්‍යක් සම්බෝධියට පැමිණ, ඉක්බිත්තෙන් වයසින් පන්
28 තිස් හවුරුදු ඇති වූ සේක් බිම්බිසාර රජාණන් කරා පැමිණි සේක.
ඉක්බිත්තෙන් මහා පැණැති බිම්බිසාර රජ තෙම පසළොස් හවුරුදු
වයස් ඇත්තේ සිය පියහු විසින් අභිෂේක කරණ ලද්දේ රාජ්‍යයට පත්
විය. සොළොස් වෙනි වස පැමිණි කල්හි ශාස්තෘ වූ සර්වඥ තෙම ඕහට
29 ධර්ම දේශනා කළ සේක. හෙතෙම වනාහි දෙ පනස් හවුරුද්දක්ම රජ
30 කරවිය. ඕ හට සර්වඥයන් වහන්සේ පැමිණෙන්නට පළමු රාජ්‍යයෙහි
හවුරුදු පසළොසක් වූහ. තථාගතයන් වහන්සේ ජීවමාන කාලයෙහි
31 සත් තිස් හවුරුද්දක් වූහ. බිම්බිසාර රජුහු පුත්‍ර දුර්මති වූ මහා මිත්‍ර ද්‍රෝහි
අජාතශත්‍රු කුමාර තෙම ඒ බිම්බිසාර රජහු මරවා දෙතිස් හවුරුද්දක්
32 රාජ්‍යය කර වූයේය. අජාසත් රජහට අට වෙනි වර්ෂයෙහි තථාගතයන්
වහන්සේ පිරිනිවී සේක. පරිනිර්වාණයෙන් පසු හෙතෙම සූවිසි හවුරුද්දක්
33 රජ කරවිය. සියල් ගුණයෙන් අග බැව් පැමිණි ක්ලේශයන්ට වසඟ
නුවූ තථාගත තෙම මරණවසප්‍රාප්ත වූ සේක. මෙසේ මේ ලෝකයෙහි
යමෙක් තෙම භය උපදවන්නා වූ අනිත්‍යතාව (නුවණින්) දක්කේ ද
හෙතෙම දුඃඛයාගේ පරතෙර පැමිණියේ යි. මෙතෙකින් හුදී ජනයා
ප්‍රසාද සංවේග පිණිස කළ මහවස මහා සම්මත නම් වූ දෙවෙනි අදියර
නිමි.

1. එක් පුත්‍රයෙකුගේ නම ගථායෙහි නොකියන ලදී.

Non-Commercial Distribution

# තුන් වෙනි පරිච්ඡේදය

1 පසැස් ඇත්තා වූ අතුල්‍ය වූ සර්වඥයන් වහන්සේ පන් සාලිස්
වසක් ජීවත් වෙමින්, ලෝකයාට (හිත වූ) සියලු කෘත්‍යයන් සර්වප්‍රකාරයෙන්
2 කළ සේක්, කුසිනාරා නුවර යමක සාලයන්ගේ අතර වූ උත්තම
ස්ථානයෙහි දී වෙසක් මස පුර පසළොස්වක් දවස්හි, ලෝකයාගේ ඒ
3 ප්‍රදීපය තෙම නිවී ගියේ ය. (පිරිනිවන් පෑ සේකි) ගණන පථාතික්‍රාන්ත
වූ භික්ෂූහු එහි රැස් වූහ. එසේම ක්ෂත්‍රියයෝ ද, බ්‍රාහ්මණයෝ ද,
වෛශ්‍යයෝ ද, ශූද්‍රයෝ ද, දෙවියෝ ද, රැස් වූහ. ඒ භික්ෂූන් අතුරෙන්
4 සත් ලක්ෂයක් ප්‍රධාන භික්ෂූහු වූහ. එකල්හි මහාකාශ්‍යප ස්ථවිරයන්
වහන්සේ ම සංඝ ස්ථවිර සේක. ශාස්තෘන් වහන්සේ ගේ ශරීර
5 සම්බන්ධීත වූ ශාරීරික ධාතු කෘත්‍යයන් කරවා ඒ මහා ස්ථවිර තෙමේ
6 ධර්ම නමැති ශාස්තෘන්ගේ චිරස්ථිතිය ප්‍රාර්ථනා කරණ සේක්, ලෝක
ස්වාමී වූ සර්වඥයන් පිරි නිවී සත්වන දවස්හි සුභද්‍ර නම් මහලු පැවිද්දහු
7 විසින් කියන ලද දුර්භාෂිත වචනය මෙනෙහි කරමින්, (පාංශුකූල) චීවර
දානය ද තමන් වහන්සේ හා සම බැව්හි තැබීම ද සද්ධර්මය පිහිටුවන
පිණිස සර්වඥයන් වහන්සේ විසින් කරණ ලද අනුග්‍රහය ද සිහි කරන
8 සේක් : ධර්ම සංගායනා කරුණු පිණිස, බුදුන් විසින් අනු දන්නා ලද්දා
වූ නවාංග ශාස්තෘශාසනධාරී වූ සර්වාංගයෙන් උප ලක්ෂිත වූ මහ
9 රහත් වූ සංයත භික්ෂූන් ම ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගේ
කාරණයෙන් එක් නමක් අඩු වූ පන් සියයක් සම්මත කළ සේක. නැවත
10 ඒ ආනන්ද ස්ථවිරයන් හැර සංගාය නාව කරණු නොහැකි යයි භික්ෂූන්
11 විසින් විශේෂයෙන් යාච්ඤා කරණ ලද්දේ ආනන්ද ස්ථවිරයන් ද සම්මත
කළ සේක. සාධු ක්‍රීඩා සත් දවසය, ධාතු පූජා සත් දවසය යන අර්ධ
12 මාසය ගෙවා සියලු ලොවට අනුකම්පා කාරී වූ ඒ ස්ථවිරයෝ "රජගහ
නුවර වස් වෙසෙමින් ධර්ම සංගායනාව කරම් හ. අන්‍යයන් විසින් එහි
නොවිසිය යුතුය"යි නිශ්චය කොට; ඒ ඒ තැන ශෝකයෙන් ආතුර වූ
13 මහා ජනයා අස්වසමින් ජම්බුද්වීපයෙහි චාරිකා කෙරෙමින් හැසිර කුශල
14 පක්ෂය පිහිටීම පතන්නාහු ඇසළ මස ශුක්ල පක්ෂයෙහි සමෘධ වූ
සිවුපස ඇති රජගහ නුවරට එළඹියාහුය. එහි ම වස් එළඹියා වූ ස්ථිර
15 ගුණයෙන් යුක්ත වූ සර්වඥ මතයෙහි දක්ෂ වූ ඒ මහා කාශ්‍යපාදී
ස්ථවිරයෝ තුමු අජාසත් රජහට කියා වර්ෂා මාසයන් අතුරෙන් පළමු
16 වෙනි මාසයෙහි රජගහ නුවර සියලු ම සෙනසුන්හි පිළිසකර කර වූහ.
වෙහෙර පිළිසකර කම් නිමි කල්හි "දැන් අපි ධර්ම සංගායනා කරම්හ"
17 යි රජහට වදාළහ. (ම විසින්) "කටයුතු කුමකැ"යි පිළිවිසි රජහට
18 හිඳිනා තැනක් (කටයුතු) යයි දැන් වූහ. ඒ රජ තෙමේ "කොතැන්හි ද"
යි විචාරා උන්වහන්සේලා විසින් වදාළ ස්ථානය වූ වෙභාර පර්වත

Non-Commercial Distribution

පාර්ශවයෙහි සප්ත පර්ණ ගුහා ද්වාරයෙහි රම්‍ය වූ දේව සභාව හා
19 සමාන වූ මණ්ඩපයක් වහා කරවූයේය. ඒ රජ තෙමේ එය සර්ව
ප්‍රකාරයෙන් සරසවා එහි භික්ෂූන් ගණනින් ම අනර්ඝ වූ ඇතිරිළි ඇතිර
20 වූයේය. එහි දක්ෂිණ භාගය නිසා උත්තර දිශාභිමුඛ කොට මාහැඟි වූ
උතුම් ථේරාසනයක් මොනවට පණවන ලද්දේ විය. ඒ මණ්ඩප
21 මධ්‍යයෙහි පෙරදිග අභිමුඛ කොට සර්වඥයන් වහන්සේට සුදුසු වූ
22 උතුම් ධර්මාසනයක් මොනවට පණවන ලද්දේ වූයේය. රජ තෙම"අපේ
කටයුතු නිමියේය"යි ස්ථවිරයන් වහන්සේලාට දැන්වූයේ ය.

23 ඒ ස්ථවිර තුමු ආනන්ද ජනක වූ ආනන්ද ස්ථවිරයන්
24 වහන්සේට "එම්බා ආනන්දය, සෙට දවස රැස්වීමය. එහි ශෛක්ෂ වූ
තොප විසින් ගමන නොහොබන්නේය. එහෙයින් යුෂ්මත් තෙමේ
25 ස්වාර්ථයෙහි ප්‍රමාද රහිතවේව"යි වදාළෝ. මෙසේ මෙහෙයන ලද්දා
26 වූ ආනන්ද ස්ථවිර තෙම වීර්‍ය්‍ය සම කොට (චතුර්විධ) ඊර්‍ය්‍යා පථයෙන්
වෙන්ව රහත් බැව් පත් වූ සේක. ඒ ස්ථවිරයෝ තුමූ වර්ෂා මාසයන්
27 අතුරෙන් දෙවෙනි මස දෙවෙනි දවස් හි සිත්කලු වූ ඒ මණ්ඩපයෙහි රැ
ස්වූහ. රහතන් වහන්සේලා ආනන්ද ස්ථවිරයන් වහන්සේට සුදුසු වූ
අස්නක් තබා සුදුසු පරිද්දෙන් අසුන්හි වැඩ උන්හ. ඒ ආනන්ද ස්ථවිර
28 තෙමේ අර්හත්ඵලාප්‍රාප්තිය හඟවනු කැමැත්තේ උන් වහන්සේලා සමග
නොම වැඩි සේක. "ආනන්ද ස්ථවිර තෙමේ කොතැන්හිදැ" යි කිසි
කෙනෙකුන් විසින් කියනු ලබන කල්හි, උන් වහන්සේ පොළොව කිමිද
29 හෝ අහසින් අවුත් හෝ තමහට තබන ලද අස්නෙහි වැඩ උන් සේක,
30 ධුරන්ධර වූ සියලු ස්ථවිරයෝ තුමූ විනයෙහි උපාලි ස්ථවිරයන් වහන්සේ
ද, අවශේෂ වූ සියලු ම ධර්මයෙහි ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද,
31 ප්‍රධාන කළහ. (කාශ්‍යප නම් වූ) මහා ස්ථවිර තෙම තමන් වහන්සේ ම
විනය විචාරනු පිණිස තමන් සම්මත කළ සේක. උපාලි ස්ථවිර තෙමේ
32 ද විසඳනු පිණිස තමන් ම සම්මත කළ සේක. ඒ මහා කාශ්‍යප ස්ථවිර
තෙම ථේරාසනයෙහි වැඩ හිඳ ඒ උපාලි ස්ථවිරයන් විනය විචාළ සේක.
ඒ උපාලි ස්ථවිර තෙම ධර්මාසනයෙහි වැඩ හිඳ එය ම විසඳූ සේක.

33 ක්‍රම දක්ෂ වූ ඒ සියල්ලෝ ම විනයඥයන් අතුරෙන් අග්‍ර උපාලි
ස්ථවිරයන් වහන්සේ විසින් විසඳූ ක්‍රමයෙන් විනය සජ්ඣායනා කළහ.
34 ඒ මහා කාශ්‍යප ස්ථවිර තෙම තමන් වහන්සේ සම්මත කොට ගෙණ,
බහුශ්‍රැතාදීන් අතුරෙන් අග්‍ර වූ සර්වඥයන් වහන්සේගේ ධර්ම
35 භාණ්ඩාගාරාරක්ෂාකාරී (ආනන්ද ස්ථවිරයන්) ධර්මය විචාළ සේක.
ආනන්ද ස්ථවිර තෙම එපරිද්දෙන් තමන් වහන්සේ ම තමන් සම්මත
36 කළ සේක් ධර්මාසනා ගත ව ඒ ධර්මය නිරවශේෂ කොට විසඳූ සේක.

Non-Commercial Distribution

ධර්මාර්ථයෙහි දක්ෂ වූ ඒ සියලු ස්ථවිරයෝ තුමූ වෛදෙහ මුනි වූ ඒ ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් විසඳූ ක්‍රමයෙන් ධර්මය සජ්ඣායනා කළහ. මෙසේ සියලු ලෝකයාට හිත වූ රහතන් වහන්සේලා විසින්
38 සියලු ලෝකයාගේ වැඩ පිණිස සත් මසින් ඒ ධම්ම සංගීති තොමෝ නිමවන ලද්දී ය. මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් මේ බුද්ධ
39 ශාසනය පන් දහසක් හවුරුදු පැවැත් මෙහි පොහොසත් කරණ ලද්දේ යයි ධර්ම සංගායනාව ශාසනයෙහි පෘථිවි සන්ධාරක ජලය අවසන් වූ
40 මහා පෘථිවි තොමෝ ඉතා ම හටගත් ප්‍රමෝද්‍ය ඇත්තියක් සේ සවරක් කම්පිත විය. ලෝකයෙහි නොයෙක් පරිද්දෙන් නොයෙක් ආශ්චර්‍යයෝ
41 ද වූ ද, මේ පරම්පරා තොමෝ ස්ථවිරයන් විසින් කරණ ලද හෙයින් ථේරිය නම් වේ. ඒ සියලු ම ස්ථවිරයෝ තුමූ ප්‍රථම සංගීතිය හා බොහෝ සියලු ලෙව් වැඩ ද කොට ආයු ඇති තෙක් වැඩ සිට පිරිණිවියෝ ය.

42 ප්‍රඥා නැමති ප්‍රදීපයෙන් මෝහාන්ධකාර විධ්වංශනය කළා වූ ලෝකාන්ධකාර නැසීමෙහි මහ පහන් බඳු වූ ඒ ස්ථවිරයෝ තුමූ ද, මරණ නමැති භයානක මහ පවනින් නිවන ලද්දාහු ය. එහෙයින් ද නුවණැත්තේ ජීවිතමදය හරණේ යි.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස පඨම සංගීති නම් වූ තුන් වෙනි අදියර නිමියේ ය.

Non-Commercial Distribution

# සතර වෙනි පරිච්ජේදය

1 අජාසත් රජහු පුත්‍ර මිත්‍රද්‍රෝහි වූ උදායිභද්‍ර රජ තෙම ඒ අජාසත්
රජහු මරවා සොළොස් හවුරුද්දක් රජය කරවූයේ ය. උදායි භද්‍ර රජහු
2 පුත්‍ර වූ අනුරුද්ධ කුමාර තෙම ඒ උදායි භද්‍ර රජහු මරවා ද, අනුරුද්ධ
රජහු පුත්‍ර වූ මුණ්ඩ කුමාර තෙම ඒ අනුරුද්ධ රජහු නසා දූයි මිත්‍ර ද්‍රෝහි
3 දුර්මති වූ ඔව්හු ද රාජ්‍යය කරවූහු. ඒ දෙදෙනාගේ රාජ්‍යයන්හි ද අට
හවුරුද්දක් ඉක්මුණාහ, මුණ්ඩ රජහු පුත්‍ර වූ පව්ටු නාගදාසක තෙම
4 පියා මරවා සූවිසි වසක් රජය කරවී. ඉක්බිත්තෙන් "මේ පිතෘ ඝාතක
වංශය" යි කිපී නුවර වැස්සෝ සමගි වූවෝ නාගදාසක රජහු පහ
6 කොට සාධූන් විසින් සම්මත කරණ ලද්දා වූ සුසුනාග යයි ප්‍රසිද්ධ වූ
අමාත්‍ය යෙකු සියල්ලන්ට හිත සිත් ඇත්තෝ රාජ්‍යයෙහි මොනවට
7 අභිෂේක කළහ. ඒ රජ තෙම අටළොස් වසක් රජය කරවීය උහු පුත්
8 කාලාශෝක රජ තෙම අට විසි හවුරුද්දක් රජය කරවීය. කාලාශෝක
රජහු රාජ්‍යයෙහි දස වෙනි වස ඉක්මුණු කල්හි මෙසේ ගණන්
9 පිළිවෙළින් සර්‍වඥයන් වහන්සේගේ පිරිනිවී විසින් වර්ෂ සියයක් විය.
එකල්හි විසාලා මහ නුවර වැසි අලජ්ජී වූ නොයෙක් වජ්ජිපුත්‍රක භික්ෂූහු
10 සිංගිලොණකප්පය, ද්වංගුලකප්පය, එසේම ගාමන්තරකප්පය, ආවාස
11 කප්පය, අනුමති කප්පය, ආචිණ්ණ කප්පය, අමථිත කප්පය, ජලොගි
කප්පය, අදසකනිසීදන කප්පය, ජාතරූපාදි කප්ප යයි මෙසේ (අකැප
වූ) දශ වස්තූන් කැප යයි ප්‍රකාශ කළහ. වැදෑරුට චාරිකා වෙහි වඩනා
යස ස්ථවිර තෙම ඒ ඇසූයේ ෂඩ්භිඥා ඇත්තා වූ බල ප්‍රාප්ත වූ
කාකණ්ඩක පුත්‍ර වූ යස ස්ථවිර තෙම එය සංසිඳුවනු පිණිස උත්සාහ
12 සහිත වූයේ එහි මහා වනයට වැඩිසේක.

ඒ වැදෑ රට වාසී භික්ෂූහු පොහෝ ගෙයි දිය සහිත ලොහෝ
තළියක් තබා "සඟහට කහවණු ආදිය දෙව්" කියා උපාසක යන්ට කීහු,
ඒ ස්ථවිර තෙම නොකැපය එය නොදෙව" යි වැලකුයේය, ඒ භික්ෂූහු
14 යශ ස්ථවිරයන් වහන්සේට පටිසාරණීය නම් කර්ම කළහ, ඒ ස්ථවිර

1. මෙහි ශාංගලවනකල්ප නම් ලුණු නැති ආහාර ලත් කළ ඒ හා මිශ්‍ර කොට වළඳනු පිණිස ගෙරි අං ආදී කුලාවක බහා ලුණු පරිහරණයි - ද්ව්‍යංගුකල්ප නම් ඉර නැමී දඟුල් සෙවණැලි වන තෙක් විකල් බොජුන් වැලඳීමයි- ග්‍රාමන්තර කප්ප නම් දැන් අන් ගමකට යමැයි පවුරුණු කළහු විසින් කැප නොකළ අනතිරික්ත භොජනය වැලඳීමයි ආවාස කල්ප නම් මහා සීමායෙහි නා නා ආවාසයන්හි වෙන් වෙන්ව පොහෝ කිරීමයි. ආචිර්ණකල්ප නම් ඇචායර් උපාධ්‍යායාන් විසින් පුරුදු කළ දේ පැවැත්වීමයි අමථිතකල්ප කැප කොට නොගෙණ වැලඳීමයි ජලොගිකල්ප නම් යමක් සුරාත් නොවිද මද්‍යබවත් නොගියේ ද එබඳු නොලා නුමුදු කළ සුරාබීමයි අදශකනිසීදන කප්ප නම් දහවලු නැති නිසීදන පරිහරණයි ජාතරූපාදි කල්පනම් රන් රිදී මසු කහවණු ආදිය පිළිගැන්වීමයි යන මෙතෙක් දෑ භික්ෂූන්ට කැප යය වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින් උපදවන ලද දශවස්තු නම් මෙහි පවාරන පටිග්ගහණදියෙහි වැඩි විස්තර විනය නයින් දන්නේ යි.

Non-Commercial Distribution

15 තෙම අනු දූතයෙකු අල්වා ගෙන ඒ උහු හා සමග නුවරට පිවිසියේ ය.
16 තමන් ධර්මවාදී බව නුවර වැස්සන්ට හඟවා පෙරළා වැඩි සේක. අනු
දූත භික්ෂූහුගේ බස් අසා ඒ ස්ථවිරයන් වහන්සේට උක්ඛෙපනීය නම්
කර්ම කරන්නට ආවාහු භික්ෂූහු ස්ථවිරයන් වහන්සේ ගේ ගෙය වට
17 කොට සිටියෝ ය. ස්ථවිර තෙම අසහට නැගී එතැනින් කොසඹෑ
නුවරට වැඩ අධෝගංග පර්වත විහාරයට තෙමේ වැඩ පාවා රට වාසී
වූ ද අවන්ති රට වාසී වූ ද භික්ෂූන් සමීපයට වහා දූතයන් යැවූ සේක.
සාණවාසීහු සම්භූත නම් ස්ථවිරයන් වහන්සේට ඒ සියල්ල කී සේක.
18 පාවා රට වාසී වූ සැට නමක් ද, අවන්ති රට වාසී වූ අසූ නමක් ද යන
19 සියලු මහ රහත් ස්ථවිරයන් වහන්සේලා අධෝගංග පර්වත විහාරයෙහි
බැසී සේක්ලා ය. එහි ඒ ඒ තැනින් රැස් වූ භික්ෂූහු සියල්ලෝ ම අනූ
20 දහසක් වූහ. රාගදී ක්ලේශ රහිත ඒ ස්ථවිරයන් වහන්සේලා මන්ත්‍රණය
21 කොට ක්ෂීණාශ්‍රය බහුශ්‍රැත වූ සොරෙය්‍ය රට වැසි රේවත ස්ථවිරයන්
වහන්සේ ඒ කාලයෙහි ප්‍රමුඛ වශයෙන් දූන උන් වහන්සේ දක්නා පිණිස
22 ඒ තෙරුන් වහන්සේලා නික්මුණා හ. ඒ ස්ථවිරයන් වහන්සේ ඒ
මන්ත්‍රණය (දිව කණින්) අසා විසාලා මහනුවරටම වඩිනු කැමැත්තෙන්
23 (පිරිවර සහිත ව) ඵාසු ගමන කැමැත්තේ එතැනින් එකෙණෙහි නික්මුණු
සේක. ඒ මහා ධ්‍යාසය ඇත්තා වූ ස්ථවිරයන් වහන්සේ විසිනි උදය
උදය නික්මුණ තැනට සවස සවස පැමිණෙන්නාහු ඒ රේවත ස්ථවිරයන්
වහන්සේ සහ ජාති භූමියෙහි දී දුටහ. එතැන දී සම්භූත ස්ථවිරයන්
වහන්සේ විසින් නියෝග කරණ ලද්දා වූ යශ ස්ථවිරයන් වහන්සේ,
24 සඬම් ශ්‍රවණාවසානයෙහි, රේවත ස්ථවිරෝත්තමයන් කරා එළැඹ දශ
25 වස්තූන් විචාළේය. ඒ ස්ථවිර තෙම (වරද යයි) ප්‍රතික්ෂේප කොට
වදාළේ ය. ඒ අධිකරණය ද අසා වදාරා වලක්වම්හි වදාළේය. ඒ පාප
භික්ෂූහු ද උත්තම වූ රේවත ස්ථවිරයන් වහන්සේ පක්ෂ කර ගන්නට
26 සොයන්නාහු බොහෝ වූ ශ්‍රමණ සාරූප්‍ය පරිෂ්කාරයන් සපයා ගෙණ
27 වහා නැවින් ගොස් සහ ජාති භූමි සමීපයට ගියාහු භක්ත කාලය පැමිණි
28 කල්හි භක්ත පරිභෝගය කෙරෙත්. සහජාති භූමියෙහි වසන්නා වූ
රහත් වූ (ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ සඬි විහාරික වූ) සාළ්හ නම්
ස්ථවිර තෙම සිතා වදාරා පාවෙය්‍යක භික්ෂූහු ධම්වාදිහූ යයි දැක වදාළේ
ය. මහා බ්‍රහ්ම තෙම උන්වහන්සේ කරා එළැඹ ධර්මයෙහි පිහිටුවයි
29 කියේය. ඒ ස්ථවිර තෙම තමන් සතතයෙන් ධර්මයෙහි පිහිටි බව ඒ
බ්‍රහ්මයා වදාළේය. ඒ භික්ෂූහු පිරිකර රැගෙණ රේවත ස්ථවිරයන්
30 දුටහ. ඒ සථවිරයන් වහන්සේ (පිරිකර) නො පිළිගත්තේ ය. ඒ පක්ෂය
ග්‍රහණය කළා වූ (උත්තර නම්) ශිෂ්‍යයා නෙරපූයේ ය. ඉක්බිත්තෙන්
ඔව්හු විසාලා මහ නුවරට ගොස් එතැනින් පැළළප් නුවරට ගියා හුය.
31 අලජ්ජි භික්ෂූහු "අපගේ ශාස්තෲන් වහන්සේගේ ද ගඳ කිළිය රකිමින්

Non-Commercial Distribution

32 අපි එහි වැදී රට මහා වන විහාරයෙහි වසම්හ. ගම්වැසි වූ භික්ෂූහු
33 වෙහෙර ගණුම්හ යි එති මහ රජ ඔවුන් වලක්වයි" කාලාශෝක රජහට
34 කිවුය. ඔව්හු දුර්ග්‍රාහිත කොට විසාලා මහ නුවරට ආවාහුය. මෙහි
35 සහජාත භූමියෙහි රේවත ස්ථවිරයන් වහන්සේ සමීපයෙහි භික්ෂූහු
එකොළොස් ලක්ෂ අනූ දහසක් රැස් වූයෝ ඒ දශ වස්තු සංසිඳුවන
36 පිණිස සැළ කළෝ මූලස්ථ වූ වැදෑ රට වාසී භික්ෂූන්ගෙන් වෙන් ව දශ
වස්තු සමනය (රේවත ස්ථවිරයන් වහන්සේට) රුචි නොවිය.
37 ඉක්බිත්තෙන් ඒ සියලු ම ස්ථවිර භික්ෂූහු විසාලා මහ නුවරට ගියාහු ය.
වරදවා පිළිගත්තා වූ රජ තෙමේ ද එහි ඇමතියන් යැවූයේ ය. දේවානු
38 භාවයෙන් මුළා වූවෝ අන් තැනෙක ගියාහු ය. ඒ මිහිපල් තෙම ඔවුන්
යවා ඒ රාත්‍රියෙහි ස්වප්නයෙන් ස්වකීය වූ දේහය ලොහොකුඹු
39 නරකයෙහි බැහුවා දුටුයේ ය. රජතෙම අතිශයින් බිය පත් වූයේ ය.
උහු අස්වසනු පිණිස උහුගේ නැගනී වූ නන්ද නම් රහත් ස්ථවිර තොමෝ
40 අහසින් ආවාය, තොප විසින් බර වූ කර්මයක් කරණ ලද්දේ ය. ධාර්මික
වූ ආර්‍යයන් ක්ෂමා කරව, තෙපි උන් වහන්සේලාට පක්ෂව ශාසන
41 සංග්‍රහ කරව, මෙසේ කළ කල්හි තොපට සැප වන්නේ යි කියා බැහැර
42 ගියා ය. මිහිපති තෙමේ උදෑසනම විසාලා මහ නුවරට යන්නට නික්මුණේ
43 ය. ඒ රජ තෙම මහ වනයට ගොස් භික්ෂු සංඝයා රැස් කරවා උභය
පක්ෂයාගේ වාදය ද අසා ධර්ම පක්ෂයට රුචි කොට, ඒ සියලු ධාර්මික
44 භික්ෂූන් ක්ෂමා කරවා තමන්ගේ ධර්ම පක්ෂ භාවය කියා නුඹ වහන්සේලා
45 රුචි වූ පරිද්දෙන් ශාසනයාගේ ප්‍රග්‍රහණය කරව් යයි කියා
46 උන්වහන්සේලාට ආරක්ෂාත් දී ස්වකීය නගරයට ගියේ ය. එකල්හි ඒ
දශ වස්තූන් විනිශ්චය කරණු පිණිස සංඝයා රැස් වූ සේක, එහි කෙළවර
47 නැත්තා වූ විවාද කථාවෝ සඟ මැද උපන්නාහ. ඉක්බිත්තෙන් ඒ
රේවත ස්ථවිරයන් වහන්සේ සඟ මැදට පැමිණියේ සංඝයාට අස්වා ඒ
වස්තුව (අධර්ම වාදීන් පිරිසෙන් පිට කිරීම වූ උබ්බාහිකාවෙන් සංසිඳු
48 වන්නට නිශ්චය කළ සේක. පෙරදිග වැසි භික්ෂූන් සතර නමක් ද
පාවෙය්‍ය සතර නමක් ද වස්තුව සංසිඳුවන පිණිස උබ්බාහිකාවට සම්මත
49 කළ සේක. සබ්බකාමීය, සාළ්හය, ඛුජ්ජ සොභිතය, වාසගාමික යයි
මේ පූර්වදිග් වාසී වූ ස්ථවිරයෝය, සාණවාසී සම්භූතය, රේවතය කාකණ්ඩ
පුත්‍ර වූ යසය, සුමන යයි මේ සතර නම පාවෙය්‍ය වූ ස්ථවිරයෝ ය,
50 රහත් වූ ස්ථවිර අට නම අල්ප ශබ්ද වශයෙන් නිරවුල් කොට ඒ වස්තූන්
51 සංසිඳුවනු පිණිස වාලුකාරාමයට වැඩියාහු ය. එතන්හි අභිනව වූ ඒ
භික්ෂූ නමක් විසින් පණවන ලද අස්නෙහි සර්වඥයන් වහන්සේගේ
52 අදහස් දන්නා වූ මහ තෙරහු වැඩහුන් හ. පුච්ඡාවන්හි දක්ෂ වූ රේවත
නම් මහා ස්ථවිරයන් වහන්සේ ඒ වස්තූන් අතුරෙන් එක එක පිළිවෙළින්
53 සබ්බකාමී ස්ථවිරයන් විචාළ සේක. ඉක්බිති උන් වහන්සේ විසින්

Non-Commercial Distribution

විචාරන ලද සබ්බකාමී නම් සභා ස්ථවිර තෙම ඒ සියලු ම වස්තුහු
කැප නොවෙත් යයි සූත්‍ර දක්වීමෙන් ප්‍රකාශ කොට වදාළේ ය. ඒ
54 ස්ථවිරයෝ තුමූ අධිකරණය පිළිවෙළින් බැහැර කොටලා එහිම සඟ
55 මැද පිළිවෙළින් පිළිවිසීම් විසඳීම් කළහ. ඒ මහා ස්ථවිරයෝ තුමූ දශ
වස්තූන් ප්‍රකාශ කළා වූ ඒ දස දහසක් පාප භික්ෂූන්ට නිග්‍රහ කළහ.
56 සබ්බ කාමී නම් ස්ථවිරයන් වහන්සේ එකල ලෝකයෙහි සියලු සංඝයාට
57 වැඩි මහලු වූ සේක. එකල්හි උන් වහන්සේ උපසම්පදාවෙන් එක සිය
විසි වයස් වූ සේක. සබ්බකාමීය, සාළ්හය, රේවත , ඛුජ්ජසොභිතය,
කාකණ්ඩක පුත්‍රය, යසය, සාණවාසී සම්භූතය යන මේ ස්ථවිරයන්
වහන්සේලා ආනන්ද ස්ථවිරයන් වහස්සේ ගේ සද්ධිවිහාරික වූ ශිෂ්‍යයෝ
ය. වාසභගාමිකය, සුමනය යන මේ ස්ථවිර දෙනම වනාහි අනුරුද්ධ
58 ස්ථවිරයන් වහන්සේ ගේ සද්ධි විහාරික වූ ශිෂ්‍යයෝ යි. පින්වත් වූ ඒ
59 ස්ථවිර අට නම ද පෙර තථාගතයන් වහන්සේ දුටුවෝය. භික්ෂූහු
60 දොළොස් ලක්ෂයක් රැස් වූහ, සියලු ම භික්ෂූන්ට රේවත නම් ස්ථවිරයන්
61 වහන්සේ ප්‍රමුඛ වූයේ ය, එහෙයින් එකල්හි ඒ රේවත ස්ථවිරයන්
62 වහන්සේ බොහෝ කල් සද්ධර්මයාගේ පිහිටීම සඳහා ධර්ම සංගීතියක්
කරවනු පිණිස සියලු භික්ෂු සමූහයෙන් ප්‍රභේද ප්‍රාප්ත අර්ථ ප්‍රතිසම්භිදා
දී ඥාන ඇති පිටකත්‍රයධාරී වූ රහතුන් වහන්සේලා සත් සියයක් තෝරා
63 ගත් සේක. රේවත ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ කොට ඇත්තා වූ ඒ
සියල්ලෝ වාලුකාරාමයෙහි කාලාශෝක (නම් වරනිඳුහු) විසින් ආරක්ෂා
64 කරණ ලද්දා හු ධම් සංගායනා කළහ. පූර්වයෙහි පුච්ඡාද කථනය ද
65 කරණ ලද්දා වූ ඒ ධර්මය මෙසේ ග්‍රහණය කොට මේ (ධම් සංගීතිය)
66 අට මසකින් නිමවූහ. මෙසේ ඒ මහා යසස් ඇත්තා වූ දොෂක්ෂය
ප්‍රාප්ත වූ ස්ථවිරයන් වහන්සේලා ද දෙවෙනි සංගායනාව කොට කලකින්
පිරිනිවන් පා වදාළහ.

මෙසේ උත්තම ප්‍රඥා ඇත්තා වූ පැමිණියා වූ ලෝකෝත්තර
67 විශේෂ ධර්ම ඇත්තා වූ භවත්‍රය වාසීන්ට වැඩ සිදු කරන්නා වූ සර්වඥ
පුත්‍රයන් වහන්සේලාගේ ඒ මරණය සිහි කොට (ඇතිව නැතිවන) සංඛත
ධර්මයන්ගේ සාරරහිත භාවය නිරවශේෂ වශයෙන් ප්‍රඥාවෙන් පරීක්ෂා
කොට (සාදු ජන තෙම) ප්‍රමාද රහිත වන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
දුතිය සංගීති නම් වූ සතර වෙනි අදියර නිමියේ යි.

Non-Commercial Distribution

# පස් වෙනි පරිච්ඡේදය

1 ආරම්භයෙහි මහා කාශ්‍යපාදී මහා ස්ථවිරයන් වහන්සේ විසින්
කරණ ලද ධර්ම සංගීති තොමෝ ථෙරියා යයි කියනු ලැබේ.

2 ආරම්භ වර්‍ෂ සියයෙහි ඒ එකම ථේරවාදය වූයේ ය. ඉන් මෑත
3 අන්‍යාචාර්‍ය්‍ය වාදයෝ උපන්හ. ඒ දෙවැනි වූ සංගායනාකාරී ස්ථවිරයන්
විසින් නිග්‍රහ කරණ ලද සියලු දස දහසක් ඒ පාප භික්ෂූහු මහා සංගීති
නම් වූ ආචාර්‍ය්‍ය වාදයක් කළාහු ය. ඒ මහා සංගීතික භික්ෂූන් ගෙන්
4 ගෝකුලිකය, එකබ්බොහාරික යයි ආචාර්‍ය්‍ය වාද ඇති ලබ්ධි දෙකක
5 භික්ෂූන් වූහ. ගෝකුලික භික්ෂූන්ගෙන් පුග්ගලපණ්ණත්ති වාදීහුය,
6 බාහුලිකයෝ යයි ලබ්ධි දෙකක පිහිටි භික්ෂූහු වූහ. ඒ භික්ෂූන් අතුරෙහිම
චේතිය වාද නම් වූ අන්‍යමතයක පිහිටි භික්ෂූහු වූහ. ඒ සියල්ලෝ මහා
සංගීති නම් වාදය ඇත්තෝ ය. නැවත ද ථේරි වාදි භික්ෂූන් ගෙන්
මහිංසාසක නම් භික්ෂූහු ය. වජ්ජි පුත්‍රක භික්ෂූහු යයි යන මේ දෙ
7 කොටස වූහ. ඒ වජ්ජි පුත්‍රක භික්ෂූහු ම ධම්මුත්තරිය නම් භික්ෂූහුය,
8 භද්‍රයානික භික්ෂූහුය, ඡන්නාගාරික භික්ෂූහුය. සම්මිතිය භික්ෂූහු යයි
මෙසේ (සතර කොටසක්) වූහ. මහිංසාසක නම් භික්ෂූන් ගෙන් නික්ම
9 සබ්බත්ථි වාදී නම් භික්ෂූහුය, ධම්ම ගුත්තිය නම් භික්ෂූහු යයි මේ දෙ
කොටස වූහ. යළිත් සබ්බත්ථි වාදීන් කෙරෙන් නික්ම කස්සපිය භික්ෂූහු
වූහ, එයින් සංකන්තික නම් භික්ෂූහු වූහ, එයින් වනාහි සුත්තවාද නම්
භික්ෂූහු වූහ. ඒ මොව්හු ථේර වාද නම් මතය ඇති භික්ෂූන් හා සමඟ
10 දොළොස් නිකායක් වෙති, පූර්වයෙහි කියන ලද ෂඩ්වාද යෝ දැයි
මෙසේ සියල්ලෝ ම අටළොස් නිකායක් වූහ. මෙසේ දෙවෙනි වර්‍ෂ
11 ශතයෙහි සතළොස් මතයක් වූහ. ඉන් මෑත අන්‍ය වූ ආචාර්‍ය්‍ය වාද
උපන්හ. එනම්, හේමවතයෝය, රාජ ගිරිකයෝ ය, එසේම
12 සිද්ධාර්ථිකයෝ ය, පුබ්බසෙලික නම් භික්ෂූහුය, එසේ ම අපරසේලිකයෝ
ය, වාජිරිකයෝය, මේ ෂඩ්විධමතිකයෝ ජම්බුද්වීපයෙහි බිඳුනෝය,
13 ධම්මරුචිකයෝ ය, සාගලිකයෝ යයි ලංකාද්වීපයෙහි භින්න වූහ.
ආචාර්‍ය්‍ය වංශ භේදයයි.

කාලාශෝක රජහුගේ පුත්‍ර වූ දස බෑ කෙනෙක් වූහ. ඔව්හු
14 දෙවිසි හවුරුද්දක් රාජ්‍යානුශාසනා කළහ, ඒ දස බෑ රජුන්ට අනතුරුව
නව නන්ද රජ දරුවෝ පිළිවෙළින් වූහ, ඔව්හු ද දෙවිසි හවුරුද්දක්
15 රාජ්‍යානුශාසනා කළහ.

16 ඉක්බිත්තෙන් ඒ චාණක්‍ය නම් බ්‍රාහ්මණ තෙම නන්ද රජුන්
අතුරෙන් නව වෙනි වූ ධනනන්ද රජහු චණ්ඩ ක්‍රෝධයෙන් මරවා

Non-Commercial Distribution

17 මෞර්‍ය්‍යී නම් ක්ෂත්‍රියයන්ගේ වංශයෙහි උපන්නා වූ ශ්‍රීධර වූ චන්ද්‍ර
ගුප්ත යයි ප්‍රසිද්ධ වූ රාජ කුමාරයා මුළු දඹදිව රාජ්‍යයෙහි අභිෂේක
කෙළේ ය. ඒ චන්ද්‍රගුප්ත රජ තෙම සූවිසි හවුරුද්දක් රජය කෙළේය.
18 ඔහු පිත් බින්දුසාර ක්ෂත්‍රිය තෙම අට විසි හවුරුද්දක් රජය කෙළේ ය.
19 බින්දුසාර රජහුගේ පුත්‍රයෝ තුමු ප්‍රසිද්ධ වූ එකසිය එක දෙනෙක් වූහ.
ඔවුන් අතුරෙන් ධර්මාශෝක කුමාර තෙම පුණ්‍ය තේජෝ බල සමෘද්ධි
20 සම්පන්න වූයේ ය. භින්න මාතෘක වූ එකුන්සියයක් සහෝදරයන්
මරවා මුළු දඹදිව එක රාජ්‍යයට පැමිණියේ ය. සර්‍වඥයන් වහන්සේ ගේ
පරිනිර්‍වාණ යෙන් පසු ඒ රජහු අභිෂේකයෙන් පූර්‍වයෙහි වර්‍ෂ දෙසිය
21 අටළොස මෙසේ දත යුතු මහා යසස් ඇත්තේ සිවු වසකින් එක රාජ්‍යයට
පැමිණ පාටලී පුත්‍ර නගරයෙහි තමන් අභිෂේක කෙළේ ය. ඒ රජහුගේ
22 අභිෂේකය හා සමගම අහසෙහි ද එසේම භූමියෙහි ද යොදුනක්
23 යොදුනක් තන්හි ආඥාව සතත යෙන් පහළ විය. (ඒ රජාණන්ට දෙවියෝ
24 අනෝතත්ත විලෙහි පැන්කත් අටත් දවසක් පාසා ගෙණාවාහු ය.
නරේන්ද්‍ර තෙම එයින් ජනයාට ද සංවිභාග කළේ ය. දෙවියෝ ම
හිමවතින් නොයෙක් දහස් ගණනකට පොහොනා වූ නාලිය දැවටු
25 ගෙනාවා එසේම බෙහෙත් ඇඹුලු හා බෙහෙත් අරළු ද වර්‍ණයෙන්
26 ගන්ධයෙන් රසයෙන් උතුම් වූ අඹපල ද එයින් ම ගෙණාවාහු ය. (තව
ද) දේවතාවෝ පංච වර්‍ණ වස්ත්‍රයන් ද, පීත වර්‍ණ වූ අත්පිසිනා පිළිකඩ
ද දිව්‍යපාන වර්‍ග ද ඡද්දන්ත විලින් ගෙණාවාහු ය. ඒ නුවර මැරෙන්නා
27 වූ මුව ඌරු ලිහිණියෝ ඒ රජහුගේ මුළුතැන් ගේ ළඟට අවුත් තමන්
28 මැරෙත්. එහි දිවියෝ තුමු ගවයන් ගොදුරු කවා ගාලට ගෙණ එති.
29 මුවන් හා ඌරෝ කෙත්වත් විල් ආදීන් රකිති. හුනැත්තා වූ දිව්‍යමය
සමන් මල් පට හා උපුල් ද විලවුන් ද, අඳුන් ද, නාග විමානයෙන්
30 නාගයෝ ගෙණ එති. ගිරවු වනාහි හැල්ගැල් අනු දහසක් ඡද්දන්ත
31 විලින් ම දින පතා ගෙණාවාහුය. මීයෝ ඒ හැල් නොකඩා දාසෙවිය
32 කුඩු නැති කොට සහල් ශුද්ධ කළහ. ඒ සහළින් රජ ගෙයි බත සිඩවීය.
33 ඒ රජහට සතතයෙන් මීමැස්සෝ මී බැන්දෝ, එසේ ම ඒ රජහුගේ
34 කුඹුරු හල්හි වලස්සු කුළු ගැසූහ. මනෝඥ මධුර ස්වර ඇත්තා වූ
කුරවිකෙවිල්ලෝ අවුත් ඒ රජහට මධුර වූ කූජනය කළහ. අභිෂේක
35 කරණ ලද්දා වූ ඒ අශෝක රජ තෙම ස්වකීය බාල සහෝදර වූ තිස්ස
නම් වූ කුමාරයා උප රාජ්‍යයෙහි අභිෂේක කෙළේයි -

ධර්‍මාශෝකාභිෂේකය නිමියේයි.

36 ඒ රජහු පියතෙම බ්‍රහ්ම පාක්ෂික වූ සැටහදසක් බ්‍රාහ්මණයන්
වැලඳ විය. ඒ ධර්‍මාශෝක රජ තෙමේ ද තුන් හවුරුද්දක් ඔවුන්ට ම දන්
37 දුන්නේය. නුවණැත්තා වූ අශෝක රජ තෙම දන් දෙන තන්හිදී ඔවුන්ගේ

Non-Commercial Distribution

38 අනුපසමය දැක "පරික්ෂා කොට දානය දෙන්නෙමැයි" ඇමැතියන්
39 මෙහෙයා වෙන් වසයෙන් නා නා පාෂාණ්ඩයන් ගෙන්වා හිඳීමෙන්
විමසා වලඳවා හැරී යේය. කාලයෙක්හි සිව්මැදුරු ගත වූ ඒ රජ තෙම
විථියෙහි වඩනා වූ උපසමිත සංසුන් ඉඳුරන් ඇත්තා වූ ඒ නිග්‍රෝධ
සාමණේරයන් දැක සිත පැහැද වූයේ ය. ඒ නිග්‍රෝධ සාමණේර තෙම
40 බින්දුසාර රජහුගේ පුත්‍රයන් අතුරෙන් සියල්ලන්ට වැඩි මහල් සහෝදර
වූ සුමන නම් කුමාරයාගේ පුත්‍ර වූයේය. (එහි පිළිවෙළ කථාව මෙසේයි.)

ඒ අශෝක කුමාර තෙම පියාණන් විසින් දෙන ලද උදේනි රට
41 රාජ්‍යය හැර බින්දුසාර රජහු රෝගාතුර කල්හි පාටලීපුත්‍ර නගරයට
පැමිණියේය. පුරය තමා අයත් කොට ගෙන පියා මළ කල්හි වැඩිමහල්
සහෝදරයා මරා පුරවරයෙහි රාජ්‍යය ගත්තේය. සුමන නම් කුමාරයාගේ
42 සුමනා නම් වූ ගර්භිණී වූ දේවි තොමෝ ඒ පුරයෙන් නික්ම නැගෙණහිර
43 දොරින් පිට සැඩොල් ගමට ගියාය. එහි නුගරුක අධිවාසි වූ දේවතා
44 තොමෝ නමින් ඇය කැඳවා ගෙයක් මවා දුන්නාය, ඕ තොමෝ එ
45 දවස ම උතුම් පුතෙකු වදා දේවතානුග්‍රහය අනුව ගිය පුත්‍රයාට නිග්‍රෝධ
46 යයි නම් කළාය. සැඩොල් දෙටු තෙම ඇය දැක තමා සාමි දුව මෙන්
47 සිතන්නේ සත් හවුරුද්දක් මනා කොට ඇයට උවටැන් කළේය. එ
කල්හි මහා වරුණ නම් අර්හත් ස්ථවිර තෙම හේතු සම්පන්න වූ කුමරුවා
දැක මෑණියන් විචාළේ ඒ කුමරුවා පැවිදි කරවූයේය. ඒ කුමාර තෙම
48 කරගෙහිම රහත් බවට පැමිණියේය. ඉක්බිත්තෙන් ඒ නිග්‍රෝධ සාමණෙර
තෙම මවු බිසවුන් දක්නට යන්නේ පුරවරයට දකුණු දොරින් පිවිස,
49 එකල රජ මළුවෙහි ඒ ගමට යන මගින් යන්නේය. ඒ රජ තෙම ශාන්ත
වූ ඊර්යාපථය කරණ කොට ගෙණ ඒ සාමණෙරයන් කෙරෙහි ප්‍රසන්න
වූයේය.

50 පූර්වයෙහි ම සමග විසීමෙන් උන්වහන්සේ කෙරෙහි ප්‍රේමය
උපන්නේය. (ඒ පිළිවෙළ කථාව මෙසේයි) පූර්වයෙහි වනාහි මී වෙළඳ
51 තුන් බෑ කෙනෙක් වූහ. එක් වෙළඳෙක් මී විකුණයි. දෙදෙනෙක් මී
52 ගෙණ එති, එකල එක් පසේබුදු කෙනෙක් ව්‍රණ රෝගයකින් ආතුර
විය. අන්‍ය වූ පසේ බුදු කෙනෙක් උන් වහන්සේ පිණිස මී සොයමින්
එකල පිඬු සිඟන වතින් නුවරට පිවිසි සේක. දිය ගෙනෙනු සඳහා
53 තොටට යන්නා වූ එක් සට චේටිකාවක් තොමෝ උන් වහන්සේ දුටුවාය.
54 විචාරා මී කැමැති බැව් දැන, "වහන්ස, තෙල මී සල්පිළය" අතින් දක්වා
55 එහි වැඩිය මැනවැයි කීවා. එහි පැමිණි පසේ බුදුන්ට පහන් වූ වෙළඳ
තෙම පාමුවෙන් උතුරුවමින් පාත්‍රය පුරා මී දන් දුන්නේය. පිරුණා වූද
56 ඉතිරී ගියා වූ ද පොළෝ තෙලෙහි වැටුණා වූද මී දැක ප්‍රසන්න වූ ඒ

Non-Commercial Distribution

වෙළඳ තෙමේ එකල්හි (මේ දානය කරණ කොට ගෙණ මට
ජම්බුද්වීපයෙහි එක රාජ්‍යය වේවා, අහස යොදුනක් තන්හි ද පොළොව
57 යොදුනක් තන්හි ද (මාගේ) ආඥාව පැතිරේවා"යි මෙසේ ප්‍රාර්ථනා
කෙළේය. ආවා වූ සහෝදරයන්ට හෙතෙම "මෙබඳු කෙනෙකුට මී
58 දුනිමි, මී නුඹ ලාට ද අයිති හෙයින් නුඹලාත් ඒ අනුමෝදන් වච්ය"යි
කීයේය. ඒ වැඩිමහලු සහෝදර තෙම නොසතුටු සිත් ඇත්තේ "සැම
59 කල්හිම චණ්ඩාලයෝ කසාවත් හඳනාහුය, හෙතෙම චණ්ඩාලයෙක්
වන්නේදෝහෝයි" කීයේය. මධ්‍යම තැනැත්තේ "ඒ පසේබුදුන් මුහුදින්
60 එතර දම"යි කීයේය. ඒ මධුදායක යාගේ බස් අසා ඔව්හු ප්‍රාප්තිදානය
අනුමෝදන් වූහ.

61 ඒ සල්පිළ දැක් වූ සටවේටිකා තොමෝ වනාහි ඒ මධුදායකයාගේ
මෙහෙසි බැව් හා නොපෙණෙන සන්ධි ඇති ඉතා මනෝහර වූ රූපය
62 ද ප්‍රාර්ථනා කළාය. මධුදායක වූ වෙළඳ තෙම ධර්මාශොක නම් රජ
වූයේය. සටවේටිකා තොමෝ අසන්ධිමිත්‍රා නම් දේවි විය, චණ්ඩාල
63 වාදී වූ වෙළඳ තෙම නිග්‍රෝධ සමණේර වූයේය. පාරවාදික වූ වෙළඳ
තෙම දෙවැනි පෑතිස් නම් රජ වූයේය. යම් හෙයකින් හෙතෙම චණ්ඩාල
64 වාදී වී නම් එහෙයින් සැඩොල් ගම උපන්නේය. යම්සේ මෝක්ෂය
ප්‍රාර්ථනා කෙළේද එහෙයින් සත් හැවිරිදි වයස් ඇත්තේම මොක්ෂ
ප්‍රාප්ත ද වූයේය. එහෙයින් ඒ සාමණෙරයන් කෙරෙහි පිහිටි ප්‍රේම
ඇති ඒ රජ තෙම, ඉතා යුහුසුලු වූයේ ඔහු කැඳවූයේය. හෙතෙම
65 සංසුන් පැවතුම් ඇත්තේ ම ළඟට පැමිණියේය. රජ තෙම "දරුව,
සුදුසු අස්නෙක හුන මැනවැයි"යි කීයේය. හෙතෙම අන්‍ය වූ ශ්‍රමණයෙකු
66 නොදැක සිංහාසනය කරා පැමිණියේය. ඒ සාමණෙරයාණන් පර්යංකය
කරා එන කල්හි රජ තෙම "අද මේ සාමණෙර තෙම මාගේ ගෙයි
67 ස්වාමි වන්නේය"යි සිතුයේය. හෙතෙම රජහු අත අල්වා පර්යංකයට
68 නැංගේ රාජ පර්යංකයෙහි සේසත යට වැඩ හුන්නේය. ඒ ධර්මාශෝක
69 රජ තෙම එසේ හුන්නා වූ ඒ සාමණේරයන් දැක, ගුණයෙන් සම්භාවනා
කොට, එකල අතිශයින් ම සතුටු වූයේය. ඒ සාමණේරයන් තමන්ට
පිළියෙළ කරණ ලද ඛාද්‍ය භෝජ්‍යයෙන් සතපා, සම්බුදුන් වදාළ ධර්මයක්
විචාළේය. ඒ සාමණෙර තෙම ඒ රජ හට දම්පියාවෙහි අප්‍රමාද වර්ගය
70 වදාළේය, ඒ මිහිපල් තෙම ඒ අසා බුද්ධ ශාසනයෙහි ප්‍රසන්න වූයේ "
දරුව නුඹ වහන්සේට නිති බත් අටක් දෙමැ"යි ඒ හෙරණුන්දෑට කීයේය.
71 ඒ සාමණෙර තෙම "මහරජ, ඒ නිති බත් මාගේ උපාධ්‍යායන්ට දෙමැ"යි
72 කීයේය. නැවත අටක් දුන් කල ඒ අට ආචාර්‍යින්ට ද, නැවතත් අටක්
දුන් කල්හි ඒ අට භික්ෂු සංඝයාට ද ඒ සාමණෙර තෙම දුන්නේය.
73 නැවතත් අටක් දුන් කල්හි ප්‍රාඥ වූ සාමණේර තෙම ඉවසූ සේක. දෙවෙනි

Non-Commercial Distribution

74 දවස්හි භික්ෂූන් දෙතිස් නමක් ගෙණ රජගෙට වැඩිසේක. රජහු විසින්
සියතින් තර්පණය කරණ ලද්දේ ධර්ම දේශනා කොට මහා ජනයා සහිත
75 වූ රජහු තිසරණ පන්සිල් හි පිහිටෙවූ සේක.

(නිග්‍රෝධ සාමණේර දර්ශනයි.)

ඉක්බිත්තෙන් ප්‍රසන්න වූ ඒ රජ තෙම, දවසක් දවසක් පාසා
පිළිවෙළින් ද්විගුණයෙන් භික්ෂූන් සැට දහසකට උපස්ථාන කෙළේය.
76 සැට දහසක් තීර්ථකයන් බැහැර කොට සැට දහසක් භික්ෂූන් සතතයෙන්
රජගෙයි වැළඳවීය. ඒ රජතෙම සැට දහසක් භික්ෂූන්ට වළඳවනු පිණිස
77 යුහුසුලු වූයේ මාහැඟි වූ ඛාද්‍ය භෝජ්‍යයන් පිළියෙළ කරවා, නුවර
78 සරහවා ගොස් සංඝයා පවරා රජ ගෙට වඩා ගෙණ වළඳවා බොහෝ වූ
ශ්‍රමණ පරිෂ්කාර දන් දී ශාස්තෲන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය
79 තෙම කෙතෙක් දැයි විචාළේය. මොග්ගලි පුත්තතිස්ස නම් ස්ථවිරතෙම
එකල ඕහට ඒ ප්‍රශ්නය විසඳා වදාළේය. අසූසාර දහසක් ධර්මස්කන්ධයෝ
80 යයි අසා ඒ රජ තෙම මම ඒ ධර්මස්කන්ධයන් එකක් එකක් වශයෙන්
(එක එක) විහාරයෙන් පුදමැ යි කීයේය. රජ තෙම එකල්හි සායනු
81 කෙළක් වස්තු දී මිහිතෙලෙහි අසූ සාර දහසක් පුරයන්හි ඒ ඒ තන්හි
රජුන් ලවාම විහාරයන් ආරම්භ කරවූහ. තෙමේ අශෝකාරාමය
82 කරවන්නට ආරම්භ කෙළේය. ඒ රජ තෙම රත්නත්‍රය, නිග්‍රෝධ
83 සාමණේරය ගිලන්හුය යන මොවුනට ශාසනයෙහි වෙන් වෙන් වශයෙන්
දවසක් දවසක් පාසා ලක්ෂයක් බැගින් ධනය යෙදවූයේය. බුදුන්ට
84 දෙන ලද ධනයෙන් සෑම කල්හි නොයෙක් විහාරයන්හි නොයෙක්
පරිද්දෙන් ථූප පූජා කළහ. මනුෂ්‍යයෝ තුමු ධර්මයට දෙන ලද ධනයෙන්
85 ප්‍රණීත වූ සිවුපසයන් ධර්මධර භික්ෂූන්ට පැමිණ වූහ. අනවතත්ත විල
86 පැන් කඳින් දවසක් දවසක් පාසා සතරක් සංඝයාට ද, ත්‍රිපිටකධර
භික්ෂූන් සැට නමකට එකක් ද දුන්නේය. එකක් අසන්ධිමිත්‍රා නම්
87 දේවියට දෙවීය. මිහිපති තෙම දෙකක් ම තමන් පරිභෝග කෙළේය.
දවසක් දවසක් පාසා සැට දහසක් භික්ෂූන්ට ද, සොළොස් දහසක්
88 ස්ත්‍රීන්ට ද, නාගලතා නම් වූ දැහැටි දින.

ඉක්බිති එක් දිනක් රජ තෙම චතුස්සම්බුද්ධයන්ගේ දර්ශනය
89 ඇත්තා වූ මහත් සෘද්ධි ඇති කල්පා යුෂ්ක වූ මහා කාල නම් නා රජහු
90 පවත් අසා, ඔහු ගෙන එන්ට ස්වර්ණ සඞ්ඛලික බන්ධනය යවා ඔහු
91 ගෙන්වා ඡේසත යට පළඟෙහි හිඳුවා නානාවිධ පුෂ්පයන් පුදා,
92 සොළොස් දහසක් ස්ත්‍රීන් පිරිවරා "පින්වත සද්ධර්ම චක්‍රවර්ති වූ
අනන්තඥාන ඇත්තා වූ මහර්ෂි වූ සර්වඥයන් වහන්සේ ගේ රූපය මට
93 දක්වව"යි කීයේ ය. දෙතිස් මහ පුරිස් ලකුණෙන් යුක්ත වූ අසූවක්

Non-Commercial Distribution

අනුබංජනයෙන් බබළන්නා වූ බ්‍යාම ප්‍රභා මණ්ඩලයෙන් වටකරණ ලද්දා වූ කේතු මාලාවෙන් විශේෂයෙන් හෙබියා වූ මනෝඥ වූ බුධ
94 රූපය ඒ නාග රජ තෙම මවා පෑයේය. ඒ දැක අධික වූ ප්‍රසාදයෙන් ඒ
95 විස්මයෙන් ද පිරුණේ "මොහු විසින් මවන ලද රූපය මෙබඳුය," තථාගතයන් වහන්සේගේ රූපය කෙබඳුහෝ යි ප්‍රීතියෙන් අතිශයෙන් උසස් වූයේ ය. මහත් සෘඞ්ධි ඇත්තා වූ ඒ මහ රජ තෙම අක්ෂි පූජා යයි
96 නම් වූ ඒ මහත් වූ පූජාවක් සත් දවසක් නිරතුරු කොට කරවූයේ ය. මිහිපති තෙම මෙසේ මහානුභාව ඇත්තේත් ශ්‍රද්ධා ඇත්තේ ද විය.
97 මොග්ගලිපුත්ත තිස්ස නම් වූ ස්ථවිර තෙමේ ද යන ඔව්හු පූර්වයෙහි රහතුන් විසින් දක්නා ලද්දෝ ය.

ධර්මාශෝක රජහුගේ ශාසන ප්‍රවේශය නිෂ්ඨිතයි.

98 දෙවෙනි සංගායනාවෙහි දී ඒ ස්ථවිරයෝ තුමූ අනාගතය බලන්නාහු ඒ ධර්මාශෝක රජහුගේ කාලයෙහි වන ශාසනෝපද්‍රවය
99 දුටහ. ඒ උපද්‍රවය නසන්නෙකු සකල ලෝකයෙහි බලන්නාහු නොබෝ කල් පවත්නා ජීවිත ඇත්තා වූ තිස්ස නම් බ්‍රහ්මයා දුටහ. ඒ ස්ථවිරයෝ
100 තුමූ මහා ප්‍රඥා ඇති ඔහු වෙත එළඹ මිනිසුන් කෙරෙහි ඉපිද ඒ උපද්‍රව නැසීම ඉල්වූහ. සසුන් බබළවනු කැමැති වූ හෙතෙම ඒ ස්ථවිරයන්ට
101 ප්‍රතිඥා දුන් සේක. සිග්ගවය, චණ්ඩවජ්ජිය යන නම් ඇත්තා වූ බාල භික්ෂූන් දෙදෙනාට ඒ ස්ථවිරයෝ මෙසේ වදාළහ. "අටළොසක් අධික
102 වූ හවුරුදු සියයකින් මත්තෙහි ශාසනයට උවදුරෙක් වන්නේ ය, අපි
103 ඊට නොපැමිණෙම්හ, ඇවැත්නි, තෙපි මේ අධිකරණයට නො එළඹුණාහ. එහෙයින් දඬුවමට සුදුසුයහ, මේ තොපට දඬුවම් නම්
104 වේ. සසුන් බැබළවීම පිණිස මහත් ප්‍රඥා ඇත්තා වූ තිස්ස නම් බ්‍රහ්ම තෙම මොග්ගලි නම් බ්‍රාහ්මණයාගේ ගෙහි පිළිසිඳ ගන්නේ ය. තොප අතුරෙන් එක්කෙනක් ඒ කුමාරයා පැවිදි කෙරේවා. එක නමක් සර්වඥ වචනය මනා කොට උගන්වාව"යි (වදාළහ.)

105 උපාලි ස්ථවිරයන් වහන්සේ ගේ සද්ධි විහාරික වූ දාසකනම් ස්ථවිර කෙනෙක, ඒ තෙරුන් සද්ධිවිහාරික වූ සෝණ නම් ස්ථවිර
106 කෙනෙක් විය. මේ සිග්ගව, චණ්ඩජ්ජි දෙදෙනා සෝණ තෙරුන් සද්ධිවිහාරිකයෝ වූහ.

(එහි පිළිවෙළ කථාව මෙසේ ය.)

107
108 පූර්වයෙහි විසාලා මහ නුවර දාසක නම් බ්‍රාහ්මණයෙක් විය. ශිෂ්‍යයන් තුන් සියයකට ප්‍රධාන වූ හෙතෙම ආචාරින් සමීපයෙහි

Non-Commercial Distribution

වසන්නේ දොළොස් හැවිරිදි වූයේහ වේදයෙහි පාරප්‍රාප්ත වූයේ ශිෂ්‍යයන්
සහිතව හැසිරෙන්නේ වාළුකාරාමයෙහි වසන්නා වූ කරණ ලද සංග්‍රහ
ඇති උපාලි තෙරුන් දූන උන්වහන්සේ සමීපයෙහි හිඳ, වේදයන්හි
109 ග්‍රන්ථි ස්ථානයක් විචාළේ ය. උන්වහන්සේ ඒ විසඳූසේක. (ඉක්බිති)
"මානවකය, සියලු ධර්මයන් අනුව වැටුණා වූ එක් ධර්මයක් වේ, සියලු
110 ධර්මයෝ එහි බැස ගණිති. ඒ ධර්මය කවරේද" යි ස්ථවිර තෙමේ
නාමය සඳහා කී සේක. මානවක තෙමේ නොදත්තේ මේ කවර
111 මන්ත්‍රයෙක්දැ යි විචාළේ ය. බුද්ධ මන්ත්‍ර යයි කියන ලදුයේ එය අපටත්)
112 දුන මැනැව යි කී යේය. අප වෙස් දරන්නෙකුට දෙමැයි කී යේය,
මන්ත්‍ර පිණිස ආචාර්‍යයන් හා මවුපියන් හා පිළිවිස මේ තෙමේ
113 මානවකයන් තුන්සියය හා සමග ස්ථවිරයන් වහන්සේ සමීපයෙහි පැවිදිව
114 සුදුසු කාලයෙහි උපසම්පන්න විය. ඒ උපාලි ස්ථවිර තෙම දාසක
ස්ථවිරයන් ප්‍රධාන කොට ඇත්තා වූ රහතුන් දහසකට ත්‍රිපිටකය ඉගැන්වූ
115 සේක. යම් කෙනෙක් ඒ ස්ථවිරයන් වහන්සේ සමීපයෙහි පිටකයන්
උද්ග්‍රහණය කළෝ ද ඒ ශ්‍රෝතාපන්නාදි ශෛක්‍ෂයන් හා පෘථග් ජනයෝ
116 ගණනින් ඉක්ම පැවැත්තහුය. කසී ජනපදයෙහි සෝණක නම් වූ
සාර්ථවාහ පුත්‍රයෙක් විය, වෙළඳාම් පිණිස මවුපියන් හා රජගහනුවරට
117 ගියා වූ පසළොස් හැවිරිදි වූ ඒ කුමාර තෙම, වේළුවනාරාමයට ගියේ
118 ය. මානවකයන් පස් පණස් දෙනෙක් උහු පිරිවරා ගියහ, එහි පිරිවර
භික්ෂු සමූහයා සහිත දාසක නම් ස්ථරවිරයන් දැක ප්‍රසන්නව පැවිදි
ඉල්වීය, ඒ ස්ථවිරයන් වහන්සේ තොපගේ මවුපියන්ගෙන් විචාරවයි
119 වදාළ සේක. ඒ සෝණක නම් කුමාර තෙම බත් තුනක් අනුභව
නොකොට මවුපියන් ලවා ප්‍රව්‍රජ්‍යාවට අනුඥා කරවා ගෙණ ආයේ ය.
120 ඒ පිරිවර කුමරුන් සමග දාසක ස්ථවිරයන් වහන්සේ සමීපයෙහි පැවිදිව
උපසම්පදා ලැබ ත්‍රිපිටකය උගත්තේ ය, ඒ සෝණක නම් යති තෙම
121 පිටකත්‍රය දන්නා වූ ක්ෂීණාශ්‍රවයන් දහසක් ඇති දාසක ස්ථවිර ශිෂ්‍ය
සමූහයාට ජ්‍යෙෂ්ඨ වූයේ ය.

122 පාටලී නම් නගරයෙහි ප්‍රාඥ වූ සිග්ගව නම් අමාත්‍ය පුත්‍ර යෙක්
වූයේ ය. අටළොස් හවුරුදු ඇති හේ තෙමේ ඍතුත්‍රයට යහපත් වූ
123 ප්‍රාසාදත්‍රයෙහි වසන්නේ චණ්ඩවජ්ජි නම් වූ යහළු අමාත්‍ය පුත්‍රයා කැටිව
124 ලාගෙණ, පුරුෂයන් පන්සියයක් විසින් පිරිවරණ ලදුයේ කුක්කුටාරාමයට
125 ගොස් සමාපත්තියට සම වැද වසන ලද ඉන්ද්‍රිය ඇතිව වැඩහුන් සෝණක
126 ස්ථවිරයන් දුටුයේ ය. වැන්ද කල කථා නොකරන්නා වූ උන්වහන්සේ
127 එහි වැඩ උන් ඒ සංඝයා විචාළේ ය. සමාපත්තියට සම වන්නෝ කථා
නොකෙරෙත් යයි ඒ භික්ෂූහු වදාළහ. කෙසේ නම් නැගිටිත්දැයි
විචාරණ ලද්දා වූ භික්ෂූහු කථනය කළෝ "ශාස්තෘන් වහන්සේ ගේ

Non-Commercial Distribution

128 කැඳවීමෙන් ද සංඝයාගේ කැඳවීමෙන් ද කාල පරිච්ඡේදව වූ පරිද්දෙන්
ද ආයුෂයාගේ ක්ෂය වීම වශයෙන් ද, නැගිටිත් යයි කියා ඔවුන්ගේ
හේතු සම්පත් දැක සංඝයාගේ වචනයක් යැවූහ, ඒ ස්ථවිර තෙම නැගිට
129 එහි වැඩිසේක. කුමාර තෙම වහන්ස කුමකැයි කථා නොකළසේක්දැයි
විචාළේ ය. අනුභව කටයුත්තක් අනුභව කළම්හයි ස්ථවිර තෙම වදාළේ
130 ය. "අපටත් අනුභව කරවුව මැනව" යි කුමාර තෙම කීයේය, අප වැනි
වූ කල්හි අනුභව කරවනු හැකිය යි ස්ථවිර තෙම වදාළේ ය."
ඉක්බිත්තෙන් මවුපියන්ගේ අනුදැනීමෙන් ඒ සිග්ගව කුමාර තෙරෙම් ද
131 චණ්ඩවජ්ජි කුමාර තෙමේ ද, ඒ පන්සියයක් පුරුෂයෝ ද සෝණක
132 නම් ස්ථවිරයන් වහන්සේ ගේ සමීපයෙහි පැවිදිව උපසම්පන්නව ඒ
133 දෙනම උපාධ්‍යායයන් සමීපයෙහිම පිටකත්‍රය ද උගත් හ, සුදුසු
කාලයෙහි ෂඩ් අභිඥා ද ලැබූහ.

ඒ සිග්ගව නම් ස්ථවිර තෙම තිස්ස කුමාරයන් පිළිසිඳීම දැන
134 එතැන් පටන් සත් අවුරුද්දක් ඒ ගෙට එළඹියේය. යවයි යන වචන
මාත්‍රයකුත් සත් අවුරුද්දක් නොලද්දේ ය, අටවෙනි හවුරුදුයෙහි (අන්
135 තැනකට ) යව යන වචනයක් එතැන දී ලද්දේ ය. ගෙට යන්නා වූ
මොග්ගලී නම් බමුණු තෙම නික්ම යන්නා වූ උන්වහන්සේ දැක අපගේ
136 ගෙයිදී කිසි දෙයක් ලද්දේ දැයි විචාළේය. හෙතෙම එසේ යයි කීයේය.
(ඒ බ්‍රාහ්මණ තෙමේ) ගෙට ගොස් විචාරා එයින් දෙවෙනි දවස්හි ගෙට
137 පැමිණි ස්ථවිරයන් වහන්සේට මුසාවාදයෙන් නිග්‍රහ කෙළේය. (වචන
මාත්‍රයක් ලැබීම සඳහා ලද්දේ යයි කියන ලද්දා වූ ) ඒ ස්ථවිරයන්
138 වහන්සේගේ බස් අසා ප්‍රසන්න වූ ඒ බමුණු තෙම තමන්ට කරණ ලද
බතින් උන් වහන්සේට නිති බතක් පැවැත්වූයේය. ක්‍රමයෙන් ඒ ගෙයි
වැසි සියලුම මනුෂ්‍යයෝ උන් වහන්සේට ප්‍රසන්න වූහ. බ්‍රාහ්මණ
තෙම උන් වහන්සේ ගෙයි වැඩ හිඳුවා සැමදාම වැළඳ වූයේ ය. මෙසේ
139 ක්‍රමයෙන් කල් ගෙවෙන කල්හි ත්‍රිවේද නැමැති සයුර පරතෙර පැමිණි
ඒ තිස්ස කුමාර තෙම සොළොස් හැවිරිදි වයස් ඇති වූයේ ය. ස්ථවිර
140 තෙම (මෙසේ මේ ගෙයි) කථා හට ගැණීමක් වන්නේ යයි සිතා ( එක්
දවසක්) බ්‍රාහ්මණ මානවකයාගේ ආසනය හැර (අන්‍ය වූ) ආසනයක්
141 අතුරුදන් කළ සේක. ඒ බ්‍රාහ්මණ මානවක තෙම බඹ ලොවින් ආ
හෙයින් ද පවිත්‍ර කැමැත්තේ ය. එහෙයින් ඔහු හිඳින පය්‍යංකය තෙම
142 වස්ත්‍රයෙන් වසා එල්වා තබනු ලැබේ. ස්ථවිරයන් වහන්සේ වැඩ සිටි
කල්හි අන්‍ය වූ ආසනයක් නොදකිමින් සම්භ්‍රම සහිත වූ ගෙයි වැසි
ජන තෙම ඒ බ්‍රාහ්මණ මානවකයාගේ ආසනය තෙරුන් වහන්සේට
143 පැණ වූයේ ය. මානවක තෙම ආචාය්‍යයන් සමීපයෙන් අවුත් එහි
144 උන්නා වූ තෙරුන් වහන්සේ දැක කිපී පරුෂ වචන කීයේ ය. ස්ථවිර
145

Non-Commercial Distribution

තෙම මානවකය කිමෙක මන්ත්‍ර දන්නෙහි දැයි ඕහට කීසේක. මානවක
තෙම එම ප්‍රශ්නය ස්ථවිරයන් වහන්සේට ප්‍රත්‍යාරෝපණය කෙළේ ය.
146 ස්ථවිරයන් වහන්සේ මන්ත්‍රදනිමැයි ප්‍රතිඥා කළ කල්හි ඒ මානවක
තෙම ස්ථවිරයන් වහන්සේගෙන් වේදයෙහි ග්‍රන්ථිස්ථානයක් විචාළේ
ය. ඒ ඉක්බිත්තෙන් ස්ථිවිර තෙම ඕහට (ඒ ප්‍රශ්නයන්) විසඳා වදාළසේක.
ඒ ස්ථවිර තෙම (පූර්වයෙහි) ගෘහස්ථ වූයේම වේදයෙහි පාරප්‍රාප්ත වූයේ
ය. ප්‍රතිසම්භිදා ප්‍රභේද ප්‍රාප්ත වූයේ ඕහට කිමෙකැයි ප්‍රකාශ
නොකරන්නේ ද? නිර්භය වූ ස්ථවිර තෙමේ ද (මානවකය තා විසින්
බොහෝ ප්‍රශ්නයන් පිළිවිසින ලද්දෙමි. මම ද එකක් තා පිළිවිසින්නෙමි
දැයි කීය. පිළිවිසිනු මැනවැයි ප්‍රතිඥා දුන් කල්හි) යමෙකුගේ චිත්තයක්
147 උපදී ද නිරුඬ නොවේ ද ඔහුගේ චිත්තය (මතු) නිරුඬ වන්නේ ය,
නූපදනේ ය. යමෙකුගේ චිත්තයක් හෝ වනාහි මතු නිරුඬ වන්නේ
148 ද නූපදන්නේ ද ඔහුගේ චිත්තය උපදන්නේ ය නිරුඬ නොවෙයි යන
චිත්තයමකයෙහි ප්‍රශ්නය විසාරද ස්ථවිර තෙමේ (මානවකයා) විචාළ
149 සේක. ඒ ප්‍රශ්නය තෙම උහුට අන්ධකාරයක් මෙන් වූයේය, හෙතෙම
මහණ මේ කවර නම් මන්ත්‍රයෙක් දැයි ඒ තෙරුන් වහන්සේට කීයේ ය.
ඒ ස්ථවිර තෙම බුද්ධ මන්ත්‍රයයි වදාළේ ය. මටද මන්ත්‍රය දෙවයි කී
කල්හි එය අපගේ වෙස් දරන්නකුට දෙමැ යි වදාළ සේක ඒ මානවක
150 තෙම මන්ත්‍ර පිණිස මව්පියන් විසින් අනු දන්නා ලද්දේ පැවිදි වූයේ ය.
ස්ථවිර තෙම (ඒ මානවකයා) පැවිදි කොට සුදුසු පරිද්දෙන් කමටහන්
151 දුන් සේක. මහා ප්‍රඥා ඇත්තේ භාවනාවෙහි යෙදෙමින් නොබෝ
152 කලකින් සෝවාන් ඵලයට පැමිණියේ ය. ඒ සිග්ගව නම් ස්ථවිර තෙම
එසේ සෝවාන් ඵලයට පැමිණි බැව් දැන චණ්ඩ වජ්ජි නම් ස්ථවිරයන්
153 වහන්සේ වෙත සූත්‍රාභිධර්මයන් උද්ග්‍රහණය පිණිස යැවූයේ ය, උන්
වහන්සේ එහිදී ඒ ඉගැන්ම කළ සේක. ඉක්බිත්තෙන් ඒ තිස්ස නම්
154 ළදරු භික්ෂු තෙම විදර්ශනා භාවනාව ආරම්භ කොට සුදුසු කාලයෙහි
ෂඩභිඥාවෙන් යුක්ත වූ අර්හත් වූ සේක, ස්ථවිර භාවයට ද ප්‍රාප්ත වූ
සේක. ඒ ස්ථවිර තෙම චන්ද්‍රයා සෙයින් ද සූර්‍ය්‍යා සෙයින් ද අතිශයින්
154 ප්‍රකට වූයේය. ලෝ වැසි තෙම උන් වහන්සේ ගේ වචනය සර්වඥයන්
වහන්සේ ගේ වචනය මෙන් සැලකූයේ ය.

මොග්ගලීපුත්ත නම් ස්ථවිරයන් වහන්සේ ගේ පහළ වීම මෙසේ යි.

එක් දිනක් උප රජ තෙමේ මුව දඩ ගියේ වනයෙහි කෙළනා
156 මුවන් දුටුයේ ය. ඒ දැක වනයෙහි තණපත් ගොදුරු කොට ඇත්තා වූ
මුවෝ පවා මෙසේ ක්‍රීඩා කෙරෙති. කිමෙක සැප වූ ආහාර විහරණ
157 ඇත්තා වූ භිකෂූහු ක්‍රීඩා නොකෙරෙද්දැයි මෙසේ සිතූයේ ය. ඒ යුවරජ
158 තෙම ගෙට ගියේ තමන් සිතිවිල්ල රජහට දන් වූයේ ය. ඕහට භගවන

Non-Commercial Distribution

පිණිස ඒ රජ තෙම සත් දවසකට රාජ්‍යය දුන්නේ ය. එම්බා කුමාරය.
159 තෝ මේ රාජ්‍යය සත් දවසක් අනුභව කරව්. ඉන් මතු තා මරවන්නෙමි.
යන මෙ වචනය ද රජ තෙම කීයේ ය. සත් දවස ඉක්මුණු කල්හි
වැහැරුණා වූ යුවරජහු දැක තෝ කුමකින් කෘශ වූයෙහිදැයි රජ තෙම
160 කීයේ ය. මරණ හේතු වෙන් වන්නා වූ භය කරණ කොට ගෙණය යි
කී කල්හි ඔහුව රජ තෙම නැවත කියන්නේ මම සත් දිනකින්
මැරෙන්නෙමැයි සිතා තෝ ක්‍රීඩා නොකෙළෙහි ය. දරුව සැම කල්හි
161 මරණ සංඥා ඇත්තා වූ මේ භික්ෂුහු කෙසේ ක්‍රීඩා කෙරෙද්ද යි කීයේ
162 ය. මෙසේ සහෝදරයා විසින් කියන ලද්දා වූ ද හෙතෙම බුද්ධ
ශාසනයෙහි ප්‍රසන්න වූයේ ය.

ඒ ප්‍රාඥ වූ යුව රජ තෙම කලෙක මුව දඩ ගොස් වෘක්ෂ මූලයෙක්
163 හි හුන්නා වූ සල් අත්තකින් ඇතෙකු විසින් පවන සලනු ලබන්නා වූ
164 සන්හුන් වූ මහා ධම්මරක්ඛිත නම් රහත් තෙරුන් දැක මේ ස්ථවිරයන්
165 වහන්සේ මෙන් මම ද බුඬ ශාසනයෙහි පැවිදිව කවර කලෙක වනයෙහි
වෙසෙම්ද යි සිතුයේ ය. ස්ථවිර තෙම ඔහුගේ ප්‍රසාද පිණිස උඩ නැගී
166 අහසින් ගොස් අශෝකාරමය බඳ පොකුණු දිය මතුයෙහි සිටිසේක්,
167 උතුම් වූ සිවුරු අහස තබා පොකුණට බැස ජලයෙන් ශරීර පර්ශේචනය
කළ සේක. උප රජ තෙම ඒ සෘද්ධි දැක අතිශයින්ම පැහැද නුවණැත්තේ
අදම පැවිදි වෙයි යි බුද්ධියක් ද කෙළේ (මහ) රජානන් කරා එළඹ ආදර
සහිත වූයේ පැවිදි පිණිස යාච්ඤා කෙළේ ය. මහීපති තෙම වළක්වනු
168 නොහැක්කේ ඔහු ගෙන මහ පිරිවරින් තෙමේ ම විහාරයට ගියේ ය.

169 හෙතෙම මහා ධම්මරක්ඛිත නම් ස්ථවිරයන් වහන්සේ සමීයෙහි
පැවිදි වූයේ ය. උහු හා සමාන සාර ලක්ෂයක් මනුෂ්‍යයෝ ද පැවිදි
170 වූහ. උහු අනුව පැවිදි වූවන්ගේ ගණනෙක් ද නොමැත්තේ ය. අග්ගි
බ්‍රහ්ම යයි ප්‍රසිද්ධ වූ රජහුගේ බෑණනුවන්ගේ රජහුගේ දියනි වූ ඒ
171 සංඝමිත්‍රාවගේ ස්වාමිපුරුෂයා වූයේ ය, ඔහුගේ පුත්‍ර තෙමේ ද නාමයෙන්
සුමන නම් ඇති වූයේ ය. හෙතෙමේම රජහට යාච්ඤා කොට යුවරජ
172 හා පැවිදි වූයේ ය, මහ ජනයාගේ වැඩ සිදුවීම ඇත්තා වූ ඒ උප
රජහුගේ පැවිදි වීම තොමෝ ඒ අශෝක මහ රජහුගේ (රාජාභිෂේකයෙන්)
173 සතර වෙනි හවුරුදු යෙහි විය, එහිම උපසපන් වූ උපනිශ්‍රය සම්පන්න
වූ ඒ යුවරජ තෙම වීයෑී වඩන්නේ ෂඩ්අභිඥා සහිත රහත් ඵලයට
පැමිණිසේ ක.

174 සියලු පුරයන්හි ආරම්භ කරන ලද්දා වූ ඒ මනහර වූ විහාරයන්
175 තුන් හවුරුද්දකින් මනා කොට නිම වුහ. කර්මාධිෂ්ඨායක වූ ඉන්දගුත්ත

Non-Commercial Distribution

නම් ස්ථවිරයන් වහන්සේ ගේ සෘද්ධි බලය කරණ කොට ගෙණ
අශෝකාරාම නම් විහාරය ද වහා නිම විය. මහීපාල තෙමේ සර්වඥයන්
177 වහන්සේ විසින් පරිභෝග කරණ ලද ඒ ඒ තන්හි ද සිත් කලු වූ චෛත්‍ය
178 කරවූයේ ය. විහාරයෝ නිමවන ලද්දාහු යි හසුන් පත් හාත්පසින්
සුවාසූ දහසක් නුවරින් එක දින ම ගෙණාවාහු ය. මහත් තේජස් සෘද්ධි
වික්‍රම ඇත්තා වූ මහරජ තෙමේ පත් හසුන් අසා සියලු ආරාමයන්
179 සම්බන්ධ වූ මහා පූජාව එක වරම කරණු කැමැත්තේ මෙයින් සත්වන
දවස්හි සියලු දේශයන්හි සියලු ආරාම පූජාව එක විට වේවා,
180 මිහිතෙලෙහි යොදුනක් යොදුනක් තන්හි මහ දන් දෙත්වා,
ග්‍රාමාරාමයන්ගේ ද මාර්ගයන්ගේ ද සැරසිලි කෙරෙත්වා, සියලු විහාරයන්හි
181 ද භික්ෂු සංඝයාට සර්ව ප්‍රකාරයෙන් ශක්ති වූ පිරිද්දෙන් මහ දන් පවත්වා,
182 පහන් මාලා මල්මාලා අලංකාරයෙන් ද ඒ ඒ තන්හි සියලු තූර්‍යයෙන්
183 ද නොයෙක් පරිද්දෙන් පූජා පවත්වත්වා, සියල්ලෝ පෙහෙවස් අංගයන්
ඉටාගෙණ ධර්මය ද අසත්වා එදවස්හි ද නොයෙක් පූජා විශේෂයන් ද
184 කෙරෙත්වා යි පුරයෙහි බෙර හැසිර වූයේ ය. සියල්ලෝ සෑම තැනම
185 සර්ව ප්‍රකාරයෙන් ආඥා කළ පමණටත් වැඩි වූ ද දෙව් ලොව සැණකෙළි
සෙයින් මනරම් වූ පූජාවන් පිළියෙළ කළහ. එදවස ඇතොවුරන් සහිත
186 වූ ඇමතියන් සහිත වූ ඇත් අස් ආදී සෙන් රැස් විසින් පිරිවරණ ලද
187 සව් අබරණින් සැරසුණු මහ රජ තෙම මිහිතල බිඳින සේ ස්වකීයාරාමයට
පැමිණයේ උත්තම සංඝයා වැඳ සඟ මැද සිටියේ ය. ඒ සමාගමයෙහි
අසූ කෙළක් භික්ෂූහු වූහ. උන් වහන්සේලා අතුරෙන් අර්හත් භික්ෂූහු
ලක්ෂයක් වූහ. එහි අනූ ලක්ෂයක් භික්ෂූණී හු ඇති වූහ. ඔවුන්
189 අතුරෙහි රහත් මෙහෙණින්නෝ දහසක් වූහ. ඒ රහතුන් වහන්සේලා
190 ධර්මාශෝක රජහුගේ ප්‍රසාදය පිණිස ලෝක විවරණ නම් ප්‍රාතිහාර්‍යයක්
කළහ. (ඒ රජ තෙම) පාප කර්ම කරණ කොට ගෙණ පූර්වයෙහි
191 චණ්ඩාශෝක යයි ප්‍රකට වූයේය. පසුව පුණ්‍ය කර්ම බලයෙන් ධර්මාශෝක
192 යයි ප්‍රකට වුයේ ය. ඒ රජ තෙම මුහුද කෙළවර කොට ඇති දඹදිව
193 හාත් පසින් ද නානා පූජායෙන් අලංකෘත වූ සියලු විහාරයන් ද දුටුයේ
ය. ඒ විහාරයන් දැක අතිශයින්ම සතුටුව හිඳ වහන්ස, බුද්ධ ශාසනයෙහි
194 කාගේ පරිත්‍යාගයක් මහත්ද යි සංඝයා විචාළේ ය. ඒ මොග්ගලිපුත්ත
නම් ස්ථවිර තෙම සර්වඥයන් වහන්සේ ජීවමාන කාලයෙහි ද තොප හා
195 සම වූ ත්‍යාගවන්තයෙක් නැත්තේ ය යි රජහුගේ ප්‍රශ්නය විසඳා වදාළේ
ය. එබස් අසා සතුටු වූ රජ තෙම මත්තෙහි ද මා වැන්නෙක් බුද්ධ
196 ශාසනයෙහි නෑයෙක් වේ ද යි නැවතත් ඒ ස්ථවිරයන් විචාළේ ය.
197 ශාසන භාර ධාරීහු ඒ ස්ථවිර තෙම මහින්ද නම් වූ රාජ පුත්‍රයාගේ ද
198 එසේ ම සංඝමිත්‍රා නම් වූ රජ දුවගේ ද හේතු සම්පත් බලා එබඳු වූ මහා
199 පරිත්‍යාග ඇත්තෙක් ද ශාසනයාගේ නෑදෑයෙක් නොවන්නේ ය.

Non-Commercial Distribution

200 නරේන්ද්‍රය, හෙතෙම ප්‍රත්‍යය දායක යයි කියනු ලබන්නේ ය. යමෙක්
තෙම වනාහි පුතෙක් හෝ දුවක් හෝ සස්නෙහි පැවිදි කරවා ද හෙතෙම
ශාසනයට දායාද වන්නේ ය. හුදෙක් දායකම නොවන්නේ යයි. රජහට
ප්‍රති වචන වදාළේ ය. ඉක්බිත්තෙන් ශාසන දායාද භාවය පතන්නා වූ
මිහිපති තෙම කිමෙක දරුවෙනි පැවිදි වන්නා හු ද ප්‍රව්‍රජ්‍යා තොමෝ
මහත් යයි දන්නා ලදූ යි එහි සිටියා වූ මිහිඳු කුමරු ද සඟමිත් කුමරිය
ද විචාළේ ය.

201 පියාණන් බස් අසා ඔව්හු දේවයන් වහන්ස! ඉදින් ඔබ කැමැති
202 සේක් නම් අදම පැවිදි වන්නෙමු. පැවිද්දෙන් අපට ද නුඹ වහන්සේට
ද ලාභය යි පිය රජාණන්ට කිවුය. ඒ මහින්ද කුමාර තෙම යුව රජහු
203 වූ කල් පටන් ද ඒ සම්මිත් කුමරි තොමෝ අග්ගි බ්‍රහ්ම කුමාරයා පැවිදි
වූ කල් පටන් ද පැවිදි වීම පිණිස කරණ ලද නිශ්චය ඇති වූ ය.
204 මහීපති තෙමේ උප රජ තනතුර මිහිඳු කුමරුහට දෙනු කැමැත්තේ ද
ඊටත් වඩා (පැවිද්දෙහි) අධික වූ ආසා යයි ප්‍රවජ්‍යාවට ම රුචි කෙළේ
205 ය. ඥාන රූප බලයෙන් ප්‍රකට වූ මහේන්ද්‍ර නම් වූ ප්‍රිය පුත්‍රයා ද
සංඝමිත්‍රා නම් දියණියන් ද පූජා සහිත කොට පැවිදි කර වූයේ ය.
206 එකල ඒ මිහිඳු නම් වූ රජ කුමාර තෙමේ විසි වසය් ඇති වූයේ ය.
207 සම්මිත් නම් වූරජ දූ තොමෝ අටළොස් හැවිරිදි වයස් ඇති විය. ඒ
කුමාරයාහට ප්‍රව්‍රජ්‍යාව ද උපසම්පදාව ද ද එ දවසම වූයේ ය. ඒ රජ
දූවට ද ප්‍රව්‍රජ්‍යය හා ශික්ෂා දානය එ දවස්හි විය. මොග්ගලිපුත්ත
208 තිස්ස නම් ස්ථවිර තෙම මිහිඳු කුමරහට උපධ්‍යාය වූයේ ය. මහාදේව
නම් ස්ථවිර තෙම පැවිදි කර වූයේ ය. මජ්ඣන්තික නම් වූ ස්ථවිර
209 තෙම වනාහි කර්මවාක්‍ය කථනය කළේ ය. ඒ ස්වකීය වූ උපසම්පදා
මණ්ඩලයෙහි ඒ මහින්ද යති තෙම සිවුපිළිසිඹියා සහිත වූ අර්හත්
ඵලයට පැමිණියේ ය. ධම්පාලා යයි ප්‍රසිද්ධ වූ මෙහෙණි තොමෝ
210 සංඝමිත්‍රා නම් කුමාරිකාවට උපාද්ධ්‍යාය විය, ආයුපාලී නම් මෙහෙණි
තොමෝ ආචාර්‍ය්‍ය විය, ඕ තොමෝ සුදුසු කාලයෙහි රහත් විය, ශාසනයට
211 පහන් වූ ලංකාද්වීපයට උපකාරී වූ ඒ දෙදෙනා ධර්මාශෝක නම් මහ
රජුගේ සවෙනි වර්ෂයෙහි පැවිදි වූහ. ලංකා ද්වීප ප්‍රසාදක වූ මහා
212 මහෙන්ද්‍ර යති තෙම උපාද්ධ්‍යායන්ගේ සමීපයෙහි තුන් හවුරුද්දකින්
පිටකත්‍රය උගත්තේ ය. චන්ද්‍ර රේඛා වක් වැනි වූ ඒ මෙහෙණි තොමෝ
213 ද සූය්‍ර්‍යා සමාන වූ මහේන්ද්‍ර භික්ෂු තෙමේ ද යන ඒ දෙදෙන ඒ කාලයෙහි
214 නිරන්තරයෙන් සර්වඥ ශාසන නමැති ආකාශය ශෝභමාන කළහ.

215 පූර්වයෙහි පැළලුප් නුවරින් නික්ම වනයෙහි හැසිරෙන්නා වූ
වනචර පුරුෂයක් තෙම කුන්ත කින්නරියක් සමග සංවාසය කෙළේ ය.

Non-Commercial Distribution

ඕ තොමෝ උහු හා සංවාසයට පැමිණ පුතුන් දෙදෙනෙක් ඉපදවිය.
දෙටු තෙමේ තිස්ස නම් ඇති විය කණිටු තෙමේ සුමිත්ත නම් විය.
සුදුසු කාලයෙහි මහා වරුණ නම් ස්ථවිරයන්ගේ සමීපයෙහි පැවිදිව
216 දෙදෙන ම ෂඩ්භිඥා ගුණ ඇත්තා වූ අර්හත් භාවයට පැමිණිය හ.
වැඩිමහල් තිස්ස ස්ථවිර තෙම පාදයෙහි ගෝණුසු විෂයකින් ස්පර්ශ
217 කරණ ලද්දේ වේදනා සහිත වූයේ ය. කණිටු වූ සුමිත්‍ර ස්ථවිරයන්
විසින් විචාරණ ලද්දා වූ ස්ථවිර තෙම ගිතෙල් පතක් බෙහෙත (ලැබිය
218 යුතු යයි) කීයේ ය. ඒ ස්ථවිර තෙම ගිලන්වතින් නමුත් රජහට දැන්වීම
ද පස්වරු වේලෙහි ගිතෙල් පිණිස හැසිරීම ද ප්‍රතික්ෂේප කළ සේක.
219 ඉදින් තෙපි පිඬු පිණිස හැසිරෙමින් ගිතෙල් ලබන්නාහු නම් එ ගෙණව
යි තිස්ස නම් ස්ථවිර තෙම සුමිත්ත නම් උතුම් ස්ථවිරයන් වහන්සේට
කී සේක. පිඬු පිණිස හැසිරෙන්නා වූ උන් වහන්සේ විසින් ගිතෙල්
220 පතක් නොලද්දේ ය. හටගත් රෝගය තෙම ගිතෙල් කළ සියයකින්
හෝ සාධ්‍ය නොකට හැකි විය. ස්ථවිර තෙම එම රෝගයෙන්ම
ආයුෂයාගේ අන්තයට පැමිණියේ අප්‍රමාදව වාදයෙන් (භික්ෂු සංඝයාට)
221 අවවාද කොට පිරිනිවන් පානට සිතූසේක. ඒ ස්ථවිර තෙම ආකාශයෙහි
හිඳ, තේජෝ ධාතු වශයෙන් රුචි වූ පරිද්දෙන් ශරීරය අධිෂ්ඨාන
222 කොට තබා පිරිනිවියේ ය. ශරීරයෙන් අග්නි ජ්වාලාවෝ නික්ම මාංස
223 භස්ම රහිත කොට ස්ථවිරයන්ගේ සකල දේහය දැවූහ. මහීපති තෙම
මේ තිස්ස නම් ස්ථවිරයන්ගේ පරිනිර්වාණය අසා ජන සමූහයා විසින්
224 පිරිවරන ලද්දේ ස්වකීය වූ අශෝකරාමයට ගියේ ය. අත් කඳ මත්තට
225 පැමිණි රජ තෙම ඒ අස්ථි ධාතූන් අහසින් පහ කොට බැස්විය. ධාතු
සත්කාර කොට ඒ (මරණ හේතු වූ) රෝගය කිමෙක් දැයි සංඝයා විචාළේ
226 ය. ඒ අසා හටගත් සංවේග ඇත්තේ නුවර (සතර) දොර සුණුවමින්
කරණ ලද පොකුණු බෙහොදින් පුරවා භික්ෂු සංඝයාට බෙහෙත් දුර්ලභ
227 නොවේ වා යි දවසක් දවසක් පාසා භික්ෂු සංඝයාට බෙහෙත් පැමිණ
වූයේ ය. සුමිත්‍ර නම් ස්ථවිර තෙම සක්මන් මළුවෙහි සක්මන් කරන්නේම
228 පිරිනිවිසේක. ඒ කරණ කොට ගෙ ද මහාජන තෙම සස්නෙහි
බෙහෙවින් පැහැදි වූයේ ය. ඒ ලොකහිතකාරීවූ කුන්ත පුත්‍ර ස්ථවිර
229 දෙදෙනා වහන්සේ ධර්මාශෝක රජහුගේ (රාජ්‍යයෙහි) අට වෙනි වර්ෂයෙහි
230 පිරිනිවන් පෑවහු ය. පසුව ප්‍රසන්න වූ ජනයෝ ද යම් හෙයකින් ලාභ
පැවැත් වූ ද, එහෙයින් එතැන් පටන් සංඝයාට ලාභ ඉතා මහත් විය.

ලාභ සත්කාර හීන වූ තීර්ථකයෝ ලාභ හේතුවෙන් තමන්ම
231 සිවුරු දරා ගෙණ භික්ෂූන් සමග විසූහ. ඔව්හු යම් සේ ස්වකීය වාදය
ද බුද්ධ වාදයයි ප්‍රකාශ කළාහු ද යම් සේ, ස්වකීය වූ ශාසනයෙන්
බාහිර වූ අග්නි හෝමාදී ක්‍රියාවන් රුචි වූ පරිද්දෙන් කළා හු ද එසේ

Non-Commercial Distribution

232 හෙයින් ස්ථිර වූ ගුණ ප්‍රකාශ ඇත්තා වූ මොග්ගලි පුත්ත නම් වූ ස්ථවිර
233 තෙම ඒ උපන් ඉතා කර්කශ වූ ශාසනාර්බුදය දැක දීර්ඝ දර්ශී වූයේ ඒ
234 ශාසනාර්බුදයාගේ ව්‍යපසමනයෙහි කාලය බලා වදාරා ස්වකීය වූ මහා
භික්ෂු සංඝයා මහෙන්ද්‍ර ස්ථවිරයන් වහන්සේට පාවාදී ගංගා නම්
235 නදියෙහි ඌර්ධව භාගයෙහි වූ අහොගංගා නම් පර්වතයෙහි විවේක
කැමැති වෙමින් සත් හවුරුද්දක් විසූයේය, තීර්ථකයන් බහුල බැවින් ද
236 දුර්වච බැවින් ද ඔවුන් අදහැමින් වළක් වන්නට භික්ෂූහු නොහැකි වූහ.
237 එහෙයින්ම දඹදිව සියලු ආරාමයන්හි භික්ෂූහු සත් හවුරුද්දක් පොහෝ
පවුරුණ නොකළහ. මහායශස් ඇති ධර්මාශෝක මහ රජ තෙම ඒ අසා
239 තෝ ගොස් මේ අධිකරණය සංසිඳුවා මාගේ ආරාමයෙහි භික්ෂු සංඝයා
ලවා පොහොය කරවව යි කියා එක් ඇමැතියෙකු උතුම් අශෝකාරාමයට
240 යැවූයේ ය. ඒ නුවණ මඳ ඇමැති තෙම ගොස් භික්ෂු සංඝයා රැස්
කරවා පොහෝ කරව් යයි රජහුගේ හස්න ඇස්විය අපි තීර්ථකයන් හා
සමග පොහෝ නොකරම් යි භික්ෂු සංඝ තෙම ඒ මූඪ චිත්තාන්විත වූ
241 ඇමැතියාහට කීය. ඒ අමාත්‍ය තෙම පොහොය කරවම්හ යි පිළිවෙළින්
තෙර කීප දෙනෙකුන්ගේ හිස් කපා හෙලුයේ ය, රජහුගේ සොහොයුරු
242 වූ තිස්ස නම් ස්ථවිර තෙම ඒ ක්‍රියාව දැක වහා අවුත් ඕහට ආසන්න වූ
අස්නෙක හුන්නේ ය. ඒ ඇමැති තෙම තෙරුන් දැක රජහට දැන්
වූයේ ය.

243 ඒ සියලු පවත් අසා හටගත් දාහ ඇති රජ තෙමේ හයින් චකිත
244 සිත් ඇත්තේ වහා ගොස් මෙසේ කරණ ලද කම් කරණ කොට ගෙණ
කවරෙකුට පාපය වේ දැයි භික්ෂු සංඝයා පිළිවිසියේ ය. ඒ භික්ෂූන්
245 අතුරෙන් කිසිකෙනෙක් පාපය තොපටය යි ද කිසි කෙනෙක් වනාහි
තොප දෙදෙනාට මය යි ද කීහු. පණ්ඩිතයෝ වනාහි පාපය තොපට
246 නැතැ යි කීහු. මහරජ තෙම ඒ අසා මාගේ විමතිය පහකොට ශාසනය
යථා ස්ථානයෙහි තබන්නට පොහොසත් ශ්‍රමණ කෙනෙක් ඇත්තේ ද
247 යි කීයේ ය. මහ රජාණෙනි, ඒ මොග්ගලී පුත්ත තිස්ස තෙරුන්
වහන්සේ ඇත්තේ යි සංඝ තෙම රජහට වදාළේ ය. රජතෙම
248 උන්වහන්සේ කෙරෙහි ආදර සහිත වූයේ ය. වෙන් වසයෙන් භික්ෂූන්
249 දහස දහසින් පිරිවරණ ලද්දා වූ ස්ථවිර සතර නමක් ද එසේම මනුෂ්‍යයන්
250 දහස දහසින් පිරිවරණ ලද්දා වූ අමාත්‍යයන් සතර දෙනෙක් ද ඒ රජ
තෙම එදවසම තමන් වචනයෙන් තෙරුන් වහන්සේ කැඳවන්නට යැවූයේ
251 ය. ඔවුන් විසින් එසේ කියන ලද්දා වූ ඒ ස්ථවිර තෙම නොවැඩි සේක.
ඒ අසා නැවත පෙර පරිද්දෙන් ස්ථවිර අට නමක් ද වෙන් වසයෙන්
දහස් පුරුෂයන් පිරිවර කොට ඇත්තා වූ අමාත්‍යයන් අට දෙනෙක් ද
යැවූ යේය. ඒ ස්ථවිර තෙම නොවැඩි සේක. කෙසේ ස්ථවිරයන්

Non-Commercial Distribution

252 වහන්සේ වඩනේදෝ හෝ යි රජ තෙම ඇසීය. භික්ෂූහු මහරජ, ස්වාමීන්
253 වහන්ස.[1] ශාසනය උසුලා ගන්නට උපස්ථම්භක වේවා යි කියන ලද්දේ
254 නම් ඒ ස්ථවිර තෙම වඩන්නේ යි ස්ථවිරයන් වහන්සේ ගේ ආගමන
කාරණය කීහු. රජ තෙම නැවත ද වෙන් වසයෙන් දහස දහස පිරිවර
255 කොට ඇත්තා වූ ස්ථවිරයන් සොළොස් නමක් හා අමාත්‍යයන් සොළසක්
ද එසේ කියා යැවූහ. මහලු බැව්හි සිටියා වූ ද තෙරුන් වහන්සේ
යානාවකට නොනඟින්නේ යයි (අසා) තෙරුන් වහන්සේ නැවකින්
ගඟෙහි ගෙණ එව්ය යි ද කීයේ ය. ඔව්හු ගොස් (තෙරුන් වහන්සේට)
එසේ කීහ. උන්වහන්සේ ඒ ඇසූ කෙණෙහිම නැඟිට වදාළේ ය.

256 නැවකින් තෙරුන් වහන්සේ ගෙණවාහු ය. රජ තෙම එහි පෙර
257 ගමන් කෙළේ ය. රජ තෙම දණක් පමණ දියට බැස ගෞරව ඇත්තේ
258 නැවින් බස්නා තෙරුන් වහන්සේට දකුණු අත දුන්නේ ය. රජහට
259 අනුකම්පාකාරී වූ දක්ෂිණාර්හ වූ ඒ ස්ථවිර තෙම රජහට අනුකම්පාවෙන්
ඒ දකුණු අත අල්වා ගෙණ නැවින් බටුයේ ය. පෘථිවීශ්වර වූ රජ තෙම
ආලය වඩන්නා වූ උයනට තෙරුන් වහන්සේ පමුණුවා තෙරුන්
වහන්සේ ගේ පාදයන්ධෝවනය කොට තෙල් ගල්වා හිඳගෙණ
260 ස්ථවිරයන් වහන්සේ ගේ සමර්ථතාවය විමසන්නේ වහන්ස මම
පෙළහරක් දකිනු කැමැත්තෙමි. යි කී යේ ය. කීමෙක් ද යි වදාළ
261 කල්හි පෘථිවි කම්පාවක් (දකිනු කැමැත්තෙමි) යි කීයේ ය. සර්ව
පෘථිවීහුගේ කම්පාවෙක් ද ප්‍රදේශ පෘථිවියක්හුගේ කම්පාවෙක් දකිනු
කැමැත්තෙහි ද යි නැවතත් තෙරුන් වහන්සේ වදාළේ ය. එයින්
262 කවරෙක් දුෂ්කර ද යි විචාරා ඒක දේශ පෘථිවිහුගේ කම්පාව දුෂ්කර යයි
263 අසා එය දකිනු කැමැති බව සැල කෙළේ ය. ස්ථවිර තෙම යොදුනක්
ඉම අතර සතර දිග රථයක, අශ්වයෙක, මනුෂ්‍යයෙක, දිය පිරූ
264 තලියෙක යන මොවුන් තබ්බවා, ඔවුන්ගේ (ඉම ඇතුළට පත්) අවයවයන්
265 සමග ඒ යොදුනක් පමණ පොළොව ඍද්ධියෙන් කම්පා කෙළේ ය,
එහි උන් රජහට ද දැක්වූයේ ය, ඒ ඇමැතියා විසින් භික්ෂූන් මැරීමෙන්
තමහට ද පාපය ඇති නැති බැව් මහ රජ තෙම ස්ථවිරයන් විචාළේ ය.
කිලුටු සිතින් වෙන්ව ඒ නිසා වන කර්මයක නැතැයි තිත්තිර ජාතකය
266 වදාරා ස්ථවිර තෙම රජහට අවබෝධ කරවීය. එහි සිත් කලුවූ රජ
267 උයනෙහි සත් දවසක් වසන්නේ යහපත් වූ සර්වඥාගම රජහට ඉගැන්
268 වූයේය. රජ තෙම එම සත් දවසෙහි යක්ෂයින් දෙදෙනෙකු යවා
පොළෝ තෙළෙහි සියලු භික්ෂූන් එක්තන්හි රැස්කර වූයේ ය. සත් වන
දවස්හි සිත් කලු වූ සිය අරමට පැමිණ නිරවශේෂ වශයෙන් භික්ෂූ
සංඝයා රැස් කර වූයේ ය.

Non-Commercial Distribution

269 ස්ථවිරයන් වහන්සේ සමග තිරය තුල එක් තැනෙක හුන්නාවූ
270 මිහිපති තෙම, එක එක ලබ්ධි ඇත්තා වූ භික්ෂූන් සමීප යට කැඳවා
ගෙණ වහන්ස සර්වඥයන් වහන්සේ කිනම් වාද ඇත්තේ දැයි විචාළේය.
271 ඔව්හු ස්වකීය වූ පරිද්දෙන් ශාශ්වතාදි දෘෂ්ටි ප්‍රකාශ කළෝ ය. ඒ සියලු
මිථ්‍යාදෘෂ්ටිකයන් රජ තෙම සිවුරු හැරවූයේ ය.

272 සිවුරු හරවන ලද සියල්ලෝ සැට දහසක් වූහ. සුගත තෙම
කිනම් වාද ඇත්තේ දැයි ධාර්මික භික්ෂූන් විචාළේ ය. විභජ්ජවාදී
273 භාවය උන් වහන්සේලා කීහු, මහීපති තෙම වහන්ස සර්වඥ තෙම
විභජ්ජවාදී ද යි ස්ථවිරයන් විචාළේ ය. ඒ ස්ථවිර තෙම එසේ ය යි
274 වදාළේ ය. එකල ඒ අසා සතුටු සිත් ඇත්තා වූ රජ තෙම යම් හෙයකින්
සංඝ තෙම ශෝධිත ද, එහෙයින් වහන්ස සංඝ තෙම පොහෝ කෙරේව
275 යි මෙසේ තෙරුන් වහන්සේට කියේ ය. සංඝයාට ආරක්ෂා දී මහීපති
තෙම යහපත් නුවරට ප්‍රවිෂ්ට වූයේ ය.

276 එකල සංඝ තෙම සමගි පොහොය කෙළේ ය, ස්ථවිරයන්
වහන්සේ නොයෙක් සංඛ්‍යා ඇති භික්ෂූ සංඝයා අතුරෙන් විසාරද වූ
277 ෂඩ්අභිඥා ඇත්තා වූ ත්‍රිපිටකධාරී වූ ප්‍රභේද ප්‍රාප්ත ප්‍රතිසම්භිදා ඇති
278 භික්ෂූන් දහසක් ධර්‍ම සංගායනා කරණු පිණිස තෝරා ගත්තේ ය. උන්
වහන්සේ ලා සමග අශෝකාරාමයෙහි ධර්‍ම සංගීතිය කළේ ය. මහා
කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ද යස ස්ථවිරයන් වහන්සේ ද යන ඒ
ස්ථවිරයෝ තුමූ යම්සේ ධර්‍ම සංගායනා කර වූ ද, මොග්ගලි පුත්ත
279 තිස්ස ස්ථවිර තෙමේ ඒ ධර්‍ම සංගායනාව එසේම කර වූයේ ය. පරවාද
280 මර්ධනය කරන්නාවූ කථා වස්තු ප්‍රකරණය, ඒ සංගිති මණ්ඩලයෙහි
281 තිස්ස ස්ථවිරයන් වහන්සේ ම වදාළේ ය. මෙසේ ධර්‍මාශෝක මහරජුගේ
ආරක්ෂාව කරණ කොට ගෙණ භික්ෂූන් දහසක් විසින් මේ ධර්‍ම සංගීත
282 තොමෝ නව මසින් නිම වන ලද්දේ ය. රජහුගේ (රාජ්‍යාභිෂේකයෙන්)
සතළොස් වන වර්ෂයෙහි දෙසැත් තෑ වස් ඇත්තා වූ ඒ සෘෂි තෙම
මහා පවාරණයෙහි දී සංගායනාව සමාප්ත කරවූයේ ය. ශාසන ස්ථිති
හේතුවෙන් සාධුකාර දෙන්නියක මෙන් සංගීති අවසානයෙහි මහ
පොළෝ තොමෝ කම්පිත විය.

283 ඒ මොග්ගලි පුත්ත තිස්ස නම් වූ ස්ථවිරයන් වහන්සේ මනෝඥ
ශ්‍රේෂ්ඨ වූ බ්‍රහ්ම විමානය ද හැර ශාසනය හේතු කොට පිළිකුල් වූ
මිනිස් ලොවට අවුත් කරණ ලද කටයුතු ඇත්තේ ශාසන කෘත්‍යය
කෙළේ ය. අන්‍ය වූ කවරෙක් ශාසන කෘත්‍යයෙහි ප්‍රමොදාපේත වේ ද?

Non-Commercial Distribution

# හය වෙනි පරිච්ඡේදය

1 අතීත කාලයෙහි වඟුරට වඟු නුවර වඟුරජෙක් විය. කලිඟු රජු
2 දුවක් ඒ රජහට මෙහෙසී වූවා. ඒ රජ තෙමේ එම දේවිය ගෙන් එක්
දුවක් ලැබී නෛමිත්තිකයෝ සිංහ රාජයෙකු හා ඇයගේ සංවාසය
3 කිවුය. ඉතා රූපත් වූ අතිශයෙන් කාමයෙන් ගිජු වූ (ඕ තොමෝ) රජය
දේවිය යන දෙදෙනා විසින් ලජ්ජාවෙන් පිළිකුල් කරණ ලද්දීය.

4 ඕ තොමෝ ස්වච්ඡන්දවෘත්ති සුව කැමැත්තී හුදකලාව අප්‍රසිද්ධ
වේශයෙන් පිටත්ව මගධ රට බලා යන වෙළඳ සමූහයක් කැටීව ගියාය.
5 ලාට රට අඩ වියෙහි දී සිංහයෙක් තෙමේ වෙළඳ සමූහයා වෙත දිව
ආය. (ඉස් ලූ ලූ අත දුවන්නාහු) සෙස්සෝ අනික් දිගකට දිවූහ. ඒ
කුමාරිකා සිංහයා ආ දිගට දිව්වා ය. සිංහ තෙමේ ගොදුරු ගෙණ
6 (පෙරලා) යන්නේ දුරදීම ඇය දැක සිත් ඇල වූයේ කන් හෙලා ගෙණ
නගුට සලමින් සමීපයට ආය. ඕ තොමෝ උහු දැක අසන ලද
7 නෛමිත්තික වචනය සිහි කොට බිය නුවූවා ආසා වඩවමින් ඒ
8 සිංහයාගේ අවයවයන් පරාමර්ශනය කළා හෝ අත ගෑය. සිංහ තෙමේ
ඇයගේ පහසින් ඉතා ඇළුණේ පිට නගා ගෙණ වහා සිය ගුහාවට
9 ගෙණ ගොස් ඇය හා සහවාසයෙහි හැසුරුණේ ය. ඒ රජ දූ තොමෝ
උහු හා සංවාසය කරන කොට ගෙන සුදුසු කාලයෙහි පුතෙකු දුවකැයි
10 කියා නිඹුල් දරු දෙදෙනෙක් වැදූවා. පුත්‍රයාගේ හස්තපාදයෝ සිංහාකාර
11 වූය, එහෙයින් ඔහු සිංහබාහු යයි නම් කළාය. දුව සිංහසීවලී යයි නම්
කළාය. සොළොස් විය පැමිණි ඒ පිත් තෙමේ මෑනියෙනි, නුඹ හා අප
12 පියාත් කවර හෙයින් අසමානයෝ දැයි සිත සැකය මෑණියන් විචාළේ
ය. ඒ මවු තොමෝ ඔහුට සියල්ල කීවා. ඒ තෙමේ කුමක් හෙයින්
මිනිස් පියසට නොයමෝ දැයි කීය. ඕ තොමෝ තාගේ පියා ගලෙකින්
13 ගුහාව වසයි. (එහෙයින් යා නොහෙම්හ) යි කීවාය. එ කුමාර මහ
14 ගුහා දොර වසන ගලකර නගා ගෙණ එක් දවසින්ම පණස් යොත්තක්
යාම් ඊම් කෙළේ ය. සිංහයා ගොදුරු පිණිස ගිය කල දකුණු කර
15 මෑණියන් ද වම් කර නැගණියන් ද තබා ගෙණ වහා ඒ ගුහාවෙන් පළා
ගියේ ය. ඔව්හු කොළ හැඳ ගෙණ පසල් ගමකට අවුය. එකල ඒ
16 පසල්ගම රජ දුව මයිල්හු පිත් වඟුරජු සෙනෙවියා සිටියේ විය. ඒ
17 තෙමේ කර්මාන්ත විධාන කෙරෙමින් නුග රුකක් මුල හුන්නේ ය.
උන් දැක තෙපි කවුරුදැ යි විචාළේ ය. ඔව්හු අපි වෙනෙහි වසන්නමෝ
ය යි කීවුය. ඒ සෙනෙවි තෙමේ ඔවුන්ට වස්ත්‍ර දෙවීය.

Non-Commercial Distribution

18 ඒ වස්ත්‍රයෝ මහඟු වූහ. පර්ණයන්හි බත් දෙවීය, ඔවුන් පිනින්
19 ඒ පර්ණයෝ රන් බඳුන් වූහ. එයින් විස්මිත සෙනෙවි තෙමේ තෙපි
කවුරුදැ යි (නැවත ද) විචාළේ ය. ඒ රජ දූ තොමෝ (තමා) ජාති
20 ගෝත්‍රයන් ඔහුට දැන්වූය. ඒ සෙනෙවි තෙමේ ඇවැස්ස නැන්දනියන්
දියනි වූ ඇය ගෙණ වඟු නුවර ගොස් ඇය සමග වාසය කෙළේය.

21 සිංහ තෙමේ වහා ගුහාවට ගොස් ඒ තුන් දෙනා නොදැක පුත්‍ර
ශෝකයෙන් පෙළුණේ නොම කෑයේ ය. නොම බිවේය. ඒ දරුවන්
22 සොයමින් ප්‍රත්‍යන්ත ග්‍රාමයන්ට ගියේ ය. ඒ සිංහ තෙමේ යම් යම්
ගමකට වදනේ නම් ඒ ඒ ගම සිස්වෙයි. පසල් දනව් වැස්සෝ ගොස්
23 රජහට දේවයෙනි සිංහයෙක් තෙමේ ඔබගේ රජය පෙළයි ඔහු වැළැක්වූව
මැනැව යි එ පුවත රජහට දැන්වූහ. ඒ තෙමේ සිංහයා නසන්නකු
24 නොලබමින් දහසින් බැඳි පියල්ලක් ඇත් කඳ තබා සිංහයා දෙන
25 තැනැත්තේ ගණීව යි නුවර (බෙර) හැසිැවී, නරේශ්වර තෙමේ
දෙදහසෙක තුන් දහසෙකැයි එසේම (බෙර) පියවි කරවී. මව් තොමෝ
26 දෙවරෙක ඒ සිංහබා කුමාර වැළකුවා තුන් වන වර ඒ සිංහබා කුමර
27 මවු නොවිචාරාම සිය පියහු මරන්ට ඒ (රන්) තුන් දහස ගත්තේ ය. රජ
හට කුමරු දැක්වූහ. රජ තෙමේ ඔහුට ඉඳින් තා විසින් සිංහ තෙමේ
28 ගන්නා ලැබේ නම් එම රට තට දෙමැ යි මෙසේ කීයේ ය. කුමර
29 තෙමේ ඒ ලෙණ දොරට ගොස් පුත්‍ර ප්‍රේමයෙන් එන ඒ සිංහයා දුර දී
දැක විදිනට හීයක් යැවීය. හීය තෙම නළල වැද උහු මෙත් සිතින්
30 පෙරලා අවුත් කුමරහු පාමුල්හි බිම හිණි. තුන් යල දක්වා එසේම විය.
පසුව මෘග රාජ තෙම කිපීයේ ය. ඉක්බිති යවන ලද හීය තෙමේ උහු
31 සිරුර විනිවිද නික්මිණි කුමාර තෙමේ කේශර සහිත සිංහ ශීර්ෂය ගෙණ
32 පුරයට ගියේ ය. එකල වඟු රජු මළ සත් දවසක් විය. රජ තමා අපුත්‍රක
බැවිනුත් මොහුගේ කර්මයෙන් ප්‍රසිද්ධ බැවිනුත් රජහු මුනුබුරු බැව්
33 අසාත් මවු කුමරිය ද හැඳිනගත් සියලු ඇමතියෝ රැස්ව එක් සිත් ව
සිංහබා කුමරහට රජ වව යි කී වෝ ය. හේ තෙමේ රජය පිළීගෙණ
34 මැණියන් වල්ලභයාට එය පාවාදී සිංහ සීවලිය ගෙණ තෙමේ ජාති
35 භූමියට ගියේ එහි නුවරක් ඉදි කෙළේ ය, ඒ සිංහ පුර නම් වී, සියක්
යොදුන් වෙනෙහි ගම් ද පිහිට වී. ලාට රට ඒ නුවර සිංහබා රජ
36 තෙමේ සිංහ සීවලිය මහේසිකා කොට ගෙණ රජය කෙළේ යි. ඒ
37 මෙහෙසි තොමෝ සොළොස් වරෙක පුතුන් දෙදෙනෙක් දෙදෙනෙක්
බැගින් සුදුසු කාලයෙහි වැදුවා, දෙටු පිත් තෙමේ විජය නම, දෙවැන්නා
38 සුමිත්‍ර නම, රජ තෙමේ විජය කුමර සුදුසු කල උප රජයෙහි අභිෂේක
කෙළේ යි.

Non-Commercial Distribution

39 විජය තෙමේ විසම ආචාර ඇති විය. ඔහු පිරිස ද එසේ වූය. ඔව්හු ඉවසිය නොහෙන නොයෙක් බලාත්කාරකම් කළෝ ය. කිපි
40 මහජන තෙමේ රජහට එපවත් දැන්වීය. රජ තෙමේ ඔවුන් කටයුතු හඟවා පුතුට මනාකොට අවවාද කෙළේ ය. දෙවෙනි වර ද සියල්ල
41 සේ විය. තුන් වන වර වනාහි කිපී මහජන තෙමේ ඔබ පුතු මැරුව
42 මැනැවැ යි රජහට කීය. ඉක්බිති රජ තෙම ඒ විජය කුමර ද ඔහුගේ ඒ පිරිස ද (යන) සත් සියයක් මිනිසුන් අඩක් (ඉස්) මුඩු කරවා නැවක
43 දම්මවා සමුදුර යැවීය, එසේම ඔවුන්ගේ භාර්‍යාවන් ද එසේම කුමරුන් ද (මුහුදු යැවීය) වෙන වෙනම දමන ලද්දා වූ ඒ පුරුෂ ස්ත්‍රී කුමරුවෝ
44 වෙන් වෙන් දිවයින්හි බැස්සෝ ය. (එසේම) වාසය කළෝ ය. කුමරුවන්
45 පිහිටි දිවයින මහින්ද්වීපය යයි වී. විජය තෙමේ සුප්පාරක නම් පටුන බැස ගත්තේ ය, මෙහි පිරිසගේ බලාත්කාර ක්‍රියාවෙන් භය වූයේ
46 නැවතත් නැව් නැංගේ ය. ස්ථිර බුද්ධි ඇති විජය නම් කුමර ලංකායෙහි
47 හෝ තාම්‍රපර්ණි ද්වීපයෙහි යමක ශාලාන්තරයෙහි හෙවත් සලරුක් දෙදෙනා අතුරෙහි තථාගතයන් පිරිනිවන් පිණිස සැතපුණු දවස බටුයේ ය.

මෙතෙකින් හු දී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස විජයාගමන නම් සවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හත්වෙනි පරිච්ඡේදය

1 සියලු ලෝ වැස්සාට වැඩ කොට පරම ශාන්ති කාලයට පැමිණ
පිරිනිවන් මඤ්චකයෙහි හොත්තා වූ ලෝහිමි වූ වාදීන් අතුරෙන් ශ්‍රේෂ්ඨ
2 වූ මුනි තෙමේ මහත් වූ දේව සමාගමයෙහි දී එහි සමීපව සිටි ශක්‍රයාහට
3 වදාරණ සේක් සිංහබා රජු පිත් තෙල විජය කුමර අනුගත සත් සියයක්
4 පිරිවර ඇතිව ලාට රටින් (අවුත්) ලක්දිව් බැස්සේ ය. දේවේන්ද්‍රය
මාගේ සස්න ලක්දිව්හි පිහිටින්නේ ය. එහෙයින් පිරිවර සහිත උහුද
ලංකාව ද මොනවට රකුව" යි වදාළ සේක.

5 දේවේන්ද්‍ර තෙමේ තථාගතයන් බස ගෞරවයෙන් ඇසූයේම
උපුල්වන් දෙව් රජහට ලංකාරක්ෂාව භාර කෙළේ යි. ඒ තෙමේ
6 ශක්‍රයා විසින් කී පමණින් එකෙණෙහි ලක්දිව් අවුත් පරිබ්‍රාජක වේශයෙන්
7 රුක් මුලෙක හුන්නේ ය. විජය කුමාරයා ප්‍රධාන කොට ඇති සියල්ලෝ
8 උහු වෙත අවුත් පින්වත්නි ! මේ තෙමේ කවර දිවයිනෙක් ද යි විචාළෝ
ය. හේ තෙමේ ලක්දිව යයි කියා මිනිස්සු මෙහි නැත්තාහු යයි ද
9 තොපට භයෙක් නොවන්නේ යයි ද කීය. මෙසේ කියා කෙණ්ඩියෙන්
ඒ මිනිසුන් පිරිත් පැන් ඉස උන් අත්හි (පිරිත්) හූ ද බැඳ අහසින්
ගියේ ය.

10 පිරිවර යකින්නක් බැලි රුවින් තමා දක්විය. උන් අතුරෙන්
11 එකෙක් රජ පිත්හු විසින් නවතනු ලදුයේත් "ගම් ඇති කල බල්ලෝ
ඇතිවන්නාහ" යි ඇය පසුපස්සෙහි ගියේ ය. ඇයගේ ස්වාමී දූවූ
කුවේණී නම්යකිනි තොමෝ කපු කටනා තවුසියක් සෙයින් එහි රුක්
12 මුලෙක හුන්නා ය. ඒ තෙමේ පොකුණ ද හුන් තවුසිය ද දැක එහි නහා
13 පැන් බී නෙලුඹලද පොකුරු පතින් දිය ද ගෙණ ගොඩ නැංගේ ය. ඕ
තොමෝ ඔහුට මාගේ ගොදුරු වූයෙහි සිටුව යි කීවා ය. ඒ මිනිස්
14 තෙමේ බඳනා ලද්දෙකු සේ සිටියේ ය. ඕ තොමෝ පිරිත් හුයෙහි
15 තේජසින් (මිනිසා) කන්නට අසමර්ථ වි යකිනිය විසින් ඉල්ලනු ලබන්නා
වූ ද මිනිස් තෙමේ ඒ හූය නුදුන්නේ ය. යකිනි තොමෝ හඬමින් සිටි
උහු ගෙණ උමගෙක බැහීය, මෙසේ එක එකා බැගින් සත් සියයම ඒ
උමග බහාලීය.

16 සියල්ලන් නේන කල භයෙකැයි සැක කළා වූ විජය කුමර තෙමේ
සැරහුණු පසවි ඇත්තේ මනා පොකුණ දැක ගොඩ නැගි පියවර
17 සටහන්දිටී ඒ තවුසිය ද දුටුයේ ය. කීමෙක් ද මැය විසින් මාගේ
භටයෝ ගන්නා ලදුවෝ දෝ යි සිතා කිමෙක් ද පිනැත්තිය තී මාගේ

Non-Commercial Distribution

හටයන් නුදුටුයෙහි දැයි ඇයට කීයේ ය. ඕ තොමෝ රාජ
18 කුමාරයානෙනි ! හටයන් ගෙන් කාරිය කිම් පැන් පුව මැනව නැහැව
19 මැනව යි කීවා "යකිනි තොමෝ නිශ්චයෙන්ම මාගේ ජාතිය දන්නීය යි
නිසැක වූ ඒ තෙමේ සිය නම අස්වා වහාම දුන්න සරසා ගෙණ වෙත
20 එළඹියේ නාරාච වලයෙන් බෙල්ලෙහි යකින්න ගෙණ වමතින්
කෙස්වැටිය ගෙණ දකුණතින් කඩුව අමෝරා කෙල්ල මාගේ මිනිසුන්
21 දෙව තී මරමී යි කියේ ය. ඒ යකිනි තොම බියෙන් බැගෑ වූවා ස්වාමිනී
මා දිවි දුන මැනව මම ඔබට රජය දෙන් නෙමි. ස්ත්‍රී කෘත්‍යයන් අනික්
22 කිසිවකුත් කැමති පරිද්දෙකින් කරන්නෙමැ" යි කියා දිවි ඉල්විය. ඒ
23 කුමර අද්‍රෝහ පිණිස යකිනිය සපථ කරවී. වහා මිනිසුන් ගෙණව යි කී
පමණින් ම ඕ තොමෝ ගෙණවා මොව්හු බඩසා ඇත්තාහ යි කියන
24 ලද්දා වූ ඕ තොමෝ කන ලද වෙළඳුන්ගේ නැව්හි වූ නානාවිධ වූ
25 බොහෝ වූ සහල් ආදිය දක්වීය. ඒ මිනිස්සු බත් හා සූපයන් හූයා රජ
කුමරහු බත් කවා සියල්ලෝ ද කෑවෝ ය.

26 විජය කුමරහු විසින් දෙවන ලද අග්‍රභාගය කා පිනා ගියා වූ
27 යකිනි තොමෝ සොළොස් හැවිරිදි සිත් ගන්නා රුවක් මවා ගෙන සව්
බරණින් සැරහුණි රජ කුමරු වෙත එළඹියා ය. රුක් මුලෙක තිරයෙන්
28 මොනවට හාත්පස අවුරණ ලද්දා වූ වියනින් මනාව අලංකෘත වූ මාහැඟි
29 යහනක් ද මැවීය. රජ කුමර ඒ දැක අනාගත අභිවෘද්ධිය බලන්නේ ඈ
හා සමග වාසය කොට යහනෙහි සැප සේ හොත්තේ ය. පිරිවර සියලු
මිනිස්සු තිරය සිසාරා හොත්තෝ ය.

30 රාත්‍රි භාගයෙහි ඒ කුමර තූර්‍ය නාද සහිත ගී හඬක් අසා කවර
31 ශබ්දයක් දැයයි එක්ව නිදන යකිනිය විචාළේ ය. සියලු යකුනුදු මරවා
32 රාජ්‍යයත් ස්වාමියාහට දිය යුත්තේ ය. අවශ්‍යයෙන්ම මනුෂ්‍යාවාස
හේතුයෙන් යක්ෂයෝ මා මරන්නා හ මෙසේ සිතා ඒ යකිනි තොම
රජ කුමරහට (කියන්නී) ස්වාමීනි, මෙහි මේ යක්ෂ පුරය ශිරීෂවස්තු
33 නම, එහි දෙටු යකු පිණිස ලංකා නගර වාසී වූ කුමරියක් මෙහි ගෙණෙන
ලද්දීය. ඇයගේ මවු ද ආවා, ඒ කැඳවා එන මඟුල්හි මෙහි ද මහත්
34 උත්සව පවතී, මේ එහි ශබ්ද යයි මේ සමාගමය මහත්මැයි අදම
35 යකුන් මැරුව මැනව මින් මත්තෙහි නොහැක්කැ යි කීවා ය.
36 කුමර "අදෘශ්‍යමාන ඒ යකුන් මම කෙසේ මරම්දැ" යි කීයේ ය. "යම්
තැනෙක ශබ්ද කෙරෙම් නම් ඒ හඬින් ගැසුව මැනව ආයුධය තෙමේ
37 මාගේ ආනුභාවයෙන් උන්ගේ කයෙහි හෙන්නේය" යි ඇගේ බස අසා
එසේ කොට සියලු යකුන් මැරීය. තෙමේ ද ලබන ලද ජය ඇත්තේ
38 යක්ෂ රාජයාගේ ආභරණ පැලැන්දේ ය. සෙසු ආභරණයෙන් ඒ ඒ

Non-Commercial Distribution

39 භටයන් ද පැළඳ විය. කීප දවසක් මෙහි වැස තාම්‍රපර්ණයට එළඹීයේ
ය. විජය කුමාර තෙමේ තාම්‍රපණී නගරය ඉදි කොට ඇමැතියන් විසින්
පිරිවරණ ලදුයේ යකිනිය හා විසීය.

40 එකල්හි නැවින් ගොඩබටුවා වූ විජය කුමාර ආදීහු ක්ලාන්ත
41 වූවෝ අතින් භූමියෙහි ස්පර්ශ කොට හිඳ ගත්තෝ ය. යම් හෙයකින්
තඹවන් අත්ල ඇති වී ද, එහෙයින් ඒ දේශය ද දිවයින ද ඒ නම්
ඇත්තේ හෝ තාම්‍රපර්ණී නම් විය. ඒ සිංහ බාහු නරේන්ද්‍ර සිංහයා
42 ගත්තේ ය. එහෙයින් සිංහල නම් වී ඔහු හා සම්බන්ධ ඇති මේ
සියල්ලෝ ද සිංහලයෝ යි.

43 ඔහුගේ ඇමැතියෝ ඒ ඒ තැන ගම් පිහිට වූහ. අනුරාධ නම්
ඇමැති තෙමේ කොළොම් හෝ ඉවුරෙහි අනුරාධ නම් ගම පිහිට විය.
44 පෙරවි උපතිස් තෙමේ අනුරාධ පුරයෙන් උතුරු දිග ගම්භීර නදී තීරයෙන්
උපතිස්ස ග්‍රාමය ඉදි කෙළේ ය. අනික් ඒ ඇමැතියෝ තුන් දෙනෙක්
45 උදේනිය, උරුවේලාය එසේම විජිතනගර යයි යන වෙන වෙන ගම්
ඉදි කළෝ ය. ජනපද පිහිටුවා සියලු ඇමැතියෝ රැස්ව ඒ කුමරහට
46 ස්වාමීනි ! රාජ්ජයෙහි අභිෂේක කරව යි කීහ. මෙසේ කියන ලද රජ
47 කුමර තෙමේ ක්ෂත්‍රිය කන්‍යා මෙහෙසියකගේ අභිෂේකයක් නැතිව
අභිෂේකය නොකැමති විය.

48 වැලි ඒ ඇමැතියෝ ස්වාමිහුගේ අභිෂේකයෙහි කරණ ලද ආදර
ඇත්තෝ දුක සේ කට හැකි කර්තව්‍යයෙහි ද ඒ අර්ථ සිද්ධියෙහි බය බව
49 ඉක්ම වූවෝ ස්වාමියා කෙරෙහි භක්ති ඇත්තාහු ස්වාමී වූ විජය කුමරුහට
පඬි රජු දියනියන් පිණිසත් ඇමැති වර්ගයාහට සෙස්සන් දූන් පිණිසත්
50 මිණිමුතු ආදී මහාසාර බොහෝ පඬුරු ගන්වා මදුරා පුරයට දූතයන්
51 යැවූහ. ඒ රාජ දූතයෝ වහා නැවින් මදුරාපුර ගොස් පඬුරු ද ලියුම් ද
52 ඒ රජ හට දැක්වූය. පසුව රජ තෙමේ ඇමතියන් හා මන්ත්‍රණය කොට
සිය දියනියන් හා අනික් ඇමැතියන්ගේ දූනුත් එවනු කැමැති වූයේ
53 එකුන් සියයක් කන්‍යාවන් ලැබ නැවත ලංකාවට දූන් යවනු කැමැත්තා
54 වූ මේ මධුරා වැසි මිනිස්සු දූන් දෙගුණයක් සරසා ගෘහ ද්වාරයන්හි
හිඳුවත්වා ! ඒ ලකුණෙන් උන් ඇර ගන්නෙමු යි බෙර පියව් කරව්.

55 මෙසේ ම බොහෝ කන්‍යාවන් ලැබ ඒ කුලයන් සතප්පා සැපයූ
56 සර්වාලංකාර ඇති පිරිස් සහිත දියනියන් හා සුදුසු පරිද්දෙන් ලබන ලද
සත්කාර ඇති ඒ සියලු කන්‍යාවන් ද රාජාර්හ වූ හස්ත්‍යශ්ව රථප්‍රෙෂ්‍ය
කාරකයන් ද අටළොස් ශිල්පි සමූහයන් ගෙන් කුල දහසක් ද සතුරන්

Non-Commercial Distribution

57 දිනූ විජයරජ හට ලියමන් දී එවූයේ ය. ඒ සියලු මහාජන තෙමේ
58 නැවින් (අවුත්) මහතොට ගොඩ බටුයේ ය. එහෙයින්ම ඒ පටුන
මහතොට යයි "මාන් තොට්ටම්" කියනු ලැබේ.

59 විජය කුමරහට දා ඒ යකිනියගේ පුතෙක් ද දුවක් ද වූහ. විජය
60 කුමාර තෙමේ රාජ කන්‍යාව ආ බැව් අසා යකිනියට සොඳුර දරුවන්
දෙදෙනා තබා තී දූන් යා මනුෂ්‍යයෝ සැම කල්ම අමනුෂ්‍යයන්ට බානහ
61 යි කීය. ඒ අසා යක්ෂ භයින් භය වූ ඒ යකින්නට තිට දහසකින් බලිදානය
62 කරවමි ශෝක නොකරව යි කීයේ ය. භය වූ ද ඕ තොමෝ නැවත
නැවත ඔහු යාච්ඤා කොට දරු දෙදෙනා ගෙණ යායුතු අතක් නැති
63 බැවින් ලංකා පුරයට ගියා ය. පුතුන් බැහැර හිඳුවා තොමෝ නුවරට
64 වන්නා ය. ඒ යකින්න හැඳින සෙර යයි (සතුරු පක්ෂ) සංඥා ඇති භව
වූ ලංකා පුරයෙහි යක්ෂයෝ කැළඹුණෝ ය. එක රෞද්‍ර යක්ෂයෙක් වූ
කලී එක් අතුල් පහරකින්ම යක්ෂණිය මැරූයේ ය.

65 ඇයගේ මයිල් යක්ෂ තෙමේ නුවරින් බැහැර නික්මුණේ ඒ දරු
දෙදෙනා දුක තෙපි කවුරුන්ගේ දරුවෝ දූයි පිළිවිසි යේ ය.
66 කුවේණියගේ යයි අසා මෙහි දී තොපගේ මවු මරණ ලද්දීය, තොපත්
දුක මරන්නා හ, වහා පලායෙත්ව යි කීයේය. ඔව්හු එයින් වහා පලා
67 ගොස් සමන් කුළට ගියෝ ය. ඒ දෙටු තෙමේ තරුණ වූයේ ඒ නැගණියන්
68 සමග වාසය කෙළේ ය. ඔව්හු ද පුතුන්ගෙන් වැඩි ඒ කඳුරටම විසූහ.
මේ තෙමේ වැද්දන්ගේ උත්පත්තියි.

69 පඬි රජහුගේ ඒ දූතයෝ (ගෙණා) පඬුරු ද ඒ රජුදුන් ආදිය ද
70 විජය කුමරුහට පැමිණ වූහ. විජය කුමර තෙමේ දූතයන්ට සත්කාර
සම්මාන කොට ඇමැති සමූහයාට සුදුසු පරිද්දෙන් කන්‍යාවන් පාවා
71 දුන්නේ ය. තව ද සියලු ඇමැතියෝ රැස්ව විධි වූ පරිද්දෙන් විජය
කුමරු රාජ්ජයෙහි අභිෂේක කළෝ ය. මහ සැණකෙළි ද කෙළියහ.
72 ඉක්බිති විජය රජ තෙමේ පඬි රජු දියනියන් මහ පෙරහරින් මෙහෙසි
73 බැව්හි අභිෂේක කෙළේ යි. ඇමැතියන්ට වස්තු දුන්නේ ය. එසේම
මයිල (රජ) හට වනාහි අවුරුදු පතා දෙලක්ෂයක් වටිනා සක් මුතු
දුන්නේ ය.

74 ඒ විජය නරශ්‍රේෂ්ඨ තෙමේ පළමු විෂම හැසිරීම් හැර දැහැමෙන්
සෙමෙන් මුළු ලක්දිව අනුශාසනා කෙරෙමින් පුරා අටතිස් හවුරුද්දක්
තාම්‍රපර්ණී නගරයෙහි රජකම් කෙළේ ය.

මෙතෙකින් හු දී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස
විජයාභිෂේක නම් වූ සත්වන අදියර නිමි.

Non-Commercial Distribution

# අට වෙනි පරිච්ඡේදය

1 ඒ විජය මහ රජ තෙමේ අන්තිම වස්හී සිටියේ මම වෘද්ධයෙමි.
මාගේ පුතෙක් නැත්තේ ය. දුකසේ පිහිටුවන ලද මේ රට මා ඇවෑමෙන්
2 නස්නේ ය, එහෙයින් රජය පිණිස මා මල් සුමිත් කුමරහු
3 ගෙන්වන්නෙමැයි මෙසේ සිතුයේය. ඉක්බිති ඇමැති යන් හා මන්ත්‍රණය
කොට එහි හසුන්පත් යැවුයේ ය. විජය තෙමේ හසුන් දී නොබෝ
කලකින් දෙව්ලෝ ගියේ ය.

4 ඔහු මළ කල ඒ ඇමතියෝ රජ කුමරෙක් එනු බලන්නාහු උපතිස්ස
5 ගම වෙසෙමින් රට අනුශාසනා කළෝ ය. විජය රජු මළ කල රජ
6 කුමරුවන් ඊමෙන් පළමු කොට එක් අවුරුද්දක් මේ ලක්දිව අරාජක වී.
7 ඒ සිංහපුරයෙහි සිංහබා රජහු ඇවෑමෙන් ඔහු පිත් සුමිත් කුමර රජවී
8 මද්‍ර රජු දූ මෙහෙසියගෙන් ඒ සුමිත් රජු පුතුන් තුන් දෙනෙක් වූහ.
ලක්දිවින් ගිය දූතයෝ සිංහ පුරයට ගොස් රජහට පත් හසුන් දුන්නෝ
ය. ඒ රජ හසුන් අසා පුතුන් තුන් දෙනාට දරුවෙනි මම මහලු යෙමි.
9 තොප අතුරෙන් එකෙක් මා බෑයා සතු නොයෙක් ගුණ ඇති සිත්කලු වූ
ලංකාවට යේවා තව ද ඔහුගේ ඇවෑමෙන් එහිම රජ කරන්ටවත්
10 හොබනේ යි කීයේය. කිස්දොවුන් මල් පඬුවස්දෙව් යයි නම් රජ කුමර
තෙමේ යන්නෙමැයි සිතා සැපසේ ගමන ද දැන පියහු විසින් අනු
11 දන්නා ලද්දේ පරිබ්‍රාජක වෙස් ඇත්තේ දෙතිස් ඇමති දරු කෙනෙකුදු
ගෙණ නැව් නැංගේ ය. මාකඳුරු හොය හෝ මාඔය මෝයෙහි
12 කම්මල්තොට, ඔව්හු ගොඩ බටහ. ජන තෙමේ ඒ පරිබ්‍රාජකයන් දැක
මොනවට සත්කාර කෙළේ ය.

13 මෙහි නුවර විචාරා ක්‍රමයෙන් යන්නා වූ ඔව්හු දෙවියන් විසින්
රක්නා ලද්දෝ උපතිස් ගමට පැමිණියෝ ය. ඇමැතියන් විසින් අනුමත
කරණ ලද්දා වූ ඇමැතියෙක් තෙමේ බැහැර නිමත්ත පාඨකයෙකු අතින්
14 ක්ෂත්‍රියයන්ගේ ඊම් විචාළේය. ඒ නිමිත්ත පාඨක තෙමේ විචාළා වූ
ඇමතියාට අනිකුදු (විසඳමින්) "සත්වන දවස්හි කැත් කුමරෙක් එන්නේ
15 ය, මොහු වස උපන් නෙක්ම බුදුසසන පිහිටුවන්නේය"යි ද කියාත්
16 විසඳුයේ ය. ඒ ඇමැතියෝ සත්වන දවස්හිම එහි පැමිණි පරිබ්‍රාජිකයන්
17 දැක විචාරා දැන, ඒ පඬුවස් රජහු ලක් රජයෙහි පිහිටු වූහ. මෙහෙසියක්
නැති බැවින් ඒ කුමර ඒ තාක් අභිෂේක නොකෙළේ යි. අමිතෝදන
18 ශාක්‍ය රජහට පණ්ඩුශාක්‍ය නම් පුත්‍රයෙක් විය. ඒ තෙමේ ශාක්‍යයන්ගේ
පරිහානි දැන සිය ජනයා හැර ගෙණ අප්‍රසිද්ධ වේශයෙන් ගංගා නම්
19 ගඟින් එතර ගොස් එහි නුවරක් ඉදි කොට රජය කරන්නේ දරුවන්

Non-Commercial Distribution

20 සත් දෙනෙක් ලද්දේ ය. භද්දකච්චානා නම් වූ සියලු ස්ත්‍රී ලක්ෂණයෙන්
යුක්ත වූ ජනයා විසින් අභිප්‍රේත වූ මනා රූ ඇති කිස්දොවුන් දුවකු
වූවා.

21 ඇය පිණිස සත් රජ දරූ කෙනෙක් මාහැඟි පඬුරු ඒ රජහට එවූ
ය. ඒ පණ්ඩු ශාක්‍ය තෙමේ වනාහි රජුන්ගෙන් භය වූයේ, සුව ගමන්
22 ද අභිෂේක ඵල ද දන දෙතිසක් ගැහැණුන් හා ඇය වහා නැව් නංවා
පොහොසතෙක් මා දුව අල්වා ගණීව යි කියා ගංගා නම් නම් ගඟ
23 බැහූයේ ය. ඒ රජ දරුවෝ ගන්ට නොහැකි වූහ. ශීඝ්‍ර ගාමිණී ඒ
නෞකා තොමෝ දෙවෙනි දවස්හිම ගෝණගම් පටුනු පැමිණියාය.
24 පැවිදි වෙස් ගත් ඒ සියල්ලෝ එහි ගොඩ බටහ. මෙහි නුවර විචාරා
ක්‍රමයෙන් එළඹෙන්නා වූ ඔවුහු දෙවියන් විසින් රක්නා ලද්දාහු උපතිස්
25 ගමට වන්හුය. නිමිත්ත ශාස්ත්‍ර හදාළහු බස් අසා එහි පැමිණියවුන් දැක
26 උන් හැඳින ඇමැති තෙමේ රජහට භාර කෙළේ ය. මනා නුවණැති ඒ
27 ඇමැතියෝ පිරුණු සියලු මනෝරථ ඇති ඒ පඬුවස්දෙවු කුමරුන්
රාජ්‍යයෙහි අභිෂේක කළෝය.

28 පඬුවස් රජ අලාමක රූ ඇති යාපත් භද්‍රකාත්‍යයන කුමරිය
තමාගේ මෙහෙසි බැව්හි අභිෂේක කොට ඒ බිසව් සමග ආවුන් තමා
හා ආවුන්ට පාවා දී සුවසේ විසූයේ ය.

මෙතෙකින් හූ දී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස
පණ්ඩුවාස දෙවාභිෂේක නම් වූ අටවන අදියර නිමි.

Non-Commercial Distribution

# නව වෙනි පරිච්ඡේදය

1 ඒ මෙහෙසි තොමෝ පුතුන් දස දෙනෙකු හා එක් දුවකුදු වැදුවා.
2 සියල්ලන් දෙටු පිත් අභය නම කණිට්ඨිකා තොම චිත්‍රා නම.
මන්ත්‍රපාරගත බ්‍රාහ්මණයෝ ඇය දැක මැය පිතෙක් රජය පිණිස මයිලන්
3 නසන්නේ ය යි ව්‍යාකරණ කළෝ ය. (ඒ අසා) නැඟනියන් මරන්නෙමුය
යි නිශ්චය කොට ගත්තා වූ සහෝදරයන් වැඩි මහල් අභය කුමර තෙම
4 වැළැක්කීය. බොහෝ කලක් ඇය එක් ටැම් ගෙයක වැස්වූය. රජහුගේ ශ්‍රී
යහන් ගබඩාව සමග ඒ එක් ටැම් ගෙයි දොර කරවූය. තව ද එක්
5 දාසියක් මාලිගා ඇතුළෙහි සිටවූහ. මිනිසුන් බැහැර රැකවල් ලූහ. යම්
හෙයකින් ඕ තොමෝ දැකුම්ලත් පමණින්ම රුවින් මිනිසුන් උමතු කරවීද,
එහෙයින් උප පද සහිත වූ උන්මාද චිත්‍රා යයි නම් ලද්දී ය.

6 භද්‍රකාත්‍යායන දේවියගේ ලක්දිව් ගමන් අසා මෑණියන් විසින්
මෙහෙයන ලද පුත්‍රයෝ එකෙකු තබා මෙහි අවුය. ආවා වූ ඔව්හු
7 පඬුවස් දෙව් නම් ලක් හිමියා ද ඒ නැගනියන්ද දැක සමග හඬා ඒ
බිසවුන් විසින් හා රජ විසින් කරණ ලද සත්කාර ඇත්තෝ රජු
8 අනුමතියෙන් ලක්දිව්හි චාරිකා කළෝ, රිසි සේ නිවාස ද කළෝ යි.
9 රාම කුමරහු විසින් විසූ තෙන රාම ගෝණ යයි කියනු ලැබේ.
10 උරුවේලය, අනුරාධය යන දෙදෙනාගේ නිවාසයෝ ද එසේ එසේ
(උරුවේලය අනුරාධ යයි) කියනු ලැබෙති. එසේම විජිතය ග්‍රාම
11 දීර්ඝායුය. රෝහණය යන මොවුන්ගේ වාසස්ථාන ද විජිත ග්‍රාම දීර්ඝයු
ග්‍රාම, රෝහණ යයි කියනු ලැබෙති. ඒ අනුරාධ තෙමේ දකුණු දිගින්
වැවක් කරවිය. ඉන් ඉකිබිති රජ ගෙයක් කරවා එහි වාසය කෙළේ ය.
12 පඬුවස් දෙව් මහ රජ තෙමේ සිය දෙටු පිත් අභය කුමරහු සුදුසු කල
උප රජයෙහි අභිෂේක කෙළේ යි.

13 දීර්ඝායු කුමරු පිත් දීඝ ගාමිණී කුමාර තෙමේ ඒ උන්මාද චිත්‍රා
පවත් අසා ඇය කෙරෙහි හට ගත් දර්ශනාභිලාෂා ඇත්තේ උපතිස්
14 ගමට ගොස් රජහු දිටී, ඒ රජ තෙමේ උප රජු හා රාජොපස්ථානය මේ
15 කුමර හට දුන්නේ ය. දැල් කවුළු ඉදිරි තන්හි ඊට එළඹ සිටියා වූ ඒ චිත්‍රා
16 තොමෝ ගාමිණී කුමරු දැක ඇලුණු සිත් ඇත්තී දාසියට මේ තෙමේ
කවරේ දැයි කීවා පසුව මයිල්හු පිතැ යි අසා දාසිය එහි නියෝග කළා
17 ය. ඒ තෙමේ කවුළුයෙහි සන්ධි කොට පසුව වස්වා රාත්‍රියෙහි කර්කටක
යන්ත්‍ර නැගී දොර සිඳුවා එයින් ඇතුල් විය. ඈ හා වැස අළුයම්හි
18 බැහැර වී මෙසේ නිතර එහි වාසය කෙළේය. සිදුරක් නැති බැවින්
ප්‍රකාශ නොවී.

Non-Commercial Distribution

19 ඕ තොමෝ උහු නිසා ගැබ් ගත්තීය. පසුව ගැබ මුහුකුරා ගියේ
20 ය. දාසි තොමෝ මවු බිසවට කීවා. මවු බිසව් දියනියන් විචාරා රජ
හට කීවා ය. රජ තෙමේ පුත්‍රයන් කැඳවා "හේ තෙමේ ද අප විසින් ර
ක්ක යුත්තේ ය. උහුට ඇය දෙමුය යි කී යේ ය. ඉදින් පුතෙක් වී නම්
21 උහු මරන්නමෝ යයි ඒ දීඝ ගාමිණී කුමර හට උන්මාද චිත්‍රාව දුන්නුය.
වදන කල පැමිණි කල්හි වැදීම් ගෙට ද වන්නීය, රජ කුමරුවෝ (ඒ
22 කුමරිය) රක්නා චිත්‍ර නම් දාසය කාළවේල නම් දාසය යන ගැමුණු
23 කුමරහු කම්කරු වූ පිළිණ නොදෙන්නන් ඒ කර්මයෙහි හේතු භූතයෝ
24 යයි කියා සැක කොට මැරවූහ. ඔව්හු දෙදෙනා යක්ෂ යෝනියෙහි
උපන්නෝ ගැබ හොත්තාවූම කුමරහට අරක් ගත්තු ය. ඒ කුමාරිකා
වැදීමට ආසන්න කල් ඇත්තී අතික් ගැහැණියක් දාසිය ලවා සැලකවී.
25 ඒ චිත්‍රා කුමරි පුතෙක් වැදුවා; වැලි ඒ ගැහිණි දුවක් වැදුවා ය. චිත්‍රා
තොමෝ ඒ ගැහැණියට මසු දහසක් හා සිය පුතු දී ඒ දුව ගෙන්වා
26 ගෙණ ළඟ හොවා ගත්තීය. දුවක් ලදූ යි අසා රජ කුමරුවෝ තුටු වූහ.
මවු කුමරී ද මෑණියන් මවු බිසව් ද යන දෙන්නා ඒ කුමර හට
27 මුත්තණුවන්ගේ හා දෙටු මයිල්හුගේ නම් එක් කොට පණ්ඩුකාභය යි
නම් කළෝ ය. ලංකාරක්ෂක පඬුවස් දෙව් රජ තෙමේ තිස් හවුරුද්දක්
28 රජය කෙළේ ය. පණ්ඩුකාභය කුමරහු උපන් කල ඒ තෙමේ මෙළේ යි.

29 ඒ රජහු මළ කල සියලු රාජ පුත්‍රයෝ එක්ව ගෙණ අභය දායක
වූ අභය නම් භ්‍රාතෘ කුමර හට උදාර වූ රාජ්‍යාභිෂේකය කළෝ ය.

මෙතෙකින් හූ දී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස
අභයාභිෂේක නම් නව වැනි අදියර නිමි.

Non-Commercial Distribution

# දහ වෙනි පරිච්ඡේදය

1 උන්මාද චිත්‍රාව විසින් අණවන ලද්දා වූ දාසි තොමෝ ළදරු
2 කුමරහු කරඬුවෙක බහා ගෙණ දොරමඬලා නම් ගමට ගියා ය. රජ
කුමරුවෝ ද මුව දඩ ගියෝ තුඹුරු කඳුරෙහි දී දාසිය දැක "කොයියෙහි
ද? මේ කිමෙක් දැ" යි කියාත් විචාළෝ ය. (ඕ තොමෝ) දොරමඬලාවට
3 යෙමි. මාගේ දුවට ගෙණ යන ගුඩ පූප යි කීවා ය. රජ කුමරුවෝ
4 වහා තබව යි ඈට කිවුය. චිත්‍රය කාළවේළය යන යක්ෂයෝ දෙදෙන
කුමරහු අරක් පිණිස නික්මියෝ එකෙණෙහි මහත් හූරු වෙසක් දැක්වූය.
5 ඒ කුමරුවෝ ඌරු ලුහුබැඳ ගියෝ ය. දාසි තොම ඒ කුමරහු ගෙණ
6 එහි ගියා ය. දරුවා ද දහස ද නියුක්තයාහට රහසිගතව දුන්නීය.
එදවස්හිම ඔහුගේ භාර්‍ය්‍යා තොමෝ පුතෙකු වැදුවා ය. මා බිරින් දෑ
දරුවන් දෙදෙනෙකු වැදුවා ය යි උහු පෝෂණය කෙළේ ය. ඒ කුමර
7 සත් හැවිරිදි විය. මයිල්හු උහු දූන විලදිය කෙළනා දරුවන් මරන්ට
(මිනිසුන්) මෙහෙයූ ය. දියෙන් වසන ලද සිදුරු ඇති දියෙහි සිටි රුක්
8 සිදුරකට කුමාර තෙමේ කිමිදිමින් ඒ සිදුරෙන් ප්‍රවිෂ්ටව බොහෝ වේලක්
9 වැස පසුව එසේම නික්ම සෙසු දරුවන් වෙත අවුත් උන් විසින් විචාරන
ලදුයේත් ඒ තෙමේ වචනයෙන් රැවටුයේ ය.

10 ඒ කුමර තෙමේ මිනිසුන් ආ දවස්හි රෙදි කඩ හැඳ ගෙණ දියෙහි
11 ගිලී රුක් සිදුරෙහි සිටියේ ය. සෙසු දරුවන් මරා කඩ රෙදි ගැණ "
12 සියලු දරුවෝ මරණ ලද්දාහ" යි ගොස් රජ කුමරුවන්ට දැන්වූය. උන්
13 ගිය කල ඒ තෙමේ ස්වකීය ආයුක්තකයා ගෙට ගොස් වෙසෙමින් ඔහු
විසින් අස්වැසුයේ දොළොස් වස් විය නැවත ද ජීවත් වන කුමරහු අසා
14 උහුගේ මයිල්හු එහි සියලු ගොපල්ලන් මරන්ට මිනිසුන් මෙහෙයූහ.
එදවස්හි ගොපල්ලෝ එක් සිවුපාවෙකු ලැබ ඒ කුමරහු ගිනි ගෙණෙනු
15 පිණිස ගමට යැවූහ. හේ තෙමේ ගෙට ගොස් නියුක්තයාගේ පුත්‍රයාම
මා පාරිදෙන්නාහ, ගොපල්ලන් වෙත ගිණි ගෙණ යා එහි තෝ අඟුරෙහි
16 පැලහූ මස් ද කන්නේ ය යි යැවූයේ යි. ඒ තෙමේ එබස් අසා ගොපල්ලන්
වෙත ගිනි ගෙණ ගියේ ය. මෙහෙයන ලද මිනිස්සු ඔවුන් වටලා මැරූ
17 ය. සියලු ගොපල්ලන් මරා මයිලන්ට දැන්වූ ය.

18 පසුව සොළොස් වස් වූ ඒ කුමර මයිල්හු ද දත්තෝ ය. මවු
19 තොමෝ දහසකුඳු දිනි. කුමරහුගේ ආරක්ෂාව ද විධාන කළා ය.
ආයුක්තක තෙමේ මැණියන් කී සියල්ලම ඔහුට දන්වා දාසයෙකුත් මසු
20 දහසකුත් දී පණ්ඩුල බ්‍රාහ්මණයා වෙත යැවූයේ ය. වේද පාරගත වූ
බොහෝ සම්පත් ඇති පණ්ඩුල නම් බ්‍රාහ්මණයෙක් දකුණු දිග පණ්ඩුල
21 නම් ගම විසීය. කුමාර තෙමේ එහි ගොස් පණ්ඩුල බමුණා දිටී. "

Non-Commercial Distribution

දරුව, තෝ පණ්ඩුකාභය කුමරු ද" යි විචාර "එසේය" යි කී කල ඔහුට
23 සත්කාර කොට දරුව තෝ රජ වන්නෙහි ය. සම සැත්තෑ වසක් රජය
කරන්නෙහි ය. ශිල්ප උගණුව යි කියා ශිල්ප ඉගැන්වී. ඔහුගේ චන්ද්‍ර
නම් පුතු හා වහා සිප් නිම වුවහට යෝදයන් සංග්‍රහ පිණිස ඒ තෙමේ
24 මසු ලක්ෂයක් දුන්නේ ය. එයින් පන් සියයක් යෝධයන් සංග්‍රහ කළකල්හි
25 ඒ තෙමේ "යමක් විසින් ගන්නා ලද්දා වූ පර්ණයෝ රන් (බඳුන්) වූ නම්
26 ඈය මෙහෙසිය කරව, මා පුතු ද පෙරෙවි කර යි කීය. මෙසේ කියා
වස්තු දී යෝධයන් සහිත කුමර එයින් මෙහෙයි පින්වත් ඒ කුමර මම
(පණ්ඩුකාභයෙමි) අස්වා ඉන් පිටත්ව අවුත් කසාගල වෙත නුවර දී සත්
27 සියයක් පුරුෂයන් ද සියල්ලන්ට භෝජන ද (ලැබ) ලැබූ බල ඇත්තේ
28 ඉක්බිති එක් දහස් දෙසියයකින් පිරිවරන ලද කුමර තෙමේ ගිරිකඬ පව්
29 නම් තෙනට ගියේය. පණ්ඩුකාභය කුමරහු මයිල් ගිරිකඬසිව නම්
කුමර පඬුවස් දෙව් රජ විසින් දෙන ලද ඒ දේශය අනුභව කෙරෙයි. ඒ
30 ක්ෂත්‍රිය තෙමේ එ කල්හි සියක් කිරියක පැසුණු ගොයම් කප්වයි. උහුගේ
31 දියනිය වූ රූවත් වූ පාලි නම් ක්ෂත්‍රිය කුමරියක් වූවා ඕ තොමෝ
32 හොබනා යානාවකට නැගී පියාණන්ට හා ගොයම් කපන්නට බත්
ගෙන්නා ගෙණ සම පිරිවරින් යන්නීය. කුමාරයාගේ මිනිස්සු ඒ කුමරිය
33 දක කුමර හට දැන් වූය, කුමාර තෙමේ පිරිස් සහිතව වයා ආයේ එ
34 පිරිස දෙකඩ කොට ඇය වෙතට සිය යානාව යැවීය. කොහියෙහි ද යි
ඇය විචාළේ ය. ඇය විසින් (වූ පරිදි) සියල්ල කී කල ඒ ක්ෂත්‍රිය
35 තෙමේ ඇය කෙරේ ඇලුණු සිත් ඇත්තේ තමහට බෙදනු පිණිස බතින්
යාච්ඤා කෙළේ ය. ක්ෂත්‍රිය තොමෝ යානාවෙන් බැස රන් පයින්
36 බත් ගෙණ නුගරුක මුලදී රජ කුමරහට දුන්නා ය. සෙසු ජනයා බත්
කවන්ට නුග කොළ ගත්තා ය. එකෙණෙහි ඒ පර්ණයෝ රන් බඳුන්
37 වූහ. රජ කුමර ඒ දක බමුණා කීවා සිහි කොට මහේෂිකා භාවයට
හොබනා කන්‍යාවක් මට ලැබුණා ය යි සතුටු වී ඒ සියල්ලන් බත්
38 කැවීය. නමුත් ඒ බොජුන් ක්ෂය නො වූයේ ය. එකෙකුගේ කොටස
39 ගත්තා සේ එහි පෙනුණේ ය. මෙ වැනි පින් ගුණයෙන් යුක්ත වූ
සුකුමාල ඒ කුමාරිකාව එ තැන් පටන් ස්වර්ණ පාලි නමින් ප්‍රසිද්ධ විය.
40 ඒ කුමාරිය ගෙණ යානාවට නැගී ක්ෂත්‍රිය තෙමේ මහා බල සෙන්
පිරිවරන ලදුයේ නිසැකින් පලා ගියේ ය. ඒ අසා කුමරියගේ පිය
41 තෙමේ සියලු මිනිසුන් එවීය. ඔව්හු ගොස් කලහ කොට කුමාර හටයන්
විසින් තර්ජනය කරණ ලද්දාහු පෙරලා අවුය. එහි කළ නුවර ඒ
42 හේතුවෙන් කලහ නගර නම් වී. ඒ අසා ඇයගේ පස් බෑයෝ යුධ
පිණිස අවුය. පඬුල බමුණු පිත් චන්ද්‍ර කුමර උන් සියල්ලන් මැරවී.
43 ඔවුන් යුධ කළ බිම ලෝහිත වාහඛණ්ඩ යයි (ලේවාකඩ යයි) නම්
ලැබූය.

Non-Commercial Distribution

44 ඉක්බිති පණ්ඩුකාභය කුමර ගඟින් එතර දොළුගලට ගියේ ය.
45 එහි සතර අවුරුද්දක් වාසය කෙළේ ය. මයිල්හු එපවත් අසා රජහු හැර
46 ඔහු හා යුධ පිණිස එළඹියෝ ය. දූමරක්ගල වෙත කඳවුරු පිහිටුවා
47 බෑණා හා යුද්ධ කළෝ ය. බෑන තෙමේ වනාහි මයිලන් ලුහු බැඳ ආය.
ගඟින් මොබ පළවා හැරී උන්ගේ කඳවුරෙහි දෑවුරුද්දක් විසීය. ඔව්හු
48 උපතිස් ගමට ගොස් රජහට එපවත් කිවුය. ඒ රජ රහස් සහිත හස්නක්
කුමරහට (එවනුයේ) "තෝ ගඟින් එතර අනුභව කර ඉන් මොබ නහ
49 මක් එව" යි කියා යැවීය.

50 රජහුගේ බෑයෝ නව දෙනා ඒ අසා රජහට කිපියෝ "තෙපිම
බොහෝ කලක් ඔහුට උපකාර වෙහිය, දුන් රට දෙහි. එහෙයින්
51 තොප මරන්නෙමු ය යි කිවුය. ඒ රජ උන්ට රජය පාවා දුන්නේ ය. ඒ
සියල්ලෝ ම එකඟව තිස්ස නම් බෑයා රජයට ප්‍රධාන කළෝ ය.
52 අභයදායකමේ අභය රජ තෙමේ විසි අවුරුද්දක් ඒ උපතිස් ගම්හි
වෙසෙමින් රජය කෙළේ ය.

53 දූමරක්ගල වසන චේතියා නම් යකිනී තිඹිරියඟන විලෙහි වෙළඹ
54 රුවින් ඇවිදිනීය. සුදු සිරුර හා රත් පා ඇති සිත් කලු ඒ වෙළඹ
55 එකෙක් දූක මෙහි මෙ බඳු වෙළඹක් වසනීය යි කුමරුහට දැන්වීය.
කුමර තෙමේ රැහැණ ගෙණ ඇය අල්වා ගන්ට එළඹියේ ය. පශ්චාත්
භාගයෙන් ආවහු දූක ඒ කුමරහු තෙදින් ඕ තොමෝ භය වූවා අතුරුදහන්
56 නොවී දිව්වා ය. ඒ තෙමේ දුවන්නිය ලුහු බැන්දේ ය. දුවන්නා වූ ඒ
57 තොමෝ ඒ විල සිසාරා සත් යලක් දිව්වා ය. මහගඟ බැස එයින්
58 එතරව නැවත සත් යලක් දූමරක්ගල සිසාරා දිව්වා ය. නැවත එම විල
59 වටා තුන් යලක් දිව්වා ය. එයින් ඉක්බිති කච්ඡක නම් තොටින් ගඟට
බටුවා ය. ඒ තෙමේ එහි දී වාලධියෙහි ඇය ද ගඟෙහි යන තල් පතක්
ද ගත්තේ ය. ඔහුගේ පින් තෙදින් ඒ තල් පත මහ කඩුවෙක් විය. ඈට
60 තී මරමි කියා කඩුව එසවීය. ස්වාමීනි ඔබට රජය ගෙණ දෙමි. මා
නො මැරුව මැනැව යි කීවාය. ඒ තෙමේ ඇය ග්‍රීවයෙහි අල්වා ගෙණ
61 කඩු සිලින් නාසයෙහි විද යොතින් බැන්දේ ය. ඈ වසඟ වී මහත් බල
62 ඇති ඒ තෙමේ වෙළඹ නැඟී දූමරක්ගලට ගොස් එහි සතර අවුරුද්දක්
63 වාසය කෙළේ ය. හට සේනා සහිත වූයේ රිටිගලට අවුදින් යුද්ධ
කාලය බලමින් එහි සත් අවුරුද්දක් වාසය කෙළේ ය.

64 මයිල් දෙදෙනෙකු හැර ඔහුගේ සෙසු අට මයිල්හු යුද්ධයට
65 සැරසුණෝ ඒ රිටිගල එළඹ (එහි පෙර පිහිටි) කුඩා නුවර කඳවුරු
66 පිහිටුවා ගෙණ සිවුරඟ සෙන් දී සෙනෙවියා යවා හාත් පසින් රිටිගල

Non-Commercial Distribution

වටලැවූය. යකිනිය හා මන්ත්‍රණය කොට ඇගේ වාචොයුක්තියෙන්
රාජ පරිෂ්කාර පඬුරු ආයුධයන් ද දී මේ සියලු උපකරණයන් ගනිව්
67 මම තොප ක්ෂමා කරවන්නෙමි මෙසේ කියා කුමාර තෙමේ පෙරාතුව
68 බලසෙන් යැවීය. "ප්‍රවිෂ්ට වූ ඔහු ගන්නමෝය" යි ඔවුන් විශ්වාස වූ
කල ඒ කුමර යක් වෙළඹ නැගී මහා බල සෙනඟින් පිරිවරණ ලදුයේ
69 යුධ පිණිස වන්නේ ඒ යකිනි මහ හඬින් හැඬුවා. ඇතුළත පිටත සිටි
කුමාරයාගේ බල සේනා ද මහත් අරගල කළා. කුමාරයාගේ ඒ මිනිස්සු
70 සියල්ලෝ පර සේනා මිනිසුන් වැඩි කොටස ද මයිලන් අටදෙනා ද
71 මරා ශීර්ෂරාශිය කළෝ ය. ඒ සෙනෙවි තෙමේ පලා ගොස් ලැහැබකට
වන්නේ ය. එහෙයින් මේ තෙමේ සේනාපතී ගුම්බක යයි කියනු
72 ලැබේ. ඒ තෙමේ මත්තෙහි තබන ලද මයිලන්ගේ හිස් ඇති ඉස් රැස
බලා "ලබු රැසක් වැන්නැ"යි කියේ ය. එහෙයින් ලබුගම් යයි නම් වී.

73 මෙසේ දිනූ සංග්‍රාම ඇති ඒ පණ්ඩුකාභය කුමර එතැනින් අනුරාධ
74 නම් මුත්තණුවන්වසන තැනට ගියේ ය. ඒ ආයඝ්ක තෙමේ තමා රජ
75 ගේ කුමරුට දී අන් තැනෙක වාසය කෙළේ ය. කුමර ඒ රජ ගෙයි
විසීය. නිමිත්ත ශාස්ත්‍ර දන්න න් ද එසේම වාස්තු විද්‍යා දන්නන් ද
76 විචාරවා ඒ ගම්හිම උතුම් නුවරක් ඉදි කරවී. (විජය කුමර ඇමැති වූ ද
භද්‍රකාත්‍යායන බිසවුන්) බෑවූ ද අනුරාධයන් දෙදෙනාගේ නිවාස හෙයින්
77 ද? අනුරේ නකතින් පටන් ගත් බැවින් ද අනුරාධපුර නම් වී. මයිලන්ගේ
සේසත් ගෙන්වා මෙහි සයඤ්ජාත විල්හි ශොධවා සේසත් නඟා ඒ විල
78 දියෙන් ඒ පණ්ඩුකාභය කුමර තමන් අභිෂේකය කරවි. ඒ ස්වර්ණපාලි
නම් දේවිය ද මහේසිකා බැව්හි අභිසේක කෙළේ ය. චන්ද්‍ර කුමරහට
79 විධි වූ පරිද්දෙන් පෙරවී තනතුරු දුන්නේ ය. සෙසු භටයන්ට ද සුදුසු
පරිද්දෙන් තනතුරු දුන්නේ ය. මෑණියන්ට ද තමන්ට ද උපකාර කළ
80 හෙයින් දෙටු මයිල් අභය රජ නොමරවා ඔහුට රෑ රජය දුන්නේ ය. ඒ
තෙම නුවර රක්නේ විය. එතැන් පටන් නුවර නගර ගුත්තිකයෝ වූහ.
81 ගිරිකණ්ඩ සිව නම් බිරින්ද පියහු ද නො මරවා ගල්කඬ රටම ඔහුට
82 දුන්නේ ය. ඒ විල ද කණවා බොහෝ දිය ඇති කෙළේ ය. ජය ලත්
83 කල දිය නෑ හෙයින් ජය වැව යයි නම් වී නුවරට නැගෙණහිර කාළ
84 වේළ යක්ෂයා පිහිට වී හෝ කාළ වේළ යකු දෙවොල ඉදි කෙළේ ය.
ඒ චිත්‍ර රාජයකු අභයවාපී යට භාගයෙහි වාසය කරවී. යක්ෂ යෝනියෙහි
85 උපන්නා වූ පූර්වොපකාරී ඒ දාසිය නුවර දකුණු දිග් දොර කෙළෙහි
86 ගුණ දන්නා ඒ තෙම වාසය කරවී. වළවා මුඛ යකිනි රජ ගෙවුයන්
87 ඇතුළත වැස්වී. උන්ට ද අන්‍යයන්ට ද අවුරුදු පතා බලි දානය කරවී
නකත් කෙළි දවස් හිදී ඒ පණ්ඩුකාභය රජ තෙමේ චිත්‍ර රාජයා සමග
සම අස්නෙහි හිඳ ගෙණ දෙව් මිනිස් නැටුම් කරවමින් රතී ක්‍රීඩායෙන්

Non-Commercial Distribution

88 යුක්ත ව සිත් ඇලවී. දොරගම් සතර ද අබා වැව ද එසේම මහත්
සොහොන් භූමිය හා දම් ගෙඩිය හෝ වධස්ථානය ද බටහිරි රැජන ද
89 වෙසවුණුයා (දෙවොල) ද වැදි දෙවියා තල් (දෙවොල) ද සභාග වස්තුව
90 ද ප්‍රභේද ගෙය ද යන මෙතෙක් දෑ බටහිරි දොර දිශා භාගයෙහි ඒ රජ
තෙමේ ම පිහිට වී.

91 නගර ශෝධන පන් සියයක් සැඬොල් මිනිසුන් ද වර්චස්ශෝධක
92 දෙ විස්සක් සැඬොල් පුරුෂයන් ද මළ මිනී බැහැර ගෙණ යන්නා වූ
93 එක් සිය පණසක් සැඬොලුන් ද එතෙක්ම (එක් සිය පණසක්) සොහොන්
ගොව් සැඬොලුන් ද සොහොනින් වයඹ දිග උන්ගේ ගම් ද පිහිට විය.
94 ඒ මිනිස්සු විධි වූ පරිද්දෙන් ඒ කර්මයන් කළාහු ය. ඒ සැඬොල් ගමට
ඊසාන දික්හි නීච සුසාන යයි නම් ලත් සැඬොලුන් ගේ සොහොන
කරවී. ඒ සොහොනින් උතුරු දිග පහන් පව් අතර වැද්දන්ගේ ගෙවල්
95 පෙළ පිහිටු වන ලද්දේ විය.

ඊට උතුරු දිග්හි ගැමුණු වැව දක්වා නොයෙක් තවුසන්ගේ අසපු
96 කරණ ලද්දේ වී. එම සොහොනට පෙර දිග රජ තෙමේ ජොතිය
97 නිගණ්ඨයාගේ ගෙය කරවී. එම පෙදෙස ගිරි නම් නිගණ්ඨ තෙමේ ද
98 නා නා පාසාණ්ඩයෝ ද බොහෝ ශ්‍රමණයෝ ද විසූ හ. එසේ ම රජ
99 තෙමේ කුම්භාණ්ඩ නම් නිගණ්ඨයා පිණිස දෙවොලක් කරවී. ඒ
100 දෙවොල එනම් විය. එයින් බටහිරි භාගයෙහි ව්‍යාධ පාළියෙන් පෙරදිග
101 මිත්ථ්‍යාදෘෂ්ටි කුලයන් පන්සියයක් විසී ය. එසේම ඒ රජ තෙමේ
ජෝතිය ගෙයින් ඔබ ගැමුණු වැවින් මොබ පරිබ්‍රාජකරාමයක් කරවීය.
102 ආජීවක යන්ට ගෙයක් ද බමුණන්ට ආධාර ගෙයක් ද සිවි ගෙයක් හා
103 ආශිර්වාද ශාලාවක් ද ඒ ඒ තැන කරවී. ලංකේන්ද්‍ර පණ්ඩුකාභය රජ
තෙමේ අභිෂේකයෙන් දස වස් ඇත්තේ මුළු ලක්දිව්හි ග්‍රාම සීමා නියම
104 කෙළේ ය. යක්ෂ භූතයන් යහලු කොට ඇති ඒ රජ තෙමේ දෘශ්‍යමාන
105 වූ කාළවෙළය, චිත්‍ර රාජය යන මොවුන් සමග සම්පත් අනුභව කෙළේ
ය. පණ්ඩුකාභය රජ හට ද අභය රජහට ද අතුර රජුන් නැති සතළොස්
අවුරුද්දක් වූහ.

106 ධෘතිමත් ඒ පණ්ඩුකාභය රජ තෙමේ සත් තිස් වස් ඇත්තේ රජ
බවට පැමිණ රම්‍ය වූ නොහඬු වූ සමෘද්ධ වූ මේ අනුරාපුරෙහි සැත්තෑ
අවුරුද්දක් රජය කෙළේ ය.

මෙතෙකින් හු දී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස
පණ්ඩුකාභයාභිෂේකය නම් වූ දස වන අදියර නිමි.

Non-Commercial Distribution

# එකොළොස් වෙනි පරිච්ඡේදය

1 ඒ රජු ඇවෑමෙන් ස්වර්ණපාලි බිසවුන් පිත් එම රජුට දාවූ මුටසීව
2 යයි ප්‍රසිද්ධ කුමර නිරාකුල රජයට පැමිණියේ ය. ඒ රජ තෙමේ
පලමල්තුරින් හොබනා මහා මේඝවනෝද්‍යාන නම් වූ අනූන ගුණයෙන්
3 යුක්ත යහපත් උයන කරවීය. උයන් බිම් ගන්නා දවස් නො කල් මහ
වැස්සෙක් වටු යේය, එහෙයින් ඒ උයන මහා මේඝවන නම් වී.
4 මුටසීව රජ තෙමේ ලංකා මහී කාන්තාවගේ මුහුණු බඳු යහපත් පුර
ශ්‍රේෂ්ඨ වූ අනුරාධ පුරයෙහි සැට වසක් රජය කෙළේ යි.

ඒ රජහට උනුන් හිතෛෂී වූ පුතුන් දස දෙනෙක් වූහ. කුලයට
5 සුදුසු කීකරු වූ දූන් දෙදෙනෙක් ද වූ ය. දේවානම් පියතිස්ස (දෙවෙන
පැතිස්ස) යයි ප්‍රසිද්ධ වූ දෙවෙනි පුත්‍ර තෙමේ ඒ සියලු සහෝදරයන්
6 අතුරෙන් පින් පැණ ගුණෙන් අධික වි.

7 ඒ දෙවන පැතිස් කුමාර පිය රජහු ඇවෑමෙන් රජ වීය. ඒ රජහුගේ
8 අභිෂේකය කැටිවම බොහෝ අරුම දෑ වූහ. මුළු ලක්දිව්හි පොළෝ
තුළ පිහිටි නිධානයෝ ද රත්නයෝ ද උඩ නැගී පොළෝ තලයට
9 නැංගාහ. ලක්දිව් වෙත බුන් නැව්හි පිහිටියා වූ ද ඒ සමුදුර ජාත වූ ද
10 රත්නයෝ ද ගොඩ නැංගාහ. ජාත පර්වත පාදයෙහි හුණ යටි තුනක්
11 උපන්හ, ප්‍රමාණයෙන් රිය කෙවිටි පමණය, ඉන් එකක් ලතා යෂ්ටි
නම, එහි ලතාවෝ රන්වන් ව සිත් අලවමින් පැණෙති. ඉන් එකක්
12 කුසුම යෂ්ටි නම, එහි වනාහි නොයෙක් වර්ණ ඇති අතිස්ඵුට වූ
13 නොයෙක් කුසුමයෝ පැණෙති. එකක් ශකුණ යෂ්ටි නම, එහි බොහෝ
වූ නොයෙක් වර්ණ ඇති නානා වර්ගයෙහි මෘග පක්ෂීහු දිවි ඇත්තාවුන්
සේ පැණෙති.

14 හය මුතුය ගජ මුතුය රථ මුතුය ආමලකී මුතුය වලලු මුතුය
අංගුලිවෙඨක මුතුය කකුධඵල මුතුය ප්‍රකෘති මුතුය යන මේ අට ජාති
15 ඇති මුක්තාවෝ මුහුදින් නැගී වෙරළෙහි වැටියක් සේ සිට ගත්තාහ.
මේ සියල්ල දෙවන පැතිස් රජහුගේ පින පැළඹීමෙකි. ඉඳුනිල් වෙරළුමිණි
16 පියුම්රාමිණි යන මේ (මැණික් පොළෝ තෙළෙහි නැගී සිටියහ.) මෙකී
17 රුවන් ද යට කී මුතු ද ඒ යෂ්ටීන් ද (ඔටුනු පලන්) සත් දවස ඇතුළතම
රජු වෙත එල වූහ. ඒ දැක සතුටු වූ රජ තෙම අනර්ඝ මේ රත්නයන්ට
18 මා මිතුරු දම්සෝ රජ තෙමේ සුදුස්සේය. අනිකෙක් නුසුදුස්සේය,

Non-Commercial Distribution

19 එහෙයින් මෙ රුවන් ඔහුට දෙන්නෙ මැ" යි සිතුහ. දෙවන පැතිස්සය
දම්සෝ ය යන මේ (මිහිපල්හු) දෙදෙනා බොහෝ කල් පටන් අදෘෂ්ට
මිත්‍රයෝ ය. ඉක්බිති ඒ (දෙවන පැතිස්) රජ තෙමේ බෑණ වූ මහාරිෂ්ට
20 නම් ඇමතියා ප්‍රධාන කොට බමුණාය ඇමතියා ය ගණකය යන ඒ
21 සතර දෙනා බල සමූහයෙන් පිරිවරන ලදුයෙන් දූතයන් කොට මැණික්
22 ජාති තුනය, ඒ තුන රථ යෂ්ටිහුය, දක්ෂිණාවෘත්ත ශංඛය, යට කී අට
23 ජාති මුතුය යන මේ අනගි රත්නයන් අතට දී (දම්සෝ රජු වෙත)
යවූයේ ය. ඔව්හු දඹකොළ පටුනෙන් නැව් නැගී සැපසේ සත් දවසකින්
24 (මුහුදු පිට ගොස්) තොට ලැබ පසුව ඉත් සත් දවසකින් පැළලුප් නුවරට
පැමිණ දම්සෝ රජහට පඬුරු දුන්හ. ඒ තෙමේ ඒ දැක සතුටු විය.

25 "මෙබඳු රත්නයක් මෙහි මට නැත්තාහ යි මෙසේ සිතා සතුටු වූ
රජ තෙමේ අරිටු නම් (කුමරහට) සෙනෙවි තනතුරු ද බමුණාට පෙරෙවි
බැව් ද දුන්නේ ය. ඒ ඇමතියහට වනාහි දණ්ඩනායක තනතුරු ද
26 ගණකයහට සිටු තනතුරු ද දුන්නේ ය. ඔවුන්ට අනල්ප භෝගයන් ද
27 වාසයට ගෙවල් ද දී ඇමැතියන් හා මන්ත්‍රණය කොට ප්‍රතිපඬුරු දැක
28 වල් විදුනාය මඟුල් කඩුව සේසත මිරිවැඩි සඟල ඉස්වෙළුම පාමගය
කෙණ්ඩිකාව හරිපර්වතයෙහි හට ගන්නා සඳුන, නො දෙව්නා කෙළක්
29 පිළිය, මාහැඟි අත්පිස්නාය, නයින් විසින් ගෙණන ලද අංජනය,
30 අරුණුවන් මැටිය, අනොතත්ත විලින් ගෙණා ජලය, ගංගා ජලය සක්
31 ගෙඩිය නන්ද්‍යාවෘතය වර්ධමානකය කුමාරිකාය රන් බඳුන් බඩුය මාහැඟි
32 සිවිකාය මාහැඟි අරළු නෙල්ලිය අමා ඔසුව ශකුනාහෘත ඇල් සැට
දහසක් අමුණ පිරිවරින් වෙසෙසන ලද අභිෂේ කෝපකරණයන් ද දී
33 නරේශ්වර තෙමේ සුදුසු කාලෙහි යහළුවාට පඬුරුත් මේ මතු කියන
34 දහම් පඬු රුත් දී දූතයන් පෙරලා එවූයේය. මම බුදුන් දහම් සඟ සරණ
35 ගත වූයෙමි. ශාක්‍ය පුත්‍ර බුදු සසුන්හි උපාසක බැව් ගිවිස්සෙමි.
36 නරෝත්තමය තෙපි ද ශ්‍රද්ධාවෙන් සිත පහදා ගෙණ මේ තුනුරුවන්
සරණ යව. නැවතත් මාගේ යහළුවාට අභිෂේක කරව යි කියා යහළු
දම්සෝ රජ තෙමේ සත්කාර කොට ඒ ඇමැතියන් එවී.

37 ඒ ඇමැති දූතයෝ ඉතා සත්කාර කරණ ලද්දෝ සත් මසක් එහි
වැස වෙසක් මස ශුක්ල පක්ෂයෙහි පැළවිය දා පිටත් වූවෝ,
38 තාම්‍රලිප්තියෙහි දී නැව් නැගී දඹකොළ පටුන බැස දොළොස් වක් දා
39 මෙහි පැමිණ රජහු දුටහ. දූතයෝ ඒ පඬුරු ලංකා රජහට දුන්නෝයි.
ලංකාපති තෙමේ ඔවුන්ට මහත් සත්කාර කෙළේ ය. ස්වාමියා කෙරෙහි

Non-Commercial Distribution

ඇදහිලි ඇති ඒ ඇමැතියෝ උඳුවප් පුර පැළවිය දවස්හි අභිෂේක ලද්දා
40 වූ ද ලංකේන්ද්‍රයා ධර්මාශෝක රජහුගේ වචනය කියා ස්වාමීන්ගේ
41 අභිවෘද්ධියෙහි ඇළුණාහු ලංකා වැස්සාහට හිත වැඩෙහි ඇළුණු (රජහු)
නැවත ද අභිෂේක කළෝයි.

42 දේවානම්පිය යනු උප පදනම් කොට ඇති ජනයා හට සැප දෙන්නා වූ ඒ නරේන්ද්‍රයා වෙසක් මස පුණු පොහෝදා ලක්දිව්හි ඉතා ප්‍රසිද්ධ සම්පූර්ණ උත්සවයෙහි දී මෙසේ තමන් (නැවත) අභිෂේක කෙළේ යි.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස දේවානම්පියතිස්සභිෂේක නම් වූ එකොළොස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# දොළොස් වෙනි පරිච්ඡේදය

1 බුදු සසුන් බබළුවන්නා වූ ඒ මොග්ගලි පුත්ත මහ ස්ථවිර තෙමේ
2 (තුන් වන) සංගායනාව නිමවා මතු කාලය බලන සේක, ප්‍රත්‍යන්ත
ජනපදයන්හි සසුන් පිහිටවන බැව් බලා වප් මස්හිදී ඒ ඒ තෙරුන් ඒ ඒ
3 ජනපදයන්ට යැවූසේක. කාශ්මීර ගන්ධාර රටට මජ්ඣන්තික නම් මහ
තෙරහු යැවූසේක. මහිස මණ්ඩලයට මහා දේව මහා තෙරහු යැවූසේක.
4 වනවාසි දේශය රක්ඛිත නම් මහ තෙරහු යැවූ සේක. වැලි අපරන්ත
දේශයට යෝණක ධර්ම රක්ෂිත ස්ථවිර නම් මහ තෙරහු යැවූසේක.
5 මහාරාෂ්ට්‍ර ජනපදයට මහා ධර්ම රක්ෂිත ස්ථවිර නම් තෙරහු යැවූසේක
6 මහ රක්ෂිත මහ තෙරහු වනාහි යවන ලෝකයට යැවූසේක. හිමවත්
7 පෙදෙසට මධ්‍යම නම් මහ තෙරහු යැවූසේක. ස්වර්ණ භූමි නම්
දේශයට ශෝණය, උත්තරය යන මහ තෙර දෙදෙනා යැවූ සේක.
8 ප්‍රසිද්ධ මහාමහෙන්ද්‍ර ස්ථවිරය ඉෂ්ටිය ස්ථවිරය උත්තිය ස්ථවිරය ශම්බල
ස්ථවිරය භද්‍රශාල ස්ථවිරය යන ස්වකීය සද්ධිවිහාරික ස්ථවිර පස් දෙනා
"තෙපි (ගොස්) මනෝඥ වූ ලක්දිව්හි මනෝඥ බුදුසසුන් පිහිටුවව" ය
පිටත් කළ සේක.

9 එකල්හි මහා සෘද්ධි ඇති ආරවාල නම් භයංකාර නාග රාජයා
පාණ වැසි වස්වා කාශ්මීර ගන්ධාර දෙරට පැසුණු සස්‍ය වර්ගය
සියල්ල මුහුද හෙලයි. මජ්ඣන්තික නම් මහා ස්ථවිර තෙම වහා
10 අහසින් එහි වැඩ රවාල විල්හි දිය පිට සක්මන් ආදිය කළ සේක.
11 නාගයෝ ඒ දැක රොස් වූවෝ රජහට දැන්වූහ. වැලි කිපුණු ඒ නා රජ
12 තෙමේ අනේක ප්‍රකාර භයංකාර ක්‍රියා කළේ ය. (එනම්) මහා
වාතයෝ හමති, මේඝය ගර්ජනා කෙරෙයි. එසේම වසිති; ඉන්ද්‍රාසනීහු
පුපුරති, ඒ ඒ දිගින් විදුලි ගසති, වෘක්ෂයෝ ද පර්වතයන් ගේ කූටයෝ
13 ද ඇද වැටෙති, විකෘත රූප ඇති නාග යෝ ද හැම අතින් භය
14 ගන්වති. නා රජ තෙමේත් තමා දුවයයි නොයෙක් පරිද්දෙන් ආක්‍රෝශ
කෙරෙමින් (ගිනි ගත්තා සේ) දිලිසෙයි.

15 ස්ථවිර තෙමේ ඒ සියලු භීෂණය සෘද්ධි බලයෙන් ප්‍රතිබාහනය
16 කොට තමන් උතුම් බලය දක්වන සේක් "ඉදින් දෙවියන් සහිත ලෝවැසි
තෙමේ අවුදින් මා භය ගන්වන්නේ නමුත් මට භය භෛරවයන්
17 උපදවන්ට හැක්ක නොවන්නේ ය. "මහා නාගය ! තෙපි ඉදින් සමුද්‍ර
පර්වත සහිත සියලු පොළොව ඔසවා මා මතුයෙහි දමන්නෙහි ද මට
18 භය භෛරවයක් උපදවන්ට හැකි නොවන්නෙහිය, නාග රාජය හුදක්
19 තටම් වෙහෙසවන්නේ" ය යි වදාළ සේක. ඒ අසා මඳ සිඳුණු නා

Non-Commercial Distribution

රජහට ස්ථවිර තෙමේ ධර්ම දේශනා කළ සේක. ඉක්බිති නා රජ
20 තෙමේ තිසරණ පන්සිල්හි පිහිටියේ ය. එසේම සුවාසූ දහසක්
නාගයෝය, හිමවත්හි බොහෝ ගන්ධර්වයෝ ය, යක්ෂයෝය,
21 කුම්භාණ්ඩයෝය, යන මොව්හු (තිසරණ පන්සිල්හි පිහිටියෝ ය) පංචක
නම් යක්ෂ තෙමේ වනාහි හාරිත නම් යකිණිය පන්සියයක් පුතුන්ය
යන මොවුන් හා සෝවාන් ඵලයට පැමිණියා ය. ඉක්බිති ඒ
22 මහතෙරණුවන් විසින් දූන් මෙයින් මතු පෙරසේ ක්‍රෝධය නූපදවා
23 සස්‍යහානිය ද නොකරව්. සත්ත්වයෝ සුවයක්ම කැමැත්තාහ. සතුන්
කෙරෙහි මෙත් කෙරෙත්වා මනුෂ්‍යයෝ සුවසේ වසත්වා" යි මෙසේ
අනුශාසනා කරණ ලද්දා වූ ඔව්හු එසේම පිළිපැද්දෝ ය.

24 ඉක්බිති ඒ නා රජ තෙරණුවන් රුවන්පලඟ හිඳුවා පවන් සලමින්
උන්වහන්සේ වෙත සිටියේ ය. එකල කාශ්මීර ගාන්ධාර රට වැසි
25 මිනිස්සු නා රජහට පූජා පිණිස එළඹියාහු මහා සෘද්ධි ඇති තෙරුන්
26 කරා ගොස් තෙරුන්ට අභිවාදනය කොට එකත් පසෙක හුන්නාහ.
27 ස්ථවිර තෙමේ ඒ මිනිසුන්ට ආශීර්විෂෝපම සූත්‍රය දේශනා කළ සේක.
28 අසූ දහසක් ප්‍රාණීන්ට ධර්මාභි සමය වී ලක්ෂයක් මිනිසුන් තෙරුන්
වෙත පැවිදි වූහ. එතැන් පටන් ඒ කාශ්මීර ගාන්ධාර වැස්සෝ මේ
දක්වාම තුනුරුවන් සරණ පරායණ වූවෝ කසා පිළියෙන් හෙබියෝ ය.

29 ඒ මහා දේව ස්ථවිර තෙමේ මහිස මණ්ඩල දේශයට වැඩ ජනයා
මැද පැමිණි සේක් දේව දූත සූත්‍රාන්ත වදාළ සේක. සතළිස් දහසක්
30 ප්‍රාණීහු අධිගම ලැබුයෝ ය. සතළිස් දහසක් පුරුෂයෝ උන්වහන්සේ
31 වෙත පැවිදි වූහ. වැලි රක්ෂිත නම් මහා ස්ථවිර තෙමේ වන වැද දනව්
පැමිණ අහසෙහි වැඩ සිට ජනයාට මධ්‍ය ගත වූ සේක් අනවරග්‍ර
32 සංයුක්තය වදාළ සේක. සැට දහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය වී සත්
33 තිස් දහසක් මිනිස්සු උන්වහන්සේ වෙත පැවිදි වූහ. ඒ දේශයෙහි
විහාර පන් සියයක් පිහිටියේ ය. ඒ මහා ස්ථවිර තෙමේ ඒ ජනපදයෙහි
34 බුදු සසුන් පිහිට වූ සේක. ධර්මාධර්ම දැන්මෙහි පණ්ඩිත වූ යෝණක
ධර්මරක්ෂිත නම් මහා ස්ථවිර තෙමේ අපරන්තක දනව් වැඩ ජනයා
35 මැද පැමිණිසේක් අග්ගික්ඛන්ධූපම සූත්‍රය වදාරා එහි පැමිණි සත් තිස්
දහසක්ප්‍රාණීන් දහම් අසා පෙවූ සේක. පුරුෂයන් දහසක් ද ඊට වැඩියක්
36 ස්ත්‍රීහු ද රජ කුලෙන්ම නික්ම පැවිදි වූහ. මහා ධර්මරක්ෂිත නම්
37 මහර්ෂි තෙමේ මහ රටට වැඩ එහි දී මහා නාරද කාශ්‍යප ජාතකය
38 වදාළ සේක. සුවාසූදහසක් ප්‍රාණීහු මාර්ග ඵලයට පැමිණියෝ ය.
තෙළෙස් දහසක් මිනිස්සු උන්වහන්සේ වෙත පැවිදි වූහ.

Non-Commercial Distribution

39 ඒ මහාරක්ෂිත නම් මහා සෘෂි තෙමේ යොන් රට වැඩ ජනයා
මැද පැමිණිසේක් කාලකාරාම සූත්‍රාන්තය වදාළ සේක. එක් ලක්ෂ
40 සැත්තෑ දහසක් ප්‍රාණීහු මාර්ග ඵලයට පැමිණියෝ ය. දස දහසක්
41 දෙනා පැවිදි වූහ. මධ්‍යම නම් මහා සෘෂි තෙමේ සතර තෙර කෙනෙකුන්
හා හිමවත් පෙදෙස් වැඩ දම්සක් පැවතුම් සූත්‍රය වදාළ සේක. අසූ
42 කෙළක් ප්‍රාණීහු මාර්ග ඵලයට පැමිණියෝ ය. ඒ ස්ථවිර වරයෝ පස්
43 දෙනා වෙන වෙන පස් රටක් පැහැද වූහ. එක් එක් තෙර කෙනෙකුන්
වෙත ලක්ෂයක් ලක්ෂයක් මිනිස්සු සම්මා සම්බුදු සසුන්හි ප්‍රසන්නයෙන්
44 පැවිදි වූහ. මහා සෘද්ධි ඇති ශෝණ ස්ථවිර තෙමේ උතුරු තෙරුන්
45 සමග ස්වර්ණ භූමියට වැඩි සේක. ජල රාක්ෂසියක් තොමෝ මුහුදෙන්
නික්ම අවුත් රජ ගෙයි උපනුපන් දරුවන් භක්ෂණය කොට පෙරලා
46 මුහුදු වදනීය. එකෙණෙහි රජ ගෙහි දරුවෙක් ද උපන්නේ ය. මිනිස්සු
47 තෙරුන් දැක "රකුසන්ගේ යහළුවෝය" යි සිතා මරන්ට ආයුධ ගත් අත්
ඇතිව එළඹුණා හ. ඒ තෙරුන් වහන්සේලා "මේ කීමෙක් දැ" යි විචාරා
48 ඒ මිනිසුන්ට "අපි සිල්වත් ශ්‍රමණයම්හ, රාක්ෂසියකගේ යහළුවෝ
නොවම්හ" යි වදාළෝ ය. පිරිස් සහිත ඒ රාක්ෂසී තොමෝත්,
49 සාගරයෙන් නික්මුණා ය. ඒ දැක මහා ජනයෝ මහ හඬින් හැඬූහ.
ස්ථවිර තෙමේ භයංකාර වූ රකුසන් දෙගුණයක් මවා ගෙණ පිරිස්
50 සහිත ඒ රකුසිය හාත්පසින් වට ලූ සේක. ඕ තොමෝ මොවුන් විසින්
51 මේ ස්ථානය ලබන ලදැ" යි සිතා බිය වැද පලා ගියා, හාත් පසින් ඒ
52 දේශයට අරකුන් ලබා ස්ථවිර තෙමේ ඒ රැස් වූ පිරිසෙහි බ්‍රහ්ම ජාලය
53 දේශනා කළ සේක. බොහෝ මිනිස්සු සරණ සිල්හි පිහිටියෝ ය. සැට
54 දහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය විය. තුන් දහස් පන් සියයක් කුල
දරුවෝ පැවිදි වූහ. එක් දහස් පන්සියයක් කුල කුමාරිකාවෝ පැවිදි
වූහ. එවක් පටන් මිහිපල්හු රජගෙහි උපන් කුමරුවන්ට ශොණ උත්තර
තෙරණු වන් හා සමාන නම් කළෝ ය.

55 උන් වහන්සේලා වනාහි මහා කරුණා ඇති බුදුන්ගේ පවා
චිත්තාකර්ෂණය කට හැකි අධිගතාමෘත නිවන් සැපය පවා අනුභව
කෙරෙමින් නොහිඳ ඒ ඒ දනව් සැරිසරා ලෝ වැස්සා හට යහපතක්ම
කළෝ ය. එහෙයින් ලෝ වැඩෙහි කවර නම් නුවණැත්තෙක් පමා
වන්නේ ද? නොවන්නේ මැයි.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස
නානාදෙසප්පසාදක නම් දොළොස්වන අදියර නිමි.

Non-Commercial Distribution

# දහතුන් වෙනි පරිච්ඡේදය

1 එකල උපසපන් දොළොස් හැවිරිදි වූ මහ නුවණැති ඒ මහ
මහේන්ද්‍ර ස්ථවිර තෙමේ උපාධ්‍යාය වූ මොග්ගලි පුත්ත තිස්ස
2 තෙරුන් හා සංඝයා විසින් අණවනු ලත් සේක් ලක්දිව පහයනට කල්
බලමින් "මුටසීව රජ මහළුය, පුත්‍ර තෙමේ රජ වේ වා" යි සිතූ සේක.
3 ඒ අතර ඥාති වර්ගයා දක්නට සිතා උපාධ්‍යායන් වහන්සේ ද සංඝයා
ද වැඳ පිය රජු විචාළ සේක. යටකී තෙරුන් වහන්සේලා සතර දෙනා
4 ද කැටිව සංඝමිත්‍රා පිත් ෂට් අභිඥා හා මහා සෘද්ධි ඇති සුමන
5 සාමණේරයන් ද ගෙණ නෑයන් සංග්‍රහ කරණට දක්ෂිණාගිරි දනව් වැඩි
සේක. ඉක්බිති එහි හැසිරෙන උන් වහන්සේට සමසක් ඉක්මුණාහ.
6 ක්‍රමයෙන් මවු බිසවුන් වසන වේදිසගිරි නුවර අවුත් මෑණියන් දුටුසේක.
දේවි තොමෝ ප්‍රිය පුතු දැක පිරිස් සහිත උන්වහන්සේ වලඳවා තමා
7 විසින් කරවන ලද යහපත් වේදිසගිරි විහාරයට නැංග වූ සේක.

8 ඒ අශෝක රජ තෙමේ කුමාර කාලයෙහි සියපියහු විසින් දෙන
ලද අවන්ති රට අනුභව කෙරෙමින් පෙර උදේනි නුවර යන කල
9 වේදිස නම් නුවර නවාතැන් ගෙණ එහි දී මනා රූ ඇති සිටු කුලෙහි
10 උපන් දේවී නම් කුමරියක් ලැබ ඈය සමග වාසය කෙලේ ය. ඕ
තොමෝ එයින් ගැබ් ගෙණ උදේනි නුවර දී යහපත් රූ ඇති මහින් ද
11 නම් ඒ කුමරහු වැදූවා, දැවුරුදදක් ඉක්ම සංඝ මිත්‍රා නම් දුව ද වැදූවා,
12 මේ කාලයෙහි ඒ බිසව් වේදිස නුවර වසන්නීය. කල් දන්නා මහේන්ද්‍ර
13 ස්ථවිර තෙමේ එහි වැඩ හිඳ "මපියාණන් විසින් අණවන ලද දෙවන
අභිෂේක මහෝත්සවය ඒ දෙවන පෑතිස් මහ රජ තෙමේ අනුභව
කෙරේවා, දූතයන් අතින් අසා තුනුරුවන් ගුණ දනීවා, පොසොන්
14 පුණු පොහෝ දවස්හි මිශ්‍රක පර්වතයට නගීවා එදවස්හි අපි ප්‍රවර
ලක්දිව් යන්නමෝ ය යි සිතුසේක.

15 මහේන්ද්‍ර තෙමේ උතුම් වූ මහේන්ද්‍ර ස්ථවිරයන් කරා එළඹ
16 "ලක්දිව් පහන් කරවන්ට වැඩිය මැනව බුදුන් විසිනුදු ව්‍යාකාරණ කරණ
ලදුයෙහි ය, අපිදු ඊට උපකාර වන්නමෝ ය" යි කීයේ ය. මෙහෙසිය
බුහුනන් පිත් භණ්ඩුක නම් කුමාර තෙමේ තෙරුන් විසින් මවු බිසවුන්ට
17 දේශනා කළ දහම් අසා අනාගාමි ඵලයට පැමිණියේ තෙරහු වෙත
18 විසීය. එහි මසක් වැස පෙසොන් පුණු පොහෝ දවස්හි ස්ථවිර තෙමේ
19 තෙරුන් සතර දෙනාය සුමන සාමණේරය භණ්ඩුක නම් ඒ අනාගාමි
කුමාරය යන මොවුන් හා කැටිව නෑයින් බලා එහි නො ඇළුණු සේක්
20 ඒ විහාරයෙන් අහසට නැඟී මහා සෘද්ධි ඇති සේක් ක්ෂණයකින්ම

*Non-Commercial Distribution*

මෙහි වැඩ සිත්කලු මිශ්‍රක පර්වතයෙහි පියල් කුල උතුම් රුචිර අඹතලෙහි වැඩ සිටිසේක.

21 පරිනිර්වාණ මංචකයෙහි හොත් මුනි රාජයන් විසින් ලක් වැඩ පිණිස ලක්දිව් ප්‍රසාද කර ගුණයෙන් ප්‍රකාශ කරණ ලද්දා වූ ලක්දිව් හි බුදුහු බඳු ඒ මහා ස්ථවිර තෙමේ ඊට වැඩ පිණිස ලක් දිව්හි දෙවියන් විසින් පුදන ලදුයේ එහි වැඩ උන්සේක.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස මහින්දාගමන නම් වූ තෙළෙස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# දහහතර වෙනි පරිච්ඡේදය

1 ඒ දෙවන පෑතිස් රජ නුවර වැසියන්ට දියකෙළි විධාන කොට
2 තෙමේ මුව දඩ කෙළියට ගියේ ය. සතළිස් දහසක් මිනිසුන් විසින්
3 පිරිවරණ ලදුයේ පයින්ම දුවමින් මිශ්‍රක පර්වතයට ගියේ ය. ඒ පව්හි
4 වසන දෙවියා රජහට තෙරුන් දන්වනු කැමැත්තේ ගෝණ වෙස ඇත්තේ
තණ පඳුරක් කමින් සිටි යා සේ දැක්විය. රජ තෙමේ දැක "පමා වූවා හු
විඳිනට යුතු නොවෙ" යි සිතා දුනුදිය පෙළීය. ගෝණ තෙමේ
5 පර්වතාන්තයට දිවීය. රජ තෙමේ ලුහුබැඳ ගියේ ය. මෘග වෙස් ගත්
ඒ දෙව් තෙමේ තෙරුන් වෙත ගොස් රජු විසින් තෙරුන් දුටු කල
අතුරුදහන් වී.

ස්ථවිර තෙමේ "අප බොහෝ දෙනා දුටු කල වැඩියක්ම බානේ"
6 ය යි සිතා තමන් පමණක් දැක් වූ සේක. රජ තෙමේ ඒ තෙරහු දැක
7 බියපත්ව සිටියේ ය. ස්ථවිර තෙමේ ඔහුට "එව තිස්සය" යි වදාළ
8 සේක. තිස්ස යයි යන බසින්ම රජ තෙමේ "යක්ෂයෙකැ" යි සිතීය.
ස්ථවිර තෙමේ "මහරජානෙනි! අපි ධර්ම රාජයන් වූ බුදුන් සව්
9 ශ්‍රමණයම්හ; තොපට අනුකම්පා පිණිසම දඹදිවින් මෙහි ආම්හ යි
වදාළ සේක. ඒ අසා රජ තෙමේ පහ වු බිය ඇත්තේ වී යහළුවාගේ
10 අසුන් මෙනෙහි කොට ශ්‍රමණයෝ යයි නිශ්චිත කරණ ලදුයේ දුනු හී
දමා ඒ තෙරුන් වෙත එළඹ ඒ තෙරුන් හා සමග සතුටු වනුයේ
උන්වහන්සේ වෙත හිඳගත.

11 එකල්හි මහ රජහුගේ පිරිස් අවුදින් පිරිවැරූය. එකල්හි මහා
ස්ථවිර තෙමේ සමග ආ සෙසු සදෙනා දැක් වූ සේක. රජ තෙමේ
12 උන්වහන්සේලා දැක "මොව්හු කවදා ආවෝද්ද" යි කීය. "මා සමගම" යි
13 තෙරුන් විසින් වදාළ කල නැවතත් "මෙබඳු අන්‍ය වූත් යතීහු දඹදිව්හි
ඇද්ද" යි රජතෙමේ විචාළේ ය. ස්ථවිර තෙමේ "ජම්බුද්වීපය කාෂාය
14 වස්ත්‍රයෙන් බබළයි. එහි වනාහි ත්‍රිවිද්‍යා ඇත්තෝ ය. ඍද්ධි ප්‍රාප්තයෝ
ය, පරසිත් දන්නෝය, දිව්‍ය ශෝත්‍ර ඇත්තෝ ය, යන බුද්ධ ශ්‍රාවක වූ
15 බොහෝ රහත්හු ඇත්තාහ" යි වදාළ සේක. "කුමකින් වැඩි සේක් ද"
යි විචාළේ ය. "දියෙන් හෝ ගොඩින් හෝ නොආම්හ" යි වදාරණ
16 ලද්දා වූ ඒ රජ තෙමේ අහසින් වැඩිය හ යි දත්තේ ය. මහ පැණ ඇති
ඒ මහා ස්ථවිරය තෙමේ රජහු නැණ විමසන සේක් ඔහුගෙන් පැණ
පිළිවිසි සේක. පුළුවුත් ඒ ඒ පැණ රජ තෙම ඔහුගෙන් පැණ පිළිවිසි
17 සේක. "මහ රජාණෙනි ? මේ රුක කිනම් ද" යි විචාළ සේක. රජ
තෙමේ "මේ තුර අඹ නමැ" යි කීය. "මේ හැර අඹ රුකෙක් ඇද්ද" යි

Non-Commercial Distribution

විචාළ සේක. "බොහෝ අඹ තුරු අත්තාහ" යි කීය. "මේ අඹ තුර ද ඒ
18 අඹ තුරු ද හැර වෙන තුරු ඇද්ද" යි විදාළ සේක, "වහන්ස! බොහෝ
තුරු ඇත්තාහ. ඒ තුරු අඹ නොවෙති" යි කියේ ය. "ඒ අඹත් නොඅඹත්
19 හැර වෙන තුරු ඇද්දයි" විදාළ සේක. "ස්වාමීනි මේ අඹ රුකය" යි
කීයේය. "නරෙශ්වරය ! පණ්ඩිතයෙහි" යි වදාළ සේක. "මහ රජ!
20 තොපගේ නෑයෝ ඇද්ද" යි විදාළ සේක. "බොහෝ දෙනෙක් ඇත්තාහ"
21 යි කීයේය. "නො නෑයෝත් ඇද්දැ" යි විචාළ සේක. "බොහෝ නො
නෑයෝ ඇතියහ" යි කී යේය. "ඒ නෑයනුත් නො නෑයනුත් හැර
22 අනිකෙකුත් ඇද්ද" යි විචාළ සේක. "මමමය"යි කීයේ ය. "මහ රජ!
මැනව තෙපි පණ්ඩිතැ" යි වදාළ සේක. මහ නුවණැති යි වදාළ සේක.
මහ නුවණැති ස්ථවිර මේ රජු පණ්ඩිතැ යි දැන රජහට "චූලහත්ථි
23 පදෝපම සූත්‍රය" වදාළ සේක. දේශනා කෙළවර ඒ තෙමේ සතළිස්
දහසක් ඒ මිනිසුන් හා සරණයෙහි පිහිටියේ ය.

ඒ දවස් සන්ධ්‍යා කාලයෙහි රජහට ආහාර එලවූහ. "දැන් මුන්
24 වහන්සේලා නො වළඳත්හ" යි දන්නාහ වුත් රජ තෙමේ "විචාරන්ටම
25 යුත්තේ" ය යි ඒ තෙරුන් බතින් විචාළේ ය. "දැන් නො වළඳම්හ" යි
වදාළ කල්හි නුවරට යම්හ යි මෙසේ කීය. විචාළේ ය. කාලය වදාළකල්හි
"නුවරට යම්හ" යි මෙසේ කීය. "මහ රජ! තෙපි යා අපි මෙහි
26 වසන්නමෝය" යි වදාළ සේක එසේ කල කුමාර තෙමේ අප සමග
27 යේව යි කීයේ ය. "මහ රජාණෙනි, මේ තෙමේ වූ කලි පැමිණි ඵල
28 ඇත්තේ ය, දන්නා ලද බුදු සසුන් ඇත්තේ ය. පැවිදි අපේක්ෂා
කරමින් අප වෙත වසයි. දැන් මොහු පැවිදි කරන්නෙමු. මහ රජාණෙනි!
29 තෙපි යව" යි වදාළ සේක. "පෙරවරු රථය එවන්නෙමි. නුඹ
වහන්සේලා එහි සිටියෝ පුරයට වඩිත්ව" යි කියා තෙරුන් වැඳ භණ්ඩුක
30 නම් කුමරහු ඉවත කැඳවා තෙරුන්ගේ අධිකාරිය විචාළේ ය. ඒ කුමර
රජහට සියල්ල කීය. තෙරුන් ඇඳින ඉතා සතුටු වූ ඒ තෙම "මාගේ
31 ලාභය" ය සිතුයේ ය. භණ්ඩුක නම් කුමරහු ගිහි බැවින් අපගත ශංකා
ඇති නරෙන්ද්‍රයා මිනිස් බව දත්තේ ය. ඒ ස්ථවිර තෙමේ "මොහු පැවිදි
32 කරන්නෙමු ය" යි එකෙනහිම ග්‍රාම සීමාවෙහි දී භාණ්ඩුක නම්
33 කුමාරයාගේ පැවිද්දත් උපසම්පදාවත් කළ සේක. ඒ ක්ෂණයෙහිදීම
34 උන්වහන්සේත් රහත් බවට පැමිණි සේක. ඉක්බිති මහා ස්ථවිර තෙමේ
ඒ සුමන සාමණේරයන්දෑට "ධර්ම ශ්‍රවණ කාලය සෝෂා කරව" යි
වදාළ සේක. "ස්වාමිනී අස්වන්නා වූ මම කෙනෙක් තැන්
අඬගාලන්නෙම් දැ" යි විචාළ සේක. තෙරුන් විසින් "මුළු තාමුපර්ණි
35 දිවයිනැ" යි වදාළ කල අස්වන සාමණේරයන් දෑ ඍද්ධි බලයෙන් මුළු
36 ලක්දිව දහම් කල් සෝෂා කෙළේ ය. ඒ රජ තෙමේ නාග චතුෂ්ක නම්

Non-Commercial Distribution

36 ගල් කෙම්ප හිඳගෙණ බත් අනුභව කෙරෙමින් ඒ ශබ්දය අසා ඇමැතියන් යැවූයේ ය. ඔහු ගොස් "උපද්‍රවයෙක් ඇද්දෝ" යි කීහ. "උපද්‍රවයෙක්
37 නැත්තේ ය. සම්බුද්ධ වචන ශ්‍රවණයට කාලය ඝෝෂා කරණ ලද" යි
38 වදාළ සේක. සාමණේරයන්ගේ හඬ අසා භූමි නිශ්‍රිත දෙවියෝ ඝෝෂා කළහ. පිළිවෙළින් ඒ ශබ්දය බඹ ලොවට නැංග්ය. ඒ ඝෝෂාවෙන්
39 දෙවියන්ගේ මහා සමාගමය විය. ස්ථවිර තෙමේ ඒ සමාගමයෙහි
40 "සමචිත්ත සූත්‍රය" දේශනා කළ සේක. අසංඛ්‍ය ගණන් දෙවතාවුන්ට
41 ධර්මාභිසමය වී බොහෝ නාග සුපර්ණාදීහු සරණයෙහි පිහිටියෝ යි, සැරියුත් තෙරුන් විසින් මේ සූත්‍ර දෙසන කල යම් සේ වී නම් එසේම මහේන්ද්‍ර ස්ථවිරයන් දෙසන කලත් දිව්‍ය සමාගමය වූයේ ය.

42 රජ තෙමේ පසුවදා උදය රථය එවූයේ ය. ඒ රියදුරු තෙමේ ගියේ "රථයට නැංග මැනව නුවරට යමුය" යි උන් වහන්සේලාට කීයේ
43 ය. "රථයට නොනැගෙම්හ. තෙපි යව, තට පසුව එන්නමෝ" ය යි මෙසේ වදාරා යහපත් කල්පනා ඇති ඒ මහා ඍද්ධි ඇති තෙරුන් වහන්සේලා රියැදුරා යවා අහසට නැඟි නුවරින් නැගෙණහිර පළමු
44 සෑතැන් වැඩි සේක්ලා ය. තෙරුන් විසින් පළමුවෙන් බස්නා ලද තැන
45 කළ සෑය එහෙයින් පඨමක චේති යයි මෙසේ අද වන තුරුත් කියනු ලැබේ. යම් හෙයකින් සියලු අන්තඃපුර ස්ත්‍රීහු රජහු අතින් තෙරුන්
46 ගුණ අසා තෙරුන් දක්නට කැමැති වූ ද එහෙයින් මිහිපල් තෙමේ රාජ
47 වස්තුව තුළම රම්‍ය වූ මණ්ඩපයක් කරවී. සුදුවූ වස්ත්‍රයෙන් හා මලින් වසන ලද්දේ වී එසේම අලංකාර කෙළේ ය. තෙරුන් වෙත දී උස් අස්නෙන් තොර බැව් ඇසූ බැවින් ස්ථවිර තෙමේ උස් අස්නෙහි හිඳිනේ
48 හො නොවේ දෝයි ශංකා ඇති වී ඒ අතර රථාචාරියා එහි සිටියා වූ
49 සිවුරු පෙරවන්නා තෙරුන් දැක ඉතා විස්මිත සිත් ඇත්තේ ගොස්
50 රජහට දැන් විය. රජ තෙමේ සියල්ල අසා "පුටුව හිඳීම නොකරන්නා
51 හ" නිශ්චිත වූයේ ඉතා මනාකොට බුමුතුරුණු පණවව් යයි කියා පෙර
52 ගමන් කොට සකසා තෙරුන් වැඳ මහා මිහිඳු තෙරුන්ගේ අතින් පාත්‍රය ගෙණ සත්කාර පූජා කෙරෙමින් පුරයට තෙරහු ප්‍රවේශ කෙළේ යි.

53 "නිමිත්ත ශාස්ත්‍ර දන්නෝ මෙසේ අසුන් පැණෙව්වා දැක "මුන් වහන්සේලා විසින් පොළෝ තොමෝ ගන්නා ලද්දීය. මේ දිවිහි ඊශ්වර
54 වන්නාහ" යි කී වුහ. නරේන්ද්‍ර තෙම ඒ තෙරුන් පුදමින් අන්තඃපුරයට වැඩම විය. ඒ තෙරුන් වහන්සේලා එහි සුදුසු පරිද්දෙන් පිළි අතුළ
55 අසුන්හි හිඳ ගත්තේ ය. නරේන්ද්‍ර තෙමේ ඒ තෙරුන් කැඳ අවුළු හා භෝජනයෙන් සන්තර්පණය කෙළේ ය. බත් කිස නිමි කල්හි තෙමේ
56 වෙත හිඳ ගෙණ මහා නාග නම් මල්යුව රජහුගේ මෙහෙසි වූ රජ

Non-Commercial Distribution

57 ගෙහිම වසන අනුළා නම් බිසව කැඳවීය. ඒ අනුළා දෙවි තොමෝ පන්
සියයක් ස්ත්‍රීන් හා අවුදින් තෙරුන් වැඳ පුදා එකත්පසෙක ඉඳ ගත්තා
58 ය. ස්ථවිර තෙමේ පේවත්, විමන්වත් හා සච්ච සංයුත්තය දෙසූ සේක.
59 ඒ ස්ත්‍රීහු ප්‍රථම ඵලයට පැමිණියෝ ය. නුවර වැස්සෝ ඊයේ දුටු මිනිසුන්
අතින් බොහෝ වූ තෙර ගුණ අසා තෙරුන් දක්නා කැමැත්තාහු රැස්ව
60 ගෙණ රජ ගෙහි දොර මහත් අරගල කළෝ ය. රජ තෙමේ ඒ අසා
විචාරා දැන ඔවුන්ට හිත කැමැත්තේ "සියල්ලන්ට මෙහි සම්බාධය,
61 මඟුලැතුහල ශුද්ධ කරව්, නුවර වැස්සෝ එහි දී මේ තෙරුන් දක්නාහ"
62 යි කීයේ ය. එකෙණෙහි ඒ ඇත්හල ශුද්ධ කරවා වියන් ආදියෙන්
63 අලංකාර කොට සුදුසු පරිද්දෙන් සෙනසුන් පැණවූහ. ඒ මහා ස්ථවිර
තෙමේ තෙරුන් සමග එහි පැමිණ වැඩ හිඳ මහා කථික වූ සේක් දේව
64 දූත සුත වදාළ සේක. රැස් වූ නුවරු ඒ අසා පහන් වූහ. අන් අතුරෙන්
දහසක් ප්‍රාණීහු සෝවාන් ඵලයට පැමිණියෝ ය.

65 ලංකාව පිහිටු වීමෙහි හෝ අධික කොට තැබීමෙහි ශාස්තෘ කෙනෙකුන්ගේ ආකාර ඇති ලක්දිවට පහනක් බඳු වූ ඒ මහා ස්ථවිර තෙමේ මෙසේ දෙ තැනෙක් හි දී හෙළදිව් බසින් දහම් වදාරා ලක්දිව් වැසි ජනයා කෙරෙහි සද්ධර්මයාගේ බැස ගැන්ම කරවූ සේක. හෙවත් සද්ධාරමයෙහි ජනයා පිහිට වූ සේක.

මෙසේ හුදි ජනයා පහන් සංවේග පිණිස කළ මහවස "නගරප්පවේසන" නම් තුදුස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# පසළොස් වෙනි පරිච්ඡේදය

1 එහි පැමිණි ආදර සහිත වූ ඒ මනුෂ්‍යයෝ ඇත් හල ද අනවකාශ
2 යයි නුවර දකුණු දොරින් පිට ශාන්ද්‍රච්ඡායා ඇති නිල් කුසතණින් යුක්ත
වූ සිහිල් මනරම් වූ නන්දන නම් රජ උයනෙහි තෙරුන් වහන්සේලා ට
3 හසුන් පැණවූහ. ඒ ස්ථවිර තෙම (නුවර) දකුණුදොරින් නික්ම එහි ද
වැඩ හුන් සේක. ශ්‍රේෂ්ඨ කුලවත් වූ බොහෝ ස්ත්‍රීහු ද එහි අවුත් උයන
4 පුරවමින් තෙරුන් වහන්සේට නුදුරුව උන්හ. ස්ථවිර තෙම ඔවුන්ට
5 බාලපණ්ඩිත නම් සූත්‍රාන්ත ධර්මය දේශනා කළ සේක. ඔවුන් අතුරෙන්
දහසක් ස්ත්‍රීහු පළමු වෙනි වූ සෝවාන් ඵලයට පැමිණියහ. මෙසේ ඒ
නන්දන නම් උයනෙහිම සවස් වේලාව වූයේ ය.

6 ඉක්බිත්තෙන් ස්ථවිරයෝ තුමූ "එම පර්වතයට යම්හ" යි
නික්මුණාහ. (මනුෂ්‍යයෝ ඒ බැව්) මහ රජාණන්ට දැන්වූහ. රජ
7 තෙමේ වහා එතන්හි එළඹියේ ය. එළඹ සිට "දැන් සවස් විය, පර්වතය
ද දුරැය. මේ නන්දන වනයෙහිම විසීම ඵාසුය" යි ස්ථවිරයන් වහන්සේට
8 සැල කෙළේය. "පුරයට අතිශයින් ආසන්න බැවින් නොසරුප්ය" යි
වදාළ කල්හි "මහමෙවුනා උයන ඉතා නුදුරු නොළංතැන සිත්කලු ද
9 ඡායෝදක සමන්විත ද වේ. එහි විසීම රුචි වේවා, වහන්ස! නැවතුන
මැනැවැ යි කී කල්හි ස්ථවිර තෙම එහි නැවති සේක.

10 ඒ නැවැති තැන කොළොම් හොව සමීපයෙහි කරණ ලද
11 සෑය "නිවත්තක චේතිය" යි කියනු ලැබේ. රජ තෙමේම නන්දන නම්
වූ උයනින් නික්ම දකුණු පසින් මහමෙවුනා උයන පැදුම්දොරට
13 ස්ථවිරයන් පැමිණ වූයේය, එහි රම්‍ය වූ රාජ මන්දියෙහි යහපත් වූ
14 ඇඳ පුටු මනා කොට අතුරුවා "මෙහි සුවසේ වාසය කරණ සේකවා"
14 යි කියා නරෙන්ද්‍ර තෙම ස්ථවිරයන් වැඳ ඇමැතියන් විසින් පිරිවරන
ලද්දේ පුරයට ප්‍රවිෂ්ට වූයේය. ඒ ස්ථවිරයෝ තුමූ ඒ රැය එහි විසූ
සේක. රජ තෙම උදෑසනම මල් ගෙන්වා ගෙණ ස්ථවිරයන් වහන්සේලා
කරා එළඹ වැඳ මලින් ද පුදා කිමෙක සුවසේ වාසය වී ද? උයන
16 යතීන්ට ඵාසු දැ" යි විචාළේ ය. "මහ රජ! සුවසේවාසය වූයේය. උයන
17 තපස්වීන්ට ඵාසුවේ" යි (වදාළ සේක) ඒ නරේනද්‍ර තෙම "වහන්ස!
18 ආරාමය සංඝයාට කැප දැ" යි විචාළේ ය. කැප නොකැප දැනීමෙහි
දක්ෂ වූ ස්ථවිර තෙම "කැපය" යි වදාරා වේළුවනාරාමය පිළගැණීම
වදාළසේක. ඒ අසා මහ රජ තෙම ඉතා සතුටු වූයේය. මහ ජන තෙම
තුටු පහටු විය. ස්ථවිරයන් වඳනා පිණිස ආවා වූ අනුලා දේවි තොමෝ
19 පන් සියයක් ස්ත්‍රීන් හා සමග ශකෘදාගාමි ඵලයට පත් විය. ඒ පන්

Non-Commercial Distribution

සියයක් ස්ත්‍රීන් සහිත වූ අනුළා දේවි තොමෝ ද "දේවයන් වහන්ස!
පැවිදි වෙම්හ යි කීවා ය. රජ තෙමේ මොවුන් පැවිදි කරණ සේකවා යි
ස්ථවිරයන් වහන්සේට සැල කෙළේ ය.

20 ස්ථවිර තෙම "මහ රජාණෙනි! අපට ස්ත්‍රීන් පැවිදි කිරීම කැප
නැත්තේ ය. මාගේනැගනි වු සංඝමිත්‍රා නමින් ප්‍රසිද්ධ වූ බහු ශ්‍රැත වූ
මෙහෙණින්නක් තොමෝ පැළලුප් නුවර ඇත්තීය. නරේන්ද්‍රය! ඕ
21 තොමෝ ශ්‍රමණෙන්ද්‍ර වූසර්වඥයන් වහන්සේගේ මහා බෝධි වෘක්ෂ
රාජයාගෙන් දක්ෂිණ ශාඛාව ද එසේම උත්තම වූ භික්ෂුණීන් ද ගෙණ
22 වඩනා සේක්ව" යි අප පිය මහ රජු කරා හසුන් යවව ඒ ස්ථවිර
23 තොමෝ මෙහි අවුත් මේ ස්ත්‍රීන් පැවිදි කරන්නීය. යි රජහට වදාළ
24 සේක. රජ තෙම යහපතැ යි කියා උතුම් වූ කෙණ්ඩිය ගෙණ "මේ
මහමෙවුනා උයන සඟහට දෙමි යි කියා මිහිඳු මහ තෙරුන් වහන්සේ
25 ගේ අත්ලෙහි දක්ෂි ණෝදකය වැගිර වූ යේය. ජලය මිහිපිට වැටුණ
26 කල්හි මහ පොළෝ තොමෝ කම්පිත විය. "කුමක් හෙයින් පෘථිවි
තොමෝ කම්පා වන්නී දැයි මිහිපල් තෙම ඒ තෙරුන් වහන්සේ විචාළේය.
27 ඒ ස්ථවිර තෙමේ "ලංකාද්වීපයෙහි (බුදු) සස්න පිහිටි බැවිනැ" යි වදාළ
සේක. ජාති සම්පන්න වූ රජතෙම ස්ථවිරයන් වහන්සේට දෑසමන්මල්
28 පිළිගැන් වූයේය. ස්ථවිර තෙම වැඩ ඊට දකුණු පස වැඩ සිටිසේක් මල්
29 මිටු අටක් හිඹුල් රුකක් මුල ඉසි සේක. එහිඳු පොළොව කම්පිත විය.
රජහු විසින් විදාරනු ලත් සේක් "නරෙන්ද්‍රය කකුසන්ධාදී තුන් බුදුන්
කාලයෙහිඳ මෙහි සංඝ කර්ම පිණිස මාලක සීමා විය, මේ කාලයෙහිදු
30 වන්නීය" යි රජහට කරුණ වදාළ සේක. ස්ථවිර තෙම රජ හට උතුරු
දෙසින් මනෝඥ වූ පොකුණක් කරා වැඩිසේක්, එපමණම මල් එහි ද
වැගිර වූ සේක. ඒ මල් ඉවසීමෙහිදු පොළොව කම්පිත විය. විචාරණ
31 ලද්දා වූ ස්ථවිර තෙම "මහ රජාණෙනි! මේ පොකුණ (සංඝයාට) ගිනි
හල් පොකුණ වන්නීය" යි ඊට කරුණා වදාළ සේක.

32 (මහා මහේන්ද්‍ර නම් වූ) ඍෂි තෙම එම රාජ මන්දිරයාගේ දොර
33 කොටුවට වැඩ එපමණම මලින් ඒ ස්ථානය පිදූ සේක. එහිදු පොළොව
කම්පිත විය. අතිශයින් රොමෝද් ගමයෙන් යුක්ත වූ ඒ රජ තෙම ඒ
කාරණය ස්ථවිරයන් වහන්සේ විචාළේය. ස්ථවිර තෙම "මහීපාලය!
34 මේ කල්පයෙහි තුන් බුදුවරයන්ගේ බෝධි වෘක්ෂයන්ගෙන් දක්ෂිණ
ශාඛාවන් ගෙණවුත් මෙහි රෝපණය කරණ ලදහ. මහීපාලය අප
35 තථාගතයන් වහන්සේගේ බෝධි වෘක්ෂයාගේ දක්ෂිණ ශාඛා තොමෝ
ද මේ ස්ථානයෙහිම පිහිට වන්නීය" යි උහුට කරුණ වදාළසේක.
36 මහාස්ථවිර තෙම එතැනින් මහා මුචල නම් වෘක්ෂමූලයට වැඩි සේක්

Non-Commercial Distribution

එපමණම මල් ඒ ස්ථානයෙහි වැගිර වූ සේක. එහිදු පොළොව කම්පිත
විය. රජහු විසින් විචාරණ ලද ස්ථවිර තෙම "භූමි පාලය! මෙහි
37 සංඝයාගේ පොහෝ ගෙය වන්නේය" යි ඔහුට කරුණ වදාළ සේක.
38 මහ රජ තෙම එතැනින් පැණඹ මලුවට සම්ප්‍රාප්ත වූයේය. යහපත් සේ
ඉදී ගියා වූ වර්ණ ගන්ධ රස සම්පන්න වූ මහත් වූ අඹ පලයක් ද උයන්
39 පල් තෙමේ මහ රජහට එවූයේ ය. ඉතා සිත්කලු වූ ඒ අඹ පලය
නරේන්ද්‍ර තෙම ස්ථවිරයන් වහන්සේට එවූයේ ය. ජන සමූහයා කෙරෙහි
40 වැඩ කැමති වූ ස්ථවිරයන් වහන්සේ වැඩ හිඳිනු කැමැති ආකාරයක්
(රජහට) දක් වූ සේක. නරේන්ද්‍ර තෙම එහිම උතුම් ඇතිරිල්ලක් ඇතිර
41 වූයේ ය. එහි වැඩ හුන් තෙරුන් වහන්සේට නරෙන්ද්‍ර තෙම අඹය
42 පිළිගැන් වූයේය. ස්ථවිරයන් වහන්සේ එය වලඳා අඹ බිජුවටය
රෝපණය කරණු පිණිස මහ රජාණන්ට දුන් සේක. නරේන්ද්‍ර තෙමේ
එම අඹ බිජුවටය එහි රෝපණය කෙළේ ය. ස්ථවිර තෙම එය පැලවී
43 වැඩෙනු පිණිස ඒ මතුයෙහි හස්තයන් ධොවනය කළ සේක. එකෙණෙහිම
ඒ ආම්‍රබීජයෙන් අංකුර යක් නැගී ක්‍රමයෙන් වැඩීපත්‍ර ඵලධාරී වූ ඉතා
මහත් රුකක් වූයේ ය. රජු සහිත වූ ඒ පිරිස් තොමෝ ඒ පෙළහර දක
44 හටගත් රොමෝද්ගම ඇත්තී ස්ථවිරයන් වඳිමින් සිටියාය. ස්ථවිර තෙම
45 එකල්හි මල් අට මිටක් එහි විසිර වූ සේක. එහිදු පොළොව කම්පිත
විය. රජහු විසින් විචාරණ ලද ස්ථවිර තෙම නරේශ්වරයාණෙනි මේ
46 ස්ථානය සංඝයාට උපන් නොයෙක් ලාභයන් සමගිව බෙදන ස්ථානය
වන්නේ යි යි ඒ රජහට කාරණය වදාළ සේක.

47 එතැනින් චතුශ්ශාලාව පිහිටන තැනට වැඩ එපමණම මල් එහි
විසිර වූ සේක. එහිදු පොළොව කම්පිත විය. නරේන්ද්‍ර තෙම ඒ කම්පා
48 වීමේ කාරණය විචාළේ ය. ස්ථවිරයන් වහන්සේ මහ රජාණෙනි පූර්ව
වූ කකුසන්ධාදී තුන් බුදුවරයන් මේ උයන පිළිගත් කල්හි ලක්දිව් වැස්සන්
විසින් සියලු දිගින් ගෙණවා දාන වස්තූන් මෙහි තබා සංඝයා සහිත වූ
49 තුන් බුදුවරයන් වැලඳ වූහ. මේ කාලයෙහි වනාහි මෙහිම චතුශ් ශාලාය
50 වන්නීය. නරශ්‍රේෂඨය මෙහි සංඝයාගේ භක්ත භෝජන ස්ථානය
වන්නේ යි කාරණය ප්‍රකාශ කළ සේක.

51 කාරණා කාරණායන් දැනීමෙහි දක්ෂ වූ ලක්දිව් බබුළු වන්නා වූ
මහේන්ද්‍ර නම් මහා ස්ථවිර තෙම එතැනින් මහසෑය පිහිටිය යුතු තැනට
52 වැඩි සේක. එකල්හි රජ උයනට ඇතුළත් වූ තන්හි කකුධ නම් වූ කුඩා
වැවක් වීය. ඒ වැව මතුයෙහි දිය කෙළෙවර සෑයක් පිහිටුවීමට යෝග්‍ය
53 වූ උස් තැනක් විය. ස්ථවිරයන් වහන්සේ එහි වැඩිය කල්හි රජහටසපුමල්
54 මුළු අටක් ගෙනාවාහු ය. නරෙන්ද්‍ර තෙම ඒ සපුමල් ස්ථවිරයන් වහන්සේ

Non-Commercial Distribution

කරා එලවූයේ ය. ස්ථවිරයන් වහන්සේ ඒ සපු මලින් ඒ උස් වූ ස්ථානය
55 පිදූ සේක. එහිදු පොළවෙ කම්පිත විය. රජ තෙම ඒ කම්පා වීමේ
56 කාරණය විචාළේය. ස්ථවිර තෙම පිළිවෙළින් ඒ කම්පා වීමේ කාරණය
වදාළ සේක. මහාරජාණෙනි මේ ස්ථානය සිවු බුදුවරයන් විසින්
සෙවිනා ලද්දේ ය. සත්ත්වයන්ට හිත පිණිස ද සැප පිණිස ද සෑයකට
සුදුසු වන්නේ ය. මෙ කල්පයෙහි පළමුවෙනුව සියලු ධර්මයන් දත්තා
57 වූ සියලු ලෝකයට අනුකම්පා කර වූ ශාස්තෘ වූ කකුසඳ නම්
58 සර්වඥවරයෙක් වූ සේක. එකල මේ මහ මෙවුනා උයන මහා තීර්ථ
59 නම් විය. මින් පෙරදිග කොළොම් හොයෙන් එතර අභය නම් පුරයෙක්
විය. එහි අභය නම් රජෙක් විය. එකල මේ දිවයින ඔජදීප නම් විය,
60 එකල්හි රකුසන් කරණ කොට ගෙණ මෙහි ජනයාහට හුණු ලෙඩක්
61 විය කකුසඳ නම් වූ සර්වඥ තෙම ඒ උවදුර දැක එය නසා මේ ද්වීපයෙහි
62 සත්ත්වයන් හික්මීම ද ශාසනයාගේ පැවැත්වීම ද කරුණු පිණිස කරුණා
63 වේගයෙන් මෙහෙයනු ලත් සේක් සතළිස් දහසක් රහතුන් විසින් පිරිවරන
64 ලද්දේ අහසින් වැඩ දේවකූට නම් පර්වතයෙහි වැඩ සිටි සේක.
මහරජාණෙනි එකල්හි සර්වඥයන් වහන්සේගේ ආනුභාවයෙන් මේ
65 මුළු දිවයින්හි ජ්වර රෝගය උපශාන්ත වූයේ ය. නරේශ්වරය එහි වැඩ
සිටි මහා මුනි වූ සර්වඥ තෙම අද ඔජද්වීපයෙහි සියලු මනුෂ්‍යයෝ මා
දකිත්වා, මා කරා එනු කැමැති වූ සියලු මනුෂ්‍යයෝ වහාම නිදුකින්
එත්වා යි අධිෂ්ඨාන කළ සේක.

66 පර්වතය රැසින් බබුළුවන්නා වූ සර්වඥයන් වහන්සේ ද රැසින්
බබළන්නා වූ පර්වතය ද දැක රජ තෙමේ ද නුවර වැස්සෝ ද වහා
67 ළඟට පැමිණියෝය. දෙවියන්ට බිලි දෙන පිණිස එහි ගියා වූ මනුෂ්‍යයෝ
ද සංඝයා සහිත වූ ලෝක ස්වාමීන් වහන්සේ දේවතා යයි සිතූහ.
68 අතිශයින් සතුටු වූ මහීශ්වර වූ ඒ රජ තෙම ඒ සර්වඥයන් මනා කොට
69 වැඳ බතින් පවරා පුර සමීපයට වඩා ගෙණවුත් සංඝයා සහිත වූ
මුනීශ්වරයන් වහන්සේ වැඩ හිඳීමට යෝග්‍ය වූ සිත් කලු වූ මේ ස්ථානය
70 අසම්බාධ යයි සිතා මෙහි කරවන ලද මනෝඥ වූ මණ්ඩපයෙහි උතුම්
71 වූ පර්‍යංක යන්හි සංඝයා සහිත වූ සම්බුදුන් වැඩ හිඳ වූයේ ය. මෙහි
වැඩ හුන්නා වූ සංඝයා සහිත වූ ලෝකනාථයන් වහන්සේ දක්නා වූ ද
ලංකාද්වීපයෙහි මනුෂ්‍යයෝ හාත්පසින් පඬුරු ගෙණාවෝ ය. ඒ නරේන්ද්‍ර
72 තෙම තමන් සතු වූ ද ඒ ඒ මිනිසුන් විසින් ගෙණෙන ලද්දා වූ ද
73 ඛාද්‍යභෝජ්‍යයෙන් ඒ සංඝයා සහිත වූ ලෝක ස්වාමීන් වහන්සේ
සන්තර්පණය කෙළේ ය. මෙහිම පසුබත් කල්හි වැඩ හුන්නා වූ
සර්වඥයන් වහන්සේට ඒ මහා තීර්ථ නම් වූ උයන ඒ රජ තෙම උතුම්
74 වූ දක්ෂිණා කොට දුන්නේ ය. එකල අකාල පුෂ්පයෙන් අලංකෘත මහා

Non-Commercial Distribution

තීර්ථ නම් වූ උයන සර්වඥයන් වහන්සේ විසින් පිළිගත් කල්හි
75 මහපොළව කම්පිත විය. ඒ සර්වඥතෙම මෙහිම වැඩ හිඳ ධර්ම
76 දේශනා කළ සේක. සතළිස් දහසක් මනුෂ්‍යයෝ මාර්ග ඵල ප්‍රාප්ත
වූහ. පස්මරුන් දිනූ ඒ සර්වඥතෙම මහා තීර්ථ නම් වූ උයන්හි දිවා
77 විහරණය කොට සවස් වේලෙහි බෝධිය පිහටීමට යෝග්‍ය වූ පෘථිවි
ප්‍රදේශයට වැඩ එහි වැඩ හුන් සේක් සමාධියට සම වැද එයින් නැගී
78 ලක්දිව වැස්සන්ට වැඩ පිණිස මාගේ මහරි බෝ රුකින් දක්ෂිණ ශාඛාව
රැගෙණ මෙහෙණින්නන් සහිත වූ රූප නන්දා නම් මෙහෙණි තොමෝ
79 ආගමනය කෙරේයා යි සිතූ සේක. මහරජාණෙනි ඒ මහත් ඍද්ධි ඇති
රූපනන්දා නම් තෙරණි තොමෝ උන්වහන්සේගේ ඒ සිත දැන ඊට
අනතුරුන් එහි නරේන්ද්‍රයාණන් කැඳවා ගෙණ ඒ බෝධි වෘක්ෂය කරා
80 එළඹ දක්ෂිණ ශාඛාවෙහි රත්සිරියෙලින් රේඛාවක් දෙවා එතැනින් සිඳී
රන් බඳනෙහි පිහිටියා වූ ඒ බෝධි ශාඛාව ඍද්ධියෙන් ගෙණ පන්
81 සියයක් මෙහෙණින්නන් සහිත වූ වා මෙහි ගෙණවුත් දේවතාවුන් විසින්
පිරිවරන ලද්දී රන් බඳන සහිත වූ ඒ බෝධි ශාඛාව සර්වඥයන් දිගු කළ
82 දක්ෂිණ හස්තයෙහි තැබුවා ය. තථාගතයන් වහන්සේ ඒ බෝධිය රැ
ගෙණ පිහිටුවන පිණිස අභය නම් රජ හට දුන් සේක. පෘථිවීශ්වර
83 තෙම මහාතීර්ථ නම් වූ උයනෙහි ඒ බෝධිය පිහිටු වූයේය.

සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ එතැනින් වැඩ මෙයින්
84 උතුරු දෙස මනරම් මහරි මහලුවෙහි වැඩහිඳ ජනයාට ධර්ම දේශනා
85 කළ සේක. මහ රජාණෙනි එහි විසි දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය
86 වූයේ ය. ඒ සම්‍යක් සම්බුද්ධ වූ සර්වඥයන් වහන්සේ එතැනින් ද
උතුරු දෙසට වැඩ එහි ථූපාරාම චෛත්‍ය පිහිටන ස්ථානයට වැඩ
සමාධිය අර්පණය කොට වැඩහුන් සේක් එයින් නැගී පිරිසට ධර්ම
87 දේශනා කළ සේක. එහි වනාහි දස දහසක් ප්‍රාණීහු සම්ප්‍රාප්ත වූ
88 මාර්ග ඵල ඇති වූහ. පස් මරුන් දිනූ සර්වඥයන් වහන්සේ ස්වකීය
ධබරාව වඳිනා පිණිස මිනිසුන්ට දී පිරිවර සහිත වූ ඒ මෙහෙණින්
මෙහි වස්වා මහා දේව නම් ශ්‍රාවකයාණන් ද භික්ෂූන් දහසක් සමගමෙහි
89 වස්වා එයින් පැදුම් දෙස රුවන් මළුවෙහි වැඩ සිටි සේක්ම ජනයාට
මොනවට අනුශාසනා කොට සංඝයා සමග අහසට නැඟ ජම්බුද්වීයට
90 වැඩි සේක.

91 මේ කල්පයෙහි දෙවනුව බුදු වූ සියලු ලෝ වැස්සන්ට අනු කම්පා
කර වූ සියලු ධර්මයන් අවබෝධ කළා වූ ශාස්තෘ වූ කෝණාගම නම්
92 සර්වඥ කෙනෙක් වූයේ ය. එකල්හි මේ මහමෙවුනා උයන මහා නාම
93 නම් විය. දක්ෂිණ දිශාවෙහි වඩ්ඪමාන නම් පුරයක් විය. එකල එහි

Non-Commercial Distribution

සමිද්ධ නම් වූ නරේන්ද්‍රයෙක් වූයේ ය. එකල මේ ද්වීපය තෙම වරදීප
94 නම් විය. එකල්හි මේ වර දීපයෙහි වර්ෂා හානියෙන් වූ උවදුරෙක් විය.
කෝණාගම නම් සර්වඥයන් වහන්සේ ඒ උපද්‍රවය දැක ඒ උවදුර නසා
95 මේ ලක්දිව් හි ජනයන්ගේ හික්මී ම ද ශාසනයාගේ පැවැත්ම ද කරුණු
පිණිස කරුණා බලයෙන් මෙහෙයනු ලත් සේක් රහත් වූ තිස් දහසක්
96 භික්ෂූන් විසින් පිරිවරනු ලත් සේක් අහසින් වැඩ සුමන කූට නම්
පර්වතයෙහි වැඩසිටි සේක. සර්වඥයන් වහන්සේගේ ආනුභාවයෙන්
97 ඒ වර්ෂා හානිය ක්ෂය වීමට ගියා ය.

එකල්හි ශාසනාන්තර්ධානය දක්වා යහපත් වර්ෂාවම විය.
නරේන්ද්‍රයාණෙනි! එහි වැඩ සිටි මහා මුනි වූ මුනීන්ද්‍රයානන් වහන්සේ
98 අද "වරදීපයෙහි සියලු මනුෂ්‍යයෝ මා දකිත්වා මා කරා එනු කැමැත්තා
99 වූ සියලු මනුෂ්‍යයෝ නිදුකින් වහාම එත්වා" යි අධිෂ්ඨාන කළ සේක
(පර්වත රැසින්) බබුළු වන්නා වූ ඒ මුනීන්ද්‍රයන් වහන්සේ ද බබළන්නා
100 වූ පර්වතය ද දැක මහරජ තෙමේ ත් නුවර වැසියෝත් වහා සමීපයට
පැමිණියා හ.

101 දේවතා බිලි දෙන පිණිස එහි ගියා වූ මනුෂ්‍යයෝ ද සංඝයා
සහිත වූ සර්වඥයන් වහන්සේ දේවතාවෝ යයි සිතූහ. අතිශයෙන්
102 සතුටු වූ පෘථිවීශ්වර වූ රජ තෙම ඒ මුනීන්ද්‍රයන් වැඳ බතින් පවරා
වඩ්ඪමාන නම් පුරය සමීපයට වඩා ගෙණවුත් මේ ස්ථානය සංඝයා
103 සහිත වූ මුනීන්ද්‍රයන්ගේ වාසයට යෝග්‍යය, සිත්කලුය අසම්බාධ යයි
සිතා මෙහි කරවන ලද රම්‍ය වූ මණ්ඩපයෙහි උතුම් වූ පර්‍ය්‍යංකයන්හි
104 සංඝයා සහිත වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වැඩහිඳ වූයේ ය.
105 මෙහි වැඩ හුන්නා වූ ද සංඝයා සහිත වූ ලෝක ස්වාමින් වහන්සේ
106 දක්නා වූ ද වරද්වීපයෙහි මනුෂ්‍යයෝ හාත්පසින් පඬුරු ගෙණාවෝ ය.
ඒ නරේන්ද්‍ර තෙම තමන් සතු වූ ද ඒ ඒ මනුෂ්‍යයන් විසින් ගෙණවා වූ
ද ඛාද්‍යාභෝජ්‍යයෙන් සංඝයා සහිත වූ ලෝක ස්වාමීන් වහන්සේ
107 සන්තර්පණය කෙළේ ය. ඒ නරෙන්ද්‍ර තෙම භක්තයෙන් පසුකාලයෙහි
108 මෙහිම වැඩහුන් සර්වඥයන් වහන්සේට මහානාම නම් වූ එ උයන වර
දක්ෂිණා කොට දුන්නේ ය. එකල අකාලපුෂ්පයෙන් අලංකෘත වූ
මහානාම නම් උයන සර්වඥයන් වහන්සේ විසින් පිළිගත් කල්හි මහ
109 පොළොව කම්පිත විය. ඒ සර්වඥ තෙම එහිම වැඩ හිඳ ධර්ම දේශනා
110 කළ සේක. එකල්හි තිස් දහසක් මනුෂ්‍යයෝ මාර්ග ඵල ප්‍රාප්ත වූහ.
සර්වඥයන් වහන්සේ මහානාම නම් උයන්හි දිවා විහරණය කොටසවස්
වේලෙහි පූර්ව මහ බෝධිය පිහිට භූමියට වැඩ එහි සමාධිය අර්පණය
111 කොට එයින් නැඟිසේක්, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලක්දිව්

Non-Commercial Distribution

වැස්සන්ගේ වැඩ පිණිස මාගේ උදුම්බර බෝධි වෘක්ෂයෙන් දක්ෂිණ
112 ශාඛාව රැගෙණ භික්ෂුණීන් සහිත වූ කණකදත්තා නම් මෙහෙණ
තොමෝ ඒ වා යි සිතූ සේක. මහත් සෘද්ධි ඇත්තා වූ ඒ තෙරණි තොම
113 ඊට අනතුරුව උන්වහන්සේගේ ඒ සිත දැන එහි රජු කැඳවා ගෙණ ඒ
114 බෝධිවෘක්ෂය කරා එළඹ රත් සිරියෙලින් දක්ෂිණ ශාඛාවෙහි රේඛා
දෙව, "මහරජාණෙනි! එතැනින් ඡින්නව රන් බඳනෙහි පිහිටියා වූ ඒ
ශාඛා බෝධිය සෘද්ධියෙන් රැගෙණ මෙහෙණින් පන් සියයක් සහිත
115 වූවා දේවතාවන් විසින් පිරිවන ලද්දී මෙහි අවුත් රන් බඳන සහිත වූ ඒ
ශාඛා බෝධිය සම්‍යක් සම්බුද්ධයන් විසින් දිගු කළ දක්ෂිණ හස්තයෙහි
116 තැබූවා ය. තථාගතයන් වහන්සේ ඒ හැර ගෙණ පිහිටු වන පිණිස
117 සමිද්ධ නම් රජහට දුන් සේක. ඒ මිහිපල් තෙම ඒ බෝධිය එහි
මහානාම නම් උයනෙහි පිහිටු වූයේ ය. සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ
එතැනින් නික්ම මහරිමලුවේ උතුරු නාග මාලකයෙහි වැඩ හුන් සේක්
118 ජනයාට ධර්ම දේශනා කළ සේක. පෘථිවිපාලයා! ඒ ධර්ම දේශනාව
119 ඇසීමෙන් එහි විසි දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වූයේ ය, පුරයෙන්
120 උතුරු පූර්ව බුද්ධවරයන් වැඩහුන් තැනට වැඩ එහි සමාධිය අර්පණය
කොට වැඩ හුන් සේක් එයින් නැඟී සර්වඥයන් වහන්සේ පිරිසට
121 ධර්ම දේශනා කළ සේක. එහි වනාහි දස දහසක් ප්‍රාණීහු මාර්ග ඵල
122 ප්‍රාප්ත වූහ. පස්මරුන් දිනූ ඒ සර්වඥයන් වහන්සේ ගේ මනුෂ්‍යයන්
විසින් වඳනා පිණිස කාය බන්ධන ධාතුව ප්‍රදානය කොට පිරිවර සහිත
123 වූ ඒ මෙහෙණින්න මෙහි වස්වා භික්ෂූන් දහසක් සමග මහා සුම්ම නම්
ශ්‍රාවකයන් වහන්සේද මෙහි වස්වා රත්න මාලකයෙන් මෙ පිට සුදර්ශන
124 නම් මාලකයෙහි වැඩ සිට ජනයාට අනුශාසනා කොට සංඝයා සමග
අහසට නැඟී ජම්බුද්වීපයට වැඩි සේක.

125 මේ කල්පයෙහි තුන් වෙනුව බුදු වූ කාශ්‍යප ගෝත්‍ර ඇති සියලු
126 ධර්මයන් අවබෝධ කළා වූ සියලු ලෝ වැස්සාට අනුකම්පා කර වූ
ශාස්තෘ කෙනෙක් වූ සේක. එකල්හි මහ මෙව්නා උයන මහා සාගර
නම් විය. පශ්චිම දිශාවෙහි විශාල නම් පුරයක් විය. එකල්හි එහි
127 ජයන්ත නම් නරේන්ද්‍රයෙක් වූයේය, එකල මේ ද්වීපය තෙම මණ්ඩදීප
128 නම් විය. එකල්හි ජයන්ති නම් රජහුගේ ද රජහු මල් මණ්ඩකුමාර
129 හුගේ ද භය ජනක වූ සත්ත්වයන් පෙළන්නා වූ යුද්ධයක් එළඹ සිටියේ
ය. ඒ මහා කරුණා ඇති දශබල ධාරි වු කාශ්‍යප සර්වඥයන් වහන්සේ
130 ඒ යුද්ධය නිසා සත්ත්වයන්ට වන්නා වූ මහත් ව්‍යසනය දැක එය සංසිඳුවා
මේ ද්විපයෙහි සත්ත්වයන් හික්මීම හා ශාසනයාගේ ප්‍රවෘත්තිය ද කරුණු
131 පිණිස කරුණා බලයෙන් මෙහෙයනු ලත් සේක් විසිදහසක් රහතුන්
විසින් පිරිවරනු ලැබ අහසින් වැඩ "සුභකූට" නම් පර්වතයෙහි වැඩ

Non-Commercial Distribution

සිටි සේක. නරේන්ද්‍රය! එහි වැඩ සිටි මහා මුනි වූ සර්වඥයන් වහන්සේ
132 “අද මණ්ඩපයෙහි සියලු මනුෂ්‍යයෝ මා දකිත්වා මා කරා එනු කැමැති
133 වූ සියලුම මනුෂ්‍යයෝ නිරායාසයෙන් වහාම එත්වා” යි අධිෂ්ඨාන කළ
134 සේක. පර්වතයෙහි රැස් විහිදුව මින් බබළන්නා වූ ඒ සර්වඥයන් වහන්සේ
135 ද විරාජමාන වූ පර්වතයද දැක රජ තෙමේ ද නුවර වැස්සෝ ද වහා
එළඹුණා හ. බොහෝ ජනයා තම තමන්ට පැමිණි ජය නිසා දෙවියන්ට
බිළිදෙන පිණිස ඒ පර්වතයට එළඹුණෝ සංඝයා සහිත වූ සර්වඥයන්
136 වහන්සේ දේවතා යයි සිතූහ. රජ තෙමේ ද ඒ කුමාර තෙමේ ද
137 විස්මයට පැමිණියෝ යුද්ධය හළහ. ඉතා සතුටු වූ ඒ පෘථිවීශ්වර වූ රජ
138 තෙම ඒ මුනින්ද්‍රයන් වැඳ බතින් පවරා නගර සමීපයට වඩා ගෙණවුත්
139 මේ ස්ථානය සංඝයා සහිත වූ මුනි රාජයන් වහන්සේට වැඩ හිඳිනට
යෝග්‍ය උතුම් ය සිත්කලුය සම්බාධ රහිත යයි සිතා මෙහි කරවන ලද
140 රම්‍ය වු මණ්ඩපයෙහි උතුම් වූ පර්‍යඞ්කයන්හි සංඝයා සහිත වූ සර්වඥයන්
වහන්සේ වඩා හිඳ වූයේ ය.

141 මෙහි වැඩ හුන්නා වූ ද සංඝයා සහිත වූ ලෝක ස්වාමීන් වහන්සේ
දක්නා වූ ද්වීපයෙහි මනුෂ්‍යයෝ හාත්පසින් පඬුරු ගෙණාවෝ ය. ඒ
නරේන්ද්‍ර තෙම තමන් සතු වූ ද ඒ ඒ ජනයන් විසින් ගෙණෙන ලද්දා වූ
ද ඛාද්‍ය භෝජ්‍යයෙන් සංඝයා සහිත වූ ලෝක ස්වාමීන් සන්තර්පණය
142 කෙළේ ය. භක්ත භෝජනයට පසු වූ පස්වරු කාලයෙහි මෙහිම
වැඩහුන්නා වූ සර්වඥයන් වහන්සේට ඒ නරේන්ද්‍ර තෙම ඒ මහා සාගර
143 නම් වූ උතුම් උයන වරදක්ෂිණා කොට ප්‍රදානය කෙළේ ය. අකාල
පුෂ්පයෙන් අලංකෘත වූ මහා සාගර නම් උයන සර්වඥයන් වහන්සේ
144 විසින් පිළිගත් කල්හි මහ පොළොව කම්පිත විය. ඒ සර්වඥ තෙම
එහිම වැඩ හිඳ ධර්ම දේශනා කළ සේක. එකල්හි විසි දහසක් මනුෂ්‍යයෝ
145 ද මාර්ග ඵල ප්‍රාප්ත වූහ. සර්වඥයන් වහන්සේ මහා සාගර නම්
උයන්හි දිවා විහරණය කොට සවස් වේලෙහි පූර්ව බෝධි වෘක්ෂයන්
146 පිහිටි භූමියට වැඩ එහි සමාධියට පැමිණ වැඩ හුන් සේක් එයින් නැගී
147 සේක සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ “දිව් වැස්සන්ගේ වැඩ පිණිස
සුධර්මා නම් මෙහෙණි තොමෝ මාගේ න්‍යග්‍රොධ බෝධි වෘක්ෂයන්
148 දක්ෂිණ ශාඛාව ගෙණ මෙහෙණින්නන් සහිතව දූන් ඒවා” යි සිතූ
සේක. ඊට අනතුරුව මහත් සෘද්ධි ඇත්තා වූ ඒ ස්ථවිර තොමෝ උන්
වහන්සේ ගේ සිතිවිලි දැන එහි නරෙන්ද්‍රයන් කැඳවා ගෙණ ඒ බෝධි
149 වෘක්ෂය කරා එළඹ රත්සිරියෙලින් දක්ෂිණ ශාඛාවෙහි රේඛාවක් දෙවා
එතැනින් වෙන්ව රන් බඳනෙක පිහිටියා වූ ඒ බෝධිය සෘද්ධියෙන් රැ
150 ගෙණ පන් සියයක් මෙහෙණින්නන් සහිත වූවා මෙහි පමුණුවා
151 දේවතාවුන් විසින් පිරිවරණ ලද්දී රන් බඳන සහිත වූ ඒ ශාඛා බෝධිය

Non-Commercial Distribution

152 සර්වඥයන් විසින් දිගු කළ දක්ෂිණ හස්තයෙහි තැබීය. තථාගතයන්
වහන්සේ එය පිළිගෙණ ජයන්ත රජහට එහි පිහිටුවන පිණිස ප්‍රදානය
කළ සේක. ඒ රජ තෙම ශාඛා බෝධි වෘක්ෂය ඒ මහා සාගර නම්
153 උයනෙහි පිහිටු වූයේ ය. සර්වඥයන් වහන්සේ ඒතැනින් වැඩ
නාගමාලකයෙන් උතුරෙහි අශෝකමාලකයෙහි වැඩ හිඳ ජනයාහට
154 ධර්ම දේශනා කළ සේක. නරේන්ද්‍රයාණෙනි! එහි ඒ ධර්ම දේශනාව
අසා සාර දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වූයේ ය. නැවත සර්වඥයන්
155 වහන්සේ උතුරු දිග පූර්ව බුදුවරයන් වැඩ හුන්නා වූ ස්ථානයට වැඩ
එහි සමාධිය අර්පණය කොට වැඩ හුන් වූ සේක් ඒ සමාධියෙන් නැගී
156 පිරිසට ධර්ම දේශනා කල සේක. එහි වනාහි දස දහසක් ප්‍රාණීහු
157 මාර්ග ඵලයන්ට සම්ප්‍රාප්ත වූහ. පස් මරුන් දිනූ ඒ සර්වඥයන් වහන්සේ
158 මිනිසුන් විසින් වදනා පිණිස ජලසාටිකා ධාතුව ප්‍රදානය කොට පිරිවර
සහිත වූ ඒ භික්ෂුණිය මෙහි වස්වා භික්ෂූන් දහසක් සහිත වූ සබ්බනන්දි
159 නම් ශ්‍රාවකයන් වහන්සේ ද මෙහි වස්වා නදියෙන් මෙතර සුදර්ශන
නම් මාලයෙන් බැහැර සොමනස්ස නම් මාළකයෙහි දී ජනයාට
මොනවාට අනුශාසනා කොට සංඝයා හා සමඟ අහසට නැඟී දඹදිව
වැඩිසේක.

160 මේ කල්පයෙහි සතර වෙනුව සියලු ධර්මයන් අවබෝධ කළා වූ
සියලු ලොවට අනුකම්පා කර වූ ශාස්තෘ වූ ගෞතම නම් සර්වඥයන්
161 වහන්සේ වූ සේක. ඒ සර්වඥයන් වහන්සේ ප්‍රථම කොට මේ ලක්දිව්
වැඩ යක්ෂයන් දමනය කළ සේක. නැවත කොට මේ ලක්දිව් වැඩ
යක්ෂයන් දමනය කළ සේක, නැවත දෙවනුව වැඩ නාගයන් දමනය
කළ සේක, නැවත තුන් වෙනුව පස් මරුන් දිනූ මුනීන්ද්‍රයන් වහන්සේ
162 කැළණියෙහි මණිඅක්ඛික නම් නාගයා විසින් නිමන්ත්‍රණය කරණ ලද්දේ
ආගමනය කොට එහි සංඝයා සමග ආහාර වලඳා පූර්වබෝධි පිහිටි
163 ස්ථානය ද මේ චෛත්‍ය ස්ථානය ද පරිභෝග ධාතු ස්ථාන වූ ථූපාරාමය
164 පිහිටන ස්ථානය ද වැඩ හිඳීමෙන් පරිභෝග කොට පූර්ව වූ කාශ්‍යප
සර්වඥයන් වහන්සේ වැඩසිටි (සොමනස්ස මාලක නම්ස්ථානයෙන්
මැත භාගයට වැඩ ලෝකයට ප්‍රදීප වූ සේක් එකල ලංකාද්වීපයෙහි
165 මනුෂ්‍යයන් නැති බැවින් ද්විපයෙහිසිටියා වූ දේව සමූහයාට ද නාගයන්ට
ද මොනවටඅනුශාසනා කොට සංඝයා සහිතව අහසට නැඟී දඹදිව්
වැඩි සේක.

166 නරේන්ද්‍රයාණෙනි! මෙසේ මේ ස්ථානය සතර බුදුවරයන් විසින්
සෙවුනා ලද්දේ ය. මහරජාණෙනි! මේ ස්ථානයෙහි අනාගත කාලයෙහි
167 සර්වඥ ශාරීරික ධාතූන් සම්බන්ධ වූ ද්‍රොණ යක් ධාතූන්ගේ නිධාන වූ

Non-Commercial Distribution

168 එක් සිය විසි රියන් උස් ස්වර්ණමාලී යයි ප්‍රසිද්ධ වූ සෑයෙක්
වන්නේ ය. පෘථිවීශ්වර තෙම ඒ ස්තූපය "මම ම කරවන්නෙමි" යි කීයේ
169 ය. "පෘථිවි පාලයෙනි, මෙහි තොපට අන්‍ය වූ බොහෝ කටයුතු වෙති.
ඒ කටයුතු කරව තොපගේ මුනුබුරෙක් තෙම මේ ස්තූපය කරවන්නේ
170 ය. එහි පිළිවෙළ මෙසේ යි යුෂ්මත්හුගේ සහෝදර වූ මහා නාග නම්
යුව රජහුගේ පුත්‍ර වූ යටාලතිස්ස නමින් ප්‍රකට වූ නරෙන්ද්‍රයෙක් තෙම
171 අනාගතයෙහි වන්නේ ය. ඔහුගේ පුත්‍ර වූ ගෝඨාභය නම් නරෙන්ද්‍රයෙක්
වන්නේ ය. ඒ රජහුගේ පුත්‍ර වූ කාවන්තිස්ස නම් රජෙක් වන්නේ ය.
නරෙන්ද්‍රය! ඒ රජහු පුත් වූ "දුට්ඨ ගාමිණී" යන ශබ්දයෙන් ප්‍රකට වූ
අභය නම් මහ රජෙක් වන්නේ ය. මහත් වූ තේජස් හා සෘද්ධි වික්‍රමයෙන්
යුක්ත වූ ඒ මහා රජ තෙම මෙහි ස්තූපය කරවන්නේ ය. යි ස්ථවිරයන්
173 වහන්සේ වදාළ සේක. ස්ථවිරයන් වහන්සේ ගේ වචනයෙන් මිහිපතී
තෙම එපවත් ලියවා මෙහි ගල් ටැඹක් එසවූයේ ය.

174 මහත් ප්‍රඥා හා මහත් සෘද්ධි ඇත්තා වූ ඒ මහා මහේන්ද්‍ර නම්
ස්ථවිරයන් වහන්සේ මහ මෙවුනා උයනින් සිත්කලු වූ තිස්සාරාමය
175 පිළිගත් සේක. කම්පා රහිත වූ ස්ථවිර තෙම අට තැනක දී පොළොව
කම්පිත කරවා සයුර හා සමාන වූ නුවරට පිඬු පිණිස ප්‍රවිෂ්ටව රජ
176 ගෙයි භක්ත කෘත්‍යය කොට මන්දිරයෙන් නික්ම නඳුන් වනයෙහි වැඩ
හිඳ එහි දී අග්ගික්ඛන්ධෝපම නම්වූ සූත්‍රය ජනයාට දේශනා කොට
177 එහිදී මිනිසුන් දහසක් මාර්ග ඵල ප්‍රාප්ත කරවා මහමෙවුනා වෙනෙහි
වැඩ විසූ සේක.

178 ස්ථවිරයන් වහන්සේ තුන් වෙනි දවස්හි රජ ගෙයි වළඳා නඳුන්
වෙනෙහි වැඩ හිඳ ආශිර්විෂෝපම සූත්‍රය දේශනා කළ සේක. මහා
179 ස්ථවිරයන් වහන්සේ දහසක් පුරුෂයන් මාර්ග ඵලාවබෝධයට පමුණුවා
එතැනින් තිස්සරාමයට වැඩි සේක. අසන ලද දේශනා ඇති ඒ රජ
තෙමේ ද පැමිණ තෙරුන් වහන්සේ සමීපයෙහි දී හිඳ "වහන්ස! බුද්ධ
180 ශාසනය මෙහි පිහිටි යේදෝහෝ" යි විචාළේ ය. නරෙන්ද්‍රය තවම
181 නොපිහිටියේ ය. ජනාධිපතිය උපොසථාදි කර්ම පිණිස බුද්ධාඥාවෙන්
මෙහි සීමාවක් බැන්ද කල්හි ශාසනය පිහිටන්නේ ය. මහා ස්ථවිරයන්
182 වහන්සේ වදාළ සේක. රජ තෙම උන්වහන්සේට මේ වචනය සැල
කෙළේ ය. "ශාන්තිධරයන් වහන්ස මම සර්වඥයන් වහන්සේගේ ආඥාව
183 ඇතුළත වාසය කරන්නෙමි. එහෙයින් පුරය ඇතුළත් කොට මහා
සිමාව සම කල්හි බඳනා සේක්වා" යි සැල කෙළේ ය. ස්ථවිරයන්
184 වහන්සේ ඒ රජහට "පෘථිවීශ්වරය! එසේ කල්හි යුෂ්මත් තෙමේ සීමාව
185 යන තැන් අනුව අපි එය බඳුම්හ" යි වදාළ සේක. පෘථිවීශ්වර තෙම
"මැනවැ" යි කියා නඳුන් වනයෙන් නික්මෙන දේවෙන්ද්‍රයා මෙන් රම්‍ය

Non-Commercial Distribution

186 වූ මහමෙවුනා උයනෙන් නික්ම ස්වකීය වූ මන්දිරයට ප්‍රවිෂ්ට වූයේ ය.
ස්ථවිරයන් වහන්සේ සතර වෙනි දවස්හි රජ ගෙයි වළඳා නඳුන් වනෙහි
වැඩහිඳ අනමතග්ගිය නම් සංයුක්තය දේශනා කළ සේක. ඒ
187 මහාස්ථවිරයන් වහන්සේ එහිදී දහසක් පුරුෂයන්ට අමෘත පානය පොවා
මහා මේඝවනාරාමයට එළඹිසේක. උදය බෙර හසුරුවා පුරවරය ද
188 විහාරයට යන මාර්ගය ද හාත්පසින් විහාරය ද සරසවා ඒ නරේන්ද්‍ර
තෙම රථයෙහි සිටියේ සර්වා ලංකාරයෙන් අලංකෘත වූ ඇමැතියන්
189 සහිත වූ අන්තඃපුරවාසීන් හා රථ බලවාහන සහිතවූයේ මහ පිරිවරින්
ස්වකීයාරාමය කරා පැමිණියේ ය. එහි වන්දනාවට යෝග්‍ය වූ ස්ථවිරයන්
190 කරා එළඹ වැඳ ස්ථවිරයන් හා සමග උඩු ගහ තොටට ගොස් රන්
191 නගුලක් ගෙණ එතැන් පටන් සාමීන් ගියේ ය. මහා පදුමය, කුංජය
192 යන නම් ඇත්තා වූ අතිශින් ශෝභන වූ ඇත්තු දෙදෙන ස්වර්ණමය වූ
193 නගුලෙහි යොදන ලද්දා හ. පළමුවෙනි වූ කුන්ත මාලකයෙහි සිටියේ
194 සිවුරඟ මහ සෙනඟ ඇත්තා වූ වූයේ මොනවට සරසන ලද්දා වූ
පුන්කලස නොයෙක් වර්ණ ඇත්තා වූ කොඩිය යහපත් වු සඳුන් සුණු
195 යුත් තලිය රන් රිදී දඬු ඇති කැටපත් ය, මලින් බර වූ සුමඟුය, මලැ
ඇගැය, තොරන් කෙහෙලි ආදිය ද ගත් අත් ඇති අඟනන් විසින්
196 පිරිවරන ලද්දේ නොයෙක් තූර්‍යයෙන් සෝෂණය කරණ ලද්දේ සේනා
197 සමූහයා විසින් පිරිවරන ලද්දේ ස්තුති මංගල ගීතයෙන් සිවු දිගුන්
පුරවන්නේ සාධුකාර නාදයෙන් හා පිළිහිස සිසැරුම් සිය ගණතින් ද
198 මහත් වූ උත්සව පූජායෙන් ද යුක්ත වූයේ නඟුල රැගෙණ සීවිටු දක්වා
199 සාමීන් ගියේ ය. විහාරය හා නගරය ද ප්‍රදක්ෂිණා කරන්නේ ගං
තොටට පැමිණ සීමාව යන තැන් සමාප්ත කෙළේ ය. එහි සීමා
තොමෝ කවර නිමිත්තකින් ගියා දැයි සීමාව පැමිණි තැන් දැන ගනු
200 කැමැත්තෙනි ඒ මෙසේ අවබෝධ කරව් "කොළොම් හොය පහන්
තොට පහණෙහි කුඩා වළට ද එතැනින් කුම්බල නම් වළ අගට ද
201 එතැනින් මහ දුවට ද ගියා ය. එතැනින් කුඹුක් පෙළට ගියේ එයින් මහ
මලුවට ගියේ ය. එයින් කුඳුමී රැකට ද එතැනින් මුරුත පොකුණට ද
ගියේ විජයාරාම නම් උයනෙහි උතුරු දොරටුකොටුවට ගියේ ය. ගජකුඹු
202 නම් ගලට ද තුසවැටිය මැදින් අබා උයනෙහි තොත් ගලට ද ගොස්
203 මහ සොහොන් මැදට ගියේය, දිගු පහණට ගොස් කර්මාර දෙවියාගේ
බඩහැලට වමින් නුගමලුවට ගොස් හියගල සමීපයෙහි ගිනිකොණ දියවස්
204 බමුණාගේ දේවාලයට ද එතැනින් තෙලුම්පෙළට ගියේ එතැනින්
205 තාලචතුෂ්ක යට ගියේ ය. එතැනින් අස් මඬුල්ලට වමින් සසවානයට
206 ගියේ ය. එතැනින් බොරළුතොටට ගියේ එතැනින් මත්තෙහි නදියට
ගියේ යත පළමු සෑයෙන් නැගෙණහිර ද කොළොම් ගස් දෙකෙක්
207 වුහ. සෙනින්දගුත්ත රාජ්‍යයෙහි උදක ශුද්ධික ද්‍රවිඩයෝ නදිය දුර යයි

Non-Commercial Distribution

208 සිතා බැඳ එය නුවරට ආසන්න කළහ. එහි ජීවමාන වූ කොළොම්
රුක සීමාවට ඇතුළු කොට ගියේ ය. මළ කොළොම් රුක පිහිටි
209 ඉවුරෙන් සීමා තොමෝ මළ කොළොම් රුකෙන් ඌර්ධව භාවයට පත්
විය. ස්ථවිර තෙම සිංහ ස්ථාන නම් තොටින් ඌර්ධව භාවයට පැමිණ
210 ඉවුරෙන් වඩනේ පහන් තොටට පැමිණ නිමිති ගැළපූ සේක. නිමිත්තෙන්
නිමිත්ත ගැළපූ කල්හි සස්න මොනවට පිහිටියේ යයි දෙව් මිනිස්සු
211 සාධු කාර පැවැත්තු හ. රජහු විසින් හීවිට දුන් කල්හි මහත් ප්‍රඥා ඇති
ඉන්ද්‍රිය වසඟ කළා වූ මහා ස්ථවිරයන් වහන්සේ නිමිත්තයන් හාත්පසින්
212 කීර්තනය කළ සේක් විධි වූ පරිද්දෙන් දෙතිසක් ඛණ්ඩ සීමාවන් පිණිස
ද ථූපාරාමය පිණිස ද සීමාන්තරික නිමිත්තයන්ද කීර්තනය කොට එම
213 දවස්හිම සියලු සීමාවන් බන්ධනය කළ සේක. සීමා බන්ධනය සමාප්ත
කළ කල්හි මහ පොළොව කම්පිත විය.

214 ස්ථවිරයන් වහන්සේ පස්වන දවස් රජ ගෙහි වළඳා නඳුන්
215 වෙනෙහි වැඩ හිඳ ඛජ්ජනියක නම් වූ සූත්‍රාන්තය මහා ජනයාට දේශනා
කොට එහිදී දහසක් මිනිසුන්ට අමෘත පානය පොවා මහමෙවුනා
216 උයනෙහි වාසය කළ සේක. දේශනා දන්නා වූ ස්ථවිරයන් වහන්සේ
සවෙනි දවස්හි රජගෙහි වළඳා නඳුන් වෙනෙහි වැඩ හිඳ ගෝමය පිණ්ඩික
217 නම් සූත්‍රය දේශනා කොට දහසක්ම මිනිසුන් මාර්ග ඵලාවබෝධයට
පමුණුවා මහමෙවුනා උයනෙහිම වැඩ විසූ සේක. ස්ථවිරයන් වහන්සේ
218 සත් වෙනි දවස්හි ද රජගෙහි වළඳා නඳුන් වෙනෙහි වැඩ හිඳ
219 ධර්මචක්කප්පවත්තන නම් වූ සූත්‍රාන්තය දේශනා කොට මිනිසුන්
දහසක්ම මාර්ග ඵලාවබෝධයට පමුණුවා මහමෙවුනා උයනෙහි වැඩ
220 විසූ සේක. මෙසේ කාන්තිධර වූ ස්ථවිරයන් වහන්සේ සත් දවසකින්ම
අට දහස් පන්සියයක් මනුෂ්‍යයන් මාර්ගඵලාවබෝධ කරවා (ඒ මහනඳුන්
උයනෙහි වාසය කළ සේක) ඒ මහ නඳුන් වනය ඒ ශ්‍රේෂ්ඨ වූ අර්හතුන්
වහන්සේ විසින් ශාසනය බැබළ වූ ස්ථානය යන අර්ථයෙන් "ජෝතිවන"
221 යයි කියනු ලැබේ. රජ තෙමේ ශීඝ්‍ර ලෙස ගිනිසුලින් මැටි වියලවා
පළමු වෙන් තිස්සාරාමයෙහි ස්ථවිරයන් වහන්සේට පිරිවෙනක් කර
222 වූයේ ය. ඒ ප්‍රාසාදය තෙම කාල වර්ණ වූයේය. එහෙයින් ද ඒ
223 මන්දිරය එහි කාල ප්‍රාසාද පිරිවෙන යන නමට පැමිණියේ ය.
ඉක්බිත්තෙන් මහ බෝ ගෙයක් ද ලෝවා මහ පාය ද ලහබත් ගෙයක් ද
224 බත් හලක් ද මොනවට කරවූයේ ය. බොහෝ පිරිවෙන් ද යහපත් වූ
පොකුණු ද රාත්‍රි ස්ථාන ද දිවාස්ථානාදීන් ද කර වූයේ ය. පාපයන්
225 ධෝවනය කළා වූ උන් වහන්සේගේ නාහන පොකුණු තෙර කළා වූ
226 පිරිවෙණ සුන්හාත පිරිවෙණ යයි කියනු ලැබේ.

Non-Commercial Distribution

227 ලංකාද්වීපයට ප්‍රදීපයක් වූ ඒ උත්තමයන් වහන්සේ සක්මන් කළ
තන්හි කරණ ලද ඒ පිරිවෙන "දීඝචංකමණ" යයි කියනු ලැබේ. ඒ
ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හි වනාහි අග්‍ර වූ ඵල සමාපත්තියට
228 සම වන සේක් ද එහෙයින් එය "ඵලග්ගපරිවෙණ" යයි කියනු ලැබේ.
229 යම් තැනෙක් හි බොහෝ වූ දේව සමූහයෝ උන් වහන්සේ කරා එළඹ
230 උපස්ථාන කළාහු ද එහෙ යින්ම මරු ගණ පිරිවෙණ යයි කියනු ලැබේ.
ඒ රජහුගේ සෙනෙවි වූ දික්සඳ ඇමැති තෙම මහ ටැම් අටකින් සුළු
පහසක් කර වූයේ ය. එය ඒ වෙහෙරෙහි "දික්සඳ සෙනෙවියා පිරිවෙණ"
231 යයි කියනු ලැබේ. ඒ පිරිවෙන ප්‍රධාන වේ. ප්‍රධාන වූ ස්ථවිරයන්ට
දේවානම්පිය යන වචනයෙන් වලඳන ලද නම් ඇත්තා වූ යහපත් ප්‍රඥා
232 ඇති ඒ රජ තෙම නිර්මල බුද්ධි ඇත්තා වූ මහා මහේන්ද්‍ර නම් ස්ථවිරයන්
වහන්සේ කරා පැමිණ ලංකාද්වීපයෙහි පළමු වෙනි වූ මේ මහා විහාරය
මෙහි කරවූයේ ය.

මෙතෙකින් හුදී ජනයා සංවේග පිණිස කළ මහවස මහා විහාර පටිග්ගහණ නම් වූ පසළොස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# දහසය වෙනි පරිච්ඡේදය

1 ඒ මහා මහේන්ද්‍ර ස්ථවිරයන් වහන්සේ පිඬු පිණිස පුරයෙහි
හැසිර ජනයාට සංග්‍රහ කොට රජ ගෙයි වලඳමින් රාජ සංග්‍රහ කරන්නේ
සවිසි දිනක් මහමෙවුනා උයන් වෙනෙහි වාසය කළ සේක. මහා ප්‍රඥා
2 වූ ඒ ස්ථවිර තෙම ඇසළ මස ශුක්ල පක්ෂය සම්බන්ධ වූ තෙළෙස් වන
දවස්හි වනාහි රජ ගෙහි වළඳා මහ රජහට මහා ප්‍රමාද සූත්‍රාන්තය
3 දේශනා කොට ඉක්බිත්තෙන්ද එහි චෛත්‍ය පර්වතයෙහි විහාර
4 කරණයක් කැමැති වෙමින් පෙර දිගින් නික්ම සෑගිරියට වැඩි සේක.
තෙරුන් වහන්සේ එහි වැඩියා අසා මිහිපති තෙම රිය නැඟී දේවීන්
5 දෙදෙනෙක් ද ගෙණ තෙරුන් වහන්සේ ගේ පියවර පසු පස්සේ ගියේ
6 ය. ස්ථවිරයෝ තුමු එහි නාගචතුෂ්ක ස්ථානයෙහි වූ විලෙහි නාගෙණ
පර්වතයට නගිනා පිණිස පිළිවෙළින් වැඩ සිටියෝ ය. එකල්හි රජ
7 තෙමේ රථයෙන් බැස සියලුම ස්ථවිරයන් වැන්දේය. ඒ ස්ථවිරයෝ
තුමු "මහරජාණෙනි! කුමට උෂ්ණයෙහි ක්ලාන්තව ආයෙහි ද යි විචාර
වදාළාහු ය. "නුඹ වහන්සේලාගේ ගමනෙහි සැක කරමින් ආයේවෙමි"
8 යි කී කල්හී බන්ධකයන් හි දක්ෂ වූ ස්ථවිරයන් වහන්සේ මෙහිම වස්
9 වසන පිණිස ආයෙමු ය යි වදාරා වස්සූපනායිකක් බන්ධකය රජහට
10 වදාළ සේක. රජහුගේ බෑණා වූ මහාරිට්ඨ නම් මහා මාත්‍ය තෙමේ ද
රජු ඉදිරියෙහි සිටියේය. ඒ ධර්මය අසා යාච්ඤා කොට දෙටු කණිටු
11 සොහොවුරන් පස් පනස් දෙනෙකු හා සමග ස්ථවිරයන් වහන්සේ
සමීපයෙහි එදවසම පැවිදි වූහ. මහත් ප්‍රඥා ඇත්තා වූ ඒ සියල්ලෝ
12 කරකම් අවසානයෙහි අර්හත් ඵලප්‍රාප්ත වූහ. ඒ නරෙන්ද්‍ර තෙම එදවසම
කන්තක නම් චෛත්‍ය ස්ථානයෙහි හාත්පස අට සැටලෙණ කර්මාන්ත
13 පටන් ගන්වා නගරයට සම්ප්‍රාප්ත විය. අනුකම්පා කරණ ඒ ස්ථවිරයෝ
14 තුමු (පෙරවරු) කාලයෙහි පිඬු පිණිස නුවරට වදනෝ එහිම විසූහ.
රජ තෙම ලෙන්කම් නිම වූ කල ඇසළ මස පුණු පොහෝ දවස්හි
15 ගොස් තෙරුන් වහන්සේලාට විහාර දක්ෂිණාව දුන්නේ ය. කෙලෙස්
හිස් ඉක්ම වූ ස්ථවිරයන් වහන්සේ ඒ විහාරයට ද ඒ මහාරිට්ඨා දීන්ගේ
16 ද නැවත පැවිදි අපේක්ෂා කරනනන්ගේ ද ප්‍රයෝජනය පිණිස දෙතිසක්
සිමා මාලකයන්ට ද එදවස්හි සීමාබන්ධනය කොට තමන් විසින් බඳනා
ලද තුම්බුරු මාලක නම් ඛණ්ඩ සීමායෙහි ඒ සියල්ලන්ගේ උපසම්පදාව
පළමු කොටම කළ සේක. මේ සියලුම දෙසැට නමක් රහතන්
17 වහන්සේලා ඒ සෑගිරියෙහි වස් එළඹ රජහට සංග්‍රහ කළ සේක. දෙවි
මිනිස් සමූහයෝ තමන් කරා පැමිණියා වූ ඒ ගණ ප්‍රධාන වූ තෙරණුවන්
18 ද ගුණයෙන් පතළා වූ කීර්තිමත් වූ ඒ සංඝයා ද පුදන්නෝ
උන්වහන්සේලා කරා එළඹ (පුදන්නෝ) මහත් වූ පින් රැස් කළාහු ය.

මෙතෙකන් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස චේතිය
පබ්බත විහාර පටිග්ගහණ නම් සොළොස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# දහහත්වන පරිච්ඡේදය

1 මහත් ප්‍රඥා ඇත්තා වූ මහා ස්ථවිරයන් වහන්සේ වසන
2 ලද වස් ඇත්තේ පවරා ඉල් මස පුර පසළොස්වක්හි මහ රජහට
"නරේන්ද්‍රයාණෙනි! අපගේ ශාස්තෘ වූ සම්බුද්ධයන් වහන්සේ අපවිසින්
3 බොහෝ කලකින් පූර්වයෙහි දක්නා ලද්දේ ය. අනාථ වාසයෙන් විසුම්හ.
අපට මෙහි පූජනීය වස්තුවක් නැත්තේ යයි මේ වචනය වදාළ සේක.
"වහන්ස! සර්වඥයන් වහන්සේ පිරිනිවී සේකැයි මට වදාළාහු නොවේද්ද"
යි රජතෙමේ කීයේ ය. "ධාතූන් දුටු කල්හි සර්වඥයන් වහන්සේ දක්නා
ලද්දේ නම් වේ" යි ස්ථවිරයන් වහන්සේ වදාළ සේක. "මා විසින්
4 සෑයක් කරවීමෙහි වූ නුඹ වහන්සේලාගේ අභිප්‍රාය දන්නා ලද්දේ ය.
මම ථූපයක් කරවන්නෙමි, නුඹ වහන්සේලා ධාතූන් දැන වදාරණ
5 සේක්වා" යි නරෙන්ද්‍ර තෙම කීයේ ය. ස්ථවිරයන් වහන්සේ සුමන
සාමණේරයන් හා මන්ත්‍රණය කරව" යි රජහට වදාළ සේක. ධාතූන්
කොයින් ලබමුද්ද" යි ඒ හෙරණුවන්ට කීයේ ය. "නරේන්ද්‍රයාණෙනි!
6 පුරය හා මාර්ගය සරසවා පෙහෙවස් ඇත්තෙහිපිරිස් සහිතව මඟුලැතු
නැඟී සේසත දරවමින් තුර්‍යයන් සහිතව සවස් වේලෙහි මහා නාග
7 වන නම් උයනට යව, නරේන්ද්‍රය! ධාතු ප්‍රබේදාවබෝධය කළා වූ
8 සර්වඥයන් වහන්සේ ධාතූන් එතන්හිදී ලබන්නෙහිය" යි ඒ සුමන නම්
හෙරණුවෝ සතුටු සිත් ඇති නරනිඳුනට වදාළහ.

9 ඉක්බිත්තෙන් ස්ථවිරයන් වහන්සේ රජ ගෙන් නික්ම
සෑගිරියට වැඩ යහපත් මනෝ ගති ඇත්තා වූ සුමන නම් හෙරණුවන්ට
10 "යහපත් වූ සුමනය (මෙහි) එව" යි කැඳවා තෝ උතුම් වූ පුෂ්ප
පුරයට ගොස් තාගේ මුත්තණු වූ මහරජහට මෙසේ අපේ වචනය කියව.
11 "මහරජාණෙනි! යුෂ්මතුන් ගේ යහළු වූ දෙවියන්ට ප්‍රිය වූ දෙවන පෑතිස්
නම් වූ මහරජ තෙම බුද්ධ ශාසනයෙහි ප්‍රසන්න වූයේ ථූපයක් කරවනු
12 කැමැත්තේ ය. නුඹ සමීපයේ සුගත ශරීර ධාතු ඇත්තා හ. සර්වඥයන්
වහන්සේගේ ධාතූන් ද ශාස්තෘන් වහන්සේ විසින් පරිභෝග කරණ
13 ලද්දා වූ පාත්‍රය දෙව" යි කියා පාත්‍රය පුරා ඒ ධාතූන් ගෙණ සක්දෙව්
පුරවරයට ගොස් ඒ සක්දෙව් රජහට මෙසේ අපේ වදනය කියව, "
14 දේවෙන්ද්‍රයාණෙනි! තුන් ලෝ වැස්සන්ගේ දක්ෂිණාවට සුදුසු වූ
15 සර්වඥයන් වහන්සේගේ දකුණු දළදාය ද දකුණු අකුදාව ද යුෂ්මතුන්
සමීපයෙහි ඇත්තාහ. ඒ දළදාවම පුදව, ශාස්තෘහුගේ අකුදාව දෙව
සුතේන්ද්‍රය! ලක්දිව වැස්සාගේ කටයුත්තෙහි ප්‍රපංච නොවෙව" යි කියවයි
16 වදාළ සේක. ඒ මහත් සෘද්ධිමත් වූ හෙරණුවෝ "වහන්ස! එසේය" යි

Non-Commercial Distribution

17 කියා එකෙණෙහිම ධර්මාශෝක මහරජු කරා වැඩි සේක. එහි ශාල
18 වෘක්ෂ මූලයෙහි තබන ලද කාර්තිකොත්සවයෙන් පුදනු ලබන්නා වූ
යහපත් වූ බෝධිය ද දුටු සේක. ස්ථවිරයන් වහන්සේගේ වචනය
19 කියා රජහු සමීපයෙන් ලද්දා වූ ධාතූන් පාත්‍රය පුරාගෙන හිමවතට
පැමිණිසේක. ධාතු සහිත වූ උතුම් පාත්‍රය හිමවත තබා ශක්‍රදේවේන්ද්‍රයා
කරා ගොස් ස්ථවිරයන් වහන්සේගේ වචනය කී සේක.

20 ශක්‍රදේවේන්ද්‍ර තෙම සිළුමිණි සෑයෙන් දකුණු අකුදාව ගෙන
21 හෙරණුණුවන්ට දුන්නේ ය. සුමන සාමණේරයති තෙම ඒ අකුදාව හා
ධාතු පාත්‍රය ද ගෙන එතැනින් සැගිරියට අවුත් ස්ථවිරයන් වහන්සේට
22 එය දුන්සේක. සවස් වේලෙහි රාජසේනාව විසින් පෙරටු කරණ ලද්දා
23 වූ නරේන්ද්‍ර තෙම කියන ලද විධියෙන් "මහා නාග වන" නම් උයනට
ගියේ ය. ස්ථවිරයන් වහන්සේ ඒ පර්වතයෙහිම සියලු ධාතූන් තැබූ
සේක. එහෙයින් "මිශ්‍රක පර්වතය" චෛත්‍ය පර්වත නම් විය.

24 ස්ථවිරයන් වහන්සේ ඒ ධාතු පාත්‍රය සැගිරියෙහි තබා අකුධාතුව
රැගෙණ සාමණේරයන් විසින් ලකුණු කරණ ලද ස්ථානය වූ මහා නාග
25 වනයට වැඩි සේක. නරෙන්ද්‍ර තෙම "ඉදින් මේ සර්වඥයන් වහන්සේ
ගේ ධාතුවෙක් නම් මාගේ ඡත්‍රය (ධාතූන් වහන්සේ දෙසට) තෙමේ ම
26 නැමේවා, හස්ති තෙමේ දණින් සිටීවා, මේ ධාතු කරඬුව ධාතු සමග
27 අවුත් මාගේ මස්තකයෙහි පිහිටාවා" යි සිතුයේ ය. සිතන ලද එය
එසේම විය. මිහිපති තෙම අමෘතයෙන් අභිෂේක ලද්දෙක් මෙන්
28 අතිශයින් සතුටු වූයේ ය. ඒ ධාතු කරඬුව හිසින් ගෙන ඇත් කඳ
මත්තෙහි තැබූයේ ය. සතුටු වූ හස්ති තෙම කුංචනාද කෙළේ ය.
29 පොළොව කම්පිත විය. හස්ති තෙම එතැනින් හැරී ස්ථවිරයන් හා
සේනා වාහන සහිත වූයේ පෙරදිග දොරින් යහපත් වූ පුරයට ප්‍රවිෂ්ටව
30 නැවත දකුණු දොරින් එයින් නික්ම ථූපාරාමවෙහි චෛත්‍ය ස්ථානයෙන්
31 පිටිපස කරණ ලද්දා වූ "ප්‍රමොජ වස්තු" නම් දෙවස්ථානයට ගොස්
බෝධි ස්ථානයෙහි නැවතී පූර්ව දිගට අභිමුඛවැ සිටියේ ය. එකල්හි ඒ
32 ස්තූප ස්ථානය හිඟුරු වැල් හා හිය වැලින් වැසුණේ විය. නරදේව
තෙම දෙවියන් විසින් රක්නා ලද පවිත්‍ර වූ ඒ ස්ථානය එකෙණෙහිම
මනා කොට ශුද්ධ ද අලංකෘත කරවා. ඇත් කඳින් ධාතු පාතට වඩනා
33 පිණිස ආරම්භ කෙළේ ය. හස්ති තෙම ඒ නොකැමැති විය. රජ තෙම
34 ඒ ඇතුගේ සිත් ස්ථවිරයන් විචාළේ ය. "තමන් කුම්භය හා සම උස්
තැනෙක තැබීමට හස්ති තෙම කැමැති වෙයි, ධාතූන් පාත වැඩීම උහු
විසින් අභිමත නොකරණ ලදූ" යි ස්ථවිර තෙම වදාළ සේක.

Non-Commercial Distribution

35 රජ තෙම එකෙණෙහිම අණ කොට ශුෂ්ක වූ අබා වැවෙහි ශුෂ්ක
කර්මද පිණ්ඩයෙන් ඒ හස්ති කුම්භයට සම කොට ථූපයක් නිමවා ඒ
36 උත්තම ස්ථානය බෙහෙවින් සරසා ඒ ධාතුව ඇතු කඳින් බා එහි වැඩූයේ
ය. ධාතු ආරක්ෂා කිරීම සංවිධාන කොට එහි ඇතු සිටුවා ධාතු චෛත්‍යය
37 කිරීමෙහි යුහුසුලු සිත් ඇත්තා වූ රජ තෙම වහා ගඩොල් නිම වීමෙහි
38 බොහෝ වූ මිනිසුන් මෙහෙයා ඇමැතියන් සහිත වූයේම ධාතු කෘත්‍යය
සිතමින් නුවරට ප්‍රවිෂ්ට වූයේ ය. සංඝයා සහිත වූ මහා මහේන්ද්‍ර
39 ස්ථවිර තෙම වනාහි යහපත් වූ මහමෙවුනා උයනට එළැඹ එහි වාසය
කළ සේක.

40 ඒ ඇත්තෙම රාත්‍රියෙහි ධාතු සහිත වූ ඒ ස්ථානය සිසාරා ගමන්
කෙරේ දහවල් (ධාතුව කුම්භස්ථලයෙහි තබා ගෙණ ධාතු සහිත වූයේ
41 බෝධි ස්ථානයෙහි වූ ශාලාවෙහි සිටී ස්ථවිරයන්ගේ මතය අනුව
පැවැත්තා වූ නරේන්ද්‍ර තෙම ඒ චෛත්‍ය ස්ථානය මත්තෙහි කෙණ්ඩයක්
42 පමණ උස් වූ ථූපයක් කීප දිනකින් බඳවා එහි ධාතුපිහිටුවීම නුවර
සෝෂා කරවා ථූපාරාමයට එළඹියේ ය. ඒ ඒ තැනින් හාත්පසින්
43 මහාජන තෙම රැස් වූයේ ය. ඒ සමාගමෙහි ඇත්කුඹු තෙලෙන් අහසට
නැංගා වූ ධාතු තොමෝ සත් යලක් පමණ උස අහසෙහි පෙණ මින්
සිටියා. ජන සමූහයා විස්මයට පත් කරමින් "ගණ්ඩම්බ නම් රුක් මුල
44 සර්වඥයන් වහන්සේ පෙළහර කළ පරිද්දෙන් ජනයා රොමෝද් ගමනය
කරන්නා වූ පෙළහර කළ සේක. නොයෙක් වර එයින් නික්මුණා වූ
45 ගිනි දළින් හා ජල ධාරාවෙන් සකල ලංකා පෘථිවි තොමෝ තමාට
ආලෝක ඇත්තී ද තෙමෙන ලද්දී ද විය. පරිනිර්වාණ මංචකයෙහි
46 හොත්තා වූ පසැස් ඇති සර්වඥයන් වහන්සේ විසින් "මහාධිෂ්ඨාන
පසක්" කරණ ලද්දේ ය. "අශෝක නම් රජහු විසින් ගන්නා ලබන්නා
47 වූ මහාබෝධි දක්ෂිණ ශාඛා තොමෝම සිඳී කටාරමෙහි පිහිටාවා, ඒ
ශාඛා තොමෝ පිහිටා සියලු දිගුන් රඳවමින් එළ පත්‍රයන් ගෙන් යහපත්
48 වූ සවණක් රැස් මුදවා, සිත්කලු වූ ඕ තොමෝ රන් කටාරාම සහිත
49 වූවා අහසට නැඟී සත්දිනක් අවිද්‍යමානව හිම ගර්භයෙක් හි සිටීවා
50 ථූපාරාමයෙහි පිහිටන්නා වූ මාගේ දකුණු අකුදාව අහසට නැඟී යමා
මහ පෙළෙහර කෙරේවා. ලංකාවට ආභරණ වූ රුවන් මැලි සෑයෙහි
51 පිහිටන්නා වූ ප්‍රමාණයෙන් ද්‍රෝණයක් පමණ වූ ධාතුහු බුද්ධ වේශධාරී
52 ව නැඟී අහස සිටියාහු යමා මහ පෙළහර කොට පිහිටත්වා" යි මේ
අධිෂ්ඨාන පස තථාගතයන් වහන්සේ ඉටා වදාළ සේක. එහෙයින් ඒ
53 අකුදා තොමෝ එකල්හි ඒ පෙළහර කළ සේක. ඒ ධාතු තොමෝ
54 අහසින් බැස, මිහිපල්හු මුදුනෙහි පිහිටිසේක. අතිශයින්ම සතුටු වූ රජ
තෙම ඒ ධාතුව චෛත්‍යයෙහි පිහිටෙව්වේ ය. එසමයෙහි ඒ ධාතුව

Non-Commercial Distribution

55 චෛත්‍යයෙහි පිහිටි කල්හි රොමෝද් ගමනය කරන්නා වූ අද්භූත වූ
භූමිකම්පාවෙක් විය.

56 "මෙසේ සර්වඥවරයෝ නොසිතිය හැක්කා හ. බුද්ධ ධර්මයෝ
නොසිතිය හැක්කා හ. නොසිතිය හැක්කවුන් කෙරෙහි ප්‍රසන්න වූවන්ට
57 නොසිතිය හැකි වූ විපාක ද වන්නේ යි". ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දැක ජනයෝ
සර්වඥයන් කෙරෙහි පැහැදුනහ. රජහු මල් වූ මත්තාභව නම් රජ
58 කුමාර තෙම වනාහි මුනීන්ද්‍රයන් කෙරෙහි පැහැද නරෙන්ද්‍රයන්ට යාච්ඤා
59 කොට පුරුෂයන් දහසක් හා සමග සස්නෙහි පැවිදි වූයේ ය. චෙතාපි
නම් ගමින් ද, දොර මඬුලු නම් ගමින් ද, විහිරබීජ නම් ගමින් ද,
එසේම ගල්පිටියෙන් ද, එසේම උපතිස් නම් ගමින් ද, සතුටු වූ පන්
60 පන්සිය ගම් දරුවෝ ද, තථාගතයන් කෙරෙහි හටගත් ශ්‍රද්ධා ඇත්තෝ
61 පැවිදි වූහ. මෙසේ පුරයෙන් බැහැර ද එකල බුදු සස්නෙහි පැවිදි වූ
62 සියලු භික්ෂූහු තිස් දහසක් වූහ. මිහිපති තෙම ථූපාරාමයෙහිඋතුම් වූ
ථූපය නිමවා නොයෙක් රත්නාදියෙන් සැම කල්හි පුද කෙළේ ය. රජහු
63 අන්තඃපුර වාසීහු ද ක්ෂත්‍රියයෝ ද, අමාත්‍යයෝද, එසේම නුවර වැස්සෝ
ද, සියලුම දනව් වැස්සෝ ද,

64 වෙන් වෙන් වශයෙන් පුද කළහ. නරේන්ද්‍ර තෙම ථූපය පෙරටු
කොට එහි විහාරයක් කර වූයේය. මේ විහාරයේ නම එයින් "ථූපාරාම"
ය යි ප්‍රකට විය.

65 පරිනිර්වාණප්‍රාප්ත වූත් ලෝක ස්වාමී තෙම ස්වකීය ධාතු
ශාරීරයෙන් පවා මෙසේ ජනසමූහයාට වැඩ හා සැප නොයෙක්
ආකාරයෙන් මනා කොට කළ සේක. සර්වඥයන් වහන්සේ ජීවමාන
කල කියනුම කවරේ ද?

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ සහවස ධාතු ආගමන නම් වූ සතළොස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# දහඅට වෙනි පරිච්ඡේදය

1 මිහිපති තෙම මහා බෝධිය ද (සංඝමිත්‍රා නම්) ස්ථවිරීන් ද
2 ගෙන්වනු පිණිස ස්ථවිරයන් වහන්සේ විසින් වදාළ වචනය සිහි කරමින්
වස් කාලය තුළ එක් දිනක් සිය ගෙහි ස්ථවිරයන් සමීපයෙහි හුන්නේ
ඇමැතියන් හා සමග මන්ත්‍රණය කොට තමන් බෑන වූ අරිට්ඨ නම්
ඇමැතියා ඒ කර්මයෙහි තෙමේම මෙහෙයමින් (කරුණු මෙනෙහි කොට
3 උහු කැඳවා) "දරුව ! ධර්මාශොක මහරජාණන් කරා ගොස් මහා බෝධිය
4 ද සංඝමිත්‍රා නම් ස්ථවිරීන් ද මෙහි වඩා ගෙණෙනු හැක්කෙහි ද" යි මේ
5 වචනය කීයේය. (ජනයාහට) තුෂ්ටි දායක වූ "දේවයන් වහන්ස! ඉදින්
මම මෙහි ආයෙම් පැවිදිවනු ලබන්නෙම් නම් ඒ දෙනම පැළලුප් නුවරින්
6 වඩා ගෙණ එනු හැක්කෙමි" යි (කීයේය). රජ තෙම "එසේ වේවා" යි
කියා උහු එහි යැවුයේය. හෙතෙම තෙරුන් වහන්සේගේ ද
7 නරේන්ද්‍රයන්ගේ ද හසුන් ගෙණ වැඳ වප් මස ශුක්ල පක්ෂයෙහි දෙවෙනි
දවස්හි නික්මුණේය. නරනිඳුහුගේ කර්මයෙහි අනුයුක්ත වූ හෙතෙම
8 දඹකොළ පටුනෙහි දී නැව් නැඟී මහ මුහුද තරණය කොට ස්ථවිරයන්
9 වහන්සේගේ අධිෂ්ඨානයෙන් යෙදීමෙන් නික්මුණු දවස්හිම රම්‍ය වූ
පැළලුප් නුවරට ගියේය.

10 එකල්හි වනාහි ශෛක්ෂ්‍ය වූ අනුළා දේවි තොමෝ පන්සියයක්
කන්‍යාවන් හා අන්තඃපුර වාසී වූ ස්ත්‍රීන් පන් සියයක් ද සමග දස සිල්
සමාදන්ව කසාවත් ඇත්තී පිරිසිදු වුවා පැවිදි පතමින් ස්ථවිරීන්ගේ
ආගමනය සොයන්නී නුවර එක් පෙදෙසෙක්හි නරනිඳුහු විසින් කරවන
11 ලද සිත්කලු වූ මෙහෙණ අසපුවෙක්හි යහපත් ව්‍රත ඇතිව වාසය කළාය.
12 ඒ උපාසිකාවන් විසූ මේ මෙහෙණවර ඒ කරණ කොට ගෙණ උපාසිකා
විහාර යයි ලක්දිව ප්‍රකට විය. (නරනිඳුහු) බෑනා වූ මහාරිට්ඨ නම්
13 ඇමැති තෙම රාජ සන්දේශය ධර්මාශෝක නරේන්ද්‍රයාණන්ට පමුණුවා
14 ස්ථවිරයන් වහන්සේගේ සන්දේශය සැල කෙළේය. "රාජශ්‍රේෂ්ඨයන්
වහන්ස! නුඹ වහන්සේග් යහලු රජාණන් සහෝදරයාණන්ගේ දේවි
15 තොමෝ පැවිදි පතමින් නිබඳ සංයම ඇතිව වසන්නීය. ඒ දේවිය
පැවිදි කරණු පිණිස සංඝමිත්‍රා නම් මෙහෙණින්න මෙහෙයව. ඒ
16 මෙහෙණින්න සමග මහාබෝධි දක්ෂිණ ශාඛාව ද යවව"යි මහා මහේන්ද්‍ර
ස්ථවිරයන් වහන්සේගේ වචනය වූ එම අර්ථය තෙරණියට ද කීයේය.
ඒ ස්ථවිරි තොමෝ පිය (මහරජාණන්) කරා එළැඹ ස්ථවිරයන්
17 වහන්සේගේ මතය කී සේක. මෑණියනි ! යුෂ්මතුන් නොදක්නා වූ මම
දරු මුනුබුරන්ගේ විප්‍රයෝගයෙන් වූ ශෝකය කෙසේ දුරු කෙරෙම්
18 ද"යි කීයේය. "මහරජාණෙනි! මාගේ සහෝදරයාණන්ගේ වචනය මට

Non-Commercial Distribution

ගරුය පැවිදි කට යුත්තෝ ද බොහෝය. එහෙයින් මා විසින් එහි යා
යුතුය" යි ඕ තොමෝ කීවාය.

19 "ශස්ත්‍ර ප්‍රහාරයට නුසුදුසු වූ මහා බොධි වෘක්ෂයෙන් ශාඛාව
20 කෙසේ නම් ගනී ද" යි රජ තෙම සිතුයේය. ඒ මහීපති තෙම මහා දේව
නම් අමාත්‍යයාගේ උපායෙන් භික්ෂු සංඝයා පවරා වලඳවා "වහන්ස !
21 ලංකාවට මහා බෝධිය යැවිය යුතු දෝහෝ" යි විචාළෝය. ඒ මොග්ගලි
22 පුත්ත නම් ස්ථවිරයන් වහන්සේ "යැවිය යුතුය"යි වදාරා පසැස් ඇත්තා
වූ සර්වඥයන් විසින් කරණ ලද මහාධිෂ්ඨාන පස නරේන්ද්‍රයන්ට වදාළහ.
23 ඒ මිහිපති තෙම ඒ අසා සතුටුව මහා බෝධිය වෙතට යන්නා වූ සත්
යොදුන් මග ශුද්ධ කරවා සකස් කොට නොයෙක් පරිද්දෙන් අලංකාර
කර වූ යේය. කටාරමක් කරණ පිණිස රන් බැහැර කර වූයේ ය.
24 තුලාධාරයෙකුගේ වෙස් ගත් ඒ විස්සම් දෙව් පිත් තෙමේ ද අවුත්
25 කොපමණ කටාරමක් කෙරෙම් දැ යි ඒ නරනිඳුනු විචාළේ ය. තෝම
26 ප්‍රමාණ දැන කරව යි කී කල්හි රන් ගෙණ අතින් පිරිමැද එකෙණෙහිම
බඳන නිර්මිත කොටාලා ගියේ ය. නවරියන් අවට ඇත්තා වූ ගැඹුරෙන්
27 පස් රියන් වූ තුන් රියන් විෂ්කම්භයෙන් යුක්ත වූ අට අඟුල් ඝන වූ
28 තරුණ ඇතෙකුගේ සොඬ පමණ මුව විට ඇත්තා වූ තරුණ සූර්‍ය්‍යයා
29 සමාන කාන්ති ඇත්තා වූ යහපත් වූ ඒ කටාරාම ගෙන්වා ගෙණ රජ
තෙම සත් යොත්නක් දිගු වූ තුන් යොත්තක් පතළා වූ සිවුරඟ සෙනඟ
30 හා මහා භික්ෂු සංඝයාත් සමග ප්‍රසන්න වූ ජනයන්ගේ පූජා සංඛ්‍යාත
නානාවිධි අලංකාරයෙන් සැරසුණා වූ අනේක ප්‍රකාර රත්නයෙන් විචිත්‍ර
31 වූ නානාප්‍රකාර ධ්වජ මාලා ඇත්තා වූ නානා විධ පුෂ්පයෙන්ගැවසුණා
වූ නානාවිධ තූර්‍ය්‍ය ඝෝෂණය කරනු ලද්දා වූ මහා බොධි වෘක්ෂය කරා
32 එළඹ සේනාවෙන් පිරිවරා තිරයකින් අවුරා මහාගණ ප්‍රධාන වූ මහා
ස්ථවිරයන් දහසකින් හා ප්‍රාප්තාභිසෙක ඇති දහසකින් වැඩි වූ රජ
33 දරුවන්ගෙන් ද තමන් හා මහා බෝධිය මොනවට පිරිවරා ඇදිලි බැඳ
ගෙණ මහා බෝධිය බැලූයේය. ඒ මහා බෝධිහුගේ දක්ෂිණ ශාඛාව
34 සම්බන්ධවූ සතර රියන් පමණ තැන් ස්කන්ධය ද තබා ශාඛා අන්තර්ධාන
35 වූහ. ඒ පෙළහර දැක සතුටු වූ මිහිපති තෙම මම රාජ්‍යයෙන් මහ
36 බෝධිය පුදමි යි කියා මහා බෝධිය මහා රාජ්‍යයෙහි අභිෂේක කෙළේ
ය. මිහිපති තෙම මල් ආදියෙන් මහා බෝධිය පුදා ප්‍රදක්ෂිනා කොට
37 අට තැනෙක්හි ඇදිලි බැඳ නමස්කාර කොට නොයෙක් රත්නයෙන්
38 සරසන ලද රනින් නිමවන ලද මනා කොට නගිනු හැක්කා වූ ශාඛාවන්
39 දක්වා උස් වූ පීඨයෙක්හි රන් බඳින තබ්බවා නැඟී උතුම් වූ ශාඛාව
40 ගන්නා පිණිස රන් තෙල්ලෙන් රත්සිරියෙල් ගෙණ ශාඛායෙහි රේඛාවක්
ඇඳ "ඉදින් මේ මහා බෝධිය ලංකාද්වීපයට යා යුතු වේද ඉදින් මම

Non-Commercial Distribution

41 සර්වඥයන් වහන්සේ ගේ සස්නෙහි විමති රහිත වෙම් ද, මේ යහපත්
වූ දක්ෂිණ මහා ශාඛාව තොමෝ ම සිඳී මේ රන් බඳනෙහි පිහිටාවා" යි
සත්‍ය ක්‍රියා කෙළේ ය.

42 ඒ මහා බෝධි ශාඛා තොමෝ රේඛා කළ තැනින් තොමෝම සිඳී
43 සුගන්ධකර්දමයෙන් පිරුණා වූ කටාරම මත්තෙහි පිහිටියා ය. නරේශ්වර
තෙම මූල රේඛාවෙන් මත්තෙහි තුන ඟුලෙන් තුනඟුල රත් සිරියෙලින්
44 නව තැනෙක රේඛා දානය කරමින් පිරිසින්දේ ය. ආදී වූ රේඛාවෙන්
මහත් වූ මුල් ද අනිකුත් රේඛා වලින් කුඩා මුල් ද දසය දසය නික්ම
45 ගෙණ දැල් කවුළු සමානව පාත බැස්සාහු ය. ඒ ප්‍රාතිහාර්‍යය දැක
46 අතිශයෙන්ම සතුටු වූ නරේන්ද්‍ර තෙම එහිම සිට උද්ඝෝෂණය කෙළේ
ය. හාත්පස පිරිස ද (තුෂ්ට ඝෝෂණය) කළා ය. සතුටු සිත් ඇත්තා
වූ භික්ෂු සංඝ තෙම සාධුකාරය හැඟ වූ සේක. හාත්පස දහස් ගණන්
47 පිළිහිස සිසැරුම් පැවැත්තා හ, ඒ මහා බෝධි තොමෝ මෙසේ මහ
ජනයා පහදවන්නී මුල් සියයකින් ඒ රන් කටාර මෙහි ද සුවඳ මඩෙහි
පිහිටි යා ය.

48 ඒ බෝධි ස්කන්ධය තෙම දස රියන, මනරම් වූ ශාඛා පස සතර
49 රියන්සතර රියන් වූවාහු පස් පලයකින් සැදුම් ලද්දාහ. ඒ ශාඛාවන්
සම්බන්ධ වූ කුඩා ශාඛාවන් දහසක් ද විය. මෙසේ මහා බෝධි තොමෝ
50 මනෝහර ශ්‍රීධාරණයෙන් හෙබියා ය. කටාරමෙහි මහා බෝධිය පිහිටි
51 කෙණෙහි පොළොව කම්පිත විය. නානා ප්‍රකාර ප්‍රාතිහාර්යයෙයෝ ද
වූහ. දෙවියන් හා මිනිසුන් විෂයෙහි තූර්‍යයයන්ගේ ස්වකීය නාදයෙන්
52 ද දෙව් බඹ සමූහයාගේ සාධුකාර නාදයෙන් ද මේඝයන්ගේ ද මෘග
පක්ෂීන්ගේ ද යක්ෂාදීන් ගේ ද ශබ්දයෙන් ද පෘථිවි කම්පා ශබ්දයෙන් ද
53 ඒක කෝලාහල විය. බෝධි වෘක්ෂයාගේ ඵල පත්‍රයන් ගෙන් සවනක්
54 රැස් නික්ම මුළු සක්වළ හෙබ වූහ. කටාරම සහිත වූ මහ බෝ තොමෝ
එතැනින් අහසට පැන නැඟී දර්ශන සහිතවැ සත් දවසක් හිම
55 ගර්භයෙක්හි පිහිටියා ය. රජ තෙම පීඨයෙන් බැස ඒ සත් දවස එහි
56 වෙසෙමින් සතතයෙන් නොයෙක් පරිද්දෙන් මහ බෝ පුද කෙළේ ය.
ඒ සත් දවස ඉක්ම ගිය කල්හි සියලු ඒ තුෂාර ජලයෙන් යුක්ත වූ
57 මේඝයෝ ද එකතු වූ රශ්මීහු ද මහා බෝධියට ප්‍රවිෂ්ට වූහ. කටාරාම
සහිතව පිහිටියා වූ මනරම් වූ මහ බෝ තොමෝ සියලු මහ ජනයාට
ශුද්ධ වූ ආකාශයෙහි පෙනිණිය.

58 නානාවිධ වූ ප්‍රාතිහාර්‍යය පැවැති කල්හි සහ බෝ තොමෝ ජන
සමූහයා විස්මිත කරවමින් පොළෝ තලයට බැස්සා ය. නොයෙක්

Non-Commercial Distribution

59 ප්‍රාතිහාර්‍යයන් කරණ කොට ගෙණ පිණා ගියා වූ ඒ මහරජ තෙම
නැවත මහා බෝධිය මහා රාජ්‍යයෙන් පිදුයේ ය. ඒ නරේන්ද්‍ර තෙම
60 මහ බෝධිය මහා රාජ්‍යයෙන් අභිෂේක කොට නා නා පූජායෙන්
පුදන්නේ නැවත සත් දවසක් එහිම වාසය කෙළේ ය. දෙසතිය
61 ඇවෑමෙහි වප් මස පුර පසළොස්වක් පොහෝ දවස්හි මහා බෝධිය
එතැනින් වඩා ගත්තේ ය, වප් මස කෘෂ්ණ පක්ෂයෙහි චාතුර්දශී වූ
62 පොහෝ දවස්හි නරේන්ද්‍රතෙම ස්වකීය පුරයට පමුණුවා බොහෝ
සෙයින් අලංකාර කොට යහපත් වූ මණ්ඩපයක් කරවා කාර්තික ශුක්ල
63 පක්ෂයෙහි පැළවිය දවස්හිම මහා බෝධිය එහි පැදුම් දිග ශුභ වූ මහා
64 ශාල වෘක්ෂ මූලයෙහි වඩා තබා දවසක් පාසා නොයෙක් පූජාවන් කර
65 වූයේ ය. ඒ බෝධිය ග්‍රහණය කළ දවසින් සතළොස් වන දවස්හි එක
66 විටම අංකුර නවයක් උපන්හ. එයින් සතුටු වූ නරෙන්ද්‍ර තෙම නැවත
ද මහ බෝධිය රාජ්‍යයේ පිදුයේ ය. භූමිපති තෙම මහා බෝධිය
67 රාජ්‍යයෙහි අභිෂේක කොට නානා විධ වූ මහා බෝධි පූජා ද කර වූයේ
ය.

68 මෙසේ විලක් හා සමාන වූ පුෂ්ප පුරයෙහි රශ්මි සහිත වූ නානාවිධ මනෝඥ වූ ධවජයෙන් ආකුල විශාල වූ අතිශවින් සිත්කලු උතුම් වූ මහා බෝධි පූජා තොමෝ දෙව් මිනිසුන්ගේ සිත් ප්‍රබෝධ කරන්නී විය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහවස මහබෝධි ගහණ නම් අටළොස් වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# දහනව වෙනි පරිච්ඡේදය

1 ඒ මිහිපති වූ මහ රජ තෙම මහ බෝ රක්නා පිණිස අටළොස්
2 කුලයක දෙවියන් ද, අටළොස් කුලයක ඇමැතියන් ද, අට කුලයක
බමුණන් ද, අට කුලයක කෙළෙඹියන් ද, ගොපලු කුලයන් හා තරස්
3 කුලයන් ද, කලිඟු කුලයන් ද එසේම පෙහෙර කුලයන් ද, සියලුම
සේනා සම්බන්ධ කුලයන් ද නාග යක්ෂයන් සම්බන්ධ කුලයන් ද අට
4 අට දී අභිමතදායි වූයේ රන් රිදීමුවා කළයන් අට අට දී ගංගා නම්
නදියෙහි සරසන ලද නැවට මහා බෝධිය නංවා එකොළොස් නමක්
5 මෙහෙණින් සහිත වූ සංඝමිත්‍රා නම් මහ තෙරණින් ද එසේම අරිෂ්ට
6 කුමරා දීන් ද නැව් නංවා නුවරින් නික්ම වින්ධ්‍යාවනය සත් දවස කින්
ඉක්මවා තාමලිත්ති නම් තොටට පැමිණියේ ය. දෙවියෝද, නාගයෝද,
7 මනුෂ්‍යයෝද අතිශයින් උදාර වූ පූජායෙන් පුදන්නාහු සත් දවසින් ම
8 එහි පැමිණියහ. ඒ මිහිපතී තෙම මහා බෝධිය මහා සුමුද්‍ර තීරයෙහි
9 වඩා හිඳුවා නැවත ද මහා රාජ්‍යයෙන් පිදුයේ ය. අභිමතදායක වූ ඒ
නරේන්ද්‍ර තෙම මහා බෝධිය මහා රාජ්‍යයෙහි අභිෂේක කොට උඳුවප්
10 මස ශුක්ල පක්ෂයෙහි පැළවිය දවස්හි එතැනින් මහා බෝධිය නැවට
වඩන්නට පැළලුප් නුවර ශාල මූලයෙහි දී දෙන ලද ජාතියෙන් උස් වූ
11 ඒ අට අට කුලවාසීන් හා සමග මහ බෝධිය ඔසවා ගෙණ එහි ග්‍රීවය
12 දක්වා ජලයෙහි බැස මනා කොට නැවෙහි පිහිට වූයේ ය. ස්ථවිරයන්
සහිත වූ ඒ මහ තෙරණිය ද මහාරිෂ්ට නම් මහාමාත්‍යයාද නැවට
13 නංගවා මේ වචනය කීයේ ය. මම තුන් වරක් මහා බෝධිය රාජ්‍යයෙන්
14 පිදුයෙමි. එසේම මාගේ යහළු වූ රජ තෙම රාජ්‍යයෙන් පුදාවා" මේ
වචනය කියා ඉවුරෙහි ඇඳිලි බැඳ සිටියා වූ මහ රජ තෙම වඩනා වූ
15 මහා බෝධිය දකිමින් කඳුලු වැගිර වූයේ ය. මහා බෝධියෙන් වෙන්
වීම කරණ කොට ගෙන ශෝක ඇති වූ ඒ ධර්මාශෝක මහ රජ තෙම
හඬා වැලප සිය පුරයට සම්ප්‍රාප්ත වූයේ ය.

16 මහ බෝධිය ආරෝපණය කරණු ලද්දා වූ නැව සාගරයට වන්නීය.
ඒ මහ මුහුද හාත්පස යොදුනක් තන්හි රළ සංසිඳුනේය. හාත්පස
17 පස්වණක් පියුම් පිපුනාහ. නොයෙක් තූර්‍යයෝ ද අහස්හි වැයුණා හ.
18 නොයෙක් දේවතාවන් විසින් නොයෙක් පුද පවත්වනු ලැබූහ. නාගයෝ
19 මහා බෝධිය ගන්නා පිණිස ද ඍද්ධි විකුර්වණය කළහ. අභිඥා බල
20 පාරප්‍රාප්ත වූ සංඝමිත්‍රා නම් මහ තෙරණි තොමෝ ගුරුළු වෙස් ඇතිව
ඒ මහා නාගයන් බියගැන් විය. බිය ගන්වන ලද්දා වූ ඒ මහා නාගයෝ
21 මහ තෙරණින් යාච්ඤා කොට මහා බෝධිය එතැනින් නාග භවනයට
වඩා ගෙණ ගොස් සත් දවසක් මුළුල්ලෙහි නාග රාජ්‍යයෙන් හා නානාවිධ

Non-Commercial Distribution

පූජායෙන් පුදා වඩා ගෙණවුත් නැවෙහි පිහිට වූහ. මහා බෝධි තොමෝ
22 එදවසම මෙහි දඹකොල පටුනට වැඩියා ය. ලෝ වැඩෙහි ඇලුණා වූ
දෙවන පෑතිස් රජ තෙම වනාහි සුමන සාමණේරයන් අතින් පූර්වයෙහි
23 අසන ලද ඒ බොධිද්‍රැමාගමනය ඇත්තේ උඳුවප් මස පළමු වෙති දින
පටන් ආදර සහිතව නුවර උතුරු දොරින් දඹකොළ පටුන් මහ මඟ
24 දක්වා සියලු මාර්ගය අලංකෘත කරවා මහා බෝධිය කෙරෙහි ගිය සිත්
25 ඇත්තේ මුහුදු අසල ශාලාවෙක ස්ථානයෙහි සිට මහ මුහුද වඩනා මහා
බෝධිය මහ තෙරණුවන්ගේ සෘද්ධිය කරණ කොට ගෙණ දුටුයේ ය. ඒ
26 අද්භූතය ප්‍රකාශ කරනු පිණිස ඒ ස්ථානයෙහි කරණ ලද ශාලා තොමෝ
27 මෙහි සමුද්දාසන සාලා යන නමින් ප්‍රකට විය. යහපත් දේහ ඇත්තා
වූ මහ රජ තෙම සේනා සහිත වූයේ මහා ස්ථවිරයන් වහන්සේගේ
28 අනුභාවයෙන් ඒ ස්ථවිරයනුත් හා සමග එ දවසම දඹකොළ පටුනට
29 මහා බෝධිය මෙහි පැමිණීමෙහි ප්‍රීතියෙන් පත් වූයේය. ලංකේශ්වර
නරේන්ද්‍ර තෙම ප්‍රිති වාක්‍යය පවත්වමින් ග්‍රිවය පමණ ජලයට බැස
30 සොලොස් කුල ජනයන් සමග මහා බෝධිය හිසින් දරාගෙණ වෙරළට
31 නගා ගෙණ යහපත් වූ මණ්ඩපයෙහි වඩා ලංකා රාජ්‍යයෙන් පිදූයේය.
නරේන්ද්‍ර තෙම තමන්ගේ රාජ්‍යය සොළොස් කුල ජනයන්ට පමුණුවා
32 තෙමේ දොරටුපාල තන්හි සිට තුන් දිනක් එහිම නානාවිධ පූජා කෙළේය.
කාරණයෙහි නුවණැත්තා වූ නරේන්ද්‍ර තෙම දසවක් දවස්හි මහා බෝධිය
33 යහපත් වූ රථයකින් වඩා ගෙණ එන්නේ පැදුම් දෙස විහාර ස්ථානයෙහි
තැබ්බ වූයේය. ඒ නරේන්ද්‍ර තෙම (එතන්හි) සංඝයාට හා ජනයාට
34 පෙරවරු බත පැවැත්වූයේය. මහා මහේන්ද්‍ර ස්ථවිරයන් වහන්සේ
එතන්හි දශබලධාරී තථාගතයන් වහන්සේ විසින් කරන ලද නාග දමනය
ඒ රජගහ නිරවශේෂ වශයෙන් වදාළ සේක.

35 මිහිපති තෙම ස්ථවිරයන් වහන්සේගෙන් අසා සර්වඥයන්
වහන්සේ විසින් වැඩ හිඳුම් ආදියෙන් පරිභෝග කරන ලද්දා වූ ඒ ඒ
36 තන්හි ලකුණු කරවා තිවක්ක නම් බ්‍රාහ්මණයාගේ ගම් දොර ද ඒ ඒ
තන්හි ද මහා බෝධිය වඩා හිඳුවා සුදු වැලි අතුළ නානාවිධ පුෂ්පයන්
37 ආකුල වූ ඔසවන ලද කොඩි ඇති මල් ඇගෑයෙන් සරසන ලද්දා වූ
38 මාර්ගයෙහි රෑ දාවල් අනලස්ව පුදකරමින් තුදුස්වක්හි අනුරාධපුර
සමීපයට මහා බෝධිය වඩාගෙණවුත් වැඩෙන්නා වූ සෙවනැලි ඇති
39 සවස් කාලයෙහි පූජා කෙරෙමින් මොනවට සරසන ලද පුරයට උතුරු
40 දොරින් ප්‍රවිෂ්ට කෙළේය. ඒ නරේන්ද්‍ර තෙම දකුණු දොරින් නික්ම සිවු
බුදු වරයන් විසින් සෙවුනා ලද මහමෙවුනා උයනට ප්‍රවිෂ්ට කර සුමන
41 සාමණේරයන්ගේ වචනයෙන්ම මොනවට සරසන ලද්දා වූ පූර්ව බෝධින්
42 පිහිටි ස්ථානය වූ මනරම් වූ ප්‍රදේශයට පමුණුවා රාජාභරණයෙන්

Non-Commercial Distribution

අලංකෘත වූ සොළොස් කුල ජනයන් හා සමග මහා බෝධිය තබා
43 පිහිටුවනු පිණිස අතින් තොර කෙළේය. අතින් මුත් පමණ කල් ඇති
ඒ මහා බෝධි තොමෝ අසූ රියන් පමණ අහසට නැගී සිටියා මනා වූ
44 සවණක් රැස් විහිද වූවාය. මනෝරම්‍ය වූ ඒ රශ්මීහු ලංකාද්වීපයෙහි
පැතිර බ්‍රහ්ම ලෝකයෙහි හැපි සූර්යයාගේ අස්තංගමය දක්වා සිටියා
45 හුය. ප්‍රාතිහාර්යයෙහි ප්‍රසන්න වූ දස දහසක් පුරුෂයෝ විදර්ශනා වඩා
රහත් බවට පැමිණ මෙහි පැවිදි වූහ.

46 ඉක්බිති මහා බෝධි තොමෝ සූර්ය අස්තංගත වන කල්හි
රෝහෙණ නකතින් පෘථිවියෙහි පිහිටියාය. පොළොව ද කම්පිත විය.
47 (පෙර කියන ලද්දා වූ) ඒ මුල් කටාරම් මුව විටෙන් උඩ නැගි ඒ රන්
48 බඳන වෙළා ගනිමින් පොළෝ තලට බැස්සාහ. රැස් වූ සියලු ජනයෝ
49 පිහිටියා වූ මහා බෝධිය හාත්පසින් සුවඳ මල් ආදි වූ පූජා වස්තුවෙන්
පිදූහ. මහා මේඝය තෙමේ වැස්සේය. හාත්පසින් හිම ගැප් හා සිහිල්
50 වලාවෝ මහා බෝධිය වැසූහ. මහ බෝ තොමෝ සත් දිනක් දැකුම්
රහිත වූවා ජනයා කෙරෙහි ප්‍රසාද උපදවන්නී එම හිම ගැබෙහි වැඩ
51 සිටියාය. සත් දවස ඇවෑමෙහි ඒ සියලු මේඝයෝ පහව ගියහ. සවණක්
52 රැස් හා මහ බෝ තොමෝ ද පෙණිනි. මහා මහේන්ද්‍ර ස්ථවිරයන්
වහන්සේ ද සංඝමිත්‍රා නම් භික්ෂුණී තොමෝ ද පිරිස් සහිතව එහි
සම්ප්‍රාප්ත වූහ. පිරිස් සහිත නරේන්ද්‍ර තෙමේ ද පැමිණියේය. කතරගම
53 (නිවාසී වූ) ක්ෂත්‍රියයෝ ද, චන්දන ග්‍රාම වාසි වූ ක්ෂත්‍රිය යෝද, තිවක්ක
නම් බ්‍රාහ්මණ තෙමේ ද, ලක්දිව් වැසි ජනයෝ ද මහ බෝ පිදීමෙහි
54 හටගත් උත්සාහ ඇත්තෝ දෙවියන්ගේ ආනුභාවයෙන් ආවාහුය.
ප්‍රාතිහාර්ය කරණ කොට ගෙන විස්මයට පත් වූ ඒ මහා සමාගමයෙහි
55 (ජනයන් බලා සිටියදී පැදුම් දිග ශාඛාවෙන් වැටෙන්නා වූ විලිකුම්
බෝපලය ස්ථවිරයන් වහන්සේ රැගෙන රෝපනය කරණ පිණිස
56 නරෙන්ද්‍රයාණන්ට දුන් සේක. සුගන්ධ ද්‍රව්‍ය මිශ්‍ර වූ පසින් පිරූ රන්
කටාරමක් මහාසනස්ථානයෙහි තැබූ කල්හි ඒ බෝපලය නරේන්ද්‍ර තෙම
57 රෝපණය කෙළේය. සියල්ලන් බලා සිටියදීම අංකුර අටක් නැගී
58 තරුණ බෝරුක් වූවෝ සතර රියන් පමණව සිට ගත්හ. ඒ තරුණ බෝ
රුක් දැක විස්මයට පත් වූ සිත් ඇති නරේන්ද්‍ර තෙම සේසතින් පිදුයේ
අභිෂේකය ද දුන්නේය.

59 ඒ අටක් තරුණ බෝධි වෘක්ෂයන් දඹකොළ පටුනෙහි එකල
60 නැවින් ගොඩ නැගී මහා බෝධිය පිහිටි තන්හි ද, තිවක්ක බ්‍රාහ්මණයාගේ
61 ගම්හි ද, එසේම ථූපාරාමයෙහි ද, ඉසුරුමුනි විහාරයෙහි ද, පළමු වෙනි
62 සෑමලුයෙහි ද, සෑගිරි අරමෙහි ද, එසේම කතරගම්හි ද, සඳුම් ගම්හි ද,

Non-Commercial Distribution

එක එක පිහිට වූහ. අන්‍ය වූ පල සතරින් උපන් දෙතිසක් තරුණ
63 බෝධි වෘක්ෂයෝ දිවයින හාත්පස යොදුනෙන් යොදුන විහාරස්ථානයෙහි
ලක්දිව් වැසි ජනයාගේ වැඩ පිණිසම මහා බෝධි වෘක්ෂය කෙරෙහි වූ
සර්වඥ යන් වහන්සේගේ තේජස කරණ කොට ගෙණ පිහිටියහ. පිරිස්
64 සහිත වූ අනුළා දේවි තොමෝ සංඝමිත්‍රා නම් තෙරණිය සමීපයෙහි
පැවිදිව රහත් බවට පැමිණියාය. පන් සියයක් පිරිවර ඇත්තා වූ ඒ
65 අරිට්ඨ නම් වූ ක්ෂත්‍රිය තෙමේ ද ස්ථවිරයන් සමීපයෙහි පැවිදිව රහත්
බවට පැමිණියේය. යම් අට සිටු කුලයෙක ජනයෝ මහා බෝධිය
66 මෙහි වඩා ගෙණාවාහු ද. එහෙයින් ඔව්හු බෝධාහර කුලයෝයයි
67 කියනු ලබති. උපාසිකා විහාර යයි ප්‍රසිද්ධ වූ ඒ මෙහෙණ වරෙහි
68 භික්ෂුණී සංඝයා සහිත වූ ඒ සංඝමිත්‍රා නම් ස්ථවිරි තොමෝ වාසය
කළාය. එහි (චූලංග මහංගන සිරිවඩ්ඪ යයි) මන්දිර තුණක් ප්‍රමුඛ
කොට ඇත්තා වූ මන්දිර දොළසක් (නරේන්ද්‍ර තෙම) කරවූයේ ය. ඒ
69 මන්දිරයන් අතුරෙන් එක් මහ මැදුරෙක්හි මහ බෝධිය වැඩු නැව කූඹ
යටිය පිහිටෙවුයේය. එක් ගෙයෙක්හි පළපත තැබ්බ වූයේය. එකෙක
70 කෙනිපාතය තැබූයේය. එයින් ඒ මන්දිරයෝ ප්‍රකට වූහ. (ධර්ම රුචිකාදී
වූ) අන්‍ය නිකාය වූ කල්හිද ඒ ගෙවල් දොළසම හත්ථාළ්හක විහාර
වාසී මෙහෙණින්නන් විසින්ම සෑම කල් පරිභෝග කරණ ලදහ.

71 රජුහුගේ ඒ මඟුලැත් තෙමේ සැප වූ පරිද්දෙන් හැසිරෙන්නේ
72 පුරෙහි එක් පසෙක්හි සිහිල් කඳු රැළියක් අන්තයෙහි හිඟුරු වැල්
ළැහැබක් තුළ ගොදුරු කමින් සිටියේය. ඇතා එහි ඇලුනා දැන එහි
73 ඇත් හලක් කළහ. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ ඇත් තෙමෙ ආහාර
නොගත්තේය. ඒ නරේන්ද්‍ර තෙම ලංකා ද්වීපයාගේ ප්‍රාසාදක ස්ථවිරයන්
74 ගෙන් ඒ ඇතුගේ සිත කිමෙක් දූ යි විචාළේය. "හිඟුරුවැල් ලැහැබෙහි
ථූපයක් කිරීම ඇත් තෙම අභිමත කෙරෙයි" මහා ස්ථවිර තෙම මහරජ
75 හට වදාළ සේක. සතතයෙන් ජනයාගේ වැඩෙහි ඇලුණා වූ නරේන්ද්‍ර
තෙම එහි ධාතු සහිත වූ ථූපයක් හා ථූපයට (සුදුසු) ගෙයක් ද වහාම
76 කර වූයේ ය. නුවණැත්තා වූ සංඝමිත්‍රා නම් ඒ මහා ස්ථවිර තොමෝ
තමන් වසන විහාරය ජනයන් ගැවසී ගත් හෙයින් සූන්‍යාගාර
77 විහාරණයෙහි අභිලාෂ ඇත්තී ශාසනයාගේ අභිවෘද්ධිය පතන්නී
78 මෙහෙණින්නන්ට වැඩ පිණිස ද අන්‍ය වූ මෙහෙණ වරක් පතන්නී
79 අතිශයින් විවේක සැප ඇත්තා වූ යහපත් වූ ඒ චෛත්‍ය මන්දරයට
පැමිණ ආයර්‍ය විහරණයෙහි දක්ෂ නිර්මල වූවා දිවා විහරණය කළහ.
පණ්ඩිත වූ රජ තෙම තෙරණිය වඳනා පිණිස මෙහෙණි අසපුවට ගොස්
80 තෙරණිය එහි වැඩියා අසා එහි ගොස් ඒ තෙරණිය වැඳ ඒ තෙරණින්
හා සතුටුව එහි ඊමේ කාරණය වූ ඒ තෙරණියගේ අභිප්‍රාය කිමෙක් දැයි

Non-Commercial Distribution

81 අදහස් දන ථූප මන්දිරය හාත්පස සිත්කලු වූ මෙහෙණි අසපුවක් කර වූයේ ය. ඇත් හල සමීපයෙහි කරවන ලද්දා වූ ඒ මෙහෙණින්නන්ගේ
82 අසපුව තෙම එහෙයින් හත්ථාළ්හක විහාර යයි ප්‍රසිද්ධ වූයේ ය. මහත්
83 ප්‍රඥා සම්පන්න සුමිත්‍ර වූ ඒ සංඝමිත්‍රා නම් මහ තෙරණි තොමෝ රම්‍ය
84 වූ ඒ මෙහෙණි අසපුවෙහි වාසය කළාය.

මෙසේ ලංකා වාසී ජනයාගේ වැඩ ශාසනාභිවෘද්ධිය ද මනා කොට සිද්ධ කරන්නා වූ මේ මහා බෝධිදෘමේන්ද්‍ර තෙම ලංකාද්වීපයෙහි රම්‍ය වූ මහමෙවුනා උයනෙහි නොයෙක් අද්භූතයන්ගෙන් යුක්තව දීර්ඝ කාලිකව පිහිටියේ ය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස බෝධි ආගමන නම් වූ එකුන් විසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසි වෙනි පරිච්ඡේදය

1 දම්සෝ රජහට අටළොස් වන හවුරුදුයෙහි මහමෙවුනා උයන
2 මහ බෝ පිහිටියා ය. එයින් දොළොස් වන හවුරුදුයෙහි ඒ දම්සෝ
රජහුගේ මෙහෙසි වූ රත්නත්‍රය මාමක අසන්ධි මිත්‍රා නම් බිසව කළුරිය
3 කළා ඉදින් සතර වන හවුරුදුයෙහි දම්සෝ රජ තෙමේ විසම අදහස්
4 ඇති තිස්සාරක්ඛා නම් කුමරියක් බිසෝ බැව්හි තැබූයේ ය. ඉන් සතර
වන හවුරුදුයෙහි රුවින් මත් ඒ බාල බිසව "මේ රජ තෙමේ මටත් වඩා
5 මහා බෝධිය මමායනය කෙරෙ" යි කියා ක්‍රෝධ වසයට පැමිණ තමහට
අවැඩ කරන්නී මඩු කටු විස යෙදීමෙන් මහා බෝධිය මැරවී. ඉන්
6 සතර වන හවුරුදුයෙහි මහා යසස් ඇති දම්සෝ රජ තෙමේ අනිත්‍ය
බවට පැමිණියේ ය. මේ සත්තිස් හවුරුද්ද යි:

7 දහම් ගුණෙහි ඇළුණු දෙවන පෑතිස් රජ වනාහි මහ වෙහෙර
8 නවකම් ද, එසේම සෑගිරි ගල නවකම් ද, ථූපාරාමයෙහි නවකම් ද
සුදුසු පරිද්දෙන් නිමවා විචාරණ ලද්දහට ප්‍රත්‍යුත්තරයෙහි පණ්ඩිත වූ
9 දීප ප්‍රසාදක තෙරුන් විචාරන්නේ "වහන්ස! මම මෙහි බෝ විහාරයන්
කරවන්නෙමි. ඒ විහාර ථූපයන්හි තබනු පිණිස කෙසේ ධාතු ලබම් දැ
යි විචාළේ ය.

10 "මහ රජාණෙනි! සම්මා සම්බුදුන් පය පුරා සුමණ සාමණේරයන්
විසින් මෙහි ගෙණෙන ලද්දා වූ ධාතුහු සෑගිරියෙහි තැබුවෝ ඇත්තා
11 හ. ඇත් කඳ තබා ඒ ධාතුන් මෙහි වඩා එව" යි තෙරුන් විසින් වදාරන
12 ලදුයේ එසේම ධාතු වැඩූයේ යොදුනෙන් යොදුන් තැන්හි විහාර කරවා
13 ඒ දාගැබ්හි සුදුසු පරිද්දෙන් ධාතු නිධාන කරවී. බුදුන් විසින් වළඳනා
14 ලද පය වූ කලී යහපත් රාජ වස්තු ගෘහයෙහි තබා ගෙණ නානා
15 පූජායෙන් හැම කල් පිදූයේ ය. පන් සියයක් ඉසුරන් විසින් මහ තෙරහු
වෙත පැවිදිව විසූ තැන්හි කළ වෙහෙර "ඉසුරුමුනි" නම් විය. එසේම
16 පන් සියයක් වෛශ්‍යයන් විසින් තෙරහු වෙත පැවිදිව විසූ තැන කළ
වෙහෙර "වෙස්සගිරි" නම් විය. මිහිඳු මහතෙරුන් විසින් යම් යම්
17 ගුහාවෙක වසන ලද නම් පර්වත විහාරයන්හි ඒ ඒ ගුහා "මිහිඳු ගුහා"
නම් වී.

18 පළමු කොට මහ වෙහෙර ද දෙවෙනිව සෑගිරිය ද තුන් වැනි ව
ථූපය පෙරටු කොට ඇති යහපත් ථූපාරාමය ද සතර වැනිව මහ බෝ
පිහිටු විම ද පස් වැනිව මහ සෑතැන්හි සෑබිමට යහපත් ගල් ටැඹ
19 මොනවට පිහිටු වීම ද බුදුහු ග්‍රිව ධාතුව පිහිටු වීම ද සවෙනිව ඉසුරුමුනි
20 විහාරය පිහිටු වීම ද සත් වැනි තිසා වැව ද අට වැනිව පළමු සෑය ද
නව වැනිව වෙස්සග්ගිරි විහාරය ද මෙහෙණින් එාසු පිණිස රම්‍ය වූ

Non-Commercial Distribution

21 උපාසික වෙහෙර හා එසේම හත්ථාළ්හකය හා යන මේ මෙහෙණවර
දෙක ද හත්ථාළ්හක නම් මෙහෙණවර බැස භික්ෂු සංඝයා කැටිව
22 මෙහෙණින්නන්ට බත් ගන්නා පිණිස මනා උපහාර ඇති සියලු
23 උපකරණයෙන් යුත් එළඹ සිට පිරිවර ජනයා ඇති මහා පාළී නම්
24 බත්හල ද එසේම භික්ෂූන් දහසකට අවුරුදු පතා පිරිකර සහිත වූ උතුම්
25 පවාරණ දානය ද නාග දිවයින දඹකොළ වෙහෙර ද එම පටන්හිතිස්ස
26 මහා විහාරය ද පාචිනාරාමයද යන මේ කර්මාන්තයන් ලංකා වාසි
ජනයාට වැඩ කැමැත්තා වූ පින් පැණ ගුණ ඇති ලංකේන්ද්‍ර වූ ඒ
27 දෙවන පෑතිස් රජ තෙමේ පළමු වෙනි හවුරුදුයෙහිම කරවී, ගුණයෙහි
28 ප්‍රිය වූ ඒ රජ තෙමේ දිවි හිමියෙන් නොයෙක් පින්කම් කෙළේ ය. ඒ
රජහුගේ විජිත වූ මේ දිවයින පිනා ගියේ ය. ඒ රජ තෙමේ සම
සතළිස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ යි.

29 ඒ රජහු ඇවෑමෙන් උහු මල් "උත්තිය" යි ප්‍රසිද්ධ වූ රජ කුමර
30 අපුත්‍රක රාජ්‍යය මොනවට කරවී. ඒ මහා මහේන්ද්‍ර ස්ථවිර වනාහි
පර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ යන උතුම් වූ බුදු සස්න මොනවට ලක්දිව්හි
31 බබුළුවා ලංකාවට ප්‍රදීපයක් බඳු වූයේ මහා සමූහ ඇත්තේ ලක්දිව බුදුන්
වැනි වූයේ බොහෝ ලෝවැඩ කොට ඒ උත්තිය රජහුගේ
32 රාජ්‍යාභිෂේකයෙන් අට වැනි ජය වර්ෂයෙහි සැට වස් පිරුණු සේක්
වස්සාන මාසයන්හි සෑගිරියෙහි විසූ සේක. වෙසෙමින් වප් මස ශුක්ල
33 පක්ෂයෙහි අටවක් දවස් ද්වීප වර්ධනයට හේතු වූ මහේන්ද්‍ර ස්ථවිර
34 තෙමේ පිරිනිවන් පෑ සේක. අට වක් දවස්හි මහේන්ද්‍ර ස්ථවිරයන්
35 පිරිනිවි කරුණෙන් දවස ද "අටවකදා" යි සම්මත වී.

36 ඒ අසා උත්තිය රජ තෙමේ ශෝක නමැති හුලින් පහරණ ලදුයේ
37 සෑගිරි ගොස් තෙරුන් වැඳ නොයෙක් වර නොයෙක් පරිද්දෙන් හඬා
සුවඳ තෙල් පුරවන ලද රන් දෙණක මහා ස්ථවිර දේහය යුහුව තබා
මොනවට වසන ලද ඒ දෙණ අලංකෘත රුවන් කුළු ගෙයක්හි තබ්බවා
38 කුළු ගෙය ගෙන්වා ගෙණ සාධු ක්‍රීඩා කෙළවමින් ඒ ඒ දිගින් ආ මහත්
ජන සමූහයා හා කැටිව මහත් වූ භට සමූහයා ලවා පූජා විධාන කරවමින්
39 සැරහූ මඟින් නොයෙක් ආකාරයෙන් සරහන ලද නුවරට ගෙණවුත්
40 රාජ වීථීන්හි හසුරුවා මහ වෙහෙරට ගෙණවුත් මෙහි පැණඹ මළුවෙහි
41 කුළු ගෙය තබ්බවා සත් දිනක් ඒ සත් දිනක් ඒ මිහිපල් තෙමේ තොරන්
කොඩි මාලා හා ගන්ධ පූර්ණ සටයෙන් ද විහාරයත් අවට තුන්
42 යොදනකුත් රජහුගේ ආනුභාවයෙන් සරහන ලදුයේ විය. එසේම මුළු
43 ලක්දිව දෙවියන්ගේ ආනුභාවයෙන් සරසන ලදුයේ විය. ඒ මිහිපල්
44 තෙමේ සත් දවසක් මුළුල්ලෙහි නානාප්‍රකාර පූජා සත්කාර කරවා පූර්ව
45 දිශා භාගයෙහි තෙරුන්ගේ බද්ධමාලක නම් තැන සුවඳ දර සෑයක්
46 කරවා මහා සෑය ප්‍රදක්ෂිනා කෙරෙමින් මනරම් කුළු ගෙය එහි පමුණුවා

Non-Commercial Distribution

දර සෑයෙහි තබ්බවා අන්තිම සත්කාරය කෙළේ ය. ධාතූන් ගෙන්වා
මෙහි සෑයක් ද කරවී. ක්ෂත්‍රියතෙමේ ධාතු භාගයක් ගෙන්වා
47 සෑගිරිවෙහෙර ද සියලු විහාරයන් හි ද සෑ බැඳවී ඍෂිහුගේ ශරීරය
48 බැහූ එතැන් පටන් තැන අවකාශය ද බුහුමන් ඉසිභූමංගන නමැයි
කියන ලදි. එතැන් පටන් එය සිසාරා තුන් යොදුන් මානයෙහි කලුරිය
49 කළ ආයඝීයන්ගේ ශරීර ගෙණ ඒ පෙදෙස්හි දී දවනු ලැබේ.

එසේම මහත් අභිඥා ප්‍රඥා ඇති සංඝමිත්‍රා නම් මහා ස්ථවිර
50 තොමෝ සසුන් කිස ද බොහෝ වූ ලෝ වැඩ ද කොට එකුන් සැට වස්
51 ඇත්තී උත්තිය නම් එම රජහුගේ නව වෙනි බේම නම් හවුරුදුයෙහි
52 ඇතාළ නම් මෙහෙණවර වසන්නී පිරිනිවන් පෑවා ය. රජ තෙමේ ඒ
මෙහෙණින්ට ද තෙරුන්ට සෙයින් සත්දවසක් මුළුල්ලෙහි උතුම් වූ
පූජා සත්කාර කෙළේ යි. මහ තෙරණුවන්ට සෙයින් සකල ලංකාද්වීපය
53 අලංකාර කරණ ලද්දේ වී. කුළු ගෙයෙහි නඟන ලද තෙරණී සිරුර
සත් දවසක් ඇවෑමෙන් නුවරින් පිටත් කොට ථූපාරාමයට නැගෙණහිරින්
54 චිත්‍ර ශාලා සමීපයෙහි මහා බෝධි උපාශ්‍රයෙහි තෙරණී විසූ තැන ගිනි
55 කිසකරවි. ඒ උත්තිය මිහිපල් තෙම එහි සෑයකුදු කරවී.

56 මහේන්ද්‍ර ස්ථවිරාදී ඒ පස් මහ තෙරහු ද අරිට්ඨ ස්ථවිරාදිහු ද
එසේම නොයෙක් දහස් ගණන් භික්ෂූහු ද සංඝමිත්‍රාව ප්‍රධාන කොට
57 ඇති ඒ දොළොස් තෙරණීහු ද බොහෝ දහස් ගණන් රහත් භික්ෂුණීහු
දබොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාහු මහ පැණ ඇත්තාහු විනයාදි
58 බුද්ධාගම බබුළුවා සුදුසු කල අනිත්‍යතා වසඟයට ගියෝ යි. ඒ උත්තිය
රජ තෙමේ දස හවුරුද්දක් රජ කම් කෙළේ ය. මෙසේ මේ අනිත්‍යතා
59 තොමෝ සකල ලෝකය නසන්නීය.

අතිශයින් ලාභෙලා ක්‍රියා කරන්නා වූ ඉතා බල ඇති වළකා ලිය නොහෙන්නා වූ ඒ මේ අනිත්‍යතාව යම් මිනිසෙක් තෙමේ දක්නේ ම සසර ගමන්හි කල නොකිරේ ද කල කිරුණේ ත් පාප යෙන් තොර වීමත් පින් හා ඇල්මත් නොකෙරේ ද දනිමින් ම දූඩිසේ මුළා වේ යයි යන මෝ තොමෝ ඔහුගේ අධික මෝහ රාශියෙහි බල බවයි.

මෙතෙකින් හුදි ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස ථේර පරිනිබ්බාණ නම් විසි වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# විසිඑක් වෙනි පරිච්ඡේදය

1 ඒ උත්තිය රජු ඇවෑමෙන් ඔහු කිස්දොවුන් මල් මහා සිව රජ
සුදනන් සෙවුනේ දස හවුරුද්දක් රජය කෙළේ ය. ඒ රජ තෙමේ
2 භද්දසාල තෙරුන් කෙරේ පැහැද සිත් කලු වූ නගරංගන විහාරය කරවී.

3 මහා සිව රජු ඇවෑමෙන් උහු මල් සූරතිස්ස රජ තෙමේ කුසල
කරණයෙහි ගෞරව ඇත්තේ දස හවරුද්දක් රජය කෙළේ ය. ඒ රජ
4 දකුණු දිග නගරංගන නම් විහාරය කරවී. නැගෙණ ඉර ඇත් කඳ
5 විහාරය ද ගෝණගල ද වංගුත්තර පර්වතයෙහි නැගෙණහිරි පව් නම්
විහාරය ද එසේම රෙහෙණඅරමුණු සමීපයෙහි කොළඹාලක විහාරය ද
6 රිටිගල සමීපයෙහි ලංකාරාමය ද නැගෙණහිරි වලස් ගල ද නුවරට
උතුරින් ගිරිනිල්පනාකඩ ද පෘථිවීශ්වර තෙමේ මේ ආදි රම්‍ය වූ පන්
7 සියයක් විහාරයන් ලක්දිව ඒ ඒ තැන ගඟින් එතරත් මෙතරත් රජ
8 වීමෙන් පූර්වයෙහිත් පසුවත් සැට හවුරුද්දක් මුළුල්ලෙහි මොනවට
9 දැහැමින් කරවී. තුණුරුවන් කෙරෙහි ගෞරව ඇති ඒ තෙමේ
සුවර්ණපිණ්ඩතිස්ස යයි රාජ්‍යයෙන් පූර්වයෙහි දී නම් ඇති විය.
රාජ්‍යාභිෂේකයෙන් පසු ඒ රජහු නම "සූරතිස්ස" යයි වී.

10 මහත් බල ඇති සේනය, ගුත්තිකය යන අස් නැව් පුතුන්
11 දෙදෙනෙක් ඒ සූරතිස්ස රජහු ගෙණ දෙවිසි හවුරුද්දක් දැහැමෙන්
රාජ්‍යය කරවූය.

12 ඉක්බිති එක් කුස හොත් බෑයන් අතුරෙන් නව වැනි සහෝදර වූ
මුට සීව රජහු පුත් අසේල කුමර ඒ දෙදෙනා ගෙණ අනුරාධපුරයෙහි
දස හවුරුද්දක් රාජ්‍යය කරවී.

13 සෘජු ස්වභාව ඇති එළාර නම් දෙමළ තෙමේ රාජ්‍යය පිණිස
14 සොළී රටින් මෙහි අවුත් අසේල රජු අල්වා ගෙණ සතළිස් සතර
හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. රජ තෙමේ විනිශ්චය කාලයෙහි සතුරන්
කෙරෙහිත් මිතුරන් කෙරෙහිත් මධ්‍යස්ථව ඇඳ ඉස පසෙක ඉතා දික්
15 යොතකින් විනිශ්චය කැමැත්තවුන් විසින් හඬවනු පිණිස මිණියක්
16 එල්විය. ඒ රජහුගේ එක් පුතෙක් ද දුවක් ද වූහ. ඒ කුමර තෙමේ රථ
17 නැඟී තිසා වැවට යන්නේ මවු සමඟ මග හොත් ඉතා තරුණ වස්සෙකු
රියසකින් බෙල්ල ඇක්ම නොදැන මැරුයේ ය. ඒ දෙන තොමෝ කිපී
18 සිත් ඇත්තී ගොස් ඒ මිණී ගෙඩිය ගැසුවා රජ තෙමේ ඒ චක්‍රයෙන්ම
පුත්‍රයාගේ හිස සිඳවී.

Non-Commercial Distribution

19 තල් රුකෙක (කැදැල්ලෙක හුන්) ලිහිණි පැටියෙක් එක් සර්පයෙක්
කෑයේ ය. ඒ පැටියා ගේ මවු ලිහිණි තොම මිණිය ගැසුවා. රජ තෙම
20 ඒ සර්පයා ගෙන්වා උගේ බඩ පලා ඒ පැටියා බැහැර දමා තල් ගස
ඇණ ගැස්වී.

21 උතුම් තුනුරුවන්ගේ රතන බවත් එහි ගුණ සාර බවත් නො
දන්නා වූ රජ තෙමේ චාරිත්‍ර රක්ෂා කෙරෙමින් සෑගිරියට ගොස් භික්ෂු
22 සංඝයා පවරා එමින් රතයෙහි හුන්නේ රථයාගේ විය ගස කොණින්
23 බුදු සෑයෙක එක දෙසකින් බුන්නේ ය. අමාත්‍යයෝ තුමූ රජහට "
දේවයෙනි! අපගේ සෑය තෙමේ ඔබ විසින් බිඳිනා ලද" යි කිවුය. මේ
24 රජ තෙමේ නො දන කළ දෙයෙහිත් රථයෙන් බැස "චක්‍රයෙන් මාගේ
හිස ද සිඳවිය" යි මඟ හොත්තේ ය. "මහ රජාණෙනි! අපගේ ශාස්ත්‍ර
25 තෙමේ පර හිංසා නොකැමැති සේක. සෑය පියවි කොට කමා කර වුව
මැනව" යි ඔහුට කිවුය. හෙතෙම එහි හුනු පසළොසක් පමණ ගල්
26 (පියවි කොට) තමන්ම පසළොස් දහසක් කහවනු දුන්නේ ය.

27 එක් මැහැල්ලක් තොමෝ වී වේලන්ට අව්වෙහි දමුවා නොකල්
28 වැස්සෙක් වැස ඒ වී තෙමුයේ යි. ඕ තොමෝ වී ගෙණ ගොස් ඒ
මිණිය පහළා. ඒ අකල් වැස්ස අසා මැහැලි යවා "රජ තෙමේ දහම්හි
29 වැටෙන්නේ සුදුසු කල වර්ෂාව ලබාය" යි ඇයගේ බස විනිශ්චය කරනු
පිණිස පෙහෙව හොත්තේ ය. බිලියම් ගන්නා දේව පුත්‍ර රජහු තෙදින්
30 මඩනා ලද්දේ සතර වරම් මහ රජුන් වෙත ගොස් එපවත් දැන්විය. ඒ
දෙවියෝ උහු ගෙණ ගොස් ශක්‍රයාට දැක්වූහ. ශක්‍ර තෙමේ වස්ස
31 වලාහකයා කැඳවා කාල වර්ෂණය ආඥා කෙළේ ය. බිලියම් ගන්නා
දේව පුත්‍ර රජහට එපවත් දැන්විය. එවක් පටන් ඒ විජිතයෙහි දහවල්
32 වැසි නොවටුයේ ය. වර්ෂාව තෙමේ සතියෙක් සතියෙක් හි රෑ මැදියම
33 වැස්සේ ය. සෑම තන්හි කුඩා වළද (වැසි දියෙන් පිරුණේ ය.)

නොතසන ලද මිත්ථ්‍යාදෘෂ්ටි ඇත්තේ ද, මේ තෙමේ අගතිගාමී
34 දෝෂයෙන් මුක්ත පමණින් මෙවැනි මහිමයට පැමිණියේ ය. සම්‍යක්
දෘෂ්ටි ඇත්තා වූ මේ ලෝකයෙහි උපන් නුවණැති මිනිස් තෙමේ
අගතිගාමී දෝෂය කෙසේ නම් නොහරණේ ද?

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස එක්
විසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසි දෙවෙනි පරිච්ඡේදය

1 එළාර රජු මරවා දුටු ගැමුණු කුමර රජ වී. ඒ බව ප්‍රකාශ කරණ
2 පිණිස මෝ තොමෝ පිළිවෙළ කථායි :- දෙවන පෑතිස්ස රජහුගේ
3 දෙවෙනි සහෝදර වූ මහා නාග නම් වූ එම රජහට ප්‍රිය යුව රජ
කෙනෙක් වී. රජහුගේ බිසව් නැණ හීණ වූවා සිය පිත් හට රජය
4 කැමැත්තී නිරන්තරයෙන් යුව රජ මරනු පිණිස හටගත් කල්පනා ඇත්තී.
වලස් වැව කරවන එම යුව රජ හට විෂයෙන් යෙදූ අඹයක් අඹ මතුවෙහි
5 තබා යැව්වාය. ඒ බිසවුන් බාල පුත්‍ර තෙමේ යුව රජු හා ගියේ භාජනය
විවෘත කළ කෙණෙහිම ඒ අඹය කා මෙළේ ය.

6 යුව රජ තෙමේ එයින්ම ඇතොවුරන් හා බල වාහන සමග සිය
7 දේහය රක්නට රුහුණ බලා ගියේ ය. ඒ යුව රජ ගැබ් ගත් මෙහෙසි
8 තොම යටාල වෙහෙර දී පිතෙකු වැදූවා යුව රජ පුතුට බෑයා නම්
කෙලේ ය. ඉක්බිති ඒ ක්ෂත්‍රිය තෙමේ රුහුණු ගොස් මුළු රුහුණු රට
9 ඊශ්වර වූයේ මහත් සම්පත් ඇතිව මාගම්හි මහා විහාරය කරවීය. උඬු
කඳුරු අදී වූ තවත් බොහෝ විහාර ද කරවී.

10 එසේම ඒ මහානාග රජු ඇවෑමෙන් උහු පිත් යටාල තිස්ස තෙමේ
රජය කෙළේ ය. එසේම උහු පිත් අභය තෙමේ ද රජය කෙළේ ය.
11 ගොඨාභය පිත් කාවන්තිස්ස යයි ප්‍රසිද්ධ වූ ක්ෂත්‍රිය තෙමේ පිය රජු
ඇවෑමෙන් එහි රජය කෙළේ ය.

12 ශ්‍රද්ධා ඇති ඒ රජහට කැළණි රජහුගේ දූ වූ විහාර දේවි නම් වූ
13 ශ්‍රද්ධා සම්පන්න කුමරියක් මෙහේසිකා විය. කල්‍යාණි නගරයෙහි රජ
වූ තිස්ස නම් ක්ෂත්‍රියයෙක් වී. ආයාී උත්තිය නම් ඇති ඒ කුමර
14 දේවිය හා සංයෝගයෙන් හට ගන්වන ලද කෝප ඇත්තේ භයින්
එතැනින් පලා ගොස් අන් තැනෙක විසීය. එයින් ඒ පෙදෙස ඒ නම්
15 විය. ඒ ආයාී උත්තිය තෙමේ දේවියට රහස් ලියමන් දී මහණ වෙස්
16 ගත් මිනිසෙක් යැවීය. ඒ තෙමේ රජ ගෙදොර සිටියේ ය. රජ ගෙහි
17 සැමදා වලඳන රහත් තෙරණුවන් හා අප්‍රසිද්ධයේ රජ ගෙට වන්නේ ය,
තෙරුන් හා ආහාර ගෙණ රජු හා පිටත් වන කල දේවිය බලාහින්ද දී
18 ලියුම් පත බිම හෙළිය. ඒ ශබ්දයෙන් රජ තෙමේ පෙරලා බලමින් ඒ
ලියුම් හස්න දූන තෙරුන්ට කිපියා වූ මුග්ධ මනස් ඇත්තේ ඒ තෙරුන්
19 හා මිනිසා ක්‍රෝධයෙන් මරවා මුහුද දූම්ම විය. එයින් දෙවියෝ කිපී ඒ
රට මුහුදෙන් යට කළෝ ය. එයින් ඒ රජ තෙමේ මනා රූ ඇති යහපත්
20 ආචාර ඇති දේවී නම් සිය දියනියන් රන් සැලෙක හිඳුවා එහි රජ දුව

Non-Commercial Distribution

21 යයි ලියා සමුදුරම යුහුව යැවූයේ යි. මුහුද බහා ලන ලද ඒ සැළ එයින්
22 ගොස් රුහුණු රට ලංකා විහාරයෙහි ගොඩ බටුයේ ය. ඒ කුමරිය
23 කාවන්තිස් රජ තෙමේ මෙහෙසි බැව්හි අභිෂේක කෙළේ යි. එහෙයින්
(විහාර යනු උප පද නම් වී. විහාර මහා දේවි යයි නම් වී.)

24 තිස්ස මහා විහාරය එසේම සිතුල් පව්ව, ගම්ට්ඨාවාලීය, කුටාලිය
යන මේ ආදී වූ විහාරයන් කරවා තුනු රුවන් කෙරෙහි මනා පහන්
සිතින් ඒ රජ තෙමේ හැම කල් සංඝයාට සිවුපසයෙන් උපස්ථාන කෙලේ
ය.

25 එකල්හි කොටගල නම් විහාරයෙහි ශීලයෙන් ව්‍රතයෙන් යුක්ත
වූ හැම කල් නානාප්‍රකාර පින්කම් කරන්නා වූ සාමණේර කෙනෙක්
26 විසූයේ ය. ඒ තෙමේ අහස් සැමිදුලට සුව සේ නැගෙනු පිණිස හිණි
තුණක් හා ගල් ලැහැලි ද තැබූයේ ය. පැන් දන් දුන්නේ ය. සංඝයාට
27 වත් ද කෙළේ ය. හැම කල්හි ක්ලාන්ත වූ දේහ ඇති ඔහුට මහත්
ආබාධයෙක් විය. කෙළෙහි ගුණ දන්නා භික්ෂුහු සිවි ගෙයකින් උහු
28 ගෙණවුත් තිස්සාරාම යෙහි සිලාපස්ස පිරිවෙන්හි තබා ගෙණ උපස්ථාන
29 කළෝයි. ඒ විහාර දේවී තොම සංහුන්නා මොනවට සකස් කළ රජ
30 ගෙහි පෙර බත සංඝයාට මහ දන් දී පසු බත ගඳමල් හා බෙහෙත් ද
31 පිළී ද ගෙන්වා ගෙණ ආරාමයට ගියා සුදුසු පරිද්දෙන් සත්කාර කළාය.
එකල්හි ඒ බිසව් පෙර සේ දන් දී සංඝ ස්ථවිරයන් වෙත හිඳ ගත්තා ය.
32 ස්ථවිර තෙමේ ඒ බිසවට දහම් දෙසමින් මේ වදාළ සේක. "මේ මහා
සම්පත් තොමෝ පින්කමින් ලබන ලද්දීය. දුනුදු පින්කම්හි තොප විසින්
අප්‍රමාදවම කට යුත්තේය".

33 මෙසේ වදාළ කල්හි ඕ තොමෝ "මෙහි මේ තෙමේ කවර
සම්පත්තියෙක් ද යම් බඳු වූ අපට දරුවෝ නැත්තාහු නම් ඒ කාරණයෙන්
34 අපගේ සම්පත් වඳය" යි කීවාය. ෂට්අභිඥා ඇති මහ ස්ථවිර තෙමේ
පුත්‍ර ලාභය බලා දේවිනි ඒ ගිලන් හෙරණහු දකිවා" යි වදාළ සේක. ඒ
35 බිසව් ගොස් මරණාසන්න වූ ඒ හෙරණුන්දැට "මාගේ පුත් බැව් පැතුව
මැනව, අපගේ සම්පත් මහත්ය" යිකීවාය. නොකැමැත්තේ යයි දැන
36 ඒ තෙරණුන් දැ සඳහා මහත් වූ යහපත් මල් පූජාවක් කරනා මනා
පැණ ඇත්තී නැවතත් යාච්ඥා කළා ය. මෙසේ ද නොකැමැත්තා වූ
37 හෙරණහු පිණිස උපායෙහි පණ්ඩිත වූ ඒ බිසව් නොයෙක් බෙහෙත් හා
වස්ත්‍රයන් සංඝයා විෂයෙහි දන් දී නැවතත් ඒ හෙරණු යාච්ඥා කළා
ය.

Non-Commercial Distribution

38 ඒ තෙමේ රජ කුලය පැතුයේ ය. ඕ තොමෝ එතැන නොයෙක්
39 පරිද්දෙන් අලංකාර කරවා වැඳ යානාවට නැගී ගියා ය. සාමණේර
40 තෙමේ එයින් චුතව යන්නා වූ ඒ දේවිය කුස පිළිසිඳ ගත්තේ ය. ඒ දැන
ඕ තොමෝ නැවැත්තා ය. ඒ හස්න රජ හට දන්වා රජු හා පෙරලා
ගියා ය. ඒ දෙන්නාම හෙරණහුගේ ශරීරයට කටයුතු වූ ආදාහනදිය
41 කරවා සන්සුන් සිත් ඇත්තෝ ඒ පිරිවෙන්හිම වසන්නාහු හැම කල්හි
භික්ෂු සංඝයාහට මහ දන් දුන්නෝ යි. මහ පින් ඇති ඒ දේවියට
42 මෙබඳු දොළෙක් ඇති වී. ගොණෙකු පමණ මීයක් ඉද්දර තබා ගෙණ
තොමෝ දකුණැලයෙන් යහපත් සයනයක හොත්තී දොළොස් දහසක්
43 භික්ෂූන්ට දන් දී ශේෂ වූ මී වළඳනු කැමැතියහ. වැලි එළාල රජහුගේ
44 යෝධයන් අතුරෙන් ශ්‍රේෂ්ඨයාගේ හිස් සුන් කඩුව දෙවූ පැන් එම සුන්
හිසෙහි හිඳගෙණ බීපියත්ටත් අනුරාධපුරයෙහිම උපුල් කෙතින් ගෙණෙන
45 ලද්දා වූ නොමැලවුණ මල්වඩමක් පළඳින්ටත් කැමැතිවී. දේවී තොම
රජහුට එපවත් කීවා. රජ තෙමේ නෛමිත්තකයන් විචාළේ ය. ඒ
46 අසා නෛමිත්තිකයෝ "දේවියගේ පුත්‍ර තෙමේ දෙමළුන් මරා ලක්දිව
47 එක් සේසත් කොට ශාසනය බබුළු වන්නේය" යි කිවුය. යමෙක් තෙමේ
48 මෙබඳු මී ගුළාවක් දක්වන්නේ නම් උහුට රජ තෙමේ මෙබඳු සම්පත්
දෙන්නේ යයි මිහිපල් තෙමේ ම ප්‍රසිද්ධ කරවී.

49 ගොළු මුහුද වෙරළ සමීපයෙහි මී පිර වූ මුනින් නමා පියන ලද
ඔරුවක් දැන දනව් වැසි මිනිසෙක් රජහට කීයේ ය. එජ තෙමේ
50 දේවිය එහි පමුණුවා මොනවට සකස් කළ මඬුවෙක්හි (හිඳුවා) රිසි
පරිද්දෙන් ඒ බිසව් ලවා මී වැලඳ වී.

51 රජ තෙමේ ඒ බිසවුන් ඉතිරි දොළ සපයන්ට වේළුසුමන නම්
52 යෝධයා මෙහෙයි. ඒ තෙමේ අනුරාපුර ගොස් එහි රජු මඟුලසුගේ
අස් ගොව්වා සමග මිතුරුව හැම කල ඔහුගේ කෘත්‍යය ද කෙළේ ය. ඒ
53 අස්ගොව් යහළු බැව් දැන පෙරවරුම උපුල් මල් හා කඩුව කොළොම්
හෝ තෙර තබා සැක නැත්තේ අසු ගෙණ ගොස් උහු පිට නැගී
54 උපුල්මල් හා කඩුව ගෙණ මම කාවන්තිස් රජු වේළුසුමන යෙමි.
සමර්ථ වූයේ මා අල්වා ගණිවයි තමා දන්වා අශ්ව වේගයෙන් පලා
55 ගියේ ය. (එළාල රජ ඒ අසා උහු ගන්ට මහා යෝධයා මෙහෙයි ඒ
56 තෙමේ දෙවෙනි අශ්ව යායි සම්මත අසු නැගී ඔහු ලුහුබැන්දේ ය. ඒ
වේළුසුමන තෙමේ ළැහැබක් ඇසුරු කෙළේ අසු පිටම හිඳගෙණ
පිටුපසින් එන්නා වූ උහුට කඩුව හැද දික් කෙළේ ය. අශ්ව වේගයෙන්
57 යන්නහුගේ හිස සිදිණ. අසුන් දෙන්නා ද ඉස ද ගෙණ ඒ තෙමේ

Non-Commercial Distribution

සවස් වේලෙහි මාගමට එළඹීයේ ය. දේවී තොම ඒ දොළද රිසි සේ
58 වැලඳුව. රජ තෙමේ යෝධයාට සුදුසු පරිද්දෙන් සත්කාර කෙළේ ය.

59 ඒ බිසව් සුදුසු කළ පින්වත් උතුම් පුතෙකු වැදුවා. රජ කුලෙහි
මහත් ආනන්දය ද විය. ඒ කුමරහු පුණ්‍යානුභාවයෙන් එදවස් නානා
60 රත්නයන්ගෙන් සම්පූර්ණ නැව් සතෙක් ඒ ඒ රටින් අවුය. එම කුමරහු
පින් තෙදින් ඇතෙක් තෙමේ ඡද්දන්ත කුලයෙන් ඇත් පැටවෙකු
61 ගෙණවුත් මෙහි තබා පලා ගියේ ය. තොට විල් තෙර පඳුරු අතුරෙහි
සිටියා වූ ඒ ඇත් පැටවා දැක කණ්ඩුල නම් බිලිවැදි රජහට දැන්වීය.
62 එකෙණෙහි රජ තෙමේ ඇතුන් බඳනවුන් යවා ඒ ඇත් පැටවා ගෙන්වා
63 පෝෂණය කරවී. කණ්ඩුල නම් තැනැත්තහු විසින් දුටු හෙයින් ඒ ඇත්
කණ්ඩුල නම් වී.

64 රන් බඳුන් ආදීන් පිරුණා වූ නැව් මෙහි ආවාහ යි රජහට
65 දැන්වීය. රජ තෙමේ ඒ ගෙන්වා ගත්තේයි. කුමරහට නම් තබන
66 මඟුල්හි රජ තෙමේ දොළොස් දහසක් භික්ෂු සංඝයාට ආරාධනා කෙළේ
ය. "මෙසේ ඉදින් මා පිත් මුළු ලක්දිව් තෙලෙහි රජය ගෙණ බුදු සසුන්
67 බබුළු වන්නේ නම් අටතුරා දහසක් භික්ෂූහු ම ප්‍රවිෂ්ට වෙත්වා. ඒ
සියල්ලෝ උඩුකුරු කොට ගත් පාත්‍රා ඇතිව සිවුරු පොරවත්වා. පළමු
68 කොට දකුණු පය එළිපතින් ඇතුලු කොට තබත්වා, එක් කුඩයකින්
යුත් ධබරාව බැහැර ලත්වා, ගොතම නම් ස්ථවිර තෙමේ ද පුතු
69 පිළිගනීවා. උන් වහන්සේම තිසරණ පන්සිල් දෙන සේක්වා" යි සිතුයේය.
70 සියල්ල එසේ විය. සියලු නිමිති දැක තුටු සිත් ඇති මිහිපල් තෙමේ
සංඝයාට කිරිබත් දන් දී පුතුට නම් තබන්නේ මාගම්හි ප්‍රධාන බව ද
71 සිය පියහු නම ද යන දෙක එක් කොට ගාමිණී අභය කියා නම්
තැබුයේ ය.

72 එයින් නව වන දවස් මාගම්හි ගොස් දේවිය හා සංගමය කෙළේ
ය. ඒ බිසව් ඉන් ගැබ් ගත්තීය. සුදුසු කල උපන් කුමරහු රජ තෙමේ
73 තිස්ස නම් කෙළේ ය. දරු දෙදෙනා මහ පෙරහරින් වැඩුණෝ ය.
දෙන්නාටම බත් කවන මඟුල් දවස්හි ස්නේහ ඇත්තේ පන් සියයක්
74 භික්ෂූන්ට කිරිබත් දන් දෙවා උන් වහන්සේලා විසින් අඩක් වැලඳූ කල
ඉන් සුඟ සුඟ ඉල්වා ගෙණ රන් තැටියක ලා මිහිපල් තෙමේ දේවිය
75 සමග දරුවෙනි, ඉදින් තෙපි සම්මා සම්බුදුන් සස්න හරිව් නම් තොපගේ
76 කුස ගත මේ ආහාරය නොදිරාව" යි ඔවුන්ට දෙවීය. ඒ රජ කුමරුවෝ
දෙදෙන කී අර්ථය දැන තුටු සිත් ඇත්තෝ ඒ කිරිබත අමෘතයක් සේ
77 වැලඳූය.

Non-Commercial Distribution

78 ඒ කුමරුවන් දස දොළොස් හැවිරිදි කළ විමසනු කැමැත්තා වූ
රජ තෙමේ යට කී පරිද්දෙන් භික්ෂූන් වලඳවා උන්වහන්සේ සේලාගේ
79 ඉඳුල් බත තැටියකින් ගෙන්වා ඒ කුමරුවන් වෙත තබ්බවා තුන් භාගයක්
කරවා "දරුවෙනි! අප කුල දේවි භික්ෂූන්ට අපි කල කිරුණෝ
80 නොවන්නෙමුය" යි සිතා භාගය අනුභව කරව්" යයි ද තොපි දෙබෑයෝ
81 හැම කල්හ උනුන් අද්‍රෝහවන්නෙමුය" යි සිතා මේ භාගය අනුභව
82 කරව් ය යි ද මේ කීයේ ය. දෙන්නාම ඒ භාගද්වය අමාවක් සේ
83 අනුභව කොළෝය. "දෙමළුන් හා යුද්ධ නොකරන්නෙමුය" යි (සිතා)
මේ අනුභව කරව් යයි මෙසේ කී කල ඒ තිස්ස කුමර ආහාරය අතින්
84 දැමීය. ගැමුණු කුමාර තෙමේ බත් පිඬ දමා ඇඳට ගියේ අත් පා
හකුළුවා ගෙණ ඇඳෙහි වැතිර ගත්තේ ය. දේවිය ගොස් ගැමුණු කුමරු
කුමාර තෙමේ බත් පිඬ දමා ඇඳට ගියේ අත් පා හකුළුවා ඇඳෙහි
85 වැතිර ගත්තේ ය. දේවිය ගොස් ගැමුණු කුමරු සතුටු කෙරෙමින්
දරුව අත් පා හෙළා ඇඳෙහි සැප සේ කුමකින් නොනිදයි දෑ යි මෙසේ
86 කීවා. ඒ තෙමේ "ගඟින් එතර දෙමළුය, මේ දිගින් මහා ගොළුමුහුදය,
මම කෙසේ නම් ප්‍රසාරිතාංග ප්‍රත්‍යංග ඇතිව නිදම්දෑ යි කීයේ ය. ඒ
කුමරහු අභිප්‍රාය අසා මිහිපල් තෙමේ තුෂ්නිම්භූත විය. ඒ කුමර ක්‍රමයෙන්
87 වැඩෙන්නේ පින් යශස් ධෛර්‍ය ඇතිව තේජස් බල පරාක්‍රමයෙන්
යුක්තව සොළොස් ඇවිරිදි විය.

88 සත්ත්වයෝ තුමු සංසාර ගතිය ඉතා චංචල කලහි හිත්පින් කරණ
කොට ගෙණ රුචි පරිද්දෙන් (මනුෂ්‍යාදි) ගතියකට එළඹ ගණිති,
නුවණැත්තේ මෙසේ මෙ බව දැන කුසල් රැස් කිරීමෙහි මහත් ආදර
හෝ ගෞරව ඇති වන්නේ ය

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස ගාමණී කුමාර ප්‍රසූති නම් වූ දෙවිසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසිතුන් වෙනි පරිච්ඡේදය

1 ඒ කඩොලැත් තෙමේ බල ලක්ෂණ රුවින් හා තේජස් ජව
2 ගුණයෙන් ද අග්‍ර වූයේ මහා කඳ ඇති විය. ඒ ගැමුණු කුමරහට
නන්දිමිත්‍රය, සූරනිමිලය, මහාසොණය, ගෝඨයිම්බරය, ථේර පුත්තාභය,
3 භරණය, වේළුසුමණය, එසේම ඛංජදේව, ඵුස්සදේවය, ලභියවසභ යයි
යන මහා බල ඇති මේ දස මහා යෝධයෝ ඇති වූහු.

4 එළාල රජුහුගේ මිත්‍ර නම් සෙනෙවියෙක් ඇත්තේය. නැගෙණහිරි
කඩ රොද (නම් රට) ඒ සෙනෙවියා කර්මාන්ත ගම්හි සිත් පව් සමීපයෙහි
5 බුදුණනියන් පිතෙක් වී, (ඒ තෙමේ) කොසාහිත වත්ථගුය්හ ඇත්තේ
6 මයිල්හු නම් ඇති වී දුරද බඩ ගා යන ඉතා ළදරු ඒ කුමරහු කටියෙහි
7 වරපටින් බැඳ ඇඹරුම් ගල බැන්දොයි. ඔහු ඇඹරුම් ග ල ඇදගෙණ
බිම බඩ ගා යන කල එළිපත ඇක්මීමෙහිදී යම් හෙයකින් වරපට බිඳේද
8 එහෙයින් නන්දිමිත්‍ර යයි ප්‍රසිද්ධ වී ඇතුන් දස දෙනකුගේ බල ඇත්තේ
9 ද වී, ඒ තෙමේ වැඩුණේ නුවරට අවුත් මයිල්හු උපස්ථාන කෙළේය.
එකල සෑ ආදියෙහි අසත්කාර කරණ දෙමළුන් (දැක) ශක්ති සම්පන්න
ඒ තෙමේ එක් පයකින් කලවය පාගා හස්තයෙන් ඉදිරි කලවය
10 ගෙණ දෙපළු කොට බැහැර ලයි, ඔහු විසින් දමන ලද සිරුරු
11 දෙවියෝ අතුරුදහන් කරති. දෙමළුන් අඩු බැව් දැක රජහට එපවත්
දැන්වූහ. "ස්වකීය යෝධයෝ මොහු ගණිවිය" යි රාජ නියෝග ලද්දාහු
12 එසේ කරන්නට නොහැකි වූහ. ඒ නන්දි මිත්‍ර තෙමේ "මා මෙසේ
කරද්දීත් හුදෙක් ජනක්ෂය මුත් ශාසනය බැබළීමක් නැත්තේය. රුහුණු
13 රට තුනුරුවන්හි ප්‍රසන්න රජ දරුවෝ වෙසෙති. එහි ගොස් රාජ
සේවය කොට සියළු දෙමළුන් ගෙණ ඒ ක්ෂත්‍රිය යන්ට රාජ්‍යය දී බුදු
14 සසුන් බබුළුවන්නෙමි"යි සිතීය. මේ අභිප්‍රායෙන් ගොස් ගැමුණු කුමරහට
එපවත් ඇස්වීය. ඒ ගැමුණු කුමර තෙමේ මැතියන් හා මන්ත්‍රණය
15 කොට උහුට සත්කාර කෙළේය. එසේ සත්කාර කරණ ලද නන්දිමිත්‍ර
යෝධ තෙමේ කුමරු වෙත විසීය.

16 කාවන්තිස් රජ දෙමළුන් වළකන පිණිස මහ ගඟ සියලු තොට
17 හැම කල්හි ආරක්ෂා කරවී. රජහුගේ අන් බිසවක පුත් දීඝාභය නම්
කුමරෙක් වී, ගංගායෙහි කසා තොට උහු ලවා ආරක්ෂා කරවී. ඒ
18 තෙමේ ආරක්ෂා පිණිස හාත්පස දෙයොදුනෙක් හි (තැන) මහ කුලයකින්
19 එක එක පුතෙකු බැගින් එහි (කඳවුරට) ගෙන්වීය. කොටවා දනව්වෙහි
කඩවිටි නම් පුතුන් සත් දෙනෙක් ඇති සංඝ නම් වූ ප්‍රධාන කුලපතියෙක්
20 විය. රජ කුමර පුතෙකු ගෙන්වනු කැමැත්තේ ඔහු වෙත ද දූතයෙක්

Non-Commercial Distribution

21 යැවීය. නිමල නම් සත් වැනි පුත්‍ර තෙමේ ඇතුන් දස දෙනෙකුගේ බල
ඇත්තේයි. උහු අකර්මශීලී හෙයින් බෑයෝ සදෙනාම හෙළා දක්නාහු
ඔහුගේ ගමන් කැමැති වූහ. මවුපියෝ එසේ කැමැති නුවූහ. නිර්මල
22 තෙමේ සෙසු බෑයන්ට කිපී ඉතා උදයම තුන් යොදුන් මග ගෙවා හිරු
23 නැගෙණ කලම රජ කුමර දිටි. ඒ තෙමේ ඔහු විමසනු සඳහා දුර
24 කටයුත්තෙක යෙදුයේය. "සෑගිරි ගල වෙත දොරමඬලා නම් ගම මා
යහළු කුණ්ඩල නම් බමුණෙක් වෙසෙයි. උහු වෙත මුහුදු එතර (කපුරු
සඳුන් ආදී බඩු) ඇත්තාහ. තෝ ගොස් උහු විසින් දෙන ලද්දා වූ බඩු
25 මෙහි ගෙණ එව"යි මෙසේ කියා බත් කවා ලියුමක් දී යැවී, මේ අනුරා
26 පුරය තෙමේ ඒ (කසා තොටින්) නව යොදුන් මත්තෙහිය. ඒ තෙමේ
27 පෙරවරුම ගොස් බමුණා දිටි, බමුණා "දරුව, වැව නහා එව"යි කීය.
28 මෙහි පෙර නා බැවින් තිසා වැව නහා මහා බෝධිය ද ථූපාරාමයෙහි
චෛත්‍යය ද පුදා සියලු පුරය දක්නට නුවරටත් වැද සල්පිලින් සුගන්ධ
29 ද්‍රව්‍ය ගෙණ එහි උතුරු දොරින් නික්ම උපුල් කෙතින් උපුල් මල් ද
30 ගෙණ ඒ බමුණා වෙත එළඹියේය. බමුණා විසින් විචාරණ ලද්දා වූ ඒ
තෙමේ තමා ගමන් කීය. ඒ බමුණු තෙමේ උහුගේ පළමු ඊමත් මෙහි
31 ඊමත් අසා විස්මිත වූයේ "මේ තෙමේ පුරුෂ ජානීය යෙක; ඉදින් එළාල
රජ දතහොත් මොහු අත්පත් කොට ගන්නේය. එහෙයින් මේ තෙමේ
32 දෙමළුන් සමීපයෙහි වස් වන්නට නුසුදුස්සේය, රජ පිත් පියහු වෙත
33 වාසය සුදුසුය"යි මෙසේ සිතීය. මෙසේ ලියා ලියුම ඔහුට දී පූර්ණවර්ධන
නම් වස්ත්‍ර ද (මහඟු පිළි) බොහෝ පඬුරුද දී ඔහු බත් කවා මිතුරු
34 කුමරු වෙත යැවූයේය. ඒ තෙමේ සවස් මානයෙහි රජ කුමරු වෙත
ගොස් ලියුම ද පඬුරු ද රජ කුමරහට දිනි. තුටු වූ ඒ තෙමේ "දහසකින්
35 මොහු සතුටු කරව්"යි කීයේය. රජ කුමරහුගේ ඉතිරි සේවකයෝ උහුට
36 ඊර්ෂ්‍යා කළෝය. ඒ කුමර දස දහසකින් ඒ නිමිලයා සතුටු කරවී. ඔහු
37 කෙසේ ලියවා ගඟම නහවා පූර්ණ වර්ධන වස්ත්‍ර යුග්මයක් ද මනා
38 ගඳමල් (දී) දුහුල් පටකින් හිස වෙළවා (කුමරු) වෙත එලවූහ. කුමාර
39 තෙමේම තමා පෙරහරින් ඔහුට බත් දෙවී. තමාගේ දස දහසක් අගනා
යහපත් ඇඳ ඒ යෝධයාට සැතපෙනු පිණිස දෙවිය. ඒ තෙමේ සියල්ල
40 එක් කොට ගෙණ මවුපියන් කරා ගෙණ ගොස් මෑනියන්ට දස දහස ද
41 පියාණන්ට ඇඳ ද දිනි. එම රෑ අවුදින් රක්ෂා ස්ථානයෙහි තමා දැක්වී.
42 උදෑසන රජ කුමර ඒ අසා සතුටු සිත් ඇතිව ඔහුට වස්ත්‍රාභරණා දිය ද
43 එසේම පරිවාර ජනයා ද දස දහසක් දී පිය රජු වෙත යැවූයේ ය.
යෝධ තෙමේ දස දහස මවු පියන් වෙත ගෙණ ගොස් උන්ට දී
කාවන්තිස් රජු වෙත එළඹයේයි. ඒ රජ ගැමුණු කුමරුට උහු භාර
කෙළේ ය. සත්කාර කරණලද සුරනිමිල යෝධ තෙමේ ඒ කුමරු වෙත
44 විසූයේ ය.

Non-Commercial Distribution

45 කුළුම්බරි කර්ණිකායෙහි හුන්දිරිවාපි නම් ගම තිස්ස නම්
46 (කෙළඹියාට) සොණ නම් අට වැනි පුතෙක් විය. සත් හැවිරිදි කල ඒ
තෙමේ තල් පැල ඉදිරි දස හැවිරිදි කල මහත් බල ඇත්තේ තල් ගස්
47 ඉදිරිය. කල් යාමෙන් ඒ මහා සොන තෙමේ දස ඇත් බල ඇතිවී. රජ
තෙමේ එබඳු වූ ඔහු අසා පියා වෙතින් ගෙණ පෝෂණය කරනු
48 කැමැත්තෙත් ගැමුණු කුමරහට දුන්නේය. ඉන් පසු ලබන ලද සත්කාර
ඇති ඒ යෝධ තෙමේ ගැමුණු කුමරු වෙත විසීය.

49 ගිරි නම් දනව්වෙහි නිසෙල්විටි නම් ගම මහා නාග නම්
50 තැනැත්තහුගේ පිත් දස ඇත් බල ඇතියෙක් විය. මිටි සිරුරු ඇති
බැවින් ගොඨක නම් වී. දෙටු සබෑයෝ ඔහුට කෙළිසිනා කරන්නාහ.
51 ඔවුහු ගොස් උඳු වපුරණ පිණිස මහ වනය කොටා උහුගේ භාගය තබා
ගොස් උහුට දූන්වූහ. ඒ තෙමේ එකෙණෙහිම ගොස් ඉඹුරු නම් ගස්
52 උදුරා බිම සම කොට ගොස් දූන්වීය. බෑයෝ ගොස් උහුගේ ඒ අරුම
53 ක්‍රියාව දැක ඔහුගේ කර්මකීර්තනය කෙරෙමින් උහු වෙත ගොස් දූන්වූශ
54 ඒ නිමිත්ත කොට ගෙණ ඒ තෙමේ ගොඨයිම්බර නම් වීය. රජ තෙමේ
උහු ද යටකී පරිද්දෙන් ගැමුණු කුමරු වෙත යැවීය.

55 කොටගල් අසල කත්ති නම් ගම්හි ඊශ්වර වූ රෝහණ නම්
56 ගෘහපතියෙක් වූයේ තමහට දාව උපන් පුතෙක් ගොළු අබා රජහට
සමාන නම් කෙළේ ය. ඒ දරු තෙමේ බල ඇත්තේ වී එකල්හි ඒ
57 තෙමේ දස දොළොස් හැවිරිදි වූයේ සතර පස් දෙනෙකුන් විසින් නඟා
58 ගත නොහෙන ගල් ක්‍රීඩා ගුලයන් සේ කෙළීමින් දැමීය. සොළොස්
59 ඇවිරිදි ඔහුට පිය තෙමේ සොළොස් රියන් දිග් වට අට තිස් අඟුල් ඇති
ගදාවක් කරවී. ඒ තෙමේ එයින් තල් පොල් කඳ පැහැර බිම හෙළා
60 එයින් ඒ යෝධ තෙමේ ප්‍රකට වී එසේම රජ තෙමේ උහු ද ගැමුණු
කුමර වෙත යැවීය. ඔහු පිය තෙමේ වනාහි මහා සුම්ම ස්ථවිරයන්ගේ
උපස්ථායකයි. ඒ කෙළෙඹි තෙමේ මහා සුම්ම ස්ථවිරයන්ගෙන් බණ
61 අසා කොටගල් වෙහෙර දී සෝවාන් ඵලයට පැමිණියේ ය. හටගත්
62 සසර කලකිරීම් ඇති ඒ තෙමේ රජුට කියා සම්පත් පුතුට දී තෙරහු
63 වෙත පැවිදි විය. භාවනාවෙහි යෙදී රහත් බවට පැමිණියේ ය. ඒ
හේතුවින් මේ තෙරුන් පුත්‍ර තෙමේ "ථෙරපුත්තාභය" යි ප්‍රසිද්ධ වී.

64 කප් කඳුරු නම් ගම්හි කුමාරයාගේ භරණ නම් පුතෙක් විය ඒ
65 තෙමේ කල් යාමෙන් දස දොළොස් අහැවිරිදි වූයේ ගම් දරුවන් හා
වනයට ගොස් බොහෝ සාවුන් ලුහුබැඳ පයින් පැහැර දෙකඩ කොට
66 බිම ගැසිය. සොළොස් හැවිරිදි වූයේ නවාහි ගම් වැස්සන් හා වලට

Non-Commercial Distribution

ගොස් එසේම මුවන් ගෝණුන් ඌරන් වහා හෙළිය. භරණ නම් ඒ මහ
67 යෝධ තෙමේ එයින්ම ප්‍රකට විය. රජ තෙමේ ඔහු ද යටකී පරිද්දෙන්
ගැමුණු කුමරු වෙත වැස් වී.

68 ගිරි නම් දනව්වෙහි කුටුම්බියංගන නම් ගම එහි ප්‍රසිද්ධ වූ
කුටිම්බිසවඟ නම් කෙළෙඹියෙක් වී දනව් වැසි වේල නම් වූ ද ගිරි නම්
69 රට අනුභව කරන්නා වූ සුමනනම් වූ ද යහළුවෝ දෙදෙනෙක් වූහ.
කෙළඹියා හට පුතෙක් උපන් කල පඬුරු පෙරටු කොට දෙදෙනා ගොස්
70 තමන් නම දරුවහට කළෝ ය. ගිරි භෝජක තෙමේ ඒ පුතු තමා ගෙහි
වැස්වීය. ඔහුගේ එක් සෛන්ධවයෙක් කිසි පුරුෂයෙක් පිට නැගෙන්ට
71 නුදුන්නේ ය. ඒ අස් තෙම වේළුසුමනයා දැක ම මේ තෙමේ මට සුදුසු
වූ අසරුය යි සිතා සන්තුෂ්ට වූයේ හෙසාරව කෙළේ ය. ඒ දැන ගිරි
72 භෝජන තෙමේ අසු නැගෙව යි ඔහුට කීය. වේළුසුමනයා අසු නැඟී
73 ඒ අසු මණ්ඩලයෙහි වහා මෙහෙයී. ඒ අස් සකල මණ්ඩලයෙහි ඒකාබද්ධ
74 වූ සේ පෙණිනි දුවන්නා වූ ද මේ අසුපිට පුරුෂ වළල්ක් සේ හුන්නේ
75 ය. සැලකිලි නැත්තේ උතුරු සළුව මුදයි, නැවත බඳියි. ඒ දැක සියලු
පිරිස ඔල්වර හඬ ගැසූය. ඒ ගිරි භෝජක තෙමේ උහුට දස දහසක් දී
76 "මේ තෙමේ රජහට සුදුසු" යි සතුටු වූයේ රජහට දුන්නේ ය. රජ
තෙමේ උහුට සත්කාර කරවා වෙළුසුමන බුහුමන් කෙරෙමින් තමන්
වෙතම වැස්වී.

77 නකුගල් කර්ණිකායෙහි මහේන්ද්‍ර ද්‍රෝණි නම් ගම අභය නම්
තැනැත්තෙහුගේ අන්තිම පුත්‍ර වූ ශක්ති සම්පන්න දේව නම් තැනැත්තක්
78 වී. මඳක් කොර ගසා යන බැවින් බංජ දේව යයි උහු දත්තු ය. එකල්හි
79 ඒ මානව තෙමේ ගම් වැස්සන් හා මුව දඩ ගොස් මහත් උස් උස් මීවුන්
80 ලුහුබැඳ අතින් උන් පා අල්වා ගෙණ ඉසවට සිසාරා බිම පැහැර උන්
81 ඇට පොඩි කෙරෙයි. මීපල් තෙමේ එපුවත් අසාම බංජදේවයා ගෙන්වා
ගෙණ ගැමුණු කුමරු වෙත රැඳවී.

82 සිතුල් පව් වෙත කපිට්ඨ නම් ගම අත්පල නම් තැනැත්ත හුගේ
83 ඵුස්සදේව යයි නම් ඇති පුතෙක් විය. ඒ කුමාර තෙමේ ගම් දරුවන්
හා විහාරයට ගොස් බෝධියට පුදන ලද සකක් ගෙණ තරයේ පිඹපීය.
84 එහි ශබ්දය අසනිපාත රාව සෙයින් මහත් විය. ඒ සියලු ගම් දරුවෝ
85 බිය වැද උමතු වූවන් සෙයින් වූහ. ඒ තෙමේ ඒ හේතුවින් උන්මාද
ඵුස්ස යයි ප්‍රසිද්ධ විය. ඔහුගේ පිය තෙමේ වංශයෙහි පැවත ආ
86 ධනුශ්ශිල්පය ඉගැන්වී. ඒ තෙමේ ශබ්දානු සාරයෙන් විදින සුළු වූයේ
87 විදුලි එළියෙන් විදින සුළු වූයේ ද (කරබටු ආදි කිසි ලකුණකින්) රෝම්

Non-Commercial Distribution

88 විඳින සුළු වූයේ ද වී. වැලි පිරුණු ගැලෙක එසේම බැඳි සම් සියල් පට
ය. අටඟුල් පියා ලැහැල්ල සොළසාඟුල් දිඹුල් ලැහැල්ල එසේම දෑඟුල්
යපට සතරඟුල් ලොහොපට හීයෙන් විදිනේ යි. හීය ද එකී දෑ විනිවිද
යවයි. ගොඩ අට ඉස්ඹක් යෙයි. දියෙහි ඉස්ඹක් යෙයි. මහ රජ
89 එපවත් අසා ඔහු ද පියහු වෙතින් ගෙන්වා ගෙණ ගැමුණු කුමරු වෙත
වැස්වීය.

90 තුලාධාර පර්වත සමීපයෙහි වෙහෙරවැගම මත්ත නම්
කෙළෙඹියා පුත් වසභ නම් ඇත්තෙක් විය. මොනවට හටගත් ශරීර
91 ඇති බැවින් උහු ලභිය වසභ යයි දත්තු ය. හේ තෙමේ විසි වස්
පමණෙහි මහත් කාය ශක්ති ඇත්තේ වී. කෙතෙක් කැමැති මහත් බල
92 ඇති ඒ තෙමේ මහ වැවක් කරන්නේ මිනිසුන් කීප දෙනෙක්ම ගෙණ ඒ
වැව පටන් ගත්තේ ය. දස දොළොස් දෙනෙකුන් විසින් ඉසිලිය යුතු
93 මහත් පාංශු පිණ්ඩ යන් උසුලන්නා වූ ඒ තෙමේ වහාම වැව කොට
94 නිමවී. ඒ කරුණෙන් ඒ තෙමේ ප්‍රකට වීය. රජ තෙමේ ඔහු ද ගෙන්වා
ගෙණ ඔහුට සත්කාර දීගැමුණු කුමරු වෙත වැස්වීය. ඒ කෙත "වසභ
95 අමුණැ" යි ප්‍රකට විය. ඒ ලභිය වසභ තෙමේ ගැමුණු කුමරු වෙත
විසීය.

96 එකල් මිහිපල් තෙමේ මේ දස මහ යෝධයන්ට පුතු සම සත්කාර
97 කරවී. දික්පති රජ තෙමේ මහා යෝධයන් දස දෙනා කැඳවා "තෙපි
එක එකා යෝධයන් දස දස දෙනා සොයව්" යි කීයේ ය. ඔවුහු එසේම
98 යෝධයන් ගෙණාවෝ ය. නැවතත් මිහිපල් තෙමේ ඒ යෝධයන් සියයටත්
99 එසේම යෝධයන් පරියේෂණය පිණිස කීෂය් ය. ඒ යෝධයන් දහසටත්
100 එසේම පරියේෂණයට ගියේ ය. එසේ ඔහු ද යෝධයන් ගෙණ අවුය.
කැටි කරණ ලද ඒ සියලු යෝධයෝ එකොළොස් දහස් එක් සිය දස
101 දෙනෙකි. ඒ සියල්ලෝ මීපල්හු වෙතින් හැස කල තබන ලද සත්කාර
ඇත්තෝ ගැමුණු රජ පිත් පිරිවරා විසූ හ. සුව කැමැති ප්‍රඥා මිනිස්
102 තෙමේ අද්භූත සුචරිත පරම්පරාව මෙසේ අසා අකුශල මාර්ගයෙන්
පරාංමුඛ වූයේ හැම කල් කුසල් මග ඇලෙන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස
යෝධලාභ නම් තෙවිසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසිහතර වෙනි පරිච්ඡේදය

1 හස්ති ශිල්ප, අශ්ව ශිල්ප, කඩු ශිල්ප යන මෙහි දක්ෂ වූ කරණ
ලද අභ්‍යාස ඇති ගැමුණු කුමර තෙමේ එකල මාගම්හි විසීය. රජ
2 තෙමේ සැපයුණු බල වාහන ඇති තිස්ස කුමරයා ජනපදය රක්නා
පිණිස දිගා වැව් හි වැස්වීය. ගැමුණු කුමර තෙමේ හැකි වූ කාලයෙහි
3 ශක්තිය හෝ බල සෙන් දක්නේ "දෙමළුන් හා යුධ කරන්නෙමි" පිය
රජහට කථා කරවී. රජ තෙම ඔහු රක්නේ "ගඟින් මෙතෙර පමණ ය"
4 යි වැලකුයේ ය. ගැමුණු කුමර තුන් වර තෙක් එසේම කථා
5 කරවී, "පින්වත්නි, මපිය තමේ පිරිමි වෙමින් මෙසේ නොකියන්නේමය,
එහෙයින් මේ පලදිව් "යි රජහට ස්ත්‍රී ආභරණ යැවී ය.

6 රජ තෙමේ ඔහුට කිපී "රන් හැකිල්ලක් තනව්. එයින් උහු
බඳින්නෙමි. අනික් පරිද්දෙකින් ඒ තෙමේ රැක්ක හැක්කේ නොවෙ "
7 යි කීයේ ය. පිය රජහට කිපී පලා ගොස් කඳු රටට ගියේ ය. පියාණන්
කෙරෙහි දුෂ්ට වූ බැවින් ම ඔහුට දුට්ඨ ගාමිණී යයි කීහු.

8 ඉක්බිති රජ තෙමේ මහා නුග්ගල චෛත්‍යය කරන්ට ආරම්භ
කෙළේ ය. සෑය නිමි කල මිහිපල් තෙමේ සංඝයා රැස් කෙළේ යි.
9 සිතුල් පව්වෙන් භික්ෂූන් දොළොස් දහසක් වැඩියෝ ය. ඒ ඒ
දිගින් තවත් දොළොස් දහසක් වැඩියෝ ය. චෛත්‍ය පූජාව කොට
10 එකල සංඝයා සම්මුඛයෙහි සියලු යෝධයන් රැස් කරවා සපථ කරවී.
"කුමරුවන් උතුන්ගේ කලහ ස්ථානයට අපි නොයම්" හ යි සියල්ලෝ
11 දිව්ළෝ ය. එහෙයින් ඒ යුද්ධයට ඔවුහු නොගියෝ යි.

12 ඒ මිහිපල් තෙමේ විහාරයන් සූසැටක් කරවා එතෙක් අවුරුදු
එහි වැස පසුව කලුරිය කෙළේ ය. රාජිනිය තොමෝ පිළිසන් යානාවකින්
13 රජහු සිරුර ගෙන්වා ගෙණ තිස්ස මහා රාමයට පමුණුවා එපවත්
සංඝයාට දැන්වීය. තිස්ස කුමාර තෙමේ එපවත් අසා දිගා වැවින්
14 ගොස් පියහුගේ ශරීරයට කටයුතු ආදාහනාදිය තෙමේ සකසා කරවා
මෑණියන් ද කඩොලැතු ද ගෙණ මහත් බල ඇත්තේ බෑයාට භයින්
15 එතැනින් වහා දිගා වැවට ගියේ ය. එපවත් දන්වන්ට සියලු ඇමතියෝ
16 රැස්ව ලියමන් දී දුටුගැමුණු කුමරු වෙත දූතයන් යැවූහ. ඒ තෙමේ
17 ගුත්තලට අවුත් තිස්ස කුමරු වෙත චරයන් යවා මාගම් එළඹ තමන්
18 රාජ්‍යයෙහි අභිෂේක කෙළේ ය. මෑණියන් පිණිසත් කඩොලැතු පිණිසත්
බෑයාට ලියුම් යැවී ය. තුන් යල දක්වා නො ලැබ යුධ පිණිස උහු බලා
19 එළඹියේ ය. චූලංගනිය පිටියෙහි දෙදෙනාගේ මහත් යුද්ධයෙක් විය.

Non-Commercial Distribution

20 ඒ යුදෙහි දී රජහුගේ නොයෙක් දහස් ගණන් මිනිස්සු වැටුණෝ ය.
රජ තෙමේ ද තිස්සාමාත්‍ය ද දීඝථූනිකා නම් වෙළඹ ද යන තුන් දෙනා
21 පමණක් පලා ගියෝ ය. කුමාර තෙමේ උන් ලුහුබැඳ ගියේ ය. දෙපක්ෂය
අතුරෙහි භික්ෂූහූ සංඝයාගේ ක්‍රියාවෙකැයි දැන නැවැත්තේ ය.

22 ඒ රජ තෙමේ කප්කඳුරු හොය ජීවමාලි තොටට එළඹීයේ තිස්ස
23 නම් ඇමතියාහට "අපි සාපිපාසා ඇත්තමෝ ය" යි කීයේ ය. ඒ ඇමැති
තෙමේ රජු පිණිස රන් තැටියෙහි තුබූ බත් බැහැර කෙළේ ය. සංඝයා
24 විෂයෙහි දන් දී අනුභව කරණ හෙයින් සතර කොටස් කරවා "කාල
25 ඝෝෂා කරව "යි කීයේ ය. තිස්ස තෙමේ කාල ඝෝෂා කෙළේ ය.
රජහට ශික්ෂා දුන් ස්ථවිර තෙමේ පුවඟු දිවයින වසන සේක්, (ඒ
ශබ්දය) දිව කනින් අසා කෙළෙඹි පුත් තිස්ස තෙරුන් එහි නියෝග
26 කළ සේක. උන්වහන්සේ අහසින් එහි වැඩි සේක. තිස්ස ඇමැති
27 තෙමේ උන්වහන්සේ අතින් පාත්‍රය ගෙණ රජහට දුන්නේ ය. රජ
තෙමේ සංඝයාගේ භාගයත් ස්වකීය භාගයත් පාත්‍රයෙහි බහා ලූයේය.
තිස්ස තෙමේ ස්වකීය බාගයත් පාත්‍රයෙහි බහාලී ය. වෙළඹත් සිය
28 කොටස නොකැමැති විය. තිස්ස තෙමේ ඇයගේ බාගයත් පයෙහි
බහාලීය. රජ තෙමේ බතින් පිරූ පය තෙරුන්ට දුන්නේ ය. උන්
වහන්සේ වහා අහසින් වැඩ ගෝතම නම් තෙරුන්ට දුන් සේක.

29 ස්ථවිර තෙමේ වළඳන පන් සියයක් භික්ෂූන් වහන්සේලාට
ආලෝප වශයෙන් බෙදා දී උන්වහන්සේලා වෙතින් ලැබූ කොටසින්
පාත්‍රයක් පුරවා රජු පිණිස අහස දැමූ සේක. තිස්ස තෙමේ ආකාස ගත
30 ඒ දැක ඇරගෙණ රජු වැළඳ වීය. තෙමේත් කා වෙළඹටත් කැවීය.
31 සන්නාහය සුඹුලු කොට රජ තෙමේ පාත්‍රය යැවීය.

32 ඒ තෙමේ මාගම් ගොස් සැට දහසක් බල සෙන් ගෙණ මලු හා
නැවත යුද පිණිස ගොස් යුධ කෙළේ ය. රජ තෙමේ වෙළඹ පිට ද
33 තිස්ස කුමර කඬොලැතු පිට ද නැඟී සම්මුඛ වූහ. එකල්හි දෙබෑයෝ
යුධ කරන්නාහු යුද්ධයෙහි දී රජ තෙමේ ඇතු ඇතුළු කොට වෙළඹ
34 මඬුල්ලක් කෙලේ ය. එසේ ද අවසර නොදැක පන්වන්ට සිතී ය.
35 වෙළඹ ඇතු මත්තෙන් පන්නවා සහෝදරයාගේ මස්තකයෙන් පිට
36 සන්නාහය කැපෙන පරිද්දෙන් තෝමරය දැමීය. ඒ යුද්ධයෙහි
කුමාරයාගේ නොයෙක් දහස් ගණන් මිනිස්සු යුද කෙරෙමින් වැටුණෝය.
37 (උහුගේ) මහත් බලය ද බිඳුනේය. "ඇතරුවා විකල බැවින් ස්ත්‍රිය මා
38 මතුයෙන් පැන්න වී යයි කිපුණු ඇත් තෙම ඔහු පාලනය කෙරෙමින්
එක් රුකක් වෙතට ගියේය. කුමර රුකට නැංගේය, ඇත් තෙමේ

Non-Commercial Distribution

39 හිමියා වෙත ගියේය. ගැමුණු රජ ඇතු නැඟී පලා යන කුමරහු ලුහු
40 බැන්දේය. ඒ කුමර විහාරයකට වැද මහ තෙරුන් ගෙට වන්නේය.
41 කුමාර තෙම බෑයාට භයින් යට හැඳ වැදහොත් තේය. මහා ස්ථවිර
42 තෙම ඒ ඇඳ සිවුර ඇතුළ සේක. රජ තෙමේ පසු පස්සෙහි
ගොස් "තිස්සයා කොහිදැ"යි විචාළේය. "මහරජාණෙනි, ඇඳෙහි නැතැ"යි
ස්ථවිර තෙම රජහට කීයේය. මිහිපල් තෙමේ යට හැඳ යයි දැන එයින්
පිටත්ව වෙහෙර සිසාරා මුර තැබීය. ඒ කුමරහු වනාහි කුරු ඇඳෙක
43 හොවා මත්තෙහි සිවුරෙකින් වසා ළදරු භික්ෂූහු සතර දෙනෙක් ඇඳ
කකුල් අල්වා ගෙණ මළ භික්ෂු කෙනෙකු මෙන් බැහැර ලූය. මිහිපල්
44 තෙමේ ඒ ගෙණ යනු ලබන්නහු හැඳින "තිස්සය තෝ කුල දේවතාවන්
ඉස හිඳ ගෙණ යනු නොලබ, කුල දෙවියන් අතින් මාගේ පැහැර
45 ගැන්මක් නැත්තේය. තෝ කොයි දවසත් කුල දෙවියන් ගුණ සිහිකරව"යි
මෙසේ කීයේය.

46 මිහිපල් තෙමේ එතැනින් මාගමට ගියේය. මෑනියන් කෙරෙහි
ගෞරව ඇත්තේ එහි දී මෑනියන් කැඳවා ගත්තේය. ධර්මයෙහි පිහිටි
47 සිත් ඇති ඒ ගැමුණු රජ අට සැට වසක් වෙස මින් අට සැට වෙහෙරක්
කරවී.

48 භික්ෂූන් විසින් නික්මවන ලද ඒ තිස්ස රජකුමර වනාහි
49 අන්‍යතරයෙකු සේ එතනින්ම දිගා වැවි ගියේය. ඒ කුමාර තෙමේ
යෝධ ගත්ත තිස්ස තෙරුන්ට "ස්වාමීණි ! මම අපරාධ සහිත යෙමි.
50 බෑයා කමා කරවන්නෙමැ"යි කීයේය. වතාවත් කරන්නෙකුගේ වේස
ඇති තිස්ස කුමරු ද භික්ෂූන් පන්සියයක් ද ගෙණ ඒ ස්ථවිර තෙමේ
51 රජු කරා එළඹියේය. ඒ ස්ථවිර තෙමේ රජ කුමරහු හිණි හිස සිටුවා
52 සංඝයා සමග රජ ගෙට වන් සේක. සැදැහැති මිහිපත් තෙමේ වඩා
හිඳුවා කැඳ ආදිය එල වූයේය. ඒ ස්ථවිර තෙම පාත්‍රය වැසූසේක.
53 කිමෙක්දැයි විචාළ කල "තිස්ස කුමරහු ගෙණ ආම්හ"යි කි සේක. සොර
තෙම කොහිදැයි විචාරණ ලදුයේ සිටිතැන් දැන් වූ සේක. විහාර දේවී
ගොස් පුතු මුව කොට සිටියාය. රජ තෙමේ "නුඹ වහන්සේ ලා විසින්
54 අපගේ දාසභාවය දැන් දන්නා ලද්දේ ය. ඉදින් නුඹ වහන්සේලා සත්
55 හැවිරිදි සාමණේර කෙණෙක් එව්වාහු නම් ජනක්ෂයෙන් තොරව අපගේ
කලහයෙක් නොවන්නේය"යි තෙරුන්ට කීයේය. ඒ රජ තෙමේ "මේ
සංඝයාගේ දෝසයි ද සංඝ තෙමේ දඬුවම් කරන්නේ යයි ද නුඹ
56 වහන්සේලා වැඩියා වූ කෘත්‍යය සිද්ධ වන්නේ යයි කැඳ ආදිය පිළිගත
57 මැනවැ"යි ද කියා භික්ෂූ සංඝයාට දන් දී මලු කැඳවා එහිම සඟ මැද
හුන්නේ මලු හා එක්ව මේ තිමවා භික්ෂු සංඝයා යැවීය. ගොයම්

Non-Commercial Distribution

59 කරවනු පිණිස තිස්ස කුමර ඒ දිගා වැ මඩුල්ලටම යැවූයේය. තෙමේත් බෙර පියවි කරවා සස්කම් කරවී.

මෙසේ නානා ප්‍රකාරයෙන් රැස් කරණ ලද්දා වූ බොහෝ වූ ද වෛරය සත් පුරුෂයෝ තිමති. නුවණැති කවර නම් මිනිසෙක් මෙසේ සිතා අනුන් කෙරෙහි සත්සුන් සිත් ඇත්තේ නොවන්නේද වන්නේමැයි

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස වෛභාතික යුද්ධ නම් සූවිසි වන අදියර තිමි.

Non-Commercial Distribution

# විසි පස්වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති දුටුගැමුණු රජ ජනයා සංග්‍රහ කොට ගෙණ කුන්ත යෙහි
ධාතු නිදන් කරවා යාන වාහන හා බල සෙන් ඇතිව තිස්සමහාරාමයට
2 ගොස් සංඝයා වැඳ "ශාසනය බබුළු වන්ට මම ගඟ එතෙර යන්නෙමි.
සත්කාර කරණු පිණිස අප කැටිව යන්ට භික්ෂූන් දුන මැනව, භික්ෂූන්ගේ
3 දර්ශනය අපට මඟුල් ද ආරක්ෂා ද වන්නේය"යි කීයේය. සංඝ තෙමේ
4 දඬුවම් පිණිස භික්ෂූන් පන් සියයක් දුන්නේය. මිහිපල් තෙමේ ඒ
භික්ෂු සංඝයා ගෙණ එයින් පිටත්ව මලය රට සිට මෙහි අනුරාපුර එන
5 මාර්ගය සුද්ධ කරවා කඩොලැතු නැඟි යෝධයන් විසින් පිරිවරණ ලදුයේ
මහත් බල සෙන් හා යුද පිණිස නික්ම ගත්තේය. මාගම පටන් ගුත්තල
6 දක්වා කඩ නැති සේනා තොමෝ ආය.

7 මියුගුණට අවුත් ඡත්‍ර නම් දෙමළා අල්වා ගත්තේය. එහි දෙමළුන්
8 මරා ගඟා නමැති පරිඛාවෙන් යුක්ත වූ අඹ තොටට අවුත් තිත්ථම්බ
නම් වූ මහත් බල ඇති කෘතහස්ත වූ දෙමළා යුද්ධ කෙරෙහින් සාර
මසෙකින් මෑනියන් දක්වා ඒ උපායෙන් අල්වා ගත්තේය. එයින් බෑය
9 මහත් බල ඇති දෙමළ සත්රජ කෙනෙක් එක දවසින්ම අල්වාගෙණ
10 නිර්භය කොට මහත් බල ඇත්තේ බල සේනාවට වස්තු දුන්නේය.
11 එහෙයින් (එහි) ආරාමය තෙමේ "ඛේමාරාමය"යි කියනු ලැබේ.
අතුරුහෙබ මාකොටු නම් දෙමළා ද ද්‍රෝණ නම් ගම ගවර නම් දෙමළා
ද හල්කොළ නම් ගම ඉසුරු නම් දෙමළා ද නැළිහෙබ නාළික නම්
12 දෙමළා ද අල්වා ගත්තේය. දික්අබාගල දික්අබා නම් දෙමළා ද අල්වා
ගත්තේය. කස්තොට කපිසීය නම් දෙමළා සාර මසෙකින් අල්වා
13 ගත්තේය. කෝට නුවර කෝට නම් දෙමළා ද ඊට ඉක්බිති හාලවහානක
14 නම් දෙමළා ද වහිට්ඨ නම් තැන එනම් දෙමළා ද ගැමුණු ගම ගැමුණු
නම් දෙමළා ද කුඹගම කුඹ නම් දෙමළා ද තඹගම තඹ නම් වූය, උන්න
15 නම් ගම එනම් වූය යන මයිල් ලෑන දෙමළුන් දෙන්නාය යන මෙතෙක්
දෙන අල්වා ගත්තේය. ජම්බු නම් ගම එනම් දෙමළා ද අල්වා ගත්තේය.
ඒ ඒ ගමත් ඒ ඒ ප්‍රධානීන්ගේ නම් සමාන වූය.

16 "සිය සෙන් නොහැඳින ස්වකීය ජනයෝම නසත්" යයි අසා
මිහිපල් තෙමේ එහිදී "මාගේ මේ ව්‍යායාම තෙමේ කිසි කළෙකත් රජ
17 සැප පිණිස නොවන්නේය. මාගේ මේ උත්සාහය බුද්ධ ශාසනයාගේ
18 පිහිටවීම පිණිසමැයි. ඒ සත්‍යය කරණ කොට ගෙණ මාගේ සේනා
19 කායභාණ්ඩයන් ගිති දූල්වන් වේවා"යි සත්‍ය ක්‍රියා කෙළේය. එකල්හි
ඒ එසේම විය. ගංතෙර විසූ මරණ ලදින් ඉතිරි සියලු දෙමළු ආරක්ෂා

Non-Commercial Distribution

20 පිණිස විජිත නම් නුවරට වන්හුය. ඵාසු වූ සමතලා තැනෙක කඳවුර
පිහිට වී, එතැන කඳයුරු පිටි යයි නමින් පතළ වී.

21 විජිත නුවර ගන්නා පිණිස විමසන්නා වූ නර නායක එන්නා වූ
22 නන්දි මිත්‍රයා දක කඩොලැතු යැවීය. නන්දිමිත්‍ර තෙමේ තමා අල්වන්ට
ආ ඒ ඇතු දෙයතින් දෙදළ පෙළා අල්වා උක්කුටුකයෙන් හිඳවී. ඒ
23 නන්දිමිත්‍ර තෙමේ යම් හෙයකින් යම් තැනෙකයි යුද කෙළේ නම් ඒ
හේතුවින් එහි කළ ගම "හත්ථිපෝර" යයි කියනු ලැබේ.

24 රජ තෙමේ දෙන්නාම විමසා විජිත නුවර බලා ගියේය. දකුණු
25 දොර දී යෝධයන් බිහිසුනු සංග්‍රාමයෙක් විය. නැගෙනහිරි දොර ප්‍රසිද්ධ
වේළුසුමණ තෙමේ අසු නැංගේ බොහෝ ගණන් දෙමළුන් මැරීය. දෙමළු
26 දොර වැසූහ. රජ තෙමේ යෝධයන් යැවීය. දකුණු දොර කඩොලැතුය,
27 නන්දිමිත්‍රය, සූර නිමිලය යන මොවුන් හා මහා සෝණය, ගොඨය,
ථෙරපුත්තා භය යන ඒ තුන් දෙනා ඉතිරි චාරත්‍රයෙහි යුද්ධ කළෝය.
28 ඒ නුවර වනාහි පරිඛාත්‍රයක් ද උස් වූ පව්රු තොරන්ය ලොහොකම්
කළ දොරය (යන මෙයින්) සතුරන් විසින් බිඳ හෙළීය. හැක්කේ නොවේ.
29 ඒ ඇත් තෙමේ දෙදණින් හිඳ දෙදළින් ගල් සුණු ගඩොල් බිඳ යදොරට
30 පැමිණියේය. තොරණ හුන් දෙමළු අනෙක ප්‍රකාර ආයුධයන් ද කකියා
31 ගිය ලොහො ගුළි ද එසේම කකාළ මැලියම් ද දමූය. පිට ලූ ලහටු
දුමන කල කඩොලැත් තෙමේ දුවමින් වෙදනාවෙන් මිරිකුණේ උදක
ස්ථානයට ගොස් එහි ගිලිණි.

32 ගොඨයිම්බර තෙමේ "මේ තට සුරා පාන නොවෙයි, යදොර
33 හැරීමය. යව දොර බිඳුව"යි මෙසේ කීය. ඒ උතුම් ඇත් තෙමේ මත්
උපදවා කුංචනාද කොට දියෙන් ගොඩ නැගී එඩි ඇතිව ගොඩ සිට
34 ගත්තේය. ඇත් වෙද තෙමේ ලහටු ග ලවා බෙහෙත් කෙළේය. රජ
තෙමේ ඒ ඇතු නැගි අතින් කුම්භස්ථලය පිරිමැද "දරුව කණ්ඩුලය!
35 මුළු ලක්දිව රජය තට දෙන්නෙ මි"යි ඒ ඇතු තුටු කරවා වර බොජුන්
කවා සළුවෙන් වෙළා මනා සන්නාහ ලවා සන්නාහ මතුයෙහි සත්
36 ගුණ කළ මීසම් බඳවා ඊමත්තෙහි තෙල් සම් එලවා ඒ ඇතු මෙහෙයි.
ඒ ඇත් තෙමේ සෙන හඬ මෙන් ගුගුරමින් උපද්‍රවයන් ඉවසමින් ගොස්
37 දෙදළින් ලැහැලි බින්දේ ය. එළිපත පයින් පහළේ ය. දොරබා සහිත
38 ඒ යදොර ගුගුරා ගෙණ බිම හිණි. තොරණෙහි ද්‍රව්‍ය සම්භාරය ඇතු
39 පිට හෙන්නා දක නන්දිමිත්‍ර තෙමේ බාහුයෙන් පෙරලා දමීය, කඩොලැත්
40 තෙමේ ඔහුගේ ක්‍රියාව දක තුටු සිත් ඇත්තේ පළමු කරණ ලද දළ
41 පෙළීම් වෛරය හළුයේ ය. කඬුල නම් උතුම් ඇත් තෙමේ තමා
42 පිටින්ම නුවරට වදනා පිණිස නැවතී සිට යෝධයා දෙස බැලීය. "ඇතු

Non-Commercial Distribution

42 කළ මගින් මම නො වදනෙමැ" යි සිතා නන්දිමිත්‍ර තෙමේ බාහුයෙන්
43 ප්‍රාකාරයට ගැසීය. අටළොස් රියන් උස් ඒ පවුර අට ඉස්බක් දුර
වැටුනේ ය. සුරනිමිලයා දෙස බැලිය. ඒ තෙමේ ද ඒ මග
44 නොකැමැත්තේ පවුර පැන නුවර ඇතුළත හිණි. ගොඨයිම්බරයා හා
සෝණ තෙමේ ද එකි එකී දොර බිඳ ඇතුල් වූහ. ඇත් තෙමේ රිය
45 සකක් ද, නන්දමිත්‍ර ගැලත්තක් ද, ගොඨයිම්බර නෙරළු තුරක් ද නිමි
තෙමේ උතුම් කඩුවක් ද මහා සෝන තෙමේ තල් රුකක් ද, ථේර
46 පුත්තාභය තෙමේ මහා යගදාවක් ද ගෙණ වෙන් වෙන්ව ම විථී වූවාහු
එහි දෙමළුන් සුණු කළෝ ය.

47 රජ තෙමේ සාර මසකින් විජිත නුවර බිඳ එයින් ගිරිල නම්
48 නුවර ගොස් ගිරිල නම් දෙමළා මැරී ය. එතැනින් මහා පරිබාත්‍රයක්
• ඇත්තා වූ හිගුරු වැලින් හාත්පසින් වෙළන ලද්දා වූ එක් දොරටුවක්
49 ඇති වදනට දුෂ්කර වූ මහේල නුවරට ගොස් සාර මසක් එහි වෙසෙමින්
රජ තෙමේ මන්ත්‍ර යුද්ධයෙන් මහේල නම් දෙමළා අල්වා ගත්තේ ය.
50 එතනින් අනුරාධ පුරය එන්නා වූ මහිපල් තෙමේ කසාගලින් ඔබ කඳවුරු
51 පිහිට වී, පොසොන් මස්හි ඒ (ප්‍රද්‍යොත) නම් වැව කරවා එහි දිය
කෙළියේ යි. එතැන කළ නුවර පෝසෝන නගර නම් වේ. ඒ දුටු
52 ගැමුණු රජු යුධ පිණිස ද ආ බැව් අසා එළාර රජ තෙමේ ඇමැතියන් රැ
ස් කරවා. "ඒ රජ තෙමේත් යෝධය, ඔහුගේ යෝධයෝත් බොහෝල
53 ඇමැතියනි ! කුමක් කටයුතු ද? අපගේ මේ පිරිස කුමක් සිතත්ද"යි
54 කියේ ය. එළාර රජහුගේ දීඝජන්තු ආදී වූ යෝධයෝ "සෙට යුද්ධ
කරන්නෝමය" යි මෙසේ නිශ්චය කළෝ ය.

55 දුටුගැමුණු රජ තෙමේත් මැණියන් හා මන්ත්‍රණය කොට ගෙන
ඒ බිසවුන් උපායෙන් දෙතිස් බල කොටුවක් කරවී. එහි රජච්ඡත්‍ර ධරන්නා
56 වූ (දෙතිස්) රජ රුවක් තැබුයේ ය. මිහිපල් තෙමේ අභ්‍යන්තර කොටුවෙක
57 සිටගත. එළාල රජ තෙමේ යුද්ධයට සැරසුණේ මහා පර්වත නම් ඇතු
නැඟී යාන වාහන හා බල සෙන් සමග එහි ගියේ ය. යුද්ධ පවත්තා
58 කල භයංකර වූ මහත් බල ඇති දීඝජන්තු තෙමේ කඩුපලඟ ගෙන යුධ
කෙරෙමින් අටළොස් රියන් පමණ අහසට පැන ඒ රජ රුව කඩුවෙන්
59 පැහැර පළමු බලකොටුව බින්දේ ය. මහත් බල ඇත්තේ එසේම සෙසු
60 බල කොටු ද බිඳ ගැමුණු රජ සිටි බල කොටුව බලා ගියේ ය.

61 ඒ සුරනිමල යෝධ තෙමේ මහා බල ඇත්තේ රජු ඇත්තේ රජු
62 ඉදිරියට යන්නා වූ ඔහුට තමන් නම අස්වා ආක්‍රොශ කෙළේ ය. දීඝජන්තු
තෙමේ කිපියේ උහු මරන්නෙමැ යි අහසට නැංගේය. සුර නිමිල තෙමේ
බස්නා හට පලඟ එලවී. දිඝජන්තු තෙමේ පලඟ සහිත ඹොහු කපමැයි

Non-Commercial Distribution

63 සිතා කඩුවෙන් පලඟ පහලේ ය.  නිමිල තෙමේ පලඟ හර බිම වැතිර
64 ගත්තේ ය. දීඝ ජන්තු තෙමේ හළ පලඟ පහරමින් එහි හිණි. සුරනිමල
65 තෙමේ (නැගිට) වැටුනහු කඩුවෙක් පහළේ ය. (දෙපලු කොට කැපීය.)
ඵුස්ස දේවයා සක පිම්බේ ය. දෙමළ සෙන් බිඳිණි. එළාල රජ ද
නැවැත්තේ ය. (හැරී ගියේ ය.) බොහෝ දෙමළුන් මැරූ හ. එහි වැව
66 දිය මරණ ලද දෙමළුන් ලෙයින් කැලැත් විය. එයින් නමින් "කලත්
වැව "යි ප්‍රසිද්ධ වී.

67 එහි දී දුටුගැමුණු මිහිපල් තෙමේ "මා හැර අනිකෙක් එළාල රජු
නොමරව "යි බෙර හසුරුවා සන්නාහ සන්නද්ධ වූයේ එසේම සන්නද්ධ
68 කළ කඩොලැතු නැගී තෙමේ ම එළාල රජු ලුහු බඳිමින් දකුණු වහසල්
69 දොරට ආය. නුවර දකුණු වහසල් දොර දී මිහිපලුන් දෙදෙනා යුද්ධ
කළෝ ය. එළාල රජ තෝමරය දූමීය. දුටුගැමුණු රජ ඒ වැළකීය. ඒ
70 පර්වත නම් ඇතු සිය කඩොලැතු ලවා දෙදළින් ඇන්නවී. එළාල
රජහට තෝමරය දූමීය. ඇතු සහිත ඒ තෙමේ එහි හිණි.

එහි දී දිනන ලද සංග්‍රාම ඇති ඒ තෙමේ යාන වාහන බල සෙන්
71 සහිත ලක එක්සත් කොට නුවරට වන්නේ ය. නුවර අණ බෙර ලවා
72 හාත්පස යොදුනෙක මිනිසුන් රැස් කරවා එළාල රජහට සත්කාර කරවී.
සිරුර වැටුණ තැන්හි දී (කුළු ගෙයකින් ) ඒ මිනිය දැවීය. එහි චිතකයක්
73 ද කරවී. පෙරහර ද දුන්නේ ය. අද දක්වාත් ලක්දිව්හි රජ දරුවෝ ඒ
74 පෙදෙස සමීප ගත වූවෝ එම පෙරහරින් තූර්‍ය වාදනය නොකරවති.
මෙසේ ඒ දුටුගැමුණු රජ තෙමේ දෙතිස් දෙමළ රජ කෙනෙකුන් අල්වා
75 ගෙන ඒකච්ඡත්‍රයෙන් ලංකා රාජ්‍යය කෙළේ ය.

76 විජිත නුවර බින්දකල ඒ දීඝජන්තු යෝධ තෙමේ බෑනා යෝධ
බැව් එළාල රජහට දන්වා තමා බෑනා ඒ හල්ලුකයහට මෙහි (ලක්දිව්)
77 එනු පිණිස හසුන් යැවීය. හල්ලුක තෙමේ ඔහුගේ (හසුන් ) අසා එළාල
78 රජු දැවූ දවසින් සත් වෙනි දවස්හි සැට දහසක් මිනිසුන් සමඟ මෙහි
ගොඩ බටුයේ ය. ගොඩ බටුවා වූ ඒ තෙමේ රජහු වැටුණු බැව් අසා "
79 ලජ්ජාවෙන් යුද කරන්නෙමැ" යි මහ තොටින් මෙහි ආයේ ය.
80 කොලඹහාලක නම් ගම කඳවුර පිහිට වී. රජ තෙමේ ඔහු ආ
බැව් අසා යුද්ධ සන්නාහයෙන් සන්නද්ධව කඩොලැතු නැගී හස්ති
81 අශ්ව රථ යෝධයන් හා පදික සේනාවෙන් ද සම්පූර්ණව යුධ පිණිස
නික්මුණේ ය.

82 ලක්දිව්හි අග්‍ර ධනුර්ධර වූ උන්මාද ඵුස්සදේව තෙමේ පඤ්චා
යුද්ධ සන්නද්ධ වූයේ එම ඇතුපිට රජහට පසු ආසනයෙහි ගියේ ය.
83 සෙසු යෝධයෝ ද ඒ අනුව ගියෝ ය. එහි මහා යුධ පැවති කල

Non-Commercial Distribution

සන්නාහ සන්නද්ධ හල්ලුක තෙමේ රජු ඉදිරියට ආයේය. කණ්ඩුල
84 හස්ති රාජ වනාහි ඔහුගේ වෙගමන්දි භාවය පිණිස සෙමෙන් සෙමෙන්
පසු බැස්සේ ය. සේනාව ද ඒ කැටි වම සෙමෙන් සෙමෙන් පසු
85 බැස්සාය. රජ තෙමේ "ඵුස්ස දේවය පෙර අට විසි යුද්ධයෙහි මේ ඇත්
තෙමේ පසු නොබැස්සේ ය. මේ කිමෙක් දැ"යි කීයේ ය. ඒ තෙමේ
86 දේවයන් වහන්ස, අපට උත්කෘෂ්ඨ ජයයි. මේ ඇත් තෙමේ ජය භූමිය
බලමින් පසුබසී. ජය ස්ථානයෙහි සිටින්නේ ය යි කීයේ ය.

ඉක්බිති ඇත් තෙමේ පසු බැස පුර දෙවොලට පසෙකින් මහා
87 විහාර සීමා තුල සුප්‍රතිෂ්ඨාවෙන් සිට ගත ඇත් රජු එහි සිටි කල හල්ලුක
තෙමේ එහි රජු ඉදිරියට අවුදින් රජහට පිරි හෙළා කථා කෙළේ ය. රජ
88 තෙමේ කඩුවෙන් මුව වසා ගෙන ඔහුට ආක්‍රොශ කෙළේ ය. රජහු "
89 මුඛයෙහි විදිනෙමැ "යි හේ තෙමේ ඊය විදපීය. ඒ ඊ ගස කඩුතලයෙහි
වැද බිම හිණී. "මුඛයෙහි විදින ලද "යි යන සංඥාවෙන් හල්ලුක
90 තෙමේ මහත් ජය නාද කළේ ය. රජහට පසු අස්නෙහි උන්නා වූ
91 මහත් බල ඇති ඵුස්සදේව තෙමේ රජහු කන මිණි කොඬල ගට මින්
92 හල්ලුකයා මුඛයෙහි හීයක් විදපීය. රජු දෙසට පාහෙලා වැටෙනා ඔහුගේ
දණට කෘතහස්ත වූයේ අනික් හීගසෙක් ද විද රජු දෙසට ඉසලා උහු
93 හෙළීය. හල්ලුකයා වැටුණු කල ඒ යුද්ධාංගයනයෙහි මහත් ජය නාද
පැවැත්තේ ය.

ඵුස්සදේව තෙමේ එහි දී තමා දොස් දක්වන්නට ස්වකීය තත්
94 වැලකඩා ලේ පතක් තෙමේ ම රජහට දැක්වීය. රජ තෙමේ ඒ දැක (මේ)
කිමෙක්දැයි ඔහු විචාළේ ය. ඒ තෙමේ "මා විසින් රාජ දණ්ඩනය කරණ
95 ලද"යි රජහට කීය. "තා දොස් කවරේදැ "යි කියන ලදුයේ කුණ්ඩල
96 සට්ටනය කීයේ ය. " මලණුවෙනි නිදොස දොසැයි යන සංඥාවෙන්
මේ කුමක් කෙළේ ද ? " මෙසේ කියා මහ රජ තෙමේ කෙළෙහි ගුණ
දන්නේ "හීයට සුදුසු වූ මහත් සත්කාර තට වන්නේ ය" යි මෙසේත්
97 කීයේ ය.

ඉක්බිති සියලු දෙමළුන් මරවා ලබන ලද ජය ඇති රජ තෙමේ
98 ප්‍රාසාද තලයට නැඟී එහි සිංහාසනයෙහි හුන්නේ සියළු ඇමැතියන්
මැද ඵුස්ස දේවයා විසින් විදින ලද ඒ හීය ගෙන්වා තලය සෘජු කොට
99 පගිලියෙන් තබ්බවා මතු මත්තෙහි කහවණු වගුරුවා ඒ ඊය වස්වා
100 එකෙණෙහි ඵුස්සදේවයාහට දුන්නේ ය.

101 ඉක්බිති නරේන්ද්‍ර තෙමේ අලංකාර කරණ ලද සුවඳ තෙල් පහනින්
අලු කළා වූ නොයෙක් සුවඳින් සමාකීර්ණ නාටක ජනයාගේ
102 සමායෝගයෙන් දිව්‍යාප්සරාවන් විසින් සෙයින් හෙබියා වූ රජගේ මතු

Non-Commercial Distribution

103 මහල් තලයෙහි මහඟු ඇතිරිලි අතුළා වූ මොලොක් මතා සයනෙහි
හොත්තේ මහත් වූ ශ්‍රී විභූතිය බලාත් කරණ ලද අක්ෂෞහිණී
104 සේනාඝාතනය සිහි කරන්නේ සැප නොලත්තේ ය. (සුවසේ නිදන්ට
නොහැකි වී) පුවඟු දිවයින් වැසි රහත් වූ ඔහුගේ ඒ කල්පනා දැන ඒ
105 ඉසුරුැහු අස්වසාලන්නට රහතුන් අට දෙනෙක් එවූහ. ඒ රහත්හු මැදියම
අවුත් රජ ගෙදොර බැස්සාහ.

106 දන්වන ලද අහස් ගමන ඇත්තෝ මතු මහලට නැගෝ ය. මහ
රජ තෙමේ ඒ රහතුන් වැඳ අස්නෙහි වඩා හිඳුවා නානා සත්කාර
107 කොට ආ කරුණු විචාළේ ය. " මනුෂ්‍ය ශ්‍රෙෂ්ඨයා ණෙනි ! පුවඟු
108 දිවයින සංඝයා විසින් මෙහෙයන ලද්දා වූ අපි තොප අස්වසාලන්ට
ආම්භ" යි කීය. රජ තෙමේ නැවත උන්වහන්සේලාට "ස්වාමීනි, යම්
109 හෙයකින් මා විසින් අක්ෂෞහිණී මහා සේනා ඝාතනය කරවන ලද්දේ
නම් එසේ වූ මට කෙසේ ආශ්වාසයෙක් වන්නේ ද "යි කීයේ ය. ඒ
කර්මයෙන් තොපට ස්වර්ග මාර්ගාන්තරායෙකුත් නැත්තේ ය. ජන
110 ශ්‍රෙෂ්ඨය, මරණ ලද මිනිස්සු ද එකෙක් හා අඩක් වන්නේ ය. තිසරණ
111 පිහිටි එකෙක, තිසරණ පන්සිල්හි පිහිටි අනිකෙක, සෙසු මරණ ලද්දාහු
මිථ්‍යා දෘෂ්ටි දුස්සීල වූ සිවුපාවුන් සමයෝ ය. තව ද තෙපි බුද්ධ
ශාසනයත් නොයෙක් පරිද්දෙන් බබුළු වන්නෙහි ය. එහෙයින්
112 නරේශ්වරය චිත්ත ඛේදය දුරලව "යි කීවෝ ය. උන් වහන්සේලා
විසින් මෙසේ වදාරණ ලද මහ රජ තෙමේ ආශ්වාස ලත්තේ වැඳ
උන්වහන්සේලා යවා සැතපුණේ නැවත මෙසේ සිතීය. "සංඝයාගෙන්
113 තොරව කිසි කලෙකත් ආහාර නො වළඳව් යයි ළදරු වූ අප මවුපිය
දෙදෙනා ආහාරයෙහි දිවුර වූහ. භික්ෂු සංඝයාට නොදී අප විසින්
114 අනුභව කරණ ලද කිසිවක් ඇත්තෝදැයි (පරීක්ෂා කෙරෙමින්) මෙනෙහි
නොකොට පෙරබත්හිදී සංඝයාට නොතබා අනුභව කරණ ලද එකම
115 මිරිස් වැටියක් දුටුයේ ය. "ඒ පිණිස මා විසින් දඬුවම් කටයුතු හෝ
ඉවසීය යුතු ය "යි සිතුයේ ය.

116 මේ මනුෂ්‍ය ලෝකයෙහි සත් පුරුෂ තෙමේ නොයෙක් කෙළ
ගණන් මරණ ලද ඒ මේ මනුෂ්‍ය සමූහයන් සිතා මෙය කාමයන් හේතු
කොට යයි ද ඒ ආදීනය ද මෙනෙහි කරන්නේ ය. තවද සත්පුරුෂ
තෙමේ සියල්ලවුන්ගේ අනිත්‍ය තාවය යෙහෙකිනි නිවන් නතු කොට
සිතන්නේ, එසේම නොපමාව දුඃඛ විමෝක්ෂයට ද නොහොත් මනා
ගතියට ද පැමිණෙන්නේ යි.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස
දුට්ඨගාමිණී විජය නම් පස් විසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසිහය වෙනි පරිච්ඡේදය

1 මහා යශස් ඇත්තා වූ ඒ (දුටුගැමුණු මහ රජ) තෙම ලංකා රාජ්‍යය
එක්සත් කොට යෝධයන්ට තනතුරු සංවිධාන කෙළේ ය.
2 ථේරපුත්තාභය නම් යෝධ තෙම දෙන ලද ඒ තනතුර
නොයිවසුවෙය "කුමක් පිණිස ද" යි විචාරණ ලද්දේ "යුද්ධයෙක්
ඇතැ" යි කීයේ ය. "යුද්ධයෙන් ඒක රාජ්‍යය කළ කල්හි කිනම් යුධයෙක්
දැ"යි කියාත් පිළිවිසියේය. " කෙළෙස් සොරුන් හා අතිශයින් දුර්ජය වූ
3 යුද්ධයක් කරන්නෙමැ "යි කීයේ ය. රජ තෙම උහු නැවත වැළැක්වීය.
4 හෙතෙම නැවත නැවත යාච්ඤා කොට රජහු අනුමතයෙන් පැවිදි විය.
පැවිදිවත් (විදර්ශනායෝග) කාලයෙහි රහත් බැව් පත් වූයේ රහතුන්
5 පන් සියයක් පිරිවර ද වූයේ ය.

6 සේසත් ඔසවන මඟුලින් යුත් සත් දවස ගිය කල්හි භයාති ක්‍රාන්ත
කළා වූ අභය නම් ඒ රජ තෙම කරණ ලද රාජ්‍යාභිෂේක ඇත්තෙන්ම
7 ක්‍රීඩා කරුණු පිණිස ද, අභිෂේක කරණ ලද (ක්ෂත්‍රිය) යන්ගේ චාරිත්‍රය
පාලනය කරණු පිණිස ද මහා ක්‍රියා විධියෙන් මොනවට සරසන ලද්දා
8 වූ තිසා වැවට සම්ප්‍රාප්ත වුයේය. රජහුගේ සියලු පරිභෝග භාණ්ඩ
ජාතය ද (ගෙණෙන ලද) සිය ගණන් පඬුරු ද මිරිසවැටි වෙහෙර
පිහිටන තන්හි තැබූහ. එහිම ථූපය පිහිටන තන්හි කුන්තායුධය
9 උසුලන්නාවූ රාජ පුරුෂයෝ ධාතු සහිත වූ කුන්තායුධය ඍජු කොට
තැබූහ. මහ රජ තෙම අන්තඃපුර වාසීන් සහිත වූයේ දිවා භාගයෙහි
10 ජලයෙහි ක්‍රීඩා කොට සවස් වේලෙහි "භවත්නි ! යතු කැමැත්තම්භ,
11 කුන්තායුධය වඩව්"ය යී කීයේ ය. රාජ පුරුෂයෝ ඒ කුන්තායුධය
12 සොලවනු නොහැකි වූහ. රැස් වූ රාජ සේනා වෝ සුවඳ මලින් පිදූහ.
රජ තෙම ඒ මහත් ආශ්චය්‍ර්‍යය දැක සතුටු සිත් ඇත්තේ, එහි ආරක්ෂා
13 සංවිධානය කොට පුරයට ප්‍රවිෂ්ටව නැවත එහි කුන්තායුධය පරික්ෂිප්ත
14 කරවා චෛත්‍යයක් කර වූ යේය. ඒ ස්තූපය සිසාරා විහාරයක් ද
15 කරවීය. ඒ මෙහෙවර තුන් හවුරුද්දකින් නිම විය. ඒ නරේශ්වර තෙම
16 විහාර පූජා කරණයෙන් සංඝයා රැස් කර වූයේ ය. එ දවස රැස් වූ
භික්ෂූන් ලක්ෂයක් වූහ. භික්ෂූණීහු ද අනූ දහසක් වූහ. මිහිපති තෙම
17 ඒ සමාගමයෙහි දී සංඝයාට මෙය සැල කෙළේ ය. "වහන්ස ! සංඝයා
සිහි නොකොට මිරිස් වැටියක් අනුභව කෙළෙමි. ඊට දඬුවම් වේවයි
චෛත්‍යය සහිත වූ අතිශයින් සිත්කළු වූ මිරිස්වැටි වෙහෙර කරවීම්.
18 එය සංඝ තෙමේ පිළිගන්නා සේක්ව "යි කියා සතුටු සිත් ඇත්තා වූ
19 හෙතෙම දක්ෂිණෝදකය වගුරුවා විහාරය භික්ෂු සංඝයාට දුන්නේ ය.
එම වෙහෙර ද ඒ වෙහෙර හාත්පස ද යහපත් වූ මහා මණ්ඩප කරවා

Non-Commercial Distribution

20 එහි සංඝයාට මහ දන් පැවැත්වූයේය. අබා වැව ජලයෙහිදු ටැම් සිටුවා
21 ඒ මණ්ඩපය කරණ ලද්දේ විය. අවශේෂ වූ අවකාසයෙහි (කළ
මණ්ඩපයන්) කියම කවරේ ද? නරේශ්වර තෙම සත් දිනක් මුළුල්ලෙහි
ආහාර පානාදිය (සංඝයාට) දී ශ්‍රමණ සාරුප්‍ය වූ මාහැඟි සියලු පිරිකර
22 දුන්නේ ය. ඒ ප්‍රථම පරිෂ්කාරය තෙම ලක්ෂයක් අගනේ විය. සංඝ
තෙමේ ම ඒ සියල්ල ලත් සේක.

23 යුද්ධයෙහි හා දානයෙහි සූර පණ්ඩිත වූ රත්නත්‍රය කෙරෙහි
ප්‍රසන්න නිර්මල සිත් ඇත්තා බබළවනු කැමති වූ කෘතෝපකාර දන්නා
24 වූ ඒ නරනිඳුහු විසින් රත්නත්‍රය පුදනු පිණිස ථූපය කරවීම පටන් විහාර
25 පූජාව අවසන් කොට ඇති මෙහි පරිත්‍යාග කරණ ලද ධනයෝ අනර්ඝ
වස්තූන් හැර සෙස්සෝ පමණක් එකුන් විසි කෝටියක් වෙති.

(අග්නි ආදී) පංචවිධි දෝෂයෙන් දූෂිත වූ භෝගයෝ ප්‍රඥා
26 විශේෂයෙන් යුක්ත වූ ජනයන් විසින් පැමිණියාහු (බහුජන ප්‍රියතාදී වූ )
පංච ගුණයෙන් හා යෙදීමෙන් ගන්නා ලද සාර ඇති වෙත්වයි සිතා ඒ
භෝගයාගේ සාර ග්‍රහණයෙහි නුවණැත්තේ උත්සාහ කරන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස
මරිචවට්ටි විහාරමහ නම් වූ සවිසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසි හත් වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති ඒ රජ තෙම ප්‍රසිද්ධ වූ මනා කොට අසන ලද්දා වූ
ඇසීම විශේෂයෙන් සිතුයේ ය. "ලංකාද්වීපය පැහැද වූ සැම කල්හි
2 පවිත්‍ර වූ මහා පිනැති ස්ථවිරයන් වහන්සේ ප්‍රඥාවෙන් කරන ලද නිශ්චය
3 ඇති සේක් මාගේ මුත්තණු වූ රජහට මෙසේ වදාළේ ය. තොපගේ
මුණුබුරු වූ දුටුගැමුණු යන නමින් යුක්ත වූ මහ පිනැති මිහිපතියෙක්
තෙම අනාගතයෙහි මනෝහර වූ එක සිය විසි රියන් උස් වූ
4 සොණ්ණමාලි නම් මහා ථූපය කරවන්නේ ය. නැවත ද නානා
රත්නාලංකෘත ලෝහ ප්‍රාසාදයක් වන පොහො ගෙයක් ද නව මහල්
5 කොට කරවන්නේ ය. යන මේයි පෘථිවිශ්වර තෙම මෙසේ සිතා මෙසේ
ලියා තබන ලද්දක් බල වන්නේ රජ ගෙයි කරඬුවෙක්හි ම තිබුණා වූ
6 රන්පට ලැබ එහි ලේඛනය කියවූයේ ය. "වර්ෂ එක් සිය සතලිසක්
ගෙවා අනාගතයෙහි කාවන්තිස් මහ රජහු පුත්‍ර වූ දුටුගැමුණු නම්
7 නිරිඳෙක් තෙම මේ මේ දෙය ද මෙසේ ද කරවන්නේ ය"යි කියවන
ලද්ද අසා සතුටු වූ මිහිපති තෙම ප්‍රීති වාක්‍ය පවත්වා, අත්පොළසන්
දුන්නේ ය. ඉක්බිත්තෙන් උදෑසන යහපත් වූ මහමෙවුනා උයනට
8 පැමිණ භික්ෂු සංඝයා රැස් කරවා, "නුඹ වහන්සේලාට මම දිව්‍ය
9 මන්දිරයක් සමාන වූ ප්‍රාසාදයක් කරවන්නෙමි, දිව්‍ය විමානයකට යවා
10 එහි ආකාර සිතියමක් මට ගෙන්වා දෙන සේක් වා" යි කීයේ ය. භික්ෂූ
11 සංඝ තෙම රහත් අට නමක් එහි යැවූ සේක. කාශ්‍යප සර්වඥයන්
වහන්සේගේ කාලයෙහි අශෝක නම් බ්‍රාහ්මණයෙක් තෙම ලහබත්
අටක් සංඝයාට පිරි නමා හෙතෙම (ඒ බත්) නිබඳ දෙව" යි භරණී නම්
දාසියට කීයේ ය. ඕ තොමෝ ඒ බත් සකස් කොට ජීවිතාන්තය දක්වා
12 දී එයින් චුත වූවා, සිත්කළු යහපත් වූ ආකාශස්ථ විමානයෙක්හි උපන්
13 නීය. සැම කල්හි දිව සරන් දහසක් විසින් පිරිවරන ලද්දී විය.

14 ඇගේ රත්න ප්‍රාසාදය තෙම දොළොස් යොදුනක් උස් විය. අවට
15 යොදුන් අටසාළිසෙක කුළු ගෙවල් දහසකින් සැරසුනේ නව මහල් විය.
දහසක් ගබඩාවෙන් සමන්විත වූයේ සතර දිගට මුඛ ඇතිව බබළන්නේ
16 ය. දහසක් මනාව පැවති සිව් මැදුරු කවුළු නැමැති නෙත් ඇත්තෝ
ය. කිකිණි දැල් සහිත වූ පිළිකඩින් ද සැදුම් ලද්දේ ය.

17 ඒ පහය මැද අම්බලට්ඨීක නම් ප්‍රාසාදයක් පිහිටියේ ය. නගන
18 ලද ධ්වජයෙන් ආකුල වූයේ හාත්පසින් පෙනෙන්නේ ය. ඒ ස්ථවිරයෝ
තුමූ තව්තිසා දෙව් ලොව වඩනෝ ඒ පහය දැක දැහිඟුලෙන් වස්ත්‍රයෙක්හි
19 ඒ විමානාකාරය සිතියම් කොට ගෙන එතැනින් නැවතී ආගමනය

Non-Commercial Distribution

20 කොට වස්ත්‍රය සංඝයාට දක්වූහ. සංඝ තෙම ඒ වස්ත්‍රය රැගෙන රජු
කරා යැවූ සේක. ඒ දැක සතුටු සිත් ඇත්තා වූ රජ තෙම උතුම් වූ
ආරාමයට අවුත් ඒ සිතියම් ආකාරයට උතුම් වූ ලෝහ ප්‍රාසාදය කර
21 වූයේ ය. භෝග ඇත්තා වූ නරේන්ද්‍ර තෙම ප්‍රාසාද කර්මය ආරම්භ
22 කරණකාලයෙහිම සතර දොර අට ලක්ෂයක් කහවණු තැබ්බ වූයේ ය.
එහි දොරක් පාසා දහස් ගණන් පිළී පොදි ද සිනී තල තෙල් සකුරු මී
පිරූ නොයෙක් සැළි ද තැබ්බ වූයේ ය. මෙහි නොමිලයේ කරණ
23 කර්මයක් නොකට යුතු යයි කියා කළකම් අගය කරවා ඒ කම්කරුවන්ට
24 වැටුප් මිළ දෙවූයේ ය. එක එක පසින් රියන් දහස දහස වූයේ ය.
25 සතර දොර ඇත්තා වූ ඒ ප්‍රාසාදය තෙම උසින් එපමණ වූයේය. ඒ
ශ්‍රේෂ්ඨ වූ ප්‍රාසාදයෙහි මහල් නවයක් වූහ. එක එක මහලෙහි කුළු
26 ගෙවල් සියයක් සියයක් වූහ. සියළු කුළු ගෙවල් රිදීයෙන් නිමවන
ලද්දා හ. ඒ කූටාගාරයක් සම්බන්ධධ වූ පබළු පිළිකඩ නානාවිධී
27 රත්නයෙන් සැදූම් ලද්දා හ. ඒ පිළිකඩ සම්බන්ධවූ පියුම් ද නානාවිධ
28 රත්නයෙන් විචිත්‍ර වූහ. ඒ වේදිකාවෝ රජතමය කිකිණි පෙළින්
පරික්ෂිප්ත වූහ. ඒ පහයෙහි මනා කොට සදන ලද ගබඩා දහසක්
29 නානාවිධ රත්නයන් ඔබ්බවන ලද්දාහ. සිවු මැදුරු නෙත් ඇති වූහ. ඒ
නරෙන්ද්‍ර තෙම වෛශ්‍රවණ දේවරාජයාගේ නාරි වාහන නම් යානාවගේ
පරිදි අසා එබඳු වූ රත්න මණ්ඩපයක් ප්‍රාසාද මධ්‍යයෙහි කර වූයේ ය.
30 මේ මණ්ඩපය තෙම සිංහ ව්‍යඝ්‍රාදී රූපයන් ද දේවතා රූපයන් ද ඇත්තා
වූ රුවන්මුවා ටැඹින් අලංකෘත වූයේ ය. මෙහි මණ්ඩපාන්තයෙහි
31 හාත්පස මුතු දැලින් වට කරණ ලද්දා වූ පෙර කියන ලද පරිදි වූ පබළු
වේදිකාවක් ද විය. සප්ත විධ රත්නයෙන් විචිත්‍ර වූ මණ්ඩපයාගේ
32 මධ්‍යයෙහි රම්‍ය වූ පළිඟු අතුළ සිත්කළු උතුම් පළහක් (පිහිටුවන ලද්දේය.)
33 මේ පළඟෙහි දන්තකර්මයෙන් නිම වනලද අපාශ්‍රය සංඛ්‍යාත පිට අටුවක්
ද රනින් නිම වනලද හිරු මඬලක් හා රිදීයෙන් නිමවන ලද සඳ
34 මඬලක් ද මුතු පෙළින් නිම වන ලද තාරකා රූප ද (පිහිටුවන ලදහ) ඒ
ඒ තන්හි සුදුසු පරිද්දෙන් නානා රත්නමය වූ පියුම් ද, එහිම රන් ලිය
35 අතර ජාතක ද (සටහන් කරණ ලද) වූහ. මාහැඟි පස තුරුණු ඇති
අතිශයින් සිත්කළු වූ පළඟෙහි තබන ලද ශෝභාමත් වූ දන්තමය
36 විජිනිපත සිත්කළු විය. එහි පළිඟු මතයෙහි පබළු පාදුකාවක් පිහිටියේ
37 ය. පළඟ මතුයෙහි රිදී මිටින් යුක්ත වූ සේසත හෙබියේ ය. මෙම
ඡත්‍රයාගේ අන්තයෙහි සප්ත විධ රත්නයෙන් කරණ ලද අෂ්ට
38 මංගලිකාකාර රූපයෝ ද මිණි මුතු අතරතුර ඇති වූ චතුෂ්පාද රූප
පංක්තීහු ද වූහ. ඡත්‍රයාගේ අන්තයෙහි එල්බුනා වූ රිදී මිණි ගෙඩි
39 පංක්තීහු ද වූහ. ප්‍රාසාදය, ඡත්‍රය, පර්‍යංකය,\ මණ්ඩපය යන මොහු
අනර්ඝ වූහ. සුදුසු පරිද්දෙන් මාහැඟි වූ ඇඳ පුටු පැණ වූයේ ය.

Non-Commercial Distribution

40 එසේම බුමු තුරුණු ද මාහැඟි පලසක් ද විය. ඒ ප්‍රාසාදයෙහි රනින්
නිමවන ලද ධෝවන ජලය තබන සැළ ද කිණිස්ස ද වූයේ ය.
41 ප්‍රාසාදයෙහි පරිභෝග වූ සෙසු බඩු කියනුම කවරේ ද? සතර දොර
කොටු ඇත්තා වූ මනෝඥ වූ ප්‍රාකාරයෙන් පරික්ෂිප්ත වූ ඒ ප්‍රාසාදය
42 තෙම තව්තිසා දෙව් ලොව (සුධර්මා නම්) සභාව සේ සරසන ලද්දේ
විය. මේ ප්‍රාසාදය තෙම තඹ ලෝ උළින් වසන ලද්දේ ය. එහෙයින් ඒ
43 ප්‍රාසාදයට ලෝහ ප්‍රාසාදය යන නාමය වූයේ ය. ඒ නරේන්ද්‍ර තෙම
ලෝවා මහා පාය නිම වූ කල්හි සංඝයා රැස් කරවූ යේ ය. මිරිස් වැටි
44 විහාර පූජායෙහි මෙන් සංඝයා රැස් වූ සේක. පළමුවෙනි මහලෙහි
පෘථග්ජන භික්ෂූහූම සිටියහ. දෙවෙනි මහලෙහි ත්‍රිපිටකධර භික්ෂූහූ
සිටියහ. සෝවාන් ආදී වූ ආයඝීයෝ වනාහි තුන් වෙනි මහල ආදී වූ
45 එක එක මහලෙහි වැඩ සිටියෝ ය. උඩ සියු මහල්හි රහතුන්
වහන්සේලාම වැඩ සිටියහ.

46 නරේන්ද්‍ර තෙම දක්ෂිණෝදකය පෙරටු කොට ප්‍රාසාදය සංඝයාට
දී සත් දවසක් මුළුල්ලෙහි පූර්ව වූ මිරිස්වැටි වෙහෙර මහ දන මෙන්
47 මහ දන් දින මහා පරිත්‍යාග ඇත්තා වූ නරේද්‍රයන්විසින් ප්‍රාසාද පූජායෙහි
පරිත්‍යාග කරණ ලද වස්තු අනර්ඝ වස්තූන් හැර තිස් කෙළක් කහවණු
අගනාහු වූහ.

48 නිස්සාර වූ වස්තුවෙන් ද රැස් කිරීමෙහි විශේෂ වූ සාරය දානය
වශයෙන් යහපත් ප්‍රඥා ඇත්තා වූ යම් ජන කෙනෙක් ප්‍රමාණ කෙරෙද්
ද, ඒ සත්වයන්ගේ වැඩ පරම කොට ඇත්තා වූ ඒ ජනයෝ තුමූ පහ වූ
චිත්තාලය ඇතිව විපුල වූ දානය මෙසේ දෙන්නා හූ ය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස ලෝහපාසාද මහ නම් වූ සත් විසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසිඅට වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් ඒ මිහිපති තෙම ලක්ෂයක් වියදම් කොට ඇති
2 උදාර වූ උතුම් මහා බෝධි පූජාවක් කර වූයේ ය. ඉක්බිති නුවරට
3 වදනේ සෑ තන්හි පිහිටු වන ලද්දා වූ ගල් ටැඹ දැක (තමන් කටයුතු
පිණිස) පෙර (ලියා තබන ලද්දෙන් ලත්) ඇසීම සිහි කොට මහ සෑය
කරවන්නෙමැයි' (සිතා) සතුටු වූයේ මහ ප්‍රාසාද තලයට නැඟී
බොජුන් අනුභව කොට රාත්‍රියෙහි ශයන ප්‍රාප්ත වූයේ මෙසේ සිතුයේ
4 ය. "දෙමළුන් මඩනා වූ මා විසින් මේ ජනයා පෙළන ලද්දේ ය.
(එහෙයින්) ජනයාගෙන් අය උපයනු නොහැක්කේ ය. ඒ අය ගැනීම
5 හැර සෑය කරවන්නා වූ මම කෙසේ දැහැමින් ගඩොල් උපයම්" දැයි
මෙපරිද්දෙන් සිතන්නා හුගේ සිත සේසත වසන දේවතා තොමෝ
6 දැනගත එයින් දෙවියන් අතර කෝලාහල විය. ශක්‍ර දේවේන්ද්‍ර තෙම ඒ
දැන විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයාට මෙසේ අණ කෙළේ ය. "ගැමුණු රජ
7 තෙම චෛත්‍යයට ගඩොල් පිණිස සිතුයේ ය. තොප ගොස්
අනුරාධපුරයෙන් යොදුනක් තන්හි ගම්භීර නම් නදිය සමීපයෙහි වූ එ
ස්ථානයෙහි ගඩොල් මවව" යි සක් දෙව් රජහු විසින් අණ වන ලද්දා
8 වූ විශ්වකර්ම තෙම මෙහි අවුත් එතන්හි ගඩොල් මැවූයේ ය. අලුයම්
කාලයෙහි එහි වැද්දෙක් සුනඛයන් හා සමග වනයට ගියේ ය. භූමාටු
9 දේවතාවක් තොමෝ ගෝධා වේශයෙන් වැද්දාට තමා දැක්වීය. ඒ
ගොයා ලුහුබැඳ යන්නා වූ වැදි තෙම ගොස් ගඩොල් දැක ගෝධා
අතුරුදන් වූ කල්හි එහි සිට හෙතෙම මෙසේ සිතුයේය. "අපගේ
10 මිහිපති තෙම මහ සෑයක් කරවනු කැමැත්තේය. උන්වහන්සේට මේ
11 පඬුරෙකැ" යි සිතා ගොස් සැළ කෙළේ ය.

12 ජනයා වැඩෙහි ඇලුණා වූ රජ තෙම ඔහුගේ ඒ ප්‍රිය වචනය
අසා සතුටු සිත් ඇත්තේ ඔහුට මහත් වූ සත්කාර කර වූයේ ය. පුරයෙන්
13 ඊසාන දෙස තුන් යොදුනකින් මත්තෙහි ආචාර විදිනම් ගම සොළොස්
කිරියක් පමණ වූ භූමි ප්‍රදේශයෙහි ප්‍රමාණයෙන් නානාප්‍රකාර වූ ස්වර්ණ
14 බීජයෝ උපන්හ. උඩත් පිරිසෙයින් වියත් පමණය යටත් පරිසෙයින්
15 අඟුල් පමණ ද වූ හ. ස්වර්ණයෙන් පිරුණා වූ ඒ භූමිය ඒ ගම් වැස්සෝ
16 දැක තලියක් පිරූ රන් ගෙණ ගොස් රජහට සැල කළහ. පුරයෙන්
ඉඳුරු දෙස සත් යොදුනකින් මත්තෙහි ගහ එතර තඹවිට නම් ගම
17 තඹලෝ උපන. එගම් වැස්සෝ තලියකින් තඹ ලෝහෝ බිජු වට
ගෙන රජ්ජුරුවන් කරා එළඹ ඒ කාරණය ද සැළ කළහ. පුරයෙන්
18 ගිනිකොන් පෙදෙස සතර යොදුනක් දුර සමන් වැව් නම් ගම බොහෝ
19 මැණික් උපන්හ. එගම් වැස්සෝ උපුල් කුරුවින් ද ගල් හා මිශ්‍ර වූම ඒ

Non-Commercial Distribution

මැණික් තලියකින් ගෙණවුත් රජහට සැළ කළහ. නුවරින් දකුණු පස
20 අට යොදුන් මත්තෙහි අම්බට්ඨකොල නම් දනවුවෙහි ලෙණක රිදී
උපන. නුවර වැසි වෙළෙඳෙක් තෙම බොහෝ ගැල් ගෙණ මලය
21 රටින් හිඟුරු ආදිය ගෙණෙන පිණිස ඒ රට බලා යනුයේ ලෙනට
22 නුදුරු තන්හි ගැල් තබවා කැවිටිලි සොයන්නේ ඒ පර්වතයට නැංගේ
ය. සැළියක් පමණ පලයක් ඇත්තා වූ පල බරින් නැමුණා වූ කොස්
23 පැලය ද ගලක් පිට පිහිටි ඒ පලය ද දැක එය පිහියෙන් තුවටුව
24 කපා "අගස් දනක් දෙමැ" යි සිතා ශ්‍රද්ධායෙන් සතුටු වූයේ
උන්වහන්සේලා වැඳ ආදර සහිතව වැඩ හිඳුවා පිහියෙන් එය තුවටුව
25 හාත්පස සිවිය කපා වහල්ලමුදා ආවාටය පුරා සිටි යුස පතින් ගෙණ
26 යුසින් පුරවන ලද ඒ පාත්‍ර සතර උන්වහන්සේලාට ප්‍රදානය කෙළේ ය.
27 උන්වහන්සේලා ඒ පිළිගෙණ වැඩියහ. ඒ වෙළඳ තෙම නැවතත් කාල
28 ඝෝෂා කෙළේ ය. අන්‍ය වූ අර්හත් ස්ථවිරයෝ සතර නමක් එහි
වැඩියහ හෙතෙම උන්වහන්සේලාගේ පාත්‍රයන් ගෙණ වරකා මදුලෙන්
29 පුරවා පිළිගැන් වූයේ ය. උන්වහන්සේලා අතුරෙන් තුන් නමක් බැහැර
වැඩියාහු ය. එක් වහන්සේ නමක් නොවැඩිසේක. ඒ ස්ථවිරයන්
වහන්සේ ඕහට රිදී දක්වනු පිණිස එතැනින් බැස, ලෙණ සමීපයෙහි
වැඩ හිඳ ඒ මදුළු වැළඳු සේක. වෙළඳ තෙමේ ද ඉතිරි වූ මදුළු කුස
30 පොහොනා තෙක් අනුභව කොට ඉන් අවශේෂය පොදියකින් ගෙණ
ස්ථවිරයාණන් දැක වතා වත් ද කෙළේ ය. ස්ථවිර තෙමේ ද ලෙණ
31 දොරින් ඔහුට මාර්ගයක් මැවූසේක. හෙතෙම ස්ථවිරයන් වැඳ ඒ
32 මගින් යන්නේ ලෙණ දුටුයේ ය. ඒ උතුම් වෙළඳ තෙම ලෙණ දොර
33 සිට රිදී ද දැක පිහියෙන් ගසා රිදී යයි දැන එක් රිදී පිඩක් ගෙණ ගැල්
34 සමීපයට ගොස් ගැල් එහි තබවා ඒ රිදි පිඩ ගෙණ වහා අනුරාපුරයට
35 අවුත් නරේන්ද්‍රයන්ට රිදි දක්වා ඒ කාරණය දන් වූයේ ය.

36 පුරයෙන් බටහිර පස පස් යොදුනකින් මත්තෙහි උරුවෙල්
පටුනෙහි මහ ඇඹුලුපල පමණ වූ මුතුපල අතරතුර පබළු සමඟ මුහුදින්
37 ගොඩ නැංගාහ. (ඒ මුහුදුබඩ වැසි) කෙවුළෝ ඒ දැක පබළු සහ මුතු
එකතු කොට ගෙණ තලියකින් ගෙණවුත් රජ්ජුරුවන් කරා එළඹ ඒ
38 කරුණ ද සැල කළහ. නුවරින් උතුරු පස සත් යොදුනකින් මත්තෙහි
පෙළ වැව්ව නම් ගම වැව පිවිස කඳු රැළියෙහි වැලිපිට ඇඹරුම් ගල්
39 පමණ දියමෙරලි මල් වන් පැහැ ඇති යහපත් උතුම් මිණි රුවන් සතරක්
40 උපන්හ. බලු වැද්දෙක් තෙම ඒ දැක රජ්ජුරුවන් වෙත අවුත් "මා විසින්
41 මෙ බඳු මිණි රුවන් දක්නා ලදහ" යි සැල කෙළේ ය.

Non-Commercial Distribution

මහ පැණැති මහ පිණැති ඒ රජ තෙම මහ සෑය පිණිස උපන්
42 ගඩොල් ආදී මේ ද්‍රව්‍යයන් එදවස්ම ඇසූයේ ය. සතුටු සිත් ඇත්තේ සුදුසු පරිද්දෙන් (ප්‍රවෘත්ති) දැන් වූ ඔවුන්ට සත්කාර කොට ඔවුන්ම රැකවරණ කරුවන් කොට ඒ සියලු ද්‍රව්‍යයන් ගෙන්වා ගත්තේ ය.
43 කය උපන් නොඉවසිය හැකි වූ ඛේදය ද නොසලකා ප්‍රසන්න සිත් ඇත්තා හු විසින් මෙසේ රැස් කරණ ලද්දා වූ පුණ්‍යය සැපයට ආකර වූ උපකරණ සියයක් සිද්ධ කෙරේ. මෙසේ ප්‍රසන්න සිත් ඇත්තේ පින් කරන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස මහා ථූපසාධනලාභ නම් වූ අට විසි වන අදියර නිමි.

Non-Commercial Distribution

# විසිනව වෙනි පරිච්ඡේදය

1 මෙසේ උපකරණ සම්පූර්ණ වූ කල්හි වෙසඟ පුර පසළොස් වක
2 විසා නකත පැමිණි කල්හි මහ සෑය පිණිස ආරම්භ කෙළේ ය. මිහිපල්
තෙමේ එහි ගල් ටැඹ පහ කරවා අනේක ප්‍රකාරයෙන් ස්ථිර කරනු
3 පිණිස සෑ තැන සත් රියනක් කැණවූයේ ය. අර්ථානර්ථ දූන්මෙහි
දක්ෂ වූ නරේන්ද්‍ර තෙම එහි සුණු ගල් යෝධයන් ලවා ගෙන්වා ගුළු
4 ගස්වා සුණු කකරන ලද ගල් භූමිය ස්ථිර වන පිණිස සමින් වසන ලද
පතුල් ඇත්තා වූ මහඇතුන් ලවා මැඩ වී.

5 අහස් ගඟ හුණු තන්හි සතතයෙන් තෙත් වූ එහි හාත්පස තිස්
6 යොදුන් බිම මැටි සියුම් මේ මැටි තොමෝ සියුම් බැවින් වෙඩරු මැටි
7 යයි කියනු ලැබේ. එතැනින් රහත් සාමණේරවරයෝ තුමු මැටි ගෙණාහ.
එහි ගල් අතළෙහි මැටි ඇතිර විය. නරේන්ද්‍ර තෙම මැටි මතුයෙහි ගල්
8 ඇතිර වූයේ ය. ඒ මතුයෙහි ශුද්ධ වූ කර ගල් ද ඒ මතුයෙහි බොරළු ද
ඇතිර වූයේ ය. පෘථිවිශ්වර තෙම හිමවතින් සාමණේරවරයන් විසින්
9 ගෙණෙන ලද පළිඟු ගල් ඒ මත්තෙහි ඇතිර වූයේ ය. පළිඟු අතල
10 මත්තෙහි ගල් ඇතිර විය. සෑම තන්හි මැටියෙන් කටයුත්තෙහි නවනීත
11 නම් මැටීම විය. නරේන්ද්‍ර තෙම රස ජලයෙන් මිශ්‍ර කළ ගිවුලු මැලියමින්
අටඟුල් බොල් ලෝහ පටක් ඇතිරිය මත්තෙහිද, ඒමත්තෙහි තලතෙලින්
12 තෙමන ලද රන්සිරියෙලින් සෑය පිහිටන තන්හි විශේෂයෙන් ප්‍රසන්න
13 වූ සිතින් මෙසේ පිරියම් කරවා ඇසළ මස පුර තුදුස්වක් දවස්හි භික්ෂු
14 සංඝයා රැස්කරවා ස්වාමීනි, මහසෑය පිණිස මඟුල් ගඩොල සෙට පිහිටු
15 වන්නෙමි. මෙහි අපගේ ස්වාමී වූ සියලුම සංඝ තෙම රැස්වේවා, බුද්ධ
16 පූජා යෙදීමෙන් මහජනයාගේ වැඩ කැමැත්තා වූ මහජන තෙමේ ද
පෙහෙවස් සිල් ඇති ව සුවඳ මල් ආදිය ගෙණ මහ සෑය පිහිටුවන
17 තැනට සෙට යේවා" යි මේ වදන කීයේ ය. චෛත්‍ය ස්ථානය සරසන
පිණිස අමාත්‍යයන් ද යෙදූයේය. නරනිඳුනු විසින් ඇණ වූ කල්හි
18 සර්වඥයන් වහන්සේ කෙරෙහි ප්‍රිය ගෞරව ඇත්තා වූ ඔව්හු ඒ ස්ථානය
19 අනේක ප්‍රකාරයෙන් සැරසූහ. නරෙන්ද්‍ර තෙම මුළු නුවර හා සේ
20 විහාරයට එන්නා වූ මාර්ග ද නොයෙක් ආකාරයෙන් සරසවා උදෑසන
21 ම නුවර සතර දොර කරනෑවැමියන් ද නහනු ද කපුවන් ද එසේ
බොහෝ වස්ත්‍රයන් ද තැබ්බ වූයේ ය. මහ ජනයාගේ අභිවෘද්ධියෙහි
ඇළුණා වූ පෘථිවිශ්වර තෙම මහජනයාගේ වැඩ පිණිස සුවඳ මල් ද
22 මිහිරි ආහාරයන් ද රුචි වූ පරිද්දෙන් පිළියෙළ කරණ ලද්දා වූ මේ
ද්‍රව්‍යයන් තැබ්බ වූයේ ය. පුර වැස්සෝ ද දනව් වැස්සෝ ද චෛත්‍ය
23 ස්ථානයට එළඹුණහ. තනතුරු ලෙස කරණ ලද නියෝග වශයෙන්

Non-Commercial Distribution

මොනවට සැරසුණා වූ නොයෙක් ඇමැතියන් විසින් රැකවරණ කරණ
24 ලද්දා වූ මිහිපති තෙම මොනවට සැරසුණා වූ දේව කන්‍යාවන් සා
සමාන වූ නාටිකා වන් විසින් පිරිවරණ ලදුව යහපත් සේ සැරසි පිළියෙළ
කරණ ලද්දේ සතළිස් දහසක් මිනිසුන් විසින් පිරිවරණ ලද්දේ නානාවිධ
25 තූර්යයන් ඝෝෂණ ශබ්දයෙන් යුක්ත වූයේ සක්දෙව් රජහු විලස් ඇත්තේ
26 ස්ථානාස්ථාන දූන්මෙහි විචක්ෂණ වූයේ මහජනයා සතුටු කෙරෙන්
27 මහා ථූපය පිහිටන ස්ථානයට සවස් කාලයෙහි සම්ප්‍රාප්ත වූයේ ය. ඒ
මිහිපත් තෙම පොදි බඳිනා ලද අටතුරා දහසක් වස්ත්‍රයන් මැද තබ්බවා
28 ඉන් සතර පස නොයෙක් පිළී රැස් කර වූයේ ය. මංගල්‍යය පිණිස මී
ගිතෙල් උක් සකුරු ආදිය තැබ්බ වූයේ ය. නොයෙක් දේශයෙන් ද
29 භික්ෂූහු මෙහි පැමිණියා හු ය. මේ දිවයින වැසි සංඝයා මෙහි පැමිණීම
කියනුම කවරේ ද? රජගහ නුවර සමීපයෙහි වැඩ විසූ ඉන්දගුත්ත
30 නම්ස්ථවිරයන් වහන්සේ අසූ දහසක් භික්ෂූන් (පිරිවර කොට) ගෙණ
වැඩි සේක. ධම්මසේන නම් මහා ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්
31 දොළොස් දහසක් පිරිවර කොට ගෙණ ඉසිපතනාරාමයෙන්
32 චෛත්‍යයස්ථානයට පැමිණි සේක. පියදස්සි නම් මහා ස්ථවිරයන්
වහන්සේ සැට දහසක් භික්ෂූන් (පිරිවර කොට) ජේතවන විහාරයෙන්
මෙහි පැමිණි සේක. බුද්ධ රක්ඛිත නම් ස්ථවිරයන් වහන්සේ අටළොස්
33 දහසක් භික්ෂූන් පිරිවර කොට ගෙණ විශාලා මහ නුවර මහ වනයෙන්
මෙහි පැමිණි සේක. මහා ධම්මරක්ඛිත නම් ස්ථවිරයන් වහන්සේ තිස්
34 දහස් භික්ෂූන් (පිරිවර කොට) ගෙණ කොසඹෑ නුවර වූ ඝෝෂිතාරාමයෙන්
35 මෙහි පැමිණි සේක. මහා ධම්ම රක්ඛිත නම්ස්ථවිරයන් වහන්සේ
36 සතළිස් දහසක් භික්ෂූන් රැගෙන උදේනි නුවර දක්ෂිණගිරි විහාරයෙන්
මෙහි පැමිණි සේක. මිත්තිණ්ණ නම් ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් එක්
ලක්ෂ සැට දහසක් රැගෙන පැළලුප් නුවර අශෝකාරාමයෙන් (මෙහි
පැමිණි සේක.)

37 උත්තිණ්ණ නම් තෙරුන් වහන්සේ දෙලක්ෂ සැට දහසක් භික්ෂූන්
රැගෙණ කාශ්මීර මණ්ඩලයෙන් (මෙහි පැමිණී සේක.) මහ ප්‍රඥා වූ
38 මහ දේව නම් ස්ථවිර තෙම සාර ලක්ෂ සැට දහසක් භික්ෂූන් රැගෙණ
පල්ලවභොග්ග නම් ජනපදයෙන් (මෙහි පැමිණි සේක.) ඒ මහා
39 ධම්මරක්ඛිත නම් ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් තිස් දහසක් රැගෙණ
යෝනක රට අලසන්දා නම් නුවරින් මෙහි පැමිණී සේක. උත්තර
40 නම් ස්ථවරයන් වහන්සේ භික්ෂූන් සැට දහසක් රැගෙණ වින්ධ්‍යා
වනයෙහි වූ වත්තනිය නම් සෙනස් නෙන් (මෙහි පැමිණි සේක.)
41 චිත්තගුත්ත නම් මහා ස්ථවිරයන් වහන්සේ තිස් දහසක් භික්ෂූන්
රැගෙණ බෝමැලි වෙහෙරින් (මෙහි පැමිණි සේක.) චන්දගුත්ත නම්

Non-Commercial Distribution

42 මහා ස්ථවිරයන් වහන්සේ අසූ දහසක් භික්ෂූන් රැගෙන වනවාස
ප්‍රදේශයෙන් මෙහි වැඩි සේක. සූරියගුත්ත නම් මහා ස්ථවිරයන් වහන්සේ
43 සයානූ දහසක් භික්ෂූන් රැගෙණ කෛලාස විහාරයෙන් මෙහි පැමිණි
සේක. මෙහි පැමිණි ලක්දිව් වැසි වූ භික්ෂූන්ගේ සංඛ්‍යා පරිච්ඡේදයක්
44 සර්වප්‍රකායෙන්පුරාණාචාර්යයන් විසින් නොකියන ලද්දේ ය. ඒ
සමාගමෙහි රැස් වූ සියලු භික්ෂූන් වහන්සේලා අතුරෙන් රහතුන් ම
45 සයානූ කෙළකැයි කියන ලද්දාහුය. ඒ භික්ෂූහු සුදුසු පරිද්දෙන් මහා
චෛත්‍ය ස්ථානය පිරිවරා මධ්‍යයෙහි මහා රජාණන්ට අවකාස තබා
46 සිට ගත්හ. නරේන්ද්‍ර තෙම එහි පිවිස එසේ සිටියා වූ භික්ෂු සංඝයා
දැක ප්‍රසන්න චිත්තයෙන් යුක්තව වැඳ සිත් ඇති වූයේ, සුවඳ මලින්
47 පුදා තුන් වරක් ප්‍රදක්ෂිණා කොට මධ්‍යයෙහි මංගල්‍ය වස්තු සහිත වූ
48 පුන් කලස පිහිටි ස්ථානයට ප්‍රවිෂ්ටව රන් කණුවෙහි බහන ලද රිදීයෙන්
නිම වන ලද්දා වූ සුද්ධ වූ සිසාරණ දද්ධශුද්ධ ප්‍රීතී බල ප්‍රකාශනය
49 ඇත්තේ යහපත් ජාති ඇත්තා වූ සැරසුණා වූ විශේෂයෙන් මංගල වූ
අමාත්‍යයෙකු ලවා අල්වා ගෙණ සත්ත්වයන්ගේ සම්පත්තිය පරායණ
50 කොට ඇත්තේ මහත් වූ චෛත්‍ය මණ්ඩලයක් කරවන්ට කරණ ලද
නිශ්චය ඇත්තේ පිරියම් කරණ ලද බිම සිසාර වන්නට ආරම්භ කෙළේ
51 ය. නමින් සිද්ධාර්ථ නම් වූ මහත් සෘද්ධිමත් වූ දීර්සදර්ශී මහා ස්ථවිරයන්
52 වහන්සේ එසේ කරන්නා වූ නරනිඳුහු වැළකූසේක. (ඒ කුමක්
හෙයින්දයත් ?) "ඉදින් මේ නරෙන්ද්‍ර තෙම මේසා මහත් වූ ථූපයක්
53 කරන්නට ආරම්භ කරන්නේ ද ථූපය නොනිමි කල්හි මොහුට මරණය
පැමිණෙන්නේ ය. පිළිසකර කිරීම දුෂ්කර වූ මහත් වූ සෑයක් ද වන්නේ
54 ය." මෙසේ උන්වහන්සේ අනාගතය දක්නේ මහත් බැව් වැළකූ සේක.
55 සංඝයාගේ අනුදැනීමෙන් ද ස්ථවිරයන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන්
ද ස්ථවිරයන් වහන්සේගේ වචනය පිළිගෙණ මහත් චෛත්‍යයක් කරනු
56 කැමැත්තේ ද ඒ ස්ථිවරයන් වහන්සේගේ උපදේශයෙන් නරේන්ද්‍ර තෙම
ගඩොල් පිහිටුවනු පිණිස මධ්‍යම වූ චෛත්‍ය ස්ථාන මණ්ඩලයක් කෙළේ
57 ය. නොපසුබට වීර්‍යය ඇත්තා වූ නරෙන්ද්‍ර තෙම මණ්ඩලය මධ්‍යයෙහි
රනින් ද රිදියෙන් ද නිමවන ලද කුම්භයන් අට අට තැබ්බ වූයේ ය.
58 එතැනින් (හාත්පස) අටතුරා දහසක් අභිනව කුම්භයන් පිහිට වූයේ ය.
වස්ත්‍රයන් ද එක සිට අට බැගින් තැබ්බ වූයේය. අනේක ප්‍රකාරයෙන්
59 සැරසුණා වූ සම්මත කරණ ලද ඇමතියා ලවා යහපත් වූ ගඩොල් කැට
60 අටක් වෙන් වෙන් වශයෙන් තැබ්බ වූයේ ය. එයින් නානාප්‍රකාර
මංගල ලක්ෂණ වශයෙන් සම්මත කරණ ලද එකක් ග්‍රහණය කරවා
61 පූර්ව දිග් භාගයෙහි මනෝඥ වූ සුවඳ කලලෙහි පළමු වෙනි මඟුල්
62 ගඩොල වසයෙන් සකස් කොට පිහිට වූයේ ය. දැසමන් මලින් පිදූ
63 කල්හි එහි භූමි කම්පා වූයේ ය. අවශේෂ වූ සත ද අමාත්‍යයන් සත්

Non-Commercial Distribution

දෙනෙකු ලවා පිහිට වූයේ ය. මෙසේ යහපත් සේ සම්මත කරණ
64 ලද්දා වූ ඇසළ මස පුර පසළොස්වක් දින ගඩොල් පිහිට වූයේ ය. එහි
සතර දිග වැඩ සිටියා වූ රහත් මහ තෙරුන් පිළිවෙළින් වැඳ පුදා
65 අතිශයින් සතුටු වූ ඒ නරේන්ද්‍ර තෙම ඊසාන දෙසට ගොස් පියද්සි නම්
රහත් මහ තෙරුන් වැඳ උන්වහන්සේ හමුයෙහි සිටියේ ය. ඒ ස්ථවිරයන්
66 වහන්සේ මංගල වර්ධනය කරමින් ඕහට ධර්ම දේශනා කළ සේක.
ස්ථවිරයන් වහන්සේගේ දේශනා තොමෝ ඒ ජනයාහට සාර්ථක විය.
67 සතළිස් දහසක් ප්‍රාණීන්ට (මාර්ග ඵල මුක්තව) ධර්මාවබෝධය වූයේ
68 ය. සතළිස් දහසකට සෝවාන් ඵලය සිදුවිය. දහසක් සකෘදාගාමී වූහ.
එපමණකම අනාගාමී වූහ. එහි ගිහි ජනයන් දහසක්ම රහත් වූහ.
69 අටළොස් දහසක් භික්ෂූහු ද තුදුස් දහසක් භික්ෂූණී හු ද රහත් බැව්හි
පිහිටිය හ.

70 මෙසේ රත්නත්‍රයෙහි ප්‍රසන්න ප්‍රඥා ඇති පරිත්‍යාගයෙහි අධිමුක්ත සිත් ඇති සත්ත්ව සමූහයා කෙරේ හිත වූ (ජනයා කරණ කොට ගෙණ) උතුම් වූ ලෝකාර්ථ සිද්ධිය වන්නේ යයි දැන (ජන තෙමේ) ශ්‍රද්ධාදී නොයෙක් ගුණයන් හා යෙදීමෙහි ඇල්ම කරන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස ථූපාරාම්භ නම් වූ එකුන්තිස්වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් වෙනි පරිච්ඡේදය

1 මහ රජ තෙමේ සියලු සංඝයා වැඳ "චෛත්‍ය කර්මාවසානය
2 දක්වා මාගේ පිණ්ඩපාතය ගන්නා සේක්වා" යි කියා නිමන්ත්‍රණය කෙළේ
ය. සංඝ තෙමේ ඒ පැවරීම නොඉවසූ සේක. හෙතෙම පිළිවෙළින්
සත් දවසක් දක්වා යාච්ඤා කරන්නේ අර්ධයක් භික්ෂු සංඝයාගෙන්
3 සත් දවසක් ඉවසීම ලැබූයේ ය. හෙතෙම ඒ ලැබසතුටු සිත් ඇති වූයේ
ම සෑ තැන හාත්පස අටළොස් තැනෙක මණ්ඩපයන් කරවා එහි සත්
4 දවසක් සංඝයාට මහ දන් පැවැත්වූයේ ය. ඉක්බිති සංඝයා යැවූයේ ය.
5 ඉක්බිති බෙර හසුරුවා වහාම උළු වඩුවන් රැස් කර වූයේ ය. ඔව්හු
පන් සියයක් පමණ වූහ. කෙසේ (ගඩොල්) කරන්නෙහි දැයි විදාළ
6 කල්හි එකෙක් "මම මෙහෙකරුවන් සියයක් ලැබ මැටි ගැලක් ගෙන්වා
එක දවසින් ගඩොල් ඉදිකරමි යි මහරජහට කීයේ ය. රජ තෙම ඒ
7 වැළැක්විය. එයින් අර්ධය අර්ධය මැටි ද මැටි දැමුණක් ද එක එකා
8 කීහු. රජ තෙමේ ඒ වඩුවන් සතර දෙනම වැළැක්වූයේ ය.

9 ඉක්බිති පණ්ඩිත ව්‍යක්ත වූ උළු වඩුවෙක් තෙම (කියන්නේ)
වනෙහි කොටවා කුල්ලෙන් වැඩු කල්හි මම දා ගලෙහි අඹරවා මැටි
10 අමුණක් (එක දවස ගෙවන්නෙමි) මෙහි චෛත්‍යයෙහි තෘණාදීහු ද
නොවන්නාහු යයි නරනිඳුහට කීයේය. මෙසේ කියන ලද්දා වූ ශක්‍රයා
11 හා සමාන පරාක්‍රම ඇත්තා වූ මහීපාල තෙම අනු දත්තේය. "තෝ
කෙසේ සටහන් ඇති චෛත්‍යයක් කරන්නෙහි ද" යි නරේන්ද්‍ර තෙම
12 විචාළේ ය. එකෙණෙහිම විශ්ව කර්ම දේව පුත්‍ර තෙම උහුට ආවිෂ්ට
වූයේ ය. වඩු තෙම රන් තලියක් ජලයෙන් පුරවා අතින් දිය ගෙණ දිය
13 පිට ගැසූයේ ය. (එකල පළිඟු ගුලියක් සමාන වූ) මහ දිය බුබුලක්
නැංගේය. "මෙබඳු සටහන් ඇත්තක් කරන්නෙමැ" යි කීයේ ය. මහීපතී
14 තෙම සතුටුව උහුට දහසක් අගනා වූ වස්ත්‍ර යුග්මයක් ද එසේම ආභරණ
හා (දහසක් අගනා) වහන් සඟලක් ද කහවනු දොළොස් දහසක් ද
15 දෙවුයේ ය. රජ තෙමේ "මිනිසුන් නොපෙළා කෙසේ ගඩොල්
ගෙන්වම්දැ" යි රාත්‍රියෙහි සිතුයේ ය. දෙවියෝ ඒ සිත දැන එක එක
16 දවසට පොහොනා ගඩොල් එක එක රැයට ගෙණවුත් චෛත්‍යයාගේ
සත ර දොර තැබුවාහු ය. ඒ අසා සතුටු සිත් ඇත්තා වූ රජ තෙම
17 චෛත්‍ය කර්මය ආරම්භ කළේ ය. මෙහි නොමිලයේ කර්මයක් නොකට
18 යුතු යයි ද දැන්වූයේ ය. එක එක දොර සොළොස් ලක්ෂය බැගින්
කහවනු ද ඉතා බොහෝ වූ වස්ත්‍රයන් ද තැබ්බ වූයේ ය. නානාප්‍රකාර
19 ආභාරණ ද පාන වර්ග සහිත වූ ඛාද්‍ය භෝජ්‍යයන් ද සුවඳ මල් උක්

Non-Commercial Distribution

සකුරු ආදිය ද මුව සුවඳ කරන්නා වූ තකුල් කපුරු ආදී වූ භෛෂජ්‍ය
20 පංචකය ද "රිසි වූ පරිද්දෙන් කර්මාන්තය කොට ඒ දෙය රිසි සේ
ගනිත්වා" යි කියා තැබ්බ වූයේ ය. රජහුගේ ඒ කම්කරුවෝ එසේම
බලා දුන්හ.

21 භික්ෂූහු කෙනෙක් සෑකම්හි සහාය බැව් පතන්නේ තමන් විසින්
22 කරන ලද මැටි පිඩක් ගෙණ චෛත්‍ය ස්ථානට පැමිණ රජහුගේ
කම්කරුවන් රවටා එය වඩුවාට දුන්නේ ය. හෙතෙම ගනිමින්ම දැන
23 ගත්තේ ය. ඒ භික්ෂූහුගේ ආකාරය දැන ඒ වඩුවාට කුහුල් උපන
පිළිවෙළින් රජ තෙම ඒ අසා ආයේ වඩුවා විචාළේ ය. "දේවයන්
24 වහන්ස! භික්ෂූහු එක් අතකින් මල් ගෙණ එක් අතකින් මට මැටි පිඩු
දෙන්නාහු ය. මම වනාහි මේ ආගන්තුක භික්ෂුය. මේ නේවාසික යයි
25 නොම දනි මැ" යි කී බස් අසා මැටි දුන් භික්ෂුන් දක්වන පිණිස එක්
26 බල තෙකු දුන්නේ ය. හෙතෙම බලතාට දැක්වූයේ ය. ඒ බලත් තෙම
නරෙන්ද්‍රයාට සැල කෙළේ ය. ඒ නරෙන්ද්‍ර තෙම බලතා ලවා මහබෝ
27 මළුවෙහි දෑසමන් කැකුළු කළ තුනක් තබ්බවා භික්ෂුහට දෙවූයේ ය.
28 නොදැන ඒ පුදා සිටි භික්ෂූහට බලත් තෙම (නය ගෙවීම බව) දැන්වූයේ
ය. ඒ භික්ෂු තෙම එකල එය දැන ගත්තේ ය. කේලිවා ජනපදයෙහි
29 පියඟල් වැසි වූ ඒ උළු වඩුවාට නෑයෙක් වූ ස්ථවිර කෙනෙක් චෛත්‍ය
කර්මයෙහි සහායත්වය පතන්නේ මෙහි පැමිණයේ එහි ගඩොල් හැඳින
30 ගෙණ ඒසා, ගඩොලක් කොට මෙහෙකරුවන් රවටා එය වඩුවාට දුන්නේ
31 ය. හෙතෙම එය එහි යෙදූයේ ය. කෝලාහල ද විය. රජ තෙම ඒ අසා
ඒ ගඩොල දත හැකි දැයි විචාළේ ය. වඩු තෙමේ දනිමින් නොදනිමැයි
32 රජහට කීයේ ය. තෝ ඒ තෙරුන් දන්නෙහි දැයි කියන ලද්දා වූ
33 හෙතෙම එසේ යයි කීයේ ය. ඒ දන්වන පිණිස මිහිපති තෙම ඕහට
බලතෙක් පැමිණ වූයේ ය.

බලත් තෙමේ එයින් තෙරුන් හැඳින රජහුගේ අනුඥානයෙන්
34 එළඹීයේ කට්ඨාහල පිරිවෙන්හි දී තෙරුන් දැක එක්ව කථා කොට තෙරුන්
35 වඩනා දවස ද වැඩි තැන ද දැන "නුඹ වහන්සේලා සමග සිය ගමට
යමැ" යි කියා (පෙරලා අවුත්) රජහට සියල්ල දැන්වූයේ ය. රජ තෙමේ
36 දහසක් අගනා පිළි සඟලක් ද මාහැඟි රක්තකම්බලයක් ද බොහෝ
ශ්‍රමණ පරිෂ්කාර ද සකුරු ද සුවඳ තෙල් නැළියක් ද ඒ බලතාට දෙවීය.
37 (ඒ සියල්ල දෙවා) ඔහුට අනුශාසනා කෙළේ ය. ඒ තෙමේ තෙරුන් හා
38 ගොස් පියගලු වෙහෙර පෙණෙන තැන්හි දී තෙරහු දිය සම්ප වූ සිහිල්
39 සෙවනෙක හිඳුවා, සකුරු හා පැන් පොවා තෙලින් දෙපා මැඩ වහන්
40 යොදා පිරිකර එළවීය. "මේ පිරිකර මා කුලුපග තෙර කෙනෙකුට හැර

Non-Commercial Distribution

ගන්නා ලද්දා හ. මේ වස්ත්‍ර යුග්මය මා විසින් පුත්‍රයාහට ගන්නා ලද්දේ
41 ය. ඒ සියල්ල නුඹ වහන්සේට දෙමි" මෙසේ කියා ඒ පිරිකර දී පිරිකර
රැගෙන වඩනා තෙරුන්ට වැඳ රජහු බසින් රජහුගේ පණිවුඩය ඒ තෙමේ
කීයේ ය.

42 මහ සෑය කරනු ලබන කල්හි බැල මෙහෙකරු වූ බොහෝ
43 ගණන් මනුෂ්‍යයෝ ප්‍රසන්න වූවෝ සුගතියට ගියෝ ය. බුදුන් කෙරෙහි
චිත්ත ප්‍රසාද මාත්‍රයෙන් උතුම් ගති ලබන්නේ යයි දන නුවණැත්තේ
44 චෛතිය පූජාව කරන්නෙයි. මෙහිම බැල මෙහෙ කොට ස්ත්‍රියෝ
45 දෙදෙනෙක් තව්තිසා දෙව්ලොව උපන්නෝ මහ සෑය නිමි කල දෙදෙන
පූර්ව කර්ම ආවර්ජනා කොට ගඳ මල් ගෙන සෑය පුදන්නට ආවාහු
46 ගඳින් මලින් සෑය පුදා අභිවාදනය කළෝ ය. ඒ වේලායෙහි භාතිවංක
විහාර වාසී මහා සිව ස්ථවිර තෙම රාත්‍රි භාගයෙහි මහා සෑය වඳනෙමැයි
47 ආසේක් එවුන් දෙදෙනා දක මහා සප්තපර්ණි රුක ඇසුරු කොට
48 සිටියේ, තමා නොදන්කා අද්භූත සම්පත් දකිමින් සිටගෙණ ඔවුන්ගේ
වන්දනා අවසානයෙහි ඔවුන් විචාරමින් සියලු ලක්දිව තොපගේ ශරීර
49 ලෝකයෙන් හෙබෙයි. මෙහි තොපි කවර පුණ්‍ය කර්මයක් කොට
මෙයින් දෙව්ලොව ගියාහු දැ යි විචාළ සේක. දෙව් දුහු මහ සෑයෙහි
50 කළකම් උන්වහන්සේට කිවුය. මෙසේ බුදුන් කෙරෙහිම ප්‍රසාදය තෙම
මහත් ඵලයි.

51 මහ සෑයෙහි මල් අසුන් තුන ගඩොලින් ඉදි කරණ ලද්දේ නිම
වන ලදි. ඍද්ධිමත්හු පෘථිවිය සම කොට පොළෝ ගිල්ල වූහ. නව
52 වරෙක්හි ඉදි කරණ ලද සියල්ල මෙසේම ඒ ඍද්ධි මත්හු පොළෝ
53 ගැල්ල වූහ. ඉක්බිති මහරජ තෙමේ භික්ෂු සංඝ සන්නිපාතය කරවී. ඒ
54 සන්නිපාතයෙහි අසූ දහසක් භික්ෂුන් කරා රජ තෙමේ එළඹ පුදා වැඳ
ගඩොල් ගැල්මෙහි හේතුවෙන් විචාළේ ය. සංඝ තෙම විසඳුයේ ය. "
55 මහරජාණෙනි! සෑය නොගිලෙන පිණිස ඍද්ධිමත් භික්ෂුන් විසින් මේ
කරණ ලදි, දන් නොකරනු ලැබෙයි. අන්‍යථා භාවයක් නොකොට ඒ
56 මහා සෑය නිමවව." ඒ අසා පහන් සිත් ඇති රජ තෙමේ සෑකම් කරවීය.
මල් අසුන් දසයෙහි ගඩොල් දස කෙළෙක්හ. භික්ෂු සංඝ තෙමේ
උත්තර සාමණේරය, සුමන සාමණේරය යන දෙදෙනා චෛත්‍යයාගේ
57 ධාතු ගර්භ පිණිස මෙවන් පහන් ගෙණ එව්ය" යි මෙහෙයුහ. ඒ
58 දෙදෙනා උතුරුකුරු දිවයින් ගොස් අසූ රියන් දිගපුළුලු හිරු මඬුලු සේ
බබළන අටගුල් බොල් ගැටුපුප් බඳු යහපත් මේවන් පහන් සයක්
59 ක්ෂණයකින් ඒ උතුරුකරු දිවයිනෙන් ගෙන අවුය. මල් යහන් මතුයෙහි
60 මැද ඉන් එක් ගලක් අතුට සතර දිග්හි සතරක් පෙට්ටියක් සේ වසා එක්

Non-Commercial Distribution

61 ගලක් පියත් පිණිස නැගෙණහිර දිශා භාගයෙන් අදර්ශන කොට මහර්ධි ඇති ඔවුහු තැබූහු.

62 රජ තෙමේ ඒ දාගැබ මැද සර්වාකාරයෙන් මනෝරම්‍ය වූ රුවන්
63 මුවා බෝ රුකක් කරවීය. ඒ බෝ රුක අටළොස් රියන් කඳ ය. එහි
අතු පසෙක පබළුමුවා මුල ඉඳුනිල් බිම පිහිටියේ ය. ඉතා ශුද්ධ රිදී
64 කඳය. මිණි මුවා පතින් හෙබියේය. රුවන් මුවා පාණ්ඩු පුත්‍ර ඵල
ඇත්තේය. පබළු මුයා අකුරු දළු ඇත්තේය. ඒ බෝ කඳ අෂ්ට
65 මංගලිකාය, පුෂ්පලතාය, සිවුපා පන්තිය හොබනා හංස පන්තිය, උඩ
66 හැසිරෙන වියන් කෙළ මුතු හා කිකිණි දූල් ය. රන් කලස මාලාය, ඒ
67 ඒ තන්හි මල්දම්හ. වියන සිවු කොන්හි මුතුමය කලාප ඇත්තේය.
68 එල්වන ලද බන් එකි එකී කලාපයක් නව ලක්ෂයක් අගනේ වී. හිර
69 සඳ තාරකා රූපයන් ද නොයෙක් පියුම් ද රුවනින් නිමවන ලද්දා වූ
70 වියනෙහි අමුණන ලද්දාහ. අනේක ප්‍රකාර මහඟු වර්ණ ඇති අටතුරා
දහසක් වස්ත්‍රයන් ද වියන්හි එල්වන ලද්දාහුය. බෝධිය පිරිකෙව්
කොට නන් රුවන් පිළිකඩය, මහ ඇඹුලුපලසා මුතුයෙන් ඒ පිළිකඩ
71 අතුරෙහි අතුරණ ලද්දේ ය. නානා රත්නමය පුෂ්පයෙන් ද සිවු දෑ ගඳ
72 දියෙන් ද පිරුනා වූ පූර්ණඝට පංක්තීහු බෝමුල තබන ලද්දාහ. බෝධිය
නැගෙණහිරින් පණ වන ලද අනර්ඝ පයඞ්කරයෙහිත් භාස්වර වූ රන්
73 මුවා බුදු පිළිමයක් හිඳු විය. ඒ පිළිරුව ශරීර අවයවයෝ සුදුසු පරිද්දෙන්
74 නානා වර්ණ රුවනින් කරන ලද්දාහු ඉතා හෙබූහ. රිදී ශ්වේතච්ඡත්‍ර
ධර මහා බ්‍රහ්ම තෙමේ එහි තබන ලද්දේ ය. අභිෂේකදායක ශක්‍ර ද
75 ජයතුරා සකින් යුක්ත කොට තබනු ලැබීය. වීණා ගත් අත් ඇති
76 පංචසිඛය නාටිකාවන් සහිත කාළනාග රාජය ඇතු හා පිරිවර සහිත
දහසක් අත් ඇති මාර ද එහි තබන ලදහ. නැගෙණහිර පයඞ්කය
77 සෙයින් සෙසු තුන් දිසාහි ද කෙළක් කෙළෙක් වස්තු අගනා පයඞ්කයෝ
අතුරණ ලද්දා හ. බෝධියට ඉසලා නන් රුවනින් සරසන ලද කෙළෙක්
78 වස්තු අගනා මහ සයනය පණවන ලද්දේ වී සත් සති යවන තන්හි ඒ
79 ඒ තැන සුදුසු පරිද්දෙන් ප්‍රධාන ක්‍රියා ද, බ්‍රහ්මරාධානාව ද කරවිය.
80 දම්සක් පැවතුම යශස්ථවිරයන්ගේ පැවිද්ද, භද්‍ර වර්ගීය කුමරුවන්
81 පැවිද්ද, ජටිල දමනය බිම්බිසාර රජහුගේ එළඹීම රාජ ග්‍රහ ප්‍රවේශනය,
82 වේළුවනය පිළිගැන්ම එසේම අසූමහ සව්වන්ය, කිඹුල්වත් ගමන එසේම
83 රුවන් සක්මන රාහුල කුමරහු නන්ද කුමරහු පැවිද්ද, දෙව්රම් වෙහෙර
පිළිගැන්ම, ගණ්ඩම්බරුක් මුළ පෙළහර, තව්තිසා දෙව් ලෙව්හි දේශනාව
දේවාරෝහණ පෙළහර ස්ථවිර ප්‍රශ්න සමාගම මහා සමය සූත්‍රාන්තය,
84 රාහුලෝවාද සූත්‍රාන්තය, මහ මංගල සූත්‍රාන්තය, ධනපාල සමාගමය
85 ආලවක දමනය, අඟුල්මල් දමනය, අපලාල දමනය, පාරායණ සමාගම,

Non-Commercial Distribution

86 එසේම ආයු සංස්කාරය හැරීම සූකරමාංස ප්‍රතිග්‍රහණය, ශෘඟීස්වර්ණ
වස්ත්‍ර යුග්ම ග්‍රහණය, පහන් දිය වැළඳීම පිරිනිවන් පෑම, දෙව් මිනිසුන්
87 විලාපය, කසුප් තෙරුන් විසින් පා වැඳීම දර සෑයෙහි දූව ගිනි නිවීම
88 එහි සත්කාර ද්‍රෝණ බමුණු විසින් ධාතු බෙදීම බොහෝ සෙයින්
ජාතකයන් ය යන මෙතෙක් දෑ මනා ජාති ඇති රජ තෙමේ කරවී ය.

89 වෙස්සන්තර ජාතකය වනාහි විස්තරයෙන් ද , එසේම තුසිත
පුරය පටන් බෝ මැඩ තෙක් විස්තරයෙන් ද කරවී. සතර දිග ඒ
90 සතරවරම් මහරජහු සිටියාහු ය. තෙතිසක් දෙව් පිත්හුය. එසේම
91 දෙතිසක් කුමරියෝ ය, අටවිසි යක් සෙනෙවියෝ ය, ඉන් හත්තෙහි
ඇඳිලි බැඳ ගත් දේවතාවෝ ය, ඉන් මතුයෙහි මල් සම්ත පූර්ණඝටය,
92 නටන දේවතාවෝ ය, තූර්‍ය වාදනය කරණ දේවතාවෝ ය, කැඩපත්
93 ඔසවා ගත් දේවතාවෝ ය, එසේම මල් අතු ගත් දේවතාවෝය,
පියුම්ගත් දේවතාවෝ ය, නොයෙක් පරිද්දෙන් අතිකුත් දේවතාවෝ
ය, රන් ඇගෑපෙළ දම්සක් පෙළ කඩු ගත් දේවතා පංක්තිය, එසේම
94 පාත්‍ර ගත් දේවතා පංක්තිය, උන්ගේ හිස ගන්ධ තෛලයෙන් පුරවන
ලද්දා වර්ෂූ පස් රියන් දුහුල්පට පහන් වැටි පෙළ හැම කල් අවුලන
95 ලද්දාහ. පිළිම්ණි ඇගෑකොණ එකෙකි මහඟු මිණිරුවන, රුවන්ය,
96 මිණිය මුතුය විදුරුය යන මෙයින් එකි එකී ගොඩක් බැගින් ප්‍රභාස්වර
සතර ගොඩක් සතර කොණ කරණ ලද්දේ ය. මෙවන් පහන් බිතුයෙහිම
දිලියෙන්නා වූ විදුලීහු අලවන ලද්දා හු ධාතු ගර්භයෙහි හෙබියා ය.
97 මේ මනරම් දාගැබ්හි සියලු රෑම සණ වූ තැළූ රනින් මිහිපල් තෙමේ
98 කරවීය. ෂට්අභිඥා හා මහා ප්‍රඥා ඇති ඉන්ද්‍රගුප්ත මහා ස්ථවිර
99 කර්මාධිෂ්ඨායක සේක් මේ සියල්ල මෙහි නිධාන කළ සේක. මේ
සියල්ල රාජර්ධියෙන් දෙවතාර්ධියෙන් ආර්යර්ධියෙන් නොගැටී පිහිටන
ලද්දේ ය.

100 තමහට සුව පතන්නු විසින් අවශ්‍යයෙන් පිදිය යුතු ලෝකොත්තම
වූ අවිද්‍යාදි තමස් රහිත ජීවමාන බුදුහු ද උන් වහන්සේ දැවූ තැන
විශීර්ණ ද පුදා ලබන පින් සමයි. සැදැහැ ගුණයෙන් සැරහුණු
නුවණැත්තේ එය එසේ දැන මේ බුදුන් ධාතු ද දිමවන් බුදුහු සෙයින්
යෙහෙන් පූජා කරන්නේ ය.

මෙතෙකින් හු දී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස ධාතු ගර්භ වන නම් තිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් එක් වෙනි පරිච්ඡේදය

1 නරෙන්ද්‍ර තෙම ධාතු ගර්භයෙහි කම් නිමවා සංඝයා රැස් කරවා
2 "ස්වාමීනි ධාතු ගර්භයෙහි කටයුතු කර්මයෝ මා විසින් නිම වන ලද්දා
හු ය. සෙට දින ධාතු නිධාන කරන්නෙමැ" යි මේ වචනය සැල
කෙළේ ය. මහරජ තෙමේ මේ වචනය කියා නුවරට වන්නේ ය.
3 ඉක්බිත්තෙන් භික්ෂු සංඝ තෙම ධාතු ගෙණ ඒම කරුණු හැකි වූ යති
4 නමක් සිතා පුද පිරිවෙන් වැසි ෂට්අභිඥා ප්‍රාප්ත වූ සොණුත්තර නම්
යතිහු ධාතු ගෙණ ඒම් කර්මයෙහි යෙදූ සේක.

5 ලෝක ස්වාමී වූ සර්වඥයන් වහන්සේ ලෝවැඩ පිණිස (ලොව)
සැරිසරා වඩනා කල්හි ගංගා නදී තීර වාසීනන්දුත්තර නම් මානවකයෙක්
තෙම සංඝයා සහිත වූ සම්බුදුන් පවරා වැළඳ වූයේ ය. ශාස්තෲන්
6 වහන්සේ පයාග පතිට්ඨාන නම් තොට දී සංඝයා සහිතව නැව් නැගී
7 සේක. එම් (වැඩහුන්) ෂඩ්අභිඥා ඇති මහත් සෘද්ධිමත් වූ භද්‍රජිත් නම්
8 ස්ථවිර තෙම (ගඟමැද) දිය පැකිළෙන තැනක් දැක භික්ෂුන්ට මේ වචනය
වදාළේ ය. "මහාපණාද නම් (රජ) වූ මා විසින් වසන ලද පස්විසි
9 යොදුන් ප්‍රාසාදය තෙම මෙහි වැටුණේ ය. ගංගාවේ ජලය තෙම ඒ
පහයට පැමිණ මෙහි පැකිලෙයි." භික්ෂුහු එය නොඅදහමින් ශාස්තෲන්
10 වහන්සේට එය සැල කළාහු ය. භික්ෂුන්ගේ ශංකාව දුරු කර ව" යි
සර්වඥයන් වහන්සේ වදාළ සේක. ඉක්බිත්තෙන් ඒ ස්ථවිරයන් වහන්සේ
11 බඹ ලොව ද වසයෙහි පවත්වනු සමර්ථ භාවය හඟවනු පිණිස
සෘද්ධියෙන් අහසට නැගී සමසත් තලක් තන්හි වැඩ සිටි සේක් දිගු
12 කරණ ලද හස්තයෙහි බඹ ලොව සළුමිණි සෑය තබා ගෙණ මෙහි
ගෙණ අවුත් ජනයාට දක්වා එය නැවත එහි තිබුණ තන්හි තබා
සෘද්ධියෙන් ගංගාවට පැමිණි උන්වහන්සේ පය මාපට ඇඟිල්ලෙන්
13 ප්‍රාසාද කොත් කැරැල්ල අල්වා ගෙණ ඔසවා ජනයාට දක්වා එය එහිම
14 බහාලු සේක. නන්දුත්තර නම් මානවක තෙම ඒ ප්‍රාතිහාර්‍යය දැක, "
15 මම අනුන් අයත් වූ ධාතු ගෙණ එන්ට පොහොසත් වෙම්" යි ප්‍රාර්ථනා
කෙළේ ය. එහෙයින් සංඝ තෙමේ මේ සෝණුත්තර නම් භික්ෂුහු
සොළොස් වස් නමුත් ඒ කර්මයෙහි යෙදූ සේක. ඒ සෝණුත්තර යති
16 තෙම "කොයින් ධාතු ගෙණ එම් දැ" යි සංඝයා පිළිවිසයේ ය. සංඝ
17 තෙම ඒ ස්ථවිරයන්ට ඒ ධාතු මෙසේ වදාළ සේක. "පරිනිර්වාණ
මංචකයෙහි වැදහොත්තා වූ ලෝක ස්වාමී තෙම ධාතුන් කරණ
කොට ගෙණ ද ලෝ වැඩ කරන්නට ශක්‍ර දේවේන්ද්‍රයාට (මෙසේ) වදාළ
18 සේක. "දේවේන්ද්‍රය මාගේ ශරීර ධාතු ද්‍රෝණ අට අතුරෙන් එක්
ද්‍රෝණයක් රාම ගම කෝලිය රජුන් විසින් ද සත්කාර කරණ ලද්දේ

Non-Commercial Distribution

19 එයින් නාලොවට ගෙණ යන ලද්දේ නයින් විසින් පුදන ලද්දේ එයින්
20 ලක්දිව මහා ථූපයෙහි නිධානය පිණිස වන්නේ ය. දීර්ඝ දර්ශී වූ මහා
කාශ්‍යප මහාස්ථවිර තෙමේ ද, ධර්මාශෝක නරේන්ද්‍රයන් විසින් ධාතු
21 පතුරුවන කාරණයෙන් රජගහ නුවර සමීපයෙහි අජාසත් රජහු ලවා
මහා ධාතු නිධානය කරවන සේක් ධාතූන් සම්බන්ධි වූ ද්‍රෝණ සතක්
22 ගෙණවුත් යහපත් සේ රැස් කොට කරවූ සේක. සර්වඥයන් වහන්සේගේ
23 සිත දන්නා සේක් රාමගම තුබූ ද්‍රෝණය නොගත්සේක. ධර්මාශෝක
මහීපාල තෙමේ ද ඒ මහා ධාතු නිධානය දැක අටවෙනි වූ ද්‍රෝණය
24 ගෙන්වන්නට මතියක් කෙළේ ය. එහි රහත් භික්ෂූහු සර්වඥයන්
වහන්සේ විසින් එය මහා ථූපයෙහි නිධානය පිණිස නියම කරණ
25 ලද්දේ ය" යි ධර්මාශෝක නරේන්ද්‍රයන් වැලැක්වූ සේක. රාමගම්හි වූ
ථූපය වනාහි ගං ඉවුරෙහි කරණ ලද්දේ ය. එහෙයින් ගංගායෙහි මහා
ජල ප්‍රවාහයෙන් බිඳුණේ ය. ඒ ඒ ධාතු කරඬුව වනාහි සමුද්‍රයට ප්‍රවිෂ්ටව
26 එහි ජලය දෙබෙව බුන්කල්හි නානාවිධ රත්නයන් මස්තකයෙහි
27 රශ්මියෙන් ගැවසී සිට ගත නාගයෝ ඒ කරඬුව දැක මාඤ්ජේරික නම්නාග
28 භවනයට ගොස් කාළ නම් නා රජහට දැන්වූහ. ඒ නාග රජ තෙම දස
කෙළ දහසක් නාගයන් හා සමග එහි ගොස් ඒ ධාතූන් විශේෂයෙන්
29 පුදන්නේ ස්වකීය භවනයට පමුණුවා, සර්ව රත්නමය වූ ථූපයක් ද
එසේම ඒ මත්තෙහි ගෙයක් ද නිර්මිත කොට ආදර සහිත වූයේ නාගයන්
30 සමග සැම කල්හි පුදයි. එහි ආරක්ෂාව මහ. ගොස් ධාතූන් මෙහි
31 ගෙණ එව, සෙට දින මහීපාල තෙම ධාතු නිධානය කරන්නේ ය. ඒ
යති තෙම වනාහි මෙසේ වදාරණ ලද්දා වූ සංඝයාගේ ඒ වදනය අසා
මැනවැයි කියා යා යුතු කාලය බලමින් ස්වකීය වූ පිරිවෙණට පැමිණි
32 සේක. මිහිපති තෙම සෙට ධාතු නිධානය වන්නේය" කියා නුවර බෙර
33 හැසිර වූයේ ය. සියලු කටයුතු විධාන කොට ඒ මුළු නුවර ද මෙහි
එන්නා වූ මාර්ගය ද සකස් කොට සැරස වූයේ ය. නුවර වැස්සන් ද
34 අලංකෘත කරවූයේ ය. සක්දෙව් රජ තෙමේ ද විස්කම් දෙව් පුත් කැඳවා
මුළු ලක්දිව නොයෙක් පරිද්දෙන් සැරස වූයේ ය. නරේශ්වර තෙම
35 පුරයාගේ සතර දොර මහ ජනයාගේ උපභෝගය පිණිස අනේක
ප්‍රකාරයෙන් බත් හා වත් තැබ්බ වූයේය.

රාජ කෘත්‍යයන්හි විචක්ෂණ වූ නරේන්ද්‍ර තෙම පසළොස්වක්
36 පොහෝ දින සවස් වේලෙහි යහපත් සිත් ඇත්තේ සර්වාභරණයෙන්
සැරසුණේ, සියලු නාටිකාවන් විසින් ද ආයුධ සහිත වූ යෝධයන්
37 විසින් ද, මහත් වූ සේනා සමූහයා විසින් ද, අ ැත් අස් රථ සේනාවන්
38 විසින් ද නානා ප්‍රකාර වූ ආභරණයෙන් ද සියලු දෙසින් පිරිවරණ
39 ලද්දේ යහපත් වූ ධවල සෛන්ධවරයන්සතර දෙනෙකු යොදන ලද

Non-Commercial Distribution

යහපත් වූ රථයට නැඟු සරසනලද්දා වූ යහපත් කඬුලැතු පෙරටු කොට
40 රන් කරඬුවක් ගත්තේ සේසත යට සිටියේ ය. අටතුරා දහසක් පුරුෂයෝ
ද යහපත් පුන් කලස් හා ආභරණ ඇත්තා වූ යහපත් ස්ත්‍රීහු ද ඒ රථය
41 පිරි වැරූහ. ඒ ඒ පමණ වූ නානාවිධ වූ මල් සුමුගු ද එසේම දඬුවැට
42 පහන් ද දරාගෙණ ස්ත්‍රීහු පිරිවැරූහ. මොනවට සරසන ලද්දා වූ
අටතුරා දහසක් ළදරුවෝ නානා වර්ණ වූ යහපත් ධ්වජයන් ගෙණ
43 පිරිවැරූ හ. ඒ ඒ තන්හි නානාවිධ තූර්‍ය්‍ය ශබ්දයෙන් ද පොළෝ තල
බිඳිනු ලබන සේ වූ කල්හි ශෝභාවෙන් යුක්ත ව මහමෙවුනා උයනට
44 යන්නා වූ ඒ මහා යසස් ඇති නරේන්ද්‍ර තෙම නඳුන් වන වදනා සක්
45 දෙව් රජහු සෙයින් බැබළීය. පිරිවෙන වැඩහුන් සෝණුත්තර යති
තෙමරජහුගේ නිෂ්ක්‍රමණාරම්භයෙහි නගරයෙහි මහත් වූ තූර්‍ය්‍ය ශබ්දය
46 අසා පොළොව කිමි ද වහා නාග භවනයට වැඩ එහි නා රජහු ඉදිරියෙහි
පහළ වූ සේක.

47 නා රජ තෙම හුනස්නෙන් නැඟී වැඳ උන්වහන්සේ පළඟෙහි
48 හිඳුවා සත්කාර කොට ආවා වූ දේශය පිළිවිසියේය. එය වදාළ කල
නැවතත් තෙරුන් වහන්සේ වැඩිය කරුණ විචාළේ ය. ඒ ස්ථවිර
තෙම සියලුම කරුණු කියා සංඝයාගේ හස්න වදාළේ ය. "සර්වඥයන්
49 වහන්සේ විසින් මහා ථූපයෙහි නිධාන කරණු පිණිස නියම කර වදාරණ
ලද්දා වූ ධාතූහු මෙහි තොපගේ හස්තප්‍රාප්ත වූහ. ඒ ධාතූන් තෝ මට
50 දෙව" ඒ අසා අතිශයින් නො සතුටු වූ සිත් ඇත්තා වූ නාග රාජ තෙමේ
මේ ශ්‍රමණ තෙම බලාත්කාරයෙන් ගන්නට ද සමර්ථය. එහෙයින්
51 ධාතූහු අන් තැනෙක පැමිණ විය යුතුය" යි සිතා එහි සිටි බෑණනුවන්ට
52 ආකාරයෙන් දැන්වූයේ ය. නමින් වාසුලදත්ත නම් හෙතෙම ඔහුගේ
ඉඟි දැන ඒ චෛත්‍ය මන්දිරයට ගොස් ඒ කරඬුව ගිල මේරු පර්වතය
53 පාදයට ගොස් කුණ්ඩලාවර්තව ශයනය කෙළේ ය. තුන් සියයක් යොදුන්
දීර්ඝ වූ ශරීර ඇති විය. දරණය යොදුනක් අවට ඇත්තේ ය. නොයෙක්
54 දහස් ගණන් පෙණ ද මවන ලද්දාහ. ඒ මහත් ඍද්ධිමත් තෙම ශයනය
55 කොට දුමන්නේ ය. ගින්නෙන් ප්‍රජ්වලිත වන්නේ ය. නොයෙක් දහස්
ගණන් තමන් සමාන වූ නයින් මවා හාත්පස පිරිවර කොට ශයනය
56 කර වූයේ ය. එකල්හි බොහෝ වූ දෙවියෝ ද නාගයෝ ද "නාගයන්
දෙදෙනාගේ යුද්ධය අපි බලම්හ" යි එහි රැස් වූහ. මයිල් නා රජ තෙම
57 බෑණනුවන් විසින් ඒ ධාතූහු ගෙණ යන ලද්දාහු යයි සිතා මා ළඟ ධාතු
නැතැ යි ඒ ස්ථවිරයන්හට කීයේ ය.

58 ස්ථවිරයන් වහන්සේ ඒ ධාතුවන්ගේ ගමනය මුල පටන් දැන
59 "ධාතු දෙව" යි ඒ නා රජහට කීසේක. ඒ නා රජ තෙම අන් පරිද්දෙකින්

Non-Commercial Distribution

හඟවන පිණිස ඒ තෙරුන් ගෙණ චෛත්‍ය මන්දිරයට ගොස් උන්
60 වහන්සේට එය වර්ණනා කෙළේ ය. නොයෙක් රත්නයෙන් "නොයෙක්
පරිද්දෙන් සකස් කරන ලද්දා වූ මොනවට නිර්මිත කරන ලද චෛත්‍යය
61 ද සෑ ගෙය ද ශ්‍රමණය බලව. මුළු ලක්දිව එරත්නයෝත් (මේ) හිණි මුල
62 සඳකඩ පහණටත් නො අගනු හය. අන්‍ය වූ වස්තූන් කෙරෙහි කවර
වර්ණනාවෙක් ද? ශ්‍රමණය නුඹ වහන්සේලා විසින් මහා සත්කාර
පවත්නා තෙනින් ස්වල්ප සත්කාර පවත්නා තැනකට මේ ධාතූන් ගෙණ
63 යාම නම් අයුත්තෙක "නාගය තොපට ද සත්‍යාවබෝධය නැත්තේ ය.
64 ධාතූන් සත්‍යාවබෝධය ඇත්තා වූ තැනකට ගෙණ යා යුතු ය.
65 තථාගතයෝ තුමූ සසර දුක් මිදීම පිණිසමඋපදිති. සර්වඥයන්
වහන්සේගේ මේ අභිප්‍රාවෙකි. ඒ කරණ කොට ගෙන ධාතූන් ගෙණ
66 යම්හ. ඒ රජ තෙම වනාහි ධාතු නිධානය අදම කරන්නේ ය. එහෙයින්
ප්‍රපංච නොකොට වහාම මට ධාතූන් දෙව" යි කී සේක. "වහන්ස!
67 ඉදින් නුඹ වහන්සේ ධාතූන් දක්වෙනහි නම් ගෙණ යව" යි නාග තෙම
කීයේ ය.

68 ස්ථවිර තෙම ඒ වචනය ඔහු ලවා තුන් වරක් කියවා ගෙණ එහි
වැඩ සිටියේම සියුම් අතක් මවා එකෙණෙහිම නා රජහු බෑණනුවන්
69 මුඛයෙහි අත බහා. දා කරඬුව ගෙණ "නාගය සිටුව" යි කියා පොළොව
70 කිමිද ගෙණ පිරිවෙණෙහි නැගී සිටි සේක. නාග රාජ තෙම "අප
විසින් රවටන ලද භික්ෂු තෙම ගියේය" යි සිතා ධාතූන් ගෙණෙන
71 පිණිස බෑනණුවන්ට හසුන් යැවීය. ඉක්බිති බෑන තෙමේකුසෙහි කරඬුව
72 නො දැක හඬමින් අවුත් මාමාට දැන් වූයේ ය. එකල ඒ නා රජ තෙමේ
ද "අපි රවටන ලද්දම්හ" යි සිතා හැඬුයේ ය. පෙළුණා වූ සියළුම
73 නාගයෝ හැඬූහ. රැස් වූ දෙවියෝ භික්ෂූ ශ්‍රෙෂ්ඨයන්ගේ ජයෙහි සතුටු
74 වූවෝ ඒ ධාතූන් පුදන්නෝ උන්වහන්සේ සමග ආවෝ ය. නාගයෝ
හඬමින් අවුත් ධාතු ගෙණ ඊමෙන් දුක් පත් වූවෝ සංඝයා සමීපයෙහි
බොහෝ සෙයින් හැඬූහ. සංඝ තෙම අනුකම්පාවෙන් ඔවුන්ට ධාතු
75 ස්වල්ප මාත්‍රයක් දෙවු යේ ය. එයින් සතුටු වූ ඔව්හු ගොස් පූජා
76 භාණ්ඩයන් ගෙණ චෝ ය. සක් දෙව් රජ තෙම රුවන් පලඟක් හා රන්
77 කරඬුවක් ගෙණ දෙවියන් හා සමග ඒ ස්ථානයට ආයේ ය. තෙරුන්
වහන්සේ නැගුණ තන්හි විස්සම් දෙව් පිත් ලවා කරවන ලද්දා වූ
යහපත් වූ රත්න මණ්ඩපයෙහි පළඟ පිහිටුවා ඒ තෙරුන් වහන්සේ
78 අතින් දා කරඬුව ගෙණ (තමන්) කරඬුවෙහි තබා උතුම් පළඟෙහි තැබූයේ
ය. බ්‍රහ්ම තෙම ඡත්‍රය දැරූයේ ය. සන්සිත දෙව් තෙම වල් විදුනාව
දැරූයේ ය. සුයාම දේව තෙමේ මිණි තල්වැට දරූයේ ය. ශක්‍ර තෙම
79 දිය සහිත වූ සංඛය දැරූයේ ය. සතර වරම් දෙව් මහ රජ දරුවෝ

Non-Commercial Distribution

80 කඩුගත් අත් ඇතිව සිට ගත් හ. මහත් සෘද්ධි ඇත්තා වූ තෙතිස් දෙව්
පුත්හූ තුමු සුමුගු ගත් අත් ඇත්තාහු පරසතු මලින් පුදමින් එහි සිට
81 ගත්හ. දෙතිස් දෙව් කුමරියෝ දඬුවැට පහන් දරමින් සිටියෝ ය. අෂ්ට
82 විංසති යක්ෂ සේනාධිපතීහු වනාහි දුෂ්ට වූ යකුන් පලවා ආරක්ෂා
83 කෙරෙමින් සිට ගත්හ. පංචසිඛ නම් දේව පුත්‍ර තෙම වීණා වයමින් එහි
සිටියේ ය. තිම්බරු දෙව් පිත් තෙම නෘත්‍ය භූමියක් මවා තූර්‍ය්‍ය ඝෝෂා
ඇතිව සිටියේ ය. නොයෙක් නා රජ තෙම නොයෙක් දේව පුත්‍රයෝ
සාධු ගීතිකා යොදන්නෝ වූහ. මහාකාල නම් නා රජ තෙම නොයෙක්
පරිද්දෙන් තුති කරමින් සිටින්නේ ය. දිව්‍ය තූර්‍ය්‍යයන් වයනු ලබති.
දිව්‍ය සංගීතයද වයතී දේවතාවෝ දිව්‍ය සුගන්ධ ඇත්තා වූ වැසි ද
වස්වති.

85 ඒ ඉන්දගුත්ත නම් වූ ස්ථවිර තෙම වනාහි මරු පසුබස්වන්නා වූ
ලෝහමය ඡත්‍රයක් සක්වළ සම කොට මැවූ සේක. ධාතූන්ගේ ඉදිරියෙහි
86 ඒ ඒ (දිග) පස් තැනෙක් හි සියලු භික්ෂූහු ගණ සජ්ඣායනා කළහ.
87 අතිශයින් සතුටු වූ දුටුගැමුණු මහ රජ තෙම එහි ආයේ හිසින් දරා
88 ගෙණවා වූ ස්වර්ණමය වූ කරඬුවෙහි දා කරඬුව තබා අසුනෙහි පිහිටුවා
89 දා පුදා වැඳ දොහොත් මුදුන බැන්දේ එහි සිටියේ ය. ක්ෂත්‍රි තෙම
මෙහි (පවත්නා වූ) දිව්‍යච්ඡත්‍රාදින් ද දිව්‍ය ගන්ධාදීන් ද දක දිව්‍ය
90 තූර්‍ය්‍යාදින්ගේ ශබ්දයන් අසා ද, බ්‍රහ්මයන් හා දෙවියන් නො දක ආශ්චර්‍ය්‍ය
අද්භූත සිත් ඇතිව සතුටු වූයේ සේසතින් ධාතූන් පිදූයේ ලංකා රාජ්‍යයෙහි
91 අභිෂේක ද කෙළේ ය. ඒ නරෙන්ද්‍ර තෙම දිව්‍යච්ඡත්‍රය ද මානුසිකච්ඡත්‍රය
ද, විමුක්තිච්ඡත්‍රය ද යන ඡත්‍රත්‍රය දරන්නා වූ ලෝක ස්වාමී වූ ශාස්තෘන්
92 වහන්සේට තුන් යළක්ම මාගේ රාජ්‍යය දෙමි” යි කියා සතුටු සිත්
ඇත්තේ ලංකා රාජ්‍යය තුන්වරක් ධාතූන්ට පිදූයේ ය. ක්ෂත්‍රිය තෙම
93 මිනිසුන් සමග ඒ දා පුදමින් කරඬු හා සමග හිසින් ගෙණ භික්ෂු
94 සංඝයා විසින් වට කරණ ලද්දේ චෛත්‍යය ප්‍රදක්ෂිණා කොට පෙරදිගින්
95 ගෙණවුත් ධාතු ගර්භයෙහි බැස්සේ ය. සයානු කෙළක් රහතුන්
96 වහන්සේලා උතුම් ථූපය හාත්පසින් පිරිවරා කරණ ලද ඇඳිලි ඇතිව
වැඩ සිට ගත්හ. ධාතු ගර්භයට බැස ප්‍රීතියෙන් පූර්ණ නරනිඳුහු මාහැඟි
97 වූ යහපත් යහනෙහි තබමැයි සිතන කල්හි ධාතු සහිත වූ දා කරඬුව
98 තෙම ඔහුගේ මස්තකයෙන් උද්ගතව සත් තලක් පමණ අහස් කුස සිටි
සේක. ඉක්බිති කරඬුව තෙමේ හැරුණේ ය. ධාතූහු එයින් අහසට
නැඟී (දෙතිස් මහා පුරුෂ) ලක්ෂණයෙන් හා අසූ අනු බ්‍යාංජන යෙන්
බබළන්නා වූ බුද්ධවේශය රැගෙණ ගණ්ඩබ්බ මුලයෙහි සර්වඥයන්
වහන්සේ මෙන් ජීවමාන වූ සම්බුදුන් විසින් ඉටන ලද්දා වු යමා (මහ)
100 පෙළහර කළාහු ය. ඒ පෙළහර දැක ප්‍රසන්නව එකඟ සිත් ඇත්තා වූ

Non-Commercial Distribution

දොළොස් කෙළක් දෙවි මිනිස්සු රහත් බැව් පත් වූහ (සෝවාන් ආදී වූ)
102 පල තුනට පත් වූ සෙස්සෝ සංඛ්‍යාපථය ඉක්ම පැවැත්තා හ.

ඉක්බිත්තෙන් ඒධාතූහු බුද්ධ වේශය හැර කරඬුවෙහි පිහිටියහ.
කරඬුව එයින් පාත බැස රජහු මස්තකයෙහි පිහිටියේ ය. ඒ රජ තෙම
වනාහි ඉන්ද්‍රගුප්ත නම් ස්ථවිරයන් හා නාටිකාවන් සමග ධාතු ගර්භය
104 හරිමින් යහපත් යහන කරා පැමිණ කාන්ති ධර වූයේ රුවන් පලඟෙහි
කරඬුව තබා නැවත සුවඳ කවන ලද ජලයෙන් හස්තයන් ධෝවනය
105 කොට ගෞරව සහිත වූයේ සිවු දෑ ගඳ ගල්වා කරඬුව විවෘත කොට ඒ
ධාතුන් ගත්තේ මහ ජනයා කෙරෙහි වැඩ කැමැති පෘථිවීශ්වර තෙම
106 මෙසේ සිතුයේ ය. "ඉදින් ධාතූහු කිසිවකුන් ගෙන් නිරවුල් වන්නා හු
ද ඉදින් ධාතූහු ද ජනයාට සරණවය සිටියන්නා හු ද මනා කොට පණ
වන ලද මහරු වූ යහනෙහි ශාස්තෘන් වහන්සේ පරිනිර්වාණ මංචකයෙහි
107 හොත්තා වූ ආකාරයෙන් ශසනය කෙරෙත්වා ඒ රජ තෙම මෙසේ
108 සිතා උතුම් යහනෙහි ධාතුන් තැබූයේ ය. ධාතූහු ද ඒ ආකාර ඇතිව
උතුම් යහනෙහි ශයනය කළහ. ඇසළ මස ශුක්ල පක්ෂය සම්බන්ධිත
109 වූ පසළොස්වක් හි වූ උතුරු සළ නකතින් මෙසේ ධාතු පිහිටියා හු ය.
110 ධාතුන්ගේ පිහිටීම හා සමග මහ පොළෝ තොමෝ කම්පිත වූවා ය.
111 නොයෙක් පරිද්දෙන් නොයෙක් ප්‍රාතිහාර්‍යයෝ පැවැත්තාහ. ප්‍රසන්න
වූ රජ තෙමේ ඒ ධාතුන් සේසතින් පිදූයේ ය. ලංකාවෙහි සියලු රාජ්‍යය
112 සත් දවසක් දුන්නේ ය. දේහයෙහි පැලඳි සර්වාභරණ දාගැබෙහි පුද
කෙළේ ය. නාටිකාවෝ ද අමාත්‍යයෝ ද පිරිස ද දේවතාවෝ ද එසේ
113 කළහ. මිහිපති තෙම වස්ත්‍රයන් හාඋක් සකුරු ගිතෙල් ආදීන් සංඝයාට
114 දී මුළු රැය භික්ෂූන් ලවා ගණ සජ්ඣායනා කර වූයේ ය. ජන සමූහයා
කෙරෙහි වැඩ කැමැති වූ නරේන්ද්‍ර තෙම සියලු ජනයෝ මේ සත් දවස
115 ධාතුන් වඳිත්ව" යි දෙවෙනි දවස නගරයෙහි බෙර හැසිර වූයේ ය.
"ලක්දිව දා වඳිනු කැමැත්තා වු යම් මනුෂ්‍ය කෙනෙක් වෙත් නම්
116 එකෙණෙහිම මෙහි අවුත් දා වැඳ කැමැත් සේ සිය ගෙට යෙත්වා" යි
ඉන්දගුත්ත නම් වූ මහත් සෘද්ධිමත් වූ ස්ථවිර තෙම අධිෂ්ඨාන කළ
117 සේක. එය ඉටන ලද පරිද්දෙන් විය. ඒ මහා යසස් ඇත්තා වූ මහ රජ
තෙම මහා සංඝයාට ඒ සත් දවස නිරතුරු කොට මහ දන් පවත්වා "මා
118 විසින් ධාතු ගර්භයෙහි කටයුතු නිමවන ලද්දේ ය. ධාතු ගර්භ්‍ය වැසීම
දැන ගන්නට සංඝයා සුදුස්සේ" යයි කීයේ ය. සංඝ තෙම සාමණේර
119 දෙනම ඒ කර්මයෙහි යෙදූයේ ය. ඔව්හු ගෙණෙන ලද (මේඝවර්ණ)
120 පාෂාණයෙන් වැසූහ. "මෙහි මල් නොමැලවෙත්වා, මේ ගන්ධයෝ
නො වියලෙත්වා පහන් ද නොනිවෙත්වා, කිසිවකුත් නොනසිවා

Non-Commercial Distribution

121 මේඝවර්ණ ෂට් පාෂාණයෝ අතුරු නැතිව ගැළපෙත්වා" යි රහතන්
122 වහන්සේලා මේ සියල්ල අධිෂ්ඨාන කළහ. වැඩ කැමැති වූ මහරජාණෝ
123 "මහාජන තෙම මෙහි ශක්ති වූ පරිද්දෙන් ධාතු නිධානයන් කෙරේව යි ඇණ වූයේ යත මහාජන තෙමේ මහා ධාතු නිධානය පිට ද දහස් ගණන් ධාතුන් සම්බන්ධි වූ නිධානයන් ශක්ති වූ පරිද්දෙන් කෙළේ ය.
124 නරේන්ද්‍ර තෙම ඒ සියල්ල පියවා ථූපය සමාප්ත කරවූයේ ය. මෙහි චෛත්‍යයෙහි සතරැස් කොටුව ද නිම වූයේ ය.

125 මෙසේ පිරිසිදු සිත් ඇත්තා වූ චේතෝ බල රහිත වූ සත්පුරුෂයෝ සියලු සම්පත්තීන් අතුරෙන් උතුම් වූ නිර්වාණ සම්පත්තිය හේතු කොට නිර්මල වූ පුණ්‍යයන්ම තුමූත් කෙරෙති, නානා ප්‍රකාර විශේෂ ඇත්තා වූ ජන සමූහයා පිරිවර කිරීමට හේතු වූ පින් කරවන්නාහු ද වෙති

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස ධාතු නිදාන නම් වූ එක්තිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් දෙවෙනි පරිච්ඡේදය

1 (යට කී පරිද්දෙන් කරණ ලද රුවන්මැලි) සෑයෙහිසත්කම් හා සුණු කම් නොනිම් කල මාරණාන්තික රෝගයෙන් රජ තෙමේ ගිලන්
2 විය. ඒ තෙමේ මල් තිස්ස කුමරහු දිගා වැවින් කැඳවා "සෑයෙහි නොනිමි කර්මාන්ත නිමව" යි කීයේ ය. ඒ කුමර තම බෑයා දුර්වල
3 බැවින් සන්නාලින් ලවා සුදු පිළියෙන් සැට්ටයක් කරවා ඒ සැට්ටයෙන් සෑය වස්වා සිත්තරුන් ලවා එහි පිළිකඩ ද පූර්ණ ඝට පංක්තීන් ද
4 පසඟුල් පංක්තිය ද මනාකොට කරවී ය. එසේම සත්කරුන් ලවා හුණ
5 දඬු මුවා ඡත්‍රය ද මුදුන් පිළිකඩ කරපත් මුවා සඳහිර ද කරවීය. මෙසේ
6 කළ සෑය ලාකඩ හා කොකුමින් මොනවට සිත්තම් කරවා "සෑයෙහි කටයුතු කිස නිමියේය" යි රජහට දන්වීය. රජ තෙමේ සිවි ගෙයක හෙව ගෙණ සිවි ගෙවින් ම සෑය පැදකුණු කොට වැඳ දකුණු දොරටුයෙහි
7 බිම අතුළ සයනයෙක හෙවීය, ඒ තෙමේ දකුණැලයෙන් හෙව උතුම්
8 මහා සෑය ද වම් ඇලයෙන් හෙව උතුම් ලොහෝ පහය ද දකිමින් භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලදුයේ පහන් සිත් විය. ගිලන් බැවි
9 පුළුවුස්නා පිණිස ඒ ඒ දිගින් වැඩි සයානු කෙළක් භික්ෂූහු ඒ සමාගමයෙහි
10 වූහ. භික්ෂූහු වග බැඳ ගෙණ ගණ සජ්ඣායනා කළහ. මිහිපල් තෙමේ
11 ඒ සමා ගමයෙහි ථෙරපුත්තාභය නම් මහ තෙරුන් නොදුක අටවිසි
12 මහා යුද්ධයෙහි දී යුද්ධ කෙරෙමින් පරාජය නුවූ මාගේ මහා යෝධ වූ වසී වූ ථේරපුත්තාභය නම් ස්ථවිර දාන් මාර යුද්ධ පැමිණි කල මා කරා
13 නො එළඹෙන සේක. පරාජය දුක උන්වහන්සේ නොවඩනා සේකැයි
14 සිතම්" රජ තෙමේ මෙසේ සිතුයේ ය. ඒ ස්ථවිර තෙමේ කිරිඳිහොය හිස පංජලි නම් ගල වෙසෙමින් රජහු සිතිවිලි දූන පන් සියයක් රහත් පිරිවරින් සෘද්ධි බලයෙන් අහසින් අවුත් රජුන් වෙත සිටගත් සේක. රජ තෙම උන්වහන්සේ දුක පහන් වුයේ ඉදිරියෙන් හිඳුවා ගෙණ මම
16 පූර්වයෙහි දශ මහා යෝධ නම් නුඹ වහන්සේලා ගෙණ යුද්ධ කෙළෙමි.
17 දූන් හුකදලාවම මරු හා යුද පටන් ගතිම්හ. මර සතුරා පරදවන්ට නෙහැක්කෙමි" යි ද කීයේ ය.

18 ස්ථවිර තෙමේ වදාරණ සේක "ජන ප්‍රධාන වූ මහ රජාණෙනි! නහමක් බිය වේවා. කෙලෙස් සතුරා නොපරදවා මාර සතුරා පැරද
19 විය නොහැක්කේ ය. සියලු සංස්කාරයෝ අනිත්‍යය හ යි ශාස්තෘන්
20 විසින් දේශිතමැයි ලජ්ජා භය රහිත වූ මේ අනිත්‍යතා තොමෝ බුදුන් කරා ද එළඹෙයි. එහෙයින් සංස්කාරයෝ තුමු අනිත්‍යය, දුඃඛයහ,
21 අනාත්මයහ යි. සිතා (පැවැත්ත යුත්තේ ය.) මීට (පූර්වයෙන්) දෙවන
22 අත්බැව් හිඳ තොපගේ කුශල කර්ණයෙහි අභිප්‍රාය මහත්මැයි දෙව්ලොව එළඹ සිටි කල තෙපි ඒ දිවසැප හැර මෙහි අවුදින් නොයෙක් පරිද්දෙන්

Non-Commercial Distribution

බොහෝ පින් කම් කළහ. තොප විසින් එක්සේසත් කොට
23 රාජ්‍යකරණයත් සසුන් බැබළවීම පිණිස ය. එබැවින් මහපින්
24 ඇත්තාණෙනි! අද දවස තෙක් තොප විසින් කළ පින් සියල්ල මෙනෙහි
25 කර මේ උපායෙන් තොපට එකෙණෙහි සුව වන්නේ ය" යි වදාළ
26 සේක තෙරුන් බස් අසා රජ තෙමේ පහන් සිත් ඇති විය. "ඔබ මාර
යුද්ධයෙහිත් මට අත්‍යන්තෝපකාර සේකැ" යි උන්වහන්සේට කීයේ
ය. පහන් සිත් ඇත්තේ එකෙණෙහි පින් පොත ගෙන්වා ඒ කියන්ට
ලියන්නා මෙහෙයී ය. ඒ තෙමේ ඒ පොත කීයේ ය.

27 "මහරජහු විසින් එකුන් සියයක් විහාරයෝ කරවනලද්දා හ. එයින්
මිරිසවැටියම එකුන් විසි කෙළකින් කොට නිමියේ ය. උතුම් වූ
ලොහොපාය තිස් කෙළකින් කොට නිම වන ලදී. මහරජාණෙනි!
මනාබුද්ධි ඇති ඔබ විසින් මහ සෑයෙහි ඇතුල කරවන ලද ගණන්
28 නොකට හැකි සූවිස්සක් හැර සෙසු මහ සෑ කර්මාන්තයෝ කෙළ
29 දහසක් අගනාහ වි කී යේ ය. කොළඹ නම් මලය රට බුළු කෑ සායෙහි
දී මහගු මිණි කොඩොල් සඟල විකුණ මිළ ගෙණ පන් සියයක්
30 ක්ෂීණාශ්‍රව මහ තෙරුන්ට පහන් සිතින් උතුම් වූ ඇඹුල් සහිත තණ
31 සාලේ පිණ්ඩපාතය දෙන ලද්දේ ය. චූලංගනිය යුද්ධයෙහි දී පැරද
32 පලා යන්නා හු විසින් කාල සෝෂා කරවා අහසින් වැඩියා වූ ක්ෂීණාශ්‍රව
යති කෙනෙකුට තමා නොකා රන් තැටියෙහි බත දෙන ලද්දේ ය.
33 මෙසේ කී කල රජ තෙමේ (කියන්නේ) "වෙහෙර පෙළහර සතියෙහි ද
එසේම ප්‍රාසාද පූජා සතියෙහි ද මහ සෑ ආරම්භ සතියෙහිද එසේම
34 ධාතු නිධානයෙහි ද සතර දිගින් වැඩියා වූ මහත් වූ උගතෝ මහා
සංඝයාට මා විසින් මාහැඟි වූ අවිශේෂ මහා දානය පවත් වන ලද්දේ
35 ය. සූවිස්සක් මහත් වෙසක් පූජා ද කරවීමි. ලක් දිව සියලු සංඝයාට
තුන් වරක් තුන් සිවුරු පූජා කරවීමි. පහන් සිත් ඇති මම සත් සත් දවස
බැගින් ලක්දිව්හි මේ රජය පස් වරක් සසුන් විසයෙහි දුන්නෙමි.
36 සතතයෙන් දොළොස් මහ තන්හි පිරිසිදු මැටියෙන් ගිතෙලින් ම බුදුන්
37 බුදමින් පහන් දහසක් දල්වීමි. තව ද මම අනවරතයෙන් අටළොස්
38 තැනෙක වෙදුන් විසින් විධාන කරන ලද්දා වූ ගිලන් බත් හා බෙහෙත්
39 ගිලනුන්නට දෙවීමි. සූසාළිසක් තැන සකස් කළ කිරිබත ද (දුනිමි).
40 එතෙක් තැන්හිම තෙල් කැවුම් ද එතෙක් තැන්හිම ගිතෙලෙහි බැදි මහ
දෑ කැවුම්ද එසේම බත් සමඟ නිත්‍යයෙන් දෙවීමි. මසක් පාසා පෙහෙවස්
41 දවස්හි ලක්දිව අටමහ විහාරයෙහි පහන් තෙල් දෙවීමි. ආමිස දානයට
42 වඩා ධර්ම දානය මහතැයි අසා ලෝහොපහය යට මහලෙහි සඟ මැද
43 අස්නෙහි හිඳගත්තා වූ මම මහා මංගල සූත්‍රය සංඝයාට දෙසන්නෙමැයි
(සිතා) සංඝ ගෞරවයෙන් අස්වන්ට නොහැකිවීමි. එතැන් පටන් ලක්දිව
44 ඒ ඒ තැන විහාරයන්හි ධර්ම දේශකයන්ට සත්කාර කොට දහම් දෙස්වීමි.

Non-Commercial Distribution

45 ධර්ම කථික එක් එක් නමකට ගිතෙල් ගුඩශර්කරා නැළියක් නැළියක් ද
46 දෙවීමි. සතරඟුල් දික් වැල්මී මිටක් මිටක් ද දෙවීමි. එසේම පිළි
47 සඟලක්ද දෙවීමී. (මේ කියන ලද සූරෙහි පිහිටා දුන් සියලු දානය
මෙතරම් මා සිත නොපහදවයි. දිවි නොබලා දුර්ගතවූම මා විසින්
දෙන ලද යම් දන් දෙකෙක් වේ නම් එයම මාසිත පහද"යි කීයේය.

48 ඒ අසා අභය ස්ථවිර තෙමේ බැගෑ කල දුන් දානද්වයම රජහු
සිත් පහන් පිණිස නොයෙක් ආකාරයෙන් වර්ණනා කරණ සේක් "ඒ
49 තෙරුන් වහන්සේලා පස් දෙනා අතුරෙන් ඇඹුල් සහිත තණ බත් ගත්
මලියදේව මහා ස්ථවිර තෙමේ සමන්කුළු පව්හි නව සියයක් භික්ෂූන්ට
50 ද වැළඳූ සේක. පෘථිවි පාලක ධර්මගුප්ත ස්ථවිර තෙමේ ඒ පිණ්ඩපාතය
51 කැලණි විහාරයෙහි පන් සියයක් භික්ෂූන් සමග බෙදා ගෙණ තෙමේත්
වැලඳූ සේක. තලගුරු වැසි ධම්මදින්න ස්ථවිර තෙමේ පුවගු දිවයින
52 දස දහසක් භික්ෂූන්ට බෙදා දී එය වැලඳූ සේක. මංගන වැසි මහා
53 සෘද්ධි ඇති කුඩා තිස්ස ස්ථවිර තෙමේ කෛලාශ විහාරයෙහි සැට
දහසක් දෙනාට බෙදා දී වැලඳූ සේක. මහා ව්‍යාඝ්‍ර ස්ථවිර තෙමේ ද
54 උක්කා නුවර විහාරයෙහි සත් සියයක් භික්ෂූන්ට දී තෙමේත් පරිභෝග
55 කළ සේක. රන් තැටියෙහි බත් ගත් (කුටුම්බික පුත්‍ර) මහා ස්ථවිර
56 තෙමේ දොළොස් දහසක් භික්ෂූන්ට දී ඒ වැලඳූ සේක." අභය ස්ථවිර
තෙමේ මෙසේ කියා රජහුගේ සිත පහන් කර වූ සේක.

57 රජ තෙමේ සිත පහදවා ගෙණ ඒ තෙරුන්ට මෙසේ සැල
කෙළේය. "සූවිසි වසක් මුළුල්ලෙහි සංඝයාට උපකාරක වූයෙමි. මෙම
58 කය ද සංඝයාට උපකාර වේවා. මහ සෑයට පෙණෙන්නට වූ සංඝයාගේ
59 කර්ම මාලාකයෙහි සංඝ දාස වූ මාගේ සිරුර ආදාහන කළ මැනව"යි
60 කියා මලුට (කියන්නේ) "තිස්ස ! තෙපි මහ සෑයෙහි නොනිමියා වූ
61 සියලු කර්මාන්තය සකසා යෙහෙන් නිමව, උදයත් සවසත් මහ සෑයෙහි
මල් පුදව, මහ සෑයට (දවස තුන් වරක්) පෙරහර කරව. පියේ තෙපි
මා විසින් සුගත් සසුන්හි යම් වෘත්තියක් පිළියෙළ කරණ ලද නම් ඒ
62 සියල්ල නොපිරිහෙලා පවත්වව. තව ද පියේ හැම කල සංඝ කෘත්‍යයක්හි
63 නහමක් ප්‍රමාදවව"යි මෙසේ රජ තෙමේ ඔහුට අනුශාසනා කොට
තුෂ්නිම්භූත වූයේය.

64 එකෙණෙහි භික්ෂු තෙමේ ගණ සජ්ඣායනා කළ සේක. දෙවියෝ
සදිව්‍ය ලෝකයෙන් රථ සයක් එලවූහ. රථයෙහි සිටියා වූ ඒ දෙවියෝ
වෙන් වෙන්ව රජහට "මහරජාණෙනි !" සිත්කලු වූ අප අපගේ දෙව්
65 ලොවට ඔබ අව මැනව"යි යාච්ඤා කළෝය. රජ තෙමේ ඔවුන් බස්
අසා "මම යම් තාක් බණ අසම් නම් ඒ තාක් ඉවසව"යි හස්ත සංඥාවෙන්

Non-Commercial Distribution

වැලකුයේය. භික්ෂූහු ගණ සජ්ඣායනාව වලකන්නේය"යි කියා
66 දේශනාව නැවැත්වූහ. රජ තෙමේ ඒ නැවැත්වීමට හේතු විචාළේය. ඒ
67 භික්ෂූහු "නැවැත්ත මැනවැයි සංඥා දුන් බැවිනැ"යි වදාළෝය. රජ
68 තෙම "ස්වාමීනි ! ඒ එසේ නොවෙ"යි කියා දෙවියන්ට දන්නූ බව
කියේය. ඒ අසා සමහර දෙනෙක් "මරණ භයින් භය වූ මේ තෙමේ
වලප්නේය"යි සිතූහ. ඔවුන්ගේ සැක දුරලනු පිණිස ඒ අභය ස්ථවිර
69 තෙමේ රජහට වදාරණ සේක් "(මහ රජ තොපට) රථ එලවන ලදහයි
කෙසේ දන්වීය. හැක්කේ ද" යි මෙසේ වදාළ සේක. පණ්ඩිත වූ රජ
70 තෙමේ මල් දම් අහසෙහි දක්ම විය. ඒ මල්දම් වෙන් වෙන්ව රිය හිස්හි
71 ලැගුණාහු එලුනෝය. මහාජන තෙමේ අහස එලෙන්නා වූ ඒ මල්
වඩම් දක සැක හළේය. රජ තෙමේ "වහන්ස ! කවර දෙව් ලොවක්
72 රම්‍ය දෝ" යි ඒ තෙරුන් විචාළේය. ඒ ස්ථවිර තෙමේ "මහරජාණෙනි!
තුසිත පුරය සිත්කලුය යි ද සත්පුරුෂයන් විසින් අභිමත යයි ද මහා
73 කරුණා ඇති මෙතේ බොසත් තෙමේ ද බුදු බව පිණිස කල් බලමින්
තුසීපුර වෙසෙ"යි වදාළ සේක.

මහ පැණැති රජ තෙමේ තෙරුන් බස් අසා මහ සෑය බලමින්ම
74 හොත්තේ ඇස් පියා හෙලීය. එකෙණෙහිම මෙයින් චු තව තුසිත
75 පුරයෙන් එලවූ රියෙහි ඉපිද සිට ගත්තේය. දිව්‍ය දේහ ඇත්තේ කළ
පින්කම්හුගේ ඵල දුටුයේය. මොනවට සරහන ලද තමා ගත් බැව්
76 මහජනයාට දක්වනු සඳහා රථයෙහි සිට ගෙණම මහ සෑය තුන් යළක්
77 පැදකුණු කොට සෑයත් සංඝයාත් වැඳ තුෂීපුර ගියේය. නාටක ස්ත්‍රීහු
78 මෙහි අවුදින් යම් තැනෙක්හිදී (මළ රජහු) ඔටුන්න ගැළ වූ ද ඒ මෙහි
කළ ශාලා තොමෝ "මකුට මුක්ත ශාලා" යි නම් විය. රජහු සිරුර දර
79 සෑයෙහි තැබූ කල්හි මහාජන තෙමේ යම් තැනෙක්හිදී හැඬූ යේ ද එහි
ශාලාව "රාව වර්තී" නම් විය. යම් නිස්සිම මාලක යෙක්හි රජහුගේ
80 සිරුර දැවූද මෙහි එම මාලකය "රාජ මාලක" යයි කියනු ලැබේ. රාජ
81 නාමයට හොබනා වූ ඒ දුටුගැමුණු මහරජ තෙමේ මෙතේ බුදුහුගේ අග
සව් වන්නේය. රජහු පිය තෙමේ ඒ බුදුහු පියද මවු තොමෝ මවු ද
82 වෙත්. මල් සැදෑහැතිස් රජ දෙවන සවූ වන්නේය. ඒ දුටුගැමුණු රජු
83 පුත් වූ ප්‍රසිද්ධ සාලිය රාජ කුමාර මෙතේ බුදුහු පිත් වන්නේය.

යමෙක් මේ ආකාරයෙන් කුසල්ම උතුමැයි සිතා ගෙණ පින්
84 කෙරේ නම් ඒ තෙමේ බොහෝ වූත් අනියම් පාපයන් වසමින් සිය
ගෙට සෙයින් දෙව් ලොව යෙයි. එහෙයින් නුවණැත්තේ පින්කම් නිති
ඇලුනේ වන්නේය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස
තුසිත පුර ගමන නම් වූ දෙතිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් තුන් වෙනි පරිච්ඡේදය

1 දුටු ගැමුණු රජහුගේ රජයෙහි ජනයා පිනා ගියෝ වූහ. " සාලි
2 රාජ කුමාර "යයි ප්‍රසිද්ධ වූ පිතෙක් ඒ රජහට ඇති විය. අතිශයින්
වාසනාවන්තය, හැම කල පින්කම්හි අලුතේ වී. හේ ඉතා ලාවන්‍ය රූ
ඇති චණ්ඩාලියක් කෙරෙහි ඇලුනේ ය. පූර්ව ජාතියෙහි සම්බන්ධ වූ
3 ඒ අශෝක මාලා දේවිය රූපත් බැවින් අතිශයින් ප්‍රිය කරන්නේ රජය
නොම පැතී ය.

4 එහෙයින් දුටු ගැමුණු රජහු මල් සද්ධාතිස්ස කුමර ඔහු ඇවෑමෙන්
5 අභිෂේක කරණ ලදුයේ, සම අටළොස් හවුරුද්දක් රජය කෙළේ ය.
සැදැහැ හෙයින් කරණ ලද සද්ධා තිස්ස යයි නම් ඇති හේ තෙමේ මහ
සෑ පිළිබඳ සත්කම් ද සුණුකම් ද ඇත් පවුර ද කරවීය. එකල්හි ඒ
6 පහය අනූ ලක්ෂයක් අගනේ විය. ඒ රජ තෙමේ දක්ෂිණ ගිරි විහාරය
7 කල්ලක ලෙන කුළුම්බාල විහාරය එසේම පෙතඟ වැලි විහාරය වෙළඟ
8 වැටිය දුඹුල්වෑතිස් විහාරය දූරතිස් වැව එසේම මාතු විහාරය දිගා වැව
9 දක්වා යොදනෙන් යොදනෙහි විහාර ද කරවීය. දිගා වෑ වෙහෙර ද
10 සෑයක් සහිත කොට කර වීය. ඒ සෑය වසා එලන සත්රුවන් ඇවුණු
සැටට්ටයක් කරවිය. රිය සක් පමණ ඇති සිත්කලු රන් මල් කරවා ඒ
11 දූල සන්දියක් පාසා ඇවින විය. පරාභිභවකර වූ ඒ රජ තෙමේ සූවාසූ
12 දහසක් ධර්ම ස්කන්ධයන්ට සුවාසූ දහසක් පූජා ද කරවී. ඒ රජ තෙමේ
මෙසේ නොයෙක් පින් කොට ශරීර භේදයෙන් පසු තුසී දෙවියන්
13 කෙරෙහි උපන්නේ ය.

14 සැදැහැතිස් මහ රජු දිගා වැව වසන කල ලදූතිස් නම් දෙටු පිත්
15 ගිරිකුම්භීල නම් රම්‍ය විහාරය කරවීය. ඒ රජහු බාල පිත් ථුල්ලත්ථන
16 නම් කුමාර තෙමේ කන්දර නම් විහාරය කරවිය. ථුල්ලත්ථන කුමාර
භාතෘ වූ දුටුගැමුණු රජු වෙත එන පියාණන් සමගම තමන් කළ
17 විහාරයාගේ සංඝභෝග පිණිස ආයේ ය. සැදැහැතිස් මහ රජු මළ කල
සියලු ඇමතියෝ ථූපාරාම විහාරයෙහි රැස් වූවෝ සියලු භික්ෂු සංඝයා
රැස් කොට රට රක්නා පිණිස සංඝානු මතයෙන් ථුල්ලත්ථන කුමරහු
18 අභිෂේක කළහ. ලදූතිස් කුමර ඒ අසා මෙහි අනුරාපුර අවුදින් උහු
19 අල්වා ගෙණ තෙමේ රජය කරවී. ථුල්ලත්ථන රජ වනාහි එක් මස් දස
දිනක් (රජය කෙළේ ය.)

20 ලදූතිස් රජ තෙමේ තුන් හවුරුද්දක්ම සංඝයා කෙරෙහි ගෞරව
නැතිව වැඩිමල් පිළිවෙළ නොදත්තෝ යයි ඒ සංඝයාට පරිභාෂණය

Non-Commercial Distribution

21 කෙළේ ය. පසුව රජ තෙමේ සංඝයා කමා කරවා දඬුවම් පිණිස තුන්
22 ලක්ෂයක් (කහවණු) දී මහ සෑයෙහි සෙල්මුවා මල් අසුන් තුනක් කරවී
ය. වැලි ඒ භූමිශ්වර තෙමේ ම ලක්ෂයකින් මහ සෑ ථූපාරාම අතර බිම
සම කොට ගොඩ කරවීය. තව ද ථූපාරාමයෙහි සෑයම ගලින් උතුම්
23 වූ දා ගෙයක් ද කරවී. ථූපාරාමයට පෙරදිග ගල් දාගැබ ද භික්ෂු
24 සංඝයාට ලජ්ජික නම් (තමා නමින්) ආසන ශාලා ද කරවී. සෑගිරි
25 වෙහෙර කටු සෑයෙහි ලක්ෂයක් දී සෙල්මුවා දා ගෙය ද කරවී. එම රජ
26 තෙමේ ගිරි කම්භිල නම් විහාර පූජායෙහි සැට දහසක් භික්ෂූන්ට තුන්
27 සිවුරු දෙවි. රිටිගල විහාරය එසේම කන්දරහීනක නම් විහාරය ද
28 කරවී. ග්‍රන්ථධුර භික්ෂූන්ට බෙහෙත පස දෙවි. කුමක් කැමැති දැයි
විචාරා කැමැති දෑය සහල් ද භික්ෂුණීන්ට දෙවීය. ඒ රජ තේමේ මේ
නුවර නව හවුරුදු අට මසක් රජය කරවී.

29 ලදූතිස් රජු මළ කල උහු මල් බල්ලාට නාග නම් රජ සහවුරුද්දක්ම
30 රජය කෙලේ ය. මේ රජ ලෝවා මහ පාය සිසාරා ඉතා මනරම් දෙතිස්
ප්‍රාසාදයක් ලොහො පහයාගේ ශෝභා පිණිස කරවී ය. මනරම් රුවන්
31 මල් නම් මහ සෑය හාත් පස වැලිමලු සීමායෙහි පවුරුද කරවී ය. ඒ
32 තෙමේ ම කුරුඥ පාසක නම් විහාරය ද කරවී ය. මිහිපල් තෙමේ
අන්‍ය වූත් පින් කරවී ය.

මහාරත්තක නම් සෙනෙවි තෙමේ බල්ලාටනාග රාජ නම් වූ ඒ
33 මිහිපල්හු නුවරදීම ගත්තේ ය. ඒ රජු මල් වට්ටගාමිණී නම් කුමර ඒ
34 දුෂ්ට සෙනෙවියා මරා රජය කරවී. ඒ වළගම්බා රජ තෙමේ ස්වකීය
35 භාතෘ වූ බල්ලාට නාග රජහුගේ ළදරු පිත් වූ මහාචූලික නම් කුමරු ද
පුත්‍ර ස්ථානයෙහි තැබී ය. ඒ කුමරහු මෑනි වූ අනුලා දේවියත් බිසව්
36 කොට ගත්තේ ය. මේ කුමරහු පිය තනතුරෙහි සිටි බැවින් (ලෝ
වැස්සෝ) පිතු රජ යයි ව්‍යවහාර කළ හ.

මෙසේ අභිෂේක කරන ලද ඔහුගේ රජයෙහි පස් වෙනි මස්හි දී
37 රුහුණු රට නකුල නගරයෙහි තිස්ස නම් අපණ්ඩිත වූ එක් බමුණු
38 චේටකයෙක් බමුණෙකු වදන් අසා දාමරික විය. එසේම ඔහුගේ පිරිවර
39 ද මහත් විය. සෙන් සහිත දෙමළුන් සත් දෙනෙක් මහ තොට ගොඩ
40 බටහ. එකල බමුණුතිස් තෙමේ ඒ දෙමළුන් සත් දෙනාත් ඡත්‍රය පිණිස
41 රජහු වෙත ලියුම් එවූ හ. නීති දත් රජ තෙමේ බ්‍රාහ්මණ තිස්ස හට "
දූන්ම රජය තාගේ ම ය, තෝ දෙමළුන් ගනුව "යි ලියුම් යැවීය. ඒ
තෙමේ මැනවැයි කියා දෙමළුන් හා යුද කෙළේ ය. දෙමළු ඔහු ගත්තු
ය.

Non-Commercial Distribution

42 ඉක්බිති ඒ දෙමළු කොළඹැල සමීපයෙහිරජු හා යුද කළෝ ය.
43 යුදයෙහි දී රජතෙමේ පැරැද්දේ රිය නැඟී තීර්ථකාරාමද්වාරයෙන් පලා
යයි. ඒ තීර්ථකාරාමය වනාහි පණ්ඩුකාභය රජු විසින් කරවන ලදුයේ
44 අනවරතයෙන් එක් විසි රජ කෙනෙකුන් දවස තබන ලද්දේම විය.
45 පලා යන ඒ රජු දැක ගිරි නම් නිගණ්ඨ නම් තෙමේ "මහ කළු සිංහලයා
පලා යෙයි" කියා අතිශයින් හඬගෑ ය. එකල මහ රජ ඒ අසා "මාගේ
මනෝරථය මුදුන් පැමිණි කල මෙහි වෙහෙරක් කරවන්නෙමැ "යි මෙසේ
46 සිතුයේ. ගැබ් සහිත අනුළා දේවිය රක්ෂා කට යුත්තී යයි හැර ගත්තේ
47 ය. එසේම රැක්ක යුත්තේ යයි කියා මහා චූල, මහානාග කුමරුන්
දෙදෙනාත් ගත්තේ ය. රථයාගේ සැහැල්ලු බව පිණිස යහපත් සිළුමිණක්
48 දී, මිහිපති තෙමේ සෝමා දේවිය ඇයගේ අනුමතියෙන් බැස්වීය. යුද
පිණිස ගමන්හිදීම පරාජයෙහි ශංකා ඇත්තේ පුත්‍රයන් හා දේවීන් දෙන්නා
49 ගෙන්වා ගෙණ බුදුන් වැලඳූ ඒ පය ගෙන්වා ගන්ට නොහැකිව නික්මුණේ
ය. පලා ගොස් වෙස්සගිරි විහාරබද වනයෙහි ඒ තෙමේ සැඟවිණි,
50 එහි දී කුත්ථිකකුල මහා තිස්ස ස්ථවිර තෙමේ ඒ රජු දැක අනාමෘෂ්ට
පිණ්ඩ දානය හැර ආහාර දුන්නේ ය. ඉක්බිති පහන් සිත් ඇති රජ
51 තෙමේ වැටකේ පත ලියා ඒ විහාරයට සංඝ භෝග දුන්නේ ය. එයින්
52 ගොස් ගල්හෙබකඩ විසී ය. එයිනුදු පලා ගොස් සල්ගල වෙත
53 මාතුවේලඟයෙහි විසී ය. එහි දී රජ තෙම පෙර දුටු තෙරුන් දිටීය.
54 ස්ථවිර තෙමේ උපස්ථායක වූ තනසීවයහට මිහිපල්හු දැඩියේ භාර කෙළේ
55 ය. ඒ රජ රට නායක වූ තනසීවයා වෙත ඔහු විසින් උපස්ථාන කරණ
ලදුයේ තුදුස් හවුරුද්දක් විසීය.

56 දෙමළුන් සත් දෙනා අතුරෙන් එකෙක් මදාවහ සෝමා දේවිය
57 (දැක එය) ගෙණ වහා පරතෙර ගියේ ය. එකෙක් අනුරාධපුරයෙහි තුබූ
58 බුදුහු පය ඇර ගෙණ එයින් සතුටු වූයේ වහා පරතෙර ගියේ ය. පුළහත්ථ
නම් දෙමළ තෙමේ බාහිය නම් දෙමළා සෙනෙවි කොට තුන් හවුරුද්දක්
රජය කෙළේ ය. බාහිය තෙමේ ඒ පුලහත්ථයා ගෙණ දෑවුරුද්දක් රජය
59 කෙළේ ය. පණයමාර තෙමේ ඔහු සෙනෙවි විය. පණයමාර තෙමේ
ඒ බාහිය නම් දෙමළ රජු ගෙණ සත් හවුරුද්දක් රජ විය. පිළය මාර
60 ඔහු සෙනෙවි විය. ඒ පිළියමාර තෙමේ පණයමාර රජු ගෙණ සත්
61 මසක් රජ විය. දාඨීය තෙමේ ඔහු සෙනෙවි විය. ඒ දාඨීය තෙමේ
62 පිළයමාර රජු ගෙණ අනුරාධපුරයෙහි දෑවුරුද්දක් රජ විය. මෙසේ ඒ
63 දෙමළ රජුන් පස් දෙනාගේ ම (රාජ්‍යය) තුදුස් හවුරුද්දක් මත්තෙහි සත්
මසක් විය.

Non-Commercial Distribution

64 තනසීවයා බිරින්ද නිවාස පිණිස කන්දෙහි ගියා වූ අනුලා
දේවියගේ පැසෙහිපයින් පහළා ය. ඕ තොමෝ කිපී හඬමින් රජු වෙත
65 එළඹියා ය. ඒ අසා ඒ තනසීව තෙමේ දූන්න ගෙණ නික්මිණි. දේවිය
බස් අසා උහුගේ ඊමෙන් පෙරාතුව රාජ තෙමේ කුමරුන් දෙන්නා ද
66 දේවිය ද ගෙණ එතැනින් පිටත් විය. මහා සීව තෙමේ දූන්න සරසා
67 ගෙණ එන්නා වූ සිවයා විද්දේ ය. රජ තෙමේ (මම වළගම්බා රජ යෙමි
68 තමා) නම අස්වා ජනයා එක් කෙළේ ය. මහත් වූ යෝධ සම්මත වූ
ඇමැති යන් අට දෙනෙක් ද ලැබුයේ ය. රජහුගේ පිරිවර ද මහත්
පෙරහර ද ඇති වී මහත් යසස් ඇති රජ තෙමේ කුම්භීලක මහා තිස්ස
69 තෙරුන් දූක වළස්ගල් විහාරයෙහි බුද්ධ පූජාව කරවීය. මළුව සුද්ධ
70 කරනු පිණිස නැංගා වූ කපිසීස නම් ඇමැතියා බස්නා කල
දේවිය සමග රජ තෙමේ උඩ සෑ මළුවට නැගෙමින් මග හිඳගත්තහු
71 දූක "හොත්තේ නොවේ ය"යි කිපී කපසීසයා මැරවී ය. ඒ කරණ
72 කොට ගෙණ සෙසු සත් ඇමැතියෝ ද රජු හා කලකිරුණාහු රජු
වෙතින් පලා ගොස් කැමැති පරිද්දෙන් යන්නාහු මග දී සොරුන් විසින්
73 කොල්ල කන ලද්දාහු හඹුගල් වෙහෙරට වැද බහුශ්‍රැත වූ තිස්ස ස්ථවිරයන්
74 දුටුහු. චතුර් නිකාය හදාළ ඒ තෙරණුවෝ ලත් සැටියෙන් වස්ත්‍රය
පැණිය තෙල්ය සහල් ය යන ආගන්තුක උපකාරයන් දෙවීය. එසේම
75 ඒ ස්ථවිර තෙමේ නොසුව කාලයෙහි කොයි යවු දූ යි විදාළේ ය. ඒ
76 ඇමතියෝ තමහන් (අසවල්ලුයයි) ප්‍රකාශ කොට රජ පවත් දූන් වූහ.
(තෙරුන් විසින්) "බුද්ධ ශාසනානුග්‍රහය කවුරුන් හා කරවන්ට හැකි ද
77 දෙමළුන් කැටිව ද නොහොත් රජු කැටිව දූ"යි විචාරණ ලද ඒ ඇමැතියෝ
"රජහු කැටිව හැක්කැ "යි කීවෝ ය. මෙසේ ඔවුන් කටයුතු හඟවා
තිස්ස, මහා තිස්ස යන තෙරුන් දෙදෙනා ඇමැතියන් ගෙණ එතැනින්
රජු වෙතට පමුණුවා උනුන් කමා කරවූ හ.

78 රජ තෙමේ ද ඒ ඇමැත්තෝ ද මෙසේ තෙරුන් යාච්ඤා
කරන්නාහු "කර්ම සඵල වූ කල එසේම දූතයන් එවූ කල අප වෙත අව
79 මැනව" යි යාච්ඤා කළේ ය. ඒ තෙරහු ප්‍රඥා දී යථා ස්ථානයට ගියෝ
80 ය. මහා යශස් ඇති රජ අනුරා පුර අවුත් දාඨිය දෙමළහු මරා තෙමේ
රජය කරවී ය. ඉක්බිති මිහිපල් තෙමේ ඒ නිඝණ්ඨාරාමය විධ්වංශනය
81 කරවා එහි දොළොස් පිරිවෙනක් ඇති විහාරයක් කරවී ය. මහා විහාරය
82 පටන් ගැන්මෙන් හවුරුදු දෙසිය සතළොස් දසමස් දස දිනක් ඉක්මුණු
83 කල (තුන් රුවන්හි ගෞරව ඇති) ඒ මිහිපල් තෙමේ අභයගිරි විහාරය
පිහිට විය. ඒ තෙරුන් දෙදෙනා කැඳවා උන්වහන්සේලා අතුරෙන්
84 පූර්වෝපකාරක වූ මහා තිස්ස තෙරුන්ට මානදායක රජ තෙමේ ඒ
විහාරය දූන්නේ ය. යම් හෙයකින් ගිරි නම් තැනැත්තහුගේ ආරාමය ද

Non-Commercial Distribution

85 යම් හෙයකින් අභය රජ තෙමේ විහාරය කරවී ද, එහෙයින් නමින්
අභයගිරි යයි කියා ද ඒ විහාරය විය.

ඒ රජ තෙමේ සෝමා දේවිය ගෙන්වා යථා ස්ථාන සංඛ්‍යාත වූ
86 සිය තනතුරෙහි පිහිට විය. ඒ බිසවුන් ගේ ඒම නම් කොට සෝමාරාමය
කරවීය. ඒ උත්තමාංගනා තොමෝ වනාහි රථයෙන් බස්ව ද්දී එතැන
87 කදම්බ පුෂ්පගුල්පයෙහි සැඟවී හුන්නා අතින් මාර්ගය වසා ගෙණ මූත්‍ර
88 කරණ සාමණේර කෙනෙක් දුටුවා ය. රජ තෙමේ ඒ බිසවුන් බස් අසා
මහ සෑයට උතුරු දිග උස බිම ඇති ගල් හෙබ්කඩ නම් සෑය ද විහාරයක්
89 ද එහි කරවී ය.

ඒ සත් යෝධයන් අතුරෙන් උත්තිය නම් තැනැත්තේ නුවරට
90 දකුණු දිගින් දක්ෂිණ නම් විහාරයක් කරවී ය. මූලාව තෙමේ ද එහිම
91 විහාරයක් කරවී ය. මූල නම් ඇමැති වූ තෙමේ ද විහාරයක් කරවී ය.
එහෙයින් ඒ විහාරය ද එම නම් ඇති විය. සාලිය නම් ඇමැති තෙමේ
92 සාලියාරාමය කරවී ය. පර්වත නම් ඇමැති තෙමේ පර්වතාරාමය
කරවී ය. තිස්සාමාත්‍ය තෙමේ තිස්සාරාමය කරවී ය.

93 රම්‍ය වූ විහාරයන් කොට නිමවා ඒ ඇමැතියෝ තිස්ස තෙරුන්
වෙත එළඹ "ඔබ වහන්සේලාගේ උපකාර සාමාර්ථ්‍යයයෙන් අප විසින්
කරවන ලද්දා වූ විහාරයන් ඔබ වහන්සේලාට දෙමුය "යි කියා දුන්නෝ
94 ය. ස්ථවිර තෙමේ හැම තැන්හිම සුදුසු පරිද්දෙන් ඒ ඒ භික්ෂූන් වැස් වූ
සේක.

ඇමැතියෝ තුමූ ශ්‍රමණ සාරූප්‍ය නානාප්‍රකාර පරික්ෂ්කාරයන්
95 සංඝයාට දුන්නෝ ය. රජ තෙමේ සිය වෙහෙර වසන්නවුන් නො අඩු
96 සිවුපසයෙන් උපස්ථාන කළේ ය. එහෙයින් ඒ භික්ෂූහු බොහෝ වූහ.
මහා තිස්ස යයි ප්‍රසිද්ධ වූ කුලයන් හා සංසර්ග ඇති ඒ තෙරහු කුල
සංසර්ග දෝෂය කරණ කොට ගෙණ සංඝ තෙමේ මේ මහ වෙහෙරින්
97 නෙරපීය. ඒ තෙරුන් ශිෂ්‍ය වූ බහලමස්සු තිස්ස ස්ථවිර යයි ප්‍රසිද්ධ වූ
98 තැනැත්තේ තිපීයේ අභයගිරියට ගොස් පක්ෂය උසුලන්නේ හේ
පක්ෂපාතව එහි විසී ය. එතැන් පටන් ඒ භික්ෂූහූ මහා විහාරයට නො
99 අවූ ය. මෙසේ ඒ භික්ෂූහු ථේර වාදයෙන් වෙන්ව දෙපරිද්දෙකින්
100 බිඳුනා හ. දිව්වැසි ඒ මහා අභයගිරි භික්ෂූන්ට වඩන්ට ඒ වළගම්බා රජ
101 තෙමේ ප්‍රාප්ති නම් වැටුප් දෙවී ය. මෙසේ නවකම් කිරීම (සුව) වන්නේ
ය යිසිතා පන්ති බැඳි විහාර හා පිරිවෙන් කරවී ය. ත්‍රිපිටක පාළිය ද
102 එහි ඒ අර්ථ කථාව ද මහා ප්‍රඥා ඇති පූර්වික භික්ෂූහු මුඛ ප්‍රථයෙන්

Non-Commercial Distribution

103 ගෙණ ආවෝ ය. එකල් වැසි වූ භික්ෂුහු සත්ත්වයන්ගේ පරිහාණි දැක
104 ධර්මයාගේ චිරස්ථිති පිණිස පොත්හි ලියවූ හ. වට්ටගාමිණි අභය රජ
තෙමේ මෙසේ දොළොස් හවුරුද්දක් ආදියෙහි පස් මසක් ද රජය
කරවී.

105 මෙසේ ප්‍රඥා තැනැත්තේ ඓශ්වර්‍ය්‍යී ලැබ ගෙණ පර වැඩ හා
තමා වැඩ කෙරෙයි. සම්පත්ති ලොල් වූ මන්ද බුද්ධි තැනැත්තේ මහත්
සම්පත් ලැබත් ආත්මාර්ථ පරාර්ථයක් නොකෙරෙයි.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස දස
රාජක නම් වූ තෙතිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් හතර වෙනි පරිච්ඡේදය

1 ඒ රජහු ඇවෑමෙන් මහසිළු මහතිස් රජ තුදුස් හැවිරිද්දක් දැහැමෙන්
2 සෙමෙන් රජය කෙළේ ය. ඒ රජ තෙමේ "සියතින් කළ වතින් දෙන
3 දන මහත් ඵලය" යි අසා රජ වූ පළමු වස්හිම අප්‍රසිද්ධ වේශ ඇති වැ
(පසල් දනව්) ගොස් ඇල් ගොයම් කපා එයින් ලත් කුලියෙන් මහා
4 සුම්ම තෙරුන්ට පිණ්ඩපාතය දුන්නේ ය. නැවත ක්ෂත්‍රිය කුල ඇති
භූමිශ්වර ඒ රජ තෙමේ ම ස්වර්ණ ගිරියෙහි තුන් හවුරුද්දක් උක්යත
5 උසුලා එයින් කුලී උක් සකුරු ලැබ ඒ උක් සකුරු ගෙන්වා ගෙණ
6 නුවරට අවුත් භික්ෂු සංඝයාට මහ දන් දුන්නේ ය. භික්ෂූන් තිස්
7 දහසකටත් එසේම දොළොස් දහසක් භික්ෂූණීන්ටත් වස්ත්‍ර දන්
දුන්නේ ය.

මිහිපල් තෙමේ මොනවට පිහිටි විහාරයක් කරවා භික්ෂූන් සැට
8 දහසකට තුන් සිවුරු දෙවී ය. භික්ෂූණීන් තිස් දහසකට ද දෙවී ය. ඒ
9 රජ තෙමේ මණ්ඩවාපී විහාරය ද අබාගල ද වගුපට ගල ද දි ශාඛා ගල
ද වාලගම් වෙහෙර ද කරවී ය. මෙසේ ඒ රජ තෙමේ සැදැහැයෙන්
10 නොයෙක් පරිද්දෙන් පින් කොට තුදුස් වස් ඇවෑමෙන් දෙව් ලෝ ගියේ
ය.

11 වළගම්බා රජු පිත් චෝරනාග යයි ප්‍රසිද්ධ වූ කුමාර තෙමේ
12 මාසිළු රජු දවස්හි දාමරිකව හැසුරුණේ ය. මාසිළු රජ කලුරිය කළ
කල අවුදින් රජය කරවී. දුෂ්ට බුද්ධි ඇති ඒ තෙමේ තමන් දාමරික කල
13 යම් වෙහෙරක නිවාස නොලත්තේ නම් ඒ අටළොස් විහාරයන්
14 විධ්වංශනය කරවී. ඒ චෝරනාග තෙමේ දොළොස් හවුරුද්දක් රාජ්‍යය
කරවී ය. ඒ පාපිෂ්ඨ තෙම ලොකාන්තරික නිරයෙහි උපනි.

15 ඒ රජු ඇවෑමෙන් මා සිළු රජු පිත් වූ තිස්ස යයි ප්‍රසිද්ධ රජ
තෙමේ තුන් හවුරුද්දක්ම රජය කරවී. චෝරනාග රජු බිසව් විසම
16 අදහස් ඇති අනුළා දේවි බලතා කෙරෙහි ඇළුණු සිත් ඇත්තී විස දී
විසම ක්‍රියා ඇති (චොරනාග රජු) මැරවී ය. එම බලතා කෙරෙහි
17 ඇළුණු සිත් ඇති අනුළා තොමෝ ම තිස්ස රජු විසයෙන් මරවා බලතාට
රජය දුන්නී ය. ඒ සිව නම් වූ දෙටු දොරටුපල් බලත් තෙමේ අනුළාව
18 මෙහෙසිකා කොට දෙමසක් අධික අවුරුද්දක් ඒ නුවර රජය කරවීය.
19 අනුළා තොමෝම වටුක දෙමළා කෙරෙහි ඇ ළුණු විසයෙන්සිවයා
මරා වටුකයා කෙරෙහි රාජ්‍යය පැමිණ වී, නුවර වඩු ඒ වටුක දෙමළා
20 වනාහි අනුළාව මහේසිකා කොට ගෙණ දෙමසක් අධික හවුරුද්දක්

Non-Commercial Distribution

නුවර රජය කරවී ය. අනුළා තොමෝ ම එහි පැමිණි දර කැටියා දැක
22 උහු කෙරෙහි ඇළුණු සිත් ඇත්තී විසයෙන් වටුකයා මරා ඔහුට රජය
පැමිණවී. ඒ දර කැටි තිස් තෙමේ අනුළාව මහේසිකා කොට ගෙණ
එක් මසක් අධික හවුරුද්දක් නුවර රජය කරවී ය. ඒ තෙමේ මහමෙවුනා
23 උයන්හි පොකුණක් කරවී. එම අනුළා තොමෝ නීලිය නම් දෙමළ
පෙරවි බමුණා කෙරෙහි රාගයෙන් ඇළුනා උහු හා සහවාස කැමැත්තී
24 ඒ දර කැටිතිස් රජු විස දී මරවා නිලිය බමුණාට රජය දුන්නා ය. ඒ
නිලිය බමුණු තෙමේ ද ඇය මහේසිකා කොට ගෙණ නිතර ඇය විසින්
25 උපස්ථාන ලදුයේ, මේ අනුරාධපුරයෙහි සමසක් රජය කරවී. රුචි වූ
26 පරිද්දෙන් දෙතිස් බලතුන් සමග වසනු කැමැති එම අනුළා බිසව්
27 විෂයෙන් ඒ නිලිය රජු මරාවා තොමෝ ම සාර මසක් රජය කරවි.

28 මහා චූලික රජහු දෙවන පිත් මකලන්තිස් නම් ඒ තෙමේම
29 අනුළා දේවියට භයව පලා ගොස් පැවිදිව හිඳ සුදුසු කල්හි ලත් බල
30 ඇත්තේ මෙහි අවුදින් දුෂ්ට මනස් ඇති ඒ අනුළා රාජිනිය මරවා දෙවිසි
31 හවුරුද්දක් රජය කරවී ය. රජ තෙමේ සෑගිරියෙහි මහ පොහෝ ගෙය
කෙළේ ය. ඒ ගෙට ඉදිරියෙහි ගල් සෑය ද බැඳවී. ඒ තෙමේ එම සෑගිරි
32 ගල බෝධි වෘක්ෂය ද ඉඳුවී අතුරුගම තේලගාම විහාරය ද කරවී.
33 එහිම වර්ණක නම් මහමොවු ඇළ ද ආමුදුර්ග මහ වැව ද භයෝලුප්පලු
නම් වැව ද නුවර සත් රියන් උස් පවුර හා එසේම පරිබාව ද (කරවීය)
34 මහා වස්තුයෙහි නොසන්හුන් අනුළාව ආදාහනය කරවා එතැනින්
35 මඳක් තොර කොට මහා වස්තුව කරවී ය. නුවර පද්ම ස්වර වන උයන
ද කරවී ය. මේ රජු මව් බිසව් දන්තයන් ධෝවනය කොට බුදු
36 සස්නෙහි පැවිදි වූවා ය. කුල සමීප ගේ තැන්හි මවු මෙහෙණින්ට
මෙහෙණවරක් දන්තගේහ නමින් කරවී ය. එහෙයින් ඒ දන්ත ධෝවන
මෙහෙණවර යයි ප්‍රසිද්ධ විය.

37 ඒ මකලන් තිස් රජු ඇවෑමෙන් උහු පිත් භාතිකාභය නම් ක්ෂත්‍රිය
38 තෙමේ අටවිසි අවුරුද්දක් රජය කරවී ය. මහදැලියා තිස් රජු සහෝදර
39 බැවින් ධාර්මික මිහිපල් තෙමේ භාතිය රජැයි ලක්දිව්හි ප්‍රකට විය. ඒ
40 තෙමේ මේ ලොහොපහය නවකම් ද කරවී ය. මහ සෑයෙහි පිළිකඩ
41 දෙක ද ථූපාරාමයෙහි පොහෝ ගෙය ද කරවී ය. තමාට උපදනා අය
විසඳා නුවර යොදනක් මානය සිසාරා දෑසමන් සීනිද්දමල් බොහෝ
කොට ඇති කරනා නර ශ්‍රෙෂ්ඨ තෙමේ පාපිළිකඩ පටන් ධුරච්ඡත්‍රය
42 තෙක් සතරඟුල් බොල් ගඳකලලින් මහ සෑය අලේප කරවා එහි මනා
කොට නැටියෙන් මල්වද්දා සෑය මල්ගුභාවක් සේ කරවී ය. නැවත ද
43 දෑඟුල්බොල් මනෝසිලා කබලින් සෑය ආලේප කරවා පෙර සෙයින්ම
44

Non-Commercial Distribution

46 මල් ඇවිණීම කරවී ය. ඉක්බිති හිණි හිස පටන් ධුරච්ඡත්‍රය තෙක්ම
මල් රාශිය විසුරුවා ඒ මල් රැසින් සෑය වැසීය. අබා වැවින් යන්ත්‍රයෙන්
දිය නගා ගෙණ ඒ දියෙන් සැදූහැති ඒ රජ සෑය තෙමමින් ජල පූජාව
47 කරවී ය. ආලේප කටයුතු සුණු සියක් ගැලක් මුත්තෙන් තලතෙල් හා
මනා කොට මනවා සුණු කම්කරවී ය. පබළු දැලක් කරවා ඒ සෑයෙහි
බහා රියසක් පමණ රන් පියුම් (තනවා) සන්ධියෙහි සන්ධියෙහි අවුළුවා
48 එතැනින් බිම තෙක් මුතු වැල් එල්වා පියුම්ද එහි එල්වා මහ සෑය පිදී
ය. ඒ රජ තෙමේ දාගැබිහි රහතුන් පිරිත් බණන හඬ අසා "මම එය
50 නොදැක නැගී නොසිටනිනේ මි යි නිශ්චය කරණ ලදුයේ නැගෙණහිර
ගල් ටැඹ මුල නිරාහාරව හොත්තේ ය. තෙරුන් වහන්සේලා දොරක්
මවා ඒ රජහු දාගැබ් කුසට ගෙණ ගිය හ. ඒ මිහිපල් දාගැබ් ඓශ්වර්‍ය්‍ය
51 සියල්ල දැක බැහැර නික්මුණේ එබඳු වූම පෙතැලි රුවින් පිදීය. මධු
52 භාණ්ඩයෙන් ද ගන්ධ පිණ්ඩයෙන් ද, (පියුම් උපුල් කලප් එබ්බූ පුන්)
53 කළසින් ද ගණ්ධ රසයෙන් ද අඳුන් හිරියල් හා එසේම මනොසිලායෙන්
ද සෑ මළුවෙහි මනෝසිලා බහා ගොස් මහ පමණ සිටි කල (පූජා මල්)
වස්වා ඉන් පසු අතුරු සිදුරු නැතිව වින්‍යාස කළ උපුල් මලින් ද, මුළු
54 සෑ මළුව ගඳ කලලින් පුරා එහි සිතියම් පැදුරු සිදුරෙහි අවුණන ලද
55 උපුල් මලින් ද, එසේම සෑමළුව සොරවූ අවුරා පිර වූ ගිතෙල් නොයෙක්
පට පිලී වැටියෙන් දූල් වූ පහනින් ද එසේම මී තෙල්හි ද තල තෙල්හි
56 ද එපරිද්දෙන්ම පට වැටියෙන් දල්වන ලද බොහෝ වූ පහනිනි ද (පූජා
කෙළේ යි). ක්ෂත්‍රිය තෙමේ කී පරිදි වූ මේ දෙයින් වෙන් වෙන්ව සත්
57 සත්වර බැගින් දාගැප් පූජාව කෙළේ ය.

58 අවුරුදු පතා නියම කොට කරවන ලද උතුම් වූ සුණු පිරියම්
මංගලය එසේම ජය මහා බෝධිය බෝධි නාන පූජාය, අට විස්සක්
59 මහ වෙසක් පූජාය, නොමහත් කොට සුවාසූ දහසක් පූජාය, නානාවිධ
60 වූ නැට්ටුවන් විසින් කරණ ලද නැටුම් හා නානාප්‍රකාර පංචාංගික තූර්‍ය්‍ය
නාදය යන පූජා වර්ගය ශ්‍රද්ධාවෙන් මෙහෙයන ලද රජ තෙමේ මහ
සෑයෙහි පැවැත්වී. දවස තුන් යලක් බුද්ධොපස්ථානයට ආයේ ය. ඒ
61 තෙමේ ම නියත කොට දෙවරක් මල් පූජායෙහි බෙර හැසිරවී. පෙළහර
62 දානය ද පවාරණ දානය ද නියම කොට තෙල් පැණි වස්ත්‍රාදිය ශ්‍රමණ
සාරූප්‍ය පරිෂ්කාරය සංඝයාට බොහෝ කොට දුන්නේ ය. ක්ෂත්‍රිය
63 තෙමේ සෑයෙහි පිරියම් පිණිස ඒ සෑයට ක්ෂෛත්‍රියන් ද පූජා කෙළේ ය.
තව ද ඒ භූමීශ්වර තෙමේ සෑගිරි වෙහෙර භික්ෂූන් දහසකට හැම කල
64 සලාක බතුත් දෙවී ය. චිත්‍ර ප්‍රාසාද මණි ප්‍රාසාද මුචෙල ප්‍රාසාද නම්
65 උපස්ථාන කරණ තැන්හි ද, එසේම පද්මස්වර ප්‍රාසාද ද මනොරම්‍ය
ඡත්‍ර ප්‍රාසාද ය යන පස් තැන්හි හැම කල ධර්මයෙහි ගෞරව අති ඒ

Non-Commercial Distribution

66 තෙමේ ග්‍රන්ථ ධූරයෙහි යුක්ත භික්ෂූන් ප්‍රත්‍යයෙන් උපස්ථාන කෙළේ
67 ය. ඒ භාතිකාභය මිහිපල් තෙමේ පුරාණ රජුන් විසින් නියම කරණ
ලද්දා වූ යම් කිසි සසුන් පිළිබඳ දෙයක් වී නම් ඒ සියලු පින්කම් කෙළේ
යි.

68 ඒ භාතිය රජු ඇවෑමෙ මන් උහු මල් මහදලියා මහා නාග තෙමේ
69 නන් පින්කම් පරමාර්ථ කොට ඇත්තේ දොළොස් හවුරුද්දක්ම රජය
70 කරවී ය. මහ සෑ මළුවෙහි කිඤ්ජල්කපාෂාණයන් ඇති කර විය. මළුව
මහත් කරවා වැලි මළු සීමාව ද කරවී ය. ලක්දිව සියලු විහාරයන්හි
71 දහම් අසුන් කරවී ය. රජ තෙමේ අඹතලා මහ සෑය කරවීය. ගෙපල
72 බිඳ වැටෙන කල බුදුගුණ මෙනෙහි කොට ගෙණ තෙමේ එහි හෙව
ස්වකීය ප්‍රාණය පරිත්‍යාග කොට එහි සෑ භූමිය නවත්වා සෑය පිහිටුවා,
73 සතර දොරටුයෙහි දක්ෂ ශිල්පීන් විසින් මොනවට බෙදන ලද නන්
74 රුවණින් හෙබියා වු රුවන් ඇගෑ සතරක් තැබ්බ විය. නන් රුවනින්
කළ සැට්ටයක් සෑයෙහි බහා පළඳවා ඒ සැට්ටයෙහි රන් බුබුළු හා
එල්ලෙන මුතු දැල් ද තැබ්බ වී.

75 සෑගිරිය අයට යොදනක් මානය සරසවා හාත්පස මනා විථි
76 ඇති සතර දොරටුවක් යොදවා විථි දෑළයෙහි සල්පිල් අතුට කොඩි
77 ඇගෑ තොරණින් තන්හි තන්හි සරසවා හාත්පසින් පහන් මාලා ආලෝක
78 කරවා නැට්ටුවන් ලවා නැටුම් හා ගීත වාදිතයන් ද කරවී ය.
කොළොම්හොය පටන් සෑගිරිය තෙක් මාර්ගයෙහි දෙවිපයින් යනු පිණිස
79 ඇතිරිලි ඇති කර වීම ද කරවී ය. නැටුම් ගී වැයුම් සහිත නෘත්‍ය ද එහි
80 කරවීය. නුවර සතර දොර මහදනුත් දෙවී ය. අතුරු නැති පහන්
මාලවන් මුළු ලක්දිවිහි ද, හාත්පස යොදනක් මානයෙහි මුහුදු දියෙහි
81 ද පැවැත්වී ය. ඒ රජහු විසින් සෑ පෙළහරෙහි කරවන ලද්දා වූ මනා
වූ උදාර වූ ඒ පූජා තොම මෙහි ගිරිහඬු මහා පූජා යයි කියනු ලැබේ.

රජ තෙමේ ඒ පූජා සමාගමයෙහි කැටි වූ භික්ෂූන්ට අට තැනෙක
දන් තබ්බවා, එහි තබ්බවන ලද අට රන් බෙරක් ගස්වා සූවිසි දහසකට
82 මහ දන් පැවැත්වී ය. ෂට් ප්‍රකාර සිව්රු දුන්නේ ය. අන්දුබන්ධනාදියෙන්
83 බඳනා ලද්දවුන්ගේ මුක්තිය ද කරවී ය. සතර දොරටුයෙහි කරනැවෑමියන්
84 ලවා හැම කල කරකම් කරවී ය. මේ රජ පෙර රජුන් විසින් තබන
85 ලද්දා වූ ද, එසේම බෑයා විසින් තබන ලද්දා වූ ද, පින්කම් සියල්ල
නොපිරිහෙලා කරවී ය. තමාය බිසව් ය කුමරුන් දෙන්නා ය මඟුලැත්ය
86 මඟුලස්ය සංඝයා විසින් වලක්වනු ලබන්නේ ම සංඝයාට දුන්නේ ය.

Non-Commercial Distribution

87 ඒ තෙමේ භික්ෂු සංඝයාට සලක්ෂයක් අගනා වූ ද භික්ෂුණී සංඝයාට
88 ලක්ෂයක් අගනා වූ ද පිරිකර දුන්නේ ය.

විධානයෙහි පණ්ඩිත වූ රජ තෙමේ නන් වැදෑරුම් සරුප් බඩු දී
89 තමනුත් සෙස්සනුත් සංඝයාගෙන් මුදා ගත්තේ ය. ජනාධිනාථ තෙමේ
රුහුණු ජනපදයෙහි කාලායන කර්ණිකා නම් තැන මිණිනා පව් නම්
90 විහාරයක් ද, එසේම කලන් ද නම් විහාරයක් ද කරවී ය. කුඹුක්ඛන්ධන
නම් හෝ තෙර මුහුදු විහාරය ද, රුහුණම හුවාවකර්ණික නම් තැන
91 චූලනාග නම් විහාරය ද (කරවීය.) ක්ෂත්‍රිය කුල ඇති මිහිපල් තෙමේ
92 ගල් දිවයින්හි තමා විසින් විහාරයක් කර වූ කල පැන් එල වු හෙරණ
93 කෙණෙකුගේ ආචාරයෙහි පැහැද විහාරය සිසාරා අට යොදනක් ඒ
විහාරයට සාංඝික කොට දුන්නේ ය. ඒ ක්ෂත්‍රිය තෙමේ පඬුවෑ වෙහෙර
ද හෙරණ කෙනෙකුට තුටු වූයේ විහාරය ද එසේම සංඝයා කෙරෙහි
භෝගය ද දෙවී ය.

94 මෙසේ මනා නැණැත්තෝ අනල්ප සම්පත් ලැබ මද ප්‍රමාද දෙකින්
තොර වූවේ එසේම කාම ආශාවෙන්ද තොර ජනයාට දුක් නොකොට
පින්කම්හි ඇලුම් ඇත්තාහු සුපහන් වූවාහු මහත් වූ නානා පින්කම්
කරන්නාහ.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස එකාදසරාජදීපන නම් සූතිස්වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් පස් වෙනි පරිච්ඡේදය

1 මහ දළියා රජු ඇවෑමෙන් එම රජු පිත් ආමණ්ඩගාමිණී අභය
2 රජ නව හවුරුදු අට මසක් රජය කරවී ය. මනරම් මහ සෑයෙහි ඡත්‍රය
3 මතුයෙහි ඡත්‍රයක් කරවී ය. එහි පාපිළිකඩ හා මුදුන් පිළිකඩ ද කරවී
ය. එසේම ලෝවා මහ පායෙහිත් ථූපාරාම පොහෝ ගෙහිත් ඇතුල්
4 මිදුල හා ඇතුළ ආලින්දය ද කරවීය දෙතැනම මනා රුවන් කරවී ය.
නර ශ්‍රෙෂ්ඨ තෙමේ රිදී ලෙන් විහාරය ද කරවීය. පුණ්‍ය කරණයෙහි
දක්ෂ ඒ තෙමේ මාගම්හි දකුණු දිග වැව කරවා දක්ෂිණ විහාරයට
5 දුන්නේ ය. ජන ශ්‍රෙෂ්ඨ තෙමේ ලක්දිව මුළුල්ලෙහි මාඝාතය හෝ
6 සතුන් නොමරවයි යන ව්‍යවස්ථාව කරවීය. ඒ ආමණ්ඩිය රජ ඵල
7 උපදනා සියලු ලතාවන් ඒ ඒ තන්හි රෝපණය කරවා (ඵල එක් කොට)
8 මස්කොමඬු නම් දානයක් පාත්‍රය පුරවා වස්ත්‍ර සුඹුළුවක් කොට අතිශය
පහන් සිතින් දෙවී ය. (යම් හෙයකින්) පාත්‍රයෙහි පුරවා (දන් දුනේනේ
ද) එහෙයින් ලෝ වැස්සන් ආමණ්ඩ ගාමිණී යයි ඔහු දත්තු.

9 ඔහු මල් කර්ණරජාණු තිස්ස කුමාර බෑයා මරා තුන් හවුරුදදක්
10 නුවර රජය කරවී ය. ඒ රජ සෑගිරි පොහෝ ගෙහි අධිකරණ විනිශ්චය
11 කෙළේ ය. (එයින් කිපී) රාජාපරාධ කර්මයෙහි හෙවත් රජු මරන්නමෝයි
සම්මත කර ගත් දුස්සීල සැටක් පමණ භික්ෂූන් රජ තෙමේ වරද ගිවිස්වා
12 අල්වා ගෙණ සෑගිරියෙහි කණීර නම් ප්‍රාග් භාරයෙහි දැම්ම වී කර්ණරජාණු
රජ ඇවෑමෙන් ආමන්ඩ ගාමිණි පිත් චූලාභය කුමර එක් හවුරුද්දක්
13 රජය කරවී ය. ඒ මිහිපල් තෙමේ නුවරින් දකුණු දිග ගෝණක නම්
හෝ තෙර සුළු ගල් වෙහෙර කරවී ය. චූලාභය රජු ඇවෑමෙන් ඒ රජු
14 නැගෙණි වූ ආමණ්ඩ රජ දූ වූ සීවලි කුමරිය සාර මසක් රජය කරවී.

15 ආමණ්ඩ රජු බෑන තෙමේ ඒ සීවලි කුමරිය ඉවත ලා ඉළනාග
16 යයි යන නමින් නුවර සේසත් නැගී ය. ඒ රජු රජ පැමිණි හවුරුදුයෙහි
17 තිසා වැව් ගිය කල බොහෝ ලම්බකර්ණයෝ රජු හැර නුවරට අවු ය.
රජ තෙමේ ඔවුන් එහි නොදැක කිපියේ වැව් පසෙක මහ සෑයක් උන්
18 ලවා මඩවමින් තෙමේ ම කරවී ය. සැඩොලුන් ඔවුන් විචාරන්නන්
කොට තැබ්බ වී.

19 එයින් කිපී ලම්බකර්ණයෝ සියල්ල එක්ව, ඒ රජු අල්වා ගෙණ
සිය ගෙහිම සිර කොට තබා තුමුම රජය විචාළෝ ය. එකල රජහු දේවි
20 තොමෝ සිය පිත් සඳමුහුණු සිව නම්ළදරු කුමරු සරසවා කිරි මවුන්
අතෙහි තබා මඟුලැතු වෙතට හසුන් දී යැවූවා ය. ඒ කිරි මවුහු කුමරු

Non-Commercial Distribution

21 එහි ගෙණ ගොස් බිසව් පණිවුඩ සියල්ල මඟුලැතුට කිවු ය. "මේ
22 තෙමේ තාගේ ස්වාමීන් පිත් ය. ස්වාමී තෙමේ සිරගෙහි සිටියේ ය.
මේ කුමරහු සතුරන් විසින් මැරීමට වඩාතා විසින් මැරීම උතුම. එහෙයින්
මොහු මරව, මේ දේවින්ගේ බසැ" යි කියා ඇතු පාමුල්හි ඒ කුමරහු
23 හෙවූහ. ඒ ඇත් තෙමේ දුක් වූයේ හඬා ඇත්හල බිඳගෙණ මහා
වස්තුවට හෝ රජ ගෙවුයනට වැද උත්සාහයෙන් දොර බිඳ හෙලා
24 රජහු හුන් තැන්හි දොර උපුටා ඒ රජු පිට හිඳුවා ගෙණ මහ තොටට
25 එළඹියේ ය. එහි දී ඇත් තෙමේ රජහු නැව් නගා තෙමේ වට ගිරි මුහුදු
26 තෙරින් මලය රටට නැංගේ ය.

27 ඒ රජ තෙමේ තුන් හවුරුද්දක් පරතෙර වැස නැවින් බලසෙන්
28 ගෙණ රුහුණු රටට පැමිණියේ ය. මිහිපල් තෙමේ හකුරු හෙබ නම්
29 තොට ගොඩ බැස ඒ රුහුණු ජනපදයෙහි මහ බල සෙන් කැටි කෙළේ
ය. රජහු කටයුතු කරණු පිණිස රුහුණටම එළඹියේ ය. ඒ ජනපදයෙහි
තුලාධාර පර්වත විහාර වාසී ජාතකභාණී මහා පදුම නම් මහ තෙරහු
30 වෙත කපි ජාතකය අසා බෝසතුන් කෙරෙහි ප්‍රසන්න වූ ඒ රජ නාග
31 මහා විහාරය බන්ධන මුක්ත දුනු සියයක් කොට කරවීය. සෑය ද තුබු
32 පරිද්දෙන් වැඩුයේ ය. තිසා වැව ද එසේම දූරතිස් වැව ද කරවී ය.

33 ඒ රජ බල සෙන් ගෙණ යුධ පිණිස නික්මියේ ය. ඒ අසා
34 ලම්බකරණයෝ ද යුද පිණිස රැස් වූහ. කබල්කඩ දොර හකර පිටිකෙත
35 උනුන් පෙළෙන දෙපක්ෂයාගේ යුද්ධය පැවැත්තේ ය. නැව්හි දී ක්ලාන්ත
දේහ ඇති බැවින් රජහුගේ මිනිස්සු දුර්වල වෙති. එහෙයින් ඒ රජ
36 තෙමේ ම (මම ඉළනාග රජයෙමි) නම අස්වා යුද්ධයට වන්නේ ය.
එයින් භය වූ ලම්බකර්ණයෝ මුණින් ශත්හ. ඒ තෙමේ ඔවුන්ගේ හිස්
37 රථ නාභිය තෙක්සිඳ කැටි කෙළේ ය. තුන් යලක් මෙසේ කළකල
මිහිපල් තෙමේ කරුණා උපදවා නොමරා ජීවග්‍රාහයෙන් ගණිව්ය" යි
කීයේය.

ඉක්බිති දිනූ සංග්‍රාම ඇත මිහිපල් තෙමේ නුවරට අවුත් සේසත්
38 නඟා තිසා කෙළියට ගියේ ය. දිය කෙළියෙන් ගොඩ නැඟී මොනවට
39 හැඳ පැලඳියේ තමා ශ්‍රී සම්පත් දක ඊට අන්තරාය කර වූ ලම්බකරණයන්
40 මෙනෙහි කොට කිපියේ රථ යෙහි යෙදුයේ ය. රථ පිළිවෙළින් ඔවුන්ට
41 පෙරතුව නුවරට වන්නේ ය. රජ ගෙවුයන් එළිපත සිට ඒ රජ
තෙමේ "පින් වන්නී! මොවුන්ගේ හිස් මේ එළිපතදී ම සිඳිව්" යි අණ
42 කෙළේ ය. ඉක්බිති මැණියන් විසින් "රජ ශ්‍රෙෂ්ඨයාණෙනි! මොව්හු
43 තොපගේ රථයෙහි යොදන ලද්දා වූ ගොන්නු ය. එහෙයින් මුන්ගේ අං

Non-Commercial Distribution

හා කුර සිඳුව" යි මෙසේ හඟවන ලද රජ තෙමේ ශිර්ෂච්ඡේදය නොකොට
44 නාසයත් පය මහපට ඇඟිල්ලත් කැප්පවී රජ තෙමේ ඇතු විසූ ජනපදය
ඇතුට දුන්නේ ය. එහෙයින් නමින් "හස්ති භෝග ජනපදය" වී මෙසේ
45 ක්ෂත්‍රිය ගෝත්‍ර ඇති ඉළනාග මිහිපල් තෙමේ අනුරාධපුරයෙහි නොහඩු
සහවුරුද්දක් මුළුල්ලෙහි රජය කරවී.

46 ඉළනා රජු ඇවෑමෙන් ඔහු පිත් චන්ද්‍රමුඛසීව රජ අට හවුරුදු
47 සත් මසක් රජය කරවී. ඒ මිහිපල් මණිකාරාගම වැවක් කරවා ඉසුරුමුනි
48 විහාරයට පිදීය. දෙමළ දේවී යයි ප්‍රසිද්ධ ඒ රජහු බිසව් ද ඒ ගම්හි
තමහට උපදනා ලාභය එම වෙහෙරට පිදුවා.

49 ඒ සඳ මුහුණු රජු තිසා වැව් කෙළියෙහි දී මරා, යසලාලක
50 තිස්ස යයි ප්‍රසිද්ධ උහුමල් තෙමේ රජව ලංකා පෘථිවියට මුහුණු බඳු
යහපත් සිත්කළු අනුරාපුරෙහි සත් හවුරුදු අට මසක් රජය කරවී. දත්ත
51 නම් දොරපල් පිත් දොරපල් රජහුගේ රූප සාදෘශ්‍යයෙන් ශුභ නම්
ඇත්තේ වී. යසලාලක රජ සිනා පිණිස ඒ ශුභ නම් බලතා
52 රාජාභරණයෙන් සරසා පයඝ්‍යංකයෙහි හිඳුවා බලතාගේ හිස්වෙළුම සිය
53 හිස ලාගෙණ අතින් යෂ්ටිය ගෙණ තෙමේ දොර වෙත සිටියේ ය.
54 අස්නෙහි උන් ඔහුට ඇමැතියන් වඳනා කල්හි රජ තෙමේ සිනාසෙයි.
ඒ තෙමේ අතරතුර මෙසේ කෙරෙයි.

ඒ බලත් එක් දිනෙක සිනාසෙන රජහු (බලා) "මේ බලත් කවර
55 හෙයන් මා හමුයෙහි සිනාසේ ද යි රජු මරවා ඒ ශුභ නම් බලත් තෙමේ
56 ශුභ රජයි ප්‍රසිද්ධ වූයේ සහවුරුද්දක් මෙහි රජය කරවී. ශුභ රජ මහා
57 විහාර දෙක්හි ශුභ රාජ නම් ඇත්තාවූම සිත්කළු පිරිවෙන් දෙකක් කරවී.
58 එසේම උරුවෙල් සමීපයෙහි වල්ලී විහාරය ද නැගෙණහැර එකද්වාර
විහාරය ද ගංතෙර නන්දිග්‍රාම විහාරය ද කරවී.

ලම්බකර්ණ ගෝත්‍රයෙහි ජාත වූ උතුරු දිග වැසි වසභ නම් එක්
59 (මානවකයෙක්) මයිල් සෙනෙවියහට උපස්ථාන කෙළේ ය. "වසභ
60 නම් ඇතියෙක් රජ වන්නේය" යි ශ්‍රැතියෙන් රජ තෙමේ, හැම කල්හි
61 ලක්දිව වසභ නම් ඇති සියල්ලන් මරවයි. ඒ සෙනෙවි "රජහට මේ
වසභ නම් තැනැත්තහු දෙන්නෙමුය" යි බිරින්ද හා මන්ත්‍රණය කොට
උදෑසන රජ ගෙට ගියේ ය (සෙනෙවි බිරින්ද) ලාහෙලා උහු කැටිව
62 යන්නාවූ වසභයා අතට උහු මොනවට රක්නා පිණිස සුණු නැති බුලත්
63 දුන්නී ය. රජ ගෙදොර දී චූර්ණවජ්ජිත බුලත් පලා සෙනෙවි තෙමේ
64 සුණු පිණිස ඔහු යැවීය. සෙනෙවියා බිරින්ද සුණු පිණිස ගිය වසභයාට

Non-Commercial Distribution

65 රහස කියා දහසකුත් දී උහු පැලවිය. ඒ වසභ වනාහි මහා
විහාරස්ථානයට ගොස් එහි තෙරුන් විසින් කිරින් බතින් වතින් කරණ
66 ලද සංග්‍රහ ඇත්තේ, ඉන් ඔබ්බෙහි රජ බව පිණිස නිශ්චය කරණ
ලද්දා වූ (ශාස්ත්‍ර දන්නා) කුෂ්ඨ රෝගතුරයාගේ වචනය අසා ප්‍රසන්න
වුයේ "දාමරික වන්නෙමැ" යි නිශ්චය කරණ ලදුයේ සමර්ථ මිනිසුන්
67 ලැබ ඉන් මත්තෙහි ගම් පැහැරීම් කෙරෙමින් රුහුණු ගොස් කබ
පුල්රටින් ක්‍රමයෙන් රට ගණිමින් සමස්ත බල වාහන ඇත්තේ
68 දැහැවුරුද්දකින් නුවර වෙත අවුත්, ශුභ රජු රජගේ මිදුලෙහි දී මරා
69 මහත් බල ඇති ඒ වසභ රජ තෙමේ නුවර සේසත් නැගීය. මයිල්
තෙමේ ද යුද්ධයෙහි හිණි.

70 පූර්වෝපකාරි වූ මෙත්තා නම් වූ මයිල් බිරින්ද ඒ වසභ රජ
71 තමහට අග මෙහෙසුන් කෙළේ යි. ඒ රජ තමන් ආයු ප්‍රමාණය හෝරා
72 පාඨකයා විචාළේ ය. ඒ තෙමේ ද දොළොස් හවුරුද්දෙකැයි රහසම
73 ඔහුට කීයේ ය. රහස් රක්නා පිණිස දහසක් ඔහුට දෙවා ඒ තෙමේ
74 සංඝයා රැස් කරවා වැද විචාරමින් "වහන්ස! ආයු වැඩීමට හේතු
75 ඇත්තෝදෝ" යි විචාළේ ය. සංඝ තෙමේ "අන්තරාය විමෝක්ෂ
ඇත්තේය" යි කියා "නර ශ්‍රෙෂඨාණෙනි! පෙරහන්කඩ දානය ද ආවාස
දානයද ගිලන් වැටුප් දානය ද දිය යුතුය. එසේම ජීර්ණාවාස
76 ප්‍රතිසංස්කරනය ද කටයුතු පන්සිල් සමාදානය ද කොට ඒ මනාව ර
ක්ක යුතු ය. පොහෝ දවස්හි පෙහෙවස් සමාදානය ද කටයුතු ය යි
විසඳූයේ ය. ඒ රජ "මැනව" යි කියා ගොස් ඒ සියල්ල එසේම
කෙළේ ය.

77 මිහිපල් තෙමේ තුන් හවුරුදු ඇවෑමෙන් ලක්දිව්හි සියලු සංඝයාට
78 තුන් සිවුරු දෙවීය. නොවැඩිය තෙරුන් වෙත සිවුරු යවා දෙවීය.
දෙතිස් තැනෙක මිහිරි කිරිබත් දෙවී ය. සූසැටක් තන්හි මිශ්‍රක මහ දන්
79 දෙවී ය. සැගිරි විහාරය ථූපාරාමය චෛත්‍යය මහ සෑය මහ බෝ ගේ
80 යයි යන මේ සතර තන්හි දහසක් පහන් පැවැත්වී ය. සිතුල් පව්
81 විහාරයෙහි මනරම් සෑ දසයක් කරවී ය. තව ද සියලු ලක්දිව් හි
82 ජීර්ණාවාසයන් ප්‍රතිසංස්කාර කෙළේ ය. ඒ තෙමේ වල්ලියේර නම්
විහාරයෙහි තෙරුන් කෙරෙහි පැහැ ද මහා වල්ලි ගෝත්‍ර නම් විහාරය
83 ද කරවී. මාගම් වෙත අනුරා රාමය කරවී ය. හේලි ගම්හි අට දහසක්
84 කිරිය ඒ විහාරයට දෙවී ය. ඒ තෙමේ තිස් වඩමන්හි මුචේල විහාරය
85 කරවා, ඇලිසර දිය භාගය විහාරයට දෙවු ය. ගලඹතොට සෑයෙහි
86 උළුවැස්ම ද කරවී ය. පොහෝ ගෙය ද කරවී ය. මෙම පොහෝ ගෙයි
87 වැටි තෙල් පිණිස ඒ තෙමේ දහස්කිරි වැව ද කරවා දුන්නේ ය. කුඹුගල

Non-Commercial Distribution

88 විහාරයෙහි පොහෝ ගෙය කරවී ය. ඒ රජ තෙමේ මෙහි ඉසුරුමුනි
විහාරයෙහි පොහෝ ගෙය ද ථූපාරාමයෙහි දා ගෙය ද කරවී. මහ
89 වෙහෙර බටහිර බලා පිහිටි පිරිවෙන් පෙළඳ සතරැස් ශාලාව ද කරවී
ය. දිරූ තැන් ද සකස් කෙළේ ය. එසේම ඒ රජ තෙමේ සතර
බුදුවරයන්ගේ පිළිමයෙන් රම්‍ය වූ පිළිම ගෙය රම්‍ය වූ මහ බෝමළුවෙහි
කරවී ය.

90 ඒ රජහුගේ ප්‍රසිද්ධ වූ බිසවි බෝ මළුවෙහිම සිත් කළු වූ වෘත්ත
91 නම් සෑයක් ද සෑ ගෙය ද කරවී ය. මිහිපල් තෙමේ ථූපාරාම විහාරයෙහි
සෑ ගෙය කොට නිමවා ඒ අවසන් පෙලහරෙහි මහ දන් දුන්නේ ය.
92 ග්‍රන්ථ ධුරයෙහි යුක්ත භික්ෂූන්ට ප්‍රත්‍යය ද ධර්ම කථික භික්ෂූන්ට
ගිතෙල් හා උක් සකුරු දනුවර සතර ධර්ම කථික භික්ෂූන්ට ගිතෙල් හා
93 උක් සකුරු දනුවර සතර දෙරටුයෙහි දිළිඳුන්ට වැටුප් ද ගිලන් භික්ෂූන්ට
94 ගිලන් වැටුප් ද දෙවී ය. මියෙත් වැව රජුපුල් වැව, කොලබෑගම් වැව
මාතික විටි වැව මාගම වැව් දෙක කේමාග වැව, කේලිවාසි වැව,
95 ඇඹටි වැව, වාතමංගන වැව අබ්වඩමන් වැව, යන එකොලොස් වැව
හා දොළොස් මොවු ඇලක් ද රට සුභික්ෂය පිණිස කරවී. සතර (නගර
96 ආරක්ෂා පිණිස උස් වූ නගර ප්‍රාකාරය ද කරවී. සතර දොරටුයෙහි
97 තොරන් ද මහ වතු ද කරවී ය. උයන් කරවා එහි හංසයන් හැරියේ ය.
රජ තෙමේ නුවර ඒ ඒ තන්හි බොහෝ පොකුණු කරවා එහි සොරොවුවේ
98 දිය යැවූයේ ය. හැම කල පින්කම්හි ආදර ඇති ඒ වසභ මිහිපල්
99 තෙමේ මෙසේ නන් වැදෑරුම් පින්කම කොට නසන ලද අන්තරාය
100 ඇත්තේ සුසාලිස් හවුරුද්දක් පුරයෙහි රජකම් කෙළේ ය. සුසාලිසක්
වෙසක් පූජා ද කරවී.

101 ඒ ශුභ රජ ජීවත් වන්නේ ම වසභයාගේ භය ශංකා ඇත්තේ
102 තමා එක් දුව උළුවඩුවාට භාර කෙළේ ය. තමගේ කම්බලය ද රාජ
භාණ්ඩ ද සලකුණු පිණිස දුන්නේ ය. වසභයා විසින් ඔහු මරූ කල
103 උළු වඩු තෙමේ ඇය භාර ගෙණ දූ තන තුරෙහි තබා තමා ගෙයි වඩයි.
104 ඒ ළඳරි තොම කම් කරණ ඔහුට බත් එලවීය. නුවණැති ඕ තොමෝ
105 හිඟුරුවැල් ලැහැබෙත නිරෝධ සමාපත්තියට සම වන් (තෙර කෙනෙක්)
106 සක් වෙනි දවස දූක බත් දන් දුන්නේ ය. නැවත බත් සපයා පියාට
107 බත් එලවී ය. පමා වූ කරුණු විචාරණ ලද්දී එපවත් පියහට කීවාය.
මේ වඩු තෙමේ තුටු වූයේ නැවත නැවතත් තෙරුන්ට බත් දෙවී ය.
108 විස්වස් ඇති ස්ථවිර තෙමේ අනාගතය දූක "කුමාරිකාවෙනි, තිගේ
ඓශ්වර්‍ය්‍ය හටගත් කල මෙතැන මෙනෙහි කර" යි කියා කුමරියට
109 වදාළ සේක. ස්ථවිර වනාහි එකල්හිම පිරිනිවී සේක. ඒ වසභ රජ

Non-Commercial Distribution

තෙමේ විය පැමිණි සිය පිත් වක්නාතිස් කුමරහට අනුරූප කන්‍යාවක්
පරීක්ෂා කරවී ස්ත්‍රී ලක්ෂණ දැන්මෙහි පණ්ඩිත මිනිස්සු උළු වඩුගම ඒ
110 කුමරිය දැක රජහට දැන් වූ ය. රජ තෙමේ ඇය ගෙන්වන්ට පටන් ගත.
එකල උළුවඩු තෙමේ ඇය තමා රජ දූ බැව් කී ය. එසේම කම්බලාදියෙන්
111 ශුභ රජහු දූ බැව් හැඟවී ය. රජ තෙමේ තුටු වූයේ, මනා කොට කෘත
මංගල්‍ය විධි ඇති ඇය පුත්‍රයාහට පාවා දුන්නේ ය.

112 වසභ රජු ඇවෑමෙන් ඔහු පිත් වංකනාසික තිස්ස රජ අනුරාධ
පුරයෙහි තුන් හවුරුද්දක් රජය කරවී. ඒ වක්නාතිස් රජ ගෝණ ගංතෙර
113 මහා මංගල නම් විහාරය කරවීය. මහා මාත්‍ර වූ ඒ දේවි තොම තෙරුන්
114 වදාළා මෙනෙහි කරන්නී වෙහෙරක් කරුණු පිණිස වස්තු රැස් කළා ය.

115 වක්නාතිස් රජු ඇවෑමෙන් පිත් ගජබා ගැමුණු රජ දෙවිසි
116 හවුරුද්දක් රජය කරවී. ඒ තෙමේ මවු බිසවුන් බස් අසා මවු බිසවුන්
117 පිණිස හිගුරුවැල් ලැහැබ් තන්හි රාජ මාතු විහාරය කරවී. පණ්ඩිත ඒ
බිසව් බිම පිණිස මහා විහාරයට ලක්ෂයක් දුන්නී ය. විහාරය ද කරවී.
118 ඒ සෙල්මුවා සෑය තොමෝ ම කරවී ඒ ඒ තැනින් මිළට ගෙණ සංඝ
119 භෝගය ද දුන්නේ ය. අභයගිරි මහ සෑය මහත් කොට බැඳවී. එහිම
සතර දොරටු යෙහි ආදි මුඛ නොහොත් තොරන් කරවී. ඒ මිහිපල්
120 තෙම ගැමුණු තිස් වැව කරවා අභය ගිරි විහාරයෙහි බත් වැටුප් පිණිස
දුන්නේ ය. මිරිස් වැටි සෑයෙහි සැට්ටය ද කරවී. තව ද ලක්ෂයකින්
121 මිළට ගෙණ සංඝ භෝගය ද දුන්නේ ය. අවසාන හවුරුදුයෙහි රාමක
122 විහාරය කරවී ය. අනුරාධ පුරයෙහි මහ අසුන් හල ද කරවී.

123 ගජබා රජු ඇවෑමෙන් ඒ රජු බිසවුන් පිය මහළුනා රජ සහවුරුද්දක්
124 රජය කරවී. නැගෙනහිර දිය පේජලක නම් විහාරයක් ද දකුණු දිග
කොටගල් වෙහෙර ද බටහිර උදපහන් නම් විහාරය ද නාග දිවයින
125 ඇල්ගිරිය ද බීජගාම සමීපයෙහි තේනවේලි විහාරය ද රුහුණු
126 ජනපදයෙහි තොබල්නා පව්වද ඇතුළු රට ගිරහාලික විහාරය ද යන
මේ සත් විහාරයන් මහ පැණැති ඒ මිහිපල් තෙම මන්ද වූ ආයුකාලයෙහි
ද කොට නිම වී.

127 පැණැත්තෝ මේ ආකාරයෙන් අසාර වූ ධනයෙන් සාර වූ බොහෝ
පින් කොට ගනිති. අඥයෝ වූ කලී මොහො නිමිත් තෙන් කාම හේතු
කොට ගෙණ බොහෝ පවු කරන්නාහු යි.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස
"ද්වාදසරාජක" නම් පන්තිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් හය වෙනි පරිච්ඡේදය

1 මහළුනා රජු ඇවෑමෙන් උහු පිත් භාතියතිස් රජ සූවිසි වසක්
2 ලක් රජය කරවී. මහ විහාරය සිසාරා ප්‍රාකාරය කරවිය. ඒ මිහිපල්
3 තෙමේ ගවරතිස්ස විහාරය කරවා මේ විහාරයට මහ ගැමුණු වැවත්
දුන්නේ ය. භාතියතිස් නම් විහාරය ද කරවිය. මිහිපල් තෙමේ
4 මනරම් ථූපාරාමයෙහි පොහෝ ගෙය ද වන්නි රට එක් වැව ද කරවී ය.
5 සසුන් කෙරෙහි මොලොක් සිත් ඇති සංඝයා විෂයෙහි මහ දන් පැවැත්වී
ය.

6 භාතියතිස් රජු ඇවෑමෙන් උහු මල් කණිටුතිස් රජ
7 අටවිසිහවුරුද්දක් ලක්දිව්හි රජය කරවී. ඒ රජ භූතාරාම මහා නාග
තෙරුන් කෙරෙහි පැහැද අභයගිරි විහාරයෙහි රත්න ප්‍රාසාද නම් ගෙයක්
8 යහපත් කොට කරවී ය. අබාගිරි පව්ව ද මහ පිරිවෙන ද මණිසෝම
9 විහාරයෙහි මහ පිරිවෙන ද එහිම දා ගෙය ද එසේම අම්බත්ථල සෑ
10 ගෙය ද නාග දිවයින ගෙයි ප්‍රතිසංස්කාරය ද කරවිය. මිහිපල් තෙමේ
මහා විහාර සීමාන්තය මැඩ එහි කුක්කුට ගිරි පිරිවෙන් පන්තිය සකස්
11 කොට කරවීය. මනුෂ්‍ය ශ්‍රෙෂ්ඨ තෙමේ මහ වෙහෙර දර්ශණීය මනරම්
12 මහත් වූ සතරැස් පහ දොළොසක් කරවී ය. දකුණු වෙහෙර සෑයෙහි
13 සෑ ගෙය ද කරවී ය. මහා මේඝවන මහා සීමාව මිරිකා දකුණු වෙහෙර
බත්හල ද (කරවීය). ඒ තෙමේ මහ වෙහෙර පව්ර පාර්ශ්වයකින් පහකොට
14 දකුණු වෙහෙර බලා යන මාර්ගය ද කරවී ය. භූතාරාම විහාරය ද රාම
15 විහාර සමීපයෙහි රාම ගොණක විහාරය ද එසේම නන්තිස් අරම ද
කරවී ය. නැගෙණ හිරි දිග ගඟරාජියෙහි අනුලතිස්ස පර්වත විහාරය
16 ද නියෙල්තිස් අරම ද පිලපිටි වෙහෙර ද එසේම මනුෂ්‍ය ශ්‍රෙෂ්ඨ තෙමේ
17 රජ මහ වෙහෙර ද කරවී ය. ඒ තෙමේ ම කැළණි වෙහෙර මඬොල්
ගිරිය දූර්වලවාපිතිස්ස යනු මේ විහාර තුන් තන්හි පොහෝ ගෙවල්
කරවී ය.

18 කණිටුතිස් රජු ඇවෑමෙන් උහු පිත් සුළුනා යයි ප්‍රසිද්ධ කුමාර
19 දෙවසක්ම රජය කරවී. සුළුනා රජු මල් වූ කුඩ්ඩනාග රජ සොහොයුරු
20 රජු මරා එක් වසක් මෙහිරජය කරවී, මිහිපල් තෙමේ මහාපාළි නම්
බත් හළ ද වැඩුයේ ය. එක් නැළි සෑයෙහි පන්සියයක් භික්ෂූන්ට
නිතොර (දන් දුන්නේ ය.)

21 එකල කුඩ්ඩනාග රජහු බිසව් සොහොයුරු සිරිනා සෙනෙවි
22 තෙමේ රජහට දාමරිකව, බල වාහයෙන් යුක්තව නුවර වෙත අවුත්
23 රජ සෙන් හා යුද කෙරෙමින් කුඩ්ඩනාග මිහිපල්හු පලවා ලබන ලද

Non-Commercial Distribution

ජය ඇත්තේ ශ්‍රේෂ්ඨ අනුරාපුරෙහි (වෙසෙමින්) එකුන් විසි හවුරුද්දක්
24 ලක් රජය කරවී. මිහිපල් තෙමේ ප්‍රවර මහා චෛත්‍යයෙහි ඡත්‍රය
කරවා මනරම් දකුම් කටයුතු රන්කම් කරවී ය. පස් මහල් කොට
25 ලොහොපාය ද කරවී ය. මහ බෝ සතර දොරටුයෙහි හිණි (පන්තිය)
26 නැවත කරවී ය. ඡත්‍ර ප්‍රාසාදය කරවා පෙළහරෙහි (මහා) පූජා කෙළේ
ය. දයා පරම කොට ඇත්තේ ලක්දිව්හි කුලඹු වර්ගයාත් (රාජකෘත්‍යයෙන්)
තොර කෙළේ ය.

27 සිරිනා රජු ඇවෑමෙන් ඔහු පිත් තිස්ස කුමරු ධර්ම ව්‍යවහාරයෙහි
28 පණ්ඩිත වූයේ දෙවිසි හවුරුද්දක් රජය කරවී. ඒ තෙමේ යම් හෙයකින්
හිංසාවෙන් තොර වූ නීති ක්‍රමය මෙහි පිහිට වී ද එහෙයින් ව්‍යවහාරතිස්
29 රජ යයි කරණ ලද නම් ඇති විය. කම්බු ග්‍රාම වාසී දේව ස්ථවිරයන්
30 වෙත දහම් අසා පංච මහා වාසයෙහි (රෝගාතුරයන්ට) පිළියම් ද කරවී
ය. අනුරා අරම් වැසි මහා තිස්ස තෙරුන් කෙරෙහි ප්‍රසන්න වූයේ
31 මුවෙහි පටුන්හි දාන වෘත්තිය කරවී ය. ඒ තිස්ස රජ මහා විහාර
32 දෙක්හිම මණ්ඩපය ද මහ බෝ ගෙයි නැගෙණහිර ලොහොරු දෙක ද
(කරවී ය.) සුව අවස්වන පරිද්දෙන් සත්පන් පහව කරවා මසෙක්
33 මසෙක්හි දහස බැගින් මහ විහාරයට (දන්) දෙවී ය. අභයගිරි විහාරය
දක්ෂිණ මූල විහාරය මිරිසවැටි විහාරය කුලතිස්ස විහාරය මියුගුණ
34 විහාරය මාගම්හි මහානාග විහාරය නාගදිවයින තිස්ස නම් විහාරය
35 එසේම කැළණි විහාරය යන අට තැන පිහිටි චෛත්‍යයන්හි ඡත්‍රකර්ම
කරවීය. ගොළුකා සෙනෙවියා වෙහෙර ද එසේම දකුණු වෙහෙර ද
36 මිරිසවැටි වෙහෙර ද එසේම පුත්තභාග වෙහෙර ද ඉසුරුමුනු වෙහෙර
37 ද නාග දිවයින තිස්ස වෙහෙර ද යන විහාර සයෙහි පවුරුත් කරවී ය.
අනුරා රාමයෙහි පොහෝ ගෙය ද කරවීය ඒ තෙමේ සද්ධර්ම
38 ගෞරවයෙන් මුළු ලක්දිව ආර්‍යවංශ දේශනා කරවා තන්හි දන් වැට
39 තැබ්බ විය. ශාසන ප්‍රිය ජනාධි නාථතෙමේ තුන් ලක්ෂයක් දී ණය
සහිත භික්ෂූන් ණයින් මිදුයේ ය. ඒ තෙමේ මහ වෙසක් පූජාව කරවා
40 ලක්දිව් වැසි සියලු භික්ෂූන්ටම තුන් සිවුරු දෙවී ය. ඒ තෙමේ කපිල
41 ඇමතියා ලවා වෛතුල්‍ය වාදය මිරිකා පාප නිග්‍රහ කරවා බුදු සස්න ද
බැබල විය. ඒ රජු මල් අභය නාග යයි ප්‍රසිද්ධ වූ කුමර රජහු දේවිය හා
42 සංසර්ග ඇත්තේ සිය බෑ රජු විසින් දන්නා ලදුයේ භයව සේවකයන්
සමග භල්ල තීර්ථයට පලා ගොස් මයිලාහට කිපියා සේ අත්පා සිඳවී
43 ය. රජහු රට භේද පිණිස ඔහු මෙහිම හිඳුවා බලු උපමා දක්වා තමා
44 කෙරෙම් සිනිඳු වූ වන් ගෙණ එහිදී ම නැව් නැගී තෙමේ පරතෙර
45 ගියේ ය. මයිල් සුභ දේව තෙමේ මිහිපල් වෙත එළඹ, සුහෘදයෙකු සේ
46 වෙසෙමින් රජ කෙරෙහි රට වැසි ජනයා භේද කෙළේ ය. අභය
කුමාර එය දන්නා පිණිස මෙහි දූතයෙක් එවී ය. දූතයා දැක ඒ තෙමේ

Non-Commercial Distribution

47 පුවක් ගසෙක වට කරකැවෙමින් කුන්ත මිටුයෙන් පෙළා මුල් දුර්වල
කොට බාහුයෙන්ම (ගස) හෙලා ඔහු තර්ජනය කොට පැලවිය. දූත
48 තෙමේ දූන අභය කුමරහට එපවත් දැන්වීය. අභය කුමර ඒ දැන ඒ
49 රටින් බොහෝ දෙමළුන් ගෙණ බෑයා හා යුද පිණිස නුවර වෙත ආය.
50 රජ තෙමේ ඒ දූන අසෙකු නැගී දේවිය සමග පලා ගොස් මලය රටට
51 ගියේ ය. ඔහු මල් තෙමේ ලුහුබැඳ ගොස් මලය රට දී රජු මරා බිසව්
ගෙණ නුවරට ආයේ මිහිපල්ව අට හවුරුද්දක් නුවර රජකම් කරවී ය.

52 ඒ රජ තෙමේ මහබෝ සිසාරා ගල් පිළිකඩ ද ලොහොපා මිදුල්හි
53 මණ්ඩපය ද කරවී ය. දෙලක්ෂයකින් නොයෙක් වස්ත්‍රයන් ද ගන්වා
ලක්දිව් හි භික්ෂූන් සංඝයාට වස්ත්‍ර දන් දුන්නේ ය. අභය රජු ඇවෑමෙන්
54 උහු බෑ වෝහාරතිස්ස රජු පිත් සිරිනාග කුමර දෙහවුරුද්දක් ලංකා
රාජ්‍යය කරවී. ඒ රජ තෙමේ මහ බෝ හාත්පස පවුර පෙරලා සකස්
55 කොට මහ බෝ ගෙහි වැලි තලායෙහිම මිදෙල්තුරින් ඔබ හංස වෘත්තය
56 ද සිත්කළු මහ මණ්ඩප ද කරවී. සිරිනා රජු පිත් විජය කුමාර නම්
57 තැනැත්තේ පිය රජු ඇවෑමෙන් එක හවුරුද්දක් රජය කරවී.

58 මියුගුණු වෙහෙර සමීප රට උනුන් යහළු වූ සඟතිස්ස සහ බෝය
තුන් වෙනි වූ ගොළු අබා යයි යන ලම්බකරණ ගෝත්‍ර ඇති තුන්
59 දෙනෙක් වූහ. රාජෝපස්ථානයට එන ඒ තුන් දෙනා තිසා වැව හේගෙහි
උන් පණ්ඩිත වූ එක් අන්ධයෙක් පද ශබ්දයෙන් හැඳින "මේ පොළෝ
60 හිමියන් තුන්දෙනා පෘථිවි තොමෝ උසුලන්නී යයි කියේ ය. පසුව
61 එන්නා වූ අබය කුමර ඒ අසා කවරෙක්හු ගේ වංශය පවත්නේ දැ"යි
පෙරලා ගොස් අභය කුමර ඔහුම විචාළේ ය. ඒ තෙමේ "පශ්චිමයාගේ
62 ය "යි කීය. ඒ අසා අභය කුමර සෙස්සන් දෙන්නා සමග ගියේ ය. ඒ
තුන් දෙනා නුවරට වැද රජහට ඉතා ඇළුම්ව රාජ කෘත්‍යයන් සිද්ධ
කෙරෙමින් විජය රජු වෙත (විසූ හ.)

63 (ඒ තුන් දෙනා) එක්ව විජය රජු රජ ගෙහිදීම මරා සෙනෙවි
සඟතිස් කුමරු ඉතිරි දෙදෙනා රාජ්‍යයෙහි අභිෂේක කළෝ ය. මෙසේ
64 අභිෂේක කරණ ලද්දා වූ ඒ සඟතිස් රජ නගරොත්තම අනුරා පුරෙහි
65 සතර හවුරුද්දක් රජය කරවිය. මහ සෑයෙහි ඡත්‍රය ද රන්කම් ද කරවී
66 ය. මිහිපල් තෙමේ වෙන් වෙන්ව ලක්ෂයක් ලක්ෂයක් අගනා මිණි
67 රුවන් සතරක් ද සතර රිවිබිඹු මැද තැබ්බ විය. එසේම සෑ මුදුන්හි
අනගි වීදුරු සුඹුළුවක් හෝ කොත් කැරැල්ල තැබ්බ විය. ඒ නර ශ්‍රෙෂ්ඨ
68 තෙමේ ඡත්‍රෝත්සව පූජායෙහි සතළිස් දහසක් සංඝයාට ෂට් චීවරයන්
69 දෙවී ය. දම්ගල් විසූ මහා දේව තෙරුන් විසින් දෙසන ලද යාගයෙහි
අනුසස් දක්වන්නා වූ ඛන්ධක පාළියෙහි සූත්‍රය අසා පහන් වූයේ සංඝයාට

Non-Commercial Distribution

සකස් කළා වූ කැඳ දානය නුවර සතර දොරටුයෙහි යහපත් කොට
70 දෙවීය. ඇතොවුරන් ඇමැතියන් සහිත ඒ රජ පැසුනා වූ දඹ අනුභවය
පිණිස අතුරෙන් අතර නැඟෙනහිර දිවයිනට යෙයි. නැගෙණහිරි වැසි
71 මිනිස්සු මොහුගේ ගමනින් උපද්‍රැත වූවෝ රාජ භෝගයට සුදුසු දඹ
එලයන්හි වස යෙදූය. ඒ ජම්බු එලයන් කා තෙමේ එහිම මෙළේ ය.

72 ගොළුඅබා කුමර සඟබෝ සෙනෙවි රජු රාජ්‍යයෙහි අභිෂේක
73 කෙළේ ය. පන්සිල් රක්නා ඒ රජ තෙමේ ශ්‍රී සංඝබෝධි යයි ප්‍රසිද්ධ
74 විය. අනුරා පුරෙහි වෙසෙමින් දෙහවුරුද්දක් රජය කරවී. මහ වෙහෙර
මනරම් ලහබත් ගෙයක් කරවී ය. එකල්හි ඒ රජ ලක්දිව මිනිසුන්
75 නියංසායෙන් බැගෑ බැව් දුන කරුණාවෙන් කම්පිත හෘදය ඇත්තේ ඒ
තෙමේ මහ සෑ මිදුල බිම මෙසේ නිශ්චය කොට ගෙණ "වැසි වැස
76 දියෙහි මා නො ඉල්පු කල මෙහි මැරෙන්නා වූ ද මම් නොනැගිටින්නෙමි"
77 යි හෝත්තේ ය. රජු මෙසේ හොත් කෙණිහි ම සියලු ලක්දිව පිනවමින්
78 වැසි වැස්සේ ය. එසේ ද ඒ තෙමේ දියෙහි නොයිල් පෙනේනෙන්
නොනැගිටි ඉක්බිත්තෙන් ඇමැතියෝ දිය බැස යන සොරොවු ඇවුරුහ.
79 ඉක්බිති දැහැමි රජ තෙමේ දියෙහි ඉල්පෙමිනි නැගිට්ටේ ය. මෙසේ
80 ලංකාද්වීපයෙහි නියං සාය කරුණාවෙන් බැහැරලීය. ඒ ඒ තැන සොරු
81 වූහයි මිහිපල් තෙමේ අසා සොරුන් ගෙන්වා රහසින් පලයා රහසින්
මළවුන්ගේ සිරුරු ගෙන්වා ගිනේනෙන් පුලුස්සා සොර උවදුරු ද නසන
ලදී.

82 රක්තාක්ෂි යයි ප්‍රසිද්ධ වූ එක් යකෙක් මෙහි අවුත් ඒ ඒ තැන
83 මිනිසුන්ගේ ඇස් රතු කෙරෙයි. උනුන් රත් ඇස් බලා බිය වැද [1]
84 මනුෂයෝ නසිති. යක්ෂ තෙමේ ඒ මිනිසුන් සැක නැතිව කයි. රජ
තෙමේ උන් උවදුරු අසා තැති ගත් සිත් ඇත්තේ හුදකලාව අටඟ
85 පෙහෙවස් ඇතිව උපවස් ගෙයැ තුල "ඒ යකු නොදැක නොනැගිටින්නෙමි
86 "යි හෝත්තේ ය. යක් තෙමේ රජහු දහම් තෙදින් රජහු වෙත ආය.
රජු වෙතින් කවරෙද්දැයි පුලුවුස්නා ලද්දා වූ යක් තෙමේ මම (අසවලැයි)
87 දැන්වීය. "කවර හෙයින් මාගේ ප්‍රජාව කයි ද නොකව "යි කියේ ය.
88 යක් තෙමේ මට එක් දනව්වෙක මිනිසුන් දෙව යි කීය. නොහැක්කකැයි
කී කල යක් තෙමේ ක්‍රමයෙන් ඉල්වා "එක් මිනිසෙක් දුන මැනව "යි
කීය. රජ තෙමේ "අනිකෙක් දෙන්ට මට නොපිළිවන මා (මස්) කයි"
89 කීයේ ය. යක් තෙමේ නොහැක්කැයි කියා "ගමක් ගමක් පාසා බිලි
දුන මැනව" යි රජහුගෙන් ඉල්වී. භූමීශ්වර තෙමේ මැනැවැයි කියා
90 සියලු දිව්හිම ගම්දොර තබ්බවා ඔහුට බලි (බත්) දෙවීය. සියලු සත්හු
විසින් හටගත් මහාරෝග භය මේ උපායෙන් නසන ලදී. රජහුගේ

Non-Commercial Distribution

91 ඇමැති වූ භාණ්ඩාගාර නායක ගොළුඅබා කුමර දාමරිකව උතුරු දිගින්
92 නුවරට එළඹියේ ය. ඒ රජ තෙමේ පර හිංසා නොකැමැත්තේ
93 පෙරහන්කඩ ගෙණ දකුණු දොරින් හුදකලාවම පලා ගියේ ය. බත්
මුළක් ගෙණ මග යන්නා වූ මිනිසෙක් බත් අනුභවය පිණිස නැවත
94 නැවත රජහට යාච්ඤා කෙළේ ය. කරුණා බහුල රජ තෙමේ දිය
පරහා ගෙණ බත් අනුභව කොට ඔහුට මේ උපායෙන් අනුග්‍රහයක්
95 කරන්නට "පින්වත මම සංඝබෝධි රජයෙමි. මා හිස ගෙණ ගොස්
ගොළුඅබා රජුට දක්වව, තට බොහෝ වස්තු දෙන්නේය" යි මේ බස
96 කීයේ ය. ඒ තෙමේ ඒසේ කරන්ට නොකැමිති විය. මිහිපල් තෙමේ
ඔහු පිණිස හුන්නේ ම මෙළෙඒ යි. මිනිස් තෙමේ රජු හිස ගෙණ
97 (ගොස්) ගොළු අබා රජුට දැක්වීය. ඒ තෙමේ විස්මිත සිත් ඇත්තේ
ඔහුට වස්තු දී (මළ) රජුට මැනවින් සත්කාර කරවී ය.

98 මෙසේ මේ ගෝඨාභය තෙමේ මේඝවර්ණාභ යයි ප්‍රසිද්ධ වූයේ
99 තෙළෙස් හවුරුද්දක් ලක් රජය කරවී ය. රාජොද්‍යානය කරවා උයන්
100 දොරටුයෙහි මණ්ඩපයක් තනා අලංකාර කරවා සඟින් භික්ෂූන් අටතුරා
දහසක් ලැබ ගෙණ එහි වඩා හිඳුවා මිහිරි වූ නන් වැදෑරුම් කැඳ අවුළු
101 හා භෝජනයෙන් සිවුරු සහිත කොට දවස් පතා මහ දන් පැවැත්වීය.
102 මෙසේ එක්විසි දිනක් නොවළහා කර වුයේ යි. මහා විහාරයෙහි මහත්
103 ශෛල මණ්ඩපයක් කර වීය. ලොහොපාය ටැම් ද පෙරලා තැබ් විය.
ජය මහා බෝධියෙහි ගල්පිළිකඩ ද උතුරු දොරටුයෙහි තොරනද, සතර
කොණ චක්‍ර සහිත ටැම් ද පිහිට විය. දොරටු තුනෙහි සෙල් මුවා පිළිම
104 තුනක් කරවා දකුණු දොරටුයෙහි සෙල් මුවා පලහක් තැබ්බ විය.
105 මහා විහාරයට බටහිරින් පදන් බිම කර විය. ලක්දිව්හි ජීර්ණවාස
106 සියල්ලම අළුත් කොට කරවීය. ථූපාරාමය විහාරයෙහි දාගෙය හා එසේම
107 අඹතලා දා ගෙය ද මිණිසොම් නම් අමර දා ගෙය ද පිළිසකර කර විය.
ථූපාරාමය මණිසොමාරාමය මිරිසවැටිය දක්ෂිණ විහාරය යන මෙතෙක්
108 තැන පොහෝ ගෙවල් ද (පිළිසකර කරවී.) මේඝ වර්ණාභය නම් අළුත්
විහාරයක් ද කරවී ය. විහාර පූජා පෙළෙහරරෙහි ලක්දිව් වැසි තිස්
109 දහසක් භික්ෂූන් රැස්කරවා ෂට් සිවුරු දෙවීය. එකල මහ වෙසක්
110 පූජාව ද එසේම කර වීය. වසක් පාසා සංඝයාට ෂට්චීවර දෙවී ය.

111 ඒ තෙමේ පව්ටුන්ගේ නිග්‍රහය කරවා බුදු සස්න ශුද්ධ කර වමින්
අභය ගිරිවාසී වෛතුල්‍ය වාදී වූ බුදු සසුන්හි කටු බඳු සැටක් පමණ
112 භික්ෂූන් ගන්වා ඔවුන්ට නිග්‍රහ කරවා පරතෙර දැම්ම විය. එහි දමන
113 ලද තෙරහුගේ ආශ්‍රය ඇති යක්ෂ විද්‍යාදි යෙහි දක්ෂ වූ සංඝමිත්‍ර නම්
114 සොළී භික්ෂූ කෙනෙක් මහා විහාර යෙහි භික්ෂූන්ට කිපී මෙහි ආයේය.
සීලාදිසංයම නැති ඒ තෙමේ ථූපාරාමයෙහි සංඝ සන්නිපාතයට වැද

Non-Commercial Distribution

එහි දී පිරිවෙන් වැසි මහා ස්ථවර වූ සංඝපාල නම් මේ ගොළු අබා රජු
115 මයිල මහළු තෙරුන් රජහුගේනමින් කථා කරන්නහුගේ මස ප්‍රතික්ෂේප
116 කොට රජහුගේ කුලෝපග විය. රජ තෙමේ ඔහු කෙරෙහි පැහැද දෙටු
117 පිත් දෙටුතිස් කුමරු ද (උහු) මල් මහ සෙන් කුමර ද ඒ භික්ෂුහට භාර
කෙළේ ය. ඒ තෙමේ දෙවෙනි කුමර සතුටු කොට ගත්තේ ය. දෙටුතිස්
කුමර වනාහි ඒ මහණහු කෙරෙහි වෛර බැන්දේ ය.

118 පිය රජු ඇවෑමෙන් ඒ දෙටුතිස් කුමර රජ විය. පිය රජු ශරීර
119 සත්කාරයෙහි පැමිණෙනු නොකැමැති දුෂ්ට ඇමැතියන් නිග්‍රහ පිණිස
රජ තෙමේ ම නික්ම ගොස් මල් කුමර පෙරතු කොට යවා පියහු
120 සිරුරත් ඉක්බිති කොට යවා, ඉන් ඉක්බිති කොට ඇමැතියනුදු මෙහෙයා
තෙමේ පසුව මල්හු ද පියහු සිරුර ද පිටත් වූ කල ඊට ඉක්බිතිව දොර
121 වස්නා දුෂ්ටාමාත්‍ය යන් මරවා පියහු දර සෑය සිසාරා දිවසුහුල හිඳවී
රජහුගේ ඒ ක්‍රියාව කරණ කොට ගෙණ දෙටුතිස් යන ඔහුගේ නාමය
122 කක්බල යනු උප පද කොට ඇති විය. සංඝ මිත්‍ර ඒ භික්ෂූ තෙමේ ඒ
123 නර නාථයා කෙරෙන් බියව ඔහු අභිෂේකයට සම කාලවම මහ සෙන්
කුමරු හා මන්ත්‍රණයකොට ගෙණ ඒ මහ සෙන්හුගේ අභිෂේක අපේක්ෂා
124 කෙරෙමින් මෙයින් පරතෙර ගියේ ය. ඒ දෙටුතිස් රජ පිය රජු විසින්
කොට අඬාල උතුම් ලොහොපහය සත් බුමුකොට කෙළක් අගණා සේ
125 කරවීය. එම දෙටුතිස් රජ සැට ලක්ෂයක් අගණා මිණි රුවනක් පුදා
126 එහි (ලොහොපහයෙහි) උතුම් මිණි පහයක් කර විය. මහඟු මැණික්
දෙකක් මහ සෑයෙහි පිදී ය. මහ බෝ ගෙහි තොරන් තුණ ද කර වීය.
127 ඒ පෘථිවීශ්වර තෙමේ පැදුම් තිස් පව්ව විහාරයක් කරවා පංචා වාසයෙහි
128 සංඝයාට දුන්නේ ය. ඒ දෙටුතිස් රජ දෙවනපෑතිස් රජු විසින් පෙර
ථූපාරාමයෙහි පිහිටු වන ලද මනා දැකුම් ඇති මහ ගල් පිළිමය
129 ථූපාරාමයෙන් ගෙණ ගොස් පැදුම් තිස් පව් අරම්හි පිහිට විය. ඒ
දෙටුතිස් තෙමේ කළු මැටි වැව් සෑගිරියට පිදීය. වෙහෙර පහ පෙළහර
130 මහ වෙසක් පූජාය (යන මෙතෙක්) පූජා කොට දහසක් සංඝයාට ෂට්
131 චීවර දානය දුන්නේ ය. ඒ රජ තෙමේ ආලම්බගාම වැව ද කරවී ය. ඒ
132 රජ තෙමේ මේ ආකාරයන් ප්‍රසාද කරණාදී වූ නන් වැදෑරුම් පින්කම්
කරවමින් දහ සවුරුද්දක් රජය කරවී.

133 මේ ආකාරයෙන් නන් වැදෑරුම් පින්කමට හේතු වූ නරපල් බව
නොයෙක් පාපයන්ට ද හේතු යයි (දන) විෂයෙන් මිශ්‍ර මධූරාහරයක්
හෙයින් එය කිසි කලෙකත් සත්පුරුෂයන්ගේ මනස භාජනය
නොකරන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කළ මහ වස
තයෝදස රාජක නම් වූ සතිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් හත් වෙනි පරිච්ඡේදය

1 දෙටුතිස් රජු ඇවෑමෙන් උහු මල් මහ සෙන් රජ සත් විසි
2 හවුරුද්දක් රජය කරවීය. ඔහුගේ රාජ්‍යාභිෂේකය කර වන්ට
සංඝමිත්‍රස්ථවිර තෙමේ කල් දැන පරතෙර සිට මෙහි ආයේ ය. උහුගේ
3 අභිෂේකය ද නොයෙක් පරිද්දෙන් අතික් කිස ද කරවා සීලාදී
4 සංයම නැති හේ තෙමේ මහා විහාර විධ්වංසනය කරුණු
කැමැත්තේ "මහරජාණෙනි මහ විහාර වාසී මොව්හු අවිනය වාදීහ අපි
5 විනය වාදියම්ය"යි රජහු මෙසේ (දෘෂ්ටි) ගන්වා "යමෙක් තෙමේ
6 මහවෙහෙර වැසි මහණෙකුට ආහාරයක් දෙයි නම් ඒ තෙමේ සියයක්
දඩය සුදුසු"යයි රජු දණ්ඩනය තැබ්බවී මහා විහාර වාසී ඒ භික්ෂුහු
7 ඔවුන් විසින් උපද්‍රැති වූවාහු මහා විහාරය දමා මලය රට රුහුණු රට
බලා ගියෝ ය. එහෙයින් මේ මහා විහාරය තෙමේ නව හවුරුද්දක්
හරණ ලද්දේ මහා විහාර වාසී භික්ෂුන්ගෙන් ශූන්‍ය විය. හිස් විය.
8 දුර්මති වූ ඒ ස්ථවිර "අස්වාමික වස්තුව පෘථිවිශ්වරයාට වන්නේ ය "යි
9 දුර්මති රජහට හඟවා මහා විහාරය නස්වන්ට රජහුගෙන් ලැබූ අනුමැති
10 ඇති දුෂ්ට මනසින් යුක්ත ඒ තෙමේ මහා විහාරය වසන්ට නියම කෙළේ
ය. සඟමිත් තෙරහුගේ මෙහෙකරු රාජවල්ලභ දරුණු වූ සෝණ ඇමැති
11 ද අලජ්ජි භික්ෂූහු ද සත්බුමු අතුම් ලොහොපාය ද නානා ප්‍රකාර ගෙවල්
12 ද බිඳ මෙයින් අභය ගිරියට ගෙණ ගියෝ ය. තවද මහ වෙහෙරින්
ගෙණ යන ලද්දා වූ බොහෝ ප්‍රාසාදෝපකරණයෙන් ඒ අභයගිරි විහාරය
13 බොහෝ ප්‍රාසාද ඇත්තේ විය. පාප මිත්‍ර වූ සංඝමිත්‍ර නම් තෙරුන් ද
14 සොණ නම් සේවකයා ද ලැබ ඒ මිහිපල් තෙම බොහෝ පවු කෙළේ ය.
ඒ මිහිපල් තෙම පැදුම් තිස් පව්වෙන් මහ ගල් පිළිරුව ගෙන්වා අභය
15 ගිරියෙහි පිහිට වී. පිළම ගෙය බෝ ගෙය මනරම් ධාතු ශාලාව සතර
ස් ශාලාව යන මෙය ද කර වීය. කුක්කුට ගිරි පිරිවෙන් පෙළ ජීර්ණ
16 ප්‍රතිසංස්කරණයෙන් සැරසී ය. දරුණු ක්‍රියා ඇති ඒ සඟමිත් තෙරුන්
කරණ කොට ගෙණ එකල ඒ අභය ගිරි විහාරය තෙම දකුම් කටයුතු
විය

17 රජහුගේ සර්වාර්ථ සාධක වූ මේඝවර්ණාභය නම් මහළු ඇමැති
තෙමේ මහ වෙහෙර නැස්ම නිමිත්ත කොට ගෙණ කිපී (රජහට) දාමරිකව
18 මලය රටට ගොස් ලැබූ මහ බල සෙන් ඇත්තේ දුරතිස් වැව්හි කඳවුරු
19 ලා ගත්තේ ය. ඒ මිහිපල් තෙමේ යහළුවා එහි ආ බැව් අසා යුධ පිණිස
පෙරට ගොස් කඳවුරු පිහිට විය. මලය රටින් ගෙණන ලද මිහිරි
20 පානයක් හා මාංසයක් ලැබ "සහය රජු විනා නොකන්නෙමි"යි සිතා
21 එය තෙමේ ම ගෙණ රාත්‍රියෙහි හුදකලාව තික්ම රජු වෙත අවුත්

Non-Commercial Distribution

එපවත් දැක්විය. ඔහු විසින් ගෙණන ලද ඔහු හා විස්වස් ඇත්තේ
22 අනුභව කොට රජ තෙමේ කවර හෙයකින් තෝ මා කෙරෙහි දාමරික
වූයෙහි ද යි ඇමැතියා පිළිරිවිසියේ ය. තොප විසින් මහා විහාරය
23 නැසූබැවිනි යි කීයේ . රජ තෙමේ විහාරය පිහිටු වන්නෙමි මාගේ වරද
ක්ෂමා කරව යි මෙසේ කියේ ය. ඒ ඇමැති තෙමේ රජු කමා කර
24 විය. ඔහු විසින් හඟවන ලද රජ තෙමේ පෙරලා නුවරට ම ආයේ ය.
25 ඒ මේඝවර්ණාභය තෙමේ රජුට හඟවා විහාරකරණයට ද්‍රව්‍ය සම්භාර
හේතුවින් රජු සමග නො ආයේ ය.

26 රජහුගේ වල්ලභ වූ ලේනාවෙයහි ද එක් බිරින්දක් තොමෝ
මහා විහාරනාසයෙහි දුක් වුවා එසේම කිපියා වඩුවාට සංග්‍රහ කොට ඒ
27 විනාසක තෙරහු මැර විය. ථූපාරාමය නසන්ට පැමිණි වූ දුෂ්ට කල්පනා
28 හා දරුණු ක්‍රියා ඇති සඟමිත් තෙරහු මරවා නොසන්සුන් දරුණු සොණ
29 ඇමැති ද මැරුහු ඒ මේඝවර්ණාභවය තෙමේ ද්‍රව්‍ය සම්භාරය ගෙණ
30 අවුත් මහ වෙහෙර නොයෙක් පිරිවෙන් කර විය. අභය මහ ඇමැතියා
විසින් ඒ භය සංසිද වු කල භික්ෂූහු ඒ දිගින් අවුත් මහා විහාරයෙහි
31 විසූහ. රජ තෙමේ මහ බෝ ගෙහි බටහිරි දිග ලොහොරු දෙකක්
කරවා තැබ්බ වීය.

32 දකුණු අරම් වැසි තුහක වූ වංක සිත් ඇති පාප මිත්‍ර වූ
33 නොසන්හුන් තිස්ස තෙරුන් කෙරෙහි පැහැද මහා විහාර සීමා පෙදෙසක්
වූ ජෝති වන උයන්හි වලකනු ලබන්නාහු ද ඒ තෙමේ ජේතවන විහාරය
34 කර විය. ඉකිබිති ඒ තෙමේ සීමාවය උදුරන්ට භික්ෂු සංඝයාටගෙන්
35 ඉල් විය. භික්ෂූහු ඒ නොදෙනු කැමැත්තෝ විහාරයෙන් පලා ගියේ යා.
මෙහි සතුරන් විසින් කරණු ලබන්නා වූ සීමා සමූහය කෝප කරන්ට ඒ
36 ඒ තැන කිසි භික්ෂු කෙනෙක් සැඟවී හුන්නේ ය. මෙසේ නව මසක්
37 මහ විහාරය මුළුල්ලෙහි භික්ෂූන්ගෙන් තොර විය. අන්‍ය භික්ෂූහු "සීමා
සමූහනය කරම්හ" යි සිතූය. ඉක්බිති සීමා සමූහන ව්‍යාපාරය නිමි කල
38 භික්ෂූහු අවුදින් මේ මහා විහාරයෙහි විසූහ. විහාර ප්‍රතිග්‍රාහක ඒ තිස්ස
39 තෙරුන්ට අන්තිම වස්තුවෙන් සත්‍යාර්ථ චෝදනාවක් සඟ මැද
පැමිණියා ය. ධාර්මික යයි ලෝක සම්මත වූ විනිශ්චය මහ ඇමැතියෙක්
තෙමේ වූ පරිද්දෙන් දැහැමෙන් විනිශ්චය කොට රජහු නොකැමැති
කලම ඒ තෙරහු සිවුරු හැර විය.

40 ඒ රජ තෙමේම මින්නේරි විහාරය කර විය. ඒ තෙමේම දෙවොල
41 නටබුන් කොට ගෝකර්ණ විහාරය එකකාපිල්ල විහාරය බමුණු ගම
42 කලන්දක විහාරය යන විහාරත්‍රය කරවිය. මාගම්ම විහාරය ගඟසෙන්

Non-Commercial Distribution

ගල වැලි බටහිර දිග දාසෙන් ගල යන විහාර ද කරවී. තව ද රජ
43 තෙමේ කොක්වා ජනපදයෙහි මහා විහාරයක් කරවී. රූපාරම්ම
විහාරයක් ද සුළු පිටි විහාරය ද උතුරු අබා හෙබ මෙහෙණවර දෙකක්
44 ද කර විය. කාලවේළක යක්ෂයාගේ දොවොලෙහි සෑයකුදු බැඳවී. ලක්
45 දිව්හි දිරූ බොහෝ ආවාසයන් අළුත් වැඩියා කෙළේ ය. ඒ තෙමේ
සංඝ ස්ථවිර දහසකට දහසක් අගණා ස්ථවිර දානය ද සියල්ලන්ටම
46 වසක් පාසා සිවුරු ද දුන්නේ ය. ආහාර පානාදි දානයා ගේ පරිච්ඡේදය
නොපැණේ.

47 ඒ රජ තෙමේ ම රජ සුභික්ෂය පිණිස සොළොස් වැවක් කරවී.
එනම් මින්නේරි මහ වැව, ජල්ලුරු වැව, බාහු නම් වැව, මාමිණිවා
48 වැව, කෝකවාත වැව, මොනරා වැව, පරක වැව, කුම්බාලක වැව,
වාහක වැව, රත්මල්කඩ වැව, තිභව නම් වැව, වෙලංවිටි වැව, මාගල්
49 වැව, සිරු වැව, මහා දාරගල්ලක වැව, කළුපහන් වැව, යන මොව්හු
50 සොළොස් වැව්හු යි ඒ තෙමේ ගුහාවෙන් පර්වත නම් මහමෙවු ඇලක්
කැනවී. මේ ආකාරයෙන් ඒ රජ තෙමේ ඉතා බොහෝ වූ පින් හා
පවුත් රැස් කෙළේ ය.

පූර්ව භාගය නිමි.

Non-Commercial Distribution

# තිසි හත් වෙනි පරිච්ඡේදය

51 ඒ මහසෙන් රජ තෙමේ අසත්පුරුෂ සමාගමයෙන් දිවි හිමියෙන්
මෙසේ ශුභාසුභ ක්‍රියා කොට කම් වූ පරිද්දෙන් පරලොව ගියේ ය.
52 එහෙයින් නුවණැත්තෝ අසත්පුරුෂ සමාගමය දළ විස සර්පයකු සේ
දුරින් ම දුරු කොට වහා තමහට හිතයක් කරන්නේ ය.

53 ඉක්බිති උහු පිත් සිරිමෙවන් කුමාර රාජ පදප්‍රාප්ත විය. හේ
තෙමේ මන්ධාතු රජු සේ සකල සම්පත් දායක විය පවිටුන් වසඟ වූ
54 මහසෙන් රජහු විසින් නසන ලද මහ වෙහෙර සියලු භික්ෂූන් රැස්කොට
සමීපයට එළඹ වැඳ හිඳ ගෙන ආදර සහිතව සඟමිත් නම් තෙරහුගේ
55 යහළු මපියාණන් විසින් කුමක් කුමක් නසන ලදදැ" යි විචාළේ ය.
56 භික්ෂූහු ඒ රජහට මහරජ ඔබ පිය තෙමේ සීමාව උදුරන්ට ව්‍යායාම
කොටත් අනෙතා සීමායෙහි භික්ෂූන් විද්‍යාමාන හෙයින් නො හැකි වී
57 මෙහි වනාහි භික්ෂූ සත් දෙනෙක් බිම් ගෙයක සැඟ වී උන්නා හ.
58 සෝණ නම් ඇමති ද සඟමිත් නම් පවිටු තෙරහු ද රජ්ජුරුවන් සිතට
59 නඟා උහු ලවා පව් කරවූ හ. උතුම් සත්බුමු ලොහොපාය ද නානා
ප්‍රකාර ගෙවල් ද බිඳ මෙයින් අභයගිරියට ගෙන ගිය හ. (අදෝමැයි)
60 බාල සමාගමයක් බැලුව මැනව අඥාන වූ ඔව්හු සතර බුදු කෙනෙකුන්
61 විසින් පරිභෝග කළ රුවන් වැලි සෑ මිදුලෙහි උඳු වැපිර වූ හ යි කීහ.
රජ තෙමේ පියහු ඒ කම් අසා බාල සමාගමයෙහි කල කිරුණේ ඒ
62 වෙහෙර තමන් පියහු විසින් නසන ලද සියල්ල ප්‍රකෘතිමත් කෙළේ ය.
මහා පණා ද රජහු උතුම් පහය සිංහල ද්වීපයෙහි දක්වන්නවුන් සෙයින්
63 පළමු කොට ම ලොහොපාය කරවී. නට සියලු පිරිවෙන් පිහිට විය.
64 හේ තෙමේ ආරාමිකයන්ගේ භෝග ද යථා ස්ථානයෙහි තැබී. දූර්බුධි
වූ පියහු විසින් පස උදුල හෙයින් තුනී වූ ආවාස ඇති විහාරය පැණැති
65 මේ රජ තෙමේ ගණාවාස කෙළේ ය. මෙම නරේශ්වර තෙමේ පියහු
විසින් කර වූ ජෝතිවන විහාරයෙහි කොට අඩාල සියලු කර්මාන්ත
නිමවී.

66 ඉක්බිති මනුජේන්ද්‍ර ඒ රජ තෙමේ ශ්‍රමණේන්ද්‍ර පුත්‍ර වූ මිහිඳු මහ
තෙරිඳු පවත් සියල්ල පළමු කොට අසා ලක්දිව් පහන් කරවූ උන්වහන්සේ
67 ගේ ගුණෙහි පැහැද ස්ථවිර තෙමේ ඒකාන්තයෙන් ලක්දිවට ඊශ්වරය යි
68 සිතා උන්වන්සේගේ ප්‍රමාණ ඇසුරු කළ රන් පිළිරුවක් කොට වප් මස
69 පුර පස සතවක් දා ගෙණවුත් එහි තෙර අඹ නම් සෑ අඹ තෙලෙහි
70 අටවක් දින වස්වා පසුව නවවක් දිනයෙහි ඒ තෙමේ ඇතොවුරන් ද

Non-Commercial Distribution

71 ගෙවල් රක්නන් හැර නුවරුන් ද දෙව්සෙන් බඳු මහ සෙන් ද ගෙණ
72 මුළු ලක්දිව් හි සියලු භික්ෂූන් ද රැස් කරවා නුවර සිර ගෙවල සිටි
මිනිසුන් මුදා හැර මහ දන් වැට තබා එසේම මේ තෙමේත් සර්වප්‍රාණීන්ට
73 වැටුප් දී සර්වෝපහාරයෙන් අප්‍රමාණ පූජා කෙරෙමින් ශාස්තෘහුගේ උතුම්
පුත් වූ ද්වීප ශාස්තෘ වූ උන්වහන්සේට දෙව් රජහු බුදුන්ට සේ පෙර
ගමන් කොට සෑ අඹ තෙලෙහි පටන් නුවර දක්වා මාර්ගයත් විසාලා මහ
74 නුවර පටන් සැවැත් නුවර දක්වා සෙයින් මොනවට සරසා
මොග්ගලිපුත්ත ස්ථවිරයන් වහන්සේගේ ආගමනයෙහි එම (මිහිඳු)
75 තෙරුන් පිය අශෝක මහ රජහු සෙයින් තෙරුන් වහන්සේට එහි සියලු
76 භෝගයන් ත්‍යාග කොට එහි දුගී මගී යාචකයන් විසයෙහි මහ දන්
77 පවත්වා සිව් පසයෙන් භික්ෂූනුදු තුටු කරවා තෙරුන් වහන්සේ ගේ
ආගමනය මහජන තෙමේ මෙසේ බලාව යි ඒ පිළිරුව ගෙණ මහා
78 යසස් ඇති රජ තෙමේ මහත් සත්කාරයෙන් ඒ සෙලින් බැස තෙමේ
පුරස්සරව භික්ෂූනුදු හාත් පසින් පිරිවර කොට ගමන් ගත, ඒ පිරිසෙහි
79 තෙරුන් ගේ සවර්ණ ප්‍රති බිම්බය ක්ෂීර සාගර මධ්‍ය ගත සන්ධ්‍යා
රාගයෙන් පරික්ෂිප්ත සවර්ණ මේරුව සෙයින් හෙබියේ ය.

80 තව ද "ලෝකනායක තෙමේ රුවන් සුත් දෙසනු සඳහා විසාලා
81 මහනුවරට මෙසේ ම වැඩිය සේකැ" යි මහජනයාට දක් වී ඒනරෝත්තම
82 තෙමේ මෙසේ සත්කාර සම්මාන කෙරෙමින් මේ නුවර නැගෙණහිර
83 දොර පසෙක් හි තමන් විසින් කරවන ලද ස්වස්ත්‍යාකාර නම් විහාරයට
84 පස්වරුහි එළඹ බුද්ධ පුත්‍රයාණන්ගේ ඒ පිළිරුව තෙ දිනක් එහි වැස් වී.
ඉක්බිති දොළොස්වක් දවස බුදුහු පළමුවෙන් වඩනා දවස් රජගහා
85 නුවර සෙයින් මනා කොට නුවර සරසා ඒ පිළිරුව ස්වස්ත්‍යාකාර නම්
වෙහෙරින් බැහැර කොට ගෙණ සයුර සේ නුවරෙහි මහ සැණකෙළි
86 පවත්නා කල මහා විහාරයට වඩා ගෙන වුත් තෙමසක් බෝ මළුවෙහි
87 වස්වා එම විධීන් නුවරට වඩා ගෙන වුත් තෙමසක් අග්නි දිග ඒ පිළිරුවට
ගෙයක් නො කොට කර වී. විසාර ද වූ ඒ රජ තෙමේ ඉෂ්ටිය
88 ස්ථවිරාදීන්ගේ පිළිරු ද කරවා ඒ තෙරරුව හා එක් කොට එහි ම
වැස්වී. මහා ප්‍රඥා ඇති හේ තෙමේ ආරක්ෂා ද පූජාවට වැටුප් ද තබා
89 අවුරුදු පතා මෙසේ ම කරන්නට නියෝග කෙළේ ය. තවාංශික වූ
මෙහි රජ පැමිණියෝ ඒ රජහු අණ රක්නෝ තද්විධාන නො නසා අද
90 තෙක් රකිති. ඉක්බිති පවාරණ දිනයෙහි නුවරින් ඒ පිළිරුව මහා
විහාරයට වඩා ගෙණවුන් අවුරුදු පතා තෙළෙස්වස් දවස්හි පූජා
91 කරන්නට නියෝග කෙළේ ය. අබා වෙහෙර ද තිස්වැහැප් වෙහෙර ද
මහබෝහි ද ගල් පිළිකඩ හා මනහර පව්රු ද කරවී.

Non-Commercial Distribution

ඒ රජු දවස් නව වන වස එක්තරා බැමිණියක් තොමෝ බුදු
92 රජහු දළදාව කලිඟු රටින් මෙහි ගෙණවා එළු දළදා වස කී පරිද්දෙන්
93 රජ තෙමේ ඒ ගෙණ බහු මාණයෙන් උතුම් පුදකොට හුදු පිළිමිණින්
94 කළ කරඬුවෙක බහා දෙවන පෑතිස් රජු විසින් රාජාරාමයෙහි කරවන
ලද දම්සක් නම් ගෙයි වැඩුයේ යි. එතැන් පටන් ඒ ගෙය දාඨධාතුඝර
95 නම්වී. ඉක්බිති සම්පූර්ණ සිත් ඇති රජ තෙමේ නවලක්ෂයක් ධන
96 විසඳා දළදා මහ පෙළහර කෙළේ යි. අවුරුදු පතා අභයගිරි විහාරයට
97 වඩාගෙණ ගොස් දන්ත ධාතුවට මෙබඳු පූජා කරව යි නියෝග කෙළේ
98 ය. ඒ රජ තෙමේ අටළොස් විහාරය ද සතුන් කෙරෙහි අනුකම්පාවෙන්
වැව දිය තහවුරු ද බෝ පුද ආදී අපමණ පින්කම් ද කොට අටවිසි වන
99 අවුරුද්දෙහි යමක් ස්වභාව නම් එහි ගියේ යි. මෙළේ යි. ඉක්බිති උහු
100 කිස් දොවුන් මල් වූ දළකඩකම් හි දක්ෂ වූ දෙටුතිස් කුමර ලක්දිව
101 සේසත් නැඟි ඒ රජ තෙමේ දුෂ්කර වූ විසිතුරු දළකඩ කම් කොට මේ
102 ශිල්පායතනය බොහෝ ජනයා ඉගැන්වී. උහු විසින් අණවන ලද්දේ
103 සෘද්ධියෙන් මැව්වාක් බඳු වූ බෝසත්හු වැනි මනහර රුවක් ද අපාශ්‍රය
පයඪිකයක් හෝ දික්හඟලා පුටුවක් ද සතක් රුවන් මඬුවක් ද ඊබඳ
හෝ දික්හඟලා පුටුවක් ද සතක් ද රුවන් ඊබඳ කිසිවක් විසිතුරු දළකඩ
104 කම් නම් හෙද ඒ ඒ තැන මොනවට කළහ. ඒ රජ තෙමේ නව වසක්
ලක්දිව අනුශාසනා හා නොයෙක් පින්කම් ද කොට කම් වූ පරිද්දෙන්
පරලොව ගියේ ය.

105 ඉක්බිති උහු පිත් බුද්ධදාස තෙමේ රජ විය. ධනවත් මෙරජ
තෙමේ සියලු රුවනනට සයුරු සේ ගුණයනට ආකාර වූයේ සියලු
106 උපායෙන් ලක්දිව් වැස්සන්ට සැප එලවන්නේ වෙසමුණු රජහු අලකාව
107 සෙයින් නුවර රකිමින් පැණ පින් ගුණයෙන් යුක්ත වූයේ. පිරිසිදු
108 කරුණාවට ද ගෘහ වී. එසේම දශ රාජ ධර්මයෙන් ද යුක්ත වූයේ යි.
සතර අගති හැර විනිශ්චය කරවන්නේ සිව් සඟරාවතින් ජන සංග්‍රහ
109 කෙළේ ය. ඒ රජ තෙමේ බෝසතුන් චරිතය ප්‍රාණී හමුවෙහි දක්වන්නේ
110 පිය තෙමේ පුතුන් සෙයින් සතුන් කෙරෙහි අනුකම්පා කෙළේ ය. මහ
නුවණ ඇති ඒ රජ තෙමේ දිළින්දන් වස්තු දීමෙන් ද සුවපත් වූවන්
111 භෝග ජීවිත රාක්ෂයෙන් ද සිත් පිරුනන් කෙළේ ය. එසේම
112 සත්පුරුෂයන් සංග්‍රහයෙන් ද අසත්පුරුෂයන් නිග්‍රහයෙන් ද ගිලනුන්
වෙදකමින් ද සංග්‍රහ කෙළේ ය.

113 පසුව එක් දිනෙක රජ තෙමේ මගුලැතු නැඟ නහනු පිණිස
තිසා වැවට යන්නේ මහ මග පුත්තාභග නම් විහාරයාගේ පසෙක

Non-Commercial Distribution

114 තුඹසක් මතුයෙහි කුස රෝගයෙන් පෙළෙන එක් මහ නයෙක් දිටී. බඩ
115 හටගත් ගෙඩි රෝගය දක්වන්ට උඩු කුරුව හොත් නාගය දැක නාග
තෙමේ රෝගීය යි රජ තෙමේ නිශ්චය කොට සිතී. ඉක්බිති අපරාධ
116 රහිත මහොත්තම තෙමේ මහ ඇතු පිටින් බැස මහ නයා වෙතට
පැමිණියේ ඒ මහා නාගයා හට මෙසේ කී ය. මහා නාගය තොපගේ
117 ඊමෙහි කරුණ මා විසින් දන්නා ලද්දේ ය. මහා තේජස් ඇති තෙපි වූ
කලී වහා කිපෙන සුල්ලභ එහෙයින් තා ස්පර්ශ කොට තාගේ පිළිවස
118 කරන්ට නො හැක්කෙමි. ස්පර්ශ නො කොටත් නො හැක්ක. මෙහි
119 කුමක් කටයුතු යි කීහ. මෙසේ කී කල්හි ඒ නාග රාජ තෙමේ තමාගේ
පෙණය සියල්ල බිලෙහි ප්‍රවේශ කොට සන්හුන් ව හොත්තේ යි. එකල
රජ තෙමේ මෙ සේ උන්නහු වෙත එළඹ තමා හිත තුබු සැත ගෙණ ඒ
120 නයා බඩ පළා පසුව දෝෂය බැහැරලා උතුම් බෙහෙත් කොට
121 එකෙණෙහිම ඒ සර්පයා සුවපත් කෙළේ යි. එකල්හි රජ තෙමේ තමන්
122 ම "මා මහ කුළුණු ඇති බව තිරිසන්නු ද දත්තු ය. මා විසින් මොනවට
123 රජය කරන ලද්ද" යි පැසසී. ඒ නා තෙමේ සුවපත් තමා දැක මාහැඟි
සිය මිණි රුවන රජ හට පූජා පිණිස දින. රජ තමේ ඒ මිණි රුවන
124 අබාගිරි වෙහෙර සල පිළිමයෙහි නෙත්‍රකෙළේ යි. එක් භික්ෂු කෙනෙක්
125 තෙමේ ද තුස වැටි ගමෙහි සිඟමින් වියළි බතක් ලැබ කිරි සිඟා
හැසිරෙමින් පණුවන් සහිත කිරක් ලැබ වැළඳු ය. කුස පණුවෝ බෝ
126 වී උන් වහන්සේ ගේ බඩ සැපූහ. ඉක්බිති ඒ ශ්‍රමණ කෙමේ රජු කරා
එළඹ එ පවත් දැන්වී. රජ තෙමේ තුස වැටි ගම්හි දී කිරි හා බත් වැළඳූ
127 කලැ" යි දැන්වී. රජ තෙමේ ක්ෂීරය පණුවන් සහිත ය යි දතී. එකල්හිම
128 එක් අසෙක් නහර වි ද පිළියම් කටයුතු විය, රාජ තෙමේ උහු නහර
විද ලේ ගෙන මහණහු පොවා මොහොතක් පසු කොට මේ වැළඳුයේ
129 අස් වලේල් යයි කීය. ඒ අසා ශ්‍රමණ තෙමේ වමන කෙළේ ය. පණුවෝ
130 ලේ හා සමග නික්මුන හ භික්ෂු තෙමේ සුවපත් වී. තමන්ගේ සතුටම
රජහට දැක්වී රජ තෙමේ එකම සැත් පහරින් පණුවෝ ය ශ්‍රමණය, හා
131 අසාය යන මෙතෙක් දෙනා මොනවට නිරෝගි කරන ලද්දාහ මා
වෙදකම ආශචර්‍ය යි සිතී ය.

132 එක් මිනිසෙක් දිය බොන්නේ නො දැන දියබරණ බිජුවක් ගිලපී
133 ය, එකල්හි ඉන් දියබරණෙක් කුස හට ගත්තේ ඇතුළත තුඩින් පහළේ
134 ය. ඒ දුකින් පෙළෙන මිනිස් තෙමේ රජු කරා ආය. රජ තෙමේ
135 උහුගේ රෝග නිදානය පිළිවිස "ඇතුළත සර්පයෙකැ" යි දැන සතියක්
ලඞ්සනය කොට සක සේ නහවා විලවුන් ගල්වා මොනවට අතුළ ඇඳ
136 සැතැප්විය. එකල ඒ තෙමේ අධික නිද්‍රායෙන් තමා කට දල්වා හොත්තේ
137 ය. එසේ කල උහුගේ මුඛය වෙත හුයක බැඳි මස් වැදැල්ලක් තැබ්බවී.

Non-Commercial Distribution

138 සජීයා ඒ ගඳින් නික්මුනේ මස් වැදැල්ල ඩැහැගෙන කුස වදනට පටන් ගත. එකල හූ ලනුවෙන් ඇද ගෙණ බඳනක දියෙහි ලා කියන්නේ
139 සම්මා සම්බුදුන්ට ජීවක නම් වෙදෙක් වි ල. උහු විසින් ලෝකයා හට කරණ ලද (මීට වැඩි) කවර දුෂ්කර කර්මයක් වේ ද? හේ තෙමේ ද සර්වාදරයෙන් කර්ම කරමින් මෙසේ ම කරන්නේ ය. මෙහි සැකයෙක් නැත්. මාගේ කුශල වෘඬිය ආශ්චර්යයි යන මේ වදන කී ය.

140 එසේ ම හෙල්ලොලිය නම් ගම සත් වරෙක මූඪගර්භී වූ
141 සැඩොලියක් සහ ගැබින් සුවපත් කෙළේ ය. එක ශ්‍රමණ කෙනෙක් තෙමේ වාත රෝගයක් කරණ කොට ගෙණ හොවන්නේ නැගුටු වන්නේ වී. ඒ මහණනු ගෝනැස් සෙයින් වක් වූ කල්හි නුවණැති රජ තෙමේ ලෙඩින් ගොඩ නැගී.

142 තව ද මැඩි බිජු සහිත දියක් වහා බොන්නක්හුගේ නැහැ සිදුරෙන්
143 ගොස් බිජුව ඉස් මුලට නැගි බිඳී මැඩියෙක් වී. හේ වැඩුනේ එහි ඇවිදී
144 වැසි කල මැඩියා විසින් ඒ මිනිසා බෙහෙවින් ඩසිනු ලබ යි. ඒ රජ
145 තෙමේ හිස පලා මැඩියා බැහැර ලා හිස් කබල් පුරුද්දා බොහෝ
146 කලකින් ප්‍රකෘතිමත් කෙළේ ය. ඒ රජ තෙමේ ලක්දිව් වැස්සන්ට හිත
147 පිණිස ගමක් ගමක් පාසා වෙදහල් කරවා එහි වෙදුන් නියුක්ත කෙළේ ය. එසේ ම රජ තෙමේ සියලු වෛද්‍ය ශාස්ත්‍රයන් ගේ සාරාර්ථයන්
148 හකුළුවා සාරාර්ථ සංග්‍රහ නම් ප්‍රකරණයක් තනා අනාගතයෙහි ලක්දිව්හි පිළියම් පිණිස වෙදුන් කෙරෙහි තැබූයේ යි. රජ තෙමේ ගම් දසයෙක්හි
149 එක එක වෙදෙක් බැගින් යෙදූ යේ ය. කෙත් අයෙන් විස්සෙන් අඩක් වෙදුන්ගේ දිවි වැටුප් කොට දුන්නේ ය. ඇතුන් අසුන්ට හා සේනාවට
150 ද වෙදුන් නියම කෙළේ යි. මහ මග ඒ ඒ තන්හි පිළුන් හා අන්ධයන්ට ශාලා ද වැටුප් සහිත ශාලා ද කර වී. ධර්ම භාණකයන්ට සත්කාර
151 කොට නිතර සද්ධර්ම ශ්‍රවණය කෙළේ ය. ඒ ඒ තන්හි ධර්ම භාණකයන්ට වැටුප් තැබී ය. මහා කරුණා ඇති ඒ රජ තෙමේ සැත් කම්ටිය ඉන තබා ගෙණ හැසිරෙන්නේ දුටු දුටු රෝගාතුර ජනයා රෝ දුකින් මිදී.
152 ඉක්බිති එක් දිනක් රජ තෙමේ රජ අබරණින් සැරහී දෙවියන් පිරිවරා ගමන් ගත් ශක්‍රයා සේ සේනාව හා යන්නේ ය. ශ්‍රී සෞභාග්‍යයෙන් අග්‍ර
153 ප්‍රාප්ත වූ රාජර්ධීන් විරාජමාන වූ ඒ රජහු දැක භවාන්තරයෙහි බඳනා ලද වෛර ඇති එක්තරා කුෂ්ඨ රෝග ඇතියෙක් කිපී පොළවෙහි අත්
154 ගසා අසුර ගමින් සැරයටිය ද පොළෝ පහරින් අනේක ප්‍රකාර ආක්‍රොශ
155 බසින් ආක්‍රොශ කෙළේ යි. මහ නුවණැති රජ තෙමේ දුරින් ම මේ විප්‍රකාරය දැක කිසි සතක් හටත් අප්‍රියයක් කලා මම නොදනිමි. කිසිසේත්
156 මේ මේ පූර්ව වෛරී එකෙක, උහු නිවමැ යි වෙත සිටි පුරුෂයෙක් යව

Non-Commercial Distribution

157 අසවල් කුෂ්ඨ රෝගීහුගේ චිත්තාචාරය දැනුව" යි අණ කෙළේ ය. හේ
තෙමේ ගොස් කුෂ්ඨ ඇත්තහුගේ යහළුවකු සෙයින් වෙත හිඳ ගෙන,
158 යහළු තෙපි කුමක් පිණිස කිපියෝ දැ යි විචාළේ ය. හේ තෙමේ
සියල්ල කී ය. මේ බුද්ධ දාස තෙමේ මා දසෙක පින් කමින් රජ විය,
159 මා අවමන් කොට මා ඉදිරියෙහි ඇතු පිටින් යෙ යි, ඉදින් ඒ තෙමේ මා
160 අතට එයි නම්, දාසයන්ට කළමනා සියලු නිග්‍රහ කොට තමා හඳුන්වමි.
ඉදින් මා අතට නේ යි නම්, මරා හෝ ලෙහෙ බොන්නෙමි ඊට සැක
161 නැත් නොබෝ කලකින් දක්නෙහවේ දැයි කී ය. ඒ පුරුෂ තෙමේ
162 ගොස් රජ හට එ පවත් දැන් වීය. මහ නුවණ ඇති රජ තෙමේ මේ
තෙමේ පෙර මා වෛරී එකෙ කැයි නිශ්චය කොට ගෙණ වෛරී හුගේ
163 වෛරය ක් උපායෙකින් දුර ලිය යුතු යි යි සිතා මැනව කුෂ්ඨ රෝගී
164 පුරුෂයා කරා එළඹ මිත්‍රයකු සේ උහුට කීය, ඒ රජහු නසන්නට සිතා
මෙතෙක් කල් මම යහළුවකු නො ලබන්නෙමි උහු නැස්මෙහි
165 පොහොසත් නො විමී. දැන් තොප ලැබ මාගේ මනෝරථය මුදුන් පත්
කරමි. එම මා ගෙයි වැස මට එකඟව පවතුව. මම කීප දවසකින්
166 මොහු දිවි නසමි යි කියා ඒ කුෂ්ට ඇත්තහු තමා ගෙට ගෙණ ගොස්
සකසා නහවා මනා විලවුන් ගල්වා මෘදු පිළි හඳවා මනා මිහිරි ආහාර
167 වළඳවා යෞවන ස්ත්‍රීන් ලවා ආදර කරවා මොනවට අතුරණ ලද ඇඳ
168 සැතැප් වී. මේ ක්‍රමයෙන් කීප දවසක් වස්වා පිණාගිය ඉඳුරන් ඇති
169 සුවපත් වූ උහුහට ගත් විස්වස් ඇතැයි දැන රජහු විසින් දෙන ලදැයි
170 කියා ඛාද්‍යාභෝජ්‍යාදිය දිනි. දෙතුන් යලක් ප්‍රතික්ෂෙප කොට උහු
171 විසින් අයදනාලද්දේ එය ගත ක්‍රමයෙන් රජු හා ඉතා විස්වස් ඇති වී
172 රජ මළේ යි අසා උහුගේ ළය දෙකට පැළුනේ වීය. ඒ රජ තෙමේ
173 සිරුරෙහි මෙනෙහි හට ගන්නා රෝගයන් මෙසේ පිළියම් කෙළේ යි.
පස් විසි රියන් පහයකින් හොබනා මොනර පිරිවෙන මහා විහාරය
174 කරවී ය. සමණය ගොළපාණුව යන ගම් දෙක ඊට පුද කෙළේ ය.
175 දහම් දෙසන භික්ෂූන්ට භෝගයක් හා කැප කරුවන් දුන්නේ යි
සිව්පසයෙන් යුක්ත විහාර ද පිරිවෙන් ද වැව් ද දන් හල් ද පිළිම
ගෙවල් ද කරවී ය. එම රජු දවස මහා ධර්මකති නම් යති තෙමේ හෙළු
බසින් සූත්‍රයන් පෙරළී.

176 ඒ රජහු පිත් සූරව දෙවියන් සමාන රූ ඇති කුමාරයෝ අසූවක්
177 වූහ. අසූමහ සව්වන්ගේ නම් ඇති කළණ දැකුම් ඇත්තේ යි. ශාරිපුත්‍රාදි
178 නමින් යුක්ත පුත්‍රයන් විසින් පිරිවරණ ලද ඒ බුජස් නම් රජ සම්බුදු
රජහු සේ හෙබියේ යි. මෙසේ ඒ රජ තෙමේ ලක්දිව් වැස්සන් වැඩහි
යොදා එකුන්තිස් වන වස්හි දෙව්ලොව ගියේ යි.

Non-Commercial Distribution

179 ඊට ඉක්බිති ඒ රජහු දෙටුපිත් උපතිස් කුමර තෙමේ රජ වි. ඒ රජ තෙමේ සියලු රාජ ගුණයෙන් යුක්ත යි. නිති සිල් ඇත්තේ යි. මහා
180 කරුණා ඇත්තේ යි. දස අකුසල් හැර දස පින් කිරියවත් සමාදන් වී.
181 දශරාජ ධර්‍මයන් ද පාරමි දසය ද පිරිවී සතර සංග්‍රහ වස්තුවෙන් සතර
182 දිග ජය ගත්තේ ය. මහා පාළි නම් බත්හල රාජ භෝජනය බඳු කොට
183 දන් දෙවි, පිළුන්ට ද වදන ගැහුණුන්ට ද අන්ධයන්ට ද රෝගීන්ට ද මහත් භෝග ඇති ශාලාවන් ද දන්හල් ද කරවී ය. මඟුල් චත්‍රයෙන්
184 උතුරු දිග දාගැබක් හා පිළිම ගෙයක් හා පිළිමයක් ද කරවී. එය
185 කරවන්නා වූ ද රජ තෙමේ ජනයා "නහමක් පෙළේව" යි සකුරු හා
186 සහල් දී දරුවන් ලවා කරවු. රජු පුල, ගිජු කුල, පෝකුරු පස, වලහස, ඇඹිටිය, ගොඩිගමු වැව, බඩරාජි විහාරය, යන මේ විහාර ද වැව් දිය තහවුරු ද කර වි. ඒ ඒ තන්හි අපමණ පින්කම් කර වී.

187 ඒ රජ තෙමෙ වැස්සෙන් තමා ඇඳ තෙමෙන කලද ජනයා මට
188 දුකැ" යි උත්වනම හිඳ මුළුරැ පසු කෙළේ ය. ඇමති තෙමේ දුන රජහු
189 උයනට ගෙණ ගොස් ගෙය වැස් වි. මෙසේ තමා සඳහා ලෝ වැස්සාට දුක් නො කෙළේ ය.

190 ඒ රජහු දවස ලක්දිව දූර්භික්ෂ රෝග දුඃඛයෙකින් පීඩිත විය පාපාන්ධකාරයට ප්‍රදීපායමාන වූ යහපත් සිත් ඇති ඒ රජ තෙමේ කිමෙද් ද ස්වාමීනි ලොව දුර්භික්ෂාදී භයෙන් පෙළෙන කල බුදුන් විසින් කරණ
191 ලද කිසි ලොක හිතයක් නැද්දෝ යි භිකෂූන් විචාළේ ය. එහි දී භික්ෂුහු ගඟාරෝහණ සූත්‍රෝත්පත්තිය දැක්වූහ. ඒ අසා සර්‍වඥ ධාතුවට සනරන්
192 පිළිමයක් කොට බුදුන් වහන්සේ සලපා ධාතුව දිය සහිත කොට
193 දොහොත්ති තබා ඒ රුව මහා රථයක තබා තෙමේ සිල් සමාදන්ව මහ ජනයා ද සිල් සමාදන් කරවා මහ දන් හා සර්‍වප්‍රාණීන්ට අභය ද පවත්වා
194 නුවර දෙව් පුරයක් සේ මනහර කොට සරසා ලක්දිව්වැසි සියලු භික්ෂූන්
195 පිරිවරණ ලදුව මහවෙයට බට එකල්හි රැස් වූ භික්ෂූහු රුවන් සූත බෙණෙමින් රජගේ වෙත, චේමගය, පර්‍වර වෙතය යන තන්හි එකල දිය
196 ඉසිමින් පැදකුණු කෙරමින් ඇවිද් ද හ. තුන් යම් රාත්‍රිය අවසන්හි
197 අරුණු නැගෙණ කල මිහිතෙලෙහි මහ මේ වටුයේ ය. සියලු
198 රෝගාතුරයෝ සුවපත් වූවාහු සැණකෙළි කෙළිය හ. රජතෙමේ මතු ලක්දිව්හි යම් කලෙක දුර්භික්ෂ රෝගාදි භයෙක් වන්නේ නම් මෙසේ
199 කෙරෙත්ව යි නියෝග කෙළේ ය. ඒ රජ තෙමේ වනාභි සෑයට නැංගේ
200 කැළිකිපිල ආදිය බලා මොනර පිළින් පිස සෙමෙන් පොළවට බසිත්වයි කියා දිය සහිත මසක්ගෙඩිය ගෙන ඇවිදිමින් ඒ සතුන් තැගි තැන් ශුඪ කෙරෙයි.

Non-Commercial Distribution

201 රජගෙයින් තිරිත දිගපොහෝ ගෙයක් ද බුදුපිළිම ගෙයක් ද
202 මනරම් උයනක් ද පවුරකින් පිරිකෙව් කොට කරවා තුදුස්වක
පසළොස්වක අටවක් දෙක පෙළහරපස යන දවස්හි අටගින් යුත්
203 පෙහෙවස් සමාදන්ව මනාචරියායෙන් එහි වෙසෙයි. හේ තෙමේ
204 දිව්හිමියෙන් බත්හල බත් වැළඳී. ඒ රජ තෙමේ ඇවිදිමන් උයනෙහි
205 ලෙහෙනුන්ට තමා බත් වැටුප් කොට දිනි. ඒ දූනුදු පවතියි. වධයට
ගෙණෙන ලද සොරුන් දක තැති ගත් සිතින් ඇත්තා වූ ර් එජ තෙම
206 සොහොනින් මිනිසක් ගෙන්වා ලොහො සැල බහාවස්තු දී රාත්‍රියෙහි
සොරා පළවා හිරු නැගි කල කිපී සේ සොරුහු මිනිය දූවී.

207 ලක්දිව් සියලු සෑ බද මහ පෙළහර ද ථූපාරාමයෙහි දාගැබට රන්
කොතක් හා සැට්ටයක් ද කරවී. හේ තෙමේ දෙ සාළිස් අවුරුද්දක්
208 ඇසිල්ලකුදු නොවඳ පින් කම් කොට දිව්‍ය රාජයා හා එකී භාවයට
ගියේ යි. රජහු කිස්දොවුන් මල් මහානාම නම් කුමරු නිසා අභ්‍යන්තර
වූ දේවියක් තොමෝ ආයුධයකින් පැහැර නො කරුණෙහි රජු මැරුවා
කිස්දොවුන් මල් හේ තෙමේ බෑයා සජීව කල පැවිදිව හිඳ රජු මැරූ
209 කල්හි හීන භාවයට හෝ ගිහි බවට හැරී රජ විය. භාතෘඝාතක මෙහෙසිය
තමා අග මෙහෙසුන් කෙළේ ය. ගිලන් හල් කරවී. මහාපාළි නම් බත්
210 හල ද වැඩී. ලොහො දොර රලගමුව කෙළපස වන යන තුන් වෙහෙර
211 කරවා අභයගිරි විහාරයෙහි භික්ෂූන්ට දිනී. දුම්රක් කන්දෙහි විහාරයක්
212 කරවා මෙහෙසිය නමින් ථේරවාදී භික්ෂූන්ට දිනී. හේ තෙමේ
213 පරණවිහාර වල නව කම් කරවි. හැම කල්හි දන් සිල්හි ඇලුනේ ද
214 තුණුරුවන් පුදන්නේ ද වී.

එකල දඹදිව බෝ මැඩ වෙත උපන් බ්‍රාහ්මණ මාණවකයෙක්
215 විද්‍යා ශිල්ප කලා දන්නේ තුන් වේද පරතෙර පැමිණියේ මොනවට
216 දන්නා ලද සමය ඇත්තේ සියලු වාදයන්හි විසාරද වූයේ වාද කැටිව
ප්‍රකෂී වාද ඇත්තේ දඹදිව ඇවිදමින් එක් වෙහෙරකට අවුත් රාත්‍රියෙහි
217 පාතංජල මතය සම්පූර්ණ පදයෙන් සුපරිමඬලයෙන් හඳාරයි. එහි රේවත
218 නම් මහා ස්ථවිර තෙනෙක් දූන මේ සත්ත්ව තෙම මහ පැණ ඇත්තේ
ය, දමනය කට යුත්තේ යයි සිතා ඒ ස්ථවිර තෙමේ කොටලු හඬින්
219 හඬන්නේ යුත්තේය යි සිතා ඒ ස්ථවිර තෙමේ කොටලු හඬින් හඬන්නේ
කවරෙක්ද" යි කී සේක. හේ තෙමේ "කිමෙක් ද? කොටළු හඬ අර්ථ දනී
220 ද?" යි උන්වහන්සේ කීය. මම දනිමැ යි තෙරුන් විසින් කියන ලද්දා
වූ ඒ තෙමේ තමා මතය පහළ කෙළේ ය. කී කී සියල්ල විසඳා විරුඬ
221 ස්ථානය ද දක් වූ සේක. එසේ වී නම් තෙපි සිය මතය හෙලවයි
222 චෝදනා කරණ ලද ස්ථවිර තෙමේ විජම්පෙළ කී සේක. ඒ තෙමේ එහි

Non-Commercial Distribution

අර්ථ අවබෝධ නො කෙළේ ය. මේ කාගේ මන්ත්‍ර දැ විචාළ ස්ථවිර
තෙමේ බුද්ධ මන්ත්‍රය යි වදාළ සේක.

223 "මේ මට දෙව" යි කීයෙන් පැවිදිව ඒ ගන්වයි වදාළ කල්හි හේ
තෙමේ මන්ත්‍ර පිණිස පැවිදිව තෙවළාව උගත පසුව එය මේ තෙමේ
224 ඒකායනමාර්ග ය යි ගත්තේ යි. බුදුන්ගේ සෙයින් ගැඹුරු හඬ ඇති
හෙයින් බුදුහු සේ පොළෝ තලෙහි පතළ යසස් ඇති වී, උහු බුද්ධඝෝෂ
225 යයි ව්‍යවහාර කළහ. එකල්හි ඒ තෙමේ දඹදිව්හි දී ඤාණොදය නම්
226 ප්‍රකරණය කොට ධම්ම සංගණියට අත්ථශාලිනී නම් අටුවාව කළ සේක.
නුවණ ඇති හේ තෙමේ පිරිත් අටුවාව කරන්ට පටන් ගති. රේවත
227 ස්ථවිර තෙමේ ඒ දැක උන්වහන්සේට වදාරණ සේක. මෙහි පෙළක
පමණක් පරම්පරානීතය මෙහි අටුවා තැන් එසේම නානාප්‍රකාර
228 ආචාර්යවාදයෝ ද නො වෙති. තුන් සංගායනාවට නගණ ලද බුද්ධ
වචන ද ශාරිපුත්‍රාදී මහ තෙරුන් විසින් වදාරණ ලද කථාමාර්ගය ද
229 මොනවට බලා, ප්‍රඥා මිහිඳු මහතෙරුන් විසින් සිංහල භාෂාවෙන්
230 කරණ ලද ශුද්ධ වූ සිංහලාත්ථ කථා තොමෝ සිංහලයන් කෙරෙහි වැටෙයි
තෙපි එහි ගොස් ඒ අසා මාගධී නිරුක්තියට පෙරළව්. ඕ තොමෝ
231 සියලු ලොවට හිත එල වන්නී වේ" යි මෙසේ වදාළ සේක. මෙසේ
වදාරණ ලදින් ප්‍රසන්න වූ මහ නුවණ ඇති ඒ තෙමේ ඉන් පිටත්ව මෙම
232 රජු දවස ලක්දිව් පැමිණි සේක.

233 සියලු සත්පුරුෂයන් නිවාස වූ මහා විහාරයට පැමිණි සේකුත්,
මහාපදන් කොට ගොස් සඞ්ඝපාල තෙරුන් කෙරෙන් සිංහල අටුවා
234 කථා හා ථේරවාදයන් සර්වප්‍රකාරයෙන් අසා මේ තෙමෙ ම ධම්මස්වාමිහු
ගේ අභිප්‍රාය යි නිශ්චය කොට එහි සඞ්ඝයා රැස් කරවා, අටුවා කරන්නට
235 මට සියලු පොත් දෙව යි කීහ. සඞ්ඝ තෙමේ ඒ තෙරහු විමසනු සඳහා
උන් වහන්සේට ගාථා දෙකක් දෙන්නේ තොප සමර්ථ බැව් මෙහි දක්වවා
236 ඒ දැක සියලු පොත් දෙමුය යි දිනී. ස්ථවිර තෙමේ අටුවා සහිත තුන්
237 පිටකය සමාසචාරයෙන් එහිම සංග්‍රහ කොට විශුද්ධිමාර්ගය කෙළේ යි.

238 ඉක්බිති හේ තෙමේ බුද්ධ සමයෙහි බුහුටි සඞ්ඝයා රැස් කොට
මහ බෝ වෙත එය කියවන්ට පටන් ගත. දේවතාවෝ උන්වහන්සේ
ගේ නිපුණ බැව් මහ ජනයා කෙරෙහි ප්‍රකාශ කරණු පිණිස පොත
239 අතුරු දහන් කළහ. උන්වහන්සේ ද දෙතුන් යලක් එය කළ සේක.
240 තුන් වෙනි වර පොත කියවන්ට ගෙණා කළ අනික් පොත් දෙකත්
241 දේවතාවෝ එහි තැබූහ. එකල භික්ෂූ හු පොත් තුන එක් කොට කිය

Non-Commercial Distribution

වූහ. අත්ථයෙන් ද ග්‍රන්ථයෙන් ද පූර්වාපර වශයෙන් ද ථේරවාදයෙන් ද
242 පෙළින් ද පදයෙන් ද ව්‍යාංජනයෙන් ද පොත් තුනෙහිම භින්නත්වයක්
243 නූ වූයේ ය. එ කල සඞ්ඝ තෙමේ වෙසෙසින් තුටු පහටු වූයේ. නිසකින්
244 ම මේ තෙමේ මෙතේ බෝසත්හු ව වී නැවත නැවත කියා සෝෂං
කෙළේ ය. අටුවා සහිත පිටකත්‍රයෙහි පොත් දින. එකල්හි උන්වහන්සේ
මහා විහාර ලද දූරසඞ්කර ග්‍රන්ථාකර පිරිවෙණ වෙසෙමින් සියලු සිංහල
245 අටුවා කථා සියල්ලන්ගේ මුල භාෂා වූ මාගධ නිරුක්තියෙන් පැවැත්තූ
සේක. සර්වභාෂික ඕ තොමෝ හිත පිණිස වී සියලු ථේරිය ආචාර්‍යහු එය
පෙළ සෙයින් පිළි ගත්හු.

ඉක්බිති ඒ ස්ථවිර තෙමේ මෙහි කර්තව්‍ය නිෂ්ඨාවට පැමිණි කළ
246 මහ බෝ වඳනට දඹදිව් වැඩි සේක. මහානාම රජ තෙමේ දෙ විසි
හවුරුද්දක් පෘථිවිපාලන කොට විසිතුරු පින්කම් කොට කම් වූ පරිද්දෙන්
247 පරලොව ගියේ ය. මොනවට කැටි කරණ ලද හට සේනා හා සම්පූර්ණ
භෝග ඇති මේ සියලු රජ දරුවෝ ම අවසානයෙහි මරු ඉක්ම වන්ට
248 සා නොහැකි වූහ. සත්වයෝ ම මරු වසඟ වන්නාහ යි දැන වස්තුයෙහි
ද ජීවිතයෙහි ද ඇල්ම නිතොර ම යෙහෙන් දුරු කෙරේවා.

මෙතෙකින් හුදී ජනයාගේ පහන් සංවේග පිණිස කළ මහ වස්හි
පංච රාජක නම් සත්තිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් අට වෙනි පරිච්ඡේදය

මහා නාම රජුට දා දෙමළියක කුසහොත් සොත්තිසේන නම්
1 කුමාරයෙක් ද එසේම මෙහෙසි දියණි වූ සංඝ නම් කුමාරිකාවන් ද
2 වූහ. එ කල සොත්තිසේන කුමාර රජ පැමිණ සංඝා කුමාරිය විසින්
3 මරණ ලද එදවස්හි දි ම ඕ තොමෝ බෙරපියවි කරවා තමා වල්ලභ
ඡත්තගාහකයා හට රජය දින ඒ තොමේ ඡත්තගාහක නම් වැව බඳවා
4 අවුරුද්දකින් මළේ ය. ඉක්බිති උහු යහළු වූ මහ පැණැති ඇමැත්තෙක්
5 තෙමේ මළ උහු ඇතුළු වහසල්හි අදාහන කරවා මහා බල ඇති කරල්
සොරහු "රජයට සුදුසු ය" යි සිතා රහස උහු රජ කොට රජතෙමේ
6 රෝගාතුර ය" යි ඇතුළු රජගෙහි ම වස්වා තෙමේ රාජ්‍යය විචාළේ ය.
7 සැණකෙලී පැමිණි කල මහා ජනයා අවුත් ඉදින් රජ තෙමේ ඇතිසේක්
8 නම් අප හා සමග සැණකෙළියට එන සේක්ව යි ගුගුළහ. ඒ අසා රජ
තෙමේ සර්වාලඞ්කාරායෙන් සැරහුනේ මගුලගැතු ගෙණා කල මේ තෙමේ
9 මට නුසුදුසු යි දළාදා ගෙහි සුණු පිරියම් ඇතුට අණකෙළේ යි "රජහු
අණැ" යි කී කල ඒ ඇත් තෙමේ ආය. උහු නැගී නුවර පැදකුණු
10 කරමින් ගොස් නැගෙණහිරි දොරින් බැහැර පළමු සෑ තන්හි ඇතු
තබන්නට යෙදී.[2]

11 මහ සෑ තුණෙහි ඇත් පවුරු තොරන් කරවී ය. ඒ මිත්‍ර සේන
රජ බොහෝ පින් කම් කොට වසෙකින් පරලොව ගියේ ය. පඬු නම්
දෙමළ තෙමේ පරතෙරින් ආයේ යුද්ධයෙහි දී මිත්සෙන් රජු මරා ලක්දිව
12 රජය කරවීය. එකල කුලවත් සියලු ජනයෝ රුහුණු ගියාහ. දෙමළු
මහ වැලි ගඟින් මෙතර අධිපති කම් කළහ.

13 ශුභ නම් බලතාට බිය වැද මෞර්‍ය්‍යවංශයෙහි උපන් යම් මිනිස්
14 කෙනෙක් පලා ගොස් ඒ ඒ තන්හි වාසය කාළෝ ද උන් අතුරෙන්
15 ධාතුසේන නම් එක්තරා කෙළඹියෙක් නන්දිවාපි ගම විසී ය. උහු පුත්
ධාඨ නම් තැනැත්තේ ඇඹුල් යාගු නම් ගම වෙසෙමින් සමාන ජාතික
16 වූ දා සෙන්‍ය සලකිස් බෝ යයි පුතුන් දෙදෙනෙක් ලද. උන් මැතියන්
17 සොහොවුරු වූ සැදෑ හැත්තෙක් පැවිදිව දික්සඳ සේනෙවියා පිරිවෙණ

---

1. පූජාවලී - ලමැතිස්

2. පූජාවලී - ඔහු ඉක්බිතිව මිත්සෙන් නම් කරල් සොරෙක් රජය ලදින් දවසෙක දළදා වඩින්නට ගොස් නැවත රජ ගෙට එනුයේ දළදා ගෙය දොර සිට මඟුලැතු ගෙණෙවයි කීය. ඇමතියෝ මඟුලැත් පසු විය. මද විගසක් බලා මහ රජයයි කීහ. එබසට මහ රජ කිපී උළින් සුණින් බැඳ නැගූ මහ ඇත්රුවක් බලා තෝ මට පිට නොදෙයි කීය; එකෙණෙහි ම උළු ඇත් රජු කරා අවුදින් පිට හිඳුවා නුවර පැදකුණු කොට රජු රජ ගෙහිලා ගියේ ය.

Non-Commercial Distribution

18 වෙසෙයි. ධාතුසේන තරුණ තෙමේ ද උන් වහන්සේ වෙත පැවිදි විය.
කලෙක ඒ සාමණේර යන් එක් රුක් මුලෙක හිඳ වණ පොත් කෙරෙවයි.
එකල වැසි වටුයේ ය, නාගයක් තෙමේ ඒ දූන දරණ වැලයෙන් පිරිකෙව්
19 කොට පෙනයෙනුද වසා පොත හා කුමරු ද රැක්කේ ය. මයිල් මහ
තෙරණුවෝ ඒ දුටහ. පසු දිනෙක කිපී එක් පැවිදි කෙනෙක් තෙමේ ඒ
20 කුමරු හිස කැළි කසලයක් දැමී ය. කුමර තෙමේ උහු කෙරෙහි සිත්
නො කෙලෙසීය. මයිල් මහ තෙරණුවෝ එය දැක ඒකාන්තයෙන් මේ
21 සත්ව තෙමේ උතුම නිශ්චයෙන්ම රජයන්නේ රක්ෂා කටයුතු යි උහු
ගෙණ වෙහෙරට ආහ. ගෝණිසාදි විහාරයෙහි මේ තෙමේ නුවණැති
22 කටයුතු යි සිතා ඒ කුමරහු හික්මවී පඬු රජ එපවත් දැන මුහු ගනු යි
සේවකයන් යැවී ය. ස්ථවිර තෙමේ එම රැ සීනයක් දැක කුමරු බැහැර
23 කළ සේක. උහු නික්මුණු කෙණෙහිම සේවකයෝ පිරිවෙණ සිසාරා
ඇවිද නුදුටුවහ. ඉක්බිති ඒ දෙදෙනා නික්ම අවුත් අනුරාපුරින් දකුණු
24 දිග ගෝණ නම් (මහවතුරු) පිරුණු හොයට අවුත් වහා යනු කැමැත්තෝ
25 නමුත් නැවැත්තා හ. මේ නදී තොමෝ අප යම් වළකා ද එසේම මෙහි
26 වැවක් බැඳ තෝ මේ ද අවුරස් යි කියා ස්ථවිර තෙමේ කුමරු හා සමග
27 හොයට බට එකල්හි නාරජෙක් ඒ දෙනො දැක තමා පිට පෑය එයින් ඒ
28 තෙමේ එතරව කුමරු ගෙණ ගොස් පිටිසර වෙසෙමින් කිරිබතක් ලැබ
වළඳා ශේෂය පාත්‍රයෙන්ම කුමරුට දින. කුමර තෙමේ ද තෙරුන්
කෙරේ ගෞරවයෙන් බත බිම බහා වැළඳී ය. තෙරුන් වහන්සේ ද
මේ තෙමේ පොළොව බුදීය යි උහු දතී.

29 පඬු රජ තෙමේ රජය කොට පස්වෙනි හවුරුද්දේ මළේ ය. උහු
පිත් පාරින්ද රජ තුන් වෙනි වස මළේ ය. ඒ පාරින්ද රජු කිස් දෙවුන්
30 මල් කුඩා පාරින්ද රජු පෘථිවියෙහි රජකම් කෙරෙමින් දාසෙන් කුමර
අනුව ගිය සියලු මහජනයා පෙළිය. දාසෙන් කුමර ද ජනයා එක්
31 කොට ගෙණරජු හා යුද කෙළේ යි. ඒ කුඩා පාරින්ද රජ ද පින් පව්
කෙළේ සොළොස් හවුරුද්දකින් මෙළේ යි. ඉක්බිති තිරිතර තෙමේ
32 රජ විය. දාසෙන් කුමර තෙමේ උහු හා මහ යුධ කොට දෙමසකින්
33 උහු මැරී ය. ඒ රජු මැරූ කල දාඨීය නම් දෙමළ තෙමේ අන්තරයෙම්
රජ ව තුන් හවුරුද්දකින් දාසෙන් කුමරු විසින් නසන ලද්දේ ය. ඉක්බිති
34 පීඨිය නම් දෙමළ තෙමේ රජව සත් මසෙකින් මරණයට ගියේ ය.
දෙමළ වංශය තෙමෙ දාසෙන් කුමරු හායුද කොට ශූන්‍ය විය.

ඉක්බිති ධාතු සේන නරශ්‍රෙෂ්ඨ තෙමේ ලක් දිව්හි රජ විය. ඒ
35 රජ තෙමේ තමා බෑ සලතිස්බෝ කුමරු හා ලක්දිව්හි එක් විසි තැනෙක
36 කඳවුරු බැඳ යුධ කොට නොයෙක් උපායෙන් ලක්දිව් නසන දෙමළුන්

Non-Commercial Distribution

37 සහ මුලින් නසා රට මොනවට ශුඬ කොට මහජනයා ද සුවෙහි පිහිටුවා,
සතුරන් විසින් නැසූ සස්න ද සුදුසු තන්හි තැබී ය.

"කුලවත් යම් කුල ගම්වැසි කෙනෙක් දෙමළුන් අනුව ගියා හු ද
38 ඔවුහු මා හෝ සස්න හෝ නො රැක්කාහ" යි කිපී උන්ගේ ගම් උදුරාගෙණ
39 ගම් රක්නවුන් කෙළේ ය. පූර්වෝක්ත සියලු කුලවත්හු රුහුණින් අවුත්
උහු උවැටන් කළහ. ඒ රජ තෙමේ සුදුසු පරිද්දෙන් උන්ට සත්කාර
40 සම්මාන කෙළේ ය. තමා දුකෙහි එක්ව වැටුණු ඇමතියනුදු තුටු කෙළේ
ය.

41 මහගඟ බඳවා කුඹුරු දිය කර තර කෙළේ යි. මහාපාළි නම් බත්
42 හල භික්ෂූන්ට ඇල්බත් දෙවී ය. නුවණැති ඒ රජ තෙමේ පිළුන් හා
43 රෝගාතුරයන්ට සාලා ද කරවී ය. කලා වැව අවුරා ගෝණ නම්
මහනදිය බැන්දේ යි. ඒ රජ තෙමේ මහා විහාරය තිරවුල් පෙත් මගින්
44 යුක්ත කරවා එසේම දර්ශනීය වූ බෝ ගෙය ද කරවී ය. සිවුපසයෙන්
භික්ෂූන් තුටු කරවා ධර්මාශෝක මහරජුහු සෙයින් තුන් පිටකයෙහි ද
45 සංග්‍රහ කෙළේ ය. මහා විහාර පරම්පරාවෙහි භික්ෂූන්ට කැපසරුප්
46 භෝගයෙන් යුක්ත අටළොස් වෙහෙර කරවිය. ලක්දිව්හි අටළොස්
47 වැවක් ද කරවී ය. කලා වැව වෙහෙර කරවිය. කලා වැව වෙහෙර
කෙළපසව දකුණුගිර වජමනි වෙහෙර කපණුවල බදුලු වෙහෙර
48 පහනඉදරට දාසෙන් පව්ව මියුගුණු වෙහෙර සැවිටියා උතුරු දාසෙන්
49 වෙහෙර නැගෙනහිර අඹවිටිය, අතුරු මෙගිර, ඇතාල වෙහෙර, කසපිටි
50 දාසෙන් වෙහෙර රුහුණු දෑගම සල්වාන් වෙහෙර විභීෂණ වෙහෙර
51 බෙල්වාන් වෙහෙර, යන මේ අටළොස් වෙහෙර දන්නා ලද්දා හ.
පාදුලකය, හඹලටියඨ මහා දත්තය යනාදී අටළොස් මහ වැව්
(දතයුත්තාහ) එසේම ඒ නරශ්‍රෙෂ්ඨ තෙමේ අටළොසක් සුළු වෙහෙර ද
වැව් ද කරවා එම විහාරයන්ට දෙවී.

52 තව ද පස්විසි රියන් මොනර පිරිවෙණ මූල ශුඩියෙන් කරවා
53 එක්විසි රියන් පමණ කොට කරවී. කලා වැව බාගාඞිය ද කෙත්
දෙසියය ද කුමාරසෙනයහට පවරා පූර්වභෝගය ශුඬ කෙළේ ය.
54 ලොහොපාය දිරා ගිය කල්හි නවක් කරයි, මහ සෑතුණෙහි දිරාගිය
55 ඡත්‍රයන් කරවිය. දෙවන පෑතිස් රජහු විසින් කළ බෝ පෙරහර සෙයින්
බුදුබව පතා පොහොයට නහනුමුර පූජාවක් කෙළේ ය. ඒ පූජායෙහි
දොවීන ලොහොහොරු සොළසක් පිදී ය. මුනිඳු රුවට අබරණ හා
නහනුමුර ද කරවී.

Non-Commercial Distribution

57 මහ බෝ පිහිටීමෙන් පසු ලඞකාවෙහි රජදරුවෝ දොළොස්
58 වන වස දක්වා බෝ පුද කරවූහ. මිහිඳු මහතෙරුන් පිළිමය කර වා
ආදාහන ස්ථානයට වඩා ගෙණ ගොස් තෙරුන්ට මා හැඟි පූජා කරණු
පිණිස දහසක් දී දීපවජසය ප්‍රකාශ කරන්ට අණ කෙළේ ය. එහි සිටි
59 භික්ෂූන්ට උක්සකුරු දෙන්ට ද අණ කෙළේ ය. තමා ඉස කැළි කසල
60 හෙළීම සිහි කෙරෙමින් එසේ කළ භික්ෂූන්ට තමා කරවූ වෙහෙර වසතුදු
61 ලාභය නොදින අභයගිරි විහාරයෙහි බොහෝ වූ පිරියම් කරවී. සල
62 පිළිමයට මඬප සහිත මන්දරයක් කරවී. බුජස් රජහු විසින් කරවන ලද
නෙත්‍රය නට කල්හි මාහැඟි මිණි සඟලකින් නෙත් තැබ්බ වී, එසේම
63 බුදුන් රැස් වළල්ල හා සිළුමිණ ද කෙස් පුඩු ද ගනනිල්මිණින් කරවී.
64 ඉතා උතුම් රන් පට ද එසේම ඌණීරොමද රුවන් සිවුර ද පා දූල ද
65 රන් පියුම ද මා හැඟි රන් පහනක් ද නානාරාග වස්ත්‍ර ද ගණන
66 පථාතික්‍රාන්ත කොට එහි පිදී, බහු මංගල චෛත්‍යයෙහි පිළිම ගෙවල්
67 ද බෝසත්රූ ද එසේම කළුගල් බුදුරුව ද කරවී. අභිෂේක නම් බුදුරුවට
රැස් වළල්ල හා සිළුමිණ ද කරවී. අභිෂේක නම් බුදුරුවටත් පෙරකී
පළඳනා කරවී. බෝගෙහි වම් අත බෝසත් ගෙයක් ද එසේම මෙතේ
68 බුදු රුවට සියලු රජ පළඳනා ද කරවී. එකල්හි හාත්පස යොදුනෙක
69 එයට ආරක්ෂා යෙදී. විහාර වල ධාතුරාජි නම් පෙත් මංද එසේම
70 ලක්ෂයකින් උතුම් මහබෝ ගෙය ද කරවී. ථූපාරාමයෙහි සෑය ජීර්ණ
71 විශෝධන හා පූජා ද දළදාගෙහි දිරිම් ද සකස් කෙරෙමින් දළදා කරඬුවක්
72 ද ගණ කොට මිණි එබ්බ වූ රැස් වළල්ලක් ද මා හැඟි මිණියෙන් ගහණ
73 වූ රන්පියුම් ද දංෂ්ට්‍රා ධාතුවට පිදී ය. ගිණිය නොහැකි පූජා ද කෙළේ
74 යි. ලක්දිව වැසි භික්ෂූනට ද සිව්රු ආදිය දෙවි, ඒ ඒ විහාර වල
නවකම් කරවා ප්‍රාකාර ද ගෙවල් ද සුණු පිරියමින් මනෝහර කරවී.
මහසෑ තුනෙහි මාහැඟි සුණුකම් කරවා රන්සත් විදුරු සුඹුළු ද කරවී.

75 පවිටු වූ මහසෙන් රජු විසින් මහ වෙහෙර නටබුන් කළ කාලයෙහි
76 ධම්මරුචික භික්ෂූහු සෑගිරියෙහි විසූ හ. රජතෙමේ අඹතලච්ච කරවා
මහා විහාරිය භික්ෂූන්ට දෙනු කැමති වූයේ ය. ධම්ම රුචිකයන් විසින්
77 ඉල්වන ලද්දේ ඔවුන්ටම දිනි. ධාතුපස්ථාන හොරුව ද කස්
78 ලොහොයෙන් කරවා දෙපස් අමුණෙකින් දන් වැට පැවැත් වී. (අනුන්
79 හා) අසම දම්සෝ රජු හා සම ඒ රජ තෙමේ නුවර ඇතුළ ද පිට ද බුදු
ගෙවල් හා සම (පිළිම ගෙවල් හා) පිළිම කරවා පූජා කෙළේ යි. ඒ
රජහු විසින් කර වූ සියලු පින්කම් එකක් පාසා කියන්නට කවර
මනුෂ්‍යයෙක් සමත් ද? එහෙයන් මුව මාත්‍රයක් දක්වන ලදී.

*Non-Commercial Distribution*

80 භින්නමාතෘක කසුප්ය සමාන මාතෘක මහබල ඇති මුගලනැයි
81 උහු පුතුන් දෙදෙනෙක් වූහ. එසේම (දුටුවන්) සිත් අල වන්නා වූ එක්
82 දුවකුදු වූවා. ඒ රජතෙමේ බෑනාහට සේනාපති තනතුර හා ඇය දිනී.
ඒ සෙනෙවිරත් වනාහි සැමිටියෙන් දො සිත් විනාම ඇගේ කලවාහි
83 තැළී ය. රජ තෙමේ දියණියන් ලෙහෙ වැකුණු පිළි දැක එබව දැන කිපී
උහු මව් නග්න කොට දැවී. එතැන් පටන් බඳනා ලද වෛර ඇති ඒ
සෙනෙවිරද්දු කසුප් කුමරු හා එක්ව රාජ්‍යයෙන් උහු පොළඹවා පියා
84 කෙරෙහි බිඳුවා ජනයා එක් කොට ගෙණ ජීවග්‍රාහයෙන් රජහු ගැන්වී.
85 ඉක්බිති කසුබ් කුමරු ලබන ලද සියලු පවිටු යහළුවන් ඇත්තේ
86 පිතෘපාර්ශ්වික මිනිසුන් නසා සේසත් නැගී ය. අනතුරු මුගලන් කුමර
උහු හා මහ යුධ කරණු කැමැත්තේ බල නොලත් බැවින් ඒ සඳහා
දඹදිව් ගියේ ය.

87 මහා රාජ්‍යයාගේ විනාසයෙන් ද, පුත්‍ර වියෝගයෙන් ද, දඹගෙයි
විසීමෙන් ද දුක් පත් වූත් රජහු (තවත්) දුක් කරවනු පිණිස නැණැති ඒ
88 සෙනෙවිරදුරත් නින්දිත කසුබ් රජහට රජ්ජුරුවන් වහන්ස ඔබ පියරජහු
89 විසින් රජ කුලයෙහි නිදන් රක්නා ලද්දාහ යි කිය. නැතැයි යි කී කල
90 මහරජ මුහුසිත නොදන්නෙහි, හේ තෙමේ මුගලන් කුමරහට නිද්න
91 රකීය යි උහුට කීය. ඒ අසා කිපියා වූ නරාධම තෙමේ නිදන්තැන්
92 කියව යි පියරජු කරා දූතයන් යැවී ය. කොල අප මරවන්ට ඒ පවිටුහු
93 උපායකැ යි සිතා කුෂ්ණීම්භූත විය. ඔවුහු ගොස් නිවට රජ හට (එපවත්)
දැන්වවූහ. ඉන් ඉතා කිපී නැවත නැවත දූතයන් යැවී. (ධාතු සේන රජ
94 තෙමේ) මා යහළුවා දැක කලා වැවෙහි ස්නානය කොට මියන්නෙමි
95 මැනවැ යි සිතා ඉදින් මා කලා වැව යවා නම් දත හැක්කැයි දූතයන්ට
කීහ. ඔවුහු ගොස් රජහට දැන් වූහ. රජ තෙමේ ද වස්තු කැමැත්තෙන්
96 තුටුව රථයක් දෙවා දූතයන් යැවී ය. බැගෑපත් ඇසින් උපලක්ෂිත වූ
රජු මෙසේ යන කල්හි රියැදුරු තෙමේ රථය පදනේ විළඳ කමින්
97 සුඟක් මුහුහට දින. එකල ඒ අනුභව කොට උහු කෙරේ පැහැද මුගලන්
කුමරු හට උහු දොරටුපාල සංග්‍රහයෙන් සංග්‍රහ කරන්ට පතක් දින.
සම්පත්හු නම් මෙසේ විදුලි උපමාව සැලෙන සුල්ලභ එහෙයින් චේතනා
සහිත කවරෙක් නම් හි පමා වන්නේ ද?

98 රජහු සුහෘත් ඒ ස්ථවිර තෙමේ රජ තෙමේ එයි යනු අසා ලිහිණි
99 මස් සහිත උඳු බතක් ලැබ රජහු රුචි නම් මෙ මැනවැයි මෙනෙහි
කෙරෙමින් සඟවා තබා හුන්නේ ය. රජ තෙමේ ද ගොස් වැඳ එකත්
100 පසෙක හිඳ ගත. මෙසේ හිඳ ගත්තා වූ ඔවුහු දෙදෙනා පැමිණි රජ

Non-Commercial Distribution

101 සැප ඇත්තාවුන් සේ පරස්පරාලාපයෙන් මහ දුක් තිවූ හ. ස්ථවිර
තෙමේ උහු වළඳවා නොයෙක් පරිද්දෙන් අවවාද කොට ලොව්දහම්
දක්වා අප්‍රමාදයෙහි යෙදී හ.

102 පසුව වැවට ගොස් (දියෙහි) ගිලී කැමැති සේ ස්නාන පානය
103 කොට රාජ සේවකයන්ට පින්වත්ති මාගේ වස්තු මෙතෙකැ" යි මෙසේ
කීය. රාජ සේවකයෝ එ පවත් අසා උහු නුවරට ගෙණ ගොස් රජුට
දැන් වූහ. මේ තෙමේ ජීවත් වෙමින් පුතුට වස්තු රකී, ලක්දිව් මිනිසුන්
104 බිඳුව යි. සිතා කිපී සෙනෙවිරත් හට මපියා මරව යි ඇණ වී ය. ඉතා
105 රොස් වූ ඒ සෙනෙවිරද්දු මා වෛරීහු පිටු දක්නා ලද්දී ය යි තුටු පහටු
106 යේ සව් බරණින් සැදියේ රජු කරා එළඹ උහු ඉදිරියෙහි සක්මන් කෙළේ
107 ය. රජ තෙමේ ඒ දැක ම පවිටු වූ මේ තෙමේ යම් සේ මා සිතත් පෙළා
108 නිරයට යවනු කැමැත්තේ ය. උහුට රොස් ඉපදවීමෙන් කවර මන
109 දොළක් පුරම්දැයි මෙත් කෙරෙමින් රජ තෙමේ එ සෙනෙවිහට මුගලන්
කුමරු කෙරෙහි ද, තා කෙරෙහි ද මම එක් සිත්මි යි කීය. හේ තෙමේ
110 සිනා සෙමින් ඉස සැලී ය. රජ තෙමේ ඒ දැක ඒකාන්තයෙන් අද (මා)
111 මරව යි දැති එකල සාහසික ඒ තෙමේ රජහු නග්න කොට නැගෙණ
හිරට මුහුණ ලා හැකිළි බැම්මෙන් බන්දවා ඇතුළු බිත්ති බැඳ මැටි ගැස්
වී

112 මෙසේ දැකත් පණ්ඩිත කවරෙක් නම් සම්පත්හි දිවයෙහි යසස්
හි හෝ ඇලේ ද?

113 ඒ දාසෙන් නම් මහ රජ තෙමෙ මෙසේ පුත් හු විසින් මරණ
ලද්දේ අටළොස්වසෙකින් දෙව් රජු කරා ගියේ යි. මේ රජ තෙමේ
114 කලා වැව බඳන්නේ සමාදියෙන් හුන් භික්ෂු කෙනෙක් දැක සමාපත්තින්
උගුළුවනු නොහැකිව ඒ මහණ මත පස් දැම්ම වී. මේ එහි සාන්දෘෂ්ටික
ඵලයයි දක්වන ලදී.

115 ඉසුරුමත් මේ රාජ ශ්‍රේෂ්ඨයෝ දශ දෙනම ඉසුරුත් සමගම මරු
මුව උපගතය හ. ඉසුරුමත්හුගේ ද වස්තුයෙහි ද අනිස බැව් දැක
පැණැත්තේ නිවන් ම කැමැති වන්නේ යි.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේ ග පිණිස කළ මහ වස දස
රාජක නම් අට තිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# තිස් නව වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති පවිටු වූ කසුබ් නම් ඒ රජ තෙමේ අස් ගොව්වා ද
අරක්කැමියා ද යවා මල් (මුගලන් කුමරහු) මරවනු නො හැකිවා බිසව
2 හා සීගිරට ගියේ ය. මිනිසුන් විසින් නැංග නො හෙන ඒ (පව්ව)
3 සිසාරා සුද්ධ කරවා, පව්රෙකින් පිරිකෙව් කොට එහි හිණි ගෙවල්
සිංහයින් බඳු කොට කරවී ය. එහෙයින් සීගිරි නම් වී

4 හේ තෙමේ වස්තු රැස් කොට එහි සුරැකි කොට තබා තමා තැබූ
ඒ වස්තූන්ට ඒ ඒ තැනින් ආරක්ෂා තබා එහි දැකුම් කටයුතු සිත් කලු
5 රජ ගෙයක් දෙවෙනි අලව්මදාවක් සේ කොට වෙසමුණු මහ රජහු
6 සෙයින් එහි විසී ය. මිගාර නම් සෙනෙවි තෙමේ සිය නමින් පිරිවෙණක්
ද එසේම අභිෂේක පිළිමයට ගෙයක් ද කරවා සල පිළිමයට වැඩියේ
7 එය අභිෂේක ඉල්වා නොලැබ "ස්වාමීහු රජයෙහි දනිමැ"යි නැවැත්තේ
ය.

8 ඒ කසුබ් රජ තෙමේ ද විපිළිසරව තමා කළ කමින් "කෙසේ
9 මිදෙම්දෝ"යි අපමණ පින් කෙළේ ය.

10 හේ තෙමේ නුවර දොරටුවල මහ වතු කරවී. ලක්දිව් හි
11 යොදනෙන් යොදන අඹ උයන් ද කරවී ය. ඉසුරුමුනි විහාරය කරවා
12 පෙර වස්තුවට වැඩියේ භෝග ග්‍රාමයන් ද විකිණ ගෙණ ඒ විහාරය
අයත් කොට දින, බෝය, උපුල්වන් ය යන මේ ඇති දූන් දෙදෙනෙක්
13 ඇති වූහ. මේ විහාරයට උන් දෙදෙනාගේ හා තමන් නම කරවී. ඒ
14 විහාරය දෙන කල මහා විහාර වැස්සෝ "පියා මැරූවහු මැ"යි ලෝ
15 වැස්සන් නින්දා නිසා භය වූවෝ පිළිගන්ට කැමැති නු වූහ. ඒ රජ
තෙමේ උන් වහන්සේලාට ම දෙනු කැමැති වූයේ පිළිමයට දින. භික්ෂූහු
16 ද "අප ගේ ශාස්තෲහු ගේ භෝගය"යි ඉවසූ හ. එසේම ඒ රජ තෙමේ
සීගිරි ගල සමීපයෙහි පුදන ලද උයන්හි වෙහෙරක් කරවී. එහෙයින් ඒ
17 ද ඔවුන් නම් විය. සිව් පසයෙන් යුත් ඒ විහාරය හා උතුරු දිග උයන
ද ධම්ම රුචික භික්ෂූන්ට රජ තෙමේ ම දිනි. ස්ත්‍රියක් විසින් තැඹිලි
කිරෙන් පිසන ලද බතක් ගිතෙල් මුසුව සකස් කරණ ලදුව යහපත්
18 පූපයන් සමග දුන්නා අනුභව කොට "මෙය ආය්‍යීයන්ට මැනව"
ආය්‍යීයන්ට ට ද මෙබඳු කොට බත් දෙමැ යි එවැනි බත් (සපයා) සියලු
19 භික්ෂූන්ට සිවුරු සහිත කොට දුන්නේ යි. පෙහෙවස් විසී සතර බ්‍රහ්ම
විහර භාවනා කෙළේ දුහඟ සමාදන් වී. පොත් ද ලියවී. අනල්ප
20 වූපිළිම ගෙවල් දන්හල් ආදිය කර වී. හේ තෙමේ පර ලොවින් හා
මුගලන් කුමරහු කෙරෙන් ද බිය ව වැටෙයි.

Non-Commercial Distribution

21 ඉන් අටළොස් වන වස්හි මහා හට මුගලන් කුමාර තෙමේ නිවටුන්
ආඥායෙන් අග්‍ර වූ දොළොස් යහළු කෙනෙක් ඇත්තේ දඹදිවින් මෙහි
22 අවුත් අඹකොළ පටුනෙහි පොරෝ වෙහෙර බල ඇණි බැන්දේ ය. රජ
23 තෙමේ එපවත් අසා " උහු ගෙණ මැ"යි කියා නිමිත්ත පාඨකයන්
විසින් "නො හැක්කැ"යි කියදීද්ත් මහා බල ඇති ව නික්මිණ. මුගලන්
කුමරද සැරහුණු බල සෙන් ඇතිව සූරයන් යහළු කොට ඇත්තේ අසුර
24 සමර වදනා සක් දෙව්රජහු සෙයින් අභිමුඛ විය.

25 ඒ දෙසෙනඟ බුන් වෙරළැති සයුරු සේ උනුනුන් කරා එළඹ
26 මහ යුද පටන් ගත්හු. කසුබ් රජ ඉදිරියෙහි මහ මඩ වළෙක් දැක අනික්
මගෙකින් වන්ට ඇතු පෙරළී ය. ඒ දැක උහු සේනා තොමෝ "කොල
අප හිමියා මේ පලායෙ"යි කියා බිඳිණ මුගලන් හටයෝ (සතුරන්) පිටු
27 දක්නා ලදූ යි අරගල කළහ. ඒ කසුබ් රජ සිරියෙන් (සිය) හිස සිඳ[1]
28 අහසට දමා සිරිය කොපුවෙහි බැහී ය. ඒ මුගලන් කුමර උහුගේ
ක්‍රියායෙහි පැහැද අදාහන කිස කොට සියලු උපකරණ ගෙන උතුම්
නුවරට හෙවත් අනුරාධපුරයට ආ ය.

29 භික්ෂූහු එ පවත් අසා මනා කොට හැඳ පෙරව විහාරය හැම ද
පිළිවෙළින් සිටියා හ. ඇත් පවුරෙන් බැහැර මහ සෙන් නවතා දෙව්
30 රජ නඳුනුයනට සෙයින් මහමෙව්නා උයන් වැද, ඒ සංඝයා කෙරෙහි
31 පැහැද සමීපයට එළඹ වැද සේසතින් පිදී සංඝ තෙමේ එය උහුට ම
32 දින එතැන ඡත්තවඩ්ඩි යන නමින් ව්‍යවහාර කළහ. එහි කළ පිරිවෙණ
ද ඒ නම් වී.

33 මුගලන් කුමර නුවරට ආයේ විහාරද්වයට ම ගොස් එහි සංඝයා
වැඳ මහරජයට පැමිණ ලෝකය දැහැමින් රැක්කේ ය.

34 හේතෙමේ "ඇමතියෝ මා පිය මැරවහු අනුගත වූහ" යි කිපී
35 යේ (ඇමතියන්) දායාද බැහර කරවී ය. එහෙයින් රකුසු නම් වි. ඒ
36 තෙමේ ඇමතියන් දහසකට වැඩියක් විනාස කෙළේ ය. එසේ ම
37 බොහෝ දෙනා කන් නාසා කැප්ප වී. රටින් තෙරපී. පසුව සදහම්
38 අසා සත්සිඳී පහන් සිත් ඇත්තේ පොළෝ තෙලෙහි මේඝ සෙයින් මහ
දන් පැවැත් විය. ඒ තෙමේ හවුරුදූ පතා දුරුතු මැදි පොහෝ දා දන්
39 පැවැත් වි. එ තැන් පටන් ඒ දානය ලක්දිව අද දක්වා ත් පවතී, පිය
රජ හට විලඳ දූන් ඒ රියදුරු තෙමේ ද පිය රජ දූන් සංදේශය ගෙණ
මුගලන් රජහට දැක්වී. රජ තෙමේ ද ඒ දැක හඬා තමා කෙරෙහි පැවති
පියත් පෙම් වණා උනුට දොරටුපාල නායක තනතුර දින.

---

1 නිකරණෙන සිරුරෙන් තොර කොට, නික්කරණී 44 පරිච් 111

Non-Commercial Distribution

40 මිගාර සෙනෙවි තෙමේ විධි වූ පරිද්දෙන් රජහට දන්වා අභිෂේක
පිළිමයෙහි අභිෂේක රිසි සේ කෙළේ ය. සීගිරි දළ්හ නම් විහාරය, දරි
41 දායා කොඩ්ඩඤ්ඤ නම් විහාරය ද, බගිරිනක දෙනා භික්ෂූන්ට දෙවි.
42 හේ මේ එම සීගිරි ගල විහාරයක් කොට දික්සඳ සෙනෙවියා කළ
43 විහාරයෙහි මහානාම තෙරුන් දෙවී. මහ නුවණැති ඒ රජ තෙමේ රැ
ජින නම් මෙහෙණ වරක් කොට දෙනානක භික්ෂූණීන්ට දින.

44 ලම්බකරණී ගෝත්‍රයෙහි උපන් දාඨාපභූති නම් කිසිවෙක් කසුබ්
45 රජහට උපස්ථානයෙහි කලකිරුණු සිත් ඇත්තේ මෙරලියවගට ගොස්
එහි ම වාසය කෙළේ ය. සිලාකාළය යි ප්‍රසිද්ධ උහුගේ එක් පුතෙක්
46 ද වී, හේ තෙමේ ද කසුබ් රජහට භය ඇත්තේ තමා මුගලන් කුමරු හා
47 මෙයින් දඹදිව් තල ගොස් බෝමැඩ වෙහෙර පැවිජි පැමිණ ප්‍රියශීලි ව
48 ආදර සහිතව සඟ වත් පිළිවෙත් කෙරෙමින් (වසන්නේ එක් දවසෙක)
අඹ ලදින් සඟනට දින. සංඝ තෙමේ උහු කෙරේ පැහැ ද "අඹ
හෙරණැ"යි වදාළේ එ හෙයින් ඒ නම් ඇති වි. හේ තෙම කෙහෙදාවස්
49 හි කී පරිද්දෙන් කෙහෙදා ලැබ දඹදිවින් මුගලන් රජහු රජ කරණ කල
50 මෙහි ගෙණා ය (රජ තෙමේ ) උහුට සත්කාර කොට කෙහෙදා ගෙණ
මාහැඟි පිළිමිණි කරඬුවෙක්හි ලා දිවකුරු බුදුන් උතුම් පිළිම ගෙයි වඩා
51 මහ පෙරහරින් පුද පැවැත් වී. ඒ තෙමේ මයිල්හු ද උහු බිරින්ද ද
52 රන්මුවා රූ කොට එහි තැබී. (එසේම) පිළිම ද, මනා අස්රුවක් ද,
53 තැබූයේ කෙස්දා කරඬුව ද, ඡත්‍රයක් ද, රුවන් මඬුවක් ද, අගසව්
54 යුගලය ද, වල්විදුනාවක් ද කරවී. රජ තෛමේ තමහට අධික පෙරහර
55 උහුට දින. සිලාකාළයන් අසිග්ගාහක කොට ආරක්ෂා පිණිස යෙදී. එ
56 හෙයින් අසිග්ගාහක සිලාකාළයයි පසිඳු වී. රජ තෙමේ භෝගයන් හා
තමා බුහුනනින් උහුට දිනි. මේ කියන ලද්දේ ඉතා සංක්ෂේප යි.
මෙහි විස්තරය සර්වප්‍රකාරයෙන් පැණැත්තහු විසින් කෙසේදාවසින් ගත
57 යුතු සයුරින් අරක් බැඳ ලක්දිව නිර්භය කෙළේය. දහම් සහිත බුදු සසුන
58 දූහැමෙන් සෙමෙන් ශුඬ කෙලේ. උතුරු සෙනෙවි තෙමේ සිය නමින්
ප්‍රධාන ගේ කරවී ය. ඒ රජ තෙමේ මෙසේ පින් කොට ගෙණ අටළොස්
වනුවස්හි මරණ ගත වී

59 මෙසේ අතිබලි කසුබ් රජුගෙන් දිනුයේත් කළ පින් ගෙවුනු කල
තමා කරා පැමිණි මරු දිනනු නොහැකි වාසේ තෙමේ ම දසෙක් සේක්
විය. එ හෙයින් නුවණැත්තෝ මරහු බල පැහැර සුවපත් වන්නෝ ය.
තමා හඳුනන්නහු විසින් ශාන්ති පද වූ පරම නිර්වාණය ලැබ්බ යුත්තේ
ය.

මෙතෙකින් හුදී ජනයා ගේ පහන් සංවේග පිණිස කළ මහවස්
හි රාජ දවයදීපන නම් එකුන්සාළිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# හතලිස් වෙනි පරිච්ඡේදය

1 ඒ මුගලන් රජු ඇවෑමෙහි කුමාර ධාතුසේනය යි ප්‍රසිද්ධ උහු
පුතෙක් දෙවියන් සමාන රූ ඇත්තේ මහා බල ඇති රජෙක් විය [1] පියහු
2 විසින් කරවන ලද වෙහෙර නවකම් කෙළේ ය. දහස් සංගායනා කරවා
3 සස්න පිරිසුදු කෙළේ ය. සිව්පසින් මහ සඟහු පිණවි. නොයෙක්
4 පින්කම් කොට නව වෙනි වස මෙළේ ය. උහු පිත් කිත්සෙන් කුමර
රජ පැමිණ නොයෙක් පරිද්දෙන් පින් කොට නව වෙනි මස් හි ඒ රජය
හැරියේ යි.

5 මයිල් සීව තෙමේ උහු මරා රජ ව අපමණ පින්කම් කොට
6 පස්විසි වෙනි දා උපතිස්සහු විසින් නසන ලදී. සීවක රජු මරා උපතිස්ස
7 තෙමේ රජ විය. මුගලන් රජහු බුහුනන් සැමි තෙමේ සෙනෙවිරත් විය.
උපතිස් රජ තෙමේ තනතුරු ආදීන් ජන සංග්‍රහ කොට සිලාකාල හට
8 භෝගයන් සමහ දූව දුන්නේ ය. උපතිස් රජහුගේ කාශ්‍යප නම් එක්
පුතෙක් වී, සූරවූ හෙතෙම් සූර වූ සොළොස් මිතුරු කෙනෙක් හා
9 යහළු ව දානමාන මහා ධන කොට ඇත්තේ ඒකවෘත්ති වූ යහළුවන් හා
දූහැමෙහි සිටියේ වීයඹියෙහි ජීවත් වන්නේ මොනවට කුල දෙටුවන්
10 පුදයි. ඉක්බිති සිලාකාළ තෙමේ රාජ්‍ය ලෝබයෙන් රැවටුනු සිත් ඇති
11 ව දකුණු මළයට ගොස් මහ බල කැටි කොට ගෙණ පසල් දනව්ව
කොල්ලකමින් නුවර වෙත පැමිණියේ ය. ඒ අසා දෙටු කසුප් තෙමේ
12 පියහු අස්වසා උතුම් ඇතෙකු නැගී යහළුවන් ගෙණ නුවරින් නික් ම
සිලා කාළයා ගේ දර්ශනයට ගියේ ය. (ඒ සිලාකාළ තෙමේ ) මෙසේ
අට වරෙක සැඟවුන පැවතුම් ඇතිව පලා ගියේ නැගෙණ හිරි බටහිරි
13 දේසයන් උපායෙන් අත් කොට ගෙණ නැවත නැගෙණහිරි තිස්පව්වට
14 යුද පිණිස අයේ ය. කසුබ් කුමරද ඇතකු නැගී යහළුන් හා එහි ගොස්
සොරු පලවා මහ ඇතු පව්මුදුනට නැංගවී ය. එහෙයියන් ගිරිකසුබ්
15 යයි නම් වී. තද මන් ඇති සිලාකාළ තෙමේ ඉබාහෝ සේ රට හෙද
16 කොට සියල්ල අත්පත් කොට ගෙණ (පරා විසින් ) නො දිනිය හැකි
17 බලවා ගත ඇතිව අවුත් නුවර ඇවිරී ය. රාජ සේවකයෝ සත් දවසක්
18 යුද කොට තුනී වූහ. ඉක්බිති කසුබ් කුමර මෙසේ සිතී නුවර වටලීමෙන්
මේ සියලු ප්‍රාණීහු බිඳෙති. බලය ද පිරිහින. රජ තෙමේ ද අඳ ය.

1. ඉති සිංහලකවෙඃ කුමාරදාසස්‍ය කාතෞ ජානකීහරණෙ යනාදිය ජානකී හරණ නම් ප්‍රසිද්ධ කාව්‍යයෙහි පැණේ.

එසේ ම පැරකුම්බා සිරිත නම් සිංහල කාව්‍යයෙහි

වෙහෙර දසටක් යි පටන් ගෙණ කුමරදස් රද කාලිදාස් නම් කිවිඳුහට සිය දිවි පිදී යනාදී කාරණා මෙහිදී සැලකිය යුතු.

Non-Commercial Distribution

18 මහලු ය. මා මවුපියන් මෙර කඳුරු රට හිඳුවා බල එක් කොට ගෙණ
19 පසුව සොර තෙමේ නිග්‍රහ කටයුතු "ය"යි සිතා හේ තෙමේ රාත්‍රියෙහි
20 යහළුවන් ද රාජෝපකරණ ද මව් පියන් ද ගෙණ මලය රට බලා
21 නික්මිණ. එකල මග කියන්නෝ සම්මුඛ වූහ, මග නො දන්නෝ නුවර
වෙත ම ඔබ මොබ ඇවිද්දා හ.

22 සිලාකාල තෙමේ එ පවත් අසා වේගයෙන් අවුත් වැටලී ය.
23 බියකරු යුද විය. දිව්‍යාසුර යුද්ධ බඳු මහා යුද්ධ පවත්නා කල යහළුවනුදු
24 වැටුනු කල මහා ඇතුහු පසු බස්නා කල තමා හිස කපා ඇතරුවාට දී
25 සිරිය ලේ පිස කොපුවෙහි බහා ඇත්කුඹ දෙඅත් තබා වැතිර ගත.
26 උපතිස් රජ ද ඒ අසා සෝක නමැති හුලින් පහරණ ලදින් මෙළේ ය.
මෙසේ එකඩවසකින් උපතිස් රජු ද මළකල සිලාකාළ තෙමේ රජ විය.
27 උහු පූර්ව නාමය හා එක් කොට අඹ හෙරණ සලමෙවන් රජැ යි
28 ව්‍යවහාර කළෝ ය. (හේ තෙමේ) තෙළස් හවුරුද්දක් වෙසෙමින්
ලක්දිව දැහැමින් රැක්කේ ය. මහාපාළි නම් බත්හල මාහැඟි රාජ
29 භෝජනයට දෙවි. ජන සමූහයාට හිත වූ හේ තෙමේ වෙද හල්හී වැටුප්
වැඩී දවසක් පාසා බෝ පුද කෙළේ පිළිම ද කරවී සියලු ලක්දිව් වැසි
30 සමණන්ට තුන් සිවුරු දිනි. ලක් දිව කිසි සතෙක් නො නසාව යි
ව්‍යවස්ථා තැබී. තමා ගෙණා කෙස් දා මොනවට පිදී. රහෙර ජලවාරය
31 ද බගිරිනකට දිනි. හේ තෙමේ මහනිකා සමණන්ගේ පෙරදිග වෙහෙරින්
32 කුන්ත නම් අස්න ගෙණ එහි බෝධි වෙත තැබී. දිව් හිමියෙන් ගණණ
පථාතික්‍රාන්ත පින්කම් කෙළේ ය.

33 මුගලන් ඒ සේ දාඨාපභූතිය උපතිස්ස යයි උහු පුතුන් තුන්
දෙනෙක් වූහ. ඉන් වැඩිමල් කුමර හට නැගෙණහිර රට ද ඈපා නම්
34 තනතුර දී " ගොස් එහි වස"යි යැවී ය. හෙතෙමේ ද ගොස් එහි විසී
35 ය. මලය රජ අඟ තනතුර ද, දකුණු රට ද දී මධ්‍යමයා මුහු ද රක්නා
36 පිණිස යෙදී. යොවුනන් අතුරෙන් මහා දැකුම් ඇති උපතිස් කුමරහු
වනාහි වෙසෙසින් මමානයට කරන්නේ තමා වෙතම වැස් වී.

37 ඒ අඹහෙරණ සලමෙවන් රජු දොළොස් වෙනි වස මෙරටින්
කසී රට ගිය වෙළඳ තරුණයෙක් ඒ කසී රටින් දහස් ධාතු මෙහි
38 ගෙණා ය. දහම් නො දහම් විමසීමෙහි අදක්ෂ වූ ඒ රජ තෙමේ දැක "
රනැ"යි සිතා පහත වැටෙන පළගැටියකු සේ "බුදු දහමෙකැ"යි සිතා ඒ
39 ගෙණ මොනවට සත්කාර සම්මාන කොට රජගේ චේත ගෙයෙක්හි
40 තබා ප්‍රාණීන්ට පථ්‍යයෙකැයි සිතා අවුරුදු පතා දෙනානකයට ගෙණවුත්
සැණකෙළි කෙළනට චාරිත්‍රයක් ද කෙළේ ය.

Non-Commercial Distribution

41 සිලකාල තෙමේ මෙසේ අපමණ පින්කම් කොට තෙළෙස් වෙනි
42 වස පැමිණි කල කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියේ ය. එකල විකෘති
බුද්ධි ඇති දාඨාපභුති නම් මලය රජ රජය ගෙණ "ක්‍රමය නෙවේය"යි
වළකන සිය මලු මැරවී ය.

43 ඉක්බිති ඈපා මුගලන් කුමර එ පවත් අසා "නො පත් රජය ගත
ධම්වාදී කිස්දොවුන් මා මලු නො කරුණෙහි මැර වියඃ මම දූන් රාජ්‍යයක්
44 කරවන්නෙමැ" යි කිපී මහසෙන් ගෙණ රෙහෙර පව්වට පැමිණියේ ය.
45 රජ තෙමේ ද ඒ අසා සැරහුණු බල ඇණි ඇතිව කිරිදිගල කඳවුරු
46 බැන්දේ ය. මුගලන් කුමර එපවත් අසා "ලක්දිව් වැසි මිනිස්සු නුඹට
හෝ මට අපරාධ ඇත්තෝ නො වෙති, අප දෙන්නා ගෙන් එකෙක්
47 මළ කල ඉතිරියාට රජය වන්නේ ය. එහෙයින් අන්‍යයෝ යුද්ධ නො
කෙරෙත්වා, මෙහි අප දෙන්නා ඇත් යුද කරමු" යයි රජහට හසුන්
යැවී ය. හේ තෙමේ ද "මැනව" යි කියා බැඳි පසව් ඇත්තේ ඇතු නැඟී
48 මුනි රජුට මාරයා සේ එකෙණෙහි ආයේ ය. මුගලන් කුමරු ද සැදී
උතුම් ඇතකු නැඟී එ සේ ම ආයේ ය. ඒ මහ ඇත්තු උනුනුත් ආහ.
49 (ඇතුන් ඉස්) පහට කල සෙන හඬ සෙයින් ශබ්ද ඇසිනඃ දළ පැහැරීමෙන්
50 විදුලියේ ගිනිසිළු නැංගේය. ලෙහෙ වැකුණු ඇත්තු සඳ වලා බඳු වූහ.
51 මුගලන් කුමරහු ඇතු විසින් විදූනාලද රජුහු ඇත් තෙමේ පසු බැස්සේ
52 ය. රජ තේමේ ඒ දූක සිය ඉස සිඳනට පටන් ගත. ඉක්බිති මුගලන්
කුමර "තමහක් මෙසේ කර" යි වඳිමින් ආයාචනා කෙළේ ය. අයදනා
53 කල්හි ද හෙතෙමේ මින් පුදමින් ගෙළ කපාගත. ඒ දාඨාපභුති රජ
තෙමේ සමස් දවසකින් රජය හැරියේ ය.

54 ඉක්බිති මහබල ඇති මුගලන් කුමර ලක්දිව රජ විය. මයිල්
55 රජහු සඳහා මොහු සුළු මුගලන් නමින් ව්‍යවහාර කළෝ. හේ තෙමේ
අසදෘශ කවිය, තුනුරුවන් පරම ප්‍රතිෂ්ඨා කෙළේ ය, දන් දීම, සත්සුන්
56 බව, පිරිසිදු බව සුරත බව යනාදි ගුණයන්ට අවාසයෙක් බඳු වී,
57 දානයෙන් ද ප්‍රිය වචනයෙන් ද වැඩට හැසිරීමෙන් ද,
සමානාත්මතාවයෙන් ද මහජනයා සංග්‍රහ කෙළේ ය. පිණ්ඩපාතය,
58 විහාරය, බෙහෙත් ය. සිවුරු ය යන සිවු පසයෙන් හා ධාර්මික
59 ගෝපනයෙන් ද බික්සඟහු සංග්‍රහ කෙළේ, ධම් භාණකයන් අතිරේක
පූජාවෙන් පුදා අටුවා සහිත තෙවළාව කියවී. ධම්ප්‍රදීප වූ මහනුවණැති
ඒ රජ තෙමේ රිසි පිරිදි වැටුපින් දරුවන් නලවා හැම කල්හි දහම්
60 හැදූරවී. පුරුෂොත්තම වූ හේ තෙමේ දහම් කව් බැඳ ඇත්කුඹෙහි
(මිනිසුන් හිඳුවා) රාත්‍රි ධම් වසානයෙහි නුවර කිය වී, පව්තය මැදින්
61 කොප්‍රොම්හොය බැඳ වී දීඝායුෂ්ක හේතු ක්‍රියා යයි ආදර සහිත පත්
පහන් වැව, දනවැව, ගිරිතවැව බැඳ වී, සදහම් ද ලිය වී. තුණුරුවන්

Non-Commercial Distribution

62 පූජා ද කෙළේ. මව් තොමෝ ඔරුවැඩුපිතක්හු සෙයින් ඒ තෙමේ
ලොවට අනුකම්පා කොට කැමති පරිද්දෙන් (දන්) දී (සම්පත්) අනුභව
63 කොට විසි වෙනි වස මෙළේ ය.

64 ඒ සුළු මුගලන් රජහු මෙහෙසී තොමෝ විස යොදා නෑයන් මරා
65 පිත්හු රාජ්‍යයෙහි අභිෂේක කොට තොමෝ රාජ්‍යය විචාළා ය. එසේ
අභිෂේක ලත් ඒ කිත්සිරිමේ රජ තෙමේ පළමු කොට තුඹුපතින් බෝගෙය
වැස්වී ය. දුගී මගී යාචකයන්ට මහ දන් පැවැත් වී. හේ තෙමේ
66 සතරමංසලක් සේ සියල්ලන් විසින් උපභෝග කට හැකි විය. එකල
67 මහේසිකා තොමෝ සියලු කම්හි ප්‍රධාන වූවා එහෙයින් ම උහුගේ රජය
68 උඩුයටිව පෙරළිණ, රාජ්‍ය ප්‍රතිෂ්ඨා මහ ඇමතියෝ අත්ලස් පරවස වූහ.
ජනපද වාසී බලවත්හු දුවිලයන් පෙළූහ.

69 අඹහෙරණ සලමෙවන් රජු දවස සංගිල්ලාගම හයසීව නම්
70 අන්‍යතරයෙක් වී. මේ තෙමේ මෞර්‍යවංශජය. අක්බෝ නම් (ඒ)
සිවයා පුතෙක් විය. මහානාග යයි ප්‍රසිද්ධ වූ උහු බෑනෙක් ද වී,
71 බැහැන වූ මහානාග තෙමේ අක්බෝ සෙයින් මනාවී. මහා බල ඇති ඒ
72 මහානාග තෙමේ උදාර අධ්‍යසය හෙයින් කෘෂිකම් ගොයක් ලැබ
නැන්දනියන් වෙත එවී. ඕ තොමෝ ගොයා දුක හැඳින වී පැසක්
යැවුවා කඹුරාහට සාවෙකු එවී. හේ තෙමේ ද එසේ ම කෙළේ ය.
73 බුහුනනියගෙන් වී ඉල්වීය. ඕ තොමෝ වී ගන්නා දාසයෙක් ද උහු ට
74 දී රස ආහාර පානාදියෙන් පෝෂ්‍ය කළා. එකල දුර්භික්ෂ කාලයෙක්හි
75 එක් මන්ත්‍රධර මිනිසෙක් තෙමේ සැදෑහතියන්ගෙන් පිඬු පිණිස මහණ
76 වෙසින් සිඟයි. ඒ තෙමේ ගමට වැද කිසි අහරක් නො ලදින් සයින්
පෙළුනේ වෙවුලමින් බැහර යයි. මහා ආදර ඇති මහානාග තෙමේ
77 උහු දුක කරුණා කරමින් පාත්‍රය ගෙණ ගම මුළුල්ල ඇවිදත් කැඳ
78 පමණකුත් නො ලදඃ ඉක්බිති උතුරු සළුව දී ආහාර ගෙණාය. මතුරු
දන්නා තැනැත්තේ ඒ ආහාර අනුභව කොට පැහැද "මොහු මේ දිවිහි
79 රාජ්‍යාභිෂේක කෙරෙමි" සිතා උහු ගෙණ සැණෙකින් ගොකන් මහ
මුහුදු ගියේ ය.

80 ඉක්බිති මුහුද වෙත හිඳ විධි වූ පරිද්දෙන් ජප කෙරෙමින් දුරුතු
පුණු පොහෝ රැහි මන්ත්‍රයෙන් නාගේන්ද්‍රයක් ගෙණා ය. "මහා නාගයා
81 ස්පර්ශීකර "යි මහා නාගය මෙහෙසී. හේ තෙමේ භය වූයේ පෙරයම
ආ ඒ නාගයා ස්පර්ශ නො කෙළේ ය. මැදියම් ද එසේ මැයි. පසුයම
82 වනාහි නගුට ගෙණ දෑමුයේ ය. ඒ තෙමේ මෙසේ තුණඟිල්ලකින් උහු
ස්පර්ශ කෙළේ ය. (මන්ත්‍රධර) තෙමේ ඒ දුක උහුට ප්‍රකාශ කෙළේ ය. "
83 මාගේ ව්‍යායාමය සඵලය, තෝ තුන්රජෙකු හා යුද්ධ කොට සතරවැන්නහු

Non-Commercial Distribution

මරා මහලු වූයේ රජව තුන් හවුරුද්දක්ම ජීවත් වන්නෙහි. එසේ තා
84 වස උපන් මිනිස්සු තෙදෙනෙක් රජ වන්නා හ. ගොස් රජහු සේවා
85 කර, පසුව මා බල දක්නෙහි ය"යි මෙසේ කියා යැවීය. හෙතෙමේ ද
ගොස් රජහු දූක උපස්ථාන කෙළේ ය. රජ තෙමේ උහු රුහුණු කැමියෙක්
86 කෙළේ ය. හෙතෙමේ එහි උපදනා බොහෝ බඩු ගෙණා ය. රජ
තෙමේ උහු කෙරේ පැහැ ද උහුට අන්ධසේනාපති නම් තනතුර දී
87 එහිම යන්ට හයසිවයා ගේ පුත්‍ර ද තමා බෑනා ද ගෙන ගොස් ඒ දේශය
88 සර්වප්‍රකාරයෙන් පෙරළි ය. ඒ තෙමේ රුහුණ ප්‍රත්‍යෙකභෝග කොට
89 ගෙණ එහි වෙසෙමින් මහා බල ඇත්තේ දාඨාපභූති (නම් මලය රජු)
හා යුද කරන්නට ගොස් මුගලන් කුමරහට හයින් පෙරළා රුහුණු ගොස්
90 එහි විසී ය. කිත්සිරිමේ රජහු රජයෙහි මනා මං බැව් අසා "රාජ්‍යය
91 ගැන්මට කාලය" යි රුහුණින් වහා අවුත් එක්විසිවෙනි දා රජහු මරා
92 තෙමේ මිහි පල්ව දේශය පෙර සේ කොට "එව"යි කියා බෑනාට පතක්
යැවී ය. මේ තෙමේ එමින් නිමිත්තකින් පෙරළා ගොස් මෙළේ ය.
93 ඉක්බිති කෙළෙහි ගුණ දන්නා (ඒ මහානාග රජ තෙමේ) මයිල් පිත්හු
94 උපරජ කෙළේ ය. හෙතෙම මහ බෝ වෙහි තොතැන්න කොට රන්මුවා
95 ගෙය වැස්සවී ය. මුනි රජහු පිළිම ද තැබී. මහ සෑ තුණෙහි සුණුකම්
96 හා කොත් කැරලි ද කෙළේ ය. ඇත්පවර ද කරවා සිතයම් කරවී. ඒ
97 තෙමේ උතුරු දිග ජම්බලා නම් පෙහෙරගම් ද සියඹලාගම ද මහා
විහාරයට බැඳ දින. උඩුගම්හි වැහැප්ගම ජේතවනයට දින, තුන් නකයෙහි
ම වස්ත්‍රදාන පැවැත් වී.

98 කෙත් තුන්සියයක් දී ජේතවන විහාරයෙහි භික්ෂූන්ට සර්ව කාලික
99 කැඳ දානයක් එහි පැවැත්වී ය. දූරතිස් වැවින් කෙත් දහයක් දී මහ
වෙහෙර වැසි තපසුන්ට නිති කැඳ දන් පැවැත් වී. ගුණයෙනහි ඇළුණු
100 රජ තෙමේ චීනමාතික වාරය ද මහ වෙහෙරටම දින, මොනර පිරිවෙණ්
ද නවකම් කෙළේ යි. කසිකට මාදෙවරත්කුරව නම් වෙහෙර දිරූ
101 අනුරා රාමය ද පිරියම් කෙළේ ය. නරේශ්වර තෙමේ මේ ආදී
102 දෙව්ලොවට හිතකම් කොට තුන් වසරකින් දෙව් රජ සහ බවට ගියේ
103 ය. තුටු සිත් ඇති වෙසවුණු මහරජහු සේ අපමණ සම්පත් ඇති මේ
රජහු අටදෙනා මිනිස් ඇත් අස් සූර සේනා රථයෙන් බබළන්නෝ වූහ.
කෙළවර ඒ සියල්ල හැර කිසි පරිජනයන්හු නැතිව හෙවත් හුදකලාව
සොහොනට ගියහ. තමහට වැඩ කැමති නුවණැත්තෝ ඒ සිහි කෙරෙමින්
බව සුව වනු කැමැත්තේ වේවා.

මෙතෙකින් හුදි ජනයා පහන් සංවේග පිණිස කල මහවස අටඨ
රාජක නම් සතළිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# හතලිස් එක් වෙනි පරිච්ඡේදය

1 (ඉක්බිති) මහානාග නරනිඳුනු මයිල් පිත් මනා පින් ඇති බුදුබව
2 බලා ආසේවිත අදහස් ඇති ඒ අක්බෝ කුමර රජ විය. (ඒ රජතෙමේ)
3 තෙදින් හිරු ද, සොම් ගුණෙන් සුපුන් මඬුලු සඳ ද, නිසල ගුණෙන්
4 සුනෙර ද, ගැඹුරු ගුණෙන් මහ මුහුද ද, නො කැපී ගුණෙන් මහ
පොළොව ද, සම වැටුමෙන් පවන ද, නුවණින් සුර මැතිහු ද සුදු
5 ගුණෙන් සරා අහස ද, කම්සුවෙන් දෙවිඳු ද, සම්පතින් වෙසවුණුහු ද,
දහමින් හුදුව සිටු හු ද, විකුමෙන් මිහිඳු ද, රජ දහමින් රජයෙන්
6 සක්විති නර ඉසුරු ද, දානයෙන් වෙසතුරු රජු ද අනුව ගොස් ලෙව්හි
7 පසිඳු වී ඒ රජ තෙමේ මයිල්හු උප රජයෙහි ද සොහොයුරුහු යුවරජයෙහි
8 ද බෑනා මලයරජ තනතුරෙහි ද පිහිට වී ය. ශ්‍රෙෂ්ඨදාඪ්‍යයන් යෙදෙන
9 සේ ඒ ඒ තනතුරෙහි පිහිට වී . ජනයා සඟරාවතින් හා රජ දහමින්
සංග්‍රහ කෙළේ ය. සෙත් සහිත දකුණ යුව රජ හට දින. හේ තෙමේ
එහි වෙසෙමින් සිරිවඩමන් වැව බැඳ වී. මහ පැණැති (රජ තෙමේ)
10 සඟසතු ගිරිවෙහෙර තනා සඟහු භෝග පිණිස කෙත් දෙසියයක් එම
11 වෙහෙරට දෙවි. මලය රජ හට දළනම් සිය කුමරිය දින සිරි සඟබෝ
12 නම් පිරිවෙණ ද කර වී මහා සිව ( තෙරුන්ට) සිය නමින් පිරිවෙණක්
ද කරවී.

උහුගේ පිරිවර ද මෙසේ ම පුණ්‍යපරායන වී, සත්පුරුෂ
සේවනයෙන් පුරාණ ධාර්මික විධිය කොට අන්තරා ය විශෝධන සඳහා
13 ජීර්ණ ප්‍රතිසංස්කරණය ද කෙළේ ය. ඒ රජහු කරණ කල කවිවරයෝ
සිංහල නිරුක්තියෙන් විසිතුරු නයින් යුක්ත බොහෝ කව් ගෙතූහ.
14 දකුණු වෙහෙර ඉතා සිත්කලු පහයක් කෙළේ ය. නව හවුරුද්දක්
15 ලක්දිව කටු ඉදිරිවී. කුරුඳ නම් වූ සර්වසාංඝික විහාරය කරවා එනම්
16 වැට ද තුන් යොදුන් තෙරළු අරමක් ද ගොයම් කරවනු සඳහා මහත්
17 සීමා දෙකක් ද එකල දින. ලාභ සත්කාර සම්මාන හා ආරාමිකයන්
සියයක් ද දින.

18 ඒ වෙන ඇඹුල්පස නම් වෙහෙර කරවා එම නම ඇති ගම මහා
19 විහාරය භික්ෂූන්ට දින. උරුවෙල් වෙහෙර පිළිබඳ බොහෝ කලක්
20 වර්ණනාකරණ ලද රුවන් නම් ගම දී සෙල්මුවා බුදු පිළිමය පිහිට වී.
21 කේලිවා (රට) සුමන නම් පව්ව කර වී ය. මහා තෛලාවාටයක් හා
බෝගෙහි ගල් පිළිකඩ ද කරවී ය. ඒ රජ තෙමේ ලොහොපාය කරවා
22 පහන් පෙරෙහර හිඳී සතිස්දහසක් භික්ෂූන්ට තුන් සිවුරු පිදී ය. දුවණියන්
23 නමින් (පැවති) ගමක් පුදා ආරක්ෂා තැබ්බවී ය. ඈත් කඳ විහාරයෙහි

Non-Commercial Distribution

ප්‍රාසාදයත් නුවණැති ඒ රජ තෙමේ කරවී ය. දාඨාසිව නම් තෙරුන්ගේ
අවවාදයෙහි යහපත්ව පිහිටා දැහැමින් (සෙමෙන්) හැසිරෙන්නේ
24 උන්වහන්සේට සකසා උවටැන් කෙළේ ය. එම රජ තෙමේ විසල්
ගොළු සෙවියා වෙහෙර කර වීය. ලජ්ජිත නම් ගම එක් (පැවදි)
25 කෙනෙකුට දාස භෝගය පිණිස දින. මහානාගරජ හට පින් පිණිස
එනම් පිරිවෙණ කර වීය. රජ තෙමේ ත්‍රිපිටකධාරී මහා ස්ථවිර හට එය
26 ද දින පහ වූ ආසා ඇති ඒ ස්ථවිර තෙමේ තමන් සමාන වූ තපස් ඇති
සිව් සැටක් භික්ෂූන්ට එකල ඒ වෙහෙර දුන් සේක. මහ පිරිවෙන් වැසි
27 එම තෙරණුවන්ට ම වටු කර පිටියෙන් හිනෙහරු ද්වීපය දෙවා දක්ෂිණා
28 ගිරි දළ නම් වෙහෙර ද මානා ගල වෙහෙර ද, කලා වැව ආදී විහාර
29 වල ද, පොහෝ ගෙවල් කෙළේ ය. අභය ගිරි විහාරයෙහි මහා
30 පොකුණක් කරවී ය. සැගිරියෙන් තිරදිය ඇති නාග සොඩ (නම්)
31 පොකුණ කර වීය. සකස් කොට මිහින්තලා වැව ද නියෝග කෙලේ
ය. මිහිඳු මහ තෙරුන් එතනට පැමිණ කල ඒ මගින් වඩා ගෙණ
32 එත්වයි කතිකාවකුදු කර වී ය. ඒ තෙමේ තුන් නකයෙහිම සත් අට
33 නව වරෙක මාහැගි රුවනින් රන් සත ද කරවී. මහා ථූපයෙහි සූවිසි
34 බරක් ඇති දළදා ගෙය තනවා විසිතුරු රුවනින් දිලිසෙන රන් කරඬුව
හා මහාපාළියෙහි ලොහොරු ද කෙළේ ය. ඒ රජ තෙමේ මිණිමෙව්ලා
35 නම් (වැ) බැම්ම ද බැන්ද විය. මිණිහිරි වැව්හි මහ මොව් ඇල ද
ගැන්වී.

36 එකල ජෝතිපාලක නම් මහාස්ථවිර කෙනෙක් ලක්දිව්හි
විවාදයෙන් වෛතුල්‍යවාදීන් පැරදවූ සේක. පසුව දාඨාපභූති නම්
ඈපාණෝ ඉතා ලැජ්ජා ඇතිව උන්වහන්සේ පහරණට අත එසවූ ය.
37 එකෙණෙහිම ගඩුවක් උපන. රජ තෙමේ ඒ තෙරුන් කෙරෙහි පැහැද
38 වෙහෙර ම වැස්වී ය. මානයෙන් උන්වහන්සේ කරා නො අවුත්
39 දාඨාපභූති තෙමේ මෙළේ ය. බෑන අක්බෝ කුමරහට මහ ඈපා තනතුර
40 දී ඒ තෙරුන් රක්නට නියෝග කෙළේ ය. හේ තෙමේ ද එසේ හැසිරින.
ඒ තෙමේ නිල්ගේ පරිවෙජදය කරවා උන්වහන්සේට ම දින. මෙසේ
නොයෙක් පරිද්දෙන් පින්කම් කොට සූතිස්වන හවුරුදුයෙහි (ඒ අක්බෝ
රජ තෙමේ) මෙළේ ය.

41 ඒ රජහු ඇවෑමෙන් අක්බෝ මහා ඈපා තෙමේ රජ විය. පූර්ව
42 රජහු මහලු බැවින් මුහු කුඩා අක්බෝ නමින් ප්‍රකාශ කළහ. පූර්ව
චාරිත්‍රයෙහි පණ්ඩිත වූ ඒ රජ තෙමේ ලක්දිව පරිපාලන කෙළේ යි. ඒ
43 තෙමේ තමා මයිල්හු දියණියක් අගමෙහෙසුන් කෙළේ ය. මෙහෙසිය
නැවු සංඝ භද්‍ර කුමරහු අසිග්‍රාහක කෙලේ ය.

Non-Commercial Distribution

44 ආලය රහිත වූයේ සුදුසු පරිද්දෙන් තනතුර ද දින වේළුවන විහාරය කොට සාගලී භික්ෂූන්ට නියෝග කෙළේ ය. ජම්බුරනතරගල්ල[1] හා මාපිටිය කෙළේ ය.

45 එම රජහුගේ කාලයෙහි කලිඟු රට රජතෙමේ යුදෙහි සතුන් මැරෙන්නා දැක කලකිරුණු සිත් ඇත්තේ මේ ලක්දිව අවුත් පැවිදි
46 පිණිස කර ලද නිශ්චය ඇත්තේ ජෝතිපාල නම් මහ තෙරුන් කෙරෙහි පැවිදි විය. රජ තෙමේ උන්වහන්සේට බොහෝ කලක් සත්කාර කෙළේ යි.

47 මත්තපබ්ත විහාරයෙහි උන් වහන්සේ ගේ පදන් තැන කෙළේ
48 ය. එසේම උන් වහන්සේගේ ඇමති තෙමේ ද මහේසිකා ද මෙහි අවුත්
49 පැවිදි වූහ. රජහුගේ මෙහෙසි තොමෝ ඒ බිසවගේ උතුම් පැවිද්ද අසා සකස් කොට උවටන් කළා. රතනා නම් ද කරවී. රජ තෙමේ ඇමති
50 භික්ෂුහට නැගෙණහිරි කඩරොද වෙත්‍රවාස විහාරය ද දින. ඒ යති
51 තෙමේ සංඝයාට ඒ වෙහෙර දිනි. රාජස්ථවිර තෙම මෙළේ ය. රජතෙමේ සෝකව හඬා සුළුගල් වෙහෙර පදන් තැන් කරවී. උන්වහන්සේට (පින් පිණිස) පලංනගරග නම් තැන කරවී ය. රජ තෙමේ මෙසේ උන් වහන්සේ පිණිස බොහෝ පිනුදු කෙළේ ය.

52 ජෝතිපාල තෙරුන් ථූපාරාමයෙහි සෑය වඳනා කල ඒ (සෑයෙන්) භාගයක් බිඳී උන් වහන්සේ ඉදිරියට හින. දුක්ඛිත වූ ස්ථවිර තෙමේ
53 රජු කැඳවා එය දක් වූ සේක. රජ තෙමේ දුක්මෙන්ම තැති ගත්තේ
54 එකෙණහිම කර්මාන්ත තැබීය. ඒ රජතෙමේ දකුණු අකුධාතුව ලෝවා මහපා කුස අරකුන් සහිත කොට තබ්බවා රෑ දෙවෙහි පූජා පැවැත් වී
55 ය. නවකම් කල්යත් ථූපාරාමයෙහි දෙවියෝ ඒ රජහට ආරාමික යන්
56 සෙයින් පෙනී සිහිනයක් දක්වන්නෝ "ඉදින් රජ තෙමේ දාගෙය කරන්නට පමා වන සේක් නම් අපි දාතුව ගෙණ යම් කිසි තැනක
57 යම්හ"යි දක් වූහ. එකෙණහි ම රජ තෙමේ පිබිඳියේ තැති ගත් සිත් ඇත්තේ දාගෙයිහි සිතියම් ආදියෙන් යුත් වූ සියලු කර්මාන්ත කල්
58 නොයවා ම කරවී. පිළිම සතර හා සෙල්මුවා පලඟ ද රන්සත් ද ගෙහි සලකම් දළකඩකම් ද සර්වාකාරයෙන් (කරවී) මහ ඇමති ආදීහු කරඬු
59 එකසිය නවයක් හා දෙවන පෑතිස්ස රජහු විසින් කරවන ලද සියලු කර්මාන්ත ද අලුත් කොට කළ හ. ඒ රජ තෙමේ යථාර්ථයෙන්
60 සර්වෝත්සහායෙන් මහාපූජාවක් කරවා සර්වාදරයෙන් ලොහොපායෙන්

---

1. රත්ගිරි දඹුල්ල

Non-Commercial Distribution

ධාතුව වඩා ගෙණවුත් සංඝයා සහිත ජෝතිපාල මහතෙරුන් පිරිවරා (
61 ඒ අකු) ධාතුව පෙරහරින් ධාතු කරඬුවෙහි වැඩුයේ ය. තමා සහිත
62 මුළු ලක්දිව දාගෙට පිදී ය. ඒ ගෙය ආරක්ෂා කරනට මෙහෙසියගේ
ලාභ ග්‍රාමය දින. නාගදිවයින රාජායතන ධාතු ගෘහය ද , උණු ලොම්
63 ගෙය ද, ආමල චෛත්‍යයෙහි සැතද (කරවී) විහාරයට කැඳ දන්
64 පිණිස තත්තග්‍රාමය දින. අගතසල් නම් ගම අභය ගිරි විහාරයට දින ඒ
65 රජ තෙමේ තමන් බිසවගේ නම් එක් කොට තබා දළ අග්බෝ නම්
66 අවස අභයගිරි විහාරයෙහි කර විය. ඒ දේවී තොමෝ සැපයුතු සිව්පස
67 ඇති කබල් නා වෙහෙර මොනොවට කරවා එම විහාරයට පිදූවා. රජ
තෙමේ දෙනානකයෙහි රිදී සුඹුලුගෙය කෙළේ ය. ඒ තෙමේ ම බෝගෙය
68 වෙත ලිඳ කැණවී. ගංතලා වැව. වලස් වැව ගිරිතලාවැව ද කරවී. බත්
ඔරු ද කරවා මහාපාලි නම් බත්හල වැඩුයේ ය. මෙහෙසි තොමෝත්
69 මෙහෙණින්ගේ බත් වස අණ කළා. ඒ රජ තෙමේ මෙසේ පින් කොට
දස වන හවුරුදුයෙහි දෙව්ලොව ගියේ ය. සපත් සම්පත් ඇති පින්
70 කිරියෙහි ඇළුනා වූ නරපතීහු පවා මෙසේ මරහුගේ වසඟයටම ගියහ.
එහෙයින්ම නුවණැති සත්ත්ව තෙමේ භවයාගේ මේ ආකාර නියමය
මොනවට බලන්නේ විධියෙන් භවයෙහි ඇල්ම හැර පැවිදි බවට එළඹීයේ
ධෛර්‍ය්‍ය ඇතිව නිවන් බලා හැසිරෙනේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේගපිණිස කළ මහ වස විරාජක
නම් එක්සාළිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# හතලිස් දෙවෙනි පරිච්ඡේදය

1 ඒ සුළු අක්බෝ රජු ඇවෑමෙන් සඟතිස් අසිග්ගාහක තෙමේ
2 මිහිපල් විය. යුක්තියෙහි ඇළුණු ඒ රජ තෙමේ සසුන් ලෝ වැඩ
කැමැත්තේ සුදුසු පරිද්දෙන් තනතුරු දී ජන සංග්‍රහ කෙළේ ය. එකල
3 සුළු අක්බෝ රජහු සෙනෙවි මුගලන් තෙමේ රුහුණු වසන්නේ සඟතිස්හු
රජ පවත් අසා යුද පිනිස මහගල කඳවුර පිහිට විය. සඟතිස් රජ
4 තෙමේ ද එපවත් අසා උහු හා යුද පිණිස බලසෙන් යැවී ය. මහාබලි
5 මුගලන් තෙමේ ඒ බලයෙන් බිය ගැන්වී ය. පසුව ඒ මුගලන් සෙනෙවි
තෙමේ රැ වෙහෙර නම් තැනට ගොස් බලසෙන් රැස් කෙරෙමින් එහිම
6 විසී ය. සඟතිස් රජ තෙමේ නැවත අවුත් කෙසෙල් තිවාත නම් තැනදී
7 තමා බලසෙන් යවා උහු පලවා නුවරට වන නැවත මුගලන් තෙමේ ද
නටුවා වූ සියසෙන් පියවි කොට ගෙණ කරේහේර නම් පෙදෙසට
8 පැමිණියේ ය. ඒ සඟතිස් රජහු සෙනෙවි තෙමේ යම්කිසි මද කරුණකින්
දුක් දොම්නස් වූයේ සොරු වෙතට පුතු යවා දැඩි ගිලන්වූවකු සේ ඇඳ
9 වැතිර ගත්තේ ය. රජ තෙමේ එපවත් අසා එකෙණෙහි උහු කරා එළඹ
10 " එසේවී නම් තෝ නහසක් සෝක වෙහිවා, මෙහි කටයුතු කුමරහුට
අනුශාසනා කෙරෙමින් නුවර රකු, තමා සමග යුද්ධ භූමියට එන්ට
11 ගිලන් හෙයින් තට නොපිළිවනැ"යි යෙදී ය.

12 සියලු ජනයා බැහැරලූ කල රජ බොජුන් සුන්කළ කල මහා
පාළියෙහි උයන ලද ආහාරය රජහට එලවූහ. රජ තෙමේ ද ඒ දැක කල
කිරුණේ "මෙපමණකින් කුඩා නොවන්නේ ය"යි සිතා පුතු හා සමග
13 ඇතු නැඟී ලන ලද සන්නාහයෙන් යු සෙන් ඇතිව යුද පිණිස වහා
14 ගියේ ය. රජ තෙමේ ඉතා මද සෙනගක් හා නැඟෙනහිරි තිස් පව්වට
15 පැමිණියේ ය. මෙසේ දෙයතින් සංග්‍රාමය පැමිණි කල මිත්‍ර ද්‍රෝහි ඒ
සෙනෙවි තෙමේ පිටිපසින් යුද පටන් ගත. රජහුගේ පුත්‍ර තෙමේ ඒ
16 දැක "මූ මරන්නෙමැ" යි කීය. රජ තෙමේ "නහමක් තට රිසිවේවා, මේ
සෙනඟ ඉවසිය හැක්කේ නොවේම ය. ඉතා මද සෙනග නසන්නේය"යි
17 වැළකී රජ තෙමේ බලසෙන් දෙකට මැදවිය, එහෙයින් රජසෙන් සොරු
හා සෙනෙවියා පිණිස දැක්විය.

18 රජහු ඇත් තෙමේ මීරුක් සෙවනකට වන. එහි අත්තක වැද
සේසත බිම හිණ. සොරහු සේනා තොමෝ ඒ දැක ගෙණ ගොස්
19 හිමිහට දින. ඒ තෙමේ පව්මුදුනෙහි සිට ඒ සේසත නැඟී ය. එකල රජ
20 සෙනඟ "මේ තෙමේ රජුදෝ" යි සිතා ගොස් උහු පිරිවැරූ ය. එකල

Non-Commercial Distribution

21 රජ තෙමේ හුදකලාව ඉක්බිති ඇත්කඳින් බැස පුත්‍ර ද, සුහෘත් ඇමති ද
(කැටිව) සමීප වූ මෙරමදාරා වනයට වන ඉක්බිති ලබන ලද ජය ඇති
22 මුගලන් තෙමේ වාහන ද, මිත්‍රද්‍රෝහි සෙනෙවියා ද, උහු පවිටු පුත්‍ර ද
23 ගෙණ නුවරට අවුත් ලඩ්කාතලාධිරාජ වී අනතුරුව "සතුරා ජීවත් වන
24 කල සුව නැති"යි සිතී ය. හෙතෙමේ පූර්ව රාජයාගේ පින් මෙහිය යි
අසා කෝපව වහා උහු අත් පා කපන්ට ඇණවී. රජහු විසින් අණවන
25 ලද පුරුෂ තෙමේ ක්‍ෂණයෙහි අත්පා කපන්ට උපක්‍රම කෙළේ ය. ඒ
26 කුමර තෙමේ දොම්නස්ව "මාගේ කැවුම් කන අත ඉදින් කැපූ නම්
එකල මම කුමකින් කැවුම් කන්නෙම් ද"යි හැඬී ය. ඒ අසා රජු අණ
27 සේ කම්කටොල් දෙන අධම මනුෂ්‍ය තෙමේ හඬා සැලව රාජාඥායෙන්
මිරිකුණේ ඒ කුමරුහු වම් අත හා පය කැපී ය.

28 රජහු අනිත් පින් දෙටුතිස් කුමර වෙස්වළා මෙරකඳුර නම් මලය
29 රටට ගියේ ය. ඉක්බිති සඟතිස් රජ තෙමේ පුත්‍රාමාත්‍යයන් කැටිව
රහසේ වේළුවනයට ගොස් භික්ෂූන් විසින් මෙහෙය වන ලදුව කසා
30 පිළි හැන්දේ ය. මහණ වෙස් ගෙණ රුහුණු යන්න කැමැතිව මිණිහිරි
වැවට පැමිණියේ ය. එහි සිටි රාජ සේවකයෝ මේ තුන් දෙනාම
31 හැඳින ඔවුන් පා අවුරා රජහට හසුන් එවූහ. රජ තෙමේ ඒ අසා
33 වෙසෙසින් තුටුව වහා එතැනින් ඔවුන් ගෙන ගොස් සීගිරට පමුණුවා
සැක බිය නැතිව එහි දී රජු හා පුතු ඉස් ගණුව, ඇමතියා වනාහි
34 සජීවයෙන් මාවෙත ගෙණුව "යි අණ කෙළේ ය. මෙසේ අණ ලත්
මිනිස්සු ඒ තුන්දෙනා ගෙණ සීගිරියට ගොස් කීවා කරන්ට පටන්
35 ගත්හ, එකල රජ කුමර ඒ කම්කරු මිනිසුන්ට "පළමු මා හිස සිඳ දෙව,
36 ඒ මට සුවය"යි කීය. රජහුගේ මිනිස්සු එසේ කළහ. පසුව රජහු හිස්
37 සින්දහ. "අදෝමය කම් දත් ජනයිනි බාලයන්ගේ ක්‍රියාවක් බලව්"
සම්පත් වූ කලී මෙසේ අනිස, නොතිරය, තමා වසඟ නොවව්. පින්වතුනි
එහි ඇලුන තෙපි නිති සූව වූ නිවන් කවර හෙයින් නො සොයද් ද?

38 හිතේසි ඇමතියා හට දූන් රජුගේ හස්න කිවූ ය. ඒ අසා සිනාසී
39 මේ වදන් කීය. "මා ජීවත් වන කල හිස් සිඳුනා ලද හිමි තෙමේ මා
විසින් දක්නා ලද අදෝමය. උහු හැර අන් හිමියෙක් සෙවීම ද මෙහි
40 උහු මරා උහුගේ සෙවණැල්ල ගෙණ වනු කැමැත්තට අදෝමය තෙපි
නුවණ නැත්තාහ. උමතුවහයි සිතමි" මෙසේ කියා (මළ) ස්වාමියා පය
ගෙණ වැද හොත්තේ ය. කිසි පරිද්දෙකින් උහු විසින් ඒ ගත් පාදයන්
අරවත අපායක් නොදක්නා මිනිස්සු උහු ගේ ද හිස සිඳ හිස් තුණ ම
41 එක්කොට ගෙණ ගොස් රජහට දූක් වූහ. රජ තෙමේ නිර්භයව තුටු වී.

Non-Commercial Distribution

43 ඉක්බිති දුෂ්ට සෙනෙවියාට මලය රජ තනතුර දින. උහුපුතු
අසිග්‍රාහක තනතුරෙහි තැබී ය. ඒ තෙමේ අලුත් වස්ත්‍රයෙන් දහගැප්
44 තුනම වැස්වී. එසේ ලක්දිව් තෙලෙහි සියලු දාගැප්හි මහ පෙළහර
45 කරවී ය. ඒ රජ තෙමේ බුදුහු කේසධාතු ය, දළදා ය. එසේ ම
මහබෝය යන මේ සකසා මහ පුදයෙන් සත්කාර කෙළේ ය. වෙසක්
46 පූජා ආදි චාරිත්‍ර ක්‍රමයෙහි ආ සියල්ල කෙළේ ය. ධර්ම කර්මයෙන් සියලු
47 බුදු සසුන් හුදු කෙලේ ය. මහා පූජායෙන් පළ සජ්ඣායනා කරවී ය.
ලාහ දී අතිරේක පූජායෙන් බහුශ්‍රැතයන් පිදී ය. ලක්දිව් වැසි සියලු
48 භික්ෂූන්ට සිවුරු දින. සියලු ආවාසයන්හි කෙළින් ඇති කරවී ය.
49 පිළිම කරව් දිරූ තැන් නව හම් කරවී. තුන් සියයකට වැඩියක් ලුණු
කෙත් ද සංඝයාට දින කරවිට මුගලන් වෙහෙර කර වීය. පිටිගම්
50 වෙහෙර සංගමුව වටගමුව එසේ ම සැගෙය ද රත් වෙහෙර ද, කරවී.
ඒ රජ තෙමේ ම බොහෝ විහාරයන්ට බොහෝ අයගම් දින. මෙසේ ඒ
51 රජ තෙමේ අපමණ පින් කෙළේයි.

පළමු රජහුගේ සම්පත් අතිස බව මෙනෙහි කරමින් එකල කිසි
52 දොසකින් මලය රජහට කිපියේ එම මලය රජු විසින් පූර්වරාජයාමට
කරණ ලද විප්‍රකාරය ද මෙනෙහි කොට උපායෙන් උහු ගෙන අත් පා
53 කැප්ප වී. එපවත් අසා (මලය රජුපිත්) අසිග්‍රාහක තෙමේ පුතුන් සහිතව
රුහුණු ගියේ ය. හේ තෙමේ එහි වෙසෙමින් මද කලකින් ම ජනපදය
54 අත් පත් කොට ගෙණ මලය රට සැඟ වී සිටි දෙවුතිස් කුමරු කරා
ආය. උහු හා ඒ තෙමේ විහාරයට දනව් නසමින් දොළු ගලට අවුත්
කඳවුරු බැන්දේ ය. රජ තෙමේ සියල්ල අසා සැරසුනු බලසෙන්
55 සහිතව ගොස් උහු වෙත ම කඳවුරු බැන්දේ ය. එකල රජහුගේ
56 බොහෝ මිනිස්සු ජ්වරයෙන් පෙළි මල හ. ඒ අසා අසිග්‍රාහක තෙමේ
57 වෙලෙව්ව යුද පටන් ගත. ඉතා දුර්වල රජ සෙන් බිඳ පැලහ. ඒ රජ
58 තෙමේ පසුව පලා ගියේ ය. ඒ අසිග්‍රාහක තේමේ සීගිරි පව්ව වෙත
59 හුදකලාව යන මහ රජහු දැක පිරිසක් එක්කොට මැරවී ය. පසුව එන
60 දෙවුතිස් කුමරුන් මරවන්ට "එව රජ වෙව"යි හස්නක් උහුට යැවී.
61 දෙවුතිස් කුමර ඒ දැන "හේ තෙමේ දූක සේ ලත් රජය කෙසේ නම් මට
62 දෙයි ද?" යි සිතා හැරී පලා ගොස් මලය රටට ම ගියේ ය.

63
64 ඒ අසිග්‍රාහක (සිලාමෙඝ) තෙමේ මෙසේ දල මුගලන් රජු
65 සහවුරුද්දකින් මරා බලසෙන් ලැබ පරෙළා අනුරාධපුර අවුත්
මිහිතෙලෙහි අණසක් පැවැත් වී. සලමෙවන් නම් ඒ රජ තෙමේ සංඝයා
හා බෝධිය වැඳ තුන් සෑයට සත්කාර කෙළේ ය. බත් හල ද වැඩී.
66 ඉතා දුක් ඇති සායෙහි ගිතෙල් උක් සකුරෙන් සකස් කරණ ලද කිරිබත්
67 ද පෙරහන් කඩ ද සංඝයාට දින.

Non-Commercial Distribution

දුගී මගී යාචකයන් සියලු දානයෙන් සංග්‍රහ කෙළේ ය. මහ
68 කරුණා ඇති ඒ රජ තෙමේ දරුවන් කැවුම් මිළ ද දින. අභයගිරි
69 විහාරහි සෙල්මුවා බුදුන් පිදී. ඒ පිළිමය පිළිබඳ දිරාගිය ගෙය ද නන්
රුවනින් විසිතුරු කොට කරවී ය. ඉලන්ද වැව පුදා ඒ බුදුන් ආරක්ෂා
ද සියලු උපහාරයෙන් පූජා ද හැම කල් පැවැත් වී.

70 පුණ්‍ය භාජන වූ ඒ රජු මෙසේ වසන කල දෙටුතිස් කුමරු මයිල්
සිරිනාග නම් නායක තෙමේ එතෙර ගොස් බොහෝ දෙමළුන් ගෙණ
71 අවුත් උතුරු රට ගන්ට පටන් ගත. රජ තෙමේ ද එපවත් අසා ගොස්
72 රජ මිතුරා නම් ගම්හි දී යුද කොට උහු මරා ඉක්බිති උහු හා ආ
73 දෙමළුන් මරණ ලදින් ඉතිරියන් ගෙණ නොයෙක් පරිභව කොට ඒ ඒ
74 තැන විහාර යන්හි දස් කොට දින. මෙසේ ලත් ජය ඇති රජහු නුවරට
75 අවුත් සියලු රට සුද්ධ කොට කොයිනුත් බිය නොව වසන කල අභයගිරි
විහාරයෙහි බෝධි නම් භික්ෂු තෙමේ උත්සන්න දුස්සීලයන් දැක හේ
76 තෙමේ පැවිදියෙන් බාල වුයේත් රජු කරා එළඹ දහම් කම් ඉල්වී ය.
රජ තෙමේ උන්වහන්සේ ලබා ඒ විහාරයෙහි දහම් කම් කර වීය.
77 උන්වහන්සේ විසින් බැහැර ලන ලද සියලු දුස්සීලයෝ එක්ව මන්ත්‍රණය
78 කොට රහස ඒ දැමිහු මරා ඒ කර්මය ප්‍රතිබාහණය කළෝ ය. එකල රජ
තෙමේ එපවත් අසා කිපියේ උන් සියල්ල එක් කොට ගෙණ අත් කපා
79 බැඳුම් සහිත කොට පොකුණු පල්ලන් කෙළේ ය. ඒ අධි කරණයෙහි
80 අතික් සියයක් භික්ෂූන් දඹදිව ලැවී ය. ඒ මරණ ලද දැහැමිහු උත්සාහය
මෙනෙහි කෙරෙමින් සස්න ශුද්ධ කරවී. ඔවුන් හා පොහෝ කරණු
81 පිණිස ථෙරිය වාදික භික්ෂූන්ට ආරාධනා කොට ප්‍රතික්ෂේප කරණ
ලද්දේ ඉතා කිපී අනාදරව අක්‍රොශ කොට පරුෂ බසින් පරිභාෂණ
82 කොට ඒ භික්ෂූන් ක්ෂමා නො කරවා දකුණු දේශයට ගියේ ය. ඒ රජ
තෙමේ එහි වෙසෙමින් මහා රෝගයකින් පෙළෙන ලද්දේ කෙණෙහි
මෙළේ ය. මෙසේ නව හවුරුද්දකින් මිහිතල හැරියේ ය.

83 ඒ රජහු ඇවෑමෙන් උහු පිත් අක්බෝ කුමර සිරිසඟබෝ නමින්
84 ප්‍රසිද්ධ වූයේ රජ විය. උහු මල් මාණ කුමර උප රජ තනතුරෙහි
85 අභිෂේක කොට උහුව සේනා වාහන සහිත දකුණු රට දින. ඒ රජ
තෙමේ පෙර රජුන් පැවති පරිදි නො නසා දැහැමින් රට රැක්කේ ය.
සඟහුද බුහුමන් කෙළේ ය.

86 ඉක්බිති මලය රට සැඟවී සිටි දෙටුතිස් කුමර ඒ සියලු පවත්
87 අසා රිටිගල අවුත් මහ ජනයා සංග්‍රහ කෙළේ ය. ඉතා මන කල්පනා
ඇති ඒ කුමාර තෙමේ පූර්ව දක්ෂිණ දේශයන් අත් පත් කොට ගෙණ
88 මහා බල ඇතිව ක්‍රමයෙන් නුවරට එන්ට පටන් ගත. බටහිර දිග වසඟ

Non-Commercial Distribution

89 කරන්ට දළසිව් මැතිහු යවා තෙමේ සිරිපිටිගම විසී ය. රජ තෙමේ
90 එපවත් සියල්ල අසා උපරජු එහි යැවී ය. හේ තෙමේ බටහිරි දිගට
91 ගොස් සෙන් සහිත උහු පැලවී ය. කැඳල්ලෙහි පිළවහු සෙයින් දරුවහු
නැසිය හැක්කැයි මයෙත් වැවට පැමිණි කුමරහුගේ ඇමතියා රජ තෙමේ
92 අල්වා ගත. දෙටුතිස් කුමරුත් මුහුසේ ගන්නෙමි සිතා අති වික්‍රම
93 ඇත්තේ නිසැකව මද වූ බල සෙනගින් යුක්තව ආය. දෙටුතිස් කුමරද
එපවත් අසා යුද පිණිස සැරහුනු සේනා වාහන ඇත්තේ බුන් වෙරළැති
සමුදුර සේ රජසෙන් වැසීය. රජ සෙන් බිඳින. ඒ රජ තෙමේ ඇතු
94 නැගී හුදකලාව අප්‍රසිද්ධ වේශයෙන් ක්ෂණයකින් පලා ගොස් රජයෙන්
සවන මස්හි එකෙණෙහි නැව් නැගී වස්තු හා රට හා නැයන් හැර
දඹදිව් ගියේ ය.

95 අනතුරුව දෙටුතිස් කුමර තෙමේ නුවරට අවුත් රජව පෙර සෙයින්
96 සියලු කිස පැවැත්විය. සස්න රැක්කේ ය. ඒ රජ තෙමේ අභයගිරි
97 විහාරයට මහා දාරගිරය දීන. මහා විහාරයට ද මාමෙන් බෝව දින. ඒ
රජ තෙමේ ම ජේතවනයට ගොඩිගමුව දින මහිලගන, දිඹුලගන යන
98 ගම් දෙක පදන් ගෙහි නායක වූ මහානාග තෙරුන් දින. කසුබ් ගිරියට
ගොදුරු ගම් කොට අඹලප නම් ගම දින. එම රජ තෙමේ වේළුවනයට
99 කැකුළු විට දින. ගඬගාමාතිකා විහාරයට කෙහෙතා ගම දින. අතුරු
100 ගං වෙහෙරට චූලාමානික ගම දින. මයෙත් වැව කසුබ් වෙහෙරට
101 සහන් නරුව දින. කළා වැ වෙහෙරට උදා ගම දින. මේ විහාරයන් හා
102 අනිකුත් විහාරයන් අය ගමින් පිරවි. දිරූ (විහාරාදිය) තුන් ලක්ෂයකින්
නවකම් කෙළේ ය. ලක්දිව් වැසි භික්ෂූන්ට තුන් සිවුරු දින.

103 , දඹදිව් ගිය රජහුගේ සහෝදරයෝ ඒ ඒ තැන සැඟවී උන්හ.
104 ඔව්හු දේශය නසන්ට පටන් ගත්හ. දෙටුතිස් රජ ඒ අසා කළාවැවට
105 පැමිණ උන් හා යුද කෙරෙමින් සේනා සහිතව එහිම විසී ය. පරතෙර
106 ගිය රජ තෙමේ දෙමළ සෙන් ගෙණ කළා වැවට අවුත් යුද කරණට
107 පටන් ගත. දෙටුතිස් රජ ද සටනට සැරහුනු බලසෙන් ඇතිව ආයුධ
ගෙණ දළසිව් ඇමති දඹදිව් යවා ලන ලද සන්නාහ ඇති ඇතෙකු නැගී
යුද කෙරෙමින් තමා සෙන් පසුබස්නා දූක තමා ඇතු නැගුනා වූ මහ
108 ඇමති හට මේ වදන් කීය. "මා හසුන් මෙහෙසියට කියා පසුව තෝ ද
109 කැමති සේ කරන්නෙහි "මා දේවිනි පැවිදිව ආගම හදාරා අබිදම් කියා
110 රජ හට පිංදෙව"යි යන මේ හසුන් දී යම්තාක් යුද්යට ආ ආ දෙමළුන්
111 මරා ආයුඃක්ෂයට ගියේ ය. එකල්හි යුදට ආ වේළුප්ප නම් දෙමළා දූක
112 අත බුලත් පයියෙහි රැක තුබු සිරිය ගෙණ තමාගේ ඉස කපා ඇතුපිට
තබා සිරිය කොපුවෙහි බැහීය. මහසේනා තොමෝ උද්ඝෝෂණය
113 කෙළේ ය. එකල ඒ මහා ඇමති තෙමේ ද ගොස් ස්වකීය පරාජය කියා

Non-Commercial Distribution

රජහු ඉස් සිඳුම්හි කී හස්ත බිසවට දන්වා ඒ බිසව් සස්න පැවිදිව අටුවා
114 සහිත විජම්පෙළ නිම වූ කල ධර්මාසනයෙන් බැස මිහිපිටුහි හිඳ ගෙණ
"එව රජහු මළ සැටි දක්ව"යි මෙහෙයන ලදුයේ ඒ බිසෝ මෙහෙණි
115 ඉදිරියෙහි හිඳගෙණ තමා හිස සිඳ සිරිය කොපුවෙහි ලා "මෙසේ" දේව
116 තෙමේ මෙළේය" කියා. බිසෝ මෙහෙණි ඒ දැක දැඩි සොවින් ළය පලා
117 ගෙණ මළා.

118 මෙසේ පස් මසකින් ඒ දෙවුතිස් රජ දෙව්ලෝ ගියේ ය.

මෙසේ දිනූ යුද්ධ ඇති (ඒ සිරිසඟබෝ) රජ තෙමේ සතුරන් මැඩ
119 රජය පියව් කොට අනුරාධපුරයෙහි වෙසෙමින් උපරජු නමින් තමා
120 විසින් කරවන ලද මහල්ලකාරාජ නම් පදන්ගෙහි නායක තෙරුන්ට
121 හංකාරය, සමුගම යන ගම් දෙක හා කේගෙල්ල රාජභාගයද සියලු
122 පිරිවර ද යන මේ සියල්ල දින. එසේම ජේතවනයට මාමිණියාගම දින.
මයෙන් කසුප් අවස සල්ගමින් පිදී. සෑ ගිරියට ඇඹුල්පදර දින.
123 පොළොන්නරුවෙහි මහපන්දිව (මහාපානාදිදීපකං) කෙළේය. උහුගේ
ඇමැත්තෝ මාණ නම් යුව රජු අන්තඃපුරයෙහි අපරාධ කළ හෙයින්
124 සම මෛත්‍රි දානය කොටත් මැරූහ. ඉක්බිති ඒ රජ තෙමේ තමන්
කිස්දොවුන් මල් කසුප් කුමරු පරම්පරා රක්නේ යුවරජ තනතුරෙහි
අභිසේක කරවිය.

දළසිව් තෙමේ මාණ නම් යුවරජු මරණ අසා දෙමළ සෙන්
125 ගෙණ සියඹලාගමුවට ආයඃ රජ තෙමේ උහු එන්නා දැක සෙන් සමග
ගොස් යුද කෙරෙමින් දොළොස් වන අවුරුදුයෙහි දඹදිව් පැළෑ. හේ
126 තෙමේ සියල්ල හැර යමින් තමා හඳුන්වනු පිණිස ඒකාවැල ගෙණ
127 හුදෙකලාව නික්මිණ. මේ තෙමේ ඒකාවැල නැතිවම විධිවූ පරිද්දෙන්
රජව දාඨොපතිස්ස යයි මිහිතල පතළ විය සිරිසඟබෝ රජ තෙමේ ලද
128 අවකාස ඇතිව යුද කොට රජ ගත. මෙසේ ඔව්හු දෙදෙනා අතරතුර
උනුන් පැල වූහ. දෙරජුන් මෙබඳු යුදයෙන් පෙළුණු සියලු ලෝවැසි
129 තෙමේ උපද්‍රැත විය. ධන ධාන්‍යයෙන් ද පිරි හිණ. ඒ දාඨොපතිස්ස
130 රජ තෙමේ පූර්ව රජුන් සතු සියල්ල නැසී ය. තුන්නිකාහි ද දාගෙවල් ද
131 සාර ගත. රන්පිළිම බිඳ රන් ගත්තේය. රන්මාලාදි සියලු පූජාභාණ්ඩ
132 බැහැර කෙළේය. එසේම ථූපාරාමයෙහි රන් කොත ගත්තේ ය. (මහ)
133 සෑයෙහි මාහැඟි රත්නයෙන් ආකීර්ණ වූ ඡත්‍රය ද බින්දේය. මහා පාළි
නම් බත් හල ඔරු දෙමළුන්ට දින. ඒ දෙමළු ධාතුගෙය හා රජ ගෙවල්
ගිනිලූ හ. පසුව විපිළිසර වූ හේ තෙමේ තමා පව් දෙස්නට භෝග
134 සහිත පලාවතු වෙහෙර කරවී ය. රුවන් දළෑයි ජනයා කෙරෙහි ප්‍රසිද්ධ
135 උහු බැන තෙමේ ද මහ ඇපා වී පොහොසත් වූයේ උහුට උපස්ථාන
136 කෙළේ ය.

Non-Commercial Distribution

137 යුද්ධ බලයෙන් අක්බෝ රජ රජයට පැමිණි කල උහු මල් කසුප්
යුව රජ තමා බලසෙන් රක්නට ථූපාරාමයෙහි දාගැබ ලාහෙලා බිඳ දෙ
වන පැතිස් රජු හා සුළු අක්බෝ රජු ඇතුළු වූ පූර්ව රජුන් විසින් පුදන
ලද සාර වස්තු පැණ නැති මේ තෙමේ දුර්නීතික පාපයෙන් පෙරටුකොට
138 ගෙණ පැහැර ගත. දකුණු විහාරයෙහි සෑය බිඳ ධනසාරය පැහැර ගත.
139 මෙසේ අනික් දාගැබ් ද බිඳවී. දුර්නිතිකයන් පෙරටු කොට ගෙණ
140 මෙසේ කරණ උහු වළකන්ට රජ තෙමේ පොහොසත් නො වී. අඥෝමය,
පව්ටුහු දූර්ායෂියෝ වෙති. උහු වළකන්ට නො පොහොසත් ඒ රජ
141 තෙමේ ථූපාරාමයෙහි එම යුවරජු විසින් බුන්සෑය දහසකින් කරවා
142 පෙළහර කෙළේ යි.

143 එකල දාඨෝපතිස්ස රජු විසින් අක්බෝ හෝ සිරිසඟබෝ රජ
පරාජයට පමුණුවන ලද්දේ බලවාහන සරසන්ට රුහුණු ගියේ ය. එහි
විසූයේ ව්‍යාධියකින් පහරණ ලදුව සොළොස්වන වස්හි මෙළේය. එකල
144 උහු කිස්දොවුන් මල් කසුබ් යුව රජ තෙමේ දාඨෝපතිස්ස රජු දඹදිව්
145 පලවා ලක්දිව එක්සත් කෙළේය. ඔවුනු නො පැලැන්දේ ය. මේ
තෙමේ සත්පුරුෂ සමාගමයෙන් විපිළිසරව "කළ පාප කර්‍මයාගේ
146 නාසනය කරණෙමැ" යි සිතා මල් වතු, පොල්වතු, හා වැව් ද කරවී.
මහ සෑ තුණ මහා පූජායෙන් සත්කාර කෙළේ ය. ථූපාරාමය ද පුදා ඊට
147 එක් ගමකුදු දින, සියලු ආරණ්‍යක භික්ෂූන් ලවා දහම් දෙස් වී ය.
148 මිරිසවැටියෙහි ඉතා තර පහයක් කොට නාහල වැසි මහ තෙරහු එහි
149 වැස් විය. එහි වසනා උන් වහන්සේට සිවුපසයෙන් උවටන් කෙරෙමින්
150 අටුවා සහිත විජම්පෙළ කියවී. නාහල් අවස කරවා උන්වහන්සේටම
දිනි. මානිටුලා ගම ද පසය පිණිස උන්වහන්සේටම දිනි. ඉක්බිති ඒ
151 දාඨෝපතිස්ස රජ තෙමේ දඹදිවින් මහ බලසෙන් ගෙණ මෙහි ආයේ
152 යුද කෙරෙමින් මොනවට සරසන ලද බලවාහන ඇති ඒ කසුප් රජු
153 විසින් පහරණ ලද්දේ මෙළේ ය. මොහුගේ රජබැව් වූ කලී දොළොස්
අවුරුද්දක් විය. ඒ දාඨොපතිස්ස රජහට සමාන නම් ඇති බෑන කෙනෙක්
154 මහා යුද්ධයෙහිදී උහු කෙරෙන් බිය වැද දඹදිව් පැලහ. ඒ කාන්තයෙන්
155 සියලු සම්පත් මෙසේ ම අනිත්‍යයහ, ඉතා දුල්භ ද වෙති, ක්‍ෂණයෙක්හිම
භොබනා හ, එහෙයින් (තම හට) වැඩ කැමැත්තේ මෙහි ඇල්ම බැහැරලා
ධර්‍මාභිමුඛ වන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
ජරාජාක නම් දෙ සාළිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# හතලිස් තුන් වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති දිනන ලද සංග්‍රාම ඇති පිරූ ආසය ඇති කසුබ් රජ
තෙමේ මහා පාළි නම් බත්හල සඟනට භෝජනය සමෘධ කෙළේ ය.
එම රජ තෙමේ නාහල් වැසි මහාධම්කථික තෙරනුවන් මහ පුදයෙන්
2 පුදා උන්වහන්සේ ලවා බණ දෙස් වී. බෑයා අවස වසන කටන්ධකාර
3 වැසි තෙරුන් සඳහා සංග්‍රහ සහිත සියලු පෙළ ලියවී ය. ජිණි
4 ප්‍රතිසංස්කරණ කෙළේ ය. සෑයෙහි නවහම් ද කරවී ය. ඒ ඒ තැන
5 නොයෙක් සඟ අය පැවැත් වී, නන්මිණියෙන් චොරජනා සිළුමිණි තුණ
කරවී. පඬුපලාසයන් සියයක් වස්ත්‍ර දානයෙන් පිණ වී.

උහු බොහෝ දරුවෝ වූහ. උන්ගේ දෙටු තෙමේ මාණක නම්
6 ඒ සියල්ලෝ යොවුන් වයසට නොපැමිණියහ. බාලයහ. ඒ හෙයින් ම
7 මුහු කළ නුවණ තැත්තාහ. පසුව ඒ රජ තෙමේ අසාධ්‍ය කිසි රෝගයකින්
වළඳනා ලද්දේ මා පුතු සියල්ලෝ ළදරුවෝ ය. මොව්හු රාජ්‍යක්‍ෂ ම
8 නො වෙතැ"යි රුහුණු රට වසන මහ නුවණැති බෑණනුවන් කැඳවා
තමා පුතුන් හා සියලු රජය පාවා දින. ගඳ මල් ආදි පුදයෙන් චෛත්‍යයන්
පුදා සිව් පසය දි භික්‍ෂු සංඝයා ක්‍ෂමා කර වී ය. ඒ කසුප් රජ තෙමේ
9 මෙසේ සුචරිතයෙහි ද, මිත්‍රාමාත්‍ය ජනයා කෙරෙහි ද දූහැමි හැසිර නව
10 හවුරුද්දකින් කම් වූ පරිදි පරලොව ගියේය.

11 ඒ මාණ තෙමේ මයිල් රජ හට කටයුතු වූ කිස ගෞරව සහිත
කොට නිමවා ජනයා සංග්‍රහ කොට ගෙණ දෙමළුන් බැහැර ලී ය.
12 දෙමළුන් එක්ව "මොහු බැහැර ලමු ය"යි උහු බැහැරව සිටි කල තුමු
13 නුවර ගත්හ. දඹදිව්හි ගිය හස්තදාඨ කුමරහට "රජය ගැන්ම සඳහා
14 ඔබගේ ඒමට කලැ"යි හසුන් යැවූ හ. මාණ තෙමේ ද පියා පිණිස
රුහුණට වහා හසුන් යැවී ය. පිය තෙමේ ඒ අසා නොබෝ කලකින්
15 රුහුණින් ආ ය. ඔහු දෙදෙනා මන්ත්‍රණය කොට දෙමළුන් උනුන් හා
බිඳු වූහ. ඉක්බිති ඔව්හු සියල්ලෝම සම පැවතුම් වූහ. එකල මාන
16 කුමර තෙමේ පියාණන් රාජ්‍යයෙහි අභිෂේක කෙළේ ය. අභිෂේක ලත්
17 ඒ රජ තෙමේ (තුන්) නිකායට තුන් දහසක් දිනි. සංඝයා ද රට ද සංග්‍රහ
කොට රජකුලෙහි තුබූ සියලු බඩු සතුරන්ගෙන් රකිනු සඳහා රුහුණු
18 යැවී ය. හත්ථදාඨ තෙමේ ද දෙමළුන් හස්න අසා දෙමළ බලසෙන්
ගෙණ ක්ෂණයෙන් මෙ දිව් ආය. එකල ඒ දෙමළු සියල්ලෝ පරිභූතව
19 මෙහි සිටියෝ ගොස් මගදී ම එන උහු පිරිවැරූ හ. මාණ තෙමේ ද
20 සියලු එපවත් අසා "යුද්දයට මේ නොකලැ"යි සාර ධන සහිත පියහු
21 රුහුණු යවා තෙමේ නැගෙණහිරි රටට ගොස් ජනයා සංග්‍රහ කෙරෙමින්

Non-Commercial Distribution

22 විසී ය. ඒ දාඨෝපතිස්ස තෙමේ දෙමළ පක්ෂය ලදින් රජ නුවර ගෙණ
23 දාඨෝපතිස්ස රජැ යි තමා නම ඇස් වී. ලෝ වැසි තෙමේ මයිල්හු
සෙයින් එම නමින් උහු ව්‍යවහාර කෙලේ ය. (ඒ තෙමේ) පියහු
24 බූහුනනියන් පිත් අක්බෝ නම් කුමරු ගෙන්වා යුව රජ තනතුරෙහි
25 තබා දකුණු රටත් දින. තමා ඇසුරු කළවුන්ට සුදුසු පරිද්දෙන් තනතුරුද
දින, සස්නට හා ලොවට කටයුතු සියල්ලන් කෙළේ ය. මහා පාළියෙහි
26 පිළි සහිත දීබත් හා කිරි ද, කිරිබත් ද දිනි, බණ ඇසී, පෙහෙවස් විසී,
සියලු පුද කරවමින් දහම් දෙසවමින් මේ ඈ පිනින් තමා යහපත්ව
කෙළේ ය.

27 කසුබ් වෙහෙරට සේනාගම දී පදන්නේ හිමියන්ට මහ ගල (වැව)
දින. මොනර පිරිවෙණට කසගම දින. ථූපාරාමයට පුණ්ණොළිය දී
28 සෑයට සත්කාර කෙළේ ය. හේ තෙමේ අභයගිරි විහාරයෙහි කපුරු
පිරිවෙණ කරවී. තිපුතුල් නම් විහාරය කරවා ඒ වෙහෙරට දෙවී. උහු ඒ
29 වෙහෙර කරණ කල ථේරවාදික භික්ෂූහු තමන් සීමාව ඇතුළතැ යි
30 වැළකූ හ. ඔවුන් ප්‍රතිබාහරණය කොට බලාත්කාරයෙන් එහි ම කරවී.
ඉක්බිති ඒ ථේරිය භික්ෂූහු රජ කෙරෙහි නොසතුටු සිත් ඇත්තෝ උහු
31 සැදෑහැ නැති කොට සිතා ගෙණ පත්තනික්කුජ්ජනකම් කළහ. ඒ
32 බුදුන් විසින් "යම් උපාසකයෙක් සැදෑහැ නැත්තේ නම් භික්ෂූන්ට අලාභ
33 පිණිස උත්සාහ කෙරේ නම් හෝ එසේ ම ඔවුන්ට ආක්‍රොශ කෙරේ
34 නම් හෝ ඔහුට පත්තනික්කුජ්ජය කටයුතුය යි වදාරණ ලද"යි සිතා
පසුව ඒ භික්ෂූහු උහුට ඒ කර්මය කළහ. ලෝ වැසි තෙමේ අනික්
35 පරිද්දකින් සිතී. "භික්ෂූ තෙමේ භික්ෂා පිණිස උඩුකුරු කළ පාත්‍රය
ගෙණ හැසිරෙමින් උහුගේ ගෙදොර දී මුනින් නමන්නේ ය"යි කතිකා
කළහ. එසමයෙහි ඒ රජ තෙමේ මහා ව්‍යාධිකයකින් පහරණ ලද්දේ
නව වන හවුරුදුයෙවහි ජීවිතක්ෂයට පැමිණියේ ය.

36 ඉක්බිති දප්පුල රජ තෙමේ සිය රුහුණු ගියේ පින් රැස් කෙරෙමින්
37 එහි ම වාසය කෙළේ යි. මෙතැන් පටන් උහුගේ වංශය නිරවුල් කොට
කියමු. ඒ මෙහි ම කියන කල නිරවුල් වේ. ඔකාවස් කුලෙහි උපන්
38 මහා තිස්ස යන නමින් ප්‍රසිද්ධ වූ මහ පින් ඇති සමාකීර්ණ ගුණ ඇතියෙක්
39 විය. රුහුණු රට හිමිහුගේ දූ වූ පසස්නා පින් ගුණ ඇති සංඝසිවාය යි
ප්‍රසිද්ධ කුමරියක් උහු භාර්‍යා වූවා. ඇයට පුත්තු තුන් දෙනෙක් වූහ.
40 ප්‍රථමයා අග්බෝ නම්, දෙවැන්නා දප්පුළ නම් තෙවැන්නා මිණි අක්

* දළ මුගලන් රජු මැරූ අසිග්‍රාහක සලමෙවන් ඒ රජ තෙමේ සිලාමේඝ සිලාදාඨ නොවේ ය.

Non-Commercial Distribution

නම් ඇයගේ එක් දුවක් ද වූවා. ඕ තොමෝ රජුට පැමිණියා. දෙටු
41 කුමර තෙමේ රුහුණු රට තමා වසඟ කෙළේ ය. මහා ධන ඇති ඒ
42 තෙමේ මාගම්හි මහාපාළි නම් බත්හල කර වීය. එහි ම දළ අක්බෝ
43 නම් පිරිවෙණ ද කර වී. කණගම්හි අන්ධයන්ටත් ගිලනුන්ටත් ශාලා
කර වී ය. සප්‍රාඥා ඒ තෙමේ පිළිම නම් වෙහෙර මහත් පිළිම ගෙයක්
44 කොට එහි සෙල්මුවා මහත් නම් බුදු රුවක් ද ඉදුහයෙන් මැව්වාක් බඳු
45 කොට පිහිට විය. තමා නම් ඇති සාලවාණ විහාරය ද පිරිවෙන්
46 වෙහෙර ද එසේ ම කතරගම ද කරවී. මේ තෙමේ දෙමහල් වෙහෙර
47 නවකම් කරවා එහි පරණ වැසිකිළි නුවණැත්තේ තෙමේ ම ශුද්ධ කෙළේ
48 ය. පහන් හේ තෙමේ බික්සඟහු ඉඳුල් බොජුන් වළඳා මඩ නම් ගම
සඟනට දින. උහු මේ හැර තවත් පින්කම් කොට දෙව් ලෝ ගිය කල
උහු මල් සාමිදප්පුල නම් කුමර තෙමේ එහි (ඉසුරු) විය.

49 ඒ තෙමේ එහි සතුරන් මැඩ ඉසුරු පැවැත්විය. මහ දන් පැවැත්වී
ය. රුහුණු ද නිභීය කෙළේ ය. උහුට තුටු ජන තෙමේ "මේ තෙමේ
50 අපගේ මහා ස්වාමියා" යි කීය. එතැන් පටන් ලෝ වැසි තෙමේ "උහු
51 මාහිමිය" යි ව්‍යවහාර කෙළේ ය. සීලාදාඨ නරෙන්ද්‍ර තෙමේ එපවත්
අසා උහුට සතුටු වූයේ බොහෝ ධන හා තමා දියණියන් දින. රාජ
52 යෝග්‍යමත් කරන්ට යුව රජ තනතුර ද දින. උහුගේ දරු වූ මාණවම්මාදී
53 හු මහත් යසස් ඇත්තෝ වූහ. පාණ දිවයින් වැසී මහ තෙරුන් වෙත
බණ අසා උන්වහන්සේ කෙරෙහි පැහැද උන්වහන්සේට බුහුමන් කරුණු
54 පිණිස රුහුණ වෙහෙරක් කොට උන්වහන්සේ දින. තෙරණුවෝ ඒ
වෙහෙර චතුර්දිශික සංඝයාගේ පරිභෝග පිණිස දුන්හ. අඹ මල් වෙහෙර
55 ආදී බොහෝ වෙහෙර කරවී. කිහිරැලි වෙහෙර කොට දෙවියන් පිදී
56 මහ පැණ ඇති ඒ යුව රජ අනුරාරම් පහය ඉතා දිරා ගියා. එලෙන මුතු
ලැල් ඇති කොට (නවකම් කරවී) එසේම සිරිවඩ පහය අන්‍ය වූ තක්
ඇඹුල යන මේ ශුද්ධ කරවා සියලු පසය දීමෙන් පණවා එහි දෙතිස්
57 භික්ෂු කෙණෙකුන් වැස් වී. කෙවුල් ගැඹුර නම් ගම නා වෙහෙරට
දින. එසේ ම රජ වෙහෙරට ගොන්ගම දින. තිස් වෙහෙරට තන්තික
58 පච්ච දින. එසේ ම ඒ යුවරජ සිතුල් පච්ච ගොන්නවිටිගම දින. එහි
59 ම ඉතා යුවරජ අරියාකර විහාරයට මල් වතු නම් ගම දින. එම් ම ඉතා
60 සිත්කලු පිළිම ගෙයක් කෙළේ යි. එහි සිටිපිළිමයෙහි මා හැඟි
61 ඌණීරෝමය කෙළේ යි. හේ තෙමේ රන් පට කරවී. සියලු පූජා
විධානය ද කෙළේ යි. චෛත්‍ය බොහෝ සේ දිරූ කල හේ තෙමේ
62 සුණුයමින් රැඳවී. තව ද අන්‍ය වූ පසළොස් රියන් මෙතේ බුදුරුව
63 කරවී. ඒ යුවරජ තෙමේ මේ ආදී අපමණ පින් තෙමේත් මනා කොට
64 කළේ ය. පිරිවර ලවාත් කරවී. උහු පිරිවැරූ බොහෝ පින්කරු

Non-Commercial Distribution

65 මිනිස්සු වූහ. උන් විසින් පස ඇති ව කරවන ලද නොයෙක් විහාරයෝ
ද වූහ.

66 කිසි කලෙක ඒ යුව රජ (සිය රට) ඇවිදිනේ ගම් නැති අරණෙක්හි
67 සේනා සංවිධාන කොට රෑ වාසය කෙළේ ය. හේ තෙමේ මොනවට
නැම් විලවුන් ගැණිම් කොට සැප ආහාර ගෙන සිත්කලු ගෙයක සුව
68 යහනෙක හොත්තේ නිදන්ට වන. එකල නිදි නො ලබන්නේ කරුණු
69 කිමැ යි දහවල් තමා සියලු පැවතුම් මෙනෙහි කරමින් ඇතුළත කිසි
70 කරුණක් නො දැක බැහැර කිසි කරුනක් උව මැනව යි මෙසේ සිතා
71 ඒ සොයන්ට මිනිසුන් යෙදී ය. මෙසේ "ඒකාන්තයෙන් මාගේ ආයසීයෝ
72 රාත්‍රියෙහි තෙමෙමින් රුක් මූලෙක ඉන්නාහ. උන්වහන්සේලා
73 ගෙනෙවයි කීය. ඒ මෙහෙයන ලද මිනිස්සු පහන් ගත් අත් ඇතිව
74 ගොස් සොයමින් මැගමින් ආ රුක් මූලෙක උන් භික්ෂූන් (දැක) එකල
75 ගොස් ඒ අසුන් රජහට දැන් වූහ. ඒ රජ තෙමේ (වෙතට) දිවී ය. ඒ
76 භික්ෂූන්ට තිති දත් පිණිස තබන ලද රැඳු සිව්රු උන්වහන්සේලාට දී
තෙත් සිවුරු ඇරගෙන වියළා පා දෙවුන් ආදිය කොට මොනවට අතුල
77 ඇඳ ඒ සියලු භික්ෂූන් වඩා හිඳුනා බෙහෙත් පිළියෙළ කොට තෙමේ ම
පිළි ගන්වා පෙරවරුද කටයුතු භෝජනාදිය කරවා කැපකරුවන් දී
78 ඉක්බිති" රුචි පරිද්දෙන් යැවී ය. කුශල ක්‍රියාවෙහි ම ඇලුනා වූ ඒ රජහු
දවස් මෙසේ පසුවිය. මෙසේ පුණ්‍යපරායනව ඒ නරේශ්‍රේෂ්ඨයා සියලු
79 රට දනව් පින්කම්හි යොදනා වසන කල මාණ කුමර නැගෙණහිර රට
80 වෙසෙමින් බලසෙන් එක් කොට ගෙණ පියහු සේනාව හා වස්තු වත්
ගෙන්වා ගෙණ යුද කරණු පිණිස තිපුවුල්ල නම් ගමට ගියේ ය.
දාඨෝපතිස්ස රජ එ පවත් අසා සහ බලසෙන් ඇතිව තඹල ගමට
ගියේ ය. එහි උනුනුන් එක්ව මහ යුද කළහ. දාඨෝප තිස්ස රජහුගේ
යෝධයෝ අවයව සහිත මාණ කුමරු මැරූ හ. ඒ පවත් අසා ඒ දප්පුල
තෙමේ ද සෝක නැමැති යහුලින් පහරණ ලද්දේ මෙළේ යි. මෙ
81 තෙමේ අනුරාධපුර සත් දවසක් වෙසෙමින් රජකම් කෙළේය. රුහුණ
තුන් අවුරුද්දක් රජකම් කළේ ය. එහෙයින් උහුගේ කථා තොමෝ
82 මෙහි ද රුහුණ ද වී. මෙසේ අකාල සතුරන් මරා දූකසේ අයින් ලද්දා
වූ සම්පත්හු ක්ෂණයෙහි විදුලිසේ වූහ නුවණැති කවරෙක් එහි ඇල්ම
කරන්නේ ද?

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
චතුරාජක නම් තෙසාළිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# හතලිස් හතර වෙනි පරිච්ඡේදය

1 හත්ථදාඨ නම් රජහුගේ ඇවෑමෙහි රජහු බාල සොහොවුරු වූ
2 අග්බෝ කුමර තෙම සිරිසඟබෝ නම් ඇතිවැ (රජ) විය. මේ තෙමෙ
සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත ධාර්මික රජෙක් වි ය. එ හෙයින් හෙතෙම
3 පමණ නො කළ හැක්කා වූ පින්කම් පැවැත් විය. තුන් නිකාය වාසි
(භික්ෂූන් ගේ) භෝජන සාලාවන් ප්‍රත්‍යය දීමෙන් බැලී, මහාපාළී නම්
4 දන්හල ද වැඩී ය. සතුන් නො නසන පිණිස ආඥාවක් ද කරවී.
5 ආලය රහිතවැ සුදුසු පරිද්දෙන් තනතුරු ද දෙවී. සිප් ගොස් ආදියෙන්
යෝග්‍ය ජනයන්ට සංග්‍රහයෙන් සංග්‍රහ ද කෙළේ ය. මහ පැණැති ඒ
තෙමේ යම් කිසි තැනකදී ත් භික්ෂූන් දක උන්වහන්සේලාට සත්කාර
6 කොට ශාසනයට අන්තභීත වූ පිරිත් කිය වී. ඒ (රජ) තෙම නාගසාල
7 (විහාර ) වාසී වූ දාඨාශීල නම් වු මහ පැණැති සිල්වත් බහුශ්‍රැත වූ
තෙරුන් කරා එළැඹැ උන් වහන්සේට සත්කාර කොට උන් වහන්සේ
8 කෙරෙන් සම්මා සම්බුදුන් දහම් අසා සියලු සෙත් කරන්නේ ය යි
ධම්මයෙහි අතිශයින් පැහැද පාපි වූ දුෂ්ට සිත් ඇත්තා වූ පුරාණ සිය
9 නෑයන් විසින් ථේරිය වාද යන නම් ඇත්තා වු (මහ විහාර වාසී වූ)
භික්ෂූන්ට කරණ ලද අප කාරයන් අසා බොහෝ වූ දිරා ගිය වෙහෙර
ද පිරිවෙන් ද ප්‍රකෘතිමත් කෙළේ ය. ඒ ඒ තන්හි බොහෝ අය උපදනා
ගම් ද දෙවී.

එකල ශූන්‍ය වූ ප්‍රත්‍යයන් ද අතිශයින් දළු ලෑ සේ ඇති කෙළේ
10 ය. සංඝයා ගේ දාසයන් ද නියම තන්හි තැබී ය. මේ (දාඨාසීව නම්)
11 තෙරුන් වහන්සේට තමන් නම් ඇත්තා වූ ප්‍රධාන ගෙයක් කර වී. මහ
12 පැණැති ඒ තෙර තෙමේ ද එය පිළිගෙණ සඟහට දින. ඒ ගෙට
13 ශාරතතල නම් වූ ද, කිහිම්බිල නම් වූ ද කතක නම් වූ ද, තුලාධාර
14 නම්වූ ද, අන්ධකාර නම් වූ ද, අනතුරෙලි නම් වූ බාලව නම් වූ ද, වාර
15 නායක නම් වූ ද, මහා තික්කඞ්ඩික නම් වූ ද භෝග උපදනා ගම්
16 17 දුන්නේ ය. එසේ ම පෙළහාල නම් අතික් ගමක් ද දින. ඒ රජ තෙම
මෙකියන ලද ගම් ද, අනිකුත් භෝග උපදනා ගම් ද දී තමන්ගේ නෑවු
ආරාමිකයන් ද දුන්නේ ය. එසේම නිකාය දෙක්හි ප්‍රත්‍යය බඳ වූ
18 විහාරයන් දක ද අසා ද බොහෝ වූ භෝග උපදනා ගම් දින බොහෝ
කීමෙන් කවර ප්‍රයෝජන ද? තුන් නිකායට ම බොහෝ ප්‍රත්‍ය උපදනා
ගම් දහසක් නිරවුල් කොට දුන්නේ ය. තුනුරුවන් ගේ උතුම් ගුණ
මෙනෙහි කරන්නා වූ ඒ (රජ) තෙම ඒකා වැල ගෙණ අක්ෂර මාලා
(රජ) තෙම ධර්මයෙහි ඇලුනේ විය. උහුට අනු හික්මෙන්නා වූ සියලු
මිනිස්සු දහම් පිළිවෙත් කරන්නෝ වූහ.

Non-Commercial Distribution

19 එ කල්හි ඒ රජහු ගේ කම්කර වූ පොත්ථකුථ නම් දෙමළ තෙම
මාටම්බිය නම් වූ අද්භූත වූ ප්‍රධාන ගෙයක් කරවී. බූකකල්ල නම් ගම
20 අඹ වැව ද තන්තවායිකවාටික නම් ගම ද නිධීලවිට්ඨි නම් ගම ද ඒ
තෙමේ දාසයන්සහිත කොට උහුට දින. කපුරු පිරිවෙන්හි ද එසේම
21 කුරුන්දපිල්ල නම් පිරිවෙන්හි ද මහ රජ ගෙයි ද ප්‍රාසාදයෙන් ඒ තෙමේ
22 ම කවි. මහත් වූ ධන ඇති හෙතෙම අන්‍ය ස්ථානයන්හි විහාර විෂයෙහි
ගම් තුනක් දින. පොත්ථසාත නම් වූ ප්‍රඥා ඇත්තා වූ සේනාපති තෙම
ජේතවන විහාරයෙහි රජහු ගේ නමැත්තා වූ පිරිවෙන නිම වි. මහාකන්ද
24 නම් දෙමළ තෙමේ ද තමන් නම් ඇත්තා වූ පිරිවෙණක් (කරවූයේ ය.)
25 එසේ ම එක් පුරුෂයෙක් තෙම චුල්ලපන්ථ නම් පිරිවෙණක් කර වී.
රජහු ගේ සංඝතිස්ස නම් ඒ උපරජ තෙමේ ද සෙහාල උපරාජ නම්
26 පිරිවෙණක් කර වි ය. අන්‍යයෝ මේ ආදි ඉතා බොහෝ වූ විහාර කරවූ
හ. ඒ රජ හට අනුව පවත්නා වූ සත්ත්වයෝ මෙසේ ධාර්මික වූ හ. යම්
27 ප්‍රධානයෙක් තෙම යම් පාපයක් හෝ පිණක් හෝ කෙරේ ද ලෝකයා
ඒ ඒ දෙය කරන්නේ ම ය, එය පණ්ඩිත තෙමේ දන්නේ ය. ඒ රජහු
28 ගේ ජෙට්ඨා නම් මහ පිණැති මෙහෙසි තොමෝ ජෙට්ඨාරාම නම් වූ
29 මෙහෙණි අසපුවක් කර වී ය. ඒ ආරාමයට පත්තපාසාණ නම් භූමියෙහි
වූ ගම් දෙකක් ද ඒ බඳ බෙල් නම් ගම් ද එසේ ම ආරාමිකයන් සියයක්
ද දුන්නී ය. මහත් වූ ධන ඇත්තා වූ මලය රජ තෙමේ ද මඬලගිරි නම්
30 විහාරයෙහි චෛත්‍යයට අයිති වූ මහරු වූ දාගෙයක් කර වි. හේ
තෙමේම ලෝවාමහාපායෙහි මෑ කුළු ගෙය සෙවෙනි කරවී. මහා
31 යසස් ඇත්තා වූ බෝධිතිස්ස තෙමේ ද බෝදිතිස්ස නම් විහාරයක්
කරවී ය. ලංකාද්වීපයෙහි මණ්ඩලාධිපති[1] වූ විහාරයන් ද පිරිවෙන් ද
32 කර වූ හ. ඒ රජහු ගේ කාලය තෙම පින්කමින් නිපන් සේ විය. අති
විස්තරයට හයින් සර්වප්‍රකාරයෙන් නො විචාරණ ලද්දේ ය. යම් සේ
33 හේතූන් ගේ ප්‍රධාන සලකුණ කියන ලද්දේ ද (එහෙයින්) පූර්ව වූ කථා
මාර්ගය ද අවුල් සේ මට වැටහේ. යළි අන්‍ය වූ කාලයෙක් පොළොන්නරු
34 ගොස් පින් රැස් කෙරෙමින් එහි ම වාසය කෙළේ. අසාධ්‍ය වූ රෝගයකින්
35 ස්පර්ශ කරණ ලද්දේ තමන් ගේ දිවි අවසාන කල් බැව් දැක මහජනයා
කැඳවා ධර්මයෙන් අවවාද කොට තෙමේ මරුමුවට පත් විය. උහුමළ
කල්හි මහජන තෙමේ දැඩි සෝක ඇතිව අඬා උහුගේ ආදාහනයෙහි
36 කටයුතු සියල්ල නිරවශේෂ වශයෙන් කොට උහුගේ ආදාහනයේ අළු ද
තමන්ට බෙහෙත් කොට, ඒ සියලු රාජ භාණ්ඩය ද සියලු සේනා වාහන
37 ද ගරු කොට ගෙණ සුරැකිව තබා නුවරට පැමිණියේ ය. මෙසේ
38 සොළොස් වෙනි වර්ෂයෙහි (අග්‍රබෝධි නම් හෝ ශ්‍රී සංඝබෝධි) රජ
39 තෙම දෙව්ලෝ පැමිණියේ ය.

1 මණ්ඩලාධිපතියෝ නම් ඒ දනව් නායක දිසාපතිහු යි.

Non-Commercial Distribution

පොත්ථකුට්ඨ නම් දෙමළ තෙමේ ද උහුගේ රාජ්‍යය විචාරණය
40 කෙළේ ය. දාඨාසීව නම් වූ උපරජ අල්වා ගෙණ සිර ගෙහි ලැවී ය.
මනා කොට කරණ ලද රැක වරණ අණ කෙළේ ය. රජෙකුගෙන් වෙන්
41 ව රාජ්‍යය භුක්ති විඳින්ට නොහැකි යයි සිතා දනපිටියේ ප්‍රධානත්වය
42 ඇත්තා වූ රාජ වංශයෙහි උපන් දත්ත නම් පුරුෂයෙකු ගෙණවුත් උහු
රාජ්‍යයෙහි අභිෂේක කොට උහුගේ නම තබා තමන් සියල්ල විචාරණ
43 ය කෙළේ ය. ඒ දනපිටියේ දත්ත නම් රජ තෙම තමන්ගේ නම් ඇත්තා
වූ විහාරයක් කරවා අනිකුදු පින් රැස් කෙළේ ය.

44 ඒ (දත්ත නම් රජ) තෙමෙ සම දෙවසක් ම සිට මෙළේ ය. උහු
45 මළ කල්හි පොත්ථකුඨ (නම් දෙමළ) තෙම නැවත හුණන්නරුවෙහි
උපන්නා වූ අනිකුදු හත්ථදාඨ නම් කුමරකු ගෙන්වා උහු ද රාජ්‍යයෙහි
46 අභිෂේක කොට තෙමේ පෙර පරිද්දෙන් ම වාසය කෙළේ ය.
කාලදීඝාවික නම් වූ ප්‍රධාන ගෙයක් කොට එසේ ම අනිකුත් පින්
(කොට) ශෙතෙමේ ද සමසකින් මරහු වසඟවී ය.

මෙසේ බොහෝ උපද්‍රව ඇත්තා වූ ධනයක් ද, ධාන්‍යයන් ද,
47 වාහනයන් ද දන ප්‍රඥා සහිත පුද්ගලයෝ රාජ්‍යයන් කෙරෙහි ඇල්ම
සැර මනෝඥ වූ පුණ්‍යයෙහි ඇලුනෝ වෙත්වා. මෙතෙකින් හුදි ජනයා
ප්‍රසාද සංවේග පිණිස කළ මහවස තිරාජක නම් වූ සූසාලිස් වෙනි
අදියර තිමි.

Non-Commercial Distribution

# හතලිස් පස් වෙනි පරිච්ඡේදය

1 ඒ (හත්ථදාඨ) රජහු ඇවෑමෙන් මාණවම්ම තෙම රජ වූයේ ය.
හෙතෙම කිනම් ගොත් ඇත්තේ ද කවරෙකුගේ පුත්‍රයෙක් හෝ වේද
කෙසේ රජයට පත් වී ද යත් ? මහා සම්මත වංශයෙහි උපන්නා වූ
2 ජාතුණයන්උසුලන්නා වූ ථූපාරාමය හෙද කළ වූ කාශ්‍යප නම් වූ රජහුගේ
3 පුත යි. ඒ රජහුගේ මෙහෙසි තොමෝ මලය රජු දියණිය වූ සංඝා නම්
4 වි ය. ඒ කුමරිය ලැබ උත්තර දේසයෙහි සැඟවුනා වූ පැවතුම් ඇතිව
වසන්නේ හත්ථදාඨ නම් රජහු විසින් ඒ බව නියම කොට දැන ගත්
5 කල්හි දඹදිවට පැමිණ නරසීහ නම් රජ කරා ගොස් ස්වකීය නාමය
6 කියා උහු ඇසුරු කරන්ට පටන් ගත්තේ ය. සියලු උපායෙන් (ඒ රජු)
සතුටු කෙළේ ය. ඔහු ගේ මිත්‍රතාව දැන තමන්ගේ බිරින්දත් ගෙණ
7 ගොස් රෑ දවල් ඒ (රජු) සේවනය කරමින් එහිම වාසය කෙළේය. කාවට්ටි
රට ඒ රජ තෙමේ ද උහු විසින් සතුටු කරණ ලද්දේ ඒ රජය සියල්ලම
පමුණුවන්නාක් මෙන් මහත් භෝග දෙවී ය.

8 සංඝා නම් දේවි තොමෝ ද මාණකුමරු සමග සංවාසයට පැමිණ
දූන් සතර දෙනෙකුන් හා පුතුන් සතර දෙනෙක් ද ප්‍රසව කළා ය. යළි
9 එක් දිනක් රජ තෙම මාණවම්ම කුමර එකතුව මගුලැත් කඳට නැගී
10 කැමැති පරිද්දෙන් හැසිරෙන්නේ එහි හිඳගෙනම පිපාසා ඇතිව කස
11 පැනක් බී ඒ අනිකෙකැයි සිතමින් මාණවම්ම හට දුන්නේ ය. ඒ
මාණවම්ම තෙම එය ගෙණ මේ රජ තෙමේ ද යහළු ය. පරමාත්ථයෙන්
12 සත්ත්වයන්ගේ කුමක් ඉඳුල් නම් වේදැයි සිතී, ඒ හෙයින් මා විසින්
පානය කටයුතුය යි සිතා එය පීයේ ය. දිනනු කැමැති වූ නුවණැත්තෝ
13 මෙසේ මහත් උත්සාහ ඇතිවෙත්. රජ තෙමේ ද ඒ දැක භය ඇති වූයේ
14 උහු බී අවශේෂ තෙමේ පානය කෙළේ ය. පින් වතුන්ගේ ක්‍රියා සැම
කල්හි එසේ වේ. එකල් පටන් තමන් භෝජනයෙහි ද, ශයනයෙහි ද,
පරිහරණයෙහි ද වාහනයෙහි ද සියවෙස්හි ම තැබී.

15 මෙසේ ඔවුන් වසන කල්හි වල්ලභ (රජ තෙම) නරසීහ (රජු) හා
සමග යුධ පිණිස උපාගත විය. නරසීහ තෙමෙ (මෙසේ) සිතී "මේ
16 තෙමේ වනාහි මා සෙවීමෙන් වංශයෙන් ආවා සිය රජය ලබන්නෙමියි
(සිතා) රෑ දවල් අනලස්ව සේවනය කරන්නේ ය. ඉදින් හෙතෙමේ ද
17 මා සමග ගොස් යුද කරමින් මරණ ප්‍රාප්ත වන්නේ නම් උහුගේ ද
මාගේ ද කල්පනා වූ ඒ සියල්ල නිෂ්ඵල වන්නේ ය" ඒ රජ තෙම
18 මෙසේ සිතා උහු තමන්ගේ පුරයෙහි නවත්තා තෙමේ වල්ලභ රජු හා
19 සමග යුද කරන්ට පටන් ගත්තේ ය. මාණවම්ම තෙමේ ද "ඉදින් මා

Non-Commercial Distribution

ජීවත් වන කල්හි මේ රජ තෙම යුදයෙහි මියයා ද මාගේ ජීවිතයෙහි
20 කුමන ඵලයක්ද"යි සිතී. "එසේ වූ කල්හි උහු හා සමග විශ්වාසය
නපුරු කොට කරණ ලද්දේ වන්නේ ය. (හෙතෙම) තමාට සමාන
භාවයෙන් මට කුමක් පිණිස සංග්‍රහ කෙළේ ද?"

21 එහෙයින් මා විසින් (උහු) සමග යුද මඬලට යා යුතු ය. උහු හා
සමගම ජීවත්වීම හෝ මරණය හෝ සැපම ය. මෙසේ සිතා සන්නද්ධ
22 කරණ ලද යෝධ ජනයා ඇත්තේ උතුම් ඇතුපිට දක් වී. ඒ නරසීහ
23 තෙමේ ද උහු දක තුටුපහටුව "අදෝමය, මා විසින් මොහු කෙරෙහි
කටයුතු වූ මිත්‍රභාවය කරණ ලද්දේ ය"යි විශ්වාස කෙළේ ය. ඉන්පසු
24 මාණවම්ම කුමරහුගේ සේනාව ද ඒ රජහුගේ සේනාව ද සමගිවැ වල්ලභ
25 නම් රජහුගේ සේනාව ද වැනසූ ය, මාණවම්ම තෙමේ ද මේ රමා
26 මඬනේ දෙවියන්ගේ යුදෙහි නාරායනයා සෙයින් එහි තමන්ගේ සූරභාවය
දක්වී. නරසීහ රජ තෙමේ ද මාණවම්ම කුමරුගේ වික්‍රමයෙහි සතුටු
27 වූයේ "ඔබ වනාහි මාගේ ජය දායකය"යි (කියා) ස්නේහයෙන් වැලඳ
ගෙණ තමාගේ නුවරට අවුත් ජයකෙළි කෙළ මාණවම්ම කුමරුගේ
සේනාවට කටයුතු සියල්ල කෙළේ ය. යලිත් රජ තෙම මෙසේ සිතී ය.
28 "මාගේ යහළුතෙම තමා විසින් කළමනා සියල්ල කෙළේ ය. හෙතෙම
අද පටන් මට ණය නැත්තේ ය. "මා විසින් කටයුත්ත කොට මාගේ
29 ණය ද සුද්ධ කරමි. කෘතඥ වූ කළගුණ දන්නා වූ පුරුෂයෝ ඉතාම
30 දුබලය"යි (සිතා) ඇමතියන් රැස්කරවා මේ වචනය කීයේ ය. "මාගේ
මේ යහළුවාගේ කම්හි තොපි ද සාක්ෂිහ. මා විසින් ද සැප ඵලවන්නා
31 වූ යහපත් කම් යක් ඔහුට කටයුත්තේ ය පූර්වෝපකාරී වූ පුද්ගලයාට
උපකාර කිරීම සත්පුරුෂයන්ගේ ධර්මයෙක"

32 මෙසේ කී කල්හි "දේවයන් වහන්සේ යමක් යමක් කැමති වන්නේ
ද ඒ ඒ දෙය අපට ද රුචි වන්නේය"යි ඒ ඇමැතියෝ රජුට පිළිවදන්
33 කීහු. ඉක්බිත්තෙන් ඒ රජ තෙමේ මාණවම්ම කුමරහට වාහන සහිත
34 සේනාව ද සියලු උපකරණ ද සියලු කම්කරුවන් ද දී "යව"යි සේනාව
35 සමග යන්නා වූ උහු බලා වෙන් වූ පුතකුට අඬන්නා සේ හැඬී.
36 මාණවම්ම ක්ෂත්‍රිය තෙමේ ද මුහුදු තෙර දී නැව් නැගී නොබෝ කලකින්ම
වේගයෙන් එය ඉක්මවා අවුත්, සේනාව සමග ලංකාද්වීපයට පෙළෙමින්
ඇතුළු වී ඒ අසා දාඨෝපතිස්ස නම් රජ තෙම පලා ගියේ ය. මාණවම්ම
37 ක්ෂත්‍රිය තෙමේ ද නුවරට ගොස් රජ නොවීම පියවරක් පියවරක් පසු
පස්සේ මතු බලා යන්නේ පලා ගියහු ලුහුබැන්දේ ය. එකල්හි ඒ ද්‍රාවිඩ
38 සේනා තොමෝ "ස්වාමී තෙම මහාරෝගයකින් මැඬ පැවතුණේ ය"යි
ඇසීල ඒ අසා සේනා තොමෝ ඉවත්ව ගියා ය. දාඨෝපතිස්ස රජ

Non-Commercial Distribution

39 තෙමෙ ඒ අසා මහත් සේනාවක් ගෙණ මාණවම්ම කුමරු කරා පැමිණ
40 යුද්ධ කරණ්ට ආරම්භ කෙළේ ය. මාණවම්ම කුමරු තෙමේ ද "මාගේ
41 සියලු" සේනාව ගියා මා මළකල්හි මා සතුරාගේ අභිමතය සමෘඬ
වන්නේ ය. එහෙයින් මම දඹදිවටම (යමි) එතැනින් සේනාව ගෙණවුත්
නැවත රාජ්‍යය ගණිමැ" යි සිතී. එහෙයින් ඒ තෙම එසේ කෙළේ ය.

42 නැවත ගොස් යහළු වූ නරසීහ (රජු) දැක මනා කොට සතුටු
43 කරමින් සකස් කොට උහු සේවනය කෙලේ ය. රජුන් සතර දෙනෙකතුන්
වන තෙක් ඒ මාණවම්ම තෙම එහි වාසය කෙළේ ය. ඉක්බිත්තෙන් "
44 මානයෙන් තද වූ කීර්ති ධන කොට ඇත්තා වූ මාගේ යහළු තෙම රජය
45 පිණිස මා සේවනය කරමින් ම කල් ගියේ මහලු වන්නේ ය උහු බලමින්
46 මම කෙසේ රාජ්‍යය කෙරෙම් ද? මේ වාරයෙහි වනාහි මාගේ සේනාව
යවා ඒ රාජ්‍යය නොගන්නෙම් නම් මාගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජන
47 දැ?" යි නරසීහ තෙම සිතුයේ ය. මෙසේ සිතා හෙතෙම තමන්ගේ
සේනාව රැස් කරවා සුදුසු පරිද්දෙන් සන්නද්ධ කරවා රුචි වූ දෙය දෙවා
48 තමන්ම ඒ සේනාව ගෙණ මුහුදු තෙරට ආයේ සිතියම් රූප ඇත්තා වූ
ස්ථිර වූ බොහෝ නැව් කරවා "පින් වත්නි, මොහු සමග යව් ය"යි
ඇමැතියන්ට කීයේ ය. එකල්හි සියලු ජනයෝ නැව් නැඟින්ට නොකැමති
වූහ.

49 එකල්හි නරසිංහ තෙමෙ නානාප්‍රකාරයෙන් සිතා තෙමේ
ප්‍රතිචඡන්නවැ හෙතෙම රාජ ලක්ෂණ වසයෙන් සම්මත වූ තමන් ගේ
පෙරහර සියල්ල ද, තමන්ගේ ආභරණ සියල්ල ද උහුටම දී ඒ (මාණවම්ම
50 කුමරහු) නැවට නංවා "යව මුහුදේ සිට මේ කොට නම් බෙරයත් වාදනය
51 කරව"යි නියෝග කෙළේ ය. ඒ මාණවම්ම තෙමේ ද සියල්ල එසේ
52 කළේ ය. අපගේ රජ තෙමේ ගියේ ය" යි (සිතා) රජුහු තනි කොට
53 ජනයෝ නැව් නැංගාහ. මාණවම්ම තෙම ඒ සෙනග ගෙණයන්ට
ආරම්බ කෙළේ ය. හුදෙක් ඒ මුහුද තෙම නුවරක් සමාන වී.

54 ඉක්බිත්තෙන් හෙතෙම පටුනට පැමිණ වාහන සහිතව ගොඩ
බැස එහි කීප දවසක් වෙසෙමින් සේනාව සතප්පා උතුරු දේශය ගෙණ
55 ජනයා අත්පත් කොට චලනය නොකොට හැකි වූ මහා සේනා ඇත්තේ
නුවරට යන්ට පටන් ගත්තේ ය. පොත්ථකුට්ඨ තෙමේ ද ඒ අසා මහත්
56 සේනා ඇත්තේ ඉදිරියට ගියේ ය. දෙසේනායෝ බුන් වෙරළැති සාගර
57 දෙකක් මෙන් එකතු වූහ. ඉන් මාණවම්ම තෙම ගත්තා ලද ආයුධ
ඇත්තේ ඇතු පිට නැඟී පොත්ථකුට්ඨ (නම් ද්‍රවිඩ) පුරුෂයා ද රජු ද වෙන්
කොට පැලවී ය. පලායන්නා වූ හත්ථදාඨයා දනව් වැසි මිනිස්සු දැක

Non-Commercial Distribution

58 උහුගේ හිස ගෙණ මාණවම්ම රජහට දැක් වූහ. පොත්ථකුඪ තෙමෙ පලා ගොස් මේරුකන්දර නම් දනව්වට පැමිණියෝ ය.

59 ඉන්පසු ඒ රට ස්වාමිතෙම උහු දැක "මේ තෙමේ ම මට බොහෝ කල් යහළු ය. එහෙයින් වීපතෙහි පිහිට සොයා ආවහු හැරදමනු
60 නොහැකි ය හිමියාට ද යහළුවාට ද නිදොස් වූ යමක් කෙසේ වන්නේ
61 දැ"යි සිතා හෙතෙම විෂ සහිත වූ පූපයක් කා මෙළේ ය. පොත්ථකුඪ තෙමේ ද එයින් ම පූපයක් අනුභව කොට මෙළේ ය. ඒ මාණවම්ම රජහට මෙසේ ලංකාද්වීපය නිරවුල් වූයේ ය.

62 ඒ මාණවම්ම තෙම එයින් ම ලංකා ද්වීපයෙහි ජනයා ගේ දුක් වළක්වන්නාක් මෙන් ම එකල්හි ලංකාවෙහි සේසත එසවී. හෙතෙම
63 බොහෝ වූ ද අනගි වූ ද පින්කම් කෙළේ ය. ඒ සියල්ල පාදයක් පාසා
64 කියන්නට කවර මනුෂ්‍යයෙක් නම් සමත් වේද? කප්පගාම් නම් වූ ද, එසේ ම සෙපණි නම් වූ ද, පධානරකඛ නම් විහාරයෙහි සිරි නම් පහය
65 ද, සිරිසඟබෝ නම් වූ වෙහෙර ප්‍රසාද එලවන්නා වූ පහය ද, ඒ උත්තම තෙමේ ම කර වූයේ ය. ලෝවා මහපහය ද එසේ ම
66 ථූපාරාමයෙහි ගෙය ද සෙවෙනි කර වි ය. ථූපාරාමයෙහි ම ප්‍රසාදයක් ඉදි කොට පාංශුකූලිකාඞ්ගය රක්ෂා කරණ භික්ෂූන්ට දින. චෛත්‍යය මස්තකයෙහි ජරාවට පැමිණි සත පියවි කෙළේ ය. එහි ම බොහෝ වූ ජරාවට පැමිණි ආවාසයන් පියවි කෙළේ ය.

(මෙහි සතළිනස් සත් වෙනි පරිච්ඡේදයේ කෙළවර නොපෙනේ මෙතැන පටන් සතළිස් අට වෙනි පරිච්ඡේද යයි හැඟේ. පූජාවලි අනුසාරයෙන් මීට අනතුරුව අග්බෝ රජහුගේ නම පැණෙ යි. පරිච්ඡේද සංඛ්‍යාව ද පොතේ අඩු වී පෙණේ.)

Non-Commercial Distribution

# හතලිස් හය - හතලිස් අට වෙනි පරිච්ඡේද

ඉක්බිති අග්‍රබෝධි කුමාර තෙම රජ විය. ඒ රජ තෙම ශ්‍රද්ධා
සම්පන්න වූයේ[1] සුලභ වූ ප්‍රත්‍යය ඇති ආවාසය කරවා ධම්ම රුචි නම්
1 නිකායේ හෝ අභය ගිරි විහාරයෙහි භික්ෂූන්ට ඒ රජ තෙම දුන්නේ ය.
රාජිනිදිපක නම් ගම ද දුන්නේ ය. මහානෙත්‍රාදිපාද නම් ආවාසය
වෙන් කරවා ඒ භික්ෂූන්ට ම දින. හෙතෙමෙ (කො) ක) වාතයෙහි
2 දේවතිස්ස නම් ආවාසය ඔවුන්ට දින. හෙතෙම මා තලයෙහි
කාදම්බගොත නම් ආවාසය කොට දේවපාලි නම් ජනපදයෙහි එසේ
ම ගිරි නම් නුවරක් කරවා අන්තරසොබ්භයෙහි දේව නම් විහාරයක්
3 කොට රාජමාතික නම් ආරාමයක් කොට පාංශුකූලික භික්ෂූන්ට දුන්නේ
4 ය. ගෝණ නම් වූ විහාරයෙහි ප්‍රධාන ගෙයක් කෙළේ ය. වඩමන් නම්
වූ බෝධිවෘක්ෂයෙහි දිරාගියා වූ ගෙය ද කරවි. සංඝමිත්තා නම් විහාරය
5 ද අනිකුත් තන්හි ද ඒ ඒ විහාරයන්හි අභිනව කර්මාන්තයන් මහත් වූ
6 යසස් ඇති ඒ රජතෙම කරවී. ඒ රජතෙම රන් සව්සිදහසක් නිමවා
7 සෑගිරියෙහි ජරාවට පැමිණි තැන් නවකම් කෙළේ ය. පන්බත් (නම්) වූ
තල්වතු වෙහෙර කරවා මහාසේනා රජහුගේ නම් ඇති විහාරයට දෙවි.
8 බිඳුනා වූ ගොඩි ගමු වැව ද පෙර තිබුණු පරිද්දෙන් බැන්දේ ය. හෙතෙම
9 සියලු දාන භාණ්ඩය ද සියලු සත්ත්වයන්ට දුන්නේ ය.

10 හෙතෙම ලංකාද්වීපවාසි ජනයන් සමග පෙහෙවස් වෙසේ.
ලෝකෝත්තර සැප දෙන පිණිස ඔවුන්ට ධර්‍මයද දේශනා කෙරේ. උහුගේ
11 රජයෙහි වූ සියලු ජන තෙම ස්වර්‍ගයට හිත වූ කර්‍මය මනා කොට
කෙළේ ය. "මහීපාලතෙම යමක් කෙරේ ද උහුගේ ජන තෙම එය
12 කෙරේ. එ හෙයින් මහත් ප්‍රඥා ඇති රජ තෙම සෑම කල්හි ධර්‍මයෙහි ම
13 හැසිරෙන්නේ ය. හෙතෙම විසූ විසූ තැන මහත් යසස් ඇත්තේ වේ.
14 පිරිවර සමන්විත වූයේ කෙළවර නිර්‍වාණයට ද යන්නේ ය." එහෙයින්
නුවණැත්තේ ආත්මාර්‍ථය හා පරාර්‍ථය ද බලන්නේ ය. ඉදින් හික්මුනා
වූ එකම තමා කරණ කොට ගෙණ සියලු මහජනයෝ ද හික්මීමට යෙත්
15 නම් කවර නම් පණ්ඩිතයෙක් තෙමෙ ඒ හික්මීම නසන්නේ ද?
16 සත්ත්වයන්ගේ යම් ප්‍රයෝගයක් තෙම දෙලොව වැඩ එලවන්නේ වේ ද
රෑ දවල් අනලස් වූ උහු විසින් නොකරණ ලද්දා වූ ඒ ප්‍රයෝගයෙක්
17 නැත්තේ ය. ඒ රජ තෙම තමා විසින් අඳින ලද්දා වූ ඒ ප්‍රයෝගයක්
නැත්තේ ය. ඒ රජතෙම තමා සිව්රු පිණිස දෙවි. ඒ රජහුගේ

---

1 මෙහි පෙළ මඳක් අඩුයි. මේ කාශ්‍යප නම් රජ තෙමෙ සත් අවුරුද්දක් රාජ්‍ය කරවී, පූජාවලි ක්‍රමයෙහි

Non-Commercial Distribution

අස්ථානයෙහි යෙදීමක් හෝ නුසුදුසු සංග්‍රහයක් හෝ වරද සහිත වූ
ප්‍රයෝජන විඳීමක් හෝ සර්වප්‍රකාරයෙන් ම නොවී. යම් යම් සත්ත්ව
18 කෙනෙක් යමක් යමක් ආහාර කොට ඇත්තා හු ද ඔවුන්ට ඒ ඒ දෙය
හෙතෙම දෙවූ යේ ය. යම් යම් සත්ත්ව කෙනෙක් යමකින් සැප ඇති
19 වෙද්ද ඒ ඒ සත්ත්වයන් එයින් සුවපත් කරවී. ශාන්තිය එලවන්නා වූ ඒ
රජ තෙමේ මෙසේ සහවුරුද්දක් දන් පින් කොට ශක්‍රදේවේන්ද්‍රයාගේ
සමීපයට ගියේ ය.

20 ඉක්බිත්තෙන් උහුගේ මල් වූ පෙර පැවැත්ම පරිද්දෙන් රාජ්‍ය
භාරය ගන්ට සමර්ථ වූ කාශ්‍යප නම් ක්ෂත්‍රිය තෙමේ රජවී. පියකු සිය
21 පුතෙකුට පරිද්දෙන්ම හෙතෙම දානයෙන් ද ප්‍රිය වචනයෙන් ද අර්ථයෙහි
හැසිරීමෙන් ද මහාජනයාට සංග්‍රහ කෙළේ ය. ඒ ඒ අයට සුදුසු පරිද්දෙන්
22 තනතුරු ද දෙවී. තෙමේ ත් සියලු දුකින් වැළැක්කේ භෝගයන් ද
23 අනුභව කෙලේ ය. ඒකෂත්‍රිය තෙමෙ ගිහින්ගේ ද, භික්ෂූන්ගේ ද,
24 බ්‍රාහ්මණයන්ගේ ද ස්වකීය (ස්වකිය) ආචාරයන් පැවැත්වූයේ ය. සතුන්
නො මරව් යන ආඥාවක් ද කරවී. මස් තොට (ආවාස) දෙකක් ද
හෙළාගාම නම් වූ ආවාසය ද වෙළඳගම ආරාමය ද එසේ ම කස්සපගිරි
25 නම් උතුම් ප්‍රධාන ගෘහය ද එසේම අඹවන නම් ආරාමය ද කරවී.
භෝග උපදනා ගමක් ද දුන්නේ ය. 1 ඔවුන් අතුරෙන් සියල්ලන්ට
26 බාල වූ මහින්ද නම් ක්ෂත්‍රිය තෙම පැමිණියා වූ රාජ්‍යය ඇත්තේ ද
අභිෂේක ප්‍රාප්ත නු වූයේ ය.

27 උහුගේ වනාහි බොහෝ කල් ඇසුරු කළා වූ නීල නම් මිත්‍රයෙක්
රාජ්‍ය ලෝභයෙන් පූර්වයෙහි ම මරණ පත් වී. හෙතෙම උහු සිහි
28 කරමින් රාජ්‍යය රුචිනොකෙළේ ය. අදෝමය යහළුවා නැති බැවින්
ලංකාද්වීපයෙහි සුව එලවන්නා වු රාජ්‍යය පවා නොසිතී ය. යහළුවෝ
29 නම් ඉතා දුර්ලවෙත් එහෙයින් ම බුදුන් විසින් "යම්කිසි ලෞකිකධර්ම
කෙනෙක් වෙද්ද එසේ ම ලෝකෝත්තර ධර්ම කෙනෙක් වෙද්ද,
30 නිර්වාණගාමී වූ ධර්ම කෙනෙක් වෙද්ද සත්ත්වයන්ට ඒ සියල්ලෝ ම
යහපත් මිත්‍රයා නිසා (සමෘද්ධි) වන්නා හු ය. එ හෙයින් කල්‍යාණ
31 මිත්‍රයන් කෙරෙහි සෑඹ කල්හි ආදර කටයුතු ය"යි වදාරණ ලද්දේ ය.

එහෙයින් හෙතෙම ලක්දිව ජනයන් රක්නා පිණිසම ජීවත්
32 වෙන්නෙක් මෙන් ආදිපාදව ම රාජ්‍ය විචාරණය කෙළේ ය. හෙතෙමෙ
33 තමා සොහොවුරු කසුප් කුමරු ගේ පුත් වූ අග්බෝ කුමර උප රජ
34 බැව්හි තබා බොහෝ වූ භෝග දී නැගෙණහිරි දේසය දී එහි වාසය
35 කරන්ට යවා, සිය කුමරුට දකුණු දෙස දීන මහාපාළි නම් දානසාලාවෙහි

Non-Commercial Distribution

දානය ද දවසක් පාසා දසගැලක් බර දෙවූ යේ ය. සියලු භෝගයන්
තමන් හා යාචකයන්ට සම කෙළේ ය. යදියන්ට නො දී හෙතෙම
36 කිසිවක් ප්‍රයෝජනයට නොගත්තේ ය. සිහි නොකිරීමෙන් අනුභවකරණ
37 ලද්දේ හෝ තමන් අනුභව කළ දෙයින් දියුණක් දෙන්නේ ය. හෙතෙම
භික්ෂූනීන්ට ස්වකීය නම් ඇත්තා වූ අසපුවක් කරවී. නගර ගල නම්
ගම ද ආරාම මරියාදක නම් ගම ද, (ඒ මෙහෙණි අසුපුවට) දින.
38 මහිඳතට නම් ආරාමය සිවුපසයෙන් සමෘඬ කොට කරවී. පුණ්‍ය
ගුණයෙහි ඇළුනේ අනිකුදු පින් බොහෝ සේ කළේ ය. තුන් හවුරුද්දක්
මෙසේ රාජ්‍යය කොට ඒ මහත් ප්‍රඥා ඇති (මහින්ද) තෙම යහළුවා
39 සොයා යන්නාක් මෙන් දෙව්ලොව ගියේ ය. දකුණු දෙස වසන්නා වූ
40 අග්‍රබෝධි කුමාර තෙම කිසියම් කටයුත්තකින් නුවරට අයේ ය. උහු
එහි වසන කල ම මහින්ද ආදිපාද තෙමේ මෙළේ ය. එහෙයින් රාජ්‍යය
41 උහුගේ හස්ත ප්‍රාප්ත විය.

42 හෙතෙම එය හස්ත ප්‍රාප්ත කොට තබා ගෙණ නැගෙණහිර
දෙස අධිපති වූ අග්‍රබෝධි කුමාරයාට හස්නක් යැවී ය. ඒ අග්‍රබෝධි
කුමාර තෙමෙ අවුත් සිලාමෙඝ යන නම් ඇතිව රජ වි. රජ තෙම (ඒ
43 අග්‍රබෝධි, කුමාරයා) ද උප රාජ්‍යයෙහි අභිෂේක කළේ ය. ඒ උප රජ
තෙම "සිතිවිලි බර මුදා නුඹ වහන්සේ භෝග අනුභව කළ මැනවි"යි
44 රජහු පවරා තෙමේ රාජ්‍යය විදාරණය කෙළේ ය. මේ තෙම සුදුසු
45 පරිද්දෙන් ජනයාට නිග්‍රහ ද සංග්‍රහ ද කෙළේ නුවණැස් ඇත්තේ
ලංකාද්වීපයෙහි විනය විරුද්ධ වූ සියල්ල මාර්ගයට පැමිණ වී ය. මෙසේ
ඒ දෙදෙනා වසන කල්හි පව් කම් කරන්නා වූ ජනයෝ අවකාශ
නොලබන්නා හු "මොව්හු ඔවුනොවුන්ට විරුද්ධ කටයුත්තාහ" යි
46 සිතූහ. කේළාම්කාරයෝ රජු කරා පැමිණ රහස් කොට "නුඹ වහන්සේ
47 නමින් රජය ස්වභාවයෙන් අනිකෙක් රජය, මේ උප රජ තෙම මහජනයා
48 සංග්‍රහ කොට රාජ්‍යය ගන්නේ ය. නොබෝ කලකින් රජ වෙයි සැක
49 නැතැ" යි කීහ. ඒ අසා රජ තෙම කුමාරයා කෙරෙහි බිඳුනේ ය. කුමාර
තෙමේ ද ඒ දැන රජහට දාමරික ව සිය රටට පලා ගොස් එහි ජනයන්
50 සංග්‍රහ කොට මහත් සේනාවක් කැටි කොට ගෙණ යුද්ධ කරන්ට පටන්
51 ගත්තේ ය. කදලිනිවාත නම් වූ ස්ථානයෙහි භයානක වූ යුද්ධයක් විය.
52 ඒ කුමර තෙම එතැන දී පැරද මලය රටටම ගියේ ය. ඉන් පසු ඒ
කෙළහි ගුණ දන්නා වූ රජ තෙම තමා සොහොවුරන්ගේ රාජ්‍යය දානාදි
53 උපකාර සිතා ප්‍රකාශයේ හැඬී ය. කුමාර තෙමේ ද ඒ අසා මොළොක්
සිත් ඇති වී මෙසේ ඔව්හු ඔවුනොවුන්ට මොළොක් බව ප්‍රකාශ කළහ.

54 ඒ රජ තෙම තමන්ම හුදකලාව මලය රටට ගොස් ඒ කුමරහු රැ
ගෙණ සියනුවරට අයේ ය. එයින් නිසැකව ම ප්‍රිය සිත් ඇතිවේ ය යි

Non-Commercial Distribution

55 සිතා සංඝා නම් වූ දුව උහු සමග විවාහ කරවී. ඒ රජු හා සමග විස්
වස් ඇත්තේ ඒ සංඝාව සමග වසන්නා වූ හෙතෙම කිසියම් දෝෂයෙක්හි
56 කිපියේ කුමරියට පහරක් දුනේ ය. ඒ තොමෝ පියාණන් කරා පැමිණ
57 "නුඹ වහන්සේ විසින් දෙන ලද ස්වාමි තෙම නිකරුණේ මා මරයි"
කියා බැගෑ පත් ලෙස රජහට ඇඩී ය. රජ තෙමේ ද ඒ ඇසූ කෙණෙහි
ම "මා විසින් ඒකාන්තයෙන් නපුරු කොට කරණ ලදැ"යි සිතා වහා ම
58 මෙහෙණවරට ගොස් ඇය පැවිදි කරවී.

ඉක්බිත්තෙන් ඒ කුමරිය මයිලනුවන්ගේ අග්‍රබෝධය යන නම්
59 ඇත්තා වූ පුතෙක් ඉතා බොහෝ කල් ම ඇය කෙරහි ඇළු නා වූ සිත්
ඇත්තේ "ඇය ගෙණ පලායන්ට මේ කාලය" යි දැන අප්‍රසිද්ධව ඒ
කුමරිය ගෙණ හුදකලාවම රුහුණු ගියේ ය. ඒ අග්‍රබෝධි රජ තෙම
60 අග්‍රබෝධි (නම් උපරජු) ගෙණ ඒ අග්‍රබෝධි කුමාරයා නසන්ට රුහුණට
61 ගොස් පිවිසියේ ය. අග්බෝ (අපරජ) තෙම තමා සොහොවුරු වූ
අග්බෝ (රජු) වළක්වා පශ්චිම පර්වතයේ දී අක්බෝ කුමරු නසනු
62 පිණිස තෙමේ ගියේ ය. මහා බල ඇත්තේ සියලු රුහුණ අත් පත්
කොට උහු සමග යුද්ද කොට සංඝා නම් වූ තමාගේ භාර්යාව (අත්පත්)
63 කොට ගත්තේ ය. එතැන් පටන් සුවපත් වූ සමගි වූ ඒ තුන් දෙන
64 ඔවුනොවුන් කෙරෙහි විශ්වාස ඇති ව රිසි සේ වාසය කළෝ
ව්‍යාපාරනිමක නම් ආරාමය ද, එසේ ම මනගගබෝධි නම් ආරාමය ද
65 අභයුත්තර විහාරයෙහි පුනාපිටි නම් විහාරයෙහිත් මහ පිරිවෙන්හිත්
වහදිව (නොහොත් වහකොට්ට) නම් විහාරයෙහිත් ප්‍රාසාදයන් ද
66 ථූපාරාමයෙහි ගෙයි දිරුවා වූ දොරටුද පියවි කෙළේ ය. ඒ ථූපාරාමයෙහි
ටැම් ද පරිවතනය කෙළේ ය. මෙසේ ශක්ති වූ පරිද්දෙන් අනික්
67 පින්කම් ද කොට සතළිස් වෙනි වර්ෂයෙහි (අග්‍රබෝධි සිලාමෙඝ) රජ
තෙම කම් වූ පරිද්දෙන් පරලෝව ගියේ ය.

68 ඉක්බිත්තෙන් ශ්‍රී ධර වූ අග්‍රබෝධි නම් උපරාජ තෙම රජ විය.
මහින්ද නම් නුවණැත්තා වූ ආදිපාදයන්ගේ පුත්‍ර වූ හෙතෙම ශාසනය
69 ද ලෝකය ද සුදුසු පරිද්දෙන් සංග්‍රහ කෙළේ ය. තමන්ගේ පුත්‍ර වූ මිහිඳු
70 කුමරු උපරජයෙහි අභිෂේක කෙළේ ය. හෙතෙම මහා බෝධියෙහි
71 දිරුවා වූ ගෙය තර කොට නවකම් කරවී ය. කලන්දය මලලවාතය
යන නම් ඇති ආරාම දෙකක් ද කරවී. ධම්කම්යෙන් සකස් කොට බුදු
සස්න සුද්ධද කෙළේ ය. ධර්මයන් විනිශ්චය කරමින් මිථ්‍යාධිකරණ
72 තගන්නන් ශූන්‍ය ලේ ය. මුළු ලක්දිව ගිලනුන්ට බෙහෙත් ද මගුල්
අවමගුල් ද තෙමේ ම විචාරණය කෙළේ ය. තුන්නිකාය වාසි වූ
73 භික්ෂූන්ට ලභ බත් දෙවී ය. තමන්ට යෝග්‍ය වූ මහාගී වූ බොජුන්

Non-Commercial Distribution

74 පාංශු කුලාඩිගය ධරණ භික්ෂූන්ට දෙවි ය. සයවංසී වූ හෙතෙම මේ
ආදි වූ පින් කොට පොළොන්නරුවෙහි වසමින් සහවුරුද්දකින් චුතවි.
75 ඉන් පූර්ව වෙයහි ම ඔහුගේ පුත්‍ර වූ යුව රජ තෙම මෙළේ ය. එහෙයින්
76 ඒ රාජ්‍යය එකල්හි අපුත්‍රක වී. මෙලාමෙඝ රජුගේ රාජ්‍යයට යෝග්‍ය වූ
මහත් පින් ඇත්තා වූ ලෝකයාට සංග්‍රහ කට හැකි වූ මහින්ද නම්
77 පුත්‍රයෙක් විය. උහු උපන් දිනම රජ තෙම නක්ෂත්‍ර පාඨකයන් පිළිවිස
රාජ්‍යයට යෝග්‍යය යි ඔවුන් විසින් ප්‍රකාශ කරණ ලද වචනය අසා
78 ඔවුන්ට මනා කොට වස්තු දී එ පවත් සැඟවී ය. ඉක්බිත්තෙන් ඒ
සිලාමේඝ රජ තෙමේ වයස පැමිණියා වූ උහු සිය සෙනෙවි කොට
79 සියලු රාජ්‍යයම උහුගේ අතෙහි තබා තෙමේ වාසය කෙළේ ය. මහත්
80 නුවණැත්තා වූ හෙතෙම දැහැමින් රාජය විචාරණය කෙළේ ය. ඒ
81 සිලාමේඝ රජු මළ කල්හි ද ක්‍රම දන්නා වූ ඒ තැනැත්තේ අග්‍රබෝධි
82 නැමැත්තා වූ උහු අතින් සේනාපති ධූරය නොගත්තේ ය. එකල්හි එ
83 තෙම රජහුගේ කිසියම් කටයුත්තකින් ගොස් මුහුද තෙර මා තොට නම්
පටුනෙහි වෙසේ. හෙතෙම සුළුපියහුගේ මරණය අසා සොරු රාජ්‍යය
ගෙණ නුවර නසත්යයි සිතා වේගයෙන් අයේ ය, ඊට පෙරාතුව උතුරු
දෙසෙහි රටියන් සහිත වූ ද මාණ්ඩලාපතී හු ඒ දේශය උදුරා ගෙණ
රජහට අයිති අය සුන් කළහ. හෙතෙම ඒ අසා මහා සේනා ඇත්තේ
84 උතුරු දෙසට ගොස් සියලු ම රටියන් සහිත මණ්ඩලීකයන් මැඩ පවත්වා
85 රජහු මළ තැනට ගොස් දේවිය දැක අඬා අස්වසා කල් වූ පරිද්දෙන් "
මහා දේවිනි මාගේ ස්වාමි තෙමෙ මෙළේ යයි නො සිතව.

86 මම දිවයින රක්නෙමි නුඹ වහන්සේ රාජ්‍යය කරව"යි මේ වචනය
87 කියේ ය. පාපබුද්ධි ඇත්තා වූ ඕ තොමෝ ඉවසුවාක් මෙන් තුෂ්ණිම්භූතව
88 රිසි සේ වසනු කැමැත්තී රහස උහු මරන්ට යෝජනා කළා ය. ඒ
සේනාපති තෙම එය දැනගෙණම බිසවට ආරක්ෂා විධාන කොට ඒ
89 පක්ෂයට අයිති වූ මහා ජනයා යුද්ධ කොට පැන්නුයේ ය. ඉන් පසු
හෙතෙම ඒ මෙහෙසිය බන්දවා යහනෙක්හි බහා ගෙණ නුවරට ගොස්
90 උපකරණ සහිත වූ රාජ්‍යය ගත්තේ ය. සිලාමේඝ නම් රජහුගේ බෑණා
වූ මහා සේනා ඇත්තා වූ මහාධන ඇත්තා වූ දප්පුළ නම් ආදිපාද
91 කෙනෙක් ඇත. හෙතෙම කළා වැව වසමින් සේනාව රැස් කරවා
92 නසංගමු නම් පියසට යුද කරණු පිණිස ආයේ ය. සේනා පති තෙම ඒ
93 ප්‍රවෘත්තිය අසා සමෘද්ධ වූ සේනා වාහන ඇත්තේ ඒ බිසව ද රැගෙණ
94 වහාම එහි ගියේ ය. ඒ දෙදෙනාගේ භයානක වූ යුද්ධයක් එහි විය.
එකල (දප්පුළ නම්) ඇපා තෙමේ පසුබස්නා වූ සේනාව දැක පළා
ගොස් සේනා සහිතවැ වලස් පව්වට නැංගේ ය. උහු එහි පලවා සේනාපති
95 තෙම සුවසේ විසී.

Non-Commercial Distribution

උතුරු රට මාණ්ඩලිකයෝ ද නුවර ශූන්‍යය යි අසා ඒ දේශයෙහි
96 සියල්ලෝ සමාගම් ව එකල්හි පුරය ගත්හ. සූර වූ ස්ථිර පරාක්‍රම ඇති
ඒ සේනාපති තෙම වනාහි ඔවුන් පසු බැස් වී ය. ඉක්බිත්තෙන් නුවරට
අවුත් විධි වූ පරිද්දෙන් රාජ්‍යය විචාරණ ය කෙළේ ය. භික්ෂු සංඝයාට
97 ද, ලෝ වැසි ජනයාට ද, මත්ස්‍යයන්ට ද, මෘග පක්ෂීන්ට ද, නෑයන්ට
ද, සේනා සමූහයාට ද කටයුතු සියල්ලම කෙළේ ය. පසුව අනුබලයට
පැමිණියා වූ දප්පුල තෙම මළය රටට ගියේ බෑණන් දෙන්නා ද රුහුණින්
98 කැඳවා සියලු ම රට දනවි වැස්සන් ගෙණ බොහෝ වාහන ඇත්තේ
රාත්‍රියෙහි නුවරට අවුත් මුහුද මෙන් පැතුරුණේ ය. හාත් පසින්
උද්ඝෝෂණය කරමින් සේනා සමූහ තෙම නුවර වට කෙළේ ය.
99 අශ්වයන්ගේ හේසාරාවයෙන් ද ඇතුන්ගේ කුංචනාදයෙන් ද තූර්‍ය්‍ය
100 ශබ්දයන්ගේ ද කාහල හෙරීන්ගේ නාදයෙන් ද යෝධයන්ගේ ගර්ජනාවෙන්
101 ද එකල්හි අහස නො පැළුණේ ද, එකල්හි සේනාපති තෙමෙ මහා
සේනාව දක සතුටු ව ඒ ප්‍රවෘත්තිය තමන්ගේ සේනා සමූහයට "මේ
102 රාජ පුත්‍රයෝ තුන් දෙන මහත් වූ සේනාව ගෙණ අපේ නුවර වට
කොට වසා ගත්හ. මෙහි තොප විසින් කුමක් කටයුතු ද"යි කීය.
103 උහුගේ යුද්ධ කැමති වූ සූරයෝ මෙසේ කියන ලද්දාහු සෙනෙවිහට
104 කීවාහු ය. "දේවයන් සේවනය කරණ දවස්හිම විජිතය සේවකයන්ගේ
නොවේ . ඉදින් මෙසේ වූ කාලයෙහි ජීවිත කැමති ව පසු බැස්සෝ
වෙමු නම් ස්වාමි තෙමේ මෙපමණ කලක් අප සැප වූ පරිදදෙන් කුමට
105 පෝෂණය කෙළේ ද? මෙසේ කී කල්හි උත්සාහ ඇත්තා වූ (සේනාපති
106 තෙම) රාත්‍රියෙහි සේනාව සජ්ජිත කොට අරුණ නැගී කල්හි කරණ
ලද කම් ඇති ඇතු පිට නැගී එක් දොරටුවකින් නිකම් වැටෙන හෙනක්
සෙයින් යෝධයන් දහස් ගණන් සමග ඉවසිය නොහැකි වූ යුද්ධයක්
107 කෙළේ ය. ඒ ඈපාණන්ගේ සේනාව ඒ ඒ දිග විසුරුවා හැර එක
තන්හි (සේනා හා) එකතුව සතුට මොනවට වින්දේ ය. දප්පුල නම් වූ
ආදිපාද තෙම නසන ලදින් අවශේෂයන් ගෙණ පෙරවරු කල්හි ම
108 පැරද රුහුණු පලා ගියේ ය. එ කල්හි රුහුණින් ආවා වූ ඒ රාජ
109 පුත්‍රයන් දෙදෙනා ද ජීව ග්‍රහයෙන් අල්වා ගෙණ නුවරට ගියේ ය.
110 මෙසේ පැමිණි ජය ඇත්තා වූ සූර වූ (මහින්ද රජ) තෙම දිවයින නිරවුල්
111 වූ කල්හි නැගෙණහිර දෙස සාදනු පිණිස ස්වකීය සේනාවන් පිටත්
කෙළේ ය. ඔව්හු ගොස් ඒ දෙස ද, උතුරු දෙස ද සාදා නොබෝ
කලකින් ම මහා සේනාවක් සංග්‍රහ කෙළේ ය. රජ තෙමේ ද ඒ මහ
112 බිසව "මෑ හරින්ට ද මරන්නට ද නොහැකි ය"යි සිතා තමන්ගේ බිරින්ද
113 කෙලේ ය. ඔවුන්ගේ සංවාසයට පැමිණ ගර්භයක් තෙම පිහිටියේ විය.
ඕ තොමෝ ධන ලාභයට හේතු වූ පුන්‍ය ලක්ෂනයෙන් යුක්ත වූ පුත්‍රයෙක්
114 වැදී ය. එතැන් පටන් ඕ තොමෙ: රජහට ඉතා ප්‍රිය විය. ඒ රජ තෙමේ

Non-Commercial Distribution

ද ඒ පුත්‍රයාට භෝග සහිත වූ උප රාජ්‍යය දුන්නේ ය. පැදුම් දෙස
115 සිටියා වූ ආදිපාදයන් ඒ අසා මේ අපට විනාසයයි සිතා දෙදෙන එකතුව
දෙපසෙහි සේනාව ද මහත් ධනය ද රැගෙණ රුහුණු දෙසින් සහෝදරයා
116 කැඳවා සම්බන්ධ කොට මහත් සේනා ඇත්තා වූ ඔව්හු ගංගා තීරයෙහි
117 වාසය කළෝ රජ තෙම මේ සියල්ල අසා ඒ ඒ තන්හි මණ්ඩලීකයන්
සතුටු කොට ගෙණ කිසි දුෂ්ට කෙනෙකුන් මරවා නුවරෙහි රැකවල්හී
කටයුතු මනා කොට යොදා මහ සෙනග ගෙණ ඒ මෙහෙසිය ද ගෙණ
118 හුම්මාර නම් ගමෙහි කඳවුරු පිහිටු වූයේ ය. උහුගේ ඊම දැන ඒ
119 ආදිපාද තුන්දෙනා ද කොවිළාර නම් ගමෙහි දී මහත් යුද පැවැත් වූ හ.
ඉක්බිත්තෙන් මහත් සේනා ඇති ඒ රජ තෙමේ ඒ සේනාව නැසූයේ ය.
120 ඒ දප්පුල තෙමේ පලා ගියේ ය. ආදිපාදි දෙදෙනෙක් මරණ ලද්දෝ ය.
එහිද ලැබූ විශේෂ ජය ඇත්තා වූ රජ තෙම නුවරට අවුත් රාජකෘත්‍ය
විචාරණ කෙළේ ය. මහ දන් පැවැත් වූයේ ය.

121 හෙතෙම මහා බෝධී වෘක්ෂ රාජයාට ද මහා චෛත්‍ය තුණටද
ධාතුවට ද සත්කාර කොට මහාපූජා කරවි. දප්පුල තෙම රුහුණට
122 පැමිණ එහි ආවා වූ කලෙක්හි නැවත රජු හා යුද්ධ කරණ පිණිස
123 සේනාව පිළියෙළ කෙළේ ය. ඒ රජ තෙමේ පුතුන්ට ද මුනුබුරන්ට ද
124 දේසය නිරවුල් කරණු පිණිස සියලුම භික්ෂූන් ථූපාරාමයෙහි රැස් කරවා
125 අනිකුදු යුතු අයුතු දැනීමෙහි දක්ෂ වූ මහා ප්‍රාඥයන් ද (රැස් කරවා)
126 සියලු රාජධර්මයන්හි දක්ෂ වූ ක්‍රම දැනීමෙහි පණ්ඩිත වූ (රජ තෙම) ඒ
127 ප්‍රවෘත්තිය දන්වා ඔවුන් විසින් මනා කොට පසස්නා ලද්දේ සිවුරඟ මහ
128 සෙනග ඇත්තේ සියලු උපකරණ අනුගත වූයේ දිවයින සැම තන්හි ද
129 නුවර ද කටයුතු යොදා නික්මුණේ නොබෝ කලකින් ම මාර පව්වට
130 ගියේ ය. ඒ දේසය මර්දනය කොට වහා ම පර්වතයට නැංගේ ය. ඒ දැක
රුහුණු සියල්ලෝ ම භයපත් වූවෝ උහු වසඟ බවට ආවාහු ය. ඉක්බිති
131 දප්පුලයන් සමග මිත්‍රසන්ථවය කොට ගර්ව සහිත ව උහු අතින් ඇතුන්
132 ද අනුන් ද මැණික් ද ගෙණ රුහුණ භුක්ති විඳින්නාවුන්ට කළුගඟ ද
133 සීමා කොට ගඟින් මෙතෙර ගෙණ රජහුගේ භුක්තිය කරවී. මෙසේ
මහත් තේජස් ඇත්තේ ලංකාද්වීපය (සතුරු භය නැති කිරීමෙන්)
නිෂ්කණ්ටක කොට එකච්ඡත්‍රවූයේ නුවරට අවුත් සැප සේ විසී. අධිපති
134 වූ ඒ රජ තෙම දාමවිහාරික නම් පිරිවෙණ කරවි, පොළොන්නරුවෙහි
තැඹිලි තොට නම් පිරිවෙණක් ද කරවි, අභය ගිරි යෙහි මහා ලේඛ
නම් පිරිවෙණ කරවි ය. එසේ වූ එහිම තුන් ලක්ෂයකින් නොයෙක්
135 මහල් ඇති කොට අන්‍ය වූ වෛජයන්ත ප්‍රාසාදයක් මෙන් ඉතා මනෝඥ
136 වූ රත්න ප්‍රාසාදය කරවා මහත් ධන ඇත්තාවූ රජ තෙම ජාම්බෝනද
රන් සැට දහසකින් අනර්ඝ චූඩා මාණික්‍යය යුක්ත කොට සර්වඥ

Non-Commercial Distribution

137 ප්‍රතිබිම්බයක් ද කරවා සියලු උපහාරයෙන් ම හැඟ වූ පූජා කරවා
ප්‍රාසාද පූජාවෙහි තමන්ගේ සියලු රාජ්‍යය පරිත්‍යාග කෙළේ ය. රිදියෙන්
138 නිමවන ලද ඉතා මනෝඥ වූ යහපත් වූ බෝධිසත්ව රූපයක් ද කරවා
සිලාමෙස නම් වූ මෙහෙණින්ගේ විහාරයෙහි තැබී. ථූපාරාමයෙහි
139 සැයට විසිතුරු පිණිස අතරතුර රිදීපටක් කොට රනින් නිමවන ලද
140 සැට්ටයක් කෙළේ ය. එහි ම දිරා ගියා වූ ප්‍රාසාදය ද හෙතෙම කරවූයේ
141 ය. ස්මෘත්තිමත් වූ ඒ රජ තෙම මහත් වූ පූජා කරවා හේමාලි විහාර
වාසී වූ මහා ස්ථවිරයන් වහන්සේ ලවා අභිධම් ය කියවී. ඒ විහාරයෙහි
142 ඒ ස්ථිවරයන් වහන්සේට පරිභෝග පිණිස පොකුණක් ද කරවී.

143 ඒ රජ තෙම ඒ ඒ තන්හි බොහෝ වූ ජිණ් දේවමන්දිරයන් කරවා
144 දෙවියන්ගේ පිළිරූ ද මාහැඟි කොට රක්වී. බමුණන්ට සමග කිරි.
145 පෙවී. හෙතෙම පිලුන්ට ගොණුන් ද දිවෙල් ද දින, ගොණුන් නො
146 ගන්නා වූ දෙමළුන්ට අසුන් දුන්නේ ය. අනාථ වූ ලජ්ජා සහිත යම්
කෙනෙක් වෙද්ද ඔවුන්ට ද හෙතෙම රහස සංග්‍රහ කෙළේ ය. උහු
විසින් සුදුසු පරිද්දෙන් සංග්‍රහ නො කරණ ලද්දෙක් ලංකාද්වීපයෙහි
147 නැත්තේ ය. හෙතෙම කලා වැවෙහි ජලසම්පාදනය ස්ථිර කෙළේ ය.
148 මෙයාකාර වූ උහුගේ පුණ්‍ය කම්ය ප්‍රමාණ රහිත ය, ඉතා බොහෝ ය.

149 එකල්හි උහුගේ පුත්‍ර වූ යුවරජ තෙම ස්වර්ගප්‍රාප්ත විය. සේනාපති
150 කාලයෙහි උපන්නා වූ අනාථ වූ කුමරුවෙක් ඇත්තේ ය. රජ තෙම
රාජ පුත්‍රයන් ගෙන් බියපත් වූයේ රජ වෙන්ට සුදුසු යයි (සිතා) යම් සේ
151 මරවන්ට නො හැකි ද එ පරිද්දෙන් ඒ කුමාරයා වර්ධනය කරවී ය. ඒ
කුමාර තෙම වනාහි එක් කලෙක සතුරන් විසින් නුවර වටකළ කල්හි
152 පියා කරා එළඹ යුධයෙහි හැසිරෙන්නා වූ ඇතෙක් ඉල්වී ය. හෙතෙම
භයානක වූ මාරයාගේ ඇතාට උපමා ඇත්තා වූ මහ ඇතෙක් ද සියලු
ආයුධ හිල්පයන්හි විසාරද යුද පුරුදු වූ සේනාවක් ද දුන්නේ ය. එ
153 කල්හි ඒ (කුමාර) තෙමෙ "මේ තෙමේ කාලය" යි කියා සිරිය බැඳ
හස්තිරාජයාට නැගි නුවරින් පිටත නික්ම දුක සේ දිනිය යුතු වූ සියලු
ම සේනාව විසුරුවා ජය ගත්තේ ය. ඒ දැක පහන් වූ රජ තෙම උහුට
154 සෙනෙවිරත් තනතුර දින. මේ තෙමේ ම වනාහි සේනා සහිත ව
155 උතුරු දෙසට ගොස් සේනා සහිත වූ ඒ දප්පුල නම් ආදිපාදයන් ද
පලාපීය. එ හෙයින් දප්පුළ තෙමේ උහු කෙරහි අතිශයින් ම බද්ධ
156 වෛර ඇති විය. මහමමාර නම් ගම යුද්ධයේ දී උහු දැක ඉතා ක්‍රෝධ
157 ඇතියේ තමා නැංගා වූ ඇතා උහු නසන්ට වහා ම යැවී . මේ (කුමර)
තෙම ඒ ඇතා තමාගේ ඇතු ලවා අන්නවා පලාපී ය. ඒ දැක ඉතා
158 සතුටු වූයේ රාජ්‍යයෙහි තබන්ට අන්‍යයන් නැති හෙයින් ද උහුට තමන්ගේ

Non-Commercial Distribution

උප රජ තනතුර දින. හෙතෙම මෙසේ විසි අවුරුද්දක් මේ දිවයින
159 මනා කොට භුක්තිවිඳ පුණ්‍යකර්මයාගේ විපාකය විඳින්ට මෙන් ස්වර්ගයට
ගියේ ය.

160 මෙසේ ජනයාට දුක් වූ විරූප වූ නොයෙක් ක්‍රම වලින් ලද්දා වූ
සියලු භොගයෝ ක්ෂණයෙන් නස්නාහු ය. අදෝමය! අඥානයෝ එහිම
ඇලෙති.

මෙතෙකින් හුදී ජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
ජරාජන නම් වූ සසාළිස්වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හතලිස් නව වෙනි පරිච්ඡේදය

1 පිය රජහුගේ ඇවෑමෙන් සතුරන්ට ද මිතුරන්ට ද නිග්‍රහ සංග්‍රහ
2 කරන්ට සමර්ථ වූ ඒ (දප්පුල නම්) උප රජ තෙම රජවී ඒ එජහුගේ ප්‍රඥා
සහිත වූ සේනා නම් වූ මෙහෙසියක්වී. කුඩා පුතෙක් ඇත්තා වූ
3 යහපත් දර්ශන ඇති ඕ තොමෝ රජ හට ඉතා ම ප්‍රිය වී. තමා දෙටුපිත්
4 හට යුව රජ තනතුර දින. අන්‍ය වූ ආදිපාදයා කෙරෙහි දූත් මෙහෙසියන්
කෙළේ ය.

5 රජ තෙම ඔවුනොවුන්ට සුදුසු සේ තනතුරු දී ජනයා චතුස්සංග්‍රහ
වස්තුවෙන්ම විසත්තාරාධනා කෙළේ ය. ඉක්බිත්තෙන් හෙතෙම කිසි
6 යම් හෙයකින් මින්නේරියට ගොස් වසන්නේ වනාහි පසල්රට කිපුනේය
යි ඇසී. එ හෙයින් සෙනෙවියා ද තමා දෙටුපිත් ද ගොස් ඒ දෙපස
7 සන්සිඳුවා සදව්" කියා වහා යැවී ය. ඔවුන් එහි ගිය කල්හි භේද සිත්
ඇත්තා වූ කේළම්මු යම් කිසිවක් කියා නරනිඳු කෙරෙහි ඒ දෙදෙන
8 භේද කරවූහ. එ හෙයින් ඒ දෙදෙන සතුරුව දේසය ගන්ට ආරම්භ
කළෝ. රජ තෙම ඒ අසා ක්‍ෂණයෙන්ම දූරතිස්ස නම් වැව ළඟට
9 පැමිණියේය. ඒ දෙදෙන එතැන දී මරවා ඔවුන්ගේ සියලුම ධනය
10 ගෙණ ඔවුන්ගේ පක්‍ෂ යෙදී පවත්තා වූ සියල්ලන් මරා පොළොන්නරුවට
ගියේ ය.

එ කල්හි රුහුණු රජ භෝගාධිපති වූ දාඨසීව නම් ආදිපාදයන්ගේ
පුත්‍ර වූ මහින්ද නම් ක්‍ෂත්‍රියයෙක් විය. හෙතෙම පියාට විරුද්ධව රජු
11 කරා ආයේ ය. උහු සුදුසු සේ දැන සතුටු වූ රජ තෙමේ ද උහු සතුටු
12 කෙළේ ය. උහු සමග මිත්‍රභාවය ස්ථිර කරනු පිණිස ඒ රජ තෙම දේවා
13 නම් වූ දුව ද සේනාවක් ද උහුට දී රුහුණට ම යැවී. හෙතෙම රාජ
14 සේනාව සමග ගොස් රුහුණ මර්ධනය කරවා පියහු දඹදිවට නෙරපා
රුහුණ ලද්දේය. (එ රජ තෙම) මහා විහාරයෙහි යහපත් වූ ලහබත්
15 ගෙයක් ස්ථිර කොට කරවි. කොලක්ඛිය නම් පිළිම වහන්සේට පෙරහර
පිණිස මහා මහ නම් ගමක් දුන්නේ ය. ශක්ති වූ පරිද්දෙන් පුදා
16 වර්ධමාන නම් වූ බෝධි වෘක්‍ෂ රාජයාගේ දිරූ ගෙය ද කරවා රක්‍ෂා
කරණ පිණිස බොහෝ අය උපදනා කොටුගම ඒ බෝදියට දුන්නේය.
17 නීලාරාම විහාරයට කාළුස්ස නම් ගම දින, ලෝ පිළිමයට ආරාමස්ස
නම් ගම දින. දිරූ (විහාර ද) පියවී කෙළේ ය. පිළිම ද කරවූයේ ය.
18 ප්‍රාසාදයන් ද, චෛත්‍යයන් ද, බොහෝ විහාරයන් ද, (කරවිය) මහත් වූ
කරුණා ඇත්තා වූ ඒ රජ තෙමෙ පොළොන්නරුවෙහි වෛද්‍ය ශාලාවක්
කරවීය. පඩාවියෙහි ද එසේම භෝග උපදනා ගමන් යුක්ත කොට

Non-Commercial Distribution

19 (වෛද්‍ය ශාලාවක් කරවීය) කුදුන්ට ද අන්ධයන්ට ද ඒ ඒ තන්හි ශාලාවන්
ද (කරවීය.)

20 හෙතෙම මනා කොට විනිශ්චය කරණ ලද යුක්ති පොත්හි ලියවා
නැවත අනාගත කලහ භය කරණ කොට ගෙණ රජ ගෙහි තැබ්බවී.
21 පුරාණ ලියුම් නොවළක්වා පූර්වශාසනය රක්‍ෂා කොට නවඩුන්නා නම්
වෙහෙරට බොහෝ භෝග ගම දින. පිය රජහු විසින් මහ දන් හා
අනිකුදු (යම් යම් පිනකුත් කරණ ලද්දේ ද ඒ සියල්ල නො නසා හෙතම
22 ආදර සහිතව රැක්කේ ය. මහ රජුගේ මෙහෙසී තොමෝ ද බොහෝ වූ
23 පින් කරවී. දේවී තොමෝ සෑගිරියෙහි කටුසෑය කළාය. ඕ තොමෝ
24 ජයසේන නම් පර්වත විහාරයද කරවා ගම්වැසි භික්‍ෂු සංඝයාට දුන්නීය.
ඒ විහාරයට ඕ තොමෝ මහුමාර නම් ගම දුන්නීය. මෙහෙණීන්නන්ට
25 සලමේ නම් අසපුවක් කරවා සලමේ අසපුවෙහි මෙහෙණීන්නන්ට පසය
26 දුන්නී ය. ඒ විහාරයෙහි පෙර යම් යම් ගමක් විකුණණ ලද්දාහ ද ඕ
27 තොමෝ වස්තු දී ඒ ගම මුදවා වෙහෙරට දෙවී. සෑගිරියෙහි සියලු
මහරුක් අතු කප්පවා නොයෙක් වර්ණ ඇති ධජපතාකායෙන් පිදී.
28 පූර්වාරාම භාගයෙහි පහය පියවි කෙළේය. ඊට අයිති වූ හීන භෝග
29 ඇති උස්සනවඩී නම් ගම භෝග සමෘධ කරවී. නටුවා වූ ගිරිභණ්ඩ
නම් වෙහෙර පියවි කෙළේය. එහි වැසි භික්‍ෂූන්ට භෝග උපදනා ගම්
ද දෙවී.

30 අඹ උයනෙහි දප්පුල පබ්බත නම් ආවාසය කොට සිව්පසින්
31 සමෘධ කොට තුන් සියයක් භික්‍ෂූන්ට දින. හෙතෙම සිත් කළු වූ
32 තිල්ගලඅරම කරවා බොහෝ පසය උපදනා ජලාවරණයක් කරවා ඒ
ආරාමයට දෙවි. අරිකාරි නම් වෙහෙරෙහි ද දිරූ තැන් පියවි කෙළේ.
33 පෙර නොතිබුණා වූ ලහබත් ගෙයක් කොට පහයක් කරවී. හෙතෙම
මහදුවෙහි සෙනග බෝධි නම් සෑයක් කරවී. බහුශ්‍රැත වූයේ තුන්
34 නිකායෙහි දහම් දෙස්වී. භික්‍ෂූන්ට යහපත් කො ට වටකරණ ලද යකඩ
35 පාත්‍රයන් පිළිගැන්වී. හෙතෙම පින් යයි කියන ලද සියල්ලෙන් කිසිවක්
නො හැර කෙළේ ය. අනාථ වූ කුලවත් ස්ත්‍රීනට පලඳනා දින. බොජුන්
36 කැමති වූවන්ට බොහෝ සේ රාත්‍රියෙහි බොජුන් දින. ගෙරින්ට ගොයම්
37 දින. කවුඩු ආදීන්ට බත් දින, ළදරුවන්ට මී සකුරු යුත් සහල් දින,
මෙසේ පිරිස් සහිත වූ ඒ රජ තෙම පින් කෙරෙමින් පස්වසක් රාජ්‍යය
අනුභව කොට පරිත්‍යාග කෙළේ ය.

38 ඔහු ඇවෑමෙන් උහුගේ පුත්‍ර වූ සම්කාර ගුණයෙන් යුක්ත වූ
මිහිඳු නම් ක්‍ෂත්‍රිය තෙම සිංහලයන්ගේ රජ විය. ධර්මයම පහන් කොට

Non-Commercial Distribution

39 ඇති ධර්මයම ධජ කොට ඇති ශුද්ධ ධර්මය පිහිට කොට ඇත්තා වූ
හෙතෙම ධාර්මික සිලාමේඝ යයි පොළෝ තෙලෙහි පතළ විය. පුරාතන
40 රජ දරුවන් විසින් කරණ ලද ධර්ම මාර්ගානුගතවූ සියල්ල නො පිරිහෙළා
41 කෙළේය. අධර්මය වනාහි දුරු කෙළේ ය. ඒ රජ තෙම රුවන් පහයෙහි
නවකම් කරණ පිණිස ගෙඩුම්බ නම් වූ ජලමාතිකාව හැම කල්හි දෙවි.
42 ජරාවට පැමිණි (චෛත්‍ය) ස්ථානය ද පියවි කෙළේ ය. පින් කම් ද
කෙළේ ය. සිව් වසක් හි රජ කොට පරලොව ගියේ ය.

43 ඒ රජ ඇවෑමෙන් අග්‍රබෝධි රජතෙම හැම සත්ත්වයන්ට
44 නිරවශේෂ වසයෙන් හිත සුව කරවමින් පුරයෙහි සත් නැගුයේ ය.
හෙතෙම ශාසතෘන් වහන්සේගේ සියලු ගුණයන්ට සුදුසු වූ ධාතු පූජාවක්
45 ද මුත්තණුවන් විසින් කරණ ලද්දාවූ බුද්ධ ප්‍රතිමාවට මහා පූජාවක් ද
46 කරවී, ඒ රජ තෙම පියාණන් හා තමන් ම ගෙණ උදාඅග්බෝ නම් වූ
පිරිවෙණක් කරවී. භූත නම් ඇත්තා වූ භෝග සහිත වූ ඒ පිරිවෙණ
47 කොට ස්වකීය ආචාර්යයනටද භික්ෂූන් තුන්සියයකටද දින. ඒ රජ
තෙමෙ සුළු වැව් නම් වූ ගම ධර්ම ශාලාවට දෙවි. කාළුළය මල්ලාවාතය
යන ගම් දෙකෙක්ද දෙවි. හෙතෙම පොහෝ දවස් වල මත්ස්‍ය මාංස
48 සූරා ආදීන් තමන්ගේ ඇතුලු නුවරට ගෙණ ඊම වැළැක් විය. හෙතෙම
49 භික්ෂූන් හෝ චෛත්‍යයන් හෝ වැඳ එ තැනින් නික්මෙන්නේ වැලි
නැති නොවෙත්ව යි සිතා පාදයන් මනා කොට ධෝවනය කෙළේ ය.
50 සඟ සැප එලවන්නා වූ යම් කර්මයකුත් වේ ද තුණුරුවන් කෙරෙහි
පහන් වූ හෙතෙම ඒ කර්ම සියල්ල කෙළේ ය.

51 හෙතෙම දිවා රෑ මෑණියන්ට උපස්ථාන කිරිමෙහි ඇළුණේ විය.
උදෑසනම රජ තෙම මෑණියන් උපස්ථානයට ගොස් හිස තෙල් හා ඇඟ
52 දූලි ආදිය උලා නිය ශුද්ධ කොට ආදර සහිතව නාවා සුව පහස් ඇති
53 අලුත් වත් තමාම හඳවා හළ වත ගෙණ තමන්ම (සෝදා) මිරිකා ඒ
54 වස්ත්‍රයේ ජලයෙන් ඔටුනු සහිතව තමා හිස තෙමා ඒ මෑණියන් සුවඳ
55 මලින් චෛත්‍යයක් මෙන් පුදා ඇය ප්‍රදක්ෂිණා කොට තුන් වරක් වැඳ
56 ඇයගේ පිරිසට වස්ත්‍රාදියෙන් රුචි වූ දෙය මාහැඟි වූ බොජුන් සියතින්
57 වළඳවා, වළඳා ඉතිරි වූ දෙය අනුභව කොට හිසෙහි ද විසුරුවා ගෙණ
ඒ බිසවුන්ගේ පිරිසට ද උතුම් වූ රාජ භෝජනය අනුභව කරවා වාසය
58 කරණ ගෙය ද සුවඳ කවා සජ්ජිත කොට එහි යහනක් මනා කොට
සියතින් පණවා පාදයන් සෝදා සිනිඳු කොට සුවඳ තෙල් ගල්වා මිරිකමින්
59 හිඳ ඇය නිද්‍රාවට පමුණුවා ඇඳ පැදකුණු කොට මොනවට තුන් වරක්
60 වැඳ දසුන් ද කම්කරුවන් ද ආරක්ෂා කාරයන් සේ නියෝග කොට ඇය
61 දෙසට පිටු නොපා පිටපසින්ම ඉවත්ව නො පෙණෙන තන්හි සිට

Non-Commercial Distribution

62 නැවත තුන් වරක් වැඳ ඒ කර්මයෙන් සතුටුව එය නැවත නැවත සිහි
63 කෙරෙමින් ගෙට යේ. දිවි සහිත වූ ඒ බිසවට මෙපරිද්දෙන් උපස්ථාන
64 කෙළේ ය. එක් කලෙක තමා දසෙකුට දාස වාදයෙන් බැණ උහු ලවා
තමාට කමා කරණු පිණිස තෙමේ වචන කියවී. මෑණියන් ලවා තමා
භික්ෂු සංඝයාට දෙවා තමා අගනා දානය දී නැවුණැත්තේ නිදහස් විය.
65 මෙසේ පිනෙහි ඇළුනේ වැ දිවයිනට සංග්‍රහ කොට එකොළොස් වසකින්
දිව්ලොවට ගියේ ය.

66 ඉක්බිත්තෙන් උහු ඇවෑමෙන් උහු මල් වූ දප්පුළ තෙම රජ වී.
ඒ තෙම පුරාතන රජනුගේ සියලු සිරිත් පැවැත්වී. එකල්හි මිහිඳු නම්
67 රුහුණ හිමියාගේ පුත්‍රයෝ පියා විසින් බැහැර කරණ ලද්දේ සිය මයිල්වූ
68 රජහු වෙත පැමිණියහ. ඒ තෙමේ ඔවුන් දැක පවත් අසා මහා සේනාවක්
69 දී නෑයන් වැඩෙහි ඇලුනේ පියා සමග යුද කරන්ට යැවී. රුහුණ
අධිපති වූ මිහිඳු තෙමේ ද එසේ බැව් දන මහා සේනා ඇත්තේ ඔවුන්ට
70 පළමුවෙන් ම යුද කෙළේ ය. සේනාවට නායකයෙක් පමුණුවා ඒ
71 දෙදෙනම පලා ගියාහු නැවත අවුත් මිහිපල්හු සේවනය කරමින් මෙහි
විසූහ. තෙමේ ද ඉන් සතුටු වූයේ අතික් සිය නෑයෙකු සමග යුද
කරමින් මරණ පත්විය. ඒ නෑ තෙමේ ද මෙළේ ය.

72 එකල්හි රජ තෙම කිතුඅග්බෝ නම් වූ බෑණනට සියලු රූප
ගුණයෙන් යුත් දේවා නම් වූ දුව දුන්නේ ය. ඒ (කිතු අග්බෝ) තෙම ඒ
රජහු සෙවුම් පිණිස දප්පුල (නම් මළනුවන්) තබා තමන් සෙනඟ ගෙණ
රුහුණ ගියේය. රුහුණට අධිපතිව සව්කාරයෙන් පිනා ගියේ පුතුන්
73 දූන්ගෙන් වැඩෙමින් එහි ම වාසය කෙළේ ය. ඒ රජ තෙමේ දිරුවා වූ
74 මහා බෝගෙය තහවුරු කොට නවකම් කෙළේ ය, රනින් නිමවූ කම්
කෙළේ ය. හෙතෙම ඒ බෝධි මන්දිරයට මංගල්‍යයෙන් ද යුක්ත වූ
75 තමන් රජ බවටද ශාස්තෘන් වහන්සේගේ පාරමිතාවට ද සුදුසු වූ කම්
76 මොනවට කොට මහත් පූජාවක් පැවැත්වී ය. ඇත්කුස් වෙහෙර දිරූ
77 පහය අලුත් කරවී. වහා දිවයින පර්වතය ලාව නම් අරමක් කොට කරවී.
78 ජේතවන වෙහෙරහි ද රන් මුවා පිළිමයක් කොට බෝධි මන්දිරයෙහි
පිහිටුවා නො සිතිය හැක් වූ පූජා කෙළේ ය. ලක්දිව අවුරුද්දක් පාසා
වස්ත්‍ර දානයක් පැවැත්වී. මහාපාළි නම් දන්සල ද වැඩි කෙළේ.
79 දානසාලාවට ද පස සැපයීමෙන් බැලී. තුලාභාර වසයෙන් දානයක් ද
දෙවි. ජීර්ණස්ථානද පිළියම් කරවී. පෙර රජ කල රජුන් නිවරද වූ සිරිත්
80 පාලනය කෙළේ ය.

Non-Commercial Distribution

81 උහුගේ වජිර නම් මහ නුවණැති සෙනෙවියෙක් විය. හෙතෙම
පාංශුකූලික භික්ෂූන්ට කච්ඡාවල නම් අරමක් කරවී, ථූපාරාමයෙහි
82 වටදාගෙය රන් උළින් මනා කොට සෙවෙති කරවී. ස්වර්ණමය ද්වාරයන්
ද සම්පාදනය කරවී. මෙසේ ඒ (අක්බෝ රජ තෙම) සොළොස් වසක්
83 රජ කොට සියලු සත්ත්වයන් විසින් යා යුතු වූ දේසයට ගියේ ය.

84 ඒ රජ දෙව්ලොවට පැමිණි කල්හි අග්බෝ යන සිය නම් ඇත්තෙක්
එ කල්හි විය. හෙතෙම ඉක්බිත්තෙන් අණබෙර හැසිර වී. උහුගේ පිය
තෙම සිය සොහොවුරුහුගේ මහිඳ නම් වූ පුත්‍රයා සිය පුතුන්ට රජය
85 පත් කරණු පිණිස ඈපා නො කරවි. ඒ මහිඳ තෙම සිය නෑයන්ට ද
මල් සොහොවුරන්ට ද සංග්‍රහ කරණු නොහැක්කේ ව්‍යාකූලව පරතෙරට
86 පලා ගියේ ය. (අක්බෝ රජ තෙම) එවුන් එනු අසා මහ සෙනඟක් යවා
87 ඔවුන් සමග යුද කරවා ඔවුන් හිස් ග්‍රහණය කරවී. හෙතෙම නිකායන්හි
88 කටයුතු සියල්ල ම වාචාරණය කරවා මුළු දිවයිනෙහි ම පව් සිරිත්
වැළැක්වීම කරවි. එකල්හි සුළු වෙහෙරවල භික්ෂූහු සෑම කල්හි ම මහ
89 වෙහෙර කැඳ පිළි ගණිති. ඒ අසා කළකිරුණු සිත් ඇති රජ තෙම
90 කණ්ඨපිඨී නම් මහ ගම ද එසේ ම යාබාල නම් සුලු ගම ද බොහෝ අය
91 උපදනා තෙල් ගම ද ජල මාතිකාවක් දෙවා (ඒ ඒ) විහාරයන්හි කැඳ
පිළි ගන්ට යෙදී. එතැන් පටන් සියලු භික්ෂූහු ආදර සහිතව ම ඒ කැඳ
පිළිගත්හු ඒ තෙම ලක්දිව බෙර හසුරුවා යදින් රැස් කරවා කැමැති
92 පරිද්දෙන් තුන් දිනක් රන් දෙවි.

93 මේ ආදී වූ පින් කම් තුන් වසකිනන් ද මොනවට කොට තුනු
රුවන් කෙරෙහි තමන් පිළිබඳ ප්‍රසාදයා ගේ ඵලය දිව්‍යඥානයෙන්
94 බලන පිණිස යන්නාක් මෙන් ඒ රජ තෙමේ මෙළේ ය.

සියලු සත්ත්වයෝ ඒකාන්තයෙන් මෙසේ අනිත්‍යයහ, සර්වඥයෝ පවා මරණ පැමිණෙත්, එ හෙයින් සසර ඇලුම් සිත් පහ කොට පණ්ඩිත තෙම නිවණෙහි යහපත් නුවණැති වන්නේ ය.

මෙතෙකින් හුදි ජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස පංචරාජක නම් වූ නව සතළිස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් වෙනි පරිච්ඡේදය

1 ඒ රජ ඇවෑමෙන් උහුගේ මල් වූ මහ දනැති සේන නම් කුමර
2 තෙම සියලු සත්ත්වයන් පිය පුතකු සේ බලන්නේ පුරයෙහි සත් එසවී.
3 පෙර රජ දරුවන්ගේ සිරිත් ගෙණ එපරිද්දෙන් මනා කොට පැවැත් විය.
දැහැමෙන් යුක්ත වූ අපූර්ව වූ චාරිත්‍ර ද පැවැත්වී භික්ෂූන්ට ද, භික්ෂූණීන්ට
ද, පාළි පොත හා සසඳා බලන විට, මෙය අධිකයක් යයි සිතේ කටයුතු
4 සියල්ල ලක්දිව් වැස්සන්ට ද මසුන්ට ද මෘග පාක්ෂීන්ට ද කටයුතු
සියල්ල පැවත්වී. හෙතම පරතෙරට ගියා වූ මිහිඳු කුමර (චර පුරුෂයන්)
යොදා මැරවී.

5 දන සොයන යදියන්ට මහ දන් පැවැත් වී. යතීන්ට ද බමුණන්ට
6 ද මන පිනවන රජ බොජුන් දෙවී. මිහිඳු ය, කසුප් ය, උදය යි උහුගේ
මලුන් තුන් දෙනෙක් වූහ. ඔවුන් අතුරෙන් මිහිඳු තෙමේ යුවරජව උහු
7 අනුව පවත්නේ සකස් කොට උහුට උවටැන් කෙළෝ ය. රජහට
8 මෙහෙසි වූ සංඝා නම් බිරින්දක් විය. මුහුදු කෙළි පිණිස රජු පටුනට
9 ගිය කල්හි ඒ උදය නම් ඈප තෙමේ පුරයෙහි නැවැත්තේ ය. එ කල්හි
රාජ රක්ෂණයෙන් රක්නා ලද නාල නම් නැන්දනියන් දුව ගෙණ
පොළොන්නරුවට ගියේ ය. රජ තෙම උහු කෙරෙහි නොකිපී කිපිය
10 නොහැකි වූ සම්බන්ධයක් කොට මා ඈපාණන් යවා උහු සතුටු කරවා
11 මෙහි ගෙන්වී. මෙසේ ඔව්හු සමගි වූහ. එතැන් පටන් ඒ ක්ෂත්‍රියයෝ
12 අතිශයින් සන්සුන්ව සස්නද ලොවද රකිමින් විසූ හ. ඉන් පසු කිසියම්
කලෙක මහා සේනා ඇති පඬි රජ තෙම දඹදිවින් මෙහි අවුත් දිවයින
13 ගන්ට පටන් ගත. රජ තෙම ඒ අසා උහු ළඟට මහා සේනාවක් යැවී.
ඇමැතියන්ගේ විවාදයෙන් රජ තෙම ලද අවකාස ඇති වී

14 පඬි රජ තෙම ඒ සියලු උතුරු දෙස වනසමින් මහා තලිත නම්
15 ගමෙහි කඳවුරක් බැන්දේ ය. එහි ඒ ඒ තැන යම්තාක් දෙමළ වෙසෙද්ද
16 බොහෝ වූ ඒ සියල්ලෝ ඔහුට පක්ෂ වූහ. එහෙයින් හෙතෙම බලවත්
වී. මහාසේනා තොමෝ එහි ගොස් රජහු හා යුද කරනට පටන් ගත.
17 ඇත් කඳ මත්තට පැමිණි පඬි රජ තෙමේ ද (යුදට) වන. ඒ ද්‍රාවිඩ
සේනා තොමෝ හිමියාගේ මුහුණ බලන්නී උහුගේ ප්‍රයෝජනයෙහි
පරිත්‍යාග කරණ ලද ජීවිත ඇත්තී සම්පන්න වූ බලවත් උත්සාහ ඇති
විය.

18 ලක්දිව සේනා තොමෝ හිමියන් නැති බැවින් උත්සාහ රහිතවැ
19 යුද කරන්නී බිඳී ඒ ඒ දිග පලා ගියා. ඒ කෙණෙහි පඬි රජහුගේ මහා

Non-Commercial Distribution

20 සේනා තොමෝ මර සෙනඟ මෙන් මහ ජනයා වෙසෙසින් සුණු කරමින්
යන්නී පැතිර ගියා ය. රජ තෙම සේනාව බූන් බැව් අසා සියලු
හස්තසාර වස්තු ගෙණ පුරය හැර මලය රට බලා ගියේ ය.

21 ඉක්බිති මිහිඳු නම් යුව රජ තෙම ඇතු නැඟී යුද කෙරෙමින් සිය
22 සේනාව පලා ගිය බැව් දැක "ඒකාන්තයෙන් ම හුදකලා වූ මා විසින්
23 මේ සියල්ලන් මරණ නොහැක්කේ ය. මේ නීචයන් අත මැරීම සැල
නොවෙයි, එහෙයින් ම මා විසින් මාගේ මරණය උතුමැ" යි සිතා
24 ඇත්කඳ මත්තේ හුන්නා වූ හෙතෙම තමා හිස කපා ගත්තේ ය. ඒ දැක
25 බොහෝ වූ සේවකයෝ හිස් කපා ගත්හු. ඒ දැක ඒ දෙමළ සේනා
26 තොමෝ තුටුපහටුව සතොස් වී. ඒ කසුපල් ඈපා තෙම සියල්ල දැක
උතුම් අසකු පිට නැඟ යහපත් සේ සන්නද්ධව ආයුධ ගත් අත ඇතිව
27 අබාගිර වෙහෙරට පැමිණ හුදකලා වූයේ ම එබඳු වූ මහා සේනාවට
28 වැද ගුරුළෙක් සයුරෙන් නයින් ගන්නා සේ (සතුරන් ගණිමින්) භේද
29 කෙළේ ය. ඒ තෙමේ ඒ (සතුරන් පිළිබඳ) සියල්ල වැළැක් වී. තමනුත්
30 මනා කොට ආරක්ෂා කෙළේ ය. එක ම අස් තෙම අස් පෙළක් මෙන්
පෙණින. හෙතෙම තමන්ගේ පස්සේ එන කිසි ජනයෙක් නොදක්කේ
31 "එකම මා විසින් සතුරන්ගේ අභිමතය පිරිමෙන් කිමෙක් ද ජීවත්වන්නා
වූ මම අන් කලෙක්හි මාගේ අභිමතය පුරවන්නෙමි. එහෙයින් යන්ටම
32 යුතුය"යි සිතා මහා සේනාව විසුරුවා හැර බිය රහිත වූයේ මහා යෝධ
33 වූ ඒ තෙමේ කොඩිවායට ගියේ ය. එහෙයින් පඬි රජහුගේ මහා
34 සේනා තොමෝ පුරය ගත්තී ය. ඒ යුවරජහුගේ හිස පඬි රජහට දැක්
වූහ. හෙතෙම ඒ දැකම දවා පඬි රට රජුන්ගේ දාහනයෙහි සියලු
35 කටයුතු උහුට කරණට නියෝග කෙළේ ය. රජහුගේ භාණ්ඩාගාරයෙහි
තුබූ සියලු සාරය ගෙන්වා ගත්තේ විහාරයෙහි ද නුවර ද ගත යුතු දෙය
36 ගත්තේ ය. පහයෙහි සියලු රුවන් ද සවණීමය බුද්ධ ප්‍රතිමා ද ගල්
පිළිමයෙහි නෙත් වූ මැණික් දෙක ද එසේ ම ථූපාරාම චෛත්‍යයෙහි
රන් පට ද ඒ ඒ වෙහර වල රන් පිළිමද යන සියල්ල ගෙණ හෙතෙම
ලක්දිව නිසරු කෙළේ ය. සිත් කළු වූ පුරය යකුන් අනුභව කළ අයුරු
කොට හැරියේ ය.

37 රජ තෙමේ මහ මග ඒ ඒ තන්හි රැකවල් දී සැක ඇතිව දෙගංමුව
වාස ය කෙළේ යි, ඉන් පසු පඬි රජ තෙම සිංහල රජහු සමග මිතුරු
38 බැව් කැමැත්තේ ඇමතියන් එහි යැවී. ඒ සිංහලාධිපති තෙම ඔවුන්
39 දකැ ඔවුන්ගේ අස්න අසා ඒ සියල්ල පිළිගෙන කැමතිසේ දූතයනට
40 සංග්‍රහ කොට ඇතුන් දෙදෙනෙක් ද සියලු ආභරණ දී තමහට වැඩ
41 කැමැත්තා වූ තෙමේ උහු වෙත දූතයන් යැවී. පඬි රජ තෙමේ ද ඒ

Non-Commercial Distribution

සියල්ල දැක සතුටු සිත් ඇත්තී ය. එ දවස ම මහ පුරය දූතයන්ට
42 පාවාදීනුවරින් නික්මි නොබෝ කලකින් ම පටුනට ගොස් එහි දී නැව්
නැඟී හෙතෙම සිය දෙසට ගියේ ය. ඉත් පසු සිලාමේඝ නම් [1] රජ
43 තෙම නුවරට අවුත් ලංකාද්වීපය යථා ස්ථානයෙහි පිහිටුවා එකඟ ව
වාසය කෙළේ ය..

දෙවෙනි සොහොවුරු වූ උදය නම් ක්ෂත්‍රිය මාපා කොට ඔහුට
44 භෝග පිණිස දකුණු දෙස දින. හේ තෙමේ ද නොබෝ කලකින් සුදුසු
45 පරිද්දෙන් පින් කොට එක් රෝගය කින් ස්පර්ශ කරණ ලද්දේ මරු
මුවට ගියේ ය. කසුප් නම් ඈපා තෙමේ ද පොළොන්නරුවෙහි
46 වෙසෙමින් පඬි රජු හා සමග යුද කරන්නේ මරණ ලද්දේ ය. එකල්හි
47 කසුප් නම් ආදිපාදයන් ගේ මහාර්ග වූ පින් ලකුණෙන් යුත් පුත්තු
සතර දෙනෙක් වූහ. එවුන් අතුරෙන් සියල්ලන්ට පළමු වෙනි වූ සේන
48 නම් යම් කුමරෙක් වී ද හෙතෙම ශූර වීර වූ මහොත්සාහ ඇති රාජ්‍ය
49 භාර දැරීමෙහි පොහොසත් වූ අසමානයෙක් විය. රජ තෙම මහ ඈපා
බැව් විධි වූ පරිද්දෙන් උහුට දී භෝග පිණිස වාහන සහිත වූ දකුණු
දෙස දින

50 රුහුණට අධිපති වූ කිතු අග්බෝ කුමරහු ගේ පුත්තු සතර දෙනෙක්
51 වූහ. දැකුම් කටයුතු වූ මන පිණවන්නා වූ දූන් තුන් දෙනෙක් ද වූහ.
එකල්හි උහුගේ දෙටු පිත් වූ මිහිඳු කුමරහු උහු නැන්දනී තොමෝ
මරවා උහුගේ උපකරණ සහිත වූ දේසය ගත්තී ය. ඒ සහෝදරයෝ
52 තුන් දෙන ඒ සොහොවුරා මැරීමෙහි රොස් වූවෝ සහෝදරියන් තුන්
53 දෙන රැගෙන රජු කරා ආවෝ ය. රජ තෙමේ ද ඔවුන් දැක කරුණා
බහුල වැ ආදර කරමින් ප්‍රේම ඇතිව ඒ සියල්ලන් දෙව් කුමරුවන්
සෙයින් සැපසේ වැඩී ය.

54 ඉක්බිති ඒ රජ තෙම ඔවුන් අතුරෙන් වැඩි මහල් කසුප් කුමර "
55 ඒ දෙස ගනුව" යි සේනාව දී යැවී. හේ තෙමේ ද ගොස් ඇය මරා
සියලු ම රුහුණ අත් පත් කොට එහි උවදුරු රහිත ව විසී ය.

56 ඉක්බිති හෙ තෙමෙ සේන උදය යන සොහොවුරන් දෙදෙන ද
කැඳවා දේසය බෙදා දී ඔවුන් සමග විසූයේ ය. රජ තෙම ඒ කුමරියන්
57 මනා කොට වඩා දිවසරන් බඳු මනා රූ ඇති පින් ඇති යොවුන් පත්

1. සේන නමින්ද කියන ලදී

Non-Commercial Distribution

57 රජ කුමරියන් තුන් දෙනා අතුරෙන් සංඝා නම් වූ කුමරිය රජිනි තන්හි
58 තබා රජය සම වූ මහා භෝග දී උප රජහට දෙවි. බාල සොහොවුරු
59 වූ සියල් ගුණනේ යුත් සියල් සතරෙහි විසාරද වූ උප රජ වූ මිහිඳු නම්
60 ක්ෂත්‍රියෙක් ද ඇත. රජ තෙම ඕහට රිසි සේ භෝග දානය කොට
තිස්සා නම් වූ ද කිත්ති නම් වූ ද සිත්කළු වූ රජ කුමරියන් දෙදෙන
දුන්නේ ය.

61 ඒ රජ තෙම මෙසේ නෑයන්ට සුදුසු සේ සංග්‍රහ කරමින් දානාදි
සංග්‍රහයෙන් මහජනයා ද සතුටු කරමින් රජුන්ට අයත් දස දහමින්
62 යෙදුනේ පින් රැස් කරමින් රට පරිභෝග කෙළේ ය. අරිට්ඨ පව්වෙහි
පාංශුකූලික භික්ෂූන්ට සෘඬියෙන් මවන ලද්දක් මෙන් මහාභෝග යුක්ත
63 වූ ආරාමයක් කොට දින. ඒ අරමට නිරවශේෂ වශයෙන් රාජ යෝග්‍ය
64 වූ පෙරහර ද බොහෝ වූ දස්කම්කරු ආරාමිකයන් ද දින.

65 බුදුබව කරා ගිය සිත් ඇත්තා වූ ඒ මිහිසුරු තෙම ජේතවන නම්
66 වෙහෙර නොයෙක් මහල් ඇති පහය කරවී. සර්වස්වර්ණමය වූ ජින
පිළිමයක් කරවා එහි වඩා හිඳුවා මහාභෝග පිහිටුවා එහි භික්ෂූන් වැස්
67 වී. එම වෙහෙර මහ පිරිවෙණහි ගින්නෙන් දන ලද, පහය අතිශයින්
මනරම් කොට කරවි. අභයුත්තර නම් වෙහෙර වීරඞ්කුර නම් ආරාමයක්
68 කොට මහා සාංඝික පරම්පරාවේ භික්ෂූන්ට ද මහ වෙහෙර වැසි
69 භික්ෂූන්ට ද දෙවි. හෙතෙමෙ සංඝා නම් වූ තමන් බිසවත් සමග
70 පූර්වාරාමය ද සිවුපස සමපන්න කොට කරවී. මහනුවණැති මිහිපල්
තෙමේ ඒ බිසව සමග මහ වෙහෙර මහාභෝග යුක්ත වූ සංඝසේන
නම් ආවාසය කරවී.

71 උතුම් රජ තෙම සියල්ල රන් මුවා කොට කෙස් දා කරඬුවක්
කරවා මහපුද පැවැත් වූයේ රජය ද පරිත්‍යාග කෙළේ ය. සෑගිරියට
72 බොහෝ අය උපදනා කණාවැව දින. ලක්දිව වැසි වූ සමණන්ට තුන්
73 සිවුරු දින. පොළොන්නරුවෙහි තුසා වැවෙන් වැව් කෙළේ ය.
'ග්‍රාමාරාමිකයන් ගෙන් යුක්ත කොට සෙන් අග්බෝ නම් ආවාසය (කරවී)
74 එහිම මහා පාළි නම් දන්හල මනා බොජුන් ඇති කරවූයේ ය. මානෙත්
පව්වෙහි සියලු භික්ෂූන්ට මහාපාළි නම් දන් හලක් (කරවී) නුවරට
බටහිර දිග වෙද හලක් ද කරවී. අනාථ ජනයාන්ට කැවිලි සහිත කැඳ
75 දනක් පැවැත් වී ය. උත්තම තෙම පාංශුකූලාංග ධර භික්ෂූන්ට වෙන්
වසයෙන් මුළුතැන් ගෙයක් කොට සතතයෙන් සකස් කොට බොජුන්
දෙවි.

Non-Commercial Distribution

76 මේ තෙමේ මහ ඈපා වූ (කල) කපුරු පිරිවෙනෙහි ද උත්තරාළ්හ විහාරයෙහි ද තමන් නම් ඇති කොටස් කරවී. මහා ධන ඇති ඒ රජ
77 තෙම තුන් වරක් තුලාභාර දෙවී. ඒ රජ තෙමේ අනිකුදු නානා විධ වූ
78 පින්කම් ද කෙළේ ය. ඒ රජුහගේ සංඝා නම් වූ මෙහෙසී තොමෝ ද
79 උතුරු වෙහෙර මිහිඳු සේන වම් වූ ද ආවාසයක් කොට භික්ෂූන්ව වැස්වී.

80 නුවණැත්තා වූ දප්පුළ නම් රජහුගේ කාලයෙහි මහාදේව නම් ඇමතියා විසින් ඒ රම්‍ය වූ දප්පුල පර්‍වත නම් වෙහෙර පටන් ගන්නා
81 ලදදේ ය. දාරුකසුප් නම් ඇමතියා විසින් කස්සප රාජක නම් වෙහෙර එසේම (පටන් ගන්නා ලද්දේ ය) අඩාල කරණ ලද්දා වූ දෙකම ඒ රජ
82 තෙමේ නිම විය. උහු ගේ භද්‍ර නම් සේනාපති තෙම මහත් වූ භොග යුක්ත භද්‍ර සේනා පති නම් පිරිවෙන ද දසුන් හා භෝග යුක්ත කොට
83 කර වී. උතුරු නම් ඇමති තෙමේ ද අබාතුර නම් වෙහෙර අධික වූ පස
84 ඇති සිත්කළු වූ උතුරු සෙන් නම් ආවාසය කෙළේ ය. එහි ම විදුරු නම් ඇමති තෙමේ ද විදුරුසෙන් නම් ආවාසය කෙළේ ය. රකුස් නම් ඇමති තෙමේ ද රකුස් නම් ආවාසය කෙළේ ය.

85 ඉන් පසු පොළොන්නරුවෙහි වෙසෙමින් විසි හවුරුදු ඇවෑමෙන් සාරදර්ශී වූ ඒ (රජ) තෙම පඬි රජහු විසින් කරණ ලද ක්‍රියාව සිහි
86 කරන්නේසූර වූ සෙන් කුමර හට අවකාශ දෙන්නා සේ ලක්දිව හැර මහ පවනින් පහරණ ලද පහනක් මෙන් පරලොව ගියේ ය.

87 ජීවිතය සමගම භෝගයෝ අනිත්‍යය හ. පළමු කොටම නෑයෝ ද යහළුවෝ ද අනිත්‍යය හ. හුදකලාවම ඉතා දරුණු වූ මරු මුවට වන් නර නිඳුහු බලවී.

මෙතෙකින් හුදී ජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස එක රාජක නම් වූ පණස් වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් එක් වෙනි පරිච්ඡේදය

1 මෙසේ උහු මළ කල්හි උහුට කටයුතු මොනවට කරවා සේන
2 නම් වූ මා ඇපා තෙමේ බලවාහන ගෙණ නුවරට අවුත් පොළෝ
3 තෙලෙහි රජ වී. ආදි කල්පයෙහි රජ දරුවන් සිරිත් දක්වන්නාසේ
ශ්‍රද්ධා ඇත්තේ මහාධන ඇත්තේ නොමසුරුව දන් දෙන්නේ ආලය
4 රහිත වූයේ සූර වූයේ යදියන් කෙරෙහි දන් දීමෙහි යෙදුනේ මහත්
භෝග ඇත්තේ සමෘධ වූ බල වාහන ඇත්තේ, නිර්මල වූ කීර්තියෙන් හා
එසේ ම තේජො ගුණයෙන් ද චන්ද්‍ර සූර්‍ය්‍යයන් එක තැන්පත් වීමක්
මෙන් දැක් වී. නොකිළිටි ගුණයෙන් ගැවසුණේ මනා කොට සොයා
5 දන්නා ලද ගුණා ගුණ ඇත්තේ පවින් එතෙර වූයේ සසර කළ
කළකිරුණේ සාර වූ දර්ශන ඇත්තේ විය.

6 උහු ගේ සංඝා නම් වූ බිරින්දක් වී ද ඒ දේවිය පිළිවෙළින් පවත්
7 වන ලද පෙරෙහර දී මෙහෙසි බැව් හි අභිෂේක කෙළේ ය. හෙතෙමේ
මිහිඳු නම් ප්‍රඥා ඇති සිය මලනුවන් ලංකා දක්ෂිණ භාගය දී උප රජ
තන්හි අභිෂේක කළේ ය.

8 හෙතෙමේ අන්තඃපුරයෙහි වැද රජ හු දත් කල්හි අඹුදරුවන්
සමග නැගී අප්‍රසිද්ධව මලය දෙසට ගියේ ය. එකල පනාද රජහුගේ
9 කුමාරයන් රූප ශ්‍රී තමහට දක්වන්නා සේ රජහුගේ සංඝා නම් බිසවගෙන්
පුත්‍රයෙක් උපන.

10 උපන් කෙණෙහිම ලුම්බිණි වෙනෙහි උපන් සිදුහත් කුමරු දැක
සුදොවුන් මහ රජු සෙයින් රජ තෙමේ උහු දැක සතුටු වී ධාන්‍යන පුණ්‍ය
11 ගුණ යුක්ත වූ මාගේ පිත් තෙමේ මේ එක දිවයින තබා සියලුම දඹදිව
රජයට සුදුසු යයි (සිතා) නම දෙන දවස්හිම සර්වප්‍රකාරයෙන් පෙරහරින්
12 යුක්ත වැ යුවරජ තන්හි අභිෂේක කොට දකුණු දෙස උහුට දුන්නේ ය.
13 යුව රජ තෙමේ ද මළය රට වෙසෙමින් (නරනිඳුහු) අපායෙන් සතුටු
කොට සිය සොහොවුරා විසින් අනුදන්නා ලද්දේ තුන් නිකාය වැසි
14 භික්ෂූන් සමග ආයේ රජහු දැක මේ තැන දීම කොප්‍ය නො විය හැකි
මිත්‍රත්වයක් කෙළේ ය.

15 ඒ යුවරජහු ගේ තිස්ස නම් යම් බිරින්දක් වී ද ඕ තොමෝ සංඝා
නම් දියනිය ඉපිද විය.

Non-Commercial Distribution

16 කිත්ති නම් අන්‍ය වූ යම් බිරිඳකුත් වී ද ඕ තොමෝ වනාහි පුතුන්
17 සතර දෙනෙක් ද එසේම එක දුවක් ද ඉපද වී. එකල්හි පණ්ඩිත වූ රජ
තෙමේ මෙසේ වූ කල්හි මාගේ මල් තෙමේ මා කෙරෙහි නිසැක වන්නේ
18 යයි මොනවට ඇමතියන් සමග මන්ත්‍රණය කොට යුවරජහුගෙ යහපත්
රූ ඇති සංඝා නම් දියණියන් කසුබ් නම් සිය පුතුට විවාහ කරවී.

19 හේ තෙමේ දකුණු දෙස මෙම මලනුවන්ට ම දුන්නේ ය.
රාජපුත්‍රයාට වෙන් වශයෙන් තමන්ගේ භෝගය ම දුන්නේ ය. සියලු
20 රජය උහුගේ පරිභෝගයට දෙවි. ලක්දිවට හිත එල වන්නේ හුදෙක්
ලක්දිව් විචාරණ තෙමේ කෙළේ ය. පින් කම් ඇත්තා වූ ඒ දෙදෙනාගේ
21 සංවාසයට පැමිණ ධන්‍ය පුණ්‍ය ගුණයෙන් යුක්ත වූ පුතුන් හා දූවරු
උපන්හ.

22 ඒ රජ තෙමේ සියලු පූජෝත්සවයෙන් දළදා මහා පූජාවක් කොට
23 රුවන් නම් මහපහයට නැගී එ කල්හි ස්වර්ණමය වූ ප්‍රතිමාව පූර්වයෙහි
පිහිටි පීඨය පවා හිස් වූවා දැක "කුමක් හෙයින් මෙසේ වීද?"යි කියේ ය.

24 ඉක්බිත්තෙන් ඇමතියෝ (කියන්නෝ) "දේවයන් වහන්ස, නො
දන්නා සේක් ද? නරේන්ද්‍රයාණනි, නුඹ වහන්සේ ගේ මහ පිය රජහු
25 දවස පඬි රජ තෙමේ මෙහි අවුත් මේ දිවයින වනසා දිවයිනෙහි සියලු
සාරය හැරගෙණ ගියේ"ය කීහු.

26 ඒ අසා තෙමේ පැරදුනා සේ ලජ්ජා ඇත්තා වූ රජ තෙමේ
එදවස්හි ම සේනා සංග්‍රහයෙහි ඇමතියන් යෙදී.
ඒ කල්හිම වනාහි පිය රජහු විසින් පරිභව කරණ ලද්දා වූ පඬිරජ
27 කුමරෙක් තෙම රාජ්‍යය පිණිස කරණ ලද නිශ්චය ඇත්තේ මෙහි ආයේ
ය.

28 රජ තෙමේ උහු දැක ඉතා සතුටු වූයේ උහුට කටයුතු (සත්කාර)
කරවා මාතොට පටුනට පැමිණ හෙතෙමේ එහි වෙසෙමින් දෙව්
29 සෙනඟක් සේ සදන ලද මහත් වූ සේනා සමූහයක් ද ඊට උපකරණ ද
අඩු නො කොට පිළියෙළ කරවා "පඬි රජ කුමරු හා සමග ගොස් ඒ
30 පඬි රජු මරා පෙර මේ රටින් ගෙණ යන ලද්දා වූ සියලු රුවන් ගෙණ
31 මොහුට රාජ්‍යය දී නොබෝ කලකින් එව" යි කියා මහත් ඉසුරු ඇතියේ
සිය සෙනෙවියා යැවීය.

Non-Commercial Distribution

32 සෙනෙවි තෙමෙ ද "එසේ කෙරෙමි"යි රජහට පිළිවදන් අස්වා
වැඳ සේනාව ගෙණ එකෙනෙහි නැව් නැඟී එයින් පරතෙරට පැමිණ
33 පිරිවරණ ලද සේනා වාහන ඇත්තේ පසල් රට වසමින් මදුරා පුරය වට
34 කෙළේ ය. දොරවල් අවුරා යාම් ඊම් සුන් කෙළේ, නුවරට ඇතුළු වූ
35 සිංහල සේනාව සියල්ල පැහැර ගනිමින් සෙනග නසන කල්හි එ පවත්
පඬි රජ අසා සිය සේනාව ගෙන වේගයෙන් ඒ සේනාව කරා පැමිණ
36 යුද කරන්ට පටන් ගත.

37 ඒ රජ තෙම අසම්පූර්ණ සේනා ඇති බැවින් ඇත්කඳ මතුයෙහි
උන්නේ ම මැරයකින් විඳින ලද්දේ සියපුරය හැර පලා ගියේ
අස්ථානයෙහි සිය දිවි හළේ ය. උහුගේ භාර්යා තොමෝ ද ඒ හා සමග
38 ජීවිතක්ෂයට පත් වූවා ය. ඉක්බිති ඒ සිංහල සේනා තොමෝ බිය
39 රහිතව නුවරට පිවිස දෙවියෝ අසුර පුරය පැහැර ගත් සේ එහි සියල්ල
40 පැහැර ගත. ඉක්බිති සෙනෙවි තෙම මේ දිවයිනෙන් ගෙණ යන ලද්දා
වූ ද එහි තිබුණා වූ ද රජගෙයි මහරු බඩු බලා, දේසයෙහි ද නුවර ද
41 තුබුණා වූ සියලු සරු දෙය ගෙණ එහි අධිපතිභාවය කොට පඬි රජ
කුමරහු තමා වසඟ කොට ඒ රාජ්‍යයෙහි අභිෂේක කොට පෙරහර ද
42 කරවා දේසය උහුට පමුණුවා ඇතුන් අසුන් හා මිනිසුන් ද රිසි සේ
43 ගෙණ කිසි තැනකින් බිය නැත්තේ ඒ ඒ තන්හි කැමති සේ වසන්නේ
මුහුදු තෙරට අවුත් එහි සැප සේ සිට විසාරද වූ හේ තෙම ක්‍රීඩා
44 කරන්නා සේ නැවකට නැඟී මඟ තොටට අවුත් මිහිපතිහු වැඳ ඒ
45 හස්න දන්වා ගෙනෙන ලද සරු දෙය දක්වි රජ තෙමෙ " යහපතැ"යි
46 කියා උහුට සංග්‍රහ කරවා ඉතා සතුටු වූ සේනාව සමග සිය පුරයට
අවුත් ජයපානය කොට විජය මගුල් පවත්වා යදියන්ට රිසි වු පරිද්දෙන්
47 මහා ත්‍යාගයක් පවත්වා ආලය රහිත වූයේ දිවයිනෙහි සරු වූ සියල්ල
48 ප්‍රකෘතිමත් කෙළේ රන් මුවා පිළිම ද තුබු තුබු තන්හි තිබ්බවා රුවන්
පහයෙහි ශාස්තෘහුගේ හිස් වූ පුටුව පිරවී. රැකවරණ විදහනින් පොළෝ
49 තලය නිර්භය කෙළේ ය. එතැන් පටන් හෙ තෙම ලංකාද්වීපය සතුරන්
50 විසින් වැනසිය නොහැකි කොට උතුරු කුරු දිවයින මෙන් භෝගයෙන්
51 වැඩුයේ ය. පෙර රජ කල්හි බැගෑපත් වූ දිවයින ජනයෝ මේඝයට
52 පැමිණ නිවුනු ගිම් සේ උහු කරා පැමිණ නිවුනෝ ය. ඒ රජහට විසි
53 වෙනි වර්ෂයෙහි අභයගිරි විහාරයෙහි පාංශුකූලික භික්ෂූහු නික්ම ගියහ.

ඒ මිහිඳු නම් වු යුව රජ තෙමේ ශාස්තෘන් වහන්සේගේ බෝධි
ද්‍රැම රාජයාහට දකුම් කටයුතු මන් පිනවන්නා වූ රම්‍ය වූ ගෙයක් කරවී.
54 එ කල්හි ඒ බෝ ගෙය කරන්නා වූ වඩුවෝ හුණ දණ්ඩෙන් උතුම් බෝධි
වෘක්ෂයාගේ ශාඛාව ප්‍රහාර ලැබ බිඳෙන්නා දැක "මෙ තැන්හි කුමක්

Non-Commercial Distribution

කටයුතු දැ"යි යුවරජහට සැල කළෝ. හේ තෙමේ ඒ බෝධි වෘක්ෂයා
56 කරා එළඹ මහපුදින් පුදා "ඉදින් සර්වඥයන් වහන්සේ සියලු ප්‍රාණීන්ට
වැඩ පිණිස උපන්නේ නම් මෙහි ගෙය කිරීමෙන් අනර්ඝ පුණ්‍යයක්හුගේ
57 ලාභ ඇත්තේ වෙම් නම් යම් සේ ගෙය කරණු හැකිවේ ද එ පරිද්දෙන්
ශාඛා තොමෝ උඩට ම යේවා " යි මෙසේ ආරාධනා කොට වැඳ
58 ස්වකීය භවනයට සම්ප්‍රාප්ත වූයේ ය. එකල රාත්‍රියෙහි බෝධිවෘක්ෂයාගේ
ශාඛා තොමෝ උඩට නැංගේ ය. ඉක්බිති කම්කරුවෝ ඒ සියල්ල සිය
හිමියාට කීහු.

59 අතිශයින් සතුටු වූ යුවරජ තෙමේ සොහොවුරු වූ රජ හට
60 සැලකොට බොහෝ වු ධන විසඳා මහපුදින් පිදී, හේ තෙමේ එසේ ම
මිහිඳු සෙම් නම් පිරිවෙණක් ද කරවා භෝග සහිත කොට සංඝයාට
60 දින. අනිකුදු පින් රැස් කෙළේ යි. හේ තෙමේ තමන් පරිභෝග කරණ
ලද්දා වූ වස්ත්‍ර ද කුඩය ද වහන් ද එසේ ම ගම්ක බත් ද භෝජන සහිත
වූනහන ජල ස්ථානයක් ද දින.

62 මෙසේ ඒ යුවරජ තෙමේ ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර වූ පින් කොට රජ හට
තිස් තුන්වෙනි වර්ෂයෙහි කම් වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත විය.
63 ඉක්බිත්තෙන් උහු මළ කල්හි රජ තෙමේ තමන් කිස් දොවුන් මල් වූ
උදය කුමරහු උහුගේ තන්හි තබා ඒ යුවරජහු සතු සියලු උහුට දින.

64 හේ තෙමේ තුලාභාර දීමෙන් බැගෑපත් වූ අනාථයන් සැතැප්වී.
65 තුන් නිකාය එකතු කොට ධර්මකර්මයෙන් ශුද්ධ කෙළේ ය. හේ තෙමේ
66 රන් තලි දහසක් මුතුවෙන් පුරවා ඒ මත්තෙහි මහාර්ඝ වූ මැණික් එක
67 එක තබා බමුණන් දහසකට ශුද්ධ වූ රන් බඳනෙහි කිරිබත් වළඳවා රන්
හු දෙවා එසේ ම රිසි සේ අභිනව වූ වතින් හඳවා පින් ඇත්තේ මහ
පෙරහරින් සැතැප්වී.

68 ලක්දිව් වැසි වු භික්ෂූන්ට තුන් සිවුරු දුන්නේ සියලු ස්ත්‍රීන්ට
69 ඉතා මනෝහර වූ වස්ත්‍ර ද දින. ලෝවාමහාප්‍රාසාදය විජයොත් නම්
පහය සම කොට කරවා රනින් ගන කොට මිණි ඔබ්බ වන ලද පිළිමය
70 එහි වැඩුයේ ය. (ඒ ලෝවා මහ පහය) සියලු බුදුවරයන්ගේ (කාලයෙහි)
පොහො ගේ බව අසා "මේ පහය තෙමේ හිස් නොවෙව් " යි එය
සංඝයාගේ වාසස්ථාන කෙළේ ය.

71 ඊට භෝග උපදනා ගම් ද දුන්නේ ආරක්ෂකයන් ද යෙදී. දෙතිස්
72 නමක් පමණ භික්ෂූහු වෙසෙත්ව" යි නියම කෙළේ ය. හේ තෙමේ

Non-Commercial Distribution

ගංගාවේ මිණිමෙවුලා නමින් ම මරියාදාවක් (හෝ මියරක්) කරවී.
මින්නේරි වැව්හි හොරොව්වක් ද කරවී.

හෙ තෙම කටුන්නරු වැව ද, කණ වැව ද බැඳවී. සැගිරියෙහි
73 වෙද සලක් ද කරවී. බුද්ගමු වෙහෙර ද, මියුගුණ වෙහෙර ද, කුළුතිස්
74 වෙහෙර ද භෝග උපදනා ගමින් වැඩී මණ්ඩල ගිරි වෙහෙරට තමා
75 සතු ගම් දින. උත්තරාළ්හ නම් පිරිවෙණහි පහයක් කරවී. මහසෙන්
76 නම් පිළිමයට ගමක් දී රැකවරණ කරුවන්ට දින. හෙප් නම් වෙහෙර
77 ද පිළිම ගෙයක් කරවී. මිණිමෙවුලා නම් පහයෙහි බෝසත් රූ ද වැඩී.
ගල් පිළිම වහන්සේ ගේ දිරූ ගෙය ද කරවී. රජ තෙමේ එහි මැදුර
78 සහිත ව ඒ බෝසත් රුව ද පිහිට වී. බෝධි වාක්ෂයාගේ තෝ තැන්න
බැඳ මහ පුදක් කෙළේ ය. සියලු රුවන් සූත රන්පට ලියා ඊට මහ
79 පුදක් කෙළේ අබිදම් කියවී.

80 ආනන්ද තෙරුන් පිළිරුව ගෙණවුත් නුවර පැදකුණු කොට භික්ෂු
81 සංඝයා ලවා වීදියේ පිරිත් කියවා පිරිත් පැන් ඉසීමෙන් ජනයා නිරෝගි
82 කරවා රජ තෙම මෙසේ රෝග භය ද සිය දෙසින් බැහැර කෙළේ යි.
83 රුවන් වැලි සෑයෙහි දී අබිසෙස් ගෙණ ඒ සිරිත අවුරුද්දක් පාසා
කරන්ට ලියවී. හෙතෙම මසකට සිවු වරෙක් පොහෝ දවස්හි සාර
84 දහසකට බත් සහිත වස්ත්‍රදානය දින හෙතෙම දුගී දනන් හා එක්ව
85 ඔවුන්ට රිසි සේ බත්, පැන් වත් දී වෙසඟ කෙළි කෙළියේ ය. ලක්දිව
ඉක්බිසඟනට නිති දන් පැවැත් වී දුගී මගී යදියන් දනින් සැතැප් වි

86 ඒ රජහුගේ සංසා නම් මෙහෙසි ද අභයුත්තර නම් වෙහෙර
භෝග සහිත කොට පර්වතාකාර සංඝසේන නම් වෙහෙරක් කරවී.
87 ශෛලමය ප්‍රතිමා වහන්සේට නිල් සිළුමිණක් ද කරවී. සියලු
උපහාරයෙන් යුක්ත කොට බුදුන්ට පූජාවක් සෑම කල්හි කළා

88 සූර වූ තුඪක නම් වූ උහුගේ සෙනෙවි තෙමේ ද මහත් භෝග
89 ඇති කොට සේනාපති නම් වූ පිරිවෙණක් කෙළේ ය. මෙසේ පිරිස්
සහිත වූ ඒ මහා යසස් ඇති (සේන නම් රජ) තෙම පින් කොට පන්තිස්
90 වන වසෙහි දෙව් ලොව ගියේ ය. ඉක්බිත්තෙන් උහු බාල මල් සියලු
පියොවින් ලක්දිව් වැස්සන්ට වැඩ කැමැති වූ උදය නම් ක්ෂත්‍රිය තෙම
රජවී.

91 හෙ තෙම තමන් රජ වැ සිය සොහොවුරු පිත් කනිටු වූ කසුප්
කුමරහු මාපා තන්හි තැබී. රජ තෙමේ "නෑයන්ට සංග්‍රහ කටයුතුය " යි

Non-Commercial Distribution

92 සිතා මෙසේ කසුප් නම් වූ සහෝදරයාගේ පුත්‍රයාට යුව රජහුගේ සේනා
නම් දියණිය භාර්‍යා කෙළේ රජ තෙමේ අන්‍ය වූ තිස්සානම් දුව තමන්
93 භාර්‍යා කොට ගත්තේ ය. කිත්ති නම් රජ දුව ගෙන් උපන් මිහිඳු උප
94 රජහු පුත් වූ නුවණ මඳ වූ කිතු අග්බෝ නම් ඈපා තෙම මහ රජහට
95 සොර වැ රැ නික්ම හුදකලා වැ අප්‍රසිද්ධ වේශයෙන් රුහුණට පැමිණ
96 ජනයා අත් පත් කොට සියලු ඒ දේශය වනසා හෙ තමෙ එහි සිටියා
වු තමන් මයිල්හු මැරවී.

97 ඒ අසා මිහිපල් තෙම උහු කෙරෙහි බෙහෙවින් කිපී හෙතෙම
උහු ගෙන් වනු පිණිස යම් කිසිසේ උපා සොයන්නේ හෙතෙම
සොහොවුරු පිත් වූ ඒ කසුප් යුව රජහු කැඳවා "මහා පිනැත්ත මට
98 සහය වෙව"යි කථා කෙළේ ය. "මා විසින් කුමක් කටයුතු දැ"යි
99 හෙතෙම කී ය. රජ තෙම (මෙසේ) පිළිවදන් කී. "තොපගේ පුත් වූ ඒ
මිහිඳු තෙමේ වැඩි විය පත් වූයේ මහ බලැත්තේ ය, මව ගෙන් ද පියා
100 ගෙන් ද රුහුණු දෙසට හිමයෙක සූර ය සියල්ල ඉවසන්නේ ය. වීර්‍ය
101 ඇත්තේ දක්ෂ වූයේ කරණ ලද සිප් පුරුදු කම් අත්තේ ය. යුද්ධයට
යෝග්‍ය වූ නුවැත්තෙක, නිපුණය ක්‍රමයෙන් දක්ෂය, උහු යවාමයිල්හු
102 මැරූ පාපියා ගෙන්වම්හ." රජහු ගේ එබස සා ආදර සහිත වූ කසුප්
තෙම කියේ ය. "දේවයන් වහන්ස, දෙවයන් වහන්සේ විසින් කියන
103 ලද්දා වූ මම යන්නෙමි. මපිත් තෙම කිමෙක, ජනාධිපතිය, මාගේ
වංශය ද නුඹ වහන්සේගේ ප්‍රසාදය ද රක්නා ලද්දේ වන. එහෙයින්
කල් නො යවා යමක් කැමැති නම් එසේ කරව"

උහුගේ එ බසසා ඉතා සතුටු වූ ඒ රජ තෙම බෙහෙවින් සතුටු
104 වැ මහා සේනා සමූහයක් සර්වප්‍රකාරයෙන් පිළියෙළ කොට මහින්ද නම්
105 ඒ රජ පොව්වා මහ පෙරෙහරින් එක්නට විදුරග නම් අධිපතීහු නියෝග
106 කොට පුරය සිස් සේ කොට සියලු සේනා වාහන ද සියලු උපකරණ
ද නො අඩු කොට උහුට දෙවා රජ තෙමේ පයින් ම උහු පස්සේ යමින්
"මහ පිනැත්ත, යන පොළොව රකුව"කියා යැවී. ඒ මිහිඳු තෙම දෙව්
107 සෙනඟ විසින් පෙරටු කරණ ලද මහේන්ද්‍ර තෙම සුරාසුරයන්ගේ මහ
108 යුදට යන්නා සේ බැබළී. හෙ තෙම ගොස් නොබෝ කලෙකින් ම ගුත්
109 හලට පැමිණියෝ ය. ඉක්බිති සියලු දනව් වැස්සෝ රැටියන් වැස්සෝ
110 රැටියන් සහිත වූ මණ්ඩලාටිපතීහු ද ඒ මාතුල ඝාතක වූ පව්ටා විසින්
කරණ ලද උපද්‍රව ඇත්තා වූ අප විසින් හිමියෙක් ලබන ලද්දේ යයි
111 ගොස් උහු පිරිවරා ගත්හ. ගිරිමඬුල්ලෙහි සිටි (ඉසුරෙන්) ගිළිහෙන ඒ
සොර තෙමේ ද සියලු මාහැඟි රජ සතු බඩු අත් පත් කොට ඇතුන්
අසුන් ද ගෙණ ගොස් පව්වට නැංගේ ය.

Non-Commercial Distribution

මිහිඳුහුගේ සේනා තොමෝ උහුගේ සේනාව ඒ ඒ තැන මරමින්
112 උහුගේ ම පසු පස්සේ යමින් ඇතුන් අසුන් කඳු අසබඩ දී දක (ඒ)
113 ගෙණ " මෙ තැන හේ තෙමේ ඇතැ"යි සියලු ගිරිගහණය මඩිමින්
114 නදීන් හා ජලධාරාවන් ද මාර්ගය සමාන කරමින් එහි පිවිසියේ ය.
හෙතෙම ජනයා දක ක්‍රෝධයෙන් මඩනා ලද්දේ ළදරුවෙකු සෙයින්
115 තමන්ගේ සියලු රුවන් ගං හෙප් ඉවුරු ආදි තන්හි දැමී ය. වනයෙහි
ගිරි කඳුරෙක හුදකලා ව සැඟවිණ. සොයන්නා වූ ජන තෙම ඒ
116 අධමමනුෂ්‍යා දක අල්වා ගත. ඉතා තුටු වූ ඒ ජන තෙම උහු ගෙණ
117 වහා අවුත් ගුත්හල උන් මිහිඳු කුමරහට දැක් වී.

හෙතෙම උහු දක " කිමෙක රුහුණ අනුභව කරණ ලද්දේ දූ?" යි
118 සිනා පහළ කොට රජහු ගේ විදූරග නම් අධිපති හට පාවා දී. තෙමේ
119 සේනාව හැර ගෙණ මාගමට ගියේ රුහුණ අධිපති වැලොවට සංග්‍රහ
120 කරන්නේ අඥානයා විසින් පෙළන ලද ජනයා සුවපත් කොට උහු
121 විසින් නසන ලද බුදු සස්න ද තුබූ තන්හි පිහිටුවා ඒ ඒ තන්හි මල් වතු
පල වතු කරවා මහ ගඟ බඳවා වැව් ද කරවා ගෙණ හැම තන්හි
සඟහට සිවුපස සුලභ කොට නපුරු වූ මණ්ඩලේශ්වරයන් හා රැටියන්
122 ද මැඩ පවත්වා සොරුන් ද දුරලා කටු රහිත කොට පරිත්‍යාගයෙන් හා
123 භෝගයෙන් යුක්ත වූයේ සියලු ජනයා තුටු කෙරෙමින් නුවණැත්තන්
විසින් ඇසුරු කටයුත්ත්, දන කැහැත්තතන් විසින් සේවා කටයුතු
124 වූයේ, සියලු යදියන්ට සැපත් එලවන්නා වූ කප්තුරක් හා සම වූයේ
125 පුරාතණයන් විසින් දෙයෙහි පවත් වන ලද දුර්විනය දුරලා දහම්
පිළිපදනේ එහි ම වාසය කෙළේ ය. විදූරග නම් අධිපති තෙමේ ද
126 ආදිපාදයා ගෙණ අනුරාධ පුරයට පැමිණ රජ හට දක්වී ය.

රජ තෙමේ ද උහු දක කිපියේ වහා දඟගෙයි දම උහුට
127 රැකවරණය දින. සියලු පියොවින් වෙහෙස ද කරවී ය. මහා යසස්
ඇති හේ තෙම තුන් වරක් තුලාභාර ද දින. ථූපාරාමයෙහි දාගැබ ද රන්
128 පටින් වැස් වී ය. එහිම පහයක් කොට භික්ෂු සංඝයා වස්වා වෙහෙර
හා පුරයෙහිත් දිරා ගිය දෑ නව කමින් යුක්ත කෙළේ ය.

129 කොළොම් හොයෙහි තහවුරු බැඳුම් ඇත්තා වූ ගඟුල් හැල්ලක්
කෙළේ ය, හෙතෙම මයෙතතී නම් වැවෙහි මියර මහත් කරවී. රජ
130 තෙමේ එහි සොරොවුව ද අවුරුදු පතා කරවී. අතිශයින් මොළොක්
යහපත් වස්ත්‍ර ද සිවුරු පිණිස දෙවි, දුර්භික්ෂ කාලයෙහි දන්හල්
131 කරවා සියලු සත්ත්වයන්ට මහ දන් පැවැත් වූයේ මහා පාළි නම් දන්හල
ද වැඩී. තුන් නිකා වැසි භික්ෂූන්ට දී හා බත් දෙවී සතතයෙන් දුගී බත්

Non-Commercial Distribution

133 ද කැවිලි සහිත වූ කැඳ ද දෙවී. හෙතෙම දෙව් ලොවට හිත වූ මේ ආදි පින් කොට එකොළොස් වසකින් දෙවියන් හා එකී භාවයට ගියේ ය.
134 උහු විසින් මේ එකොළොස් වස්හි දෙන ලද රන් ම තිස් ලක්ෂයක් විය.
135 එක් නිරිඳෙක් තෙම අතිශයින් දූක සේ දිනිය යුතු වූ පඬි රජු ද අතික්
136 රජ තෙමේ උග්‍ර වූ දුර්ගීස්ථාව ඇති රුහුණ ද තමන් යටහත් බැව්හි තබා මේ රජහු තමන් මරහුගේ යටහත් බවට පැමිණියෝ ය.

මෙතෙකින් හුදි ජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහවස රාජද්වය දීපන නම් වූ එක් පණස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් දෙවෙනි පරිච්ඡේදය

1 ඉක්බිති කසුබ් රජ රාජ්‍යයෙහි පිහිටා ප්‍රඥා සම්පන්න කසුබ් යුව
2 රජ හට දකුණු දිග දින. යුව රජහුගේ දූ වූ තමන් භාර්‍යයාවූ තිස්සා නම්
3 රාජකන්‍යාවට අග්‍රාභිෂෙක දින. ඒ ඒ දිගින් ආවා වූ යාචකයන් හා
ශිල්පීන්ට රජ තෙමේ හැම කල්හිම දණ්ඩිස්සර නම් දානය දෙවි.

4 එකල රුහුණ වසන ඒ මිහිඳු නම් ඇපා තෙමේ බලසෙන් ගෙණ
5 රජහුගේ රට ගන්ට ආය. ඒ අසා කිපී රජ තෙමේ තමන් බලසෙන් යැවී
ය. මහා හට ඒ මිහිඳු ඇපා තෙමේ යුද කොට රජහු සෙන් පැරද වි.
6 ඉක්බිති රජ තෙමේ උහු සහසනු පිණිස උහු බිය කසුබ් යුව රජු යැවී ය.
7 ඒ තෙමෙ පුතු කරා ගොස් නොයෙක් දහම් කථාවෙන් යුක්ත වූ යුක්තිය
නොයෙක් පරිද්දෙන් කියා පුතු යුද්දයෙන් වළක්වා පෙරළා ආයේ ය.
8 ඒ ඇපා තෙමේ පසුව මණ්ඩල නායකයන් මරා ජනපද වාසීන් කිපුනා
දූක නුවර වෙත ආයේ ය. භික්ෂු සංඝ තෙමේ උහු ගෙණවුත් රජු දූක්වූ
9 හ. මේ රජ තෙමේ තමා දියණියන් උහුට දී පෙරළා රුහුණු යැවී ය.

10 ඒ රජ තෙමේ තුන් නිකා වැස්සන් අතුරෙහිදුස්සීලයන් බැහැර
11 කොට ඒ ඒ ආවාසයෙහි අලුත් භික්ෂූන් වැස් විය. අබිසෙන් දෙදෙනා
පිත් ඇපාණන් ලවා මහ වෙහෙර බෝයෙහි පූජා කෙරෙමින් වස් වැසීම
12 කරවී. එකල තුන් නිකායෙහි සෙල්මුවා පිළිරූ තුණෙහි රන්මුවා රැස්
13 වළලුය, කුඩය, සිළුමිණි යන මේ කෙළේ ය. අභයගිරි විහාරයෙහි
සිය නමින් පහයක් කරවා එහි භික්ෂූන් වස්වා ගමක් ද වස්ත්‍ර සහිත වූ
14 පිළිම බතක් සියලු භික්ෂූන්ට දෙවී ය. ඒ රජ තෙමේ මහියංගන
15 විහාරයෙහි සෑයට ගමන් දින ගොඩ දිය සතුන්ට එකල අභය දින.
හැම කල්හිම පෙර රජුන් සිරිත පරිපාලනය කෙළේ ය.

16 ඒ රජු සෙනෙවි ළංගසේන නම් රජ ගොත්හි උපන්නෙක්
17 ථූපාරාමයාගේ පිටු පස මහා විහාර වැස්සන්ට ආවාසයක් කෙළේ ය.
ධම්මරුචික භික්ෂූන්ට දහම් අරම කරවී. එසේම සාගලික භික්ෂූන්ට
18 කසුප් සෙන් නම් (ආරාමය කරවි ය.) එම සෙනෙවි තෙමේ සෑගිරිගල,
19 හෘදයෝෂ්ණ නම් පිරිවෙණ කරවා ධම්මරුචික භික්ෂූන්ට දින. ආරාමික
භික්ෂූන්ට ඒ ඒ තැන්හි එක එක ගේ කොට දෙවි. එම සෙනෙවි තෙමේ
20 රන්මලගල සිත්කලු උතුම් මනා කුටියක් කොට සසුන් හිමි තවසුන්ට
21 දින. මහා විහාරයෙහි මුහුදුගිරි නම්උතුම් පිරිවෙනක් කරවා පාංශුකූලික
22 භික්ෂූන්ට දින. තමාගේ වංශයෙහි නම් ඇති ආවාසයක් වෙනෙහි
23 කරවා මහා විහාරයෙහි වනවාස භික්ෂූන්ට දින. දිරූ වෙහෙර වල

Non-Commercial Distribution

24 නවකම් කරවී. සියලු භික්ෂූන්ට මාළු සිවුරෙහි අගුල් ගැන්වී. තිස්සාරාම
25 නම් මෙහෙණවර කොට මිරිස වැටි මහබෝ පරිහරණයෙහි පිහිටු වී.
26 අනුරාධපුර ද පොළොන්නරුව ද උවදුරු රෝග නසන පිණිස වෙදහල්
27 කරවී. තමා විසින් කළ ආවාසයන්ට අය ගම් ද, එසේ ම හේ තෙමේ
ආරාමික ගම් ද, පිළිම පෝෂ්‍ය ද දෙවී. ඒ තෙමේ නුවර ඒ ඒ තන්හි
28 බෙහෙත් ගෙවල්කරවී. පාංශුකූලික භික්ෂූන්ට බත් හා වස්ත්‍ර දෙවී.
29 බන්ධන ගත බොහෝ තිරිසනුන් මිදවී. ඒ සෙනෙවි තෙමේ දිළිඳුන්ට
මහ දන් දෙවී. විසිතුරු ව්‍යාංජන බත් කැඳ නොයෙක් වර්ගයෙහි කැවුම්,
30 හුරු රූ බඳු උක් සකුරු ද තනා භික්ෂූන්ට දින. සේනා නායක සේන
තෙමේ මේ ආදී පින් කොට කීර්ති සඳරැ සින් සියලු දිගුන් හෙබවී. උහු
නෑ රකුස් මේ නායක තෙමේ සවාරක ගම ඉතා සිත්කලු විහාරයක්
31 කොට උතුම් වත් (පෙහෙවත්) මොනවට පිහිටුවා මහ වෙහෙර වැසි
32 පිළිවෙත් සරු භික්ෂූන්ට දිනී. සේන නම් මහලියන්නා මහ වෙහෙර
33 මහ ලේනා පත් නම් උතුම් ආවාසයක් භික්ෂූන් පිණිස කරවී. එම
34 රජහු ඇමති වූ සොළී රජ නම් තැනැත්තේ සහ මුලින් නටබුන්
පිරිවෙණක් සුප්‍රතිෂ්ඨායෙන් සිත් කලු කොට කෙළේ යි.

35 රජ තෙමේ තුන් නිකායෙහි රූප කර්මයෙන් සිත්කලු වූ
36 විජයොත්පාය බඳු විසිතුරු මණ්ඩප කරවා ජනයා සිත් ගන්නා ධාතු
පූජා ද කරවා දසසත් හවුරුද්දක් වැස කම් වූ පරිද්දෙන් (පරලොව)
ගියේ ය.

37 ඒ රජුට ඉක්බිති අභිෂේක ලත් බිසව කුස හොත් කසුබ් යුවරජ
තෙමේ පිළිවෙළින් ආ ලක් රජයෙහි ලද අබිසෙව් ඇති විය. හේ
38 තෙමේ සැදැහැත්තේ ආගත මාර්ගද වේ. අභිඥා ඇත්තෙකු සේ පැණවති,
39 අමර මන්ත්‍රී සෙයින් වක්තෘය, වෙසවුණු රජු සේ ත්‍යාගි කරුය, බොහෝ
ඇසූ පිරූ තැන් ඇත්තේ ධර්ම කථිකය, සියලු ශිල්පයෙහි විසාරද,
40 යුක්තායුක්ත, විචාරයෙහි දක්ෂය, නීතියෙහි පණ්ඩිතය, ඉන්ද්‍රඛීලයක්
සේ නො සැලෙන්නේ බුදු සස්නැ පිහිටියේ සියලු පරප්‍රවාදී වාතයෙන්
අකම්ප්‍යයි. තමා කෙරෙහි නැති ගුණ පහළ කරණ ලක්ෂණ මායාය,
නුගුණ සඟවන ලක්ෂණ සාඨ්‍යය, මත්ය, වනාදී පාපා යන්ට අගොචරයි,
41 සියලු රුවට සයුර සේ ගුණයනට උත්පත්ති ස්ථානයි. භූමිචන්ද්‍ර ඒ
42 නරේන්ද්‍ර තෙමේ තමා ගොත්‍රයෙහි උපන් ඉදින් භික්මුණා වූ එකම තමා
43 කරණ කොට ගෙණ බලන්නේ ය. ඉදින් දප්පුළ ඈපාණන්ට යුවරාජ
පද ය දින. දශ රාජ ධර්මයෙන් හා චතුස්සංග්‍රහ වස්තුවෙන් රජ කෙරෙමින්
44 තමා එක් ඇසක් සෙයින් ලොව රක්කේ ය. බුදුහු සියලු සස්න දහම
45 නමින් ශුද්ධ කොට නවක භික්ෂූන් ගෙණ ආවාස පූරණය කෙළේ ය.

Non-Commercial Distribution

46 දුටු ගැමුණු රජු විසින් කරණ ලද නටුවා වූ මිරිසවැටි වෙහෙර
අනේකාවාසයෙන් හොබනා සේ කරවා මහ පෙළහර කොට තෙර
47 විසඳා භික්ෂූන්ට දින ඒ පන් සියයකට අයගම් ද දෙවි. ඒ ලංකේන්ද්‍ර
තෙමේ සිත් කලු තුසී පුරයෙහි දෙව් පිරිසෙන් පෙරටු කරණ ලද උතුම්
48 දහස් දෙස නේ ලෝ හිමියා ලොවට දක්වන්නා සේ සව්සජ්ජිත ඒ
49 විහාරයහි නන් රුවනින් හෙබියා වූ සිත් කලු මඩුවෙහි හුන්නේ නුවරුන්
හා භික්ෂූන් පිරිවරණ ලද්දේ බුද්ධ ලීලායෙන් විජම් බණ දෙසී.

50 එකල (ඒ රජ තෙමේ) විජම්පෙළ රන් පත ලියවා දම් සඟුනු
51 පොත නන් රුවනින් හොබනා කොට නුවර මැද උතුම් ගෙයක් කරවා
52 ඒ පොත එහි තබ්බවා පෙරහර දෙවී. තමා පුතුට සක් සෙනෙවි තනතුර
දී ඒ දම් සඟුණු පෙරහරෙහි උහු යෙදි, ඒ රජ තෙමේ හවුරුදු පතා
53 දෙව් පුරයක් සේ පුරය සරසවා සරුසුණු සෙන් විසින් පිරිවරණ ලදුව
54 සව් බරණින් සැදී දෙව් රජු සේ හොබවන ඇත් කඳ හිඳ පුරුවේ
55 හැසිරෙමින් ඒ දම් සඳනුව තමා විසින් කරවන ලදසිත් කළු වූ සව්
56 සජ්ජිත විහාරයට මහ පෙරහරින් වඩා ගෙණවුත් නන් රුවනින් හෙබි
සිත් කළු ඒ වෙහෙර දාගෙය බඳ මඩුවෙහි දාපිළ තබා පිදුයේ ය. ඒ
57 රජ තෙමේ මහ මෙවුනා උයන ග්‍රන්ථාකර පිරිවෙණ ද නුවර වෙදහල්
58 ද කරවා ඊට ගම් ද දෙවී. අභය ගිරි විහාරයෙහි භණ්ඩිකා පිරිවෙණ ද
59 සලමේ පව්ව ද කොට ඊට අයගම් දින. ලක්නා එම රජ තෙමේ
ජෝතිවන වෙහෙර දන් හලට ද එසේ ම අභයගිරියට ද (එකී එකී)
60 ගමක් දින. පරම ධාර්මික රජ තෙමේ කෙළෙහි ගුණ දන්නා බැවින්
61 දකුණු ගිරි වෙහෙරට ද ගමක් දෙවි. සක් සෙනෙවි තෙමේ සිත් කළු
පිරිවෙණක් සිය නමින් මොනවට මවා ගම් සමග මහනිකා භික්ෂූන්ට
62 දිනි. වජිරා නම් උහු බිරින්දෑ සිය නමින් පිරිවෙණක් කොට ගම් සහිත
63 කොට මහ වෙහෙර වැස්සන්ටම දෙවි. ඕ තොමෝ ම පාදලඤ්ඡනයෙහි
64 මෙහෙණ වරක් කොට සියලු තන්හි ප්‍රසිද්ධ ථේරවංශික භික්ෂූන්ට
65 දුන්නීය. සක් සෙනෙවි මව් දේවි තොමෝ මහා විහාර වංශික ආරණ්‍යක
භික්ෂූන්ට සිය නමින් ආවාසයක් කලා. ඕ තොමෝ ම මිරිස වැටි බුදු
රුව ද, සිළුමිණ, පාදූල, සත සිව්ර යන මේ කළාය.

66 රජ තෙමේ රජ ගෙයිම සිය නමින් රාජවාසයක් ද ඉතා සිත් කළු
67 පාළික නම් පහයක් ද කෙළේ යි. රජහු අනික් බිරින්දක් වන රාජිනි
නම් තැනැත්තී රුවන් වැලි සෑය පට සැට්ටයකින් පිදුවා. ඒ බිසව් පිත්
68 ඉසුරෙහි පිහිටි සිඬසප් නම් වූ මලය රාජ යයි ප්‍රසිද්ධ රුවින් මලවියා
69 බඳු කුමරෙක් වී. රජ තෙමේ උහු මළ කළ භික්ෂූන්ට උතුම් හලක් දන්
70 වැට තබා එකල උහුට පිත් දින.

Non-Commercial Distribution

71 එකල ලංකාධිපති රජහු මෙසේ දැහැමින් රජ කරත් පඬි රජ
තෙමේ සොළී රජු හා යුද කොට පැරැද්දේ බළ සෙන් සඳහා නොයෙක්
72 පඬුරු එවී. ඒ ලංකේශ්වර රජ තෙමේ ඇමතියන් හා මන්ත්‍රණය කොට
බල සෙන් සරසා සක් සෙනෙවියා බලනායක කොට තෙමේ ම මහ
73 තොට ගියේ මුහුදු වෙරළ සිට පූර්ව රජුන් විජය කියා උත්සාහ දනවා
බලසෙන් නැව් නැංගිය. එකල සක් සෙනෙවි තෙමේ බලසෙන් ගෙණ
74 සුවසේ සයුර එතරව පඬි රටට පැමිණියේ ය. පඬි රජ තෙමේ බලසෙන්
75 සහ උහු දැක සොම්නම් ඇත්තේ "දඹදිව එක්සත් කරන්නෙමි " යි කියා
76 පඬි රජ දෙසෙනඟ ගෙණ සොළියා දිනනු නො හැකිව යුද කිස හැර
77 නික්මිණ. නැවත සක් සෙනෙවි තෙමේ "යුද කරන්නෙමැ " යි ගොස්
78 හුන්නේ පඬි රජහු පව්නිසා උපදුව රෝගයකින් මළේ ය. ලංකේශ්වර
තෙමේ ඒ රෝගයෙන් බළ සේනා ද නස්නා අසා කරුණා බාහුල්‍යයෙන්
79 සියසෙන් එ රටින් ගෙන් විය. එකල සක් සෙනෙවි තනතුර උහු පුතුට
දින. ඒ පුතු සේනානායක කොට උහු නමින් වැඩී. එකල තුන්නිකා
80 වැස්සන් ලවා නුවර පිරිත් කරවා සතුන් රෝ දුබික් බිය නැස් වී. ඒ රජ
81 තෙමේ සස්නට ද ලොවට ද නොයෙක් ආකාරයෙන් සෙත් කරවා දස
82 වන හවුරුදුයෙහි සැපසේ දෙව් ලොව ගියේ ය.

මේ කසුබ් රජු තෙමේ ලක් රජයෙහි පිහිටා හදාළ තෙවළා ඇත්තේ සියලු විදු පහන් බඳු වූයේ, වක්තෘව, වාදය, කවිත්‍වව ස්මෘති ධෘතියෙන් විශදව, දහම් දෙසන්නේ භාවනා කරන්නේ ද වී, පාණ සැදැහැ කුළුණු ඇතියහ පර වැඩෙහි නියැළුණේ ය, ලොව හඳුනන්නේ , දාන ශෞණ්ඩද වී, සියලු ලෝ වැසි තෙමේ ද මොහු ගේ නිමල් ගුණ ඇත්තේ වේවා.

මෙතෙකින් හු දි ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස ද්විරාජක නම් වූ දෙපණස් වන අදියර නිමියේ ය.

Non-Commercial Distribution

# පනස් තුන් වෙනි පරිච්ඡේදය

1 එකල දප්පුල නම් යුව රජ තෙමේ රජව එම නම් ඇපාණන් උප
2 රජ තනතුරෙහි තැබී ය. ඒ රජ තෙමේ මිරිස වැටි වෙහෙරට ගමක් දී
3 පෙර රජුන්ගේ චාරිත්‍රයන් පුරයෙහි රැක මේ පෘථුවිය තමා පෙර කළ
කමින් දීඝී කාලයක් නො වළඳා සත් වන මස මරුමුවට වන.

ඊට අනතුරුව දප්පුළ උප රජ තෙමේ රජ විය. උදය ඇපාණන්ට
4 යුව රජ පදය දින. එකල පඬි රජ තෙමේ සොළි බියෙන් සිය දනව්
5 හැර නැව් නැගී මහ තොටට පැමිණියේ ය. රජ තෙමේ උහු ගෙන්වා
6 දැක සතුටු සිත් ඇත්තේ උහුට මහා භෝග දින නුවරින් බැහැර වස්වී. "
7 සොළී රජු හා යුද කොට පටුනු දෙක ගෙණ පඬි රජහට දෙමැ" යි ලක්
8 රජ සැරසුනු කල ලක් දිව වැසි ක්ෂත්‍රියයෝ කිසි කාරියක් කරණ කොට
9 ගෙණ පඬිරජහු පව් කමින් දරුණු යුද කළහ. පඬි රජ තෙමේ මෙහි
10 විසීමෙන් කම් නැතැයි සිතා ඔටුනු ආදිය තබා කේරලය කරා ගියේ ය.
11 එකල රජ තෙමේ විග්‍රහ නැවති කල මහ මෙවුනා උයන මහ බෝගෙට
12 නුවර වෙත ගම දින. ඒ රජහු සෙනෙවි රක්ඛක නම් ඉළඟ තෙමේ ද
ථූපාරාමය වෙත රජ නම් පිරිවෙණ කෙළේ ය. ඒ රජ තෙමේ පෙර
13 රජුන් විසින් සිදු කළ දෑ පරිපාලනය කොට දොළොස් හවුරුද්දට පැමිණ
14 කම්වූ පරිද්දෙන් (මිය පරලොව) ගියේ ය. උදය නම් යුව රජ තෙමේ
15 ලක් වැස්සන් ඉසුරු වී. සේන නම් ඇපාණන් උප රජ තෙමේ අභිෂේක
16 කෙළේ ය. එකල ඇමැතියෝ රජහට භයින් තපෝ වනයට වන්හ.
17 රජ, උප රජහු ගොස් උන් හිස් සිඳවූහ. ඒ කම්යෙන් කලකිරුණු ඒ
18 තවුස් වෙත යතිහු රජහු දනව් හැර රුහුණු ගියහ. එකල දනව් වැස්සෝ
ද, නුවරු ද බළසෙන් ද සැඩපවනින් උළෙල සයුර සේ කිපියහ.
19 අභයගිරි විහාරයෙහි රුවන් පහයට නැගී රජහු දැඩි සේ බිය ගන්වා
බිහිසුණු රඟ දක්වා තපෝවෙනෙහි කලහයට උපස්තම්භ කළ ඇමැතියන්
හිස් සිඳ කවුළුවෙන් (බැහැර) හෙලූ හ. ඒ අසා යුව රජු හා උහු මිතුරු
20 ඇපා තෙමේ ද පව්රෙන් පැන යුහුව රුහුණු ගියෝ ය. බළසෙන් කළු
ගංතෙර දක්වා ලුහු බැඳ නැව් නො ලත් හෙයිනුත් ඔවුන් එතර වූ
21 හෙයිනුත් පෙරළා ආහ. තපෝ වෙනෙහි තිභීය බුන් එහි ගිය රාජ
22 පුත්‍රයෝ තෙත්වස්ත්‍ර හා කෙහෙ ඇතිව ඒ තවසුන්ගේ ඉදිරියෙහි
23 ලැම්ඩියෙන් හෙව නොයෙක් පරිද්දෙන් වැලප මුරගා හඬා තපස්වීන්
කමා කරවූහ. ඒ සසුන් හිමියන් මෙහි ආනුභාවයෙන් ලක්දිව් හිමි ඒ
දෙදෙනා ගේ පුණ්‍යොදය විය.

24 මහසෙන් සන්හුන් කල යුවරජ බලසෙන් ද තුන්තිකා වැස්සෝ
25 ද උන් ගෙණ එන්ට ගියහ. ව්‍යක්ත පණ්ඩිත රජ කුමරුවෝ දෙදෙන

Non-Commercial Distribution

26 පාංශුකූලික ඒ භික්ෂූන් යැද හැර ගෙණ සිය පුරට පෙරළා අවු ය. රජ
තෙමේ ඒ භික්ෂූන් පෙර මගට ගොස් ක්ෂමා කරවී. ඔවුන් ගෙණ
තපෝ වනයට පමුණුවා ඉක්බිති තෙමේ රජ ගෙට ගියේ ය. එතැන්
27 පටන් පූර්ව රජුන් සිරිත් රැක ඒ රජ තෙමේ තුන් වන හවුරුදුයෙහි කම්
වූ පරිද්දෙන් පර ලොව ගියේ ය.

28 උහු ඇවෑමෙන් සමෘධිමත් සේන නම් ඒ යුව රජ තෙමේ
ලංකාරාජ්‍යාභිෂේකයට පැමිණ මිතුරු වූ ඒ උදය නම් ඇපාණන් යුව
29 රජ කෙළේ ය. ඒ රජ තෙමේ පොහෝ දා කහවණු දහසක් දුප්පතුන්ට
30 දී පෙහෙවස් වෙසෙයි. දිවි හිමියෙන්ම මෙසේ කෙළේ ය. ඒ රජ තෙම්
භික්ෂූන්ට පිළිම බත් වස්ත්‍රයන් හා යාචකයන්ට ද, ශිල්පීන්ට ද ,
දඬිස්සර නම් දානයක් දින. ඒ රජ තෙමේ කොතැනක් භික්ෂූන්ට ඉතා
31 සිත් කළු පහ තනවා අය ගම් දෙවි, කහවණු දහසක් හෝ පන්සියයක්
දී ලක්දිව දිරා ගිය ආවාසයන් නව කම් කරවී. ඒ රජ තෙමේ බයාගිරි
32 සෑ (මළුවෙහි) ගල් අතුරණු පණිස සතළිස් දහසක් දෙවි. ලක්දිව
33 මහවැව්හි දිරා ගිය වාරිමාර්ග නවකම් ද ගල් පසින් වෑම්වර තරය ද
34 කෙළේ ය. රජ ගෙයි සිත් කළු මා හැඟ මාලා ගෘහයක් කෙළේ ය.
පෙර රජුන් විසින් තැබූ දන් වැට මොනවට පැවැත් වී. ඇමති අක්බෝ
35 මලය රජු විසින් කළ නාභිල පිරිවෙණ එකල්හි දෑක ගමක් දින. සතර
විහාරයෙහි රූකම් හා රම්‍ය මණ්ඩපයන් මොනවට කරවා හැම කල
36 ධාතු පූජා කෙළේ යි. ඒ රජ තෙමේ මේ ආදී වූ (පින්කම්) නොයෙක්
37 පරිද්දෙන් කොට නව වන හවුරුදුයෙහි කම් වූ පරිද්දෙන් පර ලොව
ගියේ ය.

උහු ඇවෑමෙන් උදය යුව රජ ලක් අබිසෙව් පත්ව සේන නම්
38 ඇපාණන් උපරාජ්‍යාභිෂේක කෙළේ ය. මේ උදාර මිනිසුන් පවින් නිද්‍රාශීලි
සුරාපායි විය. හොළීයා උග්‍ර පමා බැව් අසා සතුටු සිත් ඇත්තේ පඬි
39 රජ අභිෂේකයට පැමිණෙනු කැමැත්තේ පඬි රජු විසින් තබන ලද
40 ඔටුනු ආදිය සඳහා මෙහි (හසුන්) එවී. රජ තෙමේ ඒ අබරණ නොදින.
ඉන් කිපී මහත් බලැති හොළියා බලාත්කාරයෙන් ගන්ට බළසෙන් සරහා
41 එවීය. එකල මෙහි සෙනෙවි තෙමේ පසල් දනව්ව කිපී හෙයින් ගියේ
42 ය. රජ තෙම් උහු ගෙන්වා යුද පිණිස යැවී ය. එහි ගිය සෙනෙවි
43 තෙමේ යුද කොට රණබිම්හි මෙළේ ය. ඒ රජ තෙමේ ඔටුනු ආදිය රැ
44 ගෙණ රුහුණ ගියේ ය. සොළී බලසෙන් එහි ගොස් ඇතුළුව යනු නො
45 ලැබ බියෙන් පෙරළා මෙයින් සිය රට ගිය හ.

Non-Commercial Distribution

46 ඉක්බිති ලක්නා රජ තෙමේ තේජස් හා මහ පැණැති විදුරග
නායකයන් සෙනෙවිරත් තනතුර තැබී ය. ඒ සෙනෙවි තෙමේ සොළී
රජහු පසල් දනව්ව වනසා බිහිසුණු රඟ දක්වා මෙයින් ගෙණ ගිය ද
47 පෙරළා ගෙන් වී. ඉක්බිති ඒ තෙමේ මේ දිව් වැසි සියලු පාංශුකූලික
48 භික්ෂූන්ට ඉතා අගනා සියලු පිරිකර දෙවී. එකල නරේන්ද්‍ර තමේ මහ
49 වෙහෙර සතරහු පිළිබිඹු පිළිබඳ මිණි රැසින් චොරජනා සිළුමිණ කෙළේ
ය.

ඒ රජු අනෙත පූරික විදූරා නම් අංගනා තොමෝ ජ්වලිත
50 මිණියෙන් උප ලක්ෂිත පා දූලකින් සෙල් මුවා එම පිළිමය පිදුවා සොළී
රජු බල සේනා විසින් දවු මිණි නම් පහය කරන්ට පටන් ගත්තේ
51 අටවනු වස්හි උදා රජ මෙළේ ය.

වසුධාධිපති මේ පස් දෙනම එක් සේසතින් ලකුණු කරණ ලද
වසුමතිය අනුභව කොට සංග්‍රහ නිග්‍රහ දෙකින් සියලු ලෝ වැසි ජනයා
52 වසෙහි පවත්වා පුත්‍ර භාර්යාවන් අමාත්‍යානුගතයන් සමග මරු වසයට
ගිය හ. සත්පුරුෂයෝ ප්‍රමාදය මදය හරණට මෙ බන්ද මෙසේ
සතතයෙන් මෙනෙහි කෙරෙත්වා

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස පංච
රාජක නම් තෙපණස් වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් හතර වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති ඒ සේන තෙමේ ක්‍රමාගත ලංකා රාජ්‍යාභිෂේකයට පැමිණ
මිහිඳු ඇපාණන්ට යුවරජ පදවිය දිනි. ඒ රජ තෙමේ ප්‍රාඥය, මහා
2 කවිය, ව්‍යක්තය, මිත්‍ර ශත්‍රූන් කෙරෙහි මධ්‍යස්ථය හැම කල්හි දයා
මෛත්‍රියෙන් යුක්ත ද වී. සෑම කල ඒ රටෙහි කාලාතික්‍ර නො කොට
3 මොනවට ධාරාණිපාතවෙන් මෙසය වසී. එහි වසන්නෝ සුවපත්ව
නිර්භය වූහ. ඒ රජ තෙමේ ලොහොපායෙහි හුන්නේ තුන් නිකා
4 වාසීන් විසින් පිරිවරණ ලදුව සූත්‍රාන්තය වර්ණනා කෙළේ ය. හේ
තෙමේ නත් රුවනින් හෙබි දළදා කරඬුව ද සතර වෙහෙරට (වඩා
5 ගෙණවුත්) නො යෙක් පරිද්දෙන් ධාතුපූජා ද කෙළේ ය. තමන් පෙර
විසූ සිත්‍ථ ග්‍රාමයෙහි පිරිවෙණක් කරවා ලෝ වැස්සා පුතෙකු මෙන්
6 පාලනය කොට තුන් හවුරුදුයෙකින් දෙව්ලෝ ගියේ ය.

ඊට අනතුරුව මිහිඳු නම් ඒ යුව රජ තෙමේ රජ විය. මහ පින්
7 මහ තේජස් මහසෙන් මහයසස් ඇති ඒ රජ තෙමේ සොර උවදුරු
නසා ලක එක්සත් කෙළේ ය. මණ්ඩල නායකයෝ නිතියෙන් උහු
8 උවටන් කළ හ. ඒ නරශ්‍රේෂ්ඨ තෙමේ ලක්දිව ක්ෂත්‍රියයන් ඇති කලත්
9 කලිඟු සක්විති වංසයෙහි උපන් කුමරියක ගෙන්වා ඇය තමහට අග
මෙහෙසුන් කෙළේ ය. ඒ රැජනට පුතුන් දෙදෙනෙක් හා මනෝරංජනය
10 කරණ එක් දුවක් ද වූහ. පුතුන් ඇපා කළ හ. දියණියනුත් යුව රාජිනිය
කෙළේ ය. හේ රජ තෙමේ මෙසේ සිංහල වංසය ද තැ බී ය. වල්ලභ
11 රජ තෙමේ මේ දේසය මඩනා සඳහා නාගදිවයිනට බළසෙන් එවී ය.
මෙහි භූපාල තෙමේ එපවත් අසා බළසෙන් දී සේන නම් සෙනෙවිරදු
12 වල්ලභ රජහු බළසෙන් හා යුද පිණිස එහි යැවී ය. එකල සෙනෙවි
13 තෙමේ එහි ගොස් ඒ රජහු බල සේනා හා යුද කොට ඒ සෙන් නසා
14 රණ මඬල ගත. ඒ වල්ලාභාදි රජ දරුවෝ මේ රජු දිනිය නොහැක්කෝ
15 ලංකේශ්වරයා හා මිත්‍ර සම්බන්ධ කළහ. මෙසේ මේ රජහු තෙද ලක්දිව
16 පැතිර මුහුද පැන දඹදිව්හි ද පතළේ ය.

ඒ රජ තෙමේ සදහම් කියන්නන් උතුම් බුහුමන් කොට සදහම්
17 අසා බුදු සස්න පහන් වුයේ ය. ඒ රජ තෙමේ පාංශු කූලික භික්ෂූන් රැ
ස් කරවා ආයාචනා කොට තමා ගෙට වැඩමවා මොනවට අසුන් පණවා
18 වඩා හිඳුවා හැම කල්හිම එක් දවසෙක සෙයින් පිරිසිදු වූ බොහෝ
19 වළඳන දෑ දුවී ය. රජ තෙමේ හැම ආරණ්‍යක භික්ෂූන්ට අනේක
20 ව්‍යංජනයෙන් යුක්ත පිරිසිදු වූ මෑඟි වූ බොහෝ වූ බොජුන් හැම
21 කල්හිම යැවී. කරුණා නිවාස හේ තෙමේ ගිලන් තවසුන් වෙතට

Non-Commercial Distribution

22 නිතියෙන් වෙදුන් යවා පිළියම් කරවී ය. ගිතෙලින් බැඳි ලුහුණු රස හා
23 උක් සකුරු, බුලත් හා මුන වසුන් ද, පසු බත හැමදා දිනි. ලුහුණු
24 ගම්මිරිස් තිප්පලි හිඟුරු උක්සකුරු, තිපල් ගිතෙල් , තලතෙල්, මී යන
25 මේ බෙහෙත් පාත්‍රයන්හි පුරවා පාපුරණ ආස්තරණයන්හි එක එක
26 බැගින් පාංශුකූලික භික්ෂූන්ට සැමදා දිනි. රජ තෙමේ සිවුරු ආදී
27 සියලු පිරිකර කරවා පාංශුකූලික භික්ෂූන්ට දෙවී ය. රජ තෙමේ මහ
වෙහෙර එකෙකි. භික්ෂූකෙනෙකුට එකක් බැගින් සිවුරු පිණිස අලුත්
වස්ත්‍ර දෙවී. ඒ මිහිපල් තෙමේ තුන්නක වැසි ලාභයෙන් දිවිරක්නා
භික්ෂූන්ට එකක් බැගින් සිවුරු පිණිස අලුත් වස්ත්‍ර දෙවී. ඒ මිහිපල්
තෙමේ තුන්නක වැසි ලාභයෙන් දිවි රක්නා භික්ෂූන්ට දෙවරක් තුලාබර
දන් දින.

28 ඒ රජ තෙමේ "මතු කලක් රජ දරුවෝ සංඝ ලාභයෙන් භෝග
29 නොගනිත්ව"යි ගල අකුරු කොටවා තැබ්බ වී. අනාථයන් ලබා බුදුන්
30 සරණ හා නවගුණ කියවා උන්ට බත් දෙනනී. ඇත්හල් බිම් දන්සලක්
31 කොට යාචකයන්ට දන් හා සෙනසුන් දින. දයාවට ගෘහ වූ ඒ රජ
32 තෙම් සියලු වෙදහල්හි බෙහෙත් හා කැඳ ද දඟගෙයි වැසි සොරුන්ට
33 නිති බත් ද දෙවි. වඳුරන් ඌරන් මුවන් හා බල්ලන්ට රිසිතෙක් බත්
34 හා පූප දෙවී. ඒ රජ තෙමේ වෙහෙර සතරෙහි වී පුරවා රැස් කොට "
35 දුගීහු රිසිසේ ගණිත්ව" යි කියා දෙවී. නොයෙක් පුදයෙන් පුදා උතුම්
36 පෙළහර කොට වියත් භික්ෂූන් ලවා එකල විනය හැදූරවී. සජාගම්
37 වැසි දහම් සිත් තෙරුන් පුදා උන්වහන්සේ ලවා අභිධර්මයට වණිනාවක්
38 කරවී. ලක්දිව් අබරණ බඳු වන වාසී දළනා තෙරුන් ලවා විජම් දේශනා
කරවී. රජ තෙමේ රුවන් වැලි සෑය පටසැට්ට පූජාවෙන් හා ගී නැටුම්
ය, සුවඳ විලවුන් නානා පුෂ්පය, පහන් මාලාය, සුවඳ දුම් යන මේ
39 දූයින් නොයෙක් පරිද්දෙන් පූජා කොට ඒ සම්බන්ධ වස්ත්‍රයන් බෙදා
භික්ෂූන්ට දින. හැම කල්හි ඒ රජ තෙමේ රජයෙහි ඒ ඒ තැන උයන්
40 වල පුෂ්පයන් ගෙන්වා තුනුරුවන් පිදී. මිරිසවැටියෙහි සඳුන් නම්
41 පහව කරවන්ට ආරම්භ කෙළේ ය. භික්ෂූන්ට අය ගමක් ද දෙවී ය. ඒ
42 මිහිපල් තෙමේ රුවනින් කරඬුවක් කරවා කෙහෙදා නිදන් කොට එහි
43 තබා පූජා කෙළේ ය. ථූපාරාමයෙහි සෑය රන් රිදී පටින් වස්වා ඒ රජ
44 තෙමේ රජය පොහොනා පරිද්දෙන්පූජා කරවී. ඒ රජ තෙමේ එහි
දාගෙහි හිරු රැසින් දිලියෙන මහමෙර බඳු රන් දොරක් කරවි ය. හේ
45 තෙමේ පදකුණෙහි සෑ සතර බඳ සොළී රජු බළසෙන් විසින් දූවූ සිත්කළු
46 ගෙය ද කරවී. නුවර මැද දෙන ලද දළදා ගෙය ද එසේ ම මහීපාල
47 තෙමේ දම් සඟුනු ගෙය හා බත් හල ද කෙළේ ය. ඒ රජ තෙමේ බුලත්
48 මඬුවක් කොට එහි සුවත් ගෙණ තෙරවස භික්ෂූන් ගේ බෙහෙත් පිණිස

Non-Commercial Distribution

දෙවී. මහමල් නම් මෙහෙණ වරක් කොට තෙරවස මළුකම් ලත්
49 මෙහෙණින්න්ට දෙවී.

50 මිහිපල් තෙමේ මයිල් හු දී උදා රජු විසින් එකල පටන් ගත් මිණි
51 නම් පහය නිම වී. එකල ඒ රජහු ඇමතියෝ සතර දෙනෙක්
ජේතවනයෙහි පිරිවෙන් සතරක් කර වූ හ. රජහු කීර්ති බඳු වූ මනරම්
52 කීර්ති දෙවි තොමෝ ථූපාරාමයාගේ පසු භාගයෙන් සිත් කළු පිරිවෙණක්
53 කළා. ඕ ඒ පිරිවෙණ ද කපුගම් හිඳ සිවුරු සෑයෙහි ද පිවිතුරු පොකුණු
54 තුණක් කළා. ඕ තොමෝ ම දිග දොළොස් රියන් රන් මුවා පතාකාවක්
55 පුණ්‍ය සම්භාර ඇත්තී රුවන් වැලි සෑයෙහි පිදූවා. ඇය පුත් තෙමේ
56 ද ගිහියන්ට නුවර වෙදහලක් කෙළේ ය. ගුණවත් සක් සෙනෙවි තෙමේ
නුවරින් බැහැර භික්ෂූන්ට (වෙදයලක් කරවී.) මහීනායක රජ තෙමේ
සිවු වෙහෙර දෙවි පහ බඳු මඩු කරවා එක් හවුරුද්දක් ඉක්ම නොයෙක්
57 පරිද්දෙන් ධාතු පූජා කරවා පෙර රජුන් සිරිත් මනා කොට පරිපාලනය
කෙළේ ය. ඒ රජ තෙමේ නොයෙක් පරිද්දදෙන් මේ ආදී මහ පින්කම්
58 කොට සොළොස් වන හවුරුද්දෙහි දෙව් ලොව ගියේ ය.

59 එකල ඒ රජු නිසා උපන් කලිඟු බිසෝ පුත් දොළොස් හැවිරිදි වූ
සේන කුමාර තෙමේ පැමිණි රාජ්‍ය ඇති විය. මල් උදා කුමර හට යුව
60 රාජ පදවි දින. පියහු සෙනෙයි සේන තෙමේ ඒ රජු සේනාපති විය. ඒ
රජ තෙමේ සෙනෙවියා බලසෙනග ගෙණ පසල් දනව් ගිය කල මව්
61 වෙත විසූ තමා කිස් දොවුන් මලු මරවා තමා කීවාක් කරණ මහමල්ල
62 උදා නම් ඇමතියා සෙනෙවිරත් කෙළේ ය.

63 එපවත් අසා සේන සෙනෙවි තෙමේ කිපියේ බළසෙන ගෙණ "
සතුරන් ගන්නෙමි" කියා ආය. එකල රජ තෙමේ ඒ අසා තමා කීවා
කළ ඒ ඇමතියා ම තමහට ආරක්ෂායි (ඇරගෙණ නුවරින්) නික්ම
64 රුහුණ ගියේ ය. ඒ රජහු මෑණියෝ නැවතී යුව රජ හා රාජිනිය
65 ගෙණ උහු හා නොකිපියා සෙනෙවියා ගෙන්වී ය. ඒ සෙනෙවි තෙමේ
66 මව් බිසවුන් විසින් සංග්‍රහ කරණ ලද්දේ දෙමළුන් රැස් කොට උන්ට
දනව්ව දී පොළොන්නරුවෙහි විසී ය. ඒ රජ තෙමේ ඒ සෙනෙවියා
67 හා යුද පිණිස රුහුණින් බල සෙන් එවී ය.

සෙනෙවි තෙමේ රජහුගේ ඒ සියලු බලසෙන් වැනසී. ඒ දෙමළු
68 රකුසන් සෙයින් ජනපදය පෙළා මිනිසුන් සතු දෙය පැහැර ගනිති.
එකල බැගෑපත් මිනිස්සු රජ වෙත රුහුණ ගොස් එපවත් දැනූහ. ඒ
69 තෙමේ ඇමතියන් හා මන්ත්‍රණය කොට සස්න හා රට රක්නට ඒ

Non-Commercial Distribution

70 (උදා) සෙනෙවියා හැර සේන සෙනෙවියා හා මිත්‍ර සන්ථවය කොට
71 පොළොන්නරුවට ගියේ ය. මහාවංස පාලනයට (සෙනෙවියා) දුවක් මහේසිකා කොට කසුබ් නම් උතුම් කුමරෙක් උපදවා ලංකේන්‍ද්‍රයා එහි
72 වසන කල රජහට අපථ්‍යකාරී වල්ලභ ජනයෝ රා බොනු නො ලබන්නේ උහුගේ වෛරී ඇදුරෝව මද ්‍යපානයෙහි ගුණ වණා ඒ රජහු පෙවූ හ.
73 ඒ තෙමේ එකල මද ්‍යපානය කොට මත් දිවියකු බඳු විය. ඒ රජ තෙමේ ආහාරක්ෂයට පැමිණ දුර්ලභ පදවිය හැර දශ වන හවුරුද්දෙහි
74 බාලපරායෙහි ම මෙළේ ය.

යම් මනුෂ්‍ය කෙනෙක් මෙලෝ පරලෝ සැප කැමැත්තාහු නම් ඔවුහු පාපාමිත්‍රයන් කීවා කිරීම ඒකාන්තෙයෙන් පිරිහීමට හේතු යයි මෙයින් ඉගෙණ බාල තැනැත්තහු බිහිසුණු විෂයක් හු සෙයින් බැහැර කෙරෙත් වා.

මෙතෙකින් හුදී ජනා පහන් සංවේග පිණි කළ මහ වස තීරාජක නම් වූ සූපණස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් පස් වෙනි පරිච්ඡේදය

උහු ඇවෑමෙන් සිය මල් මිහිඳු කුමර තෙමේ උතුම් අනුරාපුර
1 සේසත් නංවා සේන නම් සෙනෙවියා විසින් ගෙණන ලද නානාදේශ
2 ජනයාගෙන් ව්‍යාකුළ වූ ඒ නුවර දුකසේ දස හවුරද්දක් වාසය කෙළේ
3 ය. ඉවත් කළ නිතීමාර්ග ඇති සර්ව ප්‍රකාරයෙන් මෘදු වූ උහුට අය
4 කොටස එකල ජනපද වැස්සෝ නුදුන් හ. අතිශයින් වස්තු හීන වූ ඒ
5 රජ තෙමේ දස වන හවුරුදුයෙහි වැටුප් දීමෙන් සිය සෙන් පොහොනට
නොහැකි විය. පසුව නොලබන ලද වැටුප් ඇති සියලු කේරළයෝ
එකව අවුත් "අප නො ලබන ලද වැටුප් දානය යම්තාක් නොවේ නම්
ඒ තාක් මේ මනා නිමාව" යි රජ ගෙයි දොරකඩ අත්‍යර්ථයෙන් හුදු
6 සාහසික ක්‍රියා ඇතිව දුනු ගත් අත් හා සැරසුනු සිරි අවි ඇතිව හුන්හ

7 (රජතෙමේ) උන් රවටා හස්තසාර දෙය ගෙණ උමගකින් පිටත්ව
යුහුව රුහුණු ගියේ ය. ඒ තෙමේ (එහි ගොස්) සිදු පබ්බත නම් ගම්හි
8 කඳවුරක් බැඳ බෑයා බිරින්ද මෙහෙසි බැව්හි තබා ගෙණ එහි විසී ය. ඒ
9 බිසව් නොබෝ කලකින් මළ කළ ඒ රජ තෙමේ සිය බෑයා දියණියන්
මෙහෙසි බැව්හි තැබී ය. ඒ පසුව කපුගල් නම් ගම නුවරක් කරවා
10 ගෙණ අධිපති බැව් පවත්වමින් රුහුණ බොහෝ කල් විසී ය. එකල
11 එයින් සෙසු තන්හි කේරළ ය, සිංහල ය, කණ්ණාට ය යන මොව්හු
12 කැමති පරිද්දෙන් අධිපති බැව් පැවැත් වූහ.

13 ඉක්බිති අස් වෙළෙන්දෙක් පර තෙරින් මෙහි ආයේ ලක්දිව
පවත් (දැන) ගොස් සොළී රජ හට දැන් වී ය. බලී හේ තෙමේ එපවත්
14 අසා ලක්දිව් ගන්නා කැමැත්තේ මහත් බළ සෙනගක් එවී ය. ඒ සේනා
15 තොමෝ වහා අවුත් ලක්දිව් බැස ගත. ඒ සොළි බල සේනා තොමෝ
ගොඩ බට තැන් පටන් බොහෝ ජනයන් පෙළමින් අනුක්‍රමයෙන්
16 රුහුණට පැමිණියා. ඒ සොළි රජහු සතිස් වන වස්හි මෙහෙසිය.
17 රතනයන ක්‍රමාගත ඔටුන්න එසේම සර්වාභරණය දෙවියන් විසින් දෙන
ලද අමූල්‍ය වීදුරු වළල්ල කැඩිය නොහැකි සිරිය, කපන ලද පටි ධාතු
18 ය යන මෙතෙක් ද හා හයින් වන දුර්ගයට වන් ඒ රජු හස්ත ගත සියලු
19 වස්තු සොළී රජු කරා යැවූ හ. (ඒ සොළීහු) තුන් නිකාහි දාගැබ් ද මුළු
20 ලක්දිව් තෙලෙහි මාහැඟි නොයෙක් ස්වර්ණාදි පිළිබිඹු ද එසේ ම ඒ ඒ
21 වෙහෙර සියල්ල ද ලාහෙළා බිඳ ගෙණ ඕජස් උරණ යකුන් සෙයින්
22 ලක්දිව්හි සාරය ගත් හ. ඒ සොළීහු පොළොන්නරුව ඇසුරු කෙළෝ
රක්පාන්කට නම් තැන හිමි කොට රජ රට අනුභව කළහ.

Non-Commercial Distribution

23 රට වැස්සෝ ඒ කසුබ් නම් කුමරහු ගෙණ සොළි හයින් රක්නෝ
24 ඉතා අදාර ඇතිව වඩති. සොළි රජ ඒ කුමරහු දොළොස් ඇවිරිදි බැව්
අසා උහු ගන්නා පිණිස පන්දහසකින් අඩු යෝධයන් ලක්ෂයක් දී මහා
25 බල ඇති මහ ඇමැත්තතන් මෙහෙයී. ඔව්හු මුළු රුහුණු රට ඔබ මොබ
26 කැලඹූහ. ඉක්බිති මකුහමු වැසි කීර්ති ඇමති තෙමේ ද එසේ ම මරාගල
වැසි බුද්ධ ඇමති තෙමේ ද යන මහා වීර වූ යුද්ධොපායෙහි විචක්ෂණ
වූ ඒ දෙනෝ සොළි සෙන් නසන්ට අත්‍යත්‍ථයෙන් කොට ගත් නිශ්චය
27 ඇත්තෝ පලුටුපාණ නම් තැන කඳවුරු බැඳ සමසක් යුද කොට බොහෝ
28 දෙමළුන් මැරූහ. නසන ලද්දාවුන්ගෙන් ඉතිරි වූ සොළීහු ඒ යුදෙහි
29 බියෙන් මිරිකුනෝ පලා ගොස් පෙර සෙයින් පොළොන්නරුවෙහි විසූ
හ. එකල කුමර තෙමේ දිනූ ඒ ඇමතියන් දැක තුටුපහටු ව දරුවෙනි වර
30 ගනිව්" යි කීයේ ය. බුද්ධ ඇමති තෙමේ ප්‍රවේණිගම් වර ඉල්වී ය.
31 කීර්ති ඇමති තෙමේ ගන්නා ලද සාංසික අය හරණට වර ඉල් වී ය.
32 නිර්භීත වූ ආදර ඇත්තා වූ ඒ ඇමතිවරයෝ දෙදෙනා එකල උතුම් රජ
33 කුමරහු වෙතින් වර ලැබ උහු පා වැන්දේ යි. සොළීන් විසින් ගත් මිහිඳු
රජ තෙමේ දොළොස් හවුරුද්දක් චෝළ මණ්ඩලයෙහි වැස (ඔටුනු
පැළඳි) අටසාළිස් වන්නෙහි පරලෝ ගියේ යි.

34 මෙසේ ප්‍රමාද දෝෂානුගමනයෙන් ලබන ලද්දා වූ සම්පත් ස්ථිර
නොවෙති, එහෙයින් තමහට වැඩ පතන්නා වූ මහා පැනැත්තෝ
නිතොර අප්‍රමාදයෙහි යෙහෙන් හැසිරෙන්නේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
ලංකා විලෝප නම් පස් පණස් වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් හය වෙනි පරිච්ඡේදය

1 එකල සියලු සිංහලයෝ රජ කුමරහට විකුම්බා යන නම් කොට
සාදරයෙන් උහු අණ වැටුනා හ. ඒ රජ දෙමළුන් නසන්ට නොයෙක්
2 පරිද්දෙන් වස්තු රැස් කොට සේවකයන්ට සුදුසු පරිද්දෙන් සංග්‍රහ
කෙරෙමින් අබරණ, කිරුළු, සේසත් සිහසුන් ආදිය කරවා ඇමැත්තන්
3 විසින් ආයාචනා කරණ ලද්දෙත් "රජහට ගැන්ම යම්තාක් නො වේ
4 නම් එතෙක් ම මාගේ ඒ සේසත් නැගීමෙන් කිම් දැ"යි අභිෂේකය
නවතා මහා බල ඇති ඒ ක්ෂත්‍රිය තෙමේ සියයක් දහසක් මිනිසුන් එක්
5 කොට සංග්‍රාමාරම්භ කාලයෙහි වාත රෝගයකින් දැඩි සේ පෙළෙනා
ලද්දේ "යුද්ධයට කල් නෙවේය" යි දොළොස් වෙනි හවුරුදුයෙහි වහා
6 දෙව් ලොව ගොස් දෙවියන් හා එක් විය.

සෙනෙවිරත් ධුරයෙහි සිටි කීර්ති නම් ඇමති තෙමේ රාජ්‍යාශා
7 ඇත්තේ අට දිනක් සිය අණ පැවැත් වී ය. මහා බල ඇති මහාලාන
8 කීර්ති නම් තැනැත්තේ උහු මරවා අභිෂේකයට පැමිණ රුහුණ රට
අනුභව කෙරෙමින් තුන්වන හවුරුදුයෙහි සොළී යුදයෙහි දී පැරැද්දේ
9 ලාහෙලා සිය අතින් සිය හිස සිඳ ගෙණ මෙළේ ය. එකල්හි ද ඒ
10 දෙමළු කිරිටා දී වස්තුසාරය එක් කොට සොළී මිහිපල්හු වෙත යැවූ
හ. විකුම්පඬිය යි ප්‍රසිද්ධ රජ කුමරෙක් එකල බියෙන් සිය රට හැර
දූළුදිව්හි වසන්නේ ලංකා ප්‍රවෘත්ති දත්තේ රුහුණු පෙදෙස් අවුත්
11 කළුතොට වෙසෙමින් වසක් රජය කරවී. එකල රාමගොත්‍රයෙහි උපන්
12 ජගත්පාල නමින් ප්‍රසිද්ධ රාජපුත්‍රයෙක් අයෝධ්‍යා පුරයෙන් ආයේ ඒ
විකුම් පඬිහු රණභූමියෙහි දී මරවා මහා බල ඇති ඒ තෙමේ සතර
13 හවුරුද්දක් රුහුණු රජය කරවී. සොළිහු උහු ද රණබිමෙහි මරා දියණියන්
14 සහ බිසව ද සියලු ධන සාරය ද සොළී රට යැවූ හ. ඉක්බිති පඬිරජහු
15 පුත් පැරකුම් නම් රජ තෙමේ දැවුරුද්දක් රජය කෙළේ ය. සොළිහු යුද
16 කොට උහු ද මැරූ හ.

අත්‍යර්ථයෙන් ලෝභ බලයෙන් අභිභූත මොවුහු සියල්ලෝ විගසම
විනාස ගත වූහ. එහෙයින් පැණැත්තේ හැම කල් හ මෙසේ බැව් දැන
තෘෂ්ණාක්ෂයෙහි ම ඇලුම් කරන්නේ ය.

17

මෙතෙකින් හු දී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
ෂරාජක නම් සපණස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් හත් වෙනි පරිච්ඡේදය

1 මකුහමුවැසි සත්‍ය ප්‍රතිඥා ඇති නිර්විකාර වූ සොළීන් එඩි මඩනා
ලෝකේශ්වර නම් සෙනෙවි තෙමේ ජනයා මැඩ රුහුණ රට රජයට
2 පැමිණ චාරිත්‍ර විධියෙහි දක්ෂ වූයේ කතරගම හි වෙසෙයි.

3 එකල මහා බල ඇති කීර්ති නම් රජ කුමරෙක් විය. උහු වංසාදි
සම්පත් තොමෝ පිළිවෙළින් කියනු ලැබේ. කසුබ් රජහු පිත් මාන
4 නමින් ප්‍රසිද්ධ වූ සත් පුරුෂාචාරයෙන් හෙබියා වූ ධීර වූ ඇපාණ
කෙනෙක් විය. තව ද උහු දෙටු බෑ මහපණැති මාණවම්ම තෙමේ
5 ගොකන් සමුදුර වෙත හෝ ඉවුර හිඳ විදි වූ පරිද්දෙන් අශේෂයෙන්
6 කරණ ලද මන්ත්‍රෝපචාර ඇත්තේ අක්ෂමාලාව ගෙණ මතුර දපන්ට
7 පටන් ගත. වාහන සහිත කඳ කුමර තෙමේ උහු පෙරට පහළ විය.
මොනර තෙමේ මුව තුඩින් බලිතටුව බිඳ සිදුරු සහිත පොල් කබල දිය
ගොස් වියළුනෙහි දිය නො දකිමින් මතුරණ උහු ඉදිරියට ආය. එකල
8 හේ තෙමේ හිවිනී සිද්ධි දක්නේ සිය නෙත උහුට එලවී ඒ මොනර ද
9 ඇස බිඳ වහා පියේ ය. සතුටු වූ කඳ කුමර ඒ පැතූ වරය දී බබළමින්
10 ඉන් නැගී අහසින් ගියේ ය. ඇමැත්තෝ බුන් එක් ඇස් ඇති උහු දැක
11 බැගෑව හැඬූය. ඇමතියෝ ඊට සතුටු වූවෝ "අනුරාපුරට පැමිණ අභිෂේක
12 කටයුතු "යි උහු ආරාධනා කළහ. "අංග විකල වූ මට දූන් රජයෙන්
13 කවර වැඩෙක් ද? මම පැවිදි බවට පැමිණ තපස්කම් කරන්නෙමි. කනිටු
14 මාන තෙමේ ක්‍රමාගත ලක් රජය රකීව"යි හේ තෙමේ තමහට පැමිණි
15 රජය ප්‍රතික්ෂේප කෙළේ ය. එකල සර්වප්‍රකාරයෙන් උහුගේ චිත්තාචාර
දත් ඇමැත්තෝ කනිටු කුමර හට එ පවත් කියන්ට මිනිසුන් යවූහ.
16 (හේ තෙමේ) එප වත් අසා වහා අවුත් සිය බෑයා දැක පාමුල වැටී
17 බොහෝ කොට මුරගා හඬා දෙටු බෑයා හා අනුරාධපුරයට ගියේ. දෙටුහු
18 සිත් අනුව පවත්නේ එහි දී ඔටුනු දැරී. ඉක්බිති අභය ගිරියට ගොස්
19 බුහුමන් පෙරදැරිව බෑයා පැවිද්ද එහි යතීන්ගෙන් ඉල්විය. එකල ඒ
20 යතීහු විකලංග උහු ගේ පැවිද්ද ශික්ෂා පදයෙහි ආදර නැතිව කළහ.
21 උන් වහන්සේට උත්තරොල නම් වූ මහත් පිරිවෙණක් කරවා රජ තෙමේ
22 ඒ පිරිවෙණ උන් වහන්සේ හිමි කොට එහි සසියයක් භික්ෂූ ඒ තෙරුන්
23 අයත් කොට වෙහෙර උන්වහන්සේට පස් මෙහෙකරුවන් දින. රජ
තෙමේ නානා ශිල්ප කර්මයෙහි විචක්ෂණ දළදා රක්නා මිනිසුන් ද ඒ
24 තෙරුන් අයත් කෙළේ ය. බගිරිනකයෙහි භික්ෂූහු ඒ තෙරහු අවවාද
25 සරු වූහ. රජ තෙමේ ද ඒ තෙරහු අනුශාසනාවෙහි සිට ලෝක
26 පරිපාලනය කෙළේ ය. ඒ වංශයෙහි උපන් කිසි මිනිස් කෙනෙක්
27 පැවිදි අපේක්ෂා නැතිව මහා සාමි යන පදය ඇසුරු කළෝ කැමති සේ

Non-Commercial Distribution

විසූ හ. දහම්නය දත් මේ මාණවම් රජුගේ අක්බෝ කුමර ආදී දරු
මුනුබුරු ක්‍රමයෙන් පැවත ආ ශුඬවංශ වූ රාජ කුල මස්තකයෙහි උපන්නා
වූ මනා කොට ලංකායෙහි රාජනනුශාසනා කරන්නෝ සම සොළොස්
28 දෙනෙක් වූහ. මිහිඳු රජු මයිල්හු දේවාලය ලෝකිතාය යන නමින්
ප්‍රසිද්ධ ලාවන්‍ය ගුණොපේත දූන් දෙදෙනෙක් වූහ. ඒ දූන් දෙදෙනා
29 අතුරෙන් ලෝකිතා කුමාරිකා තොමෝ මයිල්හු කුමරු නිසා කසුබ් නම්
මනා කුමරකු ලද්දී ය. ඒ තෙමේ මුගලන් ය, ලෝකයා යන නම් ඇති
30 හොබනා පුතුන් දෙදෙනෙකු ලද. ඔවුන්ගෙන් දෙටු කුමාර තෙමේ
31 ලෙව් සසුන් සිරිත්හි පඬි වූයේ මහාසාමි යයි ප්‍රසිද්ධ විය. සඞ්සොප
32 ස්ථානයෙහි ඇලුණු නොයෙක් සාර ගුණයන්ට වාසභවන වූ හේ තෙමේ
රුහුණු දනව්වෙහි වාසය කෙළේ ය.

33 දාඨොපතිස්ස රජහුගේ මුනුබුරු කෙණෙක් සැදැහැත්තේ බුදු සස්න
පැවිදි වූයේ ධූත ගුණ ඇත්තේ සීල සංවරයෙන් යුක්තව හේ තෙමේ
34 දානාදියට මෙහෙය ලද සිත් ඇති ව විවේකීව වන සෙනස්න වෙසෙයි.
දෙවියෝ උන්වහන්සේ කෙරෙහි පහන්ව හැම තන්හි ගුණ වැණූහ.
35 එකල ලංකේශ්වර තෙමේ හැම තන්හි පතළ ගුණ අසා උන්වහන්සේ
කරා එළඹ වැඳ තමන්ට අනුශාසනා කරණු පිණිස ආරාධනා කෙරෙමින්
36 නොකැමැති උන්වහන්සේ නැවත නැවත යාච්ඤා කොට වඩා ගෙනවුත්
මොනවට කළ පහයෙක්හි ඒ තෙරුන් වස්වා එහි වසන ඒ යතිශ්වරයාගේ
37 ගුණයෙහි පහන් රජ තෙමේ ඒ තෙරුන් අනුශාසනා මාර්ගයෙහි පිහිටියේ
38 දැහැමින් ලෝක පාලනය කෙළේ ය. එකල ලංකේශ්වරයා විසින් මනා
39 කොට කළ ආරාධනා සඳහා දයානුගත යතීන්ද්‍ර තෙම ගලතුරුමූල
(වෙහෙරින්) නික්ම යම් තැනෙක භික්ෂූන් රැස් කොට යම් හෙයකින්
40 වාසය කළ සේක් ද එහෙයින් ඒ විහාරය සේලන්තර සමූහයයි ප්‍රසිද්ධියට
ගියේ ය. එතැන් පටන් රාත්‍රියෙහි දෙවොල වස්වා දෙවියන් විසින්
අනුමත කළ භික්ෂු කෙනෙක් මුල් තන්හි තබත්මැයි. මුල්ව වසන
41 යතීන්ගේ අනුශාසනාවෙන් ලෙව් සසුන් රකිමින් ලඞ්කශ්වරයෝ
පවතිති.

42 ඒ දාඨොපතිස්ස රජහුගේ වංශයෙහි උපන් බෝධි නම් රජ කුමරහු
නිසා එම වස උපන් බුද්ධා නම් කුමාරිකා තොමෝ වර ලක්ෂණ ඇති
ලොකිතා නම් දියණි කෙනෙක් ලද. ඕ තොමෝ නුවණැති මුගලන්
43 කුමරහට සුදුසු කල පාවා දුන්නී ය. ඒ කුමාරිකා තොමෝ උහු නිසා
44 කීර්ති නම් කුමරකු ද මිත්‍රා නම් කුමරියක් ද, එසේම මිහිඳුය, රක්ඛිතය
යන කුමරුන් දෙදෙනෙක, මෙසේ දරුවන් සතර දෙනෙකු ලද් දී ය.
ඔවුන් අතුරෙන් දෙටු කුමාර තෙමේ ධීරය, වීරය, තෙළෙස් හැවිරිදිය

Non-Commercial Distribution

45 වෙසෙසින් ධනුශ් ශිල්පයෙහි කෘතහස්තය, පසුව හේ තෙමේ "සතුරු
උවදුරු දුරලා ලක්දිව් කෙසේ ගනිම්දෝ"යි චින්තාපරවශව මුල් සල
නම් ගම විසී ය.

46 එකල වීර වූ මහ බල ඇති බුද්ධ රාජයි ප්‍රසිද්ධයෙනේ ලොකේශ්වර
සෙනෙවියා හට විලෝම්වර්ති වු සුන්සල් නම් දනව්වට වහා පලා
ගියේ ය. එහි වැසි කීර්ති ආදි නොයෙක් ජනයන් සර්වප්‍රකාරයෙන් මා
47 48 වසඟයෙහි පවත්වා සංග්‍රාම සූරවූ බොහෝ නෑයන් හා සමග දුෂ්ප්‍රසහ්‍ය
49 වූයේ මලය පර්වත පාදයෙහි එකල විසී ය. සංඝ නම් වූ ගණක නායක
50 තෙමේ උහු වෙත එළඹ කුමාරයාගේ ඇති සැටි මනා කොට කියේ ය.
51 "මාහිමියා දෙටු පිත් කීර්ති නම් කුමාර තෙමේ පුණ්‍ය ලක්ෂණයෙන්
යුක්ත ය. උතුම් වූ බුද්ධි හා වික්‍රම ඇත්තේ ය. දඹදිව්හි රාජ්‍යය
එක්සත් කරන්ටත් උහු සමත් යයි සිතමි. ලක්දිව්හි කියනුම කිම"
එතෙමේ උහු බස් අසා කුමර තෙමේ සේවා කටයුතු ය යි නිශ්චය
52 කොට කුමරහු වෙත මිනිසුන් යැවී ය. උන් බස් අසා වළකන හයින්
53 මව්පියන් නොදන්නා කලම දූනු පමණක් සහාය කොට ඇති වීර ඒ
54 කුමර තෙමේ ගෙන් නික්ම නොයෙක් පරිද්දෙන් පසස්නා නිමිති
55 නොපමාව සිරිවග පිටියට ගියේ . මහ නැණැති වීර වූ ඒ තෙමේ එහි
වෙසෙමින් සිය සේවායන් යවා පසමිතුරන් සිටි බෝ වළ නම් ගම
දිනූයේ ය. ඉක්බිති අබිමන් ඇති ලෝකේශ්වර සෙනෙවි තෙමේ සෙනඟක්
56 57 එහි යැවී ය. ඒ සේනා තොමෝ ඒ ගම වටලා යුධාරම්භ කළා. ව්‍යක්ත
වූ වික්‍රම ඇති මනා භටයන් ගෙන් යුක්ත කුමාර තෙම උන් හා යුද
කෙරෙමින් සියල්ලන් සැඩ පවන පුලුන්සේ (ඒ ඒ) දිග විසිරවී. එකල
58 ස්ථාන දන්නා කුමාර තෙමේ සුණුවල් දනව් ගොස් එහි වෙසෙමින්
සියලු මලය මඬලට තමා වසඟයෙහි යා කොට එකල්හිදු සෙනෙවි
තෙමේ නොයෙක් වර සියසෙන් යවා එ කුමරහු අභිභවනය කරන්නට
නොහැක්කේ දොම්නසට පැමිණියේ ය.

59 ඉක්බිති මකුහමු වැසි කීර්ති ඇමතියා පුත් බල ඇති දේව මල්ල
60 61 යයි ප්‍රසිද්ධ අයෙක් බන්දු මිත්‍රයන් කැටිව බොහෝ වූ රුහුණු වැස්සන්
62 ගෙණ අවුත් ආදර සහිතව කුමරහු දුටුයේය. පණර වස් ඇති මහා
යසසින් යුත් සමත්ථ ඒ කුමර තෙමේ ද එහි දී සිරිය බැඳ ඇපා තනතුරට
පැමිණියේ ය. මහ බල ඇති ඒ කුමර තෙමේ හිරණ්‍ය මලයට අවුත්
63 එහි රෙමුණුගල කඳවුරු බැන්දේ ය. සෙනෙවි තෙමේ එහි ද සෙන්
64 එවා යුද කරවන්නේ ජය නො ලැබ ඉන්මතු යුද්ධයක රිසි හළුයේ ය.
65 එකල ලෝකනාථ නම් සෙනෙවි තෙමේ සිය ලෙව් හර සවන මස
66 පරලෝ පරායණ විය.

Non-Commercial Distribution

67 එකල්හි කසුබ් නම් කේසධාතු නායක වූ එක් කෙනෙක් ජනයා
68 මැඩ රුහුණ සිය අණ පැවැත් විය. එකල සොළී සාමන්ත තෙමේ
එපවත් අසා පොළොන්නරුවෙන් නික්ම යුද්ධයට සැරසී කතරගම
69 ගියේ ය. එකල කෙස්දානා තෙමේ යුද්ධයෙහි දෙමළ බළසෙන් බිඳ
70 රක්පහන් සීමායෙහි ආරක්ෂක මිනිසුන් තබා ලබන ලද ජයෙන් ඔද
වැඩිව මහ සෙනගින් පෙරටු කරණ ලදුව ශෞර්‍ය්‍ය භාවෝපලක්ෂිත ව
පෙරළා අවුත් කතරගම නුවරට වන.

71 එකල ඉතා තිර ඉසුරු ගුණ ඇති ඈපාණෝ එ පවත් සියල්ල
72 අසා කෙස් දාවන් නසන්ට යුහුව බලසෙන් සැරසූ හ. අතිශයින් අබිමන්
ඇති හේ තෙමේ එ පවත් අසා සියලු බළසෙන් ගෙණ ඉන් පිටත්ව
73 සිප්තලට ආයේ ය. පස් යොදුන් ආදි රට වැසි ඉතා බොහෝ මිනිසුන්
ගෙණ අතිශයින් පැරද විය නොහෙන රජ කුමර සමීප වන කල
74 කෙස්දානා තෙමේ බොහෝ රට වැස්සන් (තමහට) නො සතුටු බැව්
75 දැන " මෙහි යුද උගහටය"යි සිතා බදිරංගණියට ගියේ ය. සොළොස්
වස් ඇති ඒ මිහිපල් කුමර ද මහ සෙන් සඟ පහ වූ බිය ඇත්තේ
76 කතරගම් නුවරටවන. රුහුණ සමසක් අනුභව කොට රොස් මනස්
77 ඇති කෙස්දානා තෙමේ යුද පිණිස එහි ගියේ ය. ඉක්බිති රජ කුමරහු
මහ බල ඇති සේනා තොමෝ රළු යුද පවත් වන්නී කෙස්දාවන් හිස
ගත්තා ය.

78 මේ කුමර තෙමේ සතළොස් අවුරුදු විය පැමිණ සියලු තැන
පතළ මහ යසකිත් හා තෙද ඇත්තේ සමා දී නොයෙක් විදි යෙදුම්
විශෙෂයෙහි දක්ෂ වුයේ ඒ මුළු රුහුණු සතුරු කටු උපුටා නැති කෙළේ
ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස රොහණ රාති විජය නම් සත් පණස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් අට වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් යුව රජ පදවියෙහි සිටි නය දන්නා වූ උහු ගේ
2 නම විජයබාහු ය. ඕ සෑම තන්හි පතළ වී. මහ නුවණැත්තේ එහි සිය
3 අණින් බෙර හසුරුවා නොයෙක් ඇමතියන් සුදුසු තනතුරෙහි තබන්නේ
4 චතුර වූ (හෙතෙමේ) රජ රට වසන්නා වූ සොළින් මඩනා පිණිස උපා
5 යොදමින් එහි විසී. සොළී රට තෙම ඒ අසා පොළොන්නරුවෙහි
සිටියා වූ (සිය) සෙනෙවියා බලවාහන දී යැවී, කතරගම ළඟට පැමිණි
සෙනෙවියා පැරද විය නොහැක්කැයි දැන (මහ ඈපා තෙමේ) එ තැනින්
පර්වත දුර්ගයට ගියේ යි.

6 සෙනෙවි තෙමේ වේගයෙන් කතරගම පැහැර ගෙණ එහි වසනට
7 නො හැක්කේ නැවත සිය දෙසට ආයේ ය. ඉක්බිත්තෙන් ඈපා තෙමේ
8 ද පර්වතයෙන් වහා අවුත් මහත් වූ සේනා සමූහයක් සමග සිප්තල විසී.
9 (මහාදිපාද) රජ තෙම රාමඤ්ඤ රට රජු කරා බොහෝ ජනයන් ද
10 බොහෝ සාර වූ ධන සමූහයක් ද යැවී. විසිතුරු වස්ත්‍ර කපුරු සඳුන්
ආදී වතින් සම්පූර්ණ (එවන ලද) නොයෙක් නැව් තොට රැස් වූහ.
11 නොයෙක් ධන ජාතියෙන් යෝධයන් සංග්‍රහ කරන්නේ ඉක්බිති මහ
12 සේනා ඇතිව තම්මල නම් ගමෙහි විසී. රජ රට වැසි වූ ජනයෝ
ඔවුනොවුන් විරුද්ධ බැවින් සියල්ලෝ ම එළඹ සර්වප්‍රකාරයෙන් සුංවත්
13 නො දෙති. සොළී රජ හට විපක්ෂ වූවෝ ඒ අණ බිඳ මදයෙන් උඩඟුව
14 සුංවත් ගන්නා රාජ පුරුෂයන් වෙහෙසමින් කැමති සේ හැසිරෙත්. ඒ
අසා බලවත් කෝපයෙන් වසඟ කරණ ලද්දා වූ සොළී රජ තෙම මහ
15 සේනාවක් දී සිය ඇමතියා පිටත් කෙළේ ය. මහ තොට බැස්සා වූ
16 හෙතෙම ඒ ඒ තැන බොහෝ ජනයන් නසමින් රජ රට වැස්සන් තම
වසඟ කොට ක්‍රෑර වූ ආඥා ඇත්තේ පිළිවෙළින් රුහුණට ගොස් සේනා
සහිත වූයේ බුන්වෙරළැති සාගරය මෙන් යට කර ගත්තේ ය. රවිදේව
චලය යන නම් ඇත්තා වූ මහ බලැත්තෝ දෙදෙන රජ හට සතුරු ව
දෙමළ සෙනෙවියා වසඟවී ය.

17 සේනාපති තෙම මහත් පක්ෂ බල යුක්ත වූ ඔවුන් දැකසියලු
18 රුහුණු රට වහාම තමා හස්ත ප්‍රාප්ත වූ සෙයින් සිතී. ඒ රජ තෙමේ
එකොළොස් වෙනි වසෙහි සොළීන් මැඩ පැවැත්වීම පිණිස පලටුපාණ
දුර්ගයක් කොට එහි විසී. සොළී සේනා තොමෝ එකල්හි එ පර්වතය
19 හාත්පසින් වටකළා ය. එහි උභය සේනාවන්ගේ භය උපදවන්නා වූ
යුධයක් විය,

20 රජහුගේ යෝධයෝ ඒ සියලු ම දෙමළ සේනාව වනසා පලා
21 යන්නා වූ මහසොළි සාමන්තයා ද ලුහුබැඳ තඹවිටි නම් ගමෙහි දී යාන

Non-Commercial Distribution

22 වාහන හා සාර වූ වස්තූන් සමග උහුගේ හිස ගෙන ගන්නා ලද සියලු
බඩු ගෙණවුත් රජහට දක්වා "පොළොන්නරුවට යන පිණිස කල්ය" යි
23 කීහු. මිහිපල් තෙමේ ද ඇමතියන් බස් අසා එකල්හි මහා සේනා
සමූහයා හා සමග පොළොන්නරුවට ගියේ යි. සොළි රජ තෙමෙ මේ
24 සියලු පවත් අසා තියුණු කෝප වසඟ වූයේ මිහිපල්හු අල්වා ගණු
25 කැමැත්තේ වීයර්‍ය ඇතිව තෙමේ ම වහා මුහුදු පටුනට අවුත් බොහෝ
සෙයින් මහ සෙනගක් ලක්දිවට එවී.

26 රජ තෙමේ ඒ දැන සොළී සේනාව හා යුද කරණු පිණිස මහ
27 සේනාවක් දී සිය සෙනෙවියා යැවී. යන්නා වූ ඒ සේනාපති තෙමේ
අනුරාධපුර සමීපයෙහි දෙමළ සේනාව හා සමග මහත් වූ යුද්ධයක්
පැවැත් වී.

28 ඒ යුද්ධයෙහි දී රජහුගේ බොහෝ මනුෂ්‍යයෝ වැටුනා හ. ඒ රට
29 වැස්සෝ නැවතත් දෙමළුන් අයත් වූහ. එකල්හි මහිපල් තෙමේ
30 පොළොන්නරුව හැර වේගයෙන් විල්ලිකා බාන නම් රටට පැමිණ
එකල්හි ඒ රටෙහි සිටිය ඇමතියන් දෙදෙන නසා සිය බල සෙන් රැස්
කෙරෙමින් එහි වාසය කෙළේ ය.

31 සොළී සෙනෙවියා තමන් ලුහුබඳින්නා අසා කල් දන්නා වූ රජ
32 තෙමේ වාතගිරි නම් පර්වතයට ගොස් ඒ පව්ව වෙත බලකොටු පිහටුවා
33 තුන් මසක් යුද කරන්නේ දෙමළුන් පසු බැස් වී. පෙර යුද්ධයෙහි
34 මරණ ලද කේශධාතුව නම් අධිපතියාගේ බාල සොහොවුරු මැරවීම
සිහිකෙරෙමින් රොස් සිත් ඇත්තේ සියලු ගුත්හල් මඩුල්ල විපයර්‍යාස
කෙළේ ය.

35
ඉක්බිති මහත් බල ඇත්තා වූ ලංකේශ්වර තෙමේ වහා එහි
36 ගොස් මරුතලා නම් තන්හි කඳවුරු බැඳ උහු යුදයෙහි බඳි රංගණය
නම් දුර්ගයෙන් පලවා යුද කරන්නේ කුඹුල්ගල්ල නම් ස්ථානයෙන් ද පහ
කෙළේ ය.

පුත්‍රදාරා දී සියල්ල ද නොයෙක් ධනය ද සේනාව ද හා පලා
37 යන්නා වූ හෙතෙම සොළීන් අයත් වූ රටට වහා ගියේ ය. එකල්හි
38 නරෙශ්වර තෙම එහි තිබූ උහු සතු සියලු ධනය ගෙණ ගොස් තම්බල
නම් ගමෙහි අභිනව දුර්ගයක් පිහිටුවා පිළිවෙළින් ගොස් මානාහුල නම්
39 පුරයෙහි සොළීන් හා යුද කරන්ට සේනාවක් මොනවට සඳමින් විසී.

40 ඉක්බිත්තෙන් රජ තෙමේ මහ බලැති ඇමතියන් දෙදෙනෙකු
41 කැඳවා එහි ජනයන් වසඟ කරණු පිණිස දකුණු පසට යැවී. ඉක්බිත්තෙන්

Non-Commercial Distribution

අධිපති තෙමේ කර්කශ වූ මහ ඇමති දෙ දෙනකු සොළීන් අබිමන්
42 වනසන පිණිස වෙරළ මහ මග යැවී. දකුණු පසට යන ලද්දා වූ මහ
බලැති ඒ ඇමතියෝ දෙදෙන මුහුන්නරුගම් නම් වූ දුර්ගය ද බලතල ද,
43 වැතරූ නම් බල කොටුවද, බුද්ගමුවද, තලගුල්ද, මහගල මජගල්ලද,
44 අනුරාධපුරය ද යන මේ ස්ථානයන් ක්‍රමයෙන් ගෙණ රට වැස්සන්
45 තමන් වසෙහි පවත්වමින් මහ තොටට පත් වූහ. ඉක්බිත්තෙන් වෙරළ
46 මහ මග යවන ලද ඇමති දෙදෙන වනාහී ඒ ඒ තැන සගම ආදී වූ
කඳවුරු පැහැර ගණිමින් පිළිවෙළින් පොළොන්නරුව වෙත පැමිණ "
47 මෙහි වඩනට වටනේ" යි නරේන්ද්‍රයන් කරා, දූතයන් යැවූහ. දෙ
48 දිසාවෙහි ගියා වූ ඇමතියන් විසින් පවත් වන ලද වික්‍රම විශේෂය අසා
කල් දන්නා වූ ඒ මිහිපති තෙමේ විධි දක්ෂ වූයේ වහාම සමගි වූ
49 සේනාව සන්නද්ධ කොට සොළින් උපුටන පිණිස ඒ නුවරින් නික්මිණ.
50 අධිපති තෙමේ ගඟින් යමින් මියුගුණ දාගැබ් සමීපයෙහි සේනා නිවෙසය
51 කරවා ස්වල්ප කාලයක් විසී. ස්ථාන දන්නා වූ සේනා නිවේස කරවා
52 ස්වල්ප කාලයක් විසී. ස්ථාන දන්නා වූ මහාවීර තෙම පිළිවෙළින්
53 අවුත් පොළොන්නරුවෙහි යුද කරණු පිණිස රැස් වූහ. සොළීහු නුවරින්
පිට නික්ම ගොස් මහ යුදයක් කොට පැරද භය ඇතිව සිය නුවරට
54 පිවිස වසන ලද සියලු පුර දොර ඇතිව බිහිදොර අටලු ඇසුරු කළාහු
බොහෝ උත්සාහ ඇත්තා වූ බිය එලවන්නා වූ මහ යුද්ධයක් පැවැත්වූහ.
55 ඒ නුවර වසා ගෙණ එක් මස් පසළොස් දිනක් යුද කරන්නා වූ
මිහිපල්හුගේ මහා සේනා තොමෝ (අර්ථය) සිදු කරණු නොහැකි වී.
56 මහ රජහුගේ මහත් වූ වීර්‍ය ඇති මහා ශූර වූ මහා බලැත්තා වූ මහා
මාන ඇත්තා වූ රවිදේව, වල ආදි වූ මායා යෝධයෝ පවුර පැන
බලාත්කාරයෙන් පුරයට පිවිස ක්ෂණයකින් සියලු දෙමළුන් මුල් නැසීම්
වශයෙන් මැරූහ.

57 මෙසේ ලත් ජය ඇත්තා වූ මහත් වූ නුවණැති ඒ විජයබාහු නම්
58 වූ රජ තෙමෙ එකල්හි සිය අණින් නුවර බෙර හැසිරවී. මහ බෝ
පිහිටීමෙන් මෑත දොළොස් වෙනි හවුරුද්ද දක්වා ලක්දිව රජ දරුවෝ
බෝ පුද කර වූහ. සොළීරජ තෙම ස්වකීය සේනාවගේ විනාසය අසා
සිංහලයෝ බලවත් යයි සිතා නැවත සේනාව නො එවී ය.

58 උඩගු සොළී ශ්‍රේෂ්ඨයන් නිරවශේෂයෙන් නැසුවා වූ ඉතා මනා
කොට තබන ලද රජහට ඇති පැණැති වීර වූ රාජශ්‍රේෂ්ඨ තෙම ඉෂ්ට වූ
අනුරාධපුරවරයට අතිශයින් සතුටුව පසළොස් වෙනි වසයෙහි සම්ප්‍රාප්ත
වූයේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස අනුරාධ
පුරාභිගමන නම් වූ අට පණස් වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# පනස් නව වෙනි පරිච්ඡේදය

1 (ඒ විජයබාහු රජ) ලංකාව ආරක්ෂා කරණ පිණිස යෝධ සම්මත
2 වූ බලවත් ඇමතියන් කටයුතු උගන්වා හාත්පස යෙදී. අබිසෙස් මඟුල්
පිණිස ප්‍රාසාදා දී වූ නොයෙක් කළමනා සම්පාදනය කටයුතුය යි
3 ඇමතියකුට නියෝග කොට ඒ පියසෙහි වැදිය යුතු වූ නොයෙක්
චෛත්‍යයන් වඳිමින් තුන් මසක් ගෙවා පොළොන්නරුවට නැවත
පැමිණියේ ය.

4 ආදිමලය නමින් ප්‍රසිද්ධ වූ සේනානායක තෙම මහිපාලයාහට
5 සර්වප්‍රකාරයෙන්ම ඉඳුරාම විරුද්ධව සියලුම සේනාව ගෙණ මද වූ
නුවණැත්තේ යුද්ද පිණිස නුවර සමීපයෙහි අනු නමින් ප්‍රසිද්ධ වූ ගමට
6 ආයේ ය. ලංකේශ්වර තෙම එහි ගොස් උඩගු වූ උහු උදුර ඒ සේනාව
7 තමා වසඟ කොට පොළොන්නරුවට සම්ප්‍රාප්ත වූයේ ය. මිනිසුන්
කෙරෙන් අතිශයින් උතුම් වූ ප්‍රඥා සහිත වූ හේ තෙමේ යුව රජ පදවිය
ඇසුරු කළේ ම සතළොස් විය පියවි.

8 ඉක්බිති විධි වූ පරිද්දෙන් අනුරාධපුරට පැමිණ විදහන් දන්නේ
අබිසෙස් මහ සැණකෙළි සුවය අනුභව කොට පාප ධර්ම යන්හි
9 නොපිහිටියා වූ ශ්‍රේෂ්ඨ කර්මයෙහි පිහිටියා වූ හෙතෙම මනා කොට
පිහිටියේ අටළොස් වෙනි වස පියවි. ඉක්බිත්තෙන් අවුත් උතුම් වූ
10 පොළොන්නරුවෙහි සිරිසඟබෝ යන නාමයෙන් ප්‍රසිද්ධ වූ හෙතෙම
11 විසී. හෙතෙම බාල සොහොවුරු වීරබා කුමරහු උපරජ තන්හි පිහිටුවා
දකුණු දෙස දී විධි වූ පරිද්දෙන් උහුට සංග්‍රහ කෙළේ ය.

12 යළිත් රජ තෙමේ කිස් දොවුන් සොහොවුරු වූ ජයබා කුමර හට
13 ඈපා පදවිය දී රුහුණු රට ද දින. සියලු ඇමැතියන්ට සුදුසු පරිද්දෙන්
තනතුර දී රාජ්‍යයෙහි යුක්ති වූ පරිද්දෙන් සුංකම් යෙදී.

14 කරුණාධාර වූ පිහිටියා වූ ධර්ම ඇති ඒ මිහිපති තෙමේ බොහෝ
15 කල් පිරිහුණා වූ අධිකරණ විනිශ්චය දහම් වූ නියාවෙන් පැවැත් වී.
මෙසේ මැනවින් සතුරු කටු මුළු උදුළා වූ නරනිඳුහු මනා කොට ලංකා
16 රාජ්‍යය අනුසස්නා කල්හි ඡත්‍ර ග්‍රාහක නායක මනාකොට ලංකා රාජ්‍යය
17 අනුසස්නා කල්හි තෙමේ ද, දහම් ගෙයි අධිපති තෙමේ ද, එසේම
සිටුනා තෙමේ ද යන සහෝදර වූ මේ ත-න් දෙන රජහට විරුද්ධ බවට
18 පැමිණියාහු දඹදිව් පලා ගියෝ එකුන් විසිවෙනි වසෙහි ලංකාවට
19 බැස්සාහු ය. ඒ සියල්ලෝ ම රුහුණු රට ද එසේ ම මලය රට ද සියලුම

Non-Commercial Distribution

20 දකුණු පස ද වහා පෙරලූ හ. දක්ෂ වූ රජ තෙමේ රුහුණට ද, එසේ
21 ම මලය මාලයට ද ගොස් ඒ ඒ තන්හි බොහෝ සතුරු ජනයන් නසන්නේ
මනා කොට එය සන්සිඳුවා එහි ඇමතියන් තබා උදාර වූයේ මහා
22 සේනා ඇතිව දකුණු දෙසට තෙමේ ගොස් සමණිභාතු වංශයෙහි
උපන්නා වූ ඇමතයෙක් එකල්හි යවා වීර තෙමේ බියකරු වූ යුදෙහි
23 තමා සතුරු වූ උන් ග්‍රාහණය කොට උල ඉඳුවා ලංකාව නිෂ්කණ්ටක
24 නිරාතංක කරවා පොළොන්නරුවට ආයේ ය. සොළී රට වාසය කළ
ජගති පාල මෙහෙසී තොමෝ සොළීන් අතින් මිදී ලීලාවති නම්වූ
දියණි කුමරිය සමග වේගයෙන් නැව් නැගී ලක්දිව් බැස්සා එකල
25 ලංකේශ්වරයන් දිටී. රජ තෙමෙ ඇය කුලපිළිවෙළ අසා ශුඬවංශයෙහි
26 උපන් බැව් දන ලීලාවතිය මෙහෙසි බැව්හි අභිෂේක කෙළේ ය. ඒ
27 මෙහෙසි තොමෝ රජහු නිසා දූවක් ලැබී ය. ඒ කුමරිය රජ තෙමේ
යසෝදරා යි නම් කළේ ය. රජ තෙමේ මේරුකන්දර නම් රට සමග
28 ස්වකීය නන්දනිය වීරවම් කුමරහට දින. ඕ තොමෝ දූන් දෙදෙනෙක්
ලද්දී ය. ඔවුන් දෙදෙනා අතුරෙන් ඒ වැඩිමාල් තැනැත්තී මිත්තනියට
29 සමාන නම් වූ (ලීලාවතී) නම් විය. බාල තැනැත්තී සුගලා නම් විය.

30 කලිඟු රජ පරපුර උපන් යහපත් දකුම් ඇත්තා වූ තිලෝ සොඳුරු
නම් වූ සිව්මැළි වූ කුමරිය රජ තෙම් කලිඟු රටින් ගෙන්වා ස්වකීය
31 වංශයාගේ චිරස්ථිතිය පතන්නේ මෙහෙසි බැව්හි අභිෂේක කළේ ය. ඕ
32 තොමෝ සුභද්‍රා නම් ද, සුමිත්‍රා නම් [2] ලෝකනාථ නම් වූ ද, රත්නාවලී
නම් වූ ද, රූපවතී නම් වූ ද, යන මේ දූන් පස් දෙනා හා පිණැති
33 ලකුණු ඇත්තා වූ වික්‍රමබාහු නම් වූ පුත්‍රයා ද ලැබී. ප්‍රජාවෙන්
අභිවෘද්ධියට පත් වූ ඕ තොමෝ රජහු සිත් ගත්තී විය. සමකුල ස්ත්‍රීන්
හැර සෙසු අන්තඃපුරයෙහි ඒ රජහු නිසා ගර්භයක් කිසි කලෙකත් නො
පිහිටියේ ය.

34 නැවත එක් දවසෙක්හි ඇමති සමූහයා මැද පැමිණි ලකුණු දන්නා
35 ඒ තෙම පිළිවෙළින් සිටියා වූ සියලු දූන් බලා රත්නාවලිය හැරල
අවශේෂ වු දූන්ගේ පින් ලකුණු පිරුණු පුතෙකු ඉපදීම ප්‍රකාශ කරන්නා
36 වූ ලකුණක් නො දක්නේ පේමවේග ඇත්තේ රත්නාවලිය කැඳවා ඇය
හිස සිඹ තේජො ගුණයෙන් ද, පරිත්‍යාගයෙන් ද, ප්‍රඥාවෙන් සූර
37 බැවින් ද, පූර්වයෙහි ඇති වූ ද මතු ඇති වන්නා වූ ද සියලු රජ දරුවන්
38 ඉක්මවා මුදුන්පත් වන්නා වූ සතතයෙන් ලංකාව නිශ්ශංක ද එක් සත්
39 ද කරන්නට සමර්ථ වූ මනා කොට ශාසනය පාලනය කරන්නා වූ
යහපත් නොයෙක් වත් ඇත්තා වූ පුත්‍රයකු උත්පත්ති යට ස්ථානය මැය
40 කුස වන්නේ යයි හෙතෙම ප්‍රේමයෙන් මෘදු කොට කීයේ ය. වංශාභිමාන

Non-Commercial Distribution

ඇත්තා වූ ඒ රජ තෙමෙ නොයෙක් පරිද්දෙන් යාච්ඤා කරන්නා වූ ද
41 සොළී රජහට නැගණිය නොදී පිරිසිදු වංශයෙහි උපන්නා වූ පඬි රජෙක්
ගෙන්වා හෙතෙම මිත්තා නම් නැගණි වූ රජින ඕහට දින.

42 ඕ තොමෙ මානාභරණ නම් වූ ද කිත්සිරි මේඝ නම් වූ ද
43 සිරිවල්ලභ නම් වූ ද, පුතුන් තුන් දෙන ඉපිදවී. මිහිපල් තෙම සුභද්‍රාව
44 වීරබා කුමාරයාහට ද, සුමිත්‍රාව ජයබා කුමාරයාට ද මහ පෙරහරින් දින.
රත්නාවලී නම් දුව මානාභරණ කුමරහට දින. හෙතෙම ලෝකනාථ
45 නම් වූ දුව කිත්තසිරි මේඝ නම් කුමර හට දින. හෙතෙම රූපවතී නම්
46 දියණිය මළ කල්හි සුගලා නම් කුමරිය සිරි වල්ලභ නම් කුමරහට දින.
සිංහපුරයෙන් ආවාවූ මෙහෙසියගේ නෑ වූ මධූකාණ්ණවය, හිමරාජයා,
47 බලාත්කාරය, යන නම් ඇත්තා වූ රාජ පුත්‍රයන් දැක එකල්හි හටගත්
ප්‍රිති ඇත්තා වූ ඒ මිහිපල් තමේ ඔවුන්ට සුදුසු වූ වැටුප් වෙන් වශයෙන්
48 දින. ලැබූ සත්කාර සම්මාන ඇත්තා වූ ඒ සියල්ලෝ මිහිපතිහු සතතයෙන්
49 සතුටු කරමින් රිසිසේ විසූහ. මේ රාජ පුත්‍රයන්ගේ සුනාරි නම් වූ
නැගණිය ස්වකීය වංශයාගේ ස්ථිතිය ප්‍රාර්ථනා කරන්නේ වික්‍රමබාහු
කුමරහට දින.

50 එකල්හි නෑයන්ගේ වැඩෙහි බොහෝ සේ ඇලුනේ යළිදු විකුම්බා
කුමරහට යහපත් වූ ලීලාවතිය භෝග සමග දින. නිරවශේෂ වසයෙන්
51 භෝගයෙන් සමෘධ වූ ඒ රජ ගෙමේ බන්ධු ජනයන් මෙසේ පිහිටුවා
කරුණාපර වූයේ නීති මාර්යට සුදුසු සේ නෑ ජනයන්ගේ වැඩ කෙළේ
ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස සඟහ
කරණ නම් වූ එකුන් හැට වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැට වෙනි පරිච්ඡේදය

1 ඒ විජයබාහු රජ තෙම කුලවත් දනන් තෝරා ආචාර වූ පරිද්දෙන්
2 තමන් රැකවරණයෙහි යෙදී පොළොන්නරුවෙහි නොයෙක් දොරටු
වලින් යුත් වූ සුණුවමින් මනා කොට රැඳියා වූ හාත්පසින් දිගු පුළුලැති
3 ගැඹුරු දිය අගලකින් යුක්ත වූ උස් සම මළුවකින් උපෙත වූ සතුරන්
විසින් නො නැසිය හැක්කා වූ තුඟු තහවුරු පවුරක් කර වී.

4 උපසම්පදා කර්‍මයට ගණ පූරක භික්ෂූන් නොපොහොනා බැවින්
5 බුදු සසුන් පැවැත්මෙහි කැමැති සිත් ඇත්තේ ඉක්බිත්තෙන් රාමඤ්ඤ
6 රට අනුරාධ නම් මිතුරු රජු වෙත පඬුරු සහිත වූ දූතයන් යවා ඒ රටින්
7 තුන් පිටකයෙහි පරතෙර ගියා වූ ශීලාදී ගුණයන්ට ආවාස වූ ස්ථවිර
සම්මත වූ භික්ෂූන් ගෙන්වා ඒ රජ තෙමේ උන් වහන්සේලා උදාර වූ
8 පූජායෙන් පුදා නොයෙක් පරිද්දෙන් පැවිදි උපසම්පදා කරවා බොහෝ
සේම අටුවා සහිත තුන්පිටකය ද කියවා ලක්දිව පසු බස්නා වූ බුදු
සස්න බැබළ වී.

9 පුලස්ති පුරය තුළ පියසෙහි ඒ ඒ තන්හි අතිශයින් මනහර වූ
10 බොහෝ විහාරයන් කරවා තුන් නිකා වැසි වූ සමණන් එහි වාසය
කරවා උදාර වූ සිව්පසයෙන් දසැතැප් වී ඉන්ද්‍රඛීලස්තම්භයෙන් මනහර
11 වූ පවුරු අගලින් යුක්ත වූ පස් මහල් මහපහයකින් බබළන්නා වූ හාත්පස
12 යහපත් වූ ආවාස පෙළින් මොනවට බබළන්නා මිනිසුන්ගෙන් පැවතුනාවූ
අවකාශ ඇති බබළන බිහිදොර ඇත්තා වූ උතුම් වෙහෙරක් රත්නත්‍රය
13 පිහිට කොට ඇත්තා වූ ඒ රජ තෙම කරවා තුන් නිකා වාසි වූ බික්සඟ
14 හට දින. හෙතෙම සංඝයාට පිදිය යුතු දන් වැටුප් පිණිස එහි වාසී වූ
ප්‍රධානීන් සමග ඇළිසර නම් රට දී , එහි සමණන් නොයෙක් සිය
15 ගණන් වස්වා හෙතෙම සතතයෙන් උදාර වු සිව්පස පැවැත් වී.

16 හෙතෙම මහාර්ඝ වූ මනරම් දළදා මැදුරක් කරවා දළදා වහන්සේට
සතතයෙන් මහපුද කරවී. සමූහයා හා එක්ව පැවැත්මෙන් පහ වූ
17 හෙතෙම දිනක් පාසා උදය සොඳුරු වූ දහම් මැදුරෙහි ධම්මසංගණී
ප්‍රකරණය පරිවර්‍තනය කෙළේ ය. නැටුම් ආදිය හා සුවඳ මල් ආදි වූ
18 නොයෙක් පූජා පවත්නා ශ්‍රද්ධා සම්පන්න වූයේ හිසින් බුදුන් වඳී.
19 පරිත්‍යාගයෙහි ශූර වූ ඒ රජ තෙම දඹදිවින් ආවා වූ බොහෝ වූ
20 පණ්ඩිතයන් ඒකාකාරයෙන් දිය යුතු ධන දානයෙන් සැතැප් වී. සැම
කල්හි දහම් ගුණෙහි ඇළුනා වූ හෙතෙම ධර්ම දේශකයන් වහන්සේලාට
නොයෙක් පරිද්දෙන් පුද කොට සඳහම් දෙස් වී.

Non-Commercial Distribution

21 හෙතෙම තුන් වරක් බැගෑපතුන්ට තුලාබර දෙවී. පොහෝ දවස්හි
අතිශයින් පිරිසිදු කොට පෙහෙවස් ද විසී. රජ තෙමේ අවුරුදු පතා
22 දණ්ඩිස්සර නම් දානයක්දින. තුන් පිටකය ලියවා බික්සඟනට දින.
හෙතෙම මාහැඟි මිණිමුතු ආදි රුවන් යවා දඹදිව මහා බෝධිය
23 නොයෙක් වර පිදවී.

24 කණ්ණාටරජු විසින් ද සොළී රජහු විසින් ද එවන ලද්දා වූ රාජ
දූතයෝ මහත් වූ පඬුරු ගෙණ මෙහි ආවෝ මිහිපල්හු දුටහ. එයින්
25 සතුටු වූ සිත් ඇති හේ තෙමේ ඒ දූත දෙපසට කටයුතු මනාකොට
26 කරවා එවුන් අතුරෙන් පළමු කොට කණ්ණාට දූතයන් සමග සිය දූතයන්
27 සාරපඬුරු දී කර්ණාට රජු කරා යැවී ය. සොළී රජ තෙම තමා රටට
පැමිණි සිංහල දූතයන් බලාත්කාරයෙන් කන්නාසාදිය (කපා) ඉතා
28 විරූපාකාරයකට පැමිණෙවී. එකල්හි පැමිණි විප්‍රකාර ඇති වූ ඔව්හු
මෙහි අවුත් සොළියා විසින් තමන් කෙරෙහි කළ සියල්ල රජහට කීහු.
29 උසස්ව දිලිහුනු අබිමන් ඇත්තා වූ හේ තෙමේ සියලු ඇමතියන් මැදට
පැමිණීයේ දෙමළ දූතයන් කැඳවා සොළියාට මෙසේ දූන්වී. එක
30 දිවයිනෙකවත් සේනාව නැතිවම මහ මූද මැද අප දෙදෙනාගේ
යුද්ධයෙන් බාහුබල පරීක්ෂාව හෝ වේවා. නොහොත් සියලු සේනාව
31 සන්නද්ධ කොට තොපගේ රජයෙහිවත් තොප කැමති දේසයෙක්හි ඒ
32 යුද්ධය කරණු ලැබේවා. මා විසින් කියන ක්‍රමයෙන්ම තොපගේ
33 ජනාධිපති තෙමේ කියලු ලැබිය යුත්තේ වේ, මෙසේ කියා ගැහැණු
අබරණින් සරසන ලද ඒ දූතයන් වහා ම සොළී රජු කරා යවා
ඉක්බිත්තෙන් සෙනග ගෙණ අනුරාධ පුරයට ගියේ ය.

34 සොළී රට ගොස් යුද කරණු පිණිස මැටිවල් තොටට ද මඟ
35 තොටට ද සෙනෙවියන් දෙදෙනෙක් යැවී. යුද පිණිස සේනාව සොළී
රට යවන කරුණෙක් සෙනෙවියන් නැව් ද මාගෝපකරණ ද සදන
37 කල්හි (රජහට) තිස් වෙනි හවුරුදු වූ කල්හි වේළක්කාර යන නම්
ඇත්තා වූ සේනා සමුහයෝ එහි යන්නට නොකැමැතිව විරුද්ධව
මතැතුන් සෙයින් සේනාපතීන් දෙදෙනා මරා උඩඟුව මුළු
පොළොන්නරුව පැහැර ගත් හ.

38 පුතුන් තුන් දෙනෙක් සහිත වූ රජහු නැගණියන් ද අල්වා ගෙණ
39 බලාත්කාරයෙන් රජ පහය ද දූවූහ. ඒ රජ තෙම වහා නික්ම දකුණු
40 පසට ගොස් වාගිරි නම් පව්වෙහි සරුබඩු තබ්බවා සිහි විකුම් යුත් වූ
විරබා උප රජහු විසින් ද මහ බල සමූහයා විසින් ද හාත් පසින්

Non-Commercial Distribution

41 පිරිවරණ ලද්දේ පොළොන්නරුවට පැමිණ දරුණු යුද කරන්නේ ආවා
42 වූ සේනා සමූහයන් ක්ෂණයෙන් ම පැලවී. මරණ ලද සේනාපතින්
43 ඇට සැකිළි තුබූ සැය පිරිවරා සතුරු වූ සේනාපතියන් කණුවල
පිටිතොලහයා දූඩි බැම්මෙන් බඳවා හාත්පසින් විසි රෙණ ගිනි දූලින්
44 දූවී. මිහිපති තෙමේ එහි මාණින්ගේ ගම් නස්වා ලක්දිව් පොළොව
45 සර්වප්‍රකාරයන් කටුරහිත කෙළේ යි. සොළියා සමග යුද කරන්ට තමන්
46 විසින් කරණ ලද අවධි නො වරදවා ඒ රජ තෙමේ පන්සාළිස් වන
සවෙසහි සන්නද්ධ වූ සේනාව ගෙණ සයුරු පටන් වැද ඔහුගේ ඉදිරියට
47 ඊම් බලමින් කිසි කලක් එහි වසන්නේ රජ තෙමේ සොළියා නො ආ
බැවින් ඔහු වෙත දූතයන් යවා නැවත අවුත් පොළොන්නරුවෙහි
බොහෝ කලක් විසී ය.

48 මහාහෙළිය, සරෙහෙරුය, මා දූත්තා ය යන නම් වූ ද
49 කටුන්නරුය, පඬාවිය, කල්ලගල්ලිකය, යන නම් ඇති වැව් ද එරංගල්ල
නම් වූ වැවද, දිගුවත් නම් වැව ද, මඬවාටක නම් වැව ද, කිතු ය,
50 අක්බෝපවි ය යන නම් ඇති වැව් ද, වලාහස්සයය, මදාරතලය,
කිඹුලහෙබය යන වැව් ද, පත් පහන් වැව , කාන නම් වැව යන මෙකී
51 වැව් හා අනිකුසු හින්න මර්යාදා ඇති බොහෝ වූ වැව් සෑම කල්හි
දිළිඳු දනා කෙරෙහි බැඳුනා වූ වැඩ කැමැකි සිත් ඇත්තේ බැඳ වී.

52 ඒ මිහිපති තෙම ඒ ඒ තන්හි කඳුරු ගං හෝවල දිය නවත්වා
53 වේලි බඳවා රට සුභික්ෂ කර වී. හේ තෙමේ බිඳුනා වූ තලවතු නම්
මෝ ඇළ බඳවා මින්නේරි වැව දිය පිර වී. විහාර තලවතු නම් මෝ
54 ඇළ බඳවා මින්නේරි වැව දිය පිර වී. විහාර නිර්භය චාරිත්‍රය බින්දා වූ
55 සිය මෙහෙසිය පෙරහැර සර්ව ප්‍රකාරයෙන් සුන් කොට ගිවි අල්ලවා
නියැරින් පිට කරවා මහ සඟ සමා කරවා තමා සංඝ ගෞරවය ලොවට
56 පහළ කරවී. මාගම තුන් නිකාහි සොළින් විසින් නසන ලද්දා වූ
57 දාගැප් ද ථූපාරාම දෙකෙහි (දාගැප්) බැඳවී. මෑණියන් සොහොන් බිම
58 ද එසේම පියාණන් සොහොන් බිම ද මහත් ආවාස පසක් කරවී.
59 බුලවටියෙහි ද එසේම කරවී පඬාවිය ද පාධීන වෙහෙර ද උෟරුවෙල්
60 නම් වෙහෙර ද දෙව් මඬල ගිරිය ද මීගොඩ වෙහෙර ද සිහිල්ගම් ලෙන
61 ද දඹ කොළ නුවර වෙහෙර ද මියුගුණ වෙහෙර ද සිහිල් ගම් ලෙන ද
62 දඹ කොල වෙහෙර ද, එසේ ම ගිරිකඩ වෙහෙර, එසේම පරගම්
63 වෙහෙර ද කසගල් නම් වෙහෙර ද, සඳගිරි වෙහෙර ද, වෙල්ගැම්
වෙහෙර ද මහ සෙන්නම් ගම වෙහෙර ද, එසේම අනුරාධ පුරයෙහි
බෝ ගෙය ද යන මේ ආදී වූ දිරූ නොයෙක් විහාරයන් ඒ රජ තෙම
64 ප්‍රතිසංස්කරණ කරවී. වෙන් වෙන් වසයෙන් ගම් ද දුන්නේ ය.

Non-Commercial Distribution

65 "සමන්කුළු පව්වෙහි පිහිටි මුනිරජහුගෙ පා සටහන වඳනා පිණිස
දුකසේ යා යුතු මග යන්නා වූ මනුෂ්‍යයෝ සියල්ලෝම නොපෙළෙත්ව"යි
66 දන් වැටුප් පිණිස හැල්කෙත් ආදියෙන් සමෘධ වූ ගිලීමලය නම් ගම
දෙවී. කෙසෙල් ගම් මග ද එසේම උඅවරට මගද වෙන් වසයෙන් ගම් දී
67 සාලා ද කරවී. රජ තෙමේ අනාගත කාලයෙහි රජ දරුවෝ ඒ ගම්
68 නොගණිත්වයි අකුරු කොටලා ගල්ටැම් ද පිහිට වී. ඒ රජ තෙමේ
69 ලාභස්ථානවාසී වූ සමණන්ට අතුරුවිට නම් ගම ද එසේම සඟුළු ගම ද,
70 සිරිමඬගල් ගම ද දුන්නේ ය. වතින් ජීවත් වන සමණන්ට හෙතෙම
71 සිවුපස දින. හෙතෙමේ ඒ සමණන්ගේ නෑයන්ට ද භෝග උපදනා ගම්
දෙවි. ශීත ඍතුවෙහි පෙරෝණයන් ද ගිනි කබල් ද නානා ඔසුද බොහෝ
72 සේම භික්සඟනට දෙවී. නුවණැත්තා වූ හෙතෙම නොයෙක් වර සියලු
පිරිකර ද එසේම අට පිකර ද සකස් කොට භික්සඟනට දින. ලාභ
ස්ථානවාසී භික්ෂු සංඝයාගේ පසුම් වැටුප් පිණිස ද සෑ ආදිය පුදන
73 පිණිස වාතාවත් කරුවන්ට ද පෙර රජ දරුවන් විසින් දෙන ලද යම්
කෙනෙක් රුහුණ වූ නම් අඩු නොවූ ඒ සියල්ලන් ද හෙතෙම පෙර
74 පරිද්දෙන් තැබ්බ වී. බලී වූ හෙ තෙමේ කුදුන්ට බලව් වූ ගොනුන් දින.
දයාවෙහි ඇළුනා වූ හේ තෙමේ කවුඩු බලු ආදීන්ටත් බත් ද දින.

75 මහකවි වූ හෙතෙම් නොයෙක් කවි කරන්නන්ට ප්‍රවේණි ගම්
76 හා බොහෝ වූ ධන සමූහයක් දින. කවීන්ද්‍ර වු හේ තෙමේ රජ ඇමති
ආදීන් ගේ පුත්‍රයන් විසින් කරණ ලද ශ්ලෝකයන් අසමින් සුදුසු පරිද්දෙන්
77 ඔවුන්ට ධනය දින අඳ දනන්ට ද පිළුන්ට ද වෙන් වෙන් වසයෙන් ගම් ද
දින නොයෙක් දේවාලයන්ට ද පෙර දෙන ලද්දා නො පිරිහෙළී.

78 ඒ රජ තෙමේ අනාථ වූ වැන්දඹු කුලඟනන්ට සුදුසු පරිද්දෙන් ගම්
79 බත් වත් දින. එළු කවි කිරීමෙහි මහත් නුවණැත්තා වූ ඒ රජ තෙම
සිංහල කාව්‍යකාරයන් අතුරෙන් අග්‍ර වී ය. යහපතෙමි බඳ අදූර ඇත්තා
80 වූ ඒ උප රජ තෙමේ බුදු ගුණ නම් වෙහෙර සොළින් විසින් නසල ලද
81 සෑය බැඳවි. මසුරු මලහැර දන් දෙන න්‍යාය ඇත්තා වූ හේ තෙමේ
82 ඉක්බිති ඒ උතුම් වෙහෙර ගම්වරදි සතතයෙන් මනා කොට පුද පැවැත්
83 වී. හේ තෙමේ ම ඒ වෙහෙර උපචාර වනය වෙත තහවුරු වූ මහ දිය
84 ඇති මහ වැවක් බැඳවී. රජහු දූ වූ යසෝධරා තොමෝ කපුරු මල් නම්
වෙහෙර තහවුරු සිත්කළු වූ මහ පිළිම ගෙයක් කරවී. රජහු සිය රැජිනි
85 තොමෝ ගලතුරු සුමුවෙහි ප්‍රසාද එළවන්නා වූ උත්තුංග වූ මහ පහයක්
86 කරවී. එකල ඒ රජහුගේ නොයෙක් ඇමතියෝ ද අන්තඃපුර ජනායෝ ද
නොයෙක් පරිද්දෙන් නොයෙක් පින් රැස් කළෝ. මෙසේ ලක්දිව් රජහු
87 ලක්දිව අනුශාසනා කරණ කල්හි හික්මුනා වූ උප රජ තෙමේ දරුණු වූ

Non-Commercial Distribution

88 මරහු විසින් වසඟ කරණ ලද්දේ ය. ඔහුට කළමනා සියලු කටයුතු
89 සමාප්ත කොට භික්ෂූන්ගේ කැමැත්තෙන් ජයබා කුමරහට යුවරජ තනතුර
දුන්නේ ය. ඉක්බිත්තෙන් ඈපා පදවිය විකුම්බා කුමරහට දී ඉන් පසු
90 ගජබාය යි ප්‍රසිද්ධ වු උහුගේ පුතු උපන් කල මහ ඇමතියන් හා මන්ත්‍රණය
කොට රාජපුත්‍රයාගේ වැඩෙහි කැමැත්තේ මුළු රුහුණ දී එහි විසීමට
යැවී. නැවත හෙතෙම එහි ගොස් මහා නාහුල් නම් පුරය රාජධානි
91 කොට එහි වාසය කෙළේ යි.

මෙසේ විජයබාහු නම් රජ තෙම නොපැකුළුනා වූ අණසක මෙහි පස්පණස් හවුරුද්දක් පවත්වා බුදු සස්න ද ක්‍රෑර දෙමළ සේනාව විසින් උපද්‍රව කරණ ලද ලෝකය ද වර්ධනය කොට සිය පිනින් හටගත් ඒ මහත් ඵලය දක්නට මෙන් දෙව් ලොවට නැංගේ ය.

මෙතෙකින් හු දී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස ලෝකසාසන සඟහ කරණ නම් වූ සැටවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැට එක් වෙනි පරිච්ඡේදය

1 එකල්හි විජයබාහු රජහුගේ නෑගිනි වූ මිත්‍රා තොමෝ ද ඒ
2 බිසවුන්ගේ පුතුන්තුන්දෙනා ද, මහ ඇමතියෝ ද, එසේම (අෂ්ට) විහාර
3 වාසී භික්ෂූ ද යන මේ සියල්ලෝ රුහුණ වසන්නා වූ ඇපාණන්ට
4 මිහිපල්හු මළ අස්න නො දන්වා එකතුව මන්ත්‍රණය කොට සම කැමැති
5 බැව් පැමිණයෝ යුව රජහට ලංකා රාජ්‍යාභිෂේක දුන්නා හු. ඒ සියල්ලෝ
6 පූර්ව චාරිත්‍ර මාර්ගය ඉක්මවා මාණාබරණ නම් කුමරහු උප රජ බැව්හි
7 පිහිට වූහ. ඉක්බිත්තෙන් ඒ සියලු මාණාබරණාදී තුන් සොහොවුරෝ
ජයබාහු රජු හා සමග වූවෝ එකල්හි මුතු මැණික් ආදී වූ සාරසම්මත
8 වූ රුවන් සියල්ල ද ඇත් (අස්) ආදි වාහන ද අත් පත් කොට සියලු
සේනාව ගෙණ ඒ "වික්‍රම බාහු රජහු වහා අල්වා ගණුම් හ"යි
9 පොළොන්නරුවෙන් නිකමුණෝ ය. ඒ වික්‍රමබාහු ඇපා තෙමේ මේ
සියලු පුවත අසා "පියරජහට අන්තිම සත්කාරය කරන්ට නො ලද්දෙමි.
10 අඳෝමය දූන් වහා පොළොන්නරුවට ගොස් එහි පියාණන් සොහොන්
බිම් දැකීමෙන්ම ඒ මම මාගේ සිතට පැමිණි සෝකභාරය දුරු කෙරෙමි"යි
11 කරණ ලද දැඩි වූ ව්‍යවස්ථා ඇත්තේ ඒ පුරයෙන් නික්ම අතිශයින්
12 බලාත්කාරී වූ ඇපා තෙමේ පොළොන්නරුවට එන්නේ සත් අටසිය
13 ගණනක් වූ සේනාව විසින් පිරිවරණ ලද්දේ අතර මගදීම ගුත්හල
මඬලෙහි කොස්බුක්ක නම් ගමෙහි දී යුද්ධයට සන්නධව ආවා වූ මහ
සෙනග දැක බිය ඉක්ම ගිය එක වීර වූයේ යුද කොට ක්ෂණයකින්ම
ඔවුන් ඒ ඒ දෙස විසුරුවා හැරියේ ය.

ඉක්බිති එහි පරාජයට පැමිණියා වූ ඒ තුන් බෑ රජ දරුවෝ
14 අබිමනින් උඩඟුව වහාම සේනා වාහන සන්නද්ධ කොට ඇපා දඹ යයි
15 ප්‍රසිද්ධ වූ පියසෙහි දී යුද කළෝ ය. මේ තෙමේ නැවතත් යුද කොට
16 තුන් දෙනම පැරද වී කටගම තුන් වෙනි වරද සිවුවෙනිව කලා වැවැ ද
17 පස්වෙනි වර උදුන් දොරද සවෙනි වර මජවෙල ද ඔවුන් සමග යුද
කොට සෑම කල්හිම ගත් ජය ඇත්තේ ඇමති පිරිවර ජනයන් සහිත
18 වූයේ පොළොන්නරුවට ආයේ ය. වික්‍රමබාහු සිතු නයින්ම පියහු
19 සොහොන දැක දුරු කරණ ලද මහසෝ ඇතිව ලත් අස්වස් ඇත්තේ
පුරයෙහි වසන්නේ ම තමහට දුකෙහි සහාය වූ ඇමතියන්ට සුදුසු සේ
20 තනතුරු හා සියලු භෝගය දින. තමා සමග ආවා වූ සියලු භයටන්ට
ද දුකෙහි සහාය බැව් සිහි කෙරමින් සුදුසු වැටුප් දින.

21 ඒ මානාභරණ රජ තෙමේ ද සෙසු සොහෝවුරන් සමග (ලක්දිව)
22 දකුණු පස ද රුහුණ ද තමා අත්පත් කොට ඉක්බිත්තෙන් කිත්සිරිමේ

Non-Commercial Distribution

23 කුමරහට දොළොස් දහස් රට දී එහිම වසන්නට නියෝග කලේ ය.
සොහොවුරාණන් විසින් අණවන ලද්දා වූ කිත්සිරිමේ නම් ජනේන්ද්‍ර
තෙමේ එහි ගොස් මානාසුල නම් පුරයෙහි විසී.

24 යළිත් සිරිවල්ලභ කුමරහට අට දහස් නම් රට ද දී එහි වසන්ට
25 නියෝග කෙළේ ය. ඒ සිරිවල්ලභ තෙමේ ද එසේම ගොස් උදුන් දොර
නම් ගම් රජ දහන් කොට වෙසෙමින් ඒ රට අනුශාසනා කෙළේ යි.
26 තෙමේත් සේනා සහිතව දකුණු පසට ගොස් වීරබාහු යයි ප්‍රසිද්ධ වූයේ
27 පිළිගම විසූ තුන් බෑ රජ දරුවන්ගේමව් තොමෝ ද ජයබා රජ තෙමේ
ද එකල්හි කිත්සිරිමේ රජහු ළඟ විසූහ.

28 ඉන් මතු හවුරුද්දෙක් ඉක්ම ගිය කල ඒ මානාබරණාදී හු ඒ
29 වික්‍රම්බා රජහු විසින් තමන් කෙරෙහි යුදයෙහි කරණ ලද්දා සියලුම
නැංග නොහැකි මහත් වූ පරාජය නිගාව නැවත නැවත සිහි කරන්නා
30 වූ අභිමානයෙන් උදම්වූවෝ "හිස අබිසෙස් කළ රජුන්ගේ රජහට මේ
තෙමේ අබිසෙස් නැතිවම කෙසේ නම් අනුභව කරන්නේද"යි මෙසේ
31 ඊර්ෂ්‍යාපර බවට ද පැමිණියෝ සේවකයන් සංග්‍රහ කොට ගෙණ එකතුව
32 නැවත ද යුද කරණු පිණිස නික්මුණා ය. ඒ වික්‍රම බාහු රජ තෙමේ ද
33 ඒ අත්‍යර්ථ දූතයන්ගෙන් අසා මහසෙනග විසින් පෙරටු කරණ ලද්දේ
ඔවුන්ගේ රටටම ගියේය. ඒ වික්‍රමබාහු ක්‍ෂත්‍රිය තෙමේ දකුණු දෙස
බෝසෙන් පව් නම් ගමදී යුද කොට ඒ තුන් දෙනා පැරද වී. එකල්හි "
34 මම මේ සියලු සතුරන් මුල්සුන් කරමැ"යි සිතා පලායන්නා වූ උන්
35 පියවර පසුපස්සෙහි ලුහුබැන්දේ ය. ඔව්හු ද පස්යොදුන් රට
බලකොටුවකට ගියෝ ය. හේ තෙමේ ද එවුන් අල්වනු කැමැත්තේ
යුහුව කැලණි පුරයට වන්නේ ය.

36 එකල්හි ආරිය රට උපන්නාවූ පළන්දිප නම් රට අධිපති වූ වීරදේව
යයි ප්‍රසිද්ධ වූ වීරයෙක් තෙම ලක්දිව අත් පත් කරණු හැකැයි සිතා ශූර
37 යෝධයන් සමග මහතොට ගොඩ බැස්සේ ය. එකල ඒ වික්‍රමබාහු නම්
38 වූ රජ තෙම එපවත් අසා යම්තාක් මේ ලක්දිව ලද බැස ගැන්ම ඇත්තේ
39 නොවේ ද ඒ තාක් මුල් සිඳිය යුතු යයි සිතා කැලණියෙන් නික්මුනේ
40 මහතොට මන්නාරම් නම් ගමට ගියේ ය. වික්‍රමබාහු රජු හා සමග ඒ
41 වීරදේව තෙමේ ද යුධ කොට සෙන් ඇණි ආදීන් ද දෙබෑ රජකුමරුන්
42 ද කිතුනමින් පසිඳුවූ සේනාපති ද වීරසම්මත වූ බොහෝ ජනයන් ද
වහා මරා රක්ඛත නම් සේනාපතියා ද ජීවග්‍රාහයෙන් අල්වා ගෙණ
43 සේනා සහිත වූ උහු පරදවා පියවර පසු පස්සේ ලුහුබැන්දේ ය.
බියපත්ව පලා යන්නා වූ හේ තෙමේ සිය පුරයට අවුත් හස්තසාර

Non-Commercial Distribution

44 වස්තු ගෙණ වහාම කොටුසරට ගියේ ය. ඒ වීර දේව තෙමේ උහු පස්සේ
ලුහු බැඳ අවුත් කීප දිනක් පුරයෙහි වාසය කොට වික්‍රමබාහු රජහු
45 අල්වා ගන්නා පිණිස වහා එහිම ගියේ ය. ඒ වික්‍රමබාහු රජ තෙමේ ද
මහත් වූ සියලු සේනාව යවා යුද කරවා අතුරවිටි නම්ගම් මහාකරදම
දුර්ගයෙහි දි මහ බල ඇතියේ වීරදේවයා මරවා අධිපති වූයේ අබිසෙස්
46 නැත්තේම පොළොන්නරුවෙහි වෙසෙමින් රජ රට අනුශාසනා කෙළේ
ය.

47 ඉන් පසු තුන් බෑ රජහු ද යුද්ධයෙහි ආසාව දුරු කොට සිය රට
48 ගොස් පෙරසේම විසූහ. මේ රජුන් සතර දෙනම උත්සාහ කරමින් මේ
49 ලක්දිව එක්සත් කරන්නට සර්වප්‍රකාරයෙන්ම නොහැකි වූහ.
50 අපරීක්ෂාකාරී බැවින් උසස් කුලවතුන් පිරිහෙලූහ. හීන වූ ස්වාභිමත
ජනයන් මහත් තන්හි තැබූහ. යහපත් නුවණ නැත්තෝ විජයබා රජහු
51 විසින් නොයෙක් පරිද්දෙන් වඩන ලද්දා වූ බුදු සස්න හා ලොව ද
52 පිරිහෙලූ හ. උතුම් කුලවත් මිනිසුනගේ එබඳු දොසක් නැති කල්හි ද
ඔවුන් අයත් වූ ධනය බලාත්කාරයෙන් ගත් හ. ධන උපයන්නෝ නො
53 පිරුනුණ තොස් ඇතිව වැඩියක් අය ගණිමින් සියලු ලක්දිව උක්යතකින්
උක්දණ්ඩක්සේ මිරිකාලූහ.

54 ඒ වික්‍රමබාහු රජ තෙමේ බුද්ධාදීන් සන්තක භෝග ගම් උදුරු
සේවකයන්ට දින. හේ තෙමේ ම පොළොන්නරුවෙහි ධාතුයෙන්
අලංකෘත වූ නොයෙක් විහාරයන් පරදේසික වූ යෝධයන්ට වසන
55 පිණිස දින සැදූහැත්තන් විසින් පාත්‍ර ධාතුවට ද උතුම් දළදාවට ද පුදන
56 පිණිස දෙන ලද මිණිමුතු ආදිය ද සඳුන් අගිල් කපුරුද ද රන් ආදියෙන්
57 නිම වන ලද්දා වු පිළිමයන් ද පැහැර ගෙණ කැමති සේ විනාසයට පත්
58 කෙළේ ය. සස්නට ද ලොවට ද කරණු ලබන්නා වූ උවදුරු බොහෝ
69 සේ බලමින් එකල්හි උහු කෙරෙහි කලකිරුණු සිත් ඇත්තා වූ අෂ්ටමූල
60 විහාරයන්හි ගරු වසයෙන් සම්මත වූ භික්ෂූහු ද දොකොටස ද ඇතුළත්
වූ පාංශුකූලික භික්ෂූහු ද "මෙසේ තීර්ථයන් සම වූ සස්නට බොහෝ
උවදුරු කරන්නවුන් හමුවෙන් බැර යාම උතුමැ "යි සිතා උතුම් දළදාව
හ පාදාව ගෙණ රුහුණට ගොස් පාසු වූ ඒ ඒ තන්හි වාසය කළෝ ය.

61 එසේ ම ඒ ඒ පාසුතන්හි විසිර ගියා වු කුලවත් දනෝ ද සැඟවී
62 වාසය කළෝ ය. උභය පක්ෂගත රජහු විසින් ගත යුතුව සීමාවල
63 පිහිටු වන ලද්දා වූ සමාන්තයෝ ඔවුනොවුන් සමග බොහෝ සේ යුධ
කරමින් අතිශයින් සමෘධ වූ නොයෙක් ගම් නියම් ගම් ගිනි ලමින් දිය
64 පිරුණු වැව් ද සිඳිමින් සියලු දිය ඇල අමුණු ද හැම ලෙසින්ම නසමින්

Non-Commercial Distribution

නෙරළු ආදී තමන්ට උපකාර වූ රුක් ද සිඳිමින් යම් සේ පුරාණ ගම්
65 පිහිටි තැනෙකැයි නොහැඟේ ද එසේ ඔවුනොවුන්ට විරුද්ධ වූවෝ රට
66 වැනසූ හ. ඒ මිහිපතියෝ ද සිය චරයන් ලවා ගම් පැහැරීම් ද මං
67 පැහැරීම් ද කරවන්නෝ ලෝකෝපද්‍රව කළෝ ය. කුලවත් මිනිසුන් ගේ
දස්කම් කරුවෝ ද සිය චරයන් ලවා ගම් පැහැරීම් ද මං පැහැරීම්
දස්කම්කරුවෝ සිය හිමියන් ඉක්ම පවත්නෝ නිසැකවම බියරහිත
68 වූවෝ එකල්හි රජුන් අබතුර පවත්නාහු අවිදරව ලත් තනතුර ඇත්තෝ
අතිශයින් බලවත් වූහ. සමන්තකූට පර්වත ස්ථානා දී වූ නොයෙක් දුර්ග
69 ස්ථාන වාසී වූ ජනයෝ මිහිපලුන්ට පෙර නියම කරණ ලද අය
70 නොදෙන්නේ රජ අණ නො ගන්නාහු තුමූ සතුරු බවට පැමිණ උඩඟුව
සිය සිය දෙනම විසූ හ. එකල ලක්දිව් තලය "අවධෙහි ඇළුනෝ නම්
71 හැම සෙයින් ම පෙරළෙත්" ය යි කිය යුතු බවටම ගියේ ය.

72 මෙසේ සිරිත් මගින් බැහැර වූ ඒ සියලු මිහිපල්හු ගම් මුදළියන්
මෙන් සැම කල්හි වැඩියක් තෙද නැත්තා වූ අතිශයින් වැසනයෙහි
ඇළුණු සිත් ඇත්තා වූ උපුටන ලද රජු අබිමන් ඇතිව සතතයෙන් අත්
වැඩ පරවැඩ සිදු කිරීමෙහි බහා තැබූ ධූරයෙහි යෙදුනෝ වෙසෙසින්
හීන සිත් ඇතිව විසූ හ.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
චතුරාජචරියා නිද්දේස නම් වූ සැටවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැට දෙවෙනි පරිච්ඡේදය

ඒ ජයබා නම් මිහිපති තෙමේ ද මිත්තා නම් (නැගනි) රාජිනිය ද
රුහුණම වැස කල්හි කලුරිය කළෝ ය. යළිත් සිරි වල්ලභ රජහුගේ
1 බිරින්ද වූ සුගලා නම් බිසෝ තොමෝ මාණාභාරණ නම් පුත්‍රයා ද
ලීලාවතී නම් දුව ද යන දෙදෙන ඉපද වී. මානාභරණ රජහුගේ බිසෝ
2 වූ රත්නාවලී තොමෝත් මිත්‍රා නම් වූ ද, ප්‍රභාවතී නම් වූ ද දූන්
3 දෙදෙනෙක් ලැබී. ඒ දූන් දෙදෙන දක්නා වූ මානාභරණ නම් මහ
4 ඈපාණනන්ට එකල්හි මෙසේ විතර්කයක් වී.

ලෝකයා විසින් මනාකොට සම්මත කරණ ලද්දා වූ සියලු රජ
කුලයන්ගේ මුදුනෙහි වූ පිරිසිදු වූ චන්ද්‍ර වංශයෙහි උපන්නා වූ අපි
5 වනාහී අතිශයින් ඉච්ඡා කටයුතු ආකාර ඇත්තා වූ සියලු ශක්තියෙන්
උසස් වූ නානා විධ ශාස්ත්‍රයන්හි දක්ෂ වූ ඇත් අස් ආදී ශිල්පයන්හි
6 පොහොසත් වූවෝ (වම්හ) එතකුදු වුවත් මේ අපි තුන් දෙනාම උදකලා
වික්‍රමබාහු ඈපාණන් විසින් යුදයෙහි පැරදී නින්දාවට පත් කරණ ලද්දෝ
7 (වම්හ) මේ කිලිටු සුද්ධ කරන්ට වෙහෙසින් පොහොසත් වූ පුතකුගේ
8 පහළවීමක් නො පෙණේ, අපගේ මද පිණැති බව අදෝම ය. ජන
අපවාදයෙහි කිලුටු වූ රජ බවෙන් මට කම් කිම, දූන් කාම සැපයෙහි
9 ඇල්ම හැර මනා කම්හි සතතයෙන් නොපමා වුවහු විසින් දවස් යැවිය
10 යුතුය යි (සිතා) සියලු රාජ්‍ය විචාරණය ඇමතියන්ට පවා දී එහි සත්
අට මාසයක් වෙහෙසමින් එක් දිනක් රෑ ශීලසංයම ඇතිව දෙව් රජ
11 ගෙයි ශයනය කෙළේ යි. ඉක්බිති අලුයම් කාලයෙහි විසිතුරු වූ
වස්ත්‍රාභරණ ඇත්තා වූ සුවඳ මලින් සැරසුනා වූ වෙසෙසින් උදාර වූ
12 රූ ඇති සිය සිරුර බැබළිමෙන් අහස් කුසට නැඟී හිරු සෙයින් සියලු
දිගුන් හෙළි කරන්නා වූ මෙසේ කියන්නා වූ මහත් ඍධිමත් දේව
13 පුත්‍රයා මිහිපල් තෙමේ සිහිනෙන් දිටී. "මහ පිණැත්ත පහදුව, මිහිපතිය
14 ප්‍රීති යුක්ත වෙව, පිණැති ලකුණෙන් සමෘද්ධි වූ ඊප්සිතාර්ථය සිද්ධ
15 කරන්නා වූ හික්මුණා වූ ලොව තුළ පතළ තෙද පැරකුම් ඇත්තා වූ
ආඥාබල යසස් කීර්තීන් බබළන්නා වූ යහපත් ආකාර වූ, ලෝක
ශාසනාභිවෘධිකාරී වූ උතුම් පුත්‍රයෙක් තෙම මහ රජ දූන් තොපට
16 නොබෝ කලකින්ම ලැබෙන්නේ ය. පුත්‍රදාරාදීන් විසන් වාසය කරණ
17 ලද්දා වූ පුරයට වහා යව" යි (මෙසේ කියන දෙව පුත්‍රයා දුක්කේ යි)

18 පිබිද හටගත් ප්‍රීතිවේග ඇත්තේ ඉක්බිත්තෙන් රැය පහන් වූ
කල්හි රජ තෙමේ එයින් (නික්ම) පිලගමට ගියේ ය. ඒ මිහිපල් තෙමේ
19 දුටු පරිද්දෙන් ඒ ශුභ ස්වප්නය මෙහෙසිය ප්‍රමුඛ කොට ඇත්තා වූ

Non-Commercial Distribution

20 ඇමතියනට කීයේ ය.. එහි මෙහෙසිය හා සමග උතුම් පුතකු පතමින්
21 දානශීලා දී නානාප්‍රකාර කල්‍යාණ ධර්මයන් පුරන්නේ යළිත් එක් දිනක්
අලුයම් කල්හි සිහිනෙන් වනාහි සියලු ලකුණෙන් සමෘධ වූ. සර්වාංග
22 ධවල වූ මනහර වූ දමිත වූ උතුම් ඇතපොව්වෙක් ප්‍රේමයෙන් කණ
අල්ලා හැර ගෙණ මෙහෙසිය යහන් ගබඩාවට ඇතුළු වන්නා සේ දැක
23 පිබිදි උතුම් වූ සයනයෙන් නැගිට හටගත් ප්‍රීති ප්‍රමෝද්‍ය වේගයෙන්
24 පිණා ගිය සිතැත්තේ එවේලෙහි මෙහෙසියගේ (ශ්‍රී) යහන් ගබඩාවට
25 වහා ඇතුළුව දුටු පරිද්දෙන් සිහිනය ඇයට පැවසී. "මම ද මාගේ
යහන පැදකුණු කොට සිටියා වූ එබඳු ඇත් පොව්වෙක් සොඬ අල්වා
26 ගෙණ යහනට ඇද නගා ප්‍රේමයෙන් සිහිනෙන් වැළඳ ගතිමි "යි දේවී
27 තොමෝ ද උහුට කීය. ඒ දෙදෙන දුටු දෙය ඔවුනොවුන් මෙසේ
ප්‍රකාශ කොට සන්තුෂ්ට වුවෝ ම එකල නිදි නැතුව අරුණ නැගුහ.

28 ඉක්බිත්තෙන් උදය උපස්ථාන කරණ පිණිස ආවා වූ පෙරවි
බමුණ ද නිමිත්ත පාඨකයන් ද පිළිවිසියෝ ය. (ඒ අසා) සතුටු වූ ඔව්හු
29 ද නොබෝ කලෙකින් පින් ලකුණු ප්‍රකාශ කරන්නා වූ පුතකුගේ
උත්පත්තිය අවශ්‍යයෙන්ම විය යුතු යයි ප්‍රකාශ කළෝ.

30 ඒ අසා ඇමතියෝ එසේම නුවර වැසියෝ ද රජ තෙමේ ද යන
31 සියල්ලෝම සතුටුව මහ සැණකෙළියක් වින්දේ ය. එතැන් පටන්
අතිශයින් සැපයක් සොයන්නා වූ මිහිපති තෙමේ භික්ෂු සංඝයා ලබා
32 බොහෝ සේ පිරිත් බැණවී. ධනය නොයෙක් පරිද්දෙන් යදියන්ට දාන
මුඛයෙහි දවසක් පාසා පරිත්‍යාග කළේ ය. වේද වේදාංග දන්නා වූ
33 බමුණන් ලවා ශුභයයි සම්මාන වූ යාගාදී විදහත් ද පැවැත් වූ බෙහෙවින්
34 නටුවා වූ විහාර දාගැබ් ද ජීර්ණ වූ වැව් ද ප්‍රතිසංස්කරණය කරන්ට රජ
කම්කරුවන් යෙද වී.

මෙසේ නරනිඳුහු මනා කමින් දවස් යවන කල්හි නොබෝ
35 කලකින් දේවියගේ කුසෙහි උතුම් ගැබක් පිහිටියේ ය. ඉක්බිත්තෙන් ඒ
36 දැක තුටු පහුටු වු නරනිඳු තෙමේ දේවියට මහත් වූ ගැබ් පෙරහරක්
දෙවී. කෙමෙන් මූ කළ ගැබ ඇත්තා වූ දේවි තොමෝ යහපත් නකත්
37 මොහොතින් අභිලක්ෂිත වූ සමයෙහි පුත්‍රයෙක් ප්‍රසූත කළා ය.
38 එකෙණෙහි සියල් දිගුහු අතිශයින් පහන් වූහ. සුවඳ මුදු පවන් ද හැමූ
39 හ. ඇතුන්ගේ කුංචනාදයෙන් ද අසුන්ගේ හේසාරවයෙන් ද රජ මළුව
40 එකල මහ කෝලහලින් ද අවුල් වී. මෙසේ ආශ්චර්ය විශේෂය නොයෙක්
පරිද්දෙන් පහළ වූ කල්හි ඒ දැක විස්මයට පත් වූ මාණාභරණ රජ
41 තෙමේ එකලසිය පුතු උපන් අස්න අසා අමාවෙන් අබිසෙස් ලද්දෙක්

Non-Commercial Distribution

සේ ප්‍රීතියෙන් පිරුණා වූ මනෝරථය ඇත්තේ, කල සිරිගෙයි බැඳි
42 බොහෝ ජනයන් මුදවා මහණ බමුණන්ට උදාර වූ දන් දෙවි. නුවර
43 වැසී වූ ඇමති ආදි වූ ජනයෝ ද රාජධානිය කෙහෙල් තෝරන් ආදිය
44 නොයෙක් පරිද්දෙන් නිරවශේෂ කොට සරහා මොනවට හැඳ පැළඳ
ගත්තාහු කීප දිනක් මහත් වූ මනහර සැණකෙළි පැවැත් වූහ.

45 වේදයෙහි කියන ලද විධියෙන් මිහිපති තෙමේ කුමරහු ජතාකර්මාදි
46 සියලු විධි සමාප්ත කොට පෙරෙවි ආදි බමුණන් ද, යළිත් ලක්ෂණ
පාඨකයන් ද ගෙන්වා සත්කාර සම්මාන විධිය පූර්ව මනා කොට උහුගේ
47 අතුල්පතුල් ආදී සියලු ලකුණු කල්පනා කොට සතුටු වූ ඔව්හු ඇමතියන්
48 සහිත ජන සමූහය මැද පැමිණි රජ හට ද දේවියට ද (කියන්නා වූ) "
ලක්දිව තබා දඹදිව් තලය ද එක සේසතින් සලකුණු කොට අනුභව
49 කරන්ට දක්ෂය"යි පැවසූ හ. භෝග දීමෙන් ඔවුන් සන්තර්පණය කොට
"පෙනේනා වූ යම් කිසි අරිටු ලකුණෙක් ඇත හෝ නැත හෝයි නැවතත්
50 පිවිසියෝ ය"යි මේ කුමාර තෙමේ දීර්ඝායුෂ්කය, වැලි එකෙක් ඇත.
ඒකාන්තයෙන්ම ජනකාරිෂ්ට යෝගයක් පෙණෙ යි ඔව්හු රජහට කීහ.
51 ඒ රජ තෙමේ ඒ කුමරහට "සතුරු ජනයන් මඩනා වූ තෙදැති බාහු
52 යෝගයෙන් පරාක්‍රම බාහු ය"යි අන්වර්ථ නාමයක් ගත්තේ ය. විදහත්
53 දක්නා වූ රජ තෙම කන්විදිනා මගුල ද, බත් කවන ද විධි වූ පරිද්දෙන්
අඩු නොකොට කරවී. එල්හි ඒ රජ තෙම සිය පුතු උපන් හස්න
54 වික්‍රම්බා රජහට කියන පිණිස පොළොන්නරුවට දූතයන් එවී. ඒ
55 වික්‍රමබාහු රජ තෙම ඔවුන් අයිති යහපත් මහිම දත්තිය පුතුගේ මහ
56 පිණැති බව ද ජනකාරිෂ්ට යෝගය ද අසා "පිණැත්තා වූ විජයරාජා දී
57 රාජමාලාවට නායක බබළන මැණිකක් වැනි වූ මාගේ බෑණනුවන්
හෙතෙම ඉපද විය. ඔහුට යම් සේ සතතයෙන් කිසි හානියක්
නොවන්නේ ද එසේ මෙහි මා වෙතම කුමර තෙමේ වැඩේවා.

58 මේ මාගේ ගජබාහු නම් පුත් තෙම නොලත් ලාභයක් ලබන්ට
59 හෝ ලත් ලාභයක් රක්නට හෝ හැම වියෝවක් අපොහොසති. මිහිඳු
60 නම් අන්‍ය පුත්‍ර තෙමේ සුරබැව් ආදියෙන් යුත් නමුදු මව්ගොතින් හීන
හෙයින් මාගේ රජයට නුසුදුස්සේ ය. මා විසින් නොයෙක් සෙයින් රැ
61 ස් කළ සමෘධි වූ වස්තු රාශියන් යුක්ත වූ රජයට බෑන තෙමේම ඒකාන්ත
ස්වාමි වන්නේ වේවා" හෙතෙම මෙසේ සිතා ඒ කුමරුහු ගෙණ එනු
62 පිණිස කුමාර පළඳනා ද සෙසු සාර පඬුර ද දී දූතයන් යැවුයේ ය.
වීරබා රජ තෙමේ ඒ සියල්ල දූතයන් මුඛයෙන් අසා "උහු විසින් මෙබස
මට හිත වූ බුද්ධියෙන් කියන ලද්දේ යුත්තේ ය. එතකුදු වුවත් තමන්ගේ
63 අරිටු දෙට පිළියම් පිණිස මෙබඳු වූ උදාර පුත් රුවනක් යවන්නට සුදුසු

Non-Commercial Distribution

64 නොවෙයි. වැලි එකෙක් ඇති, කුමරහු එහි ගෙණ ගිය කල විකුම්බා
65 රජහුගේ පක්ෂය ලැබූ මහ පවන් වේග ඇති ගිනි සේ අතිශයින් උසස්
වූ මහත් තෙදින් බබළන්නේ ය, වෙසෙසින් අපට මහත් වූ කේවල වූ
65 හානියක් ම වන්නේ ය." හෙතෙම මෙසේ සිතා එහි පැමිණි දූතයන්
67 අත සිය පුත්තු නො එළවාම ඔවුන් ධනයෙන් සතුටු කොට එවූයේ ය.

ඒ නරනිඳු තෙමේ සියපිත් බිරින්දන් හා සමග වාසය කරන්නේ තියුණු වූ මහත් ව්‍යාධියෙකින් වළදනා ලද්දේ රජය සමග සිරුර හළේ යි.

මෙතෙකින් හු දී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස කුමාරෝදය නම් වූ දෙසැටවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැට තුන් වෙනි පරිච්ඡේදය

1 එකල ඉතිරි දෙබෑයෝ දෙටුබෑ මානාභරණ (යුවරජු) මළ පවත්
2 අසා සිය රටින් වහා අවුත් අන්තිම විධිය කර වූ ය. ඉක්බිති කිත්සිරිමේ
3 කුමාර තෙමේ දෙටුබෑ රට තමා අයත් කොට ගෙණ මල්හු කැඳවා
4 අනික් දෙරට දී එහිම වසන්ට අණ කෙළේ ය. හේ මල් දෙටු බෑයා
වදත් පිළිගෙණ රත්නාවලී බිසව ද කුමරු ද දූන් දෙදෙනා ද එක්
5 කොට (කැඳවා) ගෙණ මානාකුල නුවරට ගොස් එහි සමගිව වෙසෙමින්
6 කුමරහු සියලු මඟුල් කරවා මහ පෙරහරින් සැමදා වැඩී ය.

7 ඉක්බිති එ සිරිවල්ලභ ඈපා තෙමේ (රත්නාවලී) බිසවුන් දෙටු දූ
8 මිත්‍රා නම් කුමරිය සිය පුතුට දෙනු කැමැත්තේ ඇමතියන් සමග "
වැඩියේ ම කලිඟු කුලයෙහි උපන්නා වූ රජ දරුවෝ වූ කලී මේ ලක්දිවිහි
නැවත නැවත හිමිබවට පැමිණියා හ. ඉදින් කලිඟු කුල උපන් ගජබා
9 කුමරුට දෙනු පිණිස මේ රත්නාවලී දේවි තොමෝ රහසිගතව දුව යැවී
නම් විවායෙන් බඳනා ලද ඒ ගජබා කුමර තෙමේ වැඩියක් බලවත්
10 වන්නේ ය, මගේ මේ පුත්‍ර තෙමේ සර්වප්‍රකාරයෙන් නිරාලම්භ වන්නේ
හෝ පිටිවහල් නො ලබන්නේ ය. එහෙයින් මේ කුමරි තොහෝ ම
11 පුතුට දිය යුත්තී ය, එසේ කල ඒකාන්තයෙන් අපගේ දියුණක්ම වන්නේ
12 ය" යි මන්ත්‍රණය කෙළේ ය.

සූර්යවංශයට ආභරණයක් බඳු වූ දේවි තොමෝත් ඒ සියල්ල අසා
සර්වප්‍රකාරයෙන් ඒ තුරුස්ති රජහට මෙපවත් කීවා ය. "විජය කුමර
13 තෙම් සියලු යකුන් මරා මේ ලක්දිව යම් කලෙක මනුෂ්‍ය වාස කළේ
නම් එතැන් පටන් අප හා විජය රජ කුලය ගැළපූ හ. කලිඟුවස
14 උපනුන් සමගම (ආවාහ විවාහ) සම්බන්ධය කළ පුරුදු ඇත්තේ අන්
රජුන් හා අපගේ සම්බන්ධයක් ඇසූ විරූදත් නැත. සෝමවංශයෙහි
15 උපන් රජුන් සිටිය දී තොපගෙන් ජාතයයි අප හා ඒ සම්බන්ධය තෙමේ
16 ආයර්ත්වයෙහි උපන් මේ කුමර හා කෙසේ වන්නේ ද"යි (කීවාය)
17 මෙසේ ඒ දේවිය විසින් නොයෙක් ආකාරයෙන් වළකද්දී ත් (සිරිවල්ලභ
රජ) ඒ කුමරිය උදුරා සිය පුතු දෙවී. ඉන් පසු ඒ මාණාභරණ කුමර
18 තෙමේ අනේක ගුණයෙන් උදාර වූ බිරින්ද විසින් අනුගත වූයේ සියලු
ජනයන් සතුටු කෙරෙමින් පියහු වෙත විසී ය.

19 ඒ වික්‍රමබාහු රජ තෙමේ එක් විසි අවුරුද්දක් රජය වළදා ශරීර
හේදයෙන් කම් වූ පරිද්දෙන් පරලොව ගියේ ය. ඉක්බිති ගජබා කුමර
20 සම්පන්න බලවාහන ඇති සාර වූ රජය අත් කොට ගෙණ පොළොන්නරු

Non-Commercial Distribution

21 නුවර විසි ය. ඉක්බිති කිත් සිරි මේ සිරි වල්ලභ රජ දරුවෝ මෙපවත්
අසා මෙසේ සිතූහ. "ඒ විකුම්බා කුමරු තමා මාළු බැවින් මූලරාජ්‍යාධිපති
22 බව නොයෙක් පරිද්දෙන් අපට නින්දා කර නොවෙයි.

23 උහු පිත් බාල කුමරු මුල් රජය අනුශාසනා කරද්දී උපෙක්ෂා
24 වීම ඒකාන්තයෙන් අපට නුසුදුසු ය. මේ තෙමේ යම්තාක් සිය රටෙහි
25 බදමුල් ඇති නොවෙන්නේ වී නම් ඒ තාක් ඒ රජය උදුරා ගන්ට වටනේ
ය"යි (සිතා) සියලු වේලක්කාර බලය වස්තු දීමෙන් බින්දා හ. එකල ඒ
26 රජහු වල්ලභ වූ සේවකයන් කීප දෙනෙක් හැර රට වැස්සෝ ගජබා
කෙරෙහි විරත වූවෝ දෙරජුන් කරා ඒ රටින් නොයෙක් පරිද්දෙන් "
එක් වූ අපි වනාහි රාජ්‍යය සාදා දෙම් හ, හුදෙක් උපස්තම්භක භාවයම
( ඔබ දෙදෙනා විසින්) කටයුත්තේ ය" යි දූතයන් යැවූ හ.

27 ඉක්බිති දෙබෑයෝ යුහුව සියසෙන් සරසා ගෙණ දෙයතින් ඒ
රජ කුමරහු රට මැදට පැමිණියා හ, එසේම ඔව්හු දූතයන් ද යැවූ හ.
28 ඉක්බිති ගජබා මිහිපල් තෙමේ සිය ඇමතියන් රැස් කරවා "සියලු
29 වේලක්කාර බලය ඉඳුරාම සතුරු විය. රජුන් දෙදෙනෙකුදු යුධ පිණිස
අපගේ රටට පැමිණිය හ. පළමු කොට ඔවුන් අතුරෙන් වැඩි බල
30 පක්ෂයක්හුගේ මුව බුන්කළ ඉන් අන්‍යයෝ වහා සුවසේ යුද්ධ කට
31 හැක්කා" යි මන්ත්‍රණය කෙළේ ය. මෙසේ නිශ්චය කොට තමා සියලු
සෙනග ගෙණ සිරි වල්ලභ රජහු අභිමුඛයට යුද පිණිස පැමිණියේ ය.
32 සිරි වල්ලභ රජ තෙමේ ද උදෑසන පටන් සවස් වන තෙක් ඉතා බිහිසුණු
33 යුද කෙරෙමන් උහුට කිසි අභිභවයක් කට නොහැකි ව එතනින්ම
නැවත සිය රටට වහා ගියේ ය.

34 ගජබා රජු ගොකන් ඇමතිහු විසින් පරද වන ලද කිත් සිරිමේ
35 රජ තෙමේ ත් සිය රටට ගියේ ය. ගජබා රජ තෙමේ ද ඒ යුදෙහි දී කිසි
පරිහානියකට නොපැමිණියේ පෙරළා නුවර වෙත අවුත් අපරාධ සහිත
36 බලවත් වූ බොහෝ බලනායකයන්ට නිග්‍රහ කොට රටත් ව්‍යපසමනය
37 කොට ලා සිය නුවරට වන. එතැන් පටන් ඒ රජ දරුවෝ සිය රට
38 උනුන් හා මිත්‍ර සම්බන්ධයන කොට ගෙන වාසය කළහ.

ඉක්බිති මිහිපල් නන්ද පැරකුම්බා කුමර ධාරණ ශක්ති ඇත්තේ
39 නොයෙක් ශිල්පයෙහි ඉතා මනාව හික්මෙන්නේ කර්තව්‍යාකර්තව්‍යයෙහි
40 නොයෙක් පරිදේන් විචාරක්ෂම බුද්ධි ඇති බැවින් ද, ඉතා උසස්
41 අදහස් ඇති බැවින් ද, මහා පිනැති බැවින් ද සිය මව් බූහුමනන් හා
42 සමග වාස සැපයෙහිත් බාල ක්‍රීඩා රසයෙහිත් නොලැඟුනු සිත් ඇත්තේ

Non-Commercial Distribution

42 "ශූරභාවාදීන් යුක්ත වූ මා වැනි රජ කුමරුවෝ මෙබඳු පිටිසර රට
කෙසේ නම් වෙසෙද් ද? යුව රජහු විසින් උපභෝග කටයුතු මා උපන්
43 පෙදෙසටම දන් යන්නෙමැ යි පිරිවර ජනයා හා ඒ නුවරින් නික්මිණ.

44 ක්‍රමයෙන් (එමින්) සංඛනායකත්ථලි නම් වූ ගම වෙතට ආයේ ය.
45 එහි කිත්සිරිමේ රජ තෙමේ එපවත් අසා "රාජ්‍යයට හිමි මාගේ සමාන
දරු කෙනෙක් නැති බැවින් මම හුදකලායෙහි යන. යම්
චිත්තසන්තාපයෙක් වී නම් ඒ සත්හුන් බවට ගියේ ය, මාගේ දෙටුබෑයා
46 බඳ වූ උහුගේ සිරුරු පිළිරුව සතතයෙන් දක්නට මාගේ මහත් පිණක්
47 පහළ වී යයි ද ප්‍රමොද ය වේග වසඟ වූයේ ඒ නුවර තොරන් ආදීන්
48 මනෝහර කොට නොයක් පරිද්දෙන් අලංකාර කරවා බල සෙනගින්
49 පිරිවරණ ලද නරේන්ද්‍ර තෙමේ මංගල සම්මත යහපත් එක් නැකැත්
වෙසෙසක පෙරමගට ගොස් අනූන් හා අසාධාරණ බවට සම්ප්‍රාප්ත
ගුණයෙන් හා සකල මංගල ලක්ෂනයෙන් ද සමන්විත වූ කුමරහු දැක
50 සතුටුව ප්‍රේමයෙන් වැළඳ ගෙණ ලැම්ඩියෙහි හොවා නැවත නැවත
51 හිස සිඹ ඒ මහජනයා බලා හින්ද දී ඒ රජ තෙමේ ඇසින් සතුටු කඳුළු
52 ධාරා නිතොර වස්වමින් පුතු හා මනෝහර එක් වාහනයකට නැඟී
බෙර හඬින් හාත්පස දස දිගුන් පුරවමින් එ නුවරට වැද මනෝහර
අලංකාරයන් සිය පුතුට දක්වමින් රජ විමන් වන.

ඉක්බිති ඒ තෙමේ සැට්ටලන ඇමතියන් අරක්කැමියන් ආදී
53 නොයෙක් පරිවර ලැබ නානා ගුණයෙන් සතුටු කරණ ලද පියහු වෙත
සැපසේ විසී ය.

මෙතෙකින් හු දී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස සංඛත්ථපුරාභි ගමන නම් වූ තෙසැට වන අදියර නිමි."

Non-Commercial Distribution

# හැට හතර වෙනි පරිච්ඡේදය

1 තමා විසින් අභිමත වූ ජාතදේශයට වහා පැමිණීමෙන් සම්පූර්ණ
මනස් සංකල්පය ඇති දුස්සංකල්පයෙන් වර්ජිත වූ (පැරකුම්බා කුමාර)
2 විදුරු බඳු මහත් ප්‍රඥා බලයෙන් ගුරුන් වෙත නොයෙක් ශිල්ප ජාතය
3 වහා බොහෝ කොට උගන්මින් බුද්ධාගමයෙහි දී කොටල්ලා දී නොයෙක්
නීතියෙහි ද ශබ්ද ශාස්ත්‍රයෙහි ද නිඝණ්ටු කෙටුභ සහිත වූ
4 කාව්‍යශාස්ත්‍රයෙහි ද නැටුම් ගීයෙහි ද හස්ති ශිල්පාදි ශාස්ත්‍රයෙහි ද දුනු
5 කඩු ආදී නොයෙක් ශස්ත්‍රයෙහි ද වෙසෙසින් පර තෙර පැමිණියේ
හික්මුණු සිත් හෝ ගාත්‍ර ඇත්තේ ඇදහිලි පෙරටු කොට පිය රජහුගේ
අභිප්‍රායානුකූලව හැම කල්හිම හැසුරුණේ යි.

6 එකල යහපත් ආදර ආචාර ගුණයෙන් සිත් පින වන ලද පියරජ
තෙමේ උහු හා ප්‍රිය මිත්‍රයකු සමග සෙයින් උයන් කෙළි දිය කෙළි ආදී
7 නානාප්‍රකාර සුව අනුභව කෙරෙමින් සිය රට ඒ ඒ තැන හැසිරෙමින්
8 එක් කලෙක රට සීමා ආරක්ෂායෙහි යොදන ලද ඉතා බල ඇති දැඩි
9 භක්ති ඇත්තා වූ සංඛ සේනාධිපතිහු වසන බදලත්ථලී නම් ග්‍රාමයාගේ
10 සමීපයට ආයේ ය. සේනාපති තෙමේ ඒ බව අසා එකෙණෙහි ඒ ගම
11 මොනවට සරසවා පෙර ගමන් කොට පුතු සහිත මිහිපල්හු වැඳ සිටියේ
ය. එකල පිය පුත් දෙන්නා උහුට ප්‍රිය තෙපුල් කියා උහු විසින්
12 නොයෙක් පරිදෙන් ආරාධනා කරණ ලද්දේ ඒ ගමට එළඹියෝ ය. රජ
තෙමේ එහි දවස් කීපයක් ගෙවා සෙනෙවියා කැඳවා මෙ වදන් කීයේ
13 ය. "දැන් මා පිත් තෙමේ යොවුන් වයසෙහි සිටියේ ය. උපනයනාභීය.
14 උහුට උපායනය කරන්ට මහොපකරණය වහා සැරසිය යුතුය" යි (කීයේ
ය.) ඒ අසා සේනාධි නායක තෙමේ මගුල් පිණිස සියලු උපකරණය
15 වහා සජ්ජිත කෙළේ ය. සුවඳ පහන් මල් ආදි වස්තුවෙන් තුනුරුවන්හි
16 තුන් දිනක් මහත් සත්කාර කොට පෘථිවිපති තෙමේ වේදකෘතියෙහි
17 දක්ෂ වූ බමුණන් ලවා ස්වකීය තේජසට අනුරූප වූ ඒ මංගල්‍යය නිමවා
18 ඇමතියන් සහිත වූයේ පැරකුම් කුමරු හා මහත් වසන්ත ක්‍රීඩාව කෙළනට
පටන් ගත. එකල කීර්ති ශ්‍රී මේඝ රජ තෙමේ රුහුණ වසන සිය මල්
19 සිරිවල්ලභ නම් රජහුගේ මරණයත් (උහු පිත්) මාණාභරණ නම් කුමරහු
20 රාජ්‍යලාභය හා මිත්‍රා දේවියගේ සිරිවල්ලභ නම් පුත්‍ර ලාභය ද රුහුණින්
21 ආ දූතයන් අතින් අසා සිය බෑයා කලුරියෙන් හටගත් ඉතා දුරස්සහ වූ
22 ඒ සෝක වේගය මිත්‍රාවගේ පුත්‍රෝත්පත්ති ප්‍රවෘත්ති ශ්‍රවණයෙන් දුරු
කොට ඒ වසන්ත කාලයෙහි වැළැක්කේ සක් සෙනෙවියා එහි නවත්වා
පුතු හා සංඛත්ථලි නම් පුරයට ගියේ ය.

Non-Commercial Distribution

23 ඒ පැරකුම් කුමරු හා එහි සුවසේ වසන රජහට හවුරුද්දක්
24 ඉක්මිණ. මාණාභරණ රජහු දෙවන බිසෝ ප්‍රභාවතී තොමෝ කිත්සිරිමේ
නම් පුතෙක් ලද. ඒ කිර්ති ශ්‍රී මේඝ රජ තෙමේ එපවතුදු අසා "අපගේ
25 වංශය මහත්වී ය" යි එකල අතිශයින් සතුටු විය.

26 ලක්දිව උපභෝග කරන්ට අසහාය වූ අසාධාරණ මහපින් කමින්
27 මෙහෙය ලද ඒ කුමර තෙමේ පියහු විසින් තමා කෙරෙහි පිය මිත්‍රයකු
28 කෙරෙහි සේ කරණු ලබන ආදර සහිත මහත් නැලවිල්ල ද නොයෙක්
29 ඇමැතියන් විසන් භය ශක්ති පෙරටු කොට කරණු ලබන උපස්ථානය
ද, තණපතටත් නොතකා වහා සියලු ම මේ ලක්දිව එ සේසතින්
30 හොබවනු කැමති වූ හේ තෙමේ මෙසේ සිතී ය, "මේ ද්වීපය තෙමේ
31 සම්‍යක් සම්බුද්ධයන්ගේ කේසධාතුය, අකුධාතුය, ශ්‍රීවාස්ථිධාතුය, දාඨා
ධාතුය, පාත්‍රාධාතුය, පාදචෛත්‍යය, මහා බෝධි සාඛාය යන මොවුන්ට
32 හා සම්‍යක් සම්බුද්ධවරයන් වැනි සුවාසූදහසක් ධර්මස්කන්ධයන්ටත්
33 නිත්‍යාධාර බැවින් ද එසේම මණිමුක්තා දි වස්තූන්ට ආකර බැවිනුත්
34 විශිෂ්ට යයි සම්මත වූ නමුත් ඉතා මහත් නොවේ. මපිය රජ දරුවෝ
තුන් දෙනාද එසේම මයිල් තෙමේ ද සර්වප්‍රකාරයෙන් මේ දිවයින
35 ඒකච්ඡත්‍රයෙන් පවත්වන්ට නොහැක්කෝ බෙදා වළඳන්නෝ "
36 මෙපමණකින් අපි කළ කිස ඇත්තම්හ"යි සිතන්නාහු කුලෝදිත
37 අභිෂේකයෙහි පහ වූ ආසා ඇත්තෝ ගම් මුදළියන් සෙයින් කෘෂිකර්මාදිය
38 ඇසුරු කළෝ සිය රට ඉසුරු පැවැත්වූ හ. ඔවුන් අතුරෙන් මාගේ
39 කුඩා පිය කිත්සිරිමේ රජු තබා අනිත් ඒ රජ දරුවෝ තුන් දෙනා කම් වූ
පරිද්දෙන් පරලොව ගියහ. අහෝමය, මෙකල මනුෂ්‍යයන් පරමායු
40 තෙමේ ස්වල්පයෙක, බාලයෝ ය, තරුණයෝ ය, මහල්ලෝ ය යන
මේ සත්වයෝ ක්‍රමයෙන් මරණයට පැමිණෙන්නා යි යන මේ නියමයද
41 මේ ලෝකයෙහි කිසි කලෙකත් අවිද්‍යමාන මැයි. අප වැනි
රජකුමරුවන් විසින් බිඳෙන සුලු වූ සාර රහිත වූ සාරදර්ශීන් විසින්
42 හෙළා දක්නා ලද්දා වූ ඒ මේ සිරුරෙහි අපෙක්ෂාව සර්වප්‍රකාරයෙන්ම
43 බැහැරලා ප්‍රාර්ථනා කටයුතු වූ චිරස්ථායි වූ යශස් ශරීරයෙහි සෑම කල්හි
ආදර කටයුත්තේ ය. උමමග්ග ජාතකකාදී වූ බොහෝ තැන බෝසත්හු
44 විසින් කරණ ලද වීරභාවාදී නිශ්‍රිත චරිතය ද රාමායණ භාරතාදී ලෞකික
45 කථාහිත් රාවණා මැරූ ඒ රාමාකුමරහු වික්‍රමය ද, දුර්යෝධනාදි රජුන්
46 මරා පංච පාණ්ඩ පුත්‍රයන් විසින් යුද්ධයෙහි පවත් වන ලද වික්‍රමාතිශය
47 ද ඉතිහාස කථායෙහි පෙර දේවා" සුර යුද්ධයෙහි දුෂ්මන්තාදි රජුන්
විසන්කළ අද්භූත චරිතය ද, නන්ද වංශයෙහි නරේශ්වරයන් උන්
48 මූලනය කළ ප්‍රසිද්ධ චාණක්‍ය නම් බ්‍රාහ්මණයාගේ නුවණ ශක්තිය ද,
49 අසා ලෝකයෙහි සියලුම මේ චරිතයෝ අද දවස දක්වා උන්ගේ සාමිප්‍යය

Non-Commercial Distribution

නැතිවත් ලෝකයෙහි සුප්‍රසිද්ධියට ගියාහු මැයි. මෙබඳු අසාධාරණ වූ
50 උත්කෘෂ්ට චරිතයක් කරන්ට සමර්ථයෙක් නම් ඔවුන්ගේ ජීවිතය
ලෝකයෙහි යහපත් ලාභයකි. ක්ෂත්‍රිය වංශයෙහි ඉපිද ක්ෂත්‍රිය වීරවරයන්ට
51 සුදුස්සක් මම ඉදින් නොකරන්නෙම් නම් මගේ මේ ජාති තොමෝ හිස්
52 වන්නී ය. හුදෙක් ඔවුන්ට කාල සම්පත්තියට අධික විය. කිමෙක් ද
53 ප්‍රඥා ආදියෙන් ඔවුහු හට වඩා අධිකයෝද්ද යි සිතා "දූන් මපිය රජ
තෙමේ ද පශ්චිම වයසෙහි සිටියේ ය, ඉදින් පියා අයත් මේ රජය මා
54 අත්පත් වී නම් රාජ්‍ය ශ්‍රී වසඟයෙන් යුක්ත සිත් ඇති මාගේ ප්‍රමාදයෙන්
55 යථාභිප්‍රේතය ඉදින් නො වී නම් අත්‍යර්ථයෙන් මට මහත් හානියෙක.
ඉදින් මම මෙහිම වෙසෙමින් සිය වරයක් ඇවිදුවා තත් වූ පරිදේදන්
56 පරමණ්ඩල ප්‍රවෘත්තිය දනිම් නම් පසමිතුරන්ගේ සිදුරු පරිද්දෙන් මාගේ
අභිප්‍රයානුරූප කොට ප්‍රකාශ කරණයෙහි චරයෝ සමර්ථ යෝ හෝ
නොවෙද්ද? මෙහි යම් පමණ ජන කෙනෙක් වෙත් නම් ඔහු සියල්ලෝ
මා හමුයෙහි සතුරන්ගේ බලාධික්‍යය නොයෙක් පරිද්දෙන් කියත් මැයි.
57 "එකි එකී රට හිමි වූ (ඔබ) පිය රජුන් තුන් දෙනා විසින් එක්ව සත්
58 වරක් මහා යුද්ධ කොට සාධාගන්ට දුෂ්කර වූ රට හුදකලා වූ තරුණ
වූ එක් රටත් අනුභව කරන්නා වූ භවත්හු විසින් කෙසේ (සාධා) ගන්ට
හැකි වන්නේ ද? මුල් වූ ඒ රාජයාගේ සාධනය සුවසේ කොට හැක්කැයි
59 යන තාගේ මේ දුශ්චිත්තිය දුරු කටයුතුය" යි කණෙහි රත් යවුල් එලන්නා
සේ නොයෙක් පරිද්දෙන් පරමණ්ඩලයෙහි මහිමව බොහෝ කොට
60 මෙසේ කියති. තත් වූ පරිදි නොදැන් කියන්නා වූ දුර්බුද්ධීන්ගේ නියාලු
61 මේ වචනය කිසි කලෙකත් ඇදහිය යුතු නොවන්නේ ය. එහෙයින්
62 එක් උපායකින් පරමඬලයට වහා ගොස් මම එහිම තත්වය දැනපුම් නම්
යෙහෙකැ" යි සිතුයේ ය. "ඉදින් මපිය මිහිපල් තෙමේ මේ සිතිවිල්ල
දැන "අභිජාත වූ වංශය බබුලුවන්නා වූ සතුරන් රටට ගිය මපුතු හට
63 අන්තරායකුදු විය හැක්කේ ය"යි අනුකම්පා බුද්ධීන් මා ගමන් වළකන්නේ
64 නම් සර්වප්‍රකාරයෙන් මාගේ මන දොළ මුදුන්පත් නොවෙන්නේ ය.
එහෙයින් වෙස් වළා යමා යෙහෙකැයි සිතා පසුව එක් දිනෙක රාත්‍රි
65 කාලයෙහි එබඳු අවකාශයදු ලැබ අක්ෂිණ තර මහා උපා ඇත්තේ සිය
66 පිය තෙමේ ඒ ගමන් යම්සේ නොදනී නම් එසේ කල් දන්නා වූ චතුර
වූ ඒ කුමර තෙමේ ගෙන් බැහැර නික්මිණි.

මෙතෙකින් හුදී ජනයාප්‍රසාද සංවේග පිණිස කල මහවස පරමණ්ඩලාභි ගමන නම් වූ සූසැට වන අදියර නිමි."

Non-Commercial Distribution

# හැට පස් වෙනි පරිච්ඡේදය

1 සිය අවි දෙවෙනි කොට නික්මෙන පැරකුම් කුමරි ඉදිරියෙහි
2 එකෙණෙහි කිසි සක්හඬක් නැංග් ය. ඉක්බිති නොයෙක් නිමිති දන්නා
3 හෙතෙමේ ඒ අසා "සංකල්ප තෙමේ වහාම සිද්ධවන්නේ යයි සතුටු
4 වූයේ, ඒ ඒ තැන නියුක්ත ආරක්ෂක ජනයන්ගෙන් නොදන්වා ම
5 පහවූ භය ඇති සිංහ පරාක්‍රම ඒ කුමාර තෙම නුවරින් නික්ම වේගයෙන්
6 පස්ගවු පමණ මග ගෙවා ගොස් බදුලු තපාගමට නුදුරු පෙදෙසක
පිලිංවත්තැයි නම් වූ එක් ගමකට එළඹියේ ය. තමා ඊමෙන් (පෙරතුව
7 අවුත්) පෙරමග හිඳිනට සිය ජනයාගේ සන්නිපාත පිණිස කළ අවධි
ඇති කුමර තෙමේ එකල පිළිලද නියෝ ඇත්තන් අතුරෙන් මද කෙනෙක්
ම එහි අවුත් සිටියත් දැක "කිමෙක් ද ආවෝ මේ පමණෙක් දැ"යි විදාළේ
ය. ඉක්බිති ඔව්හු කුමරහට මෙසේ කිවූය.

ලෝ පවත් සියල්ල දන්නාවූත් ස්වාමීන් විසින් මෙසේ කුමක්
8 කියනු ලැබේ ද? මරණ භය විද්‍යමාන නො වන්නේ කාටද? ස්වාමී
9 තෙම බාල බව අනුගවූ ඊනියාව වයස්ව සිටිසේක. නුඹ වහන්සේ ගේ
10 තුඩ අද දක්වාත් කිරි සුවඳ හමයි. ඔබ විසින් වෙන් කොට රැස් කරණ
ලද වස්තුවෙක් නැත්තේ මය. ඉන් අන්‍ය වූ උපකරණ සාමග්‍රීයකුත්
11 නැත්තේ ම ය. බොහෝ කලක් ඉතා පුරුදු වූ දැඩිව හටගත් ඇදහිලි
12 ඇති අප හැර ඔබ අනුව යන්නා වූ ජනයෝ කවුරුද? වැලි එකෙක්
13 ඇති. ආවා වූ අපටත් නුඹවහන්සේ ගේ පිය නරෙශ්වර තෙමේ මේ
නම් දඬුවමක් කරන්නේ යයි සර්වප්‍රකාරයෙන් ම නො ම දක්නා ලැබේ.
14 අපගේ අතරමග මහාවීර මහා බල ඇති සංඝ නම් සෙනෙවි තෙමේ
රාජ්‍යසීමාන්තයෙහි වසන්නේ (කුමක් කරන්නේ ද (අනික් පස මිතුරන්
තබා මේ අප කීප දෙනෙක් මිනිස්සු උනුන් කෙරෙහි නියතයෙන් අත්‍යර්ථ
15 වූ සැකයෙන් යුත් සිත් ඇත්තම්හ. දැන් අරුණොද්ගම වේලාව ද ඉතා
අසන්නය" මෙසේ හෘදය ඇසුරු කළා වූ භීතිය වෙන් වෙන්ව ප්‍රකාශ
කළෝ ය.

16 උන් බස් අසා මිහිරි සිනා කොට සැක නැති ඒ කුමාර තෙමේ
17 ඔවුන් මුහුණු බලා "අහෝ මෙතුවක් කල් මොව්හු සියල්ලෝ මා සමග
හැසිරත් මා නො හැඳින්නාහ. මොවුන් බිය ඊනියා ය" මෙසේ සිතා
18 එළඹ සිටි ඔවුන් භය දුරු කරණුවට සිංහ වික්‍රම ඇති කුමාර තෙමේ
19 එකල මහත් සිහනද කෙළේ ය.

Non-Commercial Distribution

20 සියලු මිනිසුන් සිටිත්වා, මා හස්තගත ආයුධ ඇති කල කිපියා
21 වූ සක් දෙව් රජ තෙමේත් කුමක් කරන්නේ ද? මා බාලයයි සිතන්නා
වූ තොපට මෙබඳු දුර්මතියකින් හටගත් තේජස හා ආඥාව පරීක්ෂා
කරණු ලැබෙයි, වයස නොවෙයි යනු කිමෙක් ද? තොප විසින් නො
22 අසන ලද්ද? අද මා විසින් කරන්ට සිතන ලද එක් ක්‍රියාවකින් මසිය
23 රට පර රට වැස්සෝ යම් සේ මා කෙරෙහි භය හා භක්ති කෙරේද
තෙපිත් යම් සේ මේ භය හරිව්දමේ රැය පහන් වූ කල ඇසිල්ලකින්
24 එසේ මාගේ උග්‍ර වූ ඥානබලයෙන් කටයුතු වූ විකුම් දක්වන්නෙමි පිය
25 රජහු සේනා තොමෝ මා ලුහුබඳනී ය. එදින තොපට භයෙක් ඇත්තම්
තෙපි පෙරතුවව්" යයි උන්ට කියා ගන්නා ලද අවි ඇතිව නිර්භය ඒක
26 ක්‍රියා කොට ඇති වීර වූ (කුමාර තෙමේ) ඒ ගමින් පිටත් ව උදාගිරි
මුදුන සිටි හිරුමණ්ඩල දිනන්නට බටහිරි මුවින් නැගී අනික් හිරු මඬලක්
27 සෙයින් පැතිරෙණ තෙදින් ජනයන් නෙත් පියුම් වන පොබයමින්
පෙරවරු බදුලුතලට පැමිණියෝ ය.

සමභ්‍රම ඇත්තේ තෙ පැමිණි රජ කුමරු හැඳින මහ බලසෙන්
28 සමග පෙර ගමන් කොට කරණ ලද ආදර ඇත්තේ සුදුසු ප්‍රණාමය
29 කරන්නට මිහිතෙලහි නැඹුරු විය. "මේ තෙමේ ජීවත් වෙන්නේ අපට
30 කවර වැඩක් කරන්නේ ද? දූන්ම මැරිය යුත්තේ ය"යි මුහුණ බල්නා වූ
31 ද භටයන් "නුදුටු අපරාධ ඇත්තක්හු මැරවීම පුරුෂ බවට නුසුදුසු ය.
විරුද්ධ කල වධය හැක්කැයි" යි ඉඟියෙන් වළකා සිංහයකු බඳු ඒ
32 කුමාර තෙමේ සෙනෙවියා අත ගෙණ මිහිරි වදන් කියමින් ඔහු
මාලිගාවට ම ගියේ ය. ඉක්බිති සෙනෙවි තෙම "මොහු ගමන් රජු නො
33 දූන ම විය යුතුය , යි (සිතා) යම්තාක් ස්වභාව දනිම් නම් එතෙක්
මොහු කැටුව ආවෝ යම් සේ එක් එක් නොවෙත් නම් එසේ වෙන්
34 කොට තැබිය යුත්තා හ. කුමර තෙමේ මා ගෙයි වෙසේව" යි සිතා
සෙනෙවි තෙමේ එසේම කොට මහ පැණැති කුමරහු රවටන්නට
35 ආගන්තුක සත්කාර දක්වා රජු කරා දූතයන් යැවී ය.

36 ඉක්බිති කුමර උහු විසින් ක වංචා දූන "මෙහි කටයුතු නො
37 කොට ඉඳින් මම උදාසීන වීම් නම්, කිස කලෙක! මාගේ මනොරථයාගේ
නිෂ්පාදිතිය නොවයන්නේ ය. පළමු කොට දූන් මේ තෙමේ අවශ්‍යයෙන්
38 මැරවිය යුත්තේ ය" යි සිතා එක්ව ආවක්හු මෙහෙයා සෙනෙවියා මැර
39 විය. සෙනෙවි මැරවූවා කොලාහල විය. සෙනෙවියා එක් භටයෙක්
40 සෙනෙවිහු මැරවූවා අසා "මා හිමියා මරණය කරව කරුණකින් ද"යි
කියමින් කඩු ගත් අත් ඇතිව සිය මිහියාට පුදන ලද මහා දිවි ඇත්තේ
එකලාව සිටි කුමරහු වෙත ලා හෙලා දිවා රැ ආය. ඉක්බිති ඒ තෙමේ

Non-Commercial Distribution

41 කුමරහු මුහුණ දැක භයින් වෙවුලමින් ඉදිරියෙහි සිටින්ටත් අසමත්ව
පාමුල හිණ. කුමරහු "මොහු ගණුවයි" කියන්නට පෙරාතුව ම කුමරහු
42 සහ චරයෙක් තෙමේ මේ භටයා මැරී ය. "මා නියෝග නැතිව උභු
43 විසින් කළකම නොයෙදේ" යයි මොහුට සෑහෙන දඬුවම් කරවී. ඉක්බිති
රජ කුමර තෙමේ එකල භටගත් ඉතා බිහිසුණු සංක්‍ෂොභය බැම එසවීඹ
පණකින් සමනයට යැවී ය.

44 යසස් ම උතුම් ධන කොට ඇත්තා වූ ධෘතිමත් වූ වීරයන්ට
උපකාර කරණයෙහි චතුර වූ ප්‍රවර කීර්ති සාර කොට ඇති වීර කුමාර
තෙමේ සෙනෙවියා රැස් ක ළ අනල්ප වූ සියලු ධනය භටයන්ට රුචි
පරිද්දෙන් ගන්ට විසිර වී.

මෙතෙකින් හු දී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
සේනාපතිවධ නම් වූ සැටපස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# හැට හය වෙනි පරිච්ඡේදය

1 "සිතූ අභිප්‍රාය (සිද්ධ) කරන්නට ඉදින් අදම ගියෙහි නම් "කුමර
2 තෙමේ බියෙන් ගියේ ය"යි මේ ජන තෙමේ සිතන්නේ ය. නොවිමසා
සෙනෙවියා මරා හුන් මට මපිය තෙමේ යමක් කෙරේ නම් මෙහි
3 සිටියේ ඒ දකිමි" මෙසේ හටගත් සිතින් පණ්ඩිතයන් අතුරෙන් ප්‍රවර වූ
වීර තෙමේ කිහිප දවසක් එහිම පසු කළේ ය. සෙනෙවියා හටයෝ ද
රට වැසි බොහෝ ජනයෝ ද සෙනෙවියා මැරීම නිමිත්තෙන් හටගත්
4 මහා භයට පැමිණියෝ යි. එහෙයින් ගිය ගිය තැන්හි හිඳිනට
5 නොපොහොසත්ව භාත්පසින් අවුත් ඒ කුමරහු දුටුහ. පිය රජහු විලෝම්ව
6 වැටෙන ඒ කුමරහු විසින් සෙනෙවියා මරණ ලදැයි සිතන රට වැස්සෝ
"දැඩිව හටගත් භක්ති ඇති අප වැනි බල වත්ත වූ දාසයන් ඇති කළ
ස්වාමීහුගේ කවර කාරණයක් සිද්ධ කට නොහැක්කේ ද? ස්වාමි වූ
7 (ඔබ) හින්දදී ඔබ වහන්සේලා ගේ පිය සතු මේ රජය ඔබ පිය
8 පරම්පරාගත බාල කුමර තෙමේ මෙබඳුව කෙසේ අනුභව කරන්නේ ද?
9 අපි එක්ව ගෙණ සක්නාතල නුවර ගොස් වස්තු ගබඩා හා ඇතොවුරන්
සහිත ඒ රජහු පැහැර ගෙණේම්හ"යි මෙසේ දැඩිසේ ගිවිස රජය
ගැන්මෙහි හුදු තත්පර කම් ඇති ඔව්හු පදවර සුන්කඩ නම් තැනට
ගියහ.

(පැරකුම්) කුමර තෙමේ තමා අයත් කිහිප දෙනෙක් එහි යනා
10 උන් අතුරෙන් ඒ බලනායකයන් ගෙන්වා "මා විසින් පියරජුට විරුද්ධව
සෙනෙවි මරණය කරණ ලදැයි මෙසේ තොපි නහමක් සිතත්වා. මා
11 කෙරෙහි තොපගේ කෝපය නහමක් වේවා. ඒකාන්තයෙන්ම මම පිට
12 රජහට විරුද්ධව නොයෙමි. එසේ ම මේ රාජ්‍යබාගය තමා අයත් කරන්ට
13 කැමැත්තෙම් ද නොවෙමි. හුදක් අප වැනි පුතුන්ගේ අසතීත්වය තමන්
14 මහලු මව්පියන්ට මදකුත් තුරුස්සතනක් නො කොට අනික් යම්
15 කිසිවක්හු විසින් කරණ ලද උපද්‍රවයනුත් වළකා හැම කල්හි සකසා
උපස්ථාන කරන්ට නොවේ ද? තොප විසින් මෙසේ කුමක් සිතන
ලදදැ" යි උන්ගේ (අවේග) සිතිවිලි දුරලා මහ පැණැති (කුමර තෙමේ)
16 මත්තෙහි කටයුතු සිතන්නේ "ඉදින් මෙහි ම කීප දිනක් වසන්නෙම්
17 නම් දුදනෝ අප පිය පුතුන් දෙදෙනා (උනුන්) බිඳුවන්නා හ. මෙහි
18 කාලාතික්‍රමණය නො කොට පෙර සිතූ දූයගේ සිද්ධි පිණිස ඒතාක්
දනැ මෙතැනනී යන්ට වටී ය"යි නිශ්චය කොට ගණෙ ඉක්බිති සිරිදෙවියා
19 ගල වෙත බුදු ගම බලා යන්ට රජ කුමර තෙම බදුලුතලා ගමින් නික්මිණි.
20 එකල රට වැස්සෝ කැටිව ගෙණ (කුමරහු) සිරියාලනම් ගමට එළඹෙන්ට
පෙරාතුව වෙන් වෙන්ව පලා ගියහ.

Non-Commercial Distribution

21 එකල කුමර තෙමේ තමා අනුගත සිය පිරිවරන් යුක්ත වූයේ
අවියෙන් මොනවට සැරසෙන ලදුව වීයඞ් ගුණොපේ ත වුයේ මහ
22 මඟට පිළිපන. "සෙනෙවියා නැසූ කුමරහු පලායන්නා නො සලකා
හැර අප විසින් ආහාර දායක ස්වාමියා කෙරෙහි කරවර පක්ෂපාතයක්
23 කරණ ලද්දේ ද? මෙසේ කිපිය ධූති කෙනෙක් කළ උපක්‍රම ඇත්තෝ
අතරමග යන ඒ කුමරහු යන්ට පිටිපස ලුහු බැන්දෝ යි එකල රාජපුත්‍ර
24 තෙමේ උන් කෙරෙහි මදකුත් සැක නො කොට ස්වකිය හස්ත ගත
25 කඩුනේ යුදකොට අන් පලවා කැටිව ආවුන් ගෙණ නො දක්නා ලද
පිරිහිම් ඇත්තා වූ බිය ඉක්ම වූ මහ නැණැතියේ බුදු ගමට එළඹියේ ය.

26 එහි වසන කුමරහට කිහිප දිනක් පසු වූ කල "කුමරහු ගණුම්හ"යි
27 කැටි වූ රට වැස්සෝ මහ වේගයෙන් තිරතුරුව හී වැසි වස්වන්නෝ
28 යුධ පැටිවනු කැමැත්තෝ ඒ ගම වැටලුහ. "එයින් වැඩ ඇති කල අපි
(ස්වකීය) ප්‍රාණයත් පරිත්‍යාග කරම්හ"යි උහු හා කැටිව ආ භටයෝ
භයින් ව්‍යාකුලව රජ පිත්හුගේ සේසත් කඩු ගෙණ යන මිනිසුන් තබා
29 රජ කුමරහු බලා හින්ද දී ම ඔබ් නොබ පලා ගියහ. ඒ කුමර පලා යන
30 සිය භටයන් දුක මද කොට සිනාසී ඉතා උදාර වික්‍රමය දක්වන්ට ලද
31 අවසර ඇත්තේ අවියෙන් ම "බියගන්වා සතුරන් පලවන්නෙමි කියා
32 කඩුව ගෙණෙව"යි මහා වේගයෙන් බිණිය. ධීරගම්භීර ගුණයෙන් යුක්ත
33 උහුගේ බස් සමග දිග්වලයෙහි පතළ ජයසක් හඬ අසා කිසි සතුරු වීර
කෙනෙකුන් ගේ සිඳී හුණු හිස් දුන ඒ කුමරහුගේ පළමු පැළැ භටයෝ
34 පෙරළා අවුත් නොයෙක් දහස් ඒ බලයෙන් යුද කොට පලවා පිරිවරා
ගෙණ කුමරහුගේ ම විකුම් පැවැස්සෝ ය.

35 ඉක්බිති කුමර තෙමේ ඒ බුදු ගමෙහි වෙසෙමින් ගජබා රජහුගේ
(සාමන්ත වු) කලා වැව සිටි ගොකණ්ණනගර ගිරිහු කැඳවා උහු සිත්
36 පවත් දන්නා කැමැත්තෙන් තමන්ගේ ලියමන් ගත් ඇති ස්වකීය දූත
37 මිනිසකු එහි යැවී. සාමන්ත තෙමේ ද ඒ පත දුක හිසින් පිළී ගෙණ
කියවා ඉන් සියලු පවතුන් දුන ඒ රජ කුමරහු මහත් තෙදින් හසුන්
38 ඉක්මීම නොහැකි බව් සිතන්නේ එකල සිය රජහු අදහස් දූන් මෙහිත්
39 සර්වප්‍රකාරයෙන් අපෙක්ෂා නැතිව බුදු ගමට අවුදින් සාදරයෙන් කුමරහු
40 දිට. "පියරජහු වෙතින් මා ආවා වූ ආකාරයෙන් ලාහෙලා බලතර
41 සෙනෙවියා මැරවිමත් පසුපස්සෙහි එලවන සතුරු සේනාවට මා විසින්
42 කළ විස්මය එලවන වික්‍රමයත් අසා සතුරු සේනාවට මා විසින් කළ
විස්මය එලවන වික්‍රමයක් අසා ස්වකීය රජහු අභිප්‍රාය දූන්මෙහි සිතකුත්
43 නූපදවා පෙර පුරුදු නැතිව ම මා විසින් යැවූ දූතයාත් යවන ලද
44 පත්‍රයත් දූකම අවුදින් මා දූකුම් කරණ තා විසින් මැනවක් කරණ ලදූ"යි

Non-Commercial Distribution

සතුටු වූ ඒ ස්වාමි තෙමේ තමා පැළඳි නොයෙක් මා හැඟි රුවන්
45 අබරණ සියල්ල උතුම් ඇතෙකුත් සමග උහුට දින. පසුව උහුගේ බල
නායකයන්ට ද මා හැඟි මිණිකොඩොල් ආදී වූ ඉතා අගනා ආභරණ දී
46 වාසගෘහ ආහාර දානාදී විධියෙන් කළ සංග්‍රහ ඇති ඒ ඇමැත්තාහු
සියසෙන් හා විශ්‍රාම පිණිස එතැනින් යැවී ය.

47 ඉක්බිති ඒ තෙමේ රෑ අවසට එළඹ එහි දී සිහිනෙන් සෙනෙවියා
48 මැරුවා සෙයින් කුමරහු නියෝගයෙන් අවිගත් අත් ඇති රෞද්‍රයන්
විසින් තමා මරණයට හාත්පසින් වැටලූවාක් මෙන් දුන මරණ භයින්
පෙළුණේ පසුව වියරු හඬින් මුරගාමින් ඇඳෙන් බිම හී සිය කග තුඩ
49 ගත්වුත් පවා අපේක්ෂා නො කොට තමා හා ආ සියලු ඒ බලසෙන් ද
50 හැර දිසා ව්‍යවස්ථානයත් කොට ගත නො හැකි මහවලට වැද එහි
51 මංමුළාව ඇවිදිමි. උදැසන කළා වැව් යන මං දුන යුහුවම එයින්
52 ගොස් සිය ගමට වන. උහු සේනා ද හිමියා පලාගියා අසා අනික්
53 ආරක්ෂාවක් නො දන්නී මහ බියෙන් වෙවුලා ගිය සිය සිය අවිදූ එහිම
54 දමා සිය හිමියාගේ මං මුළා වුවෝ වෙනෙහි ඇවිද උදාසන්හි වහාම
55 කළා වැව් පැමිණියා ය. ඒ ඇමතියා පැලැ පවත් අසා ඒ කුමර තෙමේ
56 සිනාසී එහිම කිහිප දවසක් ගෙවූයේ යි. එකල නානා භාෂා රස
දන්නා උහුගේ උකටලී කාලයෙහි ඒ කතා තොමෝ ම උකටලී දුරලීමෙහි
හේතු වී.

57 කිත්සිරිමේ රජ තෙමේ සියලු මේ පවත් අසා මහ ඇමතියන්
58 කැඳවා එවුන් හා මන්ත්‍රණය කෙළේ යි. "කුමර තෙමේ දූඩි අරකුන්
ඇති ඇමතියන් වසන නොයක් භටයන්ගෙන් ආකීර්ණ වූ මේ නුවරින්
59 වෙස් වළා නික්මිණ. පසුව රැස් වූ ධූර්තයන් කීප දෙනෙක් හා එක්ව
60 අකෘත්‍යකාරි ඒ මිනිසුන් හා පලා ගොස් රජයෙහි මා ඇත්තන් අතුරෙන්
අති බලී සෙනෙවියා මරා උහු විසින් රැස් කළ වස්තු සාරය සියල්ල
ගෙන එයිනුත් පලා යන්නා වූ හේ තෙමේ පසු පස්සෙයි ලුහු බඳනා
61 බොහෝ ජානපදික භටයන් ඒ ඒ තැන මරා ගජබා රජහු (අයත්)
62 ගොකණ් නගර ගිරි නම් (සෙනෙවියා) ගෙන්වා බුදු ගම වෙසෙමින්
63 වසඟ කෙළේ ය. මේ උපෙක්ෂාවට කල් නොවෙයි. මෙ බඳු සිදුරක්
ඇති කල සතුරෝ මහ පින් ඇති ප්‍රඥා වික්‍රමයෙන් යුක්ත මේ කුමරු
64 හා කූටසන්ධි කොට ගෙණ ඉදින් යුද්ධාරම්භයට සිත් ඉපද වූ නම් අපට
65 මහත් හානි වන්නේ ය. යම්තාක් අනික් දුශ්චින්තාවක් නොසිතන්නේ
66 නම්

Non-Commercial Distribution

ඒ තාක් මේ තෙමේ එම ගම් හුන්නේ ම ගත යුත්තේ ය"යි
67 නිශ්චය කොට සේනය, මිහිඳුය යන ප්‍රසිද්ධ අදිකාරම් දෙ දෙනා ද,
එසේ ම දේවපාදමූලක දූරු මහලේනා ද යන මොවුන් හා අනික්
ඇමතියනුත් තමා, වෙතට කැඳවා "මාගේ රජයෙහි අවියෙන් දිවිවැටුම්
68 කරණ යම් කිසිවෙක් වෙසෙත් නම් මුන් සියල්ලම එක් කොට ගෙණ
වහා ගොස් බලාත්කාරයෙන් ඒ කුමරු ගෙණව"යි කියා ඔවුන් එහි යැවී
ය.

මහා බල ඇති ඔව්හු සිය සිය මහසෙන් ගෙණ සිරියාල ගම්
69 වෙතට ගියෝ දස කොටස් ව බෙදුනා හ. කුමරුද එපවත් අසා "මම
70 එබඳු දූර්ගයක සිට දස කොටස්ව බෙදී එන බලය එක්මුබ කොට වහා
උන්මූලනය කෙරෙමි" යි සිතා ඉක්බිති වීර තෙමේ මහාතිල නම් පෙදෙස
71 විල්ගමට වහා ගියේ ය. ඇමතියෝ ද ඒ කුමාර තෙමේ ඉදින් එයිනුත්
72 පලා ගොස් පර්වතයෙන් ගහන වූ මහා දුර්ගප්‍රදේශයකට ප්‍රවිෂ්ට වීනම්
73 කිසි උපායකිනුත් උහු ගැන්ම දුෂ්කර කරය" යි සිතා ඔහු සියල්ලෝ
74 එක් දෙසක් බලා එහි ම එළඹියා හ. කුමර තෙමේ ද ඒ අසා සිතුවා
සිද්ධි පිණිස තුටු වූයේ ය. යදනා සේනාවට ඉදිරියෙන් අවසර තබා
75 දුන මාර්ගයන්හි ගුඨාකාරයෙන් මොනවට සැරසුනා වූ වීරයයි සම්මත වූ
බොහෝ වූ සිය මිනිසුන් යොදා යුද්ධෝපායෙහි පණ්ඩිත වූ බලී කුමර
76 ලද අවි ඇත්තෝ නැවත යුද්ධයට ආසා ඇතිව ඈත මෑත පැලහ.
77 එකල ජන ඇති රජ කුමර තෙමේ එතනින් නික්ම පියහු සිත් රක්නා
78 සඳහා බෝගම්වරට ගියේ යි.

79 විර වූ ඒ කුමර එහි කිහිප දවසක් පසු කොට පිය රජහුගේ
80 මෙහෙයීමෙන් යුද පිණිස පසුව ආවා වූ සේනාව එහිදීම බිඳ පලවා ඒ
ගම්නුත් ලග්ගල පෙදෙස රණඹුර නම් ගමට ගියේ යි. පසුව ධීර වූ ඒ
කුමර තෙමේ සිය භටයන් ගමන් විඩා සන්සිඳුවන්ට එහි වෙසෙමින්
81 කිහිප දවසක් ගෙවා "මොව්හු සියල්ලෝ යුද්ධයෙහි මා විසින් නොයෙක්
වර බිඳුනා ලද්දා හු නමුත් පිය රජහු කෙරෙහි භයින් යුද්ධයෙහි
82 නිරුත්සාහ වූවෝ පලා නොයෙති. " මේ කුමර තෙමේ දුර්ගයෙහි සිටි
83 හෙයින් අප අතට නො වන්නේ ය" යි යන දුර්මන්ත්‍රී වූ ඔවුන්ගේ
84 දුශ්චිත්තිතය යම් හෙයකින් වී ද "එහෙයින් දැන් මම මේ උන් වසන
85 තැනට ම එළඹ උන්ගේ දුශ්චින්තිතය දුරු කරන්නේමි" සිතා සෙනඟ
86 සිටියා වූ කිරිවෑගමට යමින් අඹ වෙන නම් පෙදෙසට පිවිස එහි සිටියේ
87 ඒ ගම් වැස්සන් අතින් තන් වූ පරිද්දෙන් උන්ගේ සංචාර දත්තේ තෙමේ
88 ම සවස ඉන් නික්ම රාත්‍රි භාගයෙහි ඒ ගමට එළඹියේ ය. උහුගේ
89 භටයෝ කටුයෙන් බිහිසුණු වූ තියුණු අග්‍ර ප්‍රදේශ ඇති වැව ගැටී

Non-Commercial Distribution

ප්‍රවේශයෙහි අසමර්ථ වූවෝ බැහැර සිටියහ. තෙමේ පෙරටුව වැට බිඳ
බිය රහිතව වන්නේ ය. වීර වූ ඒ කුමර තෙමේ ගම මැද සිටියේ සිය
90 නම ද ඇස් වී. එකල්හි ඒ රජ කුමරහුගේ අද්භූත වික්‍රමය පෙර දුටු ඒ
91 සතුරෝ ගැශූරු ඒ නාදය අසා භයින් මිරිකුණෝ සියල්ලෝ ස්වකීය
92 වස්ත්‍රා යුද්ධයෙහි ද සිහි මුළා වූවෝ සිංහයා දැක මුවන් සෙයින් ඒ ඒ
අත දිවපූහ. උහු පිවිසි මගින් උහුගේ භටයෝ ද පිවිස දුටු දුටුවන් මැරූ
හ. ගම ගිනිලූ හ. එකෙණෙහි ම රජ කුමර තෙමේ නැව් ගල ගමට
සේනා විධා සන්හිඳුවමින් එහි අරුණු නැගී ය.

93 එකල්හි පිය රජහුගේ ඒ ඇමතියෝ එක්ව ඒ ඒ යුද්ධයෙහි (කුමරහු)
මහත් උත්සාහ සර්වප්‍රකාරයෙන් මන්ත්‍රණය කළහ. "නොයෙක් දහස්
94 ගණන් බළසෙන් ගෙණ සිය සෙන් නසා කුමරහු ගණුම්හයි වේගයෙන්
ගොස්" හැම තැන යුදෙහි පලා යන්නා වූ සියල්ලන් විසින් හුදෙක් ඒ
කුමාරයාගේ තේජස් ප්‍රකාශනය අක්‍යත්ර්යෙන් කරණ ලද්දේ ය.
95 නොයෙක් වර රජහු විසින් මෙහෙය වන ලද හස්න ද බිය එලවයි.
මෙහි අප උපෙක්ෂා වන කල බන්ධූ න්ගේ ජීවිතය නැත්තේ ය. යම්
96 කිසි උපායකින් රජහු අණ සිදු වන පිණිස උත්සාහ නො කොට කල්
97 යැවීමයුතු නොවේ. සිය පණ ඉවත සලාත් පෝෂනය කළ හිමියන්
98 සතුටු කරවා බන්ධූ පාලනය ම කටයුතුයි." මෙසේ යුහුසුලු වූ මහබල
99 ඇති ඒ සියල්ලෝ ම මොනවට සැරසෙන ලදුව චරයන් විසින් කියන
100 ලද මගින් මර සෙනගත් සෙයින් නික්මුණහ. සතර දිග දොරින් ගමට
වැද ඉක්බිතිව කුමාරයාගේ ගෙය හාත්පසින් ඇවුරූ හ. සිහිල් අධික
පෙදෙස් හෙයින් රත් පලසක් පොරෝණා ලද්දේ බාලවයසට ඔබිනා
කෙළියකින් කෙළෙමින් හුන්නේ යත එකල්හි ඒ කුමර තෙමේ
101 උද්ඝෝෂණයෙන් සතුරන් ඉතා ආසන්නවූවන් දැක එකෙණෙහි සිය
102 පිරිවරින් එකෙකුන් නො දැන දැඩි කොට සළුව බැඳ ගෙණ පෙරවි
103 පලස ම ඉතා දැඩි කොට හැඳ කඩු ගත් අත් ඇත්තේ බිහිසුණු රස
දක්වා යුද මැද වැද කේසර සිංහයකු ඇතුන් සෙයින් ඒ සියලු සතුරන්
104 ඇසිල්ලකින් දිශාන්තාභිමුඛ කෙළේ ය. මහා කෝලහලින් බිය ගෙණ
105 වල්වන් කැටිව ආ සිය ජනයා හඬගා එක් කොට ගෙණ "පිය රජහු
106 තබා විපක්ෂ රජහට මෙහි ආවා කරුණු කිමෙක්දෝයි යම් සැකයෙක්
107 උපදනේ ද එය සර්වප්‍රකාරයෙන් වළකන්ට සෙනෙවියා මැරවීම් ආදී මේ
108 සියල්ල පමණි. දැන් පරමණ්ඩලයට යා යුතුයි" මෙසේ (නියම කොට
109 ගෙණ ) එතැනින් යමින් පොරෝගලකඩ නම් තැන දී ලෙහෙසියෙන්
110 සම්බන්ධ වූ කඩුව දියෙන් තෙමීමෙන් අතින් ගලවා ලේ ඉසුනු හැඳි ඒ
උතුරු සළුව ද පහ කොට පෙරළන ලද වස්ත්‍ර ඇත්තා වූ ඒ තෙමේ

Non-Commercial Distribution

111 විශ්‍රාම සුව අනුභව කොට පිය රජහුගේ රට සීමා පසු කොට ගජබා රජහු රට දනව්ව නම් තැනට එළඹියේ ය. හේ තෙමේ ඒ පෙදෙසට සුදුසු නොයෙක් ක්‍රීඩා විනෝදයෙන් එහි වෙසෙමින් කිහිප දිනක් ගෙවූයේ ය.

112 ඉක්බිති ගජබා රජ තෙමේ කුමරහු ආ පිළිවෙළ තමා රක්නවුන්ගේ මුවෙන් අසා අත්‍යර්ථයෙන් හටගත් ආදර ඇත්තේ සිය ඇමතියන් හා
113 මන්ත්‍රණය කොට කරණ ලද කර්තව්‍ය නියම ඇති හේ තෙමේ උහුට
114 වස්ත්‍රාභරණාදී පඬුරු යවමින් "මා මයිල් රජහු වෙතින් තොප ගේ
115 ආගමනයද අතරමග තොප විසින් කළ අතිශය වික්‍රමය ද අවුදින් මාගේ රට අතික් තැනෙක ප්‍රවෙශය ද අසා ඉල්පෙන ප්‍රීතියෙන් මාගේ චිත්තය
116 තෙමේ පිරීමට ගියේ ය. මා ඇර තොපට ඇවැස්ස නෑයෝ හෝ කවුරු
117 ද තොපගේ දර්ශනය ඒකාන්තයෙන් මට අභිෂේක මඟුල් නම් වෙයි, මාගේ මයිල් රජ තෙමේ තමා මහලු අවස්ථායෙහි මෙබඳු පුත් රුවනක්
118 හස්ත සාර වස්තුවක් මෙන් නොකොට යම් හෙයකින් කිසි දුර්නයකින් මාගේ හස්තයට පැමිණවී ද මේ තෙමේ මහත් කුසල කර්මයාගේ ඒකාන්ත
119 උද්ගමයෙකි. දූන් අප දෙන්නා නියතින් එක්වූ කල කවර සතුරෙක්
120 නම් යුදපැටිවෙද්ද? ලබන ලද වාතයා ගේ මිත්‍රයා ඇති ගිනිසෙයින් දූන් මාගේ ප්‍රතාපය තෙමේ සර්ව ප්‍රකාරයෙන් ඉතා මහත් වන්නේ ය.
121 ඔවුනොවුන් දුටු කල පියන් සතු රජෙහි කුමරහු වහා පිට වීමට මට
122 බරෙක් නොවේ අතරමග කල් ගෙවීම් නොකොට මාගේ දර්ශනය කටයුතුය" යි කියා සිය දූතයන් යැවීය. උන් අතින් එපවත් අසා විචාරක්ෂම ප්‍රඥා ඇති කුමර තෙමේ "ක්ෂත්‍රියයන්ගේ වනාහි
123 සර්වප්‍රකාරයෙන් අතිශයින් දත නොහැකි මායා ඇත්තාහ. (එහෙයින්
124 මේ) විමසාම යන්නෙමු" යි උපාය දන්නා නිම්ල නම් එක් හටයෙක් ඒ
125 දූතයන් හා යවා රාජන්‍ය තෙමේ රජහුගේ ද ඉන් අතික් මන්ත්‍රින්ගේ ද (අදහස්) වූ පරිද්දෙන් දූන පොළොන්නරු වෙත ගියේ ය.

126 ඉක්බිති ගජබා රජතෙමේ සියසෙන් පිරිවරා පෙරමගට අවුත් කරණ ලද නොයෙක් උපචාර ඇත්තේ ප්‍රීතිවෙග ඇතිව තමා නැගි
127 ඇතු පිටට ඒ කුමරු නංවා ගෙණ නුවර සම්පත් දක්වමින් රජ මැදුරට
128 වන. කුමර තෙමේ ගජබා රජහු දැකීමෙන් හටගත් සන්තෝෂය ප්‍රකාශ
129 කෙරෙමින් කිහිප දිනක් ගෙවා ඇත්තවුන් හා එසේ ම කලකිරුණන්
130 මොනවට දන්නා පිණිස නොයෙක් උපා දන්නා එසේ ම නානාදේශ
131 භාෂායෙහි දක්ෂ වූ ස්වාමි භක්ති පුරස්සර කොට ඇති කිසි (චරපුරුෂ)
132 කෙනෙක් තෝරා ගෙණ උන් අතුරෙනුදු විෂ වෙදකම්හි නිපුණ කිසි ජන කෙනෙක් නයි කෙළ වන්නවුන් සෙයින් හැසිර වී. විධානයෙහි

Non-Commercial Distribution

133 දක්ෂ ඒ කුමාර තෙමේ සාමුද්‍රිකාදි නොයෙක් ලක්ෂණ දන්නා ජනයන් ද
134 වෙණ වයන සැඩොල් බමුණු ආකාර දන්නවුන්ද කෙළේ ය. දෙමළ
135 ආදී නොයෙක් දෙනා අතුරෙන් නෘත්‍ය ගීතයන්හි දක්ෂවූවන් සම්රු ආදී
136 කෙළි දක්වන්නවුන් බඳු කොට හැසිර වී. කදාමුදු වළලු බඩු ඇරගෙණ
හැසිරෙන්ට ස්වකීය ආකාර වර්ජිත කළ කිසිවෙක් සැලසී. කුඩ සැරයටි
ආදී පිරිකර ගෙණ ගන්නා ලද තාපය ලීලා ඇති සැදෑහ ඇත්තවුන්
සෙයින් ව ගමක් ගමක් පාසා චෛත්‍ය වන්‍දනා කරන්නාවුන් සෙයින්
යම් සේ ඇවිද්ද ද එසේ අණ කොට කිසිවෙක් යැවීය. ගම් නියම්ගම්හි
137 වෙදකම් කරමින් හැසිරෙන්ට පිළියම්හි දක්ෂ කිසිවෙක් යෙදි ය. (තවද)
138 ඒ කුමර අක්ෂරවිද ්‍යා ආයුධවිධද්‍යාහි බාලයන් හික්මවනු දන්නවුන් ද,
139 එසේ ම රස ක්‍රියා දන්නවුන් ද එසේ ම භූත විද ්‍යා දන්තවුන් ද, රන්කම්
ආදියෙහි නිපුණ නොයෙක් ශිල්පීන් ද ඒ ඒ කම් කෙරෙමින් හැසිරෙන්ට
අණ කෙළේ ය.

140 තෙමේ ඇතුළු මඩුල්ල ඇසුරු කළ තත්වය දන්නා කැමැත්තේ
තමා වෙත අවුත් එක්ව කථා කිරීම් ව්‍යාජයෙන් ඒ රජහුගේ නීතියෙන්
141 සිදුරු සොයන මිනිසුන් කෙරෙහි අත්‍යර්ථ බාල බවෙන් හටගත් නුනුවණ
දක්වන්නාහු සෙයින් ප්‍රධානාමාත්‍ය සාමන්තභටාදීන් අතුරෙන් ඉතාමත්
142 ඇත්තවුන් ද, දූඩි සේ කිපියන් ද, එසේ ම භය වූවන්ද, ලෝභ ඇත්තවුන්
ද වෙන් කොට දත්තේ ය.

143 ඒ ඒ මිනිසුන් කෙරෙහි සුදුසු උපාය කිරීමෙහි චතුර වූ ඉතිහාසය
පුරාණාදී නොයෙක් පැවැති කථා දන්නා ගන්නා ලද මහණ වෙස් ඇති
144 චරපුරුෂයෝ ඒ ඒ ගෙවල් ඇසුරු කළෝ දූඩි කොට හටගන්නා ලද
විශ්වාස ඇතිව ලබන ලද පස හා පයිරුපාසන ඇත්තෝ අවවාද දායක
තනතුරෙහි සිට ඒ මිනිසුන් බිඳුවා සම්බන්ධයට යම් සේ පමුණුවද්ද
145 එබඳුවූ විධාන ද කෙළේ ය. "රජු නිසැක බවට පැමිණි කල කැමැති
146 පරිද්දෙන් ඇසිර එහි ඇතුළත පැවැති සියල්ල සුවසේ මා විසින් දත
147 හැක්කැ" යි කියා ඒ තෙමේ රුහුණ වසන මෑණියන්ට පත් යවා සිය
148 නැගණි වූ රූපත් භද්‍රවතී නම් කුමරිය ද ඒ කුමරියගේ වස්තු ව්‍යාජයෙන්
149 බොහෝ වස්තු ද ගෙන්වා ඒ වස්තුව තමා අත්පත් කොට ගෙණ ගජබා
රජහට ඒ කුමරිය පාවා දි තමා කෙරෙහි විස්වස් සිත් බවට ඒ රජු
පැමිණවී ය. පසුව රජකුලය ද මද වහනය වන වෙන ඇතකු කරණ
150 කොට ගෙණ නිත්‍ය ක්‍රීඩා ව්‍යාපදේශයෙන් විථී සංචාරය කෙරෙමින්
151 උහු විසින් ලුහු බඳනා ලද්දේ වහා දුර දිවීම ව්‍යාජයෙන් යමෙක් වසග
152 කටයුත්තෝ නම් හේ තෙමේ උන්ගේ ගෙයක් පාසා වැද උන්ට සුදුසු වූ
153 මාහැඟි ආභරණාදී ධනය දෙමින් ඉතා රහස් ආකාරයෙන් උන් සියල්ල

Non-Commercial Distribution

154 සිය වසඟයට පැමිණවී. නිහීනයන් අන්ත කොට ඇති සියල්ලෝ ද,
155 නුවර වැසි භටයෝ ද "මේ තෙමේ මාගේ ම අනුග්‍රහය" යි වෙන් වෙන්ව ම සිතූය. ඉක්බිති උහුගේ වස්තූන්ගේ ද, ධාන්‍ය රාශින්ගේ ද, සේනාවගේ ද, එසේ ම නොයෙක් යුද්ධෝපකරණයන්ගේ ද ප්‍රමාණය කරන්ට නිපුණ වූ ඒ කුමාර තෙම ඒ ලියන්නන්ගේ වර්ගයන්ට අන්තර්ගත
156 කොට තොපි ලියව් යයි සිය ලියන්නන් යොදා නගරාරක්‍ෂණයෙහි
157 නිරත වූවන්ගේ ද එසේ ම සේනානායකයන්ගේ ද චිත්තසංකල්පනා දක්නට කිසිවෙක් එහි නොයවා තෙමේ බාල ක්‍රීඩා ව්‍යාජයෙන් ඒ ඒ තැන හැසිරෙමින් උභයමණ්ඩල වෘත්තාන්තය ව්‍යසන ඉක්ම ගියේ නිශ්චය කෙළේය.

158 මෙසේ පූර්වෝපචිතවූ උසස් කුසලකර්මයෙන් යුක්ත සත්‍වයන් විසින් යොදන ලද සියලු ප්‍රයෝගයෝ කිසි විඝාත කාරණයකට නොපැමිණ මුදුන් පත් බවට එන්නාහයි දැන තියුණු නුවණැති සත්ව තෙමේ පින් කරන්නේ ය.

මෙතෙකින් හුදීජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහවස පරමණ්ඩල ප්‍රවෘත්ති නිර්ණය නම් වූ සැටසවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැට හත් වෙනි පරිච්ඡේදය

නැවත එක් දිනෙක (පැරකුම්බා කුමාර තෙමේ වාහනයකට නැගී
1 අනුව යන සිය පිරිස් ඇතිව රාජ වීථියෙහි යෙයි. දම් බිඳගත් දරුණු වූ
2 මීමදයෙක් දුටු දුටුවන් අනිමින් කොපුල්හි එලන ලද රතැස් ඇත්තේ
3 උහු ඉදිරියට වන. අභිමුඛව හෙන්නා වූ උහු දැක වාහනය ගෙණ
යන්නෝ ද, එක්ව යන මිනිස්සු ද භයින් ආකුලව වහා පැලහ. එකල
4 වීර වූ රජ කුමර " මොවුන් සෙයින් දිවීම මට අනුරූප නොවේ ම ය"
5 යි සැක නැතිව පහ වූ භය ඇත්තේ තෙමේ වහා උහුගේ ඉදිරියට පැන
ගැඹුරු වූ සහ හඬින් වූබසින් ලාහෙලා බිණි ය. ඒ මහිස තෙමේ
6 සිංහනාදය අසමින් ම බියෙන් ආපසු හැරී අභිමුඛ වූ මිනිසුන් අනිමින්
7 හෙලමින් දිවී ය. යමෙක් ඒ අරුමය හමුයෙහි දුටු ද එසේ ම ඇසූ ද ඒ
8 සියල්ලෝ ම විස්මිත වූවාහු ස්තුතියෙන් යුක්ත (මෙබඳු) වදන් (කියන්නෝ)
"තේජස් ඇති බවක් දකු ! මුහුදේ ප්‍රගල්භතායක් බල ! පුණ්‍යෝදයක්
බලව" යි කීහු.

ගජබා රජ තෙමේ ද ජනයන් විසින් කරණු ලබන වික්‍රමාදී ගුණ
9 ඇසුරු කළ උහුගේ කීර්තිය අසා "මේ තෙමේ අනන්‍ය සාධාරණ වූ උග්‍ර
10 තේජසින් හා භීම වික්‍රමයෙන් යුක්ත මහා පුරුෂයෙක්ම ය"යි උහුෙ
11 කෙරහි සැක ඉපද වී. එ කල මහීපාල පුත්‍ර තේමේ ගජබා රජහට උපන්
ඒ දුස්සංකල්පනා දැන මෙසේ සිතී ය. "මම ඉදින් මෙහි ම වෙසෙමින්
12 රජය අත්පත් කරන්නෙම් නම් බැම නගන පමණකින් ඒ සැදෙයි. ඊට
සැක නැත් එසේ කල මාගේ ප්‍රතාපය ද වික්‍රමාතිශය ද බාහු බලය ද
13 ලෝකයෙහි ප්‍රසිද්ධියට නො යයි. යුද්ධ ක්‍රීඩා කෞතුකයෙන් විනා
14 මාගේ අත්‍යන්ත වූ ඔද වැඩි බාහුකඩුති ප්‍රශමයක් නො වන්නේ මැයි
15 එහෙයින් සිය රටට ගොස් රණ කෙළියෙන් ම මිරිකා ඇමතියන් සහිත
16 මේ රජහු ජීවග්‍රහයෙන් ගෙණ පිය වූ කිත් සිරිමේ රජහු මේ නුවරට
17 ගෙණවුත් උහු මත දෙන ලබන අබිසෙව් දියන් පියන් තුන් දෙනාගේ
පරාජය කිළිට ඉදින් මම ශුද්ධ කෙළෙම් නම් මෙසේ කල මාගේ තේජස
දඹදිව්හි ද පැතිරෙන්නේ "යි ඉක්බිති ව නුවර සාධනයෙහි සෙන්
18 වදනා මග ද බැහර යන කරුණු ඇති කල නිකුත් වීමට මග ද, ස්වකීය
චරයන්ට සුදුසු මග ද නානා මාර්ග විභාග දන්නා ඒ කුමාර තෙමේ
19 වැද්දන්ගෙන් සුවිනිශ්චිත කොට ගෙණ තෙමේ ද දඩ කෙළි උපායෙන්
නුවර වෙත වෙනෙහි ඇවිදිමින් නොයෙක් සලකුණු ක්‍රියායෙන්
20 නොයෙක් මාර්ග හා අතු මාර්ග දැනගත්තේ ය. "කාලයාගේ අතික්‍රමයෙහි
21 කාලය තෙමේ එහි රස බොන්නේ යයි" යි යන වෘද්ධ වචනය මෙනෙහි
22 කෙරෙමින් එකල සිට රටට යනු කැමැත්තේ තමා කැටිව ආ මිනිසුන්

Non-Commercial Distribution

දනව්වා නම් තැන රැස් වීමට කරණ ලද අවධි ඇතිව බොහෝ සෙයින්
23 පළමු කොට යැවී ය. මෙතෙක් කල් වැස නො දන්වා නික්ම යාම
24 මාගේ පිරිමි කමට තරම් නොවේ ය යි සිතා පසුව සන්ධ්‍යා කාලයෙහි
25 අබරණින් මොනවට සැරහී ගජබා මිහිපල්හු වෙත එළඹ සිටියේ )
නොයෙක් කෙළි සතුටු ඇති සැන්දෑ කාලය පැමිණි කල මන්දහාස
26 පෙරටු කොට පරිහාසොපායෙන් මේ වදන් (කියන්නේ ) " යුව රජ රට
ගොස් පියහු දැක්ම් කොට මෙහි එන්ට අදම මා විසින් යා යුතුය " යි
27 කීහ. ඒ තෙමේ ද එබස් අසමින් ස්වභාව දූන්මෙහි අසමත් බුද්ධියෙන්
"සිය ගෙට යනු සඳහා මේ කියන ලදූ"යි සිතන්නේ "තොප සිතන ලද
28 අත්ථයාගේ සංසිද්ධිය වහා ම වේව" යි පෙරටු කොට සුබ වදන් කී ය.
29 ඒ රජහු වෙත සිටි බමුණු උතුමෙක් ද එකෙණෙහිම මංගල සන්නිශ්‍ර හිත
30 වූ අත්ථලාභය පිණිස ද, ක්ෂේමය පිණිස ද, විජය පිණිස ද, සතුරු
31 පක්ෂ විනාස පිණිස, ද, බොහෝ උපචිත දක්නට ද සුදුසු වූ වදන්
32 එසේ ම කීය. කුමර තෙමේ ද එබස් අසා යන්නේ "මට හොබනා
33 නැකැත් මේම ය"යි සියගෙට පැමිණියේ ය. පසුව උදාර වූ පුණ්‍ය හා
34 ප්‍රඥා ඇති ඒ රාජන්‍ය තෙමේ නොයෙක් පරිද්දෙන් ශුභ නිමිති දකිමින්
අසමින් ගෙන් නික්මිනි. කෙළියෙන් රාමකල නම් ඇතු අනුව දුවන්නා
සේ වීථියෙන් යමින් රැ නුවරින් නික්මිනි. සඳපහනේ යෙමින් රුක්
35 මුලෙක හුන් විඩා සන්සිඳුවා මිනිසකු දැක ඒ කුමර තෙමේ "පින් වත
36 තෝ කවරෙක් වෙහි ද?" යි පිළිවිස, උහු මගියකු බව දන්නේ වේගයෙන්
උස් හඬින් (මේ) බස කී ය. "කිමෙන් ද තෝ මා දක්නෙහි ද?"
37 හෙතෙමේ ද හයින් තුෂ්ණිම්භූතව සිටියේ ය. පරාක්‍රම බාහු ආදිපාදය
යි මට කියති, තෝ නහමක් බියපත් වේව" යි වහා ඔහු සනසා ආදර
38 ද කොට "එම්බල තා මෙහි දක්නා මට මහත් ලාභයෙක් විය, තෝ
39 දන්ම වහා කඳවුරට ගොස් "පැරකුම්බා කුමර සිය රටට යන්නේ මා
40 විසින් දක්නා ලද්දේ ය යනු කිය "යි කියා වහා (උහු) යැවී ය. "මා
41 පසුව ලුහුබඳනා සේනාවෙන් කිමෙක ඇද්දෝ නැද්දෝ හෝ "යි
ඉඳිවඩමන් වැව පසෙක සිට බලා පසුව එලවන බල සෙනගෙක් නො
42 දක්නා කුමර තෙමේ එයින් කනපද්දා උද නම් තැනට යන්ට නික්මිණ.
43 රළු මහත් නිය ඇති බියකරු කන් සිරිහී යන හඬින් බිහිසුණු වැලහින්නක්
පැටියන් සහිත වූවා මහ වෙනෙහි දී කුමරු හමුවට පැන්නා ය. ඇය
පලඟ අඟින් පෙළා කඩු සිළින් විද දෙකඩ කොට කපා පිට පයින්
(පැහැර) පැටියන් දුර දමා හයින් වල් වන් එක්ව යන්නවුන් කැඳවා
44 ගෙණ බිය පසු කළ කුමර තෙමේ මත්තෙහි ගල්කඩ ඉක්මවමින් අතිශයින්
45 ගොර හඬින් හඬන ඉතා බිහිසුණු ඌරෙකුදු රළ හා ඉදිරියට එන්නහු
එසේ ම මැරුයේ ය. ඉනුන් මත්තෙහි යමින් දෙමළිය ගල නම් තැන්හි
46 දී ඔපතාමික නම් ගම්හි වැස්සන් අලුයම්හි කිසි කටයුත්තකින් කඩු ගත්

Non-Commercial Distribution

47 අතින් යුක්තව යන්නවුන් දැක "(මට) පෙරාතුව මොව්හු මෙහි ආහ"හි යි
48 සිතා ලා හෙලා කඩුවෙන් පලඟ පිටු පැහැර "දුෂ්ටයන් මරන්නෙමැ"යි
රළු තෙපුල් කියමින් ඒ කුමර තෙමේ මුවන් මැදට කෙසරකු සෙයින්
උන් මැදට පැන්නේ ය. දැඩි සේ බිය පත් ඔව්හු හෙලන ලද අවි ඇති
ව මහවලට පැලහ.

49 ඉක්බිති රජ කුමර එහි හාත්පස බලමින් ඒ මිනිසුන් ගෙන්
ප්‍රපාතයෙක් වැටුණු එකෙක් දැක ප්‍රපාතයෙන් ගොඩ නගා ගෙණ "
50 තෙපි කවුරු ද?" යි පිළිවිස. උහුගේකටින් තත් වූ පරිද්දෙන් දන්නා ලද
ස්වරූප ඇති කරුණානුගත එ කුමර තෙම "තෙපි කොයිනුත් බිය හැර
51 සිය අවි ගනිව් ය යි කියා ස්වකීය ගමන් උන් කෙරෙහි ඉඳුරා ප්‍රකාශ
කොට මඟලගමුව සමීපයෙහි එක්ව වැඩුණු භටයන් දැක "කී සලකුණු
52 පරිද්දෙන් ආ වනැ" යි සතුටු විය. මුන් විසින් අනුගමනය කරණ ලද
53 හේ තෙමේ දනව්වා නම් තැනට ගොස් එහි පෙර සිටි පිරිස හා කැටි වී
54 ය. මුව දඩ ආදි නොයෙක්ක්‍රීඩා විනෝදයෙහි තත්පර වූ ඒ හිමි තෙමේ
ඒ මිනිසුන් සමග කිහිප දවසක් එහි විසී ය. එ කල කිත්සිරිමේ රජ
55 තෙමේ තමා පාලනය කරණ මිනිසුන් විසින් පියදූ පතෙකින් පුතු එහි
56 ආ පවත් දැන "කලක් සතුරන් වෙත විසුයේ යම් කිසිත් උපද්‍රවයකට
57 නො පැමිණ සතුරන් අතින් දුකසේ මිදිනැ" යි සතුටු වූයේ ය. "කොල
58 මාගේ සෝක දුරලන පුත්හු මාගේ මරණින් පෙරාතු ව වහා මෙහි
59 ගෙනුත් දක්ව ව"යි පස් මෙහෙකරු වර්‍ගයාගේ ප්‍රධාන යයි සම්මත
60 මිනිසුන් පඬුරු සහිත වූවත් සියතින් ලියූ ලියමන් දී යැවී ය. කුමර
තෙමේ ත් ගියවුන් ද, එවූ පඬුරු ද දැක පියහු දක්නා කැමැතතේ එතනින්
61 විගමට ගියේ ය. එකල ඒ කිත්සිරිමේ රජ තෙමේ පුතු එහි සිටියා අසා
62 "කල් ගෙවීම නො කොට ඒ තෙමේ ගෙණ අය යුත්තේ ය යි කුඨාරාදි
සභා නායකයන් ද පස් පිරිවෙන් මුල් වැසි තෙරිඳුද යැවී ය. ඒ තෙමේ
ඔවුන් ගෙන් තොරතුරු හා පිය රජු පවත් අසා "මනා නැකතෙක
63 නික්මෙන්නෙමි. තොපත් මා සමග යා යුතුය"යා කියා රම්‍ය වූ ගඟුල්
හැලි හෙන්නා වූ තැන් ආදියෙහි නොයෙක් පරිදදෙන් ක්‍රීඩායෙන් එහි
ම වෙසෙමින් කිහිප දවසක් ගෙවී ය.

64 සභාපතියා ආදි ඇමතියන් දක්නට ඒ ඒ අතින් ආ භටයින් දැක
65 කුමරහු අනුව යන්නෝ කුමරු හා එක්ව ගෙණ රජහු කෙරෙහි පෙර
කළ අපරාධ මෙනෙහි කෙරෙමින් බිය හා වෙලෙව් බැවින් වසඟ කරණ
66 ලද්දෝ "නොයෙක් තැනින් මෙහි බොහෝ භටයෝ රැස් වෙති.
67 ඇමැත්තන්ගේ ද මොවුන්ගේ ද සිත්හි අදහස දත නො හැක්ක, රැස් වූ
68 මොව්හු සියල්ලෝ හාත් පසින් වටලා අප මැදි කොට ගෙණ ඒ ඒ තැන

Non-Commercial Distribution

සිටියෝ ය. මෙසේ උනුන් කථා කෙරමින් එ කල විමතියට පැමිණියෝ
මෙ පවත් රජ කුමරහට ද දූත් වූහ.

69 "මේ සියලු අධමයෝ හැම කල්හි වූ පරිදි සව් ප්‍රකාරයෙන් ම
70 නො සලකා නිභීය කාරණයෙහි අතිශයින් භය දක්නා සුල්ලභ.
සබාපතියා දකින්ට මෙහි රැස් වූ ගම් වැසි සෙන් දක්නා වූ මොව්හු මා
71 ඉදිරියෙහි බැගෑ වදන් කියති" යි ඒ කුමර තෙම කිපියේ ඔවුන්ට මෙ බඳු
72 වදන් කීය. එසේ වුවත් ඔවුහු ක්‍රමයෙන් ඒ ඒ අත පැලහ. කුමර තෙමේ
ද එපවත් දන "නොයෙක් තැන මාගේ වික්‍රමය ද එසේම බොහෝ සේ
73 මා විසින් කළ ස්වකීය අනන්‍ථපරිත්‍රාණය ද දක්නාම වූ මේ නීචයන්ගේ
සහ ජාත භය අපගත නොවෙයි. මොවුන්ගේ මෙහි සිටීම හෝ පහව
74 යාම හෝ මට කුමක් කරන්නේ ද? මෙහි සිටි කල කවර නම් ජනයන්
කොයි කලෙකත් කුමක් සිතන්නේ දැ?" යි එහි වෙසෙමින් මද කලක්
ඉක්ම වී ය.

75 රත්නාවලී රාජනී තොමෝ පුතු එහි සිටි බැව් ද රජහු විසින්
යවන ලද ඔවුන් කැටිව (උහු) නා බවද අසා "පුතු නො අවුත් මෙසේ
76 කල් ගෙවීම කරණ ලද රජහු සිත ඉදින් දුකෙක්වී නම් සුදුසු නො
77 වන්නේ ය" යි සිතා "මම් මැ ගොස් සිය පුතු වහාම රජු වෙත ගෙණවුත්
78 දක්වන්නෙමැ" යි වහා රුහුණින් අවුත් සක්නාතලි නම් නුවරට ගොස්
79 සාදරයෙන් රජු දැක සමග සතුටු විය යුතු කථා නොයෙක් පරිද්දෙන්
80 කොට නිමවා මිහිපල්හු වෙත සිටියා තමා ආ පවත් පවසාඕ තොමෝ
81 ඒ නුවරින් විල්ගම ගොස් වැද, පුතුය, නායක තෙරහු ය, සභා නායකය
යන මොවුන් සාදරයෙන් දැක කටයුතු දැ මොවුන් හා මොනවට
82 මන්ත්‍රණය කොට "සර්වෝපාකාරයෙන් බැහැර ප්‍රපචකරණය අයුතුය"
යි ඒ කුමරහු ගෙණ බදලත්ථලියට අවුත් එහි වසන දෙව් සෙනවියා
සමග සක්නාකල් නුවර ගොස් පිය රජහු දැක් වී.

83 පසුව කිත්සිරිමේ රජ තෙමේ පුතු දැක හටගත් ප්‍රේම ඇත්තේ එ
84 කල්හි ප්‍රධාන ඇමතියන් ඉදිරියෙහි මෙසේ කීයේ යි. "ඔබලාත් මා
මෙහි කවුරු සේවා කෙරෙද්ද? අන්තිම කෘත්‍යය හෝ කරද්ද ?"යි යන
"මා සිත තුබූ ශෙම්ක උල අද උදුරණ ලද්දේ ය. දූන් තෙපි මටම
85 ලාභයයි නො සිතව්, මේ තෙමේ තොප සියල්ලගේත් පුණ්‍යොදය
86 නොවේ ද? මෙ තැන් පටන් තෙපි සියල්ලෝම කුමරු අනුව පවතිව්
ය"යි කියා ඒ සිය පුතු උන්ට පාවා දින.

Non-Commercial Distribution

87 ඇමතියන් ඒ කුමරහු අණෙහි සාදරයෙන් වැටෙන කල ඒ
කිත්සිරිමේ නම් රජ කලුරිය කෙළේ ය. දන්නා ලද ශාස්ත්‍රාගම ඇති
88 ධීර වූ ඒ කුමර තෙමේ එ කල්හි පියහු මරණින් හටගත් ශෝක වේග
වසයට නොපැමිණ, මහ ඇමති ආදි රට වැස්සන් අස්වසා පියහුගේ
89 අග්නි කෘත්‍යයන් සානුරූප කොට නිමවා ඒ ඒ දනව්වෙහි ද එරට
සීමායෙහි ද තමා විසින් වඩන ලද දැඩි බක්ති ඇති ඇමතියන් යොදා
90 පසු ව ක්ෂත්‍රිය ධර්මයෙහි පණ්ඩිත වූයේ හොබනා නැකතෙක මහාදිපාද
91 පදවි පට බැඳීම් මහෝත්සවයෙහි ලංකාලංකාරභූත වූයේ සව් බරණිනින්
92 සැදියේ ප්‍රබල වූයේ දක්ෂයන්ට අග්‍ර ව ඇතු නැඟී නොයෙක්
අලංකාරයෙන් නොයෙක් පරිද්දෙන් සරහන ලද්දා වූ බළ සමූහයෙන්
93 සංකීර්ණ වූ නුවර සුරිඳු සුරපුර සෙයින් ප්‍රදක්ෂිණා කෙළේ ය. එ කල
94 මහණ බමුණු ආදීන් ගේ දිළිඳු බැව් නැමති තැව්ලි පරම්පරාව මහත් වූ
95 ධන වර්ෂාවෙන් ශාන්තිය පැමිණවී. ඒ තෙම පසු ව ගජබා රජුටත්,
96 මාණාභරණ රජුටත් එ පවත් කියන්ට සිය දූතයන් යැවී ය.

ප්‍රවර ගුණයෙන් අනේක සාමාන්තයන් සිත් ගත් මොනවට කම්පිත කළ සතුරන් ඇති පැමිණෙන ලද තියුණු තෙද ඇති ඒ (මහාදිපාද) තෙමේ සකල භුවන කුහර ව්‍යාප්ත සත්කීර්ති වස්තු කොට ඇත්තේ සොඳුරු වූ නොයෙක් පැවතුම් ඇති ව ඒ නුවර විසුයේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස මහාදිපාද මහෝත්සව නම් සැට සත්වන අදියර නිමි.

Non-Commercial Distribution

# හැට අට වෙනි පරිච්ඡේදය

1 අතිශයින් උදාර වූ අදහස් ඇති අන් දනව් මොනවට දත්තා වූ ඒ
2 පැරකුම්බා කුමර තෙමේ රජයෙහි නියුතු ඇමති ජනයා හා සමග එහි
3 මන්ත්‍රණයට පැමිණ " මාගේ රජ බැව්හි ඵල නම් සියලු සතුරන් නසා
4 ලෝක සාසනාභිවෘද්ධි සිද්ධි සම්පත්තිය වේ. ඉතා කුඩා වූ ද මේ
5 රාජ්‍යය මාගේ ප්‍රඥා විශේෂයෙන් ම සමෘද්ධියට පමුණු වන ලද්දේ
අත්‍යන්තීයෙන් නොයෙක් සමෘද්ධියෙන් යම් සේ අන්‍ය රාජයන්ගේ
මහිමය ඉක්ම පවතී ද එසේ වහා සපයන්නෙමි"යි ඒ ස්වාමි තෙම සිතා
6 තමා සමග වැඩුනා වූ සියලු ඇමතියන්ට සුදුසු පරිද්දෙන් තනතුරු දී
7 ඉසුරෙන් සංග්‍රහ කොට සමන්කුළු සෙල පටන් සයුරු පටනු දක්වා
රාජ්‍ය සීමායෙහි නොයෙක් තන්හි සිය සෙන් පිහිටුවා "හැමට පළමු
කොට බෙහෙවින් ධාන්‍ය රැස් කිරිම කටයුත්තේ ය" යි මෙසේ ද සිතා
ඇමතියන්ට මෙසේ කී යේ ය.

8 "බෙහෙවින් මා අයත් රජයෙහි අහස් දියෙන් නිපදන නොයෙක්
9 ගොයම් බිම් හැර නුසුන් දිය මුත් නදින් හා එසේම මහ වැව් නියා
පැවති කෙත් ස්වල්ප ය, බොහෝ වූ පර්වතයෙන් ද, ඝන වූ වන
10 ලැහැබින් ද මහ මඩින් ද , රාජ්‍ය ඇති සෙයින් සම්බාධයි. මෙබඳු
11 දේශයෙහි වැස්සෙන් හටගත් ජලය මදකුත් ලෝකොපකාරයෙන් වෙන්
12 ව කිසි කලෙකත් මුහුදට නො යේවා. මැණික් රන් ආදී වස්තූන් හට
13 ගන්නා ආකර බිම් හැර සෙසු තන්හි කෙත් මොනවට පැවැත්ම කටයුතු
14 ය. ලෝ වැඩ නො කොට සිය අතට පැමිණියක් අනුභව කොට විසීම
15 මා වැන්නන්ට සර්ව ප්‍රකාරයෙන්ම යුතු නොවේ. තෙපි සියල්ලෝ වනාහි
දුෂ්කර වූ ද පැමිණි කටයුත්තෙහි නොපසුබට වීර්‍ය්‍ය ඇති ව එහි දුෂ්කර
භාවය නො සිතා නිරවශේෂ වශයෙන් මාගේ සංවිධානය නො වරදනා
කර්මාන්තය අනුසස්නා පරිද්දෙන් සපයව්" යි (කීයේ ය.)

16 දුදුරු නම් හොය බොහෝ කලක් පටන් කොටු බදය යි ප්‍රකට වූ
නම පමණක් ඉතිරි ව නටුවා වූ පෙර කල රජුන් විසින් බඳිනට ඉතා
දුෂ්කර වූ බවට පැමිණියා වූ මහහෙය බඳින්ට මහත් යසස් ඇත්තා වූ
හේ තෙමේ නියෝග කෙළේ ය. ඉක්බිත්තෙන් ඒ සියලු ඇමතියෝ
17 සර්වප්‍රකාරයෙන්දුෂ්කර බව ද කළ නමුත් නො තහවුරු බව ද නොයෙක්
18 පරිද්දෙන් ප්‍රකාශ කළෝ ය.

19 පරාක්‍රමබාහු රජ තෙමේ ඒ බස් පසු බස්වා (කියන්නේ) "ලෙව්හි
උත්සාහයවත් වූ දනන් විසින් කුමක් සිදු කළ නොහැක්කේ ද? රාම

Non-Commercial Distribution

20 තෙමේ සයුරෙහි ද වඳුරු සමූහයන් ලවා මහ හෙයක් බැන්ද වී ය. මේ
21 කථා තොමෝ අද දක්වාත් ලෝකයෙහි පවත්නේ ය. ඉදින් මාගේ
22 තෙද වෙසෙස ලක්දිව එකසතින් ලකුණු කොට ලෙව් සසුන් වඩනට
හේතු වන්නේ නම් ආරම්භ මාත්‍රයකින් ම නිමවීම පෙණෙන්නේ ය"
23 කියා මහෝත්සාහී රජ තෙමේ ඔවුන්ගේ උත්සාහය මනා කොට වැඩවී
ය.

24 හෙය මුව දොර පටන් රත් කරව්ව නම් රට දක්වා හෙය බැම්මෙහි
පළමු කොට මහ නුවණැති ස්වාමී තෙමේ නොයෙක් පුරුෂ ප්‍රමාණ
25 ගැඹුරු වූ අතිශයින් පතළා වූ තහවුරු වූ මහ මොව් ඇලක් පැවැත් වී,
26 රට වැසි වූ ගල් වඩු සමූහය ද, ලොහොකරුවන් ද, බොහෝ වූ
කඹුරන් ද, රන් කරුවන් ද රැස් කරවා ඔවුන් ගල් කොටන කම්හි යුක්ත
27 කොට ඔවුන් ලවා දුන ගත නො හැකි ශෛලසන්ධි ඇත්තා වූ අතිශයින්
28 තිර වූ ඒක ඝන වූ ගල් තලක් සම වූ මනා කොට නිම වන ලද සුණුවම්
29 ඇත්තා වූ හෙය මහා යසස් ඇති රජ තෙමේ බැඳ වීය. සැදැහැත්තේ ඒ
30 හෙය මතුයෙහි බෝතුරක් ද, පිළිම ගෙයක් ද, එසේම දහගැබක් ද
31 පිහිට වී. සියලු ජලප්‍රවාහය තෙමේ ඒ මොව් ඇලින් යම් සේ මුහුදට
වදී ද පණ්ඩිත තෙමේ එ සේ කෙළේ ය. ඒ ඇල දෙපස මහ වනය
කප්පවා වී ගැල් නොයක් දහස් ගණන් වැපිරෙන කෙත් කරවා නො
32 කඩ වූ වියෙන් පිරුණු කොටු වලින් ගැවසුණු බැවින් කොටුබඳය යනු
අන්වර්ථානුරූප වූ ව්‍යවහාරයට පැමිණ වූයේ ය.

33 ඉක්බිති සක්වඩමන, කිඹුල්වාණයයන මේ ගංගාවල සම්භේද
34 ස්ථානයෙහි රජ තෙමේ යට කියන ලද පරිද්දෙන් උෟරු දොළ නම් වූ
තැන බඳවා එහි ද මොව් ඇලක් පවත්වා ඒ උෟරු දොළ මොව් ඇලින්
35 ජලය මාගල් වැව හෙලා එහි ද සුන් බුන් තැන් ඉතිරි නො කොට
බඳවා දිය බැහැර යන මාර්ගයන්ගේ බැස යන ජලය පෙරටු කොට පූර්
36 ප්‍රමාණයෙන් වැඩි වූ දිය බැස වැටීම ද කරවා එතැන් පටන් උෟරු
37 දොල දක්වා කෙත් කරවා එහි ද වී රැස් කෙළේ ය. හේ තෙමේ දදුරු
ඔය මැර දොරාදත්තික නම් තැන දිය බස්නාවක් ද මහ ඇලක් ද කරවා
38 එතැන් පටන් උෟරු දොළ දක්වා ද කෙත් කරවා එසේ එහි ද ධාන්‍ය
රාශිය රැස් කෙළේ ය.

39 පෙර ඉතා කුඩා වු පඬු වැව වඩන ලද උස් බැව් හා අයම් විතර
40 ති තහවුරු මියර ඇති කොට සොරොව්වක් සහිත ඉතා උස් වූ මහ දිය
(කඳ) වදනා මගක් ද කරවා පැරකුම් මුහුද යන ව්‍යවහාරය ද තැබී, ඒ
41 මැදි වූ දූවෙහි ගල මුදුනෙහි කෙලෙස් කුළු සිරි උසුලන සෑයක් ද කරවී.

Non-Commercial Distribution

42 එ මැද ඉතා සොඳුරු ලෝ වැස්සන්ගේ සතුටු සමූහයට මැදුරක් වැනි වූ
43 තුන් මහල් රජ මැදුරක් කරවී.

44 මාගල වැව, සිටු වැව, සතුන්ගතු වැව, තඹ වැව, එසේ ම අඹ
45 වැව, වසා වැව, ගිරිබා වැව, පටාල වැව, මණ්ඩික්කුලම, මොනර වැව,
46 සාදියගම් වැව, කිණිහිරිගල් වැව, බුද්ගමු දොළ, හූරුගමු වැව, මහකිරලා
47 වැව, ගිරියා වැව, රක්නා වැව. අඹාල වැව, කටනුනරු වැව, ජල්ලිබා
වැව, උතුරාල වැව, එසේම සියඹලා ගම් වැව, දවලවිටිගම්වැව, කිරා
වැව, නළන්නරු වැව, කරවිටවිලත් වැව, එසේ ම දිඹුල්ගම් වැව,
48 මූනරු වැව, කසාල් වැල, එසේ ම කලලහල් වැව, මුල්වාරිකවැව,
49 එසේ ම ගිරිසගමු නම් වැව, පොලොන්නරු වැව, එසේ ම විසිරිතල
50 වැව යන මෙ කීවා වූ ද අතිකුඩු නටුවා වූ ද බොහෝ හෙප් දොළ හා
51 වැව් දයාබර සිත් අත්තා වූ හේ තෙමේ සිය රජයෙහි බැඳවී. පස්
52 යොදුන් මහමඩ හා කුඩා විල් කප්පවා එයින් ජලය ගංගා වල හෙළා
53 කෙත් පැවැත්වී ය. වී රැස ද සම්හරණය කෙළේ ය. එහි වන බිම් හා
අතිකුඩු ඉතා බොහෝ තන්හි සෑම වන බිම් වෙන් කොට ගම්
54 ප්‍රධානයන්ගෙණ කෙත් කිරීමහි රට වැස්සන් යොදා රජයෙහි පෙර
උපදනා අයෙන් වැඩි වූ අය යම් සේ අලුත් කෙතින්ම රැස් කරණු
55 ලැබේ ද එසේ කරවා ඒ රට වැස්සෝ දුර්භික්ෂ භව යම් සේ කිසි
56 කලෙකත් නො හඳුනද්ද නුවණැත්තා වූ රජ තෙමේ එසේ කෙළෙ යි.
නීති දත් (ඒ රජ තෙමේ) "මාගේ රජයෙහි යම් කිසි තැනෙක්හි පැමිණි
57 උපකාර රහිත වූ කුඩා ගෙපල් පමණ බිමකුත් නොතිබේව" යි කීය.
58 එල පිණිස ප්‍රසිද්ධ වූ ද, එසේ ම මල් පිණිස ප්‍රසිද්ධ වූ ද නොයෙක්
වැල් රුක් වෙසෙසින් ගනව ගැවසුනා වූ බොහෝ වූ නොයෙක්
අනුභවයට උදාර වූ නානා විධ උයනින් සොඳුරු වූ සිත් අලවන්නා වූ
ආරාමයන් ඒ ඒ තන්හි හේ තෙමේ පිහිට වූයේ ය.

මෙසේ සමෘද්ධියට ගියා වූ කුඩා වූ ද ස්වකීය රාජ්‍යය ස්වකීයවූ
59 ප්‍රඥා විශේෂයෙන් අන්‍ය වූ මහත් රාජ්‍යයක් නමුත් යම් සේ ඉක්මවා
පවතී ද විධානයෙහි දක්ෂ වූ රජ තෙමේ එ පරිද්දෙන් කෙළේ ය.

Non-Commercial Distribution

# හැට නව වෙනි පරිච්ඡේදය

1 එ කල්හි පැරකුම්බා රජතෙමෙ මෙ සේ සිය රජය නිරවුල් කොට
2 තබා කටයුතු මෙ සේ සිතී. "යහපත් නීතියට ප්‍රතිපක්ෂ වූ මනා නුවණ
3 නැත්තා වූ පෙර රජහු බොහෝ කලක් කැමැති සේ ලෝ සසුන් නැසූහ.
4 භික්ෂූහු බුද්ධ ශාසනය අධර්ම අවිනය කොට පිළිවෙත් වරදවමින් රිසි
සේ විසූ හ. මෙ කල්හි මම වහාම ලංකාව එක්සත් කොට සස්න ද
5 ලොව ද සෘජු කොට තබන්නෙම් නම් යෙහෙකි." මෙ සේ සිතා
6 සාමන්තයන් හා මාණ්ඩලීකයන්ට සේනාව ද යුධ පිණිස උපකරණ ද
සපයනු පිණිස උපදෙස් දෙමින් ක්ෂත්‍රිය තෙමේ පළමු කොට රත්කුරවක
7 නම් රට දෙමළ සෙනඟට අධිපති වූ මලය රට නැමැත්තා කැඳවා
නොයෙක් බල ද හසුන් ද ඔවුන්ට සන්නාහයන් හා අවි ද සපයා එහි
8 වසන පිණිස යැවී. තඹ රට ද, ගිරිබා පට ද මොනර වැව ද, මීපල් නම්
9 රට ද, බුත් ගමු නම් රට ද අළ වන නම් රට ද, බෝගම්බර නම් රට ද
10 කටුපේකට නම් රට ද පසල් දනව් රක්නා ඇමතියන් වෙන් වෙන්
11 වසයෙන් කැඳවා නොයෙක් දහස් ගණන් යෝධයන් හා කොටු ද, සන්
නාහයන් ද, කඩු තෝමර හෙල්ල ආදී නොයෙක් අවි ද සපයා ඒ ඒ
12 තන්හිම වසන පිණිස යැවී.

13 ඉක්බිත්තෙන් ලක්මහලැන නම් වූ ද, සිළුනා නම් වූද, එසේ ම
ජයමහලැන නම් වූ ද, සිටුනා නම් වූ ද මහින්ද නම් වූ ද ලම්බකරණී
14 ක්ෂත්‍රිය වංශයෙන් පැවත ආ මේ පස් දෙන එකල්හි මහ යසසින්
යුක්තව මෝරිය රට වෙසෙති. ඔවුන් ලවා භටයන් දහස් ගණන් වෙන්
වෙන් වසයෙන් කරවා යුද උපකරණ ද කරවන්ට නියෝග කෙළේ යි.
15 රජ තෙමේ තමන් අබතුරෙහි ද මණ්ඩලිසුරුවරයන් දොළසක් කොට
16 එක එක නමකට යුදෙයහි සූරයන් දෙ දහස දෙ දහස දුන්නේ ය. ජය
17 ගන්නා සුලු වූ අසූ සතර දෙනෙක් සාමන්තයන් කොට ඔවුන්ට වෙන්
වසයෙන් දෙසීය බැගින් සේනාව දින. මහත් සිරුරු හා මහ බලැතියන්
18 නොයෙක් දහස් ගණන් මුගුරු ගන්නා යෝධයන් කොට යුද්ධෝපකරණ
19 ද දින. අන්‍ය දේශවාසී වූ කේරළාදි කෘතහස්ත යෝධයන් සම්බන්ධි වූ
20 බොහෝ දහස් ගණන් ද සෑදී.

චන්ද්‍රාලෝක ධනුර්ධරයන් එක් දහසක් ඊ යුවායෙහි සපත් කරවා
21 ද සම්සැට්ට ආදිය දින. නොයක් දහස් ගණන් වැද්දන් කම් දක්ෂයන්
22 කරවා ඔවුන්ට සුදුසු වූ රිසි කළුරෙදි ආදිය දින. එකල්හි ඒ රජ තෙමේ
නොයෙක් කම්කරුවන්ගෙන් එක එක දහස ස්වකීය ස්වකීය කම් කරණට
23 යෙදී. "ඇත් අස් කඩු ශිල්පයන්හි ද අන්‍ය දේශ භාෂායෙහි ද නැටීම්

Non-Commercial Distribution

24 ගීයෙහි ද දක්ෂව රාජ කාර්‍යයෙහි නුවණැතිව වැඩෙත්ව"යි නොයෙක්
කුලවතුන්ගේ පුත් සොහොවුරු මුනුබුරන් එ කල අධිපති තෙමේ සිය
25 මැදුරෙහි වැඩුයේ ය. සිරි ගන්නා වූ ද, කපුරු වඩන්නා වූ ද කුඩා
26 සේවකයෝ එ සේම සිංහල ගාන්ධර්වයන් ලඟ හැසිරෙන්නෝ ය යන
මේ ආදී ප්‍රභේද වර්‍ගයන්ට අයත් වෙන් වෙන් වූ දහස් ගණන් මිනිසුන්
27 හේ තෙමේ රජ ගෙයිම වැඩී. තරුණ වූ සැට්ටලන්නෝ ය. නාපිතය
යනාදින්ට අවි දී ස්වකීය ස්වකීය දෙටුවන් සෙවනට අනු දත්තේ ය.
28 පිය රජහුගේ භාණ්ඩාගාරාධිකාරීන්ගෙන් ධන ප්‍රමාණ දැන "මා විසින්
29 මෙ පමණ ධනයෙන් ලංකා තොමෝ එක්සත් කරන්ට නො හැක්කී ය"
යි නිශ්චය කොට ජන සමූහයා නො පෙළ මෙ සේ ධනය රැස් කෙළේ
යි. මිහිපල් තෙමේ වස්තුව ද, සේනාව ද වෙන් වශයෙන් දෙ කොටස්
30 කොට මුල් වූ ඇමති දෙනො කෙරෙහි තැබී ය. රජ තෙමේ තමන් ජය
31 ගත් සියලු රට ද එසේම සම සේ බෙදා පිළිවෙළින් පැවත ආ සමූහාධිපති
32 ඇමති දෙදෙනෙක් කෙරෙහි තැබී, මුහුදු තෙර රටින් ද, රුවන් ආකර
රටින් ද, මහ මලය රටින් ද, ඉන් අවශේෂ රටින් දැ යි ඒ මිහිපල්
33 තෙමේ සියල් සාර තැන් වෙන් කොට අන්තරංග ධූරය යි නම් කොට
ඇමතියෙක් කෙරෙහි (අධිපති බැව්) තැබී. හේ තෙමේ බොහෝ රුවන්
34 නැව් වලින් යවා වෙළදාම් කරවා ධනරාශිය ද වැඩී. මුල් ඇමතියන්
දෙදෙනා කෙරෙහි යුද උපකරණ ද නොයෙක් දහස් යෝධ භටයන් ද
ඇති කරවී.

35 අන්තරංග නම් ප්‍රධාන ස්ථානයෙහි ද විජිත දෙකට අයත් වූ
36 ප්‍රධාන ස්ථාන දෙක් හි ද යන (ධූරත්‍රයෙහි) ඇමතියන් තුන් දෙනා
37 කෙරෙහි ඉතා බොහෝ වූ යෝ බලන් ඇති කරවී. භටයන්ගේ සූරු
38 බැව් පිණිස වීරී යුධ කරවා ඉතා සූරයන් වෙන්කොට උතුම් සත්කාර
කෙළේ යි. දයාවෙහි ඇලුණේ යුද කරන්ට නො පොහොසතුනව් "
ඔව්හු ගොවිකම් ආදිය කොට සුවසේ ජීවත් වෙත්ව"යි හළේ යි.

මෙසේ විදි දත් තැනැත්තේ සන්නාහ සහ ආයුධයන් ද සූර වූ
භටයන් ද සපයා ජන සමූහයා නො පෙළ සුවසේ නානා විධ ධන
සමූහය ද රැස් කෙළේ යි.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
බලදනසඟහ නම් වූ එකුන් සැත්තෑ වන අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් (පැරකුම්බා) රජ තෙමේ තමන්ගේ මහත් සේනාව
2 ද ධන ධාන්‍යාදි සම්පත්තිය ද, සියලු යුද්ධෝපකරණ ද බලා සිංහලද්වීපය
3 තබා දඹදිව උවත් ගන්ට දුෂ්කර නො වෙයි සිතා රාජ්‍ය සාධනයට
4 පටන් ගත්තේයි. නොයෙක් පර්වත දුර්ග ඇති බැවින් ද, චණ්ඩ සත්ව
භයින් ද දුකසේ බැස්ස යුතු වූ අන්‍යමනුෂ්‍යයන්ගේ සංචාර රහිත වූ
එක පදික මාර්ගයෙන් යායුතු වූ අතිශයින් බියකරු වූ මිනිසුන් භක්ෂණය
5 කරන්නා වූ කිඹුලුන් ඇති ගැඹුරු ජලයෙන් ගැවසුනාවූ මහා මලය රට
6 යටිකඩ දුම්බර ගජබා නිරිඳුගේ රක්ඛ නම් දණ්ඩනායක ඇමතියා
උපලාලනයෙන් කැඳවා උතුම් සංග්‍රහ කොට මලය දේශය ගෙන දෙන්ට
උහුට නියෝග කෙළේ යි.

7 එකල්හි ඒ දේස වාසීහු එපවත් අසා "දණ්ඩනාථයා ආ කල්හි
උහු මරන්නෙමුය" යි මන්ත්‍රණය කළෝය. දණ්ඩනාථ තෙමේ ම ඒ
8 අසා වහා අවුත් යුද කොට ඒ සතුරන් පනවා දුම්බර රට ගත්තේ ය.
9 ඉක්බිත්තෙන් හේ තෙමේ යටි කඩෙහි යුද පවත්වා සතුරන් පලවා එහි
10 සාමන්තයාගේ හිස ගත්තේ ය. තල්කෙත නම් ගමෙහි දෙවරක් යුද
කොට නාපාණ නම් ගමෙහි ද එසේම යුද දෙකක් කෙළේයි. රන්දෙනි
11 නම් ගමෙහි ද, රඹුක්වැල්ල නම් ගමෙහි ද, දෙමටපාතෙලෙහි ද එක
12 එක යුද කොට ඒ ඒ තැන නිවාසි වූ සියලු සතුරන් නසා, මහා බල
13 ඇත්තේ යටිකඩ නම් රට ගත්තේ ය. එහි සේනාව සමග බාල
14 සොහොවුරා සිටුවා කටයුතු පිළිවිස්නා පිණිස හේ තෙමේ රජු කරා
ගියේයි. එ කල්හි ඒ සහෝදරයා ප්‍රධාන කොට ඇත්තා වූ යෝධ
15 භටයෝ නික්ම සතුරන් හා යුද කොට නිල්ගල නම් රට ගත්හු. දණ්ඩනාථ
16 තෙමේ නැවත අවුත් සයකෙත් නම් තැන ද, රත්බෙඳුම් නම් තැන ද,
එසේම දුනුවිල ද එක එක බැගින් යුද කොට සතුරන් මරා ගන්නා ලද
ඒ නිල්ගල නම් රට අතිශයින් තහවුරු කෙළේ යි.

17 ඉක්බිත්තෙන් හේ තෙමේ බලවත් වූ ඔත්තුරාමල්ලකයා සමග ද,
18 දුනුවඩුලුනාවන් සමග ද දෙවරක් යුද කොට හිණි කෙත් නම් රට
ගෙණ පහ වූ සතුරු බිය කොට ඔත්තුරා මල්ලකාදීන් තමා වසඟ
19 කෙළේ යි. එ කල්හි රජ තෙමේ රක්ඛ නම් දණ්ඩනායකයන් කැඳවා
20 කේසධාතු නම් පදවිය ද මහ සම්පත් ද දී රජ රට ගන්නට මැදවගට
21 යැවී. හේ තෙමේ ද නිල්ගිරට ගොස් සේනා සන්නද්ධ කොට එ
තැනින් මහ සෙනග ඇත්තේ වැවල නම් පියසෙහි ද එසේම මැදවග ද
22 යුද කොට ජය ලැබී ය. ගජබා නම් රජ එ පවත් අසා උහු හා යුද

Non-Commercial Distribution

23 කරණට මහසෙන් යැවී ය. කේසධාතු නම් ඇමති තෙමේ ඒ දූන
24 ශක්තිමත් වූ සේනා වාහන ඇත්තේ ඒ සතුරු සෙන් බිඳ මැදවග (නම්
රට) ගත්තේ ය.

25 ලොකජිත්වාණ නමැත්තේ ද, රක්ඛ ලංකාධිනායක නම් ඇමති
තෙමේද සේනා සන්නද්ධ කොට ගෙන සිංහ වික්‍රම ඇත්තා වූ ඔව්හු
26 ගොස් භුකිත්ති ලංකාධිනායක නම් තැනැත්තා සමග යුද කොට උහු
නසා රෙරුපල්ලි නම් රට ස්වකීය හස්ත ප්‍රාප්ත කළෝ ය. හස්ත
28 ප්‍රාප්ත කළෝ යි. රජ තෙමේ කෝසකවගෙහි සමත් මල නැමැත්තා
ප්‍රිය වචනයෙන් තමන් යටත් කොට මහ ඉසුරු දි එකල්හි යුද උවරණ
29 ද මහත් වූ සේනාව ද යවා කොස්වග ගන්නට යෙදී. සමණමල්ලක
30 නම් තැනැත්තේ ද ඔත්තුරා මල්ලක ආදීහු ද සතුරු සේනාව හා යුද
කොට යුදෙහි බොහෝ දෙන නැසූහ. හිස්සුන්බෝ නම් ස්ථානයෙහි
මහ යුදකොට බලැත්තෝ ඒ කොස්වග නම් ස්ථානය ගත්හ. මෙසේ ඒ
31 රටවැස්සන්ගෙන් අවුල් සහිත වූ ඒ මලයරට මොනවට නිරවුල් කොට
32 සිය පුරයෙහි වසන්නා වූ ඒ රජ තෙමේ උයන්කෙළි දියකෙළියෙන් ද,
නෘත්‍යගීතාදියෙන් ද දවස් යවමින් රාජ ධර්මය අනුව පවත්නේ, විරුද්ධ
33 නරේන්ද්‍රයන් වළකනු පිණිසද, උත්සාහ පිණිසද, සොරුන් වළකනු
පිණිසද එ කල්හි මුවදඩ යන්නේ ය.

34 ඉක්බිත්තෙන් රජ තෙමේ එක් දිනෙක ඇමති පිරිවර ජනයා
සහිතව මෙහෙසිය සමග මුව දඩ පිණිස යන්නේ ය. මුවන් පිවිසි
ලකුණු ඇත්තා වූ එක් මහවනයක් දූක ඒ ශ්‍රේෂ්ඨ තෙමේ මෙහෙසිය
35 එක් අවකාස ස්ථානයෙක්හි හිඳුවා, තෙජ ගත් අත් ඇති වැද්දන් ලවා ද
36 මුව දැලින් ද ඒ වනය අවුරුවා ඒ තන්හි ඝෝෂා කරවි. එහි ඇත්
37 පොව්වෙක් පමණ වූ ගෝණෙක් තෙමේ ඒ භයානක ඝෝෂාව අසා
38 වන ලැහැබින් පිටත්ව බියෙන් තැති ගත්තේ ඔබ මොබ බලමින් දුවන්නේ
පර්වත දුර්ගයෙන් වැටෙමින් ගිරිකඳුරැලි පනිමින් වෘක්ෂ ශාඛා බිඳිමින්
39 දූල්වැල් අදිමින් වන ලැහැබ් සුණුකරමින් එලු දූල පලා ගෙණ හමු හමු
40 වූ දනන් බිය ගන්වා පන්නමින් වාතයට බඳු යුහුගමන් වේග ඇත්තේ
41 මෙහෙසිය අභි මුඛයට දිවීය. දුවන්නාවූ උහු දූක සියලු ජනයෝ බියෙන්
42 මිරිකුණෝ මෙහෙසිය හා මිහිපල්හු හැර ඒ ඒ අත පලා ගියෝ ය.
43 භයානක වූ ගොකණ්ණ මෘගයා (දූක) උහු ඉදිරියට දිව තෙබ දමා හැන්නේ
44 ය. පහර ලත් උහු විසින් අන්නට හිස නැමූ කල්හි අංදෙක ගිළිහී රජහු
පාමුල හිණ. ලද පහර හේතුවින් හඬනා මෘගයාගේ හඬ අසා නැවතී
45 ඒ ඒ දෙසින් රැස්ව ඇමතියෝ ද වැද්දෝ ද සැට්ට ලන ඇමතියන් හා
46 කරනවෑමි ආදිහු ද අං දෙක හා සිංහ වික්‍රම ඇත්තා වූ රජහු දූක හට

Non-Commercial Distribution

ගත්තා වූ සම්භ්‍රම ඇතිව වෙසෙසින් තුටු පහටු වූවෝ ඒ වනය ස්තුති
ඝෝෂාවෙන් එක කොලාහල කළෝය. රජහුගේ වික්‍රම විශේෂය ද, මහ
පිණැති බව ද, සූර බැව් හා වීර බව ද එකල්හි බෙහෙවින් වර්‍ණනා
47 කොට ඔව්හු අං යුවළ ගෙණ රජහු පිරිවරා දෙව් නුවරක් සේ සාදන
48 ලද්දා වූ පුරයට ගොස් විස්මය එලවන්නා වු ඒ ප්‍රවෘත්තිය මහා මාත්‍යන්ට
49 දන්වා ඒ අං යුවළ සියල්ලන්ට දක්වූ හ. රැස්වූ මහ ඇමතියෝ ඒ
50 අද්භූතය අසා විස්මපත් සිත් ඇත්තෝ ආශාවයර්‍ථ දන්වූහ. "අහෝ,
මහානුභාව ඇත්තා වූ මේ තෙමේ ඉදින් ජම්බුදීපයෙහි උපන්නේ නම්
51 ඒ කාන්තයෙන් ම සක්විති රජ වන්නේ ය" නොඉක්ම විය හැකි විකුම්
52 ඇති ඒ ධීරයා" මේ ආදී ස්තුති යුක්ත වචනයෙන් නැවත නැවත වර්‍ණණා
කොට ඉක්බිති ඒ අංයුවළ අකුරු ලියවා භාණ්ඩාගාරයෙහි තැබ්බ වූහ.
53 එය අද දක්වා පවතී.

54 එකල්හි "ගජබා මිහිපල් තෙමේ දේශාන්තරයෙන් මිසදිටු ගත්
55 රජ කුමරුවන් ගෙන්වා රජ රට සතුරන් සහිත කෙළේ ය" යි රජ
56 තෙමේ ආසා "මා වැනි පැණ පින් ඉදු විකුම් වෙසෙස් ඇත්තකු විද්‍යාමාන
කල්හි මෙසේ කෙළේ නොවේ ද?" යි අතිශයින් කලකිරුණු සිත් ඇත්තේ
57 රජ රටත් ගන්නා පිනිස දණ්ඩනායකයන් යෙදී. යුද පිණිස උපදෙස්
58 දෙන්නාවූ කොටල්ලශාස්ත්‍ර යුද්ධාර්‍ණවාදිය මනා කොට බලා ස්වකීය
බුද්ධියෙන් ද කල්පනා කොට දේශකාලානුරූප පරිද්දෙන් යුද්ධ විධියෙහි
දක්‍ෂ වූයේ යුද්ධොපාය ලියා සාමන්තයන්ට දෙවා "මේ උපදේශයෙන්
59 රේඛා මාත්‍රයකුදු පැන කිසියම් කර්‍මයක් කරතිහ යි නොසිතව" යි නියෝග
60 කෙළේ යි. ඒ සියල්ලෝ ම රජහුගේ බස හිසින් පිළිගෙන මහාබල
ඇත්තෝ යුද පවත් වන්ට ආරම්භ කළෝ. ගජබා රජහුගේ සමෘර්ධ වූ
61 වාහන ඇැත්තා වූ යුද්ධයෙහි දක්‍ෂ වූ කොබ්බා නම් ඡත්‍ර ග්‍රාහක
ප්‍රධානයෙක් වී. ඒ තෙමේ මල්ලවාලන නම් ගමෙහි ඉතා තිර බල
62 කොටුවක් කොට සතුරන් වළක්වන පිණිස එහි බොහෝ කලක් විසී.

වැලිකෙත් නම් බලකොටුවෙහි සිටියාවූ මලරොයර නම් ඇමති
63 තෙමේ යුද කොට උහු බැහැර කෙළේ උහුගේ ඒ දුර්‍ගය ද ගත්තේ ය. ඒ
වීරතෙමේ එයින් නික්ම මහසෙන් විසින් පෙරටු කරණ ලද්දේ නැවින්
64 දිය පිට මුතු ආකරය වෙත ගොස් බල ඇත්තේ එහි සිටි දණ්ඩනාථයා
65 සමග දිය මැද මහ යුද පැවැත්වී. සතුරාගේ බල බිඳුණේය. එකල්හි
එහි දරුණු වූ දෙවෙනි යුද්ධයක් ද පවත්වා නොයෙක් දහස් ජනයන්
66 යමයා කරා යැවී. නබ්බා නම් කේසධාතු නායකයා මොනරුවැව
67 නීලගල්ලක නම් සාමන්ත තෙමේ ද කටියා ගමට අවුත් බොහෝ සතුරන්
මැරී ය.

Non-Commercial Distribution

ගජබා රජහුගේ ම කලා වැව නම් ගමෙහි ගොකණ්ණක නගර ගිරි
70 දණ්ඩනාථයයි ප්‍රසිද්ධ වූ සුරවූ උදාර ගුණයෙන් යුක්ත වූ රථ බලවාහන
71 සහිත දක්ෂ වූ සිය හිමියාහට පක්ෂ පාත්‍රවූ මන්ත්‍රියෙක් ඇත. පැරකුම්
රජහුගේ රක්ඛදීවාන නම් අමාත්‍ය තෙමේ ගොණගම් නම් ස්ථානයේ දී
72 යුද කොට උහු පැරදවිය. සන්නද්ධ කොට පිලවිට නම් දුර්ගයෙහි ද,
73 දඹකොලෙහි ද, විදුරා වැව්හි ද, නදී වැව්හි ද, පල්ලිකා වැව් නම් තන්හි
ද, එසේ ම කල්ලහල්ලිකයෙහි ද යන සෑම තන්හි ම වෙන් වසයෙන්
74 යුද කොට පරාජයට පැමිණියේ "පෙර රජහු සමග ද යුද කොට පැමිණි
ජය ඇති මාගේ ඒ සේනා තොමෝ දැන් විගුණව ද පැරකුම්බා රජහුගේ
75 රාජ්‍ය සීමායෙහි සාමන්තයන් දෙතුන් දෙනකු හා වෙන් වෙන් වශයෙන්
76 යුද කොට පරාජයට පැමිණියා ය." සේනානායකයෝ ද මළහ. දැන් යුද
77 කරණයට නොහැකි යැයි සිතා සියලු පවත් ගජබා රජහට කියා යැවී.
78 ඒ ගජබා මිහිපල් තෙමේ එ සියල්ල අසා ඇමතියන් හා මන්ත්‍රණය
79 කරන්නේ මේ වචනය කීයේ ය. "මින් පෙර අපගේ පරාජයක්
80 නොඇසුම්හ, දැන් පරාජයට පැමිණියෙමු, අපට මහත් හානි විය, මාගේ
ඇමතියන් අතුරෙන් මහත් බල පරාක්‍රම ඇති හේ තෙමේ ද නොයෙක්වර
81 යුද කොට පරාජයට පැමිණියේ ය. ඉදින් නැවතත් උහුට හානියෙක්
වීනම් මට යහපත් නො වේ." මෙසේ හේ තෙමේ ඇමතියන් සමග
මන්ත්‍රණය කොට බොහෝ ධනය ද සේනාවන් ද සේනා නාථයන් ද
82 නොබිඳිය හැකි සන්නාහයන් ද සාදා උහු වෙත යැවී.

83 එකල්හි රජහු විසින් එවන ලද සේනාව ද තමන් පෙර සේනාව
84 ද රට වැසි සේනාව ද යුහුව සාදා නැවැතත් පතියා සමග මහ යුද
85 පැවැත්වී. එහි යුදයෙහි උහුගේ බොහෝ මනුෂ්‍යයෝ වැටුනහ. ඇවිද
දැම්මෝ ය, වනයට ද පිවිසියෝ ය. මිදී ගියෝ නැතැයි කිය යුතු බවට
86 පැමිණියෝ ය. යාන හා සත් දමා තෙමේ ද වනයට වන්නේ ය එතැන්
පටන් යුද්ධයන්හි සිත හැර එහි කලා වැව දුර්ගය ස්ථිර කොට ගෙණ
87 විසී ය. සුර අඹවන නම් රටෙහි සිටුවන ලද්දාවූ ඇමතියෝ එතැනින්
88 දනව්වා නම් ස්ථානයට ගොස් පසමිතුරු සෙන් මැරූහ.

89 බෝගම්වර රටෙහි යොදන ලද සේනා නායකයෝ ලංකාගිරි
90 නම් ස්ථානයට ගොස් එහි විසූ සතුරන් වැනසූහ. මිහිඳු නගරගිරි ආදි
91 සේනානායකයන් මල්ලවායාන නම් රටට ම යුධ කරණට නැවත යැවූහ.
බලැත්තෝ එහි ගොස් සතුරන් පසු බස්වා ඇතුළුව ඒ රට ගෙණ
92 අතිශයින් තහවුරු කළෝ ය. ඒ සියල්ලෝ එතැනීන් නික්ම දිය පිටින්
නොයෙක් නැව් සිය ගණනින් ගොස් යුද පවත්වා එහි සිටි
93 දණ්ඩනායකයා ද, උහු සේනාව ද, රට ද, මුතු ද ගෙණ මුතු සිය
මිහියහට යැවූහ.

Non-Commercial Distribution

94 ඉක්බිති ඒ මිහිපල් තෙමේ පිලවසු නම් ස්ථානයෙහි දුර්ගයක්
කරවා එහි යෝධයන් සේනාධිපතීන් වැස්වූහ. ගජබා රජ තෙමේ
95 එපවත් අසා ඇමතියන් සමග මන්ත්‍රණය කොට සේනාව යවන්නට
96 පටන් ගත. විධාන දන්නා වූ පැරකුම්බා රජ තෙමේ ඒ දූන ලංකානාථ
97 නම් ඇමතියන් දනව්වා නම් රටට යැවී. ගජබා රජ තෙමේ එපවත්
අසා සෙනග රැස් කොට සේනාව දෙපරිද්දකින් බෙදා සන්නද්ධ වූ
98 සන්නාහායුධ ඇත්තා වූ සේනාව දනව්වා නම තැනට ද පිල වසු නම්
99 දුර්ගයාට ද දෙපසින් යැවී ය. රක්ඛාලංකාධිනාථ නම් ඇමති තෙමේ
ද මහා සේනාව පෙරටු කොට පරසෙන් වනසනු පිණිස එතැනින් අඹ
වනයට ගොස් සතුරු සේනාව සමග බුබුල නම් ගමෙහි යුද කොට
බොහෝ සතුරන් සුණු කොට පස මිතුරු සේනාව පලවාපී ය.

100 එකල්හි රට වැසි ජනයෝ කඩා හෙලූ රුකින් ද කටු සහිත
101 වැලින් ද මාරගයන් දුර්ගම කළෝ ය. මාර්ගයෙහි සැඟවුනා වූ
102 ස්වරූපයෙන් පිට එකල යුද පැවැත් වූහ. එකල සතුරන් නැසීමෙහි
103 කළ නිශ්චය ඇත්තා වූ ලංකා නම් ඇමති තෙමේ ඔවුන් දිසාවන්හි
104 ලුහුබඳනේ ආවරණයෙන් ද සිඳිනේ තැනින් තැන මහ යුද කරමින්
105 දනව්වට ගියේ ය. හේ තෙමේ පැරකුම්බා රජහුගේ උපදෙස් අනුසාරයෙන්
ඒ දනව්වට ගෙණ එහි බල කොටුවක් කොට ගෙණ විසී. එකල්හි
ගජබා රජ තෙමේ දේවලංකාධිනායක නම් ඇමතියා ද දාඨභාර නම්
ඇමතියා ද උහු පරයනු පිණිස යැවී.

ඉක්බිති ඒ ලංකාධිනාථ තෙමේ ද ඔවුන් හා මහ යුද කොට
106 ඔවුන් පළවා යගාල්ල නම් පියස ගත්තේ ය. ගජබා නිරිඳු තෙමේ ද
107 ඇළිසර නම් රටෙහි තම සේනාව නැවත යුද කරණට යැවී. ඒ
108 ලංකාධිනාථ තෙමේ ද නික්ම ඔවුන් සමග යුද කොට කිසිවෙක්
ජීවග්‍රහයෙන් අල්වා ගෙණ තළා ගොඩ ගත්තේ ය. එකල්හි ගජබා රජ
109 තෙමේ සාමදානයෙන් උහු වසඟ කරණු කැමැත්තෙන් මාහැඟි රුවන්
110 ද අබරණ ද කොමුපිළි කොසෙයා පිළි ආදි නානාවිධ වස්ත්‍රයන් ද යන
111 බොහෝ පඬුරු ගෙණ දූතයන් විහාරයට පමුණුවා ඒ පඬුරු ද දූතයන්
ද සිය හිමියා කරා යැවී. රජ තෙමේ ද ඒ දූක සතුටු වූයේ ඒ සියලු
112 ධනය ද මාහැඟි පඬුරු ද නැවත උහුටම යැවී. ලංකාධිනායක තෙමේ
113 තළාගොඩ බලාකොටුවෙන් නික්ම ගඟපස ඇළිගම බලකොටුවෙහි
එකල විසී ය.

114 නැවත ගජබා රජ තෙමේ සිකාදණ්ඩනායකාදී වූ යුද කරු වූ
115 මහා භටයන් උහු හා යුද කරණට යැවී. සමුර්ධ වූ බලවාහන ඇත්තා

Non-Commercial Distribution

116 වූ ඒ සියල්ලෝ නික්ම ඒ බලකොටු අවුරා ශරවර්ෂා වැස්වූහ.
117 රක්ඛලංකාධිනාථ ඇමතියාගේ ආයුධ සන්නද්ධ වූ කිසියම් යොධ
118 කෙනෙක් දොර සිට බියකරු වූ යුද කළෝ ය. දොරටු අවළු ඇසුරු
කොට විසූ ධනුර්ධරාදි යෝධයෝ හී තෝමර හෙල්ල යන ආයුධයෙන්
119 බොහෝ වූ සතුරන් වැනසූ හ. මෙපරිද්දෙන් මහත් උත්සාහවත් වූ ඒ
120 මහා භටයෝ තුන් දිනක් නිරතුරු ව මහා යුද පැවැත් වූහ. සතුරන්
නැස්මෙහි තත්පර වූ ගජබා රජහුගේ යෝධයෝ බල කොටුවෙහි මහ
121 දොරටු බිඳිනට පටන් ගත්හ. එකල්හි ලංකාධිනාථ තෙමේ ද, උහුගේ
යෝධයෝ ද නික්මුනාහ ගඟ එතර දක්වා යුද කරමින් සතුරන් මැරූ හ.
122 ඉක්බිති ගංගා ජලය සතුරන්ගේ ලෙහෙයෙන් කැලැත් කොට බොහෝ
123 සේනා නායකයන් ජීවග්‍රහයෙන් ද ගත් හ. යුද්ධයෙහි ගත් ජය ඇත්තාහු
124 රක්ඛලංකාධිනායක තෙමේ සිය බල කොටුවෙහි මහත් විජය සැණකෙළි
අනුභව කරන්නේ සතුරු ඇමතියන්ගේ හිමි ද සත් යාන ආයුධයන් ද
ජීවග්‍රහයෙන් ගන්නා ලද්දවුන් ද සිය හිමියා වෙත යැවූයේ ය.

ඉක්බිති රජ තෙමේ දේව නම් සෙනෙවියා කැඳවා
රක්ඛලංකාධිනාථයන් විසින් කරණ ලද සියල්ල කියා "ගජබා රජ තෙමේ
125 බළ හානිය අසා ඒ දණ්ඩනායකයන් ගන්නා පිණිස ඒකාන්තයෙන් මහ
126 සෙන් එවන්නේ" ය (සිතා) මහා යයස් ඇති සෙනෙවියා ගජබා නිරිඳුන්
127 මහ සෙන් කරණ පිණිස ගිරිබා රටට යැවී. ඒ මහ නුවණැත්තේ
128 ගොස් සියලු සේනාව සදා කළා වැ ගං තෙර බල කොටුවක් කොට
ගෙණ එහි වෙසෙමින් රජහු නියොවින් කලා වැව් නදියෙහි ඇත් අස්
129 රිය පාබල සේනාවන් විසින් යා හැකි වූ අතිශයින් සිත්කළු යහපත්
130 ඇණ සම්බන්ධ වූ දෙසියයක් රියන් දිගු වූ විසි රියන් පුළුල් වූ අතිශයින්
131 තහවුරු හෙයක් එ කල්හි දඬුවෙන් කරවී. ඒ සෙනෙවි තෙමේ යම් කිසි
සාමන්ත කෙනෙකුන් එහි සිටුවා නික්ම ඒ ඒ තන්හි මහ යුද පවත්වන්නේ
පැමිණි ජය ඇත්තේ ගොස් අංගමු ස්ථානයෙහි සතුරු සෙන් යුද කරුණු
132 පිණිස බල කොටුවක් කොට එහි විසී ය. එ කල ඒ අසා සතුරු සේනා
තොමෝ ද සෙනෙවියා වළකනු පිණිස සෙන්ගම බිඳිය නො හැකි බළ
133 කොටුවක් ගත්තේ ය. සතුරෝ නැවතත් දෙ වරක් යුද කොට පරාජයට
134 පැමිණ මන්‍යාගම බළ කොටුවක් කොට ගෙණ විසූ හ. සෙනෙවි
135 තෙමේ එතැනින් ගොස් මන්‍යාගම් බල කොටුව ගත්තේ ය. එසේ ම
136 මිතාගමේ බලකොටුව ද ඌරුගමු බලකොටුව ද ගත්තේ ය. ඒ බල
කොටුවල නවකම් කරවා සියලු බල කොටු සුත් නො කොට ඇමතියන්
තබා එහි සෙනෙවි තෙමේ තෙරිගම්හි ද බල කොටුවක් කරවා එතැන්හි
137 යෝධ යයි සම්මත වූ බල සහිත ඇමතියන් වැස්වී.
138

Non-Commercial Distribution

139 එ කල්හි ගජබා රජ තෙමේ රාමනිලගිරි නම් වූ සවකීය සාමන්තයා
ද බොහෝ සේනානාථයන් ද උහු වළකනු පිණිස යැවී ය. බල වාහන
140 සහිත වූ ඒ සියල්ලෝ ද මොනවට සන්නද්ධ ව තෙරිගම අසල කඳවුරු
බැන්දාහ. දෙ සේනාවෝ වේගයෙන් උදෑසන පටන් සංග්‍රාමාරම්භ
141 කොට සවස් කාලය දක්වා පැවැත් වූහ. ඉක්බිති නීලාගිරි නම් සෙනෙවි
142 තෙමේ ද සූර සම්මත වූ උහුගේ යෝධයෝ පසු බස්නා තමන් සේනාව
දැක සන්නද්ධයායුධ ඇත්තාහු මහා යෝධයන් හෙලමින් සතුරන්ට බිය
143 උපදවමින් ඇත්මුලෙක සිංහයන් සෙයින් සේනා මැදට පිවිසියෝ ය.
සෙනෙවිහුගේ යුදයෙන් නො නවත්නා වූ යෝධයෝ ද හාත්පසින්
පැතිර යන්නෝ රාමනීලාගිරි නම් සාමන්තමාත්‍යයා ද බොහෝ
144 සේනාධිපතියන් ද යුද භූමියෙහි දී මරා කඩක්කුඩ නම් මහා යෝධයා
හා අනිකුදු බොහෝ යෝධයන් අල්වා ගත් හ.

145 එකල ඒ යුදයෙහි පැමිණි ජය ඇත්තා වූ සේනාපති තෙමේ
146 ජීවග්‍රාහයෙන් අල්වා ගත්තා වූ ඒ මිනිසුන් ස්වකීය ස්වාමි වූ පරාක්‍රම
147 මහ රජාණන් කෙරෙහි සුව සේ වස්නා පිණිස එහි යැවී ය. එකල්හි
148 පණ්ඩිත වූ පැරකුම්බා රජ තෙමේ තමන් සමීපයෙහි සිටි මහින්ද නගරගිරි
නම් (දණ්ඩනාථයා) කැඳවා ඒ ඇමතියන් වික්‍රම විශේෂය උහුට කී ය.
149 ඒ අසා හටගත් අභිමාන ඇත්තා වූ සතුරන් මඬනාහේ තෙමේ "මම ද
ගොස් වහා ම අනුරාධපුරය ගෙණ දෙම්මැ" යි ප්‍රතිඥා කොට මහ
සෙන් ගෙණ ගොස් ඩෙබරබෑමාණ නම් තන්හි මහ යුද කෙළේ ය.
150 මහා යසස් ඇත්තේ සියාමහන්තකුද්දාල නම් වූ ගමෙහි ද, තිසා වැව
151 සමීපයෙහි ද, අනුරාධ පුර සමීපයෙහි ද, මහයුද පවත්වන්නේ සතුරන්
152 පරදවා සේනා සමූහයා විසින් පිරි වරණ ලදුව අනුරාධපුරය ගත්තේ ය.
153 ඉක්බිති ඒ ගජබාහු නරේන්ද්‍ර තෙම එපවත් අසා මූලාමාත්‍යන් සහිත වූ
154 නොයෙක් සෙනෙවියන් යැවී ය. යුධ පිණිස සන්නද්ධ ව ඒ සියල්ලෝ
නුවර හාත්පස මහ ආවරණ කොට ජන සංචාරය වැළැක්වූහ. එකල්හි
දෙව් සෙනෙවි තෙමේ එපවත් අසා නුවර සිර කරන ලද දණ්ඩනාථයන්
155 මුදනු පිණිස වහා යන්නේ සියාමහන්ත කුද්දාල නම් ගමෙහි නැවත
156 යුද කොට අතරමග දී භයානක වූ යුද්ධ තුණක් කරවී.

157 මලවාරායර තෙමේ ඒ අසා තමන් බල කොටුවෙන් නික්ම
158 අතරමග දී දෙ වරක් යුද කොට ආයේ ය. සේනාපතීන් ගේ නියෝගයෙන්
හේ තෙමේ එක් මුඛයකින් ගොස් අනුරාධපුර සමීපයෙහි සතුරු සෙන්
159 සමග යුද කෙළේ යි. සෙනෙවි තෙමේ ද ඒ ඒ තන්හි මහ යුද කොට
ගොස් අනුරාධපුර සමීපයෙහි යුද්ධාරම්භ කෙළේ ය. ඒ මහ බලැති
160 මිහිඳු නම් දණ්ඩනාථ තෙමේ ඒ අසා අනුරාධපුර ප්‍රවරයෙන් වහා නික්ම

Non-Commercial Distribution

161 පසමිතුරන් නසමින් මාර්ගයෙහි බොහෝ වූ අවාරණයන්
බලාත්කාරයෙන් සිදුවෙමින් සේනාපතීන් කරා ම පැමිණි යේ ය.
සේනානාථයන්ගේ සේනාව ද උහුගේ සේනාව ද එකතු ව සතුරු
162 සේනාව හා යුද කොට සතුරන් නැවත පැල වූහ. ඒ සේනාපති තෙමේ
163 නැවත අවුත් සියාමහනත කුද්දාල නම් වූ ස්ථානයෙහි තහවුරු වූ
කඳවුරක් කොට එහි වාසය කෙළේ ය.

164 එ කල්හි පරාක්‍රමබාහු නරෙන්ද්‍ර තෙම මායා ගෙන නම්
165 සේනාධිපති ඇමතියා කැඳවා ඇළිසර යුද කරණයට යෙදී. හේ තෙමේ
වීර පුරුෂයන් සහිත වූයේ සතුටින් එ තැනින් ගොස් කලල්හැලිගම
බල කොටු බැඳ වාසය කොට ඇළිසරට යමින් නන්දාමූලක නම් ගම්
බලකොටුවෙහි තුන් යුදයක් කොට ඒ දුර්ගය හස්තප්‍රාප්ත කෙළේ යි.
166 ඉක්බිති හේ තෙමේ කදුරුගම බලකොටුව නැවත ගෙණ කිරාවි නම්
167 ගම පිහිටි බලකොටුව යුද කොට ගත්තේ ය.

ගජබා රජහුගේ සේනා තොමෝ ද යුධ කරණු පිණිස අවුත්
168 විලාන නම් තන්හි බලකොටුවක් කොට එහි විසී ය. එකල්හි ඉක්මිය
නොහැකි විකුම් ඇති ඒ පැරකුම්බා නරනිඳු තෙමේ නාලන්දාවෙහි
169 කඳවුරු බැඳ එහි වෙසෙමින් එපවත් අසා එ කල්හි උමං බිඳීමෙහි දක්ෂ
වූ සොරුන් දෙතුන් සියයක් රහස යවා තියුණු අග් ඇති මූව අං ගෙණ
170 මධ්‍යම රාත්‍රියෙහි ගොස් ඒ දුර්ගය කැණ ගන්නා පිණිස නියෝග කෙළේ
171 ය. මායාගෙන ප්‍රධාන තෙමේ ද ඒ උපදේසය අනුය යාමෙන් දළ්
දුර්ගය බිඳුවා එහි විසූ පසමිතුරන් ග්‍රහණය කරවී. හේ තෙමේ නැවත
172 මැටිවැව් නම් ස්ථානයෙහි ද බල කොටුව ගෙණ උඩු කිරුවා යටිකිරුවා
173 නම් ස්ථානයෙහි ද බල කොටු දෙක ගත්තේ ය. නාසින් නම් ගම
දුර්ගය බිඳ (එය) ගෙණ මෙසේ හේ තෙමේ ඇළිසර රට ස්වකීය
174 හස්ත්‍රප්‍රාප්ත කෙළේ යි. එකල්හි විධානයෙහි දක්ෂ වූ නරේන්ද්‍ර තෙමේ
පොළොන්නරුව වහා ම ගන්නා පිණිස සාමන්තාමාත්‍යයන් යෙදී.

රක්ඛලංකාධිනාථ තෙමේ ද සුඛජීවිතපුස්ත කී තෙමේ ද තළායන
175 බළ කොටුවෙන් වේගයෙන් නික්ම මග ඒ ඒ තන්හි පස මිතුරු සෙන්
176 සමග යුද පවත්වමින් රජකම සතම්බාධ නම් තන්හි යුද කොට මිලාන
177 නම් කෙත්පස යුද කොට එතැනින් ගියෝ කෙත මැද ද යුද කොට
178 බොහෝ සතුරන් මරා ඉන් මත්තෙහි සතුරන් ලුහුබඳිමින් දරගල නම්
තැනට පැමිණ එහි ද යුද කොට එහි ලත් ජය ඇති ව ඉන් ගොස් මහ
179 බල නම් ගම බළ කොටුව බලාත්කාරයෙන් බිඳ එහි පසමිතුරන් නසා
180 ඒ බලකොටුවෙහි ඔව්හු විසූ හ.

Non-Commercial Distribution

181 රුහුණු අධිපති වූ ඒ මාණාභරණ නම් රජ තෙමේ ගජබා රජහුගේ
182 සාමන්තයන් හා නොයෙක් පරිද්දෙන් යුද කොට පැමිණි පරාජය හා
183 පිරිහීම් ඇත්තේ එ කල්හි යුදෙයහි බැඳී ආසා ගරු හින්න වූ උත්සාහ ඇති ව වෙසෙමින් තුන් නිකා වැසි භික්ෂූ ඇති ව විසී වය. "පැරකුම් මිහිපලුහුගේ මහ බල ඇති සාමන්තයෝ ඒ ගජබා නිරිඳු මා යුද කොට යුද්ධයක් පාසා සතුරන් නසා ගන්නා ලද ජය ඇත්තෝ ය"යි අසා
184 මාණාභරණ නරේන්ද්‍ර තෙමේ මෙසේ සිතී ය. "මහත්වූ භෝග ඇති
185 පරාක්‍රමබාහු නම් ඒ රජ තෙමේ දූන් වහා ඒකාන්තයෙන් සියලුම රජරට
186 ගන්නේ ය. ඒ නරෙන්ද්‍රයන් විසින් රජ රට ගත් කල්හි නියතින් ම
187 රුහුණු රට වසන්ට නො හැක්කේ ය." ඉක්බිත්තෙන් හෙතෙමේ ගජබා රජහුගේ මිත්‍රසන්ථවය හැක්කේ ය. ඉක්බිත්තෙන් හැර පරාක්‍රමබාහු
188 නරෙන්ද්‍රයන් හා මිත්‍රසන්ථවය කොට වෙසෙමින් දෙ රට වැසි බලවත් සේනා සන්නද්ධ කොට ගෙණ සොබර නම් ගමෙහි කඳවුරක් බැන්දේ යි.

189 එ සමයෙහි වනාහි පරාක්‍රමබාහු නරේන්ද්‍ර තෙම වික්‍රම විශේෂයක
190 කරුණු කැමැත්තේ ඒ ඒ තන්හි සාමාන්තයන් නො දන වසද්දී ම මා සමග වැඩුනු යෝධයන් හා පොළොන්නරු ගොස් යුද කොට දොරටු
191 අටළු බිහිදොර බිඳ ඇතුළු ව ගජබා නරනිඳු අල්වා ගන්නෙම් නම් යෙහෙකැ යි සිතුයේ ය.

192 ඉක්බිත්තෙන් පැණැති ඒ තෙමේ අඹ වෙනෙහි සිටි මයාගෙහාධි
193 නායකයන් කැඳවා තමන් සිතු කටයුතු කියා අන් කටයුත්තක ස්වභාවය දූක්වීමෙන් අඹ වනයට ගොස් එ තැනින් පොළොන්නරුවට යනු පිණිස
194 උහුට මෙසේ රහස් වසයෙන් කීයේ ය. "මම සර්‍වඥයන් වහන්සේට උදාර තර වූ පූජාවක් කරවනු කැමැත්තෙමි, බුදුන් පුදන පිණිස පූජාවට
195 සුදුසු උපකරණ ද, සත් ද, මහත් ශබ්ද ඇති පංච ප්‍රකාර තූර්‍යයන් හා
196 චාමරයන් ද, සේසත් හා පතාකාවන් ද මා වෙත එවත්වා, ස්වාමීහු ද
197 මෙහි අවුත් මාගේ මේ පූජාව බලා වදාරත්වයි කියා හස්නක් මා වෙත එව" යි (අසුන් යැවි)

198 හේ තෙමේ ද එ තැනින් අඹ වනයට ගොස් උක්තානුසාරයෙන් පූජාව පිළියෙළ කොට හස්නක් (රජු කරා) යැවී ය. එ කල්හි මහ යසස් ඇති රජ තෙමේ ඒ දූක සතුටු ව ඇමතියන් මැද හිඳගෙන සන්දේසය
199 කියවා මහා ම උහුට නොයෙක් පරිද්දෙන් සියලු පූජෝපකරණ වවා
200 තමන් යනු කැමති බැව් ඇමතියන්ට ප්‍රකාශ කෙළේ යි. ඉක්බිත්තෙන්
201 නරේන්ද්‍රයාණන්ගේ අභිප්‍රාය දත් ප්‍රධානාමාත්‍ය තෙමේ නගර ගිරි නම්
202 වූ තමන් සොහොයුරාණන්ට එ පවත් කියා දූතයෙක් යැ වී ය. හේ

Non-Commercial Distribution

203 තෙමේ ද එ පවත් අසා මොනර වැවෙන් නික්ම සේනාව ගෙණ වහා
204 නරෙන්ද්‍රයන් කරා ගියේ ය. "කුමක් පිණිස අයෙහි ද?" යි කියන ලද්දේ
"ස්වාමීන් විසින් සිතන ලද්ද දූන ආයෙමි " යි කියා මෙසේත් කීයේ යි.
205 "අප වැසි දසුන් ඇති බැව්හි ප්‍රයෝජන නම් හුදක් පසා මිතුරු රජුන්
සාදාලීම ය. එ හෙයින් මම ම ගොස් සමෘර්ධ වූ සේනා වාහන ඇත්තා
206 වූ ගජබා රජහු ගෙණ නුඹ වහන්සේට පාවා දෙන්නෙමි" මෙසේ කියා
207 රජහුගේ සාමාන්තාමාත්‍ය තෙමේ යන්නට අවසර ඉල්වි ය. ඒ දක
අභිමාන ඇත්තා වූ ඒ මායා ගෙහාධිපති තෙමේ ද, කීර්තිලංකාධිනාථ
තෙමේ ද, බලවත් බොහෝ සාමන්තයෝ ද "මම පළමු කොට (යෙමි)
මම පළමු කොට (යමි)" යි කියා අවසර ඉල්වූහ. ඉක්බිති ඒ
යුද්ධෝපායෙහි දක්ෂ වූ මහිපාල තෙමේ යුද්ධෝපාය ප්‍රකාශ කොට යුද
208 කරණට යෝධයන් යැවූයේ ය. සේනා වාහන සහිත වූ ඒ සියල්ලෝ
209 නික්ම නාලන්දට නුදුරු තන්හි කඳවුරු බැන්දාහු ය.

210 එකල්හි මහා මේසයක් නැගී දිය දහරින් හාත්පසින් පොළෝ
බිඳ පියන්නාක් සෙයින් වස්නට පටන් ගත. එ කල්හි සත්‍ය ගුණයෙහි
ඇළුනා වූ ස්වාමි තෙමේ මේසය දක සේනාව තෙමෙන සැකයෙන්
211 "ඉදින් (මාගේ") රාජ්‍ය සාධනය කොල ශාසනාභිවෘර්ධිය පිණිස වන්නේ
212 නම් නොවසීව" යි අධිෂ්ඨාන කරමින් සත්‍ය ක්‍රියා කෙළේ ය. මේසය
213 තෙම එහි එසේ නැවත්තේය. තවද එකල්හි ඇඹුල් බත් කෙසෙල් පුළු
214 ආදීවූ නොයෙක් ජනයෝ දිය බොත්ද එපරිද්දෙන් එක සිදුරු ඇති
කොට විද දියෙන් පුරවා වසන ලද එක් සිදුරු කළ නොයෙක් දහස්
215 ගණන් හුන දඬුය යැවී. ඉක්බිත්තෙන් මිහිඳු නම් ඇමති තෙමේ මහසෙන්
216 ගෙණ නික්ම පසමිතුරන් මරා ලහුල් නම් ගම බල කොටුව ගත්තේයි.
217 එ කල්හි ලංකානාථ නම් ඇමති තෙමේද එපවත් අසා වහා නික්ම
218 හත්තන නම් ගම බලකොටුව ගත්තේ සතුරන් ද මැරවී. ඉක්බිති
219 මායාගෙහාධි නාථ තෙමේ ද ඒ අසා මහත් සේනා ඇත්තේ වහා
220 නික්ම කඩිගමට පැමිණියේ ය. ගජබා නිරිඳුගේ ඒ සිව්රග සේනා
221 තොමෝ කඩිගමු සම්බාධයෙහි තුන් අතින් වටකරණ ලදී එ කල්හි
ලංකාධීනායකයා පිත් ලංකාපුර නම් මහායෝධ තෙමේ කඩිමුවෙහි
සම්බාධයට වැද තුන් දෙසින් ආවාවූ සියලු සේනාව එක් දෙසට කරමින්
සිංහයෙක් ඇත්මුලක් සෙයින් මහායෝධයන් ලුහු බැන්දේය. ඉක්බිති
222 ලංකාධිනාථාදිවූ සේනාධිපතියෝ ගජබා රජුහුගේ මහා සේනා මරවා
223 කොණ්ඩගුලික කේදාර නම් වූ ස්ථානයට පැමිණියෝ ය. බිඳුනාවූ
ගජබා රජුහුගේ සේනාව පොළොන්නරුවට ආය.

224 ඒ ගජබාහු නරෙන්ද්‍රතෙම ප්‍රවිෂ්ට වන්නා වූ මහා සේනාව දක
හටගත් අභිමාන ඇත්තේ දැඩි කොට මෙසේ සිතී. "යම් කලෙක්හි

Non-Commercial Distribution

මාගේ පියරජ තෙම දෙවියන් හා එකී භාවයට පැමිණියේ ද යම් කලෙක්
225 හි පියසතු රාජ්‍යයෙහි සුප්‍රතිස්ඨිති නොවිඳ, එ කල්හි කීර්ති ශ්‍රී මේඝ, ශ්‍රී
226 වල්ලභ යන නම් ඇති රජදරුවෝ දෙ දිසාවෙන් ගොස් යුද
කරන්නෙමුයයි ආවෝ මාගේ ජයකොඩිය දක්නට නොපොහොසත්
227 වූවෝ පලා ගියහ. එතැන් පටන් ඔහු ජීවිතාන්තය දක්වා යුද්ධාසා
228 හැරියෝ ය. දැන් වනාහි රජ රට මනා ප්‍රවිෂ්ඨාවට පැමිණියෙමි. මාගේ
සම්පූර්ණ වූ සිවුරඟ සෙනඟ ද ඇත්තේ ය. බළ වාහන සන්නද්ධ කොට
229 යුද කරණ පිණිස මා නික්මුන කල්හි මගේ රණ භේරියෙහි හඬ අසන්ට
230 කවර නම් රජෙක් පොහොසත් වේ ද?" ගජබා රජ තෙමේ මෙ සේ
අභිමානයෙන් උඩඟු වූයේ සේනාව සජ්ජිත කරන්ට අභ්‍යන්තරගත
අමාත්‍යන්ට නියෝග කෙළේ යි. ඇමතියෝ මොනවට සන්නාහ ලා
සාදන ලද ඇතුන් ද, අසුන් ද, යුද්ධයෙහි දක්‍ෂ වූ දශ ප්‍රකාරයකින් යුද
231 පිණිස සන්නද්ධ වූ මහා යෝධයන් ඇත්තා වූ සේනාවන් ද, එ සේ ම
232 කෙරළ කණ්ණාට ද්‍රවිඩාදි භටයන් ද ක්‍ෂණයකින් ම මොනවට සාදා රජහට
දැන් වූහ.

233 ඒ ගජබා රජ තෙමේ මහත් වූ සෙනඟින් යුක්තව පුලස්ති
පුරවරයෙන් නික්ම සිකවියල නම් ස්ථානයට පැමිණියේ ය. රක්ඛ
234 ලංකාධිනාථ නම් සේනාධිපතීන් ප්‍රමුඛ කොට ඇත්තා වූ සේනාධිපතිහු
ඒ ගජබා නරනිඳු හා යුද කළහ. ඒ මහා වීරයෝ ඇතුන් ද බිඳ
235 හස්ත්‍යාරෝහාදීන් ද හෙලූ හ. සේනා සහිත වූ ඒ නරේන්ද්‍රයා පලවා
236 පූහ. ඒ රජ තෙමේ වහා සියපුර වැද දොර අගුලු ගන්වා අනුරායෙහි [1]
සැඟවුනේ ය. එකල රජහු ලුහුබඳනා වූ ඒ යෝධයෝ ද එක්ව
237 පොළොන්නරුව හාත්පසින් වටලා ඉක්බිත්තෙන් පවුරු අටලු දොරටු
238 බිඳිනට පටන් ගත්හ. පුරයෙහි නියුක්ත චර පුරුෂයෝ දොර ඇරපූහ.
239 සුවසේ ම (නුවරට) පිවිස ගජබා මිහිපතිහු ජීවග්‍රාහයෙන් ගෙණ
240 ප්‍රාසාදයෙහි ප්‍රවිෂ්ට කරවූහ. චෝලගංග නම් කුමාරයාද එසේම වික්‍රමබාහු
නම් කුමාරයා ද යන රාජ පුත්‍රයන් දෙදෙන බැඳ දඟ ගෙයි ලූහ.
241 ඉක්බිත්තෙන් ඇමතියෝ එ පවත් නර ශ්‍රෙෂ්ඨයන්ට සැලකොට යැවූහ.
විචාරණයෙහි පොහොසත් නුවණැති මිහිපල් තෙම ඒ අසා "යම්තාක්
යහපත් නකත් යෝගයෙක්හි ඔවුනොවුනගේ දර්‍ශනය වේ ද ඒ තාක්
242 අප කෙරෙහි සංකාව පහ කොට විසිය යුතු" ය කියා තමා පරිභෝග වූ
243 මහාර්ඝ වස්ත්‍ර ද සුගන්ධාභරණයක් ද ගජබා නරෙන්ද්‍රයන්ට යැවී ය.
ඉක්බිත්තෙන් සාමන්තයෝ ද මණ්ඩලේ ස්වර යෝ ද එක්ව මන්ත්‍රණය
244 කොට භූපාලනයන් කරා මෙසේ පිළි හසුන් යැවූ හ. "(ගජබා) මිහිපල්හු

Non-Commercial Distribution

332 එකල්හි එ බස් අසා ඒ භික්ෂුහු කරුණාවෙන් කම්පිත වූ සිත් ඇතිව
ගිරිතළාවට ගොස් පැරකුම්බා නරනිඳුනු දැක පිළිසඳර කථා කොට පැමිණි
කරුණ රජහු විසින් පිළි විසින ලද්දාහු උභුට සමගි කරණ බස් මෙසේ
333 වදාළහ. "දයාවෙහි ඇලුනා වූ ඒ භාග්‍යවත් සර්‍වඥතෙම බොහෝ සේ
334 නොයෙක් සූත්‍රයන්හි ඩබරයෙහි දොස් හා මිතුරු බැව්හි අනුසස් දැක්වූ
සේක. යළිත් ඒ නරනිඳුනු පුත්‍රයකු හෝ සහෝදරයකු හෝ නැත, වැලි
එකෙක් ඇත, මහලු බැවින් තෙමේ මරුමුවෙහි සිටිනේ ය.
335 ලෝකශාසනාභිවෘද්ධිය හේතු කොට ගෙණ රාජ්‍ය සාධනය වේ නම්
336 භවත්හුගේ ඒ ප්‍රතිඥාව ව ද නො බෝ කලකින් ම සමෘර්ධ වේ. එහෙයින්
භික්ෂු සංඝයාගේ වදන් පුදන්නා වූ භවත් හු විසින් සටන් හැර සිය රට
යා යුතුවේ" (යන මේ කථායි.)

මෙසේ පරාක්‍රමබාහු නරේශ්වර තෙම සංඝයාගේ බස් අසා අතිශයින් දුකසේ ගත්තා වූ රාජ්‍යය ගජබාහු නරෙන්ද්‍රයාට දී සිය රටටම ගියේ ය. ඒ නරනිඳුහුගේ කරුණාභාවය ආශ්චයර්‍යයි.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස රජ්ජදාන සැත්තෑවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ එක් වෙනි පරිච්ඡේදය

1 ඒ ගජබා මිහිපල් තෙමේ ගංතලාවට අවුත් රාජධානියක් කොට
2 ගෙණ එහි සුවසේ වාසය කෙළේ ය. එකල්හි ඒ මාණාභරණ නම්
3 නරේන්ද්‍ර තෙම ගජබා රජු හා මිත්‍රසන්ථවය කොට වසන පිණිස පඬුරු
4 යැවී ය. උහු හා සමග මිත්‍රසන්ථවය නො කැමැති ගජබා මිහිපති තෙම
5 මඬුලු ගිරි නම් විහාරයට පැමිණ "රජ රට මා විසින් පැරකුම්බා
6 නරනිඳුන්ට දෙන ලද්දේ ය" යි කියා හේ තෙමේ පිටු පහණෙක්හි
ලියවා නැවත අවුත් ගංතලාවෙහි වසන්නේ එක් රෝගයකින් පෙළි දෙ
විසි හවුරුද්දක් වැස මෙළේ ය.

8 ඉක්බිත්තෙන් නුවණ මද වූ ඇමතියෝ රැස් ව ගජබා රජහුගේ
දේහය ගෙන්වා ගෙණ කොටුසරට ගොස් ඔවුහු වහා එනු පිණිස
මාණාභරණ රජහට දූතයන් යවා එකල්හි ඔහු වාසය කළෝ ය.
9 පරාක්‍රමබාහු නරේන්ද්‍ර තෙමේ ද (ගජබා රජ) මහරජාණන් මළ අස්න
10 අසා සේන සන්නද්ධ කොට ගෙණ පොළොන්නරුවට ආයේ ය.

11 එකල්හි මාණභරණ මහිපති තෙම රජ රටින් අවුත් රුහුණු වැසි
12 ජනයන්ගෙන් මහත් සේනාවක් සමග ක්‍රෑරයන් බස ගෙණ "මොවුන්
උපස්තම්භක කොට ඒකාන්තයෙන් රජ රට ගන්නෙමැ" යි සිතා මහත්
සේනා සමූහයා සමග රුහුණින් නික්ම නිෂ්ඵළ වූ ආශාව විසින් වසඟ
13 කරණ ලද්දේ කොටු සරට පැමිණියේ ය. චිනතාවිෂයාතික්‍රාන්ත වූ
අතික්‍රාන්ත කළ නො හැකි උදාර වික්‍රම ඇති ශ්‍රේෂ්ඨ පරාක්‍රමබාහු
14 නරේශ්වර තෙම එපවත් අසා "මහා සම්පත්තිදායක වූ ගජබාහු
නරේන්ද්‍රයන් මහා සාමන්තයන් ද, යුද්ධයෙහි බැඳුනා වූ ආසාව ද හැර
15 හඳනා ලද වස්ත්‍රයට ද අස්වාමි බවට පැමිණ භයින් පලා ගොස් රජ
16 රට වැසි දුජීනයන්ගේ ප්‍රලාපය උතුම් සේ අදහා යම් මානාභරණ
17 මිහිපතියෙක් තෙම යුද පිණිස ආයේ ද උහු ගජබාහු නරේන්ද්‍රයන්
විසින් පැමිණි පරාජයටත් වඩා විගුණ වූ පරාජයට මාගේ අමාත්‍යයෝ
18 පමණුවන්නාහු ය. උහු මහවැලි ගඟින් මෙතෙර පැමිණෙන්ට නො
19 දෙමි"යි සිතා යුද්ධාරම්භයෙහි විචක්ෂණ වූ නුවණැත්තේ වල්ගම්තොට
පටන් ගොකන් මුහුද තෙක් තොටත් පාසා අමාත්‍යයන් සහිත වූ
20 චතුරංගනී සේනාව යැවුයේ ය.

21 එකල්හි මහනුවණැති ඇමතියෝ රැස්ව දෙහොත් මුදුන් දී "
22 මහරජාණෙනි" ජය ගත්තා වූ පුරාතන රජ දරුවෝ වූ කලී සව්
23 ප්‍රකාරයෙන් ජනයක් භයානුරාග වැඩෙන පිණිස ද ස්වකීය

Non-Commercial Distribution

තෙජොවිශේෂය සැම තන්හි ප්‍රකාශ වන පිණිස ද යුද්ධ භූමියෙහි සිටත්
අභිෂේක පැවැත් වූහ. සර්වාකාරයෙන් නීතියෙන් ද හික්මීමෙන් ද යුක්ත
24 වූ ස්වාමීන් විසිනුත් සදාචාර පරිපාලනයම කටයුත්තේ ය, දේවයන්
25 වහන්ස, නුඹ වහන්සේගේ වයසද අභිනවය තේජසද (සතුරන් විසින්)
නො ඉවසිය හැක්කේ ය. බාහු වික්‍රම සම්පත්තිය ද ඉක්මයා නො
හැක්කේ ය. නුඹ වහන්සේගේ පුණ්‍යප්‍රකාශය තෙම ලංකාද්වීපය තබා
26 සියලුම දඹදිව් අධිපතිභාවය පවත්වන්ටත් සමර්ථය. නුඹ වහන්සේගේ
වංශය ආදි කල්පයෙහි පටන් අද මේ දවස දක්වාත් ධෞතසංඛ ප්‍රක්ෂිප්ත
27 ක්ෂීරයක් මෙන් අතිශයින් නිර්මලය. එහෙයින් සියලු ලෝකයාට
අවශ්‍යයෙන් සම්පත් එලවන්නා වූ අභිෂේකය ශුභ දිනයෙක්හි කටයුතුය"
28 කියා අභිෂේක පිණිස මහීපාලයන්ට යාඥා කළහ.

විවේක ඇත්තා වුන් අතුරෙන් උතුම් වූ බැම බිඳුමෙන් දිනූ
29 පසමිතුරන් ඇති පැරකුම්බා මිහිපල් තෙම ඒ යාච්ඤාව පිළි ගෙණ
30 පසන්නා නකතින් මගුල් සම්මත දිනෙක්හි සර්වාභරණින් සැරසුණේ හිසින්
31 වොටුනු දරා "මාණාභරණ මිහිපති තෙම ගං මෙතෙර පත්විය" යි අසා
32 උහු තණපතටත් නොහඟනේ නුදුරු තැන තමන් නැගි සිත් කළු රුවන්
33 මණ්ඩලයෙහි ම තමන් සන්නාහ ද අවි ද තබා මහ පෙරහරින් සිය
මැඳුරෙන් නික්ම බියසුන් මිහිදෙකු සේ නුවර පැදකුණු කොට ඒ
34 ශෝභාවෙන් පැමිණි ජනයා ආශ්චර්යයෙන් අවසඟ කෙරෙමින් සිරි නිවෙස්
වූ රජ මැඳුරට පිවිසියේ ය.

(මේ පරිච්ඡේදානතය මෙන් සැකලිය යුතු තැන යි.)

Non-Commercial Distribution

# හැත්තෑ දෙවෙනි පරිච්ඡේදය

35 එකල්හි (මාණාභරණ රජහුගේ පක්ෂයෙහි වූ) මහින්ද්‍ර නම්
සභාලෙඛක තෙම මහසෙන් ගෙණ අවුත් විල්ගම් තොට සිට මහ තෙදැති
36 රක්ඛ නම් කේශධාතු නායක (සෙනෙවියන්) හා මහ යුද කෙළේයි. ඒ
මහ බලැති කේශධාතු නායක රක්ඛ සේනාධිපති තෙමේ ද ඇත් මුලකට
වන් සිංහයකු පරිද්දෙන් සෙයින් බලවාහන සහිත බලවත්
37 මහාලේඛයන් පලවාපී ය. තවද තලනිගම් තොට පැන යුද පිණිස එනු
38 කැමති වූ ඒ කේශධාතු නායක රක්ඛ සේනාධිපති තෙමේ ම මහත් යුද
39 කොට පලවාපී ය.

40 එසේ ම පූණි නම් කොට තරණය කොට යුද පිණිස එන්ටට
සජ්ජිත වූ මාණාභරණ රජහු ඒ තොට රැකවරණ පිණිස යොදන ලද්ද
වූ බුද්ධ නම් කේශධාතු නායක තෙම ඒ රජහුගේ බොහෝ වූ ඇමතියන්
41 සමග භයානක යුද්ධ පවත්වා බොහෝ වූ යෝධයන් ද මරවා එ
කෙනෙහි උහු පලවා ඒ තොටට නැවත එනු පිණිස (උපදනා) අසා
42 නැති කෙළේ ය.

එසේ ම සමීරුක් නම් තොට රක්නට යොදන ලද එක් සාමන්ත
ප්‍රධානයෙක් යුද කෙරෙමි යි සිතා ඒ තොටනී අවුත් පැමිණියා වූ
43 මායාගෙහ නායකය එසේම ගජබාය යන මොවුන් සෙන් සමග
44 බින්දේ ය.
45

මාරුක් නම් තොට එතර යෙමි යි සෙන් සහිතව ආවා වූ
46 මිත්තතාලය යි ප්‍රසිද්ධ වූ මාරාගල සෙනෙවියන් එහි නිල් ගිරි සිට
අතිශයින් උදාර පරාක්‍රම ඇත්තා වූ සිය රට වැසි රාම නම් ඇමති
47 තෙම බිය එලවන යුද කොට අල්වා ගත යුතු මහා යෝධයන් ජීවග්‍රාහයෙන්
ගෙණ යුද්යෙහි අවශේෂ වූ සෙනඟ උත්සාහ රහිත කොට පලවාපී ය.

තවද පොල්වතු නම් වූ තොට විසූ එක් සාමාන්තයෙක් එතැනින්
48 යුද පිණිස පැමිණි පස මිතුරු රජ සෙන් සමග යුද කොට බොහෝ වූ
භටයන් මරවා අවශේෂ වූ සේනාව නිරවශේෂ කොට ඔ බොම
49 පලවාපී ය.

50 අනන්තරභාණ්ඩ නම් තොට රැකවරණ පිණිස සිටියා වූ මහ
51 බලැති වීර වූ කිසියම් සාමනතාධිපතියෙක් යුද පිණිස එතැනින් අවා වූ
52 සාමන්තයන් සහිත වූ පස මිතුරු මහ රජ සෙන් යුද්ධාංගනයෙහි එක්

Non-Commercial Distribution

මස් කලම්ටක් කොට සාමන්තයන් සම අවශේෂ වූ සේනාව හාත්පසින්
එකතු වූ වේගවත් මේසකුටයක් මාරුතය සෙයින් ඒ ඒ දෙස
බලවාපී ය.

53 කණතල්වන නමින් ප්‍රසිද්ධ වූ තොට රකවරණයෙහි යොදන
ලද්දා වූ එක් සාවනතාධිපතියෙක් තෙම සියල් බල වාහන ඇතියේ
54 එතැනින් යුද කරණට ආවා වූ සතුරු සෙනග මහ යුද පවත්වා නැවත
55 යුද්ධාරම්භයෙහි දූර්මුඛ කෙළේ යි.

යක් ඌරාතොට යොදන ලද්දා වූ කීර්ති නම් අධිකාරි තෙම
56 එතැනින් යුද කරණට ආවා වූ පස මිතුරු සේනාව සමග ඉතා දරුණු
වූ යුද කොට බොහෝ වූ සියලු යෝධයන් කථාශේෂ කොට අවශේෂයන්
පලවා එම තොටම වෙසෙමින් පැරකුම්බා මහ රජානන්ගේ ඉක්මිය
57 නො හැකි වූ හස්නකින් එහි එක් මහ ඇමතියකු යොදා තෙමේ ආයේ
ය. ඒ ඇමති තෙමේ තුන් වරෙක එහි ආවා වූ පස මිතුරු සෙනග
58 නැවත මහ යුද කිරීමෙන් මෙහි අසා සුන් කොට බින්දේ ය.

වෙහෙර වෙදහල් නම් තොට විසූ ජිතගිරි සානත නම් මහ
59 සෙනෙවි තෙමේ උදාර වූ සේනාවාහන ඇත්තේ එතැනින් එතෙර
වෙන පිණිස පැමිණියා වූ ශත්‍රුරාජ සේනාව භයානක වූ මහ යුද
60 පවත්වා නිරවශේෂයෙන් විනාසයට පත් කෙළේ ය. අස්මණ්ඩලා තොට
විසූ කීර්ති පුස්තකී නම් වූ ඇමති තෙමේ ද, මහසෙන් ඇති මහී නම්
61 ඇමති තෙමේ ද, මහ බලැති ලංකාගිරි නම් ඇමති තෙමේ ද අන්‍ය වූ
62 මහ සනා තොමෝ ද (යන මොව්හු) ආවා වූ පස මිතුරු සෙන් මරා තුමු
පෙරලා රජු කරා අවුය.

අකුරල් ගඟ සමීපයෙහි විසූ වීර පුරුෂයෝ හෙය පැන සක්කුණ්ඩ
63 නම් ආරාමයට වැද එකෙණෙහි යුද කොට බොහෝ වු යෝධයන්
ජීවිතක්ෂයට පමුණුවා ඒ දෙසින් පස මිතුරන්ගේ පෙරළා ආගමනයෙහි
64 ආසා සුන් කොළෝ ය.

65 ඉක්බිත්තෙන් විල්ගම් තොට විසූ සංඛනායක නාථ නම් සේනාපති
තෙමේ එතැනින් යුද කරණට ආවා වූ සතුරු රජ සෙන් බිඳ තෙමේ
66 ගඟින් එතරව පැන්මඩු නම් ගමෙහි මහත් වූ සතුරු සෙන් නසා විසූ
67 තැනට පෙරළා ආයේ ය. එසේ ම සමීතොට යොදන ලද මහාසේනා
68 තොමෝ ඒ දෙසින් යුද කරණු පිණිස ආවා වූ සතුරු සෙන් වහා මරා
69 නැවත එනු කැමති බැව් බැහර කළා ය. සුළුනා තොට සිටි බොහෝ

Non-Commercial Distribution

70 වූ රාජ සේනා තොමෝ ඒ දෙසින් සන්නද්ධ වූ සන්නහායුධ ඇතිව
පැමිණි බොහෝ වූ පස මිතුරු රජ සෙන් නිරවශේෂ කොට වැනසී ය.
බුරුද ගොඩ ද දණ්ඩනායක දෙබෑයෝ ඒ දෙසින් පැමිණි සතුරු සේනාව
71 බින්දා හ. නිකවැලි තොට ආරක්ෂාකාරී වූ රක්ෂ නම් මහාවීර වූ
අධිකාරිතෙමේ සියලු බිය ඉක්ම වූයේ දෙමසක් නිත්‍යාරබ්ධ වූ මහ යුද
72 පවත්වා එතැනින් එතෙර වෙන්ට පැමිණි මහත් වූ සෙන් මූලොච්ඡින්න
කෙළේ ය,

73 එසේ ම කඩක්කුඩය යි ප්‍රසිද්ධ වූ ලංකාපුර නම් වූ මහාවීර
74 තෙමේ වැදිගම පවත්වන ලද මහ යුද ඇත්තේ සතුරන්ගේ මහත්
බළසෙන් සමූලඝාතනයෙන් මරවා බලවත් වූ මහෝත්සාහ ඇත්තේ
පස මිතුරු සේනාව නිරුත්සාහ කොට බින්දේ ය. බිල්පත්කඩ සිටි
75 ආරක්ඛක සංඝනායක තෙමේ එතැනින් යුද පිණිස පැමිණියා වූ සතුරු
සෙන් බින්දේ ය. තොටගමුවෙහි රැකවරණ පිණිස යොදන ලද්දා වූ
76 මහසෙන් ඇති ඇමතියෙක් තෙම එතැනින් යුද පිණිස ආවා වූ රජ
77 සෙන් පටන් ගන්නා ලද මහා යුද්ධ ප්‍රයන්ත ඇත්තේ අතිශයින් දරුණු
වූ යුද කොට නැවත යුද්ධයෙහි උත්සාහ රහිත කොට පැලවී ය.

78 නන්දිගම් නියුක්ත වූ බලවත් වූ එක් සේනාධිපතියෙක් තෙම
කරණ ලද මහ යුද ඇත්තේ එතැනින් පැමිණියා වූ මහා සේනාව භේද
79 කළේ ය, ඉක්බිති හෙදිකඩ නම් ගම සිටි දේව සේනාධිපති තෙමේ
සන්නද්ධ වූ සේනාවාහන ඇතිව මහ සේනා සමූහයා සමග මහින්ද
80 කුමාරයා යුද කරණු පිණිස පැමිණි කල්හි උහු හා සමග සිවුවරක් යුද
81 කොට හෙතෙම යුද්ධාංගනය ශත්‍රු යෝධයන්ගේ ඇටසැකිල්ලෙන් පූර්ණ
82 කොට නොපිරිහුන් සේනා වාහන ඇත්තේ කුමාරයා හීනාංග කොට
සෙනග සමග පලා යන්නා පස්සේ ලුහුබැඳ ගොස් එකෙණෙහි බෙල්ගමු
83 නම් තොටට පැමිණියේ ය. ඉක්බිති එහි දෙමසක් භයානක යුද්ධ වූයේ
84 ය. සෙනෙවි තෙම එහි සිටියේ ම සතුරු සේනාව පැලැවූයේ ය. මල්
85 ගමුව නම් තොට සිටි සාමන්තාධිපති තෙම දස වරක් පටන් ගන්නා
ලද මහ යුද සැණකෙළි ඇත්තේ එතැනින් ගංගාතරණයට පැමිණ බලවත්
86 වූ පස මිතුරු සේනාව උදාවන හිරු අඳුරු කඳ සෙයින් බිඳ හැරියේ ය.

ගොලබාහ නම් තොට ආරක්ෂා පිණිස යොදන ලද්දා වූ මහත්
බලපරාක්‍රම ඇති එක් සාමන්ත ප්‍රධානයෙක් තෙම යුද කරණු පිණිස
87 එතැනින් ආවා වූ සමාන්තයන් සහිත වූ සතුරු කේසර සිංහයෙක් මුව
88 රැළක් පරිද්දෙන් යුද්ධයෙහි දී පලවා වීය. දීපාලය ය ප්‍රසිද්ධ කොට
89 යොදන ලද්දා වූ සෙන් ඇති එක් සාමන්තයෙක් තෙම එතැනින් ආවා
වූ (සතුරු) සෙන් යුදෙ හි දී බිඳ හැරියේ ය.

Non-Commercial Distribution

90 මෙසේ යුද පවත්නා කල්හි ම රාජ සමූහ නායක වූ භීම පරාක්‍රම
91 ඇති පරාක්‍රම බාහු මහ රජ තෙමේ "යුදයෙහි මෙතැනින් බුන්
මානාභරණ රජහට රුහුණ ද පිහිටක් නොදෙන්නෙමි" යි සිතා
මානියමුවා රට ද පස් යොදුන් රට ද සිටි වේවිලය ලෝකය යන
92 කෙස්දානාවන් දෙදෙනා හා අරක්කම්නාවන් ද එසේ ම සන්නාහ
නායකයන් ද (කැඳවා) යුදයෙහි බැඳි සිත් ඇත්තේ රුහුණු යන්ට නියෝග
93 කෙළේ ය. චතුර වූ ඔව්හු ද ඒ (එ මහ රජාණන්) නියෝගයෙන් සක්
94 දෙව් රජහු නියොවින් සතර වරම් මහ රජ දරුවන් මෙන් එයින් නික්මුණා
95 හ. ඉක්බිත්තෙන් ඔව්හු නව යොදුන් නම් රටට පැමිණ එහි සිටි මහත්
96 පසමිතුරු සෙන් සමග විසි වරක් මහ යුද සැණකෙළි කොට මහා
සේනා මරවා නව යොදුන් රට ගෙණ එතැනින් නික්ම කළුපහන් බඩට
97 පැමිණ එහි සිටි සෙන් සමග ද මහ යුද විස්සක් කොට ඒ රට ද
98 හස්තප්‍රාප්ත කොට නික්ම එසේම මත්තෙහි ගියාහු ඔව්හු දී ගැලි මහකෙත
99 ගත්හ. ඒ මාණාභරණ නරේන්ද්‍ර තෙම එපවත් අසා ස්වකීය සේනාව
100 දෙකක් කොට බෙදා කොටසක් එහි යැවී ය.

ඉක්බිත්තෙන් එක් කලෙක අනුරාධපුරය රක්නා දුරබුද්ධි වූ
101 නාරායණ නම් දණ්ඩනායක මහාමාත්‍ය තෙම "මේ රට අත් පත් කොට
කොටුවක් පිහිටුවා රජුන්ට නො වසඟ ව වසන්නෙමි" යි සිතුයේ ය.
වීර වූ පරාක්‍රමබාහු නරේශ්වර තෙම එපවත් අසා "උහු මුල් ඇති වන
102 නො දී නිර්මූලනය කෙරෙමි" යි සිතා යුහුව ඡත්‍රග්‍රාහක නායකයන්
යැවී ය. ඒ මහාභාත්‍ය තෙමේ ද මුවෙකු වෙත හෝ කුඩා ඇතෙකු
103 වෙත යන සිංහයකු සේ අසම වික්‍රම ඇතිව ගොස් උහු හා සමග මහ
104 යුද කොට සෙන් සහ උහු නසා රට නිෂ්කණ්ටක කෙළේ ය. එකල
හාත්පස ප්‍රසිද්ධ තීර්ථයන් රකුසන් රැකවරණ කොට සිටි සේ
105 මහාරජාණන් ගේ මහ ඇමතියන් රැකවරණ කොට සිටිත්ම ඒ තීර්ථයන්
උත්තරණය කරන්ට අසමර්ත වූ මාණාභරණ රජ තෙම තමා වසඟ වූ
106 රජ රට වැසියන් විසින් කියන ලද අප්‍රසිද්ධ වූ එක් තොටකින් මෙතෙර
විය. ඉක්බිත්තෙන් පැරකුම්බා රජ තෙම එපවත් අසා ගං තොට දී
107 සෙන් සහිත වූ උහු නිර්මූලනය කරණට සිතා මොනරාගල් නම්
ස්ථානයෙහි දුර්ගයක් පිහිටුවා යුද කරණු පිණිස බොහෝ වූ භටයන්
108 විසින් පිරිවරණ ලද්දා වූ උදාරතර පරාක්‍රම ඇති බොහෝ සේනා වාහන
ඇති රක්ඛාධිකාරි නම් අමාත්‍යයා යැවූයේ ය. ඒ රක්ඛාධිකාරි අමාත්‍ය
109 තෙම තමා කෙරෙහි වෛරීහු දේව නම් සේනානායකයන් විසින් පවත්
වන ලද මහ යුද්ධයෙක්හි පහන් සිත් ඇත්තා වූ කෙළිහි ගුණ දන්නා
110 පැරකුම්බා රජහු විසින් දෙන ලද ඒ මහා ප්‍රසාදය මහා ඊර්ෂ්‍යායාවෙන්

Non-Commercial Distribution

නො ඉවසන්නේ මහ රජාණන් කෙරෙහි කල කිරුණා වූ ඒ තෙමේ
111 යුද්ධයෙහි ආදර සහිත නො වී ය. ඊෂ්‍යාර්ජ්වර ඇති මන්දබුද්ධි හේ
112 තෙමේ අලස වූයේ උත්සාහ නො කෙරේ. එකල්හි ගජබාහු
නරෙන්ද්‍රයන්ගේ සාමන්ත වූ අසත් පුරුෂයෙක් පරාක්‍රමබාහු නරෙන්ද්‍රයන්
113 කෙරෙන් ලත් අභය ඇත්තේ උහු සමග ගියේ උහුගේ භාවය
114 ස්වභාවයෙන් දැන ප්‍රථම කොට ම මාණාභරණ නරෙන්ද්‍රයන් හා කරණ
ලද මන්ත්‍රණය ද ඇත්තේ දුර්ගාරම්භයෙන් පළමු කොට වහාම එන්ට
115 මාණාභරණ රජු වෙත යුහුවම හසුනක් යැවී ය.

මාණාභරණ නරේන්ද්‍ර තෙම එපවත් අසා ස්වකීය සේනාව ඒ ඒ
තන්හි මහ යුදයෙහි යෙදූයේ යත ඉක්බිත්තෙන් පැමිණි මහින්ද නම් වූ
116 කුමාර තෙම දේවසේනා නායකයන්ගේ සාමන්තාමාත්‍යයන් හා වැල්
117 තොටදී යුද කෙළේ ය. බලවත් වූ ඒ ඇමතියෝ ද ඒ කෲර යුදයෙහි
බොහෝ මරුමුවට පමුණුවා ක්ෂණයකින් කුමාරයා දුර්වල කොට පැරද
118 වූහ. මාණාභරණ රජ තෙමේ රක්ඛාධිකාරි නම් මහාමාතයන් කඩුවෙන්
කඩුව ගැහැටීමෙන් හටගත් ගිනිපුපුරු ඇති මහ යුද කෙළේ ය. ඒ
119 යුදයෙහි උභය පක්ෂගත වූ බොහෝ මහා යෝධයෝ නැසුනෝ ය.
120 ඉක්බිත්තෙන් රක්ඛාධිකාරි නම් අමාත්‍යයාගේ පිරිස් තොමෝ බිඳුනා
ය. ඉක්බිත්තෙන් (රක්ඛාධිකාරි) තෙම හුදකලාව ම සියතින් යුද කොට
121 බොහෝ භටයන් මරුමුවට පමුණුවා එහිම තෙමේත් මෙළේ ය.
ඉක්බිත්තෙන් භයානක වූ පරාක්‍රම ඇති පරාක්‍රමබාහු නරේන්ද්‍ර තෙම
122 එපවත් අසා සිනා සහිත වූ මුව පියුම් ඇත්තේ "මා ජීවත් වන කල්හි
ජීවත්වන්නා වූ හෝ මැරුණා වූ හෝ ඔවුන් ගෙන් කවර ප්‍රයෝජන ද?
123 සිංහ තෙම ඇත්කුම්භ පැළීමෙහි යහළුවෙක් පතන්නේ නොවේ. යුද්ධාශාව
භජනය කරන්නා වූ බාහුයුගලයාගේ බොහෝ කල් උත්සන්න වූ
124 මනෝරථය දැන් මම පුරවන්නෙමි. මිථ්‍යාචාරයෙහි තත්පර අනේක
රජුන් හා සංසර්ගයෙන් කිලිටි වූ මේ පෘථිවි (කාන්තාව) සතුරන් සිරුරු
ලෙහෙදියෙන් නහවා සංග්‍රාමයෙන් පවිත්‍ර කළ ඇසිල්ලෙකින්
125 පාණිග්‍රහණය කරන්නෙමි. (ඕ තොමෝ) මා වැනි වීරයන්ගේ වැජඹීමෙහි
126 එක් ශාලාවෙක් වේ. සැම කල්හි පස මිතුරු අඳුරු කඳු නැසීමෙහි හිරු
වැනි වූ මට පෙනෙහෙල්ලෙකින් සෙයින් අන් බලයකින් කුමන වැඩෙක්
ද? මෙසේ සිතා පස මිතුරු සෙන් නැමති මහ මුහුදෙහි පස්වෙනි හිරු
127 මඬල වැනි වූ හෙතෙම යුදාධාංගනයට ආයේ ය. පැමිණ ද නොයෙක්
128 ගඳඹ අඟනන් විසින් ගයන ගී අසමින් ගී රස දනන්ගෙන් පූර්වගාමී වූ
129 යේ රසය ද විඳිමින් සිටියේ ය.

Non-Commercial Distribution

130 එකල බුන් මහසෙන් පසුව ලුහුබැඳ ආවා වූ මිහිපල් සහිත වූ පස මිතුරු සෙන් ඉදිරියට පැරකුම් මහරජාණන් මහ ඇමතියෝ දිව
131 ගොස් ඩෙබරවැල් නම් ගමේ දී බිහිසුණු යුද පවත්වා ජයගත් මහසෙන් බුන් කළ ඔව්හු මහ යුද කොට ලද අවි පහර ඇති වත් බොහෝ වූ
132 හටයන් මරා එකල විසිරෙමින් සිට රටට අභිමුඛව නැවැත්තෝ ය. එකල පස මිතුරු මහසෙන් තොමෝ දියුණු වූ උත්සාහ ඇති විය.
133 එකල්හි ලත් පහරැති ඔවුන් වෙදුන් කෙරෙහි පත් කොට පලා යන්නා වූ
134 මහසෙන් ලිලාවෙන් යුක්තව සිනා පහළ කෙරෙමින් බලා යානය
135 උසුලන්නාවුන්ට නවතින්ට කියන්නා වූ ඇමතියන්ට බැම බිඳුමෙන් කුටිල වූ බැලුම් පහළ කරමින් ඔවුන් නවත්වා යානය උසුලන්නවුන්ට
136 යවා තෙමේ පසමිතුරු සෙනගට අභිමුඛ වූයේ වීර ශ්‍රී සංගම නමැති
137 මංගලය කරවනු පිණිස දක්ෂ වූ ඛඩ්ගලතා නමැති දුතිය යුද්ධමාලකයට
138 යවනු පිණිස මහා වීරතෙම යුද සැණකෙළි කරුණු කැමැත්තේ "මට සිංහල කඩුවක් දෙව "යි ස්වකීය හස්තායුධ පාලනය කරණ සේවකයාහට කීයේ ය. නොදන්නා වූ උහු විසින් ජම්බුද්වීප පාටව නම් වූ කඩුවක් සිංහල කඩුවෙන් කියා ගෙණා කල්හි "මේ කඩුව සිංහල පටුත්වය ඇත්තක් නොවෙයි, ජම්බුද්වීපයෙහි සකල ශත්‍රුරාජකුලයන් නසන්නා
139 වූ මෙය තබා වහා සිංහල පටුත්වය ඇත්තක් ගෙණව" යි කියා බිය එලවන්නා වූ සිංහල පටුත්වය ඇති කඩුවක් ගෙණා කල්හි නැවත සතුරන් නමැති ඇතුන් බැඳීමෙහි තරුණ හස්තියෙක් වැනි ගර්ව සහිත
140 වූ ඒ රජ තෙම "මා අත ආයුධ ගන්නටවත් සමර්ථවයෙක් සිංහල
141 ද්වීපයෙහි නැතැ" යි නියම කොට සිතා තමන් වෙත සිටී රක්ඛ නම් කේශධාතු නායකාමාත්‍යයාගේ නාථනගර ගිරි නම් අමාත්‍යයාගේ ද
142 මුහුණ බැලුයේ ය. ඒ දෙදෙනම එකල්හි මහ රජාණන්ගේ ඉඟි දන සිංහ සමාන පරාක්‍රම ඇත්තාහු මහසෙන් මැදට වන්හ. යුද්ධාංගන
143 මධ්‍යගත වූ අසාමාන ඇත්තා වූ ඒ දෙදෙන පස මිතුරු සේනාවට දහස්
144 ගණන්ව වැටහුනෝ කඩු පහරින් දෙබෑ කරණ ලද සතුරු සිරුරෙන්
145 බිය එලවන්නා වූ මහ යුද දහවල් පටන් රෑ වෙන තෙක් පැවැත් වූහ.

146 ඉක්බිත්තෙන් මහාමාත්‍යයෝ බඳින ලද ඇඳිලි ඇතිව කීපදෙනෙක් සිටියම් හ. මෙපණක්වත් මහ යුද කරන්මෝ වීරශ්‍රිය පරාංමුඛ නො
147 කෙළෙමු. යුද්ධ දර්ශනයෙන් බියපත් වූ සෙයින් සූර්‍ය්‍ය තෙම අස්ත
148 පර්වතයෙහි සැඟවිණ. පොළොන්නරුවට ගොස් (හිඳ) පහන් වූ කල
149 ශත්‍රු මර්දනය කරන්නෙමු. මේ සංග්‍රාමයට අකල්‍ය" යි මහරජාණන්ට සැලකළාහු ය. රජ තෙමේ ඒ විධිය අසා රාත්‍රිය එහිම ගෙවා පහන් වූ
150 කල යුද පටන් ගනු කැමති බැවින් නො පිළි ගත. එකල්හි බිය රහිත වූ රජ තෙම මොහොතක් කල් නිද්‍රෝපගත විය. මේ අතර අමාත්‍යයෝ

Non-Commercial Distribution

151 ඒ මහරජාණන් මධ්‍යම රාත්‍රියෙහි පංච විහාරයට පැමින කල්හි පිබිදියා
152 වූ ඒ රජ තෙම "මේ ස්ථානය කිනම් ද?" යි (උසුලා යන්නන්) විචාළේ
153 ය. නරේශ්‍රෙෂ්ඨ තෙමේ ඔවුන් අතින් "පස් වෙහෙරය" යි අසා
නිද්‍රෝපගත වූ මා මෙහි ගෙණ එන්නා වූ තොප විසින් කරණ ලද්දේ
අයුක්ත ය" යි කිපී පිරි වරනී එකෙකුදු අවශේෂ නොකොට ගෙණ යනු
154 කැමැතිව එහි සිටියේ පංචමහා ශබ්දයෙන් හා ශංකයන්ගේ නාදයෙන්
155 ගම ආකුල කොට තෙමේ පසු වී අලුයම් සමීප කාලයෙහි
පොළොන්නරුවට සම්ප්‍රාප්ත වූයේ ය.

156 ඉක්බිත්තෙන් බිල් නම් තොට මහසෙන් විසින් පෙරටු කරණ
157 ලද් දේවසේනානායක කීර්ති අධිකාරිය යන දෙදෙන ඒ දෙසින් ආවාවූ
158 නාථ අධිකාරිය මිහිඳු කුමාරය සූබ සේනා පතිය නාථලංකාගිරිය යනාදි
159 සෙන් සහිතව යුදපත් වූවන් සමග නිරන්තර ශරවෂීා වස්වා බොහෝ වූ
යෝධයන් හා සූබ සේනා නායකයන් ද එසේම නාථලංකාගිරි නම්
160 අමාත්‍යයා ද ජීවිතක්ෂයට පමුණුවා ඉක්බිති සෙනඟ සහිතව පලා යන්නා
161 වූ නාථ අධිකාරීන් ද මිහිඳු කුමාරයන් ද පසු පස්සෙහි ලුහු බැඳ ඔවුන්
රට මැද වන් කල්හි "රට වැස්සන් සහිත වූ සියලු පස මිතුරු සේනා
162 තොමෝ හාත් පසින් මාර්ගය දුර්ගමකොට වටලාගත්තැ" යි ශත්‍රුමර්දනකාරී
163 වූ එක වික්‍රමයෙන් මඩනා ලද පොළෝ තල ඇත්තා වූ පරාක්‍රමබාහු
නරෙශ්වර තෙම ස්වකීය වංශයට ශ්‍රේෂ්ඨ වූ සූයෘීයා උදා වූ කල්හි අසා
බලාත්කාරය ඒක රස කොට ඇත්තේ එකල්හි ඔවුන් මුදාගන්නා පිණිස
යන්ට ආරම්භ කෙළේ ය. එකල්හි එහි සිටි මහා මාත්‍යයෝ යුද්ධයෙහි
164 හටගත් උත්සාහ ඇත්තා වූ මහී පාලනයක් නවත්වනු පිණිස දොහොත්
මුදන් දී "නරේශ්වරයන් වහන්ස, නුඹ වහන්සේ ගේ ඉක්මවිය නො
165 හැක්කා වූ තේජෝ විශේෂය හැර අන්‍ය වූ කිසි බලයක් අපට නැත්තේ
ය. සියලු රට වැස්සෝ ද පස මිතුරන් වසඟ වූ හ. මෙතැනින් නැදමුල්
166 නම් ස්ථානයට ගොස් ඉක්බිත්තෙන් යුද්ධ කරණු පිණිස යා යුතුය"(කියා)
මේ ආදී ව්‍යාජ වචනයෙන් නරෙශ්වරයන් නවත්වා එතැනින් නික්ම
167 නරෙන්ද්‍රයන් සහිත වූවෝ මගට පිළිපන්හ.

168 නැදමුල් නම් ස්ථාන සමීපයෙහි සිටි රට වැසි වූ පිරිස් තොමෝ
169 එන්නා වූ ස්වල්ප වූ පිරිවර ඇති භූපාලයන් දැක හාත්පසින් ශරවර්ෂා
170 වස්වන්ට පටන් ගත්තී ය. ඉක්බිත්තෙන් මිහිපල් තෙමේ කරවාළගිරි
171 නම් සාථවෙහි සිට වීර යයි සම්මත වූ ඇමතියන් කීපදෙනෙක් එතැනින්
යවා ඒ සෙනග ද යුද්ධාශා රහිත කරවා පිරිවර පෙරටු කොට තෙමේ
172 පසුව යෙමින් මහා වීර වූ මිහිපාල තෙම දඹකොළ නම් ස්ථානයට
173 සම්ප්‍රාප්ත වූයේ ය. එතැනින් නික්ම දේව නම් සේනාපතීන් මුදා

Non-Commercial Distribution

ගන්නා පිණිස වඩනේ නවගමුපුර නම් ස්ථානයට සම්ප්‍රාප්ත වූයේ ය.
173 එකල්හි දේවසේනාපති තෙමේ ද කීර්ති නම් අධිකාරි තෙමේ ද
මහරජාණන් විසින් වදාරණ ලද්දා වූ උපදෙස් වරදවා සෙන් සමඟ
174 ක්ලාන්ත වූවෝ තමන් ඒ යුද්ධය හැර සුරුළු නම් ගම පසමිතුරන්
175 වසඟ බවට පත්ව තමන් රක්නා පිණිස මහීපාලයන් පැමිණෙන්නා දැන
නවතනු කැමැති සිත් ඇතිව මේ (මතු කියන) පරිද්දෙන් හස්නක් යැවූහ.

176 "අපි මෙහි මහරට මැද පසමිතුරන් වසඟවූවම්හ. ස්වාමීන් ගේ
ද වික්‍රම විශේෂය විනා බලසෙන් නැත්තේ ය. පරාං මුඛවූ රට වැස්සෝ
177 ද වෛරීන් පක්ෂවූහ. අත්‍යනෙතාදාර තේජස් ඇත්තා වූ ස්වාමීන්
178 (ජීවමානව) වැඩ සිටි කල සාගරය කුණ්ඩලාභරණ කොට ඇත්තා වූ
පොළොව එක්සත් කොට ලොකශාසාභිවෘද්ධි විධානයෙහි සැක නැත්තේ
ය. නුඹ වහන්සේගේ පාදපද්ම දර්ශාස්වාදයට හේතු වූ එබඳු භාග්‍යයක්
179 අප කෙරෙහි ඇත්තේ නම් ඒ අපි මිදෙන්නෙමු. (බ්‍රහ්මණාදී) වංශයන්ම
ද ශ්‍රෙණියන් ද පාලනය කරන්නා වූ නුඹ වහන්සේලා මෙහි පැමිණෙන්නා
180 වූ නිශ්චයෙන් විරතව නවතින්වා"යි

දීඝීදර්ශී මහා ප්‍රාඥ වූ මහරජ තෙම ඒ අසා එහි තමන් යාමෙන්
181 පළමු (වන්නා වූ) විනාසය දැන දොහොත් මුදුන් කළ සියලු ම ඇමතියන්
182 විසින් යාඥා කරණ ලද්දේ නැවතී වික්‍රම නම් පුරයට ප්‍රාප්ත වූයේ ය.

එකල්හි "සමගි වූ සෙන් ඇති මාණාභරණ නම් මිහිපති තෙම
183 පොළොන්නරුවට අවුත් නැවත එතැනින් නික්ම ගිරිතලා නම් ස්ථානයට
184 සම්ප්‍රාප්ත වූයේ ය." යන මේ ආදි වූ වෘත්තාන්තය තත් වූ පරිද්දෙන්
මහාමාත්‍යයෝ දැන එය ඇසූ පරිද්දෙන් තත්වය රජහට සැලකොට ඒ ඒ
185 තැන මහයුදෙහි සේනා නට බව ද සැලකොට "ඉක්බිත්තෙන් පැරකුම්
186 නුවරට හෝ කැළණිගමට හෝ පැමිණ සෙනග සමගි කොට නැවත
187 යුද කරණට වටනේ ය"යි සැළකළහ. රාජමෘගෙන්ද්‍ර තෙම ඒ අසා බැම
බිඳපියන පමණ දුමින් දත යුතු වූ කෝපාග්නි ඇති බැවින් "යම් කෙනෙක්
188 බියපත් වූ ද ඔවුන් ගෙන් අපට ප්‍රයෝජනයක් නැත්තේ ය. ඔවුහු
189 වනාහි රිසිසේ යෙත්වා, මා වැන්නෝ බාහුවෙන් මඩනා ලද මහා
සේනා ඇත්තෝ ය. මා සිටි කල මාගේ රාජ්‍ය සීමාව පැන එන්ට තුන්
ලොවෙහි ශක්‍රයා ආදි කොට සමතෙක් නො දකිමි. සිංහයෙකු විසින්
190 අධිපතිව රක්නා ලද ගුහාවට වදනට හස්ති රාජයෙක් සමත්ව නොවන
191 පරිද්දෙන් මා විසින් අධිෂ්ඨිත වූ රාජ්‍යයට පැමිණෙන්නට සමර්ථ වූ
පස මිතුරු රජෙක් නැත්තේ ය. මාගේ දෘෂ්ටිපාතයෙන් කවරෙක් නම්
192 වීර නොවේ ද? මාකැමති කල්හි කිරිබොන දරුවෝ ද යුද කෙරෙති.

Non-Commercial Distribution

193 දෙතුන් මසකින්ම මාණාභරණ මිහිපල්හු රජ රට තබා සිට රට ද ඉන්
නො දෙමි. සියල්ලෙන් ශූන්‍ය වූ මෙ බඳු තන්හි මා වැනි වීර පුරුෂයන්ගේ
බාහු වික්‍රම සම්පත් තොමෝ ද ෘශ්‍යමාන වේ." හේ තෙමේ මෙ පරිදදෙන්
194 වීර රසයෙන් යුක්ත වූ අලංකාර සහිත වූ වචන පහළ කෙරෙමින්
උත්සාහ රහිත වූ එවුන් මහෝත්සාහ ඇති කොට ඉක්බිත්තෙන් ක්‍රම
195 දක්ෂවූයේ රක්ඛ නම් අදිකාරීන් ද ආදිපුස්තකී නම් සාමන්තයා ද මගලබ
නම් ගම සිටිනා පිණිස යැවූයේ ය. විධි දන්නේ මහා යසස් ඇත්තේ
196 තනතුරු ලැබීමට යෝග්‍ය වූවන්ට තනතුරු දී ඉක්බිති රක්ඛ නම් වූ
197 මහාලේඛාමාත්‍යය මන්දි ජීවිත පුස්තකී අමාත්‍ය සංඛධාතුය කීර්තිය
198 යන දණ්ඩ නායකාමාත්‍ය වූ කළා වැව හා එක්බඩ වූ මහා ජනපදයන්
199 ගන්නා පිණිස පිලවීටියට යැවූයේ ය. එසේ ම මහත් බල හා අත්‍යුදාර
පරාක්‍රම උඩවැච්හි තැබූයේ ය. මෙසේ නොයෙක් දෙසින් මහ යුද
පවත් වන පිණිස සාමන්තයන් සහිත වූ සහා සේනාව ඒ ඒ තැන
200 යෙදූයේ ය. එකල්හි මාණාභරණ නරේන්ද්‍රයන් නියෝගයෙන් දනච්
නම් ස්ථානයෙහි යුද කරණ පිණිස ආවා වූ මන්දි නම් මහා ලේඛකයන්
201 ඒ දනච්චෙහි සිටියා වූ යුධ ක්‍රීඩායෙහි බිය රහිත වූ සේනා තොමෝ යුද
කොට අනාගත යුධෙහි හින්න වූ උත්සාහ ඇති කොට පලවාපී ය. ඒ
202 සේනාතොමෝ සතතයෙන් පවත්වන ලද නොයෙක් මහා කල්‍යාණ
කම් රාශී ඇති දෙව් රජහු සෙයින් නොයෙක් ක්‍රීඩා විනෝදය විඳිමින්
203 නාලන්දාවෙහි වාසය කරන්නා වූ පරාක්‍රම බාහු නරෙන්ද්‍රයන්ට එපවත්
තත් වූ පරිද්දෙන් කියා යැවී ය.
204

ඉක්බිත්තෙන් පිලවීටියෙහි සිටු වනලද්දා වූ රක්ඛ නම් මහා
205 ලේඛකයන් ප්‍රමුඛ කොට ඇත්තාහු සමාන්තාධිපතිහු ද කලා වැව විසූ
206 බුධනාධ මහාලානදේව නම් සේනාපතියා කෙරෙහි (විරුද්ධව) අට දිනක්
2007 ඉතා බිසුණු වූ යුද පවත්වා එකෙණෙහි බොහෝ වූ යෝධයන් මරා
208 බොහෝ යෝධයන් පලවා වහාම කළා වැව නිෂ්කණ්ටක කොට අත්පත්
209 කොට ටගෙ ණ පරාක්‍රමබාහු නරනිඳුහුගේ නියෝගය අනුව ක්‍රියා
210 කෙරෙමින් එහිම බලකොටුවක් කොට සෙන් සමග විසූ හ. උඩු වැව
යොදන ලද්දා න්‍යග්‍රොධ මාරාගිරි නම් අමාත්‍ය තෙම තුන් වරක් යුද
211 කොට සතුරු සෙන් බිඳ තනරුය යි ප්‍රසිද්ධ වූ ගම ආරාමයක් බළ
කොටු කොට මහා රජාණන් නියෝගයෙන් සෙන් සමග හුන්නේ ය.

මාණාභරණ මහීපාල තෙම එකල්හි මිහිඳු කුමරහට තනතුරු ද
212 බොහෝ වූ රට ද දී "තෙපි මහතේ ඇතිව මොනර වැව රටට අභිමුඛව
213 ගොස් දකුණු පස ගන්නා පිණිස අනුරාධ පුරවරෙයෙහි හිඳුව. මම ද
214 බුත්ගමුවට අභිමුඛව යනු පිණිස දලුවලට යෙමි" යි කියා මහසෙන් දී

Non-Commercial Distribution

215 පළමු කොට උහු රම්‍ය වූ අනුරාධපුරයට යවා නැවත තෙමේ එහි රජ
216 රටම හුන්නේ ය. මිහිඳු කුමරහු මහසෙනඟ සමග අනුරාධපුරය බලා
ගිය බැව් කළා වැව නියුක්ත වූ මහ රජාණන්ගේ මහාමාත්‍යවෝ අසා
මුල් හටගනු නො දී පළමු කොටම නිර්මූලනය පිණිස එහි රක්ඛ නම්
217 මහා ලේඛකයන් ද කීර්ති බණ්ඩාර පුස්තකී අමාත්‍යයන් ද රක්ෂනයෙහි
218 යොදා ඔව්හු සෛවරිව බළවාහන සහිතව කළා වැවින් නික්ම කාණමූල
219 නම් වූ ස්ථානයටගොස් පළ කොටු බැඳ කැටිව උන්හ. නො බිඳිය
220 හැකි උපායෙහි දක්ෂ වූ පරීක්ෂාකාරී වූ පැරකුම්බා මහරජ තෙම ඒ
221 විධාන අසා පරීක්ෂා කොට "දේශ විශේෂ දැනීමෙහි අදක්ෂ වූ තෙපි
මගේ අවවාදයෙන් තොරව රට මැද වැද යුද කරණට නොයව්" කියා
222 මෙපරිද්දෙන් දීඝීදර්ශි මහා ප්‍රාඥවූයේ ශක්‍රයාගේ ගමනේ හසුන් ඇත්තේ
ඔවුන්ට හස්නක් යැවූයේ ය. එහි යුහුසුළු වූ දූර්බුද්ධි වූ ඔව්හු රජහුගේ
223 ඒ හස්න වරදවා "අනුරාධපුරය වහා ගණුම්හ" යි (ගියහ.) නරෙන්ද්‍රයන්
ගේ ඒ හසුන් පිළිබඳ ප්‍රයෝජනය තමන් නොලබන්නා වූ ඔවුන් අතුරෙන්
කාරණාකාරණායෙහි දක්ෂ නො වූ පින් මද ජනයෝ කටුවන්දු නමින්
224 ප්‍රසිද්ධ වූ ස්ථානයට උපාය රහිතව නරෙන්ද්‍රයන්ගේ හස්න පැනීමෙහි
ඵලය විඳිනු කැමැත්තන්සේ පැමිණියෝ ය. මහ රට මැද ඒ ඒ තන්හි
225 දුශ්චරිත කාරී වූ එහි පිවිසි ඔවුන්ගේ පිරිස විකීණී විය. ඉක්බිත්තෙන්
226 මහින්ද නම් කුමාර තෙම ඒ විධානය දැන (මන්ත්‍රීන් හා මන්ත්‍රණය
කොට) සෙන් පිරිවරා ඔවුන් හා යුද කරණට පටන් ගත්තේ ය.

227 එහි සේනා සාමග්‍රීය විකල වූ බැවින් මහින්ද නම් කුමාර තෙම
යුද්ධාංගනයෙහි ඒ සියලු සේනා බිඳ හැරියේ ය. ඒ යුද්ධයෙහි බිඳුනා
228 වූ ඒ සාමන්තයෝ වරදවන ලද මිහිපල් අස්න සිහි කරන්නන් මෙන්
229 නැවත කළා වැවට ආවෝ ය. (මහින්ද නම්) කුමාර තෙමේ ද නැවත
අනුරාධපුරයට පෙරළා ගොස් මහා බල ඇත්තේ කළා වැව ගන්නා
230 කැමැත්තෙන් වහා ම සිය රට වැසි සෙනග රැස් කොට යැවී ය. මහත්
231 ප්‍රඥා ඇත්තා වූ පෘථිවීශ්වර තෙම එ පවත් අසා යුහුව ම විරාග ස්වරූප
බොහෝ වූ සෙන් සමගි කොට භූත බණ්ඩාර පුස්තකී අමාත්‍යයා යැවූයේ
232 ය. ඒ සියලු වීරයෝ රැස්ව අතිශයින් දරුණු යුද්ධය තුන් මසක් මුළුල්ලේ
233 දවසක් දවසක් පාසා පැවැත්වූහ. චතුර වූ ඔව්හු නරේන්‍ද්‍රයන් අණ
දූෂණ නො කෙරෙමින් රළු යුද පවත්වන්නාවූ මහේන්‍ද්‍ර කුමාරයාගේ
234 චතුරංගනි සේනාව බින්දහ. ඒකාබද්ධවූ මහ රට ගෙණ රජහුගේ අවවාද
235 පුදමින් එහි කළා වැවම උන්හ. පෙර කියන ලද්දාවූ රාජාඥාව
උල්ලංගනය කළවුන් සමග කළාහු කුට යුද්ධයෙන් උද්දාම වූ කුමාර
236 තෙමේ ම සන්නද්ධ යුද්ධයට ආයේ ය. මොනරුවට නම් ස්ථානයෙහි
237 යොදන ලද්දාවූ එක් සාමන්තයෙක් තෙම දීඝීදර්ශී වූ නරේන්‍ද්‍රයන් අණ

Non-Commercial Distribution

බැහැර නොකෙරෙමින් ස්වකීය වූ පිරිස මග දෙපස යොදා අවශේෂ
නො ව ඇතුළට පිවිසියා වූ පසමිතුරු සෙන් සමග හාත්පසින් වටලා
238 භයානක වූ යුද්ධ කරන්නේ බොහෝ වූ සමන්තාධිපතීන් ජීවිතක්ෂයට
239 පමුණුවා කුමාරයා ද පලවා යුද්ධාංගනයෙහි මරණ ලද්දාවූ සතුරන්ගේ
බොහෝ වූ හිස් නරේන්ද්‍රයන් කරා යැවී ය.

240 ඉක්බිත්තෙන් (සතුරන්) බිය එලවන පරාක්‍රම ඇත්තාවූ ඒ
පරාක්‍රමබාහු නරේන්ද්‍රතෙම ඒ ඒ තැන යොදන ලද සෙනඟ රැස් කරවා
241 මාණාභරණ මහීපාලයන් රජ රටින් පලවා හරිනු පිණිස රක්ඛ නම් වූ
242 මහා ලේඛකයින් ද අජන නම් කර්මනායකයන් ද ක්‍යාන ගම යොදා
කීර්ති පුස්තකී අමාත්‍යයන් ද රක්ඛ නම් අදිකාරීන්ද මදංලබ නම් ගමට
යවා යව පර්වත දුර්ගයෙහි රාත්‍රි සංචාරයෙහි දක්ෂ වූ වැදිසොර ආදි
පිරිසක් ද යවා ඒ ඒ තැන මහ ජනයන් රෑ දෙවෙහි මරවමින් මැදිරියෙහි
244 බඳනා ලද පක්ෂින් මෙන් පොළොන්නරු වැස්සෝ බොහෝ කල් දහවල්ද
245 සියගෙයින් දොරට නික්මෙනු නොහැකිව දිය දර රැස්කරනු කැමැත්තෝ
දරින් කටයුතු සිදු කරණු පිණිස සියල්ල තෘණ රහිත කොට යම්සේ
ස්වකීය ස්වකීය වූ ගෙය නිරවශේෂ කොට සර්වප්‍රකාරයෙන් නසද්ද,
246 යම්සේත් නගරය සීමාන්තයෙහි ඒ ඒ තැන ආපාණයන්හි නානාප්‍රකාරවූ
247 වෙළඳාම් සර්වප්‍රකාරයෙන් සුන් වෙද්ද, පුරයට ප්‍රවිෂ්ට වන මාර්ගයෙහි
නරෙන්ද්‍රයන්ගේ නිරන්තර බඩ වූ කෝලාහලය උපන් කල්හි යම්සේ
248 මුළු නුවර කම්පිත වේ ද, එපරිද්දෙන් රාජාංගනය දක්වා නගරය
249 උපද්‍රවයෙන් යුක්ත කොට මාණාභරණ රජ හට මහත්වූ පීඩා කෙළේ
250 ය.

ඉක්බිති දැඩිසේ උපද්‍රව ඇතිවූ ඒ මාණාභරණ නරේන්ද්‍ර තෙම
සිතිවිල්ලෙන් පීඩිත වූ හෘදය ඇත්තේ "අදෝමය! ඉදින් අපි රුහුණු
251 (රට) බලා යන්නෙමු නම් එහි සිටි රජ රට වැස්සෝ පලායන්නාවූ අප
දුබල බැව් දන පරාක්‍රමබාහු භූපාලයන්ට පක්ෂපාතභාවය දක්වනු පිණිස
252 අපට එහි යාමට (අවකාස) නොදෙන්නාහුය, ඉදින් මෙහිම වසන්ට
යුතුයයි (සිතන්නෙමුද) දිවා රෑ මෙබඳු දුක් ඉවසන්නාවූ අපට හෙද
253 දුෂ්කර වන්නේය. පසමිතුරන් බිහිසුණු යුද පවත්වාම එයින් ලත් ඒ
254 සැප හෝ දුක අනුභව කරන්ට අපට යුතු වන්නේ ය" යි මෙපරිද්දෙන්
255 දැඩි කොට සිතී ය. හේ තෙමේ ස්වකීය මහත් චතුරංගිනි සේනාව
256 සන්නද්ධ කොට යුද්ධ පිණිස බඳනා ලද කැසපට ඇත්තේ දළුවලට
ගියේ ය. ඉක්බිත්තෙන් සිංහ පරාක්‍රම ඇත්තාවූ විමසා කටයුතු කරණ
257 ස්වභාව ඇත්තාවූ මහාප්‍රාඥවූ පරාක්‍රමබාහු නරේශ්වර තෙමේ ඒ සියලු
පිළිවෙළ අසා ලංකාපුර නම් අමාතයාද දණ්ඩනායක සහෝදර දෙදෙනා

Non-Commercial Distribution

258 ද ලොග්ගල නම් අමාත්‍යයා ද බොහෝ වූ යුද්දෝපාය උගන්වා ඒ
දෙසින් සම්ප්‍රාප්ත වූ ශත්‍රු සේනාව පරාංමුඛ කරුණු කැමැත්තේ
259 තුන්දෙසින් දවසක් පාසා උදාරතර වූ යුද්ද පවත්වමින් මාසයක් ගෙවූහ.

260 ඉක්බිත්තෙන් ඊට දිවුණක් ඛේදයට පත්වූ මාණාභරණ නරේන්ද්‍ර
261 තෙම "යුද්ධාර්ථව කඳවුර හැර ආවෙමු. ඒ මෙතැන්හි අපට අස්වැසීමෙක්
නැත්තේ ය. අපගේ බදමුල් ඇත්තාවූ දුකම ඒකාන්තයෙන් දිවා රෑ
262 නැවත නැවත වැඩීමට යේ. ඒ වෙතෙහි පැමිණි කැප හෝ දුක හෝ
263 අනුභව නොකොට මෙහි පැමිණි (අපට) ඉවසිය නොහැකිය. මෙබඳුවූ
දුක යුත්තේමය. නැවත එහිම හෝ යෙමුද? එය දන් ඉතා උගහටය. ඒ
264 ඒ තැන මහමග ශත්‍රුන්ගේ මහසෙන් සිටිත්ම අතිශයින් ගැහැටවූ
මෙතන්හි වාසය කරන්නට යුතු නොවේ. ඔබ මොබින් ප්‍රවිෂ්ටවූ
265 ශත්‍රුසේනා මධ්‍යයෙහි මෙහි බෙහෙවින් පුරුදු වූ මිනිසුන් විචාරණය
266 කොට ඔවුන් විසින් දක්වන ලද්දාවූ කිසි යම් අප්‍රසිද්ධ මාර්ගයකින්
යන්නෙමි" යි සිතා රටවැස්සන් පිළි විස ඔවුන් විසින් දක්වන ලද
267 මගින් කොඳුරුවා නම් ගමට ගියේය. ඉක්බිත්තෙන් රක්ඛ නම් අධිකාරි
තෙමේ ද මහරජාණන් අනුශාසනාවට බුහුමන් කරන්නේ මිහිරණ බිබිල
නම් ගම වෙසෙමින් ඇතුන් විසිනුදු සෙල්විය නොහැකිවූ හිඳි පලාශ්‍ර
268 සමානවූ කණු එකිනෙක සම්බන්ද කොට බිම කැණ සිටුවා ඉන් බැහැර
269 ප්‍රමාණයෙන් ඊට අධිකවූ යෂ්ටි වෙෂ්ටනයෙන් වෙළන ලද්දා වූ මහකණු
270 සිදුරු රහිත කොට සිටුවා යළිත් ඒ කණු (දෙවැට) මැද හාත්පස විසිතිස්
271 රියන් පුළුල්වූ ශතපුරුෂ ප්‍රමාණ ඇළ කණවා, එහි තියුණු උල් හා කටු
272 අතුට ඉන් බැහැර පෙදෙස ශුලපාදයන් සිටුවා ඒ හා බඩ සිදුරු රහිතවූ
273 කටුවැට කොට ඒ මැද පෙර පරිද්දෙන් අගල කණවා එහිදු හුල් පාගා
274 කටු අතුරුවා වැටෙන් පිට ද ජාලන්ත කොට අගල කණවා එහි ද
275 තියුණු උල් හා කටු අතුට ඇළෙන් පිටත ශරපාන දෙකක් තුණක්
පමණ තැන එක හෙළා මහවනය සිඳුවා ඉන් පිට චෞර මාර්ගයන්හි
276 මහා ආවාටයන් කැණ එහි අතුරු නැති සේ තියුණු කටු අතුට ඒ
277 ආවාටයන් හාත්පස වැලි හා පුරාණ පර්ණයෙන් වස්වා බලන්නන්ට යා
278 යුතුවූ මාර්ග සමාන කරවා ඒ මහ පැමිණි පසමිතුරු සෙන් නිරවශේෂ
කොට සන්වනු පිණිස හාත්පස සොරමං කරවා ඒ මාර්ගයන්හි
279 තීක්ෂණවෙධි වූ ධනුර්ධරයන් යොදවා දුර්ගය මැද සිටු මහල් පහයක්
280 කරවා ඒ මතුයෙහි ඒ ඒ තන්හි ධනුර්ධරයන් යොදවා ඉක්බිති පසමිතුරු
සෙන් අසල පත්කරණු පිණිස දුනු හා ක්ෂණවෙධි වූ ධනුර්ධරයන් දෙතුන්
දහසක් යවා සම්ප්‍රාප්ත වූ නොවැළකිය හැකි කුරිරු පසමිතුරු සෙන්
281 සබඳ වන්නා වූ ශරවර්ෂායෙන් බුන් ආකාරයෙන් මිථ්‍යා ප්‍රයෝග දක්වා
නැවතියන් පසුපස්සෙහි ලුහු බැඳ යම් තැනෙක (සතුරුසෙන්) ලඟට

Non-Commercial Distribution

පැමිණියාද (එතන්හි) යුද්ධ ක්‍රීඩායෙහි දක්ෂ වීර වූ දහස් ගණන් සමර්ථ
283 යෝධයෝ සන්නද්ධව වෙන් වෙන් වශයෙන් ඇතුයෙන් ඇතුන්සේ
පසමිතුරු සෙන් දිරියට ධාවනය කළාහු යමරජහු සේනාව දෘශ්‍යමාන
වූ සේ යුද්ධය පැවැත් වූහ. එකල හාත්පස ශරවර්ෂා ද වස්නට පටන්
284 ගත. පහමතුයෙහි සිටි ඔව්හු බිම සිටියවුන් විදිනට උපක්‍රම කළහ.
285
යන්ත්‍රමුක්ත වූ ඔබ මොබ පැතිර යන්නා වූ ප්‍රමාණාතික්‍රාන්ත
පාෂාණයන්ගේ විජෘම්බරණය ද පැවැත්තේ ය. කඩ කඩ කොට කපා
287 (ගින්නෙන්) උද්දීප්ත කොට (අහසින්) හරණ ලද උණුදඬුවකට සබඳ වූ
288 අතිශයින් නොඉවසියහැකි දාහය ද පැවැත්තේ ය. යදමින් බඳනාලද
උද්දීප්ත වූ යහුලින් ද අදිමින් ක්‍රෑර වූ ක්‍රියාවක් සතියක් පැවැත්වූහ.
289 මෙසේ ඒ මහරජාණන්ගේ මහපැණැති මහ ඇමති රජහු නියෝග
පරිද්දෙන් යුද්ධ මනාකොට පැවැත්වූහ. එකෙණෙහි මුහුදු වෙරළ වැද
බිඳෙන රළමාලා සෙයින් රජ සහිත පසමිතුරු සෙන් බිඳිණ. එකල්හි
අරුණොද්ගමන කාලයෙහි චන්ද්‍රයා හා තාරකාවන් සෙයින් මිහිපල්
290 සහිත වූ ඒ සේනා තොමෝ (පරාජය ප්‍රාප්තව) මිලාන විය.
291
ඉක්බිත්තෙන් රිදීකෙත සමසක් මුළුල්ලෙහි දවසක් පාසා
(කරණලද) භයානක යුද්ධයෙහි ශත්‍රු සේනාව දුර්වල කළහ. ඒ
292 මාණාභරණ මහීපාල තෙම බහිර්භාග සහිත වූ දුර්ගයක් කටු අතුට
293 කරවන්ට ආරම්භ කෙළේ ය. ඉක්බිත්තෙන් අදාළ ප්‍රඥා ඇත්තාවූ
294 නිලෝත්පල වැනි නේත්‍ර ඇති පණ්ඩිත වූ පරාක්‍රමබාහු නරෙශ්වර තෙම
ඒ ක්‍රමය සකසා අසා "ඉදින් හෙ තෙම දුර්ගයක් පිහිටුවන්ට ආරම්භ
කරන්නේ නම් මේ තෙමේ උපායෙකැ" යි චින්තාවෙහි දක්ෂවූයේ මෙසේ
සිතුයේ ය. "සෙනග හීනවූයේ යන්ට නික්මුනේ ම ය යි හඟිමි, ඒ
295 මාණාභරණයා ග්‍රහණය කරන්ට ඒකාන්තයෙන් මේ කල් වන්නේය.
296 මා විසිනුදු එහි යායුතුය. යන්නහු විසින්ද යම්සේ හෙතෙම දූන නො
297 ගන්නේ ද එසේ යන්ට වටනේ ය. එපරිද්දෙන් නො වන්නේ නම්
පලායන්නේ ය."
298
මෙසේ නිශ්චය කොට මුවදඩ යනු කැමැත්තක්හු සේ එක්
ව්‍යාජයක් දක්වා වික්‍රමපුරයෙන් නික්ම නොයෙක් දක්ෂ වූ ගන්ධර්වයන්
299 විසින් පෙරටු කරණ ලද්දේ ක්‍යානගමට පැමිණ වීණා වස්දඬු වාදනයන්
හා ගීතිකාවන්හි රස දන්නේ ප්‍රාඥවූ මහීපාල තෙම ශක්‍රයා සේ එහිම
වෙසෙමින් "වහා සේනා සන්නද්ධ කොට ගෙණ මාණාභරණ රජහුගේ
300 බුද්ධනායක නම් (ඇමතියා) සමග යුද සැණකෙළි පවත්වන්ට" (කියා)
301 රක්ඛ නම් අධිකාරීන් කරා හස්නක් යැවූයේ ය. මහරජාණන් කිවාක්
302 කරන්නා වූ මහ නුවණැති අධිකාරි තෙම කියා යවන ලද ඒ සියල්ල
අසා ඉක්බිත්තෙන් පසමිතුරු පුලුන් පිඹහැරීමෙහි උත්පාතවාත සමාන

Non-Commercial Distribution

303 යුද්ධ දක්ෂ සේනා සරහා එ කෙණෙහි යැවී ය. ඒ චතුරංගනී සේනා
304 තොමෝ රිදී කෙතට පැමිණ හිරු අස්තංගත වනතෙක් දරුණු යුද
පවත්වා බුද්ධනාථාදි සමාන්තයන් මරා අවශෙෂවූ සේනාව පලවා රෑ
එහිම වාසය කළාය. චතුර විචක්ෂණවූ පරාක්‍රමබාහු මහරජ තෙම
එපවත් අසා මිහිරණබිබිලි නම් වූ ගමට ගොස් අතිශයින් උදාර
පරාක්‍රමාන්විතවූ කඩක්කුඩ නම් ඇමතියා ද ලංකාපුර නම් ඇමතියා ද
305 යළිත් දණ්ඩනායක දෙබෑයන් ද කැඳවා "ඒ මාණාභරණ රජ තෙමේ
මහබියෙන් මැඩපැවැති සිත් ඇත්තේ නියමයෙන් ම අද රෑ පලා යන්නේ
306 ය. තෙපි පෙරටුව උහු පලා යන මාර්ගයට ගොස් අවුරව්" කියා පිටත්
307 කෙළේ ය. ගල ගල යන අනුකරණ පවත්වන්නා වූ මේඝය නිරතුරුව
308 වසිත් ම කෘෂ්ණ රාත්‍රියෙහි ඝනාන්ධකාරය පවත්වා කල්හි යන්නාවූ
309 ඔවුහු, බියෙන් පීඩිතව පලායන්නාවූ ඒ මාණාභරණ නරෙන්ද්‍රයන් කරා
මාර්ගයෙහි පැමිණෙන්ට නො පොහොසත් වූහ.

310

311 ඒ මාණාභරණ මහීපාල තෙමේ එකල්හි මෙසේ සිතුයේ ය. "අද
පසමිතුරු සෙන් වසන දුර්ගයෙහි මහා සමුද්‍රචලනයක් සමානවූ භයානක
ශබ්දයක් ඇසෙන්නේ ය. ඒ සතුරු රජ තෙමේ දුර්ගවට සම්ප්‍රාප්ත වූයේ
ය යි හඟිමි. ඉදින් බැහැර නොගොස් රාත්‍රියෙහි මෙහි ම උන්නෙම්
312 නම් (කිසිවෙකුට) වසඟ නු වූ මම අවශ්‍යයෙන් ම උහු යටහත් බවට
313 යන්නෙමි. සියලු පිරිවර ජනයන් අතුරෙන් කිසිවෙකුත් නොදන්වා මෙ
තැනින් පහව යන්ට වටනේ යි" යි භයින් පීඩිතව මෙසේ ද සිතා
314 ස්වකීය පුත්‍රයන් ද හැර ඝනවූ වර්‍ෂාව වසිත්ම බහලාන්ධකාරය පවත්නා
කල්හි විටින් විට ඒ ඒ තැන මහා ආවාටයෙහි වැටෙන්නේ වන පඳුරුවල
315 හැපෙමින් නැවත නැවත උත්‍රස්තවෙමින් බියෙන් කැළම් සිත් ඇත්තේ
316 මහ වැලි ගඟට පැමිණ "ඉදින් මම ප්‍රසිද්ධ වූ තොටකින් පලායන්නෙම්
ද පසමිතුරෝ මා ලුහුබැඳ ජීවග්‍රාහයෙන් ගන්නාහුය" යි සිතා කිසියම්
317 අප්‍රසිද්ධ තොටකින් දුක සේ ගඟ ඉක්මවා එකෙණෙහි ලද අස්වස්
318 ඇත්තේ රටවැසි ජනයා කෙරෙහි ද අතිශයින් සැක ඇතිවූයේ මහත්
319 භය ඇත්තේ අප්‍රසිද්ධ වේශයෙන් ගමින් ගමට පැමිණෙමින් පලාගොස්
320 ගතියෙන් වර්ජිතවූයේ සියරට වන්නේ ය.

321

322 ඒ ඒ තන්හි සිටියා වූ පරාක්‍රම මහරජාණන් යෝධයෝ මාණාභරණ
රජහු පලා ගිය බැව් දැන සතුටුව වස්ත්‍ර හිස සිසෑරුම් දහස් ගණන්
පවත්වමින්, හාත්පස විලක්කු ලක්ෂයක් දල්වා යෝධයන් නොයෙක්
323 දහස් ගණනන් ජීවිතක්ෂයට පමුණුවමින් අත්පොළසන් දි දී නාද
324 කෙරෙමින් හාත්පසින් පනිමින් පැතිරෙමින් ඒ සියල්ලෝ එක පැහැර
මාණාභරණ රජහු විසූ මහාදුර්ගයට හාත්පසින් ප්‍රවිෂ්ටව එහි නැවතී උන්

Non-Commercial Distribution

325 සිරිවල්ලභ නම් කුමාරයා හා අනිකුදු මහාමාත්‍යයන් ජීවග්‍රහයෙන් ගෙණ
326 සතුරු රජහුගේ ඒ ඒ තැන විසුළ බොහෝ වූ ධනය ද ඇතුන් අසුන් හා
327 සන්නාහයන් ද බොහෝ වූ ආයුධයන් ද ගෙණ ඔවුන්ට යෙදිය යුතු
328 ආරක්ෂා ද යොදා ඒ සියල්ලෝ ම මාණාභරණ රජහු ලුහු බඳිමින් ඒ
ක්ෂයෙහි මහවැලි ගඟ වෙත පැමිණ එහි දු පරිච්ඡෙදය රහිත වූ වෛරී
සේනාව නසා සියල් සතුරු සෙන් මස් ලේ ගඟක් කොට "මුහුදු දක්වා
329 හෝ ගොස් මාණාභරණ භූමි පාලයන් ගෙණ නවතුම්හ. අන් පරිද්දෙන්
නො නවතුම්හ" යි ස්ථිර වූ සිත් ඇතිව තික්මුනෝ ය. අතික්‍රමණය
330 කළ නො හැකි හසුන් ඇති වීරබාහු පරාක්‍රමබාහු නරෙශ්වර තෙමේ "
ගඟ පරතෙර නො යාතුය " යි කියා හස්නක් යවා ඔවුන් නැවැත් වී ය.

331 ඉක්බිත්තෙන් (පස මිතුරු) රජුන් දිනූ පරාක්‍රමබාහු නරේන්ද්‍ර තෙම
පලන් සවිබරණ ඇත්තේ සෙනඟ පිරිවරණ ලද්දේ සිරිවල්ලභ නම්
332 කුමාරයා විසින් පෙරටු කරණ ලද්දේ අසුරු යුද්ධයෙහි ජයප්‍රාප්ත වූ
ශක්‍රදෙවෙන්ද්‍රයා සුරමන්දිරයට සෙයින් මහජය ඝෝෂණයෙන් ඒ ඒ
333 දිගුන් පුරවමින් පුලස්ති පුර නම් රම්‍ය වූ පුරයට ප්‍රවිෂ්ට වූයේ ය.

334 ඉක්බිති ඒ මාණාභරණ රජ තෙම පරාක්‍රමබාහු මහ රජාණන්
335 කෙරෙහි බියෙන් හට ගන්නා වූ රෝගයකින් ආයු පරිහී මට පැමිණියේ
336 ඉස අත් බැඳ අඬන්නා වූ අන්තඃපුර වැසි ජනයා මැද දුක්පත්ව මරණය
අවසන් කොට ඇති ශයනයෙහි හොත්තේ පසුව කීර්ති ශ්‍රී මේඝ නම්
337 කුමාරයා හා අනිකුදු මහාමාත්‍යයන් කැඳවා මේ වචනය කීයේ ය. "ශ්‍රී
338 දංෂ්ට්‍රාධාතු ස්වාමීවහන්සේට ද උත්තම පාත්‍රධාතුන් වහන්සේට ද ශ්‍රද්ධා
ඇත්තා වූ කුල පුත්‍රයන් විසින් පුදන ලද බොහෝ වූ ධනය ද අනිකුදු
භික්ෂු සංඝයා සන්තක වූ නානා විධ ග්‍රාමයෝ ද රාජ්‍ය ලෝභයෙන්
339 අභිභූත වූ මා විසින් ගන්නා ලද්දාහු නසන ලද්දාහු ද වෙති. දැන් මම
340 නැඟී නොසිටිනා සෙය්‍යාවෙන් ශයනය කළේ වෙමි, මළා වූ ද මට
ඒකාන්තයෙන්ම අපායෙන් මිදීම කොයින් ද? මා මෙන් තෝ නො
නැසී පරාක්‍රමබාහු මහරජාණන් කරා එළඹ උහුගේ බස් පිළිපදනේ උහු
341 විසින් කියන ලද ක්‍රමයට අනුකූලව වාසය කරව" යි මෙසේ ද කියා
342 අත්‍යාත්ථියෙන් බැගෑ පත් සේ හඬමින් පරාක්‍රමබාහු මහරජාණන්ගේ
343 සමත්ථ යෝද්දයන්ට විෂය නූ වූ ප්‍රදේශයකට යනු කැමැත්තේ සෙයින්
යම පුර දූර්ගයට ගියේ ය.

344 රංජනය කරණ ලද අනන්ත සජ්ජයනයන් ඇත්තා වූ පරාක්‍රමබාහු
345 මහ රජ තෙම මාණාභරණ භූපාලයා මළ බැව් අසා කීර්ති ශ්‍රී මේඝ
කුමාරයා එතැනින් ගෙන් වූයේ ය. එකල්හි ඒ මහාමාත්‍යයෝ රැස්ව
බඳන ලද ඇඳිලි ඇතිව මෞලි මංගල්‍යය කරණ පිණිස මහා ප්‍රඥා ඇති
346 නරෙන්ද්‍රයන්ට යාච්ඥා කළෝ ය. මිහිපති තෙමේ ප්‍රශස්ත වූ

Non-Commercial Distribution

347 නක්ෂත්‍රයෙන් හා මුහුර්තයෙකින් ශත්‍රු (භය) රහිත වූයේ ප්‍රශස්ත වූ
348 මෞලි මංගලය පැවැත් වූ යේ ය.

349
එකල්හි නානාප්‍රකාර වූ භෙරීන්ගේ මහා ශබ්දය තෙම කල්පාන්ත
වාතයෙන් කැළඹී සාගරයාගේ හඬ සෙයින් භයානක විය. ස්වර්ණමය
සන්නාහ සන්නද්ධ වු ඇතුන් කරණ කොට ගෙණ රාජ වීථි තොමෝ
විදුලි සහිත වූ මේඝකූටය බට සේ විය. අශ්වයන්ගේ නෘත්‍යයෙන්
හටගත් රළ ඇති වූයේ ඒ නුවර මුළුල්ලේ එකල්හි සාගරය සේ ගැවසුනේ
350 ය. විසිතුරු ඡත්‍රමාලාවෙන් හා රන්දද පෙළින් අහස්කුස හාත්පසින්
351 වසන ලද්දා සේ විය. පිළි හිස සිසෑරුම් පැවැත්තා හ. අසුරු සන්ද
352 පැවැත්තාහ. එකල නුවර වැස්සෝ "(බෝකල්) ජීවත්වෙව" යි ආශිර්වාද
පැවැත් වූහ. කෙහෙල් තොරණින් ගැවසුනා වූ පුන් කලස් මාලාවෙන්
353 ගහණ වූ සියලු පොළෝ මඬුල්ල නොයෙක් උත්සවයෙන් යුක්ත විය.
354 අනේක ශතසංඛ්‍යා වු ස්තුති පාඨකයන් විසින් කියන ලද්දා වූ ස්තුති
ගීතය ද පැවැත් තේ ය. විසිතුරු වත් ඇති නානා විධාභරණයෙන්
355 විභූෂිත වූ නානායුධ ගත් ඇති ආයුධ ශිල්ප පරිචය කළා වූ පරිපූර්ණාංග
ප්‍රත්‍යංග ඇති අත්‍යන්ත විරාංගයෙන් ශෝභාමත් රූප ශ්‍රී ඇත්තා වූ
356 මහායෝධ භටයෝ ද (මද) බුන් ඇතුන් බොහෝ ධනුර්ධරයින් ද හසුන්
කරණ කොට ගෙණ පොළෝ තළය දෙව් සෙනග පැමිණියා සේ විය.
රන් මිණි මුතු ආදියෙන් යුක්ත වූ විමන් සියෙයන් ගහණ පුරය තාරකාවන්
357 ගැවසුනා වූ අහස මෙන් වැටහුනේ ය.

358
359 මහානුභාව ඇත්තා වූ නිලොත්පල මෙන් දිගු ඇස් ඇත්තා වූ ඒ
නරේන්ද්‍ර තෙම මෙසේ ආශ්චර්යාද්භූත පරම්පරාවක් පවත්වමින්
ස්වර්ණාභරණයෙන් වසන ලද්දා වූ හස්තීන් දෙදෙනෙක් යොදන ලද
ස්වර්ණමය මණ්ඩපයට නැගී නානා ප්‍රකාරභරණයෙන් සැරසුරණේ
360 මාණික්‍ය රශ්මියෙන් සමුජ්වලිත වූ ඔටුන්න සිරසින් දරමින් උදා වන
361 හිරු මඬල දරන්නා වූ උදයපර්වතය සෙයින් ස්වකීය වූ කාන්ති ශක්තියෙන්
අනංගයා මඩනේ පුරස්ත්‍රින්ගේ සතුටු කඳුළු ජලයෙහි නේත්‍ර (යුග්ම)
ගල්වමින් නුවර පැදකුණු කොට ශුභ ලක්ෂණයෙන් හෙබියා වූ ශක්‍රයා
362 සේ මනොඥ වූ රාජ මන්දිරයට ප්‍රවිෂ්ට වූයේ ය.

මෙසේ ඒ ප්‍රවරාඥාවර්ති මධ්‍යම ලෝකපාල වූ පරාක්‍රමබාහු
නරෙශ්වර තෙමේ සියලු දිසාවන් හා අනුදිසාවන් ද පූජාවෙන් නිපන්
සේ කොට (ප්‍රථමාභිෂේකය කළ වර්ෂයෙහි) දෙවෙනි වර්ෂයෙහි
වීතියාභිෂේකය කෙළේ යි.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවෙග පිණිස කළ මහවස
363 අභිෂේක මංගල නිද්දෙස නම් වූ දෙසැත්තෑවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ තුන් වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති කරණ ලද අභිෂේක ඇති අර්ථ දක්නවුන් අතුරෙන්
2 ප්‍රවර වූ ප්‍රඥා සම්පන්න වූ ඒ පැරකුම්බා මිහිපල් තෙම මෙසේ සිතී ය.
3 " අතිශයින් ලෙව් සසුන් වැඩුම් ක්‍රියාහි උපාය රහිත වූ ඡන්දයෙන්
4 ද්වේෂයෙන් භයින් මෝහයෙන් අගතිගාමි වූ නුසුදුසු අය ගැණිම් ආදි
5 මහා දුක් දෙන්නා වූ පෙර රජුන් විස්න පූර්වීයෙහි දි බොහෝ සේ
6 පෙළන ලද්දා වූ ලෝකය තෙම යම් සේ සුවපත් වන්නේ ද, එසේ ම
මහර්ෂීහුගේ සස්න ද දූලද සිය ගණින් මුසු බැවින් කලක් කැලැක් බවට
7 ගියේ තුන් නිකාය භේදයෙන් බිඳුනේ කුස පුරණ කිස ඇති අලජ්ජී වූ
නොයෙක් භික්ෂූන් විසින් බැස ගන්නා ලද්දේ පස්වා දහස නො ඉක්මුණු
8 කල්හි ම විනාශභාග් බවට ගියේ යම් සේ දීඝී කාලයක් පවත්ථේ ද, ඒ ඒ
9 තන්හි විනෂ්ට වූ මහකුල ඇත්තන් සුදුසු තන්හි තබා විධි වූ පරිද්දෙන්
පරිපාලනය යි යන යමක් වේ ද, චාතුර්ද්වීපික මේඝ සෙයින්
අනවතරයෙන් දන් නමැති මහ වැසි වස්වමින් යාචකයන් පෝෂ්‍ය
කෙරෙහින් යන යමක් වී නම් එ ද, මහ දුක් ඇති ව රාජ්‍ය සම්පාදනය
10 කරන්නා වූ මා විසින් සියලු විධානය නොයෙක් පරිද්දෙන් පල බැවින්
11 ගරු කොට සිතන ලදී. ඒ යථාභිප්‍රේතය කරන්ට දූන් මේ කාලය යි
12 සිතා තනතුරු දිය යුත්තන්ට ඒ තෙමේ තනතුරු දින.

13 ඉක්බිති බෙර පියවි කරවා යදියන් රැස් කොට අවුරුදු පතා
14 තුලාබර මහ දන් දෙවී. ඉක්බිති රජ තෙමේ ශාසන සංවෘර්ධි විධානයකට
15 තුන් නිකාය වැසි මහසඟහු රැස් කොට එසේම ආපත්ති අනාපත්ති
16 විභාග ක්‍රමයෙහි පණ්ඩිත වූ ප්‍රවර බොහෝ ආචායර්යයන් ද රැස් කොට
17 ස්ථානාස්ථාන දන්නා විනය ධරයන්ට තෙමේත් පුරස්සර ව ශුද්ධාශුද්ධ
18 තපස්වින් පක්ෂපාතවර්තී නො ව බැවින් ආදර අනාදර රහිත වූයේ
අප්‍රමාද ස්වභාව ඇති හෙයින් රෑ දෙවෙහි නො පමාව පැණවත්ව
න්‍යායෙහි පණ්ඩිත වූයේ ශල්‍ය කර්තෘ වෛද ්‍යාදාර්යයක් හු සෙයින්
19 පිළියමට සුදුසු නුසුදුසු දෝෂයන් සලකමින් පිළියමට යෝග්‍යයන් පිළියම්
20 කෙරෙමින් පිළියමට අයෝග්‍යයන් හරිමින් අයුක්තෙන් පහ වූ සංකල්පනා
20 ඇති හේ තෙමේ විනයෙහි කී ක්‍රමයෙන් වට්ටගාමිණී අභය රජු දවස්
පටන් මෙකල් දක්වා බොහෝ වූ පෙර මිහිපලුන් විසින් මහා
ප්‍රයාසයෙනුත් සර්වප්‍රකාරයෙන් කොට අඩාල සමගි බැව් ඇති උනුන්ට
21 විරුද්ධ හැසිරිම් ඇති නානා විග්‍රහ යෙහි දක්ෂ වූ නිකායත්‍රය පූර්ව
22 අතික්‍රාන්ත ජාතිවල ශාසනයා ගේ ම සංසුද්ධිය පතා ගන්නා ලද ව්‍රත
23 ඇත්තේ රාජ්‍ය සාධක දුඃඛයටත් වඩා ද්විගුණ වූ අත්‍යර්ථ්‍යආයාසය අනුභව
24 කෙරෙමින් මහ පැණැති ඒ රජ තෙමේ සමගි කොට පස්වාදහසක් යම්

Non-Commercial Distribution

24 සේ සුද්ධ ව පවත්නේ නම් එසේ බුදු සස්න කිරි හා දිය සෙයින් එකග
කෙළේ යි.

25 ඉක්බිති ඒ නර ශ්‍රෙෂ්ඨ තෙමේ නුවර මැද විසාල නා නා ශාලා
ඇති සතර දිගට දොරටු ඇති චතුශ්ශාලාවක් කරවා නොයෙක් සිය
26 ගණන් සිල් රක්නවුන්ට දවස් පතා දන් දේව සර්වෝපකරණයෙන්
27 යුක්ත වූ මහ දන් වැට තැබී ය. සොම්නස් ඇති ඒ රජ තෙමේ ඔවුන්ට
වැඩිමහලු පිළිවෙළින් හැම කල්හිම අවුරුදු පතා හඳනා පොරෝණා
28 (පිළි) දෙවී ය.

29 ඉක්බිති ඒ රජ තෙමේ නුවර සතර දිග භාග වසයෙන් ප්‍රමාණ
30 කොට බෙදන ලද්දා වූ දන් හල් සතරක් කරවා එහි ලොහොමුව්
31 නොයෙක් බඳුන් හා කන්වයින් මාවුලා ද කළල් ඇතිරිලි හා මැසි ද
දහස් ගන් මිහිරි කිරි ඇති දෙනුන් තබ්බවා පසුව ඒ සමීපයෙහි පිරිසිදු
ජලාශයෙන් ඇති නොයෙක් මල් පල්ලෙන් සැඳුම් ලද තුරු පෙළින්
32 හෙබියා වූ ආනන්ද ජනක නඳුනුයන් සේ සිත්කළු වූ උයනුදු කරවා එම
33 දන් හල් වෙත ධන ධාන්‍යයෙන් යුක්ත වූ සකුරු ගුළ මී ආදි
සර්‍වොපකරණයෙන් යුක්ත වූ පරිපූර්ණ බොහෝ කොටු ගුලු ද කරවා
34 මසුරු නැතිව එහි සීලාදි ගුණ යෝග ඇති නොයෙක් දහස් ගණන්
සතර දිගින් වඩන භික්ෂූන්ට ද බමුණන්ට ද අකම්ප්‍ය වූ බුහුටි වූ
35 ප්‍රීතියෙන් පිණාගිය සිත් ඇති පැණවත් ඒ රජ තෙම් දවස් පතා එහි මහ
36 දන් පැවැත් විය.

ඉක්බිති කරුණාපර නරෙශ්වර තෙමේ නොයෙක් සිය ගණන්
37 රෝගීන්ගේ වාසයට සුදුසු වූ මහා සාලාවක් කරවා යට කී ක්‍රමයෙන්
එහි ද සියලු උපභෝග සාමග්‍රිය තබ්බවා සියලු රෝගීන්ට එකෙක් පාසා
38 දිවා රාත්‍රි දෙක්හි පොහොණ පමණින් බෙහෙත් හා කැඳ යුතු බිඳිය යුතු
39 ආහාරාදිය ද සපයනු පිණිස ද එක් දසෙක් හා දැසක් දෙවා ඒ වෙද
40 හල්හි නොයෙක් බෙහෙත් සම්භාර හා ධන ධාන්‍යාදීන් රැස් කරණ ලද
බොහෝ කොටුගුළු කරවා නොයෙක් අවස්ථා විභාගයෙහි නිපුණ වූ
41 මහ පැන ඇති සියලු වෙද සතර දන්නා කෘත හස්ත වෙදුන්ට වැටුප් දී
42 හැම තැන වෙසෙස් දන්නේ උන් ලබා සුදුසු පරද්දෙන් රෑ දෙවෙහි
43 මොනවට පිලියම් කරවමින් සම සතර පෙහෙවස් දවස්හි පහකළ
44 සව්බරණින් මොනවට සමාදන් වූ පෙහෙවසින් සුපිරිසිදු ව සුදු උතුරු
45 සළු පෙරවගෙණ ඇමතියන් විසින් පිරිවරණ ලදුව තෙමේම ඒ වෙද
හලට එළඹ කුලුණින් සිහිල් සිත් ඇතිව පහන් සොම් නෙතින් රෝගීන්
බලා නර ශ්‍රේෂ්ට වූ තමනුත් ආයුර්වේදයෙහි නිපුණ බැවින් එහි නියුක්ත

Non-Commercial Distribution

46 වෙදුන් ගෙන්වා මහ පැණැත්තේ ඔවුන්ගේ පිළියම ක්‍රමයෙන්
47 සර්වප්‍රකාරයෙන් විචාර ඔවුන් විසින් වරදවා කරණ ලද පිළිමයක් ඉදින්
වී නම් වාදීන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ ඒ තෙමේ විරෝධයන් යුක්ති පරිද්දෙන්
48 ඔවුන්ට අවබෝධ කරනා තෙමේ ශාස්ත්‍ර යුක්තය වූ පරිද්දෙන් උපදෙස්
කොට සමත්ථ ව සියතින් කිහිප දෙනෙකුට පිළියම් කොට රෝගීන්
49 සියල්ලන්ගේම සුවදුක් විචාරා එසේ රෝග මුක්තයන්ට අඳනා පිළි
දෙවා කුසල්හි ඇලුනෙත් වෙදුන් අතින් පින් අනුමෝදන්ව උන්ට ද පින්
50 දී සිය ගෙට යයි. කරුණානුගත වූ නිරෝගි ඒ රජ තෙමේ මේ උපායෙහි
51 ම අවුරුදු පතා රෝගීන් සියලු රෝගයන් ගෙන් මිදවී.

52 පෙර නුදුටු නැසූ අනිකුදු අද්භූතයෙක් ඇති. මොනවට පවත්වන
53 ලද මහා කරුණා ගුණ යෝග ඇති ඒ රජහුගේ වෙද හලට කොපුල
54 හටගත් අර්බුදයකින් අතිශයින් මිරිකුණා වූ මහ දුකින් පහට එක් කවුඩෙක්
ආය. උහු දැඩි දයා මලපතින් බඳනා ලද්දෙකු සේ බැගෑව අතිශයින්
හඬමින් පියා සුන්නෙකු සේ එයින් බැහැර නො යෙයි. එ කල්හි
වෙදහු ඒ කවුඩාගේ අවස්ථාව තත් වූ පරිද්දෙන් හැඳින උහු ගෙණ මහ
55 රජහු විධානයෙන් පිළියම් කළහ. රෝගය සන්හුන් කල රජ තෙමේ ඒ
56 කවුඩා ඇතෙකු පිට නංවා නුවර පැදකුණු කරවා මුදා හැරවී ය.
57 තිරිසනුන් කෙරෙහි පවා මෙබඳු උදාරතර කරුණාවක් තොමෝ කොහි
කිකලක කා විසින් මෙසේ දක්නා ලද්දී හෝ අසන ලද්දී ද? ඉක්බිති
58 සතුටු කළ භූදි ජනයා ඇති නොපසුබස්නා පැරකුම්බා රජ තෙමේ
59 නාමශේෂ බවට පැමිණි පොළොන්නරු නගරවරය ඉති මහත් රජ සිරිසර
60 ඔලඹනට නොපොහොනනු විසල් සිත්කළු කොට කරවන්ට ආරම්භ
61 කෙළේ ය. අනතුරුව මිහිපල් තෙමේ හාත්පසින් පෙර රජුන් පුර
62 වළල්ලෙන් බැහැර කඳවුරු පිරිකෙව් කොට සුණුපිරියමින් දිලිසෙන
63 උස් මහත් පවුරු වළල්ලක සරත් වලා සේ පඬර කොට කරවී. ඒ
වටා අනුක්‍රමයෙන් කුඩා පවුරු තුනක් ද ඒ පිරිකෙව් කොට නානා
ප්‍රකාර වීථි ද කරවී. එසේම ස්වකීය රාජභවනය හා සියලු අන්තඃපුරය
ද පරික්ෂෙප කොට අනු ප්‍රාකාර මණ්ඩලයක් කරවී

64 ඉක්බිති සියලු මිහිපලුන් අගරජ තෙමේ ගබ්ගෙවල් දහසින්
65 හෙබියා වූ විසිතුරු නොයෙක් සිය ගණන් ටැඹින් සැරහුනා වූ කෙලෙස්
66 කුලුවන් කුළු ගෙවල් කැටිකළා වූ නත් විසිතුරු ලියකම් හා මල් කමින්
67 දිලිසෙන්නා වූ රන්මුවා මහදොර හා කවුළු ඇති මොනවට බෙදනලද
68 බිතු හා හිණි පෙති ඇති සියලු සෘතුයෙහි සුව එලවන්නා වූ රන්මුවා
දළ කඩමුවා ආදි වූ මාහැගි ඇතිරියෙන් යුක්ත වූ නොයෙක් හැඳ
දහසින් අනවරතයෙන් හෙබියා වූ අහස්ගඟ හොබනා බවට

Non-Commercial Distribution

69 සිනාසෙන්නාක් බඳු කැලුම් ඇති සඳරැස් සේ සුදුවූ සතර කොන්හි
70 එලෙන දළ මුතු කළමින් නිතොර අතිශයින් හොබනා වූ රන්මුවා මහත්
පහන් මාලාවෙන් තෙවුනා වූ මල්දම් සබඳ දුරහමන සුවඳ අනවරතයෙන්
නගන්නා වූ සිරියහන් ගැබින් යුක්තකළා වූ උතුම් පසතුරු රැව් සුදුසු රැ
71 ව් වගුරුවන්නාවූ කුසලයන්ගේ නොමද අනුසස් ගුගුරන්නා බඳු ඒ ඒ
තැන එලෙන රන් කිකිණි දැලින් යුක්ත වූ විස්සම් දෙව්පීත්හු අසමාන
72 මැවීමක් සමාන වූ පහන් බැව් එලවන විජයොත් නමින් යුත් තමහට
73 වැඩියෙන් නැති උතුම් වූ සත්බුමු මහපහයක් කරවී.

74 ඊට ඉක්බිති කොට බමුණන් ලවා ශාන්ති කරවන්ට රන් මැදුරක්
75 ද, මන්ත්‍ර පුරවනු පිණිස සිත්කළු වූ ධාරණී ගෘහයක් ද අනතුරු කොට
76 මහාසෘෂිහු විසින් අස්වන්ට රම්‍යවූ වටගෙයක් ද, ඉක්බිති කසාපිළි හඳනා
ව්‍රතීන් හා බෞද්ධ භික්ෂූන් විසින් දෙන ලද පිරිත් පැන් හූ ගන්නා
77 පිණිස පන්සැත්තෑ ගෙයක් ද (කරවීය) හාත්පසින් විසිතුරු තිර පව්රෙන්
78 පිරිකෙව් කරණ ලද්දා වූ මාහැඟි රන්වියතින් හෙබියා වූ ඒ ඒ තැන
පුදන ලද නීන්වන් සුවඳ මලින් එක් මල් ගුලාවක් සේ බබළන සුවඳ
79 තෙල් පහනින් අනවරතයෙන් අළුකළ ගැබ් ඇති කළුවැල් දුමින්
හාත්පසින් සුවඳ කවන ලද්දා වූ රන්මුවා ඇ නොයෙක් බුදු පිළිරුවින්
විසිතුරු කරණ ලද වස්ත්‍රයෙහි නගන ලද්දා වූ සර්වඥයන් පිළිබිඹු
80 මාලාවෙන් හොබවන ලද බුදු පිළිරුවෙහි සියතින් නෙත් තබන්ටත්
81 බුදුන් පුදන්ටත් අනුත්තර සද්ධර්ම ශ්‍රවණයටත් ඒ රාජේන්ද්‍රයා ප්‍රවිෂ්ට කළ
දිව්‍ය සංගීති සදෘස කොට ළයාන්විත මිහිරි ගායනා කොට නටන නාටක
82 ස්ත්‍රීන් සමග කෙකාරවය වගුරන්නා වූ අනවරතයෙන් පටන්ගත් නැටුම්
93 ඇති ජනයා ආශ්චර්යයෙන් විස්ම කරන්නා වූ උථුම් මොනරෙකුගෙන්
84 හෙබියා වූ ධර්මගාරයක් ද හැම කල්හි ධර්මයට අනුව පවත්නා හේ තෙමේ
කර වී ය.

ඉක්බිති සදල්ල වෙත ළයාන්විතව අනේක ගන්ධර්ව ගීතිකා
85 අසන්ටත් රම්‍ය දක්නටත් රන්මුවා ටැඹින් හාත්පසින් තෙවුනා වූ තමාගේ
86 චරිතයෙන් යුක්ත සිතියමින් මනහර වූ කුංඩලාභරණය අභූපළඳනාය
මුක්තාහාරය යනාදි නානාභරණ දීප්ති ඇති ක්ෂෞමකෝශේය චීනාදි
විචිත්‍ර ශෝභාවෙන් යුක්ත වූ ස්වර්ණමය මහාකඳ හා අතුපතරින් තෙවුනා
87 වූ සිතියම් කරණ ලද නොයෙක් පක්ෂි සමූහයන්ගේ ශෝභාවෙන් යුක්ත
88 වූ අභිමතාර්ථ දායක කල්පවෘක්ෂයෙන් හෙබියා වූ සරස්වතී මංඩපයක්
ද නරශ්‍රෙෂ්ඨ තෙමේ කරවිය.

Non-Commercial Distribution

89 ඊට ඉක්බිති කොට සුධර්මා නම් දිව්‍යසභාව පොළෝතලය බැස්සා
90 බඳු වූ සියලු ලෝකයෙහි චාරිත්‍ර එකතැනෙක කැටි කළා බඳු වූ
තුන්මහලයක් ඇති විසිතුරු සිත්තමින් හෙබියා වූ සිත්කළු පිළිකඩ
91 පෙළින් වටකරණ ලද්දා වූ එහෙයින් ම සිත් අලවන්නා වූ ගායකාදීන්ට
ඉෂ්ටාර්ථ ප්‍රදානය කරන්නා වූ කල්පවෘක්ෂයාගේ අධඃප්‍රදේශයෙහි කරණ
92 ලද මාහැඟි අස්නකින් හෙබියා වූ ස්වකීය බාහු බලයෙන් යුදෙහි
93 ලඞ්කාඞ්ගනාව ලත්කල (එහෙත් ම මුදුනෙහි) බබළවන්නා වූ කිරිටයක්
බඳු නානා රත්නයෙන් ප්‍රභාස්වර වූ නරලෝ තොපුලක්හුගේ හෙවත්
94 මහ දෙවියාගේ දළමඩුලු බඳු වූ රාජවේස භුජංග නම් රම්‍ය වූ මන්ඩපය
95 කරවී ය. එසේ ම පොළෝ බිඳගෙන නැංගා වැනි මකර තොරණින්
නිමියා වූ රම්‍ය වූ එකස්තම්භ ප්‍රාසාදයක් ද කරවී. පසුව (එය) මනොඥ
96 වූ රන්මුවා ටැම් මත්තෙහි පිහිටි රන්බිමින් හෙබියා වූ හොබනා
97 පහන්තුරකින් යුත් සිත්කළු වූ ඒ රාජසිංහයාගේ රන්ලෙන් සිරි එලවන
98 රන් ගෙයකින් හොබවන ලද්දේ ය.

ඉක්බිති ඒ රාජනිවෙසනය වෙත පෙදෙස්හි පෘථිවිපාල නායක
99 ඒ රජ තෙමේ ගෘහොද්‍යානයක් කරවී. (ඒ උයන තෙමේ) අධිකශ්‍රීන්
100 නඳුනුයන් හා සාදෘශ්‍ය දැක්වී. ජනයන්ගෙ නෙත්‍ර සන්තුෂ්ටි දායක වූයේ
101 සතුටු කෙරෙහි යන හේතුවින් නමින් නඤයා ඒ උයන කුසුලතාවෙන්
වලඳනා ලද රුක් ඇත්තේ ය. නානා පුෂ්ප රසාස්වාදයෙන් මත් බමර
කැලන් විසින් ගිගුම් ගත්තේ ය. සපු හෝපලු තෙල් නා දොඹ දුනුකේ
102 සල් පළොල් කොළොම් අඹ දඹ බක්මී මුහුළු පොල් කෙලිඳ රත්කරව්
103 දෑසමන් මලිගිය තමළු යොහොඹු මේ ආදි නන් පල කුසුමෙන් යුත්
දුමයේ යම් තැනකට ගිය මිනිසුන්ගේ සිත උදම් කරන්නා බඳු වෙත් ද,
104 මොනරුන්ගේ කෙකාරවයෙන් හා කොවුලන් මියුරු අවියත් හඬින්
105 හැම කල්හි ලෝ වැස්සා ලෝභ කරමින් සිත්කළු ද, කමලොත්පල
106 සාළුලායෙන් හා විල්ලිහිණි රාවයෙන් මනෝහර වූ සිත්කළු ඉවුරු
ඇති විල්රැසින් හෙබියේ ඇත්දළමුවා හිම් නැති රූ පෙළින් හෙබියා වූ
107 ටැඹින් දැඩිකළාක් වැනි වූ මහත්ව බබළන්නා වූ යතුරු නළින් හරණ
ලද දිය දහරින් හැම කල්හි වස්නා මහ මේකුළු අයුරින් සිත්කළු වූ
උද්‍යාන ශ්‍රීයෙන් මෞලි මණ්ඩනාකාර දරන්නා වූ නෙත් පැහැර ගන්නා
108 ධාරා මණ්ඩපයකින් ද හොබවන ලද්දේ ය.

නොමද සඳුන් ටැඹින් හෙබියා වූ භූමණ්ඩල මණ්ඩනාකාර
109 එලවන්නා වූ තෙවුනා විමානයකින් ද, (එසේ ම චොරජනා අසමාන
අටැස්මඩුවකින් ද, නැව. නැද වටක් බඳු මඩුවකින් ද, අනන්තයා දරණ
110 වැල සිරි එලවන ශ්‍රීමත් මනොඥ මහත් මඩුවකින් ද හෙබවී ය. යම්

Non-Commercial Distribution

111 උයනෙක්හි පිහිටි ගල්පොකුණු තොමෝ සතුටු කළ ගණන් සපුරිසන්
ඇති මිහිපල් මුදුන් මල් රජහු හැම කල් සිත සතුටු කරන් නී ද, යම්
උයනෙක් තෙමේ මගුල් පොකුණ කරණ කොට ගෙණ අතිශයින් රමණීය
112 වූයේ හැම කල නඳුන් පොකුණෙන් යුත් නඳුනුයන සෙයින් හැගේ ද,
113 යම් උයනෙක්හි සුවඳ දිය දහරින් යුත් අනික් පුණු නම් පොකුණු තොමෝ
114 ඒ මිහිපල් සඳහු සතුටු කරන්නී වොරජනී ද, එසේ ම යම් උයනෙක්
වසත් නම් ලෙනින් හා පොකුණු වලින් ද යුක්ත වූයේ නොමඳ සිරින්
115 මනා වූයේ හැම තල සිත් කළුව පෙණේ ද, මෙරමා මඩනා ඒ රජ
තෙමේ දෙරිද්දෙකින් ගිය දිය දහර ඇති බැවින් දිවයිනක් බඳු පෙදෙසක
අන්‍ය වූ ද්වීපොද්‍යානයක් ද කරවී ය. යම් උයනෙක්හි සියලු සුණුවමින්
116 නිමියා වූ විස්මයාවහ වූ කෙලෙස්කුළු මුදුන් බඳු සුදු ගෙය දෘශ්‍යමාන ද,
117 නානා විද්‍යා විශේෂයන්ගේ දර්ශණය පිණිස කළ හෙයින් විද්‍යාමණ්ඩප
118 නම් විමානයක් සැරහෙන ලද්දේ ද, එන් රස්සෙන් යොදන ලද මනෝහර
ඕවිල්ලෙන් යුක්ත වූ ඉතා පවිත්‍ර වූ එසේ ම සිත්කළු වූ දෝලමඩපය
119 යම් උයනෙක හෙබේ ද, භාෂ්‍යාරස දන්නා ක්‍රීඩාමාත්‍යයන් විසින්
පෙරටු කරණ ලද රජ තෙමේ යම් තැනක සිත් අලවා ද, එහෙයින් ක්‍රීඩා
120 මණ්ඩප යයි නම් වූ විමානයෙන් වොරජනා වූ ද එසේම දළකඩ
121 කර්මාන්තයෙන් උපලක්ෂිත වූ තීරස්කරණී මණ්ඩපයෙන් ද මයුර මණ්ඩප
නම් අන්‍ය මණ්ඩපයකින් ද ප්‍රවර වූ කැටපත් බිතු ඇති අන්‍ය වූ ආදර්ශ
මණ්ඩපයකින් ද හැම කල්හි හොබවන ලද්දේ ය. යම් උයනෙක්හි
122 අනන්තයා දරණ වැල (අතුට) බඳනා ලද ගලින් යුක්ත වූ අනන්ත
123 පුරෂ්කරණී තොමෝ හැම කල්හි ජන සමූහයා සතුටු කරන්නී ද, තවද
යම් උයනෙක්හි විසිතුරු සිත්තමින් යුක්ත වූ චිත්‍රා නම් පුෂ්පකරණී
තොමෝ මෙරමා මඩනා වූ පරාක්‍රමබාහු නමැති රාජසෘෂියා සිත්
අලවන්නී ද යම් උයනෙක්හි නන් සිතියමින් විසිතුරු වූ තමහට වැඩියක්
124 නැත්තා වූ සිවුමහල් විමන ශෘංගර ශබ්ද පෙරටු කොට හෙබේ ද තල්
125 කිතුලින් යුක්ත වූ නා දොඹ තුරින් රඳනා (යම් උයනක්) කෙසෙල්
ගසින් හා කිණිහිරි ගසින් ද (එසේ ම) යොහොඹු ගසින් යුක්ත වී ද.

126 ඊට ඉක්බිතිව සියලු මිහිපල් නමැති කුලපර්වතයන්ට මහා මේරුව
127 බඳු වූ ඒ රජහුගේ අභ්‍යන්තික වූ තුනුරුවන් මාමක කොට ඇති
අත්ථනත්ථයත් පරිග්‍රහ කරන්නා වූ පැණවත් පිරිසිදු සිත් ඇති නොයෙක්
128 කුශල ක්‍රියාවන්ගේ විධානොපායෙහි පණ්ඩිත ඡන්දයෙන් ද්වේෂයෙන්
භයින් මෝහයෙන් අත්‍යර්ථයෙන් අගතිගාමී නොවන්නා වූ ජලයෙන්
129 සයුරසේ කුශල රාශින් තෘප්ත නු වූ හිරි උත්තපප්පන්න වූ නිරත්‍යරබ්ධ
130 පරාක්‍රම ඇති සිල් රක්නා විචක්ෂණ මහෙන්ද්‍ර නම් එක් ඇමතියෙක්
131 තෙමේ සුවසුදහසක් දහම් කඳ නමැති අමෘතාභිෂේකයෙන් පවිත්‍ර වූ

Non-Commercial Distribution

132 දළදා ධාතු ස්වාමීහුගේ වැඩීම් පිණිස සියලු කම්හි සැමදා උපස්තම්භත
133 වූ ශ්‍රීමත් එම නරෙන්ද්‍රයා අනුග්‍රහයෙන් රන්මුනා පියසිදොර කවිළුවෙන්
134 හෙබියා වූ ඇතුළු පිට කරණ ලද නොයෙක් සිත් තමින් සමුජ්ජවලිත වූ
විදුලිය දළින් වළඳනා ලද රන් මුවා පව්වක් සෙයින් නන්වන් විසිතුරු
වියනින් හෙබියා වූ නන් පැහැ විසිරෙන තිරයෙන් චොරජනා වූ මාහැඟි
134 ඇතිරි සෙයින් යුත් මැසි පෙළින් යුක්ත වූ ශ්‍රී දේවතාවාගේ නිවාස
ගෘහයක් බඳු වූ සියලු ලෙව්හි සිත්කළු දැ එක් තැනෙක කැටි කළ
136 මූර්තිමත්ව බබළවනා බඳු වූ ඉතා සිත් කළු වූ මුත්හර හංස තුසාර
137 කිරිවලා සේ පඬෙර විසල් මනෝඥ චන්ද්‍ර ශාලාවකින් චොරජනා වූ
නගන ලද කොඩි ඇති සිත් කළු වූ රන් මුවා කොත්කැරලි ඇති
138 ප්‍රසාදජනක වූ හොබනා විසිතුරු වූ පහය කර වී ය.

139 ඊට ඉක්බිති ව කීර්ති ශ්‍රී මේඝ මහාරාජ නමැති මහාණීවයෙන්
පහළ වූ චන්ද්‍රලේඛා වූ බඳු වූ ලෝ වැස්සා නෙතට මනෝහර වූ ක්ෂත්‍රිය
වංශයට ඒක කේතු වූ ඒ මහරජහුගේ ප්‍රිය භායර්‍යා වූ ඒ මිහිපල් මුදුන්
140 මල් හු සීතා දේවිය රාමා සෙයින් සිත් අලවන්නා වූ නොයෙක් සිය
141 ගණන් අන්තඃපුර ස්ත්‍රීන් අතුරෙහි අත්‍යන්ත වල්ලභතර වූ තුනුරුවන්
ස්වාමි කොට පවත්නා සිය හිහියා තබා ශක්‍ර දේවියා හා සදාශවුවත්
142 යම් බඳු කිසිවෙක් තණපතටත් නොතකන්නා වූ ඒ නරෙන්ද්‍රයා මනවඩනා
143 පරිද්දෙන් හැසිරෙන්නා වූ ප්‍රියවාදිනී වූ ශ්‍රද්ධා ශිලාදි අනේක
ගුණාභරණයෙන් බෙහිබා වු නැටුම් ගීයෙහි දක්ෂ වූ කුශාග්‍රබුද්ධීන්
යුක්ත වූ කරුණා ගුණ යෝගයෙන් හැම කල් සිහිය මනස් ඇති රූපවතීන්
144 අතුරරෙන් ප්‍රවර වූ පතිව්‍රතා ධර්මය රක්නා වූ ප්‍රඥාවන්ත වූ පුණ්‍ය
145 වන්ත වූ පවිත්‍ර ක්‍රියා ඇති පෙව්හි පතළ කීර්ති ඇති රූපවතී නම් දේවී
තොමෝ "මිනිසුන්ගේ ආයුස ස්වල්පයි. සත්පුරුෂ තෙමේ එය සුළු
146 කොට හඟින්නේ ය. ගිනි ගන්නා ලද හිසද ඇත්තෙකු සෙයින්
හැසිරෙන්නේ යයි මරහුගේ නො ඒම නැත්තේ ය." මේ ආදි අනිත්‍ය
147 තාවෙන් යුක්ත වු බුද්ධභාෂිතය මෙනෙහි කරන්නී නොයෙක්
මුනිශ්‍රෙෂ්ඨයන්ගේ භාෂිතය ශ්‍රවණ ධාරණ ඇත්තී සත්වයන්ගේ
අල්පායුෂ්ක බව හා සසර සයුර මුළාව හැසිරෙන්නන්ට කුසල් සමාන
148 ප්‍රතෂ්ඨාවක්හුගේ අභාවයත් දත්තී නොමැලිව නානාප්‍රකාර කුසල්
සම්පාදනය කරන්නී සසර සයුරෙන් වහා තමා එතර කොට නිවන්
149 තෙරට පමුණු වනු පිණිස රන්මුවා නැවක් බඳු රන්මුවා මහසෑයක්
නුවර මැද කරවූවා.

Non-Commercial Distribution

150 ඉක්බිති රම්‍ය වූ ඒ නගරයෙහි නොයෙක් සිය ගණන් දෙමහල්
තුන් මහල් ආදියෙහි යුක්ත නොයෙක් දහස් ගණන් හොබවන ලද්දා වූ
සියලු අතුරු සල්පිළින් යුක්ත සියලු උපකරණයෙක් යුක්ත වූ දවස්
151 පතා ඇත් රථ සංචාරයෙන් නොකඩ වූ නිත්‍යයෙන් පටන් ගන්නාල ද
152 මහ සැණකෙළියෙන් යුක්ත ජන සමූහයාගෙන් ගහණ වූ නානාප්‍රකාර
වීථීන්, පැණ ඇති ඒ රජ තෙමේ කරවී ය.

153 ඒ රජ තෙමේ ඊට ඉක්බිතිව සියලු සම්පත් එලවන්නා වූ ශ්‍රී
වහනය වන තුන් මහල් තුන් පහයකින් සමලංකෘත වූ සමීපයෙහි කරණ
154 ලද වේළුවනය ඉසිපතනය කුසිනාරාමය යන නමින් යුත් විහාරත්‍රයකින්
155 ද යුක්ත කරණ ලද්දා වූ රාජ වේසීභුජංගනය එසේ ම රාජ තුලානතකය
විජිතයයි යන නම් ඇති අතු නුවර තුණක් කරවී ය.

ඉක්බිති පෘථිවි පාල තෙමේ ඒ සමීපෙයෙහිරාජ ප්‍රසාදයට හා
156 පුරත්‍රයට මංවර්ති (ප්‍රදේශයෙහි) ගවුගවු තන්හි සතර දිගින් වඩනා භික්ෂූණ්
පිණිස (කරන ලද) විශ්‍රාමශාලායෙන් ගෙබියා වූ සිත් කළු ධර්මශාලා
157 ප්‍රතිමාගෘහ සහිත වූ එබඳු වූ ම උතුම් වෙහෙර තුණක් කරවී ය.

158 මෙසේ සර්වාංග සම්පන්න වූ සර්වකාමයෙන් සමර්පිත වූ ඒ රජ
159 තෙමේ වසන්ත ශ්‍රීන් හෙබියා වූ අමරාවතිය සදෘශ වූ සතර ගවු අයමින්
සත් ගවු විතරින් තමා විසින් ම වඩනා ලද්දා වූ ස්වකීය නාමයෙන්
උපලක්ෂිත වූ හොබනා සිත් කළු පවුරු වලලු ඇති එසේ ම සිත් කළු
160 මුඩු සෙවෙණි ගෙයින් සමුජ්ජ්වලිත වූ කොවේ මහවෙයින් යුක්ත වූ
ඇසට රසයින් බඳු පුලස්ති නම් පුරයෙහි ශක්‍රද්වේන්ද්‍රයා සදෘශ වූ හැම
161 කල්හි නොලත් ලද්ද වුන්ගේ ලාභ පාලනයෙහි පණ්ඩිත වූයේ විශිෂ්ට
162 වූ රාජද්වාරය මනෝරම්‍ය වූ සිංහද්වාරය විශාල වූ හස්ති ද්වාරය එසේ
163 ම විශාල වූ අන්‍ය වූ ඉන්ද්‍රද්වාරය හනුමන්ත් ද්වාරය උත්තුංග වූ
කුවේරද්වාරය විචිත්‍ර වූ චණ්ඩිද්වාරය එසේ ම රාක්ෂ සද්වාරය උස් වූ
164 භඳංජගද්වාර උජ්ජ්වලවූ පානීයද්වාර අන්‍ය වූ උද්‍යානන්ද්වරයයි හොබ
මායාද්වාරය මහා තීත්වද්වාරය උතුම් වූ ගන්ධර්වාද්වාරදයයි හොබ යන
මේ තුදුස්දොර නරෙශ්‍රෙෂ්ඨ වූ ඒ රජ තෙමේ කරවී ය. මෙසේ පූර්වයෙහි
ඉතා කුඩා වූ අනේක යුද්ධයෙන් නටුවා වූ ඒ පොළොන්නරුව මේරුසාරවූ
විදුරු අගන් වැනි ප්‍රඥා ඇති ඒ පරාක්‍රම බාහු රජ තෙමේ මනා තව්තිසා
දෙව් නුවර මෙන් සජ්ජිත කෙළේයි.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
පුලත්ථි පුර පටිසංඛරණ නිද්දෙස නම් වූ තෙසැත්තැවන අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ හතර වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති නරශ්‍රේෂ්ඨ තෙමේ සොළී සේනාව විසින් සර්ව ප්‍රකාරයෙන්
2 සියල්ල නසන ලද තමන් මුල් රාජධානිය වූ ඒ අනුරාධපුරය ජීවමාන
3 ශස්තෲහුගේ දූවී දහස හා නිම්වළලු ඇති චක්‍ර ලක්ෂණයෙන් හෙබියා වූ
4 පාදයෙන් පිවිතුරු කළ බිම හෙයින් ද මහර්ෂීහුගේ මහා බෝධිය දකුණු
5 ශාඛාවෙන් හා ධාතු ද්‍රෝණයකින් පිහිටි ප්‍රදේශ හෙයින් ද අතිශයින්
6 පිදිය යුතුය හඟතේ ඒ නගරයාගේ ප්‍රතිසංස්කරණය කරවන්ට පටන්
7 ගත. පසුව විචක්ෂණ වූ ඒ රජ තෙමේ එක් මහ ඇමතියකු කැඳවා සිය
කැමති වූ පරිද්දෙන් එය උහුට අණ කෙළේ ය. ඉක්බිති හේ තෙමේ ද
8 ආඥාව සර්වප්‍රකාරයෙන් නුගුළුවා හිසින් පිළිගෙණ ඇඳිලි ද බැඳ
අනුරාධපුරයට ගොස් තෙමිත් විධානයෙහි පණ්ඩිත වූයේ සියලු රාජාඥාව
9 සම්පාදනය කරන්ට ආරම්භ කෙළේ ය.

ඉක්බිති නුවණැති ඒ ඇමති තෙමේ පෙර රජුන් රජ දහන්
10 සීමායෙහි පවුරු අනුපවුරු හා විථි ප්‍රාසාද තොරණයන් ද මනෝඥ
11 පොකුණු ද සුදසුන් ද උයන් ද පෙර පරිද්දෙන් නො බොහෝ කලකින්
12 ම කරවී ය. පසුව මහසෑ ආදි තුන් නිකා අයත් දාගැප් ද ලොහොපා
ආදී බොහෝ වෙහෙර ද කරවී ය. තමා විසුවා වූ ද දොරටු අටලු
තොරන් සහිත වූ දුටුවන් සිත් පිණවන සඳැල්ලෙන් සිත්කළු වූ රාජාංගන
13 සහිත රුසිරු පහයද මේ ආදි සමෘර්ධියෙහි යුක්ත සියලු නුවර පෙර
සෙයින් කරවිය. මෙසේ ම ඒ රජ තෙමේ බොහෝ වූ පෙර රජුන්
14 විසින් කරවන ලද කර්මාන්තයක් එක් ස්වකීයාමාත්‍යයෙකු ලවා වහා
15 නිම විය. (ඒ එසේමැයි) නොයෙක් ජාතියෙහි රැස් කළා වූ
16 කුශලොද්භවයට භාතී වූ නුවණැත්තන්ගේ සියලු මනදොළ
ඒකාන්තයෙන් මොනවට සිදුවේ මැයි.

ඒට ඉක්බිතිව නුවර දොරටු තොරණින් යුක්ත වූ පවුරුදිය අගල්
17 වීථී පහ අවන්හලින් හෙබියා වූ සීලාදි ගුණයෝග ඇති නොයෙක් සිය
ගණන් භික්ෂූන් වාසය පිණිස කරණ ලද ප්‍රාසාදයන්ගේ හෙබියා වූ
18 ආරාමයෙන් සිත් කළු වූ දෙවියන්ගේ ආලකමන්දා නුවර සෙයින්
පොහොසත් වූ පිරුණා වූ සුභික්ෂ වූ හැම කල්හි මනුෂ්‍ය සමූහයාගෙන්
19 ආකීර්ණ වූ පරාක්‍රම නම් නුවර ද මහ පැණැති ඒ රජ තෙමේ කරවී.

20 ඒට ඉක්බිතිව මේ සිංහල ද්වීපයෙහි ඒ ඒ ජනපදයෙහි සිටි යා වූ
මහ ඇමතියෝ එ ඒ දනව් වැසි මහජනයා නොපෙළා ඒ ඒ දනව්වෙන්
21 උපදනා අයත් නොනස්නා කොට යම් යම් පරිද්දකින් ඔවුහු ගණිත්

Non-Commercial Distribution

නම් එසේ එසේ ආඥා කළෝ ය.  පසුව මසක් පාසා සතර පෙහෙවස්
22 දවස්හි සියලු ලක්දිව්හි වැව් ආදි සියලු තැන් වල ගොඩදිය හැසිරෙන්නා
23 වූ මුවන් මසුන් ආදී ප්‍රාණීන්ට ප්‍රඥා සම්පන්න වූ කොයිනුත් භය නැත්තා
වූ ඒ රජ තෙමේ අභය දෙවී ය.

24 පසුව රුහුණු රට වැසි බොහෝ සාමන්තයෝ මාණාභරණ රජහු
මළ කළ තමන් පිහිටක් නැත්තෝ පරාක්‍රමබාහු රජහුගේ ස්වරූප
25 නොදන්නේ භයින් තැති ගත් සිත් ඇති බැවින් ඒ රජහට තමන්
26 නොදක්වා ස්වකීය අපරාධය කෙණෙහි මෙනෙහි කරන්නෝ කල් පසු
27 යත් භය දෙගුණ බවට ගිය කල ඒ නරේන්ද්‍ර ශ්‍රෙෂ්ඨයාගේ අත්‍යයන්
28 විසින් අවිලංඝනීය වූ උදාර වූ වික්‍රම ක්‍රමය සර්වප්‍රකාරයෙන් දූත දූතන්
29 " උපන් වැඩුණු රට එක දවසකුදු ජීවත්ව හිඳීම මැනව"යි සිතමින්
30 අනික් යා යුතු මගක් නොදන්නෝ "නදී පර්වත දුර්ගාදියෙන් යුක්ත වූ මේ
ජනපදය සතුරු සෙනගට කිසි කලෙකත් දකින්ට හෝ වසඟ කොට
31 ගෙණ සුගලා නම් රාජ මාතාව කරා අවුත් "මාණාභරණ රජහු මළ බව
හේතු වූ යම් ශෝකයෙක් වී ද?  දේවිනි,  ඒ ශෝකය ගනමේ ඒ
32 කාන්තයෙන් ඔබගේ සිත නහමක්.  අප ජීවත්වනකල නොයෙක්
33 දූර්ගයෙන් යුක්ත වූ අපගේ මේ ජනපදයට ඒකාන්තයෙන් කවරෙක්
34 නම් වදනේ ද?" මේ ආදි බසින් ඒ රාජනියට හඟවා සියල්ලෝ සමගිව
සියලු දූර්ගස්ථානයෙහි රට සීමාව දක්වා ඇතුන් විසිනුදු කම්පාකට
35 නොහැකි බොහෝ බලකොටු කොට ගෙණ ඒ වටා අඟල් බිඳුවා එහි
යකටු බඳු වූ තියුණු කටු අතුරවා කපා හෙළන ලද රුකින් මාර්ගයනුදු
දුර්ගම කොට පසුව රටවැසි ඒ සියල්ලෝ ප්‍රතිවිරුද්ධයෝව එකෙකි
36 මහ කොටුවෙක නොයෙක් දහස් ගණන් යෝධයන් ඇතිව යුද පිණිස
37 කැසපට බැඳගත්තෝ බොහෝ වූ සන්නාහ ආයුධ ඇතිව මහා බල
38 ඇතිව අතිශයින් සාහසිකව හිඳගත්හ.

39 සුගලා රාජිනි තොමෝ ද විචාරාක්ෂම බුද්ධි නැති බැවින් හා
තමන්ප්‍රකෘතියෙන්ම ම දුෂ්ට බැවින් තියුණු ව්‍යසනයට භාගි වූ ඔවුන්
බස් ගෙණ තමා අයත් මිණි මුතු ආදී බොහෝ වස්තු ද එසේ දළදා
40 පාදා සන්තක වූ බොහෝ වස්තු ද ගින්නෙහි බහලන්නියක් සෙයින්
41 සියල්ල ඔවුන්ට විසර්ග කොට කර්තව්‍යාකර්තව්‍යායෙහි අපණ්ඩිත වූවා
42 තනතුරද දී තොමෝත් ඔවුන් ලවා රජහට පටහැණිකම් කරවන්ට පටන්
ගත්තා ය.

43 අතුන් වසින් ඇක්මිය නොහැකි විකුම් ඇති පැරකුම් නරනිඳු ද
එපවත් අසා ලීලාසහිත මිහිරි සිනාවෙන් සිනා සෙමින් යුද්ධක්ෂම වූ

Non-Commercial Distribution

රක්ෂ නම් සෙනෙවියා කැඳවා ඒ පවත් ඇසූ පරිද්දෙන් තත්වයෙන්
44 උහුට කියා "තෝ වහා ගොස් නැංගවූ සතුරු සෙන් නමැති ලැව් ගින්න
45 ශරවෂ්ා හෙළීමෙන් සියලු ආකාරයෙන් නිවා ඒ දනව්ව රක්නට තැබිය
46 යුත්තන් තබා වහා එව"යි කියා මහ බල ඇති උහු යැවී ය.

47 එකල කොටසර රටවැසි සිංහල කේරළයෝ වේළක්කාර බලයත්
සමග රැස්ව "පරාක්‍රම නරෙන්ද්‍රයන් විසින් රුහුණු රට ගැන්ම පිණිස
48 ඇමැතියන් සහිත ප්‍රසිද්ධ බොහෝ යෝධයෝ යවන ලද්දෝය. මේ
49 අතුරෙහි රජ රට ගනුම්හ"යි මන්ත්‍රණය කොට සියල්ලෝ එක් බස්ව
මහ යුද පටන් ගත්හ. අවනත සියලු මිහිපලුන් ඇති පරාක්‍රමබාහු රජ
50 තෙමේ රථ වාහන බලසෙන් සහිත වීර වූ කිහිප ඇමැති කෙනෙක් එහි
51 යවා මැරිය යුතු ජනයන් මරවා එහි බොහෝ ගම් ගණවැසි (භික්ෂූන්ට)
දෙවා තවත් නොයෙක් ගම් රාජභොගාභී කරවා එහි ද පසමිතුරන්ගෙන්
52 හටගත් භය කොයිනුත් භය නැත්තේ සමනය කරවී.

ඉක්බිති රක්ෂ නම් ඒ සෙනෙවි තෙමේ ඒ මහරජහු අණ පිණිපා
53 පෙරටුව හිසින් පිළිගත. වීර වූයේ මහා යසස් ඇත්තේ
පොළොන්නරුවෙන් නික්ම බරබ්බල නම් පෙදෙසට ගොස් එහි" වාඩිලා
54 ගත්තේ ය. රට වැසියන් සහිත රුහුණු සියලු මහා සේනාවෝ උහු
55 එළඹී ක්‍රමය වූ පරිද්දෙන් අසා "අපි ජීවත් වන්නමෝ අපගේ රාජ්‍ය
සීමාව පැනගෙණ මෙහි එන්ට නොදම්හ" යි මෙසේ කරණ ලද නිශ්චය
56 ඇත්තේ මහත් බලාත්කාර ක්‍රියා ඇත්තෝ ව ස්වකීය ජීවිතයෙහි අපේක්ෂා
57 රහිත ව යුද්ධාරම්භයෙහි ඉතා කැමැති ව එ තැනට ම එළඹිය හ. පසුව
58 රක්ඛ නම් සෙනෙවි තෙමේ ඒ සේනාව සමග රුදුරු යුද කෙරෙමින්
59 බොහෝ බල සෙන් මරවමින් ඔවුන් විසින් මාර්ගයෙහි සිඳ හෙළන ලද
රුක් සිඳමින් කටුවන නම් තැනට ගොස් මහා බල ඇත්තේ එහි
60 බලකොටුවක් කොට ගෙණ උන්නාවූ සතුරු සේනාව හා යුද කොට ඒ
කොටුව බිඳ හේ තෙමේ ඇතුල්ව නොයෙක් දහස්ගණන් යෝධයන්
61 ජීවිතක්ෂයට පමුණුවා එයින් පිටත්ව ගෙණ අම්බල නම් තැන ගියේ එහි
62 සිටි සේනාව සමගත් යුද කොට එහි බල කොටුවක් බිඳ සියලු ඒ යුද්ධ
63 භූමිය මස් ලෙහෙයෙන් පූණී කොට එයිනුත් නික්ම සැවැත් නම් මහ
64 කොටුව ද බිඳ බොහෝ භටයන් මරා ඒ ඉදිරියෙහි දිවාචන්දන්තාබාටව
(බල කොටුවෙහි) ද (ඊට ඉදිරියෙහි ඒ මහ දූලයෙහි මහ පව්වෙන් ගහන
65 වූ මැදිමද්දෙහි ද සිඳ හෙලන ලද නොයෙක් මහ රුකින් බැස ගත නො
හැක්කා වූ (මිනිසුන්ගේ) යාම් ඊම් වර්ජිත වූ මහමග ගව්වක් දෙකක්
66 පමණ දුර වූ වෙනෙහි මතැතුන් විසිනුදු සෙල්විය නො හැකි මහ දොර
67 ඇති අතිශයින් යා නොහෙන බලකොටු සතක් ද පිළිවෙළින් ම කරවා

Non-Commercial Distribution

68 එකක් පාසා තමන් විසූ බල කොටුව (සතුරු සේනාවට) "ඒකාන්තයෙන්
වදනට නො දෙන්නම්හ" යි සර්වප්‍රකාරයෙන් කරණ ලද දෘඪ ගිවිසිමෙන්
යුක්ත පසමිතුරු සෙන් හා කීප මාසයක් රෑ දාවල් දරුණු යුද කොට
ඇමැතියන් සහ නොයෙක් දහස් ගණන් යෝධයන් මරවන්නේ මහත්
බල ඇති ඒ සෙනෙවි තෙමේ එහි ම විසී ය.

69 වීර වූ පරාක්‍රම මහ රජ තෙමේ පොළොන්නරු නුවර වෙසෙමින්
ඒ සෙනෙවිහුගේ මේ යුද්ධ ක්‍රමය දූත මුඛයෙන් අසා "ලාමක වූ දාමරික
70 වූ උන් හා මෙතෙක් කල් සම ව යුද කිරීම සර්වප්‍රකාරයෙන් ම නො
71 යෙදේ. මා විසින් කියන ලද උපදෙසින් දොරටු සහිත සියලු බලකොටු
බිඳ හෙළා අනල්ප වූ සියලු සේනාව මරවා ඒ වෘත්තාන්තය තත්වූ
72 පරිද්දෙන් කියා වහා මා වෙත එව" යි මෙසේ ආඥා කොට බොහෝ
73 යෝධයනුදු දෙවමින් එම යුද්ධ භූමිය වෙතට ස්වකීය රාජ භවනයෙහි
74 වසන සංග්‍රාමොපාය කුශල වූ භූතාධිකාරීහු යැවූයේ ය.

75 ඉක්බිති ඒ මහ ඇමති තෙමේ පුලස්ති නගර වරයෙන් නික්ම
76 රාක්ෂ සේනාධිනාථයා හා කැටිව මහ බල ඇත්තේ ශ්‍රීමත්
77 නරශ්‍රේෂ්ඨයාගේ ආඥාව විරුද්ධ නො කොට මීසම්මුවා සන්නාහ කරවා
ගෙණ මහ සෙන් සරහා ගෙණ මහ යුද කොට නොයෙක් සිය ගණන්
78 බොහෝ වූ යෝධයන් මරවන්නේ පිළිවෙළින් කරවූ සත් බලකොටු
79 බිඳුවා එයින් නික්ම කැලවත්ත යි නම් ලද ගමට ගියාහු, නැවත එහිදු
ඝෝර වූ ඉතා බිහිසුණු යුද කොට එයිනුදු නික්හ වටරක් ගොඩට
80 ගොස් එ කල එහි දී නානා දිගින් පැමිණියා වූ සතුරු සෙන් මරවා
81 දළවඩුන් නම් ගම්හි මහ යුද කොට එයිනුදු ගොස් සොහොවුරා නම්
82 ගම්හි මහ යුධ කොට එයින් රක්ෂ සෙනෙවි තෙම ලොග්ගල සිටි
සතුරු සෙන් සාධනයට බොහෝ බල සෙන් යවා බොහෝ යෝධ
83 සහස්‍රයන් තමා වෙත ද රැඳ වී ය.

මේ අවකාශයෙහි "සෙනෙවි අධිකාරී ගණ්මහ" යි ආවා වූ මහ
84 සෙන් මරවා හේ තෙමේ පැල වී ලොග්ගල ගියා වූ මහත් චතුරංගිනි
85 සේනා තොමෝ ද එහි සිටි සතුරු සෙන් කථාශෙෂ කරන්නී උන් සතු
86 වස්තු ජාතය සර්වප්‍රකාරයෙන් අසිඳ ගෙණ සේනාධිනාථයන් විසූ තැනට
ම පැමිණියා. දෙ සෙනඟ එක්ව මැදගමට ගොස් එහි ද ලොග්ගල සිටි
87 සෙනෙවි අධිකාරීන් හා "දළදා ස්වාමීන් ද , පාදාචාරය ද ගන්ට නො
88 දෙම්හ" යි දෘඪ නිශ්චය කොට ගෙණ කටුදොර වත් ගම්හි හුන් සතුරු
සේනාව හා මහ යුද කොට සතුරු සේනාව මරවා උදුන් දොරට ගොස්
89 එහි බලකොටු තනා හුන් සතුරු සෙන් හා දරුණු යුද කොට දොරටු

Non-Commercial Distribution

90 සහිත බලකොටු බිඳ ප්‍රවිෂ්ට ව බොහෝ සතුරන් මරවා බල වාහන
91 සරහා ගෙණ ඒ ගම විසූහ. ඉක්බිති සුගලා රාජනි තොමෝ ද දළදා
පාදා ස්වාමීන් වහන්සේලා ඇරගෙණ උරුවෙල් ගියා ය.

92 තව ද දිගා වැව සිටි සතුරු සෙන් සාදනු පිණිස පරාක්‍රම
93 නරේන්ද්‍රයා විසින් බල සෙන් සහ යවන ලද කීර්ති නම් අධිකාරි තෙමේ
ද කීර්ති ජීවිත පුස්තකී තෙමේ ද අන්‍ය වූ මහා ප්‍රධානයෝ ද සරසන
94 ලද මහත් බල වාහන ඇත්තේ එරාහුලු දිගින් ගොස් ගිවලබා නම් ගම
95 හුන් සතුරන් හා බිහිසුණු යුද කොට එහි බල කොටුව ද බිඳ නො මඳ
96 ව සතුරනුදු නසා ඉනුන් ඉක්ම නැවත උඩුගම ගොස් එහි බලකොටු
97 කොට ගෙණ තුන් මසක් නිරන්තරයෙන් මහ යුද පවත්වා මහ සෙන්
පලවා ඉන් ඉක්බිති ව හිභොබු නම් වූ තැන බල කොටු බැඳ ඉන් පරිඛා
98 කණවා කටු අතුට ගෙණ සෙනග රැස් කරවා ගෙණ හැම කල්හි යුද්ධයට
සජ්ජිත ව හුන් සතුරු සෙන් හා බිහිසුණු මහ යුද කොට දොරටු සහිත
99 ඒ සියලු බල කොටු බිඳ ප්‍රවිෂ්ට වී. ඉක්බිති ශර වෂ්‍රා වැස්වීමෙන් ළං
100 විය නො හැකි යුද කොට ඉතිදූ තික්ම කිරින්ද නම් ගම ගව්වක් පමණ
101 තන්හි පෙර සෙයින් බල කොටු බැඳ හුන් සතුරු සෙනග පෙර සෙයින්
ම බිඳ මහ බල ඇති ඔව්හු දිගා වැ නම් තන්හි විසූහ.

102 දීඝී දර්ශීන් අතුරෙන් ප්‍රවර වූ පරාක්‍රම නරේන්ද්‍රයා ද එහි සිටි
103 ඇමැතියන්ට මෙසේ හසුන් යැවී ය. "යුද්ධයෙහි බිඳී පලායන සතුරෝ
වනාහි ප්‍රවර වූ පාත්‍රා දංෂ්ට්‍රා ධාතු ස්වාමීන් වහන්සේලා ගෙණ බිය
104 වැද මුහුදු එතර යන්නාහ යි මා විසින් අසන ලදී. එසේ කල මේ
105 ලංකාද්වීපය හිස් වන්නේ ය. වැලි මේ ලක්දිව්හි මිණි මුතු ආදි වෛද
ඇති මාහැගි නන් රුවන් වර්ගය විද්‍යමාන කල්හිත් සර්වප්‍රකාරයෙන්
106 අසදෘශ වූ රුවන් නම් ධර්මස්වාමීහුගේ දංෂ්ට්‍රා පාත්‍රා ධාතුන් වහන්සේලා
107 දෙදෙන ය. තව ද සාර වූ බොහෝ වූ ධනයන් විසඳා සන්නාහ ආයුධ
108 සහිත යෝධයන් අතුරු නැතිව රැස් කොට ගෙණ මේ උතුම් වූ ලක්දිව
නිරවුල් කොට සාදන්නා වූ මා විසින් කරණ ලද මහත් ව්‍යායාමය
109 තෙමේ ද ඒකාන්තයෙන් නිෂ්ඵල වන්නේ ය. නන් රුවන් රසින් උකටින්
දිලයෙන මාහැඟි කිරුළෙන් මා උතුමග ලකළ සළ නුමුත් මහර්ෂිහුගේ
110 දළදා පාදා වහන්සේලා දෙදෙනාගේ උතුම් පහස් යෙදීමෙන් පවිත්‍රිත
නම් වන්නේ ය. එහෙයින් බල වාහන සහිත සියල්ලෝම ඒකමුඛව හා
111 විසින් කියන ලද උපදේශයත් නො වරදවා සාකල්‍යයෙන් සතුරු සෙන්
112 රජ ගෙණ වර දළදාව හා පාදා වහන්සේ වහා එව්ව"යයි කියා හසුන්
113 යැවී ය. කීර්ති නම් අධිකාරීහු ද දිගා වැව් මඬල වසන්නේ ඒ රජු
114 හසුන් හිසින් පිළිගෙණ සෙනග සහිත බොහෝ ඇමතියනුහු රැස්
115 කරවා ගෙණ සේනානායක අධිකාරීන් සිටි තැනට එළඹියේ ය.

Non-Commercial Distribution

116 ඉක්බිති යුහුව ම රට වැසි මහ සේනාව ද වර්ගිකයෝ ද සියලු
ඇමතියන් කැටිව බොහෝ වූ සන්නාහ ආයුධ ඇතිව යුද්ධයෙහි සැරසී
117 ගෙණ නො පසුබස්නා වීර්ය ඇතිව වේගවත් අවයව රූ ඇතිව උඩුන්
දොර නම් ගමට යුද කටැව්ව අවු ය. "අප අයත් රට මැදට වන් සතුරන්
118 අතුරෙන් එක සතුරෙකුත් මිදෙන්නට ඒකාන්තයෙන් ම අවසර නොදී
සතුරන් පලායන මාර්ගයෙහි ද බලකොටු බැඳ දෙ තුන් ගවු පමණ
119 තැන මාර්ගය ද යා නොමහැකි කොට සතුරන් වසන ප්‍රදේශය හාත්පස
නානාවිධ ධාන්‍යයන්ගේ ප්‍රවේශය ද වළකා සියලු සතුරු සේනාව ම
120 දුබල බවට ගිය කල ශර වර්ෂායෙන් ළං විය නො හෙන මහ යුද කොට
121 (සතුරන්) මරන්නෙමු ය" සිතා යට කී ආකාරයෙන් මහ බලකොටු බැඳ
122 ගෙණ යුද ලොල් ව හිඳ ගත.

123 ඉක්බිති භූතාධිකාරී ද, රාක්ෂ සේනාධිනායක තෙමේ ද කීර්ති
124 නම් අධිකාරී ද රණ බිම සුරු වූවෝ මහ සෙන් සරහා ගෙණ සතුරු
125 සෙන් මඬනෝ, උපදෙස් පරිද්දෙන් සියල්ලෝ එක්ව නික්ම ගෙණ
126 ඉතා දරුණු යුද කොට බොහෝ භටයනුදු මරවා ඉතිරියන් පලවා පසුව
127 එයිනුදු නික්මුණු මහ බලැතියෝ මහරීවර නම් බලකොටුව ද බිඳ
එතැනින් සියල්ලෝ නික්ම ගෙණ වොයලගමුව නම් තැන රැස්ව යුද්ධ
128 දක්ෂ වූවෝ වාඩිලා ගත්හ. ඊට ඉදිරියෙහි සමන්ගල් නම් පෙදෙස හුන්
සතුරු සෙන් යට කී ආකාරයෙන් බියකුරු යුදෙහි දී මරා ඉන් ඉක්බිති
129 ව බද ගුණ නම් තැන්හි බල කොටු බැඳ ගෙණ හුන් සියලු සෙන් මහ
130 යවුදෙහිදී බිඳ ප්‍රවර දංෂ්ට්‍රා පාත්‍රා ධාතූන් වහන්සේද්ලා ගෙණ මහ
සෙන් විසින් පෙරටු කරණ ලද්දෝ එහිම විසූහ.

131 ඒ කල මාණාභරණ රජහු සාමන්ත හුරු බෑදෙව් නම් දුර්බුද්ධි වූ
එක් සෙනෙවියෙක් පරාක්‍රමබාහු මහ රජහු විසින් දඟගෙහි හැකිලි
132 බැම්මෙන් බඳනා ලද්දේ දම් බිඳගෙණ පලා ගොස් රුහුණට වන. ඉක්බිති
133 (පැරකුම්බා) නරපල් තෙමේ මංජු අධිකාරීන් අණවා (කියන්නේ) "හුරු
බෑ සෙනෙවියා සිය රටට පලා ගියේ ය. හේ තෙමේ යම් තාක් එක්
134 තැනෙක දෑඩිමුල් ඇති නොවේ නම් ඒතාක් තා විසින් යා යුතුය" යි
135 කියා නරේශ්වර තෙමේ උහු යැවී. හේ තෙමේ පොළොන්නරුවෙන්
නික්ම සාපත්ගමු නම් තැනට ගොස් එහි දී සතුරු සෙන් හා මහ යුද
136 කොට එහි දී බොහෝ යෝධයන් මරවා බල කොටුවකුදු බිඳ ගෙණ
මහා සේනාව විසින් පෙරටු කරණ ලද්දේ තෙමේ එහි ම වාඩිලා ගත.
137 එකල්හි සිය වග වැසි සියල්ලෝ ද බොහෝ දාමරිකයෝ ද බාල දරුවන්
138 දක්නා රට වාසි සියල්ල ද පෙරළා "අපි ප්‍රාණය ත්‍යාග කරන්නමෝත්
දංෂ්ට්‍රා පාත්‍රා ධාතූන් දෙදෙනාා සර්වප්‍රකාරයෙන් ත්‍යාග කරන්නෙමු ය"යි

Non-Commercial Distribution

139 මෙසේ කොට ගත් නියම ඇතිව කෙලෙසුනු චිත්තසංකල්පනා ඇතිව,
දැඩි මන් වසඟ වූ ඒ සියල්ලෝ බත්සූ නම් ගම රැස් වූහ.

140 එකල රක්ෂ සෙනෙවි ද කීර්ති අධිකාරී ද, එසේ ම භූතාධිකාරී ද
141 අන්‍ය වූ බොහෝ සාමන්තයෝ ද සතුරු සේනා හා බිහිසුණු යුද
142 පවත්වන්නෝ දෙදෙනකු විසින් එක් මගෙක යන්ට නො දෙන්නෝ
143 යුද්ධක්ෂම වූවෝ දළදා පාදා ගෙණ රාජ ගෞරවයෙන් මහ පුද
144 පවත්වමින් කොයිනුත් බිය නො ව නික්මුණහ. එ කල දෙමටමල්ලම්
තැන සියලු සතුරු සේනා තොමෝ සන්නාහ සන්නද්ධ ව ගන්නා ලද
145 ආයුධ ඇති වූ වහාම වැව් නම් තැන වසන්නී සියලු අතින් අවුත්
146 බිහිසුණු ලොමුදමන් මහ යුද පැවැත්වී. සෙනෙවියා ආදි වූ ඒ ඇමතියෝ
147 ද දරුණු යුදෙහි මරණ ලද මිනිසුන් සිරුරෙන් ද, දමන ලද ආයුධයෙන්
ද හාත්පසින් පදනික්ෂේපයට අවකාශ නො දෙන්නෝ එතැනින් ප්‍රවර
148 දංෂ්ට්‍රා පාත්‍රා ධාතුන් වහන්සේලා ගෙණ සප්පනාරුකෝකිල නම් ගමට
149 පැමිණියාහ. එ කල්හි රක්ෂ සෙනෙවි තෙම අතීසාරයෙන් මිරිකුණේ
කම් වූ පරිද්දෙන් පරලොව ගියේ ය. සියලු සංස්කාරයෝ ම නස්නා
සුල්ලහ. එ කල මංජු කිර්ති නම් ඇති ඒ අධිකාරීහු දෙදෙනා ඒ
සෙනෙවිරත්හුගේ තනතුරට සුදුසු වූ ගෞරවය නො වරදවා ප්‍රේත
කෘත්‍ය කරවා, ප්‍රඥා සම්පන්න ඒ සෙනෙවියා මළ කල්හිදු නර ශ්‍රේෂ්ඨයා
දුර සිටි කල්හිදු හිම වික්‍රම සම්පන්න එම ධරණීශ්වරයාගේ
ප්‍රභාවතිශයෙන් සියලු සෙන් එක් කොට ගෙණ කිසිවක්හුගේත් කිසි
සංක්ෂොභයකට අවසර නො දෙන්නෝ ( දංෂ්ට්‍රා පාත්‍රා සංඛ්‍යාත) ධාතු
150 ස්වාමීන් දෙ නමට ද මහත් පූජා පවත්වන්නෝ ඒ හසුන් ශ්‍රීමත්
නරෙන්ද්‍රයා හට පමුණුවා වීර වූ ඔව්හු කිහිප දවසක් එහි ම විසූ හ.
151 එපවත් අසා කෙළෙහි ගුණ දන්නවුන් අතුරෙන් පූවර වූ (කර්තව්‍යාකර්තව්‍ය)
විභාග දන්නවුන් අතුරෙන් ප්‍රථම වූ පරාක්‍රම මහීපාල තෙම අණවමින්
152 "යම් පෙදෙසක ඔව්හු ඒ සෙනෙවියා දැවූ නම් එහි සතර දොරක් ඇති
153 මහත් දන් හලක් කරවා සතර දිගින් එන දුප්පතුන්ට මහත් දන් හලක්
154 කරවා සතර දිගින් එන දුප්පතුන්ට මහත් පහන් වැට තබව් " ය යි පූජා
155 පිණිස හසුන් යැවී. ප්‍රධානයෝ දෙදෙන ද සතුටු වූවෝ ඒ ඇණවීම විධි
156 වූ පරිද්දෙන් නිමවා ක්‍රම දන්නෝ එහි ම හුන් හ. එ කල්හි ඒ දාමරිකයෝ
157 සෙනෙවියා මළ හෙයින් ද හුරුබෑ සෙනෙවියා ලත් හෙයින් ද (මේ
අතුරෙහි) "ජය පිණිස උත්සාහ කරමු ය" යි සිතා ඒ සියල්ලෝ ගුත්හල්
මඩුල්ලට ආහ.

158 එපවත් අසා පරාක්‍රාන්ත රජහුගේ ඇමතියන් සහිත මහත් වූ
159 සතුරන් බල මිරිකන්නාහු සේනා තොමෝ නොයෙක් තන්හි මහ යුද

Non-Commercial Distribution

160 පවත්වනී සියලු අතින් ගුත්හල් මඬල අභිමුඛ වූවා ය. එකල්හි ඒ සියලු
දාමරිකයෝ ඒ ගම හැර භයින් මාගම මඩුල්ලට පැලහ. පරාක්‍රම මහීපාල
161 තෙමේ එපවත් අසා "දංෂ්ට්‍රා පාත්‍රා ධාතූන් දෙදෙනා ගමින් ගමට
162 ගෙණෙන්නන් විසින් යුද්ධ කිරීම ඒකාන්තයෙන් සවුප්‍රකාරයෙන් ම මට
163 නුරුස්නේ ය. වහා ම මා වෙත ධාතු යුගලය එවම්" ය යි ළං විය
නොහෙන පැරකුම් ඇත්තේ දූතයන් මෙහෙයී.

164 සෙනෙවි අධිකාරිහු ඒ හසුන් අසා දළදා පාදා වහන්සේලා
165 පොළොන්නරු නුවර යවනු කැමැත්තෝ එක් සාමන්තයෙක්
166 ආරක්සාවෙහි යොදා කිතුල්වල් නම් ගමින් නික්ම කිරි ගම්හි දී සම්ප්‍රාප්ත
167 සතුරු සේනාව හා පෙර සෙයින් බිහිසුණු යුද කොට උන් ඔබිනොබ
පලවා කිරිගමට වැද ඔව්හු එහි දී ද මහ යුද කොට බොහෝ දෙන
මරවමින් ඉනුදු නික්ම තණ ගල ද, යුවගිර ද, කටදොරවෑ, දඹගල ද,
168 යහල්පත ද එසේම මමහ යුදකොට මහාපූජාවෙන් උපලක්ෂිත වූ දළදා
පාදා වහන්සේලා දෙදෙනා ගෙන්වූයේ මංජු නම් අධිකාරීහු වෙත යැවූහ.

169

සාපත් නම් ගම්හිද, ලොග්ග ලද අනල්ප භටයන් මරවා දුනු
170 මඬලායෙහි සියල්ලන් ද වසන කොට එහි සිට හේ තෙමේ දළදා පාදා
171 වහන්සේලාට පෙර ගමන් කොට ඊ දෙවෙහි මහ පුද පවත්වන්නේ
අඳුන් කම්නාවන් ධාතු රක්ෂයෙහි යොදා ධාතු යුගලය මහරජු වෙත
172 යවා එයින් නික්ම බෝ කුසල නම් ගමට ගොස් මන්ත්‍රණක්ෂම වූයේ
173 සියලු ඇමතියන් හා මන්ත්‍රණය කෙරෙමින් "මේ වෛරීහු ප්‍රදේශ
174 කුශලයෝ ය, තමන් වෙතින් අප බැහැර ගිය කල ඔබිනොබ පලා
ගොස් අප විසින් සාදන ලද තැනට වැද වසඟ කළ ජනයා පෙළති,
175 අපගේ ස්වාමි වූ ජගදිශ්වර තෙමේ ද ස්වකිය උපදේශය වරදවා මොනවට
176 සාදන ලද රජය පවා දන්නා යුද ක්‍රම ඇත්තේ තණපතටත්
නොතකන්නේ ය. එහෙයින් ශ්‍රීමත් උන්වහන්සේ ගේ උපදෙස් ම
177 පුදන්නෝ (අප විසින්) වසඟ කළ තෙනට ඔව්හු යම් පරදිදෙකින්
178 නොවද්දි, එසේ ඒ ඒ තැන්හි සාමන්තයන් සහිත වූ බොහෝ සෙන්
179 වෙන් වෙන් කොට තබා සියලු වෛරීන් සුන්මුල් ඇති කොට ස්වාමිහුගේ
වරණ පද්මය හිසින් උසුලන්ට අප යන්නෙමු ය" යි නිශ්චයක්ෂම ප්‍රඥා
180 ඇත්තේ නිශ්චය කෙළේ ය. ඉක්බිති සියලු ඇමතියෝ උහු බස් පිළිගෙණ
181 යුද්ධක්‍රමයෙන් මහසෙන් ගෙණ පිටත්ව නො යෙක් මාර්ග ඇති
වැලිවෑසර ගමට පැමිණ එහි බොහෝ වෛරීන් ජීවිතක්ෂයට පමුණුවා
එයින් නික්ම බලගල් නම් තැන බලකොටුවක් කොට පසුව එහි කිත්තිය
ලංකාපුරය යන දෙදෙනා හා අනිත් චතුරංගනි මහ! සේනාවක් ද,
සිටුවා සියලු ඇමතියෝ ද, ප්‍රධානීහු ද මහා බල සේනාවෙන් පෙරටු

Non-Commercial Distribution

182 කරණ ලද්දාහු දිගාවැමඩුලු නම් තැන්හි සිටි බොහෝ
දාමරිකයන්සාදනුවට මහත් බල ඇති ඔව්හු (රාජ) ආඥා පරිද්දෙන්
පිටත් ව ගියහ.

183
ඉක්බිති දින න ලද (සතුරු) රජුන් ඇති පරාක්‍රමබාහු රජ තෙමේ
දූරිභූත කොට සතුරු වියවුල් ඇති සිත්කළු පොළොන්නරු නුවර
184 වසන්නේ ශ්‍රද්ධා බුද්ධි ගුණයෙන් උපගත වූ නානා පුණ්‍යොදයෙන්
උපලක්ෂිත ව මධුර ක්‍රීඩා විනෝදනයෙනුදු නවවාට්‍යරස දන්නවුන්ට
185 අග්‍රෙසරව දවස් යන්නේ ධාතුන් වඩා ආක්‍රමණය අසා පරමසනෙතාෂ
186 ප්‍රසාදයෙන් සම්පූර්ණ සිත් ඇත්තේ "මම යයි යන යමෙක් මුනිරජුන්ගේ
මේ ධාතු යුග්මය දැකීමට හා නිවෙසනගට ලැබුයෙම් නම් අහෝ ඒ
187 මාගේ මහත් ලාභයෙක, මාගේ ජීවිතය මනා කොට ලබන ලද්දේ ය,
රාජ්‍යසාදන ව්‍යායාමයෙහි උතුම් ඵලය මා විසින් ලබන ලද්දේ ය. මේ
188 ආදී වදන් කියමින් මොනවට ස්නානය කොට මොනවට හැන්දේ මනා
විලවුන් ගත්තේ මොනවට සැරසුනේ සැරසෙන ලද රජකුමරුන් හා
189 ඇමතියන් පිරවරණ ලද්දේ තරු කැලන් විසින් වෙළන ලද සතර චන්ද්‍ර
ලිලායෙන් මහ පින් ඇත්තේ යොදනක් පමන තැන් පෙර ගමන් කොට
පළමුවෙනි දූක්මෙහි ද විසිතුරු අබරණින් හා මිණි මුතු ආදී නන්වැදෑරුම්
190 මාහැඟි රුවතින් ද, නොයෙක් දුමින් හා පහනින් ද, සුවඳ මලින් හා
නන් සුවඳින් ද සත්පුරුෂයන් විසින් පසස්නා ලද්දේ පුදා දිවමනු බුදුන්
191 කෙරෙහි සෙයින් දක්වන ලද ආදර ඇති වීර තෙමේ නිරතුරු සතුටු
192 කඳුළු දහර හෙළන්නේ සිත හටගත් පහන් බැවින් බැහැර ලිය ලුවා බඳු
193 රොමු දෙහෙන් සියල් සියගත හොබවමින් මහා ප්‍රිති ප්‍රවාහයෙහි සිය
194 මනස ගල්වමින් අමාරස දහරින් තෙමූ ගතින් යුක්තවුවකු සේ ධීරවර
තෙමේ හිසින් දළදාවරය උසුලන්නේ හිසින් අඩ සඳ දරන චන්ද්‍රසේකර
195 ලීලා ඇත්තේ එක්ව ආ සියල්ලවුන්ට ධාතු යුලය දක්වමින් මොනවට
196 අසන ලද ආගම් ඇත්තේ ඒ ධාතුන්ගේ ප්‍රභාවය ප්‍රකාශ කරමින් මහපැණ
ඇති ඒ රජ තෙමේ උන් ලවා ද මහත් පූජා කරවා නරේශ්වර තෙමේ
ධාතු යුගලය. එහිම තබ්බවා මොනවට ගොපනය කරණ ලද සියලු
197 ඉඳුරන් ඇත්තේ ඊට මහත් ගොපනය ද කරවා නානාප්‍රකාර පූජා කරන්ටත්
198 නියෝග කොට පහන් බැවින් යුක්ත වූ සිත් ඇත්තේ ම ඇමතියන් හා
පිරිස් සහිත ව මහ බඹහු බඹ විමනට සෙයින් සිය මැදුරට පෙරළා
ආයේ ය.

199
ඉක්බිතිව නුවර මැද මනා දළදා ගෙයක් මොනවට බෙදන ලද
200 සුදම් සබය සේ හොබවා රජ ගෙදර පටන් යොදනක් තැන් මහ ඇතුල්
තලයක් සෙයින් සමතලා කරවා සියලු සතුරන්ගේම වැඩෙහි ඇළුනේ
201 හැම තැන්හි සිතියම් දරන්නා වූ ලෝකානන්ද හේතු වූ තොරන් කරවා

Non-Commercial Distribution

202 තොරන් යට නන් කුසුම් එලෙන විසිතුරු වණී පෙරම්පරා ඇති පුල්වියන්
203 පැළලී බඳවා තොරන්ටැම් එකක් පාසා නන් වතින් වසා බැඳ ඒ ටැම්
204 මුදුනුත් ඡත්‍රචාමර පන්තීන් හා නානා පුෂ්ප කලාපයෙන් ද, විසිතුරු
205 කොටියෙන් ද, පූජාවට සුදුසු අන්‍ය වූ දෙයින් ද සරසා මාර්ගයාගේ
206 උභයපාර්ශවයන් පලදරණ තැඹිලි හා පුන් කලසින් ද, සරසවා
ත්‍රිදරශෙන්ද්‍රයාගේ සුදසුන් වෙය සෙයින් මාර්ගමාරග දෙක්හි විචක්ෂණ
207 වූ රජ තෙමේ මාර්ගයන් අංලකාර කරවා දළදාගෙදොර මාලකයත්
208 අලකා නුවර සේ සත්පුරුෂයන් සතුටු කිරීමෙහි හැකි වූ චතුර රජ
209 තෙමේ එකෙණෙහි සරසවා ඉක්බිති පෘථිවිශ්වර තෙමේ මාහැඟි එක්
210 මහමිණි රුවනක් කරවා සුවඳ සුණින් පුරවා රාෂ්ට්‍ර වර්ධනයට හේතු
211 වූයේ වරද ළදාව එහි වඩා ඒ මිණි රුවන රුවන් මුවා කරඬුවෙක තබා
212 ඒ කරඬුව මැහැඟි රන්මුවා කරඬුවෙක තබා ඉක්බිති ඒ පාදාව ද මාහැඟි
213 කසුන් මුවා නන් රුවන් රැසින් වොරජනා සිත් කළු දෙව්දුනු බඳු සක්
214 සතරෙක්හි පිහිටි ළහිරු රස්පිඬක් බඳු ඉතා සිත් කළු මඬුවෙක්හි
215 මොනවට පණවන ලද මහඟු ඇතිරිළි අස්නෙක්හි සුවඳ මල් ඇතිරියෙක
වඩා ඡත්‍රචාමර බශංබාදීන් ගත් ඇත් ඇති ලම්බකණීයෙන් ද අන්‍ය වූ
මහා කුලවතුන් ද මඬුව හාත්පස්හි තබන ලද්දේ ය. සංරක්ෂණයෙහි
216 සමර්ථ රජ තෙමේ ආරක්ෂායෙහි තබ්බවා ඒ මඬුව පිරිවරා මාහැඟි
217 නොයෙක් සිය ගණන් මණ්ඩපයන්හි සර්වාභරණ විභූෂිත වීණා වස්කුළල්
218 මිහිඟුබෙර ආදිය ඇති ජනයා විසින් ද දිව්‍ය ගාන්ධර්ව ස්ත්‍රීන් සදෘශ
ගාන්ධර්ව ස්ත්‍රීන් වෙන් වෙන් කොට සිටුවා එවුන්ගේ නැටුම් ගීයෙන්
219 වැයුමෙන් ද පුදන්නේ නන් කුසුමෙන් දුමින් නන් වැදෑරුම් ගඳින්
220 සියලු නුවර සුවඳ කවමින් බොහෝ ජනයන් පිණවමින් නොයෙක්
221 පහන් දහසුන්ගේ අලුයෙන් හාත්පස සියලු දිගුන් හා එ සේ ම විදිසාවෙන්
222 එකලු කොට ඡත්‍රචාමර පන්තීන්ද, විචිත්‍ර ධ්වජ පන්තීන් ද, නානා
223 වර්ග පතාකාවෙන් ද සියලු අහස් (කුස) වසමින් ඇතුනගේ කුංච
නාදයෙන්ද අසුන්ගේ හේසාරවයෙන් ද, රථයන්ගේ චක්‍රනාදයෙන් ද,
භෙරීන්ගේ භාන්ඩාකාරයෙන් ද සියලු මංගල සංඛ යන්ගේ මනෝහර
224 ශබ්දයෙන් ද, කාහලයන්ගේ ශබ්දයෙන් වන්දීන්ගේ ජය ඝෝෂාවෙන්
225 ද, සාධුකාරධ්වනියෙන් ද, ආසෙළු ටන රාවයෙන් ද, එසේම උක්කුටී
226 ශබ්දයෙන් ද, සියලු දිගුන් දොඩමලු කෙරෙමින් මිහිපල් තෙමේ
227 සර්වාභරණයෙන් විභූෂිත වූයේ රන්සැත් අදියෙන් සැදුම් ලද ප්‍රවර ශෝභා
228 ඇති ඇතකු නැඟී නොයෙක් වාහනාරූඪ වූ ඇමැත්තන් විසින් පිරිවරණ
ලද්දේ මහත් වූ රාජානුභාවයෙන් ප්‍රවර නගරයෙන් නික්ම දළදා ස්වාමීන්
හා උතුම් පාත්‍රා ධාතූන් වහන්සේ වෙත ගොස් මොනවට ඉසෙහි ඇඳිලි
බැඳ සුවඳ මලින් සිය අතින් මොනවට පුදමින් ධාතු යුගලය ගෙණ ඒ
රජ තෙමේ මගට පිළිපන.

Non-Commercial Distribution

229 එකල ගැඹුර හඬින් පටහ භේරීන්ගේ ස්වරය දික් කෙරෙමින්
ඉන්ද්‍රචාප කලාපයෙන් නභස්තලය හොබවමින් ආලෝක සහිත විදුලීන්
20 ද ඔබ මොබ වගුරුවමින් ශිඛණ්ඩිමණ්ඩලයාගේ අඛණ්ඩතාණ්ඩවයට
231 උපදේසක වූ අසුන් කුර පහරින් උස්ව නගන ලද ධූලීන් හා සමග
232 හිරුහුගේ රශ්මිපන්තීන් අන්තර්ධාන කොට ගෙණ සියලු ආකාසතලය
අඳුරු රැසින් මුවහ කෙරමින් (දිගුබිත් වසා) පැතිර ගෙණ මහත් වූ
233 අකාල මේඝයෙක් ආය.

සියලු ඇමතියෝ ඒ දැක මහ පෙළහර වලහත සන වර්ෂාව
234 වස්නේ යයි නැවත නැවත සිතන්නෝ මහත් දුක් අයත් සිත් ඇත්තෝ
235 මහ පැණැති ඒ මිහිපල්හු වෙත එළඹ "මෙහි කුමක් කටයුතුද ?"යි
236 විචාළහ. එ කල්හි ඒ මහ රජ තෙමේ ත් ස්වකීය තේජස් ආධික්‍යය හා
මහර්ෂිහුගේ චිප්තාවිෂයාපි ක්‍රාප්ත වූ ආනුභාවයන් දන්නේ "තෙපි වූ
237 කලී නහමක් සිතව්, මිනිසුන් දෙවියන් සිත් ගන්නා සුලු වූ අත්භූත වූ
238 මෙබඳු මහත් පූජාවක් පවත්නේමය, මහ පිණැති මහ පැණැති මහ
239 යසැති ළංවිය නොහැකි පැරකුම් ඇති මම ද නික්මිණිම්, මෙහි කවර
240 දෙවියකු කවර මාරයකු මා විසින් පවත් වනලද ඉතා උසස් පූජාවට
බාධා වඩා ගෙන කිසි සැකයක් නො සිතා ඒ තෙපිනිකමෙව්"යයි කියා
නුවණැති රජ තෙමේ නික්මිණ.

241 (එකල්හි ඒ මහා මේඝය තෙමේත් උත්සව ස්ථානයෙන් බැහැර
242 වැසි දහරින් දූඩි ගංවතුර ඇත්තේ සැම තැන්හි වැව් පුරවමින් තෙමේ
243 මහා පූජාව ඉදිරිවූයේම ඉදිරි මාර්ගයෙහි ධාරා පරාග මාත්‍රයක් ම ප්‍රශමයට
244 යවන්නේ වටුයේ යි. ඒ අද්භූතය දැක සියලු නුවර වැස්සෝ ද ප්‍රිය ශීලි
නොයක් සිය ගණන් භික්ෂූන් ද ඇත්තේ මැයි, මේ පිනෙක, මේ
ප්‍රඥාවෙක මේ සර්වඥයන් කෙරෙහි භක්තියෙක, මේ යසසෙක, මේ
තේජසෙක මේ වික්‍රම විශේෂයෙක් ඒකාන්තයෙන් අපගේ මහත් වූ
පිණකින් ලක්දිව්හි පහළ වූයේ ය." මේ ආදි වූ විස්මයාතිශය වදන්
245 කියන්නෝ මහත් වූ ස්තුති සෝසාවෙන් සියලු දිගුන් පිරවූහ.

246 ඉක්බිති ඒ ධරණිපාල තෙමේ පෙර නො දක්නා ලද නො
247 අනුභාවයට සුදුසු මහ සැණකෙළි පවත්වමින් දළදාපාදා වහන්සේලා
දෙදෙනා දළදාගෙට වඩා ගෙණවුත් නුවණ ඇති වීර තෙමේ සියලු
248 පුලස්ති නගරයෙහි සත් රැයක් සවර්ලොකෛකදීපායමාන වූ හේ තෙමේ
249 පූජා කරවිය. මෙ සේ අවලෝකනය කරණ ජනයාගේ ප්‍රමෝද මද
විස්මය සම්භ්‍රමයන්ට ඒක හේතු වූ මහත් වරධාතු පූජාවක් අවනත
250 හිමිපාලයන් ඇති පරාක්‍රමබාහු නම් රජ තෙමේ මනා කොට කර විය.

Non-Commercial Distribution

# හැත්තෑ පස් වෙනි පරිච්ඡේදය

1 එ කල්හි මහ බැලැති සියලු ඇමතියෝ ද, ප්‍රධානීහු ද දීගා වැ
2 මඩුලු රට ගන්ට නික්මුනෝ ස්‍යවනවියල නම් තන්හි මහ යුද කොට
3 එහි දොළොස් දොරටුවක් ඇති බලකොටුව සර්වප්‍රකාරයෙන් බිඳ ඉන්
4 ගොස් ගොමගමු නම් තැන ද, යගම නම් බල කොටුව ද, බල ගල නම්
කොටුව ද බල ගල ද, මහත් යුද කොට සතුරු සෙන් බිඳ බල ගල නම්
5 බලකොටුවෙහි බලවාහන සහිත ඒ සියල්ලෝ වාඩිලා ගත්හ. ඉක්බිති
ඇමතියෝ ද, ප්‍රධානීහු ද එයිනුදු නික්ම මල්වතු මඩුල්ලෙහි මහයුද
6 කොට වටගම් පහණ ද මුලුන නම් ගම ද සෙන්ගොන් නම් ගම ද
7 බොගමු නම් තැන ද, වඳුරාගම ද ගලලමධීක ගම ද ඒ ඒ තැන
8 බිහිසුණු ක්‍රම ඇති මහ වුද කරන්නෝ කිතුල්වල්ගමු නම් ගමට ගොස්
9 හාත්පසතුන් ගවු පමණ තන්හි බොහෝ ආවරණ සහිත වූ මහ බල
10 කොටුවක් කොට ගෙණ හුන්නා වූ සතුරු සෙන් හා මහ යුද පවත්නා
බොහෝ හටයන් මරවා සතුරන්ට භය උපදවමින් ඔව්හු එහිම වාඩි
ලූහ.

11 එකල්හි සියලු දාමරිකයෝ " මුළු රට වසඟ රණ ලදුව ගණුම්
12 හ"යි දිගාවැමලට නික්මුණාහ. කීතුල්වල්ගම්හි සිටියා වූ ඇමතියෝ ද
ඒ විධාන තත් වූ පරිද්දෙන් අසා බොහෝ හටයන් යැවූහ. ඒ සියල්ලෝ
දෙරැයකින් විසිගවු පමණ මග ගෙවා ගොස් මහ යුද කොට සතුරන්
13 මරා නැවත යුද්ධයක නිරුත්සාහයන පරිද්දෙන් භයකොට දිනුවා වූ
14 ඔව්හු එ තැනට ම පෙරළා අවුය. එ කල්හි සියලු ඒ ඇමතියෝ එම ගම්
15 සමීපයෙහි ඈපාදොඹකඩ නම් තැන බල කොටුවක් කොට ගෙණ
16 තුන්හල මඩල සිටි වෛරීන් හා මහා යුද කොට එසේ ම සොරඹගමුවෙහි
17 ද, නැවත මුලාන ගම්හී ද, එසේ ම හුදමුමඩල ද යන මේ ගම්වල මහ
17 යුද කොට කිතුල්ගම් නම් තැනින් පිටත්ව කිත්රජවැලිගම්හි යුද කොට
18 දලදා නහ් තැන්හි ද වැලිකසා නම් ගම්හි ද බිහිසුනු යුද කොට
19

20 ඉක්බිති හුයගම්හි යුද කොට බොහෝ සතුරන් මරමින් වාඩිලා
21 හුන්හ. ඉක්බිති පෙර රජුන් විසූ මානාභුල නුවර රාජධානි කරුණු
22 පිණිස (පැරකුම්බා) මහ රජුන් විසින් යවන ලද්දා වූ රක්ඛ නම් දෙමළ
23 අධිකාරී තෙමේ ද, රක්ඛ කංචුකීනායක තෙමේ ද මහත් සේනාව
සරසා ගෙණ යුද කටැට්ව නික්මුණා හ. පසුව රක්ඛ කංචුකී නායක
තෙමේ පස්යොදුන් රට වැසි දේවරාජ නම් කෙස්දානාවන් ද මහසෙන්
24 ද යවා එහි සිටි බොහෝ සතුරන් විනාස කරවා පසුව ගිම්තොට නම්
ගම රාජධානියක් කරන්ට කරණ ලද නොයෙක් බලාකොටුවල

Non-Commercial Distribution

වාඩිලාහුන් සතුරන් බොහෝ සෙයින් කථාශේෂ කොට විධානයෙහි
25 පණ්ඩිත වූයේ යුද්ධයෙහි ක්ලාන්ත වූ සෙනග විශ්‍රාම කරවන්ට වීර වූ
හේ තෙමේ එහිම කිහිප දවසක් කල් ගෙවිය.

26 ඒ කල්හි ඒ මේ සතුරෝ මහ දුකින් පෙළෙන ලද්දාහු සියල්ලෝ
ම රැස්වගෙණ නැවත දැඩිසේ මෙසේ සිතූහ. "පරාක්‍රම නරෙන්ද්‍රයාගේ
27 කල්පාන්ත වහ්නිය බඳු තේජස තෙමේ මුළු දඹ දිව රජුන් විසිනුත් නො
28 ඉවසිය හෙයි. ගජබා තෙමේ ද මාණාභරණ රජ තෙමේ ද යන
29 යුද්ධෝපාය දන්නා මේ රාජ ශ්‍රෙෂ්ඨයෝ දෙදෙනා මහසෙන් සරසා
30 බොහෝ වස්තු වියදම් කොට රැ දෙවෙහි අනේකාකාරයෙන් යුද කරන්නෝ
ඒ රජහුගේ ජය බෙරහඬ අසා දුරින්ම බිඳුනාහු හිරු උදාකල කන
31 මැදිරියන් බඳුව සිය රට වසන්ටත් නොහැකි වූවෝ බයින් පෙළුනාහු
32 අනික් ගතියකුත් නො දක්නාහු යම රජහුම ඇසුරු කළහ. අපගේ බල
කොටු හැර අන්‍ය වූ ආරක්ෂක ස්ථානයක් විද්‍යාමාන නොවේ. සියලු
33 ආකාරයෙන්ම මේ රට තෙමේ ගිරි දුර්ගාදියෙන් යුක්ත ය. එහෙයින්
34 සියලු දුර්ගයන්හි බොහෝ අවුරුණු කොට ගෙණ සියලු ප්‍රසිද්ධ මහා
මාර්ගයන්යෙන් ද යා නොහෙනු කොට බොහෝ සෙර මාර්ගයනුදු
කොට රට දුෂ්ප්‍රවෙශ බවට ගිය කල රැස්ව ගෙන යුද්ධ කරම්හ "යි
35 (මන්ත්‍රණය කොට) පසුව සියලූ දාමරිකයෝ තුමු එක්මුවට ගාලුනදියගේ
මුව දොරට යුද කැමතිව පැමිණියාහ.

ඉක්බිති කංචුකී නායක තමේ ඒ පවත් අසා එහි පැමිණ මහ යුද
36 පවත්වා ඔවුන් පැලවීයුදෙහි බුන් ඒ සේනා තොමෝ මහවැලි ගම්හි
37 හුන් සතුරන් හා හැම අතින්ම සමාගම් වීය. වැලිත් කංයුකී නායක
38 තෙම සිය සෙන් සකස්වා ගෙන මහ වැලි ගම සිටි සතුරන් හා යුද
39 කරණු පිණිස (එතනින්) පිටත්ව ඒ සියලු සතුරන් මැඩ පවත්වා
40 යුද්ධාංගනය ගුරුලන් විසින් පහරණ ලද නාලොව සේ කොට එතනිදු
ඔවුන් දිවියකු බොහෝ මුවන් සේ පලවා ජය ගන්නා සුලු වූ මහ බල
ඇති හේ තෙමේ එහි වැඩි ගත. ඉක්බිති ඒ කංචුකී නායක තෙමේ
41 වැලිගම වෙසෙමින් අර්ථානත්ථ චිත්තායෙහි විචක්ෂණ වූයේ මෙසේ
42 මන්ත්‍රණය කෙළේ ය."මේ සතුරෝ නොදන්නා ලද දහනක්‍රම ඇති
පළඟැටියන් සෙයින් බොහෝ වූවෝ එහි ම දනු ලබමින් අතිශයින්
43 විනාස වන්නාහ. මුන් නට කල රට ද වනයක් බඳු වන්නේ ය. මොව්හු
44 වනාහි අප රජහුගේ දයා බහුල බව නොදනිති. මෙතැන් පටන් යම්
45 සතුරු කෙනෙක් අප වසයට එත් නම් උන්ට අභය දෙවා රක්ෂණය
කටයුතුය" යි (මන්ත්‍රණය කොට) පසුව රට වැසි කිසිවෙකුට හසුන්
46 (යවන්නේ ) "යමෙක් ජීවත් වනු කැමැත්තෝ නම් ඔව්හු මා කරා

Non-Commercial Distribution

47 එත්ව"යි කියා යැවී ය. ඒ අසා සිය පණ හා සිය දන කැමැති වැලිගම්වැසි
48 වෙළඳුන් හා බොහෝ පටුන් වැස්සෝ ද අන්‍ය වූ රට වැස්සෝ ද
හාත්පසින් අවුත් බියෙන් මිරිකුනෝ රක්ඛ කංචුකී නායකයා දුටහ.
ඉක්බිති ඒ කංචුකී නායක තෙමේ දෙව් නුවර ද, එසේ ම කඹුරුගමුවෙහි
ද, මහාපනාලගම ද මානාකපිටි ගම ද, තිල්වලා ගං තෙර ද,
49 කෙහෙල්පත් නම් ගම් ද යන නොයෙක් තැන සිටි සතුරන් ස්වකීය
50 යෝධයන් යවා බොහෝ යුද කරවා ඒ ඒ තැන ජය ලැබ සම්ප්‍රාප්ත වූ
ඔවුන්ට අනුග්‍රහ කෙළේ ය.

51 එ කල්හි සියලු දාමරිකයෝ "වෛරීන්ගේ ප්‍රබල බලයට මාකෙත
52 නම් තැන (මාවැල්ල?) නදිය එතරව යුද කරන්ට නොදෙන්නෙමු ය " යි
53 නිශ්චය කොට ගෙණ ඔව්හු එයින් නික්ම මහත් සාහසික වූවෝ තුමු ම
54 හෝ තෙරට පැමිණායහ. කංචුකී නායක තෙමේ ද එ පවත් අසා බල
55 සෙන් එහි ගොස් සතුරන් හා යුද පිණිස සිය සෙනග යැවී ය. පසුව
56 උභය පාර්ශ්වික වූ මහා භටයෝ ගඟමැද රළු යුද කළහ. එකල දෙ
57 සේනාවන්ගේ යුද්ධය මුහුදෙන් නැංගාවූ දානවයන් හා දෙවියන්ගේ
යුද්ධ සෙයින් බිහිසුණු විය. එකල ඒ මහා වීරයෝ වනාහි ඒ සතුරු
මහසෙන් හා යුද්ධ කරන්නෝ මෙසේ සිතූහ. "මුන් හා සමසංග්‍රාමය
58 නම් පරාජයක් වැන්න, අපගේ ස්වාමිවූ රජු තබා ඒ කංචුකී නායක
59 තෙමේත් මෙ පත් ඇසුයේ වී නම් අපට මහත් නින්දා ය, මේ සතුරන්
කිලිල් කඩ සෙයින් සිඳ හෝ දියෙහිහෙලා මස්කැස්බන් බත් කරන්නෙමු.
උන්ගේ ක්‍ෂුධා දුරු කරන්නෙමු. නොහොත් අපි හෝ (ඔවුන් බත්
60 වන්නෙමු"යයි සිතා) රාම රාවණ සංග්‍රාමයෙහි තරණය කරණ ලද මුහුදු
61 ඇති වඳුරන් සෙයින් අත්‍යන්තදාරුණ මහා යුද්ධ කොට වහාම සේනාව
මස් ලේ ගංගා කොට මහ බල ඇත්තෝ දිගැලිකෙත ගන්නා පිණිස
62 එයින් නික්මුණහ. ඒ යෝධයෝ එහි ගොස් කෙසෙල් වනයට ඇතුන්
63 සෙයින් වැද පසමිතුරන් මුළු උම්මූලනයකළහ. එහි දී බිඳුනු සතුරෝ ද
64 ස්වර්ණමලය නම් තැන්හි රැස්ව ගෙණ නැවත ද යුද පටන් ගත්හ.
65 ඉක්බිති ඒ කංචුකී නායක තෙමේ එහි ද බොහෝ භටයන් යැවී ය.
ඔව්හු ද නිරන්තරයෙන් ශර වර්ෂා වස්නෝ ද වරයන් අතින් වනගාමී මං
66 විචාර ඔවුන් විසින් දක්වන ලද මගින් එහි වැද ඒ ඒ බල කොටු ඇසුරු
කළා වූ බොහෝ වූ ඒ යෝධයන් මරා ස්වර්ණමාලය නම් තැන ද
නිෂ්කණ්ටක කළහ."

67 ඉක්බිති ඒ කංචුකී නායක තෙමේ මාලාවරත්ථලී නම් තැනට
68 යෙමින් ස්වර්ණමලයට ගිය යෝධයන් වෙත "මම මේ මගින්ම
69 මාලාවරත්ථලී නම් ගමට යෙමී. තෙපිඳු ඒ යන මගට පිළිපදව් ය"යි

Non-Commercial Distribution

අසුන් යැවී ය. ඔව්හු ද ඒ අසා එසේ කළහ. ඒ තෙමේ ද ඒ සියලු
(යෝධයන්) ගෙණ මාලාවර්තලියට ගියේ ය.

70 යුද්ධක්ෂම වූ රක්ඛ නම් දමිළාධිකාරි තෙමේ ද මහ බලසෙන්
71 විසින් පෙරටු කරණ ලද්දේ දෙණවකට එළඹියේ ය. එකල්හි බොහෝ
72 දාමරිකයෝ එ පවත් අසා මානාකුල නුවර වසන එක්බාලංකාපුර නම්
ඇමතියාහට ද තත් වූ පරිද්දෙන් එ පවත් ප්‍රකාශ කොට වහා එනු
73 පිණිස උහුට ද හසුන් සැනෙකින් යවා "දෙනවක පටන් නව යොදුන්
74 රටට වැදීම (වළක්වා) ඒ බල කොටුවලම නවත්වන්නෙමු" ය යි සිතා
75 මහත් සාහසික වූ ඒ සියල්ලෝ යුද්ධාරම්භ කළහ. විධානයෙහිපණ්ඩිත
වූ රක්ඛ නම් දමිළාධිකාරි තෙමේ ද විධානයට ප්‍රථමයෙන් සතුරන් හා
76 යුද්ධයාගේ මුඛ භංගය කරන්ට කැමැත්තේ බොහෝ වූ භටයන් ලෝක
නම් කෙස්දානය නාථ නම් සංඛ නායකයා යන මේ ආදි සාමන්තයන්
78 ද යුද කැමැත්තේ යැවී. ඔව්හුදු මහ යුද කොට මහරජ පැමිණියහ.
79 එකල්හි බිඳුනා වූ ඒ සතුරෝ මහ බියෙන් වියවුල් වූවාහු ගරුළථක
80 ලඤ්ච නම් තැන රැස් වූහ. එකල්හි ද රක්ඛ නම් ඒ දමිළාධිකාරි
තෙමේ එතැනත් ගන්නා පිණිස එම මහසෙන් යැවී ය. ඒ මහා යෝධයෝ
81 ගොස් බොහෝ අවුරුණු සිඳින්නෝ නොයෙක් දොරටු යෙදූ මහ බල
කොටු බිඳිමින් සතුරන් වූසු තැනට සම්ප්‍රාප්තව ජීවග්‍රාහයෙන්ගත යුතු
82 වූවන් ගෙණ බොහෝ වූ අන්‍ය වෛරීන් වහාම මරු මුවට පමුණුවා
ඉතිරියන් පිහිට නැතිව පලවා එ තැන ද නිෂ්කණ්ටක කොට ගියා වූ ඒ
83 යෝධයෝ උහු වෙතටම පෙරළා ආහ. එකල්හි ඒ තෙමේ සුදුසුපරිද්දෙන්
උන්ට ප්‍රසාද දෙවී ය.

84 එකල්හි දෙමළ අධිකාරී තෙමේ ද ගිම් හිරු තෙදින් දනු ලබන්නා
85 වූ වලත් මේඝය සෙයින් ඒ රජහුගේ තෙදින් අළු ශේෂ බවට යන
86 වෛරීන් ශාමප්‍රයෝගයෙන් රක්නට නුවණැත්තේ දෙණවකටම පෙරළා
අවුත් සිංකළ රටෙහි තැබ්බයුත්තන් තබ්බවා වසඟ වන්නන් වසඟ
87 කොට ඒ රටත් ශුද්ධ කෙළේ ය. පූවක් දණ්ඩාවෙහි බලකොටුවක්
88 කොට ගෙණ හුන්නා වූ මහත් බල ඇති පසමිතුරෝ නැවත යුද පටන්
89 ගත්හ. ඉක්බිති දෙමළ අධිකාරි තෙමේ ද එහිදු යුද්ධ ක්‍රීඩායෙහි
නුවණැත්තා වූ සාමන්තයන් හා බොහෝ භටයන් යැවී ය. ඒ මහා
යෝධයෝ ද ගොස් ශර වර්ෂා වස්වන්නෝ භේරීන්ගේ නාදයෙන් ද
90 ඛඩ්ගයන්ගේ විවර්තයෙන් ද විදුලිය සහිත අකාල මේඝ විග්‍රහ සෙයින්
91 දක්වන්නෝ ස්වකීය වීර රසාස්වාද යෙන් යුද්ධශ්‍රම දුරු කෙරෙමින්
තමන්ගේ ජයභේරියෙන් වීරශ්‍රිය ද පිදූහ. පසුව බොහෝ ඒ පස මිතුරෝ
92 "තඹගමු නම් තැන බලකොටුවක් කොට ගෙණ ඉන්නාහ"යි අසා වීර

Non-Commercial Distribution

සම්මත වූවෝ ස්වකීය වික්‍රමෙක රස බව දක්වනු කැමැත්තවුන් සෙයින්
93 රාත්‍රියෙහි එහි ගොස් රණභෙරි ධ්වනියෙන් යුද පිණිස පස මිතුරන්
94 කැඳවන්නවුන් සෙයින් වන්හ. එකල්හි සියලු දාමරිකයෝ බෙරහඬ
95 අසා ඉස හෙන හෙන්නා සේ සිතමින් කිසිවෙක් මූර්ජිත වූහ. කිසිවෙක්
පලා ගියහ. කිසිවෙක් ආයුඃක්ෂයට පැමිණියහ. ඒ බල කොටු
හස්මවාශේෂ කොට දමවා එකල්හි මහ බල ඇති ඔව්හු පුවක් දණ්ඩාවටම
පෙරළා ආහ.

96 රක්ඛ නම් දමිළාධිකාරි තෙමේ නැවත සිට සෙන් කැඳවා ඒ ඒ
තැන සැඟවී උන් පසමිතුරන් සාදනු පිණිස සාමන්තයෙකු හා චතුරංගනී
97 සෙන් යැවී ය. ඒ සේනා තොමෝ බෝ වල කිතුල් වල
98 අතරන්දාමබෝකඳ (යන ගම් වල) බොහෝ සතුරන් මරා රාත්‍රි යුද්ධ ද
99 කොට පෙරළා ආවා. එකල්හි දෙමළ අධිකාර තෙමේ ද මහ බල
සේනා විසින් පෙරටු කරණ ලද්දේ උෟරල බෙරලපනාතොට නම් තැනට
100 ගොස් සර්වප්‍රකාරයෙන් නරෙන්ද්‍රයාගේ උපදේශය විරුද්ධ නො කොට
101 වෛරී නොව ඒ ඒ තැන සැඟවී උන් බොහෝ දෙනා සිය රට පෙර
102 සෙයින් පිහිටුවා දිනූ රටත් තැබ්බ යුත්තන් තැබ්බවා බිහිසුණු
103 මහාසේනායෙන් පෙරටු කරණ ලද්දේ එයින් නික්මහින් තල් ගොඩ
නම් ගමට එළඹියේ ය. එකල්හි ඒ ඒ තැන සැඟවී උන් බොහෝ
104 දාමරිකයෝ රට වැසි සේනා ගෙන්වා මහ බල ඇත්තෝ තමන් විසින්
ම සෙනෙවිරත් බැව්හ තබන ලද නොයෙක් සිය ගණන් යෝධයන්
105 විසින් පෙරටු කළ රක්ඛ ලංකාපුර නම් තැනැත්තහු ද බෙර හා කාලම්
106 හඬින් නා නා දිගුන් පුරවන්නා කැඳවා නදී හඬනම් වූ ගමට එළඹිණහ.
නැණැති දෙමළ අධිකාරි තෙමේ ඒ විධාන අසා සිය භටයන් කැඳවා
107 මේ බස් ඔවුන්ට (කියන්නේ) "තොපගේ ස්වාමියාහට පක්ෂපාත බැව්
108 මෙහිදී දක්වව්. තොපගේ වීර බැව් මම ද මෙහිදී දකිමි. මේ තෙමේ
109 නෙරට ය. මේ සතුරෝ ද මහා සාහසිකයෝ යි. මෙසේ කල්පනා නො
කොට අපගේ ස්වාමිහුගේ තේජසින් යුද්ධ භූමියෙහිනිසැකයෙන් ජය
110 ලාභය මෙනෙහි කෙරෙමින් යුද කර ඉක්බිති මහා උත්සාහ ඇති ඉතා
111 සාහසික වූ ඔව්හුදු නික්ම ගෙණ මහා සේනා නම් ගම්හි යුද පිණිස
112 තැනක් ගත්තහ. එ කල දෙ පක්ෂයෙහි ම යෝධයෝ පැන යුද්ධ
භූමියෙහි ආයුධ අන්‍යෝන්‍ය ඝට්ටනයෙන් හටගත් ගිනි පුපුරුයෙන්
113 සියලු අහස දවල් තරු නැංගා සේ කෙරෙමින් ශර වර්ෂා නිපාතයෙන්
114 සියලු අහස් දිගුන් පුරවමින් වීර කෙරෙමින් මහ යුද පටන් ගත්හ.
115 එකල්හි මහ බල ඇති දෙමළ අධිකාරී තෙමේ රක්ඛ ලංකාපුර නම්
සේනාපතියා ගේ වීර භාවයන් සමග ම හිස ගත්තේ ය. එකල්හි සියලු
දාමරිකයෝ පිටිවහල් නැතිව වෙරළ නැගි සාගර ජලය සෙයින් බිඳුනාහ.

Non-Commercial Distribution

116 එකල යුද්ධ භූමිය ද කා ගිජුලිහිණි ආදීන් විසින් ගැවසී ගත්තේ වී.
117 එකල්හි දෙමළ අධිකාරී තෙමේ ද යුද්ධයෙහි ලත් ජය ඇත්තේ මහ
සැණකෙළි කෙළෙමින් සෙනග විසින් පිරිවරණ ලද්දේ මහා යසස්
ඇතිව මායාකුල නුවර ගත්තේ ය.

118 එකල්හි රාක්ෂ කංචුකී නායක තෙමේ ද මාලාවරත්ථල [1] යෙන්
පිටත් ව මානාකුල නුවරට වහාම ගියේ දමිළාධිකාරීහු දිට. එකල්හි
කල් නොකල් දන්නාද ප්‍රාඥ වූ ඒ තෙමේ දළුහු සමග මෙසේ මන්ත්‍රණය
119 කෙලේ ය."ස්වාමීහු ගේ උපදෙස් පරිදෙන් මානාකුල පුරය අප විසින්
120 ගන්නාලද්දේ එහෙත් නොනුවා වූ බෙහෝ වෛරීහු ද වෙති. ඔව්හු
121 පිටිවහල් නැති ව ගොස් කටවකට[2] වන්හ. ජය ලැබ සිටියා වූ
122 යෝධයන්ගේ වහාම එහි යාම මහ නුරුස්නේ ය. ස්වාමීන්ගේ උපදේශය
123 ම අපට සරණමැකැ යි එහෙයින් එහි ඉද ගෙණ පස මිතුරු නොවී ඒ
124 ඒ තැන සැඟවී උන් (එහි වැස්සන්) ගෙන්වා ස්වකීය රටෙහි පිහිටුවා ඒ
මානාකුල නුවරම කල් ගෙවූහ. එකල්හි සංවකට වන් බොහෝ වූ ඒ
125 සියලු පස මිතුරු වර්ගීකරයන් පෙරළා නැවතත් යුද කරණු කැමැතිව
126 කඩවක් නම් තැන්හි රැස් වූහ. එකල්හි දෙමළ අධිකාරී තෙමේ ද "
යුද්ධය පිණිස මේ කාලය"යි මෙසේ සිතා මානාකුල නුවරින් පිටත්ව
127 (අවුත්) කොග්ගල උඩවැව්හි බිහිසුණු යුද්ධාරම්භ කෙළේ ය. මහා
128 ප්‍රාඥ හේ තෙමේ ඒ සියල්ලන් පලවා පෙරළා ගියේ ය. එකල්හි කිසි
සතුරු කෙනෙක් සඟබෙ නම් ගම්හි පැමිණියහ. සූකරභාතුදේව නම්
129 සේනාපති තෙමේ ස්වකීය භටයන් හැර ගෙණ යුද කැටිවව මාගමට
130 ආය. එකල්හි හේ දෙමළ අධිකාරී තෙමේ ද ස්වකිය භටයන් සංබෙය
131 නම් ගමට ප්‍රථම කොට යැවී ය. එකල්හි ඒ මහා වීරයෝ යුද්ධ භූමියට
ගොස් ශ්‍රීමත් වූ පරාක්‍රම නරෙන්ද්‍රයාගේ තේජස් ගින්නෙහි බොහෝ
132 වෛරීන් දවා එහි මනකොට මහා සැණකෙළි පවත්වමින් මනාකඳල
133 නුවරට ම පෙරළා අවු ය. එකල්හි දෙමළ අධිකාරී තෙමේ ද සෙනෙවියා
ගන්ට දේවලංකාපුර නම් සෙනෙවියා ද අන්‍ය වූ බොහෝ භටයන් ද
134 යුද පිණිස යැවී ය. ඔව්හු ද යුද්ධභූමියට ගොස් අනවතරයෙන් යවන
135 ලද හීයෙන් සියලු අහස වසමින් ගර්ජනාත් කෙරෙමින් යුද්ධ භූමියට
වන්නාහු සෙනෙවියා මරා සතුරන් බින්දාහ. එකල්හි ද ඒ මහායෝධයෝ
ජය හෙරි ධවනියෙන් දෙමළ අධිකාරීහු සතුටු කරන්නෝ මාගමට
එළඹියහ.

136 එකල්හි රක්ඛ ලංකාපුර නම් සෙනෙවියාගේ වැඩිමහල්
137 සහෝදරයෙක් එහි තමන්ටගේ ප්‍රධානත්වය තෙමේ ම කොට ගෙණ

1. මාරාකඩ 2. (කඩවතු කෝරලය?) 3. කෙරවග් ගල?

Non-Commercial Distribution

138 මරණ ලදින් ඉතිරි බොහෝ සතුරන් ගෙණ චෝර යුද්ධ පිණිස මානාකුල
නුවරට එළඹියේ ය. එකල්හි දෙමළ අධිකාරී තෙමේ වනාහි එහිත්
139 භටයන් යැවී ය. ඒ යෝධයෝ එහි දී උහු මරා බොහොා් සතුරන්
140 බින්දාහ. බිඳිනා ලද ඒ යෝධයෝ කුරවකල්ල[3] නම්තැනට පැමිණියහ.
රක්ඛ නම් දෙමළ අධිකාරි තෙමේ මානාකුල නුවරින් නික්ම ඒ සියල්ලන්
බිඳ පෙරළා එහි නො ආ ය.

141 එකල්හි වික්‍රම නම් ලොකගල්ලතෙමේ ද එසේ ම අන්‍ය වූ
බොහෝ සතුරෝ ද මානමූල පුස්තකිහු සමග මාගම්හි යුද පිණිස හැම
142 අතින් එළඹිය හ. මානමූල පුස්තකී නම් ඒ තෙමේ ද ඒ යුදයෙහි දී
ස්වකීය පක්ෂපාතයනුත් එකත්ව යුද කොට ලා හෙලා ජය ගත්තේ ය.
143 එකල්හි දෙමළ අධිකාරි තෙමේ ඇමතියන් සහ මන්ත්‍රණය කෙරෙමින්
144 " එකී එකී මහා යුද්ධයෙක්හි වෛරින්ගේ විනාශය ද භයින් ඒ ඒ තැන
පලායාම ද දකිමින් වෛරීහු පෙරළා යුද්ධයෙහි නිරුත්සාහ වූ යයි
145 සිතම් හ. එසේ ද උවත් උන්ගේ මුල් නැති බව නොපෙණේ මැයි රට
146 මැද හැර ඒ ඒ තැන සැඟවී උන්නන් රට මැදට පැමිණි කල නසන්නෙමු
147 ය" යි කියා පණ්ඩිත වූ මහා යසස් ඇති හේ තෙමේ පුවක්දණ්ඩාවට
148 පෙරළා ආයේ ය. ඒ දාමරිකයෝ වනාහි උහුගේ මන්ත්‍රණය නො දැන
149 ඒ ඒ දුර්ග ස්ථානයෙන් රට මැදට බැස්සාහ. දෙමළ අධිකාරි තෙමේ වූ
පරිද්දෙන් එපවත් අසා එතැනින්ම පිටත්ව වීරයන් විසින් පෙරටු කරණ
ලද්දේ ම බෝ වල නම් ගම හුන් බොහෝ වෛරීන් ද පසුව ඌරල
150 බෙරගල නම් තැන ද මීගොඩ නම් දුර්ගයෙන් දූයි යන හැම තැන්හි මහ
151 යුද පවත්නා සතුරන් ජීවිතක්ෂයට පමුණුවා රට මැදට එළඹ එහි ද
152 තන්හි තන්හි සියසෙන් යවා ඒ සියල්ලන් මුල් උදුරවා පසුව හුලය නම්
153 ගම සිටි ප්‍රධානයන් වෙතින් ආවා වූ හසුන් අසා කුඹුගමට එළඹියේ ය.

154 ඉක්බිති හුයල බලකොටුවෙහි උන් මඤ්ජු නම් අධිකාරි තෙමේ
155 ද කීර්ති නම් භූත නම් ඒ අධිකාරීන් දෙදෙනා ද අනල්පවීර සාමන්තයන්
හා භටයන් විසින් පිරිවරණ ලද්දෝ මහසැණ පවත්වමින් එතනට ම
156 එළඹියහ. එයින් මඤ්ජු නම් අධිකාරි තෙම රක්ඛ නම් වූ දෙමළ
අධිකාරීහු කැඳවා මේ වදන් කිය. "තොපගේ රටින් බිඳී අවුත් නොයෙක්
දුර්ග ස්ථානයන්හි සැඟවී හුන් බොහෝ පසමිතුරෝ යම්තාක් එහි ප්‍රතිෂ්ඨා
නොලබද්ද, ඒතාක් ඒ සියල්ලන් මරවා අපි අට දහස්රට[1]
157 දුර්ගස්ථානයෙහි සිටි සතුරන් ද සුගලා නම් රාජිනි ය ද ගණුම්හ. වැලි
158 දුර්ගස්ථානයෙහි ශ්‍රිත බොහෝ වෛරීහු ඉදින් තොප විසින් දුස්සධ්‍යයෝ
159 නම් භටයන් එවන්නෙමුය" යි (කීය) දෙමළ අධිකාරී තෙමේ ඒ වදන්

1. අටකලන් කෝරළෙය;

Non-Commercial Distribution

160 යහපත් කොට පිළිගෙණ එයින් (පිටත්ව) සේනාව කැටිව වහා වන
161 හෝ ආදියට වැදී බලමින් ගිරිදුර්ගාදියට නැගෙන්ට සනිකේ මාලාව
162 රත්ථලියට ගියා වූ සතුරන් වෙතට වහා පැමිණියේ ය. ඔව්හු දස ඒ
163 අධිකාරිහු නික්මුනු බැව් අසා හයින් මිරිකුනෝ මහපව් ඇසුරු කළා වූ
මහවනයට වන්හ. දෙමළ අධිකාරි තෙමේ වනපව් වටලා උන් හා මහ
164 යුද කොට සර්වප්‍රකාරයෙන් උන් වනසමින් සතුරු කටු නැති කොට ඒ
165 දොළොස්දහස් රට ගෙණ ජීවග්‍රහයෙන් ගත් වෛරීන්ගේ කටයුතු විචාරා
166 ගම්හිද නියම්ගම්හිද නොයෙක් සිය ගණන් වෛරීන් උල හිඳුවා මහ
බල ඇත්තේ කිසිවෙක් තුළාරූඪ කොට අළු ශේෂ කොට දමා මනාකුල
167 නම් ගම්හි ම හිඳගෙන ශ්‍රීමත් වූ නරේන්ද්‍රයාගේ ආඥාභෙරිය පසස්නා
168 නකතින් ගම්හි ද නියම් ගම්හි ද හැසිරවී. නරෙන්ද්‍රයා වෙත එපවත්
169 කියා යවා මහ රජහු වෙතිනුත් ප්‍රසාද ලැබගෙණ මහ පැණැති ඒ තෙමේ
ඒ දොළොස් දහස් රටම කටයුතු විදාරමින් මහත් යසස් ඇතිව විසී ය.

170 කුඹුගම හුන් සියලු ප්‍රධාන අමාත්‍යයෝ ද "යුද පිණිස රුහුණු
රට බලා අප නික්මුණු කල් පටන් ඒ ඒ තැන මහා යුද්ධයෙහි අප විසින්
171 යවන ලද මහා යෝධයෝ වෛරීන්ගේ ඇටයෙන් පොළෝ තෙල වැසුම්
172 කළහ. තවද මේ භටයන් වළකන්ට දඹදිව් වැසි සියලු මහා යෝධයෝ
උවත් කිසි කලෙකත් හැකි නොවෙති. එහෙයින් හයින් ඒ ඒ තන්හි
173 සැඟවී උන් කිසි සතුරෙකු හා යුද්ධ කරන්ට මින් මත්තේ කුමට සිතමුද?
174 උන්ගේ දාමරික බවට මුල් වූ සුගලා රාජිනී තොමෝ ම ඒ ඒ දුර්ගයෙහි
වනයෙහි උන් ප්‍රවේශ කරන්නී ය. එහෙයින් ඒ රාජිනී තොමෝ ම
175 ජීවග්‍රාහයෙන් ඇල්විය යුත්තී ය." යි මෙසේ නිශ්චය කොට ගෙණ
176 කුඹුගමින් පටතව මහ පැණැත්තෝ අළුවාවට ගොස් එහි නොයෙක්
නුවර යහපත් වූ අතිවීර යයි සම්මත වූ තැබිය යුත්තන් තබා එතැනින්
කළුවළට ගොස් බහා පලඳනා ලද කවදන් අවි ඇත්තෝ වල්ගම නම්
177 තන්හි රාජිනිය සහිත සතුරු සෙන් දැක එහි ඉතා බිහිසුණු මහ යුද
178 කොට ජයභේරි ධවනියෙන් පොළෝ තෙල බිඳිහින්නවුන් සෙයින්
179 රාජිනිය අල්වා ගෙණ බොහෝ වූ වස්තු ජාතය ද ගෙණ වස්තු
180 රාක්ෂාකරණ පිණිස තැබිය යුතු කංචුකීන් තබා පටන් ගත් යුද්ධ ක්‍රීඩාව
181 එකල්හි එහිදී සමාප්ත කෙරෙමින් වෛරීන්ගේ අතින් පයින් හිසින්
පොළෝ වසමින් ජීවග්‍රාහයෙන් ඇල්විය යුත්තන් අල්වා ගෙණ
182 සර්වප්‍රකාරයෙන් රුහුණු රට සතුරු කටු රහිත කළහ. එකල්හි කිසිම
අවසරයක් හේතු කොට ගෙණ සතුරන් අතින් මිදී හයින් පෙළී පලායන
183 කිසි භට කෙනෙකුදු ගෙණ ආයුඃක්ෂයට පැමිණි ඵාලකාල නම් තුන්
දෙනා ද තඩිගාම නම් තැනැත්තේ ද පර්වත නම් දෙදෙනා ද ලංකා පුර
184 නම් නැත් තේ ද එසේ ම කඩක්කුඩ යයි ප්‍රසිද්ධ දණ්ඩනාථ සහෝදර

Non-Commercial Distribution

185 දෙදෙනා දඅනාා වූ ලංකාපුර නම් (සෙනෙවියෙක් ද) හටයන් සහිත
186 බොහෝ සමාන්තයෝ ද උද්ධනද්වාර නම් ගම්හිදී හමුව මහයුදයෙහි දී
බිඳී නිග්‍රෝධ මාරගල්ල නම් තැනට එළඹියහ. එකල්හි ඒ මහ
187 ඇමතියෝත් සාමන්තයන් කැටිව සතුරන් පස්සෙහි ලුහුබඳනේ
එලකාලයාගේ ඉස ප්‍රධාන ඇමතියන් වෙත යවා පංකාපුරය පර්වතය
යන මේ ඇත්තන් ජීවග්‍රාහයෙන් අල්වා ගෙණ සර්වප්‍රකාරයෙන් සියලු
සතුරන් කථාශේෂ කළහ.

188 එකල්හි මඤ්ජු නම් අධිකාරි තෙමේ මන්ත්‍රණ කරන්නේ "මේ
189 රුහුණ දිනන්ට ආරබ්ධකාලය පටන් අපගේ ස්වාමීහුගේ තේජසින්
සංග්‍රාමයෙහි දී ම සතුරන්ට කළා වූ විනාශ හැර රාජාපරාධය තෙමේ
190 මෙසේ ආදීනව සහිත යයි අත්‍යන්ත භයදායක වූ මහජනයා කෙරෙහි
191 දන්වනු පිණිස පිළිමලුන්ට කළ නිග්‍රහයක් නැත්තේ ය. එහෙයින් නිග්‍රහ
192 කටයුත්තන් සර්වප්‍රකාරයෙන් නිග්‍රහ කරවා හැම තන්හි ප්‍රග්‍රහ කටයුත්තන්
ප්‍රග්‍රහ කරවා ස්වාමීහු ආඥාව පරිද්දෙන් සංග්‍රහ නිග්‍රහ කරන්නමෝ" යි
(කීය) සියල්ලෝ ම ආදර සහිත වූවෝ උහුගේ ඒ මන්ත්‍රණය සතුටින්
පිළි ගත්හු.

193 ඉක්බිති නිග්‍රහයෝග්‍ය බොහෝ පසමිතුරු ගෙන්වා ගම් හි ද
නියම්ගම්හි ද බොහෝ උල් හිඳුවා නොයෙක් සිය ගණන් වෛරීන් එහි
194 නංවා, බොහෝ වූ සතුරන් කිසිවෙක් තුලාරූඪ කොට භස්ම කරවා,
195 පරාක්‍රම නරෙන්ද්‍රයාගේ ඉවසිය නො හෙන්නා වූ අවිලංඝනීය වූ විස්මය
එලවන්නා වූ ප්‍රතාප ගුණය සර්වප්‍රකාරයෙන් ප්‍රකාශ කළහ.

196 පසුව අනුග්‍රහ කරන්ට සුදුසු වූ අනුග්‍රහ යෝග්‍යයන් ලැව් ගින්නෙන්
දූවෙනු ලබන්නා වූ වන ලැහැබක් ප්‍රාවෘට්කාලික මේඝයන් සෙයින්
(නිවා) විධි වූ පරිද්දෙන් ඒ රට අල්වා ගන්නෝ සංසුන් බවට පැමිණවූහ.
197 එපවත් අසා පරාක්‍රමබාහු මහරජ තෙමේ මහත් ප්‍රසාද සහිත වූ හසුන්
198 යවන්නේ ජීවග්‍රාහයෙන් ගත් සියලු ඇමතියන් ද සුගලා නම් රැජිනි ය
199 ද පළමු කොට මෙහි එවා එරට සියලු භාරය භූතාධිකාරින් කෙරෙහි
200 සමර්පණය කොට එරට වැසි අනල්ප වූ භික්ෂු සංඝයා පෙරටු කොට
201 ගෙණ මෙයින් මෙහෙයන ලද්දා වූ සිවුරඟ සෙනඟ ගෙන ඒ ඒ ජනයෙහි
202 තැබිය යුත්තන් තබ්බවා වහා අවුත් මනා යයි සම්මත කත් මොහොතක
සියලු ඇමතියන් විසින් ම මම දක්ක යුත්තෙම් වෙමි" යිමෙසේ හසුන්
203 යැවී ය. ඉක්බිති . ඒ සියලු ඇමතියෝ ද ඒ මහසෙන් විසින් පෙරටු
204 කරණ ලද්දෝ ඒ මරජාණන් ආඥා වූ පරිද්දෙන් සර්වප්‍රකාරයෙන්ම විරුද්ධ

Non-Commercial Distribution

205 නොකෙරෙමින් රුහුණු ජනපදයෙන් නික්ම පොළොන්නරු අවුත්
206 බොහෝ සෙයින් වාදනය කරන්න වූ ඔල්වරසන් අත්පොළසන් දෙන්නා
වූ සව් ප්‍රකාරයෙන් දහස් ගණින් පිළි හිස සිසාරන්නා වූ ජය ශබ්ද
කරන්නා වූ පොළොන්නරු වැස්සන් විසින් අනුගමනය කරණු
207 ලබන්නාහු ප්‍රවර වූ රාජ මන්දිරයට උප සංක්‍රාන්තව මහත් වූ දීප්තියෙන්
208 හුන්නාහු ශ්‍රීමත් ඒ රාජාධිරාජයාගේ පාදපද්ම රේණුයෙනු ස්වකීය
උත්තමාංගයන් පවිත්‍ර කළහ.

මෙසේ ලැව්ගින්නක් සෙයින් උග්‍රතර වූ ඉතා බිහිසුණු තෙද
209 ඇති නය විනය ක්‍රමය අනුව යන්නා වූ ව්‍යක්ත බුද්ධි ඇති
නරශ්‍රේෂ්ඨතෙමේ සහගත වීරයන් ඇත්තේ රුහුණු රට පහ කළ සතුරු
කටු වූවාක් කරවී.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
රෝහණ භජන නම් වූ පන්සැත්තෑ වන අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ හය වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති ඒ මිහිපල්හු දිවා රෑ දෙක්හි නො මැලිව ප්‍රඥාවෙන්
යුක්තව ලෙව්සසුන් වැඩුම් කරණකල්හි ශ්‍රීමත් ඒ නරේන්ද්‍රයාගේ ඔටුනු
2 පැළඳි අට වැනි හවුරුදුයෙහි රුහුණු රට අධිවාසි සියල්ලෝ එක්ව
3 ගෙණ ඉතා දරුණු වූ කිසිම පව්කමකින් මෙහෙය වන ලද්දෝ නැවතත්
4 දාමරික වූවෝ තියුණු විපතට සහභාගී වූහ. ඒ පරාක්‍රමබාහු රජ තෙමේ
5 එපවත් අසා නැවත ද ඇමතියන් සහිත මහසෙන් එහි යවා යටකී
6 සියලු ගම්හි ද නියම් ගම්හි ද පෙරසෙයින් නීති පටන් ගත් බොහෝ යුද
කෙරෙමින් සතුරු සේනාව සිය තෙද ගින්නට දර කොට මුළු රුහුණු
7 රට වහාම කටු රහිත කෙළේ ය. පසුව ඒ රාජාධි රාජයාගේ ඔටුන්
පලන් සොළොස් වෙනි වස මාවටු පටුන හා ඒකාබද්ධ රට
8 සර්වප්‍රකාරයෙන් පැමිණි ආයුඃක්‍ෂය ඇති ඒ රට වැසි කිසි ජන කෙනෙක්
9 පෙරළී උතුමැයි සම්මත වූ යුද පැවැත්වූහ. ප්‍රඥා සම්පන්න මහා රාජ
තෙමේ විහිඳු සිවුරඟ සෙන් යවා පොළෝ ධූලි වනතෙක් සතුරන් නැස්වී.

10 සම්‍යග්දෘෂ්ටි සමගි මිනිසුන්ගේ නිවස බැවින් ලංකා රාමඤ්ඤ
11 දේශයන්ගේ භේදයෙක් හැම කල්හි නොවී ය. ලක්දිව් අධිපති වූ රජ
12 දරුවෝ රාමඤ්ඤ දේශ ඊශ්වරයෝ ද යන මේ දෙපක්ෂයෙහි ඇත්තෝ
සාද ෘශ්‍යයෙන් හැමකල්හිම පරාම සෞගතය හ. එහෙයින් දේශ දෙක්හි
13 ම පූර්වික සියලු රජ දරුවෝ දැඩිසේ හටගත් විස්වස් ඇත්තේ සිතින්
යුක්තවම හිතයෝ ය. මාහැඟි නොයෙක් පඬුරු උනුන් වෙත පමුණුවමින්
බොහෝ කලක් නො කඩවා සමගි බැව් පැවැත් වූහ.

14 පරාක්‍රමබාහු මහ රජාණන් සමගත් රාමඤ්ඤ රට තෙමේ පෙර
රජුන් සෙයින් චිරානුගත සමගිය පරිපාලනය කරන්නේ නැවත එක්
15 කලෙක නැණ හීන ඒ රජ තෙමේ මේ ලක්දිවින් ගිය කණෙහි
කොඳුරන්නා වූ කිසි දූත කෙනෙකුන්ගේ බස් අසමින් තමන් වෙත ගිය
16 ලංකේශ්වරයාගේ දූතයන්ට පුරාණ සිරිත් වූ දෙනු ලබන්නා වූ වැටුප්
17 පිරිහෙළී. බැහැර නොයෙක් තැන නොයෙක් දෙනා විසින් විකුණනු
ලබන්නා වූ "ඇත්තු නොවිකිණිය යුත්තාහු ය" සම්මතයකුදු කරවී. යම්
18 ඇත් කෙනෙක් වනාහි රිදී සියයට හෝ වැලි දහසට හෝ පූර්වයෙහි එහි
19 විකුණනු ලබන්නෝ "සහස්‍ර ද්වයට හෝ සහස්‍රත්‍රයට හෝ වික්ක යුත්තාහ"
යි මෙසේ දුෂ්ට අදහස් ඇති හේ තෙමේ ගණන් සීමා තැබ්බ වී.

(මෙයින්) ගෙණ යන පඬුර පණිස නැවක් පාසා එකෙක් එකෙක්
20 බැගින් දෙනු ලබන්නා වූ පුරාණ ඇත්පඬුර මුලිනිදිරි. තමන් උදෙසා

Non-Commercial Distribution

21 එලවන ලද රන්මුවා ලියුම් දක්නේත් "දූත වූ මේ මිනිස්සු කම්බෝජ රට
22 සඳහා ය" යි මෙසේ යම් කිසි (සුබ චේශවූවක්) කියා සියලු වස්තු උදුරා
23 ගෙණ ලංකේශ්වරයාගේ දූතයන් කඳුරට බලකොටුවෙක ලැවී ය. ස්වකීය
24 වූ තපස්වී නම් දූතයාහට ලංකේශ්වරයා විසින් කරණ ලද සංග්‍රහ සයල්ල
සියලු ආකාරයෙන් අසමින් ම ලංකේශ්වරයාගේ දූතයන් සතු වස්තු ද
25 ඇත්තු ද එසේ ම නැව් ද යන ඒ සියල්ල උදුරා ගෙණ නීතික්‍රම නො
දන්නා ඒ තෙමේ ඔවුන් ගේ පාදයන්හි බොහෝ සේ මූෂලපීජනය
කරවා දිය ඇදීම් පිණිස ද සිරගෙට ලද යෙදූයේ යි. එක් කලෙක කසුබ්
26 නම් වූ දඹදිව් ප්‍රධානියෙකු විසින් රන් ලියුම් සහිත කොට එවන ලද්දා
27 වූ සරු වූ පඬුරු නවතා ඒ මිනිසුන්ගේ ගොඩ බැස්ම වළකා පසුව ඒ
ලියුම් සහිත (පඬුරු) අවමන් සහිත කොට සිය පුරයට ගෙන් වී ය.

28 ඉක්බිති හේ තෙමේ එක් කලෙක සිංහල දූතයන් කැඳවා
(කියනුයේ) "මෙතැන් පටන් අපගේ රටට සිංහල දේශයෙන් නැව්
නොඑවිය යුත්තාහ. ඉදින් ඔව්හු එවත් නම් ඉන් ඉන්බිති මෙහි පැමිණි
දූතයන් සර්වප්‍රකාරයෙන් නසන්නා වූ ද තොපගේ වරදෙක් නැතැයි
29 මෙසේ පතක් දූන් අපට දෙව. ඉදින් නො දෙව් නම් තෙපි සිය ගෙට
30 (රටට) යන්ට නොලබන්නාහුය"යි කීය. මෙසේ ඔවුන් ආක්‍රමණය කොට
31 පසුව සිය රට එනු පිණිස ලියවා උන් අතින් පතක් ගත්තේ ය. වාගීශ්වර
32 නම් ආචාරීන් ද ධර්ම කිර්ති නම් පණ්ඩිතයා ද සිදුරු සහිත නැවෙකින්
මුහුද හිට්යේ යි. නැවත එක්කලෙක ඇතුන් විකිණ ගන්නා පිණිස
33 ලංකේශ්වරයා විසින් මෙහේ යනලද පඬුරු හා බඩුත් දූතයන් අතින්
34 හැරගෙණ " ඇතුන් තුදුසක් තොපට දෙමු. රිදී මිල හෝ දෙමු ය" යි
35 මෙසේ කියා උන්ට කිසිවක් නොදෙන්නේ හුදෙක් බොරුම කීය. ඉක්බිති
ලංකාධිපතීහු විසින් කාම්බෝජ රට බලා යවන ලද රජ කුමරියක් ද
බලාත්කාරයෙන්උදුරා ගත.

36 පරාක්‍රම බාහු මහරජ තෙමේ ඒ රජහු විසින් අනේක ප්‍රකාරයෙන්
කරවන ලද විප්‍රකාර අසා අත්‍යර්ථයෙන් කිපි සිත් ඇත්තේ "මුළු දඹදිව්හි
37 කවර නම් රජෙක් තෙහේ හමා අයත් දූතයන්ට මෙබඳු ක්‍රියාවක් කරණු
38 පිණිස සමත් වූයේ විද ත්‍යා මානද?" මෙසේ කියා ඇමතියන් රැස්
කොට "අරිමර්දන රජහු අල්වා ගැන්ම හෝ මැරීම හෝ වහා කටයුතුය"
39 යි ඒ තෙමේ කීයේ යි. එකල්හි ආදිත්‍ය ද්‍රවිඩාධිකාරි නම් ඇති එහි එක්
ගණක මහ ඇමතියෙක් බඳනා ලද ඇදිලි ඇත්තේ තෙමේ ම එහි යනු
කැමැත්තේ රජහට මෙබස් කීය. "මේ ක්‍රියාවෙහි ප්‍රධාන වූ මහා
40 ඇමතියන් නොයෙදෙන සේක්වා. නුඹ වහන්සේලාගේ උපදේශ
41 මාර්ගයෙන් අවක්‍රමණය නොකරන්නා වූ ප්‍රතිලබ්ධ නියෝග ඇති හුදකලා

Non-Commercial Distribution

42 වූ මට දුරතික්‍රමණය අනුශාසනා ඇත්තා වූ ම ස්වාමිහුගේ අනුශාසනාව
නොසිස් ආකාර කරනු පිණිස කිසි කලෙකත් බරෙක් නැතැයි කීය.

43 රජ තෙමේ ඒ අසා ප්‍රසන්න වුයේ යැවී ය යුත්තා වූ සියලු ඒ
භයාධිපතීන් උහු කෙරෙහි ස්මරණය කොට වහා යන්ට අණ කෙළේ
44 ය. පසුව මහා යසස් ඇති ඒ රජ තෙමේ "නොයෙක් සිය ගණන් නැව්
විශේෂයෝ වහා සම්පාදනය කටයුත්තාහ"යි නියෝග කෙළේ යි. එකල්හි
45 මොනවට පටන් ගන්නා ලද නැව් කර්මාන්තයෙන් ආකුල වූ (ලක්දිව)
46 හාත්පස මුහුදුබට දේශයේ එක් කර්මාන්ත ශාලාවක් බඳු වූහ. පසුව
පස්මසකින් ඒ සියලු නැව්කම් නිමවා දළුවක් නම් තොට යුහුව රැස්
47 කරවී. ඒ රජ තෙමේ අවුරුද්දකට පොහෝනා සහල් ආදි මාගෝපකරණ
48 ද සන්නාහ ආයුධ ආදි නොයෙක් යුද්ධෝපකරණ ද තියුණු අග් ඇති
(හී ආදිය) වළකනු පිණිස අයෝමය සන්නාහ ද නොයෙක් සිය ගණනින්
49 දහස් ගණනින් ගණනා ලද ගෝණ සමින් කළ සන්නාහ ද විෂ පෙවූ
50 හීයෙන් හටගත් තියුණු වණයන්ගේ ශාන්ති පිණිස ගෝහඟ බහා ලන
51 ලද බෙහෙත් ජාතීන් ද නොයෙක් ජල ධාරාවන්හි විෂයෙන් මිශ්‍ර කරණ
ලද ජලයන්ගේ විශෝපශමනය පිණිස එසේ ම ඖෂධ ජාතීන් ද
52 කණිසහිත විෂ පෙවූ ගැඹුරෙහි වන් උදුරණට දුක් වූ හී දඬු එයින්
බැහැර අදනට යහඬු ද එසේම තියුණු බුද්ධි ඇති වෙදුන් ද සප්පායකාර
ස්ත්‍රීන් ද මහාරාජර්ධියෙන් යුක්ත වූ රජ තෙමේ අඩු නො කොට පිළියෙළ
කෙළේ ය. නොයෙක් දහස් ගණනින් ගණනා ලද ප්‍රබලබලයෙන්
නැව්හි නංවා සංවිධානයෙහි අසහාය පණ්ඩිත වූ ඒ මහීපාල තෙමේ
53 අනේකෝපකරණයෙන් ආකීර්ණ වූ මහා භටයන්ගෙන් සම්පූර්ණ වූ
54 සියලුනැව් දවසින්ම පිටත් කෙළේ යි. මුහුදු මැද කිට්ව ඒ නැව් රාශිය
55 තෙමේ ඉතා වේගයෙන් යන්නේ ගමන් ගත් දිවයිනක් සේ පෙණින. ඒ
56 නැවින් කිසිවක් විරුද්ධ වූ වායුවෙන් අවුරණ ලද්දාහු සමුදර දී නටහ.
57 කිසිවක් නොරට පැමිණියහ. එක් නැවෙක නැංගාවූ ඉතා සමත්ථ
බොහෝ භටයෝ කාක දිවයිනට ගොඩ බැස්සෝ එහි යුදකොට ඒ දිවයින්
58 වැසි නොයෙක් ජනයන් ජීවග්‍රාහයෙන් අල්වා ගෙණ එයින් ගෙණවුත්
ලංකාධිරාජයාහට දැක්වූහු.

59
එකල්හි නැව් පසෙක නැංගවු මහ බල ඇති යෝදයෝ අරමණ
60 දේශයෙහි කුසුම්තොට බැස්සාහ. කීර්ති නගර ගිරි ප්‍රධාන කොට
ඇත්තා වූ ප්‍රබල වූ ඒ භටයෝ නැවෙන් ගොඩබට තොට පටන් බහා
පලඳනා ලද ඒ කවදත් හා ආයුධ ඇතිව අරමණ වැසි නොයෙක් දහස්
60 ගණන් ඒ බලයෙන් බිහිසුනු යුදෙහි දී මරමින් මතැතුන් සෙයින් හාත්පස
නෙරළු ආදී නොයෙක් වෘක්ෂයන් සිඳිමින් ගම්හි ගිනිලමින් රාජ්‍යයෙන්

Non-Commercial Distribution

63 භාගයක් විනාස කළහ. ආදිත්‍ය ද්‍රවිඩාධිකාරීන් විසින් අධිෂ්ඨිත නෞකා
64 තොමෝ ද එම රට පප්පළා නම් තොට බටුවා, එසේ ම දෙමළ
65 අධිකාරීන් ප්‍රධාන කොට ඇති ජනයෝ වෛරීන් විධ්වංසනය කරන්නා
66 වූ ඝෝර වූ බිහිසුණු යුද කෙරෙමින් ජනලද වැසි බොහෝ වූ ඒ (අරමණ)
ජනයන්ජීවග්‍රහයෙන් අල්වමින් එකල්හි අරමණ නම් ඒ රට අත්‍යත්ථයෙන්
ඇලලූහ.

67 පසුව භීමවික්‍රම ඇති සිංහලයෝ ක්‍රම උල්ලංඝනය කළ නුවරට
68 ද වැද ශස්ත්‍රයෙන් කර්කශ වූ අරමණ හිමියා මැරූහ. ඒ රට අරමණයන්
69 වැඩ රජය ස්වහස්ත කොට ගෙන ඒ මහාවීරයෝ ප්‍රවර වූසුදු ඇත්කඳ
නැගී විගත භය ඇත්තෝ ඒ නුවර පැදකුණු කෙරෙමින් පසුව
ලංකේශ්‍යවරයාගේ ආඥායෙන් එහි අණබෙර කර වූහ. එකල්හි
70 රාමඤ්ඤ රට ජනයෝ භයින් කම්පිත වූවාහු අනික් ආරක්ෂා ස්ථානයක්
71 නොදන්නෝ සියල්ලෝ එක් රැස්ව මන්ත්‍රණය කොට "මෙ තැන් පටන්
අවුරුදු පතා අප අතින් කැමැත්තෙක් සුංකම් පිණිස ඇත්තු ගෙණයා
72 යුත්තාහ. මෙසේ අපගේ වස්තු වර්ගය උදුරන්නේ ම ලක් මිහිපල් තෙමේ
මෙවැනි වූ ඉතා ඉවසිය [illegible] යම් සේ නොකෙරේ නම් එසේ
73 ඒ රජ හට අනු ශාසනාවදාරන්නා වූ හැමකල්හි දයාබහුල ස්වාමීන්
වහන්සේ විසින් අපි සියල්ලෝ මව දයා කටයුත්තෙමු ය"යි මෙසේ
74 කියා හසුන් ගත් අත් ඇති ස්වකීය දූතයන් ලක්දිව වැසි බික්සඟනු
වෙත වහා එවූහ. ඉක්බිති නිකායත්‍රය වාසී සඟහු බසින් මොළොක්
බවට පැමිණි ලක්දිව් රජහට (අරමණ රට වැසි) ඔව්හු හවුරුදු පතා
75 බොහෝ ඇතුන් එවන්නෝ සත්‍ය සන්ධ්‍යාන ඇති ලංකාධිපතියා හා
76 නැවත සන්ධි කළාහ. ඉක්බිති මදුරා පුරයෙහිපරාක්‍රම නම් පඬිරජ
තෙමේ යුද කටැටි වූ කුලශේඛර පුරයෙහි පරාක්‍රම නම් පඬි රජ තෙමේ
77 යුද කැටි වූ කුලශේඛර නම් සතුරු රජහු විසින් බලසෙන් සමග අවුදින්
78 සිය පුරය යටලු කල දඹදිව් තෙලෙහි ශර්ණාර්හ රජක්හු නො දුන "
79 ශර්ණර්හයායෙනි, ශත්‍රුතේජො ගින්නෙහිහුද කළා පළගැටියෙක් බඳු
මට ඔබගේ පාසඟල් නමැත් වජ්‍ර පංජරය අත්‍යර්ථයෙන් පිහිටවේවා" යි
මෙසේ කියා ලංකා නාථයා වෙත දූතයන් එවී ය. ලංකේශ්වර තෙමේ
80 ඔවුන් බස් අසා (මේ කියන්නේ) "අප සරණවන්නකුහුගේ ආපදා තොහෝ
ඉදින් බැහැර නො ලනු ලැබේ නම් අපගේ ඒ පැරකුම්බා බැව් කෙසේ
ගැලපේ ද? මා ඇසුරු කෙළේ යම් කිසි සතුරෙකු විසින් දුෂ්ප්‍රසහ්‍ය ය.
82 සඳ ඇසුරු කළ සා තෙමේ මෘග ශත්‍රු වූ කවරෙකු විසින් මඩනා ලද්දේ
ද? ලක්පුර දණ්ඩ නාථය, කුලශේඛරයා මරා පඬිරජු සිය රටෙහි පිහිටුවා
83 එව"යි යෙදුයේ ය.

Non-Commercial Distribution

ඉක්බිති හොබනා විකුම් ඇති ලක්පුර අබිදන් යුද්ධෝපාය දන්නා
84 සතුරු මහවනයට ලැව්ගිනි බඳු දණ්ඩනාථ තෙමේ "එසේය"යි රජහු
85 අණ මල්වඩමක් සෙයින් හිසින් පිළිගෙණ යුද්ධෙයෙහි දක්ෂ වූ බොහෝ
සාමන්තයන්කැටිව යුද්ධයෙහිදුර්වාර වූ මහසෙන් විසින් පෙරටු කරණ
86 ලද්දේ නුවරින් පිටත්ව  මාවටුපටුනට එළඹියේ ය.

87 කුලශේඛර රජ තෙමේත් අඹු දරුවන් සහිත පඬිරජහු මරා මධුරා
නම් පුරය (පැහැර) ගත්තේ ය. මහරජහු විසින් එපවත් දැක "උහු වස
88 උපන්නක්හට වත් රජය ගෙන දේවා"යා නියෝග කරණ ලද්දා වූ
89 දණ්ඩනාථ තෙමේ මෙතෙර තල්විල් නම් තොටට ගියේ ය. නොයෙක්
සිය ගණන් නැවට මහබල සෙන් නංවා (ඉන්) පිටත් ව මුහුදු පිට එක්
90 රෑ දවාලක් ගොස් (එහි) ගියේ එතර දැකසතුරු සෙන් සිටි බැවින් සියලු
91 බල සන්නද්ධ කරවා ඉතා ගැඹුරෙහි ම නැව් නවත්නා එහි මංබට කල
92 සියලු සේනාවගේ සන්නාහයන් තෙමෙන හෙයින් ඒ තෙමේ එක් කඳ
93 හොරු සිය ගණන් සෙන් නංගවා ගොඩ සිටි දෙමළුන් විසින් (විදිනා
ලද) ශරවෂ්ඨා වැටෙන කල්හි සමින් කළ සන්නාහයන් ඉදිරියෙහි තබ්වා
94 පඬිරට තලවිල් නම් තොට බැස්සේ ය. තොට සිටි දෙමළුන් පලවා ඒ
තොට ගෙණ එහි වාඩිලාගත් මහාල ඇත්තේ යුද සතරක් කෙළේ ය.

95 මඩවලත්ති රැක්කුනාඩර්වාර් නම්වූ ය, එසේම කුඩය මුත්තුරා
96 රස නම් වූ ය, විල්ලාවාරායරාය නම් වූය, අංචුකොට්ටනාඩාල්වාර්
97 නම්වූය, නරසීහදේවනම් වූය යන මේ සාමන්ත රජුන් පස්දෙනා යුද
පිණිස ආකල ඔවුන් සමග ද යුදකොට බොහෝ දෙමළුන් මරා උයන්
98 අසුන් ගෙණ මහසෙන් පලවත්තේ යුද පසක් කොට රාමේශ්වරම ගත්තේ
ය. වැලි හේතෙමේ එහි හුන්නේම යුද නවයක් කොට දස වැස්නෙහි
99 දී ශිලාමේඝය, නරතුංග බ්‍රහ්ම හා රායරය, ඉලංකියායරය, එසේම
100 අවුකෙකටටාරායරය, පලුදිය රායරය, පණසියරායරය යන සාමන්ත
101 රජුන් සදෙනා හා යටකී සාමන්ත රජුන් පස්දෙනා මහත් බලසෙන්
ගෙණ එළඹියවුන් (හා) (හේ ලංකානාථ) තෙමේ යුද කොට ජයට පැමිණ
බොහෝ අසුන් ගෙණ දෙමළුන් මරවමින් රාමේශ්වරම් පටන් සතර
102 ගවුමත්තෙහි මුහුදු දෙකට අතුරු පිහිටි කුන්දුකාල් නම් තැනට (ඒ
103 රාමේශ්වරමෙන්) ගියේ ය. බොහෝ දෙමළු භයින් පලාගොස් වලට
වන්නාහ. පසුව ඔවුන් අල්වා ගෙණ කිසිවෙකු උලතැබ්බවී.

104 "දෙමළුන් විසින් පූර්වයෙහි බිඳිනා ලද ලක්දිව්හි සියලුසෑ උන්
ලවාම කරවිය යුතුය" යි ලංකාධිපති (රජහු) විසින් ඇණ වූ කල සමහරුන්
105 ලක්දිවට පමුණුවා රුවන් වැලි සෑයෙහි කර්මාන්ත කරවීය. ලංකේශ්වර

Non-Commercial Distribution

106 තෙමේ ද දෙමළුන් විසින් බිඳිනා ලද සෑය පෙරළා බඳවා අවසානයෙහි
107 කොත් පළඳනා පෙලහර කරන්ට ඇමතියන් හා පිරිවර කැටුව
අනුරාධපුරයට ගියේ ය. ලක්දිව්හි මහා භික්ෂු සංඝයා ද රැස් කරවී. ඒ
108 සංඝයා හට සිවුපසයෙන් උපස්ථාන කෙරෙමින් තුදුස්වක් පැමිණි
කලනුවර බෙර හසුරුවා "නුවර අලංකාර කෙරෙත්වා, ගඳමල් ආදිය
109 ගෙණ මහජන තෙමේ මහ සෑ තැනට සෙට යේවා"යා කියා සියලු පූවී
110 ගහන වූ මෙ?ලිමාලා අංගදා දි මහඟු අබරණින් දේවලීලාවෙන් සැරසෙන
111 ලද්දේ දිවසරන්විලසින් මොනවට සැරසුණු සිරුරු ඇති නො යෙක්
සිය ගණින් ඇතොවුරන් විසින් පෙරටු කරණ ලද්දේ නන් අබරණ
112 වතින් විසිතුරු වෙසින් ලීලෝපෙත වූ මහා කරණ ලදුයේ සියොලඟ
113 පහන් පුදින් සෑය පුදන්නා වූ දිලසෙන රන්සන්නාහ ඇති ඇත් ඇස්
114 මුලින් හා ජනරාසිභාර යෙන් මැඩ පොළේ තෙල ගල්වන්නා සෙයින් ද
115 සත්සෙමෙර දෙදෙන් දියාගිමුඛය වසන්නාමෙන්ද නන්තුරු රැවින්
116 ගිරිගුහා බිඳිනා සෙයින් ද සිරිසැපතින් ලෝ වැස්සන් නෙත් සතුටු
117 කඳුළු ගන්වමින් කරඬු කොඩි කෙණ්ඩිකා තල්වැට කළසාදි ස්වර්ණ
භාණ්ඩයනගේ රැසින් එතැන පිඟුවන් කෙරෙමින් ඒ (රජ තෙමේ) රජ
118 මැදුරින් අවුත් ඡායාව වැඩෙන කල (සවස් වේලෙහි) සෑ මිදුලෙහි දෙව්
රජ සිරින් සිටගත.

119 නොයෙක් සිය ගණින් භික්ෂූහු ද පබළු පිළිකඩින් සෑය වට
ලන්නවුන් සෙයින් අවුදින් පිරිවැරූහ. රජ තෙමේ සෑ මතුයෙහි රන්
120 කොත තබා මස්තකයෙහි සිටි හරුමඬුලු ඇති කෛලාශශ්‍රීය ලෝකයාහට
121 දක්වී. එදවස් රජහුගේපහන් පූජායෙන් දෝ සෑයෙහි පිහිටි රන්කොතින්
122 දෝ නුවර රෑ නැත්තේ සේ වී. මෙසේ පරාක්‍රමබාහු මහරජ තෙමේ
සෑය පිළිබඳ මහපෙළහර කරවා පොළොන්නරු පුරවරට ම එළඹියේ
ය.

123 ඒ දණ්ඩනාථ තෙමේ එයගේ චිරස්ථිති කැමැත්තෙන් කුන්දුකාල්
124 නම් පෙදෙස පරාක්‍රමපුර නම් වූ කඳවුරක් කරවී. දෙදහස් සාරසියරියන්
125 අයම් ඇති උත්තුංගවූ පහන්මුවා පව්රු තුණක් හා දොරටුවක් හා
චතුශ්ශාලාවක්ද කරවා මුහුදින් මුහුදට දිය යම් සේ යේ ද එසේ
126 පරිඛාත්‍රයක් ද කරවා ඒ බලකොටුවෙහි වෙසෙමින් කඩක්කුඩිය නම්වූය,
127 චෝළ ගඟ නම්වූය, යනාදි සාමන්ත රජුන්ද ගෙන්වී. මෙසේ දවසින්
දවස සිංහලයන් බල වැඩෙන කල කුලශේඛර රජ තෙමේත් එයින්ම
128 උන් පලවන්ට සුන්දර පඬුරායරය, පඬිය රායරය යන දෙන්නා හා
129 අන්‍යවූ බලවත්වූ බොහෝ සාමන්ත රජුන් නැවත ද මෙහෙවී . ලක්පුර
130 නම් (ප්‍රභුරාජ) තෙමේ උන් හා යුද තුණක් කොට උන් පලවා වරුකොට්ට

Non-Commercial Distribution

නම් ගම ගත්තේ ය. ඉනිදු පිටත්ව එම සාමන්ත රජුන් හා එක් වත්
131 ආළවන්දප්පෙරුමාල් නම් දෙමළා හා මහ යුද කොට ජයට පැමිණ
132 කොලුවුරු නම් ගම් හා මරුප්ප නම් ගම ගත්තේ ය. ඒ දණ්ඩනාථ
තෙමේ කුඩ්කුණ්ඩිය රටද කොලු උෟරු රට ද මරව වර නම් භටයන්
133 වසඟ කෙළේයි. වීරගංගයාගේ රට කුණප්පුය නල්ලුරුය යනාදී වූ
බොහෝ ගම් නියංගම් කොල්ලකා මහා බල ඇත්තේ මාළවරායර නම්
134 වූ බලවත් සාමන්ත රජ හුදු දෙමළ දහසුන් ද වසඟ කොට එහි විසී ය.
135 ඉක්බිති ඒ තෙමේ එයින් පරාක්‍රමපුරයට ස්වකීය බල සේනා වත් වියදම්
දීමේත් සතප්පනට පෙරළා ආවාය. එමින් අතරමග මඩලි නම් ගම
හුන්නා වූ ආළවන්දයා හා යුද කොට උහු මැරී ය.

136 ඉක්බිති සිංහවික්‍රම ඇති යුද්ධක්‍ෂම මහා සේනා සම්පන්න වූ
යුද්ධෝපායෙහි පණ්ඩිත වූ බලවත් කුලශේඛර නම් රජ තෙමේ බොහෝ
137 බලවාහන ඇති මහ ඇමතියනුදු මෙහෙයා උහු දිනනු නොහැකි වූයේ
138 තෙමේම යුද පිණිස නික්මිණි. මාළව චක්‍රවර් තිය, මාළවරායරය,
139 පරිත්තික්කුණ්ඩරායරය, තොණ්ඩමානාරාය රය, තුවරරට අධිපති
140 වේළාරය, වීරප්පෙර රායරය, සෙඬ්කුඩිය රායරාය, තිකලධරායරය,
කරුමමලතත රාජරය, එසේම මනකුල රාජරය, පුංකොඬනාඩාල්වාරය,
141 කරඹ රායරය, වීරගඟය, වෙමුව රායරය, අලත්තුරුනඩාල්වාරය,
මරත්ණයරාජය තුන්දෙනාය, කලවඬිය නාඩාළවාරය,
කේරළසීහමුත්තරය මේ ආදි සාමන්ත රජදරුවන් හා යට කියන ලද්දවුන්
142 ද ගෙණ පැරකුම් පාඬි රජහුගේ රට සෙසු බලසෙන් ද මයිලන්
143 දෙදෙනාගේ කොඩිගුරඑටදෙක්හි සියලු බලසෙන් ද තමා අයත්
144 ත්‍රිණවෙලිරජ යෙහි සියලු බලසෙන්ද නිච්චවීනෝදමානව රායරය,
145 පට්ටිරායරය, තුඬිකුත්තරායරය, තොම්පිය රායරය, ආලවන්දපෙරුමාළය,
146 චෝළකෝනාරය, එසේම තංගිපේපෙරුමාළය, අලබිය රායරය,
147 මාණාභරණ රජුය, අවන්දිය රායරය, මුන්දිර රායරය, විට්ටාවර දෙමළය
148 මෙකී සාමන්ත රජුන් ද මහත් බලවාහනයන් ද ගෙණ පරාක්‍රම පුරය
වෙත අවුත් "සිංහලයන්ගේ හිස් සිඳුම් කොට රාමෙශ්වරම් දෙවොලෙහි
149 මේවර මාගේ දේව පූජාව වන්නේය" යි සිංහ ගර්ජනාකොට එරුක්
150 කොට්ට නම් ගමද ඉඩගළිස්සර නම් ගම ද කඳවුරු පිහිට වී.

151 පසුව පරාක්‍රම පුර නම් කඳවුරු කොල්ලකන්ට කුලශේඛර තෙමේ
152 ගොඩින් ද බොහෝ (දෙන) නැව් නගා මුහුදුපිටින් ද මහසෙන් මෙහෙයි.
153 මෙසේ නොයෙක් දිගින් අවුත් මහා සේනා යුද කරණ කල සමුද්‍රයන්
154 දෙදෙනෙකුගේ ඉවුර උතුරන්නා බඳු වී. ඉක්බිති ඒ ලඞකාපුර (ප්‍රභූ
රාජ්) තෙමේ මහාසේනා සන්නද්ධ කරවා කඳවුරින් නික්ම ඔවුන් හා
155 යුද කරනට පටන්ගත. ඉක්බිති ඒ දෙමළ සේනා තොමෝ යුද කරන්නී

Non-Commercial Distribution

156 මහ යුදෙහිදී ඛඩ්ගප්‍රහාරයට ද අනල්ප වූ ශරවේධයට ද පැමිණ
ක්ලාන්තවූවා සිය කඳවුරට පෙරළා ගියා ය.
157 මෙසේ ම අවුදින් තෙපණස් යුද්ධයක් කළා. ඉක්බිති කුල ශෙඛර
158 රජතෙමේ යුද්ධයක් යුද්ධයක් (පසා) පරාජය දැක තෙමේත් කඳවුරින්
(නික්ම) යුද පිණිස බලසෙන් මෙහෙයී. ලඞකා පුර නම් (ප්‍රභු රාජ)
159 තෙමේ සියලු දොරටු හරවා මහා ශෛලයක් සෙයින් සියසෙන්
160 ඉදිරිකොට ගෙණ නික්මුනේ යුද කොට බොහෝ දෙමළුන් මරා අසුන්
ද ගෙණ ජයට පැමිණ ලුහුබඳනේ කුරුඹඬඩකලියට ගියේ ය. එහි
කඳවුරක් කරන්ට පටන්ගත්කල කුලශෙඛර රජතෙමේ යුදෙහි බුන් ඒ
මහා සේනාව ද එකතු කරවා සාරභූතවූ තමා හා සමාන වූ මහසෙන් ද
ගෙණ තෙමේම අවුත් පිළිසතුරන්ට භය එලවන්නේ යුද කෙළේ ය.
161 කඩු නමැති මසුන් දහසක් විසින් ද අශ්ව නමැති රළ සියයක් විසින් ද
162 පදික සේනා ගංගාවන්ගේ නිපතනයෙන්ද බෙරහඬ නමැති ගිගුමෙන්ද
163 එකල මහ යුද පවත්නාකල මහාවික්‍රම සම්පන්න සිංහලයෝ භූජකණ්ඩු
තිය දුරු කළෝ යි.

164 විල්ලව රායර නම් වූවහු ද චෝල කෝනාර නම් වූවහු ද යාධව
165 රායර නම් වූවන් ද ඉතා මහත් බල ඇති සාමන්තයෙක් ද, නොයෙක්
166 සිය ගණන් භටයන් ද සියලු රාජාමාත්‍යයන්ද අවසර දෙන්ට සෙයින්
167 පිට දැක්වී. යුදෙහි පලායන අහු විසින් හුදෙක් වික්‍රමයට හරණ ලද්දේ
නො වෙයි සිංහාසනය ඡත්‍රය අලඞකාරාදිය යන මේ ද දැම්මේ යි.

168 ලංකාපුර නම් (ප්‍රභුරාජ) තෙමේ සතුරු වූ කුලශේකර රජහු විසින්
169 වාසය කළ හරික්කාවුර නම් බලකොටුවට ගොස් එය ගිනි තබ්බවා
170 පසුව තෙමේ ගෙණ මදකලක් එහි වැස එකල් ලංකාවිද්‍ර තෙමේ එයින්
171 පිටත්ව මණ්ඩලියට වැද එයිනුදු ගොස් ඉක්බිතිව දෙවියා පට්ටන නම්
172 ජනපදය ලාහෙලා ගත්තේ ය. එයින් සිරියවල යට ගොස්
කොළුවන්කොට්ට නම් වූ ඒ බලකොටුවෙහි වසන්නාවූ බුද්ද කඩ්කුඩ
173 රායර නම් වූ (බලනායකයා) සැරසුනහු කෲර යුද්ධකොට පිඹහැර එසේම
කුලශෙඛර රජහුගේ බොහෝ ඇමතියන් ද ඒ යුදයෙහි දී පලවා ඒ
174 බලකොටුව ද ගෙණ මහගම් සත්විස්සක් ද ඒ දවැදනතික නම් ගම
වෙසෙමින් බිහිසුණු පැරකුම් ඇති හේ තෙමේ කොටස බූකකය යන
175 නම් ඇති දෙතැනය, බමුණුගමය යන මෙහි වසන පඬියණ්ඩාර දෙමළය,
176 චෝළ කෝනාරය, යාථවරායර නම් සාමන්ත (රජය) එසේම විල්ලව
177 රායරය, කාලිංග රායරය, සුන්දරපඬුරාය නරසීහ දේවනම් දෙදෙනය
එසේම පඬිය රායරය යන මොවුන් හා යුදකෙරෙමින් ඔවුනුදු බිඳ
178 බොහෝ දෙමළුන් මරවා බොහෝ අසුන් ගෙණ සම්පන්න බලවාහන

Non-Commercial Distribution

179 ඇත්තේ පසුව කුඬයන්නේක නම් වූ තැන වසන්නේ කඬයමුත්තු රායරය,
180 එසේම කඬිල රායරව, යාඵව රායරයයි යන සාමන්ත දෙමළ රජුන්
181 තුන්දෙනා වසඟ කොට ඒ තැන්හි වෙසෙමින් ස්ථාන දන්නා හේ තෙමේ
182 වික්‍රම චොළපෙපර නම් බල කොටුවෙහි පඬිය රායරය, පඬිමඬල
නාඩාල වාරය, වීරමග රායරය, කගකොඬපෙපරායරය යන මොවුන්
තුන්දෙනා ද කාමතදකොට්ට (රට) වැස්සන් ද මහාවිර තෙමේ එ කල්හි
වසඟ කොට ගෙණ මහ යුද කරනු කැමැත්තේ මරුථු කෙකාටටයට
ගියේ යි.

183 එහි ද චෝළකෝනාරය, තොන්ඩිය එසේ ම අන්‍ය වූ සුත්තඬාර
184 සාමන්තය, වීර ගගර දෙමළය, එසේ ම කුතතඬාරය යන මේ ආදීන්
මහයුදකොට තොන්ද්‍රිය (බලනායකයා) එහිදී ජීවිතක්‍ෂයට පමුණුවා
185 උන්ගේ අසුන් ද ගෙණ බොහෝ දෙමළුන් මරවා මත්තෙහි කග
186 කොට්ටානයයි ප්‍රසිද්ධවූ බල කොටුව ගත්තේ ය. එයින් නික්ම පණිව
187 නම් තැන්හි හුන්නේ, අළත්තුරු නාඩාල්වාර දෙදෙනය, පන්ද්‍රිය රායරය,
විල්ලවා රායරය, චුල්ලකඬකුඬ රායරය යන මොවුන් හා මහ යුද
188 කොට එහි ඔවුන් බිඳ පිණිවකොට්ටය ගෙණ එතතින් හැරී ඒ තෙමේ
189 කගකොට්ටාන නම් තැනටම හුන් පරිද්දෙන් අවුදින් එයින්
190 අණිවලකෙකාට්ටාන නම් තැනටම හුන් පරිද්දෙන් අවුදින් එයින්
අණිවලකෙකාට්ටයට යුද පිණිස ගොස් එහිද බඬමාළව රායරය, වීරගගර
දෙන්නාය, චෝළකෝනාර නම් දෙමළය යන මොවුන් හා මහ යුද
191 කොට ඒ සියල්ලන් බිඳ බොහෝ දෙමළුන් මරවා බොහෝ අසුනුදු
192 ගෙණ ඒ බල කොටුව සහ නෙට්ටුරුවන් ගෙණ තෙමේ එහි හුන්නේම
කුතතාඬාස, වීරගඟ තඟිපෙපරුමාල්ය යන (බලනායකයන් හා උන්
193 ඇසුරු කළ නොයෙක් සිය ගණන් දෙමළුන් ද එසේම ඉලඬකිය රායරය,
194 අංචුකෙකාච්ට රායරය (යන මොවුන්ද) වසඟ කොට ගෙණ (මිණි)
කොඬොල් ආදී අබරණ (ප්‍රසාද පිණිස) ද ඉක්බිති ඉලංකි රායරයාහට
රාජ වෙසීභුජංග සිලාමේඝයයි යන අභිප්සිත (විරිදු) නාමය දී,

195 මේ අතුරෙහි පරාක්‍රම පඬිරජුහුගේ දරුවූ වීරපඬු කුමාරයයි
196 ප්‍රසිද්ධවූ සැමට බාල කුමාරයා පුත්‍ර භාර්‍ය්‍යාවන් සහිත මරණ ප්‍රාප්ත වූ
සතුරන් වසයට පැමිණි පියරජහුගේ ජීවිතක්‍ෂයට පැමිණීමෙහිදි එක්තරා
197 උපායෙකින් සතුරන් අතින් මිදුනහු භයින් නො අවුත් මලය නම් රට
198 හුන්නහු අසා (උහුවෙත) දූතයන් යැවී ය. "මම මෙහි මහ යුදෙහිදී
ඇමතියන් සහිත කුලශේඛර රජහු නොයෙක් විට දිනා රාජ්‍යයෙන්
199 භාගයක් ගෙණ ප්‍රමාණයෙන් දෙතුන් ගව්වක් පමණ වූ මදුරාපුරයට
200 තුදුරු දේශයෙහි පැමිණ සිටියෙම් වීමි. අපගේ ස්වාමි තෙමේද තොපගේ

Non-Commercial Distribution

201 පියරජහු අනුරක්‍ෂණය පතන්නේ සතුරන් විසින් ඒ නරනායකයා නැසූ
කල්හි එපවත් අසා "මා සරණ ගියා වූ (ඒ තෙමේ) ඉදින් එසේ සතුරු
රජහු විසින් නසන ලද නම් දූන් උහුද මරා පරාක්‍රම පඬිරජහුගේ ඒ
රාජ්‍යය ඒ වංශයෙහි උපන්නා වූ කිසිවෙක් ඉදින් විද්‍යමාන නම් උහුටවත්
202 ගෙණ දෙවිය" යි අප මෙහෙයුයේ ය. එහෙයින් (සිතෙහි) භයක් නො
203 කොට වහා අවුත් පිය සන්තක වූ රාජ්‍ය අනුශාසනා කරවිය" යි සත්‍ය
204 මෘදු වදන් කියා (යැවීය.) කුමාර තෙමේ ද ඒ වෘත්තාන්තය විවිධ වූ
පරිද්දෙන් අසා කල් නො ගෙවා අහු වෙත එළඹියේ ය.

205 එකල්හි කිසිවක් නැති කුමරහු ආ බැව් කියා ලඞකාපුර (ප්‍රභූරාජ
206 තෙමේ) මහරජු පිළිබඳ ලඞ්කාවට පතක් එවී. මහ රජ තෙමේ එපවත්
207 විධිවූ පරිද්දෙන් දූත භෝජනයට සුදුසු වූ ස්වර්ණමය රජතමය නොයෙක්
208 බඳුන් හා රන්මුවා රිදී මුවා බොහෝ වූ ප්‍රදීපාධාරයන් ද මාහැඟි වූ
තමන්ගේ වස්ත්‍ර බඳු වූ අ ඳනට සුදුසු දෑ ද කර්ණකුණ්ඩල හා මුතුවැල් ද
209 රුවන් මුවා වළලුද මේ ආදී (භාණ්ඩයන්) සතුටුවූ (රජතෙමේ) සතුටු
210 පඬුරු කොට යැවූ සේයි. ඉක්බිති කුමාර තෙමේ ඉතා ආදරයෙන් ඒ
පඬුරු සියල්ල රජහු දිසාවට වැඳ භය සහිතව පිළිගත්තේය.

එකල්හි මහ බල ඇති ඒ ලංකාපුර තෙමේ මුණ්ඩික්කාර (රජ)
211 බණ්ඩදේව මාළව රායර නම් තැනැත්තහුද යුද කොට එතැනින් පලවා
කීලංගල නම් වූ ද මේල මංගල නම්වූ ද යන දෙරට දෙමළුන් වසඟකොට
212 එහි වෙසෙමින් පසුව වීර තෙමේ එකල්හි භයපරවස වූ සිත් ඇතිව
213 පහවූ මත් ඇතිව සරණ පිණිස ආවාවූ මාළව රායරය
214 පූර්වස්ථානාන්තරයෙහි පිහිටුවා මුණ්ඩික්කාරය ද පෙරළා දී මංගල දෙරට
ප්‍රධාන කොට මුණ්ඩනනංකොණ්ඩගත වූ ගෝකර්ණනාඩ නායක කොට
අණිවලක්කිකොට්ටයෙහි ලංකාපුර තෙමේ එකල විසී ය.

215 ඉක්බිති තෙමේම එයින් නික්ම ලාහෙලා නෙට්ටූරුවට වැද
216 මානවීර මධුරාවෙහි වැසි සාමන්තයන් සමග ද, අලතඞ තරු, නාඩාල්වාර
දෙදෙනය කාලිංග රායරය, කලිකාල රාය රය යන මොවුන් සමග ද
මහයුද කොට බොහෝ දෙමළුන් හා කලිකාල රායරයාත් මරා මහත්
217 බල ඇත්තේ ඒ මධුරාව අත්පත් කොට ගෙණ, පසුව බොහෝ දෙමළුන්
ද එසේම මුවරය (නම් රායරයා) ද කරුමමළුතත රායරයා ද තම වසයෙහි
218 කොට ගෙණ බලවත් හේ තෙමේ අලලත්තුරනාඩාලයාගේ දූගීයට බොස්
219 කාලිංග රායරය, චුල්ලකංකුඩ රායරය යන මොවුන් හා මහ යුද කොට
220 දුරතික්‍රම භීමවික්‍රම ඇත්තේ ඔවුන් එතනින් පලවා ප්‍රසිද්ධ ගම් කිහිපයකුත්
221 ගිනි තබ්බවා මහා වීර තෙමේ නැවතත් නෙට්ටූරුවට එළඹියේ ය.

Non-Commercial Distribution

222 එකල දකුණු දිගින් චුල්ලකංකුඩ රායරය, අලත්තුරු නාඩාර්වාර
223 දෙදෙනාය මණ්ණාය රායර නම් වූය, පරිතතික් කුණඩියාර් නම් වූය,
එසේම සෙංකුඩි රායර නම් වූය, යන බල නායකයන් හා සංග්‍රාම
විධානයෙහි කොවිද වූ අන්‍ය වූ බොහෝ වූ දෙමළු ද කුලශේඛර රජහු
224 රභ්‍යන්තරික සාමන්ත වූ කාලිංග රායර තෙමේ ද තෙන්නපප්ල්ලව
225 රායර තෙමේ ද ආළ වඥපුපෙරුමාල් තෙමේ ද යන මේ පැරදවීය
නොහෙන්නෝ සියසෙන් සන්නද්ධ කොට නික්ම සාහසයෙන් යුත්
226 සිත් ඇත්තෝ පාතපත නම් තැනට එළඹියහ.

227 ඒ වාරයෙහි (ඔව්හු) සතුරු විජය පිණිස කරණ ලද නිශ්චය
228 ඇතිවූහ. ඉක්බිති විධානයෙහි දක්‍ෂ ලඞකාපුර තෙමේ ඒ විධාන අසා
බොහෝ ලවාහන ඇති සාමාන්තයන් එහි යැවී. ඔව්හු එහි ගොස් ඒ
229 බල කොටුව හාත්පසින් වටලා ගෙණ බල කොටුව වෙත මහ ගම්
විස්සකුදු දෙවා පසුව එපවත් කියා ලංකාපුර නම් (ප්‍රභුරාජයා) වෙත "
230 බලකොටුව පැහැර ගන්නමෝ ද නොහොත් එසේ නො කරන්නමෝ
231 දෝ" යි දැනගන්ට දූතයෙක් යැවූහ. ඒ තෙමේ ඒ අසා නැවතත් මහ
සේනාවක් යවා "බලකොටුව පැහැර ගණිව්" යි කියා හසුන් යැවීය.

එකල්හි ඔව්හු සියල්ලෝම උහු විසින් එවන ලද හස්න අසා
232 ඉතා බියකරු යුද කරණට පටන් ගත්තුය. කල්පාන්තවාත සඞ්ක්‍ෂොභයක්
බඳු වූ ඉවසිය නොහෙන මහා යුද්ධයක් එහි උභය සේනාවක් සම්බන්‍ධ
233 වූයේ විය. දහස් ගණන් දෙමළුන් ජීවිතක්‍ෂයට පමුණුවා එසේ ම
234 (කුලශේකර) රජහු අභ්‍යන්තරික වූ තෙනනපප්පලලව රායර නම්
235 (ඇමතියා ද) මරා ආළ වඥප්පෙරුමාලු විත්තා පලාගිය කල උහු නැගි
අසුද අනිකුත් බොහෝ අසනු ද ගෙණ සිංහ වික්‍රම ඇති ඒ සිංහලයෝ
වීරශ්‍රී දේවියගේ මුව පියුම තුටු කරවමින් දෙමළ සෙන් බින්දහ. පාතපත
236 නම් ඒ (පෙදෙස) අත්පත් කොට ගෙණ එහි සිටි සේනාව ලඞකාපුර
තෙමේ පසුව තමා වෙතට ම ගෙන් වී.

පසුව ඒ ලඞකාපුර තෙමේ අණිවලක්කිකොට්ට නම් (තැනට)
237 ගියේ මාලව චක්‍රවර්තිහු ද අංචුකොට්ටයන් ද වසඟ කෙළේයි. මෙසේ
තොණ්ඩිය පාසය යන (දෙරට) ගෙණ උතුරු දිග සතුරන් නැති කොට
238 සදනු පිණිස කුරුඥංකුණ්ඩි යට හේ තෙමේ ගියේ ය. එහි වළුධීය
239 රායර නම් (සාමන්ත රජු) තමා වසෙහි කොට ගෙණ උහුට සවකීය
පදවියත් සවණි වලයාදියත් දී ඉනිදු නික්ම නැවත තිරිවේකම්බම නම්
240 (රටට) ගොස් එකල්හි (එහි සිටි) සිලාමෙඝ රායරය එසේ ම කණසි
241 රායරය, අංචුකොට්ටනාඩාල්වාරය යන (සාමන්තයන්) තමා වසයට
242

Non-Commercial Distribution

ගෙණ මොවුන් සියල්ලන්ට පෙර සෙයින් සතුටු පඬුරු දී
පුංකොට්ටනාඩාල්වාර (නම් බලනායකයා) ද තමා වසයෙහි පමුණුවා
මොවුන් සියල්ලන්ට ද පෙර සෙයින් ප්‍රසාද දී
243 ඉක්බිති සත්‍යසන්ධාන ඇති මහා වීර තෙමේ තමා වසඟ වන්ට
244 මාළව චක්‍රවර්තීන් වෙත හසුන් යවා වැලි උහු (තමා) නො දක්වා
245 සෙන්පොන්මාරියට ගිය කල ලංකාපුර තෙමේ සෙන්පොන්මාරි නම්
246 නුවර ගන්නා පිණිස තෙමේ ම එහි ගියේ ය. ඒ නුවර ගන්ට පූර්වයෙහි
ආවා වූ සොළි සේනා තොමෝ වනාහි දැවුරුද්දක් එහි යුද කරන්නී
ගන්ට නො හැකි වීල. එබඳු වූ යාමට දුක් වූ ඒ බල කොටුව සිංහ
වික්‍රම ඇති ඒ සිංහලයෝ දිනයාගේ අර්ධභාගයක් කලු දූ පසු නො
247 කොට පව්රු දෙක හා දොරටු සතර බිඳ වෙන වෙන ඇතුන් සෙයින්
248 දුර්ගය ඇතුළට වන්නාහ. එහි නොයෙක් සිය ගණන් දෙමළුන් මරා
මෙසේ ඔව්හු සෙන්පොන්මාරි නම් වූ ඒ නුවර ක්ෂණයකින් පැහැර
ගත්හු.

249 එකල්හි කලල සේනාවය, නැවත මරවරයෝය, එසේම
ගෝළිමළයෝ ය, වැලි එසේම කුතතවරයෝ ය, වලලක්කුත් තාර සේනාව
250 ය, එසේම ඌවෙන සේනාව ය යන පණස් දහස් සැට දහස් ගණන්ට
251 ගියා වූ ඉතා උදාර පරාක්‍රම ඇති දෙමළ මහාබලය, සිංහලයන් සිටි ඒ
252 බල කොටුව වටලා පසුව ඉතා බිහිසුණු තර යුද්ධ කරණට වහා පටන්
ගත. ඉක්බිති දකුණු දොරටුවෙහි දොර හැර දේවලංකාපුර නම් වූ ය,
253 එසේම සොර ලංකාගිරිය යන ඉක්මවිය නො හැකි වික්‍රම අති
(බළනායකයෝ) සියසෙන් සහිත වූවෝ දහස් ගණන් දෙමළුන්
ජීවිතක්ෂයට පමුනුවා ඒ දිගින් ආවා වූ ඉතා උග්‍ර වූ දෙමළ බලය ඇති
254 මුළක් සිංහටන් සෙයින් සිංහ වික්‍රම ඇති ව බින්දග. ගෝකණ්
255 දණ්ඩනායක නම් වූ ද ලෝක කේසධාතු නම් වූ ද (සේනාපතීහු) එ
256 කෙණෙහි එ දකුණු දොරින් නික්ම ගෙණ සතුරන්ගේ බාහෝ හටයන්
257 රණබිමෙහි මරවා නසන ලදින් ඉතිරි වූ සියලු සතුරු බලසෙන් භග්න
258 කළහ. මහත් බල ඇති කීර්ති කේසධාතු නම් බලනායකය, ජගද්විජය
නම් වූ ලංවිය නොහෙන එක් සාමන්තයෙක් යන වීරයෝ දෙදෙනා
259 උතුරු දොරින් බැහැරව දෙමළ යෝධයන් අතුරෙන් බොහෝ දෙනෙක්
260 ජීවිතක්ෂයට පමුණුවා දෙමළුන් අයත් බලසෙන් වහා බින්දහ, මෙසේ
261 එදවස් ම සිංහලයෝ ක්ෂණයක දී දෙමළුන් අයත් සියලු සේනා මරා ද
පලවා ද බොහෝ අසුන් ගත්තාහ. දිනක ස්වභාව ඇති ප්‍රසිද්ධ වූ බල
262 කොටුවට පෙරළා අවු ය.

Non-Commercial Distribution

එකල්හි කුන්තවරයෝ ය, එසේම කල්ලර සේනාය, ගෝළි
263 හළයන්ගේ සේනාය, මරවරයන්ගේ සේනාවය, වල්ලක්කුත්
264 තාරසේනාය, එසේම ඌවවෙන පිරිසය, ඵලයුරු නාඩාල්වාරය, එසේම
කාඩිගයාරාය යන මේ දෙදෙනාගේ සේනාය, එසේම
265 ඵලයුරුනාඩුවාසීහුය, කලහිනාඩුවෙහි සේනාය, ඵලයුනනාඩු වාසීහු
ය, කාකන්නාඩුවාසීයයි යන මේ දෙමළ බලසෙන් හා සොළී දේශ
සීමාවෙන් (මොබ) වොල්ලරු නම් ගම දක්වා මොබ රට වැසි සියල්ල
266 තමා වසයට ගෙන ආයේ ය. හේ තෙමේ යථානුපූර්වියෙන් මොවුන්ට
ප්‍රසාද ද දිනි. එකල්හි වෛශ්‍යයන් විසින් ද යොනුන් ද ගෙණෙන ලද
267 පඬුරු ගෙණ ඔවුනුදු බොහෝ ප්‍රසාද (දීමෙන්) සත්කාර කොට පෙරළා
සරණ පිණිස ආවා වූ මාළව චක්‍රවර්ති නම් (බල නායකයාට)
268 සෙන්පොන්මාරි (නුවර) දී උහු සිය පදවියෙහි තබා එයින් පිටත්ව
269 තිරුවේකකම්බයට නැවත අවුත් ඉදුනු තික්ම කුරන්දංකුණ්ඩියට ආයේ
ය.

270 එකල්හි බලවත් වූ කලවණ්ඩිනාඩාල්වාර් තෙමේ යුද කොට මාළව
රායරයා කෙරෙන් මුණ්ඩික්කාරය පැහැර ගත්තේ ය එසේ කළ මාළව
271 රායර තෙමේ අනික්සරණක් නොදක්නේ " මට ඔබ සරණ වෙව"යි
ලංකාපුර දන්ඩනාථයන් වෙත එළඹියේ ය. එකල නියෝජක වූ ලංකාපුර
තෙමේ කේස ධාතුය, ලෝක සම්මත වූ කීර්ති ය, ලෝකනාථ ය යන
272 දෙදෙනා ය, ගෝකණ්ණ දණ්ඩනාථය යන උතුම් වූ සාමන්තයන් කැඳවා
273 යුද කොට මුණ්ඩික්කාරය ගෙණ නැවත උහුට ම දෙනු පිණිස නියෝග
274 කෙළේ යි. ඔව්හු එහි ගොස් දුරතික්‍රම යුද කොට (කලවණ්ඩිය නාඩාල්වාර
නම් වූ) උහු එයින් බැහැරලා බොහෝ දෙමළුන් මරා මාළ රායරයන්
නැවතත් යථා ස්ථානයෙහි තබා තුබු එයින් ලංකාපුර (දණ්ඩනාථ) යන්
275 වෙතට ම පෙරළා අවු ය. තව ද පුංකොණ්ඩනාඩාල්වාර නම් වූ අනික්
276 සාමන්තයෙක් තෙමේ සිරියවල නම් වූ තැනට අවුත් එහි වෙසෙමින්
277 මාළව චක්‍රවර්තීන් හා මහ යුද කොට ජයකොට්ටාන යයි ප්‍රසිද්ධ වූ
278 ගමට උහු පලවා තෙමේ එකෙණෙහි සෙන්පොන්මාරිය අත් පත් කොට
ඇත.

279 එකල්හි ධීරයන් අතුරෙන් ප්‍රවර වූ ලංකා පුර තෙමේ ඒ ක්‍රියාව
අසා තෙමේ එකෙණෙහි අණිලක්කී පූරයෙන් පිටත්ව සෙන්පොන්මාරි
කොටුව ගන්නට රිවේ කම්බයට ගියේ ය. පසුව පුන් කොණ්ඩ නාඩාල්
280 වාර් තෙමේ ඒ විධාන අසා භයින් සෙන්පොන්මාරි හැර එයින්
281 සිරියවලයටම ගියේ ය. නැවත ලංකාපුර වීරතෙමේ සෙන්පාන්මාරියට
282 එළඹියේ ය. පුංකොණ්ඩනාඩාල්වාර තෙමේ (ලංකාපුරයන්ගේ) වසෙහි
283 වන්නෙමැයි ආයේ (තමා) නොදක්වා නැවතත් සිරියවලයම ම ගියේ

Non-Commercial Distribution

ය. ලංකාර තෙමේ ද සිරියවල නම් ගමට ගොස් හාත්පසින් ඉතා
284 බිහිසුණු යුද කරණට පටන් ගත. ඉක්බිති පුංකොණනාඩාල්වාර් තෙමේ
"ඉදින් මම ලබන ලද අභය ඇත්තෙම නම් ඔබ වසෙහි ඉන්නෙමි.
285 ඉදින් නැත්නම් මහා භයපරාධීන වූයෙම් එන්ට නොහැක්කෙමි"මෙසේ
හසුන් යැවී ඒ අසා ලංකාපුර තෙමේ "පහවූ භය ඇතිව තෙමේ ම ඒවා"
යි පිළිහසුන් යැවී.

286 ඉක්බිති විගත සාරද ඍා ඇති ඒ තෙමේ සැබෑවෙන් සැබෑ
ගළපන්නා වූ ලංකාපුර වීරයාගේ හස්නෙන් (උහු) වෙතට උපගතවී.
287 පසුව ලංකාපුර තෙමේ උහුට අනල්ප වූ ප්‍රසාද දී මාළව චක්‍රවර්තීහු ද
288 තමන් වෙත ගෙන්වා දෙදෙනාට මිතුරු කොට ඒ දෙදෙනා
289 යථාස්ථානයෙහි තබා මහාවීර වූ ඒ තෙමේ නෙට්ටුරුවට එළඹියේ ය.
290 විනෂ්ට වැව් දෙක ප්‍රකෘතිමත් කොට බඳවා එසේ ම ඒ තෙමෙ
සිරියවලයෙහි ද පෙරුම්පයල් හි ද වැව් දෙකක් බඳවා කෘෂිකම් කරවී.

291 කුලශේඛර භූපාල තෙමේ ත්‍රිණවෙලියෙහි බළසෙන් ද තෙත්
කොංගුය වඩකොංගුය යන දෙරට මයිනලගේ බල සෙන් ද එසේ ම
292 සාමදානාදී නනා නය දන්නේ එකල්හි බිඳුවා තමා වසයට ආ බොහෝ
දෙමළුන් ගෙණ සම්පන්න වාහන ඇත්තේ යුද පිණිස එන්ට ආරම්භ
293 කෙළේ ය. ඉක්බිති ප්‍රාඥා ලංකාපුර තෙමේ ඒ විධාන අසා දුෂ්ට නිග්‍රහ
294 කෘත්‍යය පිණිස ස්වාමිහුගේ අනුශාසනායෙහි පිහිටියේ ශය බුද්ධි ඇති
295 ඒ දෙමළුන් සමූලඝාතනයෙන් මැරවී. එකල්හි පිටිවහල් පිණිස
පැරකුම්බා මහ රජහු විසින් මෙහෙයන ලද ලෝකාතික්‍රාන්ත වික්‍රාන්ති
296 ඇති ජගද්විජය නම වූ (නායක තෙමේ) පාබල සේනා හා බොහෝ
අශ්ව සේනාවන් විසින් අනුගත වූයේ එතර වූ මහ මුහුදු ඇත්තේ නො
පසුබස්නා වීයෑ ඇත්තේ අනිවක්කිලයට උපගත වී.

297 මහා යසස් ඇති ලංකාපුර තෙමේ නෙට්ටුරුවෙන් නික්ම
අණිවක්කිලයට එළඹ අධුනාගත වූ උහු වැළඳ ගෙණ සිහි කටයුතු වූ
රම්‍ය වූ කථාව කොට නිමවා නැවතත් නෙට්ටුරුවට ම අවුත් පරාමජනා
298 හේ තෙමේ එයින් නික්ම මුන්ද්‍රනන්ණඩයයි ප්‍රසිද්ධ වූ ස්ථානයකට
299 එළඹ විශ්‍රැත වික්‍රම ඇත්තේ ස්ථාන දන්නේ එහි සිට කීළකොණ්ඩ නම්
300 තැන ද මංගල නම් තැන ද දෙමළුන් හා යුද කොට බොහෝ භටයන්
301 මරා ජීවග්‍රාහයෙන් ගත යුතු වූ බොහෝ වෛරීන් ගෙණ යුද්ධභූමියෙහි
302 ඉතිරි වූ බොහෝ අසුන් ද ගෙණ එයින් ඔරිත්තියුරු තොණ්ඩමය ගොස්
පුඩෙකාණඩනාඩාල්වාරය සිලාමේඝරය අංදුක්කොට්ට නාඩාල්වාරය
303 යන මොවුන් මහ යුද කොට හීම උද්දාම අතිශය වික්‍රමයෙන් යුක්ත

Non-Commercial Distribution

වුයේ බොහෝ දෙමළුන් මරා එයින් සිරියවලලට ගියේ යි. තමා වසයට නොපැමිණි පුඩෙකාණ්ඩ නාඩාල්වාර් (නම් බළනායක) යාගේ දෙමහල් ප්‍රාසාදය හා කොටු ව ද ගිනි ලවා තිරික්කානප්පෙර නම් තැනින් නික්ම ගියේ ය.

එකල්හි ජගද් විජය නායක තෙමේ අණිවක්කිලයෙන් නෙට්
307 ටුරුවට ගොස් ඉනුදු නික්ම මනවීර නම් මධුරාව ද පතත නල්ලුවට ද
සොරණ්ඩකොට්ටය ද යන මේ දුර්ගම ගර්ඩයන් බිඳ නැවත නෙට්ටුරුවට
ම පෙරළා අවුත් (එහි) වෙසෙමින් අලත්තුරුනාඩාල්වාරයන් හා
308 චුල්ලකංකුණ්ඩ රායරයා වසයට පැමිණවී. මහා බල ඇති වීර වූ හේ
309 තෙමේ කිසි කලෙක පතතනල්ලුරුවට අවුත් එකල්හිලංකාපුරයන් වෙත
310 "සිංහ නම් නදියට වහා ඔබ විසින් එන්ට යෙදෙයි. අවශ්‍යයෙන් දැක
311 කිය යුත්තක් විද්‍යමාන ය"යි අසුන් යැවී. එපවත් අසා ලංකාපුර තෙමේ
312 වහා ඉන් පිටත් ව මහබල ඇත්තේ මගට පිළි පන්නේ ය.

තිරිප්පාලූරු ය යි ප්‍රසිද්ධ වූ තැන්හි සිටි සතුරු සේනා තොමෝ
313 සන්නාහ සන්නද්ධ ව ස්වකීය වූ බොහෝ අසුනුන් (ගෙණ) අවුදින් අධි
314 මාර්ගයෙහි ද බිහිසුණු යුද කරණට පටන් ගත්තී ය. යුද්ධගම වීර වූ
315 දේව ලංකාපුරාදින සමග ඒ වීරයෝ එහිදී ඒ මහ සෙන් (විසුරුවන්නෝ)
පතල සූර්ය රශ්මීහු අඳුරු කඳ සෙයින් එකෙණෙහි ම බිත්දාහ. මෙසේ
316 එකෙණෙහි ලංකා පුර තෙමේ තිරප්පාලුවට ගෙණ කල්පාන්ත වහ්නී
බඳු පරාක්‍රම ඇත්තේ එහි ම වාසය කෙළේ ය. මන්ත්‍රණයෙහි කොවිද
317 වූ ජගද් විජය නම් සාමන්ත තමේ ද යුද්ධ ශාස්ත්‍රහිසමත්ථ වූයේ
318 පන්නට්ට කොට්ට වාසී වූ දෙමලුන්ගේ මහ පළ සෙන් යුද්ධාංගනයේ දී
බිඳ බල කොටුව අත්පත් කොට ගෙණ එහි ම හුන්නේ ය.

ඉක්බිති කුලශේඛර රජ තෙමේ බලාත්කාර ක්‍රියා විශේෂ
319 යෙන්යුක්ත වූයෝ තුවාධිපති වේළාර නම් තැනැත්තහු ද තොණ්ඩමාන
වර නම්තැනැත්තහු දවීප්පෙ රායර (පළ නායක) යා ද එසේ ම නිගධ
320 රායරාය, කලවංඩිය නාඩාල්වාරය එසේ ම කාංගය රායරය (යන
321 සෙනෙවියන්) හැරගෙණ ස්වකීය වූ බොහෝ හටයන් ද සන්නද්ධ කොට
322 ගෙණ යුද පිණිස බඳනා ලද කැසපට ඇත්තේ රංජිනි (නුවරට) ආයේ
ය. බිහිසුණු පැරකුම් ඇති මහ සෙන් ඇති ඒ තෙමේ බියකරු ස්වකීය
සේනාව ලංකාපුර (නම්ප්‍රභූරාජයා) හා යුද කරණට මෙහෙසී. එකල්හි
323 ලංකාපුර වීර තෙමේ විධානයෙහි පණ්ඩිත වූයේ ජගත් විජය (නම්
324 සමාන්තරජ) හට විධාන වූ පරිද්දෙන් ඒ විධිය (කියන්නේ) "කුලශේඛර
325 මිහිපල්හු පලවනට මට සහාය ව එක් දිගෙකින් යුද කරණට සේනා

Non-Commercial Distribution

සන්නද්ධ කොට ගෙණ තොප විසින් වගා ආගමනය කටයුත්තේ ය.
326 කියා හසුන් යවා එකෙණෙහි බලවත් වූ ස්වකීය සෙනඟ හරහා ගෙණ
එයින් පිටත්ව දෙමළුන් මහ යුද පැවැත්වී. ඒ දෙමළු එහි ඇසිල්ලක දී
327 බිඳුනෝ රාජිනා (පුරය) ට පිවිස එහි කුඩා මහත් දොරටු ද ගෝපුරයන්
ද වසාගෙණ මිහිපල්හු සහිත දෙමළු ඇතුළත සිට ගත්හ.

328 එ කල්හි පූර්වංගම වීර වූ ගෝකණ්ණ දණ්ඩනායක තෙමේ ද ලෝක
329 නම් කේශ ධාතු (සාමන්ත) තෙමේ ද එසේ ම දේව ලංකාපුර සමාන්ත
330 තෙමේ ද යන මොව්හු එක්ව ගෙණ බටහිරි දොර පවුරු බිඳ හෙළන්ට
331 ද ගෝපුරයන් බිඳින්ට ද පටන් ගත්හ. දේවලංකාපුර තෙමේ ද ගෝකණ්ණ
332 දණ්ඩනායක තෙමේ ද ප්‍රාකාරය හා දොරටුව බිඳ ඇතුළට වන්හ. ඉක්බිති
333 මහත් බල ඇති මානිලෝක නම් කේශ ධාතු තෙමේ" මම අනුන් ගිය
මගින් නොයන්නමැ යි සිතා බොහෝ වීරයන් මරමින් බොහෝ අසුන්
හෙලමින් දකුණු දොර බිඳගෙණ ක්ෂණයෙක්හි ඇතුල්වී එකල්හි
334 අත්‍යත්ථයෙන් බා ගිය සිත් ඇති ඒ කුලශේඛර රජ තෙමේ ඇඳි සිය
වත්වන් අනීශවර වූයේ නැගෙණහිරි දොර හැර දොරටුවෙන් බැහැර
335 ගොස් කිසි හේතුවකින් සතුරන් අතින් මිදිනි. ඒ සියල්ලෝ එහි දී
336 දෙමළුන්ගේ බොහෝ හට යන් මරා බොහෝ අශ්වයන් ද බොහෝ
වස්තුවර්ගය ද පැහැර ගෙණ පිළි හිස සිසාරන්නෝ ඔබ මොබ
පනින්නෝ අත් පොළසන් දෙන්නෝ සිනාසෙන්නෝ විජනායක තෙමේ
337 ද අන්‍ය වීරයන් සමග රාජිනා පුරයට ප්‍රධාන්‍යයෙන් එළඹියෝ යි.

මෙසේ කළ පින් ඇත්තා වූ තීක්ෂණ ප්‍රඥාවෙන් යුක්ත වූ නීති හා ශික්ෂා ඇත්තා වූ බිහිසුණු තෙද ඇති නොලිහිල් ව්‍යායාම ඇත්තවුන්ගේ චිත්තසංකල්පයෝ සරාකල් පෙරඩ මස සඳ සෙයින් සමෘර්ධියට පැමිණෙති.

මෙතෙකින් හුදී ප්‍රසාද සංවේග පිණිස කළ මහවස රාජිනා පුර ගහණ තිදෙදස නම් වූ සැත්තෑ හවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ හත් වෙනි පරිච්ඡේදය

1 ඒ කුලශේඛර මිහිපල් තෙමේ භයින් එ තැනින් පලා ගියේ
තොංඩමාන නම් තැනැත්තහුගේ පර්වත දුර්ගයෙහි ස්ථිතිය කෙළේ යි.
2 වීරනුක්කර සේනාවෝ ද එසේ ම අන්‍ය වූ කකේකාල යෝ ද මධුරක්කාර
3 සේනා ද රාජිනා නුවර ආවෝ එ කල්හි කුලශේඛර රජහුගේ ඒ සියලු
4 පවත් කියා මධුරා පුරයට යන්ට ලංකාපුර (ප්‍රභූරාජයා) හට ආරාධනා
5 කළහ. පසුව ලංකාපුර තෙමේ ද මහත් ශ්‍රියෙන් යුක්ත වූවෝ මධුරාපුරයට
ගොස් "මේ තෙමේ තොපගේ උපන් ගෘහය ද පිය රජහුගේ නිවාසය
වෙයි" කියා වීර පඬි කුමර හට (පාවා) දී ඔව්හු එහි විසූහ.

සිරිවල්ලභ නම් රජය, නාරායන නම් වූ ය පරාක්‍රම පඬු නම් වූ
6 ය, වීරප්පෙරය රායරය, මණ්ණය රායර සාමන්තය එසේම සෙඩිකුංඩි
7 රායරය, අන්‍ය වූ වීරප්පේරායර නම් වූය. කේරළසිහ මුත්තරය යන
8 මොවුන් වසයට නම් තැනැත්තා හට පූර්වයෙහි තමා විසින් අනුභව
9 කරණ ලද පරිත්තිකුංඩි රට නායක බැව් අනුදන උහු සිය පදවියෙහි
10 තැබූහ. කලවංඩිය නාඩාල්වාර් තෙමේ "වසඟ වන්නෙමැ"යි අනෙතා
11 මධුරාවට අවුත් "මා දක්වන්නට භය යි කියා තමා නො දන්වා හේ
තෙමේ සිය තැනට ම ගියේ යි. එකල්හි ලංකාපුර තෙමේ උහුගේ රට
12 ගන්ට ගොස්දූරතික්‍රම වියඎ ඇති ඒ තෙමේ යුද කොට ඔහු පලවා මහ
බල පරාක්‍රම ඇත්තේ ආලඟ්වානගිරි රට ගත.

අන්‍ය වූ සූරදේව නම් කවංගෙඩිය නාඩාල්වාර් තෙමේ සරණගත
13 වූයේ පසුව (ලංකාපුර දංඩනාථ) නායකයන්ගෙන් රට ඉල්වී ය. ලංකාපුර
14 තෙමේ ද ඒ රට උහු විසින් ඉල්වන ලදුයේ උහුට දී පසුව කුරුඹ රායර
නම් බළනායක යා ගේ රටට ගොස් මහා යසස් ඇත්තේ කුරුඹ රායරයන්
15 ද තමා වසෙහි පවත්වා එසේම කංගර රායරයන් ද තමා වසෙහි පවත්වා
16 නියමයෙහි වෙමින් පසුව ඒ වීර තෙමේ නිකලධ රායරයන් වසෙහි
පවත්වන්ට එ තැනින් තිරප් පුත්තරු නම් තැනට ගියේ යි.

17 නිකලධ රායර තෙමේත් සිය සෙන් රැස් කරවා අකලංක නාඩාල්
වරාය එසේ ම කාඩම්බ රායරය මලයස රායරය, කිංචා එත්තරායරය
18 යන මේ සොළී සාමන්තයන් හා ඔවුන්ගේ අනල්ප වූ බළ සෙන් ද
19 ඔවුන් අයත් බොහෝ අසුන් ද ගෙණ දුර තික්‍රම සංග්‍රාම කරණට පටන්
20 ගත්තේ ය. පසුව යහළුවන් පදිකයන් සහිත වූ ඒ සතුරු සේනාව
21 තිරුප්පත්තුව පටන් පොන් අමරාවතිය තෙක් මෙ අතුරු මහ මග තුන්
22 ගව් පමණ තන්හි එක් මස් කලවිටි කොට ඒ මහ අමරාවතියට එළඹ
23 එහි කරණ ලද තෙමහල් පහයකුදු දවා අනිකුදු බොහෝ ගෙවල් ද
24 සමෘධ වී කොටු ද ගිනිලා පසුව රට වැස්සන් භය දුරලනු පිණිස වීර

Non-Commercial Distribution

තෙමේ අණ බෙර හසුරුවා රට වැසි ජන සමූහයා තමා වසයට ගෙණ පෙරළා මදුරාවට ආයේ ය.

25 එකල්හි දැඩි ආඥා ඇති (පරාක්‍රම්බා) මිහිපල් තෙමේ වීර පඬි
26 කුමරහට ඔටුනු පැළඳීම් මඟුල් විධානයට හසුන් යැවූයේ ය. පසුව රජහු
දුරතික්‍රම හසුන් අසා ඒ තෙමේ එකෙණෙහිම අභිෂේක විධිය කරවන්ට
27 ආරම්භ කෙළේ ය. මාළව චක්‍ර වර්තිය එසේ ම මාදුව රායරය, ඵලයුරු
28 නාඩාල්වය යන මේ ලම්බකරණී (ගෝත්‍ර) ඇත්තවුන් ලම්බකර්ණී ධුරාව
කරණට මෙහෙයා පසුව (අනුන් විසින්) ඇක්ම නොහැකි ආඥා ඇත්තේ
රජයෙහි අණබෙර හසුරුවා සිය සෙන් විසින් පෙරටු කරණ ලද්දා වූ
29 නන් අබරණින් හෙබියා වූ පඩි රජයෙහි සාමාන්තයන් සියලලන්ම රැස්
30 කරවා පූර්ව රාජ මන්දිරයෙන් උතුරු දිග්භාගයෙහි පූර්වයෙහි ලබන ලද
31 ජය භේරියෙන් හෙබියා වූ දෙවොලෙහි දී කුමරහට විධානවූ පරිද්දෙන්
ඒ අභිෂේක (මඟුල්) කරවා මහ යසස් ඇත්තේ උහු ලවා නුවර
පැදකුණුකරවී ය.

ඉකිබිති තොඩමානයන්ගේ ගිරි දුර්ගයට පලවන ලද කුල ශේඛර
32 මිහිපල් තෙමේ තොංඩමානයන් තමා වසයෙහි කොට ගෙණ උහුගේ
සෙනගත් සවකීය සෙනඟත් තොණ බිහිසුණු විකුම් ඇති අනුජීවිය මිංඩ
33 නම් තැනැත්තහු ගෙණ ඒ පර්වත දුර්ගයෙන් බැහැර ආයේ පසුව මංගල
31 නම් වූ බලකොටුවට වැද මණනය රායරය, සෙංකුඩි රායරය යන
35 සිංහලයන් වසඟයට ගියවුන් හා මහයුද කොට ඒ කොටුව පැහැර
ගෙණ හේ තෙමේ එහි ම හුනි. ඉක්බිති ලඞකාපුර තෙමේ වූ පරිද්දෙන්
36 එපවත් දැන "වෛරී රජහු එතනතිදු පලවා පර්වත දුර්ගයෙහි ආරණ්‍ය
37 දුර්ගයෙන් යුක්ත වූ රට ද ශුද්ධ කොට එන්ට වටනේ ය" යි සිතා මධුරා
38 පුරයෙන් පිටත්ව මංගලකොටුව සමීපයෙහි බල කොටුවක් කොට ගෙණ
39 හිඳගත වෙල්ලිනාබ (නම්) බල කොටුවෙහි මහා සේනා හා සිටියාවූ
41 තොංඩමානයන් බිරින්ගේ සහෝදරයන් තුන්දෙනා සමග ද කල්ලක්ක
41 නම් වේළාරය, මුතයධරායරය, කාලිංගරායරය යන මොවුන් සමගත්
42 මහයුද කොට ඒ බළකොටුව පැහැර බොහෝ දෙමළුන් මරා පසුව
සිවලී පුත්තුරුව පැහැර මහා යසස් ඇත්තේ හුනි.

42 එකල කුලශේඛර නම් සතුරු රජ තෙමේ ත්‍රිණවෙලියෙහි
43 බළසේනා ද කැටි කොට එසේ ම මයිලන් දෙදෙනාට ද හසුන් යවා
තොන්කොංගු වඩකොංගු දෙරට බලසෙන් ගෙණ මහසෙන් ඇත්තේ එ
44 කල්හි ඒ සියලු සේනාවට අණ කොට සාන්තනේරිය යි ප්‍රසිද්ධ වූ
බලකොටුවෙහි සිටින්ට නියෝග කෙළේයි. එ කල්හි ලඞකාපුර තෙමේ
45 ද ජගත් නායක තෙමේ ද ඒ බළකොටුව ගන්ට එකෙණෙහි මගට
පිළිපන්හ.

Non-Commercial Distribution

46 එ කල්හි උපායකුශලවූ කුලශේඛර නම් තෙමේ සතුරන්ගේ මහ
47 ඇවිරීම් පිණිස තෙමේ මහ වැවක් සින්දවී. එ කල්හි විර වූ ලඞ්කාපුර
තෙමේ එ පවත් දැන සතුරන් හා මහයුද කරණට යන්නහු විසින් අතරමග
48 සුන් වැව දැකීම් අයුක්තය යි මෙසේ සිතා මහා බල ඇත්තේ එකෙණෙහි
49 ඒ වැව බඳවා මහා බල පරාක්‍රම ඇත්තේ ඒ මහා දුගීයට ගොස් දරුණු
50 යුද කොට එකෙණෙහි එය පැහර එහිදී කලලක නම් වේළාරයා හා
51 අන්‍ය වූ බොහෝ දෙමළුන් මරා බොහෝ දෙමළුන් ද අසුන් ද ගෙණ
52 එයින් තිරිමලක්ක නම් වූ ය, එසේ ම කත්තලමන යන තොංඩමානයාගේ
ගම් දෙකට කෙණෙහි වැද තිරිමලක්ක නම් ගම නාමශේෂ කොට ගිනි
ලවා පරාක්‍රම පණ්ඩු රජ තෙමේ මෙහි ආයේ යයි එයින් පිටත්ව චෝල
කුලාන්තක නම් ගමට ගොස් මහා යසස් ඇත්තේ මඳ කලක් එහි ම විසී
ය.

53 ඉක්බිති කුලශේඛර රජ තෙමේ ස්වකීය මයිලන් දෙදෙනා ද ඒ
දෙදෙනාගේ ද එසේ ම බොහෝ අසුන් ද අකලඞ්ක නාඩාල් වාරය
54 එසේ ම පල්ලව රායරය, මළයප රායරය එසේම කංඩම්බි රායරය,
55 කිංචාරතත රායරය මහා බල පරාක්‍රම ඇති මෙකී සොළීසාමන්තයන් ද
56 එවුන්ගේ අනල්ප සේනාව විසින් පෙරටු කරණ ලද පුඞ්කොංඩ නාඩාල්
57 වරාය (යන මෙතෙක් බළ සෙන්) ගෙණ තෙමේ මපලඞ්කොට්ට නම්
58 තැනට ආයේ, පාංඩුනාඩුකොට්ටාන නම් තැන ද එසේ ම උෟරි යේරි
නම් තැන ද ඒ මහ සෙන් සිටිනට මහා බල ඇති හේ තෙමේ ඒ
59 වාරයෙහි සතුරන් දිනනු පිණිස කරණ ලද නිශ්චය ඇත්තේ නියෝග
කෙළේ ය.

60 ඉක්බිති ලඞකාපුර නම් ප්‍රභූරාජතෙමේ ද ජගද් විජය නායක
තෙමේ ද යුද පිණිස චෝළ කුලානතය නම් ගමින් පිටත්ව ගෙණ මහ
61 බලකොටු දෙක්හි සිටි සතුරු සෙන් යුද්ධ භූමියෙහි යුද්ධාරම්භයට
62 නොසතුටු කොට උෟරියේරි නම් ගම්හි වෑ මත්තෙහි මහ බලකොටු
63 කරවා එහි එ කල්හි රාත්‍රි භාගයෙහි විසූහ. එ කල බලකොටු දෙක්හි
සිටුවන ලද්දා වූ සතුරු සේනා තොමෝ බිඳුන යම් තැනක කුලශේඛර
රජ තෙමේ වි නම් එහි ගියා.

64 එ කල්හි ලංකාපුර තෙමේ ද ජගද් විජ්ජ නායක තෙමේ ද තැන්
නොතැන් (දූන්මෙහි) විචක්‍ෂණ වූවෝ පලඞ්කොට්ට නම් තැනට ගොස්
65 බිහිසුණු යුද කොට නොපසුබස්නා වීයෲ ඇත්තෝ වෛරී රජහුගේ
66 බොහෝ යෝධයන් මරවා බොහෝ අසුන් ගෙණ කුලශේඛර මිහිපල්හු
67 පලවා එකෙණෙහි පලඞ් කොට්ටය ගෙණ ඉනිදු නික්ම තුවර (රට)
අධිපති වෙළාර නම් එකක්හු වෙතට ගොස් උහු විසින්ම දෙන ලද්දා වූ
68 අසුන් ද ඇතුන් ද ගෙණ කුලශේඛර මිහිපල් තෙමේ මධුරාවට ආයේ ය
69 යි අසා උහු එතැනිනුදු නෙරපනු පිණිස අධරට් ටෙරි (නම් තැනට)

Non-Commercial Distribution

අවුත් එහි නිගලරායරයා වසෙහි කොට උහුට බොහෝ ප්‍රසාද දෙවුහ.
70 පසුව එ තැනින් නික්මුණු කල කුලශේඛර මිහිපල් තෙමේ භයට
පැමිණියේ , එයින් සොළී රටට වන.

71 ඉන් පසු ලඞකාපුර තෙමේ ද ජගද් විජය නායක නම් ඇමතියා
පත්ත නන්ලූර නම් තැන්හි සිටින්ට නියෝග කොට තෙමේ බල සේනා
72 විසින් පෙරටු කරණ ලද්දේ තිරික්කානුප්පෙර නම් තැනට ගියේ ය.
73 කුලශේඛර රජ තෙමේ ද නානාප්‍රකාර යාචන කර්‍මයෙන් සොළි රජ
74 පහදවා ඒ රජහුගේ නියෙච්ගයෙන් පල්ලවරායරය නම් වූවහුගේ සේනාව
ද බොහෝ අසුන් ද ඉනඥපද නම් තැනැත්තහු ද වැලි අන්‍යවූ
75 තොංඩමාන නම් වූවහු ද රාජරාජකළප්ප නම් රායරයා ද පතතාරායර
නම් වූවහු ද කංගකොංඩකළප්ප නම් රායරයා ද එසේ ම අන්‍ය වූ
76 නකාරානිබිලුපාදී රායරයා ද එසේ ම අන්‍ය වූ ) නිච්චවිනොදමානව
77 රායරයා ද වීර වූ නරසීහ පද්මරායරයා ද සේකීරපද්ම රායරයා ද
රාජිඥබ්‍රහ්ම මහාරාජයා ද මාධව රායරයා ද (නිකලධ රායරයා ද )
78 චොළකොනාරයා ද ජන්දබ්‍රහ්ම මහ රායරයා ද චොළනිරික්ක රායරයා
ද උච්චංකුඨ (රට) මෙකී බල නායකයන් ගෙන නීයාරයා නැවත අන්‍ය
79 වූ කුංඩු චෙට්ටිය එසේ ම කොංගමංගලය නාඩාල්වාරය වැලිදු අන්‍ය වූ
80 අකලජක නාඩාල්වාරය එසේ ම කංඩම්බ රායරය කීළමංගලනාඩාල්වාරය
81 එසේ ම අන්‍ය වූ විශාලමුත්තු රායරය ඔවුන් බොහෝ අසුන් ද
82 (එක්කොටය) තොංඩිය පාසය යන දෙරටට එවී ය. ලංකාපුර තෙමේ
83 ඒ විධාන අසා ඔවුන් නාමශේෂ කරන්ට සිතා මධුරායෙහි ජගද්විජය
නායක ඇමතියා සිටුවා වීර වූයේ තිරික්කානුප්පෙරු නම් තැන්න් පිටත්ව
84 පසුව තෙමේ කීළෙනීලය නම්මධුරානතක පුරයට එළඹීයේ ය. එකල්හි
සොළී මහාසේනා තොමෝ මහ යුද පටන් ගත.

85 සතරගවු පමණ වූ ඒ මාරග මිණීමෙන් ආකුල කොට මුහුද
86 හුනුවා වූ ද බොහෝ භටයන් මරවා සයුර දිය සතුරන් ලෙහෙයෙන්
ඉතා රතු කොට බොහෝ අසුන් ද එසේ ම බොහෝ දෙමළුන් ද ගෙණ
87 රාජින්ද්‍ර බ්‍රාහ්ම මහා රායරය නන්දි පද්මරාය නරසීම පරද්මරාය,
88 චොළකොනාරය යන බල නායකයන් මඩමණමේක්කුඩිය
89 මනමේකක්කුඩිය එසේ ම මඩක්කුඩිය යන තැන් භූමි ශේෂ කොට ගිනි
90 ලවා සොළි දේශයෙන් සත් ගව් පමණ තැන් ද ගිනි ලවා මෙසේ ඒ
සොළීන් සාදා ඉනුදු පෙරළා ආයේ ය නිකලධ රායරයා අයත් වූ
වෙලංකුඩිනම් ගමට වැද එනු පිණිස උහුට හසුන් යැවී.

91 එකල්හි ඒ තෙමේ කුල ශේඛර රජහු වසෙහි වී කුලශේඛර රජය
92 ශිලාමේඝරය අකලංක නාඩල්වාරය එසේ ම කංඩම්බ රායරය
93 මලයප්ජපරයාරය විශාල මුතතුරායරය කලවංඩිනාඩාල් වරාය

Non-Commercial Distribution

94 ක්‍රිණවෙලියෙහි බල (සේනාය) පුඩකොංඩ නාඩාල් වරාය (යන මෙකී
සෙන්) ගෙණ මහ බල ඇත්තේ මහ යුදකරණු පිණිස පොන් අමරාවතයට
ආයේ ය.

95 මහ බල ඇති ලංකාපුර තෙමේ එ පවත් අසා සතුරු රජහු
96 දිනන්ට වේලඞ් කුඩියෙන් නික්ම පස්දිගෙකින් අවුත් පවත් වන ලද
97 මහයුද ඇති සතුරුසෙන් එ කෙණෙහි බිඳ බිහිසුණු විකුම් ඇත්තේ
දහස් ගණන් දෙමළුන් මරවා බොහෝ අසුන් ගෙණ කුලශේඛර රජහු
පැලවී. නිකලධ රායර තෙමේ පසුව භය වූයේ "මා සතු වස්තු වර්‍ගය ද
98 මාගේ බොහෝ වූ අසුන් ද ගෙණ මාගේ මේ දෝෂය තෙම ඔබ විසින්
ක්‍ෂමා කටයුතු ය" යි කියා හසුන් එවී ය.

99 ඉක්බිති ලඞකාපුර තෙමේ ඒ අසා පිලිහසුන් (යවන්නේ) "
අවශ්‍යයෙන් තොප වසින් ම අනුසසුන් පිළිපැද්ද යුතු ය. තොපගේ
100 ධනයෙන් හෝ අසුන්ගෙන් හෝ මට වැඩෙක් නැත. භයනුවූයේ තෙමේම
අවුත් දර්‍ශනය කෙරේව" යි හසුන් යැවී ය. ඒ අසා ඒ තෙමේ ලඞකාපුර
101 නම් ප්‍රභූ රාජයා දක්නට එ කල්හි එළඹියේ ය. උහු දැක ප්‍රසාද හා රටත්
102 උහුට දී දන ලද ගෙවල් කරවන්ට බොහෝ වස්තුව ද දී එයින් නික්ම
103 මහා යසස් ඇති හේ තෙමේ නියමයට අවුදින් එ සියලු රට ම නිෂ්කණ්ටක
කොට පරාක්‍රම මහීපාලයාගේ නාමාඞ්කිත කර්‍ෂාපණයන් ඒ රට සැම
104 තන්හි ව්‍යවහාරයන්හි නියොග කොට වීරපඞි කුමරහට ඒ රට ප්‍රතිපාදනය
කොට සොළීදෙශයෙන් ද, පඞිරටින් ද ගන්නා ලද්දා වූ බොහෝ අසුන්
105 හා මිනිසුන් ද ඇතුන් ද, වහා සිංහල ද්වීපයට එවී ය.

එ කල්හි රාජේන්‍ද්‍ර කේශර සිංහවූ පරාක්‍රමබාහු රජතෙමේ පඞිරට
106 ජය ප්‍රකාශ කරන්නා වූ පංඩු විජය නම් සියලුකාලයෙහි සමෘධි ඇති
107 උතුම් ගමක් කොට සැමකලහිම දානයෙහි ඇලුනේ බමුණන්ට දන්
කොට දුන්නේ යි.

මෙසේ විචිත්‍රාන්ත වික්‍රාන්තිසාර ඇති පරාක්‍රමබාහු නම් වූ
108 ධරණීපාල කුලාග්‍ර වූ යමෙක් තෙමේ පරාභිභවනය කෙරේ නම්
යුක්තායුක්ත විවේක චින්තනයෙන් උපග උත්කෘෂ්ට චිත්තාචාර ඇති
අද්විතීය වූ හේ තෙමේ බොහෝ කාලයක් සමුද්‍රනත කොට ඇති මේ
පෘථිවිය උද්වහනය කෙරේවා.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
පණ්ඩුරටය විජය නම් වූ සත්සැත්තෑ වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ අට වෙනි පරිච්ඡේදය

1 මෙසේ සම්ප්‍රාප්තාභිෂේක ඇති ක්‍රම දක්‍ෂ වූ ඒ පරාක්‍රමබාහු
ලඬ්කේශ්වර තෙමේ ලඬ්කාද්වීප තලය නිරවුල් කොට රාජ්‍ය
සාධනයෙහි ප්‍රධාන ඵලභාවයෙන් ප්‍රාර්ථනා කරණ ලද්දා වූ ගරු කොට
සලකන ලද බුද්ධ ශාසනාභිවෘද්ධිය කරනු කැමැත්තේ තේ "සඟසතු
2 ගම්හි සඬසයාගේ පුත්‍රදාරාදී පොෂණයම ස්වභාවය. එයින් අන්‍ය වූ
3 ශීලයක් නැත්තේ මය" යනු ද සමගි වූ කර්මාදිය තබා ඔවුනොවුන්
දර්ශනයත් නොරුස්නා සුසිල්වත් කිසියම් භික්‍ෂූන් ද බලා බුද්ධ
4 ශාසනාභිවෘද්ධිය පිණිස පළමු කොට ශාසන ශුද්ධිය ද තුන්නිකා වැසි
භික්‍ෂූන්ගේ සාමග්‍රිය ද කරවනු කැමැත්තේ ධර්මාශෝක මහ රජහු
5 මොග්ගලිපුත්ත තිස්ස ස්ථවිරයන් ප්‍රධාන කොට සෙයින් ත්‍රිපිටකධර
විසාරද වූ විශේෂයෙන් විනය දන්නා වූ ස්ථවිර වංශයට අසහාය
6 ප්‍රදීපායමාන වූ පැවිදිව බොහෝ කල් ඇත්තා වූ මහා කාශ්‍යප නම්
7 මහා ස්ථවිරයන් ප්‍රධාන කොට අනුරාධපුර වාසි වූ ශිෂ්‍යයන් සහිත
8 ඤාණපාල නම් ස්ථවිරයන් ද සපරගමු වැසි භික්‍ෂූන් ද මෞද්ගල්‍යාන
9 ස්ථවිරයන් සහිත වූ නාගෙන්ද පල්ලියෙහි ස්ථවිරයන් ද, යුවරජ රටවැසි
10 අන්‍ය වූ සියලු භික්‍ෂූන් ද, ගලතුරුමුල විහාර වාසී නන්ද නම්
ස්ථවිරොත්තම යන් ප්‍රමුඛ කොට රුහුණු රට තුන්නිකා වාසි භික්‍ෂූන් ද
පොළොන්නරුවට කැඳවූයේ ය.

ඉක්බිත්තෙන් පෘථිවීශ්වර තෙමේ ඔවුනොවුන්ගේ සමගිය පිණිස
මහා විහාරවාසි භික්‍ෂූන්ට ආයාචනා කෙළේ ය. අලජ්ජීන්ගේ උත්සන්න
11 භාවයෙන් ද, බොහෝ කල් විවිධව භින්න වූ බැවින් ද එකල්හි බොහෝ
12 වූ භික්‍ෂූහු සාමග්‍රිය නොයිවසූහ. ඇතැම් කෙනෙක් පර දේශයට යන්ට
13 ද ඇතැම් කෙනෙක් සිවුරු හරණට ද ආරම්භ කළහ. ඇතැම් කෙනෙක්
විනිශ්චය මණ්ඩලයෙහි හිඳිනට ද නො කැමති වූහ.

ඉක්බිත්තෙන් දුක සේ සමනය කටයුතු වූ මහාධිකරණ පටන්
ගත්හ. එ කල්හි සමගිය මහමෙර එසවීම සෙයින් වැටහින. (ඡන්දයෙන්
14 මමත්වයක් නැත්තා වූ ස්ථිර වූ ආරම්භ ඇති ධාර්මික වූ ඒ පෘථිවීශ්වර
15 තෙම ඒ භික්‍ෂූන් අස්වසා දුකසේ පිළි ගැන්වී ය. ඉක්බිත්තෙන් උපනුපන්
16 අධිකරණයන් සමථයට පමුණුවනු පිණිස මහා කාශ්‍යප ස්ථවිර ප්‍රධාන
වූ භික්‍ෂූන් ලවා විනිශ්චය කරවී.

17 විනිශ්චය පිළිගැන්මෙහි පිටකත්‍රයධාරී වූ ආචාර්ය වරයන් සමග
තමන් සමීපස්ථව පිළියම් කළ හැක්කන්ට ධර්මය වූ පරිද්දෙන් ශුද්ධියෙහි

Non-Commercial Distribution

පිහිටුවා මහා විහාර වාසී වූ සියලු භික්ෂූන් සමගි කෙළේ ය. හේ
18 තෙමේ දුස්සීලයන් "ලාභාපේක්ෂාවෙන් ශාසනය නො නසත්ව" යි මහ
19 තනතුරු දී සිවුරු හැරවූයේ ය.

මෙ සේ මහා විහාරයම මහෝත්සාහයෙන් ශුද්ධ කොට (වට්ට
20 ගාමණී) අභය මහ රජාණන්ගේ කාලයෙහි පටන් වර්ගීගාවයට ගියා වූ
21 අභයගිරි විහාරවාසී භික්ෂූන් ද මහසෙන් නරනිඳු කල් පටන් භින්න වූ
වෛතුල්‍ය පිටකාදී අශුද්ධ වචනයම බුද්ධ වචනය යි ප්‍රකාශ කරන්නාවූ
22 ප්‍රතිපත්තියෙන් පරාඞ්මුඛ වූ ජේතවන විහාරානුගත භික්ෂූන් ද නිරවශේෂ
23 ගුණ යුක්ත වූ මහා විහාරවාසී භික්ෂූන් සමග රත්නයන් හා කදාගල්
24 සෙයින් සමගි කරන්ට ආරම්භ කෙළේ ය. ශීලාදී සාර ශූන්‍ය වූ ඔව්හු
මහා සංඝයාගේ ද, නරෙන්ද්‍රෝත්තමයාගේ ද තේජස් කරණ කොට
ගෙණ බුද්ධ ශාසනයෙහි ඇල්මට නො පැමිණියෝ ය. එසේත් ධාර්මික
25 වූ රජ තෙම කම්ම දන්නන් ලවා විචාරණය කරවන්නේ ප්‍රකෘති භාවයෙන්
යුක්ත වූ එකම උපසපන් කෙනෙකුන් නො ලද්දේය. එ කල්හි බොහෝ
26 වූ භික්ෂූන්ට සාමණෙර භාවය කරවූයේ ය. දුස්සීලයන් සිවුරු හරවා
මහ තනතුරු දුන්නේ ය. මෙ සේ ඒ මහ රජ තෙමෙ මහෝත්සාහයෙන්
27 බොහෝ කලකින් ශුද්ධිය හා සාමග්‍රීය සම්පාදනය කොට සඞ්ඝයාබුද්ධ
28 කාලයෙහි මෙන් පැවැත්වූයේ ය. අවුරුද්දක් පාසා මහා ගඞ්ගාතීර
සමීපයට පමුණුවා එහි උයනෙහි වස්වා අමාත්‍යයන් සහිත වූයේ
29 උපස්ථාන කෙරෙමින් ගඟ මැද අතිශයින් නිශ්චල කොට නැව් තබ්බවා
30 එහි මනෝහර සුවිභක්ත මණ්ඩපයක් කරවා මාහැඟි සිවුරු ද නොයෙක්
31 පිරිකර ද දෙවා මෙහා ප්‍රඥා වූ හෙතෙම උපසම්පදා කර්මය කර වූයේ
ය.

මෙසේ බොහෝ වූ නොයෙක් සිය ගණන් භික්ෂූන්ගේ සැප
32 විහරණයට යෝග්‍ය වූ මහා විහාරයන් කරවනු කැමැත්තා වූ ඒ මහ රජ
තෙම ජේතවන විහාර සම්පත්තිය ප්‍රත්‍යක්ෂ කොට දක්වන්නා සේ
33 ජේතවන නම් මහා විහාරයක් කර වූයේ ය. එහි ආශ්‍රමස්ථානවාසී වූ
තර සිල් ඇති ස්ථවිරයන්ට මාහැඟි වූ තුන්මහල් පහ අටක් කර වූයේ ය.
34 ශාරිපුත්‍ර නම් ස්ථිර ශීල යෙන් යුක්ත වූ ස්ථවිරයන් වහන්සේට ද සඳලු
සහිත උඩුමහල් ඇති ගබ් ගෙවලින් යුක්ත වූ බබළන්නා වූ මහා
ප්‍රාසාදයක් කර වූයේ ය.

35 ප්‍රතිමා රූපයන්ගෙන් සංයුක්ත වූ පර්වතයන් පරිද්දෙන්
36 අප්‍රතිසම්මතවූ සැත්තෑවක් පමණ තෙමහල් ප්‍රතිමා මන්දිරයන් ද කර
37 වූයේයඃ පන් සැත්තෑවක් පිරිවෙන් පිණිස රම්‍ය ලක්ෂණ ඇති දෙමහල්

Non-Commercial Distribution

දීඝී ප්‍රාසාදයන් එ පමණම කර වූයේ ය. සුළු පහ එක්සිය සැත්තෑ
38 අටක් ද සූ තිසක් දොර කොටු ද පුස්තකාලය දෙකක් ද කුළු ගෙවල් හා
39 ගුහාවක් ද මල්කම් ලියකමින් යුත් බඹ ආදීන් පිළිරූ ඇති ශාලාවන් හා
බොහෝ වූ ගබඩා ගෙවල් ද උළුකම් හා සුණු වලින් නිපද වන් ලද්දා වූ
40 නේත්‍ර රසායනය දක්වා ත්‍රිවංක ප්‍රතිමා ස්වාමීන් වහන්සේ සඳහා ත්‍රිවංක
41 ප්‍රතිමා ගෘහයක් ද, සිහ කවුළුවලින් හා ආදී රූප පෙළින් බබළන්නා වූ
42 නා නා දූල් කවුළු වලින් හා බොහෝ පිළිකඩින් ද සිත් කළු වූ ටැම් බිතු
43 ආදියෙන් සැදුම් ලත් මනා වූ සර්වශෛලමය වෘත්ත දන්තධාතු මන්දිරයක්
44 ද ධර්මශාලා තුණක් හා එක් චෛත්‍යයක්ද, දිගු සක්මන්මළු අටක් ද, දිගු
පුළුල් වූ එක් බොජුන් හලක් ද, උළු සෙවෙනි කරණ ලද අසූපහක්
45 ගිනිහල් ගෙවල් ද, වැසිකිළි එක්සිය සැත්තෑ අටක් ද කර වූයේ ය.
භික්ෂූන්ගේ අභ්‍යන්තර මලය ශාසන සුද්ධියෙන් ශුද්ධ කොට පිටත් මල
ද ශුද්ධ කරණු පිණිස සෙයින් ග්‍රීෂ්ම සමයෙහි නහනු පිණිස වට නාන
46 කොටුවය, ගුහා නාන කොටුවය, පියුම් නම් නාන කොටුවය, භද්‍ර නම්
47 නාන කොටුවය යනාදි ටැම් පියගැට පිළිකඩ ආදියෙන් සැදුම් ලත්
48 ශෛලමය වූ නාන කොටු අටක් කර වූයේ ය. මහ රජ තෙමේ එහි
49 බොහෝ වූ ප්‍රාකාර ද බැඳ වූයේ ය. මෙසේ ජේතවන විහාරයෙහි
50 සියලුම ගෙවල් පන්සිය විස්සක් වූහ. [1] නොයෙක් පිරිකර ද එහි සඞසයා
වැස්වූයේ ය.

ක්ෂත්‍රිය තෙමේ ආළාහණ පිරිවෙන එහි කර වූයේ ය. එහි
51 ස්ථවිරයන් වහන්සේ පිණිස ඉතා දුර නොවීම් ආදි සියලු අඞ්ගයෙන්
52 සමන්විත වූ මනායයි සම්මත ඉතා සිත්කළු සඳළුතල ඇති නානාවිධ
53 උතුම් ගැබ් ගෙවල් ඇති කුලු ගෙවලින් හෙබියා වූ තෙමහල් පහයක්
(කර වූයේ ය) දිගු පහ සතළියක් ද, එ පමණ වැසිකිළි ද, සුළුපහ අටක්
ද, දොරකොටු සයක් ද, ගිනිහල් ගෙවල් සූ තිසක් ද, අතිශයින් මහත් වූ
54 ප්‍රාසාද දෙකක් ද සුභද්‍ර නම් චෛත්‍යයක් ද, රූපවතී නම් චෛත්‍යයක්
55 ද (කර වූයේ ය.) මාලාකම් ලතාකම් හා දේව බ්‍රහ්මයන්ගේ මනෝහර
56 රූප ඇත්තා වූ කූටාගාර ගුහා ගර්භශාලා මන්දිරයෙන් උපශෝභිත වූ
57 යම් ප්‍රතිමා මන්දිරයෙක්හි ලඞකා තිලකය යන අර්ථයාන්විත නාමයකුත්
වී ද, මනහර පස්මහල් එ පිළිම ගෙය ද (කරවී ය) ඒ පිළිම ගෙයි
ජීවමාන සර්වඥයන් වහන්සේගේ ආයාමයෙන් යුක්ත වූ ලඞකා තිලක
58 නම් නේත්‍ර රසායන වූ සිටි පිළිමයක් ද කර වූයේ ය. නොයෙක් කුළු
59 ගෙවලින් ද ගබ්හල් ගෙවලින් ද එ සේ ම මැදිරි ගෙවලින් ද යුක්ත වූ

Non-Commercial Distribution

බද්ධසීමා ප්‍රාසාද නම් වූ දොළොස් මහල් පොහෝ ගෙයක් (කර වූයේ
60 ය.) එහි සීමා බන්ධනය කරවනු පිණිස අමාත්‍යයන් සහිතව අන්තඃපුර
61 ජනයා සහිත වූ මහා සේනා වාහන ඇති නන් බරිණින් සැදි ඒ රජ
තෙමේ ශක්‍රදේවේන්‍ද්‍ර විලාසයෙන් ඒ වෙහෙරට පැමිණ මහාකාශ්‍යප
62 ස්ථවිර ප්‍රමුඛවූ මහා සඞසයා විසින් මෙහෙයන ලද්දේ මඞ්ගල
63 සතුතිගීතිකාවෙන් හා තූර්‍ය්‍ය නාදයෙන් ද, සාධුකාර නිනාදයෙන් සිවුදිගුන්
64 පුරවමින් ස්වර්ණාදීන් කරණ ලද කලස් හා සුමුගුදඃ බොහෝ වූ ධ්වජයන්ද,
65 ඡත්‍රයන් ද දරන්නා වූ ජනයන් විසින් පිරිවරණ ලද්දේ මහත් වූ සැණකෙළි
පවත්නා කල්හි මගුලැතුන් යොදන ලද්දා වූ රන් නගුල අල්වා ගෙණ
භූමිපාල තෙමේ සාමින් වැඩියේ ය. ඒ සඞ්ඝ තෙමේ එහි පෙර බඳනාලද
66 සීමාවන් සම්බන්ධ වූ ශඞ්කා දුරු කරුණු පිණිස ප්‍රථම කොට නොයෙක්
තැන සිටියේ සීමා සමූහණනය කොට නරේන්ද්‍රයන්ගේ සීවිට
අනුසාරයෙන් හාත්පස නිමිතින් කීර්තනය කොට සකල සම්පත්තියෙන්
යුක්තවූ කර්‍මවාක්‍යයෙන් ඛණ්ඩසීමා තුනක් හා එක් මහා සීමාවක්
67 මනාකොට බන්ධනය කෙළේ ය.

68 පස්රියන් යටියෙන් ලක්තිලක ගෙය පටන් සූසාළිස ය,
එකුන්පනස ය, අටතිස ය, සතිස ය, පන්සතිස ය, සත්පණසය,
සතළිස්පය ය, සැටසය යටයෙක යන දුර ඇති තන්හි පිළිවෙළින් පෙරදිග
69 ආදි අට දිගුන්හි නිමිතිගල්පිහිටියහ. දකුණු දිග්භාගයෙහි පිහිටි නිමිත්ත
70 පාෂාණය තෙම ගොපලු පව්වෙන් ද අටපණස් යටයක දුර ඇත්තේ ය,
උතුරු දිග යම් නිමිති ගලෙක් පිහිටියේ ද එය විද ්‍යාධර ගුහායෙන්
පනස් යටියෙක දුරය, ඒ පාෂාණයෝ මහා සීමා සම්බන්ධ නිමිත්ත
71 භාවයට පැමිණියහ. බද්ධසීමා ප්‍රාසාදයෙහි පසළොස් යටක් හා තෙළෙස්
72 යටක් තන්හි දිගින් හා පුළුලින් ද බද්ධසීමා තොමෝ විය. ඛණ්ඩසීමා
73 නම් වූ මාළකයෙහි දිගින් පසළොස් යටියෙක් ද පුළුලින් යෂ්ටි සයක්
74 තන්හිද සීමා තොමෝ බඳනා ලද්දීය. එසේ ම ස්ථවිරයන් වහන්සේගේ
75 ප්‍රාසාදයෙහි බද්ධසීමා තොමෝ දිගින් අටළොස් රියනක් ද පුළුලින්
විසිරියනක් ද (බඳනාලදී.) ඒ විහාරය පිරිකර සමග භික්ෂූන්ට දුන්නේ ය.
76 එසේ ම නරෙශ්වර තෙම පශ්චිමාරාමය කරවූයේ ය. එහි දෙවිස්සක්
පමණ පිරිවෙන්හි එපමණ දෙමහල් දීඝශාලාවෝ ද, ගිනිහල් විස්සක් දඃ
77 දෙමහල් සුළුපහ එක් විස්සක්ද, එසේම වැසිකිළි පන්තියක්ද, සක්මන්
මළු දෙකක් ද, එක් ධර්‍ම ශාලාවක්ද, දොරටු කොටු දශයක්ද වූහ. පරිෂ්කාර
78 සහිත වූ ඒ විහාරය ද භික්ෂූන්ට දුන්නේය. එසේම නරෙශවර තෙමේ
මහා චෛත්‍යයට ආසන්න තන්හි පර්‍වතය බිඳුවා එහි උත්තරාරාමය
79 කරවූයේ ය.

Non-Commercial Distribution

සියලු කර්මයන් දක්වා විද්‍යාධර ගුහාව ද, වැඩහුන් පිළිම ලෙනක්
80 ද, හොත් පිළිම ගුහායෙක් දැයි මෙසේ පිළිම ලෙන් තුණක් ද දක්‍ෂ වූ
81 ශිල්පීන් ලවා කරවූයේ ය. පඬිරජය ගෙණ ඒ රටින් ගෙණෙන ලද
82 දෙමළුන් ලවාත් කරවූ බැවින් දෙමළ සෑයයි නම් ලත් එක් දහස් තුන්සිය
රියන් විශාල වූ සියලු ථූපයන්ට මහත්වූ දෙවෙනි කෛලාශය ඒ සමානවූ
83 මහාසෑයක් රහතුන්ගේ සෘද්ධියක්ද, දෙවර්ගයක්ද, නැතිව මහත් වූ
රාජරධියෙන්ම කරවූයේ ය.

84 එසේම රාජවෙසීභුජංග නම් වූ ශාඛානගරයෙහි යතීන්ගේ සිත්
85 පිනවන්නා වූ ඉසිපතන නම් විහාරයක් කරවූයේ ය. ඒ විහාරයෙහි එක්
දාගැබක් ද, තුන්මහල් පිළිමගෙයක් ද, එහි සිතියමින් බැබළී මා හැඟි
86 පිළිම තුනක් ප්‍රසාද එලවන්නා වූ කර්මාන්තයෙන් යුක්තවූ දෙමහල් පහයක්
87 ද, දිගුපහ දෙකක් ද, දොරකොටු සතරක්ද, සුළුපහ අටක් ද, ධර්මශාලාවක්
හා චඞ්ක්‍රමණ මාලකයක් ද, එසේම ගිනිහල් අටක් ද, වැසිකිළි සයක්ද,
රම්‍ය වූ සර්වශෛලමයවූ එක් නාන කොටුවක්ද, එකම සීමාපවුරු
88 වළල්ලක් ද, සඟසතු අයනක්ද වී.

89 එසේම සිංහපුර නම් වූ ශාඛා නගරයෙහි සිංහ වික්‍රම ඇති
90 පෘථිවීශ්වර තෙම කුසිනාරා නම් විහාරයක් කර වූයේ ය. එහිද දාගැබද,
තුන්මල් ප්‍රතිමා, මන්දිර තුනක් ද, දීඝප්‍රාසාද සයක්ද, ධර්මශාලාවක් හා
සක්මන් මළුවක්ද, සුළුපහ සොළසක්ද, දොරකොටු තුනක් ද වැසිකිළි
91 එකොළොසක් ද, ගිනි හල් සයක්ද වූ හ.

92 පරාක්‍රමබාහු නරේන්‍ද්‍රතෙම විජිත නම් ශාඛාපුරයෙහි වේළු නම්
93 වෙහෙරක් ද කරවූයේ ය. එහි මනෝඥ වූ පිළිම හා සිතියම් බැබළී
94 තුන්මහල් පිළිම ගෙවල් තුනක් ද, දාගැබක් ද, සක්මන් මළුවක්ද, දෙමහල්
පහයක් ද, දොර කොටු සතරක්ද, දිගුපහ තුනක්ද, සුළුපහ අටක්ද, එක්
95 බොජුන් හලක්ද, එසේ ම එක් ධර්මශාලාවක් ද, ගිනිහල සතරක් ද,
96 වැසිකිළි දොළසක් ද වූ ය. ඒ මනුජේන්‍ද්‍රතෙම ගව්වක් ගව්වක් තන්හි
මනෝඥ ප්‍රතිමා මන්දිරයන් හා දොරකොටු පව්රු දම්හලින් යුක්තවූ
97 ගාවුත විහාරයන් ද කරවූයේ ය. විවේක කාමිවූ සියලු ධූතාංගධර
98 භික්‍ෂූන් ගේ සැප විහරණය පිණිස කපිල නම් විහාරයක් කරවූයේ ය.
එහි මහාර්ඝවූ දෙමහල් පහයෙක් ද, දීර්ඝ චඞ්ක්‍රමණයක් ද, දීඝ ප්‍රාසාද
99 සතරක් හා දෙමහල් පහ සතරක් වේ. නානාප්‍රකාර විචිත්‍ර
100 කර්මාන්තයෙන් යුක්තවූ කුලු ගෙවල් ආදියෙන්හෙබියාවූ ගිජිලිහිණියකු
බඳු ගෙයක් ද කපිල නම් තපස්වීන්ට කරවන ලද්දේ ය. සුළුපහ
101 සතරක් ද වැසිකිළි තුනක් දැයි පිරිකර සහිත වූ ඒ විහාරයන් ද භික්‍ෂූන්ට

Non-Commercial Distribution

දුන්නේ ය. අනුරාධපුරයෙහි ද පූර්වයෙහි දෙමළුන් විසින් නසන ලද
දුෂ්කර හෙයින් නොයෙක් රජුන් විසින් නොකරවන ලද්දා වූ විහාරයන්
කරවනු පිණිස එක් ඇමතියෙක් යවා, එක්සිය විසිරියන් උස් වූ
102 රුවන්වැලිසෑය කොට නිමවා එක්සිය සතළිස් රියන් උස්වූ අභයගිරි
103 නම් සෑයද, එක්සිය සැටරියන් උස්වූ ජේතවන සෑයද, අසූරියන් උස්වූ
මිරිසවැටි මහසෑයද, යන මේ පෙර දෙමළුන් විසින් පලන ලද්දා වූ මහ
රුකින් වැසුනු වලසුන් දිවියන් නිබඳ සෙවන ලද්දා වූ ගඩොල් හා මැටි
104 පිඩු කරණ කොට ගෙණ දුකසේ යා යුතු ජාඞ්ගල භූමිප්‍රදේශ ඇත්තාවූ
105 තුන්සෑයත් වනය සිඳුවා මනාකොට බඳවා සුණුකම්ද කරවා සෑමළු
106 ශුද්ධ කරවූයේ ය. එක් එක් පසෙකින් සියස් රියන් වූ සියක් රියන්
විශාල වූ උසින් එපමණ වූ සොළීන් විසින් නසන ලද්දා වූ ලෝවාමහපාය
107 එක් දහස් සසියයක් ගල්ටැම් පිහිටුව නොයෙක් සිය ගණන් ගබ්ගෙවලින්
හා උතුම් කුළුගෙවලින් ද සිව්මැදුරු කවුළු පෙළින් ද අලංකෘත වූ
108 නොයෙක් මහල් ඇති අතිශයින් විස්මය එලවන්නා වූ කර්මාන්ත ඇති
109 කොට නරේශවරතෙම කරවූයේ ය. සැටක් මහපා ඇති ශෛපර්ණි
පුෂ්ප නම් වූ මහා ප්‍රාසාදය නටුවා වූ මහෙන්ද්‍ර සේන නම් ප්‍රාසාදය

110 බොහෝ වූ සීමා ප්‍රාකාරයන් ද පිරිවෙන් ද කරවූයේ ය. දන්හලක්
ද කරවා දන්වැට තැබ්බ විය. ථූපාරාමාදි පරණ පිරිවෙන්හි ද
ඛණ්ඩපුල්ලපටිසංස්කරණයත් කරවූ යේ ය.

111 හේ තෙමේ සෑගිරියෙහි ද සූසැටක් දාගැබ් කරවිය. පුරාණ
වාසයන්හි සුන්බුන් තැන් ද පිළිසකර කරවි ය.

112 මෙසේ විශුද්ධ බුද්ධිමත් වූවෝ මහත් සම්පතෙහි පිහිටා ද පුණ්‍ය
ක්‍රියාව එක රස කොට ඇත්තෝ වෙත්යයි දන ලෝකයෙහි කවර නම්
පණ්ඩිත ජනයෙක් තෙම සියල් සුව එලවන්නා වූ පුණ්‍ය ක්‍රියායෙහි
ප්‍රමාදයට පැමිණේ ද?

මෙතෙකින් හුදී ජනයා ප්‍රාසාද සංවේග පිණිස කළ මහවස විහාර
කාරාපණ නම් වූ අටසැත්තෑ වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# හැත්තෑ නව වෙනි පරිච්ඡේදය

1 පරාක්‍රමබාහු නරේන්ද්‍ර තෙම නුවරවැස්සන්ට සර්වෝපකරණයන්
2 සුලභ කරවනු කැමති වූයේ ඒ ඒ තන්හි උයන්වතු කර වූයේ ය. ජනයන්ට
3 සතුටු එලවන්නා වූ නරේන්‍ද්‍රතෙම ඵල පුෂ්පධාරීහු නොයෙක් සිය ගණන්
4 වෘක්ෂයෙන් සමලඞ්කෘත වූ නන්දන නම් උයනක් කරවී ය. නෙරලු අඹ
කොස් පුවක් තල්රුක් ආදීන් එක් ජාතියෙන් ලක්ෂය පමණ රෝපනය
කරවා අත්ථානුගත වූ නම් ඇති බැවින් ලක්ඛුය්‍යානය යි සම්මත වූ මහ
උයනක් බොහෝ උත්සාහ ඇත්තේ සාඩ්සික කොට කර වූයේ ය.

5 ග්‍රීස්ම කාලයෙහි භික්ෂූන්ට නහනු පිණිස ඒ උයනෙහි ගුහ ඇත්තා
6 වූ සිත්කළු වූ ගල් පොකුණු දෙකක් කර වූයේ ය. රජ තෙමේ ඒ
පුරයෙහි දිවා විහරණ ඇත්තා වූ තමන් විසින් සතතයෙන් සම්භාවනා
7 කටයුතු වූ සොභාවෙන් බබළන්නා වූ දීප නම් උයනෙක, මහමෙව්නා
නම් උයනෙක, එසේම චිත්‍රලතා වන නම් උයනෙක, මිශ්‍රක නම්
8 උයනෙක, රාජනාරායන නම් උයනෙක, ලංකාතිලක නම් උයනෙක,
තිලොක නන්දන නම් උයනෙක, වානරාකර නම් උයනෙක, නිර්මිත
9 පුර නම් උයනෙක, මනෙව්හර නම් උයනෙක, සොමනාථ නම් උයනෙක,
10 ජඞ්ඝාහාර නම් උයනෙක, පූර්ණවර්ධන නම් උයනෙක, සංසාර ඵල නම්
උයනෙක, එසේම පාරුසක නම් උයනෙක, සාලිපොත නම් උයනෙක,
11 සෝමනාථ නම් උයනෙක, ධානාකොඩ්කණ නම් උයනෙක, උතුරුකුරු
12 නම් උයනෙක, හාරුකවජ නම් උයනෙක, පුලවෙචරි නම් උයනෙක,
13 කීළාකර නම් උයනෙක, පණ්ඩාවන නම් උයනෙක, රාමේශ්වර නම්
14 උයනෙක, යාම්සනෙතෝෂ නම් උයනෙක, එසේම චින්තාමණි නම්
උයනෙක, ප්‍රවුර නම් උයනෙක (යන මේ) උයන් කරවූයේ ය. ඒ
නරේන්ද්‍රතෙම රජරට නොයෙක් ගම් නියම්ගම් වලද නව අනූවක් අභිනව
15 ථූපයන් කරවූයේ ය. මිහිපති තෙමේ තුන්සැත්තෑවක් පමණ වූ ධාතු
16 ගර්භයන්හි සුන්බුන් පිළිසකර කරවා සුණුවම් කරවී ය. සදාස් එක්සියයක්
ප්‍රතිමා මන්දිරයන්ද ප්‍රතිසංස්කරණය කෙළේ ය. ජීර්ණ වූ ප්‍රතිමා මන්දිර
17 තුන්සියයක් අභිනව කොට කරවූයේ ය. සාරසිය සැත්තෑ සයක්
නානාප්‍රකාර ප්‍රතිමාවන් කරවූයේ ය. එක් අනූවක් බොධිවෘක්ෂයන් ද
හෙතෙමෙ රොපණය කරවූයේ ය. සතර දිගින් වඩනා සඞ්ඝයාගේ
18 යාම් ඊම් ආදියෙහි වාසය පිණිස දෙසිය තිසක් ආවාසයන් කරවූයේ ය.
19 සපණසක් ධර්ම ශාලාවන් සක්මන් මළු නවයක් ද කරවූයේ ය. සූසාළී
20 සක් අධික කොට ඇත්තා වූ සියයක් දොරකොටු ද, එක්සිය අනූ දෙකක්
21 මලසුන් ගෙවල් ද, සැටසතක් ප්‍රාකාරයන් ද, තෙළෙසක් දේවාලයන් ද,
ආගන්තුකයන්ගේ ප්‍රයෝජනය පිණිස දොළසක් ආරාමයන් ද, දෙසිය
22 තිසක් ආගන්තුක ශාලාවන් ද කරවූයේ ය. එකුන් තිසක් ධර්මශාලාවන්
23 ප්‍රකෘතිමත් කරවූයේ ය. භූමිපති තෙම එක්තිස් ලෙනක් ද, ආරාම

Non-Commercial Distribution

පසක් ද, එසේ ම එක් පණසක් ආගන්තුක ශාලාවන් ද, නවසැත්තෑවක්
24 ජීර්ණ දේවාලයන් ද (අභිනව කිරීම් වශයෙන් කරවූයේ ය) අතිශයින්
25 සාධු මනුෂ්‍ය වූ ඒ රජ තෙම සත්වයන්ගේ දුර්භික්ෂ දුඃඛය නසන පිණිස
ඒ ඒ තන්හි නොයෙක් වැව් ද මාතිකාවන් ද කරවූයේ ය. භූමිපති තෙම
26 කරගඟ මහත් වූ ගල් හෙයකින් අවුරා ඒ ගඟ විශාල වූ ජලප්‍රවාහය
27 ආකාශ ගංගා නම් වූ මහත් මාතිකාවකින් ගෙනවුත් උතුම් රාජ
ප්‍රාසාදයකින් බබළන්නා වූ දූවක් ඇති පරාක්‍රම සමුද්‍රයයි. ප්‍රසිද්ධ ගලින්
28 කරණ ලද දුර්ගම වූ හතහස්ත ප්‍රණාලිකාවන් ඇත්තාවූ පරාක්‍රම තඩාගවු
29 නම් වූ මහා වැවක් ද කරවූයේ ය. හේතෙමේ මිහිඳු තළා නම් වූ වැවක්
ද එකාහවාපි නම් වූ වැවක් ද, පරාක්‍රම සාගර නම් වූ වැවක් ද, කොටුබඳ
ගඟුන්හැලි නම් වූ වැවක් ද කරවූයේ ය.

30 නර ශ්‍රේෂ්ඨ තෙමේ නොයෙක් තන්හි එක්දහස් සාරසිය එක්
සැත්තෑවක් කුඩා වැව් ද කරවූයේ ය. එසේම මිහීපති තෙමෙ තුන්
31 සියයක් පමණ වැව්වල එ පමණ ශෛලමය වූ (ජලනිර්ගම) ප්‍රණාලිකාවන්
කරවූයේ ය බිඳුනා වූ බොහෝ වූ පුරාණ වැව් ද බැඳවූයේ ය. හේ
32 තෙමේ මින්නේරිය නම් මහ වැව ද, වහාදාර ගල්ල නම් වැව ද, සුවන්තිස්
නම් වූ ද, දුරතිස්ස නම් වූද, කළා වැව නම් වූද, බමුණුගම නම් වූද,
33 නෙරළු මහටැම් නම් වූද, රෙහෙර නම් වූද, එසේ ම ගිරිතළා නම් වූද
34 යන මේ වැව් ද, කිඹුල්හෙබ් වැවය, කණු වැවය, මහනම්මත නම්
වැවය, වඩුන්නා නම් වැවය, මා දූත්තා නම් වැවය, කණගම් වැවය, විර
35 වැවය, වලස් වැවය යන නම් වූද, සුරමාන පහන්ගම නම් වූ වැව්ද
36 කළුවැල් නම් වැව ද, කාහල්ලි යන නම් වූ වැව ද, අඟගම් නම් වැව ද,
37 ගිලිපත්කඩ නම් වැව ද, මදගු නම් වැව ද, යන මේ ජීර්ණවූ වැවක්
38 පෘථිවීශවරතෙම ප්‍රකෘතිමත් කරවූයේ ය.

39 නටුවාවූ සාරසිය සැට සතක් කුඩා වැව් (ප්‍රතිසංස්කරණයවීය)
40 නොයෙක් වැව් වල එක්දහස් තුන්සිය අනූපසක් බිඳුනු තැන් ස්ථාන
41 දන්නා වූ රජ තෙම සුසවීර කොට බැඳවූයේ ය. පරාක්‍රම සමුද්‍ර නම්
42 වැව මකර නම් මුඛයෙන් නික්මුනා වූ ගම්භීර නම් මාතිකාවක් නරේන්ද්‍ර
43 තෙම කරවූයේ ය. ඒ මුඛයෙන්ම මහමේ වනයට අභිමුඛව නික්මුණාවූ
හේමවති නම් මහා මාතිකාවක් ද, එසේම කර වූයේ ය. එම පරාක්‍රම
සමුද්‍ර නම් වැව මාලතී පුෂ්ප නම් ප්‍රාණලිකාවෙන් නික්මුණ වූ නීලවාහී
යයි ප්‍රසිද්ධ වූ මාතිකාවක් ද එසේම කිරුළ කරුයහන නම් වූ
44 ප්‍රාණලියෙන් නික්මුණා වූ සලලවතී නම් මාතිකාවක් ද , මෛත්‍රිවතී
45 නමින් ප්‍රසිද්ධ වූ ප්‍රාණලියෙන් බැස ගියා වූ චෛත්‍රවතී නම් මාතිකාවක්
46 ද, දක්ෂිණ ප්‍රණාලිකාවෙන් නික්ම ගියා වූ තුංගභද්‍ර නම් මාතිකාවක් ද,
47 එසේ ම මංගල නම් ප්‍රාණාවෙන් නික්මුනා වූ මංගල ගංගා නම්
48 මාතිකාවක් ද, චිණ්ඩි නම් දොර ප්‍රණාලිකාවෙන් නික්මුනා වූ චම්පා
නම් මාතිකාවක් ද, තෝය වැවෙන් නික්ම පූර්ණවර්ධන නම් වැවට

Non-Commercial Distribution

49 ගියා වූ සරස්වතී නම් මාතිකාවක් ද පුන්නවඩ්ඩන්නා වැවෙන්
පශ්චිමදිශාභිමුඛව ගියා වූ යමුනා නම් මාතිකාවක් ද, උතුරට අභිමුඛව
නික්ම ගියා වූ සරභූ නම් මාතිකාවක් ද, ලක්ෂොද ්‍යානය මැදින් ගියා වූ
50 චන්‍ද්‍රභාගා නම් මාතිකා වක්ද, ජේතවන විහාරයෙන් නික්ම ගියා වූ
නර්‍මදා නම් මාතිකාවක් ද, එම වැව උතුරට අභිමුඛව එසේ නික්ම ගියා
51 වූ නේරංජා නම් මාතිකාවක්ද අනෝතත්ත නම් වැවෙන් නික්ම ගියා වූ
භාගිරථී නම් මාතිකාවක් ද, එයින් ම දකුණු දිගට අභිමුඛව නික්ම ගියා
52 වූ මාතිකාවක් ද, එයින්ම දකුණු දිගට ඇති මුඛව නික්ම ගියා වූ
ආවතීගංගානම් මාතිකාවක්ද, අඹාල වැවෙන් උතුරු දිගට ගියා වූ
තම්බපණ්ණි නම් මාතිකාවක් ද, මහ වැලි ගඟින් පශ්චිම දිගට අභිමුඛව
53 ගියා වූ බොහෝ කල් දුර්භික්‍ෂය නසන්නා වූ අචිරවතී නම් මාතිකාවක්
54 ද, එයින් නික්ම නැගෙණහිරට අභිමුඛව ගියා වූ මලාපහරණී නම්
55 මාතිකාවක් ද, උතුරු දිගට අභිමුඛ නික්මුනා වූ මලාපහරණී නම්
මාතිකාවක් ද, අචිරවතියෙන් ම නැගෙණහිරට අභිමුඛව ගියා වූ යත
56 රුඩ නම් වූ ද, නිර්භින්‍ද නම් වූ ද, ධවල නම් වූ ද, සීද නම් වූද
මාතිකාය. මින්නේරි මහවැව දක්ෂිණ වාරිමාර්‍ගයෙන් දකුණු දිගට අභිමුඛව
57 ගියා වූ කාලින්‍දි නම් මාතිකාවක් ද එසේ ම ගිරි තලා නම් වැවින් කදුරු
58 වඩමන් තඩාගයට ගියා වූ කාවේරි නම් මාතිකාවක් ද, කදුරුවඩමන්
වැවෙන් බැස අරිමද්දවිජය ගමට ගියා වූ සෝමවතී නම් මාතිකාවක් ද,
59 ඒ මහීපාල තෙම කරගඟින් නික්ම පරාක්‍රම සාගර නම් වැවට ප්‍රවිෂ්ට වූ
60 ගොදා වෙරී නම් මාතිකාවක් ද කරවූයේ ය. රජ තෙම කළා වැවෙන්
නික්ම අනුරාධපුරයට ගියා වූ නටුවා වූ ජය ගංගා නම් මාතිකාව කරවූයේ
ය. කුඩා මාතිකාවන් පන්සිය සූතිසක් කරවූ යේ ය. නටුවා වූ මාතිකා
තුන්දහස් තුන්සියයක් ප්‍රකෘතිමත් කෙළේ ය.

61 විචක්‍ෂණවූ ශ්‍රෙෂ්ඨ නරේන්‍ද්‍රතෙමේ යුවරජහුගේ රට ද නොයෙක්
62 තැන අනේක ප්‍රකාර වූ කර්‍මාන්ත කරවූයේ ය. හේ තෙමේ පිළගම
ස්වකීය වූ ප්‍රසූති මන්‍දිරසථානයෙහි සූතිඝර නම් චෛත්‍යයක් ද එකසිය
63 විසිරියනක් උත්තුංග කොට කරවී ය. දාගැබ් දෙවිස්සක් ද තිස්සතක් ද
බෝධිවෘක්‍ෂයන් ද, ප්‍රතිමා මන්දිර සියයක් ද, ලෙන් පසළොසක් ද,
64 සතරදිගින් වඩනා සඞ්ඝයා පිණිස විසිඑක් ආවාසයන් ද, එසේම
65 අසූසතක් ආගන්තුක ශාලා ද කරවූයේ ය. එකුන්තිසක් පමණ මලසුන්
ගෙවල් ද ධර්‍මශාලා සතක් ද පවුරු සතක් ද තෙසාළිසක් නානාවිධ වූ
66 ප්‍රතිමාවන් ද කරවූයේ ය. ජීර්‍ණවූ ප්‍රතිමා මන්‍දිර සූවිස්සක් ද නවකර්‍මයෙන්
67 සෑදවූයේ ය. මහගල වැව ද තලගල වැව ද මිහිපල් තෙමේ දේශයෙහි
68 ශස්‍ය සමෘර්ධිය පිණිස රජන නම් දොළ ද, තෙල්පිස නම් දොල ද,
දදුරු නම් දොල ද, ජජ්ජර නම් දොල ද, වීලත්තකඩ නම් දොල ද
69 බැඳවූයේ ය. වැව් වල ජීර්‍ණස්ථාන තුන්සිය අට පණසක් ද, එසේ ම
තෙළෙස් වැව්හි ශෛලමය ප්‍රණාලිකාවන් ද එකසිය සැටක් කුඩා වැව්වල

Non-Commercial Distribution

70 ස්ථිර ආවරණයන් ද සත්තිසක් පමණ නට වැව් ද ඒ මිහීපති තෙම
බැඳවූයේ ය.

71 අන්‍ය වූ පුණ්‍යකර්ම කැමතිවූ රජතෙම රුහුණුරටද ගම් නියම්
ගම්හි නානාවිධ කර්මාන්ත කරවූයේ ය. රජතෙමේ කිරිගම තමන්
72 මෑණියන්ගේ ආදාහණ ස්ථානයෙහි එකසිය විසිරියන් අසම් ඇත්තා වූ
73 රත්නාවලී නම් චෛත්‍යයක් ද, දාගැබ් සොළසක් ද බෝධිවෘක්ෂ සතක්
74 ද, එපමණ මහ බෝගෙවල් හා බෝ කොටු ද, තෙසාළිසක් පමණ
දෙමහල් පිළිමගෙවල් ද, ධර්මශාලා දෙකක් හා පන්සැත්තෑවක් ප්‍රතිමාවන්
75 ද, සතර දිගින් වඩිනා සඞ්ඝයාට තිස්සතක් ආවාසයන් ද සතළිස් සතක්
76 ප්‍රාකාරයන් ද, දොරකොටු විස්සක් ද, එසේ ම එකුන් සැටක් ආගන්තුක
ශාලාවන් ද, ආරාම සතරක් හා මෛත්‍රෙය (බෝසත්) රූ තුණක් ද,
77 නාටකශාලා පසක් ද, භූපාල තෙමේ කරවා ඒ ඒ තැන සුන්බුන් ද ද
ප්‍රතිසංස්කරණය කර වූයේ ය.

78 තිස් සතරක් ථූපයන් ද, බෝකොටු දෙවිස්සක් ද, දෙසිය
79 සූසැත්තෑවක් මහ පිළිම ගෙවල් ද, එක් දාගෙයක් ද, හොත් පිළිම
80 ගෙවල් සතක් ද, සතළිස් ලෙනක් හා ගඩොලින් කළ මන්දිර සතරක් ද,
81 දීඝ ප්‍රාසාද සතරක් ද, තෙමහල් පහසක් ද, ධර්මශාලා එකුන්තිසක් ද,
82 සක්මන් මළු තුනක් ද, වාසමන්දිර එක්සිය සවිස්සක් ද, පුස්තකාලය
එක්සිය අටවිස්සක් ද, ආගන්තුක ශාලා සතරක් ද, දේවමන්දිර සූවිස්සක්
ද, එකසිය තුණක් ගොපුර ද්වාරයන් ද, එකසිය සවිස්සක් ප්‍රාකාරයන්
83 ද, පෘථිවීශ්වරතෙම පිළිසකර කරවූයේ ය. උරුවෙල් මහ වැව ද, පඬුවැව
ද, කොළොම් වැව ද ආදි කොට ඇත්තාවූ දෙසිය සොළසක් සඟසතු
84 වැව් ද, සුන් වැව් සොළසක් ද, ජීර්ණ වූ ආවරණ අටළොසක් ද, නටුවා
85 වූ කුඩා වැව් දෙසිය පසක් ද, ඒ මිහිපති තෙම බැඳවූයේ ය. වැව්
86 දහසෙක්හි ශෛලිය වූ ප්‍රණාලිකාවන් ද කරවූයේ ය. ඒ ඒ තන්හි
සූසාළිසක් මාතිකාවන්ද කැණවූයේ ය. මෙසේ සිත්කළු වූ වෙහෙර
87 උයන් වැව ආදීන් කරවා ඒ නොයෙක් දෙයින් මුළුලක සැරසූයේ ය.

මෙසේ කරණ ලද විසිතුරු නොයෙක් පින් වෙසෙස් ඇති සතතයෙන් ශාස්තෘ ශාසනයෙහි අති ප්‍රසන්න වූ උතුම් වූ ධාරණ ප්‍රඥායෙන් යුක්ත වූ ඒ පරාක්‍රමබාහු රජ තෙමේ ද දෙතිස් වසක් රජය කෙළේ ය.

මෙතකින් හුදී ජනයාගේ සංවේග පිණිස කළ මහවස උය්‍යානාදී කාරාපණ නම් වූ එකුන් අසූවන අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් ඒ පැරකුම්බා මහරජාණන් බෑන වූ කවීශ්වර
පණ්ඩිතතෙම විජයබාහු රජ නමින් ලඞ්කේශවර විය. එකල සම්ප්‍රාප්ත
2 වූ රාජාභිෂේක ඇති මහකරුණා ඇති මේ ව්‍යක්ත තෙමේ තමන් මයිල්
3 පරාක්‍රමබාහු මහරජාණන් විසින් දග'ගෙයි බහාලනලද වධ බන්ධනයෙන්
4 පීඩිත වූ ලක්දිව් වැසි ජනයන් ඒ දුකින් මුක්ත කරවී ය. ඒ ඒ තන්හි
5 සියල්ලන්ට ස්වකිය ග්‍රාම ක්‍ෂෙත්‍රාදියත් දී සර්වප්‍රකාරයෙන් ප්‍රීති වර්ධනය
6 කෙළේ ය. වෙසවුණු රජහට අලකාව මෙන් ද සක්දෙව්රජහට අමරාවතිය
7 මෙන්ද ඒ පොළොන්නරුවම උහුගේ රාජධානිය විය. මහා යසස්
ඇත්තේ තෙමේ ම මාගධ භාෂාවෙන් ප්‍රවර වූ සන්දේශයක් රචනා කොට
8 අරිමද්දන පුර වැසි නරෙන්ද්‍රයන්ට යවා ආදියෙහි තමා මී මුත්තන් විජයබාහු
9 නරෙන්ද්‍රයන්ට පරිද්දෙන් ම උහු හා සමග මිත්‍රසන්ථවය සිතිඳු කමින්
බැඳගෙණ ලංකාව හා අරිමද්දන දේශයෙහි භික්ෂූන්ට ප්‍රීති වඩන්නා වූ
10 සම්‍යක් සම්බුද්ධ ශාසනය මනාකොට බැබළවිය. පෘථිවීශ්වර තෙමේ
මනුනීති ක්‍රමය මදකුත් නොඉක්මවා චතුස්සංග්‍රහ වස්තුවෙන් මහාජනයා
11 සන්තර්පණය කෙළේ ය. සුරත භාවය සුචිභාවය ප්‍රමුඛ කොට ඇත්තා
12 වූ ගුණයන්ගෙන් යුක්ත වූ හේ තෙමේ ශුද්ධ වූ බුද්ධාදි රත්නත්‍රයෙහි
අතිශයින් ප්‍රසන්න වූයේ ය. මොනවට හික්මුනේ හැමකල් සතුටු ඇත්තේ
ප්‍රණීත වූ චතුර්විධ ප්‍රත්‍යයෙන් භික්ෂු සංඝයාට උපස්ථාන කෙළේ ය.
13 බුද්ධිමත් වූයේ මහෝත්සාහය දක්වමින් බොධිසත්ව කෙනෙකුන් මෙන්
සර්ව ප්‍රකාරයෙන් සකල සත්වයන්ට සර්වාර්ථචර්යාව කෙළේයි. මහා
14 ප්‍රඥා ඇතිව සතර අගති අත හැර විනිශ්චය කරන්නා වූ හේ තෙමේ
සුජන දුර්ජනයන්ට අනුග්‍රහ ද නිග්‍රහ ද කෙළේයි. මෙසේ ප්‍රකාශ වූ ඒ
මිහි පල් තෙමේ ද ලෝකහාසනයෙහි නානාවිධ වූ පින්කම් කොට
15 හවුරුද්දක් රාජ්‍යය කෙළේයි.

ඉක්බිත්තෙන් කලිඟු කුලයෙහි උපන් මිත්‍රද්‍රෝහි වූ මහින්ද නම්
16 එක් පුරුෂයෙක් තෙම ගොපලු දූ දීපනී නම් එක් සහායිකාවක් ලබා,
දුර්මති ඇත්තේ දුෂ්ට ප්‍රයෝගයකින් ඒ මිහි පල්හු මරවා සෙනෙවියන්ගේ
17 ද යෝධයන්ගේ ද කිපියා වූ රට වැස්සන්ගේද ඇමතියක් දූයි යන
සියල්ලන්ගේ ම සම්මුතිය නොලබන්නේ ඉතා දුකින් පස්දිනක්
ලඞ්කාරාජ්‍ය කෙළේ යි.

18 විජයබා රජුගේ උපරජ වූ කාලිංග වංශයේ උපන් කීර්ති නිශ්ශංක
නම් ක්‍ෂත්‍රිය තෙම උහු මරවා රජ විය. හෙතෙම රාජ්‍යාභිෂේකයට
පැමිණ පුලස්ති පුරවරයෙහි රම්‍ය වූ ශෛලමය දන්තධාතු බඳවා ඒ
උතුම් සෑය රත්කොතකින් අලංකෘත කෙළේ ය. පහ සියෙන් හෙබියා

Non-Commercial Distribution

20 වූ වෙහෙරක් සිය නමින් කරවා භික්ෂුසඞ්ඝයාට පරිත්‍යාග කොට උපස්ථාන
කෙළේ ය. පණ්ඩිතතෙමේ රන්රිදියෙන් උසස්ව බබළන්නාව වූ
21 බිතුටැඹින් හෙබියාවූ හිඟුලෙන් කළ භූමිභාග ඇති රන්මුවා උළින් වසන
22 ලද දඹකොළ නම් වෙහෙරක් කරවා එහි සැත්තෑ තුනක් සවර්ණමය
23 බුද්ධප්‍රතිමාවන් පිහිටුයේ ය. ඒ මිහිපති තෙම භක්ති පෙරටු කොට
24 සිවුරඟ සෙනග සමග සමන්තකූට පර්වතයට ගොස් මනාකොට වැඳ
තාම්‍රපර්ණි ද්වීපයෙහි සැමතන්හි පුෂ්පාරාම ඵලාරාමයන් ද නොයෙක්
25 ශුභ වූ සභාවන් ද මනාකොට කරවූයේ ය. මෙසේ දිනක් දිනක් පාසා
බොහෝ ආකාර පින් රැස් කරන්නා වූ ඒ පෘථිවීශවර තෙම නව හවුරුද්දක්
මනාකොට රාජ්‍යය කරවූයේ ය.

26 ඉක්බිත්තෙන් ඒ මහරජාණන් පුත්‍රවූ වීරබාහුයයි ප්‍රසිද්ධ වූ රජ
තෙම එක් රැයක් ම රාජ්‍යය කොට මරහු වසඟ බවට ගියේ ය.
ඉක්බිත්තෙන් ඒ කීර්ති නිශ්ශංක රජහුගේම මල්වූ වික්‍රමබාහු රජතෙම
27 මාසයක් රාජ්‍ය පරිභෝග කෙළේ ය. ඉක්බිත්තෙන් උහු මරා නිශ්ශංක
18 රජහු බෑන වූ චෝඩගංග නම් මිහිපති තෙම නව මසක් රාජ්‍යය කෙළේය.

ඉක්බිත්තෙන් මහ බලැති කීර්ති නම් සේනානායක තෙමේ ඒ
29 නරනිඳු ගේ ඇස් උපුටා උහු දුරු කොට පරාක්‍රම භූජේන්‍ද්‍රයාණන්
31 අගමෙහෙසුන් වූ ලීලාවතී බිසවුන් ලවා නිරුපද්‍ර ලෙස තුන් වසරක්
රාජ්‍යය කර වූයේ ය.

ඉක්බිත්තෙන් ඔක්කාක වංශයෙහි උපන්නා වූ වික්‍රමයෙන්
සිංහයකු වැනි වූ සාහසමල්ලනම් ක්ෂත්‍රියයෙක් තෙමේ ද දවසක් රාජ්‍යය
කෙළේ ය.

ඉක්බිත්තෙන් ඉක්මවිය නොහැකි වික්‍රම ඇති ස්වකීය රාජකුලය
32 වර්ධනය කරණ පණ්ඩිත වූ ආයස්මන්ත නම් සේනා නායක තෙම ඒ
මහිපාලයන් පහකොට කිර්ති නිශ්ශංක මහ රජාණන් අගමෙහෙසුන් වූ
33 කල්‍යාණවතී නම් බිසවුන් ලවා ධර්මනීතියෙන් සාවුරුද්දක් රාජ්‍යය කරවී.
බුද්ධශාසනයෙහි මමත්වය ඇත්තා වූ ඒ කල්‍යාණවතී නම් දේවී තොමෝ
34 පණ්ණ ශාලක නම් ගමෙහි සිය නමින් වෙහෙරක් කරවා ඊට ගම්
නතුකිරීමෙන් ගම් කෙත් පිරිකර මෙහෙකරුවන් හා උයන් ආදිය ද
35 දුන්නී ය. ඒ බිසව අනුමතියෙන් සකල ලංකා රාජ්‍යානුශාසක වූ
කඳවුරු කුල උපන් ආයස්මන්ත නම් සේනාපති තෙම දේව නම්
36 අධිකාරින් වල්ලි නම් ගම් යවා එහි මනෝහාර වූ විහාරයක් කරවා
37 මහසඟහට දෙවී. හේ තෙමේ ස්වකීය රාජකුලය පිළිබඳ වූ වර්ධන ඇති
38 සිය නමින් ප්‍රසිද්ධ වූ පිරිවෙණ ද කරවා ඊට ආරක්ෂා විධාන කරන්නේ

Non-Commercial Distribution

39 දුකසේ ඉක්මිය යුතු වූ දුර්භික්ෂයෙහි අරම් ආදියෙහි පිරිවරණ ලද්දා වූ
40 ගම් කෙත් පිරිකර හා දාසි දාසයන් දුන්නේ ය. පුන්‍යාර්ථී වූ හේ
තෙමේ මිශ්‍ර වූ සිවුකුල ජනයා අසංකීර්ණ කොට ධර්මාධිකරණ නම් (නීති)
ශාසත්‍රයක් කරවී.

41 ඉක්බිත්තෙන් ධර්මාශෝක නම් වූ එක් කුමාරයෙක් තෙමෙ
හවුරුද්දක් රජ කෙළේ ය. හෙතෙම (රජ වන සමයෙහි) උත්පත්තියෙන්
42 තුන් මසක් ඇත්තේ ය. මහසෙන් විසින් පෙරටුකරණ ලද්දා වූ අණීකංග
නම් මහ ඇපා තෙමේ සොළී රටින් අවුත් ආයස්මන්ත සේනා නායකයන්
43 සහිත වූ පුලස්ති පුරාධිශවර වූ ඒ ධර්මාශෝක නම් කුමාරයන් මරවා
මෙතෙම සතළොස් දිනක් රජකෙළේ ය.

44 ඉක්බිත්තෙන් උහුගේ වික්‍රමාන්විත චමුනක්ක නම් වූ සේනාපති
තෙමේ ඒ අණීකංග නම් නරනිඳු මරා දුර්මති වූයේ පූර්ව යෙහිදූ රාජ්‍ය
45 කළා වූ ලීලාවතී නම් රාජාග්‍ර දේවිය ලවා රාජ්‍යය කරවීය. ඉක්බිත්තෙන්
46 හුලින් භග්න වූ අංශයක් ඇති ලෝකේශවර නම් වූ නරේන්‍ද්‍රයෙක් තෙම
47 පරතෙරින් මහත් වූ දෙමළසෙන් ගෙණ අවුත් මුළු සිරිලක තමන් වසඟ
කොට පොළොන්නරුවෙහි වෙසෙමින් නව මසක් රජ කෙළේ ය.

එකල්හි කළුන්නරු වස උපන් ධෘතිමතුන් අතුරෙන් බල
පරාක්‍රමාන්විත වූ පරාක්‍රම නම් සෙන්පති තෙම චන්ද්‍ර සූර්‍ය්‍ය වංශද්වයෙන්
48 උපන් රාජතේජෝ විලාස ඇත්තා වූ ලීලාවති නම් මෙහෙසිය නැවත ද
49 රාජ්‍යයෙහි අභිෂේක කෙළේ ය. මෙසේ ඒ මෙහෙසියට සත්මසක්
පමණ ගිය කල්හි තේජස් ඇත්තාවූ පරාක්‍රම නම් පඬි රජ තෙම මහත්වූ
50 පඬිසෙන් ගෙණ පඬි රටින් (අවුත් ලක්දිව්) බැස ඒ දේවිය ද පැරකුම්
සෙනෙවියන් ද පහකොට ලඞ්කාද්වීපය නිෂ්කණ්ඨක කොට පුලස්ති
51 පුරවරයෙහි (වෙසෙමින්) මනු නීතිය නො ඉක්මවා තුන් හවුරුද්දක්
රාජ්‍යානුශාසනා කෙළේ ය.

52 ඉක්බිත්තෙන් ලංකාවාසී වූ ජනයන්ගේ රෞද්‍ර වූ අතිශයින්
53 උත්සන්නවූ යම් කිසි පාපකර්මයක් කරණකොට ගෙණ එකල ලඞ්කා
රක්ෂණයෙහි නියුක්ත වූ දේවතාවන් ඒ ඒ තන්හි ආරක්ෂා විධානය
54 කරන්ට උපේක්ෂා කරණ කල්හි මිථ්‍යා ද ෘෂ්ටින් සමාදන්වූ දුර්නීතියෙහි
නිබඳ ඇලුනු සිත් ඇත්තාවූ දානාදී කුශලකර්ම නමැති වන ලැහැබ
55 දැවීමෙහි ලැව්ගිනි බඳු වූ සද්ධර්ම නමැති කෛරව පංක්තිය ක්‍රාන්ති
56 ආක්‍රමණයෙහි චන්‍ද්‍රයා වැනි වූ මහා මෝහයෙන් හිස්කළ විචාරන ඇති
කාලිංග වංශයෙහි උපන් මාඝ නම් වූ එක් අධාර්මික මහී පාලයෙක්
57 තෙම සූවිසි දහසක් යෝධයන්ට අධිපතිවූයේ කලිඟුරටින් බැස
ලංකාද්වීපය ගත්තේ ය.

Non-Commercial Distribution

මාඝ නරේන්ද්‍ර නමැති මහා ග්‍රීස්මය තෙම ලංකා රාජ්‍යය නමැති
58 මහ වනය පෙළන්ට බොහෝ වූ යෝධ නමැති ලැව්ගිනි මෙහෙයී ය.
59 ඉක්බිති ලෝකයාට පීඩාකරන්නා වූ උහුගේ ක්‍රෑර වූ මහායෝධයෝ "
අපි කේරළ යෝධයම්හ" යි උන්නාද කෙරෙමින් තැනින් තැන
60 මිනිසුන්ගේ වස්ත්‍රා භාරණාදිය පැහැර ගත්හ. බොහෝකල් පාලනය
61 කරණ ලද්දාවූ කුලාචාරය කඩකළ හ. හස්තපාදාදිය කැපූ හ. බොහෝ
62 ගෙවල් බිඳපූ හ. ගවමහිෂාදීන් තමන් අයත් කොට බැඳ පූ හ. මහා
63 ධනවත් වූ ආඪ්‍ය ජනයන් බැඳ වධ කොට සියලු බොහෝ වූ චෛත්‍යයන්
64 වැනසූ හ. විහාරයන් හි විසූහ. උපාසකයන් පහර පෙළූහ. දරුවන්
තැළූ හ. පස්සාදූම් යන් පෙළූහ. ජනයන් ලවා බර ඉසිලවූහ. බොහෝ
64 වූ කාර්‍ය කරවූ හ. ඔවුන් ප්‍රසිද්ධ ප්‍රශස්ත වූ බොහෝ පොත් ලනුවෙන්
මුදා ඒ ඒ තැන විසුර වූහ. ශ්‍රද්ධා ඇත්තා වූ පූර්‍ව නරේන්ද්‍රයගේ කීර්‍තිශරීර
සමාන වූ රත්නාවලි ආදි වූ අස් මහත් වූ චෛත්‍යයන් හෙලමින් වනසා
66 ඒ චෛත්‍යයන්ගේ ජීවිත සමාන වූ බොහෝ ශාරීරික ධාතූන් අතුරු
67 දහන් කළ හ. අදෝමය !

68 මෙසේ දුෂ්ට අදහස් ඇත්තා වූ මාර යෝධයන් සමාන වූ ද්‍රවිඩ
යෝධයෝ ලොව ද සස්න ද නැසූහ. ඉක්බිත්තෙන් පුලස්ති නම් පුරය
69 සර්‍වප්‍රකාරයෙන් හාත්පසින් සිර කොට පැරකුම් පඬිරජු ගත්හ.
ඉක්බිත්තෙන් ඒ නරේන්ද්‍රයන්ගේ ඇස් උපුටා මුතු වෛරළුමිණි ආදි වූ
සියලු ධනය පැහර ගත් හ. ඉක්බිත්තෙන් ඒ කාලිංග මාඝ රජහු
මාණාභරණා දිවූ ඒ ප්‍රධාන යෝධයෝ ලංකා රාජ්‍යයෙහි අභිෂේක
70 කළහ. මෙසේ ඒ නරේන්ද්‍ර තෙම රට හස්තප්‍රාප්ත කොට ගෙණ
71 රාජ්‍යාභිෂේකයට පැමිණ පොළොන්නරුවෙහි විසී ය. ඒ මහීපාල තෙම
72 මහාජනයා මිසදිටු ගන්වා අමිශ්‍රිත වූ සතර කුලයෙහි ජනයා අත්‍යර්ථයෙන්
73 මිශ්‍ර කෙළේ ය. සිංහලයන් අයත් වූ ග්‍රාමක්ෂේත්‍ර ගෘහාරාම දාස ගව
74 මහීෂාදි සියල්ල කේරළයන්ට දෙවී ය. විහාරයන් හා පිරිවෙන් ද බොහෝ
75 දේවාලයන් ද කිසියම් යෝධ කෙනෙකුන් ගේ වාසස්ථාන පිණිස නියම
76 කෙළේ ය. හේ තෙමේ බුදුන් අයත් වූ ද එසේ ම දහම්, සඟ අයත් වූ
77 ද ධනය හැර ගෙණ නරකයට යනු පිණිස බොහෝ පව් ඉපදවූයේ ය.
මාඝ නම් මහීපති තෙමේ මේ පරිද්දෙන් බලාත්කාර (ක්‍රියා කොට)
78 එක්විසි වසක් ලක්දිව රජය කරවී. මෙසේ ලංකාද්වීපයේ ඒ ඒ
79 නරේන්ද්‍රයෝ මහත් වූ ධන ලෝභයෙන් ඒ ඒ රජුන් මරා තුමුන් මේ
කර්‍මයෙන් ආයු නැතිව රාජ්‍යයට පැමිණත් එය බෝකල් අනුභව කරන්ට
80 නොහැකි වූ හ. අදෝමය! එහෙයින් ප්‍රාඥා වූ ජන තෙමේ
ප්‍රාණඝාතයෙන් වළකීවා විෂ වූ ධන ලෝභය හරිවා.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස සොළස
රාජක නම් වූ අසූවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ එක් වෙනි පරිච්ඡේදය

එ රාජාන්තරයෙහි මහ පිණැති බොහෝ ඇතැම් ජන කෙනෙක්
ඒ ඒ මහා දුර්ග පර්වතයන්හි මනෝඥ වූ නගරග්‍රාමයන් කරවා ඒ ඒ තැන
1 වාසය කරන්නෝ ලෝකය ද ශාසනය ද නිරවුල් කොට පාලනය කළෝ
2 ය. සතුරන් විසින් දුක්සේ නැංග යුතු වූ යහපව් මතුයෙහි අලකමඳ
3 පුරය සේ පුරයක් කොට සුභ නම් සෙනෙවි තෙම වෙසමුණි රජු සේ
එහි වසන්නේ දෙමළුන් නමැති රකුසන් වළකමින් ඒ දෙස ද එහි
4 පවත්නා බුද්ධශාසනය ද පාලනය කෙළේ ය. සතුරන් විසින් ළංවිය
නොහැකි ගෝවින්ද නම් පර්වත මස්තකයෙහි පුරයක් කොට ගෙණ
වසන්නා වූ ලෝකයෙහි ප්‍රසිද්ධ වූ වික්‍රම ඇති භුවනෙකබාහු නම් වූ
5 ඈපා මිහිපති තෙම රුහුණ රට ද (එහි වැසි) භික්ෂු සංඝයා හා සජ්න
6 ද රක්ෂා කෙළේ ය. යළි එසේ ම මිණිමෙවුලා නම් රට උස් වූ ගංදෙණි
නම් පර්වතයෙහි උතුම් වූ පුරයක් කොට ගෙණ එහි වසන්නා වූ සංඛ
7 නම් සේනාපති තෙම එයින් දෙයොදුන් මතුයෙහි වසන්නා වූ දුෂ්ට
8 මාඝරාජසේනාව ද තණපතකටත් නොතකමින් බිය රහිත වූයේ ඒ රට
9 ද එහි සේනා ද රක්ෂා කෙළේ ය. එකල්හි වනාහි ශ්‍රී සංඝබෝධි
රාජවංශයෙන් පැවත ආවා වූ මනෝඥ වික්‍රමාන්විත විජයබාහු යයි
ප්‍රසිද්ධ වූ රජ තෙම පස මිතුරු බියෙන් ඒ ඒ මහවනයට දුර්ගයට පිවිස
බෝකල් වැස වන්නි රජ බවට පැමිණියේ සියලුම සිංලාමාත්‍යයන්
10 තමන් වසඟ කොට මහ බලැත්තේ සිංහල සේනාව සමග නික්ම මහා
11 තේජස්කන්ධ යක් අඳුරු සෙයින් යුද පිණිස සැදුන චතුරංග සමන්විත
12 වූ සියලු පස මිතුරු සෙන් වැනසූයේ ය. කැමති පරිද්දෙන් ගමෙක්
13 ගමෙක්හි, ගෙයක් ගෙයක් පාසා, වාසය කරන්නා වූ සියලුම ද්‍රවිඩ
14 යෝධයන් ඒ ඒ තැනින් පලවාපී ය. ඒ ප්‍රධාන මායා රට සතුරු කටු
15 පහ කොට එහි අතිශයින් උස් වූ දඹදෙණිපව් මතුයෙහි මනරම් පුවරු
වාසල් යුක්ත වූ රම්‍ය වූ පුරයක් කරවා එහි සැපසේ වෙසෙමින් පණ්ඩිත
වූ මිහිපති තෙම රජ කෙළේ ය.

ඩබරයෙහි අනිකක් කීමට පෙරාතුව පොළොන්නරුවෙන්
17 ශාස්තෲහු ගේ පාත්‍රා ධාතුව හා දන්ත ධාතුව ගෙණ වාගීශ්වරාදී සියලු
18 මහා ස්ථවිරයෝ නික්ම මායා රටට අවුත් එහි කොත් මලය නම් පව්වෙහි
19 එක් පියසෙක්හි නිභීය වූ ස්ථානයෙක්හි සාදර වූවෝ ඒ ධාතු යුග්මය
20 භූමි ගත කොට නිධාන කළෝ ඉක්බිත්තෙන් ඔවුන් අතුරෙන් වාගිශ්වරාදි
යම් මහා ස්ථවිර කෙනෙක් ශාසනස්ථිතියට කාරණ වූ ලංකාරක්ෂාව
21 සොයමින් අතිශයින් කම්පිත වූ රළමාලා ඇති මහා සමුද්‍රය තරණය
22 කොට පඩි සොළි ආදී රට ගියාහු ද, කරුණාවට ආකර වූ ඒ විජය

Non-Commercial Distribution

23 බාහු නරේන්ද්‍ර තෙම මහා මාත්‍යයන් යවා ඒ සියලු වහන්දෑ ම නැවත
ඒ රටින් (මෙහි) කැඳ වූයේ ය. හේ තෙමේ ආවා වූ ඒ මහ තෙරුන්
24 වැඳ "දන්ත ධාතු පාත්‍රා ධාතුද්වරය කොතැන තිබුණේ දැ"යි විචාළේ ය.
අසවල් තැනය යි උන්වහන්සේලා වදාළ කල්හි නරෙශ්වර තෙම
25 පස්වනක් ප්‍රීතියෙන් සම්පූර්ණ වූ සර්වාංග ඇති වූයේ ය. ඒ මිහිපති
26 තෙම එ මහ තෙර සමූහයා පෙරටු කොට ඒ කොත්මල පව් වලට ද
සෙන් සමග වැඩියේ ය. පර්වතය හාත්පස මහපුද කරවා සතුටු සිත්
ඇත්තේ දංෂ්ට්‍රාපාත්‍ර ධාතු යුග්මය එහි දුටු යේ ය. එකල්හි පෘථිවිශ්වර
27 තෙමේ චක්‍රරත්නාදි රත්නයක් හෝ මහා නිධානයන් ලබන්නා මෙන් ද
28 නිර්වාණයට පැමිණෙන්නා මෙන් ද සතුටු වූ සිත් ඇත්තේ මන්ධධාතු
නරෙන්ද්‍රයන් සමාන සම්පත් ඇත්තේ ඒ ධාතු යුග්මය ගෙණ මහත්
29 සැණකෙළියෙන් යුක්තව ගමින් ගමට පුරයෙන් පුරයට ගෙණවුත්
30 සජ්ජනයා විසින් ආරබ්ධ දර්ශණීය මහෝත්සව ඇත්තා වූ රම්‍ය වූ
දඹදෙණි පුරයට ගෙණාසේ ය.

පණ්ඩිත වූ රජ තෙමේ මේ ධාතුන් වහන්සේලාට මහත් වූ
පූජාවිධිය දවසක් දවසක් පාසා පවත් වන්නේ ඉක්බිත්තෙන් මෙසේ
31 සිතුසේ ය. "සර්වප්‍රකාරයෙන් අනාගත කාලයෙහි අන්‍ය නරෙන්ද්‍රයෙක්
වූ කලී මේ බුද්ධ ධාතුන්ට පරසතුරන්ගෙන් යම් සේ පීඩා නොවන්නී ද
32 එපරිද්දෙන් අතිශවින් දුර්ගමස්ථිර වූ නිර්භය ස්ථානයක් සකසා
33 කරවන්නෙමි"යි සිතා යම් සේ අහස්හි දෙවියන් විනා පොළෙවෙහි පස
මිතුරු මිනිසුන් විසින් යනු නොහැකි වේ ද එපරිද්දෙන් බෙලිගල
34 හාත්පසින් පව්රු දොරටු ආදියෙන් සුරක්ෂිත කොට ඒ ගලමත්තෙහි
35 උතුම් වූ දංෂට්‍රාධාතු මන්දිරයක් දෙව් ලොවින් ආවා වූ දෙව් විමනක්
36 මෙන් මනරම් කොට කරවාථ ඒ හාස්පස ද නානාවිධ ප්‍රාසාද
මණ්ඩලාන්විත වූ රාත්‍රි ස්ථාන දිවා ස්ථාන ප්‍රතික්‍රමණ ශාලාවෙන් ශෝභන
37 වූ වැව් පොකුණින් යුක්ත වූ සංඝාරාමයක් කරවා පණ්ඩිත වූ රජ
තෙමේ ඒ ධාතු මන්දිරයෙහි දංෂ්ට්‍රා පාත්‍රධාතු යුග්මය මහත් වූ
38 සැණකෙළියෙන් ආදර සහිත පිහිටු වූයේ ය. ධාතු රක්ෂාවෙහි නියුක්ත
වූ ස්ථිරශීලි වූ ස්ථවිරයන්ට ඒ සංඝාරාමය ද දී දන්වැට ද තැබ්බ වූයේ
39 ය. දවසක් දවසක් පාසා ධාතුන් වහන්සේලාට උතුම් වූ පූජාවිධි
40 මහෝත්සවය මනාකොට පවත්වනු පිණිස ව්‍යවස්ථා කරවූ යේය,
ඉක්බිත්තෙන් පෘථිවිශ්වර තෙම සම්‍යක් සම්බුද්ධ ශාසනයට ශ්‍රද්ධාවෙන්
උපකාර කරන්ට පටන් ගත්තේ ය. ඒ කෙසේ දැයි කියනු ලැබේ.

41 ලංකාද්වීපයෙහි සධර්මසංයුක්ත වූ බොහෝ පොත් පරසතුරන්
විසින් නසන ලැදැ යි සංවේග ප්‍රාප්ත සිත් ඇතතේ ධාරණ ඥානයෙන්

Non-Commercial Distribution

42 සම්පන්න වූ සැදැහැත්තා වූ බහුශ්‍රැත වූ කුමිත බැව් නැත්තා වූ මනෝඥ
43 වූ ලෙස වහා ලියුම්හි දක්ෂ වූ උපාසකයන් ද එයින් අන්‍යවූත් බොහෝ
44 වූ පොත් ලියනන්නන් එක තන්හි රැස් කරවා මිහිපති තෙමේ ඒ සියල්ලන්
ලවා ආදර සහිතව සුවාසූ දහසක් ධර්මස්කන්ධයෙන් මනා කොට ලියවී
ය. හේ තෙමේ ඒ ධර්මස්කන්ධ ගණනින් ඔවුන්ට එපමණ ම රන්
45 කහවනු දී ධර්ම පූජා ද කරවා පුණ්‍යාහාරය ද රැස් කෙළේ ය. ත්‍රි
46 සිංහලයෙහි ශිලාචාර ධූරන්ධර වූ යම් ස්ථවිර කෙනෙක් වෙද්ද මධ්‍යම
47 කෙනෙක් වෙද්ද නවක කෙනෙක් වෙද්ද යම් සාමණේර කෙනෙකුත්
48 වෙද්ද ශාස්තෘ ශාසන පාලක වූ ඒ සියල්ලන් රැස් කරවා අසමගි වුවන්
49 ද සමගි කරවා ඉක්බිත්තෙන් "උපසම්පදා තොමෝ ශාසනාභිවෘධිය
පිණිස වේ. මම ඒ මනා කොට කරවන්නෙම් නම් යෙහෙකැ" යි සිතා
සමගි වූ ඒ සියලු මහා සංඝයාට ඒ රජ තෙමේ අට පිරිකර දී වැඩියක්
50 සතුටු වූ සිත් ඇත්තේ මොනවට පටන් ගන්නා ලද පූජාසත්කාර පූර්ව
51 කොට සත් දවසක් උපසම්පදා මංගල්‍යය කරවූයේ ය. මිහිපති තෙමේ
52 ස්වකීය නාමයෙන් ලෝකයෙහි ප්‍රසිද්ධ වූවිජයසුන්දර නම් ආරාමයක්
53 කරවා සාංඝික කොට සංඝයාට දුන්නේ ය."සැදැහැ ඇත්තා වූ යම්
භික්ෂුහු හෝ සාමණේරයරයෝ හෝ තුන්පිටකය ඉගෙණ ගනින් ද
54 සැම කල්හි සර්වප්‍රකාරයෙන් වාචෝද්ගත කෙරෙද්ද ද ඒ සියලු වහන් දෑ
55 ප්‍රත්‍ය නිසා දුක් අනුභව ප්‍රත්‍යය පිළිගණිත්වා"යි කියා පවරා තමන්
මන්දිරද්වාරයට පැමිණි බොහෝ වූ ඒ භික්ෂුන්ට දානයෙහි විසාරද වූ
ඒ රජ තෙමේ උතුම් අනගි වූ පිණ්ඩපාතය සකසා දුන්නේ ය.

56 ඉක්බිත්තෙන් තෙර මහ තෙර තනතුර පත් වූ ද සියලුම භික්ෂුන්ට
57 රජ තෙමේ භෝජනපාකයෙහි වියදම් ද තැබූයේ යි. මිහිපල් තෙමෙ
58 මේ මේ පරිදදෙන් ශාසන සංග්‍රාහ කොට ඒකාන්තයෙන් එම සංග්‍රහයෙන්
59 බුද්ධාදිරත්නත්‍රය පිදූයේ ය. ඉක්බිති රජ තෙමේ වත්තල් ගම්හි භික්ෂූන්ට
ස්වකීය නමින් විජයබාහු නම් වූ විහාරයක් මොනවට කරවූයේ ය.
60 ඉක්බිත්තෙන් ඒ මිහිපති තෙමේ කැළණි නම් වෙහෙර ද්‍රවිඩ යෝධයන්
61 විසින් වනසන ලද ලද්දා වූ උතුම් මහා වෙහෙර ඊට සවණිමක වූ
කොතක් ද කරවා ඊට පූර්ව භාගයෙහි වහසල් ද කරවූයේ ය. එහි පිළිම
මැදුරු පව්රු වළලු ආදි වූ අනික් සියල් තැන ජීර්ණ ප්‍රතිසංස්කරණය
62 කෙළේ යි. මායා රට යම් පහ පිළිම මැදුරු වෙහෙර පිරිවෙන් සහ
63 එසේ ම චෛත්‍ය මණ්ඩප ප්‍රාකාර ගෝපුර වාරාදීහු වෙත් ද ඒ ඒ
64 (ප්‍රාසාදාදීන්ගේ) පූර්වයෙහි පරිද්දෙන් නව කර්මාන්ත කරන්ට රජ තෙමේ
65 නියෝග කෙළේ ය. ඉක්බිත්තෙන් තමන් ලෝකය හා ශාසනයට
අභිවෘර්ධියක් අධික කොට කරන්ට කැමැති වන්නා වූ ද රජ තෙමේ
66 මෙසේ සිතුයේ ය. "මහලු බැව් පැමිණ යෞවනය ගෙවුන කල්හි මා

Non-Commercial Distribution

විසින් රාජශ්‍රී තොමෝ ලද්දී ය. එහෙයින් දූත් අනුභව කරණ ලද්දේ
67 විය. මේ කාලයෙහි ජය ගෙණ අව ශිෂ්ට වූ යම් දුෂ්ට වූ පස මිතුරු
68 කෙනෙක් වෙද්ද ඒ සියල්ලන් ද වැඩ එසේ ලෝකය පාලනය කරන්ට
ද නටබුන් විහාර සම්බන්ධ ව නවකම් කරවා ලෝකාභිවෘර්ධිය ද කරණට
69 කාල මදය"යි සිතා පණ්ඩිත වූ රජ තෙම තමන් ඖරස පුත්‍ර වූ පැරකුම්බා
70 කුමරුය, බුවනෙකබා කුමරු යන කුමරුන් දෙදෙනාගේම ලකුණු ලක්ෂණ
71 වේදීන් සමග තෙමේ විමසා යමක් කරණ කොට ගෙණ හේ තෙමේ
72 තමන් බල තෙදින් ශත්‍රු මර්ධනය කොට සකල ලංකාව ද නිරුත්තර
සේ එකචඡත්‍ර කොට සර්වඥ ශාසනය ද අතිනිර්මල කොට වඩා
දිසානුදිසාවන්හි කීර්තිය ද පතුරුවා නොයෙක් දේශයෙන් අන්තඃපුර
රාජකනනදි පඬුරු ද ලැබ බොහෝ කලක් ද්වීපචක්‍රවර්ති වන්නේ ද
73 පැරකුම්බා නම් කුමරහුගේ මේලක්ෂන දුටුයේ ය. මෙසේ දූන සතුටු
74 කඳුලෙන් පිරුණු ඇස් ඇත්තේ උහු ඇකයෙහි හිඳුවා නොයෙක් වර
75 හිස සිඹ ලඟ සිටියා වූ උහු මල් කුමාරයා ද නැවත නැවත ස්නේහයෙන්
බලා ඔවුන්ට නානා ප්‍රකාර උතුම් අවවාද දී මේ දෙදෙන ම සකල කලා
76 ශිල්පාදියෙන් හික්මවා පණ්ඩිත කැරවූයේ ය. ඉක්බිත්තෙන් ඔවුන්
77 අතුරෙන් පරාක්‍රමබාහු නම් වූ ශ්‍රේෂ්ට පුත්‍රයා සංඝරක්ෂිත නමින් ප්‍රසිද්ධ
වූ මහාස්වාමීන් ප්‍රමුඛ කොට එකල රැස් වූ සංඝකොට ලවා දී එයින්
78 පසු එහුටත් මුනීන්ද්‍රයන් වහන්සේගේ දංෂ්ට්‍රාපාත්‍රා ධාතු යුග්මය ද මහා
79 සංඝයා ද සියලු ම ලංකාවාසී ජනයා ද එසේ ම පාවා දී මිහිපල් තෙමේ
ඔහුට මනා කොට අනුශාසනා කෙළේ ය. මෙසේ නරේශ්වර තෙමේ
ලංකා නමැති මහා කෙෂත්‍රයෙහි රාජබීජය නික්ෂිප්ත කොට සිව්
80 හවුරුද්දක් රජය වලඳා සවර්ගී ප්‍රාප්ත වූයේ ය. මේ විජයබාහු නරෙශ්‍රේෂ්ට
තෙම සියලු ලෝකය ද බුද්ධ ශාසනය ද යම් සේ පාලනය කෙළේ ය
නම් අනාගත කාලික වූ ලංකේශ්වරයෝත් එසේ ම ඒ ලෝකශාසන
දෙක අභය දෙමින් පාලනය කෙරෙත්වා.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කල මහවස ඒකරාජන නම් වූ අසූ එක්වන අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ දෙවෙනි පරිච්ඡේදය

1 පියරජහු ඇවෑමෙන් ඒ පරාක්‍රමබාහු නම් රජ තෙමේ ත්‍රි සිංහල
2 ගත වූ සියලු මහ ජනයා එකතු කොට රම්‍ය වූ පුරය අලංකාර කරවා
ශක්‍ර දේවරාජයට සම වූයේ පළමු කොට අභිෂේක මහෝත්සවය
3 කැරවූයේ ය. ඒ (නරේන්ද්‍රත්තම) තෙමේ පණ්ඩිත බැවින් කලිකාල
4 සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන ප්‍රසිද්ධ (උප පද) නාමය ද ලැබූයේ ය.
තමන් මල් වූ භුවනෛකබාහු ක්‍ෂත්‍රියයන්ට ද යුව රජ බැව් දී රාජ්‍ය
5 භාගයක් ද දෙවූයේය. හේ තෙමේ "මම ලංකාංගනාව මා අයත්
6 කරන්නෙමි. අනිකෙකුට අයත් නොකෙරෙමි" යි පරශත්‍රූන් මැඩීමෙහි
7 අබිමන් බැන්දේ ය. හේ තෙමේ "පළමුවෙන් සර්වඥා දංෂ්ට්‍රා ධාතු
පූජාව කොට පසුව ද්‍රවිඩ යුද්ධයට යන්නෙමි"යි සිතා මහත් පූජා සමග
ඒ ධාතූන් වහන්සේ බිල්ල නම් පර්වතයෙන් ජම්බුද්‍රෝණි නම් පුර ප්‍රවරයට
වැඩම වූයේ ය.

8 මිහිපල් තෙම තුන් වේලෙහි සිතූ සිතූ කෙණෙහි ආදර සහිතව
9 වඳින්ට මාගේ ආලයක් ඇතැයි සිතමින් තමන් මන්දිරය සමීපයෙහි ම
රම්‍ය වූ දන්තධාතු මන්දිරයක් කර වූ යේ ය. ඒ රජ තෙමේ (ඒ මන්දිරය)
10 මැද මාහැඟි අස්නක් කරවා එය මහඟු ඇතිරියෙකින් ප්‍රතිච්ඡන්න
11 කරවූයේ ය. මිහිපති තෙම මහාමාණික්‍යයකින් දන්ත ධාතුවට එක්
12 ආධාරයක් කරවා ඉන්පසු හේ තෙමේ නැවතත් විචිත්‍ර මාණික්‍යයෙන්
ඊට ආධාර වූ මනහර උතුම් වූ මහත් මිණි කරඬුවක් කරවූයේ ය.

ඉක්බිත්තෙන් ඊට ආධාර කොට සවර්ණ නිෂ්කයන් පන් දහසකින්
13 බබළන දෙවෙනි කරඬුවක් කරවූයේ ය. පසුව ඒ රජ තෙමේ රිදී නික්
14 පස්විසි දහසකින් තුන්වෙනි කරඬුවක් නැවතත් කරවී ය. ඉක්බිත්තෙන්
15 නරෙන්ද්‍ර තෙමේ දාගෙය පටන් පුරය අලංකෘත කොට දළදා මහා
16 පූජාවක් ආදර සහිත කොට කරවා දන්ත ධාතූන් වහන්සේ ස්වකීය
හස්ත නමැති පද්මයෙහි තබා ගෙණ මහා සංඝයා මධ්‍යයෙහි මෙසේ
සත්‍ය ක්‍රියා කෙළේ යි.

"මහත් සෘර්ධිමත් වූ මෝනෙය්‍යය ගුණ ඇත්තා වූ භාග්‍යවත්
17 නරොත්තම වූ දේවාතිදේව වූ අප සර්වඥ තෙම තුන් වරක් මේ ලක්දිවට
18 වැඩ ඒ ඒ තන්හි වැඩහිඳ සොළොස් තැන් උතුම් පාරිභෝගික (චෛත්‍ය)
19 කොට වැඩිසේක් ද, එහෙයින් මිථ්‍යාදෘෂ්ටික රජුන් ගේ වසෙහි ලංකා
20 නොසිටන්නී ය. සම්‍යග්දෘෂ්ටික වසෙහි මනා ලෙස පවත්නී ය.

Non-Commercial Distribution

21 පූර්ව*යෙහි ද මේ දිවයිනෙහි මුටසිව නම් මිහිපතිහු පුත්‍ර වූ න්‍යායෙහි
22 දක්ෂ අසේල නම් නරේශ්වරයෙක් වූයේ ද අශ්ව නාවික පුත්‍ර වූ සේනය
ගුත්තිකය යන දෙමළුන් දෙදෙනා දිනා බුද්ධ ශාසනය පාලනය කරන්නේ
රාජ්‍යය කරවී ය. ඉක්බිත්තෙන් දුටුගැමුණු ය යි ප්‍රසිද්ධ වූ අභය මහරජ
තෙමේ එළාර නම්සොළී රජු දිනා ලෝසසුන් පාලනය කෙළේ ය.
23 ඉක්බිත්තෙන් වට්ටගාමිණී නම් මහීපාල තෙම යුදයෙහි ඉතා කර්කශ
24 දෙමළුන් පස්දෙන දිනා ලෝසසුන් පාලනය කෙළේ ය. ඉක්බිත්තෙන්
25 ධාතුසේන රජ තෙමේ නොයෙක් මහා යෝධයන් ඇති දෙමළ රජුන්
26 සදෙනෙක් දිනා ලෙව් සසුන් පාලනය කෙළේ ය. නැවත මහා විජයබාහු
27 රජ තෙමේ ද යුද්ධයෙහි සොළි දෙමළුන් පලවා ලෙව් සසුන් පාලනය
කෙළේ ය. දනුදු විහාරාදිය හා ශාස්තෘන් වහන්සේගේ ශාසනය නසා
28 ඒ පිහිටි රට වසන්නා වූ උඩගු වූ දෙමළුන් ද මාඝ රජු ය, ජයබාහු ය,
යන මේ දෙදෙනා ද දිනා ලෙව් සසුන් වඩන්ට මම ප්‍රාර්ථනා කෙරෙමි.
මේ වචනය ද සත්‍යය."

29 "අනික් කිසිවකුදු මම කියමි. පින්වත් මහා යසස් ඇති කෝසලාදි
වූ භූමිපාලයෝ ජීවමාන වූ ශාස්තෘන් වහන්සේ ගේ සම්මුඛයෙහි ධර්ම
30 දේශනාව ද අසා නානාවිධ වූ පෙළහර දැක කරණ ලද අත්ථ ඇති වූහ.
31 සර්වඥයන් වහන්සේ පිරිනිවි කල්හි උපන්නා වූ මහත් සෘද්ධි ඇති
ධර්මාශෝකාදි භූපාලයෝ නානා විධ නිර්මිත බුද්ධ රූපාදි ප්‍රාතිහාර්‍ය්‍ය
දැක ස්වකීය ජීවිතය මොනවට සඵල කළහ. බුද්ධ කාත්‍යයන් කොට
32 නිමවා මල්ල රජුන් ගේ උපවත්තන නම් සල් උයනෙහි පරිනිර්වාණ
33 මංචකයෙහි හොත්තා වූ ලෝකස්වාමි වූ භාගවතුන් වහන්සේ ප්‍රාතිහාර්‍ය්‍ය
පිණිස මහ ඉටන් පසක් කරණ සේක් ක්ෂුද්‍රධිෂ්ඨානයනුත් නො කළ
34 සේක් ද? එතැන් පටන් අද දක්වාත් යම් ශාරීරික ධාතු කෙනෙක් වෙත්
35 ද යම් පාරිභෝගික ධාතු කෙනෙකුත් වෙත් ද ඒ සියලු ම දාතුහු
බුද්ධානුභාවයෙන් ම මේ ලොකයෙහි පෙළහර කෙරෙති. එහෙයින් ඒ
ඒ ඉටන් කරන්නා වූ මුනීශ්වර වූ සර්වඥ තෙම සිය සස්න පස්වා
36 දහසක් පවත්නා කල අනාගත කාලයෙහි ශ්‍රද්ධා ශිල ධුරන්ධර වූ
37 මහීපාලයන් දක්නේ ඔවුන් අතුරෙහි මා ද නුවණැසින් නුදුටු සේකැ"යි
38 නො හැඟිමි. ඉදින් ශ්‍රේෂ්ඨයන් වහන්සේ විසින් දන්නා ලදුයෙහ් ද ඉදිනුත්
39 ඒ පූර්ව මහා වීර වූ සැදැහැති මිහිපලුන් කෙරෙහි මම ද සර්වප්‍රකාරයෙන්
40 අන්තර්ගත වෙම් ද, ඉදින් බිය එලවන්නා වූ යුද්ධයෙහි පරශත්‍රුන්
මර්ධනය කොට ලෙව් සසුන් වැඩීම් කරන්නෙම් ද, මෙකල්හි මේ
දාඨාධාතුන් වහන්සේ මට යහපත් වූ ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වන්නේ නම්
මැනැව යි කියා නානා ප්‍රකාරයෙන් සිතුයේ ය.

Non-Commercial Distribution

41 එකෙණෙහි ම දංෂ්ට්‍රා ධාතූන් වහන්සේ ඒ නරේශ්වරයාගේ හස්ත
නමැති පද්මයෙන් චන්ද්‍ර රේඛාවක් පරිද්දෙන් අහසට නැගී මනෝඥ වූ
42 සර්වඥ රූපය මවා සවණක් ගන රැස් විහිදුවා සියලු පුරය බබුළුවා
අද්භූත වූ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා නරශ්‍රේෂ්ඨයා සතුටු කොට නැවත අහසින්
43 බැස අවුදින් ඒ රජාණන්ගේ අතෙහි පිටිහි සේක. ධාතූන් වහන්සේ ගේ
44 ඒ අද්භූත වූ ප්‍රාතිහාර්‍ය්‍ය දැක අනුමෝදන් වන්නා වූ මහජන සමූහයා
විසින් ද මහා සංඝයා විසින් ද අධික කොට ගෙණ කරණ ලද සාධුකාර
45 ශබ්දයෙන් හා ස්තුති ඝෝෂණයෙන් එකල්හි මුළු නුවර සර්වප්‍රකාරයෙන්
ඒකකෝලහල විය.

"අද මා විසින් ජීවිතය ලද්දේ ය. අද මාගේ ජීවිතය උතුම් විය.
46 අහෝ අද මාගේ ජීවිතය මොනවට සඵල වූයේ ය. මාගේ පුණ්‍ය බලය
47 කරණ කොට ගෙණ අද මෙවැනි වූ ප්‍රාතිහාර්යක් දැක මහ ජනයා විසින්
ද පුණ්‍ය සම්පත්තිය රැස් කරණ ලද්දී ය. මේ බුදු සස්නෙහි ගුණ
48 සමූහයෙන් යම් කෙනෙක් ප්‍රසිද්ධයෝ ද ඒ පූජාව නරේන්ද්‍රයන් කෙරෙහි
මම දුන් අන්තගීතයෙමි" මහත් ඍද්ධි ඇති මහා පණ්ඩිත වූ මහ රජ
49 තෙම මහ පිරිස් මැද මෙසේ කියා සිංහ නාදය මනා කොට කෙළේ ය.

50 ඒ මහීපති තෙම ඔටුනු වළලු ආදී වූ සියලු සිවුසැට බරණින්
51 දළදාව පුදා ඒ මිණිකරඬුවෙහි සකස් කොට පිහිටුවා ඔප් නැගූ ඒ
52 කරඬුව ද රන් කරඬුවෙහි බහා ඉක්බිති ඒ කරඬුව ද මාහැඟි මනා
කලදෝ මුවා කරඬුවෙහි ආදර සහිතව පිහිටෙවුවේ ය.

මෙසේ පිළිවෙළින් කරඬු තුණෙක්හි මනා කොට පිහිටු වන
53 ලද්දා වූ දාඨා ධාතූන් වහන්සේ නැවත ඒ ස්වකීය ධාතු භවනයෙහි
පිහිටෙවුවේ ය. එක් දවසක් සප්ත රත්නයෙන් මාලා ගන්ධයෙන් ද
නානා විධ ඛාද්‍ය භෝජ්‍යයෙන් ඒ රජ තෙමේ පූජාත් කරවී.

මෙසේ හු දී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස දාඨා
ධාතු පාටිහාරිය දස්සනනම් වූ අසූ දෙවන අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ තුන් වෙනි පරිච්ඡේදය

1 එකල්හි පටන් සියලුම ලංකා වාසි ජනයෝ ඒ රජහුගේ අධික පින්
බලය දැක උහු කෙරෙහි ගෞරව සහිතව ද භය සහිතව ද ප්‍රමෝද සහිතව
ද සෙනග සහිත වූවෝ ව හැසුරුණහ. උහුගේ ආඥාවක් කිසි කලෙකත්
2 උල්ලංඝණය කරණු නොහැකි විය. ඒ රජහුගේ ප්‍රතාපානුරාගයෙන්
3 නැමුණු සිත් ඇත්තා වූ නා නා දේශ වාසි රජ දරුවෝ සියල්ලෝ ම
පඬුරු එවූ හ.

හේ තෙමේ හිස සිඳිය යුතු ජනයා සිරගෙයි බැඳීම පමණකින්
4 දැඩිසේ නිග්‍රහ කොට නැවත ඔහු මිදූයේ ය. මිහිපති තෙම දඟ ගෙට
සුදුසු වූ ජනයන්ට යම්කිසි නිග්‍රහයක් කොට කරුණාපරවශව අවවාද
කෙළේ ය. මනු රජු හා සම වූ මිහිපති තෙමේ රටින් නෙරපිය යුතු
5 ජනයන්ට වනාහි දහසක් පමණ දඩ නියම කෙළේ ය. හේ තෙමේ දඩ
6 පැමිණ විය යුතු සියලු ජනයා කිපී බලන්නේ නොයෙක් නිග්‍රහ වචනයෙන්
7 සුවිනීත කෙළේ යි. වීර වූ වෛරීන් වර්ධනය කළා වූ තමන් පිය රජාණන්
8 විසින් නො දිනිය හැකි බවට ගියා වූ වනදුර්ගාදිය ආශ්‍රය කොට විසූ
9 සියල්ලන් ද ඒ නරෙන්ද්‍ර තෙම තේජෝ බලයෙන් ද එසේ ම මෛත්‍රී
10 බලයෙන් ද ලංකාවෙහි සතුරන් බලය දිනන්ට ආරම්භ ද කෙළේ ය.
සිංහාසනයෙහි වැඩහුන්නේ ම සේනා වාහන සමන්විත වූ සිංහල
වන්නිරජුන් සර්වප්‍රකාරයෙන් වසඟ භාවයට ගෙණායේ ය.

ඒ නරේශ්වර තෙමේ ත්‍රී සිංහල ගත වූ සිංහ වික්‍රමාන්විත වූ සියලු
11 සිංහලයන් රැස් කරවා සතුටු කර වී. කඳවුරු බැඳ ඒ ඒ තැන නිවාසි වූ
12 මහා ද්‍රවිඩ යෝධයන්ට නිග්‍රහ කරන්ට උත්සාහ කෙළේ ය. යුදෙහි
13 හැසිරෙන සතුරු මතැතුන්ට සිංහලයන් වැනි වූ සියලුම සන්නද්ධ වූ
14 සියල්ලන් ඒ ඒ තැන යැවී. සිංහල මහා යෝධයෝ ගුරුළන් සෙයින්
ගමනය කොට සියලු ද්‍රවිඩ යෝධයන් නයින් සෙයින් පෙළූ හ.

15 එකල්හි සම්පතින් ප්‍රසිද්ධ වූ පුලස්ති පුරයෙහි ද, කොටුසරගම්
16 හි ද, එසේ ම ගංතලාවෙහි ද, කාකාලය ගම්හි ද, පදී රට ද, කුරුන්දියෙහි
ද මානාමත්හි ද, මාතොට ද, එසේ ම මන්නාම් පටුනෙහි ද, පුලවෙෂටී
නම් තොට ද, එසේ ම වැලිගම ද මහත් වූ ගෝනරට ද, එසේ ම
17 ගෝනුසුරට ද, මීපා තොට ද එසේ ම හුරා තොට ද, මේ ආදී තන්හි
18 කඳවුරු බැඳ බලාත්කාර කොට බොහෝ කල් වසන්නා වූ මාසෙන්ද්‍ර, ජය
19 බාහු නම් දෙමළ රජුන් දෙදෙනා ගේ සතළිස් දහසක්වූ ද්‍රවිඩ කේරළ
20 යෝධයෝ කුන්තායුධ ගත් අත් ඇති සිංහල යෝධයන් විසින් දැඩිසේ

Non-Commercial Distribution

21 පෙළෙන ලද්දාහු හිඳිනු නො හැකි ව භයින් මඩනා ලද්දාහු ඒ ඒ තැනින්
22 පොළොන්නරුවට අත් වූ මෙසේ මන්ත්‍රණය කළහ. "පරාක්‍රමබාහු රජ
තෙම මහ තෙත්තේ මහත් සෘර්ධි ඇත්තේ ය. උහුගේ ආඥාව ඉක්මවන්ට
23 පෘථිවියෙහි කවර ධීරයෙක් හෝ වන්නේ ද? මේ කාලයෙහි දේශාන්තර
24 වාස නරෙන්ද්‍රයෝ පවා උහුට ම වසඟ වූහ. සියලුම සිංහලයෝ උහුගේ
25 ම වසෙහි පවතිත් ම ය. අපගේ සමහර දෙමළු ද උහුගේ ම සේවකයෝ
වෙති. අන්‍යයන් කෙරෙහි කියනු කිම? කිමෙක් ද අපි වනාහි කුමක්
කරමු ද? දූන් සූර්‍යයා සේ තෙදැති උහුගේ උදාවෙහි අපිසියල්ලෝ ම
26 කදෝපැනියන් සෙයින් නිෂ්ප්‍රභා වුවෙමු. එහෙයින් සිංහල ද්වීපයෙහි
අපට වනාහි භවිෂ්‍යත් කාලයෙහි වාසය කරනු නො හැක්කේ ම ය.
දේශාන්තරයට යම්හ" යි. (මන්ත්‍රණය කොට)

27 ඇතුන් අසුන් ද එසේ ම මාහැඟි මුතු මැණික් ද එසේ ම රජ
28 ඔටුනු ද සියලුම අන්තඃපුර ස්ත්‍රීන් ද සියලු ආභරණයන් ද පට සළු
පෙට්ටි ද අනිකුදු සියලු සාරයන් බියෙන් හැර ගෙණ එ නුවරින් බැහැර
29 යන්ට එ කල ආරම්භ කළහ. රජහු ගේ පුණ්‍යානුභාවයෙන් ම ඔවුන්ට
30 දිශා මුළා විය. ඒ එසේම ය. ඔව්හු නැගෙනහිර පුර දොරය යි සිතා
31 බටහිරි දොරින් නික්ම යම් තැනෙක සිංහල සේනා තොමෝ කඳවුරු
32 බැන්ඳා ද ඒ කලා වැවට ගියහ. ඛෙදයකී. ඔව්හු ඒ ඒ ස්වකීය වස්තූන්
ස්වකීය ජීවිතයට ද ඒ සිංහල යෝධයන්ට දානය කොට මහ රජාණන්
විනිස් සිතන ලද අර්ථය ම තමන් සිද්ධ කොට දුන් හ.

33 සියයක් පමණ රජුන් විසින් බියෙන් දමන ලද්දා වූ සම්පත් ලබන්නා
34 වූ මියුලු නුවර වැස්සන් සෙයින් සියලු ම සිංහලයෝ ඔවුන්ගේ වස්තු
සම්භාරය ගෙණ එකල් පටන් සමෘද්ධ වූවෝ පූර්වයෙහි යම් සේ ද එසේ
35 වූ හ. හේ තෙමේ ආනුභාවයෙන් පර සතුරන් මර්ධනය කොට මුළු
ලක්දිව සමෘර්ධ කරවන්ට ආරම්භ කෙළේ ය.

ඉක්බිත්තෙන් ඒ නරේන්ද්‍රයන් ගේ එකොළොස් වෙනි වස පැමිණි
36 කල්හි චන්ද්‍රභානුය යි ප්‍රසිද්ධ වූ එකල ජාවක රට එක් රජෙක් තෙම "අපි
ද බෞද්ධයම්හ" යි මායා කොට කර්කශ වූ ජා සෙන් සමග ලක්දිව් බැස්සේ
37 ය. හැම තොට බැස්සා වූ ඒ දුෂ්ට වූ සියලු ජා යෝධයෝ ද දරුණු
38 සර්පයන් වැනි විෂ පෙවූ හීයෙන් යම් ම දුටු දුටු ජනයන් නිරතුරු පෙළමින්
39 ක්‍රෝධයෙන් දුවමින් මුළු ලක්දිව වැනසූහ. ගිනි හෙනින් විධ්වංසනය
40 කරන ලද ස්ථානයක් දිය හෙනින් සෙයින් මාඝ රාජාදීන් විසින් පෙළන
ලද ලංකාව ජාවෝ නැවත පෙළූ හ.

Non-Commercial Distribution

41 එ කල්හි රජ තෙමේ බෑන වූ නොපසුබට වීරබාහු මිහිපතිහු
42 යෝධයන් සමග ජා යුද පිණිස යැවූයේ ය. දරුණු වෙස් දරූ බියකරු
වූ විරබාහු නරෙන්ද්‍ර නමැති රාහු අසුර තෙම යුද්ධ භූමි නමැති
43 ආකාශාංගනයෙහි ඒ චන්ද්‍රභානුහු අත්‍යාත්‍ථයෙන් වැළැක් වූයේ ය. මේ
තෙමේ වීර වූ සිංහල යෝධයන් ඒ ඒ තැන්හි යොදා ජාවක යෝධයන්
44 සමග යුද කරණට පටන් ගත. යුද්ධයෙහි දී ජා යෝධයන් විසින් වහ
වහා යන්ත්‍රයෙන් මුදන ලද බොහෝ සෙයින් අභිමුඛව ආවා වූ විෂ
45 පෙවූ මුඛ ඇතිශරයන් ලක්ෂ්‍යාවේධි වූ යම් ධනුර්ධර සිංහල මහා යෝධ
46 කෙනෙක් වූ ඔව්හු තික්ෂණ මුඛ ඇති හීයෙන් කඩ කඩ කොට කැඩූහ.
47 වීරබා මිහිපති තෙමේ යුදයට ගොස් රාම රජහු සෙයින් බොහෝ වූ
ජාවක යෝධයන් රකුසන් වෙරම්බ වාතය මෙ ජා සතුරු නමැති මහ
වනය නැවත නැවත භස්ම කළේ ය.

48 හේ තෙමේ මෙපරිද්දෙන් ම යුද කොට ජාවුන් පලවා සියලු
ලංකා පෘථිවි තලය පසමිතුරන් නැති කෙළේ ය. පසුව දෙවි නුවර
49 ගොස් උපලුවන් දේවයා යැඳ එ තන්හි ඒ දෙව්රජහට දෙව පූජා ද
50 කරවී ය. ඒ නරෙන්ද්‍ර තෙම එහි සාංඝික පිරිවෙණක් තමන් ම කරවූයේ
51 ය. එය ජනයා සතුටු කරණ බැවින් නන්දන නම් විය. එ තැනින්
නැවත දඹදෙණි පුරයට ආයේ පරාක්‍රමබාහු රජ තෙමේ ද අත්‍යාත්‍ථයෙන්
52 ප්‍රීතියට පැමිණි යේය. පරාක්‍රමබාහු මිහිපතී තෙම එ කල්හි මෙසේ
නානාප්‍රකාර වූ මහා යුද්ධ කොට බිය එලවන්නා වූ සියලු ශත්‍රු සමූහයා
පහ කොට විශාල වූ තෙජසින් යුක්ත වූයේ විජය ශ්‍රීය ලද්දේ ය.

මෙතෙකින් හු දී ජනයා ප්‍රාසාද සංවේග පිණිස කළ මහවස
වෙරිරාජ විජය නිද්දේස නම් වූ අසූ තුන් වර අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ හතර වෙනි පරිච්ඡේදය

1 ඉක්බිති මනු නීතියෙහි දක්ෂ වූ ඒ රජ තෙමේ පර සතුරන් විසින්
2 බොහෝ කාලයක් කොල්ල කනලද කුල ප්‍රවේණි අයත් ගම් කෙත්
3 ගෙවල් ආදිය ඒ ඒ හිමියන්ට වෙන් කරවා පිළිවෙළින් දෙවී ය. නැවත
4 ද ඒ තෙමේ එසේ ම බුදුන් දහම් අයත් වූ ගම් අරම් ආදීන් ද කැප වූ පස
5 ගම් ද සඟ සතු ගම් ද එසේ ම පුද්ගලික ගම් ද අෂ්ටායතනය අයත් ගම්
6 ද පිරිවෙන් අයත් පංච ප්‍රෙෂ්‍ය වර්ගයන් දශ ප්‍රෙෂ්‍ය වර්ගයන් ද නියම
7 කරවා තැබී ය. ඒ රජ තෙමේ ලක්වැසි සියලු ජනයන් ආඪ්‍ය මහා
ධනවතුන් කොට සියලු රට සුභික්ෂ කරවී. වැලිදු ඒ තෙමේ අන් රජුන්
8 පටන්සිය සඳ සේ වසන්නා වූ මිථ්‍යා ජීවයට පැමිණි අනවතරයෙන්
9 නො සන්හුන් ඉඳුරන් ඇති සියලු අලජ්ජි සමූහයා මොනවට එක කොට
බැහැරලා සම්මා සම්බුද්ධ සස්න ද පිරිසිදු කරවී. තව රජ තෙමේ
10 බොහෝ පඬුරු සොළී මහ රට යවා මනා සිල් හා ආචාරයෙන් යුක්ත
වූ පිට කත්‍රය ධාරී වූ පසිඳු සොළී භික්ෂූන් ගෙන්වා තාම්‍රපර්ණියෙහි
උභය ශාසනය සමගි කරවී.

11 නැවත එ තෙමේ තඹරට අනවතරයෙන් වසන්නා වූ නොයෙක්
ලජ්ජි භික්ෂූන් අතුරෙන් ධර්මකීර්ති ය යි ප්‍රසිද්ධ වූ සිල් තෙදින් බලන්නා
12 වූ එක් මහ තෙර කෙනෙක් ඇති. පිඬු පිණිස වඩනා එ තෙරුන්ගේ
ඉදිරියෙහි මග කිසි කලෙක පියුමෙක් පහළ වීය යි විස්මිත කරණ ලදුව
13 දළදාවෙන් ස්වර්ශකරණ ලද්දා වූ සුවඳ සඳුන් කලල් ආදී වූ දහම්
14 පඬුරු ද එසේ ම උත්කෘෂ්ට වූ රජ පඬුරු තඹරට යවා මිහිපල් තෙමේ
15 ඒ මහ තෙරුන් ලක්දිව් වැඩමවා රහත් කෙනෙකුන් සෙයින් දක්නේ
16 නැවත සතුටු වෙමින් උන්වහන්සේට මහ පූජා කොට සත්කාර භාජන
වූ තෙරහු සිවුපස දානයෙන් සකසා උවටැන් කෙළේ ය.

17 මහ රජ තෙමේ තමා විසින් ම වඩන ලද්දා වූ ශාසනයා ගේ
මනා රක්ෂණය කරණු කැමැත්තේ රාජධානිය හාත්පසින් අෂ්ටායතන
18 වාසී වූ මහතෙරුන් අටදෙනාගේ ද ගම් වැසි අරම් වැසි ස්මෘතිමත්
19 තෙරුන්ගේ ද නිවාසයට යෝග්‍ය වූ විසල් නන් පහයෙන් හෙබියා වූ
20 නානා මණ්ඩපයෙන් යුක්ත වූ නානා පුෂ්කරණීයෙන් යුක්ත වූ ද රාත්‍රී
ස්ථාන වඩ් ක්‍රමණ ශාලායෙන් හෙබියා වූ ද මල් වතු පොල් වතු පත්තීන්
21 පිරිවරණ ලද්දා වූ ද බොහෝ සංඝාරාමයන් කොට උන්වහන්සේලාට දී
පසුවත් සියලු පිරිකරින් මහාපූජා ද කරවී.

Non-Commercial Distribution

22 පසුව රජ තෙමේ ග්‍රාමාරණ්‍ය වාසී වූ මහා සංඝයා රැස් කොට
23 එයින් නිතොර සීල ශුද්ධිය සොයන්නා වූ යමෙක් ධූතාංගධර වූවෝ
24 රුක්ෂ ප්‍රතිපත්තියෙහි විසාරදයෝ ද ඍජු භාවාදි ගුණ යුක්ත ලජ්ජී
ධර්මයෙහි පිහිටියෝ ද ඒ සියල්ලන් පලාබද්ගල රැස් කරවා ආරණ්‍ය
25 වාසයක් කරවා උන්වහන්සේලාට දී උපස්ථාන කෙළේ යි. මහා රුක්ෂ
26 පිළිවෙත් පූරණ උන්වහන්සේලා ලවා ඒ රජ තෙමේ තමන් කාලයෙහි
27 ලංකා රහතුන් ඇත්තා සේ කෙළේ යි. ඉක්බිති මේ ද්වීපයෙහි ආගමධර
ස්ථවිරයෝ තුනී යයි සියලුම පොත් දඹදිවින් ගෙන්වා ආගමයන්හි ද
එසේම සියලු තර්කව්‍යාකරණාදියෙහි ද බොහෝ භික්ෂූන් හික්මවා
28 විචක්ෂණ කරවී. මෙසේ පිළිවෙත් ද පය්‍යාප්තිද වඩමින් මහානුභාවති
(රජ තෙමේ) ඒ පූජාවයන් හා ශ්‍රද්ධාවෙන් බුදුන් පිදී. ඒ රජ තෙමේ
29 භුවනෙකබාහු නම් වූ තමා මල් රජහු පිටකත්‍රයෙහි හික්මවා විසාරද
30 කරවා උහු ලවා ම ස්ථවිර ධර්මය දේශනා කරවා අස්නා වූ බොහෝ
31 භික්ෂූන්ට මහා සඟ මැදයෙහි ථෙර සම්මුති දෙවා සියලු පිරිකර දී ථෙර
පූජා ද කරවී. අටග අරි මගින් මහා සංසාර සාගරයෙන්පරතෙර යන්ට
32 හේතු වූ පුණ්‍ය උපසම්පදාව සොයමින් තමන්ගේ (අභිෂේකයන්) තෙ
33 වැන්නෙහි ය, ස වැන්නෙහිය, ය, සතළොස්වැනි වර්ෂයෙහිය, එක්විසි
වැන්නෙහි , සත්විසි වැන්නෙහිය, එසේ ම තිස් වැන්නෙහි යි මෙසේ
34 අට වරෙක සැටක් ටැම් ඇති මහගෙයක් කරවා ඒ හාත්පස ද උතුම්
35 මහ මඩුවක් කොට නිමවා නැවත එය විසිතුරු නන් වතින් සාලංකාර
36 කොට එහි බොහෝ භික්ෂු සමූයන් පන්තීන් වඩා හිඳුවා ආදර පවත්වමින්
37 හෙරණ පැවිදි බොහෝ දෙනට උපසම්පදාව දෙවා පසුව තෙර (පදවිය)
38 මහ තෙර (පදවිය) ආයතන (පදවිය) යනාදි වූ උතුම් තනතුරු ද භික්ෂූන්ට
39 දෙවා ඊට අනතුරුව මාහැඟි බොහෝ ගරු භාණ්ඩයන් ද එසේ බොහෝ
40 වූ යහපත් පරිෂ්කාරයන් ද හස්ති රාජ ප්‍රමාණයෙන් රැස් කොට මහ
41 තෙර (පිදිවි) විහාර පදවි ලද්දන්ට පළමු කොට රාජාර්හ පරිෂ්කාර දෙවා
42 පසුව සියලු ස්ථවිර නිසමුක්ත ආදි වූ භික්ෂූන්ට මිහිපල් තෙමේ
43 පිළීවෙළින අට පිරිකර දුන්නේ ය. මෙසේ උතුම් වූ අෂ්ට උපසම්පත්ති
මහ මංගලය නරොත්තම රජ තෙමේ සත් සත් දින බැගින් පැවැත් වී.
පසුවත් මේතෙමේ බොහෝ වර උපසම්පදා මංගලය කරවා බුදු සස්න
සමෘර්ධ කරවි.

මෙසේ ඒ රජ තෙමේ නානා ප්‍රකාර උපකාර කෙරෙමින් අමාත
44 රශ්මිහු සාගරය සෙයින් සද්ධර්ම රාජන් වූ තථාගත යන් ගේ ස්න
මොනවට වර්ධනය කෙළේ යි.

මෙතෙකින් හුදී ජනයා ප්‍රාසාද සංවේග පිණිස කල මහවස
ශාසනොපකාර කරණා නම් අසූ සතර වන අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ පස් වෙනි පරිච්ඡේදය

1 පසුව ඒ රජ තෙමේ සශ්‍රීක වූ තමන් උපන් සිරිවඩ්ඪන නම්
2 අතුල්‍ය නුවර මහ මඩුවෙන් යුක්ත වූ තුඟු පවුරු හා තොරන් ඇති
3 බෝධි චෛත්‍යාරාම ප්‍රතිමා ගෘහයෙන්, සැදුම් ලද නන් විසිතුරු කමින්
යුක්ත වූ සුභගත්වයෙන් හොබ වනලද විශාල සම්පත් ඇති මහ
4 වෙහෙරක් කරවී. පසුව දඹදෙණි නුවර පටන් ශ්‍රී වර්ධන නුවර තෙක්
5 දිග පුළුලින් අඩ [1] යොදුන් හා ඉස්බක් පමණ වූ බෙර ඇසක් සේ සම
කළා වූ තලා ඇති මනොහර වූ නො කඩවා විසුරු වන ලද මොළොක්
6 සුදු වැලි ඇති ඔසවන ලද හිරු රැස් මුවහ කළ නොයෙක් ධජ
7 පතාකාවෙන් හා කෙසෙල් ගස් පෙළින් යුක්ත වූ පුෂ්පාලංකාර දරන්නා
8 වූ චිත්‍ර කර්මයෙන් මනෝ වූ අනෙක පූර්ණ කුම්භයන් විසින් උභය
9 පාර්ශවයෙහි අලංකාර කළා වූ මේ විශාලාවකාශයෙහි අතුරතුර පස්
රියන් අයම් තැන එකි එකී රජ තොරණ ය. දස රියන් අයම් තැනෙක
එක එකී පට තොරණ ය. සියක් රියන් අයම් තැනවිසිතුරු වූ සිත්තමින්
නිමියා වූ තුඟු කැරලි ඇති තුන් මහල් වූ බුදු පිළිමයෙන් යුක්ත වූ මහ
10 පහ එකක් එකක් බැගින් ද නර ශ්‍රෙෂ්ඨ රජ තෙමේ කරවී ය.

11 පසුව වෙහෙර පවුරු මඩුලු හාත්පස මහත් වූ අනෙක වූ සිත්තමින්
12 මනහර සුරාධිශයා ගේ චාප ලීලාවට අපහාස කරන්නා වූ තොරණින් ද
සුපුන් සඳ මඩුලු බඳු සේසතින් ද ආකාශාංගනයෙහි නටන දිව්‍ය
13 නාටකයන් බඳු මනහර වූ නානා රූපධර වූ පසු පැහැ දෙදෙන් ද
14 දෙව්ලොවේින් ආවා වූ නොයෙක් විමන් පෙළ බඳු කාන්ති ඇති
15 අනවතරයෙන් බබළන්නා වූ මිණි මඩු පෙළින් දා සේසත් ගෙණ
පෙළසැදී නටන්නා වූ මිණි මඩු පෙළින් ද යන්ත්‍රයෙන් නිම වන ලද
මනහර වූ බඹරු වළල්ලෙන් ද හිස ඇඳිලි බැඳ ගෙණ සක්‍යා
16 හැසිරෙන්නා වූ නන් වන් දරණ යන්ත්‍ර රූපයෙන් කළා වූ දේව රූපයෙන්
17 ද මහ සමුදුර මොනවට නැංගා වූ රළමළා බඳු කාන්ති ඇති ඒ ඒ තැන
දුවන්නා වූ යන්ත්‍රයෙන් කරණ ලද අස් රූ වළල්ලෙන් ද පොළෝ තල
18 බටුවා වූ වළාවෝ දෝයි සැක උපදවන්නා වූ හස්ත්‍යලංකාර ධර වූ
යන්ත්‍ර රූ ඇතුන්ගෙන් ද යන මේ ආදි වූ ලෝකානන්ද කර වූ නන්
වැදෑරුම් සියලු පූජා වස්තුවෙන් වෙහෙර මොනවට අලංකාර කෙළේ
19 ය.

1 අට කියාත් තිබේ.

Non-Commercial Distribution

20 නැවතත් ඒ මේ වෙහෙරින් බැහැර හාත්පස ගවු ගවු තැන්
21 අනවකාශව පිරි ගෙණ සිටිනට ලක්දිව් වැසි සාධු නාද පවත්වන සම්බුදුන්
22 ගුණ කියන්නා වූ බුදු මඟුල් කටයුතු පුද මල් ආදිය දරන්නා වූ භික්ෂු
23 සාමණේරයන් හා එසේ ම උපාසිකා උපාසකයන් ද පූජා වස්තු ඔසවා
24 ගත්තා වූ සියලු අලංකාරයෙන් හෙබි තුනුරුවන් ගුණ දන්නා වූ අන්‍ය
25 වූ සියලු නර නාරීන් ද සියල්ලන් නියෝග කෙළේ යි. පසුව මිහිපල්
තෙමේත් සියලු අබරණින් සැරසුනේ සිව්රඟ සෙන් සමග සැදැහැයෙන්
මෙහෙයන ලද්දේ සියලු රථාලංකාරයෙන් සරහන ලද මාහැඟි රථයක
26 ඒ දළදා පාදා දෙදෙනා වහන්සේලා නගා පසුව රන් කොඩිය එසේම
27 රිදී කොඩිය, රන් කලස්ය, එසේම මනා වූ රිදී කලස් ය, රන් මනෝ
28 හර වූ රන් විජිනිය රිදී විජනිය රන් පොකුණු හා එසේ ම රිදී පොකුණය,
රනින් නිමවනලද්දා වූ රිදියෙන් නිමවනලද්දා වූ ද පුන් කලස යන මේ
අදි වූ නානා විධ පූජා භාණ්ඩයන් පෙරටු කොට ඒ මිනිසුන් ලවා
29 පංක්තීන් පිටත් කරවා එකල්හි හේ තෙමේ පසු පස්සෙහි පංච
30 තූර්‍යවාදයෙන් ද මහ පුද කරවමින් අලංකෘත ඒ වීථියෙන් ක්‍රමයෙන් ශ්‍රී
31 වර්ධන නම් නුවරට වඩා ගෙණ ගොස් ඒ වෙහෙර මැද මහත් මිණි
32 මඩුවෙක පණවනලද බුද්ධාසනයෙක් හි සාදරයෙන් (ඒ ධාතු ද්වය)
වඩා හිඳුවා ඒ ඒ මිනිසුන් ලවා පූජා කරවන්ට ආරම්භ කෙළේ ය.

33 එකල පින්සොඩ සියලු ජනයෝ ආභරණයෙන් සැරසුනෝ
34 පෙරවරුහි දළදා වහන්සේ හා පාදා වහන්සේ රන් මල් හා මිශ්‍ර වූ වර්ණ
35 ගන්ධාදියෙන් හොබනා දෑසමන් සපු නා ආදි වූ පුෂ්ප රාශීන් භක්තියෙන්
36 පිදූහ. බොහෝ කලක් ගෙණ එන ලද මහ රජු යසෝරසි විලාස ඇති
සුවඳ හැල් බත් සම්බන්ධි වූ බොහෝ රාශීයෙන් ද පිදූ හ. මොනවට
විලිකුත් සුවඳ ඇති යහපත් වර්ණයෙන් යුක්ත ඉතා මිහිරි වූ කෙසෙල්
37 පනා අඹ ආදී ඵල වර්ගයෙන් පිදූහ. ඉක්බිති ඒ රජ තෙමේ මෙසේ ම
38 භික්මියේ උතුම් ධාතුද්වය නානාවිධ පූජායෙන් පූජාකොට ඉන් පසු
39 ආහාර පානයෙන් ද ඛාද්‍ය භෝජ්‍යයෙන් ද එසේ ම ලෙය්‍ය පෙය්‍යයෙන්
ද සාදරයෙන් භික්ෂු සංඝයා ද උපස්ථාන කෙළේ යි. පසුව ඒ මිහිපල්
තෙමේ එ කල්හි ඉතා සතුටු සිත් ඇත්තේ නොයෙක්සිය ගණන් භික්ෂූන්ට
40 අටපිරිකර දුන්නේ යි. පසුව එ තෙමේ තුන්යම් රැය වෙහෙර වටා සුවඳ
41 තෙලින් දල්වන ලද පහන් ලක්ෂ කෙළ ගණනින් මනෝහර වූ යොදන
ලද නොයෙක් කපුරු පහන් මාලාවෙන් ද තරු නැඟි අහස සෙයින්
42 සියලු පොළෝ තෙල අලු කෙළේ.

43 ඒ ඒ තැනඋතුම් රඟ මඩුලු බැඳ ගෙණ නානා ආකාර ගෙණ
නොයෙක් නැටුම් පවත්වන්නා වූ නැට්ටුවන්ගේ ද නන් ගී

Non-Commercial Distribution

ගයන්නවුන්ගේද නන් වැදෑරුම් නැටුමෙන් හා මිහිරි ගීයෙන් සිත් කළු
44 වූ පාරාදාරයාගේ ආරාවය දුරු කෙරී මෙහි පන්ඩිත වූ ද ලජ්ජා කරණ
45 ලද නොයෙක් මේඝ ගර්ජනා ඩම්බර ඇත්තා වූ ද සිය පින් මහ මුහුද
46 හඬ සලා බඳු පසඟතුරු රැවින් වඩනා ලද්දා වූ සැදැහැත්තවුන් විසින්
47 සාදරයෙන් ඒ ඒ තැන පණවන ලද විසිතුරු විජනි ගෙණ බණ අස්නේ
හිඳ අසන්නවුන් සිත් ගන්වා සදහම් දෙසන්නා වූ ධර්මකථික යන්ගේ
දහම් ගොසින් ශබ්ද කරණ ලද්දා වූ "බුදුහු ආශ්චර්‍යයියි, ධර්මය
48 ආශ්චර්‍යයියි සංඝයා ආශ්චර්‍යය" යි කියමින් නිරන්තරයෙන් සාධු නාද
49 පෙරටු කොට තුනුරුවන් ගුණ කියා ගෙණ අනුමෝදනා කොට කොට
50 ඒ ඒ තැන ඇවිදින්නා වූ සිවු වණක් පර්ෂද්හුගේ සාදු නාදයෙන් හෙබියා
51 වූ ද, ඒ ඒ දිග නිරතුරු සිටිමින් ආනන්ද ජනක විධානයෙන්පිහිටු වූ
බුද්ධ ශාන්ති කරන්නා වූ නන් අබරණ බලි භෝජක ජ්‍යොෂ්ඨයන් විසින්
පසන්නා ලද්දා වූ ද බුදු පුද මිහිපල් තෙමේ පැවැත් වී.

52 මිහිපල් තෙමේ "දෙව් ලොව සුරේන්ද්‍ර තෙමේත් බුදුපුද මෙසේ
53 කෙරේය"යි ඒ මෙහිදු දක්වන්නාක් සෙයින් ද ලක්දිව් නායක මහර්ධි
54 ඇති පෙර රජ දරුවෝත් මෙසේ ම බුදු පුද කළහ යි එය එසේ ම දැන්
55 සිංහල වාසීන්ට දක්වන්නා සෙයින් ද සර්වඥයන්ගේ පාරමී කල්ප
56 ලතායෙහි එල මෙබඳු යයි සියලු මිනිසුන්ට කියන්නක්හු සෙයින් ද මෙ
බඳු වූ තුණුරුවන් මහපුද සතියක් පැවැත් වී. පසුව ඒ තෙමේ ඒ මහ
වෙහෙර සාංඝික කොට මහ සඟනට දී පින් හා කිත් පිරූයේ ය.

57 ඉක්බිති රජ තෙමේ සිය නමින් පරාක්‍රමබාහු නම් වූ තුඟු පහයෙන්
58 හෙබියා වූ පිරිවෙණක් කරවා නානා කප්පිය භාණ්ඩ හා බොහෝ අය
59 උපදනා ගම්වර ද ඒ වෙහෙරට දී මහා පූජාත් කරවී ය. ඒ රජ තෙමේ
60 සිය නමින් ම තමන් යුව රජු ලවා බෙලි ගල් වෙහෙර භුවනෙකබාහු
61 නම් වූ ප්‍රාසාද මණ්ඩපාදියෙන් හෙබියා වූ පිරිවෙණක් කරවා ඒ ශ්‍රී
62 වර්ධන නම් පුරයෙහි කී ක්‍රමයෙන් සියලු පූජා වස්තුවෙන් ආදර සහිතව
63 සත් දවසක් තුණුරුවනට මහ පූජා පැවත් වී. නැවත ද ඒ රජ තෙමේ
එසෙනෙවි රදුන් ලවා ම හස්තිශෛල පුරවරයෙහි සිය නමින් මහ
වෙහෙරක් කරවා පසුව එම පූජා කොට පින් රැස් කෙළේ ය.

64 යටාලතිස් රජහු විසින් උතුම් කැළණි නුවර පූර්ව කාලයෙහි කරවන
65 ලද දිරා ගිය පස්බුමු පහය බොහෝ කොට ජීර්ණවිශොධනය කරවා
66 පසුව සුණුකම් විධානයෙන් නැවත ප්‍රකෘතිමත් කෙළේ ය. එහි ම මුනි
67 රජහු ඔත්පිළිම ගෙය ද එසේ ම ත්‍රිවංක පිළිම ගෙය ද නැවත සකස්
68 කෙළේ ය.

Non-Commercial Distribution

68 මිහිපල් තෙමේ ඒ කැළණි පුරයෙහි ම දිගුපුළුන් සතරැස් එ මහ
සෑ මළුව මහත් ගලින් මොනවට සමතලා කොට වස්වා ඉන් පසු ඒ
69 ඉදිරියෙහි ම මහ මඩුවකුත් මොනවට කරවී. ඉක්බිති මහත් භක්ති ඇති
මිහිපල් තෙමේ එම වෙහෙර නොයෙක් වර සතුටු කරණ ලද මහ
70 ජනයා ඇති අලාමක නොයෙක් මල් පහන් බත් පූජායෙන් ද බෝධි
71 චෛත්‍ය සම්මුඛ පූජා තොට පින් ලද්දේයි. පසුව ද ඒ රජ තෙමේ ඒ
72 විහාරයට දවස් පතා පහන් පූජා පැවැත්වීම පිණිස ඊට ආසන්න පෙදෙස
මනෝ රම්‍ය වූ සශ්‍රීක මහ පොල් උයනක් සිය නමින් කරවා දෙවී ය.
73 ඉක්බිති රාජෝත්තම මිහිපල් තෙමේ අත්තනගලු නම් විහාරයෙහි ඒ
74 සිරිසඟබෝ රජ තෙමේ යම් තැනක දිළින්දා හට ශීර්ෂදානය දුන්නේ ද
75 එකල්හි එතැන ගොළු අබා නම් මිහිපල්හු විසින් දෙමහල් ඇති යම්
76 වටදා ගෙයක් කරණලද ද එය තුඟු එන් කොත් කැරලි ඇති තෙමහල්
77 කොට නැවත කරවී. එම අත්තනගලු වෙහෙර තමා පිය රජහුගේ ශරීර
නික්ෂෙප ස්ථානයෙහිඋතුම් සෑයක් කරවී ය. එහි ම නැවත අටැස්
පිළිම ගෙයක් කරවා එහි සෙල්මුවා සම්බුදු පිළිමයක් තැබ්බ වී.

78 සුගත් ලෝනා සම බුදුන් ජීවමාන කල එම බුදුහුගේ උතුම් මහා
79 පාංශුකුල චීවර දායාදය ද ලැබ උන් වහන්සේ ගේ ඇවෑමෙන් යමෙක්
80 තෙමේ ධර්ම රාජ්‍යය ගෙණ පරිපාලනය කෙළේ ද සම්බුද්ධ පුත්‍ර වූ ඒ
81 මහසුප් තෙරහුගේ එක් දළදාවක් පූර්වයෙහි කාල ක්‍රමයෙන්ම ලක්දිව්
82 පැමිණියා පස් යොදුන් රට බෙන්තොට විහාරයෙහි දනුදු සිටින්නේ ය
83 යනු අසා මහාධ්‍යාසය ඇති ඒ රජ තෙමේ ඒ තෙරුන් කෙරෙහි හටගත්
බැතිපෙම් හා ඉතා ගෞරව ඇතිව සිවුරඟ සෙනඟින් පිරවරන ලද්දේ
ඒ මහා විහාරයට ගොස් එහිඒ උතුම් දළදාව දක මනෝඥ වූ සුවඳ ඇති
84 අත්තන මල් වර්ගයෙන් ද එසේ ම පහනින් හාදුමින් ද බත් රැසින් ද
තෙදිනක් සාදරයෙන්සතුටු වෙමින් ධාතු පූජා පැවැත් වී.

ඉක්බිති "පුණ්‍යාකර වූ දේව නගර ප්‍රවරය දුන් උපුල් වන් දෙව්
85 නම් දිව්‍ය රාජයාගේ මන්දිරය බොහෝ කලක දී කරණ ලද්දේ හාත්පසින්
86 දිරණ ලද්දේ වෙයි." මිහිපල් තෙමේ මෙසේ අසා ඒ උතුම් නුරවට
87 ගොස් එහි දිව්‍ය රාජ භවනය ශක්‍ර භවනය සෙයින් අලුත් කොට මොනවට
කරවා සර්ව භෝගයන්ගේ ගෘහයක් කෙළේ ය. ඉක්බිති නරෝත්තම
88 තෙමේ එ නුවර දෙව්නුවර සෙයින් සොඳුරු වූ සියලු සම්පත් සම්පූර්ණ
89 කරවී. පසුව ඒ නුවර දිව්‍ය රාජයාට අවුරුදු පතා ඇසළ පෙළහර
පවත්වන්ට නියෝග කෙළේ ය.

90 ඉක්බිති මහ රජ තෙමේ රජ ජම්බුද්‍රෝණි පුරෝත්තමයට ම පෙරළා
අවුත් පිය රජහු විසින් කරණ ලද සිට විජය සුන්දර නම් වූ විහාරය

Non-Commercial Distribution

91 හාත්පස උත්තුංග ප්‍රාකාර ගෝපුරයන් කරවා පසුව එහි තෙමහල් දා
92 ගෙයක් අභිනව කොට කරවා එහි මහර්ෂිහුගේ දන්තධාතුව මාහැඟි
93 උස් පළඟෙක වඩා හිඳුවා සියලු සම්පත් සිද්ධ කරන්නා වූ තුනුරුවන්
විෂයෙහි මහා පූජාවක් පෙර කී ක්‍රමයෙන් ම සත් දිනක් පැවැත් වී.

94 ජීවමාන ශාස්තෘහුගේ රූපය බඳු වු සිත් කළු වූ එක් සුගත්
95 රුවක් දවස් පතා දක්නා කැමැති ඒ නරෙශ්‍රේෂ්ඨ තෙමේ නන් රුවනින්
යුත් මහ රුවන් සක්මන් සක්මන් කරන්නා වූ ජීවමාන භගවත්හු බඳු
96 අතුල්‍ය බුදුරුවක් මහත් චිත්‍රවස්ත්‍රයෙක පටුතර නොයෙක් චිත්‍රකාරයන්
97 ලවාලිය වී ය. පසුව මහා යසස් ඇති ඒ රජ තෙමේ ලක්දිව් වැසි සියලු
98 භික්ෂු සංඝයා ද මහජනයා ද එක් කොට පූර්වයෙහි ශ්‍රී වර්ධන
නගරවරයෙහි උක්තප්‍රකාරයෙන් මහත් බුදු පෙළහරක් සත් දිනක් පැවැත්
වී.

ඉක්බිති කඨින දානයෙහි අනුසස් අචින්ත්‍යයයි අසා පහන් සිත්
99 ඇති මහරජ තෙමේ එකල්හි "පරතෙර නැති බියකරු සසර මහ මුහුද
(තරණයට) එක් හෙයක් බඳු වූ ලෝ වැස්සා විසින් සත්කාර කරණ ලද
100 සකකුලට එක් කෙහෙළි බඳු වූ මුනිරාජන් වූ ශාස්තෘ වූ ලෝකස්වාමි වූ
සෘෂීහු වශී වූ ලෝකබන්ධු වූ (ලෝවැස්සා නෑ වූ) සුයශී බන්ධුහුගේ
101 මහානුභාව සම්පන්න අසූ මහසව්වන් උදෙසා මම වූ කී උතුම් අසූ
102 මහා කඨිනයක් දෙන්නමැ"යි මෙසේ සිතා නුවණැත්තේ ලක්දිව් වැසි
103 සියලු නරනාරි ජනයා රැස් කොට ඒ සියල්ලන් ලවා කපු සකස් කිරීම්
ආදි සියලු සිවුරු කර්මාන්තයන් ද වහා එක් දවසින් ම කොට නිමවමින්
104 කැප සියලු ගරු භාණ්ඩයන් විසින් පිරිවරණ ලද අසූ කඨිනවත් ඒ
තෙමේ දෙවී. දන් දීමෙහි විසාරද වූයේ ඒ සියල්ල සම්පාදනය කරවා
105 තාම්‍රපර්ණී දිවයින් වැසි සියල් තෙරුන්ට දී අසූමහ සව්වන් වහන්සේලාට
106 වෙන් වෙන් කොට ඒ දවස්හි ම අසූමහ පුදක් ද කරවී. මෙසේ ම
107 නොයෙක් වර ඒ තෙමේ බොහෝ කඨිනයන් මහසඟනට දී මහ පින්
108 වැඩුයේ ය.

ඉක්බිති ඉතා ප්‍රසන්නතර අදහස් ඇති ඒ රජ තෙමේ නොයෙක්
109 වර ලක් රජයෙන් සම්බුදුන් පුදමැයි සිතා තමාගේ රාජ භවනය දේවේන්ද්‍ර
110 භවනය සෙයින් සරහා පුරය ද දෙව් පුරය සෙයින් සකස් කොට සදා
පසුව ඒ රජගෙහි මාහැඟි සිංහාසනයෙහි මහර්ෂිහුගේ දළදා
111 ස්වාමීන්වහන්සේ වඩහිඳුවා නොයෙක් සෙමරින් සහ සැතින් ද නොයෙක්
112 රුවන් ඔටුන්නෙන් ද නන් අබරණ වතින් ද නන් රුවන් රැසින් ද
113 නානා ඇතුන් හා නානා අසුන්ගෙන් ද නොයෙක් පදිකසේනා හා

Non-Commercial Distribution

114 රථයෙන් ද නොයෙක් බෙරහඬින් හා නොයෙක් සක්හඬින් ද නොයෙක්
115 ධජ පතාකා හා නොයෙක් කදලි පංක්තියෙන් ද නොයෙක් කිරිබඳතින්හා
116 නොයෙක් පුෂ්පවෘක්ෂයෙන් ද ඉතා අගනා ගඳ මලින් හා ඉතා අගනා
117 අවුළු ජාතියෙන් ද ඉතා අගනා පහන් දුම් හා ගඳින් ද මේ ආදි රාජාර්හ
වූ යොයෙක් වර්ගයෙහි සියලු වස්තුවෙන් සාදර (කොට) ලක්දිව් වැසි
මහා භික්ෂු සඞසයා, කැටි කොට සත්සියයක් මහපුද පැවැත්වී.

118 ඉක්බිති රාජශ්‍රේෂ්ඨ තෙමේ චතුරංග බලසේනා හා පච් සිළු මිණි
119 සමන් කුළට ගොස් එහි දේවාතිදේව වූ ධර්මරාජන්වූ ශාස්තෘන්
වහන්සේගේ දිව්‍යාදීන් විසින් වැන්ද යුතු වූ ඒ පද ලකුණු වැඳ ඒ ගිර
120 හාත්පස දස ගවු පමණ තැන් නන් රුවනින් සුපුන් නරනාරීන්ගෙන්
121 ගහණ වූ දනව්ව භක්තියෙන් ඒ ශ්‍රී පාදයට පුදා නැවතත් එය රුවන්
අබරණින් ද පිදී ය.

මෙසේ බුදුන් කෙරෙහි සැදැහැ ඇති නුවණැති රජ තෙමේ සසර
122 කතර තරණයෙහි හෙයක් බඳු වූ ද දෙව්ලොවට නැගෙන හිණි බඳු වූ
ද උස් උස් සියල් පින් රැස් කෙළේ ය.

මෙතෙකින් හුදී ජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
විවිධ කුසල කරණ නම් වූ අසූ පස්වන අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ හය වෙනි පරිච්ඡේදය

1 පසුව (රජ තෙමේ) "සියලු ලක්දිව රජය අනුශාසනා කරණ මට
දූත් ඒ ඒ තැන හැසිර සාදරයෙන් සිද්ධස්ථානයන් වැඳ රිසි වූ පරිද්දෙන්
2 දවසක් පාසා පින් කරන්ටත් ලෝකෝපකාර කරන්ටත් සර්වප්‍රකාරයෙන්
උරුමයි. මාගේ අදහසට එකඟ ව පින් රැස් කරන්ටත් ලෝකෝපකාර
3 කරන්ටත් කවර ඇමතියෙක් තෙමේ සමර්ථදෝ" (යි සිතා) "දේවප්‍රතිරාජ
4 නම් වූ මාගේ මේ ඇමති තෙමේ බුදුන් කෙරෙහි ද ධර්මයෙහි ද සඞ්ඝයා
5 කෙරෙහි ද පහන් වූයේ දූන් පවතියි, බුදුබව පතා ඉටන් කරන්නාවූ
මොහු විසින් හිඳුවන ලද ඒ පොල් පලයෙහි එකල තුන් ඇස්සෙන්
6 පොල් පැල තුණක් නැංගාහ. කරුණාබර මේ තෙමේ ඒ එක් දිළින්දෙකු
7 දූක තමා අඹුදරුවන් හා සියලු සම්පත උහුට දී "මම බුදුවන්නෙමි" යි
8 පැතී ය. එහෙයින් මේ තෙමේ මා අදහස් ඇදින සම්පූර්ණ කරන්නේ
ය." මෙසේ සිතා උහු කැඳවා මේ මතු දක්වන ආකාරය කීයේ ය.

9 (මෙරමා) "වසෙහි පවත්වන අනිෂ්ටමාරයා විසින් මවන ලද්දා
10 බඳුවූ පඞ්කදුර්ග, ජලදුර්ග, ගිරිදුර්ගයන් විසින් සමන්කුළු යන්නා වූ මේ
ශරණි තොමෝ ඒ ඒ තැන අවුරණ ලද්දී ඉතා දුකින් යායුතු වූවා මුනිහු
11 පා වැඳ පුණ්‍ය සම්පත් රැස්කරණට යන්නා වූ අටළොස් දෙ වැසි
සත්වයාට දුක් උපදවයි. එහෙයින් එය තෝ මනා මගක් කර වැලි
12 අත්තනගලු නම් වෙහෙර පූර්වයෙහි තමා පින් තෙදින් අහසත් පොළොවත්
ගුගුරුවා යම් තැනෙක මහර්ධි ඇති එක් මහතෙර කෙනෙක් රහත්
13 බවට පැමිණි සේක් ද, එතැන උපතිස් රජු විසින් පස් මහල් පහයක්
තෙමේ රන්උළු සෙවෙනි ඇත්තේ එකල කරවන ලද්දේ ඒ පහය තෙමේ
14 කාල ක්‍රමයෙන් නටුයේ දූන් ටැම් පමණක් ඉතිරිව සිටින්නේ ය යි මා
15 විසින් අසන ලදී. පින්වත, තෝ එයද මාගේ නමින් අලුත් කොට
16 තනව. බෙන්තොට වෙහෙරක් නිශ්ශඞ්ක රජහු විසින් වූකලි
17 එලෝද්‍යානයක් කරවන ලදී. එසේම මා නමින් පොල් ආදියෙන්
සම්පූර්ණවූ එක් මහ උයනක් රෝපණය කර" කියා ඒ ඒ පින්කිරියෙහි
18 උහු යෙදූයේ ය. ඒ තෙමේ එසේ යයි පිළිවදන් අස්වා එකල ගඟ
සිරිපුරට ගොස් එහි දී පළමු කොට මනා සර්වාඞ්ග ලක්‍ෂණ ඇති සමන්
දෙව්රුව කරවා රන්රුවන් අබරණින් එය සිත්කළු කොට අලංකාර
19 කෙළේයි. එකලපසුව සමන්කුළු යනු කැමැත්තේ ඒ දෙව්හු ඒ රුවන්
20 පෙළහර සමග ගෙණ ඒ තෙමේ නික්ම බෝතල නම් ගමට ගොස්
21 එතැන් පටන් ම හේ බඳනට පටන් ගත්තේ ය. හේ තෙමේ කදෝ
22 හොය මුවදොර පන්තිස්රියන් පමණ වූ (හෙයක් ද) එම හොය එසේ
23 තිස්රියන් දික් (හෙයක්) ද එසේම උලපත ගම්හි සතිස් රියන් දික් (හෙයක්

Non-Commercial Distribution

ද) යම් සේ ඇත් අස් ගෙරි මීවුන් ආදීන් විසින් යන්ට හැක්කේ ද එසේ
24 එකල බැඳවී. ඒ ඒ මහහෙය බැමි මත්තෙහි උස් ටැම් ආදියෙන් හෙබියාවූ
25 සොඳුරු මහ ගෙවල් කරවා ආරාධනා කොට බොහෝ භික්ෂූන් එක්
26 කොට ඒ ඒ තන්හි ඒ භික්ෂූන්ට මහදන් දී මහ පුද පැවැත් විය.

27 සෙසු තන්හි නොයෙක් පරිද්දෙන් අම්බලම් කරවා එසේම පාලම්
28 තනවා පාද පාසාණයන් තබ්බවා මහ වනය කප්පවා මහා මාර්ගය
29 කරවා සමන් කුළට ගොස් පා සළකුණ වැඳ ශ්‍රීපාද චෛත්‍යාංගන
30 භූමියෙහි දෙව්රුව පිහිටුවා එ තෙමේ ශ්‍රි පාද මණ්ඩපය ද කරවී. මහනුවර
31 ඇති ඒ තෙමේ ඒ හාත්පස පවුරුද බඳවා ඉන් මත්තෙහි ඒ මණ්ඩප මහ
32 හැකිලිදමින් යටැම්හි දඬි කොට බඳවා එයින් පසු සිරිපතුල් පහන්
33 ආදින් තුන් දිනක් පුදමින් තමා මස්තකයෙන් ද සුවඳ තෙල් පහනක්
34 ගෙණ සිය හිමි මහරජහු නමින් වදිමින් ඒ ශ්‍රී පාදය හාත්පස පැදකුණු
35 කොට මුළු රැය (පහන්) පැවැත් වී ය. මේ සියලු ප්‍රවෘත්තියත් ආදියෙහි
36 පටන් ක්‍රමයෙන් ඉතා උස් ගල්ටැඹෙක ලියවා පසුව ඒ ටැඹ පරාක්‍රම
බාහු මහාරාජාධිරාජයාගේ කීර්තිස්තම්භයක් සෙයින් සතුටින් ඒ තෙමේ
එහි පිහිට වී. පරිපූර්ණ මනෝරථ ඇති ඒ තෙමේ පසුව ඒ සියලු පවත්
රජහට දූත මුඛයෙන් දන්වා යැවී ය.

37 ඉක්බිති ඒ තෙමේ අත්තනගලු වෙහෙරට ගොස් රජහු විසින් කී
38 නියමයෙන් බොහෝ ධනව්‍යය කොට තුඟුසිය ඇති තෙමහල් පහයක්
කරවා ප්‍රඥා සම්පන්න අනොමදස්සී නම් මාහිමියන්ට ඒ පහය දී පසුව
39 උන්වහන්සේට මහරජහු නියොවින් දන්වැට ද තබ්බවා ශිලාලේඛනයකුත්
40 කරවී. ඉක්බිති මහ ඇමති තෙමේ බෙන්තොට පටුන් ගොස් කාළි හෝ
41 මුවදොර අසූ රියන් මහහෙයක් ද කෙහෙල්සෙන් ගම්හි සියක් යටි මහ
42 හෙයක් ද සල්ගමුගඟ සතළිස්යටි හෙයක් ද සල්රුක් හෙබ එක් සිය
43 පණස් රියන් හෙයක් ද මේ ආදි වූ පාලම් යා නොහෙන ඒ ඒ තන්හි
බඳවා එසේ ම බොහෝ වූ ආරාම හා ධර්මශාලා දීන් කරවා මහ දෙන්
හා පූජා පැවැත් වී.

44 ඉක්බිති රජ මහ ඇමති තෙමේ බෙන්තොට වෙහෙර පටන්
45 කළුගංතොට දක්වා යොදුනක් පුළුල් තන්හි පරාක්‍රමබාහු නමින් ප්‍රසිද්ධ
46 කොට මහා සෙවණැති එලයෙන් හරිත වූ මහත් පොල් උයනක් කරවීය.
47 ඒ ඒ රට කපු (කැටීම්) වියමන් ආදි වූ සියලු කර්මාන්ත කරවා එක්
දවසම නිමවා මහා යසස් ඇත්තේ මහැගි සවිසි කඨිනයක් භික්ෂු
සංඝයාට දී මහත් පූජාවක් ද කරවී. ඒ තෙමේ මෙසේ ම (දානාදිය)

Non-Commercial Distribution

48 දෙමින් ඒ ඒ තැන හැසිරෙමින් නැවත සැටක් කඨින (චීවර) යන භික්ෂු
සංඝයාට දුන්නේ ය.

49 ඉක්බිති ඒ තෙමේ මාදෙල් ගස් නම් මහවනය මුල් සහිත සියල්ල
50 සින්දවා එහි තුන්මහල් එක් පිළිම ගෙයක් ද බෝධිය චෛත්‍යය, ආරාමය
ය න මේ පවුරු වළල්ලෙන් වෙළන ලද්දක් කරවා රජහු නමින් මහා
51 පූජාත් කරවී. රාජනප නම් ඇත්තේ එසේ ම මහ පින් කොට පෙරළා
52 අවුත් ඒ සියල්ල රජහට දුන් වී ය. ඉක්බිති ඒ රජ තෙමේත් උහු
කෙරෙහි හටගත් මහා කරුණා ඇත්තේ මාදෙල් ගස් නම් ගම ආදි වූ
53 බොහෝ වූ උහු විසින් කරවන ලද ගම් උහුගේ ම කුලසන්තක කොට
54 දී පසුවත් උහු ගෙණ ධාතුමන්දිරයට ගොස් සඟ මැද "මාගේ මේ
55 ඇමති උතුමා තුණුරුවන් කෙරෙහි ද මා කෙරෙහි ද හැම කල පහන්
56 සිත් ඇත්තේ ය. එහෙයින් මේ තෙමේ බුදුනට හා රජහටත් හිත
57 සෙවනයෙහි තත්පරකම් ඇත්තේ ප්‍රිය ද මනවඩන්නේ ද වෙයි. එහෙයින්
මම ද ප්‍රිය වස්තුවෙන් දළදා වහන්සේ පුදමි" යි කියා අඹුදරුවන් සහිත
ඒ ඇමති උතුමා බුදුන් දළදාවට දින.

58 මෙසේ එතැන් පටන් ඒ මධ්‍යම ලෝකපාල තෙමේ උතුම්
දේප්‍රතිරාජ නම් උහු ලවා ම නන්වැදෑරුම් මාහැඟි පූජාවස්තුවෙන්
ලෝ වැස්සා විසින් පුදන ලද තෙරුවන් සතතනයෙන් පිද විය.

මෙතෙකින් හු දී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස විවිධ
කුසල කාරාපන නම්අසූ සවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ හත් වෙනි පරිච්ඡේදය

1 කිසි කලක ලක්දිව්හි අවග්‍රහ වශයෙන් සියල්ලවුන් සන්තෘප්ත
2 කර හේතු වූ මහා ග්‍රීෂ්මයක් හටගත් කල ශස්‍යයන් මැලවෙන කල
ඉක්මිය නොහැකි දුර්භික්ෂු ඇති කල සියලු ලක්දිව් වැසි මහජනයා
3 අතිශයින් බියපත් කල රජ තෙමේ වූ කලී එකල්හි
තුනුරුවන්චෛත්‍යබෝධීන්ට ද මහර්ධි ඇති නාථ මෛත්‍රිය දේවාදි
පූජනීය දෙවියන්ට ද නන්වැදෑරුම් පූජායෙන් සියලු ලක්දිව එක් උතුම්
4 පූජාවක් කරවා පුද පෙරදැරි කොට බික්සඟහු එක්කොට පිරිතුදු බණවා
5 මර්ෂීහුගේ දළදාවහන්සේ වඩාගෙණ නුවර මොනට පැදකුණු කරවා
6 ඉන්පසු ඒ තෙමේ "වර්ෂාව වසීවයි" මෙසේ අධිෂ්ඨාන කෙළේ ය.

7 එකල්හි වනාහි ඒ ඒ දිගින් මහා වලානැගෙන්නෝ විදුලියෙන්
8 නැවත නැවත අතිශයින් දිලසෙන්නෝ ම සකල ලෝකයාගේ කන්
සිත් පිනවමින් නැවත නැවත ගුගුරන්නාහු මහ ගිම් සනන්නාහු මහජනයා
9 සතුටු කරන්නාහු දුර්භික්ෂය කෙලෙසන්නාහු දිශාන්තරය හොබවන්නාහු
10 ශස්‍යයන් අස්වසන්නාහු වසන්ට ගත්තු. "බුදුන්ගේ ආනුභාවයෙන් අපගේ
11 චිත්තානන්දදායක වූ මේ වැසි වලායෝ මෙසේ වසිති. එහෙයින් මේ
12 බුදු ගුණයෝ මෙපමණයෝ යි දන්නට දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යයන් අතුරෙහි
කවරෙක් පණ්ඩිත වෙත් ද? අපගේ රජ තෙමේ ත් මහ තේජස් මහර්ධි
13 ඇත්තේ ය. මොහු හා සදෘශ රජෙක් නුවුයේ ය. (මතුද) නොවන්නේ
ය. මෙසේ ම මුනිරජුන්ගේ ගුණය ද රජහු ගුණට ද කියා කියා එකල්හි
14 ලක්දිව් වැසි මහජනයෝ ප්‍රශංසා කළහ. මෙසේ ධර්මයෙන් ලෙව්
15 සසුන් පරිපාලනය කෙරෙමින් තමාගේ ආත්ම භාවයත් සාරවත්
කරන්නේ ම කලක් රජසිරි අනුභව කෙරෙමින් එක් කලෙක ඒ රජ
16 තෙමේ තමා බුහුනනියන් දරු විරබා කුමර හා පුත්‍ර වූ විජයබාහු ය,
17 එසේ ම බුවනෙකබාහු ය, තිලෝකමල්ල නම් එසේ ම පරාක්‍රමබාහු ය,
ජයබාහු ය යන මේ පේසල කුමාරයන් පස්දෙනා කැඳවා මොවුනට
හෙතෙම මෙසේ අවවාද දෙන්ට පටන් ගත්තේ ය.

18 "දරුවෙනි, මා බස් අසව්, මේ ලෝකයෙහි පුත්‍රයෝ වූ කලී
19 අවජාතය අනුජාතය අතිජාතය යි කියා මේ තිදෙනෙක් වෙති. ඔවුන්
අතුරෙන් යමෙක් මවුපියන්ගේ වංශ ක්‍රමයෙන් වඩන ලද්දා වූ ඉසුරු
20 ගුණයට එකඟව අනුභව කරනට දක්ෂ වූවාහු වඳුරන් මල්වඩමක් සෙයින්
නසා නිඃශ්‍රිකව හැසිරෙත් නම් ඒ දරුවෝ අවජාතය හයි පුරාතන
21 පණ්ඩිතයෝ කීහු. යමෙක් එබඳු සම්පත්තයක් ලැබ මවුපියෝ යම් සේ
22 නම් එසේ ම එබඳු කරන්නෝ කුල ක්‍රමයපාලනය කෙරෙද්ද ඒ දරුවෝ

Non-Commercial Distribution

23 අනුජාත යහයි දනිව්. නැවත අන්‍යයා මම කියමි. යමෙක් කුල ක්‍රමයෙන්
රැකී සම්පත් සමගම නැවත අන්‍යවූත් එයින් වැඩි බොහෝ සම්පත්
24 උපයා සැප විඳිද්දී, ධීර වූ ඒ දරුවෝ අතිජාත යහ යි ප්‍රකටයෝ යි ම
25 විසිනුත් පියහු දුන් එක් මායාරට ගෙණ දූන් අනීක් දෙරටත් දිනා වැලි
26 නිරවශේෂ රාජ්‍යත්‍රම එක් සේසතින් ලකුණු කරණ ලදී. වැලි උහු
විසින් දිනිය නුහුනු සියලු දෙමළු ම පරදවල ලද්දාහ. ගිරිදුර්ගාදීන්
ඇසුරු කොට ගෙන ඒ ඒ තැන වස්නා වූ සියලු වන්නි රජ දරුවෝ ම
27 මා වෙත ගෙන්වන ලද්දා හ. සියලු දේශාන්තරයෙහි ම කීර්තිය පතළ
28 කොට මෙසේ දහම් නයින් ම කලක් මා විසින් කරණලද්දේ ය. පඬුරු
සහිත රාජ කන්‍යාවන් දඹදිවින් ගෙන්වා පරදේශයෙහි ක්ෂත්‍රියයනුත්
තොප නෑයන් කෙළෙමි.

29 චන්ද්‍ර වංශ සූර්‍ය වංශෝද්භූත වූ පාණ්ඩව චෝළිය (ආදි) වීර වූ
රජ දරුවෝ කිරුළු අබරණ ද මා වෙත එවූහ. හුදක් මේ තොප
30 සියල්ලවුන් විසින් පමණක් නොව එන කාලයෙහිත් සත් මුනුබුරු
31 පරම්පරාව දක්වා වින්ද යුත්තා වූ වෙසවුණු රජහු විසින් සංඛාදි නිදන්
32 නවය සෙයින් මා විසින් රැස් කරණ ලද රුවන් ඇත්තාහ. දනෝ මා
විසින් නිග්‍රහ කරණ ලද්දාහ. සජනයෝ ද පරිපාලනය කරණ ලද්දාහ.
බුදු සස්න ද මොනවට සමගි කරණ ලද්දේ ය. එහෙයින් මම පියරජහුගේ
33 අතිජාත පුත්‍රවීමි. දරුවෙනි, තෙපි ද මා බඳු වූ අතිජාත පුත්‍ර වව්. පෙර
34 ඔකාවස් පරපුරෙන් පැවති සගර රජහුගේසැටදහසක් පුත්‍රයෝ එතෙක්
35 රාජධානීන් නිපදවා සියලු දඹදිව සැටදහසක් විභාගයෙන් බෙදාගෙණ
36 වෙන් වෙන් වූ රජය සමගිව ම කළහ. ඒ දසබෑ රජ දරුවෝ ද පෙර
37 කීවාක් සෙයින් ම දඹදිව දස කොටස් කොට මොනවට රජ කළහ.
පින්වත්නි, එසේ ම තෙපිදු සුදුසු පරිද්දෙන් මේ ලක්දිව බෙදාගෙණ
38 උනුන් අනුසාසනා කරන්නෝම මොනවට රජය කරවු. දරවෙනි
සර්වප්‍රකාරයෙන් පරසතුරන්ට සිදුරු නො දක්වව්" මෙසේ ඖරස
පුත්‍රයන්ට හා බෑනට අවවාද කෙළේ ය.

39 ඉක්බිති ඒ රජ තෙමේ මහාසංඝයා හා මහජනයා රැස් කරවා "
40 මාගේ බෑණානුවන් හා ඖරස පුත්‍ර වූ මේ රජ දරුවන් සදෙනා අතුරෙන්
41 කවරෙක් රාජ්‍යයට යෝග්‍යද?" යි විචාළේ ය. එකල්හි රජහුගේ ඒ බස්
42 අසා මහාසංඝ තෙමේ (දන්වන්නේ) "මහරජාණෙනි, භවත්හුගේ මේ
43 කුමාරයෝ ය, මේ බෑනය යන මොහු සියල්ලෝ ම ධීරවීර ගුණ ඇති
බහුශ්‍රැතයෝ ය. සියල්ලෝ සංග්‍රාමවචරයහ, පරසතුරුන් මඩනෝ ය.
44 ලෙව් සසුන් රක්නෝ රාජ්‍ය යෝග්‍ය ම වන්නාහ. එසේ ද උවත්
භවත්හු දෙටුපිත් විජය බා (කුමර) බාල්‍යාවස්ථායෙහි පටන් තුනුරුවන්

Non-Commercial Distribution

45 කෙරෙහි ප්‍රසන්නය. ගිලන් මහණුන් උවටන්හි නිතොර එළඹ සිටි සිත්
ඇත්තේ ය. සත්‍යයෙන් සත්‍යය ස්කධ්‍යාන කෙරෙහි ය. කෙළෙහිගුණ
46 දන්නේ ද වෙයි. උසස් වූ සැදැහ පැණ ගුණ ඇත්තේ ය. මහලු දුබල
47 සතුන් අතුරෙන් අසරණයන්ට ආදරය එසේ ම දුප්පත් සතුන් කෙරෙහි
48 අතිශය කරුණාපරය. තව ද ඒ තෙමේ ඒ රාජාන්තරය වූ කල දාසභාවයට
පමුණු වන ලද භික්ෂු සංඝයාගේ බොහෝ නැයන් ද අන්‍යවුත් බොහෝ
49 ජනයන් ද උන් ස්වාමීන්ට රන් රුවන් ආදිය දී ඒ දාස භාවයෙන් මිදවී.
තවද මහරජාණෙනි බොහෝ සොරහු රජගෙහිත් සොරකම් කොට
50 නිග්‍රහ යෝග්‍ය වූ කල ඔහු වෙතට ම පැමිණ තැති ගැන්ම බය ද දමා
51 නිරුපද්‍රව වූවෝ අංග හානියට ද නොපැමිණ ජීවිතයත් ලද්දාහ. (තව
52 ද) මහරජාණෙනි, ඒ ඒ ගම්හි රාජයත්ත සුංකම් ගෙණ සොර වූ මිනිසුනුදු
53 දුක උන්ට ස්වකීය ධනය දී දුක් පත් සියලු ජනයා ඒ ඒ සුංකමින්
නිදහස් කොට ලෝක පාලයෙහි පණ්ඩිත වූයේ නිත්‍යයෙන් පාලනය
කෙරෙයි. පළමු කොට උහු දුක නිර්භය වූවෝ ම තොප දකිති. "එන
54 කාලයෙහි වූ කලී අප කුල පරම්පරාව රක්නා වූ ඒ විජයබා කුමරහු
55 මෙතැන් පටන් නිරතුරුව දැඩි භක්ති ඇතිව තෙපි සේවය කරව්"යි
මෙසේ කියා ඇමති කුලඟනෝ, කරණලද ආදර ඇති තම තමා
56 වල්ලභයන් හික්මවති. යම් මවු පිය කෙනෙක් දෙතුන් අවුරුදු බාල
දරුවන්ගේ මිහිරි බොළඳ තෙපුල් අසනු කැමැත්තෝ නම් එබඳු මවුපියන්
57 විසින් "තෙපි කවරක්හු සේවනය කරව්ද" විචාරණ ලද දරුවෝ "අපි ඒ
58 විජයබා කුමරහු සේවනය කරන්නෙමු"යි කියති. කෝපයෙන් මවුපියන්
59 විසින් තළන ලද දරුවෝ (උහු වෙත) ආවෝ තම තමා දුක් කුමරහට
කියති. එකල්හි විජයබා කුමර තෙමේ ද කරුණාවෙන් උන් කැඳවා "
60 මෙතැන් පටන් තෙපි ඒ දරුවන්ට නොතළව්"යි මෙසේ කියා තමාගේ
ඒ භාණ්ඩාගාරයෙන් ම ඒ ඒ දරුවන් බත් වැටුප් ද දෙවී. ඇස් ඇති
61 පුද්ගලයෙක් තෙමේ පුන්සඳ සහිත අහස බලා "පුන්සඳ මෙහි කොයිද"යි
62 විචාරන්නා සේ ඒ කුමරහු කෙරෙහි රාජ්‍ය රංජනය කරණ සුලු ගුණයෝ
63 විද්‍යාමාන වූවාහු යයි දැන ගණිත් පින්වත් මහ රජාණෙනි. තෙපි
සංඝයා කෙසේ විචාරව්ද ? පින්වත් මහරාජාණෙනි, ඇසුව මැනව,
හුදෙක් ලක්දිව් පමණක් නොවෙයි. දඹදිව් පාලනයට දැඋහු පිළිබඳ ශුභ
ලක්ෂණ ඇත්තේ ය යි දැන්වීය.

64 උහු පිළිබඳව මේ ආදී බොහෝ ගුණයන් සංඝයාගේමුඛයෙන්
65 අසා සතුටු කඳුළෙන් තෙමුණු ඇස් ඇත්තෙක් විය. එකල්හි රජ තෙමේ
66 සන්තෝෂයෙන් ඒ විජයබා පිතු කැඳවා සමීපයෙහි සමාන අස්නෙක
67 හිඳුවී. ඉක්බිති මහ රජ තෙමේ තමාවිසින් නොකරණ ලද යම් ලෝක
ශාසන කෘත්‍යයෙක් වී නම් ඒ සියල්ල මෙසේ උහුට දැන්වී. "පරසතුරන්

Non-Commercial Distribution

විසින් රුවන්වැලිසෑය බිඳ හෙලන ලද්දේ ය. එය පෙරළා බඳවා රන්
68 කොතින් සරසව සිංහලාධිපතීන්ගේ යම් පුරාතන රාජධානියක් තොමෝ
69 සියලු නගරණිට තිලකවී ද උතුම් ඒ පොළොන්නරුව තුඟු පවුරු දොරටු
70 හා මොනවට බෙදන ලද සිවු දොරටු හා ගැඹුරු පිරියෙන් පිරිකෙව්
කරණලදුව පෙර පරිද්දෙන් කරව. එහි දිව්‍යාගාරයක් සෙයින් මනෝහර
වූ පෙර දළදා ගෙහි ඒ දළදා පාදා දෙදෙනම පිහිටුව. මම ද පූර්
71 රජුනගේ මේ රාජධානියෙහි ම අබිසෙව් පෙළහර කරන්ට කැමැත්තෙමි.
72 ත්‍රිසිංහල ගත වූ සියලු බික්සඟහු ද මහ ජනයා ද දහස් තොපට පමුණාවා
73 එහි මහාපූජා පෙරටු කොට මහවැලි ගඟ උපසම්පදා මංගලය්‍ය කරවා
74 තෝ බුදු සස්න සමෘර්ධිකර"වයි යන මේ ආදි වූ සියලු ලෝක ශාසන
කර්තව්‍යය උහුට කියා උහුඅත්හි ඇති හේ තෙමේ රාජ්‍යභාරය තැබූ යේ
යි.

75 ඉක්බිති රජ තෙමේ ඉතිරි පස් රජ කුමරුන් ද මුනි උතුමාගේ වර
දළදා පාදා යන ඒ දෙදෙන ද ශ්‍රමණ සමූහය ද සියලු අමාත්‍ය වර්ගය ද
ලංකා පෘථිවියෙහි ද උහුට ම පාවාදිනි.

මෙතෙකින් හු දී ජනයාප්‍රසාද සංවේග පිණිස කළ මහවස
රාජජභාර රෝපන නම්අසූසත් වෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ අට වෙනි පරිච්ඡේදය

1 එකල්හි නිර්භය සිත් ඇති ඒ විජයබා රජ තෙමේ ද ඒ එසේ යයි
2 ප්‍රතිවචන දී රාජ්‍යය භාරගත්තේ යි ඉක්බිති ඒ තෙමේ (තමා) "අතිජාත
3 පිත් බැව් ජීවත් වන්නා වූ ම ඒ පිය රජහට දක්වන්නෙමි ය"යි සිතීය. "
4 ස්වාමී අමාත්‍ය සුහාත් ආදි වූ මේ සප්ත රාජ්‍යාංගයන් අතුරෙන් මිත්‍රාංග
යෝග්‍ය වූ ඇදහිලි ඇති සම්මන්ත්‍රණයෙහි විසාරද වූ විපත්ති දී එක්ව
5 වැටෙන සත්‍යවාදී ප්‍රියංකර වූ කවරෙක් තෙමේ දූන් මට ඇත්තේ
දෝහෝ"යි නැවත නැවත විමසා "පියහු බුහුනනියන් පුත්‍ර වූ වීරබාහු
ආදිපාද තෙමේ වූ කලීපණ්ඩිතය. ගුණයෙනුදු හෙබියේ සර්වකෘත්‍යයෙහි
6 කෝවිද වූයේ ද විද්‍යාමානය. ඒ මේ තෙමේ වැලිකෙළිනා දවස් පටන්
7 අද වන තෙක්ම මා කෙරෙහි ද සුදනන් කෙරෙහි ද ඒකාන්ත විශ්වාසය
8 කෙරෙයි. හේ තෙමේත් මා නො දක්නේ කිසි තැනක සිටිනට නො
9 හැක්කේ ය මම ද උහු නොදක්නෙම් ඉන්ට නො හැක්කෙමි. ඒ තෙමේ
ද ඥාණබල කායබලාධික වූයේ ලෙව් සසුන් වඩන්ට මා සෙයින් ම
උත්සාහ කෙරෙයි. එහෙයින් ඒ තෙමේ මිත්‍රාංගයෝග්‍යය" යි දූන එකල්හි
උහු කැඳවා සම්භක්ත මිත්‍ර ස්ථානයෙහි යෙදූයේ යි.

10 ඉක්බිති මා විසින් අතිශයින් උස්වූ මනහර පින්කම් කටයුත්තේ
11 මය. දළදා පාදා යන ඒ දෙදෙනා මට පාවා දෙන ලද්දා හ. එහෙයින්
ඒ ධාතුන්ගේප්‍රාසාදය තෙම අභිනව කොට මා විසින් කටයුත්තේ ය.
12 වැලි පියරජුන් විසින් කරවන ලද පුරාතන දාඨාධාතු මන්දිරයත් පිණිස
13 එහෙයින් එයම අලුත් කොට කරවන්නෙමැයි සිතා සියලු සිප්කම්හි
නුවණැති බොහෝ ශිල්ප සමූහයන් ද අන්‍ය වූ බොහෝ කම්කරුවන් ද
ඒ ඒ තැනින් රැස් කොට පූර්ව කර්මාන්තයටත් වඩා දෙගුණ නූ දකුම්
14 කටයුතු වූ නවකම් කරවා දිව මැදුරක් සේ සොඳුරු වූ සියලු දළදා
15 මැදුර නිමකරවා ඒ තෙමේ එහි සම්බුදුහු ධාතුද්වය පිහිටුවා ඉක්බිති
16 පූර්වයටත් වඩා ධාතුන් පිළිබඳ මහපුද දවස් පතා පවත් වන්ටත් එහි
ආරක්ෂාවත් නියෝගකෙළේ ය.

17 එතැන් පටන් ඒ රජ තෙමේ සිය පියරජහුගේ ප්‍රේමය විගුණ
ත්‍රිගුණ කොට නිරතුරු වැඩ වී. තමාගේ පිය රජහට පුත්‍ර වියෝගයෙන්
18 හටගත් ශෝකයෙන් නහමක් වේව" යි සිතා පැරකුම්බා ය එසේම
19 ජයබා ය යන මේ සිය මලුත් දෙදෙනා මිහිපල් තෙමේ සැමකල්හි පියහු
20 සමීපයෙහි වැස්වී ය. ඉක්බිති ඒ තෙමේ තිලොකමල්ල නම් වූ සිය මලු
21 කැඳවා දඹදෙනි පුර පටන් යම්තාක් දකුණු සයුර ද යන මේ අතුරෙහි
22 විද්‍යමාන වූ සිංහල සේනාව උහුට අනුවර්තනය කොට දී පිය රජ හට

Non-Commercial Distribution

දක්ෂිණ දිශාන්තරයෙහි ආරක්ෂා කරණයට එකල්හි උහු මහ වත්තල
23 ගම්හි සිටවී. මිහිපල් තෙමේ උතුරු දිශාභාගයෙහි "කුඩා වැලිගම් හි ඒ
24 සතුරෝ පරතෙරින් බොහෝසේ බසිති. සංග්‍රාමෝපායෙන් බිහිසුණු ඒ
25 දිග පරිපාලනයට භුවනෙකබාහු නම් වූ මා මල් රජු හැර කවරෙක් හෝ
ඇත්තේද?" සිතා උහු කැඳවා උහුට උතුරු දිග පවත්නා බොහෝ
26 සෙන්දී පියරජ හට ඒ දිශාමුඛයෙහි අරකුන් කරණ පිණිස යාපව්වෙහි
සිටිනට නියෝග කළේ ය.

27 ඉක්බිති එ රජ තෙමේ තුමූ ම වීර (කුමරු) හා සැරසුනේ "ඒ ඒ
තැන හැසිර සියලු දුර්ජනයන් මැඩ ලක්දිව නිෂ්කණ්ටක කොට පසුව
28 පියහු අනුරති ලැබ පොළොන්නරු නුවර කරවන්නෙමැ" යි නික්මිණි.
29 එකල්හි එ පැරකුම්බා මහරජ තෙමේ ද පුත්‍ර ප්‍රේම නමැති මහ වතුරෙන්
30 ගෙනයනු ලබන්නෙකු සේ පිය රජුගේ අනුගමනය පිත්හු නොකැමැති
31 කල්හිම සාදර කෙරෙමින් දයා පරවස වූයේ පසු පස්සෙහි යන්ට ආරම්භ
32 කෙළේ ය. පසුව ඒ තෙමේ පිය රජු නැවත නැවත වැඳ බලාත්කාරයෙන්
නවත්වා යන්ටම නික්මිණි.

33 නැවත රජ තෙමේ "මා පුතු කරෙහි යම් ජන කෙනෙක් පෙම්
34 කෙරෙත් නම් ඔහු සියල්ලෝ ඒ අනුව 'යෙත්ව" යි නියෝග කෙළේ ය.
35 එකල්හි රජහු එබස් අසා ප්‍රමෝද්‍ය බහුල වූ සියලු රාජාමාත්‍යයෝ ද
සියලු සෙනෙවියෝ ද එසේම සියලු මහා විර යෝධයෝ ද එසේම
සියලු ඇතුන් නැගෙන්නෝ ද සියලු අසුන් නැගෙන්නෝ ද එසේම
සියලු රිය නැගෙන්නෝ ද "අප බෝසත් විජයබා (රජ) පොළොන්නරු
නම් රාජධානිය කරවන්ට දැන් යන්නේය. ඉදින් ඒ තෙමේ යේ නම්
36 වහා අපිදු යම්හ" යි කියා රජු කැටිව යන්ට ඔහු සජ්ජිතවූවෝ නික්මුණාහ.
37 එකල්හි කෞසිද්‍ය වසයෙන් අමාත්‍ය භාටාදීන් අතුරෙන් සමහරෙක්
යන්ට නො කැමැති කල්හි උහු භාර්‍යාවෝ "පින්වත් ස්වාමිවරුනි, අප
38 සමග යෙත්වා නොහොත් නො යෙත්වා. අපි දැන්ම ගුණ සලකන්නා
39 වූ උන් වහන්සේ කැටිව යන්නම්හ. උන්වහන්සේ විසින් කරන ලද
උතුම් නුවර වසන්නම්හ" යි කියා පෙරාතුව ඔවුහු නික්මුණහ. එකල්හි
40 එසේම යන්ට නො කැමැති සිය සිය පියනුදු හැර බාල දරුවෝ පවා
41 උහු අනුවම ගියෝ ය. තම තමන්ගේ ගම් හා ගෙවල් ද භෝග සම්පත්
42 ද දමා නික්මෙන්නා වූ ඒ මහ ජනයා දකිමින් රජ තෙමේ මහා
කරුණාවෙන් නැවත නැවත අවවාද කෙරෙමින් නැවැත් විය යුත්තා වූ
සියලු ම මිනිසුන් නැවැත් වී.

Non-Commercial Distribution

43 ඉක්බිති ඒ තෙමේ කැමැති පමණක් සිවුරඟ සෙන් ගෙණ දුර්ගම
44 වූ උස් වූ වාගිරි ගලට ගියේ ය. එ තෙමේ ඒ පව්ව මුදුන්හි මාහැඟි ඉතා
45 උස් පවුරෙන් වටකරණ ලද මහඟු රජ ගෙයක් කරවා තමා පිය රජහු
46 විසින් දුන් මහාධනය සියල්ල ම ආපදා පිණිස එහිම සුරැකිව තැබී ය.
එ මහ පව්වෙහි ම යහපත් සංඝාරාමයකුත් කරවා මහනේත්‍ර ප්‍රාසාද
විහාරයෙහි නායකවූ මහ තෙරුන් වඩාගෙණවුත් ඒ ආරාමය
47 උන්වහන්සේට දී මහාපූජාව කරවා දන්වැට ද තැබූයේ ය.

48 පසුව ඒ රජතෙමේ සමන්කුළට ගොස් මුනිහුගේ පාදය වැඳ
49 එයින් ගඟ සිරි පුරට ගියේ ය. ඒ තෙමේ එහි නියම්ගම් නම් වූ පුරාතන
විහාරයෙහි කැඩුම් බිඳුම් පිරියම් කරවා එකල් එහි වැසි භික්ෂූන්ට දන්වැට
50 ද වෙන් කොට තබා සිඳුරුවානට එළඹියේ ය. ඒ රජ තෙමේ එහි
51 වල්ගම්පා විහාරය කරවා පසුව එහි පිය රජහු නමින් අභයරාජ පිරිවෙණ
52 ද කරවා ඊට නන්වැදෑරුම් පිරිකර ගම් කුඹුරු ආදිය දුන්නේ ය.

53 ඉක්බිති මිහිපල් තෙමේ හස්තිගිරි පුරවරයට ගොස් එහි ද (තමා)
54 සුළු පියහු විසින් කරවන ලද සිත්කළු වූ මහා විහාරයෙහි උහුගේ ම
55 සතතයෙන් පිදිය යුතු ශරීර නිඃක්ෂේපස්ථානය ද නැවත නැවත බලමින්
වීරබාහු නරේන්‍ද්‍රයා ද සේනාව ද සමග කනස්සළු වූයේ එහිදී අනිත්‍ය
56 ලක්ෂණය නැවත නැවත ඉලදවී. ඉක්බිති එහි තුන්මහල් උතුම් පිළිම
57 ගෙයක් කරවා එහි මහත් බුදුපිළිරුවක් කරවී ය. අනතුරුව සුළුපියහ
පිළිරුව සර්වාභරණයෙන් සරහන ලදහු මොනවට කරවා එහිම තැබ්බවී.
58 මිහිපල් තෙමේ පිළිම ගෙයට ද (සුළු පියහු) ඒ රුවට ද මනහර වූ කැප
59 පස ගම් හා බොහෝ පිරිවර මිනිසුන් ද දී උහු නමින් භුවනෙකබාහු
60 පිරිවෙණය යි නාමය ද තැබූයේ යි. ඊට ඉක්බිති ඒ නුවර නරනාරි
ජනයාගෙන් සමාකීර්ණ කොට පව්රු පිරි ආදින් පිරිකෙව් ද කරවී.

61 සූර වූ ඒ රජ තෙමේ සිවුරඟ මහසෙන් ගෙණ ඒ (හස්ති ශෛලපුර)
62 යෙන් නික්ම යාපව් නුවරට ගියේ ය. ඒ කාලයෙහිදී සොළී ආදි රටින්
මහත් බල ඇත්තේ මහා දෙමළ යෝධයනුදු කැටි කොට ගෙණ ජාවක
63 සේනා සමග මාතොට ගොඩ බටුයේ ය. ඊට අනතුරුව ඒ රජ තෙමේ
64 පදී රට කුරුන්දිරට ආදියෙහි වැසි සිංහලයනුත් වසඟ කොට ගෙණ
65 යාපව් නුවරට ගොස් කඳවුරු බැඳ ගෙණ "ත්‍රි සිංහලය ගන්නෙමි ඔවුන්
නො හරින්නෙමි. එහෙයින් බුදුහු දළදාව හා පාදාවත් ඒ එජයත් මට
66 දෙව. ඉදින් නො දෙව් නම් යුද කරමි" යි කියා දූතයනුදු මෙහෙයී.

Non-Commercial Distribution

67 එකල්හි විජයබා රජ තෙමේත් වීරබා මිහිපල්හු කැඳවා
මන්ත්‍රණයකොට මහ බළසෙන් සරසවා "ආශ්චර්යයෙක. මෙකල් වූ
68 කලී අප දෙදෙනාගේ බාහුවික්‍රමය දකින්නම්හ" යි කියා ඒ දෙදෙනම
පිටත්ව ගෙණ චන්ද්‍රභාණු (රජු) මහසෙන් හාත්පසින් වටලා රාම යුද්ධය
69 සෙයින් දරුණු වූ මහයුද කළහ. එකල්හි යුද්ධයෙහි පරදනා ලද්දාවූ
සතුරු යෝධයෝ ආයුධ රහිතව මුළාව ඇවිද්දහ. ස්තුති කළහ. භයින්
70 පෙළි වැන්දාහ. තැති ගත්හ. වෙව්ලූහ. යුදයෙහි සරණ ඉල්ලූහ.
71 ඇඬූහ. වැළපුනහ. එකල්හි භය වූ සතුරු භටයෝ කිසිවෙක් වනය
72 බලා ද කිසිවෙක් මුහුද බලා ද තවත් කිසිවෙක් කඳු බලා ද භය
73 නිමිත්තෙන් හාත්පස දිව පූහ. හේ තෙමේ මෙසේම යුද කොට බොහෝ
74 භටයන් මරවා ඒ චන්ද්‍රභානු නරනිඳු නිරායුධ කොට පැලවී. ඉක්බිති
උහුගේ උතුම් අන්තඃපුර ස්ත්‍රීන් ද සියලු ඇතුන් ද අසුන් ද කඩු ආදී වූ
බොහෝ ආයුධයන් ද මහත් වස්තුව ද ජයසක්, ජයසත්, ජය බෙර
75 ජයකොඩි යන මේ සියල්ල පියරජු වෙත එවූයේ ය. මෙසේ හෙතෙමේ
76 තුමුල යුදකොට (මිහි) මඬල ජයගෙණ විජය ශ්‍රියට පැමිණ ලක්දිව
එක්සත් කෙළේ ය.

77 පසුව තුඟුපවුරු පිරියෙන් පිරිකෙව් කරණ ලද ඒ නගරයද කරවා
78 ඉක්බිති එහි මාහැඟි රජ ගෙයක් ද කොට නිමවා නැවත එකල්හි ඒ
79 නුවර ඇසුරුකළ මහත් භික්ෂු සංඝයාට දන්වැට ද තැබී. ඉක්බිති ඒ
තෙමේ භුවනෙකබාහු නම් මල්රජු අස්වසා පෙරසෙයින් යාපව්වෙහි ර
80 දවී. අනන්තරයෙහි රජතෙමේ අනුරාපුරයට ගොස් එහි ථූපාරාමාදි
සියලු සිද්ධස්ථානයන් හාත්පසින් මාරයා විසින් එවන ලද බලකොටු
81 වැනි වූ මහවනය සිඳුවා ආකාශ නදියෙහි හේදඬු බඳු පවුරු ද කරවී ය.
82 ඒ දිසානායක තෙමේ නවකමින් සිත්කළු වූ මේ සිද්ධස්ථානයන් කරවා
මහපුද පැවැත්වී.

83 ඉක්බිති ඒ මිහිපල් තෙමේ පියරජු විසින් ආරම්භ කොට
නොනිමියා වූ රුවන්වැලිසෑයෙහි නවකර්මාන්තය නිමවනු කැමැත්තේ
84 පුරවැසි සියලු මහජනයා ඒ පුරයෙන් ගිය ගිය තැනින් වහ වහා එක්කොට
85 විසාරද වූ බොහෝ වූ ශිල්ප සමූහයා මේ (නවකම්) හි යොදවා සේනානාථ
86 පිරිවෙණ මහතෙරහු ප්‍රධාන කොට ඇති සංඝයාට දන්වැට ද නිමවා
87 නවකම් කරවන්ට ඒ සංඝයා එහි වැස්වී. පසුව පිහිටි රට වැසි වන්නි
88 රජදරුවෝ බොහෝ පඬුරු දී මිහිපල්හු දුටහ.

Non-Commercial Distribution

එකල්හි හේ තෙමේ කිරුළු, සේසත්, සෙමර ආදි වූ මහාවන්නි
89 රාජයන්ගේ කකුද (භාණ්ඩ) යන්ද ඔවුන්ට දී සියල්ලන් පිණවා ඒ නුවර
රක්නට නියෝග කොට ඉක්බිති එයින් පොළොන්නරු නුවර ගියේ ය.

90 වැලි නරනා තෙමේ එහි දී වීරබා මිහිපලු කැඳවා "අපි මේ
යහපත් මුල් රාජධානිය කරම් හ. යශෝරාශි කපීපුරයෙන් දිශාමුඛය
91 පුරවම්හ" යි උහු හා මන්ත්‍රණය කොට "දූන් පුලස්ති නම් පුර ප්‍රාසාදය,
92 පිළිමගෙය, විහාරය පිරිවෙණ, චෛත්‍යය, දාගෙය, පවුරු ය, දොරටු ය,
93 ගුරුළුවං පහය, සඳලු සහිත පහය, මණ්ඩපය, ධර්මශාලාය, එසේම,
94 දේවාලාදිය (යන මොව්හු) කිසිවෙක් පැලව ගිය තෘණ වෘක්ෂාදියෙන්
වැසුනෝ සිටිති. දිරාගිය ටැම් සමූහ ඇති අනික් සමහරක් ආධාර
95 නැතිව වැටෙති. අනික් සමහරක් මුල පටන් අග දක්වා බිඳුණු මහ බිතු
96 බරින් බිම් බලා නැමුනා වූ අන්‍යාධාර තැනැත්තෝ වැටෙනු කැමැත්තෝ
ය. ඛේදයෙකි ! අනික් කිසිවෙක් හාත්පසින් දිරූ බැවින් ද දුබල බැවින්
97 ද සිටිය නොහැක්කෝ මහල්ලන් සේ දිනෙන් දින නැමෙති. අඳෝමැයි
! තවත් සමහරක් බිඳුනා වූ තුලායෂ්ටි හා නටුවා වූ කොබෝ ගෙඩි
වළලු ඇති වෙති. අනික් කිසිවෙක් විනෂ්ට වූ මස්තක ඇති වෙති.
98 බිඳුණු උළු ඇති වෙති. (එසේම අනික් කිසිවක්) දිරාගිය ගෝනැස්
ඇතිව බුන් තැනින් වැගුරුණු වැසූ උළු ඇති වෙති. අනික් කිසිවක්
99 වනාහි බිතු හා ටැම් ඉතිරිව සිටිති. අනික් කිසිවක් ගිළිහුණු දොර
ඇතිව නටුවා වූ දොරබැම් ඇතිව අනික් කිසිවක් ලිහිල් පියගැට ඇතිව
100 නටුවා වූ පිළිකඩ ඇති වෙති. කිසි ගෙයක්හුගේ ගෙපල් සමණ හේතුව
101 පැණෙයි. (එසේම) අනික් කිසිවක්හුගේ (ගෙය) පිහිටි තැන් පමණක්
102 නොපෙණේ. නොයෙක් බසින් කීම? නිඃශ්‍රීත මේ පුරය කරන්න යම්හ.
රජ තෙමේ අනුමත කෙරේවා. පසුව මේ උතුම් නුවරදී අභිෂේක
මංගලය කෙරේවා !" මෙසේ කියා පියරජු වෙත ඒ තෙමේ දූතයෙක්
මෙහෙයී ය.

103 ඉකිබිති රජතෙමේ ද එපවත් අසා සතුටු සිත් ඇත්තේ එකල්හි
තෙමේ මූල රාජධානිය කරවන සිත් ඇත්තේ මහ ඇමති මණ්ඩලය
104 කැඳවා ලඞ්කාරාජ්‍යවාසී සියල්ලන් ඒ ඒ (ක්‍රියා) යෙහි යොදවා
105 අයංකාරයන එසේම ලියන වඩුවන, නළාකරුවන, කඹුරන, කුඹලුන,
106 එන්කරුවන, සිත්තරුන, බර අදින්න, බැළයන, දාසයන, සැඩොලුන,
107 කර්මහි සමත් වූ උළු වඩුවන, සුණු වඩුවන, ලි වඩුවන, ගල්වඩු වගී (යන
108 මෙතෙක් දෙනා) එක්කොට ඉන්පසු පිඹිනා හම, මිටිය, හඩුය, යකුල
කිණිහිර යනාදී සියලු කුඹුරු බඩුය, තියුණු වූ බොහෝ කියත, වෑය,

Non-Commercial Distribution

109 කැට බිඳිනා මුගුරුය, උදළුය, කලාල පැස යනමේ ආදිවූ මහා ධනය ද
110 සාදරයෙන් දී පිත් රජු වෙත සේනා හා යැවී ය.

111 එකල විජයබා රජ තෙමේ ද සතුටු සිත් ඇත්තේ බොහෝ කලක්
112 වල් වූ නටුවා වූ එ එරටෙහි සුන්බුන් මහ ඉවුරු ඇති ගැඹුරු දිය නැති
වැව් පොකුණු වෙලි හා ගැඹුරු විල් ආදි ජලාධාරයන් පෙර සෙයින්
113 බඳවා (යම්සේ) ගැඹුරු දිය පිරුණු නොයෙක් පියුමෙන් ගහණ වූ නන්
114 මස්කැලන් විසින් ආකුල වූ (ජලාශය වෙත් නම් එසේ කරවා) සියලු
ශිෂ්‍යයන්ගේ උත්පත්තිස්ථාන වූ බොහෝ හැමකල් සරු වූ කෙත් තනවා
115 ඉන්පසු ඒ ඒ තන්හි සියලු ශස්‍යයන් සම්පාදනය කරවා ඒ සියලු රට
මනෝහර කොට සෘමද්ධ කරවී.

116 ඉක්බිති රජ තෙමේ සයුර සේ ගැඹුර පරිඛායෙන් පිරි වරණ ලද
117 සක්වළ ගල බඳු වූ සිත්කළු පවුරු වළලු ඇති යුක්ත වූ නොයෙක්
118 විහාර සම්බන්ධ ඇති නොයෙක් සෑයෙන් ගහණ වූ නොයෙක් ගරුළුවන්
119 ගෙයින් මිශ්‍ර වූ නන් පහයෙන් හෙබියා වූ නොයෙක් මුඩු සෙවණි කම්
120 ඇති නෙයෙක් මණ්ඩපායෙන් මණ්ඩිත වූ නොයෙක් දේවාලයන් ඇත්තා
වූ නානා ගෝපුරයෙන් භාස්වර වූ නානා ගෙවල් පෙළින් සිත් කළු වූ
නානා වීථියෙන් විරාජිත වූ මොනවට බෙදන ලද සතර දොර ඇති
යහපත් තුන් මං සතර මං සන්ධි ඇති උතුම් වූ පුලස්ති පුරය සෙයින්
කරවී ය.

121 මෙසේ කාන්තියෙන් ඕතොමෝ යම්සේ මිථිලාව දිනා ද කාංචිපුර
බිඳී ද සැවැත් (නුවරට) සිනාසේ ද මදුරාව දිනා ද බරණැස කෙලෙසා
ද විසාලා නුවරත් කොල්ලකාව් ද චම්පා නුවර කම්පා කෙරේ ද එසේ
ඒ තෙමේ ඉන්‍ද්‍ර නගරය සදෘශ කොට පොළොන්නරු පුරය කරවී.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
පුළත්‍ථිපුර කාරාපන නම් අට අසූවන අදියර නිමි.

Non-Commercial Distribution

# අසූ නව වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් ඒ නරේන්ද්‍රතෙම "පුලස්ති නම් වූ මේ පුරය පූර්වයෙහි
2 යම් සේ වී ද එසේ කරවන ලද්දේ සර්ව නගරාංගයෙන් සමන්විත ය.
දූන් මේ පුරය තෙමෙ ඓශ්වර්‍ය්‍ය සෞභාග්‍යය ලක්‍ෂමිය කරණකොට
3 ගෙණ බබළයි. ජේතුත්තර නම් නුවර ද පරයයි. සාගල පුරය පැහැර
ගන්ට ඊර්සා කෙරෙයි. සුංසුමාරගිරි නම් පුරය ද පැහැර ගෙණ කිමෙක
4 සාකේත පුරය සලකා ද? අහෝමය ! රජගහා නුවර ජීවග්‍රාහයෙන් ගන්ට
5 ඊර්සා කෙරේ. සකස් පුරය ද විධ්වංසනය කොට ඉඳුපත් නුවරට ගර්හා
කෙරේ. කිඹුල්වත් පුරය හා මිත්‍රභාවය කරන්ට උත්සාහ කෙරේ. එ
6 හෙයින් ශක්‍ර පුරයෙහි දෙවියන්ට අධිපති වූ ශක්‍ර තෙම යම්සේ ද එසේම
රජුන්ට අධිපති වූ මහත් සෘධි ඇති රජ තෙමෙ මේ පුරයෙහි දූන්
7 අභිෂේකෝත්සවය කරන්ට වඩින සේක්ව." මෙසේ කියා පිය රජාණන්
කරා දූතයෙක් යැවුවේ ය. ඉක්බිත්තෙන් ඒ රජ තෙමේ ඒ ප්‍රවෘත්ති
8 ක්‍රමය අසා තුටු පහටු ව සේනාව විසින් පෙරටු කරණ ලද්දේ රජහට
සුදුසු වූ මහත් උත්සවයෙන් යුක්තව දඹදෙණි නුවර සිට ඒ මූල
9 රාජධානියට පැමිණියේ ය.

එකල්හි විජයබාහු රජ තෙමේ ද ගව්වක් පමණ තැන් පෙර
10 ගමන් කොට ඒ මහ රජාණන් ඒ රාජධානියට කැඳවා ගෙන, ගියේ ය.
11 ඉක්බිත්තෙන් ඒ පුරයෙහි රජහුගේ අභිෂේක මහෝත්සවය සත් දිනක්
පවත්වා පිළිවෙළින් නිම විය. ඉක්බිත්තෙන් හේ තෙමේ වීරබා යුව
12 රජහට ඒ උතුම් රට දී ඒ සමෘධ වූ රාජධානියෙහි ම උහු තබා "
සර්වඥයන් වහන්සේගේ ධාතූන් මේ රාජධානියට ගෙණ එමි" යි (සිතා)
13 පියරජාණන් සමග ද දඹදෙණි පුරයට ගියේ ය. ඉක්බිති හේ තෙමේ
14 ලක් දිව් වැසි මහජනයා රැස්කරවා පස් යොදුන් පමණ මහ සම කොට
15 එහි අතරතුර අඩ යොදුන් අඩ යොදුන් පමණ තන්හි මගුල් කොඩි රඹ
16 තොරන් ආදියෙන් මනොහර වූ මහරු නවාතැන් එක එක කරවූයේ ය.
17 ඉක්බිත්තෙන් ඒ දිව්‍ය රථ සෞභාග්‍යයෙන් සුන්දර වූ මහා රථයෙක්හි
සර්වඥයන් වහන්සේගේ පාදා දළදා දෙදෙනා වහන්සේ වඩාහිඳුවා
අසමාන වූ මහා බ්‍රහ්ම රථය බ්‍රහ්ම සමූහයන් විසින් මෙන් ඒ මහා
ධාතූන් පිහිටි උතුම් මංගල රථය හාත්පසින් සේවනය කරන්නා වූ

---

1 දඹදෙණි පුරය පටන් පොළොන්නරුව දක්වා, මාර්ගය පස් යොදුනට ඉතා අධිකයි. ඉන් තිසා සොළොස් යොදුනක් හෝ විසිපස් යොදුනක් කියා තිබී පසුව මෙසේ වූයේ යයි හඟිමු. එසේත් ලැබුණු පමණ පොත්වල "පංච යෝජනා" මත්තක කියා තිබෙන බැවින් එසේ ම තැබුවෙමු.

Non-Commercial Distribution

18 නොයෙක් භික්ෂු සඞ්ඝ සමූහයන් සමග එ මහත් දඹදෙණි පුරවරයෙන්
ඒ රජ තෙම නික්ම රන් මුතු කුඩ ය, රන් මුතු සෙමෙර නවය, රන් මුතු
19 කෙඩි ය, රන් මුතු මාලය, රන් රිදි කළස් හා රන් රදී විජිනි ය, රන් රිදි
20 කෙණ්ඩි ය, රන් රිදී සක් ය, රන් රිදී ආධාර ඇති රන් රිදී කරඬු ය, රන්
21 රිදී තලිය, රන් රිදි කැඩපත් ය, රන් රිදී රඹ හා රන් රිදියෙන් කරණ ලද
22 ශඞ්ඛ වලයාකාර අලඞ්කාර ජාති ය, රන් රිදී අසුන් ය, රන් රිදී ඇතුන්
23 ය, නානාවිධ වූ රිදී රන් ආදියෙන් කළ පහන් දඬු ආදිය යන මේ දෑ
24 ධාතු පූජා පිණිස සාධුකාර පවත්වා අභිමුඛයෙන් හා පශ්වාද් භාගයෙන්
25 අතුරු නැතිව යන්වා වූ ඒ ඒ ධූරයෙහි නියුක්ත මිනිසුන් කරණ කොට
ගෙණ සිත්කළු වූ හස්ත්‍යාභරණයෙන් සරහන ලද ප්‍රශස්ත වූ හස්ති
26 පංක්තීන් විසින් ද සියලු අශ්වාලඞ්කාර සමූහයෙන් දර්‍ශනීය වූ අශ්ව
27 පංක්තීන් විසින් ද යෝධ ක්‍රිඩා කරන්නා වූ යෝධාඞභරණධාරී නානාවිධ
28 ආයුධ ගත් ඇත් ඇත්තා වූ වීර භට පංක්තීන් විසින් ද මඟුල් වෙස් දරූ
29 නානාවිධාභරණයෙන් හෙබි නරේන්‍ද්‍ර රාජ පුත්‍ර මන්ත්‍රී පංක්තීන් විසින්
හාත්පසින් සෙව්නාලද "අහෝ ! යහපත අහෝ ! යහපත අහෝ ! යහපතැ"
යි කියන්නා වූ පින් සොඬ මිනිසුන්ගේ සාධු නාදයෙන් හෙබියා වූ "මම
30 පෙරටු වෙමි, පෙරටු වෙමි" යි කියන අහංපූර්විකා වචනයෙන් බාධා
නැතිව නික්මෙන්නා වූ නොයෙක් නිර්මලාචාරයෙන් යහපත් වූ පුද මල්
31 ආදිය ගත්තා වූ උපාසිකා ජනයන් හා උපාසක ජනයන් විසින් පෙළින්
32 පෙළ පිරිවරණ ලද්දා වූ ඔවුනොවුන්ට අධික කොට මහා වාද කරන්නන්
සෙයින් බොහෝ වූ බලවත් බලවතුන් විසින් නැවත නැවත ක්‍රීඩා
කරන්නන් විසින් ද නැවත නැවත විහේෂයෙන් තාඩනය කරනු ලබන්නා
33 වූ මහ බලැති බලවතුන්ගේ ඝෝෂණයෙන් හාත්පස ගිඟුම් ගත්තා වූ
දිසාන්තරයෙහි පැතිර යන්නා වූ අතිශයින් ශ්‍රවණීය වූ යහපත් පංචාංග
34 තූර්යරාවය පවත්වන්නා වූ මංගල පාඨක වෛතාලියන් විසින් පසස්නා
35 ලද්දා වූ ස්තුති පාඨක මාගධයන් නැවත නැවත ස්තුති කරණ ලද්දා වූ
දර්‍ශන ශ්‍රවණයට ප්‍රිය වූ නෘත්‍ය ගීත කරන්නන් විසින් ද නැටුම් හි
හැසිරෙණ වර්‍ගයන් විසින් ද භක්තියෙන් හාත් පසින් සෙව්නාලද්දා වූ
36 මහපුද පවත්වමින් නිරවුල් පරිද්දෙන් පවත්නේ සරහන ලද්දා වූ ඒ
37 මගින් ගොස් පෙරාතුව කරණ ලද ඒ ඒ නිවාසස්ථානයට පැමිණ ඒ ඒ
තන්හි ද ධාතූන් තබා මහා පුද කොට ඒ ඒ තැනින් නික්ම නැවත
38 නැවත අනුක්‍රමයෙන් ම ඒ මුනීන්‍ද්‍රධාතූන් වහන්සේලා ඒ මූල රාජධානියට
ම වැඩම කෙළේ ය.

39 ඉක්බිත්තෙන් නරේන්‍ද්‍ර තෙම මුළු නුවර එක් සැණකෙළි කොට
යහපත් නකත් තිථි යුක්ත වූ යහපත් දිනෙක්හි යහපත් මුහුර්තයෙක්හි එ
40 කල්හි දිව්‍යරාජ මන්‍දිරයක් මෙන් සරහන ලද යහපත් වූ මන්‍දිරෝත්තම

Non-Commercial Distribution

41 වූ ඒ පුරාතන ධාතු මන්දිරයෙහි නොයෙක් රත්නයෙන් හෙබියා වූ මහා
රත්න පයඞ්ඞිකයෙහි ඒ ධාතූන් වහන්සේලා දෙනම ආදර සහිතව මනා
කොට පිහිටුවූයේ ය.

42 ඒ තැන් පටන් පණ්ඩිත ක්‍ෂත්‍රිය තෙම දිනෙන් දින අධික කොට
43 සිව් දූ ගඳින් ද, මනෝඥ වූ සුවඳ දුමින් ද, දොඹ නා පුවක් ඈ නන්
කුසුම් දෑයෙන් ද, උතුම් එළිය ඇති ගණන් ඉක්ම වූ මිණි කපුරු පහනින්
44 ද, සුවඳ තෙලින් දල්වන ලද දඬුවැට පහන් මාලාවෙන් ද, මිහිරි කිරින්
පිසූ සියුම් බත් තලියෙන් ද, කෛලාස කූටාකාර වූ සුවඳ හැල් බත් රැ
45 සින් ද සකල ඛාද්‍ය භෝජ්‍ය ලෙය්‍ය පෙය්‍යාදියෙන් ද, තුන් මසක්
46 මුළුල්ලෙහි ලෝකයාගේ සිත් ගන්නා වූ මහා ධාතු පූජා ශංඛ පූජා
සමග පවත්වා නිම වූයේ ය.

47 ඉක්බිත්තෙන් මිහිපල් තෙම "දහස්තොටදී උපසම්පදා මංගලය
48 නිම්ලකොට කරවම්හ" යි කියා එහි පළමුකොට වීරබාහු මහීපාලයන්
යවා උහු විසින් මනෝඥ වූ නොයෙක් දහස් ගණන් සඞ්ඝාරාමයන්
49 සහ නානාවිධාලඞ්කාරයෙන් බබළන්නාවූ පාට තොරණින් යුක්ත උස්
50 වූ ෂඩ්ඨීස්තම්භ මහා මන්දිරයක් කරවූ කල්හි, ඒ ඒ උපසම්පදා පූජාවස්තූන්
ද සියලු සිව්පස ද සර්වප්‍රකාරයෙන් සම්පාදනය කළ කල්හි, පිහිටිරට
51 රුහුණු ආදි ඒ ඒ එට වසන්නා වූ සියලු වන්නි රජුන් විසින් ආදර
52 සහිතකොට නොයෙක් මත්ස්‍ය මාංසාදි විවිධ ව්‍යංජනයෙන් යුක්තවූ
මහත් සහල් බර හා දීකිරි ගිතෙල් ද මීපැණි ඛණ්ඩ ශර්කරා ගුඩාදීන් ද
යන මහා සඞ්ඝයාට දාන යෝග්‍ය වූ උපකරණයන් ගෙණා කල්හි විජයබා
53 රජ තෙමේ ද එකල එහි ගොස් "අපි උපසම්පදා මංගල්‍ය කරවන්ට
54 පටන් ගන්නෙමු. "අප කෙරෙහි වනාහි අතිශයින් සුප්‍රසන්න වූ සිත්
55 ඇත්තා වූ යම් (ස්ථවිරාදි වහන්දෑ) කෙනෙක් වෙද්ද, ඒ සියලු මහා
56 ස්ථවිරයන් වහන්සේලා ද, මධ්‍යම වූ ද නවක වූ ද යතීශ්වරයන්
57 වහන්සේලා දහස් තොටට එනු පිනිස උත්සාහ කෙරෙත්ව" යි ආරාධනා
කොට සැම තැන දූත ප්‍රේරණය කෙළේ ය. තාම්‍රපර්ණි වීපවාසි වූ
සියලුම යතිවරයෝ ඒ ප්‍රවෘත්තිය අස අසා මහත් සන්තෝෂයට පැමිණ
58 තම තමන්ගේ භාණ්ඩාගාරික භික්‍ෂූ නමුකුදු හිඳිනට අවකාශ නොදී ඒ
59 ඒ තැනින් නික්මුණා හ. ඉක්බිති සජ්ජිත වූ ඒ සියලු යතිශ්‍රේෂ්ඨයෝ
පිළිවෙළින් ශීඝ්‍රව දහස්තොට අවුත් රැස් වූහ.

60 එකල්හි යතීන් විසින් පිරිවරණ ලද ඒ දහස්තොට නැවත නැවත
බලන්නා වූ නරේන්ද්‍ර තෙම සුලභ වූ ප්‍රීතිය ලැබූයේ ය. ඉක්බිත්තෙන් ඒ
61 මිහිපල් තෙම ප්‍රණීත වූ අන්න පානයෙන් ඒ මහා භික්‍ෂූ සංඝයා සකස්

Non-Commercial Distribution

62 කොට වැඩියක් මනා කොට උපස්ථාන කෙළේ ය. එකල ඒ දහස්තොට
දී දවසක් දවසක් මහ පුද පවත්වන්නේ ඒ කාරක භික්ෂූන් ලවා උපසම්පදා
63 පේක්ෂකයන්ට උපසම්පදා දෙවමින් අඩමසක් උපසම්පදා මංගලය පැවැත්
වූයේ ය.

64 ඉන්මතු මා හිමි පදවිය, එසේ ම මුල් පදවිය, මහතෙර පදවි,
65 තෙර පදවි, පිරිවෙන් ආදි පදවි ද ඒ එය ලැබීමෙහි යෝග්‍ය වූ සසුන්
66 බබුළුවන්නා වූ යතීන්ට දෙවා ඒ නරේන්ද්‍ර තෙම රාජ යෝග්‍ය වූ යහපත්
67 දහස් අගනා අටපිරිකර ද දී එයින් අන්‍යවූ ද සියලු ම භික්ෂූන්ට පිළිවෙළින්
68 මාහැඟි පිරිකර ද නැවත නැවත දී ඉතිරි වූ බොහෝ පිරිකර පඬි සොළී
රට වැසි භික්ෂූන් වහන්සේලාට ද යවා පිරුණු මනදොළ ඇත්තේ "
69 නුවණ පෙරටු කොට යම් පිනක් මා විසින් කරණ ලද් දේ ද ඒ සියල්ල
පියරජාණන් නමින් ම කරණ ලද්දේය" යි දන්වා පියරජාණන් වෙත
70 දූතයෙක් වැවූයේ ය. මෙසේ හෙතෙම (මහ) වැලිගඟ දහස්තොට
පුළුල් තන්හි උපසම්පදා දානය කරවා එයින් භාග්‍යවත් සර්වඥයන්
වහන්සේ ගේ මේ නවාඞ්ගික ශාසනය බැබළුවූයේ ය.

71 රජුන්ට උතුම් වූ ඒ පරාක්‍රමබාහු නරේන්ද්‍ර තෙමේ ලෝකයෙහි
ප්‍රකට වූ ස්වකීය පුත්‍රයා කෙරෙහි රාජ්‍යභාරය තබා මේ මේ පරිද්දෙන්
නොයෙක් පුණ්‍ය සම්පත්තීය උහු ලවා ම කරවා තමන්ගේ පන්තිස්
වන වර්ෂය පැමිණි කළ ස්වර්ගප්‍රාප්ත වූයේ ය.

මෙතෙකින් හුදී ජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහවස අභිෂේක මංගලා දී දීපන නම් එකුන් අනූවන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ වෙනි පරිච්ඡේදය

1 ඒ රජහු ඇවෑමෙන් ද සියලු ම ලංකා රාජ්‍යානුශාසනා කරන්නා
2 වූ විජයබාහු රජහට දෙවෙනි වර්ෂයෙහි වනාහි ඒ රජහුගේ දූර්මිත්‍ර වූ
3 මිත්‍ර නම් එක් පවිටු වූ සෙනෙවියෙක් රාජාභ්‍යන්තර වූ එක් දාසයෙන්
4 මිත්‍ර කොට ගෙණ අල්ලසින් රවටන ලද සිත ඇත්තා වූ උහු ලවා රාජ්‍ය
ලෝභයෙන් එක් දිනක් රෑ ඒ නරෙන්ද්‍රයා මැරවූයේ ය. එකල්හි ඒ රජහු
ලෝභයෙන් එක් දිනක් ඒ රජහු මල් භුවනෙකබාහු රජ තෙමේ ඒ පවත්
5 අසා දඹදෙණි පුරයෙන් නික්ම බියෙන් පිළිසන් යානකට නැගී යහපව්
6 දුර්ගයට යන්ට ආරම්භ කළේ ය. එකල්හි එම දුෂ්ට වූ මිත්‍ර නම්
7 සේනාධිපතියා අතින් ආදියෙහි ම අල්ලස් ගෙණ යම් කෙනෙක් යෙදුනෝ
යම් සේ සියලු අන්දෝරුපටි ආදිය සුන්වේ ද එපරිද්දෙන් ඒ
භූපාලයාණණ් ගේ යානයට කරුණා රහිතව තීක්ෂණ ශස්ත්‍රයෙන්
8 බෙහෙවින් පහර දුන්හ. එකල ඒ මිහිපති තෙම ඒ යානයෙන් බිමට
9 පැන භය රහිත වූයේ වේගයෙන් කළුගල ගමට පැමිණ එහි ඇතුන්
10 බඳනා ඇත්හල උතුම් වූ ඇතෙකු ගෙණ ඒ ඇතු නැගී ගොස් ඉන් පසු
11 ජලාශයෙන් පිරුණා වූ කොළඹුන් නම් මහහොය තරණය කොට
12 යාපව්වට ම ගියේ ය. එකල ඒ මිත්‍ර (නම් සෙනෙවි තෙමේ ද දඹදෙණි
පුරයෙහි මහ රජගෙට පිවිස එහි යහපත් වූ සිංහාසනයෙහි හිඳ
දුෂ්ටාධ්‍යාශය ඇතියේ රාජාභරණයෙන් සැරසුනා වූ තමන් සියලු
13 සේනාවට දක්වූයේ ය.

ඉක්බිති උහු කෙරෙහි ස්නේහ ඇති යම් අමාත්‍ය කෙනෙක් වූ ද
14 එකල සියල්ලෝ ම රැස්ව ඔවුනොවුන් අනුව පවත්නෝ "ස්වදේශක වූ
15 පාරදේශක වූ ද සියල් සේනාද්වය මනා කොට පඩි දීමෙන්
16 සර්වප්‍රකාරයෙන් සංග්‍රහ කරම්හ"යි සිතා සියල්ලන්ට ප්‍රථම "ඨකුරක"
17 ආදී වූ ආර්‍ය ක්ෂත්‍රිය යෝධයන්ට පඩි දෙන්ට පටන් ගත්හ. "හැම
18 කල්හි අපි සියල්ලෝම සංග්‍රහ කටයුතු බවට පැමිණියම්හ. තොප
19 විසින් සර්වප්‍රකාරයෙන් සිංහල යෝධයෝ ම බැළයන් සංග්‍රහ කටයුතු ය,
නැවත නැවත සතුටු කටයුතුය " යි කියා ඒ (ආයර්‍යක්ෂත්‍රි) සියල්ලෝ
එකල බැළ නො ගත්හ. "එසේ වේවයි" කියා එකල එහි විසූ සියලු
20 සිංහල යෝධයන්ට පඩි දී ඉක්බිත්තෙන් ඔවුන්ට පඩි ගන්ට කීහු. ඉන්
21 පසුත් ඒ සියල්ලෝ "පඩි පසුව දෙනු ලැබේවා, මෙවර නොගණුම් හයි
කියා ප්‍රතික්ෂේප කළහ. ඒ සියල් ඇමතියන් විසින් සර්වප්‍රකාරයෙන්
නැවත නැවත පඩි ගැනීම් හේතු වූ නිබන්ධන බෙහෙවින් කළ කල්හි
22 ආයුධයෙන් සැදුනා වූ සත්සියයක් ඒ සියලු ආර්‍ය ක්ෂත්‍රියෝ "අපි
23 සියල්ලෝ ම රජහු අභිමුඛයෙහි කියන්නෙමු ය"යි රජ ගෙට ගොස් එහි

Non-Commercial Distribution

සිංහාසනයෙහි උන්නා වූ මිත්‍ර සේනාධිපතියා දැක ආදර සහිතව
24 ක්ෂණයක් සිටියෝ ය. ඉක්බිත්තෙන් බිය රහිත සිත් ඇති ඨකුරක නම්
යෝධ තෙමේ එකල්හි යහළුවන්ට සංඥා දී තමන්ගේ තීක්ෂණ වූ කඩුව
25 ගෙණ එකෙණෙහි වහාම ඒ සෙනෙවියාගේ හිස කපා පෙළෝ තලෙහි
26 හෙළී ය. එකල ඉක්බිත්තෙන් ඒ පුරයෙහි මහා කෝලහල උපන් කල්හි
27 මහ බලැතැ සියලුම සිංහල යෝධයෝ කැටිව "කුමක් හෙයින් මේ නො
28 කටයුත්ත තොප විසින් කරණ ලද්දේ දැ"යි ඨකුරකයා ප්‍රමුඛ වූ ආර්ය
29 යෝධයන් පිළිවිසියෝ ය. නැවත ඔව්හු "යහපව්වවැසි භුවනෙක
භූපේන්ද්‍රයා ගේ නියෝගයෙන් මෙය කරණ ලද්දේ ය"යි කීහු. " එසේ
වේව" යි කියා ආර්‍ය්‍ය සිංහලය යන (උභය පක්ෂගත) සියලු යෝධයෝ
30 සමගිව භුවනෙක භූපේශ්වර නරේන්ද්‍රයන් එකල ඒ ශුභාචල පුරයෙන්
31 දඹදෙණි පුරයට වඩා ගෙණවුත් ආදර සහිත ඒ කුමරහු අභිෂේක කළහ.
32 එතැන් පටන් ඒ රජ තෙම සියලු ම උභය සේනාව වෙත ධාන්‍යාදිය
දීමෙන් තමන් පක්ෂපාත කොට කාලිංගයරායරය චෝඩගංගදේව යනාදී
33 වූ මුහුදු කදලීවාටය, ආපානය, තිපය, හිමියානකය, යනාදි වූ සිංහල
වන්නි රජුන් ද පහ කොට ලංකාව සතුරු කටු නැති කොට අවුරුදු
34 කීපයක් දඹදෙණි නුවර වාසය කොට ඊට අනතුරුව යහපව් නුවර
35 ගොස් එහි සෞභාග්‍යයෙන් බබළන අතිශයින් විස්තීර්ණ වූ රාජධානියක්
කරවා ගෙණ එහි වාසය කෙළේ ය.

36 ඉක්බිත්තෙන් ධර්‍මනීතියෙන් ම සියලු ජනයා රංජනය කරන්නා
37 වූ රජ තෙමේ ධාර්මික ද බුද්ධශාසනයෙහි සුප්‍රසන්න ද වූයේ ය. ඒ
නරේශ්වර තෙමේ ධර්‍ම පුස්තකයන් ලියන්නා වූ නුවණැත්තන්ට බොහෝ
38 වස්තු දී සියලුම ත්‍රිපිටකය ලියා එවන්තේ ලංකාද්වීපයෙහි ඒ ඒ
ප්‍රදේශයෙහි විහාරයන්හි තබ්බවා පාළා ධර්‍මාභිවෘර්ධිය කර වූයේ ය.
39 මහීපති තෙම බොහෝ සේ කරණලද උදාර පූජා සත්කාරයෙන් භාස්වර
40 වූ ලෝකයට ශුභ වූ උපසම්පදා මංගලය කරවා ලෝවැස්සන් විසින්
41 පිදිය යුතු අග්‍ර මහිම ඇති බුද්ධශාසනය විපුලත්වයට ද විශේෂයෙන්
42 හට ගැනීම ද සම්ප්‍රාප්ත කෙළේ ය. හෙතෙම දවසක් දවසක් පාසා
දළදා මහ පුදක් පැවැත්වූයේ යත සිවුපසයෙන් භික්ෂු සංඝයාට ද
උපස්ථාන කෙළේ ය. යහපව් පුර වෙසෙමින් මේ පරිද්දෙන් යහපත
කොට ඒ රජ තෙමේ ද එකොළොස් හවුරුද්දක් රාජ්‍යය කොට
දෙව්ලොවට ගියේ ය.

43 සායක් හට ගන්නා කල්හි පඬිරට අනුශාසනා කරන්නා වූ පස්බෑ
රජ දරුවන් විසින් සේනාව සමග මෙහෙය වන ලද්දා වූ අනාර්‍ය්‍ය වූ
44 නමුදු ආර්‍ය්‍ය චක්‍රවර්තිය යි ප්‍රසිද්ධ ද්‍රවිඩාධිපති වූ මහ බලැති මහ

Non-Commercial Distribution

45 ඇමතියෙක් තෙම (ලක්දිව්) බැස ඒ (යහපව්) දෙස ඔබ මොබ පැහැර
46 ගෙණ මහා දුර්ගවරය වූ යහපව් පුරයට පිවිසියේ ය. දංෂ්ට්‍රා ධාතු
47 ස්වාමීන් ද එහි සියලු සාර ධනය ද ගෙණ නැවතී පඩිරටට ම ගියේ ය.
හෙතෙම එහි දී පඩිමහරජ වස් නමැති පියුම් (පොබයන) හිරු වැනි වූ
කුලශේඛර රජහට ඒ දංෂ්ට්‍රා ධාතුව දුන්නේ ය.

එකල බෝසත් විජයබා රජාණන් පුත්‍ර වූ ඒ මහත් සෘර්ධි ඇති
48 පරාක්‍රමබාහු මහ රජාණන්ට ද මුනුබුරු වූ පරාක්‍රම භුජ නම් වූ රජ
49 තෙම ලංකාද්වීපවාසි සත්වයන්ගේ සන්තාප වළකන පිණිස මේඝයක්
50 සෙයින් උතුම් රජුන් ගේ ප්‍රධාන වූයේ ශිතච්ඡායායෙන් මනෝඥ වූ
51 සොඩෂ කලා පරිපූර්ණ චන්ද්‍ර බිම්බානුකාරී වූ (ශ්වෙත) ඡත්‍රය එසවූයේ
ය. ඉක්බිත්තේන් ඒ තෙමේ තමන් කුලයෙහි පූජනීය අග්‍ර දේවතා වූ පඩි
52 රට පැමිණ මුනීන්ද්‍ර දන්තධාතුව "ඒ රටින් කවර උපායකින් (මෙහි
ගෙණ එන්ට හැක්කෙම් දැ?" යි සිතා සාමය හැර අන්‍ය වූ උපායක් නො
53 දක්නේ දක්ෂ වූ කිසියම් යෝධ කෙනෙකුන් සමග නික්ම ඒ පඩි රට
54 ගොස් පඩිරඩහු දැක දවසක් දවසක් පාසා උහු හා ආලාප සල්ලාපයෙන්
55 සතුටු කරවා ඒ රජුහු අතින් දන්ත ධාතුව ගෙණ නැවත ලක්දිවට අවුත්
56 පුලස්ති පුරවරයෙහි පූර්ව වූ දන්ත ධාතු මන්දිරයෙයි ඒ දළදාව පිහිටු
57 වූයේ ය. ඉක්බිත්තෙන් ඒ මිහිපල් තෙම ඒ පුරයෙහි වාසය කොට රාජ
නීතිය නොඉක්මවා රාජ්‍ය කරන්ට ආරම්භ කෙළේ ය. [1] ඒ නරේන්ද්‍ර
58 තෙමේ දවසක් පාසා දළදා පුද කරන්නේ අප්‍රමාදයෙන් අමන්ද වූ පුණ්‍ය
59 රාශිය රැස් කෙළේ ය. චීවරාදි ප්‍රත්‍යයෙන් භික්ෂු සංඝයා උපස්ථාන
60 කොට ලෙච්ක ශාසනාභිවෘර්ධිය කොට මරණ ප්‍රාප්ත වූයේ ය. ශුභ
පර්වත පුරාධිපති වූ භුවනෙක බාහු නරෙන්ද්‍රයාණන් පුත්‍ර නුවර රජ
වූයේ ය. පින් කැමැති වූ දානාදි කුසල්හි ඇලුනා වූ ජනේන්ද්‍ර තෙම
61 සතතයෙන් භික්ෂූන් දහසකකට පිසීමෙහි දානෝපකරණ තැබූයේ ය.
රජ තෙමේ අවුරුද්දක් පාසා රාජාග්‍ර සම්පත්තියට යෝග්‍ය වූ තමන්

---

1 (57 වෙන් ගාථාව පටන් 63 වැන්න දක්වා ඇතැම් පොත්වල තිබෙන ක්‍රමය මෙසේ යි.)

(ශුභ පර්වත පුරාධීශ්වර වූ භුවනෙකබාහු නරේන්ද්‍ර පුත්‍ර වූභුවනෙක බාහු නම් වූ කුමර තෙමේ ද අනාගත කාලයෙහි රාජ්‍යයෙහි ලොභ කරන්නේ යයි නැවත නැවත සිතන්නේ කිසියම් කලෙක වනාහි ඒ රජ තෙමේ තමන් කනිෂ්ඨ භාතා වූ ද ඒ රාජකුමාරයාගේ ඇස් උපුටුවන්ට රාජපුරුෂයන් හා කරනවෑමියා මෙහෙයූයේ ය. කරන වෑම් තෙමේ එ කල උහු කෙරෙහි .... සතතයෙන් භික්ෂූ දහසකට පිසීමෙහි දන් වැට තැබූයේ ය. නරේනද්‍ර තෙමේ අවුරුදු පතා රාජාග්‍ර සම්පත්තියට යෝග්‍ය වූ තමන් කිරීට මංගල්‍යය කරවා ඊට අනතුරුව පොසොන් මස ශ්‍රෙෂ්ඨ පූජා පෙරටු වූ උප සම්පදාව පවත් වන්නේ බුද්ධ ශාසනය බැබලවූයේ ය. බොහෝ අටපිරිකර ද එසේ ම කෙළින් සිවුරු ද බොහෝ භික්ෂූන්ට අවුරුදු පතා දෙවූයේ ය.

Non-Commercial Distribution

මෞලි මංගලය කරවා ඊට සම්පත්තියට යෝග්‍ය වූ තමන් අනතුරුව
62 පොසොන් මස ශ්‍රේෂ්ඨ පූජා පෙරටු වූ උපසම්පදා කරවා බුද්ධ ශාසනය
බැබැළ වූයේ ය. ඒ භුවනෙකබාහු නරේන්ද්‍ර තෙමේ ද මේ ආදී නොයෙක්
63 පින් නොයෙක් පරිද්දෙන් කොට දෙවෙනි වර්ෂයෙහි අනිත්‍ය භාවයට
64 පැමිණි යේ ය. ඒ රජහු අතිජාත පුත්‍ර වූ වික්‍රමාන්විත පණ්ඩිත වූ ඒ
පැරකුම්බා කුමර තෙමේ ද ඒ පුරවරයෙහි රජ වූයේ ය. රත්නත්‍රයෙහි
65 ප්‍රසන්න වූ ඒ තෙමේ භික්ෂූන් රැස් කරවා නොයෙක් වර උපසම්පදා
කරවූයේ ය.

66 ඉක්බිත්තෙන් ඒ නරේන්ද්‍ර තෙම රාජාංගනයෙහි බිතු ටැඹින්
67 මනහර වූ විසිතුරු සිත්කම් ඇති රන් තොරණින් යුක්ත වූ රන්
68 දොරබාවෙන් සශ්‍රීක වූ සිත්කළු තුන් මහල් දළදා මැඳුරක් කරවා ඉක්බිති
එහි විසිතුරු වතින් හා පට පළී ආදියෙන් වියන් බඳවා නැවතත් එය
69 එල්බෙන සිත්කළු රන් මාලාවෙන් හා එසේ ම රිදී මාලාවෙන් ද මුතු
70 මාලාවෙන් ද සරහා හෙබියා වූ කෞශේය ජවනිකා ප්‍රාකාරයක් බඳවා
71 යළිත් එහි විසිතුරු රුවනින් බබළන පර්‍යඞ්කයන් පණවා ඒ හාත්පස ද
72 රන්රිදී කළස් මාලාවෙන් ද සරසා ඉක්බිත්තෙන් එහි දළදා කරඬුව හා
73 පාදා කරඬුව ආදර සහිත ව පිහිටුවා නොයෙක් මල් සුවඳින් හා සුවඳ
දුම් පහනින් බබළන්නාවූ ද සකල ඛාද්‍යභෝජ්‍ය ලෙය්‍යපෙය්‍යයෙන්
සාදන ලද්දා වූ ද විජෘම්භමාන පංචාඞ්ග තූර්‍ය්‍ය ශබ්දයෙන් ශෝභමාන
74 වූ ද නානා ප්‍රකාර ස්තුති පාඨකයන් විසින් ආරබ්ධ වූ නෘත්‍ය ගීතයෙන්
මනහර වූ ද ජගදානන්ද කරවූ සර්වඥ ධාතු පූජා මහෝත්සවය දවසක්
75 පාසා මැනවින් පවත් වන්ට ආරම්භ කෙළේ ය.

නොයෙක් ගම් කෙතින් හා දැස් දැසි ආදිවූ ඒ ඇත් අස් ගව
76 මහිෂාදි වූත් (සවිඤ්ඤාණක වස්තුවෙන් ද) ධාතු පූජාකරවූයේ ය. "
77 සකල ලෝකාග්‍ර නායක වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ජීවමාන
කල්හි උන්වහන්සේට යම් වාර චාරිත්‍රයක් ඇති වී ද එය දන්ත ධාතූන්
78 වහන්සේට මෙ තැන් පටන් වේව"යි සිතා රජ තෙමේ එය ප්‍රකාශ
79 කරන්නා වූ "දාඨා චරිත" නම් වූ ග්‍රන්ථයක් ස්වබුද්ධින් සිංහල භාෂායෙන්
තනා ඒ ග්‍රන්ථානුසාරයෙන් ධාතූන් වහන්සේට දවසක් දවසක් පාසා
80 දින චාරිත්‍රය පැවැත් වූයේ ය. ඉක්බිත්තෙන් ඒ රජ තෙමේ සොළීරටින්
ආ නා නා භාෂිහි විසාරද වූ තර්කාගම ධාරී මනාව හික්මුණු එක් මහ
81 තෙර කෙනෙක් රාජ ගුරු තන්හි තබා උන්වහන්සේ වෙත සියලු
ජාතකයන් නිරන්තරයෙන් අසමින් ඉගෙණ එහි අර්ථ ද ධාරණ කොට
82 ඊට අනතුරුව ශුභ වූ ඒ සියලු පන්සිය පණසක් ජාතකයන් පාළි
83 භාෂාවෙන් ගෙණ සිංහල නිරුක්තියට ක්‍රමයෙන් පෙරළා පිටකත්‍රය

Non-Commercial Distribution

ධාරී වූ මහා ස්ථවිරයන් මැද අස්වා පිරිසිදු කොට ලියවා ලක්දිව සැම
තැන පැවැත්වූයේ ය.

85 යළිත් ඒ ජාතකයන් ස්වකීය ශිෂ්‍ය පරම්පරාවෙන් පාලනය
86 කෙරෙමින් පවත්වනු පිණිස ආරාධනා කොට ප්‍රාඥ මේධංකරාභිධාන
87 එක් ස්ථවිර කෙනකුට දෙවී ය. ඒ රජහු සිය නාමයෙන් ම පිරිවෙණකුත්
කරවා පරණගම, තැඹිලි හෙල දෙල්මඩ මොරවක යන මේ ගම් සතර
88 ද හේ තෙමේ දෙවී ය. මහා විජයබාහු නරෙන්ද්‍රයන් විසින් තොටගමු
89 විහාරයෙහි කරවන ලද සතළිස් පස් රියන් අයම් වූ දීර්ඝ ප්‍රාසාදය තෙම
90 යම් තැනෙක්හි හාත්පසින් ජීර්ණ වී ද එ තල්හි නැවත ඒ පරාක්‍රමබාහු
නරේන්ද්‍ර තෙම තිරියන් අයම් විතගති තුඟුකැරලි ඇති දෙ මහල් දිගු
පහයක් කරවා නා නා විධ චිත්‍ර කර්මයෙන් භාස්වර වූ ඒ පහය එකල
91 විජයබාහු පරිවෙණාධිපති කායසත්ථි නම් පින්වත් මහා ස්ථවිරයන්
92 වහන්සේට පැමිණ වූයේ ය. ගිම් ගඟ ඉවුර වෙත පවත්නා වූ සල්ගම
93 නම් වූ එක් ගමක් ද ඒ පිරිවෙණ අයත් කොට දෙවුයේ ය. හේ තෙමේ
94 පන් දහසක් නෙරළු තුරින් යුක්ත වූ අරමක් මනරම් වූ තොටගමුවෙහි
කර වූයේ ය.

95 ඉක්බිත්තෙන් හේ තෙමේ දෙව් නුවර මනෝඥ වූ ද්වාරද්වරයක්
ඇත්තා වූ දිගු දෙමහල් සිංහ ශයන ප්‍රතිමා මන්දිරයක් කරවා ඊට වටා
පිහිටා ආරාමය ද ගැටමාන්ත නම් වූඑක් ගමක් ද බුද්ධායත්ත කොට
දෙවූයේ ය.

96 මිහිපල් තෙමේ වැලිගම වෙහෙර තමන් නමින් පරාක්‍රම භුජභිධාන
97 වූ දෙමහල් දිගු පහයක් මහ සඟ සතු කොට කරවා ඒ වෙහෙරට
ඇල්ගිරි නම් වූ මහා භෝග ග්‍රාමයක් දුන්නේ ය. රත්ගම්පුර සමීපයෙහි
98 යහපත් වූ විදුම්ගම පිරිවෙන් යුක්ත වූ බෝ පිලිම මැදුරු සහිත වූ උතුම්
99 ශ්‍රී සනානන්ද නම් වෙහෙරක් කරවා තමන් ආචාර්ය වූ සොළී රටින්
100 වැඩි මහ තෙරුන් වහන්සේට දෙවුයේ ය. ඉක්බිති ඒ රජ තෙමේ
101 මායාදුනු නම් සිත්කළු රට මනා පවුරු දොරටු ඇති අළුත් නුවර කොට
102 එහි ප්‍රාකාර ගොපුද්වාර යුක්ත වූ උස් කොත් ඇති දෙමහල් දේවාලයක්
103 මනරම් කොට කරවා එහි උපුල්වන් දෙව්රජහුගේ බබළන රූපය පිහිටුවා
මහ පුද පැවැත් වූයේ ය. ඒ නරේන්ද්‍ර තෙමේ මේ ආදි මහත් ලෝක
ශාසන සංග්‍රහය ද නොයෙක් පින්කම් ද කොට මරහු වසඟ වූයේ ය.

104 පූර්වයෙහි කරණ ලද පින් බල සහිත වූ හේ තෙමේ ලද්දා වූ
අසාර ධනයෙහි ලෝභය හැර ආත්මාර්ථාදියෙහි ඇලුනේ සියලු කුසල්

Non-Commercial Distribution

කෙළේ ය. ශ්‍රද්ධාව ධන කොට ඇත්තා වූ සාධු ජනයෙනි, ආත්මාත්ථය හා ස්වානීත්‍යතාව ද සිතා දාන ශීල ප්‍රමුඛ වූ පුණ්‍ය යත් කොට ගනිව්.

105 ඒ රජු ඇවෑමෙන් වන්නි භුවනෙකබාහු නම් නරේන්ද්‍ර තෙම ද වූයේ ය. ඒ රජු ඇවෑමෙන් මහ බලැති ජයබා රජ තෙම වූයේ ය. මේ රජ දරුවන් අවෑමෙන් මහවැලි ගඟ සමීපයෙහි මනරම් වූ ගඟසිරිපුරයෙහි
106 මහා ප්‍රඥා සම්පන්න ශ්‍රද්ධා ඇත්ත වූ යහපත් ගුණයන්ට ආකාර වූ
107 භුවනෙකබාහු නම් වූ මහීපාලයෙක් තෙම වූයේ ය. ඒ රජහුගේ සතර
108 වෙනි වර්ෂයෙහි සර්වඥයන් වහන්සේගේ පිරිනිවී මෙන් එක්දහස් අටසිය අනූසතර හනුරුද්දක් ඉක්මී ගියේ යයි ක්‍රම දන්නාහු විසින් දත යුත්තේ ය. පූර්වයෙහි නරොත්තමයෝ තුමූ දුකසේ ලැබිය යුතු වූ අතිශයෙන් දුර්ලභ වූ බුද්ධකාලය ලැබ සතතයෙන් ප්‍රමාද රහිත වූවෝ දානාදී වූ නොයෙක් කුසල් කළෝ යයි දැන තෙපිදු මනාකොට සියලු කුසල් කරව්.

109 මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස විජයබාහු ආදි අටථ රාජ දීපන නම් වූ අනූවන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ එක් වෙනි පරිච්ඡේදය

1 ඒ රජු ඇවෑමෙන් ඒ පුරයෙහි පරාක්‍රමබාහු ය, පණ්ඩිත වූ
2 වික්‍රමබාහු ය යි රජ දෙදෙනෙක් වූහ. ඉන් පසු මහවැලි ගඟ සමීපයෙහි
සිත්කළු වූ පේරාදෙණි යන නාමයෙන් ප්‍රසිද්ධ වූ යහපත් පුරවරයෙහි
3 වික්‍රමබාහු නම් මහ රජාණන් ගේ කාලයෙහි ම ගිරිවංශාභිජාත වූ මහ
4 පැණැති ඒ අලගක්කෝනාර නම් වූ තේජස් හා ශ්‍රද්ධාදී ගුණාභරණ
5 ඇත්තා වූ ප්‍රභූ රාජයෙක් වූයේ ය. මහා බලැත්තේ ලෝක
ශාසනාභිවෘද්ධිය කරණු කැමැත්තේ "කැළණි පුර තොමෝ ප්‍රාසාද බෝධි
වෘක්ෂ හා උත්තම චඞ්ක්‍රමණ මණ්ඩප ප්‍රාකාර ශාලා ප්‍රතිමා මන්දිර
6 චෛත්‍යයෙන් ද, සිත්කළු සල්පිලින් ද, අතිශයින් සිත්කළු ගොපුර
ද්වාර තොරණයෙන් ද බබළයි." මේ ආදීන් වර්ණනා කරන ලද්දා වූ ද,
සර්වඥයන් වහන්සේ විසින් සෙවුනා ලද්දා වූ කැළණි නම් පුරයෙනුදු
7 දකුණු පස බුද්ධ්‍යාදියෙන් යුක්ත වූ ජනයන් විසින් වාසය කරණ ලද
යහපත් ස්ථානයෙහි දරමාගම සමීපයෙහි වූ මහා විලෙහ මහ පවුරු
වළල්ලෙන් හා දොර කොටු ආදියෙන් හෙබියා වු ජයවර්ධන කෝට්ට
නමින් ප්‍රසිද්ධ වු නුවර කෙළේ ය. පින් කැමැති මහ බලැති හේ තෙමේ
8 එහි වෙසෙමින් ශාසනාභිවෘද්ධි ආදි වූ බොහෝ පින් කෙළේ ය. ඒ
9 පස්වෙනි භුවනෙකබාහු රජ ඒ පුරයෙහි විසී ය. පුදන්නේ සංඝයාට
10 නිති බත් ආදි දානය අනල්ප කොට දෙන්නේ ශාසනාභිවෘද්ධි කරණයට
11 භික්ෂූන් රැස් කො විචාරණය කොට දුස්සීලයන් සිවුරු හරවා ලජ්ජීන්ට
සංග්‍රහ කොට බල දී බුදු සස්න බැබළ වී.

රිදී සත් දහසකින් කරඬුවක් කරවා දන්ත ධාතුව වඩා සතතයෙන්
12 ආදර ඇතිව පුජා කරන්නේ විසි හවුරුද්දක් රාජ්‍යය කොට එකලනිම
විය. ඒ රජහුගේ සුහුරු වූ වීරබාහු ය යි ප්‍රසිද්ධ වූ (ක්ෂත්‍රිය) යෙක්
13 තෙම රාජ්‍යයට පැමිණියේ ය. හේ තෙමේ ශානාභිවෘද්ධි ආදි වූ සියල්ල
14 එසේ ම කොට මෘත්‍යු රාජයා හට වසඟ විය. ඉන් මෑත භාගයෙහි
16 ශ්‍රීමත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පිරිනිවීමෙන් ද එක දහස් නව
සියයකින් මතු තෙපණස් වෙනි වර්ෂයෙහි ප්‍රඥා වීර ගුණයන්ට මන්දිර
වූ සූර්‍ය වංශයෙහි උපන්නා වූ ඒ පරාක්‍රමබාහු නරෙශ්වර තෙමෙ
17 ජයවර්ධන නාම් රම්‍ය වූ පුරයෙහි අග්‍රෝත්තමෝදාර වූ රාජ්‍යශ්‍රීයට පැමිණ
ශ්‍රද්ධාවෙන් එත්නත්‍රයෙහි පුද පටන්ගත්තේ ය. ඒ මිහිපති තෙම
මුනීන්ද්‍රයන් වහන්සේගේ දළදාව උදෙසා තුන් මහල් මනරම් වූ රුචිර
18 දර්ශන ඇති ප්‍රාසාදයක් කරවා නව රත්නයෙන් මනා කොට බඳනා ලද
රන් කරඬුවක් ද එය වසා නානාප්‍රකාර කාන්තියෙන් බබළන්නා වූ
උතුම් මැණික් බඳනා ලද අන්‍ය වූ රන් කරඬුවක් ද හෙද ඇතුළු කොට
19 රන් කරඬුවක් ද කෙළේ ය. අතුල්‍ය වූ මහත් උතුම් කරඬුවක් ද කොට

Non-Commercial Distribution

උතුම් කාන්තිමත් ස්වර්ණයෙන් ආලේප කොට බව සුව හා නිවන් සුව
20 පතන්නා වූ ඒ රජ තෙමේ ඒ උතුම් කරඬු සතරෙහි දළදාව වැඩූයේ ය.
සර්වඥ ශාසන වරයෙහි පවිත්‍රාදර සහිත වූ රජුන් විසින් කරණ ලද
ලංකාද්වීපයෙහි පුද සිහි කොට "මම ද එසේම අන්ලස්වූයේ රාජ්‍යයෙහි
21 සියලු ලාභයෙන් ඒ රත්නත්‍රය පුදමැ"යි සිතා ආදර සහිත වූ හේ තෙමේ
22 සංඝයාට අට පිරිකර හා නිති බත් ද, මාසයක් මාසයක් පාසා පූජා ද
අවුරුදු පතා තුන් රට භික්ෂූන්ට කඨින චීවර දානය ද ශ්‍රද්ධාවෙන් මහ
23 දන් ද, අවුරුද්දක් පාසා සිව්රු ද දෙවා පින් කැමති මහා යසස් ඇත්තේ
පින් රැස් කෙළේ යි. පින් ඇත්තා වූ හේ තෙමේ තමන් මෑණියන්
24 නමින් ඒ පැපිළියාණෙහි සුනේත්‍රා දේවි නම් පිරිවෙණ ද, සංඝාරාමයක්
25 ද කරවා බොහෝ ගම් කෙත් පුදා තුන් රටින් අවා වූ යතීන්ට තුන්
26 දිනක් උතුම් සාංඝික දානයක් දෙන්ට එහි ම (දන්වැට) තබ්බවා පුණ්‍ය
රාශියක් ද මොනවට කෙළේ යි.

අටුවා හා ටීකා සහිත වූ උතුම් පිටකත්‍රය පාළිය ද ලියවා සර්වඥයන්
27 වහන්සේගේ ශාසනය සංග්‍රහ කෙළේ ය. ඒ නරේන්ද්‍ර තෙම එ කල්හි
28 සද්ධර්ම පුස්තකයන් ම දවසක් දවසක් පාසා ලියනු පිණිස ලිපි කරුවන්ට
29 ග්‍රාමාදිය දුන්නේ ය. ඒ ඒ තන්හි ම මහියංගන චෛත්‍යාදි චෛත්‍යයන්හි
බඩණ්ඩුල්ල පටිසංඛරාණාදි වූ කර්මයන් හා සුණුවම් ද කරවූයේ ය.
30 එසේ ම ගඩලාදෙණි අරම ලංකාතිලක විහාරාදියෙහි සියලු සුණුවම්
ආදිය එ කල්හි කරවුයේ ය. නොයෙක් වර මහ සැණකෙළි කරවා මහා
31 පූජා ද කරවා උපසම්පදා මංගල්‍ය කරවී ය. ඒ නරෙන්ද්‍ර තෙම රාජ්‍ය
32 භාරය ලබා එ හෙයින් දෙ පණස් හවුරුද්දක් බොහෝ කුසල් කරන්නේ
33 විය. ඒ පණ්ඩිත තෙමේ සවිසි දහස් එකසිය සතළිසක් තුන් සිවුරු ද,
34 අනිකුදු පරිෂ්කාරයන් ද, පිරිවර කොට තුන් දහස් සාර සිය දෙතිසක්
35 කඨින චීවරයන් භික්ෂු සංඝයාට ශ්‍රද්ධාවෙන් දුන්නේ ය. රත්නත්‍රයෙහි
ප්‍රසන්න වූ ඒ නරෙන්ද්‍ර තෙමේ බුද්ධ ශාසනය කෙරෙහි මමත්වය ඇත්තේ
අප්‍රමාණ වූ ධනය දී නානාවිධ කුශල කර්ම කෙළේ යි.

36 ශ්‍රද්ධා ප්‍රඥා කරුණා බහුල වූ ගුණ නමැති උතුම් රත්නයන් ඇත්තා වූ පුද්ගල තෙමේ ලදභෝගයන් අසාර වශයෙන් දන්නේ සතතයෙන් අනලස් වූයේ නොයෙක් පින් මෙසේ කෙළේ යයි දැන ආත්මකාමී වූ බව සුව නිවන් දන්නා වූ ද පතන්නා වූ ද තෙපි නානාවිධ සුඛදායක වූ පුණ්‍ය රාශිය මොනවට කොට ගණිව්.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස පරක්කම භුජාදි චතුරාජ දීපන නම් වූ එක් අනූ වන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ දෙවෙනි පරිච්ඡේදය

1 ඒ රජු ඇවෑමෙන් උහු මුනුබුරු ජයබා කුමර තෙම රජ වී. ඔහු
2 නසා බුවනෙකබාහු කුමර තෙමේ මිහිපල් වූයේ ය. සම්ප්‍රාප්ත රාජාභිෂේක
ඇත්තා වූ හේ තෙමේ සත් හවුරුද්දක් විසූයේ ය. ඒ රජු ඇවෑමෙන්
3 පණ්ඩිත බැවින් පණ්ඩිත යයි ප්‍රසිද්ධ වූ පැරකුම්බා කුමර තෙමේ යහපත්
4 වූ ඒ පුරයෙහි රජ විය. ඊට ඉක්බිතිව ද වීරපරාක්‍රමබාහු යයි ප්‍රසිද්ධ වූ
කුමාරයෙක් තෙම රජ වී. ඒ රජු ඇවෑමෙන් ගුණ නමැති ආභරණයෙන්
5 සැරසුනා වූ විජයබා කුමර තෙම රජ විය. ඔහු ඇවෑමෙන් භුවනෙක
බාහු නම් රජෙක් විය. මේ රජ දරුවෝ තුමුත් ශ්‍රද්ධාදි ගුණ ශක්ති වූ
6 පරිද්දෙන් ලෝක ශාසනාභිවෘද්ධිය කොට කම් වූ පරිද්දෙන් පරලොව
ගිය හ. ශ්‍රී සංඝබෝධි මහ රාජණන්ගේ ගොත්‍රයෙහි උපන්නා වූ වීර
7 පරාක්‍රම නම් වූ කුමාරයෙක් තෙම සර්වඥයන් වහන්සේගේ පිරිනිවීමෙන්
දෙදහස් අසූ පහක් ගෙවුන කල්හි මහ බලැතියේ මහවැලි ගඟ නමැති
8 අගලින් අලංකෘත වූ සෙංකඩගල සිරිවඩන නම්පුරයෙහි රජ විය. එකල
එහි වසන්නා වූ ඒ රජ තෙම සිවුසඟරා වතින් ජනයන් රංජනය කොට
ශ්‍රද්ධායෙන් පින්කම් කරන්ට ආරම්භ කෙළේ ය. තමන්ගේ රජ ගෙයින්
9 ඉතා දුරු නූ වූ සිත් කළු වූ භූමි භාගයෙක්හි මුනීන්ද්‍රයන් වහන්සේගේ
10 පාත්‍රා ධාතුව වඩා හේ තෙමේ චෛත්‍යයක් ද ඒ සමීපයෙහි උළු සෙවිලි
11 හාත්පස අසූ සයක් සංඝාවාසයන් ද කරවා ඒ ඒ තන්හි භික්ෂූන්
12 වස්නා උපස්ථාන කොට බුද්ධ දේසිත වූ සද්ධර්මය ඇසූ යේ ය. හේ
13 තෙමේ උදාර වූ පූජා කොට පස් පණසක් පමණ සර්ව රාත්‍රියෙහි කියන්නා
වූ ධර්මයන් ද ඇසූයේ ය.

පත්‍රයන්හි පොත් ලියවා හැට දහසක් පමණ ධනයෙන් ත්‍රිපිටක
14 ද පිදූයේ ය. එක්සිය අසූවක් සර්වඥ ප්‍රතිමාවන් ද, ධාතුන් වඩන
15 පිණිස එකසිය සතළිසක් කරඬු කරවා පුණ්‍ය රාසිය ද රැස් කෙළේ යි.
හේ තෙමේ ස්වකීය පුරයෙන් නික්ම ස්වකීය පා බලයෙන් එක දවසින්
16 ම සත් ගව්වක් පමණ ගොස් නානාවිධ වූ සුවඳ මලින් හා පහන් දුම්
17 ආදියෙන් මහ පුද පවත්වමින් මහියංගන නම් වූ චෛත්‍යය පිදූයේ ය.
18 නරශ්‍රේෂ්ඨ තෙමේ එක දවසින්ම සමන්තකූට පර්වතයට ද ගොස් වටින
පසළොස් රියන් වූ උසින් පස් රියන් ප්‍රදීපා ධාරයෙහි තෙල් කළ සියයක්
19 වගුරුවා ශ්‍රීපාද ලාඤ්ඡනය පිදූයේ ය. හේ තෙමේ අග්‍ර මාර්ගීය ප්‍රාර්ථනා
කෙරෙමින් දුර්ගම වූ මාර්ගය සුද්ධ කොට යන එන්නවුන්ගේ සුව පිණිස
20 සත්සිය අසූවක් ගලින් පියගැට ද කරවී. මිහිපති තෙම මේ ආදි වූ
21 නොයෙක් පින්කම් නොවෙක් පරිද්දෙන් කොට උපසම්පදාව කරවන්ට

Non-Commercial Distribution

22 සිතා ගංතෙර බොහෝ ගෙවල් ද කරවා තුන් රට වසන භික්ෂූන් එහි
වඩා ඒ පණ්ඩිත තෙමේ ඒ භික්ෂූන් විෂයෙහි මහ පුද පවත්වන්නේ
23 ධර්ම කීර්ති මහා ස්ථවිර ප්‍රමුඛ පන්තිස් නමක් වූ භික්ෂු සංඝයා පවරා
මහෝත්සව කරමින් තුන්සිය පස් පණස් නමක් යහපත් කුල පුත්‍රයන් ද
24 තෝරා ගෙන උපසම්පදා ව ද දෙවූයේ ය. පෙර පැළලුප් නුවර වාසී වූ
25 ඒ මහාසේන නම් නරපති තෙමේ දහසක් භික්ෂු සංඝයාට දවසක්
දවසක් පාසා දන් වළඳවා එයින් ද තෘප්තියට නො පැමිණියේ උදාර වූ
26 අදහස් ඇති බැවින් හේ තෙමේ ම වස්තු ශුද්ධිය කොට දානය දෙන්ට
සිතමින් රාජ්‍යශ්‍රීය හැර උතුරු මදුරාපුර ගොස් බැළමෙහෙ කොට ලැබූ
ධාන්‍යයෙන් ශ්‍රද්ධාවෙන් දුන් දන ද අසා ශුද්ධ දානයෙහි ඇලුනා වූ
27 පන්ඩිත තෙමේ ස්වකීය කාය බලයෙන් දස හැල් කෙතක් කොට එයින්
ලද ධාන්‍යයෙන් ම මනා තොට දානයක් පැවැත් වී.

28 රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ හේ තෙමේ දෙදහස් එකසිය අසූ දෙකක්
29 සිව්රු පූජා කෙළේ ය. ඒ රජ තෙමේ පන්ලක්ෂ දහසක් ධණය ප්‍රදානය
30 කොට පින්කම් කරවී ය. නරේශ්වර තෙම හස්ත්‍යශ්වයන් දෙසැටක් ද
31 සාරසිය පණසක් ගව මහීෂයන් ද පුද කෙළේ ය. කුශලාර්ථී වූයේ මේ
ආදි වූ නොයෙක් ක්‍රමයෙන් පින්කම් කොට ස්වර්ග මාර්ගය ශුද්ධ කෙළේ
ය.

මෙසේ පර වැඩෙහි නිරන්තරයෙන් ඇලුනා වූ ශ්‍රද්ධා ඇත්තා වූ
32 අතිශයින් පණ්ඩිත වූ නරේන්ද්‍ර තෙම ලැබූ කායාදියෙහි අසාරය දැන
ගෙණ නානාවිධ සුඛදායක වූ නොයෙක් පන් මනා කොට කෙළේ ය යි
දැන ඝෝර වූ සංසාර දුඃඛයෙහි මහත් වූ භය ඇති ජනයෙනි, සංසාරය
මෙනෙහි කොට ශරීරාදියෙහි පැවැත්තා වූ සියලු ලෝභය කරව්. අකුසීත
ව පුණ්‍යරාශිය කරව්.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
ජයබා ආදිය සතත රාජ දීපන නම්වූ දෙයානුවන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ තුන් වෙනි පරිච්ඡේදය

1 ඒ මහ යසස් ඇති නරේන්‍ද්‍රයන් මෙසේ රජ කරණ කල්හි
2 ජයවර්ධනාදි වූ මුහුදු අසල රට ඒ ඒ තැන සූර්‍ය්‍ය වංශයෙහි රජුන් අතුරෙන්
3 ජනාධිපති මායාදුනු නම් වූ තේජස් ඇති එක් නරේන්‍ද්‍රයෙක් වූයේ ය.
4 ඔහු පිත් රාජසිංහ යයි ප්‍රසිද්ධ වූ කෲර වූ කුමාරයෙක් විය. පියා හා
සමග ගොස් ඒ ඒ තැන යුද කොට ජය ගන්නා වූ මහාමූර්ඛ තෙමේ
5 තමන් පියාහු ද සියතින් මැ නසා දූමිත වූයේ රාජ්‍යය ගත්තේ ය. සීතාවක
6 නුවර රාජසිංහ යයි ප්‍රසිද්ධ වූයේ ස්වල්ප කාලයක් බුද්ධ ශාසනය
කෙරෙහි ප්‍රසන්නව කුසල් කරන්නා වූ ඒ රජ තෙමේ එක් දිනෙක දන්
දී භය ඇතිව "පිතෘඝාතක කර්‍මය මම කෙසේ නසම්ද?" යි මහ තෙරුන්
විචාළේ ය.

7 එකල්හි විසාරද වූ ස්ථවිරයෝ දුර්බුද්ධි වූ ඕහට ධර්‍ම දේශනා
කොට දුෂ්ට වූ සිත සතුටු කරන්ට නො හැකිවූ හ. "කරණ ලද පාපය
8 නසන්ට නොහැකියැ" යි යන වචනය ඇසූයේ දණ්ඩෙන් ගසන ලද
9 කෙණෙහි කිපී නයෙකු සේ වූයේ ශිව භක්තිකයන් ද පිළිවිස "හැකිය"
10 යි කියන ලද වචනය අමෘතයක් සේ අසා ඇඟ අළුගා ශිවභක්ති ගෙණ
11 බුද්ධ ශාසනය නසන්නේ භික්‍ෂු සංඝයා ද මරවමින් ධර්‍ම පුස්තක දවන්නේ
ආරාමයන් ද බිඳුවා ස්වර්‍ග මාර්‍ගය ද වැසූයේ ය. හේ තෙමේ සසර කණ
12 වූයේ මිසදිටු ගත්තේ ය. සමන්තකූටයෙහි උපන් සියලු ලාභය ගන්ට
13 එහි පව්ටු මිසදිටු තවුසන් යෙදූයේ ය. මෙ සේ ඒ අධාර්මික වූ අඥාන
14 තෙමේ ගතයුත්ත නො දැන නො ගත යුත්ත ගෙණ මහත් දුක් ගත්තේ
ය.

15 එකල රාජය භය කරණ කොට ගෙණ ම භික්‍ෂූහු සිවුරු හැර
ගිහිවූ හ. ඔවුන් අතුරෙන් සසරබිය දක්නෝ ඒ ඒ තැන ගියෝ වූහ.
16 හේ තෙමේ සියලු ලොවට හිත වූ අතිශයින් නිර්‍මල වූ බුද්ධ ශාසනය
17 නසා පූර්‍ව පුණ්‍ය බලයෙන් මෙහි රාජ්‍යය කෙළේ ය. ආඥා බලයෙන්
යුක්ත වූ ඒ පාපිෂ්ඨ තෙමේ සියලු ලඞ්කා තලය තමන් අත්පත් කොට
රාජ්‍යය කෙළේ යි.

18 මෙසේ රාජ බලයෙන් යුක්ත වූ ඒ මිහිපතිතෙම ආඥා බලය
දක්වා සියලු අකුශල රාශිය කොට මාරයාගේ හස්තයට ගියේ ය. මෙසේ
පාප මිථ්‍යාදෲෂ්ටි මෝහ වසඟයන්ගේ දෝෂ දැන බියව සකල ප්‍රමාදභාව
රහිතව බොහෝ වැඩ සිදු කෙරෙත්වා.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස මායා
ධන්‍වා මහරාජාදී දීපන නම් වූ අනූ තුන් වන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ හතර වෙනි පරිච්ඡේදය

1 ඒ එජහුගේ කාලයෙහි ගඟසිරි නම් පුරයෙහි සූර්‍ය්‍ය වංශයෙහි ම
2 උපන් එක් කුමාරයෙක් තෙම කොළොම්තොට පැමිණියේ විය. ඒ
තෙමේ එහි සිටින්ට අවකාශ නොලැබ ගෝව රට ගියේ ය. බොහෝ
කාලයක් එහි සිට ගජබාහු යන නමැති ප්‍රසිද්ධ වූ මහ බලැති ප්‍රධානයා
3 මරා ලත් ජය ඇති පණ්ඩිත වූ හේ තෙමේ නොයෙක් පරිද්දෙන් සම්මාන
4 ලබා නැවත ලක්දිව් බැස කල් දූන උඩරට පසෙහි වැසියන් සම්බන්ධ වූ
5 සේනාව ලැබ මහ බලැතියේ පීතෘඝාතක රාජසිංහ රජහු ඇවෑමෙන්
6 බුදුන් පිරිනිවි දෙදහස් එකසිය පන්තිස් වන වර්‍ෂය පැමිණි කල්හි යට
7 කියන ලද ශ්‍රී වර්‍ධන පුරයෙහි ශ්‍රද්ධා සම්පන්න පින් මහ බලැතියේ
8 විමලධර්‍ම සූර්‍ය්‍ය යයි ප්‍රසිද්ධ වූ මහ යසස් ඇති නරේන්‍ද්‍රයෙක් වූයේ ය.
9 ඒ මහත් මුළු පුරය සිසාරා ඒ ඒ තන්හි අටළොස් කොටුවක් තනා උස්
කොට කරණ ලද ඝන වූ ප්‍රාකාරයෙන් යුක්ත කරවා ප්‍රතිවිරුද්ධ ශත්‍රූන්
වළකනු පිණිස ආරක්‍ෂක ජනයන් යොදා සියලු ලංකා රාජ්‍යය නිරුපද්‍රිතව
කොට එබඳු වූ රාජ කන්‍යාවක් ද අග මෙහෙසුන් කොට සම්ප්‍රාප්ත වූ
10 රාජාභිෂේක හා මහා යසස් ඇති හේ තෙමේ පින් කැමතියේ ශ්‍රද්ධායෙන්
ලෝක ශාසන සංග්‍රහ කරන්ට ආරම්භ කෙළේ ය.

11 නරශ්‍රෙෂ්ඨ තෙමේ "සර්‍වඥ දංෂ්ට්‍රා ධාතු තොමෝ කොතැන ද?"
යි විචාරා "දෙල්ගමුවෙහෙර" යයි අසා අතිශයින් ප්‍රසන්න සිත් ඇත්තේ
12 සපගමු රට දෙල්ගමුවෙහි වඩන ලද දන්තධාතුව වඩා ගෙන්වා ගෙණ
තමන්ගේ යහපත් වූ පුරයෙහි දවසක් දවසක් පාසා වඳිනට ද වත්
13 පිළිවෙත් කරන්ට ද ඒ පණ්ඩිත වූ රජ තෙම සමීපයෙහි යහපත් උතුම්
14 වූ භූමි භාගයෙක් හි සිත්කළු වූ දෙමහල් දා ගෙයක් කරවා එහි දළදාව
තබානිරන්තරාදර ඇත්තේ පූජා කෙළේ ය.

මුළු ලක්දිව උපසම්පන්න භික්‍ෂූන් නැති බැවින් ඇමතියන් ද
15 රක්ඛඞ්ග නම් වූ දේශයට යවා නන්දිචක්‍රාදි භික්‍ෂූන් පවරා ලක්දිවට
16 ගෙන්වා උතුම් වූ ශ්‍රී වර්‍ධන පුරවරයෙහි වාසය කරවා ඉක්බිති ඒ එජ
17 තෙම ආදරයෙන් උපස්ථාන කොට මහවැලි ගඟ ගැටඹ නම් තොට
18 උදකුක්ඛේප සීමායෙහි මනෝඥ වූ ගෙයක් කොට සර්‍වඥයන්
19 වහන්සේගේ පරිනිර්‍වාණයෙන් පසු දෙදහස් එකසිය සතළිස් වන වර්‍ෂයෙහි
භික්ෂූන් එහි වඩා ඒ මහා භික්‍ෂු සංඝයා කෙරෙහි බොහෝ වූ කුලපුත්‍රයන්
20 උපසම්පන්න කරවා සර්‍වඥ ශාසනය රක්‍ෂා කෙළේ ය. බොහෝ
21 කුලපුත්‍රයනුත් ශාසනයෙහි පැවිදි කරවා බොහෝ වූ සියුපසයෙන් ද
22 උපස්ථාන කරන්නේ කුශලාර්ථී වූයේ මේ ආදි වූ නොයෙක් ක්‍රමයෙන්

Non-Commercial Distribution

මහත් වූ පින් කොට ස්වර්ග මාර්ගය ශුද්ධ කෙළේ යි. පණ්ඩිත වූ හේ
23 තෙමේ එ කල්හි බුද්ධ ශාසනයෙහි පැවිදිව සිටි ඒ රජහුගේ ම මල් වූ
කුමරහු ගෙන්වා ඔහු සිවුරු හරවා රාජ්‍ය භාරයෙහි නියෝග කොට
කම් වූ පරිද්දෙන් පරලොව ගියේ යි.

24 මෙසේ ඥාන බලයෙන් යුක්ත වූ මහිපාල තෙමේ බොහෝ පින්
කොට ඇති නිර්මල වූ බුද්ධ ශාසනය හොබවන්නේ ආඥා බලය දක්වූයේ
ය. ශ්‍රද්ධාව ධන කොට ඇති චතුර වූ එබඳු පුද්ගල තෙමේ ද මරහු
වසඟ විය. අනිත්‍ය භාවාදී වූ සියලු ආදීනවය දන ජනයෝ අප්‍රමාදයෙහි
ඇලුනෝ වෙත්වා.

මෙතෙකින් හුදී ජනයාගේ ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
විමලධමම රාජ දීපන නම් වූ සිවු අනුවන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ පස් වෙනි පරිච්ඡේදය

1 පැමිණි රාජ්‍යාභිෂේක ඇත්තා වූ ඒ සේනාරත්න නරේන්ද්‍ර තෙම
2 නිරන්තරයෙන් ආදර ඇතිව දානාදි පුණ්‍යකර්මයන්හි යෙදුනේ, එ කල්හි
3 සිව්සඟරා වතින් ජනයන් රංජනය කොට දන්තධාතු පූජාව හා මහදන්
පැවැත්වී. එ කල්හි හේ තෙමේ දෙටු සොහොවුරු වූ නරේන්ද්‍රයන්ගේ
4 මෙහෙසිය ම අග මෙහෙසුන් කොට ඒ නුවර වාසය කෙළේ ය. එ
කල්හි කොළොම් තොට සිටි වෙළෙන්දෝ බොහෝ කලක් එසේ සිට
5 ක්‍රමයෙන් උත්සන්න වූහ. මිසදිටු ගත් පව්ටු කුරිරු දරුණු පරංගි නම්
6 වූ ඒ සියල්ලෝ මනෝඥ වූ ඒ ඒ රට ගොස් කෙත්වත් නසන්නාහු
7 ගෙවල් ද්වන්නාහු කුල පරම්පරාවන් නසමින් මෙසේ සිංහලයන්
වැනසූහ. පුරයන් ද, චෛත්‍යාරාමයන් ද, ප්‍රතිමා මන්දිරයන් ද, බිඳ
8 බෝධිවෘක්ෂ බුද්ධප්‍රතිමාදීන් ද නසා බුද්ධශාසනය හා ලෝකය ද වනසා
9 ඒ ඒ තැන බලකොටුව ද බැඳ යුද කරමින් සිටගත් හ. එ කල වන
පර්වත නදී දුර්ගස්ථාන ඇති පන්සිය ආදී රට ද දන්තධාතු ස්වාමීන්
10 ගෙන්වා නිර්භය ස්ථානයෙන්හි පිහිටුවා ධාතු රක්ෂාවෙහි නියුක්තයන්
11 ද එහි වස්වා පූජාවිධිය පවත්වමින් දන්දධාතු ස්වාමීන් මොනවට රැක,
ඒ සේනාරත්න නම් නරේන්ද්‍ර තෙම ඒ පුරයෙන් නික්ම හස්තසාර වස්තු
12 ආදීන් හා දෙටු බෑ රජහුගේ පුත්‍රයන් ද ගැබ් සහිත වූ ප්‍රවර ධන්‍ය
පුණ්‍ය ලක්ෂණ ඇති ස්වකීය මහෝසිකාවුන් ද මොනවට යෝග්‍ය
13 විධියෙන් ගෙන මහියඞගනයට ගියේ ය. ඒ නරේන්ද්‍රයා එහි ම වසන
කල්හි ඒ මෙහෙසි තොමෝ ඉතා යහපත් නකතෙක තේජස් ඇති
පුත්‍රයෙක් ප්‍රසව කළා ය.

14 වෛරීන්ගේ දෙටු තෙමේ ඒ දවස් රෑ බිය එලවන්නා වූ ස්වප්නයක්
15 දුටුයේ ය. (එනම්) ඒ පුරයෙන් කදෝපැණියෙක් පමණ වූ ගිනි පුපුරක්
16 පූර්වදිග්භාගයෙන් නික්ම ක්‍රමයෙන් එය මහත් ව අවුත් කොළඹ තොට
මැද පැමිණියේ ය. එය අතිශයින් මහත් ව එකෙණෙහි සියල්ල දැවූයේ
17 ය. එ දවස ම ඔහුගේ තේජසින් ශ්‍රී වර්ධන පුර සමීපගත වූ වෛරී
18 ජනයෝ බියෙන් තැති ගත් සිත් ඇත්තෝ පලා ගිය හ. නරේන්ද්‍රතෙම
අනුක්‍රමයෙන් වැඩෙන්නා වූ දෙවෙනි චන්ද්‍රයෙක් බඳු ස්වකීය පුත්‍රයා
19 ආදී වූ සියල්ල ආදර සහිත ව මනා කොට රැකැ පැමිණි කල් දැන
20 තමන් සතු සියල්ල රැගෙන ශ්‍රී වර්ධන පුරයටම නැවත අවුත් දෙටු බෑ
රජහුගේ පුත්‍රයන් ද තමන් ඖරස පුත්‍රයා ද වෘර්ධියට පැමිණි කල්හි
දයාවෙහි ඇලුනු සිත් ඇත්තේ ඔවුනට පර්වතාදියෙන් පරික්ෂිප්ත වූ තමන්
21 අයත් රට බෙදා පත්‍ර තුණෙක්හි මොනවට ලියවා ඒ පුත්‍රයන් දන්ත
ධාතූන් වහන්සේලා ලඟ තබා කුමාරයන් එහි පමුණුවා රුචි වූ පරිද්දෙන්

Non-Commercial Distribution

# අනූ පස් වෙනි පරිච්ඡේදය

1 පැමිණි රාජ්‍යාභිෂේක ඇත්තා වූ ඒ සේනාරත්න නරේන්ද්‍ර තෙම
2 නිරන්තරයෙන් ආදර ඇතිව දානාදි පුණ්‍යකර්මයන්හි යෙදුනේ, එ කල්හි
3 සිව්සඟරා වතින් ජනයන් රංජනය කොට දන්තධාතු පූජාව හා මහදන්
පැවැත්වී. එ කල්හි හේ තෙමේ දෙටු සොහොවුරු වූ නරේන්ද්‍රයන්ගේ
4 මෙහෙසිය ම අග මෙහෙසුන් කොට ඒ නුවර වාසය කෙළේ ය. එ
කල්හි කොළොම් තොට සිටි වෙළෙන්දෝ බොහෝ කලක් එසේ සිට
5 ක්‍රමයෙන් උත්සන්න වූහ. මිසදිටු ගත් පව්ටු කුරිරු දරුණු පරංගි නම්
6 වූ ඒ සියල්ලෝ මනෝඥ වූ ඒ ඒ රට ගොස් කෙත්වත් නසන්නාහු
7 ගෙවල් දවන්නාහු කුල පරම්පරාවන් නසමින් මෙසේ සිංහලයන්
වැනසූහ. පුරයන් ද, චෛත්‍යාරාමයන් ද, ප්‍රතිමා මන්දිරයන් ද, බිඳ
8 බෝධිවෘක්ෂ බුද්ධප්‍රතිමාදීන් ද නසා බුද්ධශාසනය හා ලෝකය ද වනසා
9 ඒ ඒ තැන බලකොටුව ද බැඳ යුද කරමින් සිටගත් හ. එ කල වන
පර්වත නදී දුර්ගස්ථාන ඇති පන්සිය ආදී රට ද දන්තධාතු ස්වාමීන්
10 ගෙන්වා නිර්භය ස්ථානයෙහි පිහිටුවා ධාතු රක්ෂාවෙහි නියුක්තයන්
11 ද එහි වස්වා පූජාවිධිය පවත්වමින් දන්දධාතු ස්වාමීන් මොනවට රැක,
ඒ සේනාරත්න නම් නරේන්ද්‍ර තෙම ඒ පුරයෙන් නික්ම හස්තසාර වස්තු
12 ආදීන් හා දෙටු බෑ රජහුගේ පුත්‍රයන් ද ගැබ් සහිත වූ ප්‍රවර ධන්‍ය
පුණ්‍ය ලක්ෂණ ඇති ස්වකීය මහෝසිකාවුන් ද මොනවට යෝග්‍ය
13 විධියෙන් ගෙන මහියඞගනයට ගියේ ය. ඒ නරේන්ද්‍රයා එහි ම වසන
කල්හි ඒ මෙහෙසි තොමෝ ඉතා යහපත් නකතෙක තේජස් ඇති
පුත්‍රයෙක් ප්‍රසව කළා ය.

14 වෛරීන්ගේ දෙටු තෙමේ ඒ දවස් රෑ බිය එලවන්නා වූ ස්වප්නයක්
15 දුටුයේ ය. (එනම්) ඒ පුරයෙන් කදෝපැණියෙක් පමණ වූ ගිනි පුපුරක්
16 පූර්වදිග්භාගයෙන් නික්ම ක්‍රමයෙන් එය මහත් ව අවුත් කොළඹ තොට
මැද පැමිණියේ ය. එය අතිශයින් මහත් ව එකෙණෙහි සියල්ල දැවූයේ
17 ය. එ දවස ම ඔහුගේ තේජසින් ශ්‍රී වර්ධන පුර සමීපගත වූ වෛරී
18 ජනයෝ බියෙන් තැති ගත් සිත් ඇත්තෝ පලා ගිය හ. නරේන්ද්‍රතෙම
අනුක්‍රමයෙන් වැඩෙන්නා වූ දෙවෙනි චන්ද්‍රයෙක් බඳු ස්වකීය පුත්‍රයා
19 ආදී වූ සියල්ල ආදර සහිත ව මනා කොට රැකැ පැමිණි කල් දැන
20 තමන් සතු සියල්ල රැගෙන ශ්‍රී වර්ධන පුරයටම නැවත අවුත් දෙටු බෑ
රජහුගේ පුත්‍රයන් ද තමන් ඖරස පුත්‍රයා ද වෘර්ධියට පැමිණි කල්හි
දයාවෙහි ඇලුනු සිත් ඇත්තේ ඔවුනට පර්වතාදියෙන් පරික්ෂිප්ත වූ තමන්
21 අයත් රට බෙදා පත්‍ර තුණෙක්හි මොනවට ලියවා ඒ පුත්‍රයන් දන්ත
ධාතූන් වහන්සේලා ලඟ තබා කුමාරයන් එහි පමුණුවා රුචි වූ පරිද්දෙන්

Non-Commercial Distribution

23 ගන්ට නියෝග කෙළේ ය. එ කල්හි වැඩිමහල් කුමරසීහට ඌව රට ද,
එසේ ම විජයපාල නම් කුමාරයා හට මාතල රට ද, රාජසිංහ නම් වූ
බාලකුමාරයාහට උඩරට පසද වූහ.

24 මිහිපති තෙම මෙසේ සම්ප්‍රාප්ත වූ පුත්‍රයන් බලා ස්වකීය පුත්‍රයාට
25 සම්ප්‍රාප්ත වූ පස් උඩරට ලේඛනය දැක අතිශයින් සතුටුව මහ පිණැත්තේ
26 යයි කීයේ යි. ඒ නරශ්‍රේෂ්ඨ තෙම ඒ ඒ රට ඒ පරිද්දෙන් කුමාරයන්ට
දී දානාදී පුණ්‍ය කර්‍මයන් හා ලෝක ශාසන සංග්‍රහය ශක්ති වූ පරිද්දෙන්
කරමින් හත් අවුරුද්දක් විසූයේ ය.

27 ඒ මිහිපති තෙම ස්වකීය පුත්‍රාදීන්ට මේ ලංකාව හා බුද්ධ ශාසනය
රක්‍ෂා කරණු පිණිස දයාවෙන් රාෂ්ට්‍රයන් බෙදා දී නො වැළැක්විය හැකි
වූ මරණයට පැමිණියේ ය.

මෙතෙකින් හුදී ජනයා පහන් සංවේග පිණිස කල මහවස සේනාරතන රාජ දීපන නම් වූ අනූපස් වන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ හය වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් ඒ නර ශ්‍රේෂ්ඨයෝ තුන් දෙන කල් වූ පරිද්දෙන් ඒ
2 ඒ තත්හි සමගිව සිට රාජ්‍ය සුඛය ද විඳින්නෝ පරඬිගීන් සමග යුද
3 කරන්නෝ ඒ ඒ තත්හි ජයග්‍රාහී වූහ. නැවත ඒ තුන් බෑ රජ දරුවෝ
4 ඔවුනොවුන්ට විරුද්ධ වූහ. ඔවුන් අතුරෙන් මහ යසස් ඇති රාජසිංහ
නරේන්ද්‍ර තෙමේ ඒ වැඩිමහලු සහෝදරයන් පහ කොට ඒ රාෂ්ට්‍රායන්
තමා අයත් කෙළේ ය. එකල වැඩිමහල් නරෙන්ද්‍රයා විෂ යෙදීමෙන්
මැරූ කල්හී, මාතලයෙහි සිටි නරේන්ද්‍ර තෙමේ යානකට නැගී ගොස්
5 රට සීමාව ඉක්මුණු කල්හි ලත් එක් පුරුෂයකු සමඟ මුහුදින් එතර ද
6 ගියේ ය.

ඉක්බිත්තෙන් නො ඉක්මිය හැකි හසුන් ඇති ළංවිය නොහැකි
7 පරයනු නො හැකි වූ සිංහ සමාන වික්‍රමාන්විත අන්‍ය වූ රාජසිංහ
නරෙශ්වර තෙම පියසතුව තිබුන රටම ප්‍රථමයෙන් ගත්තේ ය. සම්‍යක්
ද ඃස්ධීක දෙවියන් විසින් ලෝකශාසනාභිවෘර්ධිය පිණිස නිර්මිත කරණ
ලද්දකු සේ යුද්ධයෙහි ධීර වූ වීර වික්‍රමාන්විත බල ඇත්තෙක් වූයේ ය.

8 කුමර ක්‍රීඩායෙන් කෙළෙනේ අන්‍ය වූ අශ්වයෙකු නැගී පුරුෂයෙකු
9 හා සමග තේමේත් අසෙකු නැගී ගියේ සත්කළ කල්හි වනාහි අශ්ව
තෙමේ වීථියෙන්හි දිව එහි මඩෙහි ගැලුනේ ය. වික්‍රම සම්පන්න වූ ධීර
10 තැනැත්තේ තෙමේ අහසට නැගී පසුව ආවා වූ අසු නැගුනහු ඉවත්
11 කොට මහත් බල ඇතියේ ඒ අසුනැගී හිඳ ගියේ ය. රත්වැම් තොට
යයි කියන ලද බියකරු වූ ගංතොට මෙතර ගලින් අහසට පැන පරතෙර
12 ගලට පැමිණියේ ය. මේ ආදි වූ නෙයෙක් ක්‍රමයෙන් බල දන්නා ලද්දේ
ලෝකශාසනාභිවෘර්ධි කරණු කැමති මහත් අදහස් ඇත්තේ නොයෙක්
13 පරිද්දෙන් යුද්ධෝපකරණාදිය සාදා යුද්ධ කරණු පිණිස සැදුනා වූ ඒ
14 සිහල ජනයන් ගෙණ සංග්‍රාමාරම්භකරණු පිණිස හස්ත්‍යශවයර රා
15 සේවකාදීන් හා සමගශුභ වූයේ ශුභ මුහුතීයෙක් හි ඒ ශ්‍රීවර්ධන පුරයෙන්
නික්ම මහා යෝධාදීන් විසින් ද මහාභාත්‍යාදීන් විසින් ද, දුනු කඩු
කොත් ආදී වූ ගන්නා ලද ආයාධ පන්තියෙන් හා බෙර මිහිඟු බෙර ආදි
16 වූ තූර්‍ය්‍යංගයෙන් පෙරටු කරණ ලද්ද් දානාදී පුණ්‍යකම් පිණිස බුද්ධ
පුත්‍රයන් කැටුව ගෙන රජ තෙමේ ඒ ඒ තැන ගොස් සෙනහජ සෙයින්
17 භයංකාර වූ රණහෙහරි සෝෂා වෙන් ගුගුරුවා නිර්භයව යුද්ධාරම්භ
කෙළේ ය.

Non-Commercial Distribution

18 ඒ නරේන්ද්‍ර තෙමැඋඩරට පසට පැමිණි වෛරීන් හා සමගම
19 පළමුවෙන් මහ යුද්‍ද කොට බොහෝ පාපීන් මරවා කර්කශඅධම වූ සතුරන්
20 ඒ ඒ තැනින් පලවා කඳවුරු බිඳ ජය ගත්තේ ය. ඔබ මොබ බලා ගිනි
21 කඳු රැලි පැන පර්වත දුර්ගයෙන් වැටෙමින් භයින් තර්ජිතව දුවන්නා වූ
22 වෛරීහු සිංහයෙක් ඇත්මුලකට වන් කල්හි සෙයින් නිර්භය වූ ඒ
නරේන්ද්‍රයා යුද මැද වන් කල්හි වායු වේගයෙන් යන පුලුන් සේ බැහැර
ගියහ. ඒ ඒ තැන විසූ සතුරන් හා නොයෙක් පරිද්දෙන් යුද කොට
බොහෝ වූ පසමිතුරු ජනයන් මරා පලවාත් ඒ රට ගෙණ නිරුපද්‍රව
23 කොට කොට බිඳුවා මහත් බලය දැක්වී. භයින් තර්ජිත බොහෝ වූ
24 වෛරී ජනයෝ සැඟවී ගිය හ. මිසදිටු පාපී ජනයෝ මුහුදු අසල ඒ ඒ
තන්හි ඒ ඒ කඳවුරෙහි මඳ කලක් වෙසෙමින් නැවත නැවත ඒ ඒ රට
25 පැහැර ගන්ට ආරම්භකළහ. ඉක්මිය නොහැකි හසුන් ඇති රාජසිංහ
26 නරේන්ද්‍රතෙම ඒ ප්‍රවෘත්තිය ද අසා පූර්වදිග්භාගයෙහි දාගාවැව වෙත
27 නැවත පැමිණියේ ය. පැමිණ ජ එහි සිටියා වූ මනුනීතියෙහි විසාරද වූ
28 ඒ නරේන්ද්‍ර තෙම ඕලන්දයින්ගේ ප්‍රවෘත්තිය අසා යහපතැයි සිතා
ඔවුන්ගේ මනෝහර වූ දේශයට ඇමැතියන් ෙ දදෙනෙක් යනා බොහෝ
29 වූ ජනයා විසින් ගැවසෙන ලද්දා වූ දිගා වැව සමීපයට පැමිණියා වූ
30 මුහුදු තෙර ඔවුන් පැමිණි කල්හි ඔවුන්ට සංග්‍රහ කොට ස්වකීය ලංකාවේ
31 බලය ද ඔවුන්ට දක්වන්ට සිතා බලාසිටිව් යයි මොනවට අණ ජ කොට
ඒ නරේන්ද්‍ර තෙම සමීපස්ථානවෙහි සිටි වෛරීන් හා නොයෙක්
32 පරිද්දෙන් යුද්‍ද කොට එතැන්හි සතුරන් නසා ද කඳවුර ගෙණ ඕලන්ද
33 රට වාසීන්ට ඒ ස්ථානය දීම ආදී වූ බොහෝ සංග්‍රහ කොට යහපත් සේ
සතුටු කෙළේ ය. එතැන් පටන් ලංකේශ්වර තෙම දෙ සෙනඟ විසින්
34 පෙරටු කරණ ලද්දේ හාත්පස ගොඩ මුහුද (දෙක්හි) යුද්‍ද කරන්ට ආරම්භ
35 කොට ඒ ඒ තැන පිහිටි ශෛලයෙන් ඝන වූ ප්‍රාකාරයෙන් අලංකෘත වූ
36 බලකොටුද බිඳ පසමිතුරන් නසා මුළු ලක්දිව මහ බලයෙන් යුක්ත වූ
බෝකලක් බලකොටු බැඳ සිටියා වූ වෛරීන් ජනයන් නිරවශේෂ
37 වසයෙන් විනාස කොට නිරුපද්‍රව කො පසමිත-න් බල වලක්වනු පිණිස
38 ඕලන්ද වාසී වූ ජනයන් මුහුදු අසල ස්ථානයන්හි ලංකාරක්‍ෂා පිණිස
යෙදූයේ ය. නරේශ්වර තෙම අවුරුදු පතා ඔවුන් විසින් නොයෙක්
පරිද්දෙන් පඬුරු ද තෙම අවුරුදු පතා ඔවුන් විසින් නොයෙක් පරිද්දෙන්
පඬුරු ද ගෙන්වා එන සේ නියම කොට අසුරු යුද්‍ද කොට ජයගත්
39 සක්දෙව් රජහු සෙයින් ස්වකීය පිරිස ගෙණ තමන් පුරයට ප්‍රවිෂ්ට
වූයේ ය. නිරුපද්‍රව ම වසන්නා වූ පණ්ඩිත වූ රාජසිංහ නරේන්ද්‍ර තෙම
40 ස්ථානාන්තරයන්ට සුදුසුසන් යහපත් සේ විචාරණය කොට සේනාපති
බැව් ආදි තනතුරු දුන්නේ ය.

Non-Commercial Distribution

41 නරේශ්වර තෙමේ බුද්ධායතත වූ ද දේවායතන වූ ද සියලු ගම්
කෙත් ආදිය පූර්වයෙහි වූ පරිද්දෙන් හා විධි වූ පරිද්දෙන් එසේ ම දානය
42 කොට ඉක්බිති එධුරා පුරයෙන් රාජ කන්‍යාවන් ගෙන්වා මහ බැලැත්තේ
43 දෙපණස් හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය.

44 මෙසේ බල බලැති යම් රාජසිංහ නම් නරේශවරයෙක් තෙම
සූර්‍ය්‍ය වංශයෙහි උපන් මුනිරායන් වහන්සේ ශාසනය හාලෝකය
ස්වකීයාක්ෂිය සෙයින් ද, ආත්මය පරිද්දෙන් ද මනා කොට රක්ෂා
කෙළේ ද, ඒ නරෝත්තම තෙම මෘත්‍යුරාජයා සමීපයට ගියේ ය.

මෙසේ වෛරී බල විනාස කිරීමට දක්ෂ වූ මහ බලැත්තා වූ
පෘථිවිශ්වර රජ තෙමේ බලාදියෙන් මරුවා දිනන්ට නොහැකි යයි ඒ
ප්‍රබවය පණ්ඩිතයන් විසින් දැන, මරුවා ගේ පැමිණීමට පළමු කොට
මහත් වූ ආදරයෙන් සතතයෙන් දානාදි පුණ්‍යයයන් කටයුතුම ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ වස
රාජසිංහ රාජ දීපනය නම් වූ සයානු වන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ හත් වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් ඒ රාජසිංහ රජහුගේපුත්‍ර වූ ශ්‍රද්ධා ගුණාභරණ
ඇත්තා වූ රත්නත්‍රමෙයහි මත්වයෙන් යුක්ත වූ විමලධර්ම සූර්ය නම්
2 කුමාර තෙම රජ වූයේ ය. ගුණාභරණයෙන් සැරසුන ඒ නරෙන්ද්‍ර
තෙම මධුරා පුරයෙන් පිය රජහු විසින් ගෙනෙන ලද මෙහෙසිය දුවම
3 අගමෙහෙසුන් කොට සිවු සඟරා වතින් දැහැමෙන් සෙමෙන් සතතයෙන්
රංජනය කොට ලංකා රාජ්‍යය පාලනය කෙළේ ය.

4 පැමිණි රාජ්‍යාභිෂේක ඇති ඒ පෘථිවීශ්වර තෙම බුද්ධ ශාසනයෙහි
ප්‍රසන්න වූයේ දංෂ්ට්‍රා පූජාදී වූ සියල්ල නොයෙක් පරිද්දෙන් ආරම්භ
කොට මුනීන්ද්‍රයන් වහන්සේගේ දළදාව උදෙසා මනෝහර වූ නොයෙක්
5 කර්මයෙන් මොනවට බබළන්නා වූ තුන්මහල් පහයක් ද කරවා රීදී
6 විසිපත් දහසකින් මනෝඥ වූ කරඬුවක් ද කරවා එය රනින් ආලේප
7 කොට නව රත්නයන් ද ඔබ්බා රත්නා චෛත්‍යයක් සමාන වූ ඒ මහ
කරඬුවෙහි සර්වඥ දංෂ්ට්‍රා ධාතුව වැඩී ය. උපසම්පදා ද කරවන්ට සිතා
8 පන්සියයක් පන්සියයක් වශයෙන් චීවරාදී වූ යහපත් පරිෂ්කාරයන් වෙන්
9 වසයෙන් සජ්ජිත කොට පඬුරු ආදිය සමග රාජ සන්දේශාදි ඒ සියල්ල
දී පණ්ඩිත වූ අමාත්‍යයෙක් රක්ඛංග දේශයට යවා සන්තාන නම්
ස්ථවිරයන් වහන්සේ ආදි කොට ඇති භික්ෂු සංඝයා පවරා භික්ෂූන්
10 තිස්තුන් නමක් මෙහි ගෙන්වා යහපත් වූ ශ්‍රීවර්ධන පුරයෙහි වාසය
11 කරවා සිවු පසයෙන් සකස් කොට උපස්ථාන කරමින් පෙර පරිද්දෙන්
12 ගංතොට උදකුකෙඛප සිමායෙහි මනාකොට ගෙයක් කරවා එහි භික්ෂු
සංඝයා පමුණුවා කුල පුත්‍රයන් තිස්තුන් දෙනෙක් උපසම්පන්න කරවා
13 බුද්ධ ශාසනය බැබළ වූයේ ය.

පන්සිය විස්සක් කුල පුත්‍රයන් ශ්‍රද්ධායෙන් හෙරණ පැවිදි බැවින්
14 පිහිටුවා බොහෝ වූ සිව්පසින් උපස්ථාන කරන්නේ සද්ධර්මයෙන්
15 හික්මවා පුණ්‍යරාශිය ද රැස්කෙළේ ය. පදව්‍යතිහාර කුශලය ද මහතැයි
සිතා සමන්තකූට පර්වතයට ද ගොස් මාණික්‍යමුක්තාපලාදියෙන්
16 ස්වර්ණරත්න භාණ්ඩයෙන් ද නානා විධ වස්ත්‍රාදියෙන් ද මහපුද
17 පවත්වමින් සත් දිනක් එහි වාසය කෙළේ ය. සමන්තකූට පර්වත
මස්තකයෙහි පිහිටියා වූ ඒ සර්වඥ පාදලාඤ්ඡනය රජතමය වූ මහත් වූ
18 ඡත්‍රයකින් වසා මහා පූජාද කෙළේ යි. දවසක් දවසක් පාසා ධර්ම
19 ශ්‍රවණය කරමින් පොහොයක් පාසා පෙහෙවස් රකිමින් බොහෝ වූ
20 කුසල් හේ තෙමේ කෙළේ ය. කුසලාර්ථී වූ හේ තෙමේ මේ ආදී වූ

Non-Commercial Distribution

නොයෙක් ක්‍රමයෙන් රෑ දවල් අප්‍රමාද වූයේ නානා විධ වූ කුසල් කෙළේ
21 ය. ඒ නරේන්ද්‍ර තෙමේ මෙසේ ලෝකශාසන සංග්‍රහ කොට දෙවිසි
හවුරුද්දක් වාසය කෙළේ මරුවා වසඟ වූයේ ය.

22 දානාදි වූ නොයෙක් කුශලයන් කෙරෙහි දයා ඇත්තා වූ අතිශයින්
ධීර වූ හේ තෙමේ ලොකෛකනායක වූ මුනිශ්වරොත්තමයන් වහන්සේගේ
23 උතුම් වූ ශාසනය මෙසේ ආදර සහිතව ම බැබළවූයේ ය. (තෙපිදූ)
නිරන්තරයෙන් අප්‍රමාදව ශාසනය බබුළුවවි ඉක්බිත්තෙන් ඒ
24 නරේන්ද්‍රයාණන් පුත්‍ර වූ ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ නම් වූ කුමාර
තෙම රජ වූයේ ය. ප්‍රඥාවීරගුණයන්ට මන්දිරායමාන වූ නරේන්ද්‍ර සිංහ
25 නම් වූ ඒ රජ තෙම ලංකාරාජ්‍ය රක්ෂා කරණු පිණිස මධුරා පුරයෙන් ද
රාජකන්‍යාවන් ගෙන්වා අගමෙහෙසුන් කොට දානාදි පින්කම් හා
දන්තධාතු පූජාද දවසක් දවසක් පාසා කරන්නේ ම පුණ්‍යස්කන්ධයක්
26 ද රැස් කළේ ය. පිය රජාණන්ගේ කාලයෙහි උපසම්පදා ලත් භික්ෂූන්ට
උපකාර කරන්නා වූ හේ තෙමේ බෙහෝ කුල පුත්‍රයන් පැවිදි කරවා
ශ්‍රද්ධාවෙන් ශාසන සංග්‍රහ කෙළේ ය.

27 සර්වඥයන් වහන්සේ ජීවමාන කාලයෙහි ම කරවනලද මහියංගන
චෛත්‍යය වඳනා පිණිස මහසෙන් සහිත වූ නරේන්ද්‍ර තෙම වැඩ
28 නානාවිධ විචිත්‍ර වස්ත්‍රයෙන් එකල චෛත්‍යයපුදා රිදී මල්හා රන්මලින්
29 ද, දියෙහි උපන්නා වූ ද බොහෝ නානාප්‍රකාර සුගන්ධ පුෂ්පයෙන් හා
30 ඛාද්‍ය භෝජ්‍යාදියෙන් මහපුද පවත්වා මහපින් ද රැස් කෙළේ ය.
31 මහසෙන් ගෙණ එම මියුගුණු වෙහෙරට දෙවරක් වැඩ මහ පුද
32 පැවැත්විය. ඒ නරේන්ද්‍ර තෙම ශ්‍රද්ධාවෙන් දෙවරක් සමන්තකූට පර්වතයට
වැඩ පූජාත් කොට පුණ්‍ය රාශීය රැස් කර ගත්තේ ය.

33 මහ පිරිස් ගෙණ මහනුවරින් නික්ම මහත් වූ අනුරාධපුරයට
වැඩ මහ පුද පැවැත්වූයේ ය. හෙතෙම සුගත චීවර ප්‍රමාණ වූ සිවුරක්
34 කරවා පූජා වස්තුවෙන් නොයෙක්රිද්දෙන් සර්වඥ දංෂ්ට්‍රාව පිදූයේ ය.
35 මුල නගරයෙන් නුදුරු වූ සිත් කළු ගංඉවුරෙහි මහපොල් උයනෙහි
කුණ්ඩසාලය යන නමැත්තා වූ ශාඛා නගරයෙක් කොට වස්සා වූ එ
36 නරේන්ද්‍ර තෙමේ එහි මනා කොට සෙනසුන් කරවා සාමණේරවරයන්
37 වාසය කරවා දානාදී බොහෝ කුසල් දිනක් දිනක් පාසා කරන්නේ
38 පුස්තකයන් ද ලියවා පියරජාණන් විසින් දන්තධාතූන් වහනසේ උදෙසා
39 මහනුවර කරවන ලද මන්දිරය ජීර්ණවූවා දැක කම්පිත වූ සිත් ඇති ඒ
නරේන්ද්‍ර තෙම දෙමහල් උතුම් ශුභ ප්‍රාසාදයක් කරවන්නේ නානා
විධවිචිත්‍ර කර්මයෙන් බබළන ද්වාරයෙන් යුක්ත කොට කලධෞත

Non-Commercial Distribution

40 පර්වතයක් මෙන් සුණුවමින්බැබළුම් ඇති තොට පලයෙන අලංකෘත
කොට මාලකද්වයෙහි භිත්ති (මතුයෙහි) හි විදුර ජාතකය ගුත්තිල
41 උම්මග්ග ජාතකය දධි වාහන මහා කණ්හ සුතනු ජාතකය, ඡද්දන්ත
42 ධම්මධ්වජ ධම්මපාල ජාතකය මහාජනක ධාතකය පදමානවක ධම්ම
සොණ්ඩි මහානාරද කස්සප ජාතකය මහපදුම තේලපත්ත චුල්ලපදුම
43 ජාතකය සත්තුභත්ත අන්ධභූත චම්පෙය්‍ය සස ජාතකය විසයහ කුස
44 සුතසොම තේමිය යන ජාතක ද චුල්ලධනුර්ධර ජාතකය හා සච්චංකිර
ජාතකය ද දූම්මෙධ ජාතකය හා කාලිංගබෝධි ජාතකය ද සීලව ජාතකය
45 හා එසෙ ම මණ්ඩබ්බ ජාතකය ද වෙස්සන්තර ජාතකය යන මේ
46 ජාතක දෙතිස විචිත්‍ර වූ සිත්තමින් මොනවට කරවා නරේන්ද්‍ර තෙමේ
47 අප්‍රමාණ වූ පුණ්‍යස්කන්ධයක් රැස් කෙළේ යි. ඒනුවර මැද මහා බෝධි
වෘක්ෂ හා චෛත්‍යය ද නාථ දේවාලය ද ඇතුළු කොට හාත්පසින්
48 ගලින් නිමවන ලද්දා වූ ඝනොත්තුංග වූ සුණුවමින් බබළන්නා වූ
49 පුරස්ත්‍රියගේ ශ්‍රීවාලංකාරයට මුක්තාහරයක් මෙන් යහපත් වූ ප්‍රාකාරය
ක් ද කරවා කීර්ති දේහය පැවැත්වූයේ ය.

50 තමන්ගේ කාලයෙහි පැමිණි හෙරණ පැවිදි තැන් අතුරෙහි යමෙක්
තෙම ශිලාචාර ගුණයෙන් යුක්ත වූ යේ ද, අප්‍රමාදයෙහි හැම කල්හි
51 ඇලුනේ ද, නොයෙක් ව්‍යාකරණයන්හි ද බුද්ධ වචන යන්හිද (දක්ෂවූයේ
ද) පණ්ඩිත වූයේ ආගම ප්‍රකාශ කරන්නෙක් වූයේ පරමාදක්ෂම වූයේ
මහ යසස් ඇති ගණාචාර්‍ය වූයේ ද, ආත්මාත්රථයෙහි ද පරාර්ථයෙහි
52 ද පරිත්‍යාග කරණ ලද ජීවිත ඇත්තේ දලංකා ද්වීපයෙහි පවත්නා
53 බුද්ධශාසන නමැති අහසෙහි චන්ද්‍රයා සේ ප්‍රකට වූයේ ද, ශ්‍රද්ධාප්‍රඥාවන්ට
මන්දිරයක් වූ අප්‍රමාදයෙහි ඇලුනා වූ ඒ සරණංකර
නම්සාමණේරයාණන්ට ඒ මිහිපති තෙම ධර්මාමිස සංග්‍රහයෙන් නැවත
54 නැවත සංග්‍රහ කරන්නේ ලෝකයට අසහාය නායකසර්වඥ වූ මුනීන්ද්‍රයන්
55 වහන්සේගේ ධාතූන් වැඩීමෙහි එක් රියන් සමාරක් උස් කඬුවක් කරවා
ස්වර්ණයෙන් ද ආලේප කොට මැණික් ගල් සත්සියයක් ද බඳවා
56 දිලිසෙන්නා වූ ඒ සධාතුක කරඬුව ද නේක විධ වූ සද්ධර්ම පුස්තකයන්
57 ද ප්‍රදානය කොට කැප කෙළේ ය. රජ තෙමේචීවාරාදි ප්‍රත්‍යන් ද බොහෝ
58 කැප කරුවන් ද ඒ සරණංකරාභිධෘන සාමණේයාණන්ට දානය කොට
ආමිසයෙන් සංග්‍රහ කෙළේ ය. නරේශ්වරතෙම සද්ධර්මය බොහෝ
කල් පිහිටු වනු පිණිස යහපත් සේ ආරාධනා කොට එකොළොස්
59 දහසක් ග්‍රන්ථයන්ගේ ප්‍රතිමණ්ඩිත වූ සාරත්ථ සංග්‍රහ නම් වූ සද්ධර්ම
ප්‍රකරණයක් ද, මහා බෝධිවංශයට සිංහල භාෂාත්ථ වර්ණනාවක් ද,
පූර්ව කාලයෙහි බෝධිවංශට සිංහල භාෂාත්ථ වර්ණාවක් ද, පූර්ව

Non-Commercial Distribution

60 කාලයෙහි ජම්බුද්‍රොණිපුරයෙහි පරාක්‍රමබාහු නම් රජහු රජ කරණ කල්හි
61 පස්පිරිවෙන් වාසීන්ට ප්‍රධාන වූ පණ්ඩිත කුශලාර්ථ වූ ස්ථවිරයන් විසින්
62 ප්‍රතිපත්ති පුරන්නා වූ සියලුභික්ෂු මෙයින් නිරෝගි වෙත්වායි ආශංසනය
කොට කරණ ලද භෛසජ්‍ය මංජුසාවට අත්ථ වර්ණනාව ද ඒ නැණැත්තා
63 වූ පරිශුද්ධ සමබෝධිය පතන්නාවූ සරණංකර නම් සාමණේරයාණන්
ලවා කර වුයේ ය. ඒ පණ්ඩිත වූ නරේශවර තෙම මේ ආදි නොයක්
පින්කම් කොට රාජ්‍ය තිස්තුන් වර්ෂයක් කොට මරහු වසඟ විය.

64 ඒ නරේන්ද්‍ර තෙමේ අතිරම්‍ය වූ ලංකාද්වීයෙහි ඉතා උතුම් ඉසුරු
ලබා ඒ සියල්ල ද ශරීරය ද ස්වකීය ජනයන් හා සුහෘත් ප්‍රාණීන් ද හැර
(පරලොව) ගියේ ය. යි දැන භවතුනි තොපි උතුම් වූ සර්වඥයන්
වහන්සේ ගේ වචනාවවාදධර්ම සිහිකොට උතුම් වූ මොක්ශ්‍රීය හා
ස්වර්ගසුඛදායක වූ පුණ්‍ය කර්මය කරව්.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කලමහ වස මිමල
ධර්මාදි විරාජ දිපන නම් වූ අනූසත්වන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ අට වෙනි පරිච්ඡේදය

1 ඉක්බිත්තෙන් ඒ රජහු මෙහෙසිය බාල සොහොවුරු වූ
2 ගුණාභරණයෙන් සැරසුනා වූ කුමාරයෙක් තෙම රජ වූයේ ය. ශ්‍රී විජය
3 රාජසිංහ යන නමින් ප්‍රසිද්ධ වූ හේ තෙම සම්ප්‍රාප්ත රාජ්‍යාභිෂේක
ඇත්තේ ම රත්නත්‍රයෙහි ප්‍රසන්න වූයේ ය. සද්ධර්ම ශ්‍රවණයෙහි යෙදුනා
4 වූ ප්‍රමාද රහිත විචක්ෂණ වූයේ යහපත් වූ ආචාර සහිත ජනයන්ගේ
5 සේවනයෙහි නිරන්තරයෙන් ආදර ඇත්තෙක් විය. ස්වකීය (රාජ) වංශය
රක්ෂා කරන පිණිස ද ඒ මදුරාපුරයෙන් රාජ කන්‍යාවක් ගෙණවුත්
අගමෙහෙසුන් කොට සියලු ලක්දිව් වැසි ජනයන් මනා කොට සිවු
6 සඟරා වතින් රංජනය කොට යහපත් වූ ඒ පුරයෙහි වාසය කෙළේ ය.
ඒ රජහුගේ මෙහෙසියෝ ද බොහෝ කල් පැවත්වා වූ මිථ්‍යා දෘෂ්ටිය
7 හැර නිර්වාණ දායක වූ සම්‍යග් දෘෂ්ටිය මොනවාට සමාදන් ව ලෝකයට
අසහාය නායක වූ සර්වඥයන් වහන්සේගේ උතුම් වූ සද්ධර්මය අසා
මෙසේ සතතයෙන් ආදර ඇතිව බුද්ධා දී රත්නයන් පිදූහ.

8 බිසෝවරු ශ්‍රද්ධාවෙන් සකස් කොට (සර්වඥ) දන්තධාතුව දවසක්
දවසක් පාසා සමන් මල් ආදි වූ නානා විධ පුෂ්ප පූජායෙන් ද කපුරු
9 ආදියෙන් යුක්ත වූ මිහිරි බුලතින් ද සුවඳ තෙල් යෙදූ පහනින් ද සුවඳ
10 සඳුන් ආදියෙන් ද නානා විධ සුවඳ දුමින් ද ශර්කරායෙන් හා මීයෙන් ද
11 අනිකුත් භෛෂජ්‍යයෙන් ද වස්ත්‍රාභරණාදියෙන් ද ඛාද්‍ය භෝජ්‍ය ලෙය්‍ය
12 පෙය්‍යයහා රසවිඳිය යුතු දෙයින් මොනවට පුරවන ලද රජත ස්වර්ණමය
පාත්‍රයෙන් ද කිර හා ඇතිරියෙන් ද නානා විධ පරිෂ්කාරයෙන් ද මාහැඟි
චීවරයෙන් ද මේ ආදියෙන් පුදා පුණ්‍ය රාශිය ද රැස් කළා හු ය.

13 නිරන්තරයෙන් පන්සිල්ද, පොහොයක් පාසා පෙහෙවස් ද
සමාදන් සද්ධර්ම ශ්‍රවණයෙහි යුක්ත වූවෝ (වාලධි රක්නා) සෙමරුන්සේ
රකිමින් බුද්ධානුස්මෘත්‍යාදි භාවනා ද වඩන්නෝ සද්ධර්ම පුස්තකයන්
14 ලියවා දානානිසංසය කැමැති වන්නාහු නිති බත් ද යළිත් ගමක ගිලන්බත්
15 අදීන් ගේ විභාග ද මනා කොට ද දුන ලද භෝගයෙහි අලග්නව නිති
16 බත් දුන්හ. ළදරුවන් ද පැවිදි කරවා බොහෝ වූ සංග්‍රහ කොට පර්යාප්ති
ප්‍රතිපත්තියෙහි මනා කොට හික්මවා රුති රුති දෑ දීමෙන් කල්ප ශාඛා
17 සමාන වූහ.

18 ලංකාද්වීපයෙහි වසන්නා වූ සකල ජනයා කෙරෙහි හිතවක්
19 කරුණා ඇති වූහ. පුතුන් මව් සෙයින් සිතමින් ගුණයන්ට
උත්පත්තිස්ථානව දයා සහිත වූහ. පිළිම හා කරඬුද මොනවට කරවා

Non-Commercial Distribution

20 සියලු පාපයෙහි බිය ඇතිව සැම කල්හිම සකල පුණ්‍යයෙහි ඇලුනෝ
මේ ආදී වූ නොයෙක් කාරණයෙන් ගුණාභරණයෙන් සැරසුනාහු
සියලු ලංකාද්වීපයෙහිඅතීහයින් ප්‍රකට වූහ.

21 ශ්‍රද්ධා ඇත්තා වූ ඒ නරෙන්ද්‍රතෙම ඒ ඒ තන්හිආවාසයන් ද
කරවා සාමණේරයන් වාසය කරවා ඔවුන්ට මහත් ආදර ඇත්තේ සිවුරු
22 ආදී වූ ප්‍රත්‍යයෙන් බොහෝ වූ සංග්‍රහ කොට උතුම් වූ සද්ධර්මය අසා
23 ඒ සාමණේරවරයන් අතුරෙන් උපොස්ථාරාමයෙහි වාසය කරන්නා වූ
24 ශ්‍රද්ධා ඇති ගුණයන්ට ආකාර වූ සරණංකර නම් සාමණේරයන් ද
පිදුයේ ය. ඒ හෙරණුන්ද ම පවරා සතර බණවර සත්නයක් සිංහල
25 භාෂාවෙන් කරවා ඒ (නරෙන්ද්‍ර) තෙම පර්‍යාප්ති ධර්මය ද රැකියේ ය.
26 ඒ නරෙන්ද්‍රයා අභිනව වූ ධාතු මන්දිරයෙහි ධාතු වඩා හිඳවීමෙන් ද
මහත්දෝෂයක් වන්නේ යයි බුද්ධාශාසනයෙන් බාහිර වූ කුත්සිත බුද්ධි
27 ඇත්තන්ගේ බස් ගෙණ අන්‍යයන් ලවා කරවන්ට නියෝග කොට එයින්
අන්‍ය වූ නුවරකට ගොස් වාසය කරණ කල්හි ඉක්බිත්තෙන් ඇමතියෝ
28 එකුතවය වත්කරු ආදීන් සමග මහ බලැති සියල්ලෝ කරඬුව විවෘත
29 කරන්ට කරණ ලද උත්සාහ ඇත්තා හු මුළු රැය නොයෙක් පරදිදෙන්
ව්‍යායාම් කොට විවෘත කිරීම නො ලැබූහ. ඇමැතියෝගොස් ඒ ප්‍රවෘත්තිය
30 මහරජාණන්ට සැළකළෝ . මිහිපති වූ රජ තෙමේ ඒ අසා වේගයෙන්
31 ඒ පුරවරයට අවුත් නානාවිධ සුගන්ධ පුෂ්පයෙන් ද පහන්දුම් ආදියෙන්
32 ද පුදා වැඳ යතුරු මුදුව ගෙණ එකෙණෙහි කරඬුව මොනවට විවෘත
කෙළේ ය. පිළිවෙලින් තුබූ ඇතුළු කරඬු ද හැර සර්වඥයන් වහන්සේ
33 ගේ දංෂ්ට්‍රා ධාතුව දක "ලැබූ ආත්මය සඵල ය" යි ප්‍රීති වාක්‍ය පහළ
34 කොට නුවර වැස්සන් රැස් කරවා මහ මැණකෙලි ද කරවා මළුඳහ පුද
පැවැත් වූයේ ය. ඒ අද්භූතය දැකප්‍රීති ප්‍රමෝද යෙන් බර වූයේ
හස්ත්‍යශ්වරයන් හා මිණි මුතු ආදියෙන් පුදා උතුම් වූ මුනීන්ද්‍ර දන්තධාතුව
හස්ත නමැති පියුමට ගෙණ දක්වා ඒ පෘථිවිපාල තෙම සියල්ලන්
මොනවට සතුටු කෙළේ යි.

35 පූර්ව නරෙන්ද්‍රයන්ග් කාලයෙහි කරවන ලද ධාතු මන්දිරය
ස්වර්ණයෙන් ධාතු විසිතුරු කරන ලද්දා වූ නානාවිධ වස්ත්‍රයෙන් සරසා,
නානාවිධ සුවඳ තෙලින් පහන් දල්වා පුන් කලස් තබ්බවා දේවමන්දිරයක්
36 සෙයින් විචිත්‍ර වූ ඒ මැදුරෙහි රිදී අසුන් මත්තෙහි සර්වඥයන් වහන්සේගේ
37 දළදාව වඩා ධාතු පූජා කරන්නා වූ හේ තෙමේ මුළු නුවර නිරවශේෂ
38 වශයෙන් ශුද්ධ කරවා සකස් කොට වැලි ඉස ඒ දන්ත ධාතු පූජාවෙහි
39 ලා (ධාතු) මන්දිරය හාත්පස ඒ ඇතුළු මලුවෙහි ද පිටත ආලින්දයෙහි ද
40 මහ රජ මලුවෙහි ද ඒ සියලු විථිවලද දෙපස උස්වූ ඇඳ නැති යටියෙන්

Non-Commercial Distribution

41 තොරන් නිරතුරු කොට සදවා කෙසෙල් ගස් බැඳ පුවක් මල් පොල්මල්
42 ආදියෙන් මොනවට සැරසූයේ ය. එකල යටි අක්හි බඳිනා ලද නා නා
43 වර්ණයෙන් බබළන්නා වූ වස්ත්‍ර ඛණ්ඩයෙන් නගරාකාසය කොකාවැලින්
44 ගැවසුනා සේ දර්ශනීය වී. ඒ ඒ තැන මනාකොට පුන්කලස් තබ්බවා
45 හාත්පස මන්දිරාලින්ද ඉදිරියෙහි මණ්ඩපයන්හි ද රන් රිදී ආදියෙන් නිමවන
ලද නා නා කර්මයෙන් බබළන්නා වූ වියන් ද බඳවා නානාවිධ කාන්තිමත්
46 වූ ජවනිකාවෙන් වට කොට නානාවිධ කර්මාන්තයෙන් බබළන්නාවූ
47 බුමුතුරුණු ම එහි මනාකොට අතුරුවා ලද පස්මල් ද හාත්පස ඉස
48 සියලු පුරය සජ්ජිත කරවා දෙව්ලොව දේවේන්ද්‍ර තෙමේත් මෙසේ පුද
කරන්නේ යයි ද පූර්ව ලංකේශ්වර වූ මහිපතිවරයෝ ද මෙසේ පුද කළෝය
49 යි දක්වන්නා සේ ඒ මහීපති තෙම රාජාභරණයෙන් සැරසුනේ ඒ පුරයෙහි
50 ලක්දිව් වැසි සාමණේරවරයන් ද යළිත් උපාසක උපාසිකා ජනයා ද
51 සියලු නුවර වැස්සන් ද පිට රට වැසි ජනයන් ද රැස්කරවා ඔවුට
දයාවෙන් කරුණා තත්පර පෘථිවිපති තෙමේ පෘථිවියෙහි පසඟ පිහිටුවා
මුනීන්ද්‍රයන් වහන්සේගේ දංෂ්ට්‍රාධාතුව වැඳ හස්තපද්ම මස්තකයෙහි
52 වඩාගෙණ අතිශයින් සතුටු සිත් ඇත්තා වූ ඒ නරේන්ද්‍ර තෙම දාගෙයින්
53 නික්ම රිදී කුඩයෙන් ද රන් කරඬුවෙන් ද මනා සෙමෙර පෙළින් ද රන්
54 රිදී මල් ආදී වූ නානාවිධ පුෂ්ප ජාතියෙන් ද නොයෙක් මිණිමුතු ආදිය
55 හා වස්ත්‍රාභරණාදි වූ පූජා වස්තුවෙන් ද නොයෙක් පංචාංග නානාවිධ
56 විචිත්‍රාලඞකාර ඇති පිටක මණ්ඩපයට ගොස් සිටියේ ය. ලංකාධිපති
වූ ඒ නරේන්ද්‍ර තෙම උතුම් දන්තධාතුව දක්වා අවට සිටි අනල්ප වූ ජන
සමූහයා විශේෂයෙන් සතුටු කොට එය යථා ස්ථානයෙහි ම වැඩුයේ ය.

57 එකල මෙසේ ජීවමාන බුදුන් දර්ශනයෙහි මෙන් සර්වප්‍රකාරයෙන්
58 සියල්ලන් සතුටු කොට බොහෝ කුසල් රැස් කෙළේ යි. ස්වර්ණමාණික්‍ය
59 මුක්තාඵලාදිය හා නානාවිධාභරණයෙන් ද ඇත් අස් දස් ආදි වූ
60 පූජාවස්තුවෙන් නොයෙක් පරිද්දෙන් පුදා උත්තමාධ්‍යාසය ඇත්තා වූ
ඒ මහීපති තෙම සමන් සපු ආදී වූ මලින් සුවඳ සඳුන් ආදියෙන් ද පුදා
පහන් පුදා අනුසස් මහතැයි සිතා "ස්වකීය පුරයෙහි ද රටවල ද ඒ ඒ
61 තැන චෛත්‍යයන්හි එක දවසින් ම පහන් පුදා කෙරෙත්වා යි" ආඥා
කොට එක රැම ජනසමූහයා රැස් කරවා සත් ලක්‍ෂ අනූදහස් සත්සියයක්
62 පහනින් පූජාවක් ද කෙළේ ය. මෙසේ එකල්හි ලඞකාධිපති රජ තෙමේ
63 ලඞකාද්විප භූමිය උසස්ව බබළන පහනින් තාරකාවන් විසින් ගැවසුණු
අහස සේ කෙළේ ය. තිස්තුන් දහස් අට සියයක් අධික කොට ඇත්තා
64 වූ තුන් කෙළක් පුෂ්ප පූජායෙන් ද පුණ්‍යස්කන්ධය රැස් කෙළේ යි.

Non-Commercial Distribution

65 බුද්ධ රූපයන් කරවීමෙහි ප්‍රසන්න වූ මහ ගුණැති රජ තෙම මා
තුල රට ආලෝක ලෙන ආදියෙහි ද ඒ ඒ රට ගිරිලෙන්හි ජනයන්ට
66 සැප දෙන්නා වූ බුද්ධ ශරීර ප්‍රමාණ වූ සැතපෙන වැඩසිටින අභිනව
67 බුද්ධරූපයෙන් හා චෛත්‍යයන් ද කැඩුණු බිඳුණු ප්‍රතිමා මන්දිරයන්
68 බොහෝ වූ ප්‍රතිසංස් කරන කර්මයන් ද කරවා ඊට සඞ්ග්‍රහ ද කොට
පුණ්‍යරාශිය තර කෙළේ ය. නරෙශ්වර තෙමේ ඒ ශ්‍රීවර්ධන පුරයෙහි
69 පෙර කරණ ලද ජීර්ණව තුබූ බොහෝ රාජමන්දිරාදීන් පහකොට
70 ශෛලකර්මාදියෙන් බබළන්නා වූ සිත්කළු මන්දිරයන් කරවා යදොර සහිත
71 වූ මනොඥද්වාරයන් යොදා නානාවිධ රූප ලතා කර්ම ඇත්තා වූ දෙමහල්
72 මනහර වූ දොරකොටු ගෙය ද කරවූයේ ය. ඒ නුවර වසන්නා වූ ධර්ම
ශ්‍රවණයෙහි මහත් ආදර ඇත්තා වූ ඒ මහීපති තෙමේ රජමලුව මැද
73 මණ්ඩප කරවා විසිතුරු තොරන් ආදියෙන් නිරතුරු කොට සරසවා
වියන් බඳවා අසුන් ද පණවා මහෝත්සවයෙන් බොහෝ සද්ධර්ම කථිකයන්
74 වඩා ගෙණවුත් චිත්‍ර වූ විජිනිපත් ගෙන්වා ඒ ධර්ම කථිකයන් වැඩ හින්ද
වූයේ ය. මනා කොට අර්ථ දන්වීම් ආදි ආකාරයෙන් කියන ලද
75 හෘදයඞ්ගම වූ සද්ධර්මය ද අසා ප්‍රසන්නවූයේ රත් රදීයෙන් හා පහන්
දුම් ආදියෙන් ද නානා විධ විචිත්‍ර වස්ත්‍රයෙන් ද පූජා වස්තුවෙන් ද
76 නොයෙක් පරිද්දෙන් ඇමතියන් සහිත වූ රජ තෙම පූජාකොට සේනා
77 සමග බොහෝ වූ කුසල් රැස් කෙළේ යි. ධර්මදානය මහත්ය යි
78 සද්ධර්මයෙන් අසා එ පරිද්දෙන් (කරණු කැමැත්තේ) රාජායතන නොයෙක්
79 රටවල සුදුසු වූ ඒ ඒ තන්හි මත සෙනසුන් හා ධර්මශාලාදීන් ද කරවා ඒ
80 ජනෙන්ද්‍ර තෙම බොහෝ වූ ධර්මකථිකාදීන් ඒ ඒ තන්හි යවා මනුෂ්‍යයන්
81 රැස්කරවා සද්ධර්මය කියවා ධර්මදානය ද දෙවූයේ ය. පූර්වයෙහි රාජසිංහ
82 නරේන්ද්‍රයන්ගේ කාලයෙහි ඉතිරි වූ ඒ මිථ්‍යාදෘෂ්ටික අධාර්මික වූ පරඞ්ගි
දූජිනයෝ එකල්හි ඒ ඒ තැන වැස ඔවුන්ගේ දෘෂ්ටිය මිළ දීම ආදියෙන්
අනුන් ලවා ද ග්‍රහණය කරවන්ට උත්සාහ කරන්නාහු ශාසනයට අගෞරව
83 ඇතිව උපායෙන් යුක්තව වාසය කළහ.

84 නරේන්ද්‍ර තෙම ඒ ප්‍රවෘත්තිය අසා වේගයෙන් කිපී ඇමතියන්ට
ආඥා කොට ඔවුන්ගේ ගෙවල් හා පොත් නස්වා ඒ දෘෂ්ටිය
85 නොහරින්නන් රටින් නෙරපූයේ ය. ඒ මිහිපති තෙම සමන්තකූට
86 පර්වතයෙහි උතුම් සර්වඥ පාද ලාඤ්ඡනයෙහි සහන් පුද ආදි සියල්ල
87 කරවූයේ ය. අනුරාධපුරයෙහි ද මහියඞ්ගනාදි ඒ ඒ ස්ථානයන් හි ද
මහ පුද පැවැත්වූයේ ය. පූර්වදිශායෙහි හා පශ්චිම දිශාභාගයෙහි ද දුක
88 සේ යා යුතු ජලයුක්ත මාර්ගයෙහි යන එන්නන්ගේ කැප පිණිස ගල්ගෙය
89 ද කරවී. ලඞ්කාද්වීපයෙහි වූ බුද්ධශාසනය භික්ෂුසඞ්ඝයා නොලැබීමෙන්
90 ප්‍රහීණ වූ බව දැන කම්පිත වූ රජ තෙම භික්ෂුසඞ්ඝයාට ආරාධනා කරන්ට

Non-Commercial Distribution

491 සිතා බුද්ධශාසනය කොයි කොයි තන්හි පවතීදැයි නොයෙක් පරිද්දෙන්
92 විචාරා පේගුවය, රක්ඛඞගය, සයාමය, යන ඒ ඒ දේශයන්හි පවත්නේ
ය. යන ඕලන්දයන්ගේ ශුභ වචනය අසා ඒ ඒ රට බුද්ධශාසනයෙහි
ප්‍රවෘත්ති විචාරණය කරන්ට මූල භාෂාවෙන් මනාකොට සන්දේශ ලියවා
93 දි රජ තෙමේ ඇමති ආදීන් වෙන් වෙන් වශයෙන් පිටත්කොට "ඒ
අයොධ්‍ය රාෂ්ට්‍රයෙහි ශාසනය අති නිර්මලය, අතිශයින් යහපත් භාවයෙන්
94 පවත්නේය" යන කථාව ඇසුයේ ය. නරේශ්වර තෙම ඒ අයෝධ්‍යයෙන්
95 ම බුද්ධ පුත්‍රයන් ලඞ්කාවට ගෙණ එන්නැයි පූජෝපකරණාදී වූ නොයෙක්
පඬුරු හා සමග හසුන්පත් ද දී එකල්හි ඇමතියන් යැවූයේ ය. ඒ
මිහිපති තෙම මුනින්ද්‍රයන් වහන්සේගේ දංෂ්ට්‍රා ධාතුව වඩවන්ට එක්රියන්
96 සමාරක් උස් වූ රන්මුවා කරඬුවක් ද කරවා ධාතු මහඟු මිණි මුතු
ආදීන් බඳවා එය නොනිමි කල්හි කළ පින් ගෙවුනේ අට අවුරුද්දක්
වැස මෙළේ යි.

97 ශ්‍රද්ධාදී නොයෙක් ගුණ නමැති ආභරණයෙන් සැරසුනා වූ
සර්වඥයන් වහන්සේගේ උතුම් ශාසනයෙහි අතිශය ශුද්ධිය කැමැති වූ ඒ
නරේන්ද්‍ර තෙම අනන්ත සැප දෙන්නා වූ මහත් කුසල් කොට පසුව
මැරුවා සමීපයට ගියේ ය.

මෙසේ ලඞ්කාධිපති වූ පරාර්ථයෙහි නිරන්තරයෙන් ඇලුනාවූ
98 පින් කැමති වූ ජනේන්ද්‍ර වූ ඒ උතුම් රජ තෙම ආත්මාර්ථය හා පරාර්ථය
සිද්ධකරමින් රාජ්‍යය කෙළේ ය. ලෝකයෙහි සැපය ද ලෝකොත්තර
වර මහත් සැපය ද ප්‍රාර්ථනා කරන්නා වූ නොපිද කුසීත බැව් හැර
නානාප්‍රකාර සුඛදායක වූ පුන්‍ය රාශිය මොනවට කරව්.

මෙතෙකින් හුදීජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස සිරි
විජය රාජසිංහ දීපන නම් වූ අටානූවන අදියර නිමි.

Non-Commercial Distribution

# අනූ නව වෙනි පරිච්ඡේදය

1 ප්‍රවර ගුණවත් රජුහුගේ ඇවෑමෙන් ඒ එජු සුහුරුබඩු වූ ජනනයන
මනෝඥ වූ රූප ශෝභායෙන් අග්‍රප්‍රාප්ත වූ සකල ලඞ්කාද්වීපයට පහනක්
2 වැනි උතුම් ශ්‍රී ඇති ඒ කුමාර තෙම කීර්ති ශ්‍රී රාජසිංහ නමින් රජ විය.
ලක්දිව් වැස්සන් වැඩෙහි ඇලුනා වූ ඒ නරේන්ද්‍ර තෙමේ බුදුන් පිරිනිවී
3 දෙදහස් දෙසිය අනූවෙනි අවුරුද්ද පැමිණි කළ මනරම් ලක්දිව්හි මහ
4 රජුන් වියොවින් ශෝකාතුර ජනයා එකල්හි අස්වැසී. සියලු දිගුන්
5 බබුළුවා හිරු අස්තඞ්ගත කල අඳුරු සෙයින් ශෝකාතුර සියලු ජනයා
නිශ්ශෝකකොට එකල් මහත් යසස් ඇති ඒ රජ තෙමේ සියලු දිගුන්
බබුළුවමින් උදාවන හිරු සේ ලක් රජයට පැමිණ මොනවට සියල්ලන්
සතුටු කෙළේ ය. බුදුන් ආදී තෙරුවන් කෙරෙහි ප්‍රසන්න වූ පැමිණෙන
6 ලද රාජ්‍යාභිෂේක ඇති පින් කැමැති ඒ රජතෙමේ අප්‍රමාද වූයේ මුළු
7 නුවර ශුද්ධකරවා පිළි තොරණ ආදියෙන් අලංකාර කරවා උතුම් හොබනා
8 ඒ නුවර සියලු ලක්දිව් වැසි ජනයා මොනවට රැස්වූකල මහා යසස්
ඇති, පිණින් පහළ වූ මහ රජ තෙමේ රාජර්ධියෙන් යෙමින් නුවර
9 පැදකුණු කොට රජෙක් නැති ලක් රජය සරාජයකයයි උන්ට හඟවා, ඒ
10 රජ තෙමේ මහපිනින් යුක්තව ශ්‍රී වඩීන නුවර වෙසෙමින්, බුදුසස්න
පාලනයට ප්‍රාර්ථනා කොට ආවා වූ පින් ඇති ඒ කීර්ති ශ්‍රී රාජසිංහ
ශ්‍රෙෂ්ඨ තෙමේ මෙ කලට පැමිණ ලංකා රාජ්‍යශ්‍රී ධරව මනා පැණ
11 ඇතිව ශ්‍රද්ධා ධන කොට ඇත්තේ සාරාසාර බැව් මෙනෙහි කොට
බුද්ධාදී වස්තු පූජා පටන් ගත්තේ ය.

සැදැහැ ඇති ඒ නරාධිප තෙමේ පවිටු මිතුරන් බැහැර කෙරෙමින්
12 පඬි දනන් සෙව්මින් හුදියන් ඇසුරු කෙරෙමින් උතුම් දහම් අසමින්
පැණැතිව කටයුතු නො කට යුතු හැඳින අකර්තව්‍යයන් හරිමින්
13 කර්තව්‍යයෙහි ඇලුනේ සියලු ජනයන් සිවුසඟරා වතින් තුටු කෙරෙමින්
14 පණ්ඩිත මිනිසුන් විසින් ප්‍රශංසා කටයුතු වූයේ දහම් දානයෙහි විපාකය,
15 සද්ධර්ම ශ්‍රවණයෙහි ඵලය, දහම් ලියවීමෙහි හා දහම් පූජාවෙහි පින්ය,
16 යන මේ දහමින් ආ ඒ කටයුතු යයි සිතා නොයෙක් තන්හි බණ මඩු
කරවා නන් විසිතුරු වතින් වියනුඳු බඳවා තොරණ ආදි නොයෙක්
17 දූයින් නානා විභාගයෙන් සපයා පහනුදු දල්වා අසුනුදු පණවා සත්කාර
18 බහුමානයෙන් සදහම් දෙසන්නාවුන් වඩා ගෙණවුත් ආදර සහිත වූයේම
ආරාධනා කොට මොනවට පැණ වූ ඒ අසුන්හි වඩා හිඳුවා එම දහම්
19 දෙසන්නවුන් ලවා දම්සක් ආදි බොහෝ සූත්‍රාන්තයන් දෙස්වා ගෞරව
20 සහිත වූයේ මුළු රැය අසා සිරුර දිවි සම්පතුන්ගේ අසාරබැව් අසාර
21 හෙයින් ද සාරබැව් සාර හෙයින් ද ධර්ම ශ්‍රවණයෙන් ද දූන ශ්‍රද්ධා ඇති

Non-Commercial Distribution

ඒ තෙමේ ප්‍රසන්නව ඇමතියන් සෙන් සහිත වූයේ පූජා වස්තුවෙන්
22 මහ පුද නොයෙක් සේ පවත්වමින් ඇතුළු නුවර වැසි වූ ද පිට නුවර
23 වැසිවූ ද සියලු ජනසමූහයන්ගේ අභිවෘද්ධිය පිණිස හා සැප පිණිස
නොයෙක් වාරයෙහි දහම් දානය දෙවා ඒ නරාධිපති තෙමේ දහම්
දන්මුවා පින් කෙළේ ය.

24 රක්කඞ්ගුවෙන් ආ භික්‍ෂූන් කෙරෙහි ද නැවත ලක්දිව භික්‍ෂූන්
කෙරෙහි ද පැවිදිවූ නොයෙක් හෙරණ වහන් දෑ විෂයෙහි ආදර සහිත
25 වූයේ ම සිවුරු ආදි පසයෙන් ඒ වහන්දෑට සංග්‍රහ කොට නරශ්‍රේෂ්ඨ
26 තෙමේ පිරිත් මඞ්ගලාදිය කියවි. මෙසේ නොයෙක් වර සදහම් පවත්වා
27 පසය ද දී පින් රැස වැඩුයේ ය. නවදහස් සසීයක් මිල ශ්‍රද්ධාවෙන්
28 විසඳා උතුම් රන් පොතක් කරවා ඒ රන් පොත්හි දම්සක් ආදි බොහෝ
සූත්‍රයන් ලියවා ඒ තෙමේ ධර්‍ම කථිකයන් ලවා මුළු රැයකියවා නොයෙක්
29 වස්තුවෙන් පුදා නොයෙක් වර උතුම් දහම් ඇසී ය. නරශ්‍රේෂ්ඨ
30 තෙමේ ලියන්නන් රැස් කරවා එක දවස්හිම දික් සඟිය ලියවා බොහෝ
31 සංග්‍රහ කොට එයින් මුළු රැය මොනවට සඳහම් කියවා මහපුද පවත්වා
32 තෙමේත් අසා (අනුන්ට ද) ඇස්වී. සංයුත්සඟි ආදි අනික් බොහෝ
33 පොත් ද ශ්‍රද්ධාවෙන් ලියවා ලියන්නන්ට වස්තු දුන්නේ ය. අනික් ගිහි
34 පැවිද්දෝ ද මනාකොට දහම් පොත් ලියවා තමා දක්වති. (එසේ) කල
35 තුටු සිත් ඇත්තේ ඔවුන්ට ධනාදිය දීමෙන් බොහෝ සංග්‍රහ කොට
36 ආදර ඇති හේ තෙමේ ලක්වැසි අන්‍යයන්ගෙන් පින්ගත්තේය.

37 පින් කැමති නරශ්‍රේෂ්ඨ වූ ඒ රජ සපිරිවරින් අනුරා පුරවරයට
ගොස් වරබෝධි චෛත්‍යයන්ට ඇත් අස් ආදීන් ද රන් රිදී ආදීන් ද පුදා
38 අනේක ප්‍රකාරයෙන් පින් රැස් කෙළේයි. මහා යසස් ඇති ඒ ජනේන්ද්‍ර
39 තෙමේ මියුගුනු සෑයට හා තිකා සෑයට ද ගොස් රාජතේජසින් මහපුද
40 පවත්වමින් වැඳ පින් රැස් කෙළේ යි. පැරකුම් මිහිපල්හු විසින්
41 පොළොන්නරු නගර වරයෙහි කරවන ලද සෑම මනා දැකුම් ඇති
42 වෙහෙර පුදන්ටත් වඳින්ටත් මහ සැදැහැ මහ යසස් ඇති රජ තෙමේ
43 මහ පිරිස සමග ගොස් මොනවට පූජා කෙළේ ය. ශ්‍රද්ධාදි ගුණ සම්පන්න
රජ තෙමේ රිදී විහාරය ද වැඳ පින්රැස් අත්පත් කෙළේ ය.

44 පෙර ලක්දිව්හි රජුන් සෙයින් ලෝකයෙහි මඟුලැයි සම්මත වූ
45 නාථ, උපුල්වන් යනාදී දේව පූජා පෙරටු කොට සෙනග දක්නා පිණිස
මුළු නුවර දෙව්පුරය සෙයින් සර්‍වප්‍රකාරයෙන් සරසවා ලක්දිව වැසි
46 සියලු ජනයන් රැස් කොට එපුරෙහි ඔවුන් අතුරෙන් එකෙකී රටින් ද
තනතුරෙන් ද ජනයන් වෙන් වෙන් කොට නගන ලද කොඩි සලකුණු

Non-Commercial Distribution

47 ඇති කොට ඒ ඒ තැන වස්වා දේවස්ථාන ගත ආයුධයන් ද ඇතුන් පිට
48 තබ්බවා නොයෙක් නැට්ටුවන්ගෙන් ආකීර්ණ වූ බෙර මද්දලයෙන් ද
නොයෙක් ඇත් සමූහයෙන් හා නොයෙක් අස් සමූහයෙන් ද නොයෙක්
49 සත් දරන්නවුන් විසින් ද නොයෙක් ගැහැණු සමූහයා විසින් හා
නොයෙක් පිරිමි සමූහයා විසින් ද නන් පලඟ දරන්නවුන් විසින් හා
නානා කඩු ගත්තවුන් විසින් ද නොයෙක් කුන්තායුධ දරන්නවුන් හා
50 නොයෙක් අවි ගත්තවුන් විසින් ද නන් වත් දරන්නවුන් හා නොයෙක්
අවි ගත්තවුන් විසින් ද හා නන් කොඩි උසුලන්නවුන් විසින් නන්
51 දෙසින් ආවුන් විසින් හා නානා භාෂා දන්නවුන් විසින් ද නොයෙක්
ශිල්පින් විසින් හා නොයෙක් කම්කරුවන් විසින් ද මේ ආදි නොයෙක්
52 දෙනා විසින් නොයෙක් පරිද්දෙන් ඇතුන් පිරිවරා ඉදිරියෙන් ද පස්සෙන්
ද යන්ට මෙහෙයා ඊට ඉක්බිතිව රජ තෙමේ දෙව්රජහු සෙයින් මහත්
53 රාජර්ධියෙන් පිටත් ව මුළු නුවර මොනවට පැදකුණු කොට නිම (විය).

සැදැහැ පැණ ගුණයෙන් උස් වූ අපගේ අගරජ තෙම අවුරුදු
54 පතා පවත්වන්නා වූ ඒ ඇසළ මහ පෙරහර බුදු පුද පෙරටු කොට
55 පවත්වනුවට සිතා මඟුලැතු පිට රන් කමින් මනා කොට නිමවන ලද
56 සිව්ගෙය සකසා බැඳ මාත බින්දු හා දෙදළ ඇති ඇතු බරණින් සරසවා
රිදී කුඩ හා චාමරයන් ද මල් ගත්තවුන් විසින් නැගි ඇතුන්ගෙන් ද
57 අනේකාකාරයෙන් පූජා වස්තූන් ගත්තවුන් විසින් ද මල්වියන්
58 ඔසවන්නවුන් විසින් ද නොයෙක් රජ ඇමතියන් විසින් ද නන් දෙසින්
59 පැමිණියන් විසින් ද ඇතු සිසාරවා නිමිකල නරෙශ්‍රේෂ්ඨ තෙමේ බුදු
සිරුරු දා වැඩූ බහසුරු වර රන් රන්කරඬුවෙන් සකසා සිව්ගෙයි වඩා
60 මල් ඉස්නවුන් ලවා මල්වැසි ද වැස්වී. සාධුකාර රවයෙන් හා සක්
61 තාලම් පටහඬින් ද නානා භෙරීන්ගේ හඬින් ද මහොත්සවය කරවන්නේ
ආශ්චර්ය අද්භූත සිත් අති යම් යහපත් සත්පුරුෂ ජන කෙනෙක් වෙත්
62 නම් කරණ ලද ශීර්ෂාංජලියෙන් ඔව්හු අනවරතයෙන් පුදති. දඬුවැට
63 පහන් ගත්තවුන් ලවා ද මඟුල් වෙස් ගතුවන් ලවා ද අනේකවිධ පූජාවෙන්
64 නරශ්‍රේෂ්ඨ තෙමේ පුදවමින් සුරාසුර නරාදීන් විසින් පූජනීයයන් අතුරෙන්
අගතැන් පැමිණි ජින ධාතුව පෙරටු කරවා දෙව් මිනිස් ආදී සියල්ලන්
65 පසු පසු කොට යන්ට යොදා තෙමේත් මඞ්ගල ස්තුති ඝෝෂාදී වූ මහත්
66 රාජර්ධියෙන් මහත් රාජානුභාවයෙන් මහත් පෙළහරින් දෙව් රජ
67 දෙව්ලෙව්හිත් මෙසේ ධාතු පෙරහර කරන්නේ යයි මිනිසුන්ට දක්වමින්
සෙයින් යෙයි.

68 ශ්‍රද්ධා ආදි අනේක ගුණයෙන් යුක්තවූයේ බුදුන් දහම් සංඝයා
සෙවමින් සාරයත් අසාරයත් සිහිකෙරෙමින් සතුටු වූයේ දන් ඈ පින්

Non-Commercial Distribution

නිරන්තරයෙන් කෙරෙමින් සැදැහැ පැණ කුළුණු බහුල වූ අතිශයින්
උතුම් ගුණ ඇති ලක්දිවච් පහන් බඳුවූයේ බුදුන් කෙරෙහි සුපසන් වූයේ
69 දසබලධාරී බුදුහුගේ දහම්හි මොනවට හැසිරෙමින් සතතයෙන් අප්‍රමාද
වූයේ ආදර සහිතව ඒ තෙමේ දානාදි පින්කම් කෙරෙමින් සාරාසාරය
මෙනෙහි කෙරෙමින් සියලු ජනයා හිත වූයේ මෙසේ ම කෙළේ යි.
70 තුනුරුවන්හි ආදර සහිතවූයේ දවසක් දවසක් පාසා මහ පෙරහරින්
71 දළදා වහන්සේට මහ පුද පුවත්වමින් තමන් කාලයෙහි හටගත් සිය
72 සඟහු හැමකල්හි ආදර ඇත්තේ තමන් අයත් සිවුපසයෙන් උපස්ථාන
73 කොට සදහම් හි ඉතා පහන් ඒ තෙමේ නැවත නැවත දහම් අසා හැම
74 කල්හි ආදර ඇත්තේ අනල්ප වූ පින් රැස්කෙරෙමින් දිවමන් බුදුන්
75 කල්හි සෙයින් බුදුසසුන් පවත්වන්නේ ලක්වැසි මිනිසුන්ට බොහෝ
76 කොට පින් වඩවමින් පැරකුම්බා ආදි පෙර රජුන් කටයුතු අසා මැනවැයි
දැන ඔවුන් කටයුතු අනුගතවූයේත් රජ දහමුසු අසා එහිදු මහා ආදර
ඇත්තේ අගතියෙහි බියැති ව සිවුසඟරාවත්හි තමා යෙහෙන් යොදමින්
සිය බෑයා ආදි සියල්ලන්ට සුදුසු පරිද්දෙන් ඒ තෙමේ සඞ්ග්‍රහයෙන්
77 සතුටු කොට විචාරා ඔවුන්ගේ සිත් මනාකොට ගත්තේ ය. මෙසේ
පරහිතනිරත ජනෙන්ද්‍ර වූ ලඞ්කාධිනාථ තෙමේ බුදු සස්න ද එසේම
78 ලෝකය ද අනලස් වූයේ මොනවට පාලනය කෙරෙමින් පෙර ලක්දිවිහි
79 අධිපතිවූ නරපල් සමූහයන් පවත් අසා ඔවුන් කටයුතු මෙනෙහි
කෙරෙමින් මම ද උතුම් රාජධර්‍මයෙහි හැසිරෙමි. මෙසේ නිශ්චය කොට
80 නරේන්‍ද්‍ර තෙමේ සිතමින් මහවස රජුන් ගේ ද සුළුවස රජුන්ගේ ද
මහාසම්මත රජු පටන් හස්තිශෛල පුරය දක්වා ඒ ප්‍රවෘත්තිය පූර්වයෙහි
81 ගාථා බන්ධනයෙන් පුරාතන ආචාර්‍යවරයෝ මහාවංශ නම් ඇති
ග්‍රන්ථයක් පවත්කොට (තැබූ ද) ලක්දිව පැවැති හෙද සියම් රටින් ගෙණ
ආ ලක් රජුන්ගේ එම වංශකාථා පොත ද යන දෙක පිළිවෙළින් වෙන
82 වෙන ම විචාළේ ලංකෙන්‍ද්‍ර තෙමේ අඩුය යි අසා පරාක්‍රමබාහු ආදිවූ
83 මෙකල් දක්වා රජුන්ගේ මෑත භාගයෙහි අප්‍රකටවූ ප්‍රවෘත්තිය ද ලියවා
84 රාජ වංශය පැවැත්වී. මෙසේ ඒ රජ තෙමේ රාජනීතිය ද ධර්‍මනීතිය ද
85 නො ඉක්මවමින් දැහැමෙන් සෙමෙන් රාජ්‍යානුශාසනා කරන්නේ
86 රජදහමට එකඟ වූයේ ම දානාදි බොහෝ කුසල් දවසක් දවසක් පාසා
87 කෙරෙමින් උතුම් දහම් මෙනෙහි කෙරෙමින් සිවුසඟරාවත්හි ද එනම්
දාන, ප්‍රියවචන, අර්ථචර්‍යා, සමානාත්මතා යන මෙහි නරශ්‍රේෂ්ඨ වූ
88 රජතෙමේ සියමල් රජුන්ට සමාන බැව් ලෝකයා හට දක්වමින් යාන
89 වාහන හා නො අඩු සම්පත් දී වෙසෙසින් ම යුවරජුන් දෙදෙනා
සතොස්වා සතරාකාරයකින් වස්තු සංග්‍රහයෙහි මොනවට පිරවී. මෙසේ
90 ලබන ලද යසස් ඇති එ දෙදෙනා දළදා මහපුද වෙන් වෙන් ම කරන්නෝ
බණ පොත් ලියවා ලියන්නට වස්තු දෙති. භික්ෂු සංඝයා ආරාධනා

Non-Commercial Distribution

91 කොට නිති බත් ආදි දන් නිරතුරු දෙමින් බණ ඇසීමෙන් ම කටයුතු
නො කටයුතු දැන පව්කම්හි පිළිකුල් කරන්නෝ පින්කම්හි මහත් ආදර
92 ඇත්තෝ දක්ෂ වූ ඉතා යහපත් මනා හෙරණ පැවිදි (වහන්දෑ) විචාරා ඒ
93 සාමණේර (වහන්දෑට) රාජාර්හ අටපිරිකර දීමෙන් උපසම්පදා දෙවා
94 විනය ධර්‍මයෙහි සහ සූත්‍රාන්තයෙහි මනාකොට හික්මවා මහ පිරිකර
95 ඇති ආවාසයක් කරවා එහි භික්ෂූන් වස්වා සකස් කොට ආදර ඇතිව
96 උපස්ථාන කළහ. ලෙව්සසුන් කිස නොයෙක් පරිද්දෙන් විචාරන්නෝ
සජ්ජන සංග්‍රහය ද දුර්ජන නිග්‍රහය ද මහරජාණන් සිතට එකඟව ම
97 සුදුසු පරිද්දෙන් කෙරෙති. මේ ආදි නොයෙක් නයින් පින් කැමැති වූ
ද රජහුගේ චිත්තයට එකඟව වැටෙන්නා වූ ද ලෙව් සසුන් මාගේ ම ය
98 යි සිතන්නාහු (වූහ.) සමහර පෙර රජදරුවෝ රාජ්‍යලාභාදිය කරණකොට
99 ගෙණ සොහොවුරු ආදීන් නොතකා උනුන් පෙළූහ. ඔවුන්ගේ
විවාදයෙන් ම මිනිස්සු ද එසේ ම වූහ. මේ තුන්දෙනා ඒසා රාජ්‍ය
සම්පත්තියක් ලැබත් විවාදය තබා උනුන් සිදුරු ද නො දක්වා එම
100 නුවර වසන්නෝත් ඡායා සෙයින් හැමකල් ප්‍රිය වූහ. මෙසේ රාජ්‍යය
නිසාත් කෝප මාත්‍රයකුදු නො කොට සීලව ජාතකයෙහි බෝසතුන්
101 ගුණ සමාන (හැසිරීම්) කළහ. විසාලා මහනුවර ලිච්ඡවි රජහු මෙන්
සමගිව විරිදු නොව රජ කළහ. එහෙයින් ම ඔව්හු ජයලාභ ද ලැබූ.
ලංකාංගනා ශ්‍රීයෙන් උමතු වූ මද පැණැති කිසි මිහිපල් කෙනෙක්
102 නොකටයුතු කොට නොයෙක් ව්‍යසනයට පැමිණියෝ ය. ලකඟන
103 සිරි සැපත් ලත් පැණැති නරපල්හු කටයුතු දැ කොට මහා යසස් හිමි
104 වූහ. එබඳු ලකඟනට හිමි වූ මේ නරපල්හු තිදෙනා සමගි බවට
105 පැමිණියහ. ඒ ආශ්චර්‍ය්‍යය යි මම කියමි. මහ ගුණ ඇති මහරජ තෙමේ
106 කුඩ ආදි සම්පත් දී රජපිරිස් ගෙන ඇවිදිනා සිය මලු දැක සතුටු බවට
පැමිණ නැවත නැවත බලා මෙසේ ඒ තෙමේ හුදු බ්‍රහ්ම භාවනාව ම
වැඩුයේයි.

මිහිපල් කුලග සසුන් පිටිවහල් අපමණ ගුණදර වූ ඔව්හු මොනවට
107 දහමෙහි හැසිරෙන්නෝ අගති ගමන් හරිමින් මනා මිතුරන් බෙජෙමින්
සුගති ගමන් මගම සාදනු කැමැත්තෝ ය. මෙබඳු මනා ගුණයෙන් යුත්
108 වූ සැදැහැ ධන කොට ඇති මිහිපල්හු සැදැහැයෙන් ශ්‍රීමත් සම්බුදුන්ගේ
මේ දළදාව ද ධර්‍මය ද උතුම් සංඝයා ද පූජා කොට ආශෙෂ සම්පත්
දායක බොහෝ පින් රැස් කොට ගෙන නිමල් බුදුසසන ද මෙලක ද
109 මොනවට පාලනය කළෝ යි. ලොවට අසහාය නායක වූ බුදුහු ගුණසාර
භාරය මනා කොට මෙනෙහි ලාගෙණ නිතියෙන් සිහිකරන්නා වූ එසේ
ම ඒ බුදුන්ගේ ධර්‍මය හා සංඝයාත් මෙනෙහි කරන්නා වූ වරගුණ ඇති
110 ලංකාධිපතියා නිරන්තරයෙන් භජනය කෙරෙත්වා. මෙසේ රජුන්ට

Non-Commercial Distribution

අධිපති මහරජ වූ රාජබලයෙන් යුක්ත මිහිපල් තෙමේ නිමල් මුනිසසුන් ද මේ ලක්දිව ද සකස් කොට රක්නේ මහසම්පත් දී සියලු රටවැසි මිනිසුන් සතොස්වා දෙවි මිනිසුන් සතුටු කෙරෙමින් මහ පැණැති පුණ්‍යාර්ධි ආඥාබල ඇත්තේ විය.

111 මහ තෙද ඇති මහ පැණවත් මත යසසින් යුක්ත (රජු)
ලෙව්සසුන් රකිමින් මහනුවර වසනකල රාජසිංහහ රජහුගේ කාලයෙහි
112 ලංකා ආරක්ෂාව පිණිස යොදන ලද්දා වූ මහත් බල ඇති ඕලන්දෝ ය
113 යි නම් වූ ඒ මුහුදු වෙළෙන්දෝ වූ ලක්දිව් හිමි රජුන්ගේ දූත කෘත්‍යයෙහි
114 යුක්තවූහු. නොයෙක් රට උපන් නොයෙක් වස්ත්‍රාදි බොහෝ රාජ
115 පාරිභෝගයට සුදුසු මාහැඟි බඩු මොනවට විචාරා මහත් ගෞරවයෙන්
116 මහ පෙරහරින් ගෙණවුත් පඬුරු කොට අවුරුදු පතා දෙති. එකල්හි
117 ලක් වැසි මිනිසුන්ගේ පෙරකළ කමින් හෝ ලෙව්සසුන් අර කුන්හි
118 නියුක්ත දේවතාදීන්ගේ ප්‍රමාදයකින් දෝ වෙසෙසින් කිපුණු ඉතා කර්කශ
119 ඔව්හු ලක්වැසි මිනිසුන් නොයෙක් ආකාරයෙන් පෙළූහ. මහා යසස්
ඇති මහ රජ තෙමේ එපවත් අසා ඒ නුසුදුසුයයි සිතා එකල්හි ඇමතියන්
යැවී ය.

120 එසේ ඒ ඇමතියෝ ද ලක්වැසි ජනයන් හා ගොස් ඕලන්දයන් හා
බිහිසුණු යුද කරන්නෝ පිළිසතුරන් නසන්නෝ ගෙවල් හා කොටු
121 ගිනිලන්නෝ නානා උපායෙන් උන්ට භය එළවූ හ. බියෙන් පෙළුන
122 සතුරන් අතුරෙන් දුර්වල කර්කශ අධම ආයු ගෙවුනා වූ පව්ටු එකෙක්
ප්‍රධාන බැව්හි සිටියේ තෙමේ ජාවුන් ආදී නානා ප්‍රකාර මහපිරිස් ගෙණ
123 ඒ ඒ රට හා ගම් ද විහාර දේවාල ද හේදඬු අම්බලම් ආදිය ද නොයෙක්
124 පරිද්දෙන් විනාශ කෙළේ ය. ලක්හිමියා විසින් අණවන ලද ඇමතියෝ
වූකලී යුද්ධයෙහි දක්ෂ ශූරයන් හා (ඉදිරියට ගොස්) ඒ ඒ තැන
125 අනේකාකාරයෙන් යුද කරන්නෝ ම සතුරන් ඒ ඒ තන්හිදී මැරීමෙනුත්
126 සර්වප්‍රකාරයෙන් ඒ තෙමේ වලකාලිය නුහුනුයේ නුවර බලා ආය. යුද
127 පිණිස සැදුනා මහ ඇමතියෝ නානාප්‍රකාරයෙන් මාර්ගයන් අවුරා
වෛරීන්ගේ ඉදිරියෙන් සිට වහා ඊම වැළකූහු කල් දක්නා ලක්හිමි මහ
128 නුවණැති මහ රජ තෙමේ ලැව්ගිනි සම වූ වෛරීන්ගේ ආගමනය
129 වළකන්ට නොහැක්කායි සිතා දළදාවහන්සේ ද බිසව් ද නැගණියන් ද
සාරවස්තුව ද යුව රජුන් දෙදෙනා සුගෝපනය පිණිස භාරකොට පර්වත
වන දුර්ගයෙන් දුර්ගම වූ රටට යැවී ය.

130 පසුව සියලු වෛරී සමූහයෝ කර්කශ දක්ෂ සේනා සෙයින් නුවරට
131 පැමිණ දහම් පොත් ආදිය විනාශ කළහ. සෙනෙවිරත් ආදි නොයෙක්

Non-Commercial Distribution

මහ ඇමතියන් හා යුද දක්‍ෂ වූ තැන් නො තැන් දන්නා වීරයන් විසින්
132 පිරිවරණ ලද මහරජ තෙමේ මහසෙන් විසින් පෙරටු කෙළේ මහනුවරට
133 නුදුරුවූ අතු නුවරවල ඒ ඒ තැන්හි වෙසෙමින් නුවර ඇහිර වූයේ ය.
134 ලක් වැසි බුදු සසුන් සැදැහැති මිනිස්සු ද රජහු සිතට අනුව වැටෙන්නෝ
සතුරු පක්‍ෂගතයන් අතුරෙන් දුටු දුටු බොහෝ මිනිසුන් ඒ ඒ තැන
135 මැරූහ. රාජදූතාදි මිනිසුන් හා භික්ෂු සංඝයා ද රක්‍ෂා කළහ. රජහට
136 පක්‍ෂපාත වූ වීරගුණ ඇති බල වත් කිසි ධීරයෝ රණ කෙළියෙන් ක්‍රීඩා
137 කොට බුදුසස්න රක්නා කැමැත්තෝ යුද්ධයෙහි සූර යෝධයන් විසින්
පිරි වරණ ලද්දෝ මහ ඒ ඒ තැන වසන්නවුන් හා නොයෙක් පරිද්දෙන්
138 යුද කොට පලවා ඇතුළු නුවර (වැඩිලා හුන්) වෛරීන් හා යුද කරන්ට
අරබයා උන් නැවත නැවත මැරූහ. මනුෂ්‍ය වූවෝ අපගේ රජහු
139 චිත්තානුවර්ති වූහ යනු ආශ්චර්‍ය්‍ය යයි නො සිතමු. දෙවියෝ ද එසේ
140 වූහ. එහෙයින් එකෙණෙහි වෛරීන් අතුරෙන් මහා ප්‍රධානයාට එක
141 පැමිණි නො බෝ කලකින් ම දේවතාභාවයෙන් ද රජහු
පුණ්‍යානුභාවයෙන් ද භය සන්ත්‍රාසයෙන් බිහිසුණු උමතු බව පැමිණ ඒ
මනා නුවර හැර නිඃශ්‍රීකව ම ගොස් මරණ ගිත්නට පැමිණියේ ය.

142 අඥානයා වසඟව ආවාවූ සියලු ඒ සතුරු සමූහයා අනාථ අසරණ
ව ව්‍යවසනයට පැමිණිය හ. කිසිවෙක් රෝගාතුර වූහ. කිසිවෙක්
143 ක්‍ෂුධා රෝගයෙන් පීඩිත වූහ. කිසිවෙක් යුදෙහි දී මරණ ලද හ. කිසිවෙක්
144 පර්වත දුර්ගයට වත් හ. මෙසේ වෛරී පක්‍ෂ නරාධමයෝ මරණ ලද්දෝ
ද ගියෝ ද වූහ. මෙසේ දෙව් මිනිසුන් ආදීන් විසින් මේ රජතෙමේ
රක්නා ලද්දේ වී,

145 මෙසේ මහානුභාව ඇත්තේ අතිශයින් මහපින් ඇත්තේ යයි ද
(ලෝවැස්සෝ) කිවූහු. මෙබඳු අනුභාව හා මහපින් ඇති ඒ රජහු අණ
146 ඇක්මෙන්ට ලෝකයෙහි කවර සමර්ථයෙක් වන්නේ ද? දුරු කරණ ලද
වෛරී සමූහ ඇති මහයසස් ඇති නර නායක මහරජ තෙමේ සතුරු
147 බලය නොදන්නේ පෙර සෙයින් මුළු නුවර ශුද්ධ කරවා දළදා මැදුර
ආදිය සකසා වෙසෙසින් අලඞකාර ද කරවී. උතුම් බුදු සස්නෙහි
148 පිවිතුරු අදර ඇති ඒ තෙමේ වරබුදුවදන් නිතියෙන් මෙනෙහි කෙරෙමින්
149 බුදු පිතුන් ගුණ මෙනෙහි කිරීමෙන් යුක්ත වූයේ සම්බුදු රජු දශනධාතුව
නිත්‍යයෙන් පුදමින් තෙරුවන් හි මෙසේ මොනවට වැටෙමින් නරශ්‍රෙෂ්ඨ
150 ඒ තෙමේ දළදා වියොවින් තමහට උපන් දුක නො ඉවසන්නේ එකල
151 පිරිස් සහිතව මහ දුර්ග වූ රට (ගොස්) මහසැදැහැතියේ ධාතුකරඬුව දැක
152 ආශ්චර්‍ය්‍ය අද්භූත සිත් ඇත්තේ ම සකසා වැඳ හිස බිම තබා භික්ෂුසඞ්ඝයා
ද වැඳ තමා සිත දුක් නිවූයේ ය.

Non-Commercial Distribution

153 හොබනා අස්වස් ලද්දා වූ ඒ තෙමේ දළදාව සහිතව ඒ කරඬුව
හිස තබාගෙන මහපෙරහර පවත්වමින් සාධුකාර රාවයෙන් හා පසඟ
154 තුරු රැවින් ද මහ සැණකෙළි කොට තමා පුරයට වන. එකල ලක්දිව්
155 වැසි මිනිසුන් ද දළදාව සහිත මිහිපලු දැක සතුටුව සාධුනාද කළහ. ඒ
පෙර දළදාගෙයි දන්තධාතුව වඩා සියලු පෙර පූජාවිධි වඩාලා පැවැත්වී,
156 සියලු නුවර අරම්හි සඟරජු ආදී බොහෝ බුද්ධ පුත්‍රයෝ ද සතුරු භයට
වැඩි වූ මහත් සසර භය දක්නාහු පැවිදි බැව් නො හැර පොත් හා ධාතු
157 හා පිරිකර ගෙණ එයින් ගියෝ පිට රට වෙසෙමින් ද සස්න රැක්කෝ
158 ය. නැවත අගරජ තෙමේ ද ඒ සියල්ලන් නුවරට වඩා ගෙණවුත් නුවර
159 අරම් ශුද්ධ කරවා එහි භික්ෂූන් වස්වා දහම්හි පිළිවෙත්හි හික්මෙන්ට
160 යෙදූ කල්හි සමර්ථ ධර්මකථිකයන් විචාරා ආරාධනා කොට රාජෝවාදාදි
161 සදහම් නැවත අසමින් (ඒ තෙමේ) විසී ය.

162 සතුරු වූ නොයෙක් ඕලන්දවාසීන් අතුරෙන් යමෙක් දේශාචාරය
සලකන්නාහු නම් ඒ සියල්ලෝ රැස්ව මන්ත්‍රණය කොට "මේ ලඞ්කාව
163 අශේෂයෙන් ගන්ට නුපුළුවනැ" යි නිශ්චය කොට දැන "මෙහි යමෙක්
ලක් නා රජු කෙරෙහි විරුද්ධ වූ නම් ඒ සියලු ජනයෝ විනාශ භාවයට
164 පැමිණියෝ ය. එසේ ම අපට ද වන්නේයි. ඒ හෙයින් අපිදු ලඞ්කේන්ද්‍රයා
කෙරෙහි බැතිපෙම් හා ඉතා ගෞරව පෙරටුකොට පුරයෙහිම වසමු
165 නම් ඒ සුදුසුය" යි සිතා නැවත නැවතත් මන්ත්‍රණය කොට රජ පඬුරු
166 හා "මහා මෝහ" යා විසින් ගෙන්වාගෙණ ගිය යහපත් සෑයක් සෙයින්
බබළන්නා වූ ධාතු ශූන්‍ය (රිදීමුවා) කරඬුව ද රන්සිවිගෙය ද ගෞරවයෙන්
167 ගෙන්වාගෙණ (වුත් භාරකොට) "සිය නැයන් කළ දොස් ක්ෂමා
කරවාගෙණ මිත්මතු වසන්නෙමුය" යි සිතා ආවා වූ ඔව්හු මිහිපල්හු
නොයෙක් පරිද්දෙන් පුදා වැඳ සමග සතුටු වූහ.

168 ඉක්බිති ලඞ්කේශ්වර රජ තෙමේ ඔවුන් ගේ අනල්ප දෝෂය
ඉවසා ඔවුන්ට නොයෙක් පරිද්දෙන් සම්මාන ද දුන්නේ ය. එසේම
169 අපගේ රජතෙමේ ද මිත්‍රසන්ථවයෙහි කරුණු තරයේ කොට ඔවුන් හා
170 මිත්‍රභාවයට පැමිණියේ යි. ඕලන්ද ජනයෝ ද ලඞ්කේශ්වර නරේන්ද්‍රයා
171 කෙරෙහි මොනවට පැහැද නොයෙක් රට උපන් මාහැඟි පඬුරු ද රාජ
172 සන්දෙශ ද ගෙණ අවුරුදු පතා දෙති, මනුෂ්‍ය ශ්‍රේෂ්ඨ තෙමේ මිථ්‍යාද
173 ෘෂ්ටීන්ගේ හස්තයට ගියා වූ මහත් ඒ කරඬුව රණින් ගහා මැණික් බැඳ
හිරුරැස් පිඩක් සේ ශෝභාමත් කරවා දන්තධාතුව වඩා ශක්‍රයා සෙයින්
පිදූයේ ය.

174 මෙසේ දුෂ්ට මිථ්‍යාද ෘස්ටි වෛරී සමූහයෝ දුරුකළ එඩි ඇතිවූහ.
සම්‍යග්ද ෘෂ්ටික සිංහල අධිපතිහුගේ කුශලානුභාවය ආශ්චර්‍ය්‍යයි .

Non-Commercial Distribution

175 සත්වයෝ ආශ්චර්ය අත්භූත මේ කාරණය ද සලකා ආදර සහිත වූවෝ
සත්පුරුෂයන් විසින් පසස්නාලද අසදෘශ වූ ප්‍රවර සම්‍යග්දෘෂ්ටි ගුණය
මොනවට ඇසුරු කෙරෙත්වා.

176 මනරම් ලක්දිව්හි එක් භික්ෂුකෙනෙකුන් නැතිකල රාජ්‍ය භාරය
ලැබ ශ්‍රීවර්ධන පුරයෙහි වෙසෙමින් බොහෝ සාමණේර වහන්දෑ ද එසේම
177 කුලපුත්‍රයන් ද පැවිදි උපසම්පදාවට පමුණුවා (ලිය) ඒ භික්ෂූන් අතුරෙහි
178 කිසිවක්හු දහම් දෙසන්නෝ ද විනයෙහි බුහුටිවූවෝ ද විදර්ශකයෝ ද
179 වූහ. එසේම කිසිවෙක් ආරණ්‍යක ද වූහ. ශ්‍රමණ ගුණාඪ්‍යවූ මේ මුළු
ලක්දිව මේ ආදි ගුණයෙහි යෙදුනා වූ නොයෙක් සියගණන් භික්ෂූන්
ඇති කරවමින් බබුළුවා ඒ රජ තෙමේ දවස්පතා පින් කෙරෙමින්
180 සඞ්ඝයාට නිති බත් හා ගිලන් බත් ද ආරාධනා කොට දෙමින්
181 භික්ෂුසඞ්ඝයා කෙරෙහි වැඩ කැමැති ඒ තෙමේ භික්ෂූන් සාමණේරයන්දෑට
182 කායරෝග චිත්තරෝග වශයෙන් මෙහි රෝගයෝ දෙදෙනෙක් වෙති.
183 උන් අතුරෙහි සිතෙහි රෝගයන්ට පිළියම පිණිස දීපදෝප්තම තෙමේ
විනය දහම් ද සූත්‍රාන්තයන් ද දෙසූ සේක. චිත්තරෝගයන්හි රාගාදි
184 රෝග නසන හේතු වූ ඒ විනය සූත්‍රාන්තයෙහි භික්ෂූන්ට සිරුර රෝගයෙන්
පෙළීම ඇති කළ පර්යාප්ති ප්‍රතිපත්තියෙහි මැනවින් හික්මීම දුෂ්කරයි.

185 එහෙයින් මිහිපල් තෙමේ ජ්වරාදි රෝගයනුදු ශමනය පිණිස
සඞ්ඝයාට ආරාධනා කොට වෙදකම්හි මොනවට හික්මවා වෙදුන්
දෙදෙනකු හා පරිවාරක මිනිසුන් ද නියම කොට උන්ටත් ගම් කුඹුරු ද
186 වස්ත්‍රාභරණාදි සම්පත් ද දී බෙහෙත් මිල පිණිස අවුරුදු පතා (රිදී) සිය
187 ගණන් රජගෙයින් දෙමින් ඒ එජ තෙමේ ඒ ඒ අරම්හි භික්ෂු
සාමණේරයන්ගේ සුවදුක් විචාරා උන්වහන්සේලාට කටයුතු උපස්ථාන
කරවී. මෙසේ රාජාධිරාජ වූ හේ තෙමේ සඞ්ඝ ලාභය ද ඒ සියලු
ලාභයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ ආරෝග්‍යලාභය ද දෙවී ය.

බුද්ධ තෙමේ (යමක්) ශ්‍රේෂ්ඨයයි දෙසූ සේක් නම් එයිනුදු පූජා
188 කොට සම්බුදුසසන මොනවට බබුළුවා පැවැත්විය. සාසනාධාරවූ නරවර
ප්‍රවර වූ ඒ පූර්වික ලඞ්කාධිපතීහු මිත්‍යාදෘෂ්ටිය හා රිපුජන සමූහයාත්
189 දුරුකොට රාජ්‍යභාරය ඉසුලූහ. රජ තෙමේ එය ද අසා අපමණ යසස්
දායක වූ තමා විසින් පසක් කරණ ලද ධර්මය ද දකිමින් ශාසනෝපකාරක
වූයේ ම අලස නොව නිරන්තරයෙන් පින් කෙළේ ය.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහවස
අභිෂේක මඞ්ගලාදි දීපන නම් වූ එකුත් සියවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# සීය වෙනි පරිච්ඡේදය

ඒ තෙමේ නිරන්තරයෙන් ආදර ඇත්තේ චක්‍රරත්නය සෙයින්
1 දළදාව පුදන්නේ සමන් සපු දොඹ කිණිහිර දුනුකේ පියුම් උපුල් ආදි
2 නන් වගෙහි මලින් ද සඳුන් අගිල් ආදි වූ සුගන්ධයෙන් ද නන් සුවඳැති
3 දුමින් ද සකුරු මී ආදියෙන් ද යහපත් පුවක් කපුරු බුලත් බෙහෙතින්
4 ද මනා මිහිර බත් කැඳ පූ ආදි වූ නන් වැදෑරුම් ආහාරයෙන් ද පැහැ
5 ඇති රඹ දඹයෙන් හා පනා අඹ බොරළු දමුනුරයෙන් ද තිඹිරි නාරඟ
හා ප්‍රණීත මනෝඥ තැඹිලි හා කසපැනින් ද මනා විළිකුන් දෙළුමෙන්
6 ද ඉඳි මිදි ආදි වූ නන්වැදෑරුම් ඵලයන් ද මිහිරි අලදි දූයෙන් හා
නොයෙක් බොඩ ජාතියෙන් ද නොයෙක් පරිද්දෙන් මේ ආදි වූ පූජා
7 හා පසඟතුරු රැවින් පෙර රජුන් පවත්වා ආ බොහෝ පූජාවන් හා
8 අලුත් පූජාවෙන් ද දිනපතා දළදා වහන්සේ පුදා පින් කැමති මහා
9 යසස් ඇත්තේ පින්රැස් වැඩියේ ම වඩමින් රන් රිදියෙන් හා මිණිමුතුයෙන්
10 ද යහපත් නන් විසිතුරු කමින් දිලිසෙන්නා වූ බොහෝ වස්ත්‍රයන් ද
11 (බඳනාලද) වියතින් හා තිරයෙන් ද සිව්රු හා පිරිකරින් ද නන්වැදෑරුම්
අබරණින් ද නොයෙක් ඇත් අස් මුලින් හා එසෙම ගෙරි මීවුන්ගෙන් ද
12 පූජා කොට ආදර සහිත ඒ නරේන්‍ද්‍රතෙමේ අභිවාදනය කෙළේ ය.
13 බුදුන් දළදා වහන්සේ බලා සුපහන් මිහිපල්තෙම පෙර රජු දවස කරවා
14 නොනිමියා වූ අන්මුවා කරඬුව ද කරවන්ට සිතා සත් නිකක් අධික
15 කොට ඇති රන් දෙදහසෙකින් කරවන ලද මැණික්වන් මනහර ඒ
16 කරඬුමුදුනෙහි මාහැඟි උතුම් මහත් විදුරක් මනා කොට බැඳවිය. පින්
17 කැමැති මිහිපල් තෙමේ ප්‍රසාදාවහ දැකුම් කටයුතු අටසැක් අධික වූ
එක්සියයක් වර විදුරුමිණි හා මනෝහර වූ එක් සැත්තෑවක් අධික
18 කොට ඇති එක් සියයක් පුෂ්පරාග මිණිරුවන් ද බැඳ අසූපසක් අධික
19 කොට ඇති නිල්මිණියෙන් පන්සියයක් ද අටසිය අසූවක් අධික කොට
20 ඇති සාරදහසක් රත්මිණිවරුන් ද බැඳ අටසැත්තෑවක් අධික කොට
ඇති මුතු සත්සියයක් ද බඳවා මාහැඟි කරඬුව නිම කල්හි ඒ ඇතුළෙහි
තබන පිණිස කරඬු දෙකක් කරවන්නේ එහි මාහැඟි උතුම් යහපත්
21 මිණි බඳවා යසස් ඇති විමල දහම් සූරිය රජහු විසින් කරවන ලද මහත්
22 වූ කරඬුව ඒ රජ තෙමේ රන් ගාවා මහපුද පවත්වමින් එහිම බුදුරජුහු
දළදාව වැඩුයේ ය.

එ මහ පැණැති රජ තෙමේ බුදුන් දළදායෙහි ඉතා පහන් වූයේ
23 අකරබඩු නම් මහගම පූජා කෙළේ ය. රජතෙමේ ඒ ධාතු පෙළහරෙහිදි
24 ලංකා වාසීන්ට දළදා වහන්සේ දක්වනු පිණිස කරුණාවෙන්සිතා මුළු

Non-Commercial Distribution

25 ශ්‍රී වර්ධන පුරය මොනවට ශුද්ධකරවා නන් විසිතුරු කමින් ද
26 පිළිතොරණින් ද කෙසෙල් තොරණ පෙතීන් හා තැඹිලි වලු ආදියෙන්
27 ද නොයෙක් ධජ පතාකාවෙන් අතුරු නැතිව සරසවා මුළු ලක ජනයා
28 එහි රැස් කරවූයේ ය. මිහිපල් තෙමේ නන් අබරණින් දෙව්රජ සිරින්
29 හෙබියේ නන් වැදෑරුම් මහපුද පෙරටු කොට ගෙණ දළදා ගෙට ගොස්
30 නොයෙක් පරිද්දෙන් පූජා කොට බිම පසඟ පිහිට වූ මිහිපල් තෙමේ
බුදුන් දළදාගෙයි ගෞරව ඇත්තේ වැඳ දළදා වහන්සේ සහිත රන්පියුම
31 හස්තපද්ම මස්තකයෙහි වඩාගෙණ ඒ දළදා ගෙන් පිටත්ව රිදී කුඩයෙන්
32 හා සෙමර මල් විජනියෙන් ද රන් රිදී මලින් හා ලද පස්මලින් ද
33 නොයෙක් මිණිමුතුයෙන් හා රන් රිදියෙන් ද නන් විසිතුරු පිළියෙන් ද
නන් අබරණින් හා නොයෙක් සුවඳ මලින් හා බොහෝ වූ පහන් දුමින්
ද සක් කස් තල ආදිවූ පසඟ'තුරු පිළි මනා රවයෙන් ද නන් දහස්
34 සාධුකාර ධ්වනියෙන් ද සයුර තරඟවැල සෙයින් කරණු ලබන පූජා
පවත්නා කල මහා යසස් ඇතියේ සක්රුවන සහිත සක්විති රජක්හු
35 සෙයින් ගොස් විවිධ විචිත්‍ර අලංකාර වස්ත්‍රාදියෙන් සරසන ලද දෙව්
36 මණ්ඩපයක් බඳු වූ යහපත් ප්‍රවර මණ්ඩපයෙහි සිටියේ ය. ජන ශ්‍රේෂ්ඨ
37 රජ තෙමේ දේව සමූහයා විසින් පෙරටු කරණ ලද දෙව්රජහු සෙයින්
38 කල්ප ලක්‍ෂ ගණිනුත් ඉතා දුර්ලභ වූ යහපත් බුදුන්ගේ වර දළදාව
39 ජනසමූහයන්ට දක්වමින් සියල්ලන් සතුටු කරවා කුසල් රැස් කෙරෙමින්
40 කරඬු ඇතුළට වැඩුයේයි. මෙසේ ජීවමාන බුද්ධ දර්ශනය සෙයින්
සර්වප්‍රකාරයෙන් ජනසමූහයා ද සතුටුව පින්රැස් වැඩුයේ ය.

41 ජනයාහට හිත වැඩකරු රාජමහිම ඇති බුදුසසුන් මනා කොට පිහිටුවිමෙන් හටගත් නන් වැදෑරුම් අපමණ පින් ඇති මිහිපල්කුල අබරණ බඳු වූ මනා ගුණයෙන් හෙබියා වූ මිහිපල් තෙමේ බොහෝ කාලයක් මුලුල්ලෙහි යහතින් දිනේවා! යහතින් දිනේවා ! යහතින් දිනේවා !

42 පුණ්‍යාර්ථී රජ තෙමේ මෙසේ නොයෙක් වර දළදාව දක්වා
බොහෝ පින් රැස් කෙළේයි. බුදු රජු දළදාව උදෙසා පෙර ලක්හිමියන්
43 විසින් පිදූ ගම් කෙත් මඳකුත් නො නසා ඉතා පහන් වූයේ දවසක්
පාසා මහ පුද පවත්වමින් බොහෝ ඇතුන් අසුන් ද එසේම ගෙරි මී
44 සරක් ද සමෘද්ධ මිනිසුන් සහිත රදාතල නම් වූ එක් ගමක් ද අනිකුත්
45 මුතුගල නම් වූ මහ ගමක් ද පූජා කොට ඒ තෙමේ පුණ්‍යාහාරය අත්පත්
කෙළේය.

Non-Commercial Distribution

46 ශාසන ශුද්ධි කැමැති ඒ තෙමේ ලක්දිව් වරයෙහි පෙර භික්ෂූන්
විද්‍යා මාන කල පැවිදි ලද්දා වූ සියලු හෙරණ පැවිදි වහන්දෑ අතුරෙන්
47 පවට බානසුලු සමහරු මනාසිල් හා පිරිසිදු ආජීව ඇති සදහම් බුහුමන්
47 ඇත්තෝ වූහ. සමහරු පවින් බර වූ දුස්සීල පාප ස්වභාව ඇතිව අඹු
49 දරු ආදීන් රකිමින් ගිහිකිස ඇලුනාහුය. නැකැත් වෙදකම් ආදි අයුතු
50 කටයුත්තෙහි යෙදුනාහුය. රජ තෙමේ එබඳු අලජ්ජීන්ගේ පවත් අසා
51 මොනවට දූන සත්පුරුෂ ලජ්ජි පක්ෂගතයන් අතුරෙන් පිරිසිදු ආජීව
52 ඇති අරණ්‍යවාසී වූ බුදුසසුන් වැඩුම් පිණිස කරණ ලද උත්සාහ ඇති
53 සිල්වත් ගුණවත් බහුශ්‍රැතවූ ව්‍යාකරණයෙහි ද බුද්ධ වචනයෙහි ද විසාරද
වූ සරණඞ්කර නම් ප්‍රසිද්ධ ඒ සාමණේර වහන්දෑ මැනවැ යි සිතා
උන්වහන්සේගේ ආධාරයෙන් රජ තෙමේ දහම් වූ නියායෙන් විචාරමින්
54 නිග්‍රහ කොට "මෙතැන් පටන්නැකැත් වෙදකම් ආදී වූ (අන්‍ය වූද)
අකතීව්‍යයන් හැර පැවිදි සියල්ලෝ හැම කල බුද්ධ වචනයන් ද පිළිවෙත්
55 ද කරන්ට" යි මොනවට අවවාදයත් දෙවා ඉතා පසුබැස්සා වූ සස්න
56 වඩනා කැමැති ඒ රජ තෙමේ ලජ්ජීන්ට බල දී නා නා උපායෙන්
සස්නට සඞ්ග්‍රහ කෙළේ ය.

57 මුළු ලක්දිව උපසම්පන්න භික්ෂූන්ගේ අභාවයෙන් මුනි රජහු
සුවිමල් සස්න විනාශ වන්නේ යයි කම්පිත වූ මිහිපල් තෙමේ "මා වැනි
58 රජක්හු ලක් රජය කරණ කළ බුද්ධ ශාසනයාගේ විනාශය යුතු නො
59 වන්නේ ය" යි සිතා පෙර රජහු දවස භික්ෂූන් ගෙණෙන්ට ඒ ඒ තැන
60 (ඇමතියන්) යවා නොලත් ඒ ශාසනාවෘර්ධිය මම් මැ කරන්නෙමැයි
61 සිතමින් ජන ප්‍රධාන වූ මහ පින් ඇති මිහිපල් තෙමේ මහර්ෂි ශාසනයාගේ
චිරස්ථිතියම කැමැති වෙමින් බුද්ධ පුත්‍රයන් ගෙණ ඒම පිණිස බුදුන්
පිරිනිවි තැන් පටන් දෙ දහස් දෙසිය අනූ තුන් වස පැමිණි කල නොයෙක්
ආකාර පඬුරින් හා නොයෙක් පූජා වස්තුයෙන් යුක්ත වූ උතුම් රාජ
62 සන්දෙශ ද දී (සියාම් දේශයෙහි) අයෝධ්‍යා පුරවරයට ඇමතියනුදු යැවී
ය.

මෙසේ ලංකා නායක තෙමේ බුදුසසුන් සුවිශෝධනය කරණු
63 කැමැත්තෙන් තද්වර්ධනය ආරම්භ කෙළේ ය. ඒ ඇමතියෝ රාජ
සන්දෙශාදිය ගෙණ මහ පෙරහරින් මහත් ගෞරවයෙන් පිටත් වූහ. ලංකා
64 ආරක්ෂාවෙහි නියුක්ත ඕලන්ද මිනිසුන් හා නැව් නැගී ගොස් සියාම්
65 දේශයෙහි අයෝධ්‍ය පුරයට ඔවුන් පැමිණි කල එරට මිහිපල් තෙමේ
66 රාජසන්දේශාදිය පිළිගෙණ විධි වූ පරිද්දෙන් ඇමතියන්ට ද කටයුතු
67 සංග්‍රහ මොනවට කරවා උතුම් රාජ සන්දේශය බැලී ය. නුවණැත්තේ
68 බුදුබැව්ම පතමින් දසපෙරුම් පුරන්නා වූ සස්න මොනවට රක්නා වූ

Non-Commercial Distribution

68 ධාර්මික නම් ඒ නරපල් තෙමේ ලක්දිව්හි බුදුසසුන් පිරිහුන් බැව් ආදි වූ
සියලු පවත් දැන වෙසෙසින්ම කම්පිත වූයේ "මම වනාහි බුදු සසුන්
69 වැඩුම් කරන්ට උපස්තම්භක වන්නෙමි" යි සිතී ය. ඒ මිහිපල් තෙමේ
70 සියාම් ජනපදයෙහි සඟරජු ආදි බොහෝ වූ බහුශ්‍රැත ධර්ම ධරයන්ට
71 පැවිදිව බොහෝ කල්ගිය (තෙරුන් ද) විනය දන්නා මහතෙරුන් හා
72 ශාසනකෘත්‍යකාරක සමත් (තෙරුන් ද) රැස්කොට මොනවට විචාර
අල්පේච්ඡ සන්තුෂ්ට ගුණයන්ට ආධාර වූ ආචාර ශීලාදි ගුණයෙන්
73 යුක්ත උපාලි ස්ථවිර ප්‍රමුඛ අතිරේක දශ වර්ගයක සඞ්ඝයා ආරාධනා
74 කොට ලක්දිව්හි නැති ධර්ම විනය පුස්තකයන් ද රන් පිළිමයක් හා
75 උතුම් රන් පොතක් ද ලක්දිව් මහරජාණන් කෙරෙහි පහන්ව උතුම් රාජ
සන්දේශයක් හා නොයෙක් පඬුරු ද අයෝධ්‍යාපුර රාජාමාත්‍යයන් ද
76 වෙසතුරු රජු වැනි වූයේ ඒ රජ තෙමේ ලක්දිව් වර දළදා මැදුරට එවී
ය.

77 මෙසේ රන්පිළිබිඹුව ආදිය සපයා මේ නැවක් එවන ලද්දී ද ඒ
මහ නැව් තොමෝ බොහෝ උපද්‍රව ඇති අනේක භයින් ආකීර්ණ වූ
78 ගැඹුරු මුහුද උපද්‍රව රහිතවම අවුදින් යහපත් උතුම් ලක්දිව්හි
ත්‍රිකෝණමලය තොට පැමිණියාය. ලඞ්කාධිපති වූ ඒ මහ රජ තෙමේ
79 එපවත් අසා ශ්‍රී වර්ධනපුරයෙහි සියලු නුවරුන් රැස් කරවා මහ සැණකෙළි
80 කරවමින් පහන් රජ තෙමේ මහමුහුද පටන් ශ්‍රී වර්ධනපුරය යම්තාක් නම්
81 එතෙක් මාර්ගය ශුද්ධකරවා ඒ ඒ තැන ආරාමයන් ද කරවි. ඒ ජනේන්ද්‍ර
82 තෙම මහසෙනෙවි ආදි වූ ඇමතියනුදු යවා බුදුන් පිළිරූ හා දහම්
පොත් බික්සඟන ආදි සියල්ල යථා ක්‍රමයෙන් ගෙන්වා මහත්
83 ගෞරවයෙන් හා මහත් පෙළහරින් ද දුරුමඟ ගෙවා සමණළ ගලින්
84 වැටුනා වූ මහවැලිගඟ වෙත පැමිණි කල ශ්‍රීවර්ධන පුරාධිශ්වර පුණ්‍යකාමී
85 මහ යසැති ජනශ්‍රේෂ්ඨ තෙමේ තුනුරුවන් සඳහා පෙර ගමනින් උපදනා
86 ඵලය කැමැත්තේ ම ඇත් අස් ආදියෙන් හා බල සෙනඟින් පෙරටු
කරණ ලද්දේ පෙර ගමන් කොට ශ්‍රද්ධාවෙන් උතුම් වූ මහ තෙරුන් ආදී
87 මහ සංඝයා වැඳ එකෙණෙහි සතුටු වී. සමග සතුටු විය යුතු වූ කථාව
88 ද මොනවට කොට නිමවා තුණුරුවන් පෙරටු කොට ගෙණ සිය පුරයට
89 අවුත් පුෂ්පාරාමයෙහි මනා තැනෙක කරවන ලද මනරම් වූ උළු සෙවෙණි
ඇති අලඞ්කෘත සංඝාරාමයෙහි පසයෙන් උපස්ථාන කෙරෙමින් දවස්
90 පතා සැප දුක් පිළිවිසිනට ඇමතියනුදු නියෝග කෙළේ ය.

91 අයෝධ්‍ය පුරයෙන් ඒ මහ රජහු විසින් එවන ලද උත්තම රාජ
92 සන්දේශාදිය ගෙන්වා ගෙණ ආවා වූ රාජදූතාදී ඇමතියන් සුදුසු තන්හි
වස්වා ඇමතියන්ට කටයුතු සඞ්ග්‍රහ කරවා බුදුන් පිරිනිවි පසු දෙ දහස්

Non-Commercial Distribution

93 දෙසිය සනාතූවන ඒ අවුරුද්දෙහි ඇසළ මස පැමිණි පුණුපොහෝ
94 දවස්හි මහ බල ඇති ඒ මහිපතී මනුජේන්ද්‍ර වූ මහ රජ තෙම
95 රාජානුභාවයෙන් යුක්ත වූයේ ම ආරාමයට වැද ඊ මැද යහපත් පොහෝ
96 ගෙයි මොනවට අසුන් පණවා ශීලාචාර ගුණයෙන් යුක්ත තියුණු උපාය
97 දන්නා මහ උපාලි තෙරුන් ද, සියලු සතුන් හිත වැඩෙහි ඇලුනු දෙවෙනි
98 අරියමුනි තෙරුන් ද සංඝයා සමග වඩා ගෙණවුත් වැඩ හිඳුවා උන්
වහන්සේලා ලවාම ලඞ්කේන්ද්‍ර රජ තෙමේ එකල්හි මහ පෙළහර
පවත්වමින් ලක්දිව්හි හෙරණුන් දෑ අතුරෙන් ප්‍රධානයන්ට උපසම්පදාව
දෙවී.

99 එතැන් පටන් සද්ධර්ම ශබ්ද ශාස්ත්‍රයන්හි සමත් වූ හෙරණ පැවිදි
ආදින් ගෙන්වා උපසම්පදා දෙවමින් එසේම අනුක්‍රමයෙන් උතුම් බුදු
100 සස්නෙහි පැවිදි උපසම්පදාවට සුදුස්සන් මොනවට විචාරා ඔවුන්ට
101 මනාකොට පැවිදි උපසම්පදා දෙවා ලක්දිව භික්ෂු සංඝයා බොහෝ වූ
102 කල උන්වහන්සේලා අතුරෙන් ආගම පිළිවෙත් රැකීමෙහි නිති ආදර
ඇති සමත්වූ ගුරු තන්හි තැබිය යුතු වහන්දෑ විචාරා අයොද්ධ්‍යයෙන්
වැඩි සඞ්ඝයා කෙරෙහිහික්මෙනු වට උන්වහන්සේලා මෙහෙයා
103 බුදුසසුන්කරු ඒ ලජ්ජී භික්ෂූන් අතුරෙන් ලක්දිව බොහෝ කලක්
104 විනායද්වාරයට ආවාවූ බුදුසස්න බබුළුවන්ටම යමෙක් තෙමේ බොහෝ
105 කාලයක් කළ උත්සාහය ඇත්තේ ද, යමෙක් තෙමේ අනලස් වූයේ රෑ
දෙවෙහි බුදු සසුන් පිළිබඳ දහම් හා පිළිවෙත් නුවණ පමණින් බල
106 පමණින් බැබළ වීද, එසේම යතිතුමෙක් තෙමේ අන්‍යවූත් බොහෝ
107 ශිෂ්‍යයන් දහම් පිළිවෙත සකසා හික්මවා මෙහි සස්න බැබළ වීද, යමෙක්
තෙමේ ස්වාර්ථයෙහිත් පරාත්ථයෙහිත් යෙදුනේ බුදු සසුන් කලක්
පවත්වනු කැමැත්තේ ද, එසේම යමෙක් තෙමේ ශුද්ධාජීවයෙහි ඇලුනේ
ද යමෙක් තෙමේ ලක්දිව්හි හිතකාමී සියලු බුද්ධ පුත්‍රයන්ට ගුණශීල
108 ධූතාංගාදියෙහිදී කැඩපතක් බඳු වීද, යමෙක් සාමණේර කාලයෙහි
109 සරණඞ්කර නම් වීද, උපසම්පදාවූ පසු ශීලාචාර සම්පන්න ඒ බුද්ධ
පුත්‍රයන් වහන්සේ සඞ්ඝ රාජභාවයෙහි පිහිටුවා උන්වහන්සේ අනුගත
110 භික්ෂූන් අතුරෙන් බුදු සසුන් කටයුත්තෙහි යමෙක් දක්ෂ නම්, එසේම
යමෙක් සූපේසල නම්, විහාර දෙක්හි වැසි එබඳු වහන්සේ ද විචාරවා
111 උන්වහන්සේලාට තනතුරු දී බුදු සසුන්කරු සියල්ලෝම සමගිව රෑ
112 දෙවෙහි නො මැලිව විනය යම් සේ නම් ධර්‍මය යම්සේ නම් එසේම
113 කළ මැනවැයි නියම කොට රජ තෙමේ බොහෝ සඞ්ග්‍රහ කොට කලක්
පැවැත්ම පිණිස මෙසේ මොනවට ලක සසුන් බැබළ වී.

Non-Commercial Distribution

114 සියම් දේසයෙන් මෙහි පැමිණි රාජදූතාදීහු ද රාජසන්දේශාදිය දී
115 රජුහු දුටහ. ලක්දිව්නා මහ රජ ඒ සියල්ල පිළිගෙණ ප්‍රවර රාජ සන්දේශය
116 යෙහෙන් බලා පහන් මිහිපල් තෙම ඔවුන්ට සංග්‍රහ ද කෙළේ ය. තමා
117 සඳහාත් අනුන් සඳහාත් නැවත නැවත සසුන් වඩනු පිණිස කළ පින්
118 ඇති දහම් කැමැති සසුන් හොබවන යහපත් තැනැත්තේ ආරාමයට
පිවිස සඟමැදට ගියේත් සසුන් පැවැත්මට කරුණු නොයෙක් පරිද්දෙන්
විචාරා සසුන්ම බබුළුවන්ට සිතමින් මිහිපල් තෙමේ ප්‍රවර උපාලි මහ
119 තෙරුන් සකසා ආරාධනා කොට දික්සගියෙන් ද, සංයුක්සගියෙන්ද,
120 අනිකුත් සද්ධම් සංග්‍රහදී නොයෙකුත් ග්‍රන්ථයෙන් ද, දශ ප්‍රකාරයෙන් වූ
121 රාජ ධර්මයන් හා සිවුසඟරාවතුන් ද යන මේ ආදිය අසා උපන් සැදැහැ
ඇති මහ පැණැත්තේ කටයුතු නො කටයුතු ද පින් පව්ද වරද නිවරදද
122 දැන නොකටයුතු පාප ධර්මයන් හා වරද දුරුකොට කටයුතු දහම්හි සහ
අනවද්‍යයෙහි තමා යෙහෙන් පිහිට වී.

123 දවසක් දවසක් පාසා දානාදී නොයෙක් පින්කම් කෙරෙමින් මුළු
නුවර පෙර (කීවාක්) සෙයින්ම අලංකාර කරවා අයෝද්ධ්‍යයෙන් ආ
124 ඇමතියන් ද, එසේම ලංකා වැසි සියල්ලන් ද උපාලි මහතෙරුන් ආදී
භික්‍ෂූන් ද, එසේම ලංකා වැසි සියල්ලන් ද උපාලි මහතෙරුන් ආදී
භික්‍ෂූන් ද, එසේ ම ලක්දිව් වැසි (නවක) භික්‍ෂූන් ද සාමණේර ආදිහු ද,
125 සියල්ලන් රැස් කරවා ආදර සිහිත වූයේ ඒ සියල්ලවුන්ගේ වැඩ සඳහාත්
126 හිත සුව සඳහාත් රාජාභරණාදී නොයෙක් පූජා වස්තුවෙන් පෙර සෙයින්
සැණකෙළි පවත්වමින් දළදා වහන්සේ දැක්වීය.

127 මියුගුණු සෑ ආදී වූ චෛත්‍යස්ථාන වඳනා කැමැති රාජ දූතාදී
128 ඇමතියනුදු ලක්දිව්හි ඇමතියන් හා ඒ ඒ තන්හි යවා රිසි සේ වඳවමින්
129 ඔවුන්ගේ කටයුතු සඞ්ග්‍රහ මොනවට කරවා යැවී. එසේ ම ප්‍රවර උපාලි
තෙරුන් ආදි භික්‍ෂු සඞ්ඝයාත් පූජා වස්තුන් දී ඇමතියනුදු මෙහෙයා,
130 මියුගුණු ආදි ලක්දිව් උතුම් සොළොස් (මහ) ස්ථානයන් හා ශ්‍රීවර්ධන
131 පුරාදියෙහි චෛත්‍යයන් ද බඳවා බඬසීමා කරවා භික්‍ෂූන් වැඩෙහි
කැමැත්තේ පොහෝ ගෙවල් හා ආවාසයන් ද තන්හි තන්හි කරවී.
132 භික්‍ෂු සඞ්ඝයා කෙරෙහි මොනවට පහන් ඒ එජ තෙමේ තුන් අවුරුද්ද
133 ඇතුළත ආරාමද කරවා භික්‍ෂු සඞ්ඝයා වස්වා වස්කල කටයුතු
134 උපකාරයනුදු කරවා සදහමුත් අසා පොහෝ පෙහෙවස් විසී. සඞ්ඝයා
පවාරණය කළ කාලයෙහි නොයෙක් පිරිකරින් හා පිරිවර සිවුරෙන්
135 යුත් කෙළින් සිවුරු දුන්නේ ය. තුන් හවුරුදු ඇතුළත උතුම් වූ ඒ
136 සඞ්ඝයා කෙරෙහි සත්සියයක් පමණ උපසම්පදා කරවමින් ජනසමූහයා

Non-Commercial Distribution

කෙරෙහි හිතකාරී රජ තෙමේ තුන් දහසක් පමණ කුලපුත්‍රයන්ට උතුම්
හෙරණ පැවිදි දෙවි.

137 ලොවට පථ්‍යකාරී ජනාධිපති රජ තෙමේ මෙසේ ශාසන වෘර්ධිය
කෙළේ ය. එහෙයින් සතුටු සියල්ල බ්‍රහ්ම සුර අසුරයෝ ඒ මහීපතියා
හට ශ්‍රී ආයු දෙත්වා.

138 ලොවට වැඩුම්හි බොහෝ උපකාර කර වූ මනා පැණැති ධාර්මික
139 නම් (සියම්) නරපති තෙමේ බුදුබවම පතමින් සීලාචාර ගුණයන්ට
වාසභවන වූ සැදැහැ ආදී ගුණයෙන් හෙබියාවූ මහා විශුද්ධචාර්‍ය්‍ය
140 තෙරුන් ද, ගුණාකාර වූ තියුණු බුද්ධි ඇති වරඥාණමුනි නම් අනු
141 තෙරුන් ද යන දෙදෙනා දෙදෙනා ප්‍රධාන කොට ඇති දශ වර්ගාතිරෙක
සුපේසල සඞ්ඝයා ඒ අයොද්ධ්‍ය පුරයෙන් සූකර සංවත්සරයෙහි ලක්
142 සසුන් වැඩුම් පිණිස නැවත ලක්දිවට එවූයේ ය. ඒ සඞ්ඝයා මෙහි
143 පැමිණි කල මහා යසස් ඇති ලක්රජ තෙමේ පෙර සෙයින් මහත්
ගෞරවයෙන් නුවරට වඩා ගෙණවුත් මල්වතු වෙහෙර වස්වා සාදරයෙන්
ම දවස්පතා නිති බත් ආදී සියල්ල පෙර යම් සේ නම් පසුත් එසේ ම
දුන්නේ ය.

144 ප්‍රවර ඒ උපාලි මහා ස්ථවිර තෙමේ ද තුන් අවුරුද්දෙහි ශාස්තෘ
ශාසනාභාවෘර්ධි පිණිස රෑ දෙවෙහි නොපමාවූසේක් ම කටයුතු කිස
145 කොට පින්රැස රැස්කළ කල්හි උපන් නාසිකා රෝගයක් ඇතිව එයින්
146 ම ඉතා මිරිකුණු සේක. ගිලන් බවට පැමිණි ඒ උතුම් මහතෙරුන්ට
147 සිංහලාධිශ්වර මහ යසැති රජතෙමේ මනා කොට බෙහෙත් හා උපස්ථාන
148 කරවමින් නැවත නැවත ආරාමයට ගොස් රෝගයෙන් බැගෑ මහ තෙරුන්
149 දැක කම්පිත සිත් ඇත්තේ අසාධ්‍ය යයි දැන පූජා වස්තුවෙන් නොයෙක්
150 පරිද්දෙන් බුද පුද පවත්වා ප්‍රාප්ති දානය ද දෙවි. පසුව කලුරිය කළා වූ
තෙරුන් වහන්සේගේ ශරීරයත් මහඟු පිළිගෙයක තබා සකස්කොට
මහ පෙළහරින් වඩා ගෙණවුත් නොයෙක් පූජා විධානයන් පවත්වමින්
ජන ශ්‍රේෂ්ඨ තෙමේ ආදාහන කෘත්‍යය කරවා පින් රැස් කෙළේ ය.

"ලක්දිව බුද්ධ ශාසනයාගේ වෘර්ධි පිණිස දෙවරක් භික්ෂු සඞ්ඝයා
151 එවීමෙන් හා මුළු ලක්දිව් එක් භික්ෂූ කෙනෙකුත් නැතිකල නොයෙක්
152 සියගණන් භික්ෂූන් පහළ කිරීමෙන් ද, මෙහි නොයෙක් පොත් එවීමෙන්
ද, ස්‍යාමදෙශ නායක ධාර්මික නම් නරශ්‍රෙෂ්ඨ තෙමේ මුනි සසුන්
153 වැඩුම්හි උපකාරකය" යි දැන බොහෝ උපකාර කළ එබන්දහට මම ද
154 කටයුතු සඞ්ග්‍රහ මොනවට කරන්නෙමැ'ය" යි සිතා බුද්ධ දාඨා ධාතු
155

Non-Commercial Distribution

යෙහි සටහනක් ද මහඟු මිණිරුවනකින් නෙළුබුදු පිළි රුවක් ද දකුණට
156 කරකැවුණා වූ සක් ආදී නන් වැදෑරුම් බොහෝ පඬුරු ද ප්‍රවර රාජ
157 සන්දේශයක් ද දී ඇමතියන් නියම කොට සියරට වඩනා කැමැති භික්ෂු
සඞ්ඝයාත් ඔවුන් සමග සියරට යැවූයේ ය.

158 මහත් ගෞරවයෙන් ඒ සියල්ලනුදු ගෙණ ඒ ඇමතියෝ ගොස්
159 ඒ සියම් දේශයට පැමිණි කල ධාර්මික රජ තෙමේ ඉතා තුටු සිත්
160 ඇත්තේ බුදු දළදා ලකුණු ආදිය බලා රිසි සේ බුදු දළදාව ලද්දෙකු සේ
161 ම පහන්වූයේ දවස් පතා මහ පෙළහර කරවමින් රාජසන්දේශයෙහි
162 ප්‍රකාශ වූ සසුන් වැඩුම් ආදියෙහි පින්දීම් ආදි වූ බොහෝ වචනයන්
163 අසා දූන ලක් රජහට පැහැද ලක්දිව්හි නැති බොහෝ වචනයන් අසා
දූන ලක් රජහට පැහැද ලක්දිව්හි නැති බොහෝ පොත් ද ශ්‍රී පාද
ලාඤ්ඡනයක් ද මනොඥ බුද්ධ දංෂ්ට්‍රා ධාතුවට පූජා පිණිස රන්මය
164 කුඩද රාජ පරිභෝගයට සුදුසු නන් වැදෑරුම් දූකුම් කටයුතු මනරම්
පඬුරු ද තමන් විසින් කරවන ලද උපසම්පදාදීන් සියලු පින් කමෙහි
165 පින් ද දී දෙරජුන්ගේ මිත්‍රබන්ධනයට යුතු කාරණයන් ප්‍රකාශකොට ලියන
ලද උතුම් රාජසන්දශයක් ද යන සියල්ල දී ප්‍රවර මනා ලක්දිව් එවී.

166 මහ යසස් ඇති ලක් රජ තෙමේ ඒ සියල්ල ගෙණ සදහම් පොත්
167 හා මුනි පා සලකුණු ආදිය දූක සතුටුව මහා පූජා ද මහ පෙළහර ද
168 කරවා සියල්ලන්ට දූක්වී. සන්දේශය බලාත් එහි ප්‍රකාශ වූ ප්‍රාප්ති දානාදි
169 මිත්‍රබන්ධන ප්‍රකාශ වූ බොහෝ වචනයන් ද මනාකොට දූන පින්
අනුමෝදනාවෙන් හා අති සොම්නසින් යුත් සිංහලාධිශ්වර තෙමේ "
170 සසුන් වැඩුම් ආදී වූ පින්කමින් උපන් ඵල සාන්දෘෂ්ටික වශයෙන් ම
171 දශීනය කෙළෙමැය" යි ද "ආයතිභවයෙහි මනාකොට වින්දයුතු ඵලයෙහි
172 කථාව කිමැ" යිද සිතා මෙසේ තුනුරුවන් විෂයෙහි යෙහෙන් පහන් ඒ
173 මිහිපල් තෙමේ ආරාමයට වැද දෙවෙනිවර වැඩියාවූ මහතෙරුන්
කෙරෙන් සදහම් උපසපන් භික්ෂූන් විශුද්ධාචාර්‍ය්‍යාද භික්ෂුසංඝයා කෙරෙහි
174 හික්මෙන්ට නියෝග කොට අනාවූත් බොහෝ කුලපුතුන් ඒ තෙරුන්
කෙරෙහි යෙහෙන් උපසම්පදා කරවි.

175 ඒ ලක්වැසි භික්ෂූන් අතුරෙන් ගුණයෙන් හෙබි කිසිවෙක් මහා
176 විශුද්ධාචාර්‍ය්‍ය නම් තෙරුන් වෙත නිවන් මං වූ ඒ විවසුන් උගත්හු.
සමහරු වරඤාණමුනි නම් අනුතෙරුන් වෙත සදහම් විනය අරුත් හා
177 සදතර ද උගත්හ. මෙසේ ලකිසුරු රජ දහම්හි ද පිළිවෙත් හි ද, ලඞ්කා
178 භික්ෂූන් නියෝග කොට බුදුසස්න රැක්කේයි. ඒ ලක්දිව් වැසි භික්ෂූහු ද
179 පමා නොව නුවණැති ව ශීලාචාර ධූත අල්පේච්ඡ ආර්‍ය්‍යවංශයන්හි

Non-Commercial Distribution

179 යෙදුනාහු මැලි නොව අලස නොව බුදුසසුන්හි පිළිපදනෝ ඒ දෙවෙහි
180 නොපමාව ග්‍රන්ථධූර විදර්ශනාධූර ඇත්තෝ වූහු. සෙනසුන් දීම ආදියෙන්
ඒ රජ තෙමේ උන්වහන්සේලාට සඞ්ග්‍රහ කෙළේ ය.

181 සියරට වඩනා කැමැති දෙවෙනිවර සියම් දේශයෙන් මෙහි වැඩි
182 භික්ෂුසඞ්ඝයාත් ඒ රජ තෙමේ ඕලන්ද වෙළඳුන්ගේ උපකාරයෙන් වැඩමවී.
183 ශ්‍රී වර්ධනපුරයෙන් නැගෙනහිරි දිග ඉතා දුරු නොවූ හොබනා තැන
184 සුපිහිටි ගලෙක ගල්වඩුවන් ආදී දක්ෂ වූ කම්කරුවන් ලවා (වඩු) නවරියන්
185 පමණ උස් උතුම් සිරියෙල් බුදුපිළිරුවක් මනාකොට කරවා ඒ පිළිරුව
186 රන්පටින් වස්වා දිවමන් බුදුන් බඳු ඒ බුදුරුව ඇතුල්කොට උස් ගන
187 මනා ගල්බිත් කරවා මනහර ගල්ටැම් හිඳුවා යා පත් දෙමහල් ගෙයක්
හා විශාල මලුවක් ද කරවා දකුම් කටයුතු මහත් මැදුරදු කරවා පව්රු
188 මඩු ආදියද මනා කොට කරවා නන් විසිතුරු වතින් වියන් තිර බැඳ ඒ
වටා තොරණු ද අතුරු නැතිකොට බඳවා නානා අලංකාරයෙන්
189 නොයෙක් පරිද්දෙන් සරසා නානා ධ්වජ පතාකාවෙන් ඒ ඒ තන්හි
190 නංවා එහි නෙත් තබන පින්කම් දවස්හි පහන් දල්වා පුන්කළස් තබ්බවා
191 මංගල සම්මත විවිධ විධානය ද එහි කටයුතු සියල්ල ද මොනවට
සදවා එහි විසිතුරු සිත්කම් කළවුන්ට රිසිසේත් වස්ත්‍රාභරණාදි බොහෝ
192 දෑ දී නොයෙක් පරිද්දෙන් උන් සතුටු කරවා, සක් කස්තල ආදී
193 තුර්‍යයන්ගේ මහහඬ මහසයුරු ගොස සෙයින් මනහරකොට පවත්වා
194 මංගලසම්මත නැකැත් මොහොත් ඇති මනායයි සිතෙන යහපත් දිනෙක
නෙත් තබ්බවා මහපෙළහර කෙරෙමින් නොයෙක් රිදී පාත්‍රා ද බොහෝ
195 රිදී භාජන ද මහඟු පිරිකර ද මාහැඟි තුන්සිව්රුද පතාකා හා ධවලච්ඡත්‍රද
වල්විදූ නා ද මේ මෙනෙහි කෙරෙමින් ජීවමාන බුදුන් හමුයෙහි සෙයින්
196 විශේෂයෙන් පහන් රජතෙමේ සිතා පින්කැමැත්තේ පිදූයේ ය. බොහෝ
196 වූ මිහිරි ආහාර කැඳ අවුලු ආදී නානා ආහාර ද, සකුරු මී බුලත් සුණු
198 කපුරු ආදිය ද, බෙහෙත් සඳුන් ආදී නොයෙක් සුගන්ධයෙන් ද දෑසමන්
199 සපුමල් ආදී යහපත් මනරම් පුෂ්පයන් ද මේ ආදී සියලු පූජාවස්තූන්
200 පුදා බුදුපිළිරූකරු ආදීන්ට ඇතුන් ගෙරින් ආදී වූ සවිඤ්ඤාණක
201 අවිඤ්ඤාණක නානා වස්තූන් ප්‍රදානයෙන් ඔවුන් සතුටු කෙළේ ය.

202 ධනයාගේ අසාරය දැන එකල ඒ රජහු ඒ විහාර පූජාහි පරිත්‍යාග
203 කළ ධනය එකසිය පණසක් අධික වූ සොළොස් දහසක් වූහ. ඒ
විහාරය මහත් වූ දකුම් කටයුතුවූ ද හොබනා වූ ද මහවැලි ගඟ ඉවුරෙහි
204 මනරම් භූමිභාගයෙහි කළ හෙයින් ම ගංගාරාමයයි ප්‍රසිද්ධ විය. රජහු
205 විසින් කරවන ලද හෙයින් රජ මහවිහාර නම් විය. මෙසේ මනා කොට
206 කරන ලද සෞභාග්‍යශ්‍රීන් සංයුක්ත ඒ විහාරයත් නුවරට පැමිණි සතුරෝ

Non-Commercial Distribution

නැසූහ. රජ තෙමේ ඒ විහාරය මොනවට පිරියම් කරවා පූර්ව නේත්‍ර
207 පින්කම්හි සෙයින් ම මහපෙළහර කරවා නේත්‍ර පින්කම් ද කරවා සිත්තර
ආදීන්ට වස්ත්‍රාභරණාදි වස්තූන් අනල්පකොට දීමෙන් ද
208 ජනශ්‍රෙෂ්ඨතෙමේ නොයෙක් පූජාවස්තුවෙන් පුදා ඒ වෙහෙර වෙත
209 මනරම් සඟරමකුත් කරවා දහම්හි පිළිවෙත්හි යෙදුනු නීති ආදර ඇති
210 බික්සඟනු වස්වා නොයෙක් පසයෙන් රත්නත්‍රයෙහි ආදර සහිත ඒ
211 තෙමේ උපකාර කෙරෙමින් පෙර කී ක්‍රමයෙන් ම බුදු පුද පවත්වා දහම්
හා සඞ්ඝයාත් එකවිට ම පුදා තමන්ටත් ලොවටත් පින්රැස වැඩී.

212 කරවන ලද මනා දැකුම් ඇති සිත්කළු විහාරය (නිමවා) එහි ම
213 පවත්වන ලද අනල්ප වූ සියලු පූජාවිධි ද සඞ්ඝදානාදි වූ බොහෝ
214 පින්කම් කලක් පවත්වන්ට මිහිපල් තෙමේ වෙහෙර සමීපයෙහි
අරුප්පලයි නම් වූ එක් ගමෙක් ද අන්‍යවූත් බොහෝ ග්‍රාමක්ෂේත්‍රයන් ද
215 යන මෙය හා උයනු ද නියම කොට මායාදුනු නම් රට "මිනිසුන් සහිත
216 දියගමය" යි නම් මහ ගමක් ද දී එහි ම සිත්කළු පව්වෙක අකුරු වූ
217 කොටා ස්ථිර කොට පැවැත්වී. මෙසේ ශ්‍රී ධර වූ ගුණවත් වූ රාජාධිරාජ
තෙමේ ලද සම්පත්ති සාරය දන්නේ බුද්ධ පූජා ද ප්‍රවර සඞ්ඝ පූජා ද
මොනවට කරවා සැදැහැත්තේ නිරන්තරයෙන් සියලු පින්සාරය කෙළේ
යි. එහෙයින් තෙපි සියල්ලෝ ද නිරන්තරයෙන් අනලස්වූවෝ පින්කම්
කරව්.

කුණ්ඩසාල නම් වූ යහපත් ශාඛා නගර වරයෙහි සිත්කළු වූ
218 උයන්හි ප්‍රකාර මණ්ඩපයෙන් යුක්ත වූ යහපත් දැකුම් ඇති විහාරයක්
219 මොනවට සර්වඥධාතු (පිහිටුවන ලද) පිළිමද කරවා එහිම කොස් අඹ
220 පොල් ආදී පලතුරින් හෙබියා වූ අළුත් උයන් හා බොහෝ ගම් කෙත්
221 හා ආරාමකයන් පුදා ආහාර පූජාදි සියලු පූජාවිධිය ද පින් කැමති රජ
තෙමේ දවස පතා පැවැත්වී.

222 සීතාවක නුවර රාජසිංහ ය යි ප්‍රසිද්ධ වූ යම් පව්ටු රජෙක් තෙම
පිතෘඝාතන කර්මය හා බුද්ධශාසන හානියක් කටයුතු නොදන කෙරේ ද
223 මිථ්‍යාදෘෂ්ටි ගෙණ (එම) මිථ්‍යාදෘෂ්ටින් කෙරෙහි භක්ති ඇත්තේ සුමන
224 කූටයෙහි සම්බුදුන් උතුම් පාදසටහන්හි උපදනා ලාභය ගන්ට ඒ
225 (මිසදිටුවන්) යෙදී, එතැන් පටන් ඒ සියල්ල මිථ්‍යාදෘෂ්ටීහු විනාශ කළෝ
ය. මහ යසස් ඇති මහරජ තෙමේ එ පවත් අසා ඒ අයුක්තියයි සිතන්නේ
226 බුදුන් කෙරෙහි ගෞරව ඇති ඒ තෙමේ "මෙතැන් පටන් නහමක් එසේ
227 කෙරෙත්ව" යි මිත්‍යාදෘෂ්ටීන්ට ආඥා කොට සකසා එහි කටයුතු වූ
බොහෝ වූ පූජාවිධිය පවත්වන්ට බුද්ධ පුත්‍රයන් මෙහෙයා මිනිසුන්
228 සහිතවූ ඉතා සමෘර්ධ වූ කුට්ටාපිටි නම් මහගමද පුදවා පා සලකුණෙහි

Non-Commercial Distribution

230 වැසි අව් වළකන්ටත් මස්තකච්ඡත්‍රයෙන් හෙබියා වූ වියන් සහිත මඩුව
කරවා යදමින් බැඳ පූජාවිධිය පවත්වා බොහෝ කුසල් රැස් කෙරෙමින්
231 එහි උපදනා ලාභයත් සස්නෙහි ම යෙදී ය. මෙසේ අඥාන රජහු
විසින් උතුම් බුදුන් ගුණ නො දන යමක් කරණ ලද නම් අපගේ
සිංහලේන්ද්‍ර බුදුන් පිත් නිමල් බික්සඟහු යොදා ප්‍රවරාමඃත දායක වූ
බුද්ධපූජාව ඒ නරේන්ද්‍ර තෙම පැවැත්වී.

232 තවද වළගම්බා මහීනායක රජු විසින් කරවන ලද විනාශ බවට
ගිය ප්‍රසිද්ධ මැදවෙල විහාරය හා එම විහාරය පිළිබඳ සෑය ද මොනවට
233 කරවා ශෘඞ්ගස්තල ගම ද පුදා දවස් පතා එහි මොනවට පූජා ද පවත්වා
234 ආයතිගමනිය වූ ඒ ස්වර්ග මාර්ගය ද හෙළිකෙළේ යි. දෙවනගල විහාරය
235 සතු රන්දෙණි නම් වූ පූර්වයෙහිම වෙන්ව ආවාවූ ගම පින් කැමැති මහ
236 යසස් ඇති නරශ්‍රෙෂ්ඨ තෙමේ ගල් අකුරු සටහනින් දන පුදා පූජා
237 පැවැත් විය. නරශ්‍රේෂ්ඨ තෙමේ මැද්දේපල විහාරය කරවන්ට
238 සඞ්ඝරක්ෂිත වහන්සේට මොනවට සඞ්ග්‍රහ කොට සැතපෙන මහ පිළිම
ආදිය කරවා නිමිකල මහ පෙළහර පවත්වා එහි නේත්‍ර පින්කම් ද
239 කරවා පූජා විධානය පවත්වන්ටත් මල්ගමු නම් ගම පුදවා දවස් පතා
240 මොනවට පූජා පැවැත් වී ය.

241 මෛත්‍රය මුනින්ද්‍රයන්ගේ අග්‍ර ශ්‍රාවක වරය පතා ආ දුටු ගැමුණු
242 රජු විසින් කරවන ලද මහත් වූ ඒ රිදී විහාරය රජ තෙමේ සිඞ්ඝඨ නම්
243 හෙරණුන් දෑ උපසම්පදා කරවා ලඞ්කේන්ද්‍ර තෙමේ ඒ වහන්සේට හා
උපොසථාරාම වාසී සියලු බුද්ධ පුත්‍රයන්ටත් තනතුරු දී නොයෙක්
244 පරිද්දෙන් සංග්‍රහ කෙළේ ය. කලක් ජරාවාස වූ එ වෙහෙර කරවන්ටත්
නොයෙක් කම් කරුවන් ද බොහෝ සිත්තර ආදීන් ද බුදු රුවෙහි
245 ගානට යහපත් වර්ණ ඇති බොහෝ රන් හස්ත කර්මාදි සියල්ල ද ලක්දිව්
246 නරනා තෙමේ දනී. ඒ සියල්ල ලැබුවා වූ ඒ සිද්ධාන්ත නම් යතිනා
තෙමේ ද ජරා ජීර්ණාදි සියල්ල සක සේ බැහැර කොට සෙල්මුවා ගන
තුඟු බිතු හා ගෙ බිමින් බැහැර මඩුවත් හොබනා කොට කරවා උඩ
247 ගලෙහිත් මාර යුද්ධ සහිත වූ බුදු පිළි රූ හා නොයෙක් මල් වැල් ආදිය
ද මොනවට (සිත්කම්) කරවා යහපත් වූ උළින් සුණින් මැටියෙන්
248 සැතපෙන මහ පිළිරුවක් හා එසේ ම උන් සිටි බොහෝ මුහුනීමුනී ආදී
249 පිළි රූත් කරවා ඇතුල් බිතු හොබනා, දහසක් පමණ බුදු පිළි රූ
250 විසිතුරු සිත්තමින් මනා කොට කරවා සැතපෙන මහ පිළිමයෙහි පා
251 මුල යථා ක්‍රමයෙන් බුද්ධොපස්ථාන ධර්ම භාණ්ඩාගාරික අනඳ තෙරුන්ගේ
252 ද, මෙතේ බෝසතුන්ගේ ද නාථදේව වරයාගේ ගැමුණු රජුගේ ද හොබනා
253 රූ කරවා පස් මහ බුදුරූ රතින් ආලේපද කොට නොයෙක් පරිද්දෙන්

Non-Commercial Distribution

254 ඇතුළ කටයුතු කම් කරවා බැහැර බිත ද පූජා පිණිස ආවුන් වැනි මල්
ගත් අත් ඇති හාසවර වූ දෙව් බඹ රූ පෙළ ද දැකුම් කටයුතු සිත් කළ
255 මහත් තොරණින් ද දොර දෙපස සිංහ රූ දෙකක් ද සෙසු බිත් ඇතුළත්
256 අමනුෂ්‍ය රූපයෙන් ද කරවා මියුගුණු සෑ ආදී උථුම් සොළොස් තැන ද
257 සච්චබද්ධ පර්වතයෙහි විසිතුරු පද සලකුණ දශ ප්‍රකාර පාරමී හා ත්‍රිවිධ
258 චරියා පංච මහ පරිත්‍යාගාදී ධර්ම ප්‍රකාශිත බොහෝ ජාතකයන්ද, විසිතුරු
259 සිත්තමින් කරවි. සිංහ පෙළ ය, ඇත් පෙළය, හංස පෙළ ය, මණ්ඩප
260 ය, එසේ ම නොයෙක් ආකාර ඇති මල් වැල් ය, යන කරවා පසුව එම
261 ගල උඩ සිත්කළු ලෙන්හි දැකුම් කටයුතු යහපත් ප්‍රවර මහ පිළිම ගෙයක්
262 ද කරවා සකස් කොට බොහෝ සිත්තම් ආදිය (කරවා) එහි වැඩ හුන්
263 හොබනා දිව මනු බුදුන් වැනි මහත් වූ දර්ශනීය වූ එම පිළිරුව හා
දූලයෙහි මනා දැකුම් ඇති උස් සිටි පිළිම දෙකක් ද මෙතේ බෝසතුන්ගේත්
264 උපුල්වන් දෙව් රජුගේත් පිළිරූ ද එහි කරවා අන්‍ය වූ බොහෝ වූත් බුදු
265 පිළිරූ හා නොයෙක් සිය ගණන් රහත් රූ ද, එසේ ම සූවිසි බුදුන් ද,
266 එතෙක් බෝධියද්‍ද, සියලු සූවිසිවිවරණයද, සොළොස් මහ තැන් ද, භූත
රූපාදීන් ද, යහපත් වූ පංච ප්‍රකාර සංගීත ද, දැකුම් කටයුතු අන්‍ය වූ ත්
267 විසිතුරු සිත්තම් නොයෙක් පරිද්දෙන් කරවා එහි ම බුද්ධ ධාතූන් වඩා
සෑයකුදු කරවා රන් කොතින් අලංකාර කෙළේ ය.

268 ඒ උතුම් මතුලෙනෙහි පිළිම ගෙයක්ද, සැරියුත් මහ තෙරහු වන්
ආදි පන් සියයක් පිරිවර සහිත වැඩ උන් පිළිමයක් ද, දැකුම් කටයුතු
269 කරවා ඒ ඒ මිදුල්හි පවුරු හා මඩු ද එසේ ම නොයෙක් කොටු ද, හිණි
පෙති ද, ඒ ඒ තන්හි අනිකු දූ යහපත් කර්මාන්ත ද, බොහෝ වූ ජරාවාසයට
270 ගිය දූ පිළියම් කිරීම් හා අලුත් බොහෝ දෑ ද මනොහර සියලු කර්මාන්තයන්
271 ද කරවා එහි නේත්‍ර තබන පෙළහරෙහි රජහු වස්ත්‍රාභරණාදි වූ බොහෝ
දෑ ද දී ඇමැත්තන් එවූ කල නන් තොරණ පෙත් අතුරු නැතිකොට
272 සරසවා එහි කටයුතු බොහෝ වූ අලංකාරද කරවා උතුම් මංගල විධිය
273 ද කරවා සකස් කොට මහ පෙළ හර ද පවත්වා යහපත් නකත් මුහුර්තයෙහි
274 එහි නේත්‍ර පින්කම් කොට එ තැන් පටන් මුළු රට වැසි බොහෝ
275 ජනයෝ ගොඩ ගමන් ගත් සමුදුර සේ ඒ ඒ දිගින් අවුදින් රැස් වූහ.
276 සියලු ජනයෝ එහි-කරණ ලද්දා වූ බොහෝ වූ රන් කම් ආදි නොයෙක්
දෑ දැක ඉතා පහන් සිත් ඇත්තාහු යමක ප්‍රාතිහාර්යයෙහි බුදුන් දුටුවා
277 සේ පහන් ඔද වැඩි සිත ඇත්තෝ ම සාධු නාද පෙරදැරි කොට මහ පුද
පවත්වමින් ස්වර්ග මාර්ගය පිරිසිදු කළෝ.

278
ඒ වෙහෙර පෙළහරෙහි භික්ෂු සඞ්ඝයා නිමන්ත්‍රණය කොට ඇතුලු
279 විහාර ගෙයි අසුන් පණවා සද්ධර්ම කථික භික්ෂූන් වඩා හිඳුවා

Non-Commercial Distribution

උන්වහන්සේලා ලවා මඞ්ගල සූත්‍රාදී ශ්‍රවණීය උතුම් දහම් දෙස්වා සකසා දහම් පුද පැවැත්වී ය. දුටු ඇසූ සියලු ජනයෝ බුදුන් දැක්ම ද ධර්ම ශ්‍රවණයද එක ප්‍රහාරයෙන් ලැබ එ කල්හි ජීවමාන බුදුන්ගේ දහම් දෙසුමෙහි සෙයින් නොයෙක් පරිද්දෙන් මහත් ප්‍රීති ප්‍රමොද්‍ය ඇත්තෝ වූහ. දවස්පතා මෙබඳු විලාස ද දේශනා ලීලාව ද දැක්වී. බැහැර මළුවෙහිත් මනහර ගල්ටැම් හිඳුවා මඩුවක් තනවා අසුන් පණවා මඩුව හාත්පස මහ ජනයා රැස් වූ කල පන්සිල් ආදි සිල්හි ඒ සියල්ලන් පිහිටුවා දවස්පතා බොහෝ වූ දහම් අස්වා ධර්ම කථිකයන් නිමන්ත්‍රණය කොට නොයෙක්වර තුන්යම් රෑ දහම් ද සාදරයෙන් කියවී. බුදුන් පිරිනිවී තැන් පටන් දෙ දහස් තුන් සිය එක්වන හවුරුදුයෙහි රිදී විහාරය කරවා මහ පෙළහර කෙළේ යි.

ඒ වෙහෙරින් දකුණු දිග හොබනා සිත් කළු විසල් වූ ගල තල මතුයෙහි කරන ලද ඒ උතුම් සෑයක් නටුයේ පස් ගොඩක් සෙයින් (තුබූයේ) ප්‍රකාශයට ආයේය (එය) කරවන්ට සාත සුණු ගඩොල් ගල් ආදිය ඒ ඒ අතින් රැස් කොට සිත්කළු සතරැස් අස්න මනාකොට බඳවා එහි ශ්‍රීමත් සම්බුදුන්ගේ ධාතු තබා දාගැබක් කරවමින් ඒ වෙත ඉතා හොබනා භූමි භාගයෙක්හි සඞ්ඝයා පවරා යහපත් කොට බඩසීමාවකු දූ කරවා පොහෝ ගෙවල් ආදිය ද උළු සෙවෙනි ආදිය ඇති සඞ්ඝා වාසයක් දූ කරවමින් හාත්පස භූමි භාගයෙහිත් නන් මල් තුරින් හා නොයෙක් මල් වැලින් ද, අනෙකඵල වෘක්‍ෂාදියෙන්ද, සමලඞ්කෘත වූ බොහෝ පොකුණින් යුත් මහ උයනකු දූ කර වමින් එහි සුපේසල බුද්ධ පුත්‍රයන් වස්වා උන් වහන්සේලා දහම්හි ද පිළිවෙත්හි ද මහත් ආදරයෙන් යෙදූයේ යි. මෙ සේ රාජබලයෙන් ම කරවන ලද මහරහතුන් විසින් සෙවිනා ලද ඒ ස්ථානය පූර්ව ලඞ්කාධිපතියන් විසින් පිදූ පවත් අසා මහා යසස් ඇති රජ තෙමේ එසේම විහාර සීමාව ද නියම කොට පුදා එහි සියලු පූජා විධිය ද බොහෝ වූ සඞ්ඝ දානාදිය ද වැඩි කොට පවත් වමින් පින් රැස් කෙළේ යි.

පුවක් දොඹ නා ආදි තුරු පෙළින් හෙබියා වූ කෙළවරක් නැති සියලු ලිහිණියන් විසින් රැව් පිළිරැව් හඬන ලද සිහිල් නිමල් සුදු අතළ ගලින් යුක්ත වූ නොයෙක් මුවගණා විසින් ගහණ වූ දොළුගල්පව් වෙත වරාවළ නම් වූ ඉතා සිත්කළු අරම්හි රජු අනුදන්නා ලද ඇමතියෙකුදූ විසින් බුදු පිළිම ගෙයක් කරණ ලද්දේ ය. ස්වර්ණග්‍රාම මන්ත්‍රීන් විසින් ගල්ටැඹ හිඳුවා පොහෝ ගෙයක් කොට සඞ්ඝයා විෂයෙහි පුදන ලදී. ඒ තෙමේ ම ටැම් ආදි දාරුසම්භාර එක් කොට එ කල්හි ම ඒ වෙහෙර බොහෝ ගෙවළු දූ කරවී. රජ තෙමේ එහි විසූ භික්‍ෂූන්ගේසැම දා පසග

Non-Commercial Distribution

පිණිස නොයෙක්ගම් කෙත් ආදිය පිදි ය. එ කල්හි නරශ්‍රේෂ්ඨ තෙමේ මේ සියල්ල කරවා පහන් සිත් ඇත්තේ ධම්‍ම රක්ෂිත මහ තෙරුන්ට පැමිණ වී. මෙ සේ රජ තෙමේ නන් වැදෑරුම් පින් රැස් කොට පන්තිස් වැනි අවුරුදුයෙහි මෙලොවින් කම් වූ පරිද්දෙන් ගියේ ය.

භෝගයෙහි ද දේහයෙහි ද අසාර බැව් සලකා නුවණැත්තෝ ආසාව ඉතා දුරුකොට හරිති. තෙපි ද්‍ද තුණුරුවන් ම සේවා කොට ලොකොත්තරාදි (සැප දෙන) කුසල ම භජනය කරව්.

මෙතෙකින් හුදී ජනයා ප්‍රසාද සංවෙග පිණිස කළ මහවස කිත්තිසිරි රාජසීහ දීපන නම් වූ සියවෙනි අදියර නිමි.

Non-Commercial Distribution

# එකසිය එක් වෙනි පරිච්ඡේදය

ඒ රජු ඇවෑමෙන් උහු බාල සහෝදර වූ ශ්‍රී රාජධිරාජසිංහ තෙමේ ලක්දිව රාජාභිෂේකයට පැමිණියේ ය. තුනුරුවන්හි පහන් වූයේ අප්‍රමාද වූ විචක්‍ෂණ වූ, සද්ධර්ම ශ්‍රවණයෙහි යුක්ත වූ පැමිණි රාජාභිෂේක ඇත්තේ ම නරශ්‍රෙෂ්ඨ තෙමේ බෑයා විසින් කරවන ලද ඝර්ම ලෙව් සසුන් ආරක්‍ෂාවෙක් වී නම් ඒ සියල්ල නො නසා පෙර සේ ම කරවී. මහා යසස් ඇත්තේ දළදා වරයටත් පුදන්නා වූ ආහාර පානාදිය නො පිරිහෙළා පෙරසේ ම පිදී ය. පූර්වයෙහි බුද්ධ පුත්‍රයන්ට තැබූ දන් වැට (පෙර) රජු විසින් දුන් ක්‍රමයෙහි එසේ ම දෙන්ට නියෝග කෙළේ ය. දෙවු බෑ රජු දවස සියම් රටින් වැඩි උපාලි තෙරුන් ප්‍රධාන කොට ඇති භික්‍ෂූහු ශ්‍රී වර්ධන පුරයට පැමිණියාහු ය. පසුව උපාලි ස්ථවිරාදී ඒ භික්‍ෂූහු නුවරින් දකුණු දිග පුෂ්පාරාම නම් වූ ඒ විහාරයෙහි ඤත්තිදුතිය කර්මයෙන් සීමා බැන්දාහ. එ කල්හි කීර්තිශ්‍රී නම් රජහු විසින් කරවන ලද දිරාගිය ඒ පොහෝ ගෙය ඒ තෙමේ බලා සීමාන්තයෙහි පටන් හාත්පසින් උස් කොට බොහෝ කල් යෙදීමෙන් ඇතුළු සීමායෙහි බිතු ඔසවා ඉදි කොට පින් කැමති නරපල් තෙමේ කරවී. ඒ රජ තෙමේ ගල්ටැම් හිඳුවා පොහෝ ගෙය කොට චාතුද්දිසික භික්‍ෂු සඞ්ඝයාට පිළිගැන්වී. මාගධී සංස්කෘත ආදි නොයෙක් ශාස්ත්‍රයන්හි දක්‍ෂ වූයේ නිත්‍ය දානයෙහි ඇලුනේ රුවින් මලවියා බඳු වූ ඒ තෙමේ ම ශබ්ද ශාස්ත්‍රයෙහි විසාරද වූයේ අසදෘශ ජාතකය සිංහල නිරුක්තියෙන් කවිකොට ලියවී පිරිසිදු සිත් ඇත්තේ එක රැයක පහන් ලක්‍ෂයකින් එළිය කොට ලා ශ්‍රද්ධාවෙන් දළදාව වැඳුයේ ය. සියලු දන් අතුරෙන් කඨින දානයෙන් මහා අනුසස් අසා ඒ තෙමේ අවුරුදු පතා සඞ්ඝයා විෂයෙහි කඨිනයන් දන් දුන්නේ යි. ඒ රජහුගේ දේහ ප්‍රමාණ කොට බුදු පිළිරුවක් බුදු බව පතන්නේ ලොහොයෙන් කරවී ය. මැනවැයි සම්මත වූ ගංගාරාම විහාරයෙහි මනහර දැකුම් කටයුතු වූ දාගැබක් කරවී. ඒ මිහිපල් තෙමේ අටළොස් වර්ෂයෙක්හි මේ ආදී පින් රැස්කොට කම් වූ පරිද්දෙන් මෙලොවින් ගියේ ය.

(අනන්තරව) රාජාධි රාජසිංහ රජහුගේ බෑනා වූ ජන නායක තෙමේ ශ්‍රී වික්‍රමරාජසිංහ යන නමින් ධෛර්‍ය ඇතිව රජවූයේ බුදුන් විසින් වදාළ ධර්මය අසා සතුටු විය. මිහිපල් තෙමේ දළදා වහන්සේට මිණිමුතු ආදිය ද එසේ ම නොයෙක් ගම් කෙත් ද පිදුයේ ය. බුදුන් ප්‍රධාන සඞ්ඝයාට ප්‍රණීත ආහාර ද බොහෝ වර දන් දී අනන්ත සම්පත් පැතුයේ ය. ඒ මිහිපල් තෙමේ මේ ආදි වූ බොහෝ කුසල් රැස් කෙළේ

Non-Commercial Distribution

ය. පසුව අසත්පුරුෂ සමාගමයට පැමිණ විපර්‍යාසයට පැමිණි යේ ය. මන්ත්‍රිශ්වර මහාමාත්‍යයන් ද එයින් අනික් බොහෝ ඇමතියන් ද හේ තෙමේ ගෙන්වා ගෙණ රකුසකු සේ කරුණා රහිත වූයේ ඒ ජනයන් නැසූයේ යි. එකල්හි නොයෙක් සිය ගණන් මිනිසුන් ගෙන්වා මරහු සේ දයා නැත්තේ ඒ ඒ තැන උල හිඳ වී. ඒ මිනිසුන්ගේ පරම්පරාගත බොහෝ සම්පත් ද ඒ රජ තෙමේ ගම් පහරණ සොරෙකු සෙයින් කොල්ල කැවී. මිහිපල්හු මෙ සේ නොයෙක් අදහම්හි හැසිරිණු කල දූඩිසේ කිපියා වූ උඩරට වැස්සෝ ද, කොළොම්පුර වැස්සෝ ද ඒ සියල්ලෝ මෙහි අවුත් දුෂ්ට ස්වභාව ඇති ඒ රජහු උහුගේ අභිෂේකයෙන් අටළොස්වන පැමිණි කල්හි ජීවග්‍රාහයෙන් ගෙණ මුහුදින් එතර ලූහ. ලොව පෙළූ රජහු පරතෙර යවා ඉංග්‍රීසි නම් ඇත්තෝ සියලු රාජ්‍යය හස්ත ගත කළෝ ය.

**සිඬිරස්තු**

Non-Commercial Distribution

# ලක් දිවයිනට ප්‍රතිකාලුන්ගේ සම්ප්‍රාප්තිය.

ශ්‍රී බුද්ධ වර්ෂ 2048 දී හෙවත් ක්‍රිස්තු වර්ෂ 1505 දී නව වෙනි ධර්ම පරාක්‍රමබාහු මහරාජාණන් ජයවර්ධන පුරවරයෙහි හෙවත් කෝට්ටේ රාජ්‍යානුශාසනා කරන කලැ පෘතුග්‍රීසීන්ට හෙවත් ප්‍රතිකාලුන්ට ලංකාද්වීපය ගැන නිශ්චය වශයෙන් කරුණු දැන ගන්ට ලැබුණේ ය. මොව්හු යුරෝපයේ බටහිර දිශා භාගයේ ස්පාඤ්ඤ අර්ධද්වීපයට ඒකාබද්ධ පිහිටි පෘතිකාල නම් ප්‍රදේශයේ වැස්සෝ ය.

ප්‍රතිකාල් රාජධානිය ඇති වූ පරිදි මෙයාකාරයෙන් දක්වා ඇතඃ- යුරෝපයේ ඉතාම කුඩා රාජ්‍ය අයිතිකර ගෙන සිටියා වූ ද ස්වකීය සීමා රහිත උනන්දුභාවය හේතු කොට ගෙන සහ නිර්භීත ධෛර්ය සම්පන්න භාවය නිසාත් යුරෝපීය ආචාර ශිෂ්ටත්වය අභිවර්ධනයෙහි ප්‍රමුඛ ස්ථාන ශත වර්ෂ එකහමාරක් දැරුවා වූ ද මේ මනුෂ්‍ය වර්ගයාගේ බෝවීම පුදුමාකාර සම්මිශ්‍රත්වයකින් සිදු වී තිබේ. ඓබීරියෙන් අර්ධ ද්වීපයේ අතිශය පෞරාණික අනාර්ය පදිඤ්චිකාරයෝ යුද්ධකාමී කෙල්ට්ස් නම් මනුෂ්‍ය වර්ගයා හා මිශ්‍ර වන විට ග්‍රීක් වරු කාර් කජිනියන්සිවරු නැව්තොටවල් අසබඩ නගරවල පදිංචි වූවෝය. ක්‍රිස්තු වර්ෂය පටන් ගැනීමට පෙර පළමුවන ශත වර්ෂයේ දී රෝමවරු විසින් රාජ්‍යය අත්පත් කර ගත් විට කෙල්ටික් භාෂාව සහ ප්‍රඥාප්ති ද ඔවුන්ගේ භාෂාව හා විධි විධානද පාප්තුමාගේ රූ සටහන ද පමණකුදු නොව නවීනව පරිචය කරන ලද කිතු සමය ද රටවාසීන් විසින් අව්‍යාජ ප්‍රසනත්වයෙන් පිළි ගනු ලැබූහ.

ගොත්ස්වරුන්ගේ යුද්ධයට පසු විසිගොත්ස් නමැත්තවුන් විසින් ද යුද්ධයක් ආරම්භ කරන ලදී. ක්‍රිස්තු වර්ෂ 771 දී ජයග්‍රහණය කළා වූ මොහම්මත් කාරයින්ට විරුද්ධව කරන ලද යුද්ධයේ දී විසිගොත්ස්වරුන්ගේ අන්තිම රජ වූ රොඩ්රික් මරුමුවට පත් විය, ඔම්මියඩ් සුල්තන්වරුන්ගේ ඥාණවන්ත ආණ්ඩු ක්‍රම කරණ කොට ගෙන රටේ වෙළදාම සහ ඉසුරුමත් භාවයත් ක්‍රමයෙන් වර්ධනය විය. එහෙත් දහ වෙනි ශත වර්ෂයේ දීඔවුන්ගේ පරිහානිය ඇස්ටූරියාස් කඳු හෙල් වල සිට විසි ගොත්ස් රජ කුමරුන් විසින් දෙන ලද ප්‍රොත්සාහි වේගවත් පහරවල් කරණ කොට ගෙන යුහුව සිද්ධ විය. මෙයින් අනතුරුව පැමිණි ශත වර්ෂය මුලාරම්භයේ දී මධ්‍යම නගරවල් අත් පත් කර ගෙන විසුවාහු ය. මේ කාලයේ දී උතුරු ඒරෝපයේ සංග්‍රම සූරභාවයෙහි ප්‍රධාන වූ රුද්‍රිගෝ දියෙස් ද බීවියර් නැමැත්තා මූලිකයෙක් මෙන් මොහම්මදිකයන් හා මේ මුරණ්ඩු සටනට වහාම ඇතුළගත්විය ඇල්මොරවාවිදෙස් නමැති අභිනව මොහම්මත්

---

පෘතිකාලය මා ස්පාඤ්ඤය සම්බන්ධ කොට ඓබීරියන් ද්වීපය යිය ද නම් කරනු ලැබේ.

Non-Commercial Distribution

මොහෙස්සත් රජ පෙළ පතේ එකල විද්‍යමාන පැවති ශූර බුද්ධි සම්පන්න බව හේතු කොට ගෙන ක්‍රිස්තියානි රජ දරුවන් අභිභවයනය කොට මොහෙමිත් ආඥාචක්‍රය තව වරක් පිහිටුවන්ට හැකි විය. ක්‍රිස්තු වර්ෂ 1095 දී සන්ටාරීම්, බැඩජොස්, ලිස්බන් යනනගර නැවතත් මොහම්මත්කාරයින් හස්තගත විය, රෝමන්වරුන්ගේ පෝර්ටුස්කේල් යයි නම් කරනු ලැබූ ඔපොටෝ පළාත වචන මාත්‍රයෙන් පමණක් ගැලේෂියා රටේ ඔටුන්නට යටහත් යම් කිසි රාජකාරියක් සඳහා ප්‍රවේණියට භුක්ති විඳින කෝරළයක්ව පැවැත්තේ ය. එහෙත් මේ සංග්‍රාමය නිසා අර්ධ ද්වීපය කෙරෙහි ආකර්ෂණයට පත් නිර්භීත අනන්ත ක්‍රියා කරුවන් අතුරෙන් කෙනෙක් වූ හය වෙනි ඇල්පොන්සෝ රජුගේ අවජාතක දියනිය වූ ද බර්ගන්ඩීහි හැන්රි සිටුතුමා ගේ වැන්දඹු වූ ද තෙරේෂා කුමරිය විසින් ඥාණත්විත කල්පණාවෙන් යුක්තව අමුතු මනුෂ්‍ය ජාතියක් නිපැද්මෙහි බීජයාපනය කරන ලද්දීය ඇගේ පුත්‍රයා බාලවියෙහි සිටි දීර්ඝ කාලය තුළ එරටවාසීහු තමුන් ගැලේෂියන්වරුය යන්න ප්‍රතික්ෂේපකොට ඔවුන් පෘතිකාල්වරුයයි ව්‍යයහාර කිරීමට පුරුදු වූවෝ ය. මෙයාකාරයෙන් උද්දීපනය වූ ඇගේ කාලය අඳුරු බවට පැමිණීමේ ලකුණක් වශයෙන් ඕ තොමෝ ඩොම් පර්නැන් ඩෝ පේරෙස් ද ත්‍රාවා නමැති තරුණ වයසෙහි පිහිටි සෞන්දර්යය සම්පන්යෙකු කෙරෙහි කාමබන්ධනයෙන් යුක්ත විය. මේ උන්මන්තක බන්ධනය වනාහි ඇගේ අන්තිම විනාශයෙහි හේතුවක් ද වූයේ ය. අන්‍යොන්‍ය ඝාතක සංග්‍රාම වලින් යුත් මේ වික්ෂිප්ත වකවාණුවෙන් අනතුරුව වර්ෂ 1128 දී එවකට අටළොස්වයසැති ඇපොන්සෝ හැන්රිකස් නමැති ඇගේ පුත්‍රයා විසින් ඇ රටින් නෙරපා හරින ලදී. කැස්ටයිල්මි රජුට විරුද්ධව ඒ තරුණ කුමරු විසින් කරන ලද සටන් වලින් ජයග්‍රහණය ලැබූ හෙතෙමේ වර්ෂ 1140 දී ප්‍රතිකාල් රටේ රජය යන පට බැඳි නාමය පළමුවරට අත්පත් කර ගන්නා ලද්දේ ය. මේ නාමය පාප්තුමාට වර්ෂයක් පාසා රත්රන් අවුන්ස සතර බැගින් සුංගම් වශයෙන් ප්‍රදානය කොට එතුමා කෙරහි අවංක වූ සම්මානයෙන් ඔහු විසින් වැඩි දුරටත් ශක්තිමත් කර ගන්නා ලදී. වර්ෂ 1185 දී ඔහු කාල ක්‍රියා කරණ විට එවකට උහු විසින් නොකඩවා මොහම්මත්කාරයින් විරුද්ධව කර ගෙන ගිය සටන් හේතු කොට ගෙන ඔහුගේ කුඩා කෝරළය ඒකාබද්ධ කර ගෙන තිබුනි. එහෙත් අද දවසේ පෘතිකාලයයි නම් කරනු ලබන රාජධානිය මොහොම්මත්කාරියින් ගෙන් පැහැර ගැනීමට හැකි වූයේත් මුළු මහිපාලයන්ට පෘතිකාලයේ සහ ඇල්ගාර්විස් හිත් රජය යි නම් කිරීමට පොහොසත් වූයේත් ක්‍රිස්තු වර්ෂ 1263 න් පසුව ය. යනුයි.)

අති පුරාණයෙහි පටන් අරාබි වෙළඳ ජනයාගේ මාර්ගයෙන් ලක් දිවින් රතු මුහුද අසබඩ ප්‍රදේශ වලට කුරුඳු ගෙන යනු ලැබූ නමුත්, හේ කිනම් රටක හටගනු ලබන්නක් ද යන බව ප්‍රංගිකාරයෝ යයි ප්‍රකට

Non-Commercial Distribution

3

ප්‍රතිකාලූන් නොදැන සිටි බව ප්‍රත්‍යක්ෂවේ, එසේ වුවද ඉන්ද්‍රිය සාගරයෙහි පිහිටි ඇතැම් දූපත් පිළිබඳ පුරාණ ග්‍රීක්වරු තරමක් දැන සිටි බව ක්‍රිස්තු වර්ෂ 330 පමණේ දී ජීවත්ව සිටි ඔනීක්‍රිටස් නම් ග්‍රන්ථ කර්තෘගේ පොතක මේ ද්වීපය ගැන කරුණු අන්තර් ගත වීමෙන් හැඟේ, හතර වෙනි ශත වර්ෂයේ දී ස්කොලස්ටිකස් නම් අයෙක් ලංකාවට පැමිණ මලවර ප්‍රදේශරජෙකු විසින් සාවුරුද්දක් සිරභාරයේ තබනු ලැබ, ලංකාවේ මහරජාණන්ට විරුද්ධව යුද්ධාරම් භ ඇති වූ විට සිර බන්ධනයෙන් මිදී සිය රට කරා ගිය බවත් ලක්දිව සම්බන්ධව තොරතුරු ඔහු විසින් දක්වන ලද බවත් සැන්ට් අම්බ්‍රෝස් නම් ග්‍රන්ථ කතෘවරයකු විසින් ලියන ලද පොතක සඳහන් වේ. තව ද ක්‍රිස්තු වර්ෂ 1284 දී වැන්ස් රටවාසියෙක් වූ දේශාන්තරචාරී මාර්කෝපෝලෝ නමැත්තෙකු විසින් විදේශ සංචාරණයේ යන ගමන් ලද්දිවට පැමිණ තිබේ. ඔහුගේ ගමන් විස්තර අන්තර්ගත වූ ප්‍රකරණයක ලංකාව ගැන ද මෙසේ ලියා තිබේ. ලංකාද්වීප වාසීහු සාමාන්‍යයෙන් යුද්ධකාමීනු වූ මනුෂ්‍ය වර්ගයක් බවත් ස්වාර්ථාපෙක්ෂකවම හේවා කම් කරන බවත් (තල්, කිතුල්, පොල් ආදී) මල් පැණියෙන් සකසා ගනු ලබන මත්පැන් පානීය වර්ගයක් වශයෙන් ද සහල් කිරි මාංස වර්ග ප්‍රධානාහාර වශයෙන් ද ප්‍රයෝජනගනු ලබන්නෝ බවත්, මේ දිවයිනේ රතු කැට, නිල් පුෂ්පරාගාදී මැණික් වර්ග සම්භවන බවත් ගිනිසිලක් මෙන් දීප්තිමත්ව බැබළෙන බාහුප්‍රමාණ වූ නො කිලිටි අති ශෝභන රක්තමාණික්‍යයක් ලක් රජු වෙත තිබෙන බවත් යනාදියයි. මෙයින් අනතුරුව අවුරුදු පණසකට පමණ පසු සර් ජෝන් මොන්ඩිවිල්තුමා ලංකාගමනය පිළිබඳ විස්තරයක් ද දහතුන් වෙනි ශත වර්ෂයේ දී ඔඩොරිකස් නම් රෝමානු තාපසයාගේ ලක්දිව් පැමිණීම සම්බන්ධ විස්තරයක්ද ප්‍රකාශවේ. ක්‍රිස්තු වර්ෂ 1340 දී රෝම් නගරයේ පාප්තුමාගෙන් ආඥා පත්‍රයක් ලැබ වැනිස් රට වෙළඳ ජනයා මිසර දේශාධිපති සුල්තන් සමග ගිවිසීමකට බැඳී ඉතා උනන්දුව සඵල ලෙස සියවසකට වැඩි කලක් අනවරතයෙන්ම ලංකාව හා අනිකුදු නැගෙනහිර රටවල් සමග වෙළඳාම් ගනු දෙනු ආදිය කර ගෙන ආ බව පෙනේ. "වැනීෂියානෝ" නමැති රෝම රන්මිල මේ දක්වාත් ලංකාවේ දුර්ලභව විද්‍යාමානවීය ඒ පිණිස සාක්ෂියක් කැරට්ස් (මංචාඩි) 24 ක් බර වූ මේවායේ එක පැත්තක පාප්තුමාගේ රූ සටහන ද අනික් පැත්තේ දේවමාතාව මේරී කන්‍යාතුමියගේ රූප සණ්ඨානයද දක්වා තිබේ. දැනට සුපිරිසිදු රන් වලට ලංකාවාසින් විසින් කථා ව්‍යවහාරයේදී භාවිතා කරනු ලබන විලිසියානු යන වචනය ඉහත දක්වූ වැනීෂියානෝ යන්නෙන් තද්භව වුනකැයි කල්පනා කටයුත්තකි. තව ද දස සතර වන ශත වර්ෂයේදී බොලොග්නා නගර වැසියෙක් වූ ලුඩුයික් බර්තිමා නමැත්තෙක් ද මෙහි පැමිණ තිබේ. ලක්දිව්වාසීහු දකුණු ඉන්දියාවෙන් පිණිස බලාපොරොත්තු වූවා මිස මේ රටේ උපද වන සහල් ස්වදේශීන්ට පමණවත් නොපොහොනා තරම් බව කියා තිබේ. මීට පසු

Non-Commercial Distribution

මෙහි පැමිණි නිකොලෝඩ් කොන්ටි නැමති වැනීසියන්කාරයෙක් ලංකාවේ සමෘද්ධිමත් බව ද මෙහි උපදනා මුතු මැණික් ආදී අනර්ඝ වස්තූන් ද කුරුඳු වැවිල්ල සහ ඒවා පිළියෙළ කරන අන්දම ද ඇතුන් ගැන ද කරුණු විස්තර කොට තිබේ.

රෝමන්කාරයින්ට ලංකාවේ තොරතුරු දැන ගන්ට ලැබුණු ආකාරය දක්වන ප්ලීනි නැමති ඓතිහාසික ග්‍රන්ථ කර්තෘවරයා මෙසේ දක්වයි. රෝම නගරයෙන් පිටත්ව ගිය ඇනියස් පෙලෝකේනස් නමැත්තෙක් රෝම රාජධානියට අයත් රතු මුහුදේ, බදු ආදායම් රැස් කොට ගෙන සිය රටට යාත්‍රා කරන කැලැ අරාබි මුහුද වෙරළාසන්නයේ දී චණ්ඩ මාරුතයකට හසු ව නියම මාර්ගයයෙන් ඉවත්ව විරුද්ධ දිශාවකට ගසා යනු ලබන්නේ පසළොස් දිනකට පසු තප්‍රොබේන් (තම්බපණ්ණි) නම් ද්වීපයෙහි වූ කුදිරෙහි මලෙයි (අස්හෙල) නම් තොටට පැමිණයේ ය, ඒ දිවයිනේ වැස්සෝ උහුට බෙහෙවින් ආගන්තුක සත්කාර කොට රජු වෙතට ගෙන යනු ලැබ රජ තියොවින් තිසි සංග්‍රහ ලබනුයේ සමසක් එහිළවදුරු රහිතව විසීය. ඔහු කෙරෙන්රෝම රාජධානියේ බලසම්පන්නභාවය දැන ගත් එවකට ලංකාධිපතිව වැඩ විසූ චන්ද්‍රමුඛ සීව (සඳමුහුණුසිව) නම් රජ තෙමේ ක්ලෝඩියස් සීසර් නම් රෝම රජු හා මිත්‍ර සන්ථවය පිණිස කැමැතිව ලංකික තානාපතීන් සතර දෙනෙකු එහි පිටත් කර යවන ලද්දේ ය.

යුරෝපයේ සිට අප්‍රිකා මහා ද්වීපය වටේ ගොස් ඉන්දියාට ලඟා වන මාර්ගය පසළොස් වෙනි ශත වර්ෂය වන තුරු කවරෙක්වත් නොදැන සිටි නමුත්, මේ කාලය වනාහි ලක්දිවයින වෙළඳාම සම්බන්ධය ඇති ප්‍රසිද්ධියට පැමිණි අවස්ථාවක් විය, ආරාබි මරක්කළ පාර්සි යන වෙළඳ ජනයා චීන දේශයෙන් පටපිළිද, පර්සියාවෙන් අශ්වයෝ ද, ඉන්දියාවෙන් කුළු ද්‍රව්‍ය කපු පිළි සහ වෙනත් භාණ්ඩ ද මෙහි ගෙනෙනු ලැබුවාහුය. එමෙන්ම ලංකාවේ උපදනා මුතු මැණික් ඇතුන් ඇත්දත් කුරුඳු ආදිය රතු මුහුදු බඩ සල්පිල් වලට ගෙන යනු ලැබ, යුරෝපීය වෙළඳුන් විසින් යථොක්ත අවන්හලින් මිලදී ගෙන සිය දේශයන්හි විකිණීම පිණිස ගෙන යන ලද්දාහ.

මොප්ලාස් හෙවත් මුවර් නම් ජනයාගේ මුල් භූමිය වනාහි අප්‍රිකා මහද්වීපයේ වයඹ කොන පිහිටි මොරොක්කෝ නම් ප්‍රදශේය වන්නීය, සාමුද්‍ර සීමාන්තවාසී මොව්හු මුහුදු තරණයෙහි ද රටින් රට ගොස් වෙළඳාම් කිරීමෙහිදී මනා පරිචය ඇත්තෝ වූහ.

අන්‍යයන්ගේ යස ඉසුරට ඊෂ්‍යාකරන්නෝ වර්තමාන කාලයෙහි මෙන්ම පෙර කල ද බෙහෙවින් ඇති වූහ. මරක්කළයින්ගේ වෙළඳාමෙහි

Non-Commercial Distribution

ඇති වූ සූරවීරභාවය ඇසුදුටු ප්‍රතිකාල් ජනයා යථෝක්ත වෙළඳාම තමන් අතට පත් කර ගැනිමේ ලෝභය උපදවා ඔවුන් හා නිතර නිතර කළහ හට ගැනීමට හේතු වන පරිදි සාහසික ක්‍රියා කරන්නට වන්හුය. පසළොස්වෙනි ශත වර්ෂයේ දී පෘතුගාලයේ විසූ ජෝන් ද ග්‍රේට් නම් මහරජුන්ගේ පුත් හැන්රි කුමරු මහා ධෛර්ය සම්පන්න නිර්භීත නාවික ශ්‍රේෂ්ඨයෙක් වූයේය. මේ තෙම් ඉන්දියාව ආදී පෙරදිග රටවල් සොයා දැන ගැනීමෙහි බලවත් අභිලාෂයෙන් අප්‍රිකාව වටේ යාත්‍රා කරනු පිණිස කණ්ඩායම් කීපවරක්ම පිටත් කර යවන ලද නමුත් අප්‍රිකාවේ ගැම්බියාව දක්වා පමණක් සමුද්‍ර යාත්‍රමාර්ගය දැන ගත් පමණින් උහු අදහස් නොනික්මහි (ක්‍රි.ව 1460) දී ජන මාන්තරගත විය. මෙයට හවුරුදු සවිස්සකට පමණ පසු ජෝන් රජු විසින් ද අප්‍රිකා මහාද්වීපය වටේ යාත්‍රා ගමනය උදෙසා බර්තොලමියුස් දියස් නම් ප්‍රසිද්ධ නෞපතියා යොදවා හරන ලද්දේ ය, හෙතෙම් ද මාස කීපයක් සමුද්‍ර ගත කොට යාත්‍ර කරනුයේ අප්‍රිකාවේ දකුණු තුඩුව පසු කොට යද්දී හටගත් චණ්ඩමාරුතයක් නිසා භයට පැමිණි නැවියන්ගේ නොසන්සුන්කම නිසා ආපසු හැරී ගියේ ය. ඒ නැව් පති තැන විසින් යටකි තුඩුවට කුණාටු තුඩුව යයි නම් තබන ලද්දේ නුමුත්, ජෝන් රජ තෙමේ අනාගත අභිප්‍රෙතාත්ර්ථීය මෙනෙහි කොට හේ නොමැනවයි කියා ඉෂ්ටාර්ථ ශංසතුඩුව හෙවත් සුබපැත්මේ තුඩුව යන අර්ථ ඇති කේප් ඔජ්ගුඩ් හෝප් යන නාමය කරන ලදී. ඒ නාමය මේ තාක් ම ව්‍යයහාර වන්නේ ය.

මීට දසවසකට පසු එනම් ක්‍රිස්තු වර්ෂ 1497 ජුලි මාසේ දී වස්කෝද්ගාමා නම් ප්‍රතිකාල් නැව් පතිතෙම නැව් සතරක් ගෙන පෘතුකාලයේ අග නුවර වූ ලිස්බන් නගරයෙන් පිටත්ව අප්‍රිකාව හාත්පස යාත්‍රා කිරීමෙන් සුබපැත්මේ තුඩුවද පසු කොට ගොස් දස මසකට පමණ පසු එනම් ක්‍රිස්තු වර්ෂ 1498 මැයි මස 20 වෙනි දින ඉන්දියා දේශයේ මුහුදු බඩ පිහිටි කැලිකට් නම් නගරාභිමුඛයේ නැංගුරම් ලෑවේ ය, හෙතෙම මද කලකට පසු එරටින් බොහෝ අගනා ගරු භාණ්ඩ ද නැව් වල පටවා ගන කැනතෝර්හී රජුගෙන් රන් සන්නසක් ද ලබා ගෙන පෙරලා සිය දේශගතව මේ සියලු පුවත් සැලකීමෙන් යථොක්ත භාණ්ඩ ද රජුට පිළි ගැන්වීය. ඒ නගර වැස්සෝ එතුමා අතිශය ප්‍රමුඛ භාවයෙන් පිළිගනු ලැබූහ. රජ තෙමේ නැව් පතිහට ඩොම් යන ගරුනාමය ප්‍රදානය කොට කෘසඩොස් නම් පෘතිකාල් රන්මිළ 20,000 ක් ත්‍යාගි කරන ලද්දේ ය, මේ හේතු කොට ගෙන සොම්නසට පත් හවෙනි ඇලැක්ෂැන්ඩලර් පාප්තුමා විසින් ක්‍රිස්තු වර්ෂ 1502 දී පෘතිකාලයේ මනුවෙල් රජ හට :- එතියෝ පියා ඇරේ බියා පර්සියා සහ ඉන්දියා යන දේශයන් පිළිබඳ ජයග්‍රහණයහි ද නාවුක යාත්‍රඥතාවය හා වණිගගභාවයෙහි ද ස්වාමියයායි යන උත්කෘෂ්ට උපාධි ධූරය දෙවා වදාරණ ලද්දේ ය. එවක් පටන් පෘතුකාලයට අයත් නැව් ඉන්දියාවට යාම ඊම අනවරතයෙන් කෙරෙන්නට වන. මේ නිසා ඒ

Non-Commercial Distribution

කාලයේ දී පෘතුකාලය වෙළදාම ගැන අතිශය දියුණු ස්වභාවයකට පැමිණ තිබුණේ ය. මෙසේ මද කලක් ගත වීමෙන් ඉන්දියාවේ මුහුදු බඩ ප්‍රදේශකීපයක්ම හස්ත ප්‍රප්ත කොට වෙළඳ ගබඩා සහ බලකොටු ද තනා ගනු ලැබූහ, ගෝවා නම් පළාත මුල් ස්ථානයෙහි තබා වර්ණ භාණ්ඩ යුරෝපයට ගෙන යන්ට වන්හ.

ලංකාවේ පෞරාණික කීර්තිය හා ඓශ්වර්යශ්‍රීය ද ක්‍රමයෙන් මිලානභාවයට පැමිණීමේ ප්‍රාරම්භය මෙ සමයෙහි පටන් විය. මේ කාලයේදී යෝනක ජනයෝ මෙරට වෙළදාම කෙතරම් දියුණුව පැවැත්තේද යතහොත් නැව් තොටමුණාසන්න නගරයන්හි මරක්කළයෝ ස්වාධිපත්‍යය දරුවාහු ය, වර්තමාන ව්‍යවහාරයෙහි වන්නිය යයි සම්මත ප්‍රදේශය ද කොටස් කීපයකින් යුක්තවනු ලැබ වන්නියා නම් අධිපතියෙකුගේ සෛවරී බල ආණ්ඩු ක්‍රම තනි තනිව පැවැත්වූහ.[1]

ගම්පළ බදුල්ල, ආදී නගරයන්හි විසූ සුළු ප්‍රදේශාධිපතීන් අතරේ අනවරතයෙන් ඇති වූ කළහ හේතු කොට ගෙන රටේ සමෘද්ධි පිණිස කටයුතු වූ විධි විධාන අතුරුදහන් විය. යථොක්ත අරගල නිසා රට වැස්සන් අතරේ ඇතිවූ කැළඹීමේ හේතුවින් කෘෂිකර්මය පිණිස ඇති වූ ධෛර්ය ද ක්‍රමයෙන් හීනභාවයට පත් විය ස්ථිර නිවාසයක් කිසිවෙක් නො පැතුය, වැව් අමුණු බැඳවීම හා පිළිසකර කරවීම් අනාකුල නියා දේශවාසීන් කෙරෙහි කෙත්වත් පිළිබඳ කටයුතු සංවිධාන කිරීම් ආදී ශෂ්‍ය වර්ධනයට හේතු ක්‍රියා රජවරු හලහ, තව ද මරක්කළ අරාබි ආදී මොහම්මදිකයන්ගේ වෙළදාමේ දියුණු භාවය කෙතරම්ව පැවැත්තේදයත් ප්‍රතිකාල්හු සමුද්‍රතරණයෙහි නියුක්ත මරක්කළ යන්ට අයත් නැව් කොල්ලකන්නට වන්හ. එබැවින් ඔව්හු ප්‍රතිකාලුන්ට අසුනොවී යනු පිණිස සිරිත් මාර්ගයෙන් වෙන්ව මාලදිවයින් අතරෙන් යාත්‍රා කරන්ට වන්හ. මෙ සමයේ දී ගෝවේ ආණ්ඩුකාරධූරයෙහි නියුක්තව සිටි දොම් ප්‍රන්සිස්කුද අල්මේදා නම් අධිපති තැන මේ බැව් දැන යෝනක ජනයාගේ යථෝක්ත වෙළදාමට බාධා පමුණුවන්ට ස්වකීය පුත්‍ර වූ දොම් ලොරෙන්සුද අල්මේදා නම් නාවික සෙනෙවියා අණවන ලදුව, මෙතෙමේ ප්‍රන්සිස්කන් ප්‍රේව්සෙන්ති නම් පූජක තැනක් කැටුව නැව් නවයක් සහිත යුද්ධ කණ්ඩායමකින් යුක්තව වර්ෂ 1505 ක් වූ පෙබරවාරි මස 27 වෙනි දින ගෝවෙන් පිටත්ව මාලදිවයින් බලා යාත්‍රා කෙළේ ය. [1.]

---

තෙව්කුම් වීකුම් ඇති
අප හිමි දිනිඳු කුලප ති
පෙර නිරිඳුන් අයිති
හුයු දසටක් වන්නි ජය ගති
වන්නි ප්‍රදේශය කොටස් දහ අටක්ව පැවති බව මෙයින් හැඟේ.

Non-Commercial Distribution

මරක්කළ මිනිසුන්ගේ නැව් ලුහුබැඳ යන අභිප්‍රායෙන් පිටත්වූ ලොරෙන්සුද අල්මේදා ගේ නැව් කණ්ඩායම අන්තර්මාර්ගයේ දී චණ්ඩ මාරුතයකට අසුව, වායුප්‍රවාහයෙන් ගසා ගොස් ගාල්ලේ වරයාට ළඟා වූයේය, මෙහිදී නැව් වලට උවමනා සෑහෙන පමණ දිය සහ දරත් සපයාගෙන එතැනින් පිටත්ව යාත්‍රා කොට ක්‍රිස්තු වර්ෂ 1505 හේ නොවැම්බර් මස 15 වෙනි දින කොළඹට ඉතා සමීපව නැංගුරම් ලාගත්තේ ය, මේ කාලයේ දී කොළඹ වරාය නොයෙක් නගර වල වෙළඳ භාණ්ඩ ගෙන යන අනේක යාත්‍රා වලින් පිරී තිබුණේ ය. ඇතුන් ඇත් දත් සහ කුරුඳු දත් කැම්බේ නගරයට ද, ඕර්මස් නගරයට නොයකුත් දූව දඬුද, වෙනත් ප්‍රදේශ වලට කොප්පරා සහ දිය පොල්ද පටවන ලද මරක්කළ නැව් ගණනක් එහි තිබුණේ ය. මිට ඉහත නොදිටු විරූ මේ ප්‍රතිකාල් නම් වූ සුදු මනුෂ්‍යයන්ගේ දැකීම සිංහල මිනිසුන්ට මහත් විස්මිත කරුණක් වූයේ ය. එබැවින් මොවුන්ගේ පැමිණීම ගැන හෙළදිව් වැස්සෝ යුහුව ගොස් එවකට කෝට්ටේ වැඩ සිටි අට වෙනි පැරකුම්බා නරදේවයාණන්ට සැළ කළෝ ය.

එවිගසම රජ තෙමේ සහෝදර මලුන් හා ඇමතිමණ්ඩාළයාද රැස් කරවා මොවුන් හා යුද්ධ කරමු හෝ සාමග්‍රි සම්පන්න වෙමුහෝ ය සාකච්ඡා කෙළේ ය. මේ ගැන නිශ්වයකට පැමිණිමට පළමු ප්‍රතිකාලුන්ගේ තත්වය දැන ගැනීම යෙහෙකැයි යෝජනාකරන ලදින් එම සභාවේ සිටි තියුණු

---

1. මේ පිළිබඳවැ රාජාවලියේ මෙයාකාරයෙන් කරුණු සඳහන් වේ. එනම් එකලට ජම්බුද්වීපයෙහි වූ ප්‍රතිකාල් දේශයෙන් නැවක් පිටත්ව අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තු වර්ෂයෙන් එක් දහස් පන්සිය විසි දෙවැන්නෙහි (1522) දේවානුභාවයෙන් අන්තරා සමුද්‍රයෙහි කිසි උපද්‍රවයක් නැතුව කොළොන්තොටට ගොස් බැස ඉදිනා කල තොට සිටින අය ඇවිත් පරාක්‍රම බාහු රජහට මෙසේ සැළකළාහු ය, හේ කෙසේ සැළකළෝ ද යත් අපගේ කොළොන් තොටට ඉතා සුදු පැහැය ඇති ජාතියෙක් බොහෝ රූප ශ්‍රීයෙන් යුක්තව යකඩ හැට්ට ඇඟලා යකඩ තොප්පි ඉසලා ගෙණ විගසක් එක තැනෙක නො සිට සක්මන් කරන්නාහ කියාත් මුද්දිරප්පලම් අරක්කු කනු බොනු දැක කුඩු ගල් සපාකමින් ලේ බොන්නා එක මස්ටකයාට එක දෙහි ගෙඩියට රන් රිදී දෙක තුන දෙනි, උන්නේ කාලතුවක්කු වලින් තිබන වෙඩිලි සද්ද යුගන්ධ පර්වතයේ සෙන හඬටත් දැඩිය, කාලතුවක්කු උණ්ඩය ගව් ගණනක් ගොස් කළුගල්කෝට්ට වල් පොඩි වෙලායෙති, කියාත් මෙකී වග පමණක් නැතිව විස්තර වශයෙන් සැළ කළාය.

පරාක්‍රමබාහු රජ තෙමේ එපවත් අසා වදාරා අනිකුත් ප්‍රධානවරුන් හා නුවණ ඇති අමාත්‍යවරුන්ට මෙ පවත් වදාරා ඔවුන් හා සන්තානවෙමුද යුද්ධකරමු ද කියා වදාළ තැන. චක්‍රයුද්ධ රජ තෙම මම ගොසින් මගේ ඇසින් ඔවුන්ගේ ගති බලා දෙකින් එක සැළ කරමි.

Non-Commercial Distribution

බුද්ධි සම්පන්න චක්‍රා යුද්ධ රජ නම් සෙනෙවියා වෙස්වලා කොළඹට යවන ලදී. එතෙමේ ප්‍රතිකාලුන්ගේ සන්නාහ සන්නද්ධ භාවය සම සංග්‍රාමික සුරත්වයත් මනාව ජානයන කොට ඔවුන් හා සටනට අපොහොසක් බැවින් සමගියෙන්ම කල් යැවීම මැනවයි රජ හට අවවාද කෙළේය, එවිට රජ තෙමේ කොළොම්තොටින් තොපට කවරදෙයක් උවමනාදැයි විචාරා මිත්‍රත්වය හැඟවීමක් වශයෙන් ප්‍රතිකාල් සෙනෙවියාට පණිවුඩයක් යවන ලද්දේ ය මම වනාහි ප්‍රතිකාල් රජුගේ සේවකයෙක් වූ වෙළෙන්දෙක ඔබ වහන්සේ ගේ රජ හා අන්‍යොන්‍ය සමගි බන්ධනයෙන් වෙළදාම් ගනු දෙනු කරනු කැමැත්තෙන් මෙහි පැමිණි යම්හි දන්වා පර්ඟාඹි කොත්‍රිම් නම් අයෙකු නියෝජිතයෙකු කොට සිංහල මිනිසුන් කැටුව රජු කරා යැවීය.

කෝට්ටෙට යා හැකි කෙළින් පාර නොහඟ වනු කැමැති ස්වදේශකයෝ එවකට සිංහල රජු පිටිසර බද දූර පළාතක නිවසන්නාක් මෙන් ප්‍රතිකාල් තැනට අවබෝධ කරනු පිණිස දෙපැයකින් පමණ යාමට හැකි වූ එම ගමන තෙදිනක් වනතුරු කඳු හෙල් නිමන හුම් ගංගා හේ දඬු ආදි නේක දුර්ග මාර්ග වලින් ඒ නියෝජිතයා ගෙන ගොස් නුවරට පැමිණ වූහ. නුමුත් ගමනාරම්භයට ප්‍රථමයෙන් කරනලද ආඥාව පරිදි වරින් වර සංඥා පිණිස නැව් වලින්තබනු ලබන වෙඩි ශබ්ද ඇසී මෙන් තමා ගමන් කරන දූර ප්‍රමාණය දන පර්ඟාම් කොත්‍රිම්ට මාර්ග දේශකයන්ගේ මේ ශඨක්‍රියාව මනාව තේරුම් ගිය නුමුත් ඔහු සිනාමුසු මුහුණින් යුක්තවම තමා රටතොට කිසි හසරක් නොදත්තකු නියාව පිරිසට හැඟවිය. පරංගියා කෝට්ටෙට ගියා වගෙයි යන ප්‍රස්ථා පිරුළ සිංහලයන් අතරේ කථා ව්‍යවහාරයට පැමිණියේ මේ නිසා ය.

---

කියා අප්‍රසිද්ධ වේශයකින් කොළොන් තොටට වැඩ ප්‍රතිකානුන්ගේ ගති බලා ඇඳින ගෙණ නැවත නුවරට වැස මොවුන් හා යුද්ධයෙන් කම් නැත දක්වවා ගැනීම යහපතැයි කිය ඒ අසා ධර්ම පරාක්‍රම බාහු රජතෙම ප්‍රතිකානුන්ගෙන් එකකු දෙන්නකු දක්වා ගෙණ තැගි බෝගදී ඔවුන්ගෙන් පඩුරු පාක්කුඩම් ගෙන්නවා ගෙණ ප්‍රතිකාල් මහ රජ්ජුරුවන්ටත් නැතක් සම්මානදේවා ප්‍රතිකාල් රජ්ජුරුවන්ට ඉෂ්ටමිත්‍රව උන්නේ ය. එදා පටන් ප්‍රතිකානෝ කොළොන් තොට විසුවාහයි දන ගත යුතුයි යනුයි.

(මෙම රාජාවලියේ කතෘභූත වූ අය දෙදෙනෙක් බව අප බුදුන් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් යනාදි වශයෙන් යෙදී තිබෙන පාඨ වලින් හා වාග්රීතියේ භේද ඇති බැවින් ද මොනවට හැගේ, මෙහි ව්‍යාකරණානුගත නොවන අව්‍යක්ත පද යෝජනාවෙන් හා ග්‍රාම්‍යබපීවාචක ශබ්දන්තගීතවීමෙන් ද විඥයන්ගේ ප්‍රසාදයට හේතු වන ග්‍රන්ථයක් නො වන බව ස්ඵුට වේ, ප්‍රතිකාලුන්ගේ ලංකාවතිණිවීම ක්‍රිස්තු වර්ෂ 1522 දී යයි මෙහි සඳහන් වීම සදොසි ක්‍රිස්තු වර්ෂ 1505 දී යයි අවශේෂ පොත් වල අන්තර්ගත වීම පිළිගත යුක්තකැයි සිතමු.)

Non-Commercial Distribution

රජ තෙමේ ප්‍රති කාල් නියොජිත තැන කැඳවනු ලැබූ නුමුත් තමා අනභිමුඛව ඇමතියන්ගේ මාර්ගයෙන් කථාබස් පවත්වන ලදී. ප්‍රතිකාල්වරුන්ගේ පරමාද්ධ්‍යාශයනම් නානා දේශාණ්ඩු සමග සාමග්‍රියෙන් යුක්තව වෙළදාම් ගනු දෙනු කිරිම බවත්, එසේම මිත්‍රභාවයෙන් ක්‍රියා කිරීමට එකගවුනි නම් එය ස්ථර කිරීමේ ලකුණුක් වශයෙන් ප්‍රතිකාල් රජුට ලක්දිවින් පණ්ණකාරයන් යැවිය යුතු බවත් ඊට පසු ප්‍රතිකාල් රජුගෙන් ද සිංහල රජුට තුටු පඩුරු එවනු ලබන බවත් ප්‍රතිකාල් ජාතික ඔව්හු මුහුදෙහි බලපෑමට සමර්ථයෝ බැවින් ලංකාවේ මුහුදු තෙර පිහිටි තොට මුණවල් පරසතුරන්ගෙන් ආරක්ෂා කර දීමට සහතික වන බවත්, ලංකාවේ උපදින ද්‍රව්‍ය කලින් නියමකර ගනු ලබන ආකාරයට මිලදී ගැනීමත් යුරෝපියෙන් ගෙනන භාණ්ඩ මෙරට අලෙවි කරනු පිණිස ගබඩා කිරීමට වෙලඳ ගෘහ සහ ඒවා ආරක්ෂා සංවිධානය පිණිස බලකොටුවක් ගොඩනගාලීම අවශ්‍ය බවත් පර්ඥාම් කොත්‍රිම් කියා සිටියේය. මීට රජු සහ ඇමති මන්ඩලයාද එකඟවුයෙන් නියෝජිත තැන නැවට හැරීගොස් මේ බැව් දොම් ලොරෙන්සෝ නම් නාවික සෙනෙවිහට දන්වූයේය, හෙතෙමේ සිය අදහස් මුදුන්පත් වූ බැව් දන සමාදානය ස්පීර කිරීමේ සතුට ප්‍රකාශකරනු පිණිස ලක්රජුට ආචාරවශයෙන් කාලතුවක්කු වෙඩි ගණනක් තැබීමට නියම කෙළේ ය. මීට දින කීපයකට පසු ලොරෙන්සුද අල්මේදා විසින් සිංහල රජු සමග වැඩි දුරටත් සාකච්ඡා කොට ස්පීර සමාදාන ගිවිසුමකට බැඳෙනු පිණිස විශේෂ තානාපතියකු වශයෙන් පයෝදසොෟසා නම් අය තවත් ප්‍රතිකාල් කීපදෙනෙකුන් සමග පිටත් කරනලද්දේ ය, මේවාරයෙහි ද පළමු පරිද්දෙන් සිංහල මාර්ග දේශකයන් විසින් තානාපති තැන වන පර්වත ගිරි දුර්ගයන් අතරෙන් කෝට්ටේ රජු වෙත කැඳවා යන ලද්දේ ය. එවිට රජු විසින් ප්‍රතිකාල් තානාපති තැන ප්‍රිය දර්ශනීය ලංකාරයෙන් සරසන ලද ජය වර්ධන පුරාභ්‍යන්තරයෙවහි සුමංගල ප්‍රාසාදය අභිමුඛයෙහි වූ චිත්‍රකූට මණ්ඩප යෙහිදී පිළිගනු ලැබීය. මේ අවස්ථාවේදී වෙළදාම පිළිබඳ සිංහල ප්‍රතිකාල් දෙපාශ්වය මිත්‍ර බන්ධනයෙන් යුක්තව කරගනු ලබන ගිවිසුම ගැන වැඩිදුරටත් සාකච්ඡා පවත්වා, ලක්රජු විසින්ප්‍රතිකාල් දේශයේ රජුට වාර්ෂික පණ්ණකාර වශයෙන් කුරුඳු බාර් [1] භාරසියයක් දීමට ද ඒ පිණිස ප්‍රතිකාල් රජු විසිනුදු සමුදුරබද තොට මුණවල් පරසතුරු වියවුලින් තොරව ආරක්ෂා කර දෙනහැටිය ද ගිවිසීමක් වශයෙන් රජ තෙමේ තානාපති තැනට ප්‍රතිකාලයේ දොම්මානුවෙල් රජුට දෙන ලෙස අණකර රාජසන්දේශය ලියන ලද ස්වර්ණමය වූ පත්‍රය දානය කෙළේ ය. ඉක්බිති ලොරෙන්සුද අල්මේදා නම් නාවුක සේනාධිපති තෙමේ සිංහල රජුගෙන් අවසර ලබාගෙන තමාගේ ගොඩ බැසීම ගැන ලකුණක් වශයෙන් මුහුදේ වරායට නුදුරුව පිහිටි ගලක කොළඹට පැමිණ වර්ෂය සහ ප්‍රතිකාල් රාජකීය යුද්ධා යුධ සටහන ද සංලක්ෂය කරවා පිටත්ව සිය දේශයට ගොස් ධර්ම පරාක්‍රම

1. උප ග්‍රන්ථය බලනු

Non-Commercial Distribution

බාහු රජු විසින් ප්‍රතිකාල් රජුට තුෂ්ටිප්‍රභාත වශයෙන් දේවාවදාරණ ලද[2] රාජසන්නස ලේඛාකරන ලද හෙම්මුවාපත ද ඇතුන් සහ කුරුඳුත් පිළිගැන්විය. මේ පරාක්‍රමබාහු රජුහුගේ රාජ්‍ය කාලය වනාහි ඉතා වියවුල් සහිත විය, ස්වකීය යටත් වැසි ප්‍රධානයන් අතරේ ඔවුනොවුන්ගේ සමගි බැව් නෂ්ටවීමෙන් ඇති වූ අනේක කලහ ද, දකුණු ඉන්දියා වෙන් වරින් වර මරක්කළ ජනයා තොට මුණ ස්ථාන වලට පැමිණ වැසියන්ට කරනු ලබන අනේක පීඩාද බොහෝ වූහ. මේ කාලයේ දී යථොක්ත යුද්ධකාමී වූ මුහුදු කොල්ලකාරී මරක්කළයන් අතුරෙන් ප්‍රධානයෙක් වූ කායෙල්පට්ටන මෙන් [3] මෙහි පැමිණි අදිරාසාරායන් මුදලියා නමැත්තෙකු විසින් ස්වකීය පරිජනසමූහයක් සමග හළාවතට ගොඩ බැස සිංහල රජුගෙන් අවසර නො ලබා මුතු කිමිදිම සහ ඇතුන් බැඳ අල්වා ගැනීම ද පටන් ගන්නා ලද්දේ ය, පසුව රජුනියොවින් එවකට උඩුගම්පල විසූ සකල කලා වල්ලභ නම් යුව රජ සිය බෑයත් සමග යුද්ධසන්නාහ සන්නද්ධව අදිරාසරයන්ගේ කඳවුර කරා පැමිණ බලවත් යුද්ධ කොට උහු සහිත වූ මරක්කළයෝද ඝාතනය කොට සෙස්සන් පලවා හැර ඔවුන්ගේ නැව්ද විනාශකර දැමුයේ ය.

මීට මඳකලකට පසු වික්‍රමබාහු නම් ප්‍රදේශ රජෙක් පහළ රට පැවති වියවුල් අසා ඔටුන්න පැහැර ගැනීමට මාන බලා සිටිනුයේ, මේ වනාහි යහපත් අවස්ථාවකැයි කල්පනා කොට ලක්වැස්සන් අතරේ පතුරුවා හැරීම පිණිස මිල මුද්‍රණය කරන බව සහ යුද පිණිස සේනා රැස් කරන බවද කෝට්ටේ රජතුමාට දැන ගන්ට ලැබී ඔහු මැඩ පවත්වා යුක්ති ප්‍රකාර ක්‍රියාකරවනු සඳහා එවකට මැණික්කඩවර සිටි ශ්‍රී රාජසිංහ හට නියම කරන ලද්දේ ය, හෙතෙමේ තමාගේ ඇවැස්ස නෑවූ කීර වැල්ලේ මහරාළහාමි මේ පිණිස යැවීය. එතුමා විසින් යටිනුවර අත් පත් කර ගන්නා ලද්දේ ය,

මේ ගැන බියපත්වූ රාජද්‍රෝහි වික්‍රමබාහු තෙම මානභංගයට පැමිණියේ වහා සාමදානය පිණිස අභිප්‍රාය කොට වන්දි පිණිස පණම් තෙලක්ෂයක් සහ තමාගේ යුද්ධ සජ්ජිත ඇතුන් තිදෙනාව දීමට ද පොරොන්දු වී සිට දියණියන්ද කිරවැල්ලේ මහරාළහාමිට පාවාදුන්නේ ය. මේ දෙදෙනාගේ සම්බන්ධයෙන් පුත්‍රයන් සය දෙනෙකු සහ එකම දුවෙක් ඇති වූවාය. පුත්‍රයෝ සදෙන වනාහි වැලිකල, බුත්ගමුව, උබ්බෙරිය, වාහල ගෙයි, එන්නෝරුව, කීරවැල්ල යන ග්‍රාම නාමයන්ගෙන්ප්‍රකට වූහ. තවද

---

2. මෙකී ගලේ ප්‍රතිකාල් සෙනෙවිතැනේ ලංකාගමනය ක්‍රිස්තු වර්ෂ 1501 දී වියයි සටහන් වූ නුමුත් 1506 දි සිය යුතු බව පෙනේ.

3. ඉන්දියාවේ ඉතා දකුණෙන් පිහිටි වම්ර්පර්ණී නම් ගංමුවදොරරෙහි වූ තොටමුණකි.

Non-Commercial Distribution

වික්‍රමබාහු බිසෝ බණ්ඩාර නම් දියණිය ජයවීරබණ්ඩාරහට සරණ පාවා දෙනු ලැබීය.

තවද ක්‍රිස්තු වර්ෂ 1518 ක් වූ සැප්තැම්බර් මස 10 වෙනි දින දී ලෝපෝසෝරස් ද අල්බර්ගේරියා නම් අධිපති තැන යටතේ ප්‍රතිකාල් සෙබළුන් 850 දෙනෙකුගෙන් යුත් නැව් හම්බන් 17 ක් සහ කොටු බැම් තැනීමට උවමනා උපකරණ පටවන ලද වෙනත් යාත්‍රා ද පිටත්ව ඉහත දීමෙන් විරුද්ධ මාරුතයෙන් අවුරුණ ලද්දේ ගාල්ලට පැමිණියහ. වැඩිදුර මුහුදු යාත්‍රා පිණිස ඒ කාලය නොමනා වුයෙන් ගාල්ලේ මසක් පමණ ප්‍රමාදව සිට පසුව කොළඹට ළඟා වුයේය. මෙහිදී අල්බර්ගේරියා තමාගේ ඊම පිළිබඳ වූ අදහස සාමාග්‍රි සම්පන්න භාවයෙන් හසුන්පතක් මෙඅයුරු සඳහන් කොට රජු වෙත යවන ලදී. මෙහි පැමිණි සිටින මෙ අයුරු සඳහන් කොට රජු වෙත යවන ලද සේනාපති තැන සහිත වූ පරිජනයාත් ප්‍රතිකාල්දේශයේ රජුගේ මෙහෙකරුවෝ බවත්, ලංකාව හා ප්‍රතිකාලයත් අතරේ වෙළදාම සඵලභාවයෙන් කර ගෙන යාම පරමාර්ථ කොට පැමිණි සිටින බවමුත් ලක් රජහට හෝ එතුමාගේ යටත් වැස්සන්ටවත් විරුද්ධ වශයෙන් නොපැමිණි බවත් ප්‍රතිකාල් වෙළදබඩ සහ සිංහල රජුගේ තොට මුණ ස්ථානත් සතුරු වූ මරක්කළයන්ගෙන් ආරක්ෂා කර ගැනීම පිණිස වරායේ සීමාන්තයේ බලකොටුවක් ගොඩ නගා එහි ප්‍රතිකාල් හේවායන් නැවැත්වීම උවමනාබවත් ප්‍රතිකාල් රජු සහ සිංහල රජු අතරේත් විද්‍යමාන මිත්‍රත්වය නිසා මේ පිණිස අවසර දේවාවදාරණ ලෙස අයැද සිටින බවත් එම සංදේශයෙහි සංක්ෂේප අභිප්‍රාය වන්නේ ය.

යථොක්ත ලියමන ලැබූ කෝට්ටේ රජතුමා මේ සම්බන්ධව ප්‍රතිකාල් ආණ්ඩුකාරයාණන් සම්මුඛ වී කථාබස් කර ගනු සඳහා කොළඹට පැමිණියේ ය. එවිට ප්‍රතිකාල් අධිපති තැන විසින් රජතුමා බහු සම්මාන පෙරටුව පිළි ගනු ලැබ පිළිසඳර කථා ඇතිවූහ. ප්‍රතිකාල් ආණ්ඩුකාර තැන විසින් තමාගේ ආගමනය ගැන තොරතුරු විස්තර කර දෙන ලදින් රජතුමා කොටුවක් බැඳ ගැනීමට අවසර දෙන ලදී. මේ අවස්ථා වේ දී ද ලක්රජහට ආචාර වශයෙන් ප්‍රතිකාල් නැව් වලින් කාලතුවක්කු වෙඩි ශබ්ද කීපයක්ම තබන ලදී, යෝනක ජාතික මනුෂ්‍යයෝ තමන්ට ප්‍රතිකාලුන්ගෙන් සිදු වෙන භයානක ප්‍රතිඵලයන්ගේ අත් දැකීම් නිසා සිංහල රජතුමා සහ ප්‍රතිකාල් ආණ්ඩුකාරයා අතරේත් පවත්වන්ට යන සමගි බන්ධනය පිළිබඳ රහස් සාකච්ඡාව ගැන බලවත් සංවේගයකට පත්ව සුපරීක්ෂාකාරිව විසුවාහු ය, මතු තමන්ගේ වෙළදාමට මේ නිසා බලවත් බාධා පැමිණේ දෝහෝයි කල්පනා කොට ඔවුන් විසින් ස්වකීය වෙළද ජ්‍යෂ්ටයන් අතුරෙන් නියෝජිතවරු කීපදෙනෙක් සිංහල රජතුමා සම්මුඛව මේ සම්බන්ධ කාරණා තත්වාකාරයෙන් ප්‍රකාශ කිරීම පිණිස ජයවර්ධන පුරයට හෙවත් කෝට්ටයට පිටත් කර හරින ලද්දාහුය.

Non-Commercial Distribution

මේ නියෝජිතවරු තමන්ට ප්‍රතිකාලුන්ගේ ක්‍රියා නිසා ඉන්දියාවේ දී ලැබුණු ආලාභ මනා ලෙස රජතුමාට පැහැදිලි කර දුන්නෝය. ප්‍රතිකාලුන්ගේ එකම අභිමතාර්ථය නම් තමන් පැමිණෙන සියලුම රාජධානි වලින් එරටවාසීන්ට හානි පමුණුවා තමන්ගේ අභිවෘද්ධිය සලස්වා ගැනීම බවද, ඔවුන් මෙහි විසීමට ඉඩ හැරීමෙන් කල්යාමක දී සිංහල ආණ්ඩුවේ සෛවරී බලය පවා භග්න කොට ඔවුන් විසින් එය හස්ත ප්‍රාප්ත කර ගනු ලබනවාට ශංකාරහිත බවද, එබැවින් ප්‍රතිකාල් ආණ්ඩුකාර තැනගේ ඉච්ඡා කථාසල්ලාපයන් අදහා රජතුමා නොමග ගමන් කළ යුතු නොවන බවද යනාදී කාරණ මේ නියෝජිත වරු රජතුමාට සැලකර සිටියෝ ය. තවද යවන ජාතිකයන්ගෙන් සිංහල රටට සහ මිනිසුන්ටත් අනල්පයහපතක් ලැබී තිබෙන බවද ඔවුන්ගේ වෙළදාම හේතු කොට ගෙන ලංකාවට ධන සම්භාරයක් සහ විපුල ශුභ සිද්ධියක් අත් වී තිබෙන බවද, ඔවුන්ගේ ලබද්ධිය කෙරෙහි අලග්නවූ කිසිවෙක් බලාත්කාරයෙන් ඇතුළත් කර ගැනීමටප්‍රයන්ත නොයෙදු බවද යනාදිය කියමින් ආත්මගරුත්වය ගැන ගුණවර්ණා කළෝය, ක්‍රිස්තියානි සමය පතළ කර හැරීම ප්‍රතිකාල් ආණ්ඩුවේ එක් ව්‍යාජෝපායක් බැවින් ඒ ආණ්ඩුවේ ආඥා චක්‍රය ලක්දිව පිහිටුවන්ට ඉඩ හැරියොත් සිරිලක ජාතිකාගම ක්‍රමයෙන් නටබුන්වී ලක්වැස්සන්ගේ නිදහස සහ සෛවරීභාවයත් අතුරුදන්වනු නිසැකය, යන අනාගත වාක්‍යය ද ඔව්හු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියෝ ය.

මේ යෝනක නියෝජිතවරුන් බෞද්ධ භික්ෂූන්ගේ දයානුකම්පා සහගත ආධාර ඇතිවූහ. ඔවුන් විසින් ලක් රජතුමාට ඉතා ජීවලිතාකාරයෙන් කරන ලද අවවාදකථායෙන් පොළඹවනු ලැබූ සිංහලයෝ විය.රුවුවහු රටේ බලවත් කැළඹීමක් හටගත්තෝ ය, රජතුමාගේ ආඥාපවා නොසැලකීමෙන්මේ අරගලය කොළොම්පුරය දක්වා පැතිරී ගියේ ය. මේ කොළොහලය පවත්නා අවස්ථාවේදී නිර්භීත ලෙස නැව් වලින් ගොඩ බට ප්‍රතිකාලුන් ආණ්ඩුකාර තැනගේ අදහස පරිදි බලකොටුවක් ගොඩ නැගීමට තෝරා ගෙන තිබුන භූමිභාගය අවහිර කිරීම පිණිස එහි ආරක්ෂක උල් දඬුවැටක් බඳින ලදී. මරක්කළයන් විසින් සිංහල රජතුමාට ත්‍යාගිකරන ලද කාලතුවක්කු ස්වල්පයක් මේ ස්ථානයට ඇද ඒවායේ මූනිස්සන් සහ ලොකු උණ්ඩ දමා, උදෑසන වෙරළාසන්නයෙහි නැංගුරම් ලා නවතා තිබුන ප්‍රතිකාල් නැව් වලට වෙඩි තබන ලදී, ඒ අතර සිංහල සමූහයක් වෙරළෙහි සිට වර්ෂා පතනයක් මෙන් ඊසැර පහරවල් නැව්වල සිටි මිනිසුන් වෙත නික්මෙව්වෝය. නුමුත් මේ සතුරු ක්‍රියාවෙන් වැඩි ප්‍රයෝජනයක් සිදු නොවීය. නැව් වල සවිකර තිබුන කාලතුවක්කු වලින් තබන ලද වෙඩි පහර හේතු කොට ගෙන ගොඩ සිට විරුද්ධකම් දැක්වූ උදහස් සිහලුන්ගේ පලායාම සිදු වූහ.

Non-Commercial Distribution

මේ කාරණයෙන් පසු බලාත්කාරකම් දක්වා මිස වෙන ආකාරය කින් සිය අදහස් ඉටු කර ගත හැකි නොවන බව ප්‍රතිකාලුන්ට මනාකොට අවබෝධ විය. ඔව්හු වහාම සංග්‍රාමික මන්ත්‍රණ සභාවක් පවත්වා එහිදී විධාන කර ගත් පරිදි එක් උදයක අලුයම් වෙලේ නැව් වලින් සෙනඟ ගොඩ බැස්සෙව්වෝ ය, එවිට සිංහලයෝ ව්‍යාකුලාකරයෙන් ඔවුන්ට වෙඩිතබන්නට පටන්ගත් නුමුත් ප්‍රතිකාලුන්ගේ ඉදිරියට ඒම බාධා කිරීමට නොපොහොසත් වුයෙන් ප්‍රතිකාලුන් විසින් වහ වහා තනා ගනු ලැබු ආරක්ෂක අඟල් ආදියට ඔව්හු ප්‍රවිෂ්ට වූවෝය, මෙහිදී දෙපාර්ශ්වයම බිහිසුණු ලෙස සටන් කළ නමුත් අනිතිමේදී සිංහල ජනයාට නගරය දක්වා පසු බැස යන්ට සිදුවීහ. ප්‍රතිකාලුන් විසින් (දැනට බේරේ ගඟයයි ව්‍යවහාර කරන) කලපුව දක්වා ලුහු බැඳගියෝ ය.

ඊට පසු සිංහලයෝ වඩාමත් ශක්ති සම්පන්න වෙමින් නැවත ද වරක් ප්‍රතිකාලුන් ඉදිරියට පැමිණි විට ජයග්‍රහණයක් ලැබීමට අපහසුකම් තේරුම් ගත් ප්‍රතිකාල් ආණ්ඩුකාර තැන තම සෙනගත් සමග පලාගොස් රාත්‍රියෙහි ස්වකීය නැව් වල ලැගුම් ගත්තේ ය. පසු දින උදෑසන සිංහල මිනිස්සු අගල් අත් හැර ගොස් සිටින බැව් දැනගත් ප්‍රතිකාල්හු අනාගතයෙහි ඇතුන්ගෙන්උවදුරු නොපමුණුවන පරිදි පටු වූ දේශසන්ධිය හරහට ආරක්ෂක අගලක් කපා ඊට පිටිපසින් උල් වූ ඉණි වැටක් ද ඒ අතර නැව් වලින් ගොඩබානලද කාලතුවක්කු ස්වල්පයක් ද සවිකොට බලකොටුව තැනීමේ වැඩ ප්‍රාරම්භකරන ලද්දාහු ය, ගල් සවිකොට බැඳිමට හුණු සොයාගන්ට නොහැකි වූයෙන් බදාමට මැටි පාවිච්චි කරන ලද්දේ ය, ඊට පසු ලක් රජතුමාගෙන් පණිවුඩ පණතක් ගෙන ප්‍රතිකාල් ආණ්ඩුකාර තැන සම්මුඛ වීමට දිශාපතිකෙනෙක් පැමිණියේ ය, මේ අරගලය හට ගැනීමට හේතු වූයේ ප්‍රතිකාලුන් විසින් යෝනක මනුෂ්‍යයන්ට පෙන්වන ලද විරුද්ධ කම් නිසා බැවින් ඔවුන් ඒ ගැන චෝදනා ලැබිය යුත්තන් බවද ඔවුන් දෙපාර්ශය අතරේ සාමදානයක් ඇති කරවීමට රජතුමා සතුටින් සිටින බවද, ඒ පණිවුඩපණතේ අදහස විය.

මෙයින් අනතුරුව ප්‍රතිකාල් ආණ්ඩුකාර තැන සහ ලක් රජ අතරෙත් කර ගන්ට යෙදුන සාමදාන ගිවිසීමේ දී ප්‍රතිකාල් රජහට වර්ෂයක් පාසා කුරුඳු බාර්ස් 400 ක් ද රතු කැට මැණික් බැඳි මුදු 20 ක් සහ දළැතුන් දස දෙනෙකු බැගින් දීමට ද, ඒ පිණිස ප්‍රත්‍යුපකාර වශයෙන් ලෝපෝසෝරෙස් ද අල්බර්ගේරියා නම් ආණ්ඩුකාර තැනද ඉන් ඉක්බිති ඉන්දියාවේ ආණ්ඩුකාර ධූරයට සහ උපාණ්ඩුකාර ධූරවලට පත්ව එන්නන් විසින් ද ලංකාරජුට විපක්ෂව පැමිණෙන් සතුරන් අභිභවනය පිණිස ආධාර කටයුතු බවද නියම කර ගන්නා ලද්දේ ය, මේ සමගි ගිවිසුමෙන් පසු ප්‍රතිකාල් රජු විසින් සිංහල රජුට අනේක ත්‍යාගි රාශියක් ද එවන ලදින් බලකොටුව තැනීමේ

Non-Commercial Distribution

වැඩ සිංහල මිනිසුන්ගේ ආධාරත් ඇතිව යුහුව කර ගෙන යන ලදී. කොටුවේ සේනාපතිධූරයට දොම් ජො ආවෝ ද සිල්වෙයිරා සහ මුහුදේ ආරක්ෂාව පිණිස නාවික සේනාපතිධුර යට අන්තෝනියෝද මිරන්ඩාද අසවේදෝ නම් අයද පත් කර එවනලද්දේය. නුමුත් මේ සමගි ගිවිසුම චිරකලක් තිරව නොපැවැත්තේ ය, පුණ්‍ය කර්ම කරණයෙහි ගුණ මෙනෙහි කළ ධර්ම පරාක්‍රමබාහු රජ තෙමේ සියසතු දළැතුන් හය දෙනෙකු බන්ධන වලින් මුදා පිණට හැරීමට ද රජමහ කැළණිය නම් පෞරාණික විහාර ස්ථානය ප්‍රතිසංස්කාරණය කිරීම පිණිස ද ගණනායක තැනට සහ විජයකොන්නාරනම් මන්ත්‍රියාටත් නියම කරනලද්දේ ය, රජතුමාගේ මේ ක්‍රියා හේතු කොට ගෙන ප්‍රතිකාලුන් සහ සිංහලයන් අතරෙත් ඇති වූ සමගිය ක්‍රමයෙන් හීනවී ගොස් සිංහලයන් විසින් එක් රැයකදී ප්‍රතිකාලුන්ගේ කොටු භිත්තියකින් කොටසක් බිඳ හෙලන ලද්දෝ ය, මේ සම්බන්ධව ලක් රජුට තත්වාකාරපහදා කියා සිටි නුමුතු ඊට එතුමාගෙන් කිසි ප්‍රතිෂ්ටාවයක් නො ලැබුණේ ය. මෙසේ වීරවර වූ ධර්මපරාක්‍රමබාහු නරජ්‍යෙෂ්ඨ තෙමේ ද රිපුසෙන් මථනය කිරීමෙන් මෙයාකාර රාජ්‍යය නිෂ්කණ්ටක කොට ජිනශාසනය පරිපාලනය කරනු ලබන්නේ ක්‍රිස්තු වර්ෂ 1529 යේදී ශේෂ බවට පැමිණියේ ය.

---

ගණනාය කතැන මහ පරාක්‍රමබාහු විජයකොන්නාරනම් ඇමතියාණන් විසින් කළ්‍යාණිචෛත්‍ය හුණු බදාමෙන් සුද්ධකම්කරවනලද බවත්, සන අඩි හැටක් පමණ අයාම යෙන් යුත් ශිලාමයප්‍රකාර වලයක් ද එසේම සඳකඩ පහණකින් යුත් පිය ගැට පළකින්ද නිමවා පස්මහල් පහය සහසිටි පිළිම ගෙහිත් ජරාවාස තැන් පිළිසකර කරවන ලද බවත් එසේම යථොක්ත ස්ථානය ගම්වාසීන් විසින් තම තමන්ගේ වතුකුඹුරු වල අස්වැන්නත් අය බද්දක් දීමට ද නියම කරන ලද බවත් කියා තිබේ.

Non-Commercial Distribution

# ප්‍රතිකාලුන්ගේ උද්‍යෝගය.

ධර්ම පරාක්‍රමබාහුරජුහුගේ ජනමාන්නතරගතවීමෙන්හිස් වූ රාජ්‍යශ්‍රියට සුදුස්සෙක් පත් කර ගනු සඳහා ඇමති මණ්ඩලයා විසින් මහජනයා සහිත රැස්වීමක් පවත්වා සාකච්ඡා කොට එවකට උඩු ගම්පල සකල කලාවල්ලභ නම් යුවරජාණන්ට ඔටුන්න භාර ගැනීම පිණිස ආරාධනා කරන ලද්දා හ. ඔහු ඊට කාරණ දක්වා ප්‍රතික්ෂේප කොට මැණික්කඩවර සිටි තම සොහොවුරු වු විජයබාහු කුමරු වැඩමවා සිංහාසනාරූඪ කොට තෙමේ පෙරලා උඩුගම්පලටම ගියෝය, මේ රජු රාජ්‍ය කරන සමයෙහි කැලිකට් නගරයෙන් මරක්කළ සමූහයක් මෙහි පැමිණ කොටුව වටලන ලද නුමුත් ප්‍රතිකාලුන් විසින් මරක්කළයන්ගෙන් බොහෝ දෙනෙක් නසා සෙස්සවුන් පලවා හරින ලද හ. මීට මඳ කල කට පසු ඉන්දියාවෙන් නැවතත් මරක්කළ නාවුක යුද්ධසේනාවක් මෙහි එළඹීමේ බලාපොරොත්තුවෙන් ගමනාරම්භ කළ නුමුත් අතරමග මහ මුහුදේදී ම අසවේදෝ නම් ප්‍රතිකාල් සෙනෙවියා විසින් ඔවුන් සමග සටන් කොට පරාජයට පමුණුවනු ලැබුවාහු ය. මේ කාලයේ දී කොළඹ කොටුව හුණෙන් බැඳ වැඩි දුරටත් ශක්තිමත් කර ගන්නා ලදී. මේ ගෘහ නිර්මාන කර්මාන්තය සඳහා කීලාකරි යෙන් බෙලිකටු ගෙන්වා හුණු පිළිස්සීම කරන ගන්නා ලදි කොටුව හාත්පස බැරැක්ක නම් වූ අභිනව හේවාමඩම් තැනීමෙන්ද බලකොටුව වටේ තනා තිබෙන අගල තහවුරු කිරීමෙන්ද යථොක්ත ස්ථානය ක්ෂුද්‍ර ද්වීපතක ආකාරයෙන් තනා ගනු ලැබුවා හු ය.

මෙසේ මරක්කළයන් අභිභවනය කිරිමෙන් බලසම්පන්න බවට පැමිණි ප්‍රතිකාල් ජනයා හෙළදිව් වැස්සන්ගේ ජීවිත අන්තරායට පමුණුවමින් වස්තු පැහැර ගනිමින් ඉතිරිනගේ පතිවත්දම් කඩ කරමින් අනාචාරශීලිව කල් යවන්නට වන්නහුය. යෝනක ජනයා පලවා හැර ඔවුන්ගේ වෙළදාමට බාධා කිරීම පිණිස නෙකොපාය යෙදූහ. මේ සම්බන්ධව අතිශය උදහස් වූ සිංහල රජතුමා මරක්කළයන් විසින් පොළොඹ වන ලදුව හේවායන් 20,000 කින් යුත් සෙන් යවා කොළඹ කොටුව වටලැවීය, මේ හේතු කොට ගෙන ප්‍රතිකාලුන්ට ආහාර සපයා ගැනීම බෙහෙවින් දුබල වීම නිසා බලවත් අනාථභාවයට පත්වූහ, මේ ගැන ගෝවේ ආණ්ඩුකාරයාණන්ගෙන් උදව් ඉල්වා පණිවුඩකරුවන් දෙදෙනෙකු යවන ලද නුමුත්, ඔවුනුදු අන්තර්මාරග්යේදීම සිහලුන්ට හසු වි මෙන් ස්වකිය අභිමතාර්ථය ද ඉටු නොවූහ. බොහෝ වියදම් කොට තෙවෙනිවර යවන ලද පණිවුඩය කොචින් නගරයේ දොම් ඇලැක්සෝ ද මැන්සෙස් නම් ආණ්ඩුකාරයාට ලැබුණ නුමුත් හෙතෙම මේ ගැන කිසි ආධාරයක් කිරීමට අපොහොසත් විය, කොටුවේ සිර වී සිටින්නන්ගේ උදව් පිණිස ඉක්මනින් සෙන් එවීමට නොහැකි බවත් අවස්ථා දායක පරිදි මේ ගැන හතුරන්ගෙන් පලි ගන්නතුරු

Non-Commercial Distribution

ඉවසිලිවන්තව සිංහලයන් හා සමාදානය ඇති කර ගත යුතු බවත් හෙතෙම් දන්වා එවීය. අධික සා දුකින් පෙළෙමින් පිටතින් කිසියම් සහායක් නොලැබ සිටි ප්‍රතිකාල් සෙන් මෙයාකාරයෙන් දුක්ඛභාගීව සමසක් ඉක්ම වූ කල අන්තෝනියෝ ද ලැමෝස් නම් නාවික ශ්‍රේෂ්ඨයකුගේ ප්‍රධානත්වය ඇතුව කොචින් නගරයෙන් කොළඹට පැමිණි නැවකින් ආධාර ලැබුණෙන් ඔව්හු කොටුවෙන් බැහැරව අවුත් කොටුව හාත්පස සිටි සිංහල සේනාව පලවා හැරියෝය.

මේ කාලයේ පටන් ක්‍රිස්තියානිය නම් අභිනව සමය ලක්දිව පැතිරීමට හේතු වූයේ ප්‍රතිකාලුන්ගේ ආගමනයේ දී අල්බර්ගේරියා නම් සෙනෙවි තැන කැටුව පැමිණි රෝම ක්‍රිස්තියානි දෙවිගැතීන්ගේ මාර්ගයෙන් විය. විජයබාහු කුමාර තෙමේ ලක්දිව රාජ්‍යශ්‍රියට පැමිණීමට ප්‍රථමයෙන් මැණික්කඩවර පදිංචිව සිටි ස්වකීය සොහොවුරු වූ චක්‍රායුද්ධබාහු කුමරයා හා එක ගෙයි විසීය. මේ දෙනොගේ සමගි ආශ්‍රයෙන් චක්‍රායුද්ධ බාහු කුමරුගේ ඇඹණි වූ කීර වැල්ලේ මහා බිසෝ බණ්ඩාර නම් කුමරියට රයිගම් බණ්ඩාර භුවනෙකබාහුය, පරරාජ සිංහය, මායාදුන්නේ යයි පුතුන් සිව් දෙනෙක් ඇති වූහ. වැඩිමහල් කුමර තෙම කුඩා කාලයේදීම නැසී ගියේ ය, ඉන් අනතුරුව මව් පිය දෙදෙන ද අනිත්‍යභාව ප්‍රාප්ත වූයෙන් විජයබා තෙමේ දෙවෙනි වර කීර වැල්ලේ තවත් කුමරියක් විවාහ කොට ගත්තේ ය. මෙම කුමරිය තොමෝ තමන් ඇති කර ගත් සිය බෑවූ දේවරාජසිංහ නම් කුමරුහට රාජ්‍යය හිමි කර දෙන අටියෙන් කඳුරේ බණ්ඩාර හා ඒකනායක මුදලින් සමග කුමන්ත්‍රණය කළාය. ස්වකීය සුළු මවගේ මේ කුමන්ත්‍රණය ජානනය කළ සොහොවුරු තිදෙන ජීවිතාරක්ෂාව සඳහා සංඝයාගේ ආධාරත් ඇතුව පලා ගොස් බොරලැස් ගොමුව නමැති ග්‍රාමයේ රහසිගතව වාසය කළාහුය. කලකට පසු බාල සොහොයුරු වූ මායා දුන්නේ දූනට මහ නුවර නමින් ප්‍රසිද්ධ එවකට සෙංකඩගලපුරයයි ව්‍යවහාර කරන ලද නගරයට පැමිණ එහි එකල රාජ්‍ය ශ්‍රීපදප්‍රාප්තව සිටි වික්‍රමබාහු රජතුමාගේ අනුග්‍රහය අයැද සිටියේ ය. වික්‍රමබාහු රජ ද මායා දුන්නේ කුමාරයාට ස්වකීය හතර කෝරළේ යුද්ධ හමුදාවේ ආධාර ලබා දුන්නේ ය, ඒ අනුබලයෙන් උද්යෝගී වූ හෙතෙමේ සම්පූර්ණයෙන්ම පිටිගල්කෝරළය විනාශ කෙළේ ය. ඉක්බිති මායා දුන්නේ සෙසු සොහොයුරන් දෙදෙන තමහට පක්ෂ වන ලදින් කැළණියේ කඳවුරක් බැන්දේ ය, එවිට කෝට්ටේ රජ කළ විජයබාහුගේ හේවාහට කාණ්ඩයක් රාජකාර්ය ත්‍යක්තකරන ලදින් හෙතෙම සමදාන යට කැමති වුයේ ය, මායා දුන්නේ සහ කුමාරවරු තිදෙන ඊට එකඟ වෙමින් තමන් ජීවිතක්ෂයට පැමිණවීමට කුමන්ත්‍රණය කළා වු කඳුරේ බණ්ඩාර සහ ඒකනායක නමැති නිලධාරි දෙදෙන දණ්ඩනය කිරීම සඳහා ඔවුන්ට පාවාදෙන ලෙස ඉල්ලා සිටියෝ ය, විජයබාහුරජ තුමා ඒ ඉල්ලීම ඉෂ්ට කරන ලදින් කෝට්ටුමස්

Non-Commercial Distribution

කිරීමෙන් හෙවත් කස ප්‍රහාර දානය කොට අධික ශාරීරික පීඩනය කිරීමෙන් කුමන්ත්‍රණය කරුවෙක් වූ කඳුරේ බණ්ඩාර නමැත්තා ජීවිතක්ෂයට පත් විය. අනිත් කුමන්ත්‍රණකරු වූ ඒකනායක මුදලි තැනතිලධාරීන්ට අසු නොවී පලා ගොස් ජයවර්ධන පුර හෙවත් කෝට්ටේ සංඝයාගේ ආරක්ෂාව යටතේ විසුවේ ය. ඉකිබිති මේ කුමරවරු සිය සංග්‍රාමික භටයන් පිටත නවත්වා හුදකලාව කෝට්ටේ මාලිගාවට සම්ප්‍රාප්ත වූහ. එහි දී මේ වල්ලභයන් තිදෙනා තමන්ට හමු වන ලදවිරුද්ධ කම් මැඩ පවත්වා සෙලම්බා නමැති ආගන්තුකයකු ලවා ස්වකීය පිය වූ විජයබාහු රජ මරුමුවට පත් කර වූහ.

පසු දින උදෑසන මන්ත්‍රී මණ්ඩළයා රැස් වී මේ තිදෙන අතුරෙන් දෙටු සොහොයුරු තෙම සත්වෙනි භුවනෙකබාහු යන නාමයෙන් ලංකාසිංහාසනයෙහි රජමෙන් තෝරා ගන්නා ලදී. සෙසු යුවල සොහොවුරන්ගෙන් පරරාජසිංහ නම් වැඩුමහල් තැනැත්තවුහට රයිගම් වල්ලලාවිටි සහ පස්යොදුන් කෝරළ වල ආධිපත්‍ය ධූරය හිමිකර දෙන ලදී. හෙතෙම ආණ්ඩු කළ ප්‍රවේණි ප්‍රදේශයක නාමයෙන් ඔහු රයිගම් බණ්ඩාර යන්නෙන් ප්‍රකට වූහ. බාල සොහොයුරු වූ මායා දුන්නේට දෙනවක සහ හතර කෝරළේ සහිත සීතාවක පළාත අයිති කර දෙන ලදුව ඔහු එහි ස්වකීය අමාත්‍ය තැන වූ ආර්ය මන්ත්‍රීත් සමග ආණ්ඩු කෙළේ ය, රයිගම් බණ්ඩාර රයිගම් පළාත අත්හැර ගොස් මාපිටිගම පදිංචිව සිට එහි දී මෙළේ ය, ඔහු විසින් ආණ්ඩු කරන ලද ප්‍රදේශ සහ ඔහුගේ ධන සම්භාරයන් මායා දුන්නේ විසින් හස්ත ප්‍රාප්ත කරන ගන්නා ලදී. කෝට්ටේ සිංහාසනය අයිති කර ගන්නා අටියෙන් මායා දුන්නේ මරක්කළ යුද්ධ හමුදාවක ආධාර ඇතුව ස්වකීය සහෝදරයා වූ භුවනෙකබාහු රජුට විරුද්ධව වරින් වර සටන් කීපයක්ම කළ නුමුතු ප්‍රතිකාල්වරුන්ගේ මැදහත්වීම කරන කොට ගෙන ඔහුගේ අදහස ඉෂ්ට කරනු නොහැකිවිය, මේ කාලයේ වයෝ වෘර්ධ වයස්ගතව සිටි භුවනෙකබාහු රජුට තමාගේ ගම්පළ අගබිසවගෙන් සමුද්‍රාදේවී නමැති දූ කුමරියක් ඇතුව සිඹියේ ය. මේ කුමරිය මාදම්පේ වංශවත් පවුලකට අයත් වීදිය බණ්ඩාර නමැති අයෙකුට සරණ ගිවිස වර්ෂ 1538 දී සිද්ධකරන ලද්දීය, මේ විවාහය හේතු කොට ගෙන සමුද්‍රා දේවීට ධර්ම පාල සහ විජය පාල නමැති පුතුන් දෙදෙනෙක් ලැබීමෙන් කෝට්ටේ සිංහාසනය කෙරෙහි මායා දුන්නේ තුළ පැවති බලාපොරෝත්තුව චංචල විය, භුවනෙකබාහු රජ තමාගේ ඇවෑමෙන් හෙතෙම ප්‍රතිකාල් රජුගේ ආරක්ෂාවට වසඟ කර දුන්නේ ය, මේ රජ තෙමේ ප්‍රතිකාල්වරුන් සතුටු කොට ඔවුන්ගෙන් උපකාර ලබන බලාපොරොත්තුවෙන් ස්වකීය ලබද්ධියට සහ ජාතියටත් අපකීර්තිය ගෙන දෙන බිය සුළු නින්දිත ක්‍රියා කීපයක් කර තිබේ. ඉන් එකක් නම් ධර්ම පාල කුමාරයාගේ රූ සටහන නිමවා රුවන් මුවා කිරුළක් සමග සලප්පු

Non-Commercial Distribution

ආරච්චි නම් කෙනෙකු භාරේ ප්‍රතිකාල් දේශයට යවා, එම රූපයට ඔටුනු පළඳ වන ලෙස, එවකට ඒ රටේරජ කළ තුන්වෙනි ජෝන් රජුගෙන් අයැද සිටීමය. ප්‍රතිකාල් රජු ද මේ කාරණය ලංකා රජ්‍යය ස්වහස්තප්‍රාප්ත වීමේ ප්‍රමුඛ ලක්ෂණය කැයි මෙනෙහි කොට අතිශයින් උද්යෝග වූයේ වර්ෂ 1541 දී පෘතුකාලයේ අගනුවර වූ ලිස්බන් රාජමන්දිරයෙහි දී අත්‍යාලංකාරයෙන් මහෝත්සවයක් පවත්වා රන් රූපයට දොන් ජුවන් යන නාමය ප්‍රදානය කොට ඔටුනු පළඳවන ලද්දේ ය, එපමණකුදු නොව ප්‍රතිකාල් රජු විසින් සිංහල නාරාධිපයන්ගේ අනුඥවෙන් ලංකාද්වීපයෙහි කිතු සමය පතළකර හැරීම පිණිස රෝමානු කතෝලික පූජකවරු සදෙනෙක් සිංහල තානාපති තැනක් සමග පිටත්කර යවන ලදී. ඔවුනතුරෙන් දිකොන්ඩේ පූජක තැන විසින් ධර්මපාල කුමාරයාට ශෘස්ත්‍රාභ්‍යාසය කරවනලදී. බෞද්ධාගම්කාර ජනයන් ක්‍රම ක්‍රමයෙන් ක්‍රිස්තියානි භක්තිකයන් කර වීමේ කෘත්‍යය මේ පූජකයන් විසින් යුහුසුළුව කර ගෙන යන ලදී. පානදුරේ, මග්ගොන, බේරුවල, ගාල්ල සහ වැලිගම නමැති ග්‍රාමයන්හි දේවස්ථාන ගොඩ නගන ලදී. වර්ෂ 1544 දී පස්කාල් සහ ගොන්සාල් නමැති උද්යෝග සම්පන්න පූජා ප්‍රසාදිවරු දෙදෙන සෙන්කඩගල නුවර ප්‍රවිෂ්ටව රෝම සමය දේශනා කරන්ට පටන් ගත්තාහුය, මේ කාලයෙහි විශාරද ප්‍රඥාන්විත බ්‍රාහ්මණ ජාතික භික්ෂුවක් ඇරකන් දේශයෙහි සිට මෙහි ආගමනය හේතු කොට ගෙන බෞද්ධාගම පිළිබඳ ප්‍රචලිත වූ ප්‍රබෝධත්වයක් ඇති විය, වර්ෂ 1544 දී පමණ ප්‍රන්සිස් ක්ෂාවියර් නම් රෝම දෙව්ගැතියෙකු විසින් ලක්දිව උතුරු දිග්භාගයෙහි කිතු සමය පතල කිරීමට ආරම්භ කරන ලද්දේ ය, මේ පූජක තැන විසින් මන්නාරම්ද්වීපවාසී වැඩි දෙනෙක් ක්‍රිස්තුභක්තිකයන් කරගන්නා ලදහ. ක්‍රිස්තුස් වහන්සේ ගේ ආදිශිෂ්‍යයන්ට මෙන් ගිලාණප්‍රතිකර්ම ක්‍රියා සහ අනිකුදු ආශ්චර්යමත් දිව්‍යමය වූ බලයක් මොහුටද ඇතුව තිබුණේ ය. යන ප්‍රබන්ධ කථා ප්‍රවෘත්ති පතල වී මෙන් එකල යාපනේ ආණ්ඩු කළ ත්‍යාගරාජා නමැති හින්දු භක්තික රජ භීතියට පත්ව මන්නාරමේ ක්‍රිස්තුභක්තිකයන් 600 ක් පමණ ශූලාරූඪ කිරීමෙන් ජීවිතක්ෂයට පමුණුවන ලදහ. මෙසේ පලි ගැනීමෙන් ඇතිවීමක් නොවූ ශෛව වූ අධිපති තෙමේ තමන් සතු ප්‍රදේශයකට ක්‍රිස්තු සාමයිකයන් ගේ ඊම පවා තහනම් කරන ලද්දේ ය. යථොක්ත එඩිතර බාධක ක්‍රියාවන්ට නොපසුබස්නා එඩිතර වීර්යකින් මුහුණ පෑ ප්‍රන්සිස් ක්ෂාවියර් දේවගැති තෙම යථොක්ත යාපණේ රජුගේ සහෝදරියක් රෝමානු භක්තියෙහි පිහිටුවා ඈ රහසින් ගෝවේට පිටත් කර හරින ලදී. මේ ක්‍රියා කරන කොට ගෙන දණ්ඩයකින් පහරනු ලැබූ ආසිවිසයකු බඳු ද්‍රවිඩ රජ තෙමේ කිතු සාමයික ජනයා බලවත් පීඩනයට ගොදුරු කරන්ට වන, ක්ෂාවියර් නම් දෙව්ගැති තැනගේ අයැදුම නිසා ප්‍රතිකාලුන් ස්වකීය කෘරතර ක්‍රියාවන්ට විරුද්ධව නැගිටීම දූන ගත් දමිළ නරේශ් තෙමේ ක්‍රිස්තියානින් කෙරෙහි පමුණුවමින් සිටි ගොරතර දඬුවම් ක්‍රම ක්‍රමයෙන් ලඝු කිරීමෙන් අත්හිටුවනු ලැබුවේ ය.

Non-Commercial Distribution

වර්ෂ 1545 දී පමණ භුවනෙකබාහු රජුට දාව අන් බිසවකගේ පුත්හු දෙදෙන ගෝවේට ගෙන යනු ලැබ ඔවුන්ගේ හිමි කම් නො සලකා අනාගතයෙහි ධර්මපාල කුමාරයාගේ ලංකා අධීශ්වරතාවය ප්‍රතිකාල් රජුහු විසින් පිළිගනු ලැබීමේ අයෝග්‍යතාව දොන් ජොන් ද කැස්ත්‍රො නම් සෙනෙවියාට පැමිණිලි කර සිටියෝ ය. සේනාධිපති තැන සහ ඔහුගේ මන්ත්‍රි මණ්ඩලයත් කුමරවරුන්ට උවමනා මිල මුදල් වියදම් කරන්නෝ නම් ලංකා සිංහාසනය පිළිබඳ ඔවුන්ගේ අයිතිවාසිකම් ස්ථිර කර දීමට සතුටු බැව් දත් වූහ. මේ කුමාරවරු දෙදෙන ගෝවේ නැවතී සිටින කාලයෙහි එහි මසූරිකා රෝගය නම් මාරකා බාධයක් පැතිරින. තෙමසක් ඇතුළත ළදරුවෝ 8,000 ක් මෙම බියකරු වසංගතයෙන් ජීවිතක්ෂයට පැමිණි බව හා එය කුමාරයන් දෙදෙනාට ද වැලදීමෙන් ඔවුනුදු මරු වසඟ ප්‍රාප්ත වූ බවත් කියා තිබේ. ස්වකීය මරණයට ප්‍රථම මේ රාජකිය දෙබෑයෝ ක්‍රිස්තියානිභක්තිය වැලඳ ගෙන සිටි බැවින් ගෞරවාන්විත ව ඔවුන්ගේ දේහස්ථාපනය සා ඕ ප්‍රැන්ස්කෝ නම් තාපසාරාමයෙහි සිද්ධ කරන ලදී. මායා දුන්නේ සහ සත්වෙනි භුවනෙකබාහු නම් දෙබෑයන් අන්‍යොන්‍ය විරුද්ධතායෙන් සටන් කරන කාලයෙහි එනම් ක්‍රිස්තු වර්ෂ 1542 දී වීර වික්‍රම නම් කුමාරයෙක් සෙංකඩගල සිරිවර්ධන පුරවරයෙහි රජ කෙළේ ය, මේ සෞගත සමයික වූ නරජ්‍යෙෂ්ඨ තෙමේ බෞද්ධාගමේ දියුණුව සඳහා සප්‍රයෝජනවත් කටයුතු රාශියක් ඉටු කර තිබේ. උහු විසින් කරවන ලද සත්කෘත්‍යයන් අතුරෙන් සමන්කුළුපව්හි සවණ සිරිපා නැමදීමට යන මඟී ජනයාගේ සුඛාරෝහණය පිණිස සත් සිය අසූවකින් යුත් සෙල්මුවා පියගැට පන්තින් කරවීමය, ක්‍රිස්තු වර්ෂ 1551 දී සත් වෙනි භුවනෙකබාහු රජ, ප්‍රතිකාල් මනුෂ්‍යයකු විසින් ආණ්ඩු විපර්යාසක ද්‍රෝහියකුගේ අනු දැනීම් ඇතිව හෝ තමාගේ නොසැලකිම් බව කරණ කොට හෝ තබන ලද වෙඩි උණ්ඩයකින් හදිසියෙන් මරුමුවට පත්බව කියා තිබේ. මේ රජහට වන් අවාසනාවන්ත මරණය ගැන සාමාන්‍ය සිංහල ජනයා තුළ ප්‍රතිකාලුන් කෙරෙහි පැවති සැකය දෙගුණ වීමෙන් ඔවුන් කෙරෙහි පැවති විශ්වාස ස්වභාවය ක්‍රමයෙන් ක්ලිෂ්ටවීම නිසා ඔවුන්ගෙන් පලි ගැනීම පිණිස සිහලුන් තුළ සිත් නතු වූහ.

භුවනෙකබාහු රජුගේ අභාවයෙන් ස්වකීය මුනුබුරුවූ දොන් ජුවන් යන අපර නාමයකින් බව්තිස්ම කරනු ලැබ සිටි ධර්මපාල කුමාරයා ප්‍රතිකාලුන් විසින් කෝට්ටේ රජකමට පත් කරන ලද්දේ ය. බාල්‍යයෙහි සිටි ධර්මපාල කුමාරයා වෙනුවට රාජ්‍යාණ්ඩු බලය උහු පිය වූ විදීය බණ්ඩාර හට පවරන ලදී. රාජ්‍යලෝභයෙන් විසූ මායා දුන්නේ සිය සොහොවුරාණන්ගේ අභාවප්‍රාප්තිය සැළ වූ වහාම සීතාවක සිට බොල්ලැගල දක්වා ගමනය කොට, තමන් රජමෙන් පිළි ගන්නා ලෙස සිංහල

Non-Commercial Distribution

රදලවරුන්ගෙන් ඉල්ලා සිටියේය, ඊට රදලවරු ඒකමතික නොවූයේ හෙතෙමේ කැළණිගඟ අපරතීරයට පැමිණ එහි සිට රාජධානියට පහරදීමට තර්ජන කෙළේ ය. මේ බව දැනගත් වීදිය බණ්ඩාර තෙමේ යුද්ධ සේනා සමාපන්නව ආගමනය කොට මායාදුන්නේ පලවා හරින ලද්දේ ය. ක්‍රිස්තු වර්ෂ 1551 ඔක්තෝම්බර් මස මූලභාගයේ දී, මෙයට පෙර කිසි කලක නොපැමිණි තරම් අති විශාල යුද්ධ භට සමූහයක් කැටුව නොරාන්හා නම් ප්‍රතිකාල් යුවරජ කොළඹට ගොඩ බටුයේ ය. නොකැඳවන ලද ඔහුගේ මේ අද්භූත ප්‍රවේශයේ පරමාර්ථ වනාහි ළදරු, රජ සිය සුළුපිය මායාදුන්නේගේ දුෂ්ට උපක්‍රමයන්ගෙන් ආරක්ෂා කර ගැනීම බව ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. කාලතුවක්කු, අත් තුවක්කු හෙල්ල, ලංස, අයෝමය හිස්වැසුම්, ඊයම් උණ්ඩ යනාදී නානාවිධ සංග්‍රාමොපකරණයන්ගෙන් සමන්විත නැව් 70 ට වැඩි ගණනකින් යුත් ප්‍රබල තේජසින් යුත් ඔහුගේ නෞකා පද්ධතිය දර්ශණය කළ සිංහලයන්ගේසිත් තුළ නානා ප්‍රකර චංචල අදහස් උපන. නොබෝදිනකට අනතුරුව යුවරජු පුත්‍ර තෙමේ යුද්ධ භටයන් පන්සිය දෙනෙකුගෙන් යුක්තව කෝට්ටේ රාජධානියට ඇතුල්ව, කිසිවෙකුට කොටුවෙන් බැහැරවීමට අවකාශ නොවන නියා එහි දොරටු වල මුර කරුන් ද සිරභාරයට ගනු ලැබූහ. ඉක්බිතිව යුවරජ තෙමේ ශේෂ වූ ප්‍රතිකාලුන් සමග සිංහල රජදරුවන්ගෙන් පරම්පරාගතව අඛණ්ඩව හිමිව ආවා වූ ධණ සම්භාරය සොයන්ට පටන් ගත්තේ ය, මං පහරණ චෞරයන් බඳු විදේශික වූ මේ දුෂ්ටයන්ගේ අහංකාර ප්‍රශ්න ගැන නිසි පිළිතුරු නොදුන් සිංහල නිලධාරීන්ට ඔව්හු කටුක වූ ශාරීරික පීඩාකර තිබේ. මෙපමණකිනුදු තෘප්තියට නොපැමිණි යුවරජ තෙමේ, රාජ මාලිගයෙහි ධර්මපාල කුමාරයාගේ ගර්භගාරයට ඇතුල්ව මනාව පරීක්ෂා කරනුයේ එහි තිබූ මිල කළ නොහෙන රතු කැට, නිල් කැට, මුතුයෙන් තනවන ලද ශාරීරාභරණ හා රනින් නිමවන ලද ගෘහභාණ්ඩත් පැහැර ගෙන ගියේ ය. මේ ප්‍රතිකාල් යුවරජුගේ වස්තු ලෝභය කෙතරම් දැඩිව පැවැත්තේ දැයි යතහොත් රාජමාලිගයෙහි තිබුන ලාලාස්‍රාව භාජනයන් (පඩික්කම්) පවා ඔහු රැගෙන ගියේය. මේ කොල්ලගනු ලැබූ ධන සම්භාරයෙහි මුළු වටිනාකම රන් පගෝදි අටලක්ෂකයටත් අධික බැව් ඇතැම් ඓතිහාසිකග්‍රන්ථ කතෘවරයකු විසින් සඳහන් කර තිබේ. මේ සාහසික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් ලත් ශාපය, නැතක් කල කින් පූර්ව දිග රාෂ්ට්‍රාධිපතිකම් කළා වූ ප්‍රතිකාලුන්ගේ හිස්මත්තෙහි නිපතනයවීමෙන් ඔවුන්ගේ මෙල්ච්ඡගති ශිෂ්ටාචාර ලෝකයාගේ අවබෝධයට බෙහෙවින් ආධාරවිය. මෙයින් අනතුරුව මායා දුන්නේගේ බල විකුම් මැඩලීම පිණිස ධර්මපාල රජ වීදිය බණ්ඩාර, සෙම්බප්පෙරුමාල්, (සපුමල් කුමාරයා) ප්‍රතිකාල් යුවරජ යන මොව්හු රහස් සාකච්ඡාවක් පවත් වන ලදහ. මායා දුන්නේ අභිභවනය කරනු ලැබීමට ප්‍රතිකාල් යුවරජ පොරොන්දු වෙමින් ඒ පිළිබඳ ප්‍රතිකාලුන් විසින් දෙනු

Non-Commercial Distribution

බලන ආධාරෝපකාර වලට ප්‍රතිදානයක් වශයෙන් ධර්මපාලරජු විසින් ඔවුන්ට රන්පගෝදි දෙලක්ෂයක් දෙනලෙසද ඉන් භාගයක් සංග්‍රාමාරම්භයට ප්‍රථම එකැවර ගෙවන හැටියටත් ඉල්ලා සිටියේය, තවද යුද්ධයේ දී සීතාවක ප්‍රදේශයෙන් පැහැර ගනු ලැබූ වස්තු සියල්ලක් සිංහල ද්වීපයේ සහ පෘතු කාලයේත් රජුන් දෙදෙන අතර සහ සමයේ බෙදා ගැනීමට ද දෙපක්ෂය අතරේ ගිවිසීමක් කර ගන්නා ලදහ. මේ සමගි බන්ධන ප්‍රකාශ පත්‍රයට ධර්මපාල රජු අත්සන් තැබූණෙහිම ප්‍රතිකාල් යුව රජුට ස්වකීය වටිනා ආභරණ පවා විකුට රන් පගෝදි 80,000 ක් ගෙවීමෙන් ඔහුගේ රාජපදවියේ පරාධීනතාවය ප්‍රාඥයන්ට මනාකොට තේරුම් ගත හැකි වන්නේ ය.

යථෝක්ත ගිවිසුම් පත්‍රයට අත්සන් තබා ටික දිනකට පසු ප්‍රතිකාලූන් 3,000 ක් සහ සිංහලයෝ එපමණ ගණනක් ද සීතාවක රාජධානිය වටලෑමට පටන් ගත්හ, මුල්ලේරියාවේ වැව අසලදී ද, කඩුවෙල දී ද, අන්තිම කොට ගුරුබැව්ලේ දී ද ධර්ම පාල රජුගේ සහ ප්‍රතිකාල් යුවරජුගේත් සංග්‍රාමිකයන් හා මායාදුන්නේගේත් යුධ හමුදාව අතරේ සිද්ධ වන ලද සටන් වලින් මායාදුන්නේගේත් යුද්ධ හමුදාව අතරේ බලකොටුව අත්හැර බුලත්ගම් පත්තුවේ දෙරණයාගල ග්‍රාමයට පලාගියේය. ප්‍රතිකාල් යුව රජු විසින් සීතාවක මාලිගයෙහි වූ ද, ඒ අභිමුඛයෙහි 20,000 ක් කම්කරුන් ලවා විසිවසක් මුළුල්ලෙහි ගොඩ නගන ලද්දා වූ විචිත්‍ර කැටයමින් යුත් සෙලින් නිමි අභිරමණීය පරමෙශ්වර කෝවිල නම් පූජාභිස්ථානයෙහි පැවති මිලකළ නොහෙන තරම් වස්තු රාශියක් හස්තප්‍රාප්ත කරන ගන්නා ලදී. ඉක්බිති මායා දුන්නේ අල්වා හිරභාරයට ගැනීම පිණිස උහු පිය සමග ප්‍රතිකාල් යුද්ධ හමුදා වක් යවන ලෙස ධර්ම පාල රජ ප්‍රතිකාල් රජුගෙන් ඉල්ලා සිටියේය. එවිට යථෝක්ත අයදුම ඉෂ්ට කරනු පිණිස ධර්මපාල රජුගෙන් ලැබිය යුතු හිඟ වන්දි මුදල වූ රන්පගෝදි 20,00 ක් ප්‍රතිකාල් රජ ඉල්ළුම්කෙළේ ය. එම වන්දියෙන් මිදීමට අපොහොසත් වූ ප්‍රතිකාල් යුවනරාධිපති තෙමේ ගිවිසුමට ප්‍රතිවිරුද්ධකාරයෙන් සීතාවකින් බලාත්කාරයෙන් ගනු ලැබූ වස්තු සියල්ලක් තමන් පමණක් හිමිනර ගෙන සීතාව නගරය පවා ගින්නෙන් දවා, සිය සෙන් සමග පෙරලා කෝට්ටෙට ගියේ ය, මෙයින් අනතුරුව ප්‍රතිකාල් භේවායෝ, ග්‍රන්ථාරූඪයෙහි උචිත නොවන නියා ආචාරශිල සිමොල්ලංඝනය කොට අහිංසක සිංහල ස්ත්‍රී පුරුෂයන්ට අනාගතයෙහි ශිෂ්ට මනුෂ්‍යයන් අබිමුවෙහි ප්‍රකාශ කරනු නොපොහොසත්වනු පරිද්දෙන් අනේක විධ වදබන්ධනයන් කරන්ට පටන් ගත්තෝ ය, එපමණකුදු නොව සුසිල්වත් කුලාංගනාවන්ගේ කුලශිලතාවය ඔවුන් විසින් කලිෂ්ට කරන ලදී. සිය සැමියන් මරා දමා ස්වකීය භාර්‍යාවන්ගේ කුණ්ඩලාභරණ සහ හස්තාභරණත් ඔව්හු කොල්ල කෑවෝ ය, මේ සාහසික ක්‍රියා ගැන අධික කෝපයට පත් වූ වීදිය බණ්ඩාර

Non-Commercial Distribution

කිසිවක් කර ගත නොහී නාගරිකයන් සමග නගරය අත් හැර යෑමට කුමන්ත්‍රණය කෙළේ ය. මේ කුමණ්ත්‍රණය දැන ගත් ප්‍රතිකාල් යුවරජ තෙමේ ඒ අදහසට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කෙළේ ය. එහෙත් වීදිය බණ්ඩාර සහ ඔහුගේ ප්‍රධාන වල්ලභයෝ කීපදෙනෙක් කෝට්ටය අත්හැර පලා ගියෝ ය. මෙ සමයේ දී ධර්මපාල රජුගේ සුළුපිය වූ සෙම්බගප්පෙරුමාල් තෙමේ සෙනෙවිරත්න මුදියාන්සේ යන නාමයෙන් සිංහල ද්වීපය ආණ්ඩු කෙළේ ය. සිංහලයන් පිළිබඳ කරනු ලැබූ මේ නිර්ලජ්ජක නින්දිත ක්‍රියා අරබයා කිසි පැකිලීමක් නොමැති ප්‍රතිකාල් යුවරජ තෙමේ මීළඟට ධර්මපාල රජු ක්‍රිස්තු භක්තියට හරවා ගැනීමට ප්‍රොත්සාහීවිය. භය සුළු පුරුෂයෙක් වූ ධර්මපාල රජ තෙමේ එම අයිෂ්ට යෝජනාව ගැන සතුටු නොවූයේ තමාගේ අවාසනාවන්ත ප්‍රයත්තයෙන් නිදහස් වනු පිණිස උහුගේ මුත්තනුවන් වූ භුවනෙකබාහු රජුගේ ළදරු කුමාරයෙක් ක්‍රිස්තියානි කර ගැනීම සඳහා ප්‍රතිකාල් යුවරජුට භාර දුන්නේ ය. ව්‍යාජ ව්‍යායාමෙන් යුත් ප්‍රතිකාල් යුවරජ තෙමේ යථෝක්ත ගිවිසුම් පත්‍රයට අතිශය ප්‍රතිපක්ෂ ලෙස නැවත නැවතුදු රන් පගෝඩි 20,000 සිංහල රජුගෙන් බලකොට ඉල්ලා සිටින්ට වන. එය ගෙවිය නොහැකි වූයෙන් ඊට ඇපකරුවෙකු මෙන් රජුගේ සුළු පියා වූ සෙම්බහප්පෙරුමාල් නමැති එවකට රජු වෙනුවෙන් සිංහල ද්වීපය ආණ්ඩු කළ තැනැත්තා ප්‍රතිකාල් යුවරජු විසින් හිරභාරයට ගෙන හිඟ මුදල ගෙවන තුරු ඔහු පෘතුගාලයේ නවතනු ලබන්ට නියම කරන ලදී. මේ නියමයට භය වූ ආණ්ඩුකාර තෙමේ තමාගේ සවර්ණමය ඔට්ටුකච්චිය නම් වූ බඳවෙළුම විකුට රන් පගෝඩි 500 ක් ගෙවා ඉතිරි මුදල අවුරුද්දක් ඇතුළත ගෙවන හැටිට පොරොන්දු පත්‍රයක් දුන්නේ ය. මෙයින් අනතුරුව කොල්ලකෑමේ වැඩේ මින් ඔබ්බට ගෙනයා නෙහෙන බව ප්‍රත්‍යක්ෂ කළ ගෝවේ ප්‍රතිකාල් යුවරජ තෙමේ ප්‍රතිකාලුන් හා සම්බන්ධ ලංකා ඉතිහාසයේ සාධුජනයන් විසින් අතිශය ප්‍රතිකූල කරනු ලැබූ අවශාන පරිච්ඡේදය සම්පූර්ණ කොට අති රමණීය ශ්‍රී ලංකාඞ්ගනාවගේ ස්වාමිභාවය ත්‍යක්ත කිරිමට සිද්ද කරන ලද්දේ ය.

ක්‍රිස්තු වර්ෂ 1597 දී ධර්මපාල රජු ජන්මාන්තර ගත වූයෙන් උහු මුත්තනු වූ භුවනෙකබාහු රජුගේ බෑවූ මායා දුන්නේ සමතිස් වසක් සීතාවක රාජ්‍ය ශ්‍රීවින්දනය කොට වර්ෂ 1581 දී ආයුෂ ක්ෂයට පැමිණියේ ය, මේ මරණය වනාහි රාජ්‍යලෝභයෙන් කල් යැවූ ස්වකීය පුත්‍ර ටිකිරි බණ්ඩාරගේ ද්‍රෝහානුඥායෙන් සිද්ධ කරන ලදැයි සාමාන්‍ය මතය වූහ. මායාදුන්නේ ගේ මරණින් පසු ටිකිරි බණ්ඩාර පළමුවෙනි රාජසිංහ යන නාමයෙන් සීතාවක සිංහාසනාරූඪ විය, මායාදුන්නේ ගේ මරණය දැන ගත් ධර්ම පාල රජු හා ප්‍රතිකාල් හු සීතාවක ප්‍රදේශය යටත් කර ගන්නා අභිප්‍රායෙන් රාජසිංහට විරුද්ධව සංග්‍රාමාරම්භ කරනු සඳහා බලවත් යුද්ධ සේනාවක්

Non-Commercial Distribution

පිටත් කර යැවූහ. ක්‍රිස්තු වර්ෂ 1592 දී යථෝක්ත යුද්ධ සේනාව හා රාජසිංහගේ යුද්ධ හමුදාවත් අතර මුල්ලේරියාවේදී අති භයානක සටනක් සිදු විය. මේ සටනේ දී ජීවිතක්ෂයට පමුණු වන ලද ප්‍රතිකාල් සෙබලුන්ගේ ලෙයින් මුල්ලේරියා වෙල පිරී ගියේ යයි කියා තිබේ. ලංකා ඉතිහාසයේ සඳහන් වන සංවේදී ජනක අති ඝෝරවූ සංග්‍රාමය මෙයයි. පිළිගත හැකි වන්නේ ය, මේ යුද්ධයෙන් සම්පූර්ණ ජයශ්‍රීය රාජසිංහ රජු හට අත්විමෙන් ඔහු විසින් කෝට්ටේ රාජධානිය ද හස්ත ප්‍රාප්ත කර ගන්නා ලදී. මේ කාලයේ ධර්මපාල රජ කෝට්ටෙන් පලා ගොස් කොළඹ කොටුවට වැදී ප්‍රතිකාලුන්ගේ ආරක්ෂාව ඇතිව විසීය. කල්යෑමෙන් රාජසිංහ රජු සෙංඛඩගල නුවර රජ කළ ජයවීර රජු පලවා හැර මධ්‍යම පළාතද යටත් කර ගත්තේ ය. ජයවීර රජු ඔහුගේ දියණිය සමග ප්‍රතිකාලුන්ගේ ආරක්ෂා සහිතව මන්නාරමේ වාසය කෙළේ ය. එහිදී ඔහු ද ඔහුගේ දියණිය ද දොන් පිලිප් හා දෝන කතිරිනා යන නම් වලින් බව්තිස්ම ලැබ ක්‍රිස්තියානි ආගම වැලඳ ගත්තේ ය. නොබෝ කලකට පසු ජයවීර රජු තම දියණියන් වූ දෝන කත්‍රිනා නම් තැනැත්තිය සම්පූර්ණයෙන්ම ප්‍රතිකාලුන්ගේ ආරක්ෂාවට භාර දී මෙළේ ය.

ප්‍රතිකාලුන්ගේ බලය මූලෝඡ්ඡේදනය කොට ලංකා රාජ්‍යයෙන් ඔවුන් නෙරපා හැරීම රාජසිංහ රජුගේ පරමා ධ්‍යාසය විය, මේ අදහස මුදුන් පත් කර ගැනීම සඳහා යුද්ධ සේනාවක් කැටුව ගොස් කොළඹ කොටුව වටලෑවේ ය. අවාසනාවකට මෙන් මේ කාලයේ උඩ රට කැරැල්ලක් හෙවත් පොදු සමාදානය කඩ කිරීමේ කලහයක් පවත්නා බැව් රාජසිංහ රජහට දැන ගන්ට ලැබී කොළඹ කොටුව බිඳ හෙලීමේ කෘත්‍ය කල් දමා සෙංකඩ ගල නුවරට යුහුව ගමන් කොට කැරැල්ල මැඩ පැවැත්වූයේ ය, මේ කලහයේ ප්‍රධානයෙකැයි සැකකැනු ලැබූ සුන්දර බණ්ඩාර නම් කුමාරයා රාජසිංහ රජු විසින් තම දූතයන් ලවා උපක්‍රමයකින් බොරු වළක හෙලා ජීවිතක්ෂයට පමුණුවන ලදී. ද්‍රෝහි ආකාරයෙන් මරණයට පමුණු වන ලද සුන්දර බණ්ඩාරගේ ලේවල පලිය ගැනීම පිණිස ඔහුගේ පුත්‍රයෙක් වූ කොන්නප්පු බණ්ඩාර නිශ්චය කොට ගෙන කොළඹට ගොස් දොන් ජෝන් යන නාමයෙන් බව්තිස්ම ලැබ ක්‍රිස්තියානිවී ප්‍රතිකාලුන්ගේ ආරක්ෂාව යටතේ සිටියේ ය. බුද්ධාගමේ ප්‍රකාශිත අන්දමට පිතෘඝාතක කර්මය වනාහි පංචානන්තර්‍ය්‍ය කර්මයට ඇතුළත් බැවින් මෙයින් මතු අත්බැව්හි සැක නොව අපායභාගීවන බැව් දැන ගත් රාසිංහ රජ තෙමේ බුද්ධාගම ප්‍රතික්ෂේප කොට ශිව භක්තිය වැළඳ ගත්තේ ය. ශිවාගම්කාරයෙක් වූ මේ රජ තෙමේ විනයාභිධර්මා දී වැදගත් ධර්ම පුස්තකයන් සහ ශාස්ත්‍රානු කුල පොත් පත් ද දවා භෂ්ම කිරීමෙන් හා භික්ෂූන් වහන්සේලාට බලවත් ලෙස හිංසා පීඩා කරවීමෙන් ද සම්බුද්ධ ශාසනය නටබුන් කරනු අදහසින් ලෙස හිංසාපීඩා

Non-Commercial Distribution

කරවීමෙන් ද කෲරතර ක්‍රියා රාශියක් කෙළේ ය. එපමණකුදු නොව සමන්තකූට පර්වත මස්තකයෙහි සුපිහිටි බෞද්ධයන්ගේ මුදුන් මල්කඩක් බඳු සර්වඥශ්‍රීපාද ලංචනය ස්ථාපිත ස්ථානය ද ඔහු විසින් ශිවවාගම්කාරයන්ගේ භාරයට පමුණුවන ලදී. මේ දුෂ්ට ක්‍රියා හේතු කොට ගෙන මේ රජහට බොහෝ සතුරෝ ඇතිවීමෙන් ඔහුගේ අභාග්‍ය කාලය ක්‍රමයෙන් උදාවෙන්ට පටන් ගත්තේ ය, රජු විසින් කරනු ලබන ගැහැට ඉවසිය නොහී උඩරැටියෝ ප්‍රතිකාලුන් කෙරෙහි පක්ෂවාදී ස්වභාවක් දක්වන්ට පටන් ගත්තාහු ය, ඒ බව දැන ගත් ප්‍රතිකාලුන් මුළු ලක්දිවම හස්ත ප්‍රාප්ත කර ගැනීමට කදිම මාර්ගයක් එළඹි බැව් දැන යුහුසුළුව කටයුතු කරන්ට පටන් ගත්තෝ ය, පළමුවෙන්ම යුද්ධ සේනාවකුදු කැටුව මැන්ඩෝසා නම් ප්‍රතිකාල් සේනාපති තැන නැවකින් යාපනයට ගොස් ඒ ප්‍රදේශය යටත් කර ගත්තේ ය, ඉක්බිති සෙංකඩගල පුරයට හෙවත් මහනුවරට ගමන් කරන්ට අදහස් කොට උඩරට වාසීන් අස්වසනු සඳහා යටකී දොන් ජෝන් කුමාරයා සහ දොන් පිලිප් යන නාමයෙන් බව්තිස්ම ලැබ සිටි සිංහල කුමාරයකුත් දූතයන් මෙන් පෙරටුව යැවීය. ඊට පසු උඩරට වැසියන්ගේ කිසිම විරුද්ධතාවයක් නැතුව සේනාපති තැන සහ ඔහුගේ සේනාවෝ මහනුවරට නිරායාසයෙන් ඇතුල් වූහ. ප්‍රතිකාල්වරු දොන් පිලිප් කුමාරයාට මහනුවර රජ කමද, දොන් ජෝන් කුමාරයාට අග්‍ර සේනාධිපති ධූරය ද භාරදී ඔවුන් දෙදෙන ප්‍රතිකාල් ජාතියෙන් විනා අන්‍ය ජාතියක ස්ත්‍රීන් සරණ පාවා නොගන්න ලෙස ගිවිස්වා ගෙන, රජසිංහ රජුගේ යුද්ධ පටිපාටිය අවුල් කර දමන ලෙස ගිවිස්වා ගෙන, ගන්නෝරුවේ කුඩාරම් ගසා ගෙන සිටියෝ ය. රාජසිංහ රජු විසින් මරවන ලද සුන්දර බණ්ඩාරගේ පුත්‍රයා වූ දොන් ජොන් කුමාරයා, දොන් පිලිප් කුමාරයාට රජකමට දිම ගැන කිපී පිලිප් රජු විෂයෙන් මරා රට වැසියන්ගේ සම්මතයෙන් රජ බවට පැමිණියේ ය.

දොන් ජෝන් විසින් කරන ලද සාහසික ක්‍රියාව ගැන අතිශය උදහස් වූ ප්‍රතිකාල්හු ඔහුට විපක්ෂ යුද්ධ කිරීම පිණිස මන්නාරමේ විසූ දොන් ජොන් ද මේලෝ නම් සෙනෙවිතැන ගෙන් සහායෝපකාර අයැද සිටියාහුය, මේ ද්‍රෝහික පුවත් දැන ගත් දොන් ජෝන් කුමාරයා ප්‍රතිකාලුන් යුහුව ස්වකීය රාජධානියෙන් පිටවී යන ලෙස අණ කෙළේ ය. එසේ පිටවී නොගියොත් ඔවුන් සියල්ලම ජීවිතක්ෂයට පමුණු වන බව දන්වා ඇරිය හෙයින් මරබියෙන් පෙළුනු ප්‍රතිකාලුන් ඔවුන්ගේ යුද්ධෝපකරණ බොහොමයක් සහ සිය සතු ඇතැම් පුද්ගලික භාණ්ඩයන් ද අත්හැර දමා

---

මේ ජාතියට පසු ජාතියෙහි (අතර සිඳීමක් නැතිව) අපායේ වැඩී විපාක දෙන මව් මැරීම, පියා මැරීම, රහතන් මැරීම, බුදුමු සිරුරු ලේ සැලීම, සංඝ භේදය යන කර්ම පසයි

Non-Commercial Distribution

වහ වහා කොළඹ නගරයට පලා ගියෝ ය. මෙසේ පලායා නොහැකි වූ සමහර ප්‍රතිකාල් භටයෝ දොන් ජෝන්ගේ පක්ෂයට එකතු වූහ.

ඉක්බිති දොන් ජෝන් පරාජයට පමුණුවා මහ නුවර රජකම ලබා ගන්නා අටියෙන් රාජසිංහ සීතාවක සිට සතර කෝරළේට යුද්ධ සේනා සම්පන්නව පැමිණියේ ය. දොන් ජෝන් ස්වකීය යුද්ධ සේනාවක් කැටුව එඩිතර ලෙස හිම වික්‍රම සම්පන්න රජුගේ අභිමුඛයට ගමන් කෙළේ ය. කඩු ගන්නාව සමීපයට එළඹ සිටි දොන් ජෝන් කුමාරයාට රාජසිංහ රජු විසින් පණිවුඩකාරයකු යවනුයේ රාජ්‍ය ලෝභයෙන් තොපගේ පියාට ලැබුණු ප්‍රතිවිපාක ස්මරණය කරවයි. කියා යැවීය, මපියාණන්ට කළ කුටිල වූ සාපරාධ ක්‍රියා ගැන පලිගනු අභිප්‍රායෙන් මෙහි පැමිණියම්හ යි, දොන් ජෝන් කුමාර තෙමේ ඊට පිළි හසුන් යැවීය. මින් පසු කඩුගන්නාව අසල බලන නම් ස්ථානයේ දී මේ දෙපක්ෂය අතරේ රෝමෝද්ගමන යවන සුලු ඉතා රෞද්‍ර සටනක් විය. රාජසිංහ රජුගේ ජන්මාන්තර ගත වීමේ ආසන්න සමයේ දී කෙරුණු මේ අන්තිම සටනෙන් ඕ භට පරාජය අත්වූයේ ය, මේ සටන කෙරෙන කාලයේ දී රාජසිංහ රජුගේ වයස විසිවස් අධික සියයක් බවත් මේ තෙමේ සටන් දවසේ රණභූමියේ අශ්වාරූඪව සිටි බවත් ඓතිහාසික ග්‍රන්ථ කර්තෘවරයන් කිහිප දෙනෙකු විසින් ප්‍රකාශ කොට තිබේ. වර්ෂ 1592 දී සිදු වූ මේ යුද්ධයෙන් ස්වල්ප දිනකට පසු රජහු පා කටුවකින් පැහරෙනු ලැබ, එයින් හටගත් දුස්සාධ්‍ය වූ ආබාධය හේතු කොට ගෙන මේ තේජෝ බල හිමවික්‍රම සම්පන්න ක්‍රෑරාධ්‍යශය ඇතියුද්ධකාමී නරවීර තෙමේ කථාශේෂභාවොපගත විය, අලගියවන්න මුකවෙටි කවීන්ද්‍රයාණන් විසින් විරචිත සැවුල් අස්නෙහි මේ රාජසිංහ රජුගේ ගුණ සන්දේශය මෙයාකාරයෙන් දක්වන ලදී.

"හරතුර රාජ විලසින් යසැති නොවිත ර
නිසිමනු රාජ කුලයෙන් පැවතෙන පව ර
රූපුපර රාජ මත ගජ බිඳි කෙසර යු ර
දිනවර රාජ සිහ නරනිඳු සඳ එපු ර"

මේ රජුගේ මෘතදේහය වැලිවිටියේ හින්ගුරමෝදර වත්ත නම් ස්ථානයේ ආදහන කරන ලද බව හා එහි තනන ලද සොහොන් කොතේ කැඩී බිඳිගිය ගල් මේදක්වාත් දකින්ට තිබෙන බවත් ශාස්ත්‍රාචාර්ය පෝල් ඊ පීරිස් මන්ත්‍රනයාණන් විසින් ලියන ලද ප්‍රතිකාල් සමය (පෝචුගීස් ඊරා) නම් වූ ග්‍රන්ථයේ සඳහන් කොට තිබේ. රාජ සිංහ රජුගේ මරණින් පසු හෙතෙමේ ගනේගොඩ දෙවියෝ නමින් දේවතාවෙක්ව ඉපිද සිටින්නේ

---

ශෛවයෝ ශිවනඩිපදම් යනු කීමෙන් ස්වර්ණ සිරිපතුල නමදිනු ලැබේ.

Non-Commercial Distribution

යයි පරම්පරානුගතව විශ්වාස කරන ග්‍රාමිකයෝ මේ දක්වාම සිටිත්. මේ දේවතාවට කැප කරන ලද ගනේගොඩ දේවාලය හාපිටිගම්කෝරළේ පිහිටුවා තිබේ.[1] රාජසිංහ යන නාමය ශ්‍රැතිමාත්‍රයකින් පමණක් සිතෙහි හටගනු ලබන භීතිය කරණ කොට ගෙන ඒ දේවතාවා මහානුභාව සම්පන්නයයි විශ්වාස කොට ඔහුට පුද පූජා පවත්වන්නෝ බොහෝ ගම් වල සිටිත්, රාජ සිංහ රජුගේ මරණින් පසු දොන් ජෝන් නමින් බව්තිස්ම ලැබ අයුතු ලෙස උඩරට අත්පත් කර ගෙන සිටි කොන්නප්පු බණ්ඩාරතුමා දේවාලගල තෙරුන්නාන්සේ ගේ ප්‍රධානත්වය පිට උඩරට වාසීන් විසින් තමන්ගේ රජුමෙන් ස්ථිරව ප්‍රකාශ කරන ලදී, ඉක්බිති හෙතෙම විමල ධර්ම සූරිය (විමල දහම් සූරිය) යන නමින් සෙංකඩගල නුවර රාජ්‍යාභිෂේකය ලැබ ක්‍රිස්තියානි භක්තිය ප්‍රසිද්ධියෙන් ප්‍රතික්ෂේප කොට නැවතත් සෞගත සමය වැළඳ ගත්තේය, රජුග් මේ චපල ක්‍රියා ගැන අධික කෝපයට පත් ප්‍රතිකාල්හු කිසිවක් කර ගත නොහි කොළඹ කොටුවට ඇතුල්ව සුසුම්ලමින් සිටියෝය, මෙයින් මඳ කලකට අනතුරුව මලක්කාවේ සිට ගෝවේට යාත්‍රාකරන නැවත් කොළඹ වරායට පැමිණියා ය. මේ යාත්‍රාවේ නාවුකාධිපති ජේදා ලෝ පැස් ද සෞසා නම් මහතා ලක්දිව සිටින ප්‍රතිකාලුන්ගේ දුක්ඛිත ස්වභාව මනාව තේරුම් ගෙන ගෝවේට ගොස් සියලු කරුණු තත් වූ පරිදි එහි ආණ්ඩුකාර තැනට සැල කොට මුළු ලක් දිව එකඡත්‍ර කොට හස්ත ප්‍රාප්ත කර ගැනීම පිළිබඳ ව්‍යාජ උපක්‍රමයක් දක්වා සිටියේ ය. නෞපතිතැනගේ යෝජනාව නම් වරත් සෙංකඩගල නුවර රජව සිටි කරව් ලියැද්දෙ බණ්ඩාර හෙවත් ජයවීර රජුගේ රූප සම්පන්න වූ දූනට මන්නාරමේ ආරක්ෂා සහිතව නවත්වා සිටින දෝන කත්‍රිනා කුමරිය සෙංකඩගල නුවර සිංහාසනයට පත්වීම ගැන එකම උඩරට සිංහල වැසියෙකුදු විරුද්ධ නොවන නිසා ඈ එසේ පත්කරනු ලැබ, ඊට පසු ඈ ප්‍රතිකාල් වංශාධිපතියෙකුට විවාහ කර දීමෙන් මුළු ලංකාරාජ්‍යය ප්‍රතිකාල්වරුන්ට ක්‍රමයෙන් යටත් කර ගත හැකි බව ය. නභොගබ්භයෙහි නිම් සවර්ණමය ප්‍රාසාදයක් බඳු මේ ව්‍යාජ යෝජනාවට එකඟ වූ ගෝවේ ආණ්ඩුකාර තෙමේ ස්වකීය මන්ත්‍රණ සභාවේ සම්මත ඇතිව දෝන කත්‍රිනා කුමරිය සෞසා නම් නැව් පතියාගේ බෑණ කෙනෙකුට විවාහ කර දෙන

---

1. මේ සොහොන් භූමියේ තිබෙන්නේ කිකිළි බිත්තර වැල්ල ඉදිරිපිට තිබෙන තොටුපලට යාර ස්වල්පයක් ඈතින් ය. එය හතර වටේ දූනට මරක්කළ මිනිහෙකුට අයිති පොල්වත්තක් තිබේ. ඊට නුදුරුව තරමක් උස කොටුතාප්පයක් හෙවත් සරක්කු වක්ද ඈතින් ගැඹුරු අගලක් ද තිබේ. සීතාවක ගඟ ගලා බසින පරිදි මේ ස්ථානයට පෙණේ. ගඟ පතුලෙහි තිබී කාලතුවක්කු උණ්ඩ ගම්වාසීහු නොයෙක් විට අවුලා ගනිත්.

රාජසිංහ රජ ගනේගොඩ දේවතාවා වී නැවත ඉපිදී සිටින්නේ යයි දේවනීතිය නම් පොතේ ද සඳහන් වේ. (ප්‍රතිකාල් සමය)

Non-Commercial Distribution

ගිවිසීමක් ඇතුව යුහුව යුද්ධ හමුදාවක් රැස් කරවා එහි සේනාපති ධූරය ඔහුට පවරා ලංකාවට පිටත් කර එව්වේය.

මේ කාලයේ දෝන කත්‍රිනා කුමරිය මන්නාරමේ ගේබ්‍රියෙල් කෝලකෝ නමැති ප්‍රතිකාල් මහතෙකුගේ ගෙදර රැකවල් සහිතව නැවතී සිටියා ය. වර්ෂ 1594 රේ අප්‍රියෙල් මාසයේ අවසාන භාගයේ දී යථෝක්ත පේද්‍රා ලෝ පැස් ද සෞසාද නම් අයගේ මහත් බලාපොරොත්තු ඇතුව ආරම්භ කරන ලද අභිනව සංග්‍රාමයේ සේනාපති තැන මෙන් සූරවීර යුද්ධ භටයන් 600 කුත් කැටුව ලක්දිවයිනට ගොඩබටුයේ ය. හෙතෙම පළමුකොට මන්නාරමේ සිටි දෝන කත්‍රිනා කුමරිය ආරක්ෂා සහිතව ගෙන්වා ඈ පෙරටු කර ගෙන මීගමුවේ සිට සෙංකඩගල නුවර දෙසට ගමන් කෙළේ ය. සංග්‍රාමික සේනා අභිමුඛයෙහි මේ කුමරියගේ සිටීම හෙළ දිව්වාසීන්ගේ විපක්ෂවාදී භාවය බෙහෙවින් යටපත් වීමට ආධාරයක් විය. යුද්ධ සේනාව ගමන් කරන මාර්ගයේ දී කුමරිය කෙරෙහි හිතෛෂී වූ ජයවීර බණ්ඩාර නමැති යුද්ධකාමී සිංහල ජනාධිපතියෙක් භේවායන් විසිදාහක් කැටුව ගොස් ප්‍රතිකාල් යුද්ධ හමුදාවට එක් වූයේ ය. බලාපොරොත්තු රහිත අවස්ථාවෙහි ලැබෙන ලද මේ උදාරතර අනු බලය ස්වා සිද්ධියෙහි පෙර නිමිත්තකැයි සැලකූ ප්‍රතිකාල් සෙනෙවි තෙමේ ඔද වැඩි ධෛර්යමත් සිතකින් වහ වහා සිය සෙබළුන් ඉදිරියට ගමන් කෙරෙව්වේ ය.

(එන්ගලන්ත ඉතිහාසයෙහි සඳහන් වූ පරිද්දෙන් එලිසබැත් රාජනියගේ ආණ්ඩු කාලයෙහි ක්‍රම ක්‍රමයෙන් එන්ගලන්තයට පහර දීමට පැමිණි අනභිභවනීයයි කල්පනා කරන ලද ස්පාඤ්ඤයේ පිලිප් රජුගේ යුද්ධ නැව් පද්ධතියට සමාන කළ හැකි) යථෝක්ත ප්‍රතිකාල් යුද්ධ සේනාව විමල ධර්ම සූරිය රජු සහ ඔහුගේ හමුදාවත් වාඩිලා සිටි බලනේ දුර්ගමාර්ගය අසලට පැමිණිය, වර්ස 1594 ක් වූ ජූලි මස 5 වෙනි දින යථෝක්ත ස්ථානයේ දී අතිශය උග්‍ර වූ බියකරු සටනක් ඇති විය. මේ සටනේ දී ප්‍රතිකාල් සෙන් බොහොමයක් සදාකාල නිශ්ශබ්ද භාවයෙන් රණ දෙරණ හොත්තාහ,

එහෙත් වැඩිදුරටත් සටන්කිරීමෙන් ජය ග්‍රහණයක් ලැබීම උගහට බැව් තේරුමගත් විමල දහම් නරනිඳු තෙමේ සෙංකඩගල නගරය ගින්නෙන් දවා ශේෂ වූ සියසෙන් සමග වෙල්ලස්ස සරස වැදිත්තුව දෙසට පලා ගියේ ය. පසුදින ප්‍රතිකාලුන් විසින් සෙංකඩගල නුවර අත් පත් කර ගන්නා ලදී. එසේ වුව ද සූන්‍යාගාරයක් බඳු ඒ පුරය දෝන කත්‍රිනා කුමරිය පදිංචි කර විමටවත් ප්‍රතිකාලුන්ගේ උවදුරු රහිත නිත්‍ය වාසභූමිය වසයෙන් ප්‍රයෝජන ගැනීමටවත් සුදුසු ප්‍රදේශයක් නොවන බැව් ඔවුන්ට අවබෝධ විය. ඉක්බිති ප්‍රතිකාල් යුද්ධ සේනාවට අතරමගදී එක්වුන ජයවීර බණ්ඩාර ද, දෝනකත්‍රිනා කුමරිය විවාහ කර ගැනීමට අතිශය ප්‍රයාස දරමින් බලාපොරොත්තුවෙන් සිටි ප්‍රතිකාල් සෙනෙවියාගේ බෑණනුවූ සම්පන්නාව

Non-Commercial Distribution

කෝ ද සිල්වා අර්තිලාඔස් මැති මහතා ද හේවා සමුද්‍ර සම්පන්නාව වෙල්ලස්ස සහ ඌව පලාතට ගමන් කළෝය. එවකට ඒ පළාතේ ආණ්ඩු කරමින් සිටි වයෝවෘද්ධ වූ ඥාතිවරයෙක් හිරහාරයට ගෙන යථොක්ත අධිපති දෙදෙන හැරී ආවෝ ය. සිංහල රජු සොයා ගැනීමට නුපුළුවන් වූ හෙයින් ඒ වෙනුවට හිරහාරයට ගත් ඔහුගේ ඇවැස්ස නෑයෙක් වූ යටකී වෘද්ධ මනුෂ්‍යයා ප්‍රතිකාලුන් විසින් ජීවිතක්ෂයට පමුණුවන ලදී. ඒ අතරතුර ප්‍රතිකාල් හේවායන් ලවා දෝන කත්‍රිනා කුමරිය ඉතා ප්‍රවේශම් සහිතන මුර කරවන ලදී. කිසිම සිංහලයෙකුට ඈ හමුවට එළඹීම තහනම් කරන ලද්දේ ය, විකල්පයෙන් කරනු ලැබූ මේ මුගෙධාපාය වනාහි හෙළදිව් දනගේ සිත් අබියස කුකුස් නිපැද්මෙහි කාණරක් විය.

සිංහල රාජධානිය කොටසින් කොටස අල්වාගනු ලබන්නේ කත්‍රිනා කුමරියගේ ප්‍රයෝජනය පිණිස නොව විදේශික රජෙකුගේ පාලනය යටතට ගැනීමට බව තේරුම්ගත් ඇතැම්හු විමල ධර්ම සූරිය රජුගේ හේවා හමුදාවට එක් වෙන්ට පටන් ගත්තෝ ය. මේ කාලයේ දෝන කත්‍රිනා කුමරිය විවාහ කර ගෙන ප්‍රතිකාල් අගරජ යටතේ ලංකා ද්වීපය ආණ්ඩු කිරීමට යෝජනා කර ගෙන සිටි ද සිල්වා මුහුදු බත් වීමෙන් ප්‍රතිකාල් සේනාපතිතැනගේ ප්‍රධාන බලාපොරොත්තුව අතුරුදහන් විය. මෙයින් අනතුරුව ඌව පළාත යටත් කර ගැනීම පිණිස යුද්ධ හමුදා වකුත් කැටුව යවන ලද ලුවී මෝරෝ නම් කප්පිත්තා එහි පදිංචිකාරයන් විසින් අල්වා විමල ධර්ම රජහට භාර දෙන ලදී. වෙල්ලස්ස පළාත ආණ්ඩු කළ ස්වකීය ඥාතිවරයා මරුමුවට පත් කරනු ලැබීමේ පලිය ගැනීම පිණිස රජු විසින් යටකී ප්‍රතිකාල් නෞපතියා මරවනු ලැබීය, පෙර යෝජනාකර තිබුන දෝන කත්‍රිනා කුමරියගේ විදේශික විවාහය බණ්ඩ වූ හෙයින් ඈ තම මස්සිනා කෙනෙකුට විවාහ කර දෙන ලෙස ජයවීර බණ්ඩාර යෝජනා කෙළේ ය. එහෙත් ප්‍රතිකාල් සෙනෙවිතැන ඊට කිසිම පිළිතුරක් නොදී ඒ ගැන කල්පනා කිරීම මතුවට කල් තැබුවේ ය.

(කුමන්ත්‍රණ සහගත රහස් ලියුම් ගනු දෙනු කිරීම ගැන සැක කොට එංගලන්ත ආණ්ඩුව විසින් සිරස්ඡේදනය කරනු ලැබූ සෙකොට්වරුන්ගේ මේරි බිසවට මෙන්) මීළඟට ජයවීර බණ්ඩාරගේ අභාග්‍ය කාලය ද අරුණෝදයෙහි මෙන් දෘශ්‍ය මානවෙන්ට වන ජයවීර බණ්ඩාර සහ විමල ධර්ම සූරිය රජු අතරේත් ගනු දෙනු කර ගන්න ලදැයි නිශ්චිත හසුන් පත් කීපයක් ප්‍රතිකාල් සෙනෙවියා ජීවිතක්ෂයට පැමිණවීම ද, ප්‍රතිකාල් කඳවුරට ගිනි තැබීම ද යනාදිය වේ, මේ කුමන්ත්‍රණය පිළිබඳ නානාප්‍රකාර මතභේද ඓතිහාසික ග්‍රන්ථ කතෲන් අතර පවති. රැබේරුගේ මතය නම් ජයවීර බණ්ඩාර තැන ඔහුගේම සහායකාර ප්‍රතිකාල් සෙනෙවියා ලවා මරවනු අභිප්‍රායෙන් විමල ධර්ම රජුගේ කුමන්ත්‍රණ පෙරදැරි උවමනාව පිට යථොක්ත රහස් ලියවිලි අමුතුවෙන් ලිපි කරවා ප්‍රතිකාලුන්ගේ අතරට පත්වනු නියා

Non-Commercial Distribution

යවන ලද්දක් බවය. ජයවීර බණ්ඩාර සහ විමල දහම් සූරිය නරනිඳුහු අතරේත් ලියුම් ගණුදෙනුවක් ඇතුව තිබීම සැබෑ නුමුත්, ද්‍රෝහවාචකයයි චෝදිත ලියුම් ගණු දෙනුවක් ඇතුව ජයවීර බණ්ඩාර අන්තරාය පමුණුවන අදහසින් ප්‍රතිකාලුන්ගේ ස්වයං කල්පිත ලිපි බැව් බෝල්ඩ් නම් ඉතිහාසකරු විසින් කියා තිබේ. මේ මිතථ්‍යාරාවයෙන් මුළා වූ ප්‍රතිකාල් සේනාපති තැන ජයවීර බණ්ඩාර කෙරෙහි සැක උපදවා තිබෙන මේ කාලයේ, ජයවීර බණ්ඩාරගේ බන්ධුවරයෙක් කන්‍යා මේරිගේ ආවේසවීමකින් කරන ලද ප්‍රකාශයක් පරිද්දෙන් ප්‍රතිකාලුන්ගේ ව්‍යාජෝපායන්ට අනුකූලව යථෝක්ත රහස් මන්ත්‍රණය එළිදරව් කරන ලද්දේ ය. ඉක්බිති ප්‍රතිකාල් සෙනෙවි තෙමේ ජයවීර බණ්ඩාර තමාගේ අභිමුඛයට කැඳවා කාරණ විභාග කොට ඔහුට කඩුවෙන් ඇන මැරීය. මේ සාහසික ක්‍රියාව කරණ කොට ගෙන සිංහල සෙනග කෝපයෙන් උපද්දිත වූ ප්‍රතිකල් කඳවුර අත්හැර විසිරී ගියෝ ය.

වර්ෂ 1594 ක් වූ ඔක්තෝබර් මස 6 වෙනි දින ප්‍රතිකාල් සේනාව බලන අසල ලන්දකට පැමිණියා ය. එකෙණෙහිම සක්හඬ ද හේවිසි ගැසීමක් ද හාත්පස්හී පැතිරින, ඒ අසල මාන බලමින් සිටි විමල ධර්ම රජුගේ විශාල යුද්ධ හමුදාව ප්‍රතිකාලුන්ට පහර දෙන්ට පටන් ගත්තී ය, සිංහලයන්ගේ ඊතල සහ වෙඩි උණ්ඩ ප්‍රචන්ඩ වාත මේඝයකින් මෙන් ප්‍රතිකාල් සෙන් මත්තෙහි පතිත වෙන්ට වන. පැය ස්වල්පයක් ඇතුළත ඉතා ටික දෙනෙක් හැර මුළු ප්‍රතිකාල් සේනාව විනාශ ප්‍රාප්ත විය. මෙයින් ජීවත්ව සිටියේ 220 ක් පමණකි. ඔවුන් සියල්ලෝ ද තුවාල ලැබ සිටි හෙයින් රණභූමියෙන් ගැලවී යාමට නොපොහොසත් වූවෝ ද සිංහලයන් විසින් හිරභාරයට ගන්නා ලදහ. මේ හිරකරුවන් අතර ප්‍රතිකාල් සෙනෙවි තෙමේ ද තුවාල අටකින් යුක්තව සිටියේ ය. මෙතෙකින් විමල ධර්ම රජුගේ ජයග්‍රහණය නිරවශේෂයෙන් මුදුන් පත් විය. කන්ද උඩරට පළාතේ ප්‍රවේණිකාරී වූ දෝන කත්‍රිනා කුමරිය ඒකනායක මුදුයන්සේ විසින් අල්වා ගන්නා ලදුව විමල ධර්ම රජහට භාර දෙන ලදී. පසුවදා අලංකාර පෙළහරකින් ඈ රාජමාලිගයට ගෙන ගොස් විමල ධර්ම සූරිය රජුගේ අග්‍රමෙහෙසිකා තනතුරෙහි තබා ගන්නා ලදී. මේ යුද්ධයෙන් පසු විමල ධර්ම රජ තෙම මුළු ලංකාවටම වාගේ අධිපති විය. මේ හේතු කොට ගෙන පැමිණි නින්දා සහිත අලාභය ගැන කිසිවක් කිරීමෙහි අපොහොසත් වූ ප්‍රතිකාල්හු කොළඹ කොටුවට වැදී උන්නෝ ය. මේ අතුර තුර විමල දහම් නරසිරු තෙමේ ස්වකීය රාජ්‍යය ආරක්ෂා කර ගනු වස් බලකොටු තුනක් ද නගරෙහි ප්‍රිය දර්ශනය ලංකාරයක් ඇති කරවනු පිණිස අභිනව රාජමාලිගාවක් සහ වෙනත් මාහැඟි ප්‍රාසාද පද්ධතියක් ද නිමවන ලද්දේ ය. මේ කර්මාන්ත කරවීමේ දී ලක්පති තෙමේ ප්‍රතිකාල් සිරකාරයන්ගෙන් වහල් මෙහෙවර ගන්නා ලදී, ටික කලකට පසු ප්‍රතිකාල් බලය ලංකාවේ නැවතත් තහවුරු කිරීම පිණිස ගෝවේ ආණ්ඩුකාර තැන විසින් බලවත්

Non-Commercial Distribution

යුද්ධ සේනාවකුත් කැටුව දෝන් ඩැරෝනිමෝ අසවේදු නම් සේනාපති තැන ලංකාවට පිටත් කර එව්වේ ය. මේ සෙනෙවි තෙමේ කොළඹට ගොඩ බැස එවකට ඇතැම් මුහුදු බඩ ප්‍රදේශ වල පැවතී කැරළි කෝලහට මැඩ පවත්වා ඒවා ස්ථිර ලෙස යටත් කරනු ලැබුවේ ය.

මුහුදු බඩ පළාත් ප්‍රතිකාලුන්ගෙන් පැහැර ගැනීමට විමල ධර්ම රජට අභිලාසයක් ඉපිද රුහුණේ බලකොටුවක් ගොඩ නගා මුර කිරීමට සීතාවක රජ්ජුරුවෝ යන නමින් ප්‍රසිද්ධ සිටි සයිමන් කොරයා සහ දෙනවක කුමාරයා වූ මායා දුන්නේ බණ්ඩාර යටංත් ශක්ති සම්පන්න සුළු යුද්ධ හමුදාවදාවක් පිටත් කර යවන ලදී, රුහුණු පළාත එවකට ප්‍රකතිකාලුන් යටතේ ප්‍රදේශ ආණ්ඩුකාරයෙක් වූ සමරකෝන්ගේ මාතර දි සාවනියට අයිතිව තිබුණේ ය. නොබෝ දිනකින් කොටුව ඉතා දෘඪමත් ලෙස ඉදි කරන ලදී. ඉක්බිති මාතර දිසාවනිය කරවන සමරකෝන් යුද්ධ පිරිසක් කැටුවවිත් කොටුව බිඳහෙලා සිංහල රජුගේ භටයන් 566 දෙනෙක් ජීවිතක්ෂයට සම්පන්න සංග්‍රාමික සූරභාවය ඇති මුලාදැනියෙක් වූ ගෝපාල මුදියන්සේ හිරභාරයට අසු විය. මේ සංග්‍රාමික සූරයා හිර බන්ධනයෙන් මුදවා ගැනීම පිණිස වන්දි පිණිස රන් පගෝදි පන්දාහක් ගෙවන බව විමල දහම් රජු ප්‍රතිකාලුන්ටදන්වා යැවූ නුමුත් ඔවුන් ඊට එකඟ නොව හිරබාරයෙහි සිටි ගෝපාල මුදියන්සේ මරා දමන ලද්දේ ය. ස්වකීය සූර වූ යුද්ද මුලා දැනි කිප දෙනෙකුගේ ජීවිත හානිය විමල ධර්ම සූරිය රජුට ඉවසිය නොහෙන තරම් බලවත් ප්‍රහාරයක් විය, ඒ කරණ කොට ගෙන ක්‍රෝධයෙන් දිලිහි ගිය ඒ නරනාථ තෙමේ තමා යටතේ හිරභාරයේ සිටි ප්‍රතිකාල් කීපදෙනෙකු ඇතකු ලවා පාගවා මැරෙව් වේ ය. කතිපය දෙනෙක් කණ් නාසා ඡේදනයෙන් විරූප කොට කොළඹට යවන ලද්දේ ය. මොවුනතුරේ ඉතා ප්‍රියදර්ශනීය දේහ ලක්ෂණ යක් ඇති මැනුයල් දියෙස් නම් මුදලි කෙනෙක් සිටියේ ය. අසවේදු ප්‍රතිකාල් සේනාපති ැන දියෙස් මුදලිඳු සමග රහසින් කුමන්ත්‍රණය කොට විමල ධර්ම රජු මැරවීමට ඝාතක සොරුන් පස් දෙනෙකු මධ්‍යම පළාතට යැවුයේ ය. එහෙත් මේ කුමන්ත්‍රණය දියෙස් මුදලි තැන විසින් රහසින් රජුට දන්වා යවන ලද බැවින් එම දෝහි සම්පන්න ඝාතක කුමන්ත්‍රණය ඉටු කර ගත නොහැකි විය. රජු මැරීමට සපැමිණි ඝාතක සොරු පස් දෙන, රාජාමාත්‍යයන් විසින් බලනේ කන්දේදී අල්වා මරවන ලදී. මරණීය රහසක් එළිදරව් කර දීමෙන් ස්වකීය ජීවිතය ආරක්ෂා කර දීම ගැන කෘතඥුපකාර ගුණ මෙනෙහි කිරීමක් වශයෙන් සියලුම සිංහල නිල වලට ශ්‍රේෂ්ඨ වූ මහමුදලි ධුරය විමල ධර්ම සූරිය නරේෂවරයාණන් විසින් පළමුවෙනි වරට මැනුයල් දියෙස් නම් මහතාට දේවා වදාරන ලදී.

මීට ප්‍රථම වරක් ප්‍රතිකාලුන් විනාශයට පැමිණී බලනේ ලන්දේදි බියකරු සටනක් අසවේදු සේනාපතිතැනගේ සහ විමල දහම් රජුගේත් සේනාවන් අතර සිදු වූයේ ය. ඒ සටනින් ද සිංහලයන්ට ජය අත්විය.

Non-Commercial Distribution

# ඕලන්දක්කාරයන්ගේ සම්ප්‍රාප්තිය.

ඕලන්දක්කාරයෝ යන නාමයෙන් ප්‍රකට වූ ලන්දේසිහු යුරෝපා මහද්වීපයට උතුරු දිග් භාගයෙන් පිහිටි වඩා විශාල නොවූ රටක වැස්සෝ ය. ඔව්හු වෙළඳාමෙහි අභිලාෂයක් ඇති පුරාණ කාලයේ පටන් හුදු යාත්‍රා කිරීමෙහි දක්ෂභාවය ගැන ප්‍රසිද්ධියක් උසුලන ධෛර්යය සම්පන්න මනුෂ්‍ය වර්ගයකි. ඔව්හු පෙර කාලයේ දී ලංකාවේ හට ගනු ලබන කුරුඳු ගම්මිරිස් ආදී කුළු ද්‍රව්‍ය සපයා ගැනීම පිණිස ප්‍රතිකාල් දේශයට යන සිරිතක් පැවති නුමුත්, වෙළඳ ඊෂ්‍යාව හේතු කොට ගෙන ප්‍රතිකාල් දේශයේ රජු විසින් ස්වකීය රට වැසියන් හා ලන්දේසීන් අතරේ වෙළඳාම් ගනු දෙනු කිරීම සම්පූර්ණයෙන් තහනම් කරන ලද්දේ ය. මේ හේතු කොට ගෙන 16 වෙනි ශත වර්ෂයේ අවසාන භාගයේ සිට ඕලන්දක්කාර වෙළෙන්දෝ සමාගමක් සෑදී ඕලන්දයේ බඩු විකිණීම පිණිස සහ පිටරට ද්‍රව්‍ය සියරට ගෙන ගොස් වෙළදාම් කිරීම පිණිසත් අදහස් කොට පෙරදිග රටවලට නැව් එවන්ට පටන් ගත්තෝ ය. පළමුවෙන් ඒ සමාගමේ නැව් ජාවා දූපත් වලට ද සපයිස් දිවයින් වලට ද චීනයට ද පමණක් ගියාහු ය. නුමුත් විමල ධර්ම රජු සෙංකඩගල නුවර ආණ්ඩු කරන කාලයෙහි එනම්, වර්ෂ 1602 මැයි මස 31 වෙනි දින ජෝරිස් වෑන් ස්පිල් බර්ජන් නමැති අද්මිරාල් කෙනෙක් (නාවුක සේනාපතියෙක්) ඕලන්ද නැව් තුනක් සමග ලංකාවට ගමන් කොට මඩකලපුව අසල නැංගුරම් ලෑවේ ය. ටික දිනක් එහි ප්‍රමාදව සිට ජූනි මස පසළොස් වෙනි දින විමල ධර්ම රජු සම්මුඛ වීම පිණිස අද්මිරාල්ගේ ලේකම් තැන සෙංකඩ ගල නුවරට පිටත් කර යන ලදී. විමල ධර්ම රජ ඒ ලේකම් තැන සතුටින් පිළිගෙන ස්වහස්ත ලේඛනාන්තර්ගත හසුන් පතක් සහ තෑගි ද අද්මිරාල් තැන වෙත ගෙන යන පිණිස ඕහට භාරදුන්නේ ය. අද්මිරාල් තැන යථොක්ත හසුන සහ තෑගිත් ලැබ අතිශයින් ප්‍රමුදිත වූයේ තෙදිනකින් අනතුරුව සෙංකඩගල නුවරට තෙමේ ගොස් රාජමාලිගයට පිවිස රජතුමා බැහැ දැක ගත්තේ ය. ඔහු කීපදිනක්ම රජතුමා සමග සාකච්ඡා පවත්වා මුහුදුබඩ කොටුවක් තනා ගන්නා පිණිස හා ස්වදේශීන් සමඟ නිදහස් පරිද්දෙන් වෙළදාම් ගනුදෙනු කිරීම පිනිස ද රජුගෙන් අවසර ලබා ගෙන රජු විසින් දෙන ලද තෑගි බෝගත් රැගෙන මඩකලපුවට හැරී ගියේ ය. ඔහු ලංකාවෙන් පිටත්වයන්ට ප්‍රථම ප්‍රතිකාලුන්ගේ නැවක් අල්වා විමල ධර්ම රජුට භාරදී ගියේ ය. ඔහු පිටත්ව ගියාට පසු නොවැම්බර් මස 28 දින සී. බෝල්ඩ් ද වාර්ඩ් නමැති උප අද්මිරාල් කෙනෙක් යටතේ තවත් ලන්දේසි නැව් කණ්ඩායමක් ලංකාවට පැමිණ පළමුවෙන්ම මඩකලපුව අසල නැංගුරම් ලාගත්තේ ය. මින් පසු වාර්ඩ් නම් මහතා රජු බැහැදැකීම පිණිස මහනුවරට පිටත්ව ගියේ ය. ප්‍රතිකාලුන් වසන කොළඹ වටලෑමට රජු ඔහුගෙන් ආධාර ඇයදි කල, ඔහුගේ මෙහෙයවරයට සුදුසු ප්‍රතිඵල

Non-Commercial Distribution

ලැබේ නම් ඔහු ආධාර දීමට සතුටු බැව් ප්‍රකාශ කෙළේ ය. බොහෝ වේලාවක් සාධු සතුටු සාමීචි කථාබස් පවත්වා ඔහු රජුගෙන් සමුගෙන යන්ට පිටත්වූ කල, රජ තෙමේ තමන්ගේ අචල වූ මිත්‍රසන්ථව වැඩි දුරටත් ස්ථිර කිරීම හඟවනු පිණිස තමන් පැලඳ සිටි රන්මාලයක් ගලවා ඒ අද්මිරාල් තැනගේ ගෙලෙහි පැලැඳ වූයේ ය.

ඉක්බිති ද වාර්ඩ් උප නාවුකාදිපති තෙමේ මඩකලපුවට විත් නැව් නැගී ඇකන් රටට ගොස් එහි රජුගෙන් නාවික යුද හමුදාවක් ලබා ගෙන විමල ධර්ම රජු විසින් රහස් ගතව ආරම්භකර තිබෙන කොළඹ කොටුව වටලෑමේ සංග්‍රාමයට මුහුදේ සිට ආධාරදීමට සැරසී මඩකලපුවට නැවතත් ළඟා වුණේ ය, ඊළඟ සතියේ ඕලන්දක්කාරයන්විසින් මඩකලපුව මුහුදු බඩ සංචාරණය කරමින් සිටි ප්‍රතිකාල් නැව් තුනක් අල්වා ගන්නාලදි. මේ නැව් ද වාර්ඩ් විසී නිදහස් කර හරින්නට යන බව සැලවී ඒ කාරණය පරික්ෂා කරනු සඳහා විමල ධර්ම රජතුමා මඩකලපුවට අසලට ගියේ ය. ලැබෙන ලද ප්‍රවෘත්තියේ පරිදි නැව් නිදහස් කර හැර තිබෙන බැව් දැනගත් රජ නොසතුටු ස්වභාවයකින් සිටින තමාගේ නැව් බලන්ට යන ලෙස රජුගෙන් බැගෑපත්ව ඉල්ලීය. රජ තෙමේ ඒ ඉල්ලීම ඉෂ්ට කරන්ට නොකැමැති බැව් හැඟවූ නමුත්, ඒ වේලෙහි මත්පැන් පිමෙන් වෙරිවී සිටි නෞපතිතැන නැව් බලන්ට එන ලෙස රජුට නැවත නැවතත් පෙරත්ත කරමින් රාජගෞරවය නොසලකා අශික්ෂිත ලෙස බස් දොඩවන්නට වන රජතුමා කෝපාගතියෙන් දිලිහෙමින් ඔය බල්ලා බැඳ දමව් කියමින් යන්ට ගියේ ය.[1] මේ වචන රජුගේ මුඛයෙන් පිටවෙනවා හා සමගම එහි සිටි රාජවල්ලභයන් හතර දෙනෙක් සහ ද වාර්ඩ් නෞපති තැන අතරේත් පොරයක් හටගැනි ඒ වල්ලභයෙකු විසින් අනින ලද කඩු පහර වැදී ද

1. රාජ මුඛයකින් නික්මෙන්නාවූ වචනවල විද ්‍යමාන ආනුභාසම්පන්න ගතිය හඟවන්නාවූ මීට සර්වප්‍රකාරයෙන්ම අනුරූප සිද්ධියක් එංගලන්ත ඉතිහාසයේ දක්නා ලැබේ. එංගලන්තය ආණ්ඩුකළ දෙවෙනි හෙන්රි රජ්ජුරුවන්ට තෝමස් බැකට් නැමැති අග්‍රාමාත්‍යයෙක් සිටියේය. රජ ඇමති දෙදෙනම තීක්ෂණ බුද්ධිමත් විචක්ෂණයෝ වූහ. මේ දෙදෙන අතර දෘඨතර මිත්‍රධර්මක්ද පැවැතීය. ඒ කාලයේ ක්‍රිස්තියානි පූජක යන්ගේ වැරදි වලට දඬුවම් කිරීමට බලය තිබුණේ බිෂොපස්වරුන්ට හෙවත් රාජ ගුරුප්‍රසාදි වරුන්ට පමණය. එකල පැවති ක්‍රිස්තුභක්තිත්‍යානුකූල නීතියේ හැටියට පූජකයකුගේ කෙතරම් වැරැද්දකට උවත් ඔහු හිරේට යවනු ලබන්ට හෝ එල්ලා මරනුලබන්ට නොහැකිව තිබුණේය. ඔහුට දිය හැකිව තිබුණු එකම බරපතල දඬුවම නම් සභාවෙන් ඔහු නෙරපා හරිනු ලැබීම පමණය. මේ කාරුණික නිදහස හේතුකොට ගෙන පූජක වරුන්ගේ අපරාධ දිනෙන් දින වර්ධනයවෙන්ට වූ නිසා ඔවුන්ට දඬුවම් පැමිණවීමේ නීතිය ප්‍රතිසංස්කරණයට හෙන්රි රජුට ඕනෑකළේය. නුමුත් ඒ කාලයේ ක්‍රිස්තියානි සභාවේ ආනුභාවය රාජබලය ඉක්මවා පැවති හෙයින්

Non-Commercial Distribution

වාර්ඩ් මැරී වැටුණේ ය. එහි සිටි රාජකීය හේවායන් විසින් ඔහුගේ පරිවාර භටයන් පණස් දෙනෙක් ද මරණ ලද්දෝ ය. ප්‍රතිකාලුන් ලංකා භූමියෙන් වඩා කලින් නෙරපා හැරීමට තිබුන ස්වර්ණමය ප්‍රස්තාවක් මද්‍යපාන සෙවීමෙන් වූ බලවත් දෝශය හේතු කොට ගෙන අන්තර්ධානවී ගිය බැවි යථොක්ත දුක්ඛ දායක සිදීයෙන් ප්‍රකාශ වනු ලැබේ. ලක් රජ තෙමේ මහනුවරට ගොස් ද වාර්ඩ්ගේ නැව් වල උප නැව්පති තැනට මෙහි පහත සඳහන් වනකාර ලියමනක් ප්‍රතිකාල් භාෂාවෙන් ලියා හැරියේය. සුරා මෙහෙරය සේවනය කරන්නා කෙසේ හොබනේ ද? දෙවියන් විසින් යුක්තිය නොපිරිහෙළද්දී තොප සමාදාන භජනයෙහි කැමැත්තෙහිද එසේවේවා, නොප සටනෙහි කැමැත්තෙහි නම් යුද්ධය වේවා. යනුයි.

මේ කාලයේ සිංහල රජු සමග යුද්ධයකට බැඳීමෙන් ලන්දේසීහු ශක්ති සම්පන්න සහ සූදානම්ව නොසිටි බැවින් ඔව්හු වාර්ඩ් මැරීම ගැන තුෂ්ණිම්භූත වූහ. විමල ධර්ම රජුගේ මරණය වර්ෂ 1604 දී සිදු විය. මේ රජ ආණ්ඩුක්‍රම සම්බන්ධ ක්‍රියා පරිපාටියෙහි තීක්ෂණ බුද්ධි සම්පන්න මධ්‍යස්ථ ගති වලින් යුත්ත ආත්ම ගෞරව ආරක්ෂා කළා වූ කාරුණික උතුමෙක් බවපෙණෙනන්ට තිබේ. ලංකාතිලක ගඩලාදෙණියෙ සහ අත්තනගල්ල නම් වූ පෞරාණික බෞද්ධ සිද්ධස්ථාන සහ මගීන්ගේ සැප විහරණයසඳහා රාජ්‍යය අවට, ආදී නරපතීන් විසින් තනවා තිබුණ ජීර්නභාවයට පත් විශ්‍රාමාවාස රාශියක් ද මේ රජු විසින් ප්‍රකෘතිමත් කරවන ලදී. නගරය වටේ උස් වූ සංග්‍රාමික ස්තම්භ 18 ක් තනවා සන වූ ප්‍රකාරයකින් එය එකිනෙකට සම්බන්ධ කරවීමෙන් සතුරු උපද්‍රවයන් ගෙන් නගරය ආරක්ෂා කිරීමේ අති වැදගත් උදාරතර සත්කෘත්‍යය දූරදර්ශී

---

රජුගේ අදහස ඉෂ්ටකර ගැනීම එතරම් පහසු නොවන බැව් ඔහට තේරුම් ගියේය. ඒ නිසා සවකීය අභිමතාර්ථය මුදුන්පත්කර ගැනීමේ අභිලාෂයෙන් එංගලන්ත සභාවේ අග්‍ර රාජගුරු පදවියට හෙවත් කැන්ටර් බැරිහි ආච් බිෂොප් ධූරයට තම හිතෛෂීයෙක් වූ තෝමස් බැකට් තුමා හෙන්රි රජු විසින් පත්කරන ලදී. බැකට් තුමා රාජමාත්‍යව සිටි කාලේ තමාගේ කෑම් බීම් ඉඳුම් හිටුම් යාම් ඊම් ආදී ඉරියව් සම්බන්ධව රජතුමාටත් වඩා අලංකෘත ස්වභාවත් දක්වා ක්‍රියා කළේය. එහෙත් එතුමා "ආච් බිෂොප්" ධූරටය පත්වූ කඩිණමින් යථොක්ත ලෞකික ප්‍රීති සැප ප්‍රතික්ෂේපකොට හුදු තාපස ලීලාවකින් කල්යවන්නට වන. නොබෝ කලෙකින් හෙන්රි රජු සහ ආච් බිෂොප් තුමා අතරේ ආරවුලක් හටගත්තේය. දෙව්ගැතියන්ගේ ඇතැම් අයිතිවාසිකම් රජු විසින් පැහැරගනු ලබන ප්‍රස්ථාවකදී බැකට් තමා රජුට විරුද්ධව පළමුවෙන්ම ක්‍රියාකල නමුත් ආදි මිත්‍රකම සිහිවී දෙවනුව තුෂ්ණිම්භූතවූයේය. පසුව තමාගේ චපල ගතිය ගැන පශ්චාත්තාප වෙමින් රජුගේ කැමැත්ත ඉෂ්ටකරගැනීමට ඉඩහැරීම ගැන පාප්තුමා ගෙන් ක්ෂමාව අයැද සිටියේය. මේ ක්‍රියාව ගැන රජ කෙතරම් උදහස්වූයේද කිවහොත් බැකට් ආච් බිෂොප්තුමාට ස්වකීය ජීවිතාරක්ෂාව සඳහා

Non-Commercial Distribution

ඥාණාන්විත මේ භූමිපල් තෙමේ පුදුමාකාරයෙන් ඉටු කෙළේ ය. මේ රජු සමය සම්බුද්ධ ශාසනයෙහි චිරස්ථිය පිළිබඳ සැලකිය යුතු උත්කෘෂ්ට කටයුතු දෙකක් සිදු වී තිබේ. එනම් ගල උඩ මහතෙරුන් වහන්සේගේ උපදෙස් පිට ශ්‍රී දන්තධාතුන් වහන්සේ කුරුවිට කෝරළේ දෙල්ගමුවේ සිට සෙංකඩගල පුරයට හෙවත් නුවරට වැමවීම සහ යුද්ධකෝලහාල කරණ කොට ගෙන ලක්දිවින් බැහරව තිබුණ සංඝයාගේ උපසම්පදාව රක්ඛංග රට සිට මෙහි වැඩමකළ නන්දිචක්ක, චන්ද්‍රවිශාල ආදී මහා ස්ථවිරයන් වහන්සේලා විසින් ක්‍රිස්තු වර්ෂ 1597 දී මහ නුවර පුෂ්පාරාම විහාරයට අයත් ගැටඹේ සීමාවේ දී ප්‍රතිෂ්ඨාපනය කිරීමත් වේ.

---

රට අතහැර පලායන්ට සිදුවූයේය. අවුරුදු හතක් මුළුල්ලෙහි එතුමා විදේශික රටවල සංචාරය කෙළේය. වර්ෂ 1170 දී ස්වකීය පුත්‍රයා රාජ්‍යාභිෂෙක කරනු ලබන්ට හෙන්රි රජුට කැමැත්තක් ඉපිද ඒ කෘත්‍යය යෝර්ක්හි ආච් බිෂොප් සහ අනිත් බිෂොප්වරු ලවාත් කරවන ලදී. ක්‍රිස්තියානි පූජක නීතියට අසහාය විරුද්ධවූ මේ ක්‍රියාව තමන්ගේ තත්ත්වයට ලඝු කොට සැලකීමකැයි කෝපයට පත් බැකට්තුමා අභිෂේක මංගල්‍යය සිද්ධකළා වූ යොක්හි ආච් බිෂොප්ට සහ අනිත් බිෂොප්වරුන්ටත් පාප්වහන්සේ ලවා දඬුවම් පැමිණෙව්වේය. ඉක්බිති රජ සමග ව්‍යාජාකාර සමාදානයක් පවත්වනු ලැබ බැකට් ආච් බිෂොප්තැන සත්වසකට පසු එංගලන්තයට හැරී අවුත් යෝක්හි ආච් බිෂොප් සහ රාජාභි ෂෙක මංගල්‍යයට සම්බන්ධවූ අවශෙෂ බිෂොප්වරුන් සභාවෙන් නෙරපා දැමුවේය. මේ කාරණය එවකට නෝර්මන්ඩි රටේ සිටි හෙන්රි රජුට ආරංචි වූ කෙණෙහිම ඔහු කෝපාග්නියෙන් දිලිහෙමින් "හදිස්සියෙන් උසස් බවට පැමුණුන මේ පූජකයාගෙන් මා නිදහස් කිරීමට මගේ පාන් අනුභවකොට ජීවත්වන කුසීතයන් එකෙක්වත් නැද්දැයි" උස් හඬින් කථා කෙළේය. මේ වචන අසා සිටි රාජවල්ලභයෝ සතර දෙනෙක් කැන්ටර් බැරිහි දෙව්මැදුරට ගොස් කඩුවලින් ඇන බැකට් ආච් ෂොප්තුමා ජීවතක්‍ෂයට පත් කෙළේය. මේ සහාසික ක්‍රියාව සැලවූ වහාම මුළු එංගලන්තවාසීහු භයින් ත්‍රස්තවූහ. මේ ක්‍රෑරතර තාපස ඝාතනයට හේතුභූතවූ තමාගේ මුඛයෙන් පිටවූ අපරීක්‍ෂාකාරී දුර්භාෂණය ගැන හෙන්රි රජ බලවත් ශෝකයට පත්වැ ඒ දුෂ්ට ක්‍රියාව සම්බන්ධව තමන්ගේ අවිහිංසා භාවය දක්වා පාප්උන්නාන්සේට පණිවිඩ පතක් යැව්වේය. එපමණකුත් නොව හෙන්රි රජ ආච් බිෂොප්තුමා මරනු ලැබූ ස්ථානයට පාවැසුම් සහ ශරීරයේ උඩ්වාංගයේ ඇඳුම කුත් නොමැතිව ගමන් කොට තමන් විසින් ඉක්මන් කමින් ප්‍රකාශකරන ලද වචන ගැන තම ප්‍රශ්චාත්තාපය අවනතව හඟවා සිටියේය.

මේ කථාශරීරයෙන් තේරුම් ගත යුත්තේ ලංකාවේ, විමල ධර්ම රජු මෙන් එංගලන්තයේ හෙන්රි රජුත් උදහස් වූ මනසකින් යුක්තව කර්කශවූ වචන ව්‍යාවහාර කරන ලද්දේ නමුත් හෙතෙම සහසික ක්‍රියා සිද්ධියෙහි අකලංකවූ බවය.

Non-Commercial Distribution

තව ද විමල ධර්ම සූර්ය නම් වූ මේ නරදේවයාණන්ට කත්‍රිනා බිසවගෙන් උපන් දරුවන්ගේ ගණිත සම්බන්ධ ඓතිහාසික කතෘවරයන් අතර ප්‍රභේද වූ මත පවතී. නුමුත් වැඩි දෙනෙකුගේ ලියවිලි වලින්ඔහුට කුමාරසිංහ, විජයපාල, සහ රාජසිංහ යන පුතුන් තිදෙනෙක් සිටි බව පෙනේ. නුමුත් ඔව්හු බාලවියෙහි පිහිටියන් බැවින් නැසී ගිය රජුගේ සොහොයුරු වූ ශ්‍රමණභූමියට ඇතුළක්ව සිටි සෙනරත් නම් අය සිවුරු හැරදමා විත් රජකමට අයිතිවාසිකම් කියා සිටියේ ය. ඊට විරුද්ධව එවකට ඌව පළාත ආණ්ඩු කළ මායා දුන්නේ නම් කුමාරයා ඉදිරියට පැමිණ රජවීමට උත්සාහ කෙළේ ය. මේ අතර කත්‍රිනා මෙහෙසි, තොමෝ ම රාජ්‍ය විචාරණයෙහි කැමතිව, ඔටුන්න ගැන අයිතිවාසිකම් කියා සිටි කුමරුවන් දෙදෙන ඈ අභිමුඛයට පැමිණෙන ලෙස අණ කළා ය. ඔව්හු බිසවුන් බැහැ දකින පිණිස මාලිගාවට එළඹ සිටින අතර හටගත් කෝපසහගත විවාද කථා හේතු කොට ගෙන සෙනරත් කුමරු විසින් ඌවේ කුමාරයාට කඩුවෙන් ඇනමරා ඉක්බිති වැන්දඹු දෝන කත්‍රිනා බිසව සරණ පාවා ගෙන මහනුවර රජ විය. ඕලන්දක්කාරයන්ට පක්ෂව හා ප්‍රතිකාලුනට විපක්ෂවන් ක්‍රියා කිරීම සෙනරත් රජුගේ ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ප්‍රතිපත්තිය විය. ඕලන්ද දේශයේ රජුවිසින් පිටත් කර එවන ලද මර්සල් දෙබොස් චෞදර් නම් තානාපතියෙක් වර්ෂ 1612 ක් වූ මාර්තු මස 8 වෙනි දින මහනුවර රජවාසලට ප්‍රවිෂ්ටව සෙනෙරත් රජහට පණිවුඩ පණතක් ඔප්පු කර සිටියේ ය. එම අවුරුද්දේ මැයි මස 11 වෙනි දින ඕලන්දයේ රජ ද සිංහල රජ ද ගිවිසුමකට බැඳුණෝ ය. මේ ගිවිසුම් පත්‍රයේ ප්‍රධාන පොරොන්දු නම්, ඕලන්දක්කාරයෝ සහ සිංහල සෙනෙග එක් පක්ෂක් වී ප්‍රතිකාලුන්ට විරුද්ධ ව සටන් කිරීම ද ත්‍රිකාණාමලේ අසල කොට්ටියාර් නම් ගමේ කොටුවක් තනා ගැනීමෙට ඕලන්දක්කාරයන්ට අවසරදීම ද, සිංහල රජු විසින් සිංහල වැසියන් සහ ඕලන්දක්කාරයන් අතරේ වෙළදාම් ගනුදෙනු නිදහස් ලෙස කර ගැනීමට ඉඩ හැරීමට යනා දිය වේ. නොබෝ කලකට පසු ඕලන්දක්කාරයෝ ගිවිසුමේ ප්‍රකාර කොට්ටියාර් නම් ගමේ කොටුවක් තනා ගත්තෝ ය. සිංහල රජු විසින් ද බෝස් චෞදර් මහතාගේ නළලේ ස්වර්ණමය ලලාටපටයක් බන්ධනය කිරීමෙන් මීගමුව වේරළ යන පටබැදි ගරු නාමය ප්‍රදානයෙන් ඔහු සිංහල ආණ්ඩුවේ උසස් තිලයකට පත් කරන ගන්නා ලදී. ප්‍රතිකාල්වරු ඕලන්දක්කාරයන් එලවා දැමීමට අදහස් ොකාට සයිමන් කොරයා නම් සෙනෙවියකු භාරේ හේවයායන් 4,00කින් යුත් සේනාවක් යවා කොටුව බිඳහෙලා යටත් කොට ගෙන එහි සිටි ඕලන්දක්කාරයන් ජීවිතක්ෂයට පමුණුවන ලදහ. එහෙත් අමරසිංහ ආච්චිල, නෛදප්පු, සහ වීරසේකර නමැති සේනාපතීන් තිදෙන යටතේ සෙනරත් රජු විසින් යවන ලද 5,000 කින් යුත් සිංහල යුද්ධ සේනාවක් ප්‍රතිකාලුන්



Non-Commercial Distribution

ලුහුබැඳ ගොස් සත්කෝරළේ දී ඔවුන්ගෙන් 600 ක් පමණ මරා බොහෝ ගණනක් හිරභාරයට ගනු ලැබූහ.

මින් පසු සෙනරත් රජ 50,000කින් පමණ යුත් විශාල යුද්ධ සේනාවක් යවා යාපනය අසලදී එහි ගමන් කරමින් සිටි ප්‍රතිකාලුන් නැවතත් පරාජය කොට පසුබස්වා එව්වේ ය එහෙත් ඔව්හු මෙම බලවත් පහරිනුදු අධෛර්ය සම්පන්න නොව ආපසු හැරී එන ගමනේ දීමීගමුවේ නැවතී එහි ඔවුන්ගේ බලය නැවතත් ප්‍රකෘතිමත් කොට එහි, ආණ්ඩුකාරයාව සිටි විජය කෝන් මුදියන්සෙගේ බිරින්ද සහ වෙනත් කීපදෙකෙනකු ද හිරභාරයට ගෙන කොළඹට පැමුණුණේ ය. මේ කාලාන්තරයේද පමණ විමල ධර්ම රජහට දාවූ දෝන කත්‍රිනා බිසවගේ වැඩුමහල් පුත්‍රයා මෙළේ ය. ස්වකීය පුත්‍රයාට රාජ්‍යය හිමි කර දෙන අටියෙන් සෙනෙරත් රජු විසින් විෂයොදා මරණය සිද්ධ කරන ලදැයි යන සැකය දෝන කත්‍රිනා බිසවගේ සිතේ ඉපිද ඒ ශෝකාගනියෙන් හටගත් රොගයින් වර්ෂ 1613 දී ඈ ජන්මාන්තර ගත වූ වාය. රූප සම්පන්න ස්වකීය මෙහෙසියගේ අභාවයෙන් වියෝග වූ රජුගේ සිත බලවත් ශෝක ජනක විපක්ෂිත ස්වභාවක පැවති නුමුත් ප්‍රතිකාලුන් හා කරන යුද්ධ නොනැවතී කර ගෙන ගියේ ය.

නැගෙනහිර පළාතේ පනාව සහ කොට්ටියාර් යන ගම් ආණ්ඩු කළ කුමරුවරු දෙදෙනෙක් ප්‍රතිකාලුන්ට පක්ෂව ක්‍රියාකරන්නෝ යයි දැනගන්ට ලැබී විභාගයක් පවත්වන පිණිස රජවාසලට පැමිණෙන ලෙස රජ තෙම ඔවුන්ට පණිවුඩ පණතක් යැව්වේ ය. කොට්ටියාර්ගම ආණ්ඩු කල කුමාරයා රජ වාසලයට විත් තමාගේ නිර්දෝෂත්වය ඔප්පු කොට ගැලවී ගියේ ය. එහෙත් පනාවේ කුමාරයා රාජාඥාව නොතකාහල බැවින් දොබොස් චෞදර් සහ බැරැටෝ නමැති ඕලන්දක්කාර සේනා පතීන් යටතේ යුද්ධ හමුදාවක් අල්වා ගෙන ඊමට යවන ලදී. 1613 ක් වූ ජනවාරි මස 1 වෙනි දින තදබල සටනක් කොට ඔහු අල්ලාගෙනන ලදුව, ඔහු රාජද්‍රෝහියකු- මෙන් නිශ්චය කොට මැද මහනුවරදී ඔහුගේ ශීර්ෂඡේදනය කරන ලදී. ඔහුට එකතුව ක්‍රියා කළ තවත් කැරළිකාරයන් කීපදෙනෙකු ඇතුන් ලවා මැඩ ජීවිතක්ෂයට පමුණුවා ඔවුන්ගේ දේපල රාජසන්තක කරනලදී. මීට මඳකලකට පසු බැරැටෝ ගේ බෑණ කෙනෙක් යටතේ සිංහල රජුගේ නැව් පංක්තියක් කොට්ටියාර් වරායෙන් පිටත්ව ගොස් මීගොමුව හලාවත සහ මන්නාරම අසල ඔබමොබ යාත්‍රා කරමින් සිටි ප්‍රතිකාලුන්ගේ නැව් කීපයක්ම අල්වාගෙන එහි සිටි ප්‍රතිකාල් යාත්‍රාකාරුවන් මුහුදේ ගිල්වාදමා ඔවුන්ගේ ස්ත්‍රීන් පමණක් වහල් මෙහෙ ගැනීම පිණිස මෙහි ගෙන ආයේ ය. මේ කාලයේ හාරිස්පත්තුවේ හේරත් නම් දිසාපති කෙනෙක්, රජුහුගේ පුත්‍රයන් සහ ඌවේ උපරජුන් මරවන පිණිස ප්‍රතිකාලුන්ට එක් වී කුමන්ත්‍රණය

Non-Commercial Distribution

කරන්නේයයි රජහට දැනගන්ට ලැබී උඩුනුවර අසලදී හේරත් දිසාපති තැන සහ ඔහුගේ පිරිවරත් ජීවිතක්ෂට පමුණුවන ලදී. එකල්හි ප්‍රතිකාලුන්ගේ මෙහෙයීම සහ ආධාරපිට සිංහල රජුට විරුද්ධව උපදවන ලද භයානක කැරැල්ලක් කරුවිය රාළ සහ මීගොමුවේරාළ යන සේනාපති දෙදෙන විසින් මැඩ පවත්වන ලදී.

වර්ෂ 1614 පමණේ දී ප්‍රතිකාල් ආණ්ඩුවට අයත් පළාත් අතිශය සංවේගජනක ස්වභාවක පැවතියේය. ප්‍රතිකාල් සෙනෙවි තැනගේ ප්‍රචණ්ඩ අයුතු ක්‍රියා ගෝවේ ආණ්ඩුකාර තැනට දැන ගන්ට ලැබී ඔහු නිලයෙන් පහ කරනු ලැබ, එම වර්ෂයේ මැයි මැයි මාසයේ මැනුවෙල් මස් කරඤ්ඤස් හෝමැන් නමැති අය ඔහු වෙනුවට සේනාපති ධුරයටපත් කර එවන ලදී. මේ අභිනව දිශාපති තැන බලසම්පන්න යුද්ධ හමුදාවකුත් කැටුව 1615 ක් වූ ජනවාරි මස මූල භාගයේ දී බලන පාරේ ගම්පළට ගමන් කළේ ය. ගඟේ එපිට ඉවුරේ රැඳී වී සිටි සිංහල සේනාවෝ වෙඩි තබන්ට පටන් ගත්තෝ ය. එතරවීමට ඔරුද නොතිබුණේ ය. එදින රෑ තෙත්වූ පොළව උඩ ලැලි දමා ඊ මතු පිට හේවායන්ට නිදා ගන්ට සිදු විය. පූඩාවන් විසින් ඔවුන් සිරුරු විද ලේ උකාබීමෙන් ඔවුන්ගේ ශරීර තුවාළ වූවා ක් මෙන් ලේ වලින් ගැවසී තිබුණේ ය. පසු දින ගංතෙර තිබුන ලොකු ගස් කපා හෙලා යන්තමකට ගඟ සරස බොරු පාලමක් දමා හේවායන් සහ මාර්ගෝපකරණයත් එතරකරවන ලදී. සිංහලයෝ එලිමහන නොඑළඹ වනගත පඳුරෙන් මුවාව සිට විටින් විට ප්‍රතිකාලුන්ට වෙඩිතැබීමෙන් අනේක හිරුහැර කළාහුය, ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිකාල් සේනාව මතුරටට පැමිණියේ ය. කොරයාගේ ප්‍රධානත්වය පිට රැකවල් කරමහින් සිටි රහස් සේනාවක් ප්‍රතිකාලුන්ට පහරදුන් නමුත්, ඒ සේනාව දිසාවේ ගාර්දියේ අතපත්තු තැන විසින් තුවක්කු ගත් අත් ඇති 600 ක් සෙන් සමග විත් පසුබස්වන ලදී. ප්‍රතිකාලුහු සතියක් පමණ බදුල්ලේ නැවතී සිට එහි ගස් කොලන් ආදිය කපාහෙලා නගරයට ගිනි තබා තෙමසකට පසුසබරගමුව පාරේ මල්වාණට හැරී ආවෝ ය.

ක්‍රිස්තු වර්ෂ 1615 ක් වූ මාර්තු මස 7 වෙනි දින පළමුවෙනි වරට වාලධි තුණකින් යුත් අග්නිසම්බන්ධයක් බඳු ධූමකේතුවක් ලංකානභස්තලයෙහි අනාගතොපද්‍රව හඟවන්නාක්මෙක් උදාවූයේ ය. මීට පෙර කිසිකලක නොදුටුවිරු මේ අද්භූත දර්ශනය ලක්දිව් වැස්සන්ගේ භීතියට කාරණායක් විය. මේ ආශ්චර්යමත් තාරකාව දෘශ්‍යමානවීමෙන් පසු ලක්දිව පැතිරී යන ලද මාරක වසංගත රෝගයක් හේතු කොට ගෙන මනුෂ්‍ය තිරශ්චීන දෙකොට්ඨාශයේම සත්වයන් බලවත් ව්‍යසනයන්ට භාජන වූහ. සමුද්‍රයෙහි සහ ගංගාවයන්හි ද, ඇළ දොළවල් සහ තාටාකයන්

Non-Commercial Distribution

හිඳ වාසයකළා වූ මත්ස්‍යයෝ මැරී පාවීමෙන් ඉන් හටගන්නා ලද දුර්ගන්ධවත් විෂවායුව කෙබඳුදැයි යතහොත් මේ ශ්‍රී ලංකාද්විපය, යටගිය දවස ජනපද රෝගයෙන් පීඩිත විශාලා මහනුවර ආකාරය ග්‍රහණය කෙළේය. තව ද සිංහලයන්ගේ ශේෂව තුබූ අභාග්‍යය සම්පූර්ණවීමට මෙන් ක්‍රිස්තු වර්ෂ 1615 ක් වූ අප්‍රියෙල් මස 14 වෙනි දින අපරභාග 7 ට පමණ මේඝගර්ජනාවක් බඳු වේගවත් ගිගුරුම් සහිත භූමිකම්පාවක් ද, මෙතාක් නිරුපද්‍රැතව පැවති ආශිර්වාදලත් මේ සුරම්‍ය වූ දිවයිනෙහි සිද්ධ විය. පෘථිවිය දෑදිරීමෙන් හටගත් විවරයෙන් නික්මෙන ලද ගන්ධක ධූමය හේතු කොට ගෙන ආස්වාස ප්‍රස්වාසඟෙහි අවහිරතා ඇති බැවින් ද, පැත්තකට බරව චලනය වෙන්නා වූ ගෘහයන්හි වාසය අන්තරාය දායක නිසා ද වීථිවිල ට බැස එදවස හිස් ඒ ඒ අත දුවන්ටවන් මහලු තරුණ බාල ජනයාගේ සංඛ්‍යාව පමණ කළ නොහෙන්නේ ය. ඒ භයානක රාත්‍රියෙහි පවත්නා ලද පෘථිවිචලනය ඉවර වූ පසු, නගර කොටුපෙතෘවෙහි අපරදිග පිහිටි ප්‍රාකාරය ද ශක්ති සම්පන් ගල්පාලමක් ද, දෙසියක් පමණ ගෙවල් ද කඩා වැටී තිබෙන බව හා විකලාංගලයන් (අබ්බාගාතයන්) හා සුළු තුවාලවූවත් හැර 2,000 ක් පමණ සෙනග මරුමුවට පත් බව ද දැන ගන්ට ලැබුණේ ය. අනේක විධ දුශ්චරිතයන්හී ඇලී ගැලී වසන විදේශක වූ අතිශය කෲර අශිෂ්ට මනුෂ්‍යවර්ගයක් වන ප්‍රතිකාලුන්ගේ දෘෂ්ටානුගතී පසු පස්සේ ගමන් කිරීම ගැන කෝපයට පත් ලංකා සම්බුද්ධ ශාසනය භාර මහේශාක්‍ය දෙවිවරුන් විසින් දඬුවම් පිණිස මේ සාපය සිංහලයන් පිට වගුරු වන ලද්දේ ය යනු එකල ජීවත් ව සිටි බොහෝ ඥාණවන්ත මනුෂ්‍යයන්ගේ මතය විය.

ඉක්බිති ලංකාව සතුරු උපද්‍රවයෙන් මුලින් උපුටාලන අටියෙන් සෙනෙරත් රජු ලන්දේසින්ගෙන් උපකාර අයදිනු පිණිස දෙබෝස් චෞදර් නම් ලන්දේසි මහතා යුරෝපයට පිටත් කර හැරියේ ය. හෙතෙම ඕලන්දයට ගොස් සෙනරත් රජුගේ අමාත්‍යයකු මෙන්ද තානාපතියකු මෙන් ද පෙණී සිටි නමුත් ඔහුගේ අභිමානව පෙරටුව ක්‍රියා පටිපාටියට නොසතුටු වූ ඕලන්ද අධිපතිහු ඔහු හා කිසිම ගිවිසුමකට සම්බන්ධවීමට නොකැමතිවූහ. එවිට සෙවරී සම්බුද්ධයකින් යුත් ඒ ජනාධිපතෙමේ ඩෙන්මාර්ක් රාජ්‍යයට ගොස් එහි රජු සෙනෙරත් රජු සමග ගිවිසුමකට බැඳ ගත්තේ ය. ඉක්බිති ඩෙන්මාර්ක් රටේ රජ ගුලිගැට් නම් නෞපතියකු භාරේ නැව් පහකින් යුත් යුද්ධ සේනාවක් ලංකාවට පිටත් කර එව්වේ ය. මේ අතර ප්‍රතිකාල් උපද්‍රවයෙන්ලංකාව මුදවාදීමට මුලසිට පරමෝපකාරව සිටි පරාථිකාමීව ක්‍රියාකල දෙබොස් චෞදර් මහතා හදිසි රොගයෙක් වැළඳ සමුද්‍රතරණයෙහි ජන්මාන්තරගත විය. ඩෙන්මාර්ක් රටේ රජු විසින් පිටත් කර එවනලද

Non-Commercial Distribution

ගුලිගැට් නම් නාවුකාධිපතිතෙමේ මේ කරුණු තත් වූ පරිදි සෙනරත් රජුට දන්වා සිටිමුත් රජ තෙමේ ඊට සහභාගී වීමට නොකැමැති විය.

වර්ෂ 1623 දී කොන්සතන්තීහු ද සා නම් උතුමා දෙවෙනි වරට ලංකාවේ ආණ්ඩුකාර ධූරය ලැබ කොළඹට පැමිණියේ ය. මේ උතුමාගේ පැමිණීම හේතු කොට ගෙන ඕලන්දක්කාර ආණ්ඩුව සම්බන්ධ ලංකාවේ ප්‍රධාන කාරණ දෙකක් සිද්ධ විය. එනම් ත්‍රිකුණාමලේ සහ මඩකලපුවේත් කොටු දෙක බැඳීමවේ. ප්‍රතිකාලුන් මේ ස්ථාන දෙකේ කොටු දෙක බැඳ ගැනීමෙන් ලංකාවේ බඩු විදේශිය රටවලට පටවා යැවීමට අවකාශ නොලැබෙන බව දැනගත් සෙනරත් රජ ඊට අසතුටු වූ නුමුත් කලක් ඒ බව නොහඟවා සිටියේ ය. ප්‍රතිකාලුන්ගේ පරමාර්ථය අන්කිසි ජාතියක් සමග සිංහලයන්ගේ වෙළදාම් ගනු දෙනුකිරීම වැළැක්වීම බව සෙනරත් රජ තේරුම් ගෙන ඔවුන් හා යුද්ධ කිරීම පිණිස සේනා රැස් කෙළේ ය. සංග්‍රාමොපකරණදිය සම්පාදනය වූ කල්හි උඩරැටියෝ ප්‍රතිකාලුන්ට අයිති සමුදුරබද පළාත්වලට ගොස් අමුතුවෙන් අරගලයක් නිපදවීම පිණිස බලාත්කාරකම් පෑවෝ ය, මෙයාකාරයෙන් යුද්ධ ආරම්භ වූ කල්හි කොන්ස්ටන්ටයින් ද සා තමන් විසින් බන්දවන ලද බලකොටුවල හේවා හමුදා නවත්වා මල්වානට ගොස් සේනාවක් පිරිවරා ගෙන සෙංකඩගල නුවර දෙසට ගමන් කෙළේ ය. එහි දී ප්‍රතිකාලුන් ඉදිරියට යවන ලද දිසාපතිවරු දෙදෙන ප්‍රතිකාලුන් අභිභවනයෙහි අසමත් වූයෙන් සෙනරත් රජු ඌව දිසාවට පලා ගියේ ය. සතුරෝ සිංහල සේනා පසුපස්සෙහි ඌව දක්වා ලුහුබැද ගොස් තන්හි තන්හි ගවයන් මරා ගෙවල් ගිනි තබා රට පාලු කර නැවතත් කොළඹට හැරී ආවෝ ය.

වර්ෂ 1624 දී ද ප්‍රතිකාල් ආණ්ඩුකර තැන නැවතත් සේනාවක් රැස් කර ගෙන මධ්‍යම පළාතට ගොස් පෙර මෙන්ම රට විනාශ කෙළේ ය. මේ අවස්ථාවේ දීද සෙනරත් රජු ට ඌව පළාතට පලායාමට සිදු විය ඉක්බිති ප්‍රතිකාලුන් යාපනයෙන් එලවා දමනු පිණිස සිංහල රජු විසින් යවන ලද සේනාතොමෝ ද පරාජයට පැමිණියාය. කොන්ස්තන්තීනු දසා සැවතත් රට විනාශ කොට මල්වානට පැමිණ සිටින අතර ලක්දිවයින යුහුව යටත් කොට ගෙනලක් නරනිඳුන් රටින් නෙරණුමාන කටයුතු කරන ලෙස ගෝවේ ආණ්ඩුකාර තැන විසින් සේනාපතිතුමාට ආඥාවක් එවන ලද්දේ ය. එම නියමය සිද්ධ කිරිම උගහට වූ කරුණක් බව හා සිංහල රජු හා සමගිව සිටීමෙන් ස්වපක්ෂයට ප්‍රයෝජනයත් බව ද කොන්ස්තනක්තීනුදසාට වැටහී ගිය නුමුත් ඔහු ගෝවේ ආණ්ඩුකාරයාගේ අණ කඩ කිරීම නොකළ හැකි බැවින් හෙතෙම සෙනෙරත් රජු හා සංග්‍රාමාරම්භය පිණිස වහා වහා කටයුතු කෙළේ ය.

Non-Commercial Distribution

මේ කාලයේ දී ස්වදේශික මුදලි වරු සතර දෙනෙක් ප්‍රතිකාල් යුද්ධ හමුදාවේ නායක ස්ථානන්තර ලැබ සිටියෝ ය. මේ මුදලිවරු අතුරෙන් කුරුඳු බද්ද සම්බන්ධ මුදලි කෙනෙකුගේ පුත්‍රයෙනක් වන දෝන කොස්මෝ ව්‍ද ජ්සේකර නම් අය සංග්‍රාමයෙහිසූරයෙක් වශයෙන් රටවාසීන් විසින් පිළිගනු ලැබූ තැනැත්තෙකි. මේ මුදලි තැන පළමුවෙන්ම සතර කෝරළේ මැණික්කඩවර බලකොටුවේ අධිපතිව සිටි ඉමැනුවෙල් ද අසවේදු නම් සෙනෙවි තැන යටතේ යුද්ධ මුළාදෑනියෙක්ව සිටියේ ය. මෙයින් අනතුරුව සටන් කීපයක දී ජයග්‍රහණය ලැබීමෙන් ප්‍රසිද්ධභාවයට පැමිණ සතර කෝරළේ ජනනායක ධූරය ලැබ ප්‍රභූ ධනවතෙක් වී කොළඹ අසල මට්ටක්කුලියේ මාහැඟි ප්‍රාසාදයක් නිමවා මහත් ඓශ්වර්‍යයෙන් ආඪ්‍යව එහි වාසය කෙළේ ය. යථාවකාශ පරිද්දෙන් ප්‍රතිකාලුන්ට පහරදීමට මානබලමින් සිටි සෙනරත් රජ තෙමේ යුද්ධෝපකරණාදිය සකසා තබා සේනාවක් යවා ප්‍රතිකාල් බලය පවතින පළාත් දෙකක් විනාශ කර දැමීය.

වර්ෂ 1630 ක් වූ අගෝස්තු මාසේ දී කොන්ස්තන්තිනුදසා නම් සෙනෙවි තොමේ ප්‍රතිකාල් හේවායන් 1,500 යකින් ද ස්වදේශික සෙබළුන් 20,000 කින් ද යුත් සේනාවක් පිරිවර කොට ගෙන මධ්‍යම පළාතට පැමිණි විට, සිංහල රජු යුද්ධ කිරීමෙහි නොකැමිති වූවක් මෙන් ඌව පළාතට පලා ගියේ ය. ප්‍රතිකාල් සේනාව නගරය ගින්නෙන් දවා ඔහු පසු පස්සේ ඌව් දිශාවට ගමන් ගත්තාහු ය. සෙනරත් රජු එක් කන්දක සේනාව පිරිවරා යුද්ධයට සැරසී සිටින ලීලාවක් හඟවා ප්‍රතිකාලුන් සමීප වූ විට ඉන් ඔබ්බට ගියේ ය. ප්‍රතිකාලූහු කන්ද මුදුනේ කඳවුරු බැඳ ගත්තෝ ය. සිංහලයෝ පලා ගියේ යා යි යන අහංකාර පරවශ රාවයයක් ප්‍රතිකාල් හේවයා හමුදාව අතරේ නික්මින, මෙයින් චිත්තවිනෝදයට පත් අනාගතොපද්‍රවය ජානනය නොකළා වූ ප්‍රතිකාල් සේනාපති තැන හේවායන්ට ගමන් වීඩා සන්සිඳුවා ගන්න පිණිස එහි දෙදිනක් විශ්‍රාමගන්ට අණ කෙළේ ය. මේ වනාහි සිංහල සේනා මොනවට රැස් කිරීමෙහි අවස්ථාදායක විය. වැඩි කල් ගතවීමට ප්‍රථම හදිස්සියෙන්ම වාගේ අවට කඳුහෙල් සහ ප්‍රාපාතයන් හිද අතුරු සිදුරු නැතුව සිංහල සේනාවයෝ පෙණි සිටියෝ ය. මෙය සවස්භාගයෙහි වූ බැවින් සටන පටන්නොගත් නුමුත් මරණය පිණිස සූදානම් ව සිටීම යෙහෙකැයි කියා ප්‍රතිකාල් සෙනෙවියාට පණිවුඩයක් යැවීය. වලයාකාරයන් රැස් වී සිටි ප්‍රබල සිංහල සේනා දැකීමෙන් විෂ්මයට සහ සන්ත්‍රාසටයට පත් සෙනෙවි තෙමේ ස්වපාක්ෂික සමූහයා රැස් කරවා ඔවුන් අන්තරා දායක ස්ථානයකට පැමිණි සිටින බව මෙනෙහි කරන ලෙස අයැද සිටියේ ය. හේවායන්ට ආමන්ත්‍රණය කරමින් කොන්ස්තන්තීනු නම් සේනාපති තෙමේ ඔවුන්ට අවවාද වශයෙන් මෙසේ කීවේ ය.

Non-Commercial Distribution

පෙර නුඹලා ආත්මගරුත්වය අරබයා සටන් කළාහු ය, නුමුත් සෙටදින වනාහී ජීවනය උදෙසා යුද්ධ කළ යුතු වන්නේ ය. නුඹලා විසින් විජය ග්‍රමණයෙකි හෝ මරණය පිණිස හෝ ඒකමතිකයෙන් සූදානම්ව සිටිය යුතු වන් නාහ යි කියා මෙසේ තම සේනාවට ධෛර්ය සම්පන්න වචනයෙන් උනන්දුකරවා, තුන් දවසකට පමණ උවමනා ආම්පන්නාදිය තබා ගෙන අනිත් සියල්ල විනාශ කර දමන ලෙස අණ කෙළේය. මරබියෙන් පෙළුනා වූ හේවායෝ පාපොච්චාරණය ආදී ස්වසමයික කත්‍යීව්‍යාන්හි නියුක්ත වෙමින් එදා රෑ ගත කොළෝ ය. පසු දින උදය ප්‍රතිකාල් සේනාවෝ කන්දෙන් පහළ බසින්ට පටන් ගත්තෝ ය. එකල සිංහල මුදලිවරු හතර දෙනාගෙන් එක් කෙනක් වූ දෝන් කොස්මෝ තමාගේ සේනාව වෙන් කොට ගෙන සිංහල රජුගේ පක්ෂයට ගියේ ය. අනික් මුදලි වරු තිදෙන ද එසේම කළෝ ය. ස්වදේශික සේනාවන් ගෙන් 10 ක් පමණ හැර අනිත් සියලු දෙන රජුගේ සේනාවට බැඳුණෝ ය. මෙම යුද්ධ එදින සවස්භාගය වන තුරුම පැවැත්තේ ය පසු දින හිරු උදය වූ කලැ සටන නැවතත් පටන් ගෙනපැය ස්වල්පය කදී රණ දෙරණ ප්‍රතිකාලුන්ගෙන් හිස් විය. මළමිනී අතර ප්‍රතිකාල් සේනාපතියා වූ කොන්ස්තන්තිනු ද සාගේ මෘතදේහය ද සම්භ විය. රජු විසින් විජයසේකර මුදලිගේ වික්‍රමය ගැන අතිශයින් තුටුපහටු වූවේ තුටුපඬුරු වශයෙන් ඔහු සතර කෝරළේ දිශාපති ධූරයකට පත් කරන ලද්දේ ය. රාජකුමාරවරු මහවැලි නදී තෙර පිහිටි ප්‍රතිකාල් බලකොටු ද ග්‍රහණය කොට සතර කෝරළයට ගොස් එයින් ද ඔවුන් නෙරපාලූ හ. මෙවක් පටන් කෘෂ්ණපක්ෂයෙහි වූ චන්ද්‍රයාමෙන් ලංකාද්වීපයේ ප්‍රතිකාලුන්ට ඇතුව තිබුන බලය ක්‍රමයෙන් පිරිහෙන්ට වන. ප්‍රතිකාලුන් සමූලඝාතයෙන්ම ලංකාවෙන් පිටුහල් කරනු අදහස් කොට සෙනරත් රජ තෙමේ යුද්ධ හමුදාවක් කැටුව ගොස් කොළඹ කොටුව වටලෑවීය. එක් ප්‍රස්තාවක දී සිංහල සේනාව කොටුව අල්ලා ගනු ලැබූ නුමුත් ප්‍රතිකාලුන්ගේ එඩිතර ධෛර්‍ය්‍ය නිසා ඒ අදහස සඵල නොවී ය, ඉන්පසු සෙනරත් රජු කොළඹ සිට සැතැප්ම අටක් දුරින් කඳවුරු ලාගත්තේ ය. ප්‍රතිකාලුන්ගේ පරාජය සහ කොන්ස්තන්තීනු සෙනෙවියාගේ මරණයත් නොබෝ දවසකින්ඉන්දියාවේ ගෝවේ ප්‍රදේශාණ්ඩුකාරයාණන්ට සැලවී උහු විසින් කොචින්, මලක්කා, ගෝවේ යන ස්ථාව වලින් හේවායන් 630 දෙනෙක් එක්කර ලංකාවට පිටත් කර එවන ලද්දේ ය. ඒ අතරම ජෝර්ජ් ද අල්මේදා නම් අයෙක් ලංකාණ්ඩුකාර ධූරයට පත් කොට එවන ලද්දේ ය, අභිනව ආණ්ඩුකාර තැන වර්ෂ 1631 දී කොළඹට ගොඩ බැස ඒ කාලයේ දී ඒ අසල කඳවුරු බැඳ සිටි සිංහල සේනාව සමග සටනක් කෙළේය. ඒ යුද්ධයේ දී සිංහලයන් පරාජය පලාගිය හෙයින් ප්‍රතිකාලුන්ට කොළඹ අසල ප්‍රදේශ නැවතත් හස්ත ප්‍රාප්ත විය. ඉන් පසු අවුරුදු කීපයක්ම ප්‍රතිකාලුන් සමග සමාදානය පැවතුණේ ය සෙනරත් රජු විසින් වර්ෂයක්

Non-Commercial Distribution

පාසා ඇතුන් දෙදෙනෙක බැගිනි ප්‍රතිකාල් ආණ්ඩුවට දෙන ලෙස ඉල්ලීමක් ද කරන ලදී. එවක් පටන් අල්මේදා ගෙන් පසු ආණ්ඩුකාර ධුරය දිගු ද මේලෝ නම් මහතා පත්ව එනතුරු මේ දෙපක්ෂය අතරේ සට්ටනය මනාව හුදු සාමදානයම පැවැත්තේ ය. සෙනරත් රජ තෙමේ ඓශ්වර්ය සම්පන්න වූයේ යුද්ධකෝලහාදියෙන් පීඩිතව සමතිස්වසක් රාජ්‍ය කොට ක්‍රිස්තු වර්ෂ 1634 ජනමාන්තරගත විය.

සෙනරත් රජුගේ කථාශේෂ භාවයෙන් ඉක්බිති මහ අස්තාන නමැති ඔහුගේ බාල පුත්‍රයා දෙවෙනි රාජසිංහ යන නාමයෙන් සෙංකඩ ගල නුවර රජ විය. මේ කුමාරයාගේ උත්පත්තිය සිදු වී තිබෙන්නේ යුද්ධ කෝලාහල නිසා රජ පවුල මහියංගනයට ගොස් නැවතී සිටි අවස්ථාවක දී ය. මොහුගේ උත්පත්තිය සමග නිමිති කීපයක් පහළ වූ බව කියා තිබේ. මොහු උපන් දවසේ කණ මැදිරියකු සා කුඩා ගිනි පුපුරක් නගරයේ බස්නාහිර දිග සිට අහසේ ගමන් කරමින් විත් ක්‍රමයෙන් මහාග්නිස්බන්ධයක් වැ කොළඹ වරාය අසල පිහිටි සියලු ගොඩනැගිලි දවා භෂ්ම කළ බවට ස්වප්නයක් ප්‍රතිකාල් සේනාපති තැන විසින් දර්ශනය කරන ලද්දේ ය. තව ද අනේක දිශා භාගයෙන් ශාස්ත්‍රධාරි විචක්ෂණ ආචාර්‍ය්‍යවරයන් කැඳවා මේ කුමාරයාට එළු, පාළි, සංස්කෘත, ද්‍රාවිඩ පෘතුගීසි ආදී භාෂාවන් යුද්ධ ශිල්පාදිය ද මොනවට ප්‍රගුණ කරවා තිබේ. පිය රජහුගේ නියමය පරිදි ඌව පළාත සහ මාතලේ පළාත කුමාර සිංහ සහ විජය පාල යන රාජසිංහගේ වැඩිමහල් සහෝදරයන් දෙනොට අයිති විය. මේ රාජකීය තුන් බෑයෝ පළමු කොට හුදු සාමගි සම්පන්න භාවයෙන් කල් යැව්වාහු ය.

දෙවෙනි රාජසිංහ රජුගේ ආණ්ඩු කාලයේ මූලභාගයේ ප්‍රතිකාලුන් හා සමාදානය ඇති විය. එහෙත් මඩකලපුව භාරව සිටි ප්‍රතිකාල් මුලාදෑනි තැන, රජුගේ දිශාපති කෙනෙකු මැරූ කැරළිකරුවන් කීප දෙනෙකුට උදව් දීම ගැන රජ උදහස් විය. වර්ෂ 1636 ක් වූ සැප්තැම්බර් මස 9 වෙනි දින ප්‍රතිකාලුන් ලංකාවෙන් නෙරපාහරිනු පිණිස ආධාර ඉල්ලා පුලිකට් නගරයේ ඕලන්දක්කාර ආණ්ඩුකාරයා වෙත හසුන් පතක් රාජසිංහ රජු විසින් බ්‍රාහ්මණ ජාතික තානාපතියකු අත යවන ලදී. කොට්ටියාර් ගමේ නොහොත් මඩකලපුවේ කොටුවක් ද ප්‍රතිකාලුන් ගෙන් අල්ලා ගන්නා ලද කාලතුවක්කු ආදිය සහ මාසික යුද්ධ වියදමත් ඕලන්දක්කාරයන් දීමට රාජසිංහ රජු යථොක්ත හසුන් පතින් පොරොන්දු වූයේ ය. ලංකාවේ කුරුඳු වෙළඳාම සම්පූර්ණයෙන්ම තමන් අතට හිමිකර දෙන්නේ නම් ප්‍රතිකාලුන්ට විරුද්ධව සටන් කිරීමට සර්ව ප්‍රකාරයෙන් ආධාර දෙන බැව් පුලකට්හී ආණ්ඩුකාර තැන විසින දන්වා එවන ලදින් රාජසිංහ රජ ඊට එකහෙලා සතුටු විය. මේ රහස් සාකච්ඡාවට එකල සිටි දිගු ද මේලෝ

Non-Commercial Distribution

ප්‍රතිකාල් සේනාපති තැනට සැලවී ඔහු භීතියට පැමිණ රාජසිංහ රජු සහ විජයපාල කුමාරයාත් අතර භේදයක් හට ගැන්වීමට කල්පනා කෙළේ ය. විජයපාල කුමාරයා ප්‍රතිකාලුන්ට පක්ෂවන්නේ නම් ඔහුට ලංකාවේ සිංහාසනය අයිති කර දීමට උපස්තම්භක වන බව මේ ප්‍රයෝගකාර සේනාපති තැන කියා සිටියේ ය. එසේ වුව ද මේ සොහොවුරන් දෙදෙනා අතර භේදයක් හට නොගත්තේ ය. මීට ටික කලකට පසු සෙංකඩගල නුවර වාසය කළ ප්‍රතිකාල් වෙළඳ මහතෙක් රාජසිංහ රජුට තුෂ්ටි ප්‍රාභෘත වශයෙන් මාහැඟි අවශ්වයෙක් දානය කෙළේය. ඉන් කලකට පසු යථෝක්ත ප්‍රතිකාල් මහතා සියරටයන්ට සූදානම්ව රජුගෙන් අවසර ලබා ගන්ට ගිය කල රජ තෙමේ ඕහට මැණික් රාශියක් සහ අනර්ඝ ඇතෙක් ද පරිත්‍යාග කෙලේ ය. රජුගෙන් ලැබූ තෑගි කරණ කොට ගෙන අතිශය සතුටට පත් ප්‍රතිකාල් තැන ඇතා ද ගෙන්වා ගෙන කොළඹට පැමිණියේ ය. එකල දීගු ද මේලෝ නම් තෘෂ්ණා හරිත ආණ්ඩුකාර සෙනෙවි තැන ඉහතකී ඇතා දක ලෝභ උපදවා සිංහල රජ තෙමේ ප්‍රතිකාල් මහරජ හට වාර්ෂික පණ්ණකාර වශයෙන් ඇතුන් දෙදෙනා බැගින් දීමට ගිවිසීමක් කර තිබේ. යථොක්ත පොරොන්දුව ඉෂ්ට කරන තුරු ඒ සිලච්වට මේ ඇතා ගනිමි යි කියා ප්‍රතිකාල් මහතා ගෙන් ඇතා පැහර ගත්තේ ය. එවිට ප්‍රතිකාල් මහතා නැවතත් මහනුවරට පැමිණ මේ බව රාජසිංහ රජුට පැමිණිලි කර සිටියේ ය. රජ තෙමේ ඕහට වෙන ඇතෙක් දි හලාවතින් නැව් නැගී සිය දෙස යන ලෙස නියම කෙළේ ය.

මීට මද කලකට පසු සෙන්පති තැන විසින් මිලදී ගෙන සෙංකඩ ගල නුවරට විකිණීම පිණිස යවන ලද අනර්ඝ අශ්වයන් දෙදෙනෙක් රජුගේ ආඥාව පරිදි රාජ පුරුෂයෝ පැහැර ගත්තෝ ය. මේ වනාහි තණ්හාධික ආණ්ඩුකාරයන්ට ප්‍රතිවිපාක දානයක් වශයෙන් ඔහුගේ සිත රිදවන්ට රජු නියොවින් කරන ලද්දකි. මේ ගැන මහනුවර සිටි ප්‍රතිකාල් මන්ත්‍රීතුමා කොන්සල් තැන රජු වෙත පැමිණිලි කර සිටියේ ය. රජතුමා මීට පිළිතුරු දෙමින්, ප්‍රතිකාල් ආණ්ඩුකාර තැන කොල්ලකා ගත් ඇතා මෙහි එවූ කල්හි අශ්වයන් දෙදෙන භාර දෙනු ලැබෙත් යයි කීවේ ය.

මෙයාකාරයෙන් දන්වා යැව් විට දීගු ද මේලෝ නම් උඩඟු සිතැතිත ප්‍රතිකාල් ආණ්ඩුකාර තෙමේ ක්‍රොධාග්නියෙන් දිලිහි, තමා විසින් යවන ලද අශ්වයන් මහනුවර රජු වහාම එවනු නොලැබුවොත් තමාම ගොස් බලාත්කාරයෙන් ගෙන එන බව කියා යැවී ය. මීට රජ තෙමේ සාන්තදාන්ත ලීලායෙන් ප්‍රතිකාල් ආණ්ඩුකාර තැනගේ අශ්වයන් ඔහුමවිත් ගෙනයාම ගැන බාධාවක් නැත, කුමක් නිසාද යත් සියලු දනාටම ස්වකීය සන්තක දේපලාදිය ගැනීමට අවකාශ දීම මහනුවර පවතින නීතියක් ය, නුමුත්

Non-Commercial Distribution

අශ්වයන් මෙහි ගෙනයන්ට එන විට අණ්ඩුකාර තැන විසින් කොල්ල ගනු ලැබූ ඇතා ද ගෙන එන්ට ඕනෑ ය යි කියා ැවී ය. මේ හේතු කොට ගෙන නිපන් ප්‍රතිකාල් මනුෂ්‍යන්ගේ හාස්‍යය නිසා හටගත් ලැජ්ජාව ද, අශ්වයන් දෙදෙනා නැතිවීමෙන්සිදු වූ අලාභය ද දියෝගු ද මේලෝ නම් අණ්ඩුකාරය දරා ගත නොහී රාජසිංහ රජුට විරුද්ධව යුද්ධයක් ආරම්භ කෙලේ ය. හෙතෙම ප්‍රතිකාල් හේවායන් 700 ක් හා හේවාපන්න කාරයන් 28000 ක් ද සමග සෙංකඩගල නුවර දෙසට ගමන් කෙළේ ය. මේ බව දැන ගත් ඌව පළාතේ කුමාරසිංහ රජු ද රාජසිංහ රජුට උපස්තම්භක වනු පිණිස හේවායන් 10000 ක් විසින් පිරිවරන ලදුව එළඹ සිටියේ ය; ප්‍රතිකාල් සේනාව බලනේ කන්ද මුදුනේ කඳවුරු බැන්දෙ ය. එවිට රාංසිංහ රජ දේවගැතියකු අත කුරුසියක් දී මෙබඳු පණිවිඩයක් දිගු ද මේලෝ නම් සේනාපති තැන වෙත යැවී ය. නුඹ අදහන්නා වූ නුඹ නිසා කුරුසිය මත්තෙහි ජීවිතදානය කලා වූ නුඹේ දෙවියන් වහන්සේ සෙංකඩගල රජුගේ රාජ්‍යයට නුඹේ එලඹීම එපාකරන්නේ ය. නුඹ ආපසු හැරී නොගියහොත් නුඹේම දෙවියෝ නුඹට දඬුවම් කරත් ය" යනුයි. මේ පණිවිඩය ලත් සේනාපති තෙමේ දණ්ඩකින් පහරන ලද ආශිර්විෂයකු පරිද්දෙන් කිපී සේනාව ගෙන කන්දෙන් පහළට බැස ඒ අසල දොළක් සමීපයට එළඹියේ ය. එ කල සිංහලයන් විසින් හාත්පස වනාන්තරයේ පිහිටි රුක්ෂයන් කපා හෙළීමෙන් ප්‍රතිකාලුනගේ ගමන සම්පූර්ණයෙන් අවහිර කරන ලදී. සිංහල සේනාවන් වනයේ වලයාකාරයෙන් සැදී සිටගත් ක්‍ෂණයෙන් සිංහලයන්ගේ සියුම් ඊසැර ප්‍රහාරයෝ දස දිගින් වර්‍ෂා නිපතනයක් මෙන් ප්‍රතිකාලුන්ට වදින්ට වන. ප්‍රතිකාල් සෙනෙවිතැන මේ භයානක මොහොතේ දී ස්වකීය සේනාවන් බේරාගැනීමට අදහස් කොට සමාදානයක් පවත්වන මෙන් අයැද රාජංසිංහ රජු වෙත ෆර්ඥාඞ්ද මැන්ඩෝසා නම් අය අත පණිවුඩයක් යවන ලද්දේ ය; නුමුත් රජ තෙමෙ ඒ ගැන නිශ්ශබ්ද වී යුද්ධ නො නවත්තාම කර ගෙන ගියේ ය. සන්දේශහාරක තැන විජයපාල විසින් හිරභාරයට ගනු ලැබීය. යුද්ධ අවසාන වූ විට තිස්තුන්දෙනෙක් හැර අනිත් සියලුම ප්‍රතිකාල් හටයෝ රණභූමියෙහි මැරී සිටියෝ ය. මේ සංග්‍රාමයේ දී ප්‍රතිකාල් සෙනෙවි තැන ද ජීවිතක්ෂයට පැමිණි නුමුත් ඔහුගේ මෘත දේහය සොයා ගත නොහැකි විය; නුමුත් ඔහුගේ කඩුව සම්භ වී එය රජු විසින් අයිති කර ගන්නා ලදී. මේ භයානක සංග්‍රමාය වනාහි ගන්නෝරුවේ යුද්ධය යන නමින් ප්‍රකට විය. ජීවග්‍රහයෙන් හිරභාරයට ගනු ලැබූ ප්‍රතිකාල් හේවායෝ ඌවට ගෙනයන ලද්දෝය. මෙයින් මදකලකට පසු රාජසිංහ රජුගේ අවසර නොමැතිව ඌව පළාත ආණ්ඩු කළ ඔහුගේ සහෝදර කුමාරසිංහ විසින් ප්‍රතිකාල් හිරකරුවෝ රහසින් මුදාරින ලද්දෝය; නුමුත් රාසිංහ රජු විසින් එයින් 18 දෙනෙක් ගමන් මාර්ගයේ දී අල්වා ජීවිතක්ෂයට පමුණුවන ලදහ. මේ හිතුවක්කාර ක්‍රියාව ගැන රජ තෙමේ විෂ්මිත කුමාර සිංහ කෙරෙහි

Non-Commercial Distribution

සැක උපදවා ඔහුට දඬුවම් කිරීම පිණිස යුද්ධ සේනා සම්පන්නව ඌව පළාතට ගියේ ය. රාජසිංහ රජුගේ ගමන කුමාරසිංහට සැලවී ඔහු භයින් තැති ගෙන ඌව අත්හැර කොළඹට පලා ගොස් ප්‍රතිකාලුන් ගෙන් පිහිට අයැද සිටියේ ය. තමන්ගෙන් පිහිට ඉල්ලා එන්නට පිහිටවීම යුතුකමකැයි කියා ප්‍රතිකාල් සෙනෙවි තෙමේ ඒ කුමාරයා පෘතුගලායේ අගනුවර වූ ලිස්බන් නගරයට පිටත් කර යැවී ය. සිංහල රාජධානිය අත්පත් කර ගන්නා අටියෙන් කුමාරසිංහ ලිස්බන් නුවර දී ක්‍රිස්තු භක්තිය වැළඳ ගෙන බව්තිස්ම ලැබුවේ ය. එසේ ද වුවත් මේ අවාසනාවන්ත කුමාරයා අවුරුදු කිපයක් එහි ජීවත්ව සිට ඔවුන්ගෙන් කිසි පිහිටක් නොලැබ ස්වකීය අභිමතාර්ථය මස්තක ප්‍රාප්ත නොවීම ජනමාන්තර ගත විය.

ලංකාවේ ප්‍රතිකාලුන් විසීමෙන් නිතර අරගල ඇති වන බැවින් ඔවුන් සම්පූර්ණයෙන් පිටිවහල් කිරීමට අදහස් කොට රාජසිංහ රජ තෙමේ ඕලන්දක්කාරයන්ගෙන් උපකාර අයැද බෙතාවියේ ආණ්ඩුකාරයාණන්ට හසුන්පතක් යැවී ය. මේ ගැන සාකච්ඡා කිරීමට ඕලන්දක්කාරයෝ මහනුවරට තානාපතීන් එවූහ. ඉක්බිති ප්‍රතිකාලුන් ලංකා භූමියෙන් නෙරපාලීමට රජුට සහයකාර වශයෙන් ඕලන්ද යුද්ධ සේනාවක් එවීමට ද ඒ සඳහා උවමනා වියදම් රාජසිංහ රජු විසින් කරන්ට ද දෙපක්ෂය එකඟව ගිවිසුමක් කර ගන්නා ලද්දේ ය. මෙය හැර ප්‍රතිකාලුන්ගෙන් අල්වා ගනු ලබන බලකොටු රාජසිහ රජුට භාර දෙන ලෙස ද, ලංකාවේ වෙළදාම් කිරීමට ඕලන්දයන්ට විනා අවශේෂ යුරෝපීය ජාතියකට අවසර නොදෙන ලෙස ද වැඩිදුරටත් කරුණු එම ගිවිසුම්පත්‍රයේ අන්තර්ගත වුහ. මෙසේ දෙපක්ෂයෙම එක්මතිකව යථොක්ත ගිවිසුම් පත්‍රය ලියා අත්සන් කළපසු ඕලන්ද තානාපතීහු ලංකාවෙන් පිටත්ව ගියා හ.

යටකී ගිවිසුමේ ප්‍රකාර වර්ෂ 1639 දී වැස්ට්ලර් වෝල්ඩ් නම් ඕලන්ද නාවික ප්‍රධාන වූ අද්මිරාල් තැන ලංකාවට විත් පළමුවෙන් මඩකලපුව අල්වා ගත්තේ ය. ඉන් පසු එතුමා ප්‍රතිකලුන්ගේ ත්‍රිකුණාමලේ කොටුව වටලෑවේ ය. කොටු ව තුල සිටි ප්‍රතිකාල්හු හේවායෝ පණස් දෙන ඉතා නිර්භීත ලෙස ද දක්ෂ ලෙස ද ක්‍රියා කළාහුය; නුමුත් විසිතුන් දෙනෙක් ජීවිතක්ෂයට පැමිණියායින් පසු ප්‍රතිකාල්හු සිය කැමැත්තෙන් කොටුව ඕලන්දක්කාරයන්ට භාරදුන්හ. වර්ෂ 1640 දී ඕලන්දයන් විසින්ම මීගොමුව සහ ගාල්ලත් අත්පත් කර ගන්නාලදී.

ලිස්බන් නුවරදී කාලක්‍රියා කළ තම සහෝදර කුමාරසිංහ කුමාරයාට අයිතිව තිබුන ඌව පළාත තම අනිත් සහෝදර වූ මාතලේ විජයපාලකුමාරයා සමග සම ලෙස බෙදා නොගෙන රාජසිංහ රජු හුදකලාව අත්පත් කර

Non-Commercial Distribution

ගැනීම ගැන දෙබෑයන් අතර අරෝවක් ඇති විය. විජයපාල කුමාරයා සෙනඟ 8000 කුත් කැටුවවිත් රාජසිංහ රජුට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කෙළේ ය. එහෙත් හෙතෙමේ අන්තිමයේ දී යුද්ධයේ දී පැරද රාසිංහ රජු විසින් හිරභාරයට ගනු ලැබී ය.

මුළු ලංකා ද්වීපය හස්ත ප්‍රාප්ත කර ගැනිමට නානාප්‍රකාර ශඨප්‍රයෝග යොදමින් සිටි ප්‍රතිකාල් සහ ඕලන්ද යන මනුෂ්‍ය දෙවර්ග අතර වර්ෂ 1646 දී සාමදානයක් පවත්වන ලදුව යුද්ධ කලක් අත්හිටවා තිබුණේ ය. මේ කාලයේ මීගොමුවේ සිටි ඕලන්ද අධිපතීන් විසින් රාජසිංහ රජුගේ හිලෑ ඇතුන් කීපදෙනෙක් සඟවා ගන්නා ලද හ. මේ බලාත්කාර ක්‍රියාව ගැන අධික කෝපයට පත් රජ තෙමේ සත්කෝරළේ නැවතී සිටි ඕලන්දක්කාර හේවාකණ්ඩායමකට පහරදී එහි ප්‍රධාන මුළාදෑනියා හිරභාරයට ගෙන ඔහුගේ හිස සිඳ මල්ලකලා මීගොමුවේ නැවතී සිටි ඕලන්ද ප්‍රධානීන් වෙත යැවී ය. මේ අතරම ඕලන්දක්කාර මිනිසුන් 688 දෙනෙක් සිරකරුවන් මෙන් මහනුවර පළාතට පිටත් කර හැරී යේ ය. ඕලන්දක්කාරයේ රජහුගේ උදහස සහනය කරවා ගැනීමට අනේක උත්සාහ දැරුවෝ ය. රාජසිංහ මේ කාලයේ ඕලන්දක්කාරයන්ගේ අවංක භාවය ගැන තදින් සැක කරන්ට පටන් ගෙන ඔවුන් කෙරෙහි බලවත් අසතුටු ස්වභාවයක් ප්‍රකාශ කෙළේ ය. රජ තෙමේ, ප්‍රතිකාලුන්ට පක්ෂවීම වඩා යහපත් නොවේදැයි යන කල්පණාවෙන් කලක් මධ්‍යස්ථ ස්වභාවයෙන් සිටියේ ය. ඕලන්දක්කාරයන්ගේ පරමාර්ථය ප්‍රතිකාලුන් ලක්දිවින් පලවා හැර ඔවුන් ගෙන් අල්ලා ගනු ලබන බලකොටු සියල්ල සිංහල රජුට භාරදී සිය රටට යෑම බවද, රට අත්පත් කර ගන්නා කිසිම අදහසක් නැතිබව ද මාත්සූකර් නම් ඕලන්දක්කාර ජනරාල් තැන ස්ථිර දිව්රුම්පිට කියා සිටි බැවින් රාජසිංහ රජ නැවත් ඕලන්දක්කාරයන්ගේ පක්ෂය ගැනිමට අදහස් කෙළේ ය.

වර්ෂ 1656 යේදී සිංහල රජුගේ සෙනග සහ ඕලන්දක්කාර සේනාවක් එකට එකතු වී කොළඹ කොටුව වටලෑවේ ය. පිටතින් යම්කිසි ආහාරපානාදි කිසිවක් කොටුව තුලට ගෙන යා නොහැකි පරිදි හාත්පස මුර තැබීමෙන් අවහිර කරන ලදී. මේ හේතු කොට ගෙන අන්නාපානදිය නොලැබීම නිසා ප්‍රතිකාල් හු අධික ක්ෂුධාවෙන් පීඩිත වූවාහුය. මෙසේ ප්‍රතිකාල්හු විස්තර කළ නොහැකි පරිදි අනේක විධ පීඩාවන්ට භාජන වී සිට කිසිත් කර ගත නොහී සත්මසකට පසු ඕලන්දයන්ට කොටුව භාර දුන්නේ ය.

රාජසිංහ රජ තෙමේ ඕලන්දක්කාරයන් සමග කලින් කර ගෙන තිබුණ 1638 වේ අවුරුද්දේ ගිවිසුමේ ප්‍රකාර තමාට කොළඹ කොටුව භාර දෙනු ලැබේ ය යන විශ්වාසයෙන් මේ කාලයේ කොළඹට නොදුරුව නැවතී

Non-Commercial Distribution

සිටියේ ය. නුමුත් ඕලන්දයෝ යථෝක්ත ගිවිසුම් පත්‍රය තණපතකට බඳු නොතකා ක්‍රියාකරන ආකාරය හොඳින් අවබෝධ වූ රජ තෙම සිය සෙනගත් කැටුව මහනුවරට පිටත්ව ගියේ ය. ඉක්බිති ගිවිසුමේ ප්‍රකාර කොළඹ මීගමුව තමාට භාර දෙන ලෙස රජු විසින් ඕලන්දක්කාර සේනාපති තැන වෙත හසුන් කිපයක් යවනලද්දේ ය. ඉන් එක හසුනක පහත දක්වන කරුණ ප්‍රකාශිත වාක්‍යයක් අන්තර්ගත වූවේ යයි කියා තිබේ. දෙවියන් නොහඳුන්න්නාවූ ද ස්වකීය ගිවිසීම් කඩ කරන්නා වූ ද මනුෂ්‍යයන් විසින් තම තමන්ගේ ක්‍රියා පරිපාටියෙහි අනිෂ්ට විපාක යම්කිසි දවසක දී ප්‍රත්‍යක්ෂ කරනු ලැබේ යනුයි.

යථෝක්ත හසුන් වලට ඕලන්දක්කාර සේනාපති තැනගෙන් ලැබෙන ලද ප්‍රයෝගකාර පිලිතුරු වලින් කලකිරීමට පත් සිංහල රජතුමා, ඕලන්දයන් සමග කිසිම ගණුදෙනුවක් නොකරන ලෙස ස්වකීය යටත් වාසින්ට ආඥා කෙළේ ය. ප්‍රතිකාලුන් නෙරපාලීමට ඕලන්දයන් කැඳවා ගැනීම කෙසේදැයි යතහොත්, වලසෙකුගෙන් බේරීමට ව්‍යාඝ්‍රයෙක් ළඟාකර ගත්තාක් වැනි බැව් සිංහල රජුහට මෙකල හොඳින් අවබෝධ විය.

මේ දෙවර්ගයේම මනුෂ්‍යයෝ සෘජු වූ ප්‍රතිපත්තීන් ගෙන් හීන වූ ඒකාකාර තෘෂ්ණාධික අසත්‍යවාදීහු බව නිසැකවම ඕහට වැටහී ගියේ ය. කොළඹ කොටුව ඕලන්දයන්ට අත්පත් වූ පසු, පළමුවෙන් එය ආරක්ෂා වට සිටි ප්‍රතිකාල් භේවායෝ 190 දෙනෙක් නාගපට්ටනමට ගොස් එහි නැවතී සිටියෝ ය. පසුව යාපනය ආරක්ෂා කරන පිණිස ඔව්හු නැවතත් ලංකාවට එවන ලද්දෝ ය. එසේ ද වුවත් වර්ෂ 1658 දී යාපනයත් ඕලන්දක්කාරයන්ට හස්ත ප්‍රාප්තවීමෙන් ප්‍රතිකාලුන්ගේ ලංකාද්වීපය පිළිබඳ සියලුම අයිතිවාසිකම් මෙයින් නිෂ්ඨාවට පැමිණියේ ය. ප්‍රතිකාල්හු අවුරුදු 150 ක් පමණ කාලයක් ලංකාවේ මුහුදුබඩ පළාත් අත්පත් කොට ගෙන විසූ නුමුත් ඔවුන්ගේ නිසි ප්‍රකාර ආණ්ඩුක්‍රමයක් එහි පැවැත්තේවත් ලංකාවේ ශ්‍රී සමෘද්ධි අරබයා කිසිවක් කරන ලද්දේවත් නැත, ඔව්හු වස්තුකාම ක්ලේශකාම දෙක්හි ඉතා ගිජු ලෙස ඇලී ගැලී විසූ අශිෂ්ට මනුෂ්‍ය වර්ගයක් බව ඔවුන් විසින් මෙ දිවයිනේ කර තිබෙන නිහීන ක්‍රියාවලින් යසරඟට ඔප්පුවේ, ආණ්ඩුවේ යටතේ නිලතල දීමෙන් සහ අනිකුත් පූජක උපාවලිනුත් රට වැස්සන් රෝමානු කතෝලික භක්තියට හරවා ගැන්ම ඔවුන්ගේ පරමාධ්‍යාශය වූයේය, සිංහලයන්ගේ පරිහානියට ප්‍රධාන හේතුවක් වූනේ දැනට එකහෙලා පිළිගෙන තිබෙන මද්‍යපාන සේවණය හා මනුෂ්‍යයන් විසින් අතිශයින් පිළිකුල් කරනු ලබන නෛසර්ගික රෝගද මොවුන් ගෙන් බෝවුන බවට වැද ගත් සාක්ෂි තිබේ. මොවුන්ගේ අහංකාර දුෂ්ටගති නිසා ස්වදේශීහු මොවුන්ට බෙහෙවින් අප්‍රිය කළෝ ය. මොවුන්ගේ

Non-Commercial Distribution

පරිහානිය ද ඒ හේතුවෙන්ම සිද්ධ විය. මේ මනුෂ්‍යවර්ගයා පිළිබඳ නවීන ලංකා ඉතිහාසයෙහි අන්තර්ගත ඇතැම් සංවේගජනක කථා ප්‍රවෘත්ති ඔවුන්ගෙන් ගෞරවයට නොමැකිය හැකි කැලලක්ව පරමාරානුගතව පවතිනු නොඅනුමානය.

ප්‍රතිකාලුන් ලංකාව අත්හැර ගියෙත්, ඕලන්දයින් ලංකාවේ මුහුදු බඩ පළාත් අයිකිතර ගෙන ආණ්ඩු කිරීමට පටන් ගත්තෙත් ඉංග්‍රීසින් ලංකාවේ තොරතුරු දැන සෙවීමේ යෙදුනේත්, මේ දෙවෙනි රාජසිංහ රජුගේත් කාලයෙහි විය. ලංකාවට පළමුවෙන් ඉංග්‍රිසියෙක් සම්ප්‍රාප්ත වූයේ පෙරදිග ඉන්දීය සමාගම වෙනුවෙන් වෙළඳාම පිණිස රටින් රට සංචාරය කරන ලද රාල්ප් පිච් නම් ඉංග්‍රීසි මහතා ය. ලංකාව ගැන ඉංග්‍රිසින්ගේ පරීක්ෂණයට හේතු වූයේ රෝබර්ට් නොක්ස් ආදි මහතුන් රාජසිංහ රජු විසින් හිරභාරයේ තැබීම වේ. ලංකාව සම්බන්ධව ඉතා වැදගත් ඓතිහාසික ග්‍රන්ථයක් ලියන ලද යථොක්ත ඉංග්‍රීසි ජාතික මහතාගේ ලක්දිවට පැමිණීම ප්‍රතිකාල් ආණ්ඩුවේ අවසාන භාගයේ දී සිදු විය. එබැවින් එතුමාගේ ජීවන චරිතය සැකෙවින් මෙහි දක්වනු ලැබේ.

## ලංකා ඓතිහාසික ග්‍රන්ථ කර්තෘවරයෙක් වූ රොබට් නොක්ස් මහතාගේ ජීවන චරිතය.

මේ මහතා ක්‍රිස්තු වර්ෂ 1614 පෙබරවාරි මස 8 වෙනි දින ලන්ඩන් නගරයෙහි වූ "ටවර්හිල්" නමැති ප්‍රදේශයෙහි උපන්නේ ය. මෙතුමා වනාහී, ප්‍රධාන කොටම මධ්‍යධරණිය මුහුදේ වෙළඳාමෙහි නියුක්තව සිටි රොබර්ට් නොක්ස් නමැති නෞපතියකු ගේ පුත්‍රයෙකි. අත්‍යුතකෘෂ්ට දේව භක්තියක පිහිටි ඇබිගේල් බොනැල් නමැති කාන්තාව මෙතුමාගේ මෑණියෝ ය. ඇබිගේල් නමැති වැඩිමහල් සහෝදරියක් සහ ජේම්ස් නමැති බාල සහෝදරයෙක් ද මෙතුමාට ඇතුව සිටියෝ ය. මෙතුමා බාල කාලයේ දී තමා විසින් අපරීක්ෂාකාරි ලෙස ක්‍රීඩා පිණිස පරවියන්ට තබන ලද වෙඩිල්ලක මූනිස්සන් වැදීමෙන් ජේම්ස් නමැති බාල සහෝදරයාගේ ඇස අන්ධ වූ බව ස්වලිඛිත ජීවිත කථාවෙහි සඳහන් කර තිබේ. මෙතුමා ළදරු අවස්ථාවෙහි දී ස්වකීය මෑණියන් විසින් ශෘස්ත්‍රාභ්‍යාසය කරවන ලදී. ඉක්බිති තරමක් වයස මුහුකුරාගිය කල රොහැම්ටන් නගරයෙහි ශිෂ්‍ය නිවාසයකට යවන ලදුව එහිදී වූ සැස්ටර්හී රාජගුරු ප්‍රසාදි ධූරය ලැබූ ආචාර්ය්‍ය ජේම්ස් පලිට්වුඩ් තුමාගේ අන්තේවාසිකව ශාස්ත්‍ර හැදෑරුවේ ය. තුදුස් වස පැමිණි කලසිය පියහු විසින් අභිනව තනවන ලද ඈන් නමැති වෙළඳ නැවේ පියත් සමග වර්ෂ 1655 දෙසැම්බර් මස 7 වෙනි දින වෙළඳාම පිණිස

Non-Commercial Distribution

ඉන්දියානු පෙරදිග ප්‍රදේශයන්හි පිහිටි සෙන්ට් ජෝර්ජ් කොටුවට හා ඊට පසු බෙන්ගාලයට ද යාත්‍රා කරනු පිණිස පිටත් වූයේ ය. මේ වාණිජ යාත්‍රා සංචාරණය බෙහෙවින් සඵලත්වයට පමුණුවා ගෙන මෙතුමා ස්වකීය පියාණන් සහිත නාවික පිරිස ද කැටුව වර්ෂ 1657 ක් වූ ජූලි මාසයේ දී ලන්ඩන් නගරයට සුවසේ ළඟා වූයේ ය. මේ නෞකාව මුහුදු සංචාරණයෙහි යෙදී සිටි කාලය අතරතුර, එනම් වර්ෂ 1656 දී මෙතුමාගේ මෑණී තොමෝ කාලක්‍රියා කරන ලද්දී ය. ඇගේ මෘත දේහය විම්බල්ඩන්හි සුසාන භූමියෙහි තැන්පත් කොට තිබේ.

මේ වාක්‍යයෙහි නායක කතෘභූත රොබර්ට් නොක්ස් මහතාගේ ජීවිතයෙහි අභාග්‍ය කාලය ස්වකීය ප්‍රියදර මවගේ මරණය හා සමගම කඩිණමින් සම්ප්‍රාප්ත වූ බව මෙහි පහත දක්වනු ලබන කරුණු වලින් මනාව හැඟේ. මේ කාලයෙහි දඹදිව නානා ප්‍රදේශ යටත් කර ගන්නා ලද පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම අතිශය දුර්වල අඩියක පැවැත්තේ ය, එකල එංගලන්ත ආණ්ඩුව විසින් ද බටහිර සමුද්‍ර සංචාරණයෙහි නියුක්ත ස්වකීය දේශයට අයත් තිර්බීත ශූරවීර නාවිකයන් කෙරෙහි ද යම් යම් අවහිරකම් පමුණුවන ලදී.

ක්‍රිස්තු වර්ෂ 1658 වේ ජනවාරි මස 21 වෙනි දන ඈන් නමැති මෙම නැව දඹදිව වරායක් පාසා වෙළදාම් කරණු පිණිස පෙරදිග ඉංග්‍රීසි ඉන්දියානු සමාගම යටතේ කොරමැන්ඩල් වෙරළ බඩ පිහිටි සෙන්ට් ජෝර්ජ් කොටුව බලා දෙවෙනි වරට ලන්ඩන් නගරයෙන් පිටත් වූවා ය. පෙර වතාවේ මෙන්ම මේ නැවේ නෞපති ධූරය නොක්ස් මහතාගේ පියතුමා විසින් උසුලන ලදී. ඓතිහාසික ග්‍රන්ථ කතෘ වූ මෙම නොක්ස් මහතා සහ තවත් යාත්‍රා කරුවෝ කීපදෙනෙක් මේ නැවේ ආධාරික නාවිකයන් මෙන් නියුක්තව සිටියෝ ය. මෙම නැවෙහි පටවා ගෙන එන ලද වෙළඳ භාණ්ඩ විකුට එම වර්ෂයෙහි නොවැම්බර් මස 19 වෙනි දින නැව මච්සලි පැටැම් වරාය පාරේ ලන්ඩන් නගරය කරා ආපසු ගමන් කරද්දී චණ්ඩ මාරුතයකට අසුවීමෙන් එහි කුඹගස් සුණු විසුණු වෙන ලදින් වැඩි දුර යාත්‍රා කිරීමට බාධා පැමිණියේ ය. ඉක්බිත සෙන්ට් ජොර්ජ් කොටුවේ (ඒජන්ත) ප්‍රධාන මුළාදෑනි තැන වූ සර් තෝමස් චේම්බර්ස් මහතාගේ විධානය පරිදි අබලන් වූ කුඹුගස් ආදිය ප්‍රතිසංස්කරණය කර ගන්නා තුරු නවත්වා සිටීමට සහ අතර තුර වෙළදාම් කිරීම පිණිස පෝටානෝවාහි ඉන්දියානු වෙළඳ ජනයාගේ රෙදිපිළි ආදියත් රැගෙන එකලට ඉඩපාඩු ඇතුව තිබුන සිංහලද්වීපයේ ත්‍රිකෝණමලටය නුදුරුව පිහිටි කොට්ටියාර් වරයාට නැව ගමන් කරවන ලදී. යථොක්ත වරායේ නැව නැංගුරම් දමනු ලැබ පළමුවෙන්ම ගොඩබට කල්හි සිංහල මිනිසුන් කෙරෙහි මේ විදේශිකයන්ගේ සිත් තුල කිසියම් චකිතයක් සහ භීතියක් ද ඇති විය. එහෙත් විසි දිනක්

Non-Commercial Distribution

පමණ ගත වූ පසු සිංහල ජනයාගෙන් කිසි ගැහැටක් හෝ පීඩාවක් නොලත් හෙයින් සහ ප්‍රදේශයෙහි අධිපති ධූරය දරූ දිශාපති තුමාගේ අනුග්‍රහය ලත් හෙයිනුත් ඔහට ගොඩබිමෙහි සහ නැවෙහිත් රිසිසේ ප්‍රීතියෙන් කාලය ගත කිරීමට හැකි විය. සිංහල මනුෂ්‍යයෝ ඒ පළාතෙන් සපයා ගත හැකි සියලුම ආහාර පාන වර්ගාදිය මිළයට ගෙන දීමෙන් නාවිකයන්ට බෙහෙවින් උපස්තම්භක වූහ. මෙසේ දින ගණනක් යන අතර ඔවුන්ගේ පැමිණීම සිංහල රජතුමාට සැලවී ඔවුන් කෙරෙහි සැක උපදවා, කවර කරුණක් නිසා ඔව්හු මෙහි පැමිණියාහු දැයි දැන ගැනීම පිණිස සුලු යුද්ධ හමුදාවක් සහිත දිශාපති කෙනෙක් පිටත් කර යවන ලදී, ඉක්බිති රාජහස්නක් භාරදීම සඳහා ගොඩබැස එය භාරගත යුතුය කියා දිශාපති තැන නැව්පතියා වෙත දූතයකු යැව්වේ ය. නාවිකයෝ ඒ රාජශනේදශභාරක තැන ආචාර වශයෙන් වෙඩි ශබ්ද පවත්වා ගෞරවයෙන් පිළිගනු ලැබ, දිශාපති තැන සම්මුඛවීමට යාම පිණිස නෞපති තෙමේ ස්වකීය පුත්‍ර රොබර්ට් නොක්ස් මහතාට සහ නාවික වාණිජ තැන වූ ජෝන් ලව්ලන්ඩ් මහතාටත් ගොඩ බසින්ට විධාන කෙළේ ය. යථොක්ත නාවික පුරුෂයන් දෙදෙන දිශාපති තැන හමුවට වන්කල, ඔව්හු කවරහුද යන බව හා කෙතෙක් කල් වාරයේ නැවති සිටින්ට අදහස් කර තිබේ ද යන බවත් දිශාපති තෙමේ ඔවුන් ගෙන් පිළිවිසුවේ ය. තමන් ඉංග්‍රීසි ජාතිකයන් බව හා නැව අලුත් වැඩියා කිරීම සඳහා විසි තිස් දවසකට වඩා ප්‍රමාද නොවන බවත්, සිංහල රජතුමාට අයත් ඒ නැව් තොටේ වෙළදාම් කිරීමට අවසරයක් ලබා ගැනීම තම ආසාව බවත් ඔව්හු සැල කළෝ ය. දිශාපති තැනගෙන් මීට ලැබුණ ප්‍රති උත්තරය නම් තම රාජ්‍යයට ඉංග්‍රීසීන්ගේ පැමිණීම ගැන රජතුමා සතුටු බව ද, ඔවුන්ට රිසි වූ පරිදි ආධාරෝපකාර කිරීමට හෙතෙම රජතුමාගෙන් විධානලත් බව ද, නෞපතියාට හැර අන් කිසි වෙකුට භාර නොදෙන ලෙස නියම කොට ඕහට රජතුමා හසුනක් දෙවා වදාළ බව ද යනාදියයි. මේ සාකච්ඡාව කරන ලද්දේ මුහුදු වෙරළේ සිට සැතැප්ම දොළහක් පමණ ඈත ප්‍රදේශකය දී ය. නැව අත්හැර දමා එපමණ දුර නෞපති තැනට එන්ට අනවකාශ බැවින් දිශාපතිතුමා වෙරළාසන්නයට වඩිනු ලැබේ නම් රජ අස්න පිළි ගැනීමට නෞපති තෙමේ යුහුව පැමිණෙනවා ඇතැයි යන බව ද නාවිකවරු දෙදෙන දිශාපති තැනට දැනුම් දුන්නේ ය. මේ පිළිතුරලත් දිශාපති තැන පසුවදා ඔවුන් සමග මුහුදු වෙරළාසන්නයට එන බැව් කියමින් එදා ඔවුන් එහි නවත්වා ගත්තේ ය. මේ නැවියෝ දෙදෙන ලැඟුම් ගෙන සිටි නිවෙසට එදින සවස දිශාපති තෙම පණිවිඩයක් එව්වේය. එහි අදහස නම් :- ඒ රාත්‍රියෙහි තමා විසින් නෞපතියාට තෑග්ගක් යවන බව හා ඕහට යැවිය යුතු යම් කිසි ලියමනක් තිබේ නම් ඒ සමඟ යැවිය හැකි බවත්, ඔවුන් සමග නෞපති තැන හෝ නාවික අන් කිසිවෙක් ගොඩ නොබසින ලෙස අවවාද කොට ලියමනක් ලියා පණිවුඩකරුට දුන් නුමුත් ඒ ලියමන භාරවී නොමැති බැව් පසුව ඔවුන්ට දැන ගන්ට ලැබුණේ ය.

Non-Commercial Distribution

පසුදින අලුයම ගවයන් සහ පලතුරු වර්ගාදිය සහිත තෑගි බෝග වෙරළාසන්නයේ දී රාජ දූතයන් කිප දෙනෙක් විසින් නාවික සෙනෙවිහට පිළිගන්වනු ලැබුවේ ය. දිශාපති තැන හා නෞපතියා විසින් පෙර පිටත් කර යවන ලද නාවිකයෝ දෙදෙනත් රාජ හස්න රැගෙන ඔහු සම්මුඛවීමට ආගමනය කරන බැවින් ඔවුන්ගේ පෙරමුණට යන ලෙස ඒ රාජ දූතයෝ නැව් පති තැනගෙන් අයැද සිටියාහු ය. මේ වචන ගැන අවිශ්වාස නොකළා වූ නොක්ස් නම් නැව්පති තෙමේ ස්වකීය සහකාරයන් සත් දෙනෙකුත් කැටුව බොට්ටුවකින් කුඩා ගඟක් ඔස්සේ විත් රාජ හස්න පිළි ගැණීම පිණිස ගොඩට පැමිණ සියඹලා ගසක සෙවණෙහි වාඩි වූයේය. එකෙණෙහිම කලින් සැඟ වී සිටි ස්වදේශක භේවායෝ කණ්ඩායමක් විසින් නිරායුධව සිටි නැව්පතියා සහ ඔහුගේ පිරිසත් අල්වා ගන්නාලදී. එහෙත් ඒ චර පුරුෂයන් විසින් මේ විදේශිකයන්ට බලාත්කාරකම් කොට කිසිම වස්තුවක් පැහැර නො ගන්නා ලදී. ඉක්බිති ඔව්හු නෞපති තැන දෝලාවක හිඳුවා උරපිට තබාගෙන ඔහුගේ පිරිවරත් කැටුව දිසාපතිතුමා සහ පූර්වොක්තනාවිකයන් දෙනොත් සිටි ස්ථානයට එළඹ සිටියෝ ය. ඊට පසු දින නැවේ සිටි තවත් සමහර නැවියෝ කීප දෙනෙක් සිදු වී තිබෙන විපත ගැන කිසිත් නො දන ප්‍රධාන කුඹගස සෑදීමට ගසක් කපාගනු සඳහා දිග බෝට්ටුවකින් ගොඩට ආ විට ඔවුනුදු පෙරසේම අල්වා හිරභාරයට ගනු ලැබූහ. ඔවුන්ගේ ඇල්ලීමට විරුද්ධව ඔව්හු කලහකාරී ස්වභාවක් දක්වුනේ ඔවුන්ගේ අත්කඹ වලින් බැඳ නගරයේ ඈතට ගෙන යන ලද්දෝ ය. පළමුවෙන් ඔවුන් බැඳීම පිණිස කඹ ගෙනෙනු දුටු නැවියෝ, ඔවුන් එල්ලා මැරීමට සූදානම් වනු ලැබේ යයි සිතී අපමණ භීතියට පත්වූහ.

මීටපසු සිදුවෙන ලද ප්‍රවෘත්ති නොක්ස් මහතා විසින් ලියන ලද ස්වකීය ජීවිතකථාවෙහි මෙයාකාරයෙන් සඳහන් කොට තිබේ.

අප මිනිසුන් 18 දෙනෙකුන් සහ අපේ බෝට්ටු දෙකත් සිරභාරයට ගත් පසු, අපේ නැව හස්ත ප්‍රාප්ත කර ගැනීම සිංහල රජතුමාගේ ආසාව විය. එය මුදුන් පත් කර ගැනීම සඳහා ප්‍රයෝග අදහසක් සිංහල රජතුමා නෞපතියා වූ මපියාණන් දිසාපති තැන ලවා සැලකෙරෙව් වේය. පුද පඬුරු සහිත හස්නක් එංගලන්තයේ මහරජතුමාට දිසාපති තැන අත යැවීම සිංහල රජුගේ අදහස බව ද ඒ නිසා දිසාපතිතුමා එංගලන්තයට ගෙනයාමට නැව ප්‍රමාද කර ගත යුතු බවද ඇතැම් විට නැව වරායේ නවත්ව තිබුණොත් සතුරු වූ ලන්දේසීන් විසින් නැවට වෙඩි තබා අනතුරු කල හැකි බවද, එබැවින් සුරක්ෂණය පිණිස නැව ගඟට ගෙන ඊමට අණ දිය යුතු බව ද යනාදිය මපියාණන්ට දිසා පති තැන දන්වූයේ ය.

---

මෙම ගස මෙතාක් "සුදු මිනිහාගේ ගස" යන්නෙන් ප්‍රකටයි.

Non-Commercial Distribution

මේ කපටි යෝජනාවට බුද්ධිසම්පන්න වූ ඒ නාවික ශ්‍රේෂ්ඨ තෙමේ කිසිසේත් එකඟනුවූයේ ද, මේ ගැන තමා ප්‍රිය නොකරන බව එළිදරව් නොකොට තම පරිජනයන්ගෙන් දෙදෙනෙක් ලියමනකුත් සමග නැවට පිටත්කර හැරියොත් විනා කෙනෙකුගේ මුඛවාක්‍යයකින් පමණක් ඔහුගේ අණ ඉතිරි නාවිකයෝ පිළිනොගන්න බව මපියාණෝ දිසාපති තැනට කීවේ ය. ඒ පිළිතුරට දිසාපතිතැන එකඟ වූයෙන්, මපියතෙම අපේ සහචර මිනිසුන් දෙදෙනෙකු කැඳවා ඔවුන්ට ඔරුවින් නැවට ගොස්, අපෙන් පැහැරගත් බෝට්ටු දෙකේ හිලව්වට ඔරුව නතර කර ගන්නා ලෙස සහ නැවත දන්වීමක් කරන තුරු නැවේ නැවතී සිට අනිත් නැවියනුත් සමග නැව නිශ්චල ලෙස තබා හොඳින් ආරක්ෂාකර ගන්න ලෙසත් විධාන කෙලේ ය. මේ මිනිසුන් දෙදෙන සහ ඔරුවත් නැවත හැරී නොඒම ගැන සහ නැව ගඟට යාත්‍රා නොකරවීම ගැනත් දිසාව කෝපවී ඊට හේතු කරුණු කවරේදැයි මපියාණන් ගෙන් විචාළේ ය, තමා ගොඩ සිටින බැවින් අවශේෂ නාවිකයෝ ලිපි මාත්‍රයකින් කරනු ලබන අණ පිළිනොපදින බව නැව්පති තෙමේ කීවේ ය. මීට ටික දවසකට පසු නැවගඟට ගෙන ඒමට ආඥා කොට මා, නැවට පිටත් කර හැරිය යුතු බව මා නැවත ගොඩට එනතුරු මපියාණන් ඇප වශයෙන් රඳවා ගනු ලබන බව ද දිසාපති තැන ඔහුට කීවේ ය. එම නියමය පරිදි මපියාණෝ මා නැවට පිටත් කර හරිමින්, ජීවිත ලාභය සහ නිවහල් බව ප්‍රර්ථනා කරන්නෙම් නම්, අඳුරු වූ පසු නැව අසලට කිසිම බෝට්ටුවකට හෙවත් යාත්‍රාවකට එන්ට ඉඩ නොහැර නැවේ නැංගුරම් කඹවලට ඉහල දම්වැල් සවිකොට තුවක්කු වලට උණ්ඩ දමා නැව මුරකරමින් අරක්ෂා සහිතව තබා ගත යුතු බව නැවේ ප්‍රධාන සහකාරි මුළාදෑනී තැන වූ ජෝන් බර්ෆෝඩ් මහතාට අවවාද කරන ලෙස සහ නැවත මට ගොඩට හැරී එන ලෙසද නියම කළේය. මම නැවට ගොස් මගේ පියාගේ නියමයන් සියල්ල ඉෂ්ටකොට ඔහුගේ හෝ අන් කවරකුගේ වත් කිසිම ආඥාවක් නැවේ සිටින අය පිළි නොපදින බවට හා අන්තිම මොහොත දක්වාම ඔහු නැව ආරක්‍ෂා කර ගැනීමට සටන් කරන බවටත් ලියමනක් ලියා ඊට නැවියන්ගේ අත්සන් තබවා එය රැගෙන පියාගේ අයැදුම පරිදි කීකරු පුත්‍රයකු මෙන් හුදකලාව ගොඩට පැමිණියෙමි. ගොඩට ආ පසු ම විසින් ගෙනෙන ලද ලියමන දිසාවට භාරදුනිමි. ඉන්පසු දිසාපති තෙමේ නැව ගඟට ගෙන ඒම ගැන හිරිහැර නොකොට අප ඉක්මනින් මුදාහරින ගිවිසීම පිට පෙර සේම අඩුලුහුඬක් නොමැතිව ඛාද්‍යා භෝජ්‍යා මොනවට සංග්‍රහ කරන ලද්දේය. මේ මුදාහැරීමේ පොරොන්දුව දෙමසක් ඉක්මෙන තුරුත් සිංහල නරසිරුහු විසින් ඉෂ්ට නොකල හෙයින් අපේ හිස් මත්තෙහි දුක්ඛිත අනාගතයක් රැඳී පවත්නා බැව් අපට වැටහී ගියේය.

ඉක්බිති මාගේ පියා වූ නාවික ශ්‍රේෂ්ඨ තෙමේ නැවේ නෞපති දූරය එහි ප්‍රධාන සහකාර මුළාදෑනි තැන වූ ජෝන් බොෆොඩ් මහතාට පවරා,

Non-Commercial Distribution

අපි මෙහි පිටත්ව ආ පොටෝ නෝවා වරායට නැව යුහුව යාත්‍රා කරවා නැව් සමාගමේ (ඒජන්ත) කළමනාකාර තැනගේ නියමයන් පරිදි ක්‍රියා කරන ලෙසට දැනුම් දී ඔහට පණිවිඩපතක් යැවී ය. යථෝක්ත නියමයේ ප්‍රකාර අපේ අවාසනාවන්ත නෞකාව ලංකාද්වීපයේ වරාය අත්හැර පෝටෝ නෝවා වරාය බලා හදිසියෙන්ම ගමන් කළාය. අපි පැමිණි මේ නැව අපෙන් වියෝගවන කල මෙහි සිටියේ අප කණ්ඩායම අයත් විදේශික සොළොස් දෙනා පමණකි. දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ ධර්මයන් නො හඳුනනන්නාවූ ජනසමූහයක් මධ්‍යායෙහි අපේ වාසය කිරීම අපට මහත් දුක්ව පැවැත්තේය. එහෙත් අපේ දයාබර දේවොත්තමයාණන් වහන්සේ අපට කරුණාව පෙන් වූ සේක. නැව පිටත්ව ගියාට පසු අප සම්බන්ධධ කිසිම අමුත්තක් නොකොට දිසාපති තැන සහ ඔහුගේ පරිවාර ජනයාත් අප හමුවෙන් සිංහල රජතුමා විසින් අහක් කරනු ලැබූයෙන් නගරවාසි මිනිසුන් අපේ මුරකාරයන් වූහ. ටික දිනකට පසු අපි නැවතී සිටි ප්‍රදේශයෙන් තවත් සැතැප්ම හයක් ඈතට ඔවුන් විසින් අපි ගෙන යන ලදිමු. අපේ අභිනව වාසභූමිය වනාහි කඳු හෙල්වලින් ගැවසී ගත් ප්‍රපාතයෙක් පිහිටි වරක් ප්‍රතිකාලුන් විසින් අල්වා ගෙන තිබුණ ප්‍රදේශයක් විය. ක්‍රිස්තියානි මනුෂ්‍ය වර්ගයකුගේ ආශ්‍රය ලැබීමෙන් ශිෂ්ට සම්පන්න ගතිවල පිහිටියා වූ මෙහි පදිංචිකාරයෝ උඩරැටියන්ට වඩා සර්වප්‍රකාරයෙන්ම ආගන්තුක වූ අපට කරුණාව පෙන්වූයෝ ය. මෙසේ මඳක් සැනසිල්ලෙන් කල්යන අතර, වර්ෂ 1660 ක් වූ සැප්තැම්බර් මස 16 වෙනි දින අප එකිනෙකා වෙන් කරනු ලැබ තනිතනිව වෙන වෙන ගම්වලට ගෙනයෑමට සිංහල රජතුමා නියම කෙළේ ය. එහෙත් දේව කරුණාව හේතු කොට ගෙන මට සහ මගේ පියාටත් එකට වාසය කිරීමට රජතුමා අවසර දෙවාවදාළේ ය. මා සහ මගේ පියාත් හිරකරනු ලැබ සිටියේ මහනුවරට උතුරුදිග්භාගයේ සැතැප්ම 30 ක් පමණ ඈතින් පිහිටි සත්කොරළේ බණ්ඩාර කොස්වත්ත කියන ගමේ ය. අපි වාසය කෙළේ භිත්ති කිසිවක් නැති තනි වහලකින් යුත් මඩුවක් බඳු එළිමහන් ගෘහයක ය. ඒ ගෙදෙර තිබුණ එකම අරුමෝසම් බඩුව නම් මගේ පියාට නිදා ගැනීම පිණිස සූදානම් කර තිබුන පැදුරක් එලන ලද කුඩා ඇඳක් පමණ ය. මගේ සයනය බිම අතුරන ලද තනි පැදුරක් විය. අපට සැප ආහාරපාන සපයාදීමෙන් උපකාර කරන ලෙස ගම්වැස්සන්ට රාජාඥ පණවා තිබුණේ ය. එබැවින් ගම්වාසීන් වාර බෙදා ගෙන අපට දවසකට දෙවර බැගින් කෑම ගෙනැවිත් දෙන ලදී. අපට ගෙනෙන ලද ආහාර අඩුක්කුව බත් මුට්ටියකින් ද, මස් හෝ මාලු හට්ටියකින් ද. වට්ටක්කා පුහුල් හෝ වෙනත් එලවලු වර්ගයකින් පලා වර්ගයකින් යුත් හට්ටි දෙකකින් යුක්තය, අපි මෙහි වාසය කළ පළමුවෙනි අවුරුද්දේ ගම්වාසීන් බොහෝ දෙනෙක් කැලෑ උණ වැළඳීමෙන් මිය ගියෝ ය, ඒ කරණ කොට ගෙන අපට බොහෝ දවස් නිරාහරයෙන් සිටින්ට සිදු විය. අපට ආහාර උදව් කර දීමට හෝ පිටතින් ගෙනත් දීමට හෝ සැහෙන්නෙක්

Non-Commercial Distribution

නොසිටියේය. අන්තිමේදී ගම්වාසීන් අතරේ පැතිරී ගිය මේ මාරක ජ්වර රෝගය මට සහ මපියාණන්ටත් බෝවිය මපියාණෝ තෙමසකට වැඩි කාලයක් ඇදේ ඔත්පලව සිටියේය. මේ කාලයේ දී අප දෙදෙනාගේ චිත්තභ්‍යන්තරයෙහි පැවති බලවත් දොම්නස ඇත්තෙන්ම අන්කිසිවෙකුට විස්තර වශයෙන් දක්වා අවබෝධ කරවීම උගහට වන්නේ ය. රෝගය කෙතරම් දරුණු ලෙස මගේ පියාගේ ශරීරයෙහි වැද ගන්නා හුදු ලද්දයි යතහොත් ඔහු සිරු වනාහි සමෙන් ආවරණය කරන ලද හුදු අස්ථිපංජරයක් මෙන් දෘශ්‍යමානවිය. මපියාණෝ මරු වසඟයට පත්වීමට ප්‍රථම දින සන්ධ්‍යාහෙි උණෙන් ගැහෙමින් සිටි මා ඔහුගේ මරණීය සයනය සමීපයට කැඳවා එහි වාඩි වීමට සලස්වා, මට යම් දවසක මේ හිරභාරයෙන් නිදහස් වී සියරට යන්ට ලැබුණි නම් මගේ සහෝදරයා සහ සහෝදරියන් හොඳින් ආරක්ෂා කර ගන්නා ලෙස නියම කොට තවත් ස්වර්ණමය අනුශාසනාවක් කරනුයේ ඔහුගේ අතිශය වැරී ගිය හස්ත වයෙන් මා හිස ස්පර්ශය කොට ඔහුගේ අන්තිම ආශිර්වාදය ප්‍රදානය කෙළේ ය. ඔහු විසින් මට දෙන ලද අවවාදය නම් ලෝකයා නිර්නභවාට පමුණුවන මද්‍යපානයෙන් තොරවීම සහ කාමුක ජනයාගේ භජනය නොකිරිමත් ය. (මේ වනාහි කොටින්ම පාපමිත්‍ර සංසර්ගයෙන් වෙන්වන ලෙස දෙන ලද මනෝහර අවවාදයකි.

වර්ෂ 1660 ක් වූ පෙබරවාරි මස 9 වෙනි දින රෑ දෙකට හෝ තුනට පමණ මාගේ ආදරණීය පියතුමා විදේශික දූපතක දී මා දුඃඛසාගරයෙහි නිමග්න කරවමින් අවශානය දක්වා මනා සිහියකින් යුක්තව නිශ්චලාකරයෙන් සිට ජන්මාන්තර ගත වූයේ ය. ඉක්බිති ඔහුගේ මෘත ශරීරය පැදුරක ඔතා අපි සිටි අසල කුඹුරු යායකට උතුරෙන් පිහිටි කැලෑවක මගේ අතින්ම වළක් හාරා භූමිදාන කරන ලදී. මෙවක් පටන් පිතෘවියෝගයෙන් සිටින්ට සිදුවීම නිසා මගේ ජීවිතයේ අති අවාසනාවන්ත කාලය ක්‍රමයෙන් උදා වූයේ ය. මගේ එකම සැනසිල්ල දෙවියන්වහන්සේගේ ප්‍රේමය කෙරෙහි බලාපොරොත්තුව තැබීම විය. දහසය මාසයක් තුළ ගැහෙන උනින් පීඩිතව සිටි මට ක්‍රමයෙන් සුවය ලැබෙන්ට පටන් ගත්තේ ය. එක් දවසක් සන්ධ්‍යා කාලයෙහි අසල දොළක මාළු අල්ලමන් සිටි මට මහලු මනුෂ්‍යයක් සම්මුඛ වූයේ ය. ප්‍රතිකාලුන් කොළඹ හස්තප්‍රාප්ත කර ගෙන සිටි කාලයේ තමන්ට ලැබෙන ලද ඔහුගේ ඉංග්‍රීසි බයිබලයක් මේ වෘද්ධවයස්ගත මනුෂ්‍යයාගෙන් මට ලැබුණේ ය කියවන්ට කිසිත් නොමැති අන්ධකාරයෙහි නිමග්නවීමෙන් කාලකණ්නි ස්වභාවට පැමිණ සිටි මට මගේ ආගමේ උතුම් වූ මේ ධර්මපුස්තකය ලැබීම, ස්වර්ණමය නිධානයක් පහළ වූවාක් වැනි විය. මේ පොත ලැබුණාට පසු නිතරම එය කියවීමෙන් මා සිතේ පැවති කණගාටු සියල්ලක් අතුරුදහන් විය.

Non-Commercial Distribution

මේ කාලයේ මා සමග ද එයින් අනතුරුව කීපදිනකට පසුවද හිරභාරයට ගනු ලැබූ අපේ ජාතියේ සහභාගික මනුෂ්‍යයෝ එකිනෙකා ඔවුනොවුන්ට සැතැප්ම හතරකට නොහොත් පහකට දුර ප්‍රමාණයේ හතර කෝරළේ ගම්වල තනි තනිව නවත්වා සිටියෝ ය. අනේක විධ උපක්‍රම වලින් ගම්වාසීන් වසඟ කරනු ලැබීමෙන් ක්‍රම ක්‍රමයෙන් මේ මනුෂ්‍යයෝ එකට එක්ව ක්‍රියා කිරීමේ නිදහස ලබා ගත්හ. මම ද ඔවුන්ගේ ආදර්ශයට අනුව ක්‍රියා කිරීමෙන් සිංහල රජුගෙන් සහනයක් ලබා ගැනීමේ කල්පනාව අහක් කොට ස්වකීය ව්‍යායාමය ව්‍යවහාර කිරීමෙන් අපි එකි නෙකාට සුදුසු නිවාසවල් ගොඩනඟා ගෙන රිසි පරිදි යාම් ඊම් කිරීමෙන් ද එක්ව කාබී සතුටු වීමෙන්ද සුවසේ කාලාතික්‍රමණය කෙළෙමු. මම පදිංචිව සිටි බණ්ඩාර කොස්වත්ත නම් ස්ථානය හැර දමා, මහනුවර සමීපයෙහි පිහිටි සිංහල රජතුමාට අයිති රමණීය පොල්වත්තක මගේ වාසය පිණිස ග්‍රාමවාසීන්ගේ ආධාරත් ඇතිව ගෙයක් ගොඩනගත් අතර එය නිම වෙන්ට ආසන්නයේ දී, ගම්වැස්සෝ ඔවුනොවුන්ගේ පුද්ගලික කටයුතු නිසා වැඩි දුරටත් උපකාර නොකොට අප අත්හැර ගියාහු ය. නුමුත් මම මේ ගැන අධෛර්‍ය නොවී ඉතිරි වැඩ මා ළඟ ඉතිරිව සිටි එකම කොලු ගැටයාත් සමග එක් වී නිම කෙළෙමි. ඒ කාලයේ දී ගොඩනැගිලි වල සුදු හුණු ආලේප ය කිරීම රාජකීය ගෘහවලට සහ විහාර පන්සල් වලට පමණක් අවසර තිබුණේ ය. මේ බැව් නොදත් මම මගේ අභිනය ගෘහයෙහි ද සුදු හුණු ගෑමෙන් මරණීය දණ්ඩනයට යටත් වූ බරපතල වැරැද්දකට අසුවිය. වාසනාවකට මෙන් මම විදේශකයෙක් බැවින් නොදැනුම්කමින් කරන ලද්දකැයි කල්පනා කොට ඒ ගැන සැලකීමක් ඇති නොවීය. මේ කාලයේ දී මම ඌරන් කුකුළන් ඇති කිරීමෙන් ද තොප්පි වියා අලෙවි කිරීමෙන් ද මුදල් සපයා ගතිමි. මෙයාකාරයෙන් කාලයක් ඉක්ම වූ පසු සුළු බඩු වෙළදාම පිණිස රටේ ඔබ මොබ යාමට අවසර ලැබුනෙන් රටේ මග තොට සහ ආරක්ෂා ස්ථාන ගැන ද ගම් වැස්සන්ගෙන් අසා දැන ගතිමි. ගම් වැස්සන් හා නිතර එක්ව හැසිරීම නිසා ඔව්හු මා ගැන කිසිවක් සැක නොකොට මගේ ආහාර අගහිඟකම් ගැන මනාව සැළකුවෝ ය. වාසනාවකට මෙන් මේ කාලයේ සිංහල වැසියෝ තම රජුට විරුද්ධව කැරළි කෝලාහලයක් ඉපදවූහ. කැරළිකාරයන් ගෙන් රජු ආරක්ෂා කර ගැනීමට අප කැඳවනු ලැබූ නුමුත් අපි ඊට ඒකමතික නූයෙමු. එසේ වුව ද නැවත රජුහට පක්ෂපාත භාවයක් හඟවා ක්‍රියා කිරීමෙන්, මම සිත් සේ සිංහල ද්වීපයේ සංචාරණය කිරීමට නිදහස ලබා ගතිමි. ඊට පසු අවුරුදු කීපයක් මුළුල්ලෙහි අනේක විධ උපද්‍රව්‍යයන්ට භාජනය වී සිටියදීත් බලවත් උත්සාහ කොට ඒ සියල්ලෙන්ම ජයගෙන අනුරාධපුරයට පලා ගියෙමි. ඒ ස්ථානයේ සිට නොයෙක් අපහසුකම් විඳ ඕලන්දක්කාරයන්ට අයිති මන්නාරමට පැමිණියෙමි. එහි දී එම කොටු පෙතෘව භාර මුළාදෑනි තැන

Non-Commercial Distribution

විසින් ආරක්ෂා සහිතව යාපනයට මා පිටත් කර යැවී ය. මෙහි දී මට ඇන්ඩෲ බ්‍රවුන් නමැති ස්කොච් ජාතික අයෙක් සහ ප්‍රන්සිස් හොජස් නමැති අයිරිෂ් ජාතික මනුෂ්‍යයෙක් ද සම්මුඛ වූහ. ඔවුන් සමග මම කොළඹට පැමිණ, එහිදී යුරෝපීය ජාතික මනුෂ්‍යයන් විසින් මට ඛාද්‍ය භෝජ්‍ය මිළ මුදල් රෙදි පිළි ආදියෙන් අනේක විධ සංග්‍රහ කොට මම බෙතාවියට පිටත් කර හරිනු ලදිමි. බෙතාවියේ ඕලන්දක්කාර අණ්ඩුකාරතුමා සීසර් නමැති නැවෙන් මගේ ජන්මභූමිය වූ එංගලන්ත රාජ්‍යයට මා පිටත් කර යැවී ය යනුයි.

ඕලන්දක්කාරයෝ රාජසිංහ රජු සමග සමගි සම්පන්නව විසීමට අනේක ප්‍රයත්න දැරුවා හුය. එහෙත් ගිවිසුමේ ප්‍රකාර ප්‍රතිකාලුන්ගෙන් පැහැරගත් බලකොටු තමහට භාර නුදුන් කාරණයෙන් රාජසිංහ රජ ඔවුන් කෙරෙහි උපද වූ බද්ධ වෛරය කිසි කලෙකත් නොහලූ යේ ය. ඕලන්දයන් කෙරෙහි කුරුඳු ගැන ඇති ආශාව දැන ගත් හෙතෙමේ මෙය බෙහෙවින් වැවෙන මුහුදු අසබඩ පළාත් පාළුකර දමන ලෙස පහත රට මුළාදෑනීන්ට අණ කෙළේ ය. රාජසිංහ රජ තෙම ප්‍රතිකාලුන් අත් හැර දමා තමා විසින් ළං කර ගන්නා ලද්දේ ඊට වඩා ශක්තිමත් කෛරාටික සමූහයක් බව තේරුම් ගෙන, රජ ඔවුන්ගෙන් ඈත්ව සිට ගෙන ඉඩ ලැබෙන පරිදි පලි ගැනීමට කල්පනාවෙන් කාලය ගත කෙළේ ය.

මේ රාජසිංහ රජු ද පළමුවෙනි රාජ සිංහ රජු මෙන්ම කෲරගති වලින් යුක්ත සිටි බැවින් සිංහල වැස්සෝ ඔහු කෙරෙහි ද්වේෂ කළෝ ය. ඒ ද්වේෂයෙන් උද්ගත වූ විපාකයක් නම්, සමහර රට වැසියෝ වර්ෂ 1644 දී රාජසිංහ රජුට විරුද්ධ ව කැරළි ගැසීම ය. මේ කාලයේ රජු වාසය කෙලේ මහනුවර සිට දකුණු දිග්භාගයෙන් පිහිටි නිලඹේ නම් ප්‍රදේශයේ ය. යථෝක්ත වර්ෂයේ දෙසැම්බර් මස 21 වෙනි දින මැදයම් රෑ කැරළිකාර පිරිසක් රජු විශ්‍රාම ගනිමින් සිටි ගෘහය අසලට ගොස් රජුහු ආරක්ෂාවට තබා සිටි රාජකීය චරපුරුෂයන් බොහෝ දෙනකු මරා රජු අල්වා ගැනීමට ප්‍රයත්නයක් කළෝය. රජ තෙමේ තම අන්තේවාසිකයන් පණස් දෙනෙකුත් සමග කන්දකට පලාගොස් ජීවිතය රැක ගත්තේ ය. මේ කාලයේ රජුගේ සහ ජාත පසලොස් හැවිරිදිවයස් වූ පුත්‍ර කුමාර තෙමේ සෙංකඩගල නුවර රාජ මන්දිරයෙහි වාසය කෙළේ ය. කැරළි කාරයෝ මහ නුවරට ගොස් ඒ බාලවියෙහි පිහිටි කුමරු සම්මුඛව ඔහට පිය රජ්ජුරුවන්ගේ රාජ්‍යය පිළි ගැන්වූයෝ ය. නුමුත් සත්පුරුෂ වූ ඒ කුමාර තෙමේ යථෝක්ත යෝජනාව නොපිළිගෙන පියරජහු සිටි කන්දටම පලා ගියේය. මේ කාරණය දැන ගත් කුමන්ත්‍රණකරුවෝ භයින් ත්‍රස්තව ඔබ මොබ විසිරී ගියෝ ය. රාජසිංහ රජ තෙමේ තමා මැරීමට කුමන්ත්‍රණය කිරීමෙන් උපක්‍රම යෙදූ ප්‍රධානයන් අල්වා මරණීය දඬුවම් දෙවන ලදී, සිංහල රජු විසින් හිරභාරයට ගන්නා

Non-Commercial Distribution

ලද ඕලන්දක්කාරයෝ බොහෝ දෙනෙක් එවකට මහ නුවර වාසය කළෝ ය. තානාපතීන් අත මාහැඟි පඬුරු යවා සිංහල රජු සතුටු කොට ඔවුන් නිදහස් කර ගෙන රජු සමග මිත්‍රව සිටීමට ඕලන්ද ආණ්ඩුකාර තැන විසින් යොදන ලද අනේක ප්‍රයත්නයන් සියල්ලම නිෂ්ඵල විය. රජ තෙමේ පඬුරු භාර ගෙන තානාපතීන් සිර කළෝ ය. මෙයාකාරයෙන් ඕලන්දයන් කෙරහි ඇති වූ රාජසිංහ රජුගේ කෝපා ගනිය කවර කලකවත් නිවීමට නොපැමිණියේ ය.

රාජසිංහ රජ ඕලන්දක්කාරයන්ට විරුද්ධව සිටින මේ කාලයේ අන් රටවලින් වස්තු උපයීමෙහි ආශාවක් ඇති වෙනත් ප්‍රලෝභි විදේශික මනුෂ්‍ය වර්ගයක් වූ ප්‍රන්සකාරයෝ වෙළදාම පිණිස ලංකාවේ කොටුවක් තනාගන්ට අදහස් කෙළේ ය. මේ අදහස සාර්ථක කර ගැනීම සඳහා වර්ෂ 1672 දී මොන්ෂේර් ද ලාහේ නම් අද්මිරාල් නාවික සෙනෙවි තැන යුද්ධ නැව් 14 ක් සමග කොට්ටියර් වරයාට පැමිණියේය. ලංකා භූමියට තමන්ගේ ප්‍රවිෂ්ටවීමේ අදහස සැළ කොට කොටුවක් තනා ගැනීමට අවසර ලබා ගැනීම පිණිස අද්මිරාල් තැන මහ නුවරට රජහට පිළිගන්වනු සඳහා අනර්ඝ පඬුරු ගන්වා දූතයන් තිදෙනකු යැවූයේය. රජතුමා විසින් මේ දූතයන් තිදෙන සතුටින් පිළිගනු ලැබ ඔවුන්ට රන් මාලා තුනක් හා රත්‍රන් ඔබ්බන ලද කඩු තුනකුත් ත්‍යාගි කොට දී කොට්ටියාර් නම් ස්ථානයේ කොටුවක් තනා ගැනීමට අවසර දෙවා වදාරන ලදී. ඉක්බිති මේ දූතයන්ගෙන් දෙදෙනෙක් මහනුවර නැවතී අනිත් දූතයා ඔවුන්ගෙන් මෙහෙය සඵල වූ බැව් දන්වීමට අද්මිරාල් තැන සම්මුඛවීමට ගියේ ය. රජහුගේ අවසරය පරිදි අද්මිරාල්තැන කොට්ටියාර් වරාය අසල කොටුවක් තනා ගෙන ස්වජාතියේ ස්තුති සහිත ගෞරවය රජ හට පුද කිරීම පිණිස ප්‍රන්ස රාජ්‍යයේ වංශවත් පසුවලකට අයිති ලනරෝල් නැමැති මහතෙක් තානාපති තැනමෙන් තවත් ප්‍රන්ස මහතුන් සදෙනෙකුත් සමග මහනුවර පිටත්කරයවා, තෙමේ යම්කිසි හදිසි කටයුත්තක් පිණිස යුද්ධ නැව් සමග ඉන්දියාවට පිටත්ව ගියේය.

උඩරට සිරිත් විරිත් ගැන කිසිත් නොදත් ලනරෝල් නම් වූ මේ තානාපති තැන අශ්වාරූඪව මහනුවරට පැමිණියේය. අශ්වාරූඪව එහි ප්‍රවේශවීම රාජගරුත්වයට බාධක බැවින් එසේ කිරීම තහනම් බැව් රාජාමාත්‍යයන් විසින් ඕහට දන්වන ලදුවත් හෙතෙම ඒ මත කිසිසේත් නොපිළිගෙන ගර්විත ස්වභාවක් දක්වා ක්‍රියා කෙළේ ය. එසේ වුවත් තානපති තැන සහ ඔහුගේ පරිවාර ජනයාත් ඔවුන්ගේ නිවාසය පිණිස පිළියෙළ කොට තිබුණ ගෘහයට කැඳවා ගෙන ගොස් රාජසේවකයන් විසින් ඔහුට මොනවට ආගන්තුක සත්කාර කරන ලදී. ස්වල්ප දිනකට පසු

Non-Commercial Distribution

රජතුමා බැහැදැකීම පිණිස තානාපති තැන මාලිගයට පෙළහරකින් ගෙන යන ලද්දේ ය. ලනරෝල තානාපති තැන දෙපෑයක් පමණ කාලයක් මඟුල් මඩුවේ නැවතී සිටි පසුත් රජුගේ එහි පැමිණීම ප්‍රමාද වූ බැවින් ඊට වැඩිවේලා තමාට එහි නතර වෙන්ට උවමනා නැතැයි කියා සිය නිවෙසට යන්ට ගියේය. ලන්රෝල් මහතාගේ මේ අසම්මාන උද්දච්ච ක්‍රියාව දුටු ඔහු පිරිවර කොට අවශේෂ ප්‍රන්සකාරයෝ සදෙන මේ ගැන රාජ උදහස සැක නැතිව ලැබෙන බැව් දූන් ඔහු අත්හැර දමා පලා ගියෝ ය. රාජසිංහ රජ තානාපති තැනගේ අහංකාර පරවශ ක්‍රියාව ගැන අසා කෝප වී මහ නුවර පළමු නැවතී සිටි දූතයන් දෙදෙන හැර අනිකුත් සියලුම ප්‍රන්සකාරයන් අල්වා ඔවුන්ට තලා දුර්වල කොට ඔවුන්ගේ අත් පා විලංගුලන්ට අණ කෙළේ ය. රාජ පුරුෂයන් විසින් ඒ ආඥාව යුහුව ඉෂ්ට කරනලද්දේ ය. ඉක්බිති තානාපති තැන සමග පිරිවර කොට ආ ප්‍රන්සකාරයන් සදෙන ස්වකීය නිර්දෝෂභාවය ඔප්පුකර සිටියෙන් ඔව්හු අත් පා බන්ධනයෙන් මුදා නිදහස් කර හරින ලද්දෝ ය. එහෙත් තානාපති තැන සමසක් පමණ කාලයක් මාංචු සහිතව හිරභාරයේ සිටියේය. ඉන් පසු ඔහු ද නිදහස ලබා ගෙන ලංකාවේ කලක් ජීවත්ව සිට මෙළේ ය. ඔහුගෙන් පැවතෙන්නෝ, අද දක්වාත් ලංකාවේ සිටිත්, ප්‍රන්සකාරයන් විසින් ගොඩනගන ලද කොට්ටියාර් කොටුව ඕලන්දක්කාරයන්ට අයිති විය. ලංකාවේ කිසියම් ප්‍රදේශයක සෛවරී බලය පැවැත්වීමට ප්‍රන්සයන් විසින් ගන්නා ලද උත්සාහය යථෝක්ත තානාපතිතැනගේ අහංකාර කම නිසා නිෂ්ඵල වූ බැව් පෙණේ.

දෙවෙනි රාජසිංහ රජු සෙංකඩගල නුවර රාජ්‍යය කරන සමයෙහි අලගියවන්න මුකවෙටි නම් ප්‍රසිද්ධ සිංහල කවීන්ද්‍ර තෙමේ ජීවත්ව සිටියේය. මේකවිවර තෙමේ ඡන්දෝලංකාරාදියෙන් අනූන වූ කර්ණරසායන කාව්‍ය ප්‍රබන්ධ කිරීමෙහි විචක්ෂණ පඩිතුමෙකු බව ලංකාවාසීන් විසින් එකහෙලා පිළිගන්නා ලද්දකි. "ලංසි තෝම්බුව" නමින් මෙකල ප්‍රසිද්ධ ඕලන්දක්කාරයන්ට අයිති මුහුදු බඩ පළාත්වල වැසියන්ගේ පෙළෙපත් සහ ගෝත්‍රනාම සටහන් කර තෝම්බුවක් හෙවත් ලේකම් පොතක් පිළියෙල කරනු පිණිස කොළඹ ඕලන්ද ආණ්ඩුකාරයා විසින් සමර්ථ ලේකම් කෙනෙක් පත් කර දෙන ලෙස රාජසිංහ රජුගෙන් ඉල්වන ලද්දේ ය. රජු විසින් මුකවෙටි හෙවත් මොහොට්ටාල නම් වූ යථෝක්ත බැරෑරුම් ධුරයට මේ කවීන්ද්‍රයා පත් කරනු ලැබී ය. මේ කවි වරයා විසින් නිර්මාණය කරන ලද කාව්‍ය ප්‍රබන්ධ සමහරක් නම් :- කුස ජාතක කාව්‍යය, සැවුල් අස්න හෙවත් කුක්කුට සන්දේශය, සුභාෂිතය, දහම් සොඬ ජාතක කාව්‍යය, මුනිගුණ රත්නමාලය, මහ හටන, ප්‍රංගි හටන. නීතිසාරය, දුශ්ශිලය., ශ්‍රිංගාරය, යනාදිය වේ. ඉංග්‍රීසි භාෂාව උසස් ලෙස උගැන්වීමට ලෝකයේ සියලුම ඉංග්‍රීසි

Non-Commercial Distribution

පාඨශාලාවල මේ දක්වාත් භාවිතා කරන ෂේක්ස්පියර් නම් කවිවරයාගේ කාව්‍ය ප්‍රබන්ධ යම් සේ ද, එමෙන්ම සිංහල උසස් විභාග වලට සූදානම් වන නවීනයන් විසින් මෙතුමාගේ කර්තෘත්වයෙන් පළවී තිබෙන මාහැඟි කාව්‍යපුස්තක සාදරයෙන් පරිශීලනය කරනු ලබත්, මෙතුමා සීනාකොරළේ ගඟබොඩපත් තුවේ හිස් වැල්ල නම් ග්‍රාමය නින්දගම් කොට ලබාගෙන එහි වාසය කෙළේ ය.

දෙවෙනි රජසිංහ රජ අවුරුදු පණසක් ලංකාවේ රාජ්‍යානුශාසනා කොට වර්ෂ 1684 දී ජන්මාන්තර ගත විය. මරණය සිද්ධ වෙන විට ඔහුගේ වයස අවුරුදු 87 ක් පමණ වියයි කල්පනා කර තිබේ. මේ රජ යුද්ධ ශිල්පයෙහි අති දක්ෂයෙක්ව සිටියේ ය. හෙතෙම සාමාන්‍ය සිංහල මනුෂ්‍යයන්ට වඩා කලු පැහැයෙන් යුත් ස්ථුල දේහයක් ඇති ශක්ති සම්පන්න නිර්භීත වීර පුරුෂයෙකි. පළමුවෙනි රාජසිංහ රජුගේ ඇවෑමෙන් යුරෝපිය ජාතින්ගේ එඩිතර ගති මර්දනය කර ගෙන සිටි මොහුට සම කළ හැකි අන්කිසි සිංහල රජෙක් ලංකා ඉතිහාසයෙහි සඳහන් නොවී ය. මෙසේ තෝජෝ බල පරාක්‍රමයෙන් උපලක්ෂිතව වැජඹියේ ද ඔහු කෙරෙහි විද්‍යාමාන කෲරගති නිසා රට වාසීහු යථෝක්ත භූපාලයාණන්ගේ ක්‍රියාපරිපාටියෙහි බෙහෙවින් අප්‍රසන්නව සිටියා හු ය.

මේ රජු සමයෙහි සිදු වන මෙහි පහත දක්වනු ලබන කථා ප්‍රවෘත්තිය කියවීමෙන් එකල ලංකාවේ විසු ස්ත්‍රීන්ගේ ශාස්ත්‍ර දැනීමෙහි ප්‍රමාණය තේරුම් ගත හැකි වේ. දස්කෝන් සිරභාරයේ සිටි කාලයෙහි ඔහු කෙරෙහි

---

මේ ප්‍රබන්ධයන් අතුරෙන් අන්තිමට දක්වන ලද "ශෘංගාරය" නම් කාව්‍යය වනාහි රාජසිංහ රජුගේ ගුණවර්ණනාත්මක කාව්‍ය රචනාවකි. මේ කාව්‍යයෙහි ස්වභාව දැක්වීම පිණිස ඉන් උපුටාගන්නා ලද කවි තුණක් මෙහි බහාළන්නෙමුඃ-

1. "න ද සවනේ යකුහඬ ලෙසි නේ පරපුටු නොම් නේ දෙන තුරු මුදු නේ
ම ද පවනේ තද ගිම දෙමිනේ ගිනිසිළු ලෙසි නේ සිසිලෙස සැදු නේ
කොඳ සමනේ මල තුළ යහ නේ පෙති වැදුනුතැ නේ අවිමුනසෙ දූ නේ
ය ඳ පවනේ අද නොම වඩි නේ රජ සිහ රජු නේ උදහස් තදි නේ

2. පුන්ස ඳ කැ න් ගතවන් තැන ගිම්දෙය ගිම්තල රිවි ලෙසි නේ
තුන්ද සමන් සෙවුවන්දි කුසුම් ගෙන පෙතිතුළ දළ යහ නේ
නන්ද නොවන් නෙත බන්දු කුසුම් ලෙස විය කඳුලැලි නිති නේ
නින්ද මෙදුන් මනනන්ද උතුම් රජසිංහ නිරිඳුන් නේ

Non-Commercial Distribution

රාජසිංහ රජ තුළ පැවති ස්වභාවයට, ඇසැක්ස් හි ආදිපාදයාණෝ හිරකරනු ලැඹබ සිටිද්දී, එංගලන්තයේ එලැසබැත් රාජනියගේ සිතේ ක්‍රියා කරමින් තිබුන සිතිවිල වටල සමාන කළ හැකි යයි එක්තරා ඉතිහාස ග්‍රන්ථ කතෘවරයයෙක් සඳහන් කර තිබේ. ඇසැක්ස් හී ආදිපාදයාණන්ට ක්ෂමාවදිමට එලිසබැත් බිසව විසින් ඔහුට දෙන ලද මුදුව ආපසු එවනවා ඇතැයි ආශායෙන් බලාපොරෙතාත්ව සිටියාක් මෙන්ම, රාජසිංහ රජු ද දස්කෝන් අදිකාරමට ජීවිතදානය දීම සඳහා රජුගේ දයානුකම්පාව අයැදලියමනක් ඔහුගෙන් බලාපොරොත්තු වූයේ ය. ඇසැක්ස් හි ආදිපාදයාණන් විසින් එලිසබැත් බිසවට යවන ලද ඇගේ මුදුව නොටිං හැම්හී සිටු දේවිය ඇට නොදී සැඟෙව්වාක් මෙන්, දස්කොන් අදිකාරම

---

3. රිවි අවරග දිලෙ තෙයි වෙතෙයි සිසි උදයග මතු දිලෙ නෙයි
මදරද සැර විදි තෙයි ගතෙයි මම ඉඳිනෙමි බියමයි තෙයි
මෙමරඟ නොමකෙරෙ තෙයි සිතෙයි දුන් උන්රඟ පැවත වෙ තෙයි
තුන්යම නිදි අප තෙයි නෙතෙයි ඉන් රජසිහ රජුමයි තෙයි

**මෙම ප්‍රශස්ත කිව්වරයාගේ ජීවන චරිතය පිළිබඳ විස්තර කරුණු මුද්‍රිත සිතියම් සහිත කුසජාතක කාව්‍යය බලා දත යුතු.**

**දූනට හිස්සැල්ල නමින් ප්‍රසිද්ධයි**

**දෙවෙනි රාජසිංහ රජුගේ පියවූ සෙනරත් රජු දවස කෝන්ගසක් යට අතහැර දමන ලද ඕලන්දක්කාර ළදරුවෙකු රාජපුරුෂයන්ට සම්භවී රජුහට භාරදෙන ලදී. සෙන රත් රජතෙමේ පුත්‍ර සෙනහයක් උපදවා මේ ළදරුවා ඉතා ප්‍රවේශමින් ඇතිදැඩි කෙරෙව්වේය. ඔහු තරමක් වැඩිවිය පැමිණි සඳ රජතුමා විසින් ඔහුට නොයෙක් ශිල්පාශාස්ත්‍ර ප්‍රගුණ කරවන ලදී, මොහු ළදරු අවස්ථාවේදී කෝන්ගසක් යටදී අවුලාගනු ලැබූ හෙයින් හෝ ගැස්කවින් නම් මහතෙකුට දාව උපන් හෙයින් මොහුට "ගස්කෝන්" යන්නෙන් හින්නවී "දස්කොන්" යන නාමය ව්‍යවාහාර වූයේයයි යනු පරම්පරායාත කථායි; මොහුගේ රාජපාක්ෂික ගති සහ ක්‍රියා සුරත්‍වය නිසාත් මොහු සෙනරත් රජුගේ විශේෂ කරුණාව ලැබ රාජසභාවේ උසස් ධානාන්තරවලට පත්ව සිටියේය. සෙනරත් රජුගේ මරණින් පසු සිංහාසනයට පැමිණි ඔහුගේ පුත්‍ර දෙවෙනි රාජසිංහ රජු විසින් දස් කෝන් තම අග්‍රාමාත්‍ය ධූරයට හෙවත් පළමුවෙනි අධිකාරම් නිලයට පත්කරගන්නා ලදී.**

**රජතුමා සහ දස්කෝන් අතරේ කෙතරම් හිතෛෂික මිත්‍රසන්ථවයක් පැවැත්තේදැයි යතහොත් රාජමාලිගයෙහි සිත්සේ හැසිරීමට ඉඩ ප්‍රස්තා ලැබීතිබුණේය. මේ කාලයේ රජ මෙහෙසියට ලෙඩක් වැළඳී ඇගේ ජන්ම පත්‍රය පරීක්ෂා කළාවූ නැකතියන් විසින් ඇට බලිසාන්තියක් කරවන ලෙස අවවාද කරන ලදී. එවකට රෝගාතුරයාගේ ස්වභාරූපයම අඹා බලිකරන සිරිතක් පැවැත්තේය; බලි ඇඳුරෝද**

Non-Commercial Distribution

විසින් රාසිංහ රජගෙන් ක්ෂාමව අයවැද තනන ලද හෘදයාගම කාව්‍ය ප්‍රබන්ධනය අන්තර් ගත හස්න රජහට භාර නොදී ඔහුගේ සතුරන් විසින් යටපත් කරන ලද්දේය. දස්කොන් අදිකාරම විසින් ක්ෂාමාව ඉල්ලා එවන ලද අයදුම්පතක් නොලත් හෙයින් සහ බිස සමග ඔහු ගෘහ ධර්මානුරීතිය උල්ලංගණය කිරීමෙන් හැසුරුන ඉවට බිඳ හෙලිය නොහැකි අමුතු සාක්ෂි ඉදිියට පැමිණ හෙයිනුත් රජු විසින් ඔහු ශූලා රූඪ කරවීමෙන් ජීවිතක්ෂයට පමුණුවන ලදී.

---

බිසවගේ රූපානුකූලව මනාසේ බලියක් අඹා නිමකළහ. මේ රූපය දුටු දස්කෝන්තෙමේ වැඩිදුර කල්පනා නොකොට එහි අවයවයෙක්හි පිහිටි ඌනත්වයක් සම්පූර්ණ කරනු පිණිස ලපයක් සලකුණු කරන ලෙස බලිය ඇඹූ අයට නියම කෙළේය. මීටපසු රූපයෙහි සලකුණු කරන ලද ලපය නැරඹූ රජතෙමේ එය දස්කෝන්ගේ විධානයෙන් කරන ලද්දක් බැව් අසා දූන ඔහු කෙරෙහි ශංකා උපදවා විනිශ්චයක් කරන තුරු ඔහු සිරභාරයේ තැබ්බවිය. තමහට රහසින් පෙම් බැඳීම නිසා ස්වකීය ආදරවන්තයාට පත් බලවත් විපත ගැන දූඩිතර ශෝකයට පත් රජ මෙහෙසිය සැනසිලිදායක කාව්‍යමය හසුන්පතක් බන්ධනාගාරයෙහි සිරකොට සිටි දස්කොන්ට යැව්බවද ඊට පිළිතුරු වශයෙන් දස්කෝන් විසිනුදු රාගනිශ්‍රිත කවි පංතියකින් යුත් හසුනක් එවන ලද බවද කියා තිබේ. අනිසිවූ පරිදි දෘඪ බන්ධනයකින් කාම පාසයෙහි බැඳීසිටි මේ ආදරවන්ත යුවල විසින් හුවමාරු කරගන්නා ලදයි ප්‍රකට කවි දෙකක් මෙහි බහාලන්නෙමු.

රජ මෙහෙසිය විසින් දස්කොන්ට

1. "තුන්කල තුමුල වනයේ මල් රස නොවි ද
කන්තල ගජන් කොපුලත බිඟු රොනට වැ ද
කන්තල පහර වැනි නිරිඳුට අසුව ඉ ද
පින්කළ හිතනුවනි දූන් තැවෙනු කුමට ද

දස්කොන් විසින් රජමෙහෙසියට

2. විසැස් කමලාව රසපහස නොවිඳ මා
දසිස් දුනි පොරණ ඇසදුටු පමණට මා
වෙසෙස් නුඹේ අමයුරු පහස ලත් පෙ මා
මහිස් එකක් ගියනම් නුඹෙ නමට කි මා"

මේ කවි දෙකේ ඉංග්‍රීසි කාව්‍ය පරිවර්තනය හා එහි භාවාර්ථය ද ගෞරවාහි ජේම්ස් ද අල්විස් මන්ත්‍රිඥයාණන් විසින් සිදත් සඟරා උපන්‍යාසයෙහි මෙසේ දක්වා තිබේ.

Non-Commercial Distribution

# විමල ධර්ම සූරිය (දෙවෙනි)

## ක්‍රි.ව. 1684-1706

දෙවෙනි විමල ධර්ම සූරිය යන නාමයෙන් රාජ්‍යාභිෂේක ලැබ දෙවිසි වසක් පත් රජයෙහි අනුශාසනා කෙළේ ය. රාජසිංහ රජු තමාගේ මරණාසන්නයේ දී තම පුත්‍රයාට ඕලන්දක්කාරයන් සමග සාමදානයෙන් වසමින් රට ආණ්ඩු කරන ලෙස අවවාද කෙළේ ය. දෙවෙනි විමල දහම් සූරිය නරනිඳු ස්වභාවයෙන්ම උසස්විමට ආශාවක් හෝ ධෛර්යයී සම්පන්න බවත් නැති, සාමය භජනය කරන කෙනෙක් වූ බැවින් ඔහුගේ මුළු ආණ්ඩු කාලයෙහි සාමදානය පැවතුණේ ය. බෞද්ධාගමේ පෞරාණික තේජස නැවතත් උත්සන්න භාවයට ගෙන ඒම ඔහුගේ පරමාදර්ශය විය. මේ කාලයෙහි උපසපන් භික්ෂුගෙන් තොරව හුදු සාමණේර ගණනක්

---

Versified
(From the Queen to the Adigar.)

"As the honey loving bee, heedless thro' the forest flies,
Where the many coloured flowers tempt him with their rich supplies,
And by fragrance strange allured on the tusked head alights,
Victim of the flapping ears all amid the stol'n delights;
Thus, adored love, art thou captive of thy king and Lord;

Yet, dash sorrow from thy brow, cease to mourn my dear, adored."

"O meritorious lover! Wherefore dost thou lament, now that you are captured y the king! Captured like the bee which, without enjoying the sweets of flowers m the mighty forest during the theree seasons, alighted upon the elephant's cheek with a view to extract honey, and was struck by the elephants ears."

ANSWER BY THE CAPTIVE MINISTER
"Lanka's giant king enthrall'd, only by beauty's sight,
Laid down his twice five heads, uncroppd the flower of love's delight;

Then why should I, a happier swain, who with the Gods above,
Have revelled at the banquet rare of thy ambrosial love,
Repine with my one head to atone for my bold adventure,
To gain what sweetens human lives as long as they endure." (J.R.B.)

Since Rawana in days of yore offered for Lakshmee (Seeta) his ten heads, upon the mere gratification of his eye-sight, without enjoying connubial happiness; what siguifies if my only head fall for thy sake, whose ambrosial love I have enjoyed."
(Hon. Jammes De Alwis.)

Non-Commercial Distribution

ලක්දිව වැඩ සිටියේය, එබැවින් රජ තෙමේ රක්ඛංග (ඇරකන්) නම් දේශයට තානාපතීන් යවා ඒ රටින් භික්ෂූන් තිස්තුන් නමක් මෙහි වැඩම කරවා පෙරනියා ගැටඹෙ තොට උද්දකුකෙඛප සීමායෙහි අලංකාර ගෙයක් නිමවා කුල පුත්‍රයන් තෙතිස් දෙනෙකු උපසම්පදා කරවූයේ ය. රක්ඛංග දේශයෙන් භික්ෂූන් වහන්සේලා වැඩම වීම ගැන ඕලන්දක්කාරයෝ රජහට නැව් සපයාදීම් ආදියෙන් බෙහෙවින් උපස්තම්භක වූහ. මේ අතර ඕලන්දක්කාරයෝ ද රෝමානු කතෝලිකයන්ට හිංසා පීඩාදිය කරමින් රෝම සමය ලක්දිවින් මූලෝද්ධරණය කොට බැහැර කරනු පිණිස බලවත් ප්‍රයත්න දරවෝ ය. මේ කාලයේ දී වෙස්වලහා ලංකාවට පැමිණි ජෝසප් වාස් නම් රෝමානු කතෝලික පූජකයෙක් නිවසීමට ස්ථානයකුදු නොලැබ අනාථව ඇවිදිනේ කතෝලිකයන් විසින් ඔහු රෙපරමාදු භක්තික ලන්දේසීන්ට අසු නොවෙනු සඳහා පුත්තලමට පිටත් කර යැවූ හ. ඒ පූජක තැන එහි කලක් නැවතී සිට මහ නුවරට ගියේය. විමල ධර්ම තෙමේ ඒ පූජකයා ප්‍රතිකාලුන්ගේ චර පුරුෂයෙක් වනැයි සැක කොට බන්ධනාගරයක යැවී ය. ඔහුගේ අවිහිංසක බව දැන ගත් රජ තෙමේ දෙවසකට පසු ඔහු සිරෙන් නිදහස් කරනු ලැබ කිතු සමය දේශනා කිරිමෙන් කලක් මහ නුවර වාසය කරන අතර රෝගයක් වැළදී මළේ ය. වර්ෂ 1687 දී පමණ කොස්තන්තීනු හටන නම් කවි පොත සහ සිංහලයින්ගේ සහ ප්‍රතිකාලුන්ගේත් යුද්ධ සම්බන්ධ තවත් කවි පොත් කීපයක් සිංහල කවීන්ද්‍රයන් විසින් රචනා කරන ලද්දෝ ය. තව ද මේ රජු කාලයෙහි එනම් වර්ෂ 1699 දී ජේ. රුඇල් නමැති ඕල්න්දක්කාර මිසයෝ නාරි කෙනෙකු විසින් ඕලන්ද භාෂාවෙන් සිංහල ව්‍යාකරණ පොතක් ලියන ලද බැව් කියා තිබේ.

## ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ.

### ක්‍රි.ව. 1706-1739

විමල ධර්ම සූරිය රජුගේ අභාවයෙන් ඔහුගේ පුත්‍ර වූ කුණ්ඩසාල නම් කුමාරයා ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ යන නාමයෙන් මහ නුවර රාජපදප්‍රාප්ත විය, ඔහුගේ දීර්ඝ ආණ්ඩුකාලය මුළුල්ලේම පිය රජුමෙන් ඔහුද ඕලන්දයින් සමග විශ්වාස භාවයෙන් හා සමගියෙන් ද කාලය පාලනය කෙළේ ය. මේ රජ තෙමේ කුණ්ඩශාලා නම් ගමේ රාජමන්දිරයක් නිමවා වාසය කරනුයේ මද්‍යපානයෙහි අභිරතිව ක්‍රෑර ක්‍රියාවෙන් සහ දුරාචාරයෙන් ද කල්යැවී ය. මේ රජු මදුරාපුරයෙන් සරණ පාවාගෙනසිටි කුමරිය වර්ෂ 1721 දී කාලක්ෂය කළාය. මේ බැව් ඇසූ අයිසෙක් ඔගස්තින් රම්ප් නම් කොළඹ ඕලන්දක්කාර උතුමාණන් වහන්සේ විසින් තම ආණ්ඩුවේ ශෝකය

Non-Commercial Distribution

ප්‍රකාශ කරනු සඳහා කෝර්නේලියස් ටැකල් නම් මහතාගේ ප්‍රදානත්වය ඇතුව තානාපතිවරු කීපදෙනෙක් සෙංකඩගල නුවරට පිටත් කර යවන ලද්දෝ්ය.

රජ ඇමතියන් විසින් පිරිවරන ලද තානාපතිතුමා දර්ශන ශාලාව අභිමුඛයට වන්කල ජවනිකා සතරක් ඉවත් කරන ලද්දේ ය. ඒ තිර වලට මුවාව සිංහාසනාරූඪව උන් රජු දක්නා ලැබූ කලැ තානාපති තෙමේ දණනමා නමස්කාර කෙළේ ය. සෙසු සියල්ලෝම මුහුණින් හෙඳව නමස්කාර කළෝ ය. නැවතද සියලු දෙනම නැගී සිට අඩි කීපයක් ඉදිරියට ගමන් කොට තවත් දෙවරක් පෙරපරිද්දෙන් අභිවාදනය කොට රාජසනයට ලඟා වූහ.

ඉක්බිති රජතුමා පළමු කොට ඕලන්දක්කාර උතුමාණන් ප්‍රධාන කොට අවශේෂ අධිපතීන්ගෙන් ද සැප පහසු විචාරා තිසි පිළිතුරු ලැබුණු ඉක්බිති තානාපති තැනට බුමුතුරුණුවක (බිම එලනලද ඇතිරිල්ලක හෙවත් පලසක) වාඩි ගැනීමට අවසර දෙවාවදාළේ ය. එවිට කෝර්නේලියස් ටැකල් නම් ප්‍රධාන තානාපති තැන භූම්‍යසතරය පිට හිඳ කථා කරමින් පළමුව රජහු සුවදුක් විචාරා, ඊට ප්‍රත්‍යුත්තර ලැබුණු පසු තමන් සෙංකඩගල පුරවරයට ළඟාවීමේ ප්‍රධාන කාරණය දක්වනුයේ :- රජතුමාණන්ගේ ශ්‍රෙෂ්ඨවංශවත් (භාමිනීන්ට ඇති විය යුතු) උත්කෘෂ්ට ගුණාංග සම්පන්න රාජිනියගේ ස්වර්ගස්ථවීම අසන ලද පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමේ ඕලන්දක්කාර උතුමාණන් වහන්සේ සහිත ස්වකීය මන්ත්‍රණ සභාවේත් අනල්ප වූ චිත්ත සංවේගය රජතුමාණන්ට සැලකර සිටින පිණිස යයි. කිවේ ය. ඉක්බිති ටැකල් තානාපති තෙම යලිත් කථා කරමින් දෙවිමහොත්තමයාණන් වහන්සේ විසින් මහනුවර රජතුමා දිර්ඝා යුෂ සහ දික් සැපත් දෙමින් චිරාත් කාලයක් සතුරු වියවුල් රහිතව ආරක්ෂා කර දෙන සේක්ව යි ඕලන්දක්කාර ආණ්ඩුව යාඥා කර සිටින බව ඕලන්දක්කාර සෙනඟ රජතුමා සමග මිත්‍ර ධර්මයෙන් කල් යවන්ට ද රජතුමාගේ අභිවෘද්ධිය සඳහා උවමනා කටයුතු සම්පාදනය කර දෙන්නට අනවරතයෙන් සූදානම්ව සිටින්නෝ යයි ද වැඩිදුරටත් ප්‍රකාශ කෙළේ ය. මෙසේ ඉච්ඡාභාෂිතයෙන් සතුටට පත් කරනු ලැබූ රජතුමා පිළිතුරු දෙමින් ඍජු ගුණ සම්පන්න ඕලන්ද මනුෂ්‍යයන් විසින් දක්වන ලද ගෞරවාදිය ගැන බොහෝ සෙයින් ප්‍රසන්න වූ බව ද ඉර හඳ පවත්නා තුරු එවුන් සමග මිත්‍රභාවයෙන් සිටීමෙහි ආශා ඇති බව ද ප්‍රකාශ කෙළේ ය. ඕලන්දයෝ මෙයාකාරයෙන් පණ්ණකාර සහිත වූ තානාපතියන් යැවීම් ආදී කෛරාටික ක්‍රියාවලින් නරේන්ද්‍ර සිංහ රජු රවටා ගෙන ස්වකීය වෙළදාම දියුණු කර ගත්හ. රම්ප් උතුමාණන්ගේ ආණ්ඩු කාලය බොහෝ කරුණු වලින් යහපත්ව පැවතියේ යයි කිවහැකි

Non-Commercial Distribution

සේ හැඟෙතත් ඔහුගේ යටත් මුළාදෑනීන්ගේ අකටයුතු ක්‍රියා හේතු කොට ගෙන මුහුදු බඩ ප්‍රදේශ වල වැසියෝ විටින් විට කටුක පීඩා වින්දෝ ය. ඕලන්ද මනුෂ්‍යයන්ගේ අනාචාරශීලි ස්වභාවයට මර්දනය කිරීමට රම්ප් ආණ්ඩුකාරතුමා බලවත් උත්සාහ දැරූ නුමුත් ඒ කිසිවක් සාර්ථකනොවී ය.

රම්ප් උතුමාණන්ගේ අභාවයෙන් ඕලන්දක්කාර ආණ්ඩු ක්‍රමය අතිශයින් දූෂිත ස්වභාවයකට පෙරළි ගියේය. මේ කාලයේ කොළඹ සිටි වහල් මනුෂ්‍යයෝ කැරැල්ලක් උපදවා ඕලන්දක්කාරයන් කීප දෙනෙක් මැරුවෝ ය. වර්ෂ 1726 දී ඕලන්දක්කාර ආණ්ඩුකාර ධූරයට පත්ව ආ පේතාස් වූස්ට් නම් අයස් වෛරී බලය නොලත් නරපතියෙක් වීමට අදහස් කොට අත්තනෝමතික කෲරතර ක්‍රියා බෙහොමයක් කෙළේ ය. ඔහුගේ දුෂ්ට අදහස් වලට නොනැමෙ සියල්ලන්ටම කිසිම ශිෂ්ටාචාර ජාතියකට අයත් ඉතිහාසයක සඳහන් වී නොමැති ගොරතර වද බන්ධන ඔහු විසින් පමුණුවන ලදී, දරිය නොහෙන මේ අධම වූ ක්‍රියා කිසිවකු විසින් බෙතාවියේ ආණ්ඩුකාරයාණන්ට සැල කරනලදින් ඔහු ඕලන්ද ආණ්ඩුව විසින් හිරභාරයේ බෙතාවියට ගෙන යනු ලැබ එහි දී විනිශ්චයක් පවත්වා ඔහුගේ ශරීරය වධ චක්‍රයක මගින් කැබලි කොට පුළුස්සා අළු මුහුදේ පාකර හැර තිබේ. මීට පසු වර්ෂ 1729 දී ස්ටිපනුස් වැර්සලුයිස් නමැත්තා ආණ්ඩුකාර පදවියට පත්වී ආවේ ය. නොමනා ක්‍රියා නිසා ඔහුට පූර්වයෙන් සිටි ආණ්ඩුකාරයාට ලැබුණ කර්කශ වූ දණ්ඩනය ආදර්ශයට නොගෙන සහල් මිළ වැඩි කිරීමෙන් ලංකාවේ දුර්භික්ෂයක් ඉපදෙව්වේ ය. ඔහු ආණ්ඩුකාර ධූරයෙන් ඉවත් කරනු ලැබ ඔහුගේ වැඩ භාර ගැනීමට වර්ෂ 1834 දීදි ඩ්‍රෙක්පන් දොම්බරැක් නම් මහතා පත් කොට එවන ලදී. වැර්සලුයිස් නමැත්තා කෙතරම් නිර්භීත මුරණ්ඩු අයෙක් දැයි යතහොත් ආණ්ඩුකාර ධූරය භාර නොදී වරායේ නවතා සිටි පෙරදිග ඉන්දියානු සමාගමේ නැව් වලට වෙඩි තැබ්බවේ ය. පසුව ඔහු අල්වා හිරභාරයේ බෙතාවියට ගෙන යන ලදී, වර්ෂ 1736 දී ආණ්ඩුකාර ධූරයට පත්ව ආ ගෙස්තෝප් වෙලම්බරරෙන්පන් ඉන්හොප් උතුමාගේ කාලයේ දී ඕලන්දක්කාරයන්ට අයත් ප්‍රදේශ බෙහෙවින් සමෘද්ධ විය. මේ තෙමේ සාධාරණ ආණ්ඩුකාරයෙක් වූ බැවින්, ලක්වැස්සන්ට පීඩා කිරීමෙන් ස්වකීය වෙළඳ සමාගමට අලාභ හානි පැමිණෙන බව ගණනය කොට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කෙළේ ය, පොදු ජනයාට ඉන්දියාව සමග වෙළදාම් කරන්ට අවසර දී මෙරටින් පිටරට යවන්නා වූ ද පිටරටින් මෙහි ගෙනනු ලබන්නා වූ ද බඩු වලට මුදු බද්දක් ගෙවන්ට නියම කෙළේ ය. තීරුව යයි සම්මත ලංකාවේ මුදු බද්ද අය කිරීම මෙයින් ප්‍රාරබ්ධ විය. මේ කාලයේ වැවිලි කර්මාන්තය සමෘර්ධියට පමුණුවාලීම සඳහා කටයුතු සලස්වන ලදී. කුරුඳු පමණක් නොව නොයෙක් පළාත්වල ගම්මිරිස්, කර්ද මුංගු කෝපි ආදිය ද මුහුදු කර ප්‍රදේශයේ

Non-Commercial Distribution

විශේෂයෙන් පොල් වැවීමට ද නියම කරනලදී. ලක්දිව බාල බාලිකාවන්ගේ ශාස්ත්‍රාභ්‍යාසය පිණිස ශිල්ප ශාලා පිහිටුවා ඊට උවමනා පොත් පත් මුද්‍රණය කිරීම පිණිස මුද්‍රා යන්ත්‍රාලයක් ද පිහිටුවන ලදී. මේ ජනහිත උතුමා ආණ්ඩුකාර ධූරයෙහි නියුක්ත ලසු කාලය තුළදී සාමාන්‍ය ජනයාගේ ප්‍රයෝජනය සලකා කරන ලද සම්‍යක් ව්‍යායාමයෝ අනල්ප වන්නා හ.

ශ්‍රීවීරපරාක්‍රම නරේද්‍රසිංහ නරජ්‍යෙෂ්ඨ තෙමේ මෙසේ ලෞකික සමාදානයෙන් හවුරුදු දෙතිසක් ආයුශ්‍රී වින්දනය කොට වර්ෂ 1739 ජන්මාන්තර ගත විය. මේ රජුගෙන් පසු, විජය රජුගේ කාලයේ සිට අවුරුදු 1282 ක් අඛණ්ඩව පැවත ආ විශිෂ්ට ආර්ය සිංහල රාජ පෙළපත ලංකා භූමණ්ඩලයෙන් අන්තර විය. මේ රජතුමාගේ ආණ්ඩුකාලයෙහි සාරසංග්‍රමය භෙසජ්ජමඤ්ජූෂය වරයෝග සාරය නමැති ප්‍රශස්ත වෛද්‍ය ග්‍රන්ථ හා මහා බෝධි වංශය සහ රාජරත්තකරය යන මාහැඟි ඓතිහාසික ග්‍රන්ථයන්ද නිර්මාණයට පමුණු වන ලද්දාහු ය.

## ශ්‍රී විජය රාජසිංහ
### ක්‍රි.ව. 1739-1747

ආයුෂක්ෂය බවට පැමිණි නරේද්‍රසිංහ රජ මදුරාපුර නායක්කර් වංශයේ කුමරියක් බිසව කොට සරණ පාවා ගෙන සිටියේ ය. මේ රජහට රාජ්‍ය පරිපාලනයට ස්වකීය පුත්‍රයෙක් නොසිටියෙන් තම මෙහෙසියගේ බාල සොහොයුරු තෙම නරෙන්ද්‍ර සිංහ රජුගේ අභාවයෙන් ශ්‍රි විජය රාජ සිංහ යන නාමයෙන් ලංකා සිංහාසනයෙහි රජ විය. මේ රජ රාජ්‍ය කළ අටු අවුරුද්ද මුළුල්ලේහි කිසි කොල්හාලාදියක් නොමැතිව සමාදානය පැවතුණේ ය. පළමු බ්‍රහ්මාගමිකාරයෙක්ව සිටි මේ නරසිරු තෙමේ රාජ්‍ය ශ්‍රීයට පැමිණි පසු සම්බුද්ධ සමය වැළඳ ගෙන ස්වසමය දියුණු කිරීමෙහි නිරත වූයේ ය. මීට ඉහත රාජාණ්ඩු කාලවලදී යුද්ධ කොලහාල කරණ කොට ගෙන ජින්නභින්නත වූ විහාරාම ප්‍රතිමා මන්දිරාන් පිළිසකර කරවීමෙන් ශාසනානුග්‍රහ කරන ලදී. අළු ලෙන ඔත්පිළිමයෙහි ජරාවාස හරවා නව කර්මාන්තයෙන් නිමවන ලදී. මේ තෙමේ අචල ශ්‍රද්ධාවෙන් යුක්ත රත්ත්‍රයෙහි සරණ පරායණව බෞද්ධයෙක්ව සිටි බැවින් ක්‍රිස්තියානි භක්තිකයන් රටින් නෙරපාදැමී ය, ජීර්ණව තුබූ රාජ මන්දිරාදින් පහ කොට ඒ වෙනුවට ශෛල කර්මාන්තාදියෙන් බබළන්නාවූ සිත් කළු මන්දරයන් කර වූයේ ය. මේ නරනිඳු තෙමේ හඟුරන් කෙත ශාඛා නගරයක් කරවා එහි රාජ මන්දිරයක් සැදෙව්වේ ය.

Non-Commercial Distribution

# කීර්ති ශ්‍රී රාජසිංහ
## ක්‍රි.ව. 1747-1780

ශ්‍රී විජය රාජසිංහ රජුගෙන් පසු උහු මෙහෙසියාගේ සොහොවුරු වූ මදුරාපුර නායක්කර් පෙළපතේ කුමාරයෙක් කීර්ති ශ්‍රී රාජ සිංහ යන නාමයෙන් ලංකා සිංහාසනයෙහි තෙතිස් වසක් රජය කෙළේ ය. මීට ඉහත උඩරට රජ කළ රජවරු තිදෙනා හා ඕලන්දක්කාරයන් අතර පැවති සමඟි සම්පන්න භාවය මේ රජු සමයෙහි භග්න විය. කීර්ති ශ්‍රී රාජ සිංහ රජ ඕලන්දක්කාරයන් ලක් දිවින් නෙරපා දැමීම පිණිස නොයෙක් විට යුද්ධ සේනාවන් පිරිවරා ගෙන මුහුදු බඩ ප්‍රදේශ වලට ගොස් සටන් කළ නුමුත් එයින් කිසි ජයක් අත් පත් නුවූයේ ය. ඉක්බිති උඩරට ජන ප්‍රධානීන් අතර යම් යම් කාරණ නිසා පැවති අසමගිය දැන ගත් ඕලන්දක්කාරයෝ, වර්ෂ 1763 දී හේවායන් 8,000 කින් යුත් සංග්‍රාමික සේනාවක් සමග මධ්‍යම පළාතට ගොස් මහ නුවර අත්පත් කොට ගත්තෝ ය. නුමුත් නව මසක්වන්ට ප්‍රථම සිංහලයන්ගෙන් ලැබෙන ලද අනේක වධ හිරි හැර ද ආහාර පානාදිය හිඟවීමෙන් වූ අභික්ෂභය සහ රෝග පීඩාදියත් හේතු කොට ගෙන ඕලන්දයෝ මහ නුවර අත්හැර දමා ස්වකීය මුහුදු බඩ ප්‍රදේශ බලා ගමන් ගත්හ. දුර්වලතා කරණ කොට ගෙන යථොක්ත හේවායන් සීඝ්‍ර ලෙස ගමන් කිරීමෙහි නොපොහොසත් වූයෙන් ඔවුන් පසු පස්සෙහි එලවා ගිය සිංහලයන් විසින් ඕලන්දක්කාර හේවායන් බොහෝ දෙනෙක් මරණ ලද්දෝ ය, ඉතිරි ඕලන්දක්කාරයෝ සීතාවකට පැමිණි කල සිංහල සේනාවෝ එවුන් වටලා 400 දෙනෙකු මැරූවෝ ය. ජීවත්ව සිටි ස්වල්ප දෙන ඉතා දුර්වලභාවයෙන් කොළඹට වන්හ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ මනා ආණ්ඩු ක්‍රමය කරණ කොට ගෙන උඩ රැටියෝ යසසින් කල් යැවූ නුමුත්, පහත රට වැස්සෝ ඕලන්දයින්ගේ කෲර තර නොපණත් ක්‍රියා හේතු කොට ගෙන අනේක දුක්ඛයන්ට ගොදුරු වූහ. පෙර සිටි ඩන්හොප්තුමාගේ සාධාරණ ආණ්ඩු ක්‍රමය අවලංගු කොට හෙළදිව් වැස්සන්ට හිංසා පීඩා පැමිණෙන අයුරු නීති ප්‍රතිපාදනය කළහ. ජාන් සෙක්‍රදර් නම් ආණ්ඩුකාරයාණන්ගේ කාලයෙහි, එනම් වර්ෂ 1761 දි පහත රට සිංහල මිනිස්සු ඕලන්දයට විරුද්ධව කැරළි කෝළහාල කළාහු ය. මේ පිණිස උඩරැටියෝ ද සහභාගි වූහ. නුමුත් වර්ෂ 1762 දී මෙහි ආණ්ඩුකාර ධූරයට පත්ව ආ ලොබාර්ත් ජාන් බරොන් පන් ඇක් නම් ඕලන්දක්කාර ආණ්ඩුකර තැන සිංහල රජුට විරුද්ධව නැවතත් යුද්ධාරම්භ කොට උඩරට බොහෝ ප්‍රදේශ විනාශ කෙරෙව්වේ ය. : බොහෝ සිංහල මිනිස්සු ගේ දොර හැර දමා වල්

Non-Commercial Distribution

වැදුණෝ ය. මේ කෲර ආණ්ඩුකාර තැන නොබෝ කලකින් හදිසි රෝගයක් වැළඳ මරු වසඟයට පැමිණි හෙයින් ඕලන්දක්කාරයෝ දුබලව කොළඹ කොටුවට වැදී උන්හ. ලංකාණ්ඩුකාර ධූරය ලැබ පැමිණි ඊමන් විල්ලැම් ප්ලැක් උතුමා වර්ෂ, 1766 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමාදාන ගිවිසුමකට බඳවා ගෙන යුද්ධය නැවැත් වූයේ ය. මේ ගිවිසුමෙන් පසු ඒ තාක් මානාධික උඩරට රජ වාසල විසින් ඕලන්දක්කාර තානාපතීන් ගෙන් ලබන ලද මුහුණින් හෙව කරන බැහැදැකීම නැවතුණේ ය. එපමණකුදු නොව මඩකලපුවේ සහ පුත්තලමේත් පිහිටි කොටුපෙතෘ දෙක ඕලන්දක්කාරයන්ට භාර දෙන ලදී. මුහුදුබඩ ප්‍රදේශයෙහි ඕලන්දක්කාරයින්ගේ සෛවරී බලය ඇති ආණ්ඩු ක්‍රමයක් පැවැත්වීමට සහ උඩපාත දෙරට වැස්සන් අතරේ වෙළදාම් ගනුදෙණු කිරීම ගැන ද සම්පූර්ණ නිදහස ලැබුණේ ය. නමුත් කුරුඳු ගම්මිරිස්, කර්දමුංගු කෝපි පුවක් යන මෙකී ද්‍රව්‍යාදිය නියම ගණනකට ඕලන්ද වෙළඳ සමාගමට පමණක් විකිණීමට නියම විය. ප්ලැක් උතුමාණන් වහන්සේ වර්ෂ 1765 සිට වර්ෂ 1785 දක්වා විසි අවුරුද්දක් ලංකාවේ ඕලන්දක්කාරයන්ට අයිතිව තිබූ ප්‍රදේශ ආණ්ඩු කෙළේ ය. එතුමාගේ මේ දීර්ඝ ආණ්ඩු කාලය තුල කෘෂි කර්මාන්තය අතිශයින් සමෘද්ධියට පැමිණයේ ය. ආණ්ඩුවේ කාර්‍යාධිකාරයන්හි නියුක්ත නිලධාරීන් අතර බොහෝ කලක සිට පැවති දූෂිත ක්‍රියා එතුමන් විසින් බැහැර කොට එහි අවංක භාවයෙන් යුද්ධ ශිෂ්ට පිළිවෙලක් ඇති කරවන ලදී. සිංහල මිනිසුන්ගේ සිරිත් පැවැත්වීමට බාධාවන අණ පණත් බැහැර කරන ලදී. එතුමාගේ ඥාණවත් ආණ්ඩු ක්‍රමය හේතු කොට ගෙන ආදායමේ සංවර්ධනයක් ඇති වූවා පමණක් නොව උඩරට වාසීන්ගේ ආධාර නොමැතිව කුරුඳු සපයා ගැනීමට ද හැකි වූයේ ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ තෙමේ පළමුව බ්‍රහ්මාගම්කාරයෙක්ව සිටියේ ද මහනුවර උපොසථ පුෂ්පාරාම විහාරධිවාසී සරණංකර නම් සාමණේරයන් වහන්සේ නමකගෙන් සම්බුද්ධ ධර්මට හා ලෝක නීති ආදිය අසා උගෙන බුද්ධ ශාසනයෙහි මමත්වයක් ඇති කර ගත්තේ ය. ලක්දිව් වැස්සන්ගේ ශාස්ත්‍රයෙහි පටුත්වය දේවානම් පියතිස්ස දෙවන පෑතිස් රජහු කැලැ පටන් කලින් කල අඩු වැඩිව පැවැත්වුන සීතාවක රාජසිංහ නම් අදම නරේන්ද්‍රයන් විසිනුදු, ප්‍රතිකාලුන් විසින් නටබුන් කොට ශේෂව තුබු විහාර දේවාල හා සංඝයා ද පොත් පත් ද විනාශ භාවයට පමුණුවන ලද්දේ ය. මෙසේ පරිදේශික නරපතීන් හා මිත්ථ්‍යා දෘෂ්ටික රජවරුන්ගේ කෲරතර ක්‍රියා හේතු කොට ගෙන ලෝක ශාසන පරිහානියෙන් ශාස්ත්‍රාගම ඉතා හීන වූ කාලයෙහි විමල ධර්ම සූරිය මහ රජාණන් විසින් රක්ඛංගයෙන් සංඝයා වැඩමවා ශේෂ වූ සාමණේරයන් වහන්සේලා මහණ මහලු පැවිදි කරවූ නුමුත් ඒ රජතුමාගේ ආයුසංෂ්කාරය පිරිහීමෙන් නැවතත් ප්‍රතිකාලුන්ගේ කලහ හේතු කොට ගෙන ලක් සසුන් නටබුන්ව ගියහ. ඒ දූර්වල වූ කාලයෙහි සාමණේර ටික දෙනෙක් හැර අනික් සියල්ලෝ

Non-Commercial Distribution

අභාවප්‍රාප්ත වූහ. ඉහත දක්වනු ලැබූ මේ වැලිවිට පිණ්ඩපාතික සරණංකර සංඝරාජ මා හිමියාණෝ වනාහී ඒ ශාසන දුර්වල කාලයෙහි ඉතුරු වූ හෙරණුන් වහන්සේලා අතුරෙන් එක නමක් විය.

කීර්ති ශ්‍රී රාජසිංහ නරසිරු තෙමේ මෙකල ලක්දිව එකම උපසම්පදා නමකුදු නැති බව අසා, ලංකාවේ උපසම්පදාව නැවතත් පිහිටුවන පිණිස සංඝයා වැඩමවා ගෙන එන්ට විල්බා ගෙදර මුදියන්සේ සහ තවත් තිදෙනෙකුත් සියම් දේශයට පිටත් කර යැවී ය. ඔව්හු වර්ෂ 1750 දි ඕලන්දක්කාරයන්ගේ නැවකින් තිරිකුණාමලයෙන් පිටත්ව ගොස් සියමට පැමිණ සිංහල රජු විසින් යවන ලද පණ්ඩාකාර සහිත රාජ සන්දේශ පත්‍රය ද සියම් මහ රජතුමාට ඔප්පු කළෝ ය. සියම් රජ තෙමේ ජිනධම්මාන්තර්ගත පොත් පත් ද දී උපාලි මහ ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති අතිරේක දර්ශවර්ගික භික්ෂු සංඝයා ලංකාවෙන් ගිය දූතයන් කැටුව මෙහි පිටත් කර එවීය. වර්ෂ 1751 දී මේ ස්ථවිරයන් වහන්සේලා ගේ ආධාරයෙන් බොහෝ සංඝයා උපසම්පදා කොට ලංකාවේ උප සම්පදාව නැවතත් ප්‍රතිෂ්ඨාපණය කරන ලදුව වැලිවිට සරණංකර නම් ස්ථවිරන් වහන්සේ සංඝරාජ යන නාමයෙන් සංඝයා අතරේ ප්‍රධානතත්වයට පත් කරන ලද්දේ ය. එපමණකුදු නොව මේ සඟරාජ තෙරුන් වහන්සේට රජුගේ ප්‍රතිෂ්ඨාධාරය ඇතිව ශ්‍රී පාදස්ථානයෙහි නායක පදවියට හිමිකර දෙන ලදී. ශ්‍යාමදේශගත සංඝයා සයවසක් මුළුල්ලෙහි සම්බුද්ධ ශාසන සංවර්ධනයෙහි අනවරතයෙන් නිරතව සිට නැවතත් සියරටට වැඩියෝ ය. මේ නරශ්‍රේෂ්ට තෙමේ දන්ත ධාතූන් වහන්සේ පෙරහරින් නුවර වීථිවල වැඩම වීමට ද අණ කරන ලද්දේ ය. දැනට සහ නුවර වර්ෂයක් පාසා මහෝත්සවාකාරයෙන් පවත්වනු ලබන උදාරතර දළදා පෙරහර මෙසේ ආරම්භ විය. තවද මේ රජහුගේ ආරාධනාවෙන් යථාර්ත සරණංකර සංඝරාජං ස්වාමිපාදයන් වහන්සේගේ අනුශිෂ්‍ය වූ හීනටි කුඹුරේ සුමංගල නම් යතීන්ද්‍රයන් වහන්සේ විසින් මිලින්ද ප්‍රශ්නය මාගධි භාෂාවෙන් හෙළදිව් බසට නගන ලදී. මේ රජු දවස තිබ්බොටු වාවේ සිද්ධාර්ථ මහානායක තෙරුන් වහන්සේ විසින්, කුරුණෑ ගල රජ කළ පරාක්‍රමබාහු රජුගේ කාලයේ පටන් ක්‍රිස්තු වර්ෂ 1758 වනතුරු ලංකා පුරාවෘත්ත කථාව ලියා මහා වංශයට එකතු කෙළේ ය. සංඝ්‍යරාජ ශිෂ්‍ය වූ අත්තරගම බණ්ඩාර රාජගුරු නම් ප්‍රශස්ත පඬිවරයා මේ රජුගේ කාලයේ දී සෙංකඩගල නුවර වාසය කෙළේ ය. කාරක පුෂ්පමඤ්ජරි සුධීර මුඛමණ්ඩන නම් පාළි ව්‍යාකරණ පොත් මේ පඬිවරයා විසින් කරන ලද ග්‍රන්ථයෝ වන්නාහ. නමස්කාර ශතකය නමැති පොත ලියවන ලද්දේත් මේ කාලයේ දී ය. වර්ෂ 1768 දී දකුණු පළාතේ ජනාධිපයෙක් වූ දිසානායක මුදියන්සේ මකරද්ධවජ නමැති සුප්‍රසිද්ධ කාව්‍ය පුස්තකය සෑදුවේ ය. මේ මුදලි තැන විසින් වල්ලි මාතා කථාව නමැති ද්‍රවිඩ කථා වස්තුවක් සිංහල

Non-Commercial Distribution

කාව්‍ය භාෂාවට නගන ලදී. කව්මිණි කොඩල, වියොගරත්න මාලය, රත්නවති කථාව, කිඳුරු ජාතකය, ආදී කර්ණ රසායන කාව්‍ය ග්‍රන්ථයන්හි කර්තෘ වූ පත්තායමේ ලියන ආරච්චි හෙවත් සමරජීව කවීන්ද්‍රයා ජීවත්ව සිටියේත් මේ කාලයේ දිය. පත්තායමේ ලේකම් ද්වනවාක්ෂරයන් ගෙන් යුත් කව්මිණි කොඬල නම් ප්‍රශස්ත කාව්‍යය ප්‍රබන්ධ කොට ඉලන්ගකෝන් මහ මුදලි මන්ත්‍රිවරයාණන්ට පිළිගැන් වූ විට එතුමා අතිශයින් ප්‍රීතියට පැමිණ බොහෝ තෑගි බෝග දෙන ලදී, මෙය දූනගත් මාතර පළාතේ කටුවාන නමැති ගමේ එවකට විසූ ප්‍රසිද්ධ කිවිවරයෙකු විසින් සරස්වතියගේ ආරාධනා වෙන් කව් කළ බැව් ප්‍රකාශිත කව් මිණ්මල්දම නම් කවි පොතක් තනා යථෝක්ත මුදලිඳුට ඔප්පු කළ එතුමා පොත හොදාකාර බලා සරසවතියගෙන් තෑගි ඉල්ලාගණින්නැ යි කීවේ ය යන මුඛ පරම්පරානුගත කථාවක් පවතියි. එසේ කීමට හේතු වූ කවිය මෙසේ යඃ-

මා මුවගෙහි වස න
සරසවිය නම් දෙවඟ න
මුනි බණක් එළුවෙ න
කියව මදිවට අයැද සිටියෙ න

පසුව මේ කාව්‍ය කර්තෘගේ සාමර්ථ්‍යය ගැන සුප්‍රසන්න වූ ඕලන්දක්කාර ආණ්ඩුකාරතුමා විසින් ඔහුට මුහන්දිරම් නාමයක් දෙන ලදින් එවක් පටන් ඔහු කටුවානේ මුහන්දිරම යන නාමයෙන් ප්‍රසිද්ධ භාවයට පැමිණියේ ය.

වර්ෂ 1763 දී පමණ ලක්දිව හස්තප්‍රාප්ත කර ගැනීමට අභිලාසයක් ඉංග්‍රීසින් තුළ හටගත් බව පෙනෙන්නට තිබේ. ඒ වර්ෂයේදී මදුරාසියේ ආණ්ඩුව විසින් පයිබස් නම් මහතෙක් කීර්ති ශ්‍රී රාජසිංහ රජු වෙත තානාපතියෙක් මෙහි එවන ලද්දේ ය. මේ තානාපති තැන ඕලන්දක්කාරයන් දිවයිනෙන් පිටවහල් කිරීම පිණිස ඉංග්‍රීසීන්ගෙන් උපකාර ලබා දෙන හැටියට සිංහල රජු සමග ගිවිසුමකට බැඳුණේ ය. නුමුත් ඒ පරස්පරානුමතිය ඉංග්‍රීසි ආණ්ඩුව කඩකළ හෙයින්, ඒ කාලයෙහි සිටි සිංහල මන්ත්‍රිවරු ඉංග්‍රීසින් සත්‍යවාදී ඍජු මනුෂ්‍ය වර්ගයක් කොට පිළිනොගත්තෝ ය. වර්ෂ 1780 වේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජ තෙමේ ඕලන්දයන් විසින් තමහට තෑගි කරන ලද අකීකරු අශ්වයකු පිටින් මහනුවර වීථියක ගමන් කරන විට අශ්වයා පෙරළි කිරීමෙන් බිම වැටී මළේ ය.

Non-Commercial Distribution

# රාජාධි රාජසිංහ

## ක්‍රි.ව. 1780-1795

### (ලංකාවේ ඕලන්දආණ්ඩුව අභාවයට පැමිණීම)

කීර්ති ශ්‍රී රාජසිංහ රජ අපුත්‍රකව මළ හෙයින් ඔහුගේ සොහොවුරු කුමරුවෙක් රාජාධි රාජසිංහ යන නාමයෙන් රාජ්‍යශ්‍රීයට පත්වූසේක. මේ කාලයෙහි ඕලන්දක්කාර ආණ්ඩුව ඉංග්‍රීසින්ට විපක්ෂව යුද්ධයකට මැදහත්ව සිටියේ ය, එබැවින් ඕලන්දක්කාරයන්ගේ පාලනය පිට එකල පැවති ලංකාවේ මුහුදු බඩ පළාත් අයිතිකර ගැනීම සඳහා ක්‍රියා කිරීමට එය කදිම ප්‍රස්තාවය යැයි මදුරාසියේ ඉංග්‍රිසි ආණ්ඩුකාර තැන වූ මැකාර්ට්නිසාමි කල්පනා කෙළේ ය. එබැවින් එතුමා ලංකාවේ ඕලන්දයන්ට අයිති බලකොටු පැහැර ගන්නා පිණිස සර් ඇඩ්වර්ඩ් හියුස් නම් (අද්මිරාල්) නාවික සෙනෙවි තැන යටතේ යුද්ධ නැව් කණ්ඩායමක් සහ සර් හැක්ටර් මොන්රෝ නම් (ජනරාල්) සේනාපති තැන යටතේ පාබල යුද්ධ හමුදාවක් ද පිටත් කර එවී ය. ඒ සමගම හියුබෝයිඩ් නම් මහතෙකු තානාපතියකු වශයෙන් මහනුවර රාජාධි රාජසිංහ රජු වෙත යැවී ය. සර් හැක්ටර් මොන්රෝ සේනාපති තැන ඔහුගේ යුද්ධ සේනාවත් සමග ගොඩ බැස වර්ෂ 1782 ක් වූ ජනවාරි මස 11 වෙනි දින නිරායාසයෙන් ත්‍රිකුණාමලය අත්පත් කර ගත්තේ ය. ඉක්බිති බොයිඩ් මහතා මහ නුවරට ගොස් සිංහල රජු බැහැ දැක ගනිමින් ඉංග්‍රීසින් ගේ රණ සූරත්වය ගැන විසිතුරු කථාවක් කොට ඉංග්‍රීසීන් සමග රජු ගිවිසුමකට බඳවා ගන්ට ප්‍රයත්න කෙළේ ය. ඊට නොසතුටු වූ සිංහල ඇමතියෝ බොයිඩ් මහතාට උත්තර දෙමින් :- මීට විසිවසකට පමණ පෙර ඕලන්දයන් සහ අප අතරේත් යුද්ධයක් පැවතුණේ ය. ඒකාලයෙදී ඉංග්‍රීසි තානාපතියෙක් මෙහි පැමිණ, ඕලන්දයින්ට විරුද්ධව සටන පිණිස අපට උපසත්මහ ව ක්‍රියා කිරීමට ඉංග්‍රිසීහු කැමති බව ප්‍රකාශ කෙළේ ය. අප ද ඊට සතුටුව උපකාර බලපොරොත්තුව සිටි නුමුත් තානාපති තැන පිටත්ව ගියාට පසු, ඉංග්‍රිසින් ගැන කිසිම ආරංචියක් මේ වනතුරු නො අසන ලද්දේ ය, ඉංග්‍රීසීන් හා ඕලන්දක්කාරයන් සංග්‍රාමයේ යෙදී සිටින මේ කාලයේ, ඕලන්දක්කාරයන් ලංකාවෙන් නෙරපාදැමීමට ඉංග්‍රිසීහු අපට සහායවීමට කැමතිව සිටින්නෝ ය යන කීම, අපට හිත ඇති කමකට ප්‍රකාශ කරන ලද්දකැයි විශ්වාස කළ නොහෙමු යයි කීහ. තවද අමාත්‍යයන් විසින් මෙසේ ඉතා පැහැදිලි උත්තරයක් දුන් පසු, රාජාධි රාජසිංහ රජ තෙමේ ද බ්‍රිතාන්‍ය රජයේ අග රජු සමග විනා අන් කිසි ඉංග්‍රීසි අනු පතියකු සමග ගිවිසුමකට බැඳෙන්නට නොකැමැති බව ස්ථිර වශයෙන් වැඩි දුරටත් ප්‍රකාශ කෙළේ ය. මේ සාකච්ඡාව සිංහල රජු බ්‍රිතාන්‍ය තානාපති තැනත් අතර කෙරෙන කාලයෙහි සර් ඇඩ්වර්ඩ් හියුස් යම් කිසි හදිසි කටයුත්කත් අරබයා ස්වකීය නැව් කණ්ඩායමත් ගෙන මදුරාසියට

Non-Commercial Distribution

පිටත්ව ගියේය. මේ අතරතුර සජරීන් නම් ප්‍රන්ස නෞකාධිපති කෙනෙකු විසින් ඉංග්‍රිසීන් එලවා දමා ත්‍රිකාණාමලේ කොටුව සහ ඒ අවට කොටුපේතෘත් අයිතිකර ගන්නා ලදී, තමන් ගිය කටයුත්තත් සඵල නොවී සෙංකඩගල නුවර සිට ආපසු හැරී ආ බොයිඩ් මහතාගේ චිත්ත ඛේදයට, ත්‍රිකුණාමලේ වරායේ ඔසවා තිබුන ප්‍රන්ස කොඩිය කාරණයක් විය. එහෙත් වර්ෂ 1783 දී පවත්වන ලද සාමදාන ගිවිසුම හේතු කොට ගෙන ත්‍රිකුණාමලය ප්‍රන්සයින් විසින් ඕලනදක්කාරයින්ටම භාර දෙන ලද්දේ ය. වර්ෂ 1785 ගේ පෙබරවාරි මස 7 වෙනි දින විල්ලැම් යාකොබ් පන් ද ග්‍රැප් නම් උතුමා ආණ්ඩුකාර ධූරයට පත් ව අවුත් අට වර්ෂයෙක් මුහුදු බඩ ප්‍රදේශ ආණ්ඩු කෙළේ ය.

අනාගතයේ දී සිංහල රාජාන්වය නෂ්ට කිරීමෙහි සහායව පරම හතුරාමෙන් ක්‍රියා කළ පිළිමතලව්වේ නමැති බාලවියෙහි පිහිටි නිලම කෙනෙක් සිංහලයන්ගේ අවාසනාවට මෙන් මෙකල සිංහල රජුගේ ශ්‍රේෂ්ඨාමාත්‍ය තනතුරට පත්වී ය. මොහු දේශපාලනය පිළිබඳ මන්ත්‍රණයෙහි විචක්ෂණ බුද්ධිමත් අමාත්‍යයකි. සිංහල ඔටුන්න නායක්කර් වර්ගයේ පවුලකට අයිතිව තිබීම, නිර්මල සිංහල ලෙයක් දරණ වංශවත් පෙළ පතකින් පැවතෙන මොහු ගේ හිතට අරුචි වූ කාරණයක් ව තිබුණේ ය. මේ තෙමේ රාජාධි රාජසිංහ රජුගේ පළමුවෙනි අධිකාරම් ධූරයට පත් වී වැඩි කලක් ගතවෙන්ට ප්‍රථමයෙන්ම ලක් රජය තමා අතට පත් කර ගැනීම පිණිස කුමන්ත්‍රණය කරන්ට පටන් ගත්තේ ය, අවශේෂ නිලමවරුද නායක්කර්වරුන්ට සිංහල ඔටුන්න අහිමි කිරීමට කැමති වූ නුමුත් අන්‍යොන්‍ය විරුද්ධ කම් හේතු කොට ගෙන ඒ කාරණය මුදුන් පත් කර ගැනීමට බාධාවක් තිබුණේ ය. ඒ නිසා පිළිමතලව්වේ අධිකාරම් තැන රාජ්‍යය හස්ත ප්‍රප්ත කර ගනු සඳහා, ඕලන්දක්කාරයන්ගේ උදව් බලා පොරොත්තුවෙන් එකල ඔවුනට මෙහෙකරමින් සිටි කොළඹ විසූ අභයසිංහ මහමුදලි තැන සමග කුමන්ත්‍රණයකට බැදුණේ ය. නොබෝ කලකින් මහ මුදලි තැනගේ මරණය සිදු වූ හෙයින් ඒ කුමන්ත්‍රණයේ අදහස සාර්ථක නොවී ය.

වර්ෂ 1795 දී ඕලන්දක්කාරයෝ ප්‍රන්සකාරයන්ට එකතු වී ඉංග්‍රීසීන්ට විරුද්ධව නැවතත් සංග්‍රාමාරම්භක කළෝ ය. ඕලන්දක්කාරයන්ට අයිති ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට මෙය යහපත් ප්‍රස්තාවයකැයි කල්පනා වී එංගලන්ත ආණ්ඩුවේ අනුදැනම ඇතිව මදුරාසියේ ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වූ හෝබර්ට් සාමි විසින් යුද්ධ හමුදාවකුත් කැටුව ජනරාල් සටුවර්ට් නම් සේනාපතියෙක් එවන ලද්දේ ය, හෙතෙම ලංකාවට ගොඩබැස තෙසතියක් ඉකුත්වීමට ප්‍රථම ත්‍රිකුණාමලය අල්වා ගත්තේ ය. ඉක්බිති සටුවර්ට් සෙනෙවි තෙමේ ස්වකීය යුද්ධ හමුදාවත් සමග උතුරු

Non-Commercial Distribution

පිටත්ව ගියේය. මේ අතරතුර සජරීන් නම් ප්‍රන්ස නෞකාධිපති කෙනෙකු විසින් ඉංග්‍රීසීන් එලවා දමා ත්‍රිකෝණාමලේ කොටුව සහ ඒ අවට කොටුපේතෘත් අයිතිකර ගන්නා ලදී, තමන් ගිය කටයුත්තත් සඵල නොවී සෙංකඩගල නුවර සිට ආපසු හැරී ආ බොයිඩ් මහතාගේ චිත්ත බේදයට, ත්‍රිකුණාමලේ වරායේ ඔසවා තිබුන ප්‍රන්ස කොඩිය කාරණයක් විය. එහෙත් වර්ෂ 1783 දී පවත්වන ලද සාමදාන ගිවිසුම හේතු කොට ගෙන ත්‍රිකුණාමලය ප්‍රන්සයින් විසින් ඕලන්දක්කාරයින්ටම භාර දෙන ලද්දේ ය. වර්ෂ 1785 ගේ පෙබරවාරි මස 7 වෙනි දින විල්ලැම් යාකොබ් පන් ද ග්‍රැප් නම් උතුමා ආණ්ඩුකාර ධූරයට පත් ව අවුත් අට වර්ෂයෙක් මුහුදු බඩ ප්‍රදේශ ආණ්ඩු කෙළේ ය.

අනාගතයේ දී සිංහල රාජාන්වය නෂ්ට කිරීමෙහි සහායව පරම හතුරාමෙන් ක්‍රියා කළ පිළිමතලව්වේ නමැති බාලවියෙහි පිහිටි නිලම කෙනෙක් සිංහලයන්ගේ අවාසනාවට මෙන් මෙකල සිංහල රජුගේ ශ්‍රේෂ්ඨාමාත්‍ය තනතුරට පත්වී ය. මොහු දේශපාලනය පිළිබඳ මන්ත්‍රණයෙහි විචක්ෂණ බුද්ධිමත් අමාත්‍යයකි. සිංහල ඔටුන්න නායක්කර් වර්ගයේ පවුලකට අයිතිව තිබීම, නිර්මල සිංහල ලෙයක් දරණ වංශවත් පෙළ පතකින් පැවතෙන මොහු ගේ හිතට අරුචි වූ කාරණයක් ව තිබුණේ ය. මේ තෙමේ රාජාධි රාජසිංහ රජුගේ පළමුවෙනි අධිකාරම් ධූරයට පත් වී වැඩි කලක් ගතවෙන්ට ප්‍රථමයෙන්ම ලක් රජය තමා අතට පත් කර ගැනීම පිණිස කුමන්ත්‍රණය කරන්ට පටන් ගත්තේ ය, අවශේෂ නිලමවරුද නායක්කර්වරුන්ට සිංහල ඔටුන්න අහිමි කිරීමට කැමති වූ නුමුත් අන්‍යෝන්‍ය විරුද්ධ කම් හේතු කොට ගෙන ඒ කාරණය මුදුන් පත් කර ගැනීමට බාධාවක් තිබුණේ ය. ඒ නිසා පිළිමතලව්වේ අධිකාරම් තැන රාජ්‍යය හස්ත ප්‍රප්ත කර ගනු සඳහා, ඕලන්දක්කාරයන්ගේ උදව් බලා පොරොත්තුවෙන් එකල ඔවුනට මෙහෙකරමින් සිටි කොළඹ විසූ අභයසිංහ මහමුදලි තැන සමග කුමන්ත්‍රණයකට බැඳුණේ ය. නොබෝ කලකින් මහ මුදලි තැනගේ මරණය සිදු වූ හෙයින් ඒ කුමන්ත්‍රණයේ අදහස සාර්ථක නොවී ය.

වර්ෂ 1795 දී ඕලන්දක්කාරයෝ ප්‍රන්සකාරයන්ට එකතු වී ඉංග්‍රීසීන්ට විරුද්ධව නැවතත් සංග්‍රාමාරම්භක කළෝ ය. ඕලන්දක්කාරයන්ට අයිති ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට මෙය යහපත් ප්‍රස්තාවයකැයි කල්පනා වී එංගලන්ත ආණ්ඩුවේ අනුදැනම ඇතිව මදුරාසියේ ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වූ හෝබර්ට් සාමි විසින් යුද්ධ හමුදාවකුත් කැටුව ජනරාල් සටුවර්ට් නම් සේනාපතියෙක් එවන ලද්දේ ය, හෙතෙම ලංකාවට ගොඩබැස තෙසතියක් ඉකුත්වීමට ප්‍රථම ත්‍රිකුණාමලය අල්වා ගත්තේ ය. ඉක්බිති සටුවර්ට් සෙනෙවි තෙමේ ස්වකීය යුද්ධ හමුදාවත් සමග උතුරු

Non-Commercial Distribution

දෙසට ගමන් කොට යාපනය වටලැවේ ය. ඕලන්දක්කාරයෝ ඒ ප්‍රස්තවයේ දී කිසි විරුද්ධකමක් නොදක්වා ඒ නුවර ඉංග්‍රීසීන්ට පාවා දුන්නෝ ය. ඊට පසු වර්ෂ 1796 යේ පෙබරවාරි මස 12 වෙනි දින යථොක්ත ඉංග්‍රිසි සේනාපති තැන මීගොමුව ද යටත් කොට ගෙන කොළඹ දෙසට ගොඩින් ගමන් කළේ ය. මේ කාලයේ කැළණි ගඟ ඉවුර සමීපයේ ඕලනදක්කාරයන්ගේ බලකොටුවක් තිබුණු හෙයින් සටනක් සිදුවේ ය යන බලාපොරොත්තුවෙන් ඉංග්‍රීසිහු කොළඹ (නාගුලුගම්) තොටළඟ නැවතුණේ ය. එහි දී ඕලන්දයින් විසින් විරුද්ධකම් නොපා පසු බැස ගිය බැවින් ඉංග්‍රිසිහු නිරුපද්‍රව ගඟින් එතරව කොළඹ සමීපයේ වාඩිලා ගත්තෝ ය. එවිට ඕලන්දක්කාර ආණ්ඩුකාර තැන විසින් ඉංග්‍රීසීන් ගේ පෙරමුණට ජාහේවා කණ්ඩායමක් යවන ලද්දේ ය. ඒ කොටුව තුළට වැදුණේ ය, මේ කාලයේ ඕලන්දක්කාරයන් ගැන ගේ ලංකාවේ යුද්ධ බලය අතිශයින් දුර්වලව පැවති බැවින් මේ ගැන වැඩි දුරටත් සටන් කිරීමෙන් ප්‍රයෝජනයක් නොලැබිය හැකි බැව් දන ගත්, ලංකාවේ ඕලන්දයන්ගේ අන්තිම ආණ්ඩුකාර තැන වූ ජෝවාන් ගැරාර්ත් පන් එන්ගලබැක් තුමා විසින් කොළඹ කොටු වසඟ ඕලන්ද ආණ්ඩුවට අයිතිව තිබුණ ගාල්ල ආදී අනිත් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශත් ලියවිල්ලක් පිට ඉංග්‍රීසින්ට භාර දෙන ලද්දේ ය. ඕලන්දක්කාරයන්ගේ ලංකාණ්ඩුව මෙතෙකින් අභාවප්‍රාප්ත වූයේ ය. ලංකාවේ සිටි ඕලන්දක්කාරයින්ගෙන් බොහෝ දෙනෙක් බෙතාවියට යවන ලද්දෝ ය. එන්ගල් බැක්තුමා කොළඹ පදිංචිව සිට වර්ෂ 1799 දී කාල ක්‍රියා කෙළේ ය.

ඉංග්‍රීසින් විසින් ලංකාවේ මුහුදු බඩ පළාත් අත්පත් කර ගත් ලැබූ සිංහල රජු හා සමගියෙන් සිටිනු කැමතිව ගිවිසුමකට බැඳෙනු පිණිස සෙංකඩගල නුවරට තානාපතියකු පිටත් කර යවන ලදහ. රාජාධි රාජසිංහ රජු විසින් ද මදුරාසියේ ඉංග්‍රීසි උතුමාණන් වහන්සේ වෙත තානාපතියෙක් යවන ලද්දේ ය. සිංහල රජුගේ අයැදුම පරිදි පුත්තලම සහ අවට ප්‍රදේශය සිංහල ආණ්ඩුවට භාර දෙන්ට කැමතිව ඒ සඳහා ගිවිසුම් පත්‍රයක් ලියා මදුරාසියේ ඉංග්‍රීසි ආණ්ඩුකාර තැන වූ හෝබර්ට් සාමිගේ අත්සන තබා සිංහල රජුවෙත එවී ය. තුමුත් ඉංග්‍රීසි මහරජු සමග විනා අන්කිසි ප්‍රදේශාණ්ඩුකාරයකු හා සමග ගිවිසුමකට බැඳෙන්ට රාජාධි රාජසිංහ රජු නොසතුටු වූ බැවින් ඕලන්දක්කාරයන්ට අයිතිව තුබූ මුහුදුබඩ ප්‍රදේශ සියල්ලම ඉංග්‍රීසින්ගේ පාලනයට පැවරී ගියහ.

රාජාධි රාජසිංහ රජ අටළොස් වසක් රාජ්‍ය ශ්‍රී විඳ වර්ෂ 1798 දී නාම ශේෂ බවට පැමිණියේ ය. මේ රජ මාගධි සංස්කෘත භාෂාවෙන් හා සිංහල ශබ්ද ශාස්ත්‍රය ද උගත් විශිෂ්ට පඩිතුමෙකි,

Non-Commercial Distribution

මෙතුමා විසින් සිංහල නිරුක්තියෙන් කවිකොට ලියන ලද අසදිස ජාතකය මෙතුමාගේ විචක්ෂණ බහුශ්‍රැතත්වට සාක්ෂ්‍යව පවතී. මෙතුමාගේ කාලයෙ දී උඩපාත දෙරටෙහිම ප්‍රසිද්ධ කවිවරයෝ කීප දෙනෙක් ජීවත්ව සිටියෝ ය, රාජාධි රාජසිංහ රජ තෙමේ කාව්‍ය සොෂයි සුඛයෙන් කාලයාපනය කිරිමෙහි නියැලි වූ උතුමෙක් විය, මහ නුවර පුෂ්පාරාම විහාරාධිපතිව වැඩ විසූ මොරතොට ධම්මක් ඛන්ධ මහානායක ස්ථවිර පාදයන් වහන්සේ මේ රජතුමාගේ ආචාර්යවරයා බව එතුමා විසින් කියන ලද මෙහි පහත දක්වන කවියෙන් හැඟේ.

අමර ගුරු හරණ සතදත් පි නාවන්
විතර නොවන ගුණ නැණ සපිරි නාවන්
පවර නමැති මොරතොට යතිම නාවත්
සසර වසනතුරු මට වාස නාවන්

ස්වකීය සහෝදර කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයෙහි ජීවත්ව සිටි සමහර කවිවරයන් ඇතුළුව දුනුවිල, කරතොට, සාල ඇල්ල, කිරම, මොරතොට, ගල්ඇටඹෙ, බරණගතිතයා, මීරිපැන්නේ, ආදී ප්‍රහස්ත කවීන්ද්‍රයන් නමැති දීප්තිමත් තාරකාවන්ගෙන් රාජාධි රාජසිංහ රජතුමාගේ ආණ්ඩුව නමැති නභොර්භය භ්‍රාජමාන වූයේ ය. යථොක්ත කිවිවරයන් අතුරෙන් දුනුවිල ගජනායකනිලමේ උඩරට පෞරාණික වංශවත් පවුලකට අයත් කර්ණ රසායන කාව්‍ය ප්‍රබන්ධනයන් සෑදීමේ අතිදක්ෂයෙකි. රතිරත්නාලංකාරය, දුනුවිල හටනය, සහ කාලිංග බෝධි ජාතක කාව්‍යය මෙතුමා විසින් සාදන ලද පොත් වේ. රාජාධි රාජසිංහ රජ තෙමේ විවේක ඇති කල බොහෝ කොට කවිවරයන්ගේ ආශ්‍රයෙන් කාලය ගත කෙළේ ය. මේ රජ තෙම තීක්ෂණ බුද්ධිමත් පෙනීමක් ඇති දේහ ලක්ෂණයෙන් එංගලන්තයේ අටවෙනි හෙන්රි රජුට සමාන රූපා කාරවූ ස්ථූල ශරීරයකින් යුත් කාල වර්ණ පුරුෂොත්තමයෙක් බව වර්ෂ 1782 දී ඉංග්‍රීසීන් වෙනුවෙන් සෙංකඩගල නුවරට තානාපතියකු වශයෙන් ගිය බොයිඩ් මහතාගේ ලියවිල්ලක විස්තර කොට තිබේ.

---

මේ කවියේ ඉංග්‍රීසි පරිවර්තනය ගෞරවණී ජේම්ස් ද අල්විස් මැතිතුමාගේ සිදත් සඟරාවේ ප්‍රාරම්භයෙහි මෙසේ දක්වා තිබේ.

"May I be fortunate enough, so long as I dwell in metempsychosis, to behold the Venerable Reverend Moratotta, of boundless wisdom and benevolence, who is powerful as an elephant; and exceedingly well versed in the arts and sciences, even to a degree to emulate the teacher of the Gods (Brahaspati)"

Non-Commercial Distribution

# ලංකාවේ ඕලන්දක්කාර ආණ්ඩුව

ප්‍රතිකාලුන්ගෙන් පසු ඕලන්දක්කාරයෝ අවුරුදු 138 ක් ලංකාවේ සමුද්‍රතීරාසන්න පළාත් ආණ්ඩු කෙළේ ය. ලංකාවට ඔවුන්ගේ පැමිණීම ප්‍රදාන කොටම වස්තු සැපයීම පරමාර්ථ කොට බැව් සක්සුදක් සේ පෙනේ. "ශතය පිට ශතය තැබීම ඔවුන්ගේ ආගම බවද, රත්රන් නැමති නිධානය ඔවුන්ගේ ආණ්ඩු ක්‍රමය එකම ආරම්මණය බව ද, රත්රන් නැමති නිධානය ඔවුන්ගේ දෙවියෝ බවද, ගෞරවාර්හ බිසැට් දේවගැතිතුමාගේ ලිපියක සඳහන් කොට තිබේ. මේ ඕලන්දක්කාර වර්ගයා ලංකාවේ වාසය කිරීමට ඕනෑ කලොත්, සිංහල රජුගෙන් අනේක අපහාස විඳිමින් සිටියේත්, ස්වකීය වෙළදාම දියුණු කොට වස්තු සැපයීම පිණිස බැවින් පරාර්ථකාමීව රටවැස්සන්ගේ අභිවෘද්ධිය සඳහා ඔව්හු කිසිසේත් නොවෙහසුණෝ ය, යුද්ධ වලදී ගිය වියදම් ලබා ගන්නා අටියෙන් ඔව්හු බොහෝ විට රට වැසියන් ගේ දේපල අයුතු ලෙස කොල්ල කෑවෝය. ලංකාවේ කුරුඳු රත්රන් වලටත් වඩා අගේ කොට ඔව්හු සැලකුවෝය. රටේ වැවෙන කුරුඳු සියල්ලම ආණ්ඩුව සන්තක යයි ඔවුන් විසින් ප්‍රකාශ කොට තිබුණ හෙයින් වැසියන්ගේ ඉඩම් වල පවා වැඩී තිබෙන කුරුඳු පැලෑටියක්වත් කපා දැමීම බලවත් අපරාධ ක්‍රියාවක් හැටියට ගනණ් ගනු ලැබුවේ ය. කුරුඳු රාජකාර්ය පිණිස පත් කරන ලද මුළාදෑනින් විසින් විටින් විට මිනිසුන් යවා සියලුම ඉඩම් වල තිබුණ කුරුඳු තළවා ආණ්ඩුවේ ගබඩා පලට යවන ලද්දේ ය, ඕලන්දයන්ගේ මේ අධික වස්තු තෘෂ්ණාව හේතු කොට ගෙන රටවාසීන් අතරේ මහත් දරිද්‍රභාවයක් ඇති විය. ලංකාවේ සිටි ඕලන්දක්කාර ආණ්ඩුකාරයන් ගෙන් වැඩි දෙනා දුෂ්ට ක්‍රෑරතර වූහ. අතරින් පතර ධර්මිෂ්ඨ වූ ජනහිත ආණ්ඩුකාරයෝද සිටියෝ ය.

ඕලන්දක්කාරයෝ වනාහි වැදගත් කරුණු කීපයකින්ම රෝමානු සභාවට වෙනස් වූ රෙපමාදු ක්‍රිස්තු භක්තිකයෝ වූහ. ප්‍රතිකාල්හු ලංකාවේ රෝමානු ආගම පතළ කර හැරීමට යම් සේ ප්‍රයත්ත දරුවෝ ද එමෙන්ම මොව්හු ද ඔවුන්ට යටත් වූ පළාත් වල ඔවුන්ගේ භක්තිය වර්ධනය කර හැරීමට අනේක විධ දෝෂාරෝපණය උපායන් යෙදූහ. ගම්වල ක්‍රිස්තියානි පාසැල් පිහිටුවා පන්සල් වල ශාසෙත්‍රාද් ග්‍රහණය කරමින් සිටි බෞද්ධ ළමයින් එහි යැවීමට ඕලන්දක්කාර ආණ්ඩුකාරයෝ දෙමව්පියන්ට බලකෙළෝ ය. රෙපරමාදු ක්‍රිස්තියානිය වැළඳ ගත් සෑහෙන උගෙණීමක් නොමැති අය යථොක්ත පාඨශාලාන්හි ගුරුවරුන් මෙන් පත් කොට බව්තීස්ම හා කසාද සටහන් තෝම්බු ඔවුන්ට භාර දෙන ලද්දේ ය. රෙපරමාදු ක්‍රිස්තියානි භක්තියෙන් බව්තීස්ම නොලත් කිසිවෙකුට ආණ්ඩුවේ කිසිම නිලයක් දීම තහනම් කොට තිබුණේ ය. යථොක්ත ව්‍යාජෝපාය එකල

Non-Commercial Distribution

බෞද්ධා ගම්කාරයන්ව සිටි බොහෝ සිංහල මිනිසුන් රෙපරමාදු ක්‍රිස්තියානි සභාවට ඇතුළත් කර ගැනීමට බලවත් ප්‍රතිෂ්ඨාධාරයක් විය. මේ හේතු කොට ගෙන ලංකාවේ සෞගත සමවයිකයන් විරලවීමෙන් රෙප්‍රමාදු බෞද්ධයෝ ඉතා බහුල වූහ. ප්‍රතිකාලුන්ගේ කාලයේ දී රෝමානු ආගම වැළඳ ගෙන සිටි ඇතැම් චපල ගති ඇති සිංහලයෝ ඕලන්දක්කාර ආණ්ඩුව යටතේ නිලතල ලබා ගැනීම පරමාර්ථ කොට නැවත රෝමානුව ප්‍රතික්ෂේප කොට රෙපරමාදු ක්‍රිස්තියානි සභාවට ඇතුළත් වූහ. මෙපරිද්දෙන් ඕලන්ද ආණ්ඩුව පැවති කාලයේ දී නමින් පමණ රෙපරමාදු ක්‍රිස්තියානිය පිළිගත් සිංහලයෝ දහස් ගණනක් ලංකාවේ සිටියෝ ය. සොළොස් වෙනි ශත වර්ෂයේ දී එංගලන්තය ආණ්ඩු කළ ක්‍රෑරතර මේරි බිසව කළාත් මෙන් ඕලන්දයෝ ද රෝමානු සභාවට ඇතුළත් ක්‍රිස්තියානිකාරයන්ට නානා ප්‍රකාර ඉවසිය නොහැකි හිරිහැර කරන්ට පටන් ගත්තෝ ය. රෝමානු පූජකයන් ප්‍රතිකාලුන්ගේ චර පුරුෂ සංඛ්‍යාවට ගණන් ගනු ලැබ ඔවුන් මෙහි වාසය කිරීම වළක් වන පිණිස තද බල ආඥා පැණෙව්වෝ ය. එපමණක් නොව රෝමානු ආගම ද ලංකාවෙන් සම්පූර්ණයෙන් මුල් සුන් කර දැමීමට අනේක ප්‍රයන්ත දැරුවෝ ය, රෝමානුකාරයන්ට තමන්ගේ කසාද බන්දවා ගැනීම පිණිස රෙප්‍රමාදු දෙව්ගැතීන් වෙතට නොහොත් ඕලන්ද ආණ්ඩුවේ අධිකරණ ශාලා වල විනිශ්වයකාරයන් ළඟට යාමට නියම කළෝය. රෝම සභාවේ පූජකයන් විසින් බඳිනු ලබන සියලුම කසාද වලංගු නොවන බවට ප්‍රකාශ පත්‍රයක් ද නිකුත් කරන ලද්දේ ය. රෝමානුකාරයන්ගේ සූසාන භූමිවල මිනී වැළලීම තහනම් කොට රෙප්‍රමාදු සොහොන් බිම් වල රෝමානුකාරයන්ගේ මෘත ශරීර භූමදාන කිරීමේ දී අධික මුදලක් අය කිරීමට නියම කරන ලද්දේ ය. රෝමානුකාර කිසිවෙකුට ඕලන්ද ආණ්ඩුව යටතේ කිසිම නිලයක් දීම තහනම්ව තිබුණේ ය. රෙප්‍රමාදු වාලුන්ගෙන් පැවතෙන් නන්ට වාල්කමින් නිදහස් ලැබෙන ලෙස හා රෝමානු වාලුන්ගේ දරුවන් වාල් බන්ධනයෙහි අනවරතයෙන් නිරතවී මෙහි සිටින ලෙසද ආඥාපණවන ලද්දේ ය. විඳිය නොහෙන මේ ගොරතර හිංසාපීඩා නිසා රෝමානුකාරයෝ සමහරෙක් මුහුදුබඩ ප්‍රදේශ අත්හැර උඩරට වාසය පිණිස පලා ගියේ ය. ඒ කාලයේ ද සිංහල රජු ගිවිසුම් වලට ප්‍රතිවිරුද්ධ ලෙස ඕලන්දයන් විසින් රවටනු ලැබ සිටි හෙයින් ඔවුන් කෙරෙහි කෝපයෙන් එසේ අනාථභාවයෙන් පැමිණි රෝමානුකාරයන්ට ස්වකීය රාජ්‍යයේ නිමවීමට අවසර දෙන ලද්දේ ය. මෙසේ මධ්‍යම පළාත තමන්ගේ වාසභූමිය කර ගත් රෝමානු පවුල් සත්සියයකට වැඩි බව කියා තිබේ. පහතරට සමුදුර බඳ ප්‍රදේශ වලින් පලා ගිය ප්‍රතිකාල් රෝමානුකයන් ගෙන් පැවතෙන්නෝ බොහෝ ගණනක් අද දක්වාත් මාතලේ වහ කෝට්ටේ යන ගමේ වාසය කරත්.

Non-Commercial Distribution

වර්ෂ 1658, රෝමානු පූජකයකුට නවාතැන් දෙන්නා මරණීය දණ්ඩනයට යටත් කොට ප්‍රකාශ පත්‍රයක් නිකුත් කරන ලද්දේය, එහෙත් ඇතැම් දැඩි භක්තික රෝමානු පූජකයෝ ඒ පණත් පවා නොසලකා අනේක විධ හිංසා පීඩාවන්ට ගොදුරුව ස්වකීය සභිකයන් පිළිබඳ කතීව්‍ය කිරීම පිණිස මෙහි ඔබ මොබ සංචාරණය කළේ ය. ජෝසප්වාස් නම් එක් රෝමානු පූජකයෙක් ගෝවේ සිට යාපනයට අවුත් බලවත් අනාථ භාවයට පැමිණ වාස ස්ථානයක් නොලැබ, වෙස්වලහා තන්හි තන්හි ඇවිද්දේ ය, එක් දුගී ස්ත්‍රියක් අසරණභාවයට පත් ඒ ආගන්තුකයා කෙරෙහි දයානුකම්පා උපදවා ඇගේ ගෙයි ඕහට නවා තැන් දුන්නීය. එහිදී ඔහුට ප්‍රවාහිකා රෝගය වැළඳුණේ ය. ස්ත්‍රියගේ අසල්වාසීහු මේ අමුත්තාට නවාතැන්දීම ගැන ඇට දොස් තබමින් රෝගාතුර භාවයෙන් දුර්වලව සිටි ඔහු රැගෙන ගොස් ඈතක ලැවෝ ය. මේ බැව ඇසූ කාරුණික ස්ත්‍රියක් ආනාථභාවයෙන් බිම දිගාවී සිටින යථොක්ත රෝගාතුරයා සිය නිවෙසට ගෙන ගොස් යථා ශක්තීන් ප්‍රතිකාර කරවීමෙන් සුවපත් කළා ය. මෙසේ කල්යාමක දී අසල වාසය කළ රෝමානු භක්තිකයෝ ව්‍යාධිතව සිටි ඉහත කී අමුත්තා ස්වසමයේ ධර්මාර්යවරයෙක් බව ජානනය කොට ඔවුන් විසින් පූජක තැන ඕලන්දක්කාරන්ට අසු නොවන පිණිස සඟවනු ලැබීය. කල්ගතවීමෙන් ජෝසප් වාස්ගේ රක්ෂ ස්ථානය ඕලන්දයන්ට දැන ගන්ට ලැබුණු බැවින් ඔහු පුත්තලමට ගොස් එහි අප්‍රසිද්ධව විසූයේ ය. හෙතෙමේ පුත්තලම් වාසී ස්වසමයිකයන්ට ආගම ධර්මය කියා දෙමින් සිට, එවකට බොහෝ ප්‍රතිකාල් ජනයාගෙන් ගැවසී සිංහල රෝමානු භක්තිකයන් ද වාසය කළ මහනුවරට ගියේය. එහි පැමිණි නොබෝ දිනකින් හෙතෙම ප්‍රතිකාලුන්ගේ චරපුරුෂයන් වනැයි සැක කොට සිංහල රජු විසින් ඒ පාදිතැන බන්ධනාගාරයෙහි තැබවීය. නුමුත් අවුරුද්දකට පමණ පසු ඔහු අහිංසක මනුෂ්‍යයෙක් බව දැන ගන්ට ලැබී සිර බන්ධනයෙන් නිදහස් කරන ලද්දේ ය.

මේ කාලයේ මසූරිකා නම් වූ විසොඨාට ජනක මරකබාධකයක් මහනුවර ඉතා භයානක ලෙස පැතිරී ගියෝ ය. රෝගය වැළඳී බොහෝ මනුෂ්‍යයෝ නැසුණෝය. රෝගය වැළඳුණ දුගී ජනයා ආණ්ඩුව විසින් වනයට පන්නා දමන ලද්දේ ය. ප්‍රසිද්ධ මහා මාර්ගයන්හි දමන ලද මළ කඳන් වලින් වහන බලවත් දුර්ගන්ධය හේතු කොට ගෙන සිංහල රජතුමාට නුවර අත්හැරයන්ට සිදු වූයේ ය. වාස් පූජක තෙම රෝගාතුරයන් සොයා වනයට ගොස් ඔවුන්ගේ වාසය පිණිස පැල් සාදා දී ඔවුන්ට ඖෂධ ආහාර පානාදිය සපයාදීමෙන් අපමණ සත්කාර කෙළේ ය. ස්වකීය ජීවිතය සපයා

---

අතිසාර රෝගය වසූරිය, "මහබැර්කම" යයි ද ව්‍යවහාරයි

Non-Commercial Distribution

නොසලකා කරන ලද මේ උත්කෘෂ්ට දයාන්ත ක්‍රියා නිසා ඇතැම් අය මේ පූජක තැන කෙරෙහි බොහෝ සෙයින් පැහැදී බව්තීස්ම ලැබ රෝමානු ලබධිය වැළඳ ගත්තෝ ය. මේ කරුණාවන්ත පූජා ප්‍රසාදි තෙමේ මිනිසුන්ගෙන් බොහෝ ගරු බුහුමන් ලැබ මහනුවරදී කාල ක්‍රියා කෙළේ ය.

ඕලන්ද භාෂාව ආණ්ඩුව සම්බන්ධ ලියවිලි වලින් මුත් කථා ව්‍යවහාරයෙහි අප්‍රකටව පවතියි. ඕලන්දක්කාරයන් විසින් ප්‍රතිකාල් භාෂාව යටපත් කොට සියබස සුලභ කරවීමට උත්සාහ කළ නුමුත් එය සඵල නුවූයේ ය. නුමුත් ප්‍රතිකාල් හෙවත් පෘතුගීසි භාෂාව අද දක්වාත් ලංකාවෙහි ව්‍යවහාර වේ. වර්තමාන කථාව ව්‍යවහාරයේ ද සිංහල භාෂාවට මිශ්‍ර වූ ප්‍රතිකාල් වදන් බොහෝ වෙත්.

ලංකාව සහ පිටරටවල් අතර ඕලන්දක්කාරයන්ගේ වෙළදාම සශ්‍රීක කර ගැනීම පිණිස ලංකාවේ නොයෙක් පළාත් වල ඔවුන් විසින් ගොඩ නගන ලද දූනට නටබුන් වී තිබෙන කොටුවේ වලින් ඔවුන්ගේ උත්සාහවත් ස්වභාවය තේරුම් ගත හැකි වේ. මොවුන්ගේ ගොඩ නැගිලි අතුරෙන් කොළඹ වුල් පත්ඩොල්වීථියේ පිහිටි ආදිප්පු පල්ලිය නම් දෙව් මැදුරද කයිමන් දොරකඩ පිහිටි ගණ්ඨාස්තම්භය ද මේ දක්වාත් ජරාවාස නොව පවති, ඕලන්දක්කාරයන් විසින් නානා ප්‍රකාර බදු අය කර ගැනීම සඳහා නිවැරදි ලෙස කටයුතු කිරීමට ඔවුන් විසින් සම්පාදිත ලංකාවේ ඒ ඒ පළාත් වල ඉඩම් සම්බන්ධ ලේකම් පොත් සහ පෙළපත් තෝම්බුත් යම් යම් කාරණ පැහැදිලි කිරීමට මේ කාලයේ ලංකාණ්ඩුවට උපකාරිව පවති. අද දක්වාත් ඉංග්‍රිසි අධිකරණ ශාලා වල ලංකාවේ වලංගුව පවතින රෝමන් ඩච් ලෝ නමැති රෝමානු ලන්දේසි නීතිය ඔවුන් විසින් ව්‍යවහාරයට පමුණු වන ලද්දකි.

යටත් පිරි සෙයින් ප්‍රතිකාල් සහ ඕලන්ද යන ආණ්ඩු දෙකෙන්ම යම්කිසි යසෛශ්වර්යයක් ලක්දිව් වාසීන්ට අත්වී යයි කිව නොහැකියි ප්‍රතිකාල්හු ස්වසමය දියුණු කිරීම පිණිස ද ඕලන්දයෝ ධන සැපයීම පරම කොට ද කලින් කල පණවන ලද අණ පණත් හේතු කොට ගෙන සිංහල වැස්සෝ තමන්ගේ නිදහස් ජීවිතයට බාධාවක නිරන්තරයෙන් පරදේශිකයන්ගේ උවදුරු වලින් මිරිකී කාලය ගත කළෝ ය.

Non-Commercial Distribution

# ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව.
## ශ්‍රී. වික්‍රම රාජසිංහ ක්‍රි.ව. 1798-1815.

වර්ෂ 1796 යේ දී ලන්දේසීන්ට අයිතිව තිබුන ලංකාවේ සමුද්‍ර බඳ පළාත් පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට භාර වූ කල ඒ ප්‍රදේශ මද්‍රාසියේ ඉංග්‍රීසි ආණ්ඩුකාර තැන වූ හෝබට් සාමිගේ ආණ්ඩුවට යටත් විය. මේ කාලයේ දී මද්‍රාසියෙන් එවනු ලැබූ ඩුබෑෂ්වරු හෙවත් කර්ණාටික දෙමළ ඒජන්තවරු අයබඳු නියම කිරිම සහ මුදල් අය කිරීමත් සංවිධාන කළෝ ය. ඔව්හු මේ පිළිබඳව පෙර පැවති විධි විධාන නිෂ්ප්‍රභා කොට සිංහල වැස්සන්ට ගැහැට පැමිණෙන අයුරු අභිනවය අණ පණත් පැණෙව්වෝ ය. ආණ්ඩුවේ කටයුතු වල නියුක්තය සිටි සිංහල මුදලිවරුන් ස්වකීය ධූර වලින් පහ කර දමා ඒ වෙනුවට දෙමළ මිනිසුන් පත් කළෝ ය. මේ ආදී දුර්විපාක දායක ක්‍රියා නිසා සිංහලයෝ අතිශය කෝපයට පැමිණෙමෙන් බලවත් ලෙස කැරළි ගසන්ට වන්හ. එවකට පැවති මේ අරගලය පිළිබඳ විස්තර කරුණු එංගලන්තයේ තුන් වෙනි ජෝර්ජ් මහ රජාණන්ගේ මහාමාත්‍ය තැන වූ විලියම් පිට්තුමාට දැන ගන්ට ලැබී, මේ දිවයින කෙරෙහි වෙළඳ සමාගමට ඇති අයිති කම් පහකොට මෙය ක්‍රවුන් කොලනි යයි කියනු ලබන ඔටුන්නට අයත් ප්‍රදේශයක් කරන ලද්දේ ය. මෙයින් අනතුරුව යථොක්ත මහා මන්ත්‍රීතුමා විසින් ගිල්පෝ ර්ඩ්හි අර්ල් නම් ගෞවාර්හි පටබැඳී නාමයෙන් යුත් වංශාධිපති ෆ්‍රේඩ්‍රික් නෝර්ත් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරයට පත් කරනු ලැබ, වර්ෂ 1798 ක් වූ ඔක්තෝබර් මස 12 වෙනි දින එතුමා කොළඹට සම්ප්‍රාප්ත වූයේ ය.

ශ්‍රී රාජාධි රාජසිංහ රජහට නායක්කර් වංශයට අයත් බිසෝවරු පස් දෙනෙක් සිටි නුමුත් ඒ එකම බිසවක ගෙන්වත් ඔහුට දරුවෙක් නොලැබණේ ය. මේ බිසෝවරුන් අතරෙන් අලමේලු අම්මා නම් පළමුවෙනි බිසවද රෙංගනායගී අම්මා නම් තුන් වෙනි බිසවද එකකුස වන් සහෝදරියෝ වූහ. උපෙන්ද්‍ර අම්මා නමැති දෙවෙනි බිසව යථොක්ත සහෝදරියන් දෙදෙනාගේ සුළු පියෙකුගේ දුවණියක් වූවා ය, මෑට කොණ්ඩසාමි හෙවත් ගම්පළ නායක්කර් නම් වූ සහෝදරයෙක් සහ තවත් සහෝදරියක් ද සිටියෝ ය, මේ සහෝදරියට කන්නසාමි නම් පුත්‍රයෙක් සිටියේ ය. අලමේලු අම්මා සහ රෙංගනායකි අම්මා රජුගේ පළමුවන තුන්වන බිසෝවරුන්ට සහෝදරයෝ සත් දෙනෙක් වූහ. එනම් :- මුද්දුසාමි, බංගරුසාමි, කන්නසාමි, සින්නසාමි, අප්පසාමි, අයියසාමි, රාමසාමි යන මොහුවෙත් කීර්ති ශ්‍රී ජරාසිංහ රජුගේ ද රාජාධි රාජසිංහ රජුගේ ද තවත් බොහෝ

---

මුත්තුසාමි යයි ද නම්

Non-Commercial Distribution

බන්ධුවරයෝ මෙකල මහනුවර වාසය කළෝ ය. මොව්හු පළමු කොට තෙලිඟු රාජ්‍යයේ විසූ ජෙන්තු වර්ගයේ නායදු නම් වර්ගයට ඇතුළත් වූයෝ ය. පසු කලක දී මේ වංශය නායක්කර් නමින් ප්‍රසිද්ධ මදුරාපුර (තන්ජෝරුව) (තන්ජාවුර් ) යන නගරයන්හි වාසය කෙළේ ය.

රාජාධි රාජසිංහ රජ තමහට දරුවන් නොසිටි හෙයින් තමාගේ ඇවෑමෙන් ඉහත නම් සඳහන් කළ සාමිවරු සත් දෙනාගෙන් දෙටුබෑවූ මුද්දුසාමි කුමාරයාට ඔටුන්න හිමිකර දීමට නිශ්වය කොට ගෙන සිටියේ ය. නුමුත් නිර්මල සිංහල රාජත්වය අඛණ්ඩව පවත්වා ගනු පිණිස සිංහල ඔටුන්න නායක්කර් වංශයේ අයවලුන්ට අනාගතයේ දී අයිති කර ගන්ට ඉඩ නොදී පැහැර ගැනීමට පිළිමතලව්වේ පළමුවෙනි අදිකාරම්තුමා උපාය සොයමින් විසී ය.

ස්වකීය අදහස නිරායාසයෙන් ඉෂ්ට කර ගැනීම සඳහා තමහට පස මිතුරුව සිටි ඇරැව්වාවල දෙවෙනි අදිකාරම් තැන හා දඹගමුවේ දිසා පති තැනක් පක්ෂ කරගන්ට පිළිමතලව්වේ මහ නිලමේ උත්සාහ කරමින් සිටින අතර රාජාධි රාජසිංහ රජ ජන්මාන්තර ගත විය. ඇතැම් නිලමවරු තමහට පසමිතුරුව සිටින බැවින් ද, මෙකල සිංහල නිලමවරු අතරේ එක්සත් භාවයක් නොපැවති බැවින් ද තමා රාජ්‍යය බලපොරොත්තුවීම ප්‍රස්තානෝචිත නොවන බව දූන ස්වකීය අධිෂ්ටානය පසුකල දිවත් සිද්ධ කර ගැනීමට හැකිවන පරිද්දෙන් ක්‍රියා කිරීමට උපායෙහි අති දක්ෂ පිළිමතලව්වේ අදිකාරම් තැන අදහස් කෙළේ ය. සිංහල ඔටුන්න කෙරෙහි හිමිකම් ඇති නායක්කර් වංශිකයන් සහ තමහට පසමිතුරු වූ සිංහල නිලමවරු ද පළමු කොට නැති කර දැමීම එතුමාගේ පරමාධ්‍යාශය විය.

රාජාධි රාජසිංහ රජුගේ කාල ක්‍රියාව සිදු වූ රාත්‍රියේම මේ පිළිමතලව්වේ මහ නිලමේ පුෂ්පාරාම විහාරවාසී අනුනායක ස්ථවිරයන් හා ස්වපාක්ෂික නිලමවරු කීප දෙනෙකුත් සමග ගුප්තාකාරයෙන් කථා බස් කර ගත් පසු රජහුගේ මරණය එළිදරව් නොකොට, රජතුමා මරණ සන්නව සිටින හෙයින් සෙංකඩ ගල නුවරට වහාම පැමිණෙනත් වයි කියා සියලුම පළාත් වල දිසාපතිවරුන්ට ද රටේ මහත්වරුන්ට ද සෙසු ජන ප්‍රධානින්නට ද පණිවුඩපත් යැවූයේ ය. පසු දින උදෑසන පිළිමතලව්වේ මහ අදිකාරම් තැන උපෙන්ද්‍ර අම්මා බිසවගේ සහෝදරියන්ගේ පුත්‍රයා වූ එකලට අටළොස් වයසැති කන්නසාමි කුමාරයා සම්මුඛ වීමට ගොස් ඔහු සමග ස්වල්ප වේලාවක් රාජ්‍යය පිළිබඳ ඉතා බරපතල කාරණයක් ගැන සාකච්ඡා කෙළේ ය. මහ නිලමේගේ සහ කන්නසාමි කුමාරයාගේත්

Non-Commercial Distribution

කථාවෙන් මඳ වේලාවකට පසු හේවා හමුදාවක් ගොස් නායක්කර්වරුන් වාසය කළ ප්‍රදේශයෙහි රැකවල් ගත්තේ ය.

ඉක්බිති මහ නිලමේගේ පණිවුඩපත ලත් දිසාපතිවරුන් ද, රටේ මහත්වරු ද, අවශේෂ නිලධාරීන් සහ මහජනයා ද සෙංකඩ ගල නුවරට රැස් වූවෝ ය. දිසාපතිවරු මඟුල් මඩුවේ ද, සෙසු ජනයා මඟුල් මඩුවෙන් බැහරව ද රැස්වී සිටියෝ ය. මෙවිට මහාදිකාරම්තුමා රැස්ව සිටි පිරිසට ආමන්ත්‍රණය කරමින් රජතුමාට අසාධ්‍ය රෝගයක් වැළඳී තිබෙන බැවින් එතුමාගේ ස්වර්ග ස්ථවීම ඉක්මණින් බලපොරොත්තු වන නිසා, එතුමා ජීවත්ව සිටිය දීම රාජ්‍යය විචාරණයට සුදුස්සෙක් තෝරා පත් කර ගැනීම මෙහි රැස්ව සිටින සමූහයාට භාරය යි කිවේ ය. එවිට එක්තරා දිසාපති කෙනෙක් නැගිට ඔටුන්නට නියම උරුමක්කාරයෙක් නැති බැවින්, ඊට නිස්සෙක් ඒ ගැන අපට වඩා දැනුම් තේරුම් ඇති අදිකාරම්වරු විසින්ම නියමකර ගතයුතු වන්නේ ය යි කීවේ ය. එබසට පිළිමතලව්වේ මහ අදිකාරම්තුමා තමා විසින් රහසින් තෝරා ගෙන සිටි කන්නසාමි කුමාරයාගේ පුවත් කියා, එතුමා කෙරෙහි, මහාජනයාගේ කැමැත්ත කෙසේ දැයි විමසුයේ ය. එවිට එක් ප්‍රධාන දිසාපති කෙනෙක් සේසන් හා සමග සාකච්ඡා කොට ඒ කුමාරයා රජ කමට පත් කර ගැනීමට දිසාපතිවරු කැමැත්තෝ යයි ප්‍රකාශ කෙළේ ය. මඟුල් මඩුව අවට රැස්ව සිටි අවශේෂ ජනයාගේ කැමැත්ත ද උක්ත ප්‍රකාරයෙන් ලබා ගත් පසු, මහ නිලමේ නැවතත් කථා කරමින් :- කන්නසාමි කුමාරයා සිරිලක රජකමට පත් කර ගන්නා ලද්දේ මෙහි රැස්ව සිටින මහජනයාගේ ඒකමතික ඡන්දයෙන් බව මනාව සිහියෙන් තබා ගත යුතු ය. ඒ අපේ අදහස් මුදුන් පත්වීමක් නොවේ. එබැවින් මතු කිසි කලක විපර්යාස නොකළහෙන පරිදි අපි ද වැසියන්ගේ කැමැත්තට සර්ව ප්‍රකාරයෙන්ම එකඟ වන්නෙමු යයි කීවේය. ඉක්බිති මහ නිලමේ දිසාපතිවරුන් කැඳවා ගෙන ගොස් කන්නසාමි කුමාරයා ඔවුන්ට දැක් වූයේ ය. අටළොස්විය පැමිණි මේ කුමාර තෙමේ රමණීය පුරුෂ ලක්ෂණයෙන් හෙබි ප්‍රියදර්ශනීය බුද්ධිමත් තරුණයෙක් විය. ඔහුගේ දීප්තිමත් ඇස් වලින් හා චිත්තාභිරමණය වන සුළු අංග ප්‍රත්‍යංගයන්ගෙනුත්, දයානුකම්පාව හා සමමිශ්‍ර අනල්ප රාජ තේජසක් ඔහු කෙරෙහි විද්‍යාමාන වූයේ ය. පසු කාලයක දී මෙතුමා විසින් ඥාතෙතානමාදයෙන් කරන ලද දරුණු ක්‍රියා අතිශයින් සංවේග ජනක නුමුත් කිසිම කෲර ගතියක් හෝ දුෂ්ට ස්වභාවයක් මෙතුමාගේ මුහුණෙන් පෙනෙන්නට නොතිබුණේ ය. දුෂ්ටාමාත්‍යයන්ගේ ද්‍රෝහිකම් නිසා බුද්ධි විපර්යාසාව මෙතුමා තුළ ප්‍රකෘතියෙන් පිහිටි ධර්මෂ්ඨගති ඉතා භයානක ස්වභාවයකට වෙනස් වූ බව සිතන්ට බොහෝ කාරණා තිබේ.

Non-Commercial Distribution

ස්වල්ප වේලාවකට පසු සිරිත් ප්‍රකාර දියවඩන නිලමේ සහ සළු වඩන නිලමේත් කන්නසාමි කුමාරයාගේ මන්දිරයට ගොස් ඔහු සුවද පැනින් නහවා ඕහට රාජාභරණ පලඳවා රාජකීය රන්සිවි ගෙයක වඩා හිඳුවා රාජ මාලිගාවට වැඩම වූවෝ ය. කුමාරයා මහ වාසල් දොරටුව සමීපයේ දී රන්සිවි ගෙයින් බැස දළදා මාලිගාවට ඇතුල්ව දළදා ස්වාමීන් වහන්සේ අභිමුඛයේ දී තිසරණය සහිත පංචශීලයෙහි පිහිටා රත්නත්‍රයට මල් පහන් පුදා නැවත පත්තිරිප්පුවට ප්‍රවිෂ්ටව එහි ඇද තුබුණු තිරේට මුවා වැඩ හුන්නේ ය. ශුභ මුහුර්තිය පැමිණි කෙණෙහිම ජවනිකාව විවර කරන ලදින් රැස්වී සිටි සේනාවෝ කාලතුවක්කු වෙඩි අත්තුවක්කු වෙඩි ආදී නානා ප්‍රකාර වෙඩි ශබ්ද පැවැත්වීමෙන් උද්ඝෝෂණය කළාහු ය. එකල්හිම නානා පංතිවලට අයත් නිළධාරිහු පත්තිරිප්පුව ඉදිරිපිට පිට්ටනියේ රැස්ව සිටි මුහුණින් හෙව අභිනව රජතුමාට පිළිවෙළින් තුන්වර බැගින් නමස්කාර කොට නැවත දොහොත් මුදුන් දී ඉදිරියට දණින් ගමන් කළෝ ය. මින් පසු නළුවන් සහ ගායකයන් විසින් මුහුණින් වැටී අභිවාදනය කොට නෘත්‍යගතාදිය දක්වීමෙන් රජතුමා සන්තර්පණයට පමුණුවා ලද්දෝ ය. මෙකී සියලුම ක්‍රීඩා ඉවර වූ පසු නිලධාරීහු තවත් වරක් රජහට නමස්කාර කළෝ ය. ඉන්පසු රජ තෙමේ රාජ මාලිගාවට ප්‍රවිෂ්ට වූයේ ය. මේ දක්වන ලද්දේ සිංහල රජවරුන් රාජ්‍යශ්‍රීයට පැමිණෙන ප්‍රස්තාවන් හිදී සාමාන්‍ය වශයෙන් පවත්වනු ලබන මංගලෝත්සව සිරිත් බව දත යුතු වන්නේ ය. යථොක්ත රාජ්‍යාභිෂේක මංගල්‍ය කෘත්‍යය නිම වූ පසු රාජාධි රාජසිංහ නරෙශ්වරයාණන්ට ලබන මංගලොත්සවය සිරිත් බව දත යුතු වන්නේ ය. යථොක්ත රාජ්‍යාභිෂේක මංගල්‍ය කෘත්‍යය නිම වූ පසු රාජාධි රාජසිංහ නරේෂ්වරයාණන්ගේ නාමශේෂභාවොපගතවීම මහජනයා ඉදිරියෙහි ප්‍රකාශ කොට, නැසී ගිය ඒ රජුගේ මෘත දේහය රන් සිවි ගෙයක හොයවා පෙර හරින් ආදාහන මලුවට ගෙන ගොස් ආදාහන අවමංගල්‍ය සිරිත් ප්‍රකාර සිද්ධ කරන ලද්දේ ය. අභිනව රජතුමාට කඩු පළඳවන මංගල්‍ය දවසේ දී ශ්‍රී වික්‍රම රාජසිංහ යන නාමය ඕහට තබන ලද්දේ ය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු වැසියන්ගේ සම්මතයෙන් රජ බවට පැමිණි වහාම රාජාධි රාජසිංහ රජුගේ අග මෙහෙසිය සිරභාරයට ගනු ලැබී ය, මෙසේ වීමට හේතුව යටකී ප්‍රධාන බිසවගේ සොහොවුරු මුද්දුසාමි කුමාරයා ලංකා සිංහාසනයට අයිතිවාසිකම් කියා සිටීම වේ. මේ කාරණය නිසා අනාගතයෙහි ඇති විය හැකි රාජ්‍යය පිළිබඳ වියවුල් නැති කිරීම පිණිස මුද්දුසාමි කුමාරයාගේ සහෝදර වූ බංගරුසාමි සහ රාමසාමිත් වගකිය යුත්තන් කොට මහ නුවර රඳවා ගෙන, මීට සහ අනික් සහෝදරයන් සතර දෙනාටත් රාජ්‍යයෙන් බැහැරව යන ලෙස පිළිමතලව්වේ මහනිලමේ ගේ උපදෙස් පරිදි අණ කරන ලද්දේ ය. මුද්දුසාමි කුමාරයා සෙසු සොහොවුරු

Non-Commercial Distribution

කුමරුවන් සමග කොළඹට ගොස් තමා පිළිබඳ මහනුවර ඔටුන්නට හිමිකම් ප්‍රකාශ කරමින් එය හස්ත ප්‍රාප්ත කරගනු සඳහා ඉංග්‍රීසින්ගෙන් උපකාර අයැද සිටියේ ය. ඒ ඉල්ලීමට මැදහත් වෙන්ට ඉංග්‍රීසිහු ගෙන් උපකාර ඒ කාලයේ දී නොපොහොසත් බැවින් හෝ නොකැමති වූයෙන් මුද්දුසාමි සහ ඔහුගේ සහෝදරයිනුත් යාපනයට ගොස් ඉංග්‍රීසින්ගේ ආරක්ෂාව යටතේ එහි වාසය කළෝ ය. ඒ අතර රාජද්‍රෝහි ක්‍රියාවක් ගැන රජහුගේ මයිලනු වූ ගම්පළ නායක්කර් නම් කුමාරයාට විරුද්ධව පිළිමතලව්වේ මහ අදිකාරිකම් තැන විසින් චෝදනාවක් ගෙනෙනු ලැබ ඔහු අල්ලා හිරභාරයට ගන්නා ලදී. මේ ගම්පළ නායක්කර් කුමාරයාගේ දියණියන් දෙනෙකු මදුරාපුරෙන් පිටත්ව මහනුවරට එන අතර සිය පියහු සිරභාරයට ගෙන තිබෙන බැව් මාතලේ දී සැලවී පෙරලා යාමට අදහස් කරන ලද නුමුත්, පිළිමතලව්වේ මහ නිලමේ විසින් ඔවුන් අල්වා බලාත්කාරයෙන් ගෙනවුත් රජහට භාර දුන්නේ ය. මේ කුමරියෝ දෙදෙන රජු විසින් මෙහෙසි බැව්හි තබා ගන්නා ලදී. රාජ්‍යයෙන් පලවා හැරීමෙන් හා හිර අඩස්සි කිරීමෙනුත් සිංහල ඔටුන්නට අයිතිවාසිකම් කියා සිටි නායක්කර්වරුන්ගෙන් පැමිණිය හැකි උවදුරු මගහැරී ගිය නුමුත් පිළිමතලව්වේ අදිකාරමට සතුරු වූ සිංහල නිලමවරු කීප දෙනෙක් මෙවකට සිටියෝ ය. ඇරැව්වාවල දෙවෙනි අදිකාරම් තැන සහ දඹගමුවේ දිසාපති තැනත් ප්‍රධාන සතුරෝ වූහ. ඔවුන් රාජද්‍රෝහීන් බව ඔප්පු කර ගැනීමෙහි නොපොහොසත් පිළිමතලව්වේ අදිකාරම් තැන ඒ දෙදෙන චොරඝාතකයන් ලබා අතරමග දී මැරෙව්වේ ය. ඇරැව්වාවල දෙවෙනි අදිකාරම වැසියන් විසින් සම්භාවනා කරනු ලැබූ ධර්මිෂ්ඨ නිලධාරියෙක් විය. එතුමා මරණයට පැමිණවීමෙන් කරනු ලැබූ මේ බලවත් අපරාධය, පිළිමතලව්වේ විසින් සිද්ධ කරවන ලදැයි දැනගත් බොහෝ නිලමවරුන්ගේ සිත් අදිකාරම් තැන කෙරෙහි කල කිරුණෝ ය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ යහපත් අපක්ෂවාදී ආණ්ඩු ක්‍රමය නිසා නොබෝ කලකින්ම එතුමා වැසියන්ගේ සිත් දිනා ගත්තේ ය. වැසියන්ගේ රාජපාක්ෂික භාවය ද, තමා කෙරෙහි සභාගික නිලමවරුන්ගේ ඇති විරුද්ධතාවය ද හොඳින් දැන ගත් පිළිමතලව්වේ අදිකාරම්හට තමාගේ අභිමතාර්ථය වූ රාජ්‍ය ලාභය උගහට බැව් පෙනී, එය මස්තක ප්‍රාප්ත කර ගැනීම සඳහා ඉංග්‍රීසින්ගෙන් උපකාර අයැදීම මීට අනතුරුව කරන ලද තර්කණයක් විය. එබැවින් හෙතෙම් නෝර්ත් උතුමාණන් වහන්සේ හා සමග රහසින් ලියුම් ගනු දෙනු කරන්ට වන්නේ ය, වර්ෂ 1799 ක් වූ පෙබරවාරි මස නෝර්ත් උතුමාණන් වහන්සේ සහ පිළිමතලව්වේ මහ අදිකාරමත් අතරේ රාජ්‍යය පිළිබඳ අවිස්සාවේල්ලේ දී සාකච්ඡාවක් පැවැත් වූයේ ය. මේ අවස්ථාවේ දී අදිකාරම් තැන රාජද්‍රෝහි වූ තමාගේ ගුප්තාංශයය සඟවා ගෙන ඉංග්‍රීසිහු ක්‍රියා කරන්ට යන පිළිවෙළ කෙසේ දැයි පළමු කොට දැන ගන්ට උත්සාහ කෙළේ ය. මේ සාකච්ඡාවෙන් කිසිවක් පැහැදිලි ලෙස බේරාගන්ට

Non-Commercial Distribution

නුපුළුවන් වූ හෙයින් එම අවුරුද්දේම දෙසැම්බර් මාසේදීත් අදිකාරම් තැන නෝර්ත් උතුමාණන්වහන්සේ සම්මුඛ වී සිංහල රජු ද්‍රවිඩ ජාතිකයෙක් බැවින් ඔහුගේ ආණ්ඩුව සිංහල වැසියන් විසින් ගරු නොකරන බව හා ඉංග්‍රීසින්ගෙන් සහායොපකාර ලැබුණොත් රජු නසා තමා ඉංග්‍රීසීන්ට කප්පන් ගෙවන රජෙකුමෙන් උඩරට ආණ්ඩුකරන්ට කැමති බවද ප්‍රකාශ කෙළේ ය. අවිහිංසක රජු මරවා තමා ලංකා සිංහාසනයෙහි අධීශ්වරභාවය දැරීමට කරන ලද අධම යෝජනාවට එකඟවෙන්ට නෝර්ත් උතුමාණන් වහන්සේ අප්‍රසන්න වූයෙන් අධිකාරම් තැන ලැජ්ජාවට පත්ව යන්ට ගියේ ය. නුමුත් එපමණකිනුදු අදිකාරම් තැන පරාංමුඛ නොවී මීට මාසයකට පසු ඉංග්‍රීසි ආණ්ඩුවේ (ප්‍රදේශභාර) ලේකම් තැන වූ බොයිඩ් මහතා සම්මුඛව නැවතත් ඔහුගේ අදහස් වඩා පැහැදිලි ලෙස එළිදරව් කරන ලද්දේ ය. මදුරාපුර නායක්කර්වරුන්ට ලංකා සිංහාසනයට කිසිම අයිතිවාසිකමක් නැති බවද, ඔවුන් ලක් දිවයිනෙන් නෙරපා හැර සිංහල රාජ පෙළ පතක් නැවතත් ඇති කර ගැනීම ඔහුගේ පරමාධ්‍යාශය බවද, අවැදගත් මන්දබුද්ධික තරුණයෙක් වූ කන්නසාමිට ඔටුන්න හිමිකර දෙන ලද්දේ වැසියන්ගේ සිත් ඔහු කෙරෙහි කල කිරවා නැවත නිර්මල සිංහල රජ පෙළපතට සම්බන්ධ කම් ඇති කිසිවෙකු රජකමට පත් කර ගනු අභිලාෂයෙන් බවද, තමා සිංහල රාජදුහිතෘවකගෙන් පැවතෙන්නෙක් හෙයින් තමාගෙන් පටන් ගෙන සිංහල රාජ පෙළපතක් නැවතත් ලංකා භූමියේ ප්‍රතිෂ්ඨාපනය කිරීමට ඉංග්‍රීසින් සහාය වූවහොත් ඔවුන්ට ලාභාපේක්ෂ විය හැකි අයුරු ප්‍රයෝජනවත් ගිවිසුමකට බැඳෙන්ට තමා සතුටු බව ද ප්‍රකාශ කෙළේ ය.

පිළිමතළව්වේ ගේ මේ වාක්චාතුර්‍යයෙන් යුත් කථාවට බොයිඩ් මහතා පිළිතුරු දෙනුයේ :- ඉංග්‍රීසීහු මහාදිකාරම් තැනගේ අභිවෘද්ධියට අතිශයින් කැමැත්තෝ ය. එසේ වුවත් සිංහල රජු සහ රාජ්‍යය ඉංග්‍රීසින්ගේ ආරක්ෂාව යටතට භාරගෙන ඉංග්‍රීසි යුද්ධ හමුදාවක් මහනුවර නැවැත්වීමට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එකඟ කර දුනහොත් විනා, අදිකාරම් තැන සමග ගිවිසුමකට බැඳි ක්‍රියා කරන්ට නුපුළුවන, තව ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ජීවිතය සහ ගෞරවයත් ආරක්ෂා කළ යුතු බව ගිවිසුමේ ප්‍රධාන වගන්තියක් විය යුතුය. ඉංග්‍රිසි ආණ්ඩුකාර නෝර්ත් උතුමාණන් වහන්සේගේ කැමැත්ත නම් ඉංග්‍රීසි යුද්ධ හමුදාවක ආරක්ෂාව යටතේ සිංහල රජු මහනුවර වාසය කරවා, එතුමාගේ නාමයෙන් රාජ්‍ය විචාරණය අදිකාරම් තැන කෙරෙහි පැවරීම යයි කීවේ ය. මේ ප්‍රස්තානොචිත පිළිතුරෙන් තුටු බැව් නොපැමිණි ඒ ද්‍රෝහි වූ අදිකාරම් තැන කියනුයේ:- ඉංග්‍රීසි ආණ්ඩුකාරයාණන්ගේ මහ නුවර රජු කෙරෙහි ඇති වූ භක්තිය ඉතා විෂ්මිත ය, ඒ රජුහුගේ ආරක්ෂා විධිවිධානය අරබයා ඉංග්‍රීසි යුද්ධ හමුදාවක් මහ නුවරට යැවීම උවමනා නොවන්නේ ය, යටත් පිරි සෙයින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රිසින් හා

Non-Commercial Distribution

සහභාගි වන්නෙක් නොවේ ය. යනු කීවේ ය. මෙසේ කියා බොයිඩ් මහතා සම්බවෙන්ට ආ ගමන නිෂ්ඵල වී අදිකාරම් තැන යන්ට ගියේ ය. තවද වර්ෂ 1800 ක් වූ ජනවාරි මස 21 වෙනි දින යටකී දෙපල නැවතද සම්මුඛ වූහ. මේ ප්‍රස්තාවෙහි ද අදිකාරම් තැන විසින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිංහාසන යෙන් නෙරපාලීමට ඉංග්‍රීසී උතුමාණන් වහන්සේගෙන් සහායොපකාර අයැද සිටියේය. රජ කෙනෙකු පිළිබඳවැ කරුණු රහිතව යුද්ධයක් ප්‍රකාශ කිරීමේ නීති විරෝධීභාවය හා යම් යම් කාරණ ගැන බේරීමක් කර ගන්ට මහ නුවරට තානාපතියකු යැවීමට ඉංග්‍රීසි ආණ්ඩුව අදහස් කර සිටින බවත් උතුමාණන් වහන්සේ කීයේය. සිතාවකට තානාපතියකු යවා එහි දී ගිවිසුමක් කර ගැනීමට නුපුලුවන්දැයි ආදිකාරම් තැන ප්‍රශ්න කෙළේ ය. එබඳු සෛවරී බලයක් රජු විසින් අදිකාරම් තැන කෙරෙහි පවරා තිබේ නම් එසේ කිරීමට බාධාවක් නැතැයි ආණ්ඩුකාර තෙමේ ප්‍රකාශ කෙළේ ය. නමුත් එබඳු බලයක් තමාට ලැබී නැති බව අදිකාරම් තැන දූන් වූ පසු, බලවත් හේවා සමූහයක් කැටුව ජනරල් මැක්ඩෝවල්තුමා තානාපතියකු මෙන් මහනුවරට යවන්ට යෝජනා කර ගන්නා ලද්දේ ය.

තවද එම වර්ෂයේ පෙබරවාරි මස අදිකාරම් තැන හා ආණ්ඩුවේ ඒජන්ත තැන වූ බොයිඩ් මහතාත් නැවතත් වරක් සම්මුඛ වී සාකච්ඡාවක යෙදුණේ ය. මේ ප්‍රස්තාවේ දී අදිකාරම් තැන රජු නොමරා ආරක්ෂා කිරීම ගැන තමා එකඟ බව ප්‍රකාශ කොට රාජ්‍ය පරිපාලනය කිරීමේ සම්පූර්ණ බලය හුදු තමා කෙරෙහිම පවරන ලෙසද, යුහුව යුද්ධ සේනාවක් කැටුව ජනරල් මැක්ඩෝවල් මහනුවරට යවන ලෙසද ඉල්ලා සිටියේ ය. නුමුත් රජුගෙන් අවසරයක් නොලැබ මහනුවරට තානාපතියකු යැවීම නොකළ හැකි යයි බොයිඩ් මහතා උත්තර දුන්නේ ය.

නැවත ද දිනක් මේ නිලධාරීන් දෙදෙන සම්මුඛව සාකච්ඡාවක් පැවැත්වූවෝ ය. සංග්‍රමික පිරිවරා මැක්ඩෝවල් මහතා තානාපති කොට මහනුවරට එවනු පිණිස අවසර ඉල්ලා රජු වෙත යැවීමට සූදානම් කරන ලද ලියමන බොයිඩ් මහතා විසින් අදිකාරම් තැනට දක්වන ලද්දේ ය. ඒ ලියමනේ අන්තර් ගත සියල්ල අදිකාරම් තැන විසින් අනුමත කරන ලදී. මෙයින් අනතුරුව සහ නුවර රාජධානිය ආරක්ෂාව පිණිස ඉංග්‍රිසින්ගේ භාරයට ගැනීම ගැන ප්‍රතිදානයක් වශයෙන් ඔව්හු සිංහල රජුගෙන් කුමක් බලාපොරෙතාත්තුවෙනදැයි අදිකාරම් තැන බොයිඩ් මහතාගෙන් ඇසුවේ ය. ඒ ගැන ද බොහෝ වේලාවක් සාකච්ඡා කොට වී, පුවක් සහ ගම්මිරිස් ආදියෙන් ලැබෙන ආදායම් ඉංග්‍රීසි ආණ්ඩුවට දෙන හැටියට ගිවිස ගන්නා ලද්දේ ය. නොබෝ දිනකට පසු මේ නිලධාරීහු දෙදෙන නැවතත්

Non-Commercial Distribution

සංගමයක්ව රජහට යැවීමට පිළියෙළ කරන ලද ලියවිල්ල ලියා පිටත් කර හැරීයෝ ය. ඒ ලියමනට පිළිතුරු ලියමනක් රජු වෙනුවෙන් අදිකාරම් තැන විසින් එවන ලද්දේ ය, ඊට පසු බොයිඩ් මහතා අදිකාරම් තැන හමු වී රජුගේ අත්සන දරණ ලියමනක් නොලැබ තානාපති තැන යවනු නොහැකි යයි කීවේ ය. මීට අදිකාරම් තැන රජුගේ අත්සන් ඇතිව ලියමනක් එවන්ට පොරොන්දු වූයේ ය. වර්ෂ 1800 ක් වූ මාර්තු මස 5 වෙනි දින ද මේ අධිපතීන් දෙදෙනාගේ නැවතත් සංගමයෙක් ඇති විය. රාජ්‍යලාභයෙහි නොඉවසිලිවන්ත අදිකාරම් තැන මේ අවස්ථාවෙහිද රජු සිංහාසනයෙන් ඉවත් කිරීම පිළිබඳ ප්‍රශ්නය ඉපදවේවේ ය. ඉංග්‍රිසින්ට විපක්ෂව කැරැල්ලක් ගැසීමට උඩරැටියන් 3,000 ක් ඉංග්‍රීසීන්ට අයිති පළාතකට පැමිණියහොත් එය සිංහල රජුහට විරුද්ධව සංග්‍රාමාරම්භ කිරීමට සුදුසු කරුණක් වශයෙන් සළකනු ලැබේ දැයි අදිකාරම් තැන බොයිඩ් මහතාගෙන් ඇසුවේ ය. ඉංග්‍රීසින්ට විරුද්ධව සිංහලයන්ගේ එබඳු අවදිවීමක් යුද්ධ ප්‍රකශ පිණිස හේතු කරුණක් වුවද එය උපදවන ලද්දේ රජු නොදනුවත් අදිකාරම් තැන විසින් බව දන දනම අදිකාරම් තැනට උදව් දිමට ඉංග්‍රීසින්ට කැමති විය නොහැකි බැව් බොයිඩ් මහතා ප්‍රකාශ කෙළේ ය.

ඊට පසුදින, එනම් මාර්තු මස 6 වෙනි දින බොයිඩ් මහතා විසින් අදිකාරම් තැනට ලියමනක් යවන ලද්දේ ය. නෝර්ත් උතුමාණන් වහන්සේ අප්‍රමාදව තානාපති තැන මහනුවරට යවන බවද, සකස් කොට තිබෙන ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට අදිකාරම් තැන විසින් රජු කැමති කරවනු ලැබේ යයි බලාපොරොත්තු වන බවද ඒ හස්නෙහි අන්තර් ගත ප්‍රධාන කාරණ වූහ.

පිළිමතලව්වේ මහ නිලමේ සහ නෝර්ත් උතුමාණන් වහන්සේ සහිත ඉංග්‍රීසි නිළධාරීන් විටින් විට සම්මුඛව කරන ලද සාකච්ඡා වලින් වැදගත් කාරණ තුනක් එළිදරවී තිබෙන බැව් මාර්ෂල් නම් ඉතිහාස කරුණු කියා තිබේ. පළමුවෙනි කාරණය :-

කන්නසාමි කුමාරයා රාජ්‍යයෙහි පිහිටුවා ඔහු රූකඩයක් කර ගනිමින් පසුව තමාම රජ්‍යය ලබා ගැනීමට මාර්ගය පහදා ගැනීම අදිකාරම් තැනගේ පරමාධ්‍යාශය වූ බවද , දෙවෙනි කාරණය :-

ඔහු විසින් ඒ රජු මරවනු ලැබ හෝ සිංහාසනයෙන් පහකර ලැබ රාජ්‍යය ඉංග්‍රීසින්ට පාවාදී තමා සුංගම් ගෙවන රජෙක් වන ඉංග්‍රිසි හේවා සමුදාවක් ස්වකිය ආත්ම රක්ෂණය පිණිස මහනුවර කලක් නවතා ගෙන තමාගේ බලය තහවුරු කර ගත් ඉක්බිති තමන්ට සහායව සිටි ඉංග්‍රීසින්ද රටින් පලවා හැර තමා සෛවරී බල සම්පන්න නරපතියෙක්ව මුළු

Non-Commercial Distribution

ලංකාද්වීය එකඡත්‍ර ඡායාවෙහි පිහිටුවා ලීමට අදහස් කර ගත සිටින බවද, තුන්වෙනි කාරණය :-

පිළිමතලව්වේ මහනිලමේගේ උපකාරත් ඇතුව මුළු සිංහල රාජ්‍යය ඉංග්‍රීසි ආණ්ඩුව විසින් අත්පත් කොට ගෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කොළඹ වාසය කරවා ඕහට වැටුප් ගෙවීමට නෝර්ත් උතුමාණන්වහන්සේ අදහස් කරන සිටි බව ද යන මේ කාරණ තුනයි.

පිළිමතලව්වේ අදිකාරම වැනි දුෂ්ට අදහස් ඇති රාජ්‍යද්‍රෝහියෙකුගේ කුමන්ත්‍රණයට ස්වල්ප මාත්‍රයකිනුදු නෝර්ත් උතුමාණන් වහන්සේ සහභාගිවීමෙන් , එතුමා විසින් සර්ව සාධාරණ බ්‍රිතාන්‍ය කිරීටයට කැළලක් කරන ලද්දේ ය යනු වර්තමානික ඉතිහාස කතෘන් වැඩි දෙනාගේ මතය විය. වර්ෂ 1800 ක්වූ මාර්තු මස 12 වෙනි දින මැක්ඩෝවල් ජනරාල්තුමා සංග්‍රාමික මහපිරිස් සහිතව තානාපතිකමකට මෙන් නොව රණර්ජී ගමන් කරන්නාක් මෙන් කොළඹින් පිටත්ව මහනුවර දෙසට නික්මුණේ ය, මේ මුළු සෙන් රුවන් වැල්ලේ කඩඉම ඉක්මවා ඉදිරියට ගමන් කිරීමේ දී සිංහලයන් විසින් විරුධතාවක් දක්වන ලදී. එහෙත් මේජර් ජනරල් මැක්ඩෝවල්තුමා මහනුවරට පැමිණ සිංහල රජතුමා සමග කරන ලද සාකච්ඡාවේ දී අධෛර්යට පැමිණ නෝර්ත් උතුමාණන් වහන්සේ ගේ යෝජනාවන් රජු ඉදිරියෙහි නොතබා තමා ගිය තානාපති කතීව්‍යය අර්හත වූයේ, වර්ෂ 1800 ක්වූ මැයි මස දෙවෙනි දින මහනුවරින් පිටත්ව කොළඹට ආපසු හැරී ආවේ ය.

නෝර්ත් උතුමාණන් වහන්සේ ලංකේශ්වර බවට පත්ව මෙහි පැමිණි නොබෝ කලකින්ම ඕලන්ද ආණ්ඩුකාලේ පැවති අතිශය කෲරතර දඬුවම් ඉවත් කරනලදී. මේ උතුමානණ් වහන්සේ ගේ ආණ්ඩු සමයේ බාල පරම්පරාවල් අභිවෘද්ධිය සඳහා ඉංග්‍රීසි පාඨශාලාවක් සහ ආණ්ඩුවේ ගැසට් පත්‍රය ද ආරම්භ කරන ලදී.

පිළිමතලව්වේ මහනිලමේ විසින් මේ තාක්කල් යොදනු ලැබූ නේක විධ තීක්ෂණ ගැඹුරු උපයාවලින් පවා ස්වකීය ද්‍රෝහාජශය මුදුන් පමුණුවා ගත නොහැ මේවර ඉංග්‍රීසින් කෝපයට පමුණුවා යුද්ධය ආරම්භ කරවනු පිණිස කටයුතු කරන්ට පටන් ගත්තේ ය. ප්‍රථමයෙන්ම ඉංග්‍රීසින්ට අයිති දේශසීමා අසල තන්හි සේනා රැස්කරවීමෙන් සංග්‍රාමික බලපාන්ට සැසෙන විලාසයක් දක්වූයේ ය. මෙසේ මද කලක් ගත වන අතැර, වර්ෂ 1802 ක් අප්‍රියෙල් මාසයේ දී ඉංග්‍රීසින්ට යටත් පුත්තලමේ මරක්කල වැසියෝ කීපදෙනෙක් මහනුවරට ගොස් රත්රන් පවුම් සියයක් පමණ අගනා පුවක්

Non-Commercial Distribution

අමුණු බොහොමයක් මිලදී ගෙන තවලම් බැඳ සියරටට යන්ට පිටත්ව ගියේ ය. ඒ පුවක් සහ ගවයන් කැකුන කැලේ නම් ස්ථානයේ දී රාජවල්ලභයන් විසින් පැහැර ගනු ලැබූහ. මේ වනාහි දුෂ්ට අදහස් ඇති පිළිමතලව්වේගේ මෙහෙයීමෙන් කරන ලද්දක් විය. යටකී සාහසික ක්‍රියාව ඉංග්‍රීසි ආණ්ඩුවට කරන ලද පරිභාසයක් මෙන් සලකා යුද්ධ ප්‍රකාශ කිරීමට කාරණයක් කර ගනිමින් නෝර්ත් උතුමාණන් වහන්සේ ම නුවරට යුද්ධ සේනාවක් යැවීමට අරමුණු කොට ඒ බව රජුටද මහදිකාරම් තැන ට ද දන්වා හැරියේ ය. අදිකාරම් තැන සිය අදහස් මුදුන් පැමිණියේ යයි කල්පනා කොට නෝර්ත් උතුමාණන් වහන්සේ වඩ වඩාමත් කෝපකරවන ලෙස පිළිහසුන් යැවිය.

## ඉංග්‍රීසීන් හා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අතරේ යුද්ධය.

වර්ෂ 1803 ක් වූ ජනවාරි මස 31 වෙන දින බලසම්පන්න යුද්ධ හමුදාවක් රැගෙන මේජර් ජනරල් මැක්ඩෝවල්තුමා මහනුවර දෙසට ගමන් කෙළේ ය. වර්ෂ 1803 ක් වූ මාර්තු මස 43 වෙනි දින තවත් යුද්ධ සේනාවක් කැටුව කර්නල් බාර්බුට් තුමා ත්‍රිකුණාමලෙයෙන් පිටත්ව ආවේ ය. බ්‍රිතාන්‍ය හේවායෝ මාර්ගයේ දී බරපතල විරුද්ධතාවක් නොලැබ පෙබරවාරි මස 21 වෙනි දින මහනුවරට පැමිණයහ. එකල්හි සිංහල රජු සහ නගරවාසීන් නගරය අත්හැර දමා ගොස් තිබෙන බව ඔවුන්ට දැන ගන්ට ලැබුණේ ය. වර්ෂ 1803 ක් වූ මාර්තු මස 8 වෙනි දින සිංහල රජකමට අයිතිවාසිකම් කියමින් සිටි රාජාධි රාජසිංහ රජුගේ අග මෙහෙසියගේ සොහොයුරු වූ මුද්දුසාමි කුමාරයාට නෝර්ත් උතුමාණන් වහන්සේ විසින් මහෝත්සවයෙන් ලංකාරාජ්‍යය යෙහි ඔටුනු පළඳවන ලදී. මේ අභිනව රජතුමා ඉංග්‍රීසී යුද්ධ හමුදාවක් මහ නුවර නවත්වා ගැනීමට හා සත් කෝරළය ඉංග්‍රීසින්ට හිමි කර දීමත් පොරොන්දුව වී ගිවිසුමකට අත් සන් කෙළේ ය. ඉංග්‍රීසින් විසින් මුද්දු සාමි අභිෂේක කොට රාජමාලිගාවෙහි නවත්වනු ලැබූ නුමුත් හෙතෙම ස්වකීය රජුමෙන් සිංහල වැසියෝ පිළිනොගත්තෝ ය. ඉංග්‍රීසින් විසින් මුද්දුසාමිට ඔටුනු පළඳවා ඔහු ගිවිසුමකට බඳවා ගැනීමට පිළිමතලාවේ මහ තිලමේට බලවත් පහරක් විය. මේ ගැන අතිශය උදහසට පත් අදිකාරම් තුමා මුද්දුසාමි කුමාරයා සහ ඉංග්‍රීසීනුත් විනාශ කර දමන්ට ස්ථිර ලෙස හිතට ගත්තේ ය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීස්නට පාවා දෙන පොරොන්දුව පිට යුද්ධ හමුදාවකුත් කැටුව හඟුරන්කෙතට ගමන් කිරීමට

Non-Commercial Distribution

පිළිමතලව්වේ අදිකාරම විසින් ජනරල් මැක් ඩෝවල් සේනාපතිතුමා පොළඹවනු ලැබීය. ඉංග්‍රීසී යුද්ධ හමුදාව ගමන් කරන මාර්ග දෙපස හෙල් උඩ කාලතුවක්කු නංවා සිංහල සේනාව කැලෑවල තන්හි තන්හි රැකවල් ගෙන සිටියෝ ය. ඉංග්‍රිසි හේවායෝ තරමක් දුර ගමන් කළ පසු ඔවුන් කරා සෑම දිග්භායෙන් අසනිපාත බඳුවැ වෙඩි උණ්ඩ එන්ට පටන් ගත්තේ ය. හේවායෝ බොහෝ ගණනක් මාර්ගයේ මැරී වැටුණෝ ය. ඉතිරි සෙනග හඟුරන් කෙතට ළඟා වුන විට සිංහල රජු එයින් ඈතට පලාගොස් තිබෙන බව දැන ගත්තා ය. ඔව්හු හඟුරන්කෙත මාලිගයට ගිනි තබා බලවත් අන්තරායට පත්ව දුකසේ මහ නුවරට පැමිණුණේ ය. මින් අනතුරුව සිංහල සෙනග මහනුවර හාත්පස වටලැවීය. ඉංග්‍රිසි මිනිසෙකුගේ හිසකට රුපියල් දහයක් සහ ඉංග්‍රිසීන්ට පක්ෂ වූ අන්‍ය ජාතිකයෙකුගේ හිසකට රුපියල් පහ බැගින් ද ගෙවන බව කියා පිළිමතලව්වේ අදිකාරම්තුමා රටේ ප්‍රකාශයක් පතුරුවා හැරියේ ය. ඒ කරණ කොට ගෙන සිංහලයන් විසින් ඉංග්‍රිසි බොහෝ දෙනෙක් ජීවිතක්ෂයට පමුණුවන ලදහ. ඉක්බිති රටවාසීන්ගේ කෝපෝද්ගතභාවය සංසිඳවනු පිණිස නෝර්ත් උතුමාණන්වහන්සේ වෙනුවෙන් මේජර් ජනරල් මැක්ඩෝවල්තුමාත් පිළිමතලව්වේ මහ අදිකාරම්තුමා වෙනුවෙන් මීගස්තැන්නේ දෙවෙනි අදිකාරම්තුමාත් අතරේ වර්ෂ 1803 ක් වූ මාර්තු මස 28 වෙනි දින ගිවිසුම් පත්‍රයක් හුවමාරු කර ගන්නා ලද්දේ ය. ඒ ගිවිසුම් පත්‍රයෙන් පිළිමතලව්වේ අදිකාරම මහනුවර ආණ්ඩුකරන බලසම්පන්න කුමාරයා හැටියට ඉංග්‍රීසින් විසින් පිළිගනු ලබන්ට ද, මුද්දුසාමි කුමාරයාට විශ්‍රාම වැටුප්දී මහනුවරින් අහක්කරවා හරින්ට ද, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අල්වා ඉංග්‍රීසින් හස්තගත කිරීමට ද, එංගලන්තයේ මහරජුට සත්කෝරළය පාවා දෙන්ට ද දෙපක්ෂය විසින් ගිවිස ගන්නා ලදී, ගිවිසුම් පත්‍රයට අත්සන් තැබූ පසු හේවායෝ 700 ක් සහ ඒරෝපාකාර භටයෝ 300 ක් ද බෙන්ගාලේ සහ මදුරාසියේ ආර්ටිලරි යුද්ධ හමුදාවද මහනුවර නවත්වා ඉතිරි යුද්ධ සේනාවත් සමග ජනරල් මැක්ඩෝවල්තුමා කොළඹට පිටත්ව ගියේය. පිළිමතලව්වේ අදිකාරමගේ රාජද්‍රෝහි කමේ ප්‍රයෝජනය ලබා ගෙන හෝ යුද්ධ කිරීමෙන් හෝ උඩරට අල්වා ගැනීම නෝර්ත් උතුමාණන් වහන්සේ ගේ පරමාධ්‍යාශය විය. මීගස්තැන්නේ දෙවෙනි අදිකාරම සහ මැක්ඩෝවල් මහතාත් අතරේ මාර්තු මස 28 වෙනි දින කරගත් ගිවිසුම ස්ථිර කර ගැනීමේ ආවශ්‍යක බව හඟවා පිළිමතලව්වේ අදිකාරම් තැන තමා සම්මුඛ වන පිණිස දඹදෙණියට පැමිණෙන ලෙස ඉල්ලා නෝර්ත් උතුමාණන් වහන්සේට ලියමනක් යවන ලදී, මේ ප්‍රස්තාවයේදී උතුමාණන්වහන්සේ අල්ලා හිරභාරයට ගැනීම අදිකාරම් තැනගේ අදහසව තිබුණේ ය. නුමුත් එදින හදිස්සියෙන්ම වාගේ



Non-Commercial Distribution

ත්‍රිකුණාමලයේ සිට කර්නල් බාර්බුට් ජා හේවාකණ්ඩයමකුත් සමග දඹදෙණියට පැමිණියෙන් අදිකාරම් තැනගේ කපටි උපායෙනුදු සිය අදහස ඉටු කර ගැනීමට අනවකාශ විය.

ජනරල් මැක්ඩෝවල් මහතා කොළඹට එනවිට මහනුවර යුද්ධ හමුදාවේ පාලනත්වය මේජර් ඩේවිට භාරදී ආවේ ය. මිට පසු ජාහේවායෝ සහ මදුරාසියේ ලැස්කාර්වරු බොහෝ දෙනෙක් ඉංග්‍රිසි හමුදාවෙන් ඉවත්වී සතුරු පක්ෂයට එකතු වූහ. මේ කාලයේදී ලෙව්කේ දිසාව විසින් පිළිමතලව්වේ මහ අදිකාරම මුළු ලෝකයාම මුලා බවට පමුණු වන රාජද්‍රෝහි තක්කඩියෙකු බව විශ්වාස කටයුතු මාර්ගයෙන් ඉංග්‍රීසි ආණ්ඩුවට දැක්වූයේ ය. නෝර්ත් උතුමාණන් වහන්සේ ද හොඳින් දැන සිටි නුමුත් සිය අදහස් මුදුන් පත් කර ගන්නා තුරු තමාගේ දැනීම කිසිවෙකුටත් නොහඟවා සිටියේ ය. ඉංග්‍රිසින්ට පක්ෂ වී සිටීම ගැන සිංහල රජු තමා කෙරෙහි අතිශය කෝපයෙන් වසන බව කියා හඟුරන්කෙතට නැවතත් වරක් යුද්ධ හමුදාවක් යවන ලෙස මෙම අවුරුද්දේ ජූනි මස 13 වෙනිදා පිළිමතලව්වේ මේජර් ඩේවිගෙන් ඉල්ලා සිටියේය. ඒ මහතා යථොක්ත අයදිම ඉෂ්ට කරන්ට සතුටු නොවීය, පිළිමතලව්වේ ගේ බල වික්‍රමය ආනුභාවසම්පන්න ලෙස උඩරට පැතිර පැවති නුමුත් යුද්ධ කටයුතු සම්බන්ධ විධි විධාන සියල්ලක්ම සිංහල රජු විසින් පිළිමතලවේගේ බද්ධ වෛරීන් වූ අවශේෂ ප්‍රධාන රදල වරුන්ගෙ අනුශාසකත්වයෙන් කරවන ලදී, බ්‍රිතාන්‍යවරුන් ලංකා මහිමණ්ඩලයෙන් සමූලෝද්ධරණය කිරීමට සුදුසු සංග්‍රාමික කටයුතු සියල්ල යුහුසුළුව සූදානම් කරන ලද්දේ ය. වැඩිකල් ඉක්මීමට ප්‍රථම සිංහලයන් විසින් ගලගෙදර සහගිරාගම පිහිටි ඉංග්‍රීසීන්ගේ බලකොටු දෙක අල්වා ගන්නා ලදී, 1803 නේ ජූනි මස 24 වෙනි දින අරුණෝදයට ප්‍රථම සිංහල සෙන් 10,000 කින් යුත් කණ්ඩායමක් විසින් මහනුවර මාලිගාවට ඉහළින් පිහිටි කන්දක රැක්මෙහි සිටි ඉංග්‍රීසි යුද්ධ කණ්ඩායමකට පහරදී එහි සිටි හේවායන් හිරභාරයට ගෙන මහනුවර වටලා ගත්හ. බොහෝ වේලාවක් සටන් කළ පසු සිංහලයන්ට ජය අත්වෙන බැව් මේජර් ඩේවිට අවබෝධ වී සමාදානය ඉල්ලී මේ සංඥා වශයෙන් සුදු කොඩියක් ඔසවන ලද්දේ ය. එකෙණෙහිම සිංහලයෝ වෙඩි තැබීම නවත්වන ලදින් පිළිමතලව්වේ අධිකාරම සහ මේජර් ඩේවි අතරේත් සාකච්ඡාවක් ඇති විය. ඉංග්‍රීසි හේවායන්ට යුද්ධ භාණ්ඩ අතහැර දමා නිරායුධව මහනුවරින් පිටවී යන්ට අදිකාරම් තැන විසින් අවසර දෙන ලදි, මුද්දුසාමි කුමාරයාට මේජර් ඩේවිගේ යුද්ධ හමුදාවත් සමග ගැලවී යන්ට අවසර දීම ගැන සිංහල රජතුමා පිළිමතලව්වේ අදිකාරම් තැන කෙරෙහි උදහස් වූයේ ය. රාජාඥාව පරිදි මුද්දුසාමි කුමාරයා සහ තවත් ඔහු සමග ගිය ඔහුගේ බන්ධුවරයන් පස්දෙනෙක් ද අල්වා ගෙනවුත් උඩුවෙල බැද්දේ දී ශීඝ්‍ර

Non-Commercial Distribution

ඡේදනය කරවීමෙන් දිවි තොර කළෝ ය. මුද්දුසාමි කුමාරයාගේ හිතෛෂීයෙක්වූ රණරාළ නම් සිංහල මිනිහෙක්ද ශූලාරූඪ කරවන ලද්දේ ය. ඉන් පසු සිංහල නිලමේවරු සමහරෙකු විසින් ප්‍රයෝගයක් කොට මේජර් ඩේවි තවත් ඉංග්‍රීසි යුද්ධ මුළාදනී දෙදෙනෙකු හා ජාමුළාදෑනියෙකුත් සමග නුවරට කැඳවා ගෙන ගොස් රජුගේ අණ පරිදි සිරකවන ලදී. අන්තිමේ දී සිංහල මිනිස්සු කිප දෙනෙක් මහ අදිකාරමගේ ව්‍යාජ් අවසරය පිට නික්මගිය මේජර් ඩේවිගේ යුද්ධ හමුදාව එහු බැඳ ගොස්, ඉංග්‍රීසි හේවායෝ දෙදෙන දෙදෙන බැගින් වාගොල්ලේ මිටියාවතට ගෙනයනු ලැබ පොළුවලින් ගසා මරණ ලද්දෝ ය. බාර්න්ස්ලි නම් ඉංග්‍රීසි හේවායා පමණක් පුදුමාකාර යෙන් ගැලවී ගියේය. අකර්මණ්‍යව සිටි ඉංග්‍රීසි හේවායන් මැරවීමේ අපරාධය ඉංග්‍රිසි ආණ්ඩුව සිංහල රජු කෙරෙහි කෝප කරවීම පිණිස පිළිමතලව්වේ අදිකාරම විසින් කරන ලද බැව් මේජර් බීවර් නම් මහතා විසින් කියා තිබේ. ජූලි මස දෙවෙනි දින සත්කෝරළේ දඹදෙණිය පළාත සිංහලයන්ට අයිති වූයේ ය. දස දිනක් ඉක්මීමට ප්‍රථම ඉංග්‍රීසීන්ට ඔවුන්ගේ පහතරට ප්‍රථම සීමාවෙන් මෙපිට අඟලක් පමණවත් භූමිභාගයක් නොතබා සිංහලයන් විසින් සියල්ලම හස්ත ප්‍රාප්ත කර ගන්නා ලද්දේ ය.

මේ ජයග්‍රහණයෙන් ඔද වැඩි සිංහලයෝ මුහුදුබඩ පළාත් ව ඉංග්‍රීසීන්ට යටත්ව සිටි සිංහලයන් ඔවුන් කෙරෙහි කලකිරවා ස්වපක්ෂ යට හරවා ගැනීමට අනේක උත්සාහ දූරු නුමුත් එය සාර්ථක නොවීය. මෙම අවුරුද්දේ අගෝස්තු මස 20 වෙනි දින සිංහල සේනාව විසින් හංවැල්ලේ කොටුව අල්වා ගනු ලැබ පසු දින කොළඹට සැතැක්ම 14 ක් නොහොත් 15 ක් මැතට ඔව්හු ගමන් කළෝ ය. නුමුත් ඉංග්‍රීසීන් විසින් ඔවුන් පලවා හරිනු ලැබූහ. වර්ෂ 1804 දී සිංහල රජුට විරුද්ධව යුද්ධ කර ගෙන යාම පිණිස එංගලන්තයේ සිට 65 වෙනි රෙජමේන්තුව නම්ලත් යුද්ධ හමුදාවක් එවන ලදී. එයිනුදු සිංහලයන් අභිනනය කිරීමට අසමර්ථ විය.

Non-Commercial Distribution

# නෝර්ත් උතුමාණන්වහන්සේගෙන් පසු ඉංග්‍රීසි ආණ්ඩුව.

වර්ෂ 1805 ක් වූ ජූලි සම 19 වෙනි දින ශ්‍රීමත් තෝමස් මේට්ලන්ඩ් තුමා ලංකාණ්ඩුකාර ධූරය භාර ගත්තේ ය. මෙතුමා විසින් පවත්වන ලද ස්වච්ඡන්ද ආණ්ඩු ක්‍රමය නිසා මෙතුමාට ටොම් රජ්ජුරුවෝ ය යන පරිහාසනාමයව්‍යයහාරවිය. මෙතුමාගේ ආණ්ඩුකාලයේ දී සිංහල රජු හා සමග කිසිම වියවුලක් ඇති නොවීය. මේ ආණ්ඩුවේ දී රෝමානු කතෝලික ජනයාට විරුද්ධව පණවා තිබුණ අණපණත් සිථිල කරනලදී.

වර්ෂ 1811 ක් වූ මාර්තු මස 19 වෙනි දින ලංකාණ්ඩුකාර ධූරයට මේජර් ජනරල් විල්සන් තුමා පත්වූයේය. සිංහල රජු හා පූර්වෝක්ත ආණ්ඩුකාලෙයහි පැවති සමාදානය මේ ආණ්ඩුකාලයේදී ද පැවතියේ ය. ජූරි සභාවක් සම්මතව නඩු විනිශ්චය කිරීමෙහි බලය ඇතුව සුප්‍රිම උසාවිය නොහොත් ශ්‍රේෂ්ඨාධිකරණය ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් ජෝන්ස්ටන් තුමාගේ ප්‍රධානත්වය පිට ලංකාවෙහි පිහිටුවන ලද්දේ මේ වර්ෂයේ දීය.

මේ කාලයේ දී උඩරටට අතිශය අභාග්‍ය කාලයක් උද්ගත විය. සිංහල රජුගේ දෙවෙනි අදිකාරම වූ සත්කෝරළේ දිසාපති තැන්පත් මිගස්තැන්නේ ගේ ජන්මාන්තරගතවීමෙන් අනතුරුව පෞරාණික සිරිත් විරිත් වලට ප්‍රතිවිරුද්ධ වන ලෙස එම කෝරළය, එකල සිංහල ආණ්ඩුවේ අධිපතීන් දෙදෙනෙක් වූ ඇහැළ පොළ නිලමේ සහ මොල්ලිගොඩ දිසාපති තැනත් අතර බෙදා දෙන ලදී, අධිපතීන් දෙදෙනෙකුට සේවය කිරීම සහ බඳු ගෙවීමත් දුෂ්කර කටයුත්තක් සෙයින් වැසියන් අතරේ බලවත් කැරැල්ලක් එහෙත් පිළිම තලව්වේ නිළමේ විසින් ඒ කැරැල්ලේ මැඩ පවත්වා මුළු කෝරළයම ස්වකීය බෑණ නුරත් වත්තේගේ පාලනයට වටත් කර දෙන ලදී, මේ කාලයේදීම පිළිමතලව්වේ විසින් ස්වකීය පුත්‍රයෙකුට ස්වර්ගස්ථ වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ අවජාත මිනිබිරියක් පාදපරිචාරික කිරීම් වශයෙන් කරන ලද විවාහ යෝජනාව ගැන සිංහල රජතුමා තුළ බලවත් සංශය භාවයක්හට ගෙන ඔහු අදිකාරම් ධූරයෙන් නෙරපන ලදී. නින්දාවට පත් මේ සිංහල ජනප්‍රධානි තෙමේ වර්ෂ 1812 දි සිංහල රජු ස්වකීය මාලිගාවේදීම ජීවිතක්ෂයට පැමිණවීමට රජුගේ ශරීරක්ෂක භටයන්ට නායක වූ ජා මුහන්දිරම් කෙනෙකු සමඟ කුමන්ත්‍රණය කෙළේ ය. මේ කුමන්ත්‍රණය අසුවී සිංහල රජු විසින් පිළිමතලව්වේගේ හිස ගස්වා දැමීමෙන් ජීවිතක්ෂයට පමුණුවන ලදී.

Non-Commercial Distribution

# සර් රොබර්ට් බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය (ක්‍රි.ව. 1812-1820)

වර්ෂ 1812 ක් වූ මාර්තු මස 18 වෙනි දින ලැප්ටිනර්ට් ජනරල් ශ්‍රීමත් රොබර්ට් බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාර ධූරය භාර ගත්තේ ය. මේ කාලයේ දී සිංහල රජුගේ දෙවෙනි අදිකාරම් ධූරය දරූ ඇහැළපොළේ නිලමේ උහුමයිල් වූ පිළිමතච්වේ වෙනුවට පළමුවෙනි අදිකාරම් ධූරයට පත් වූවාට පසු සිංහල රජු විසින් ඔහු සබරගමු පළාතේ ආදායම් එකතු කරවීමට සහ එහි කෘෂිකර්මාන්තය සම්බන්ධ කටයුතු පරිපාලනය කිරීමේ අධ්‍යක්ෂ ධූරයට පත් කර යවනු ලැබ සිටියේ ය. ඔහු විසින් එහිදී වැසියන්ට කරන ලද ඇතැම් පීඩාවන් ගැන ඔහුට විරුද්ධව පමුණුවන ලද චෝදනාවන්ට උත්තරදීම පිණිස සිංහල රජු විසින් ඔහු මහ නුවර රජවාසලයට පැමිණෙන්ට කියා නියමකරන ලදී. එහෙත් ඇහැළපොළේ මන්ත්‍රි තැන රාජාඥාවට කීකරු නොවී කොළඹ ඉංග්‍රීසි ආණ්ඩුකාර තැන වූ බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ සමග රාජ්‍යය පිළිබඳ රහස් ලියුම් ගනුදෙනුකර ගැනීමෙන් තම රාජකීය ස්වාමියාට විරුද්ධව ද්‍රෝහි සාකච්ඡාවක යෙදුණේ ය. ඒ අතර සිංහල රජුට විරුද්ධව කැරළි ගැසීමට ඔහු ස්වපක්ෂවාදි ජනයන් පොළඹවනලද්දේ ය. යට කී ද්‍රෝහි ක්‍රියා ගැන දූනගත් සිංහල රජතුමා විසින් සිංහල රාජනීතියේ ප්‍රකාර ඔහුගේ රාජපාක්ෂික භාවය පිණිස ඇපකාරයන් වූ ඔහුගේ භාර්යාව සහ දරුවනුත් හිරභාරයට ගෙන ස්වකිය තනතුරු වලින් ඔහු පහකර දමන ලදී.

තනදන්තරව ඔහුගේ තනතුරට දෙවෙනි අදිකාරම් තැන වූ මොල්ලිගොඩ නිලමේ පත්කරනු ලැබ කැරැල්ල සංසිඳවීමට සහ ඔහු අල්වා ගෙන ඒමටත් සබරගමු පළාතට පිටත් කර යවනලද්දේ ය. මොල්ලිගොඩ අදිකාරම් තැන සමන්තකූට පර්වතය පසුකොට ගොස් සපරගමුවට උපගත වූයේය. එවිට ඇහැළපොළගේ කැරළිකාර පිරිස විසිරී ගොස් සිටියේ ය. වර්ෂ 1814 මැයි මාසේ පමණේ දී ඇහැළපොළ නිලමේ කොළඹට පලාගොස් බ්‍රිතාන්‍යවරුන්ට එක්වී සිටින බව දූනගන්නා ලදී, මේ ප්‍රවෘත්තිය දූනගත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දන්ඩෙන් පහරනලද අශ්වයකු බඳු වැ උග්‍ර කෝපයට පැමිණියේ, සිරභාරයට ගෙන සිටි ඇහැළපොළගේ පවුල තමා අභිමුවට කැඳවා ඔවුන් සියලු දෙනාටම මරණීය දණ්ඩය නියම කෙළේ ය. ඇහැළපොළ නිලමේගේ පවුල සමූලඝාතයෙන් විනාශ ප්‍රාප්තකළ පරිදි මාර්ෂල් නමැත් ඓතිහාසික ග්‍රන්ථ කතෘතුමා ඉතා සංවේග ජනක ලෙස විස්තර කර තිබේ. ඇහැළපොළ නිලමේට පිරිමි ළමෝ තිදෙනෙක් සහ ගෑනු ලමයෙක් ද ඇතුව සිටියෝ ය. මොවුන් අතුරෙන් වැඩිමහල් පිරිමි

Non-Commercial Distribution

ළමයාගේ වයස අවුරුදු එකොළොසක් විය. රාජාඥා පරිදි ශීර්ෂ ඡේදනය පිණිස කඩු ගත් අත් ඇතිව සැරසී සිටි බියකරු වධකයන් දැක මේ වැඩුමහල් දරුවා භයින් ත්‍රස්තව සිය මෑණියන්ගේ බඳ වැළඳ ගත්තේ ය. මේ ක්‍රියාව දුටු නව හැවිරිදි වයස් වූ ඔහුගේ බාල සහෝදර තෙම වැඩු මහල් සහෝදරයාට කථා කොට පුරාතනයෙහි භීම වික්‍රම සම්පන්නව ක්‍රියා කළා වූ වීර උතුම් ලේ වලට නිගා නොකොට ධෛර්යමත්ව මරණයට මුහුණ පෑවේ ය. වධකරු විසින් එලන ලද එකම කඩු පහරින් ඒ අහිංසක නිර්භීත දරුවාගේ හිස ශරීරයෙන් වෙන් වී වැටුණේ ය. මෙයින් පසු වැඩුමහල් පිරිමයාගේ ද ගැණු ළමායාගේ ද හිස් පෙර පරිද්දෙන් සිඳ මෙහගන ලදී. මේ කෲරතර සිරස් ඡේදනය කරන කල කිසිත් නොතේරෙන පවුලේ බාළ ළදරුවා ඇහැලේපොල කුමාරිහාමිගේ ළයෙහි කිරි බිබී උන්නේ ය, මේ ඝෝර වූ වධ දණ්ඩනයන් ඉටු කරන ලීලාව නරඹමින් උන්නේ ව, මේතාක් වධක භූමියෙහි ලේ පිපාසයෙන් තෘප්තියට නොපැමිණි ඒ රජ බිළිඳා දෙස ද නෙත්සඟල රවා බලා ඔහුත් මරා ඔහුගේ මෘදු මොලොක් ශරීරය වන ක ලා මව් ලවා කොටවන්ටයයි වධකයා ඇණවී ය. ස්වභාවයෙන් කෲරතර සිතක් ඇති වධකයා පවා මේ ආඥාව ලැබ චිත්තසන්තාපයට පැමිණ මදක් පසුබට වී සිට රාජ භයින් එය ඉෂ්ට කළේ ය. ළදරුවාගේ හිස කපා දැමූ පසු ඔහු බොමින් සිටි කිරි, ලේ සමග මිශ්‍රව පොළෝ තෙලෙහි ගලා යන්ට වන. එය දුටු මෑණී තොමෝ මූර්ච්ඡාවී බිම වැතිර ගත්තීය. මින් පසු තම ළදරුවාගේ මළකඳ වංගෙඩියක ලා කොටන ලෙස ඇහැළපොළේ කුමාරිහාමිට අණ කරනලදී, ඒ අණට කීකරු නොව ඈ බලාසිටින විට, එසේ නොකළොත් ඈ රොඩියෙකුට පාවා දෙන බවට රජ තර්නය කෙළේ ය. මානාධික වූ අසරණ වන්ත ඕ තොමෝ ඒ අවමානයෙන් ගැලවෙන පිණිස මෝල අතට ගෙන ඔසවා තම දරුවාගේ මළ සිරුර මත්තෙහි හෙළුවේ ය. මේ ඝෝර වූ අමනුෂ්‍ය ක්‍රියාව නැරඹූ සමහරු විලාප බස් බෙණෙමින් හැඬූ බවත් ඇතැම් අය හිසංඥාව බිම අද වැටී ගිය බවත් කියා තිබේ. ඇහළෙ පොළ තිලමේගේ මුළු පවුලම වැනසීමෙහි ගිජුවට සිටි රජ තෙම මේ භයානක ලේ ධාරාවහනයෙන් පවා ඇතිවීමකට නොපැමිණි මීළඟ ඇහැළපොළේ කුමාරුහාමි සහ පුස්වැල්ලේ දිසාවගේ භාර්යාව සහ දියතියත් මහනුවර බෝගම්බර වැවේ ගිල්වා මැරවීමෙන් තමන්ගේ දුෂ්ට කර්මය උග්‍රාකාරයෙන් සම්පූර්ණ කෙළේ ය. දුටුවන් ළය පැළියනතරම් වූ මේ සාහසික ක්‍රියාවෙන් හටගත් බලවත් ශෝකය සහ කැළඹීම ද හේතු කොට ගෙන මහනුවර වාසී සියලු ස්ත්‍රී පුරුෂ ජනයා ශෝක ප්‍රකාශ කිරීම් වශයෙන් දෙදිනක්ම ආහාර වර්ජිත කිරීමෙන් විසූ බව සහ මුළු නගරයම එකම මළගෙදරක් මෙන් පැවති බවත් කියා තිබේ.

Non-Commercial Distribution

# මුළු ලංකාව ඉංග්‍රීසීන්ට අත්වීම.
# ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිංහාසනයෙන් පහ කිරීම.

ඇහැළපොළේ අදිකාරම්තැනගේ රාජද්‍රෝහි ක්‍රියා නිසා ඔහුගේ අහිංසක භාර්යාව වූ කුමාරිහාමි සහ දරුවන් ට සිදු වූ දුක්ඛ දායක අනාර්ථ මරණ ගැන ඕහට සැළවීය. ඒ නිසා ඔහු සිංහල රජු සහ රාජධානියත් ඉංග්‍රීසීන්ට පාවාදී පසුව ඔහුගේ හිතේ පැවති යම් කිසි අභිමතාර්ථයක් ඉටු කර ගැනීමට තරයේ සිතට ගත්තේ ය. උඩරට පැවති චඤ්චලභාවය දත් බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ එය පහතරටට යාකර ගැනීමට කලක සිට තමන් සිතේ නිතොරව පැවති අදහස මුදුන් පත් කර ගැනීට කදිම ප්‍රස්තාවක් පැමිණියාක්සේ සැලකුවේ ය. උඩරට අත් පත් කර ගැනීමට යුද්ධ කටයුතු පිළිවෙළ දක්වා කතීව්‍ය පත්‍රයක් ඇහැළපොළේ නිලමෙ විසින් බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේට ඔප්පු කරන ලදී. ස්වල්ප වෙනස් කිරීම ඇතුව උතුමාණන් යථොක්ත යෝජනා පත්‍රයේ ආකාර සංග්‍රාමික කෘත්‍ය ආරම්භ කිරීමට සැලැස් වූ යේ ය. එපමණකුදු නොව බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ විසින් සිංහල රජුගේ එකල බලසම්පන්න අමාත්‍යයෙක්ව සිටි මොල්ලිගොඩ පළමුවෙනි අදිකාරම ඉංග්‍රීසිපක්ෂයට හරවා ගැනීමට පොළඹවීමට අනේක ප්‍රයත්න දරන ලද බව හා එය සාර්ථක නුවූ බවත් මාර්ෂල් මහතාගේ ලංකා ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයෙහි සඳහන් වේ. ජාතීන් අතර පවතින ධර්මනීතියට අනුරූපව සිංහල රජුට විරුද්ධව යුද්ධයක් ප්‍රකාශ කිරීමට ඉංග්‍රීසි ආණ්ඩුවට සුදුසු කාරණයක් නොමැතිව සිටින විට මෙහි පහත දක්වන සාහසික ප්‍රවෘත්තිය සිද්ධ විය.

වර්ෂ 1814 දී බ්‍රිතාන්‍ය වැසියන් වූ පහතරට මිනිසුන් දස දෙනෙක් වෙළඳාම පිණිස මහනුවර ගම්බද පළාත්වල සංචාරණ කළෝය. මේ මිනිසුන් ඇහැළපොළේ නිළමේගේ චරපුරුෂයන් වනැයි සැක කරනු ලැබ සිංහල රජු විසින් ඔවුන්ගේ අත් පා කන් නාසාදි අංග ප්‍රත්‍යංගයන් සිඳුවා ඔවුන් ආපසු කොළඹට එවන ලදී. ඔවුන්ගෙන් සත් දෙනෙක් ලබන ලද බරපතල තුවාල කරණ කොට ගෙන ගමන් මාර්ගයේ දී මිය ගියහ. ඉතිරි තුවාලකාරයෝ තිදෙන කොළඹට පැමිණ තම තමන්ට කරන ලද වධ දණ්ඩනය ඉංග්‍රීසි ආණ්ඩුවේ තත්වය පිළිබඳ ලඝු කොට සැලකීමෙන් කරන ලද පරිභවය කැයි බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ විසින් ඒත්තුගන්නා ලදී.

සිංහල රාජාණ්ඩුවට විරුද්ධව වර්ෂ 1815 ක් වූ ජනවාරි මස 13 වෙනි දින යුද්ධ ප්‍රකාශ පත්‍රයක් නිකුත් කරන ලද්දේ ය. මේ පිණිස හේතුභූත ප්‍රධාන කාරණ චතුෂ්කය විය. එනම්:-

Non-Commercial Distribution

පළමු වැනිව :- මහනුවර රජ ස්වකීය යටත් වැසියන්ට කරන ලද ඉවසිය නොහෙන කෘෘරතර පීඩනාදිය, දෙවැනිව :- බ්‍රිතාන්‍ය ආණ්ඩුව සමග කිසිම සමගි ගිවිසුමකට සම්බන්ධවීමට සිංහල රජතුමාගේ නොසතුට, තෙවැනිව :- සිංහල රජුගේ නියොවින් බ්‍රිතාන්‍ය වැසියන් වූ වෙළඳුන් කීපදෙනෙකුගේ අගපසඟ සිඳ දැමීමෙන් කරන ලද තිරශ්චීන පරිභව ක්‍රියාව, සිව් වැනිව :- උඩරැටියන්ට ඇහැළ පොළ නිලමේගේ පක්ෂවාදී ජනයා එහුබඳවා සීතාවක කඩ ඉම පසු කර එන්ට අවකාශදීම යන මේ ය.

මෙසේ යුද්ධ ප්‍රකාශ කළාට පසු පළමුවෙන්ම මේජර් හූක් නම් යුද්ධ මුලාදෑනී තැන යටතේ යුද්ධ කණ්ඩායමක් අවිස්සාවේල්ල පාරේ මහනුවර දෙසට ගමන් කෙළේ ය. ඇහැළ පොළේ නිලමේ ද මේ යුද්ධ කණ්ඩායම කැටුව ගියේ ය. මාර්ගයේ දී මොල්ලිගොඩ නිලමේ සම්මුඛ වී ඇහැළපොළ නිලමේ ගේ මෙහෙයීමෙන් ඔහු ඉංග්‍රීසි පක්ෂයට හරවා ගන්නා ලදී. වර්ෂ 1815 ක්වූ පෙබරවාරි මස 8 වෙනි දින මොල්ලිගොඩ නිලමේ ඔහුගේ පාලනය යටතේ තිබුණ සත්කෝරළය සහ එහි ලේඛනාදියත් ඩොයිල් මහතාට භාර දී ඉංග්‍රීසීන්ට යටත් වූයේ ය.

වර්ෂ 1815 ක් වූ පෙබරවාරි මස 14 වෙනි දින බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ ද්වීතිය යුද්ධ කණ්ඩායමත් සමග මහනුවරට ප්‍රවිෂ්ට විය. එවිට සිංහල රජු සහ සහ නුවර පදිංචිකාර සියලු දෙනාම වාගේත් නුවර අත්හැර පලා ගොස් තිබෙන බව දැනගන්ට ලැබුණේ ය. රජු අල්වා ගැනීම පිණිස හේවායන් සහ චර පුරුෂයන් 800 කින් යුත් කණ්ඩායමක් සර් ජෝන් ඩොයිල් මහතා යටතේ වහාම පිටත් කර යවන ලදී. හතර දවසකට පසු, එනම් පෙබරවාරි මස 18 වෙනිදින මැදමහනුවරට සැතැප්මක් පමණ දුරව පිහිටි බෝමුරේ නමැති ගමේ උඩුපිටියේ ගෙදර අප්පුරාළ ආරච්චිගේනිවසේ දී රජු සහ ඔහුගේ බිසෝවරු දෙදෙනෙකුත් සැඟවී ඉඳ අල්ලා ගන්නා ලද හ. රජු ඇල්ලීමට ගිය කණ්ඩායමේ ඉංග්‍රීසි යුද්ධ මුලා දෑනීන්ට භාෂාපරිවර්තනය පිණිස ඩී. වී. ඒ. දියෙස් නමැති පහතරට මුදලි කෙනෙක් ඒ සමග ගියේ ය. ඒ මුදලිතැනගේ ලියවිල්ලක රජු සිරභාරයට ගැනීමේ දී සිදුවන ඇසින් දුටු කරුණු රාශියක් සඳහන් කර තිබේ. එහි සංක්ෂේප අභිප්‍රාය මෙසේ යි:-

රජු ඇල්ලීමට ගිය 800 දෙනෙකුගේ යුත් කණ්ඩායම තෙල් දෙණියේ කූඩාරම් ගසා ප්‍රමාදව සිටින විට, එක්නැලිගොඩ දිසාවත් මමත් ශ්‍රීෂ්මය

---

මේ අප්පුරාළ ආරච්චිගේ මිමුනුබුරෙක්, එනම් ඔහුගේ දූවගේ මුනුබුරෙක් ඌරුගල සහ බෝමුරේ කොට්ඨාශයේ කෝරාළ පදවිය ඉතා මෑතවනතුරු දැරුවේය.

Non-Commercial Distribution

සංසිඳුවා ගැනීමට මද දුරක් එළිමහනේ ඇවිදින්ට ගියෙමු. මේ වේලාවේ දී සබරගමුවේ මිනිස්සු කීප දෙනෙක් ද අප පසු පස්සේ ගමන් කළෝ ය. අපි මදක්දුර ගමන් කරනවිට දොළොස් හවුරුද්දක් පමණ වයසැති කොලුවෙක් කුඹුරක් ඔස්සේ දුවනවා දුටුවෙමු. අපි ඌ පසුපස්සේ ලුහුබැඳ දිවන්ට වන් විට ඌ තැති ගෙන හාමුදුරුවනේ මා මරන්ට එපා, දේවයන් වහන්සේ සැඟවී ඉන්න තැන මම පෙන්වන්නෙමි යි කීවේ ය. එවිට එක්නැලි ගොඩ දිසාව වැල්පටකින් කොළුවාගේ ඉඟටිය බැඳගත්තේ ය. එහි සිට ටිකක් දුර ගමන් කළාට පසු කොළුවා නුග ගසකට අත දිගු කර ඒ ගස අද්දර තිබෙන ගෙදර දේවයන් වහන්සේ (එනම් රජ්ජුරුවෝ) ලැගුම් ගෙන සිටින බව කිව්වේ ය. අපි ඒ ස්ථානය දෙසට යන විට මෙහෙකරු ස්ත්‍රීන් දෙදෙනෙක් දොරක් තද කොට වසනවා දුටුයෙමු. තවද ලන්සයක් අතට ගත් මුරකාරයෙක් මිදුලේ රැකවල් ගෙන සිටියේ ය, මේ බැහැරකදැ යි ඔහු එක්නැලිගොඩගෙන් ඇසූ විට, අපිත් මෙහි ආවෙමු යි එක්නැලිගොඩ උත්තර දෙනවත් සමග ලංසය අමෝරා විරුද්ධකම් දක්වන ලීලාවක් හැඟවිය. එකෙණෙහිම එක්නැලිගොඩගේ මිනිස්සු ඔහුට කළා දුර්වල කොට අහකට ඇද දැම්මෝ ය. එක්නැලි ගොඩ දොරට තට්ටු කර දොර විවර කරන ලෙස රජ්ජුරුවන්ට විධාන කෙළේ ය. රජ තෙමේ එක් නැලිගොඩගේ බස සරු නොකරන බව ප්‍රකාශ කෙළේ ය. එසේ නම් ගේ ඇතුළේ තිබෙන සියලුම අවි ආයුධ පිටතට වීසිකරන ලෙස රජුගෙන් ඉල්ලන ලදී, එවිට රිදීවැඩ කරන ලද තුවක්කු තුණක් සහ කිරිච්චි දෙකකුත් කපොල්ලකින් එළියට වීසි කළේ ය. නුමුත් රජුගේ ස්වර්ණමය කඩුව විසී නොකරන ලදී. ඊට පසු මෝල්ගස් පහරින් දොර පලන ලදුව සපරගමුවේ මිනිස්සු පළමු කොට ගෙට ඇතුල් විය. ඔවුන් විසින් බිසෝවරුන් හැඳ පැළඳ සිටි ආභරණ සහ අගනා රෙදි සැට්ටත් ගලවා ගෙන යටරෙදි පිටින් එළියට ඇදගෙන ආවෝය. කුණ්ඩලාබරණ කඩා ගැනීමෙන් ඔවුන්ගෙන් කන්වැල් ඉරී ලේ ගලනවා මම දිටිමි. මවිසින් ඉඹුලන්වල ආරච්චි යවා බෙහෙත් කොළ වගයක් ගෙන්වා එය අඹරා ලේ ගලන තුවාල වල ගෑවෙමි. ඊට පසු එක්නැලිගොඩ ගේ ඇතුළට පැමිණ රජු එළියට අදිමින් එතුමාට ඉතා පරුෂ බසින් අපහාස කෙළේ ය. මූ ඌරෙකු මෙන් බැඳ ගෙන යායුතුය. කියා එක්නැලිගොඩ තම මිනිසුන්ට කිරිදිවැල් ගෙන ඊමට නියම කෙළේ ය. කලක් තුමන්ගේ රජව සිටි උතුමෙකුට මේ අන්දමින් නිග්‍රහ පරිභව බිණීම උචිත නොවන බැව් එක්නැලිගොඩට කතිපය වාරයක්ම කීවෙමි. හෙතෙමේ ඒ ගැන කිසිසේත් සැළකීමක් නොකළෙන් මේ කරන අපරාධය ගැන දන්ව සර් ජෝන් ඩොයිල් මහතාට මම ලියමනක් යැවීමි. නොබෝ වේලාවක දී හාර්ඩි සහ හුක් යන කර්නල්වරු දෙදෙන යටතේ

තෝල්ක කීම

Non-Commercial Distribution

ඉංග්‍රීසි හේවාකණ්ඩායමක් පැමිණියේ ය. කර්නල්වරු දෙදෙන අශ්වයන් පිටින් බැස තොප්පි ගලවා රජහට ආචාර කොට ඔහුගේ අත්පාවල බැඳුම් මිදෙව්වේ ය. ඊට පසු රජුට අපහස කළ සිංහල මිනිසුන් පලවාහැර, රජුටත් බිසෝවරුන්ටත් ධවල වස්ත්‍ර හඳවා, ඔවුන් දෝලාවලින් ඉතා ගෞරවාකාරයෙන් ඩොයිලි මහතාගේ කූඩාරමට ගෙන යන ලදී, එක්නැලිගොඩ දිසාව සහ ස්වකීය ප්‍රවෘත්තිය ඇතැම්හු විශ්වාස නොකෙරෙත්. එහෙත් එක්නැලිගොඩ දිසාවට සම්බන්ධතාවක් ඇත්තා වූ ද සපරගමු පළාත කලක් ආණ්ඩු කළා වූ රජු කෙරෙහි ඔවුන් තුල ස්වභාවයෙන් පවතින්ට ඇති උදාරතර ද එඩිතර වෛරය හේතු කොට ගෙන ඔව්හු රජුට ද වධ බන්ධන කරන්ට ඇතැයි විශ්වාස කිරීම උගහට නොවේ.

මේ කතීව්‍යයේ දී තුප්පහිකමේ යෙදී සිටි මුදලිතැනගේ යථොක්ත ප්‍රවෘත්තිය ලංකාවේ සිවිල් නිළධාරියෙක්ව සිටි ජේ. එච්. ඇප් හැමිල්ටන් මහතා විසින් වර්ෂ 1888 දී ලියන ලද ලියවිල්ලකින් උපුටා මෙහි පහත දක්වන කරුණු වලින් ස්ථිර වේ.

වර්ෂ 1815 දි ඉංග්‍රීසින් විසින් මහනුවර වැටලූ විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජ ගලේ නුවරට විත් සවස ඔහුගේ බිසෝවරු දෙදෙනකුත් සමග මැද මහනුවර කන්ද පහළ පිහිටි බෝමුරේ අප්පුරාළ ආරච්චි පදිංචි ස්ථානය වූ උඩු පිටියේ ගෙදරට පැමිණියේ ය. කන්ද පැත්තේ ගල් ලෙනක සැඟවෙන අදහසින් ඔහු එතැනින් පිටත්ව ගියේය, අන්ධ කාරය සහ අධික වර්ෂාවක් හේතු කොට ගෙන පාර සොයා ගත නොහි රජතෙම වික්ෂිප්ත සිතකින් යුක්තව ආපසු උඩුපිටියේ ගෙදරටම පෙරළා ආවේ ය. එදින රෑ එතුමා සහ බිසෝවරුත් ඒ ගෙදර නැවතුණේ ය. පසුදින අලුයම ඉංග්‍රීසීන්ගේ මිත්‍ර ජනප්‍රධානියෙක් වූ එක්නැලිගොඩගේ මග පෙන්වීමේ ආධාර ඇතුව යුද්ධකණ්ඩායමක් ඒ ගෙදරටවිත් රාජකීය තිදෙන අල්වා උන්වහන්සේලාගේ ආභාරණ පැහැර ගෙන එවුන් හිර භාරයේ මහනුවරට ගෙන ගියෝ ය. යනුයි.

සිංහල රජු අල්වා ගන්නා ලදැයි යන ප්‍රවෘත්තිය ලැබෙන විට බ්‍රවුන් රිග් උතුමාණන් වහන්සේ යුද්ධ මුළාදෑනින් ස්වල්ප දෙනෙකුත් සමග පෙබරවාරි මස 19 වෙනි දින රාත්‍රී භෝජනය අනුභව කරමින් සිටියේ ය. යථොක්ත ආරංචිය ලැබුණු කෙණෙහිම උතුමාණන් වහන්සේ මේසෙන් නැගිට සතුටු කඳුළු වගුරුවමින් එහි සිටි සියලු දෙනාට අතට අත දෙමින් යුරෝපීයජාතින් තුන් වර්ගයකට ශත වර්ෂතුනක් මුළුල්ලේ උත්සාහ කොටත් සාර්ථක කර ගත නොහැකි කෘත්‍යයක් අප විසින් අද ඉෂ්ට කර ගන්නා

Non-Commercial Distribution

ලද්දේ ය. ඒ සම්බන්ධව ආධාර කළ තමුන්නාසේලාට මාගේ අවංක ස්තුතිය ප්‍රදාන කරමැ යි කීවේය.

විජය රජුගේ සම්ප්‍රාප්තියේ පටන් අවුරුදු 2357 ක් වූ දීර්ඝ කාලයක් මුළුල්ලේ අවිච්ජින්නව පැවති ආ සිංහල කිරීටය සහ සිංහලයන්ගේ සෛවරී භාවයත් මේ දවසේ ලංකා භූමණ්ඩලයෙන් අභාවප්‍රාප්ත වූයේ ය යි නයිටන් නම් ඉතිහාසකරු කියා තිබේ.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හිරභාරයට ගත් පසු බලසම්පන්න ආරක්ෂාව හේවාකණ්ඩායමක් බාරයේ කොළඹට ගෙන යනලද්දේ ය. රජු සහ ඔහුගේ බිසෝවරු දෙදෙනාත් එකොළොස් මාසයක් පමණ කාලයක් කොළඹ කොටුවේ ගාලු දොරකඩ සමීපයෙහි සැප පහසු ඇති ගෘහයක සිරභාරයේ නවත්වා ගෙන සිට, පසුව ඔවුන් වර්ෂ 1816 ක් වූ ජනවාරි මස 24 වෙනි දින කෝර්න් වොලිස් නම්නැවෙන් මදුරාසියේ වෙප්ලෝර්හි දුර්ග ස්ථානයට පිටහල් කර යවන ලද්දෝ ය. ඒ නැවෙන් රජු සහ පවුල භාරේ ගමන් කළ සිවිල් නිලධාරියෙක් වූ විලියම් ග්‍රැන්විල් මහතාගේ ලියවිල්ලකින් පරිවර්තනය කොට මෙහි පහත සැකෙවින් සඳහන් කරනු ලබන ඇතැම් කරුණු වලින් රජුගේ චරිතය තරමක් දුර අවබෝධ කර ගත හැකි වේ.

## ග්‍රැන්විල් මහතාගේ ලියවිල්ලේ සාමාන්‍ය අදහස්.

සිංහල රජතුමා සමග මම නැවෙන් ගමන් කරද්දී එතුමා ප්‍රමුදිත කිරීම සඳහා දවසකට දෙතුන් විටක් එතුමා සමග අල්ලාප සල්ලාපයන්හි නියුක්තවීම මගේ සිරිතක් විය. දිනක් එබඳු ප්‍රස්තාවයක දී එතුමාට අයිති අගනා නිධන්ගත වස්තුවක් තිබෙන බව හා එම ධන සම්භාරය ඇහැළපොළ නිලමේට අයිතිවේ ය යන කණගාටුවක් එතුමාගේ සිත්හි තදින් ක්‍රියා කරන බවක් එතුමා මා සමග කීවේ ය. එම වස්තු සඟවා තිබෙන ස්ථානය මට කියතහොත් මදුරාසියට ගිය ඇසිල්ලේම ඒ ගැන බ්‍රවුන්රිග් උතුමාණන්ට දන්වා යවන බව කීවෙමි. ඊට රජතුමා ආකුල ලෙස පිළිතුරු දුන් සෙයින් එහි හරි අදහසක් තේරුම් ගැනීමට නොපොහොසත් විය. තෝල්කයන් කෙරෙහි එතුමාගේ සිතේ සැකයක් පවත්නා බැව් මට මනාකොට හැඟී ගියේය. මට මලබාර් භාෂාව පිළිබඳ ස්වල්පයකුදු දැනීමක් ඇතුව තිබුණා නම් තෝල්කානු සාරයක් නොමැතිව නොඅනුමාන ලෙස නිදන් වස්තුව පිළිබඳ විස්තර එතුමාගෙන් දැන ගන්ට හැකිව තිබුණේ ය. කිසිවෙක්

Non-Commercial Distribution

නොදත් එතුමාට අයිති නිධානයක් ලංකාවේ කවර ස්ථානයක නුමුත් තැන්පත් කර තිබීම සත්‍යයක් බැව් මට වැටහී ගියේ ය. එබන්දක් නොතිබුනා නම් එතුමා වැනි කෙනෙක් මෙබඳු ප්‍රස්තාවක දී කිසිසේත් බොරුවක් ගොතා නොකියන බව මට සත්තකය. මේ ගැන විස්තර දැන ගැනීමට තව දුරටත් උත්සාහ කළ නුමුත් රජතුමා දැක් වූ නිශ්ශබ්ද තාවය නිසා නුපුළුවන් විය.

රජතුමා ආගන්තුක සත්කාර කිරීමෙහි අභිලාෂයක් ඇති නිර්ලෝභිත්‍යාගිවන්ත උතුමෙක් බව මට එක් කාරණයකින් තදින් අවබෝධ විය. එක් දිනක් රජතුමා නැවේ මහතුන් කීප දෙනෙකුට රාත්‍රි කෑමක් දෙන්ට සතුටු බව ග්‍රැන්විල් මහතාට දැන්වීය. ඒ ගැන සතුටු බව දන්වන ලදුව රජතුමා ඒ ගැන නියම කළ දින උදය කාලයේ වෙනදා මෙන් නැවේ ඉහළ තට්ටුවට නොපැමිණියේ ය. එදින නොයෙක් කෑම වර්ග පිළියෙළ කිරීමට අරක්කැමියන්ට ගුරුකම් දෙමින් එතුමා පහළ තට්ටුවේ ඉතා උනන්දු ලෙස ව්‍යවෘතව සිටියේ ය. මේ භෝජන සංග්‍රහය ගැන එතුමා කෙතරම් සැලකිල්ලකින් හා සුහුසුළුභාවයෙන් ක්‍රියා කළේද යත් අමුතු විධියේ කෑම වර්ග සමහරක් එතුමා විසින්ම පිසනලදැයි අපට පසුව දැනගන්ට ලැබුණේ ය. මේ කෑම ජාති සෑදිමට සීනි, විනාකිරි, වෙඩරු ගම්මිරිස් ආදිය රාශියක් වියදම් වන ලදැයි ඇසීමි. භෝජන සංග්‍රහය පිළියෙළ කිරීමට ගත් පුදුම ද්‍රව්‍ය ගැන සහ සංග්‍රහකරුගේ ස්වභාවය පිළිබඳ අපට අසන්ට ලැබී තිබුණ භයානක ප්‍රවෘත්ති ගැනත් අපි කල්පනා කළ විට රජතුමාගේ භෝජන සංග්‍රහය පිළිගැනීම අනතුරුදායක දෝ හෝ යන සැක සහිත භයක් අප සිත් තුළ හටගත් බව කිය යුතු ය. එහෙත් නියම වේලාවට සිවැල් නෝනාද නැවේ මුලාදෑනී දෙදෙනෙක් ද ඕබ්‍රයින් මහතා සහ මමත් රජුගේ කෑම ශාලාවේ වාඩි ගතිමු. රජතුමාගේ මෙහෙකරන්නන් විසින් කෑම භාජන ගෙනෙන ලදී. එසේ ගෙනෙනු ලැබූ කෑම භාජන ඕබ්‍රයින් මහතාගේ වැඩකරුවෝ මේසය පිට තැබූවෝ ය. එක එක කෑම දීසිය ඊට නියම ස්ථානයෙහි තැබීම ගැන එතුමාගේ විශේෂ සැලකිල්ලක් ඇති විය. අප විසින් එක කෑම වර්ගයක් කා නිමවීමට පෙර අනික් කෑම වර්ගයක් අනුභව කිරීමට අපට සැලැස්වූයේය. එසේ කරන ලද්දේ රජතුමා විසින් පිළියෙළ කරවා තිබුන සියලුම කෑම වර්ග අපලවා භුක්ති වින්දවීමට එතුමා තුළ පැවති බලවත් ආශාව පෙරදැරිව බව තේරුම් ගතිමි. මේ අවස්ථාවේ දී දුන් අප්‍රමාණ කෑම වර්ග ඉතා පුදුම සහිත ය. කෑම දිසි මේසෙන් ඉවත් කළ පසු මගේ සිතේ බලවත් ප්‍රීතියක් හටගැනුණේ ය. නැවට ඊමට ප්‍රථම රජතුමා තමන් වහන්සේ ගේ ආහාර නිෂ්පාදනය පිණිස උවමනා ද්‍රව්‍ය සියල්ලක් රැස් කර ගෙනවිත් තිබෙන බව මට කල්පනා විය. භෝජනයෙන් පසු රජතුමා ශුභ ප්‍රාර්ථනා කොට අපි අපේ කාමර වලට ගියෙමු. පසුවදා

Non-Commercial Distribution

උදෑසන රජතුමා උඩ තට්ටුව පැමිණ එතුමාගේ රාත්‍රී භෝජනය ගැන අපේ කල්පනාව කෙසේදැයි මගෙන් විචාළේ ය. අපි සැවොම ඊට බෙහෙවින් ප්‍රසන්න වූ යෙමු යයි කිවෙමි. එහෙත් මීට පෙර නොකෑ විරූ අපථ්‍යාහාර ගැනීමෙන් ඇතැම් කෙනෙකුට අජීර්ණ රෝගය වැළඳීම නිසා අනුමානයක් නැතිව ඔවුන්ගේ කල්පනාව මගේ ප්‍රකාශයට ප්‍රතිවිරුද්ධව පවතින්ට ඇතැයි සිතමි. අපට කළ යථෝක්ත සංග්‍රහය කවදාවත් මතක නැති නොවන බැව් සැලකල විට රජතුමා මහත් සතුටු මුහුනක් දක්වා සිනහ පහළ කෙළේ ය.

තවත් දිනක් රජතුමා සමග කථා කරමින් සිටින විට ඉංග්‍රීසීන් සමග අන්තිම යුද්ධ ආරම්භ කිරීමට නොබෝ දිනකට පෙර පහතරට වෙළඳුන් සමහරෙකුගේ අත් කන්නාසාදිය සිඳුවා ඔවුන්ට හිංසා පීඩා කරවන ලද්දේ මන්දැයි මම එතුමාගෙන් ප්‍රශ්න කෙළෙමි. ඔවුන් ඔත්තු කාරයන් මෙන් උඩරටට පැමිණි හෙයින් සිංහල රාජ නීතියේ ප්‍රකාර ඔවුන්ට දඬුවම් පමුණු වන ලද්දේ යයි එතුමා උත්තර දුන්නේ ය. මීට පසු රජතුමා මේජර් ඩේවි මහතා ගැන කථාවක් ඉපදවිය. එතනදී මට කාරණයක් සිහි වී වටපොලුව ළඟ තොටුපල අසලදී මේජර් ඩේවි යටතේ නිරායුද්ධව සිටි භටයන් මැරීම යුතුදැයි මම රජුගෙන් ඇසීමි. එබසට එතුමා උත්තර දෙමින් මෙසේ කීවේ යඃ-

දුෂ්ට අමාත්‍යයන් නිසා අසාධාරණ කාරණ යුෂ්මතුන්ගේ රටවල පවාසිදු වන්නේ නොවේ ද? ඒ ගැන මම වරදකාරයෙක් නොවෙමි. පිළිමතලව්වේ මහ අදිකාරම ඒ සියල්ලක් කෙළේ ය. ඊට වගකිය යුත්තේ ඔහුම ය. ඒ ගැන මට දැනගන්ට ලැබුණේ සියල්ලක් අවශානවුනාට පසු බව සහතික ලෙස කියමි. මේජර් ඩේවිගේ ජීවිතය ආරක්ෂා කෙළේ අන් කිසිවෙක් නොව මම ය. මවිසින් ඔහුට කරන ලද සංග්‍රහයන්ගේ ප්‍රමාණය ඔහුගෙන්ම අසා දත හැකිවේ. ඔහුගේ සෙනග මගේ පස මිතුරෙක් වූ පිළිමතලව්වේට අසුචි මාපිට දෝෂාරෝපණය ඇති කරවීමට ඒ සාහසික අදිකාරම විසින් ඔව්හු මරවන ලද්දෝ ය. මෙම ඩේවි මහතාට ඉඳුම් හිටුම් සහ කෑම් පීම් ආදිය ඕනෑ තරම් දෙව් වෙමි. ඔහුට භාර්යාවක් තබාගන්ටත් මම අවකාශ දුනිමි. නීතියට අනුව ඊට වඩා ඔහුට කළ හැකි උපකාර මට නොතිබුණේ ය. උඩරට නීතිය මවිසින් සම්පාදනය කරන ලද්දක් ද? යනුයි. එක් ප්‍රස්තාවක දී මම රජු සමග ඇහැළපොළ නිලමේ සම්බන්ධ වැ කථා කෙළෙමි. ඔහු ගැන රජු මට මෙසේ කීවේ ය. ඉංග්‍රීසිහු ඔහු කෙරෙන් ප්‍රවේශම් නූනොත් ඔවුන් බලවත් අන්තරායට පත්වනු නොඅනුමාන ය. ඒ නිලමේ වනාහි ආකෘතඥ දුෂ්ට ස්වභාවයෙක පිහිටියෙක් ය. ඔහු



Non-Commercial Distribution

සිංහල නීතියේ අන්දමට දෙවරක් දඬුවම් ලැබීමට සුදුසුව සිටියේ ය. ඒ දෙවරම මම ඔහුට ක්ෂමාවීමි. අන්තිමේ දී කළගුණ නොදත් ගුණමකු ඒ පුරුෂයා පියෙකුමෙන් සිටි මට විරුද්ධව කැරළි ගැසුවේය කීය. ඊට පසු මම මොල්ලිගොඩ නිලමේ ගැන ද ප්‍රශ්න කෙළෙමි. ඒ නිලමේ ඉංග්‍රීසීන්ට පක්ෂව සිටිනවාට රජු අනුමාන නොකරන බව කීවේ ය. අන්තිම යුද්ධයේදී මොල්ලිගොඩ රජු අත්හැර ඉංග්‍රීසීන්ට එකතු වුණ බැව් කීවෙමි. ඊට රජ උත්තර දෙමින් මොල්ලිගොඩතුමාට ශක්තියක් ඇතුව සිටියා නම් මා අත් හැර යන්නේ නැත. ඉංග්‍රීසින්ට ඔහුගේ පක්ෂ වීම බැරිම තැන කරන ලද ක්‍රියාවක් ය, මොල්ලිගොඩ සංග්‍රාම සූරයෙක් 'නොවූවත් ඔහු යහපත් මිනිසෙකැ යි කීවේ ය. සිංහල රජතුමා අලංකාර ඇඳුම් පැළඳුම් ගැන ඉතා ප්‍රසන්න වූ රාජගෞරවය තදින් සලකන්නෙකි. එතුමා සමග විනාඩි පහක් ගත කළ කාටවුවත් එතුමා රාජාභිමාන සම්පන්න උතුමෙක් බැව් නිසැකින් හැඟේමය, ඉතා ඇඟපසකින් යුත් ශරීර ශෝභා සම්පන්න තේජවන්ත පුරුෂෝත්තමයෙකි. එතුමා කථා කරන විට ආඥා කරන ලීලාවෙන් ශබ්ද නගා කථා කිරීමට පුරුදුව සිටියේ ය. යනාදිය වේ.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා අවුරුදු දසසතක් පමණ කාලයක් මදුරාසි පළාතේ වෙල්ලෝර් නම් දූර්ග ස්ථානයේ සිරභාරයේ සිට, වර්ෂ 1832 ක් වූ ජනවාරි මස 30 වෙනි දින හවුරුදු දෙපණසක් ආයුවළදා ජන්මාන්තර ගත විය. ඔහු සිරභාරයේ සිටිය දී ඔහුට ඔහුගේ බිසෝ කෙනෙකුගෙන් පුත්‍රයෙක් උපන්නේ ය, [illegible] හතෙම බාලවියෙහි නැසී ගියේ ය. මේ රජු විසින් දුහිතෘ ස්ථානයෙහි [illegible] වැඩූ තැනැත්තියෙකුට පුත්‍රයෙක් සිටියි. සිංහාසනයෙන් පහ කරනු ලැබූ නම් රජහට එක විධියකින් මුනුබුරෙක් වන ඔහුට අලගිය මනවල සිංහල රජ යන අවිශ්‍රුත්‍ය ගෞරවාන්විත නාමයක් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ප්‍රදාන කොට තිබේ.

Non-Commercial Distribution

# මුළු සිංහල ද්වීපය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට සම්බන්ධ කිරීම.

සිංහල රජු සිරභාරයට ගෙන දොළොස් දිනක් ගත වුවාට පසු මහනුවර මගුල් මඩුවේ අත්‍යාලංකාරයෙන් යුත් රැස්වීමක් පවත්වන ලද්දේ ය. මේ සභා රැස්වීමේ දී එංගලන්තයේ මහරජතුමා වෙනුවෙන් ඉංග්‍රීසි උතුමාණන් වහන්සේ ද, හෙළිදිව් වැස්සන් වෙනුවෙන් සිංහල රදල වරුන් ද පෙනී සිටියේය. පළමු කොට ඉංග්‍රීසි උතුමාණන් වහන්සේ මගුල් මඩුවේ ඉහළ කොනේ පනවා තිබුණ ප්‍රධාන ආසනයේ වාඩි ගෙන සිටියේ ය. මාලිගාවේ රාජංගනය හාත්පස යුද්ධ හමුදාව රැකවල් ගෙන සිටියෝ ය. ඇහැළපොළ නිලමේ පළමුවෙන්ම හුදකලාව මගුල් මඩුවට ඇතුල් වූයේ ය. එවිට ඉංග්‍රීසි උතුමාණන් වහන්සේ ඒ මහාදිකාරම්තුමා ගෞරව පෙරටුව කරුණ මහිමතාවයෙන් පිළිගනු ලැබ උන්වහන්සේ ගේ දකුණු පාර්ශ්වයේ ආසනයෙක්හි වාඩි කරවා ගත්තේ ය. ඉන්පසු මොල්ලිගොඩ අදිකාරමතුමා ඒ ඒ පළාත්වල දිසාපතිවරුන් සහ අවශේෂ ප්‍රධාන රදලවරුන් පිරිවරා ගෙන එහි උපගත වූයේ ය. ඉක්බිති වගන්ති එකොළොසකින් යුත් ගිවිසුම් පත්‍රයක් සහකාර සෙක්‍රතාරිස් තැන විසින් ඉංග්‍රීසි භාෂාවෙන් කියවන ලද්දේ ය. එහි සිංහල පරිවර්තනය ආණ්ඩුවේ භාෂා පරිවර්තක මුදලි තැන විසින් ඊළඟට කියවන ලදී. මේ ගිවිසුම් පත්‍රයෙන් රටේ පැවති රාජනීතියටත් උඩරට සම්බුද්ධ ශාසනය (පරසමය වියවුල් වලින් තොරව) ආරක්ෂා කරන හැටියට ද බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් පොරොන්දුවන ලද්දේ ය. මගුල් මඩුවෙන් පිටත රැස්ව සිටි අවශේෂ සිංහල මුලාදෑනීන් සහිත පිරිසට නැවත වරක් යථෝක්ත ගිවිසුම් පත්‍රය සිංහලෙන් විස්තර වශයෙන් කියවා දුන් ඉක්බිති බ්‍රිතාන්‍ය කොඩිය ඔසවන ලද්දේ ය. මින් අනතුරුව එංගලන්තයේ තුන්වෙනි ජෝර්ජ් මහරජාණන් ක්‍රි. වර්ෂ 1815 වේ මාර්තු මස 2 වෙනි දින පටන් ලංකාද්වීපයේ රාජ්‍යශ්‍රීයට පත් වූ බව මහාජනයාට ප්‍රකාශ කිරීමේ ගෞරවොත්සවයක් වශයෙන් කාලතුවක්කු වෙඩි ශබ්ද නික්ම වන ලද්දේ ය.

තවද රාජ්‍ය රාජ්‍ය පරිපාලනය අරබයා උඩරට පළාත් ආණ්ඩු කිරීම පිණිස රැසිඩන්ට් නම් සභාපති කෙනෙක් ද, නීතිය සහ ආදායම් පාලනය සම්බන්ධවූ කොමසාරිස්වරු දෙදෙනෙක් යන ඉංග්‍රීසි මූළාදෑනි තිදෙනකුගෙන් යුත් ප්‍රධාන සභාවක් පත් කරන ලද්දේ ය. නඩු විසඳීම පිණිස අදිකාරම් වරුන්ගෙන් සහ ප්‍රධාන රදලවරුන්ගෙන් යුත් තවත් සභාවක් ද පත් කරන ලදී. ඔවුන්ගේ නඩු තීන්දු වෙනස් කිරීමේ බලය ආණ්ඩුකාරයාණන්ට පමණක් තබා ගන්නා ලද්දේ ය. ඌව, සපරගමුව,

Non-Commercial Distribution

තුන් කෝරළය යන පළාත් තුන පාලනය කිරිමට ඉංග්‍රීසි ඒජන්තවරු තිදෙනෙක් පත් කරනලද්දේ ය. භටයින් 1,700 කින් නොහොත් 1,800 කින් යුත් යුද්ධ හමුදාවක් අභ්‍යන්තර පළාත්වල ස්ථාන එකොළොසක කණ්ඩායම් වශයෙන් රටේ සමාදාන ආරක්ෂාව පිණිස නැවැත්වීමට ද සම්මත කරන ලදී. ඇහැළ පොළ නිලමේට පළමුවෙනි අදිකාරම් ධූරය ප්‍රදානයට කැමති වූ නුමුත් ඔහු ප්‍රතික්ෂේප කෙළේය. ලංකා සිංහාසනය අත් පත් කර ගැනීමට ප්‍රලෝභිව සිටි ඔහුගේ ප්‍රයත්නය ශූන්‍ය වී ගිය බව දුටු ඔහු බ්‍රිතාන්‍යවරුන්ගේ හිතෛෂීය යන්න පමණක් කියවා ගැනීමට තමාගේ ප්‍රසන්නය බව කීවේ ය. මේ නිසා පළමුවෙනි අදිකාරම් ධූරයට මොල්ලිගොඩ නිලමේ ද, දෙවෙනි අදිකාරම් තනතුරට කපුවත්තේ නිලමේද පත් කරනලදී.

උඩරට පළාත් ඉංග්‍රීසි ආණ්ඩුවට හිමි වී දෑවුරුදු සමසක් පමණ කාලයක් අතික්‍රාන්ත වනතුරු රටේ සමාදාන නිශ්චල භාවයෙහි පිහිටියේ ය. නුමුත් වර්ෂ 1817 තේ ඔක්තෝබර් මාසයේ දී උඩරට පළාත්වල අතිශයින් බියකරු කැරැල්ලක් හට ගත්තේ ය. එය මර්දනය කිරීමට ඉංග්‍රීසි ආණ්ඩුවේ මුළු ශක්තියම අනේක විධ ව්‍යසනයන්ට භාජනව දරන්ට සිදු විය. කැරැල්ල පළමුවෙන්ම හටගත්තේ වැදිපත්තුවට ආසන්න වෙල්ලස්ස පළාතේ ය. එය හටගැනීමට මුල් හේතුව සිංහල රදලවරු විසින් අඛණ්ඩව කර ගෙන එන ලද රාජකාරියක මුළාදෑනි තනතුරුට මරක්කල මිනිසෙක් පත් කිරීම වේ.

මේ අතර උඩරට ඔටුන්නට අයිතිවාසිකම් කියන්නෙක් මහණුන් අට දෙදෙනකුත් පිරිවරා ගෙන වෙල්ලස්සේ වන ප්‍රදේශක හැසිරෙන බව බදුල්ලේ උප රැසිඩන්ට් තැන වූ විල්සන් මහතාට දැනගන්ට ලැබුණේ ය. සැක කටයුතු වූ ඒ පුද්ගලයා සහ ඔහුගේ සහචරයිනුත් අල්වා ගෙනෙනු පිණිස විල්සන් මහතා වර්ෂ 1817 තේ ඔක්තෝබර් මස 14 වෙනි දින ජාහේවා කණ්ඩායමක් කැටුව වෙල්ලස්ස පළාතට පිටත්ව ගියේ ය. මේ ගමනේ දී කැලෑවේ සැඟවී උන් සිංහල මිනිසෙකු විසින් යවන ලද ඊතල පහරක් වැදීමෙන් විල්සන් මහතා මැරී වැටුණේ ය. එවිට හාත්පස කඳු උඩ රැස්ව සිටි සිංහල මිනිස්සු සරදම් වශයෙන් මහ කුළුගෙරියා මළා යයි කියමින් කෑගසන්ට වන්නෝ ය. මින් පසු කැරැල්ල සංසිඳවීම පිණිස කැප්පෙටිය පොළ නිලමේ වෙල්ලස්සට පිටත් කර යවන ලදි. ඔහු එහි ගොස් කැරැල්ල මැඩ පවත්වනවා වෙනුවට කැරළිකාරයන්ගේ පක්ෂයට එකතු උණේ ය. නුමුත් ඔහු තමාගේ ඍජු ගුණය දක්වනු පිණිස අභිමානයෙන් ආණ්ඩුවේ ගබඩා වලින් රැගෙන ගිය තුවක්කු වෙඩි බෙහෙත් සහ උණ්ඩ ආදියත් ඩොයිල් මහතාට ආපසු එවීය.

Non-Commercial Distribution

තත්හි තත්හී පවතින නානා ප්‍රකාර කැරළි කෝලාහල මැඩ පැවැත්විමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් යොදන ලද බලවත් පරිශ්‍රමයන් සියල්ල නිෂ්ඵල වී, පළමුවෙන් පටන් ගත් සුළු කැරැල්ල ක්‍රමයෙන් වැසියන් විසින් ස්වාධිපත්‍යය පතමින් කරන්නා වූ සංග්‍රාමයකට පෙරළි ගියේ ය. මේ හේතු කොට ගෙන වර්ෂ 1818 ක් වූ පෙබරවාරි මස 21 වෙනි දින උඩරට සියලු පළාත්ම මාර්ෂල් ලෝ නම් යුද්ධ නීතියට යටත් කරන ලද්දෝ ය. එසේ ද වුවත් මාර්තු මස හරියේ දී සපරගමුවේ පහළ කොට්ඨාශය ද, තුන් කෝරළය සහ හතර කෝරළේ ද, උඩු නුවර සහ යටි නුවර ද හැර අනිකුදු සියලුම උඩරට පළාත් වල වැස්සෝ යුද්ධයට සැරසුණෝ ය. මොල්ලිගොඩ අදිකාරම හැර, කැරැල්ලට සම්බන්ධයක් නැති අනිකුත් රදලවරු සියල්ලෝම ශංකා කරනු ලැබ ඉංග්‍රීසීන් විසින් සිරභාරයට ගනු ලැබූහ.

වර්ෂ 1818 රේ මාර්තු මස 2 වෙනි දින බ්‍රිතාන්‍ය ආණ්ඩුවට විරුද්ධව ක්‍රියා කිරීමට වැසියන්ට රහසිගතව අනුබල දෙන්නේ යයි සැක කොට ඇහැළ පොළ නිලමේ අල්වා සිරභාරයේ කොළඹට ගෙනෙන ලද්දේ ය. ඔහු සත්වසක් කොළඹ නවත්වා ගනු ලැබ සිටියේය. වර්ෂ 1825 හේ දී ඔහුගේ ද්‍රෝහිභාවය පිළිබඳ කිසි විභාගයක් නොකරම, මොරීෂස් නම් දිවයිනට පිටිවහල් කර යවන ලද්දේ ය. හෙතෙම එම දිවයිනේ සතර අවුරුද්දක් සිරකරුවෙක් මෙන් සිට, වර්ෂ 1829 ක්වූ අප්‍රියෙල් මාසේදී ජන්මාන්තර ගත විය.

මැයි, ජූනි, ජූලි යන මාස වලදී යුද්ධය ඉතා බිහිසුණු ලෙස කෙරී ගෙන ගිය බැවින් කොයි පක්ෂයට ජය අත්වේ ද යනු අනුමාන සහිතව පැවතුණේ ය. ඉංග්‍රීසීහු මේ කාලයේ දී ස්වකීය යුද්ධ හමුදාවල් උඩරටින් අහක්කර ගෙන යාමට සුදුසු විධි විධාන සීඝ්‍රව ආරම්භ කළෝ ය. තුන් කෝරලේ සහ හතර කෝරළේත් වැසියෝ කොයි වේලාවක නුමුත් එකතු වෙත්ය යන සංවේගයක් ඉංග්‍රීසීන් ගේ සිත්හී බලවත්ව පැවතුණ. ඒ මක්නිසාද යතහොත් යථෝක්ත කෝරළබද වාසීන්ගේ විරුද්ධත්වයක් ඇතිවුනි නම්,, උඩරට වසන ඉංග්‍රීසීන්ගේ කොළඹ හා ඇති සම්බන්ධතාවය නැතිවීයා හැකි බැවිනි.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ නෑකෙනෙකැයි කියා වෙල්ලස්සේ පදිංචිකාරයන් විසින් කෝළහලය පටන් ගැන්මේ දී ඔටුන්න හිමි කාරයා කොට පිළිගනු ලැබූ දොරේසාමි නම් ව්‍යාජ රජුගේ පළමුවෙනි අදිකාරම් ධූරයට කැප්පෙටි පොළ නිලමේ සහ දෙවෙනි අදිකාරම් ධූරයට මඩුල්ලේ නිලමේත් පත්ව සිටියෝ ය. මඳ කලකට පසු දොරේ සාමි නමැත්තා රජ පවුලේ කෙනෙක් නොව, විල්බෑව නම් ගමේ අඩු කුලයකට අයිති සිරළුවෙක්

Non-Commercial Distribution

යයි මඩුගල්ලේ නිලමේට ද වෙනත් රදලවරුන්ටද දැන ගන්ට ලැබුණේ ය. තමාගේ සැබෑ තත්වය එළිදරව් වී තිබෙන බැව් දැන දොරසාමි හෙවත් විල්බෑව රහසින් සැඟවී ගොස් කලක් බිම් තැන්නේ වන ප්‍රදේශ වල වාසය කෙළේය. වර්ෂ 1829 යේ දී ඔහු අල්වා ගනු ලැබ, නඩු අසා මරණයට නියම කරන ලදී, එහෙත් ඔහු එංගලන්තයේ මහරජතුමාගෙන් සමාව ලැබ, ජීවිතාන්තය දක්වා ගල්කිස්ස යන ගමේ නිවසීය. සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාස වල කැරළි කෝළාහල බෙහෙවින් මැඩ පැවතෙන්නට වන. එහෙත් අවුරුද්දක් පමණ කාලයක් පැවතුණ මේ සටන් වලින් දෙපක්ෂයටම සිදු වන අලාභ හානි මෙතෙකැයි කිව නොහේ. මෙය යුද්ධයක් නොව කොල්ලකෑමක් යයි එක් අතකින් කිය යුතුවේ. හේ යුද්ධයේ දී මඩකලපුවෙන්ද, මහනුවරින් ද, වෙල්ලස්සට පිටත්ව ගිය යුද්ධ කණ්ඩායම් කීපයක්ම මාර්ගයේ දී සිංහල මිනිසුන්ගේ ගෙවලට වැද, වස්තුව පැහැර ගෙන ගෙවල් ගිනි තබා ගිය බවට සාක්ෂි තිබේ. දහස් ගණන් සිංහල ස්ත්‍රීන් සහ ළදරුවෝත් තම තමන්ගේ වාස ස්ථාන දවන ගිනිමැල බල බලා විලාප බෙණෙමින් කඳු උඩ උන් බවට සහ ඔවුන්ගේ සාරවත් කෙත්වතු මුළු වර්ෂයක්ම පාළුවෙන්ට හැර ඔවුන් සාපිපාසායෙන් පීඩිතව සිටි බවටත්, මේ යුද්ධයෙහි නියුක්තව සිටි ඉංග්‍රීසි යුද්ධ මුළාදෑනියෙකුගේ සාක්ෂියක් ඉතිහාසයෙහි අන්තර්ගත වීමෙන් ප්‍රත්‍යක්ෂ වේ අනිත් අතට මේ අවාසනාවන්ත සංග්‍රාමය හේතු කොට ගෙන ඉංග්‍රීසීන්ට පැමිණෙන ලද අලාභ හානිද අප්‍රමාණ වන්නේ ය. ආහාර දුර්ලභත්වයෙන් ද පින්නට සහ වැස්සටත් අසුවීමෙන් ද බොහෝ ඉංග්‍රීසින් හේවායෝ අනේක අයුරු ව්‍යසන ප්‍රාප්ත වූ බවද සඳහන් වේ. සටන් වලදී සිංහලයන් විසින් මරන ලද ඉංග්‍රීසි හේවායන්ගේ ගණන අහක තිබියදී ආබාධිතවීමෙන් දෙසියකට අඩු නොවන ගණනක් මරුමුවට පත්වී තිබේ. සිංහල සෙන් අතුරෙන් මේ සටන් නිසා මිය ගිය සංඛ්‍යාව 10,000කට අඩු නොවේ යයි කියත්,

ජූලි අගෝස්තු මාස වලදී ඇල්ළේ පොළ නිලමේ සහිත මූලික කැරළිකාරවන් කීප දෙනෙක් අල්වා ගන්නා ලදුව කෝරට් මාර්ෂල් නම් සංග්‍රාමික නීතියේ ප්‍රකාර නඩු විභාග කොට ඇල්ළේ පොල නිලමේ පළමුවෙන් එල්ලා දමනු ලබන්ට නියම කළ නුමුත් පසුව එම තීන්දුව වෙනස් කොට ඔහුගේ හිස ගහදමන ලදී. හේතෙම ඉතා නිර්භීත ලෙස මරණයට මූණ පෑ බවද කියා තිබේ. ඔහු ජීවිතක්ෂයට පැමිණ වූවා. ඉක්බිති උහුගේ මෘත දේහය සිවල් සුනඛාදීන්ගේ ගෝචර භූමියක ලවන්ට

---

මේ *තෙමේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ද්‍රොහමාත්‍යව සිටි ශීර්ෂච්ඡේදනයට පත් පිළිම තලවුවේ මහනිලමේගේ පුත්‍රයාය.

Non-Commercial Distribution

ඉල්ලා ඔහුගේ අයදීමක්ව තිබුණේ නුමුදු එම මළ සිරුර ආණ්ඩුව විසින් භූමි ස්ථාපනය කරන ලදී, ඔක්තෝබර් මස 30 වෙනි දින කැප්පෙට්ටි ලබනවා වෙනුවට, ඒ ඒ තනතුරු වලට ඔවුන් ආණ්ඩුව විසින්ම පත්කරනු ලැබීමට නියම කරන ලදී. ගොවියන්ගෙන් රාජකාරිය ගැනීම තහනම් කොට ඒ වෙනුවට ගොවි තැනෙන් දහයෙක් කොටසක් අය කිරීමටආඥාවක් පණවනු ලැබීය. දැනට අවුරුදු කීපයකට ප්‍රථම අවලංගු කරන ලද මඩරන් බද්ධ ක්‍රියා කිරීමට පැමිණියේ යථොක්ත ආඥාව කොට ගෙන බ්‍රවුරන් රිග් උතුමාණන් වහන්සේගේ කාලයේ දී යයි සිතිය යුතු ය.

බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ දේශපාලන නීත්‍යානුකූලව බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමට ගිවිසුමෙන් කැමැත්ත දුන් නුමුත්, ජ්වලිත ක්‍රිස්තු භක්තිකයෙක්ව සිටි බව පෙනේ. එතුමාගේ ප්‍රතිෂ්ඨාධාරය ඇතිව පළමුවෙනි සහකාරික බයිබල් සමාගම කොළඹ පිහිටු වන ලද්දේ ය. වර්ෂ 1812 දී ද, වැස්ලියන් සමාගම වර්ෂ 1814 දී ද චර්ච් මිෂන් සමාගම වර්ෂ 1818 දී ද මෙම උතුමාණන්ගේ ආණ්ඩු සමයේ දී ලංකාවේ පිහිටුවනු ලැබූහ.

# සර්. ඇඩ්වර්ඩ් බාර්න්ස් උතුමාණන් වහන්සේගේ ප්‍රථම ආණ්ඩු කාලය ක්‍රි. ව. 1820-1822

බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේගෙන් පසු ලැප්ටිනන්ට් ජනරල් සර්. ඇඩ්වර්ට් බාර්න්ස් උතුමාණන් වහන්සේ වර්ෂ 1820 ක් වූ පෙබරවාරි මස 1 වෙනි දින උප ආණ්ඩුව භාර ගත්තේ ය. මෙතුමා නැපෝලියන් බොනපාර්ට් නම් රාජාධිරාජෝත්තමයාණන් අභිභවනය කළ වෝටර්ලූ යුද්ධයේ දී ලෝක ප්‍රසිද්ධ යුද්ධ සේනාධිපතියෙක්වූ වැල්න්ටන් ඩියුක්තුමා ගේ ඇඩ්ජුටන්ට් ජනරල් තැන මෙන් ක්‍රියා කළ කීර්තිමත් යුද්ධ දක්ෂයෙකි. මෙතුමා දෙවසක් පමණ කාලයක් අභිවෘද්ධිය දායක ලෙස ලංකාණ්ඩුව කරනු සමයෙහි ඉන්දියාවේ ශ්‍රේෂ්ඨ යුද්ධ සේනාපති ධූරයට පත් කරනු ලැබ, වර්ෂ 1822 ක් වූ පෙබරවාරි මස 2 වෙනි දින ලංකාව අත් හැර ගියේ ය.

Non-Commercial Distribution

# සර්. ඇඩ්වර්ඩ් පේජට් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය

## ක්‍රි. ව. 1822-1823

වර්ෂ 1822 ක් වූ පෙබරවාරි මස 2 වෙනි දින සර්. ඇඩ්විඩ් පේජට් උතුමාණන් වහන්සේ වැඩ බලන ආණ්ඩුකාර ධූරයට පත්විය. මේ ආණ්ඩු කාලයේ දී තවත් වන්දනාකාරයෙක් සිංහල රාජ වංශිකයෙකැයි කියමින් මහනුවර රජකම ලබා ගැනීමේ අදහසින් නුවර කලාපිය පළාතේ කැරැල්ලක උපදවන්ට යත්න කෙළේ ය. ඒ බව ඉංග්‍රීසි ආණ්ඩුවට සැළ වී කර්නල් ප්‍රේසර් යටතේ යුද්ධ හමුදාවක් යවා ඔහුගේ සහචරයිනුත් සමග අනුරාධපුරය අසලදී අල්වා සිර භාරයට ගනු ලැබූහ. රජකම ප්‍රර්ථනා කළ ඒ අහංකාර පුරුෂයට පරිභව දණ්ඩනයක් වශයෙන් මහනුවර වීථි ඇමදීමෙහි යොදවන ලද්දේ ය, ඉන්දියාවේ ශ්‍රේෂ්ඨ යුද්ධ සේනාපති ධූරයට ලංකාවේ සිට පත්ව ගිය සර්. ඇඩ්වර්ඩ් බාරන්ස් උතුමා සහ ඉන්දියාවේ අග්‍ර ආණ්ඩුකාරතුමා අතරේත් යම්කිසි කරුණක් අරබයා මත භේදයක් ඇති විය. එම නිසා බාර්න්ස්තුමා සිය ධූරයෙන් අස්ව යන්ටගිය බැවින්, එම ධූරයට ලංකාණ්ඩුකාර පේජට් උතුමාණන් වහන්සේ පත් කරනු ලැබීය. එතුමා ලංකාව ආණ්ඩු කළ කාලය දස මසක් පමණ ය.

# සර්. ජේම්ස් කැමල් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය

## ක්‍රි. ව. 1823-1824

සර්. ජේම්ස් කැමල්තුමා ලංකාවේ උපාණ්ඩුකාර ධූරය ලැබ වර්ෂ 1823 තේ දී මෙහි පැමිණියේ ය. මේ ආණ්ඩු කාලයේ දී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නායක විනිශ්චයකාර ධූරය සර් හාර්ඩින් ගිපර්ඩ්තුමා ද, ආණ්ඩුවේ අද්වකාත් පිස්කල් ධූරය මැතිවුස් මහතා ද දැරූවෝය. මෙසමයේ දී නීතියක් සම්බන්ධ පුදුම ප්‍රශ්නයක් ඉදිරිපත් වීමෙන් යටකී නීතිවේදීන් දෙදෙන අතර අරගලයක් හටගත්තේ ය. හේ සැකෙවින් මෙසේ යිඃ- ඉන්දියාවේ යුද්ධ හමුදාවෙන් සැඟ වී ආ හේවායෙකැයි සැක කරනු ලැබූ අයෙක් කොළඹ යුද්ධ මුළාදෑනීන් විසින් අල්වා නවතා ගනු ලැබූ ය. නතර කර ගත් ඒ අය ඉදිරියට ගෙනෙනු පිණිස සුප්‍රීම් උසාවිය විසින් යුද්ධ

Non-Commercial Distribution

දෙපාර්තමේන්තුවට හේබියස් කෝර්පස් නමැති වරෙන්තුවක් නිකුත් කර යවන ලදී, යුද්ධ දෙපාර්තමේන්තුව ඊට විරුද්ධව කාරණා දක්වීම පිණිස කල් ලබා ගත්තේ ය. ඒ අතරතුර, කවරෙක් උවත් නතර කර ගැනීමට ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේට බලය ඇතිවන අන්දමට සහ එම බලයට උසාවි වල බලය යටත් බවටත්, වර්ෂ 1824 රේ අංග 1 දරණ ආඥා පණත පණවන ලද්දේ ය. මේ අභිනව ආඥා පණත ගැන නොසතුටු වූ නායක විනිශ්චයකාරතුමා, ආණ්ඩුවේ අද්වකාත් තැන වූ මැතිව්ස් මහතාට තර්ජනය කරමින්, ඔබඳු හිතුවක්කාර ක්‍රියාවකට මැදහත්වීමෙන් තමාගේ සයනය පිණිස කටු ඇතුළ්ලූ ඇඳක් තමා විසින්ම සදා ගන්නා ලද්දේ වේ දැයි කීවේ ය. මෙසේ ප්‍රකාශ කරන ලද්දේ මැතිව්ස් මහතා එසේ පත්විමට කලින් නැසී ගියේය. ආණ්ඩුකාර තැනට සීමා රහිත බලයක් තබා පණවන ලද ඉහත කී ව්‍යවස්ථාව, වර්ෂ 1830 හේ නොවැම්බර් මස පළමුවෙනි දින රාජ මන්ත්‍රණ සභාවේ නියෝගයකින් අවලංගු කරන ලදී.

# සර්. ඇඩ්වර්ඩ් බාර්න්ස්තුමාගේ
# ද්විතීය ආණ්ඩු කාලය
# ක්‍රි. ව. 1821-1831

වර්ෂ 1824 ක් වූ ජනවාරි මස 18 වෙනි දින ජනරල් සර් ඇඩ්වර්ඩ් බාර්න්ස් උතුමාණන් වහන්සේ විසින් යුද්ධාධිකරණයෙහි ශ්‍රේෂ්ඨ බලයත් ඇතුව ලංකාද්වීපයේ ආණ්ඩුකාර ධූරය දෙවෙනි වරට භාර ගන්නා ලදී. මෙතුමා ස්වකීය මුළු ආණ්ඩු කාලය මුළුල්ලෙහි තමන්ගේ ඥාන ශක්තියත් ධනයත් බලයත් යන ත්‍රිවිධ ගුණාංගයන්ම ලංකාවාසීන් ගේ සුභ සිද්ධිය සඳහා ගත කෙළේ ය. රටක අභිවෘද්ධිය එහි මංමාවත් උඩ රඳා තිබේ ය යන කියමන බාර්න්ස් උතුමාණන් වහන්සේ තදින් විශ්වාස කළ කෙනෙකි. ඒ විශ්වාසය අනුව ගමන් කරමින් එතුමාගේ ආණ්ඩු කාලයේ දී ලංකාද්වීපයේ ප්‍රසිද්ධ පාරවල් විවෘත කිරීමෙන් එතුමා විසින් මේ දිවයිනට ඉෂ්ට කර දෙන ලද සුබ සිද්ධිය මෙතෙකැයි ප්‍රමාණ කළ නොහේ. වර්ෂ 1796 යේ දී ලංකාවට ඉංග්‍රීසීන්ගේ සම්ප්‍රාප්තිය වන කල රථ වාහනාදිය බාධා රහිතව ගමනාගමනයට යෝග්‍ය වූ පාරවල් ඉතා ස්වල්පයක් විය. බාර්න්ස් ආණ්ඩුකාරතුමා ලංකා ආණ්ඩුව භාර ගැනීමට පෙර, කොළඹ සිට මහ නුවරට යන්ට හැකිව තිබුණේ හන්වැල්ල, අවිස්සාවේල්ල, අඹ ගමුව සහ

Non-Commercial Distribution

ගම්පළ හරහා දුරස්තර වටකුරු මාර්ගයකින් ය, ප්‍රතිකාලුන්ට සහ ලංදේසීන්ටත් ශත වර්ෂ තුනක් මුළුල්ලේ අපමණ උත්සාහ කොටත් උඩරට පළාත් අල්වා ගන්ට නොපොහොසත් වූයේ නිරායාසයෙන් එහි පැමිණීමට සුදුසු පාරක් නොතිබුණ බැවිනි. එමෙන්ම එබඳු පාරක් තිබුණේ නම් මේ කථාන්තරයේ ඉහත විස්තර වී තිබෙන පරිදි අල්වා ගැනීමට ගිය සංග්‍රාමික ගමන් වලදී ඉංග්‍රීසීන්ටත් ඔවුන් විසින් විඳින ලද අනේක විධ ගැහැට සහ පීඩාදියෙනුත් ගැලවී ගත හැකිව තිබුණේ ය. මේ දිවයිනේ උඩ පහත දෙරට සුරක්ෂිත ලෙස සම්බන්ධ කිරීමේ ආවශ්‍ය කතාව පිරිමසාලීමට පිණිස කුරුණෑගල සහ ගල ගෙදර හර , කඩු ගන්නාවේ විස්ම ජනක ශිලාමය පර්වත මස්තකයෙන් ද මහනුවර පැමිණීමට ප්‍රසිද්ධ පාරවල් දෙකක් බාර්න්ස් උතුමාණන් වහන්සේ විසින් තැනීමෙන් මහජන සංග්‍රහයක් කරන ලද්දේය. මේ පාරවල් විවෘත කිරීමෙන් කලහ කාර රට ජන ප්‍රධානීන්ගේ අයුතු බල උඩ මර්දනයවූවාක් මෙන්ම එය රටේ වෙළහෙළදාම් සහ වැවිලි කර්මාන්තාදිය දියුණුවීමට අසහාය ප්‍රපීෂ්ඨාධාරයක්ද වූහ. දහනව වෙනි ශත වර්ෂයේ මුලභාගයේ ද මෙම කර්මාන්ත පුදුම ඥාන ශක්තියකින් නිර්මාණය කර තිබෙන බැව් පෙණෙන්නට තිබේ. මේ පාරවල් දැමීමේ ඉංජිනේරු තැන වූ ඩෝසන් මහතාගේ ප්‍රතිමාරූපය කඩුගන්නාවේ කන්ද මුදුනේද, එහි කර්තෘ භූත බාර්න්ස් උතුමාණන් වහන්සේ ගේ ප්‍රතිමා රූපය කොළඹ රාජමන්දිරය ඉදිරිපිට ද කෘතඥතානුසමරණය කිරීමේ ගෞරවයක් වශයෙන් පිහිටුවා තිබේ. අද දවසේ සෑම ප්‍රධාන නගර වලට යා හැකි ප්‍රසිද්ධ කරන පාරවල් සියල්ලක්ම වාගේ මේ උතුමාණන් වහන්සේ විසින් සාදවන ලද ඒවා බව සිහිකටයුතු කාරණයකි. තවද කොළඹ සමීපයේ නාගුළුගන්තොට කැලණිගඟ හරහා පාරු පාලමක් ද, මහ නුවර සමීපයේ පේරාදෙණියේ මහවැලි ගඟ හරහා මාහැඟි බුරුතලී පාලමක් ද මෙතුමාණන් විසින් සාදවන ලදී, එසේම මෙතුමා විසින් මහනුවර සාදවන ලද පැවිලියන් නම් රාජමන්දිරයෙහි ජ්ලෑන හෙවත් සටහන දිනක් මෙතුමා රාත්‍රී භෝජනය අනුභව කරමින් සිටින කල ක්ලැරට් නමැති බීම වර්ගයෙන් මෙසේ මතුපිට ඇන්දේයයි කථා ප්‍රවෘත්තියක් පවතියි.

දැනට හෝටලයක් මෙන් ව්‍යවහාර කරන ගල්කිස්සේ බන්ගලාව උෂ්ණ කාලවලදී මෙතුමාගේ වාසභවනය පිණිස මෙතුමා විසින්ම සාදවන ලද්දකි. මෙතුමාගේ ප්‍රිය භාර්යාව වූ ලැවීනියා ආර්යාවගේ නාමව සිහිපත්වීම වශයෙන් අද දක්වා මේ ප්‍රදේශයට මවුන්ට් ලැවීනියා යන නාමය ව්‍යවහාර කෙරෙත්. මේ ආණ්ඩු කාලයේ දී රාජකාරිය පිණිස මංමාවත් ආදිය සෑදවීමේ වැඩ, බොහෝ කොට බලාත්කාරයෙන් මෙහෙ ගැනීමෙන් සිද්ධ කරන ලද්දේ ය. එංගලන්තයේ නෝර්මන් රජවරුන්ගේ කාලයේ පැවතී පියුඩල් සිස්ටම් නම් සේවක මෙහෙයට සමාන රූප වූ මේ රාජකාරිය නමැති

Non-Commercial Distribution

සිංහල නීතිය මීළඟ ආණ්ඩුවේ දී ලැප්ටිනන්ට් කරන්ල් කොල් බෲත් සහ සී. එච්. කැමරන් යන මහතුන්ගෙන් යුත් රාජකීය කොමිෂන් සභාවක රෙකම දාරුවක් පිට අවලංගු කරන ලදි. සිංහල රාජනීතියේ අන්දමට මරණීය දඬුවමට පත් කරනු ලබන ස්ත්‍රීන් දියේ ගල්වා මැරීම මේ තාක් සිරිත විය. එහෙත් මේ ආණ්ඩු කාළයේ දී, එනම් වර්ෂ 1826 යේ දී ඒ නීතිය ද අවලංගු කරන ලදී. නුවර එළිය සෞඛ්‍යා රක්ෂක ස්ථානයක් වශයෙන් නියමකර ගන්නා ලද්දේත් බාරන්ස් උතුමාණන් ගේ ආණ්ඩු කාලයේ දී කලකට ප්‍රථම ලංකාවේ සමෘද්ධිමත් භාවය සම්පූර්ණයෙන් රඳා තිබූ කෝපි වැවිලි කර්මාන්තයේ පළමුවෙනි කෝපි ගස මේ උතුමාණන් වහන්සේ විසින් නුවර එළියේ පිහිටි බාර්න්ස් හෝල් නම් නිවසට අයත් භූමි භාගයේ රෝපණය කරන ලදී. දැනට පවත්නා කොළඹ අසරණ සරණ සමාගම මෙතුමාගේ අණ්ඩු කාලයේ දී ටිනර් බිෂෝප්ස්වාමීන් ද ලංකාවට පැමිණ උන්වහන්සේගේ ලියවිලි වල බාර්න්ස් උතුමාණන් වහන්සේ ගේ ආණ්ඩු ක්‍රමයේ පරාර්ථකාමී ස්වභාය ගැන කරුණු සඳහන් කර තිබේ. වර්ස 1824 රේදී පළමුවෙනි වරට මේ උතුමාණන් වහන්සේ විසින් ලංකාවේ විසූ පදිංචිකාරයන්ගේ සංඛ්‍යාව සටහන් කර තබන ලදී. ඒ ජන ලේඛනයේ ප්‍රකාර එවකට විසූ ලංකාවේ වැසියන්ගේ ගණන 8,51,440 විය. නුමුත් වැසියන් ගණන් ගනු ලබන දිනයේ දී යම් යම් විමති අදහස් ඇතිවීමෙන් බොහෝ දෙන කැලෑවල සැඟවී සිටි බැව් දැනගන්ට ලැබී තිබෙන සෙයින්, එවකට මෙහි ජන සංඛාව දශ ලක්ෂයකට අඩුනොවේ යයි කල්පානා කරන ලද්දේය. මේ ආණ්ඩු කාලයේ පාරවල් තැනීම සම්බන්ධව ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ධූරය දරණ ලද්ද සී. ඇම්, ඩී යන උපාධි නාමධාරී මේජර් ස්කිනර් මහතා ය. මෙතුමා අවුරුදු පණසකට වැඩි කාලයක් ලංකාවේ මංමාවත් නිර්මාණය කිරිමේ ව්‍යවෘතව සිටි කෙනෙකි. වර්ෂ 1831 ක්වූ ඔක්තෝබර් මස 13 වෙනි දින ලංකාණ්ඩුව කේ. සී. බී. නම් උපාධිනාමධාරි සර් ජෝන් විල්සන් තුමාට භාරදී බාරන්ස් උතුමාණන් වහන්සේ සියරටට නික්ම ගියේය.

Non-Commercial Distribution

# වංශාධිපති සර් රොබර්ට් විල්මට් හෝර්ටන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය

# ක්‍රි. ව. 1831-1837

සර් ජෝන් විල්සන්තුමා දස දිනක් ආණ්ඩුකාර ධූරයෙහි වැඩ බැලූ පසු වර්ෂ 1831 ක් වූ ඔක්තෝබර් මස 23 වෙනි දින වංශාධිපති සර් රොබර්ට් විල්මට් හෝර්ටන් උතුමාණන් වහන්සේ නියම වූ පරිදි ලංකාණ්ඩුකාර ධූරයෙහි වැඩ භාර ගත්තේ ය. මෙතුමා වනාහි කීර්තිමත් යුද්ධ දක්ෂයෙක්වූවා පමණකුත් නොව, රාජ්‍ය පරිපාලනයෙහි විසාරද බුද්ධි සම්පන්න ශ්‍රේෂ්ඨ මන්ත්‍රිවරයෙකි. බ්‍රිතාන්‍ය අග්‍රරාජ්‍යය හා ඊට අයත් යටත් ප්‍රදේශ අතරේත් ඇතිවිය යුතු අන්‍යොන්‍යානය සම්බන්ධත්වය පිළිබඳ බොහෝ දුරට විවාද කරන ලද ප්‍රශ්නයෙහි මෙතුමා අතිශය ආසකත්ව ක්‍රියා කළ උතුමෙක් ද වන්නේ ය. ලංකාණ්ඩුකාර ධූරයට පත්වී එන්ට ප්‍රථම නිදහස්මතධාරී මන්ත්‍රිවර යන්ගෙන් යුත් ආණ්ඩු කාලයක මෙතුමා ප්‍රදේශ භාර ද්වීතිය මහලේ කම් තැනව සිටියේය. මෙතුමාගේ ගෝත්‍ර නාමය විල්මට් ය. ලෝක ප්‍රසිද්ධ බයිරන් නමැති සුප්‍රසිද්ධ කිවිහුගේ බෑනා කෙනෙක් වූහ, විශාල ධන සම්භාරයක් ඇති ලක්ෂණ කාන්තාවක් වූද හෝර්ටන් මැතිනිය හා මෙතුමා විවාහ වූ විට, ඇගේ නාමය ද මෙතුමාගේ නාමය හා සම්බන්ධ කරන ලදී. වර්ෂ 1828 ටේ සිට වර්ෂ 1837 දක්වා අවුරුදු කීපයක්ම ලංකාවේ මුතුපර වලින් බෙල්ලන් කඩන ලදී. මේ නිසා ආණ්ඩුවට ලැබුන ආදායම රන් පවුන් 2,27,000 ක් විය. වර්ෂ 1832 කේ පෙබරවාරි මස 1 වෙනි දින පටන් කොළඹත් මහනුවරත් අතර අසුන් බැඳි තැපැල් කෝච්චියක් ගමන් කරවන්ට පටන් ගත්තේ ය. මුළු ආසියාවෙන්ම පළමුවෙනි වරට මගීන් සහ තැපැල් ගෙන යාමට ආරම්භ කරන ලද තැපැල් රථය මෙය බව කිය යුතු ය. රාජ මන්ත්‍රණ සභාවේ නියොවින් මෙම අවුරුද්දේදී වැසියන්ගෙන් බලාත්කරයෙක් රාජකාරිය ගැනීමේ පෞරාණික ස්වදේශිය ව්‍යවස්ථාව අවලංගු කරන ලදී. ඇතැම් අය විසින් දූනට දොස් පරවනු ලබන පාරබදු හෙවත් ඇඟබදු ආඥා පණත මේ ආණ්ඩු කාලයේ දී පණවන ලද්දකි. මේ ආඥා පණතේ අන්දමට ආණ්ඩුකාරයද, යුද්ධ හමුදාවේ අයද, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ද, විදේශීය කුලීකරුවන්ද හැර, අවුරුදු 18 ටේ පටන් 55 දක්වා වයස් වූ සියලුම පිරිමින් පාරවල් අලුත් වැඩියා කිරීම සහ ඇළ දොළවල් සකස් කිරීම සඳහා ද දින භාගයක්

Non-Commercial Distribution

වැඩ කරන්ට හෝ ඒ රාජකාරියට වැටෙන වැටුප් මුදල ගෙවන්ට හෝ බැඳී සිටිත්.

හෝර්ටන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලයේ දී මරක්කල මිනිසුන්ටත් ද්‍රවිඩ ජනයාටත් කොළඹ ඇතුල් කොටුවේ සහ පිට කොටුවේත් ගෙවල් මිලදී ගැනිමෙන් ඉඩම් හිමියන් වීමට නිදහස දෙන ලද්දේ ය. ලන්දේසි ආණ්ඩු කාලයේ පටන් මේතාක් කල් ආණ්ඩුවට පමණක් අයිතිවාසිකම් ඇතුව කර ගන ආ කුරුඳු වෙළඳාම, වර්ෂ 1833 නේ දී අත්හැර දමන ලදින් එවක් පටන් කුරුඳු වැවීමටත් වෙළඳාම් කිරීමටත් වැසියන්ට සම්පූර්ණ නිදහස අත්පත් විය. දැනට රෝයල් කොලේජ් යන නාමයෙන් ව්‍යවහාර වෙන, ආණ්ඩුවේ රාජකීය උසස් ශාස්ත්‍ර ශාලාව, වර්ෂ 1836 යේදී කොළොම්බෝ ඇකැඩමි යන නමින් පිහිටු වන ලද්දකි. ඊට පෙර ඇම්. ඒ. යන උපාධි නාමධාරී ගෞරවාර්ථ ජේ. මාර්ෂ් දෙව්ගැතිතුමා චර්ච් මිෂන් සමාගමට අයිති කෝට්ටේ ක්‍රිස්තියානි ශාස්ත්‍ර ශාලාවේ ආචාර්යවරයෙකු මෙන් පත් වි සිටියේ ය. එතුමා ඉන් අස්වී 1835 දී කොළඹ සන්ත පාවුළුගේ දෙව් මැදුරේ කොලෝනියල් චැප්ලේන් නමැති පූජක පදවිය භාරගෙන හුදු ස්වකීය විධානය ඇති අධ්‍යාපන ශාලාවක් විවෘත කොට එහි සිංහල උසස් පවුල් වල ළමයින්ට උගන්වමින් සිටියේ ය. මේ කාලයේ යථොක්ත පාඨ ශාලාවට ආණ්ඩුවේ ආධාර අයැද සිංහල ප්‍රභූ ජනයා විසින් හෝර්ටන් උතුමාණන් වහන්සේට අයදුම් පතක් ඔප්පු කරන ලදී. ඒ අයදුමේ ප්‍රතිඵලයක් වශයෙන් යටකී පාසැල වර්ෂ 1836 යේ දී කොළොම්බෝ ඇකෑඩමි යන නමින් පිහිටු වන ලදුව , අද දක්වාත් නමින් පමණක් වෙනස්ව පවතින ආණ්ඩුවේ මහා ශාස්ත්‍ර ශාලාව වූයේ ය. එහි ප්‍රධානාධ්‍යක්ෂ තැන මෙන් පළමු වෙන්ම ක්‍රියා කෙළේ , ආණ්ඩුවේ උසස් නිලතල වලට දක්ෂ ශිෂ්‍යයන් බොහෝ දෙනෙක් පුහුණු කොට යැව් පූර්වෝක්ත ශාස්ත්‍රධාරී මාර්ෂ් දේව ගැතිතුමාවේ. වර්ෂ 1833 නේදී එංගලන්තයේ රාජමන්ත්‍රණ සභාව විසින් දෙවා වදාරන ලද පණතක බලය පිට ලංකාවේ නීතිදායක මන්ත්‍රී සභාව සහ නීති විධායක මන්ත්‍රී සභාවත් පිහිටුවන ලද්දේ ය. නීතිදායක මන්ත්‍රී සභාව නිලලත් සාමාජිකවරු දස දෙනෙකුන්ගෙන් හා නිල නොලත් සාමාජිකවරු හය දෙනෙකුගෙන් ද, නීති විධායක මන්ත්‍රී සභා ආණ්ඩුකාරයා ඇතුළු නිලලත් සාමාජිකවරු හය දෙනකුගෙන් ද සමර්ථ කරන ලදී. බාර්න්ස් උතුමාණන් වහන්සේ ගේ ආණ්ඩුවේ දී පවත් වන ලද රාජකීය කොමිෂන් සභාවේ අනුශාසකත්වය නිසා පළමු වෙනි දී තිබූ සන්නස් පත්‍රය වඩාමත් සුදුසු ආකාරයෙන් සකසා

Non-Commercial Distribution

මේ වර්ෂයේ දී මහා බ්‍රිතන්‍යයේ මහ මන්ත්‍රිම මණ්ඩල විසින් ලංකාවට අභිනව සන්නස් පත්‍රයක් දෙන ලද්දේ ය. වර්ෂ 1831 දී කොළඹ ප්‍රසිද්ධ කළ පළමුවෙනි ආරංචි පත්‍රය වූ කොළොම්බෝ ජර්නල් නම් පත්‍රය ආණ්ඩුවේ ආධාරත් ඇතුව ආරම්භ කරන ලදී. එහෙත් වැඩි කල්යන්ට ප්‍රථම මෙකී පත්‍රය අත්හිටවන්ට සිදු විය. ඊට පසු වර්ෂ 1834 දී කොළඹ යුරෝපීය වෙළෙන්දන්ගේ උවමනාව පිට සිලෝන් ඔබ්සර් වර් නම් පත්‍රය පටන් ගන්නා ලද්දේ ය. වර්ෂ 1833 නේ දී මේ දිවයින උතුරු, දකුණු නැගෙනහිර, බස්නාහිර සහ මධ්‍යම යන පළාත් පහකට බෙදන ලද්දේ ය. වර්ෂ 1834 දී ඉගැන්වීමේ කටයුතු සඵලකාරයෙක් කර ගෙන යනු සඳහා ස්කූල් කොමිෂන් නම් සභාවක් ද පිහිටුවන ලද්දී ය.

වර්ෂ 1834 රේ දී නැවත ද වරක් උඩරැටියන් කීප දෙනෙකුන් විසින් ඉංග්‍රීසීන්ට විරුද්ධව කුමන්ත්‍රණය කර ගෙන යන බැව් හෝර්ටන් උතුමාණන් වහන්සේට මහවල තැන්නේ දිසාව සහ වෙනත් අය විසින් දන්වන ලදී. මේ කුමන්ත්‍රණය නැසිගිය මොල්ලිගොඩ මහ අදිකාරමගේ සහෝදර වූ දෙවෙනි මොල්ලිගොඩ මහඅදිකාරම ද, දුනුවිල දිසාවද රද්දේ ගොඩ මහ අදිකාරමගේ සහෝදර වූ රද්දෝ ගොඩ ලේකම් ද මල්වතු විහාරයේ සමණන් දෙදෙනෙක් ද ලංකා රෙජමේන්තුවේ ජාමුළා දැනියෙක්ද සම්බන්ධ වී සිටියෝ ය. ඔවුන්ගේ අදහස සියම්වරුන්ගෙන් සහ ප්‍රන්සකාරයන්ගෙනුත් උපකාර ලැබ, ඉංග්‍රීසීන් එරටින් නෙරපා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ඥාතියකු ලංකා රාජ්‍ය පරිපාලනය උදෙසා පත් කර ගැනීමේ යෝජනාව බව දන ගන්නා ලදී, යථොක්ත කුමන්ත්‍රණ කරුවන් සය දෙන අල්වා බර පතළ චෝදනා කීපයක් උඩ ඔවුන්ට විරුද්ධව නඩු පවරනු ලැබ, වර්ෂ 1835 ක් වූ ජනවාරි මස 112 වෙනි දින කොළඹ ශ්‍රේෂ්ඨධිකරණ ශාලාවේ විභාග කරන ලද්දේ ය. එය දස දිනක් මුළුල්ලේ විභාග කාට, යුරෝපියන් ගෙන් සහ පහතරට සිංහල මිනිසුන්ගෙනුත් සමන්විත ජූරි සභාවක් විසින් ඔව්හු නිදහස් කොට යවන ලද්දෝ ය. එසේ ද වුවත් ආණ්ඩුවෙන් තිලතල ලබා සිටි විත්තිකාරයන් වූ සැම දෙන ස්වකීය ස්ථානාත්ර වලින් නෙරපනු ලැබූහ.

Non-Commercial Distribution

# අති ගෞරවාර්හ ජේම්ස් ඇලෙක්සැන්ඩර් ස්ටුවර්ට් මැකැන්සි උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය

## ක්‍රි. ව.1837-1841.

සර් රොබර්ට් විල්මට් හෝර්ටන් උතුමාණන් වහන්සේට පසුව, වර්ෂ 1837 තේ නොවැම්බර් මස 7 වෙනි දින අති ගෞරවාර්හ ජේම්ස් ඇලෙක්සැන්ඩර් ස්ටුවර්ට් මැකැන්සි උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරයට පත් විය. උන්වහන්සේ විසින් මෙම දිවයින ආණ්ඩු කරන ලද සතර අවුරුද්ද ඇතුළත ආණ්ඩුව මගින් වැසියන්ට බොහෝ වැඩ සැලසුණේ ය. මේ උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුව භාර ගන්නා විට ප්‍රථමයෙන් ආදායම් උපදින මාර්ග බොහෝමයක් නැති වී අලුත් වැවිලි කාර්මාන්තාදිය දියුණු කිරීමට වියදම් පිණිස මුදල් රාශියක් උවමනා වී තිබුණේ ය. මීට ඉහත ආණ්ඩුවේ දී විශාල ආදායමක් ලැබුණ මුතුපර වල දීර්ඝ කාලයක්ම ඵල රහිත විය. කුරුඳු වැවීමට සහ වෙළඳාමටත් වැසියන්ට අවසර දීම නිසා වැඩකරුවන්ට පඩි දී ආණ්ඩුවට අයිති කුරුඳුවතු පාලනය කිරීම ආදායම පාඩුවක් බව මෙතුමාට පෙණී ගියේ ය. එබැවින් එංගලන්ත ආණ්ඩුවෙන් අවසර ඇතුව ආණ්ඩුව සන්තක කුරුඳුවතු බොහෝමයක් විකුණන ලදී. ජාවාරටේ උපදින කුරුඳු කරණ කොට ගෙන හා මුදු බද්දේ වැඩිකම නිසාත් ලංකාවේ කුරුඳු වෙළඳාම ක්‍රමයෙන් පිරිහීම විය. මේ කාලයේදී කෝපි වැවිලි කර්මාන්තය ඉතා මෑතක ආරම්භ කරන ලද්දක් බැවින් එයිනුදු වැඩි ආදායමක් නොලැබුණේ ය. වැසියන්ගේ පැල් වටේ වවා තිබුණ කෝපි ගස් වලින් ලැබුණ කෝපිත් සමග අවුරුද්දකට රන් පවුන් 1,06,000 ක් වටිනා කෝපි හොන්ඩර 34,000ක් පමණ මැකැන්සි උතුමාණන් වහන්සේගේ කාලයේ දී පිට ප්‍රදේශ වලට යවා තිබේ. මේ කාලයේ දී කෝපි වැවීමේ බලවත් ආශාව කෙතරම් වූ ද යත්, මෙය උන්මාද රෝගයක් මෙන් උතුමාණන් වහන්සේගේ පටන් ආණ්ඩුවේ සියලුම තරාතිරම් වල උසස් නිලධාරීන්ට පමණක් නොව ක්‍රිස්තියානි පූජකයන්ට පවා වැළඳුන බව එක්තරා ග්‍රන්ථයක සඳහන් කර තිබේ.

Non-Commercial Distribution

ආණ්ඩුවේ උසස් නිලධාරීන්ගේත් යුරෝපීය වැවිලිකරුවන්ගේත් පුද්ගලික ප්‍රයෝජන කෝපි වැවිල්ලෙන් ඉටු කර දිම පිණිස රාජ සන්තක වටිනා මූකලාන් අක්කරයක් සිලිම් පහ බැගින් අක්කර දහස් ගණන් එකිනෙකාට විකිණී මෙන් මැකැන්සි උතුමාණන් වහන්සේගේ කීර්තිය ක්ලිෂ්ට වූයේ ය යනු ඇතැම් ගුණ දොස් පරීක්ෂකයන්ගේ මතය විය. මේ උතුමාණන් වහන්සේ ආරෝග්‍ය ශාලා , බන්ධනාගාර උන්මන්තකාරෝග්‍ය ශාලා සහ පාඨශාලා දියුණු කිරීමට බලවත් පරිශ්‍රම දරු කෙනෙකි. කොළඹත් ගාල්ලත් අතර තැපැල් ගෙන යාමට අශ්ව කෝච්චියක් තබන ලද්දේ මෙතුමාගේ ආණ්ඩු කාලයේ 1838 වේ අවුරුද්දේ දීය. බොහෝ කලක පටන් මස් මරන්නන්ගෙන් අය කරනු ලැබූ දහයෙන් කොටස් මාලු බද්ධ වර්ෂ 1840 හේදී අත්හැර දමන ලද්දේ ය. මැකින්සි උතුමාණෝ වනාහි භක්තිවන්ත ක්‍රිස්තියානි කාරයෙකි, එබැවින් බොහෝ ප්‍රස්තාවන් හිදී එතුමා විසින් මිෂියොනාරිස් සභාවන්හි ප්‍රසිද්ධ රැස්වීම් වල මුළාසනය පිළිගැනී මෙන් ස්වකීය භක්ත්‍යාදරය හඟවන ලදී. බෞද්ධ භික්ෂූන් වහන්සේලා යම් යම් පදවි වලට පත් කරනු ලබන විට ඒ පත් කිරීමේ සන්නස් පත්‍ර වලට ස්වකීය රාජකිය මුද්‍රා අත්සන තැබීම පෞරාණික හෙළදිව් නරේන්ද්‍රයන්ගේ සිරිත විය. ඒ සිරිත උල්ලංඝනය නොකොට උඩරට ගිවිසුමට අනුව ඉංග්‍රීසි ආණ්ඩුකාරයන් විසින් මේතාක් පවත්වා ගෙන ආවේවී නුමුත් මෙතුමා එය ප්‍රතික්ෂේප කරන ලද්දේ ය. ලංකාවේ වසන වැද්දන්ගේ දුක්ඛිත ස්වභාවය ජානනය කොට මේ ආණ්ඩුකාර තුමා ඔවුන් දැකීම පිණිස බිම්තැන්නට ගමන් කෙළේ ය. ඒ ගමනෙන් වැළඳී ජ්වරාබාධය හේතු කොට ගෙන සනීපයට බාධා පැමිණීමෙන්, නියම කාලයට ප්‍රථම ලංකාව අත්හැර අයෝනියන් දූපත්හි ශ්‍රේෂ්ඨ කොමසාරිස් ධූරයට පත්ව ගියේ ය.

---

යුරෝපයේ ග්‍රීස් රටට බස්නාහිර දිග්භාගයෙන් පිහිටි දූපත් රැස

Non-Commercial Distribution

# සර් කොලින් කැමල් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය

## ක්‍රි. ව.1841-1847

ලෝක ප්‍රසිද්ධ වැලිංටන් ආදිපාදයාණන්ගේ ලැප්ටිනන්ට් ධූරයක් දරූ සර් කොලින් කැමල්තුමා වර්ෂ 1841 කේ අප්‍රියෙල් මස 5 වෙනි දින ලංකේෂ්වර පදවියට පත් කරන ලද්දේ ය. මේ ආණ්ඩු කාලයේ දී උඩරට කෝපි වැවීම කෙතරම් සීඝ්‍ර ලෙස දියුණු වූයේ ය ද යතහොත් උපදින්නා වූ කෝපි කොළඹ සිට ලන්ඩන් නගරයට යවන්ට ගත වන කාලයට වඩා වැඩි කාලයක් උඩරට සිට මෙහි කොළඹට ගෙන ඊමට ඕනෑ විය. කෝපි වතු වල කුලීකාරයන්ට ආහාර පිණිස ඉන්දියාවෙන් පටවා එවනු ලබන හාල් වලින් ලබන තීරුවෙන් සහ වෙනත් කාරණ වලින් මැකැන්සි උතුමාණන් වහන්සේගේ කාලයේ දී ලැබුණට වඩා ආණ්ඩුවේ ආදායමට අවුරුදු පතා පවුන් ලක්ෂය බැගින් වැඩි විය. මේ කාලයේ ලංකාද්වීපයේ සිටි සිවිල් නිලධාරින්ගේ ඇතැම් නොමනා ක්‍රියා පැවතුම් ගැන තදින් දෝෂා රෝපනණය කොට ප්‍රදේශ බාර අමාත්‍ය තැනපත් ස්ටැන්ලි සාමි විසින් එවන ලද අනුශාසක නිවේදනයක් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ විය. ඒ හේතු කොට ගෙන දෝෂාරෝපිත නිලධාරීන් සහ ඔවුන්ගේ මිත්‍රයන් අතරේ ද බලවත් කැලඹීමක් ඇතිවිය. ආණ්ඩුවේ නිලධාරීන්ගේ අත්තනෝමතික දූෂිත ක්‍රියා සංසෝධනය කරනු පිණිස ස්ටෑන්ලි සාමිගේ අනුගාමික විචක්ෂණ ශිෂ්‍යයෙක් වූ දලංකාව පිළිබඳ විශිෂ්ට ඓතිහාසික ග්‍රන්ථයක කර්තෘවරයෙක් වූ ද සර් එමර්සන් ටැනන්ට්තුමා කොලොනියල් සෙක්‍රතාරිස් (මහලේකම්) ධූරය ටද, සී. ජේ. මැකාර්ති මහතා ඔඩිටර් ජැනරල් (ගණන් පරීක්ෂකාධ්‍යක්ෂ) ධූරයට ද පත්කර එවන ලද්දේ ය. මේ පත් කිරීම් ලංකාවේ එවකට සිටි පරණ සිවිල් නිලධාරීන්ට බෙහෙවින් සැලවි ය. විසාරද සූක්ෂම බුද්ධිමත් මේ නිලධාරීන්ගේ පත් වීමෙන් පසු, ආණ්ඩුවේ සියලුම දෙපාර්තමේන්තු වලම වාගේ විපර්යාසයක් ඇති කරවා එහි කටයුතු මනා පිළිවෙලට ගෙනෙන ලදී. තව ද සුළු නඩු විසඳීම පිණිස සහ බරපතල නඩු වල සාක්ෂි සටහන් කර ගැනීම පිණිසත් පොලිස් නඩු ශාලා ද, සුළු ණය ගනු දෙනු ආදිය අය කර ගැනිම සඳහා රික්වැස්ට් උසාවිද ලංකාවේ නොයෙක් පළාත් වල පිහිටු වන ලදී, තදබල අපාරාධ සම්බන්ධ ප්‍රථම විභාග පැවැත්වීම පිණිස තිලලත් සහ නිල නොලත් සාමදාන විනිශ්චය කාරවරු ද, හදිසි මරණ පරීක්ෂා කිරිම පිණිස කොර්නර්වරු සහ ඩැපියුටි කොර්නර්වරු ද පත් කරන ලද්දෝ ය. වහල් මෙහෙ ගැනීමේ සිරිත සමහර රටවල මෙන්ම ලංකාවේ ද බොහෝ කාලයක සිට පැවත ආයේ ය. කොළඹ කොම්පොඤ්ඤ වීථිය පළාතට, වහල් දූපත යන අර්ථවත් සෙල්වි

Non-Commercial Distribution

අයිලන්ඩ් යන නාමය අද දක්වාම ව්‍යවහාර කිරීමෙන් ලංකාවේ වාල් මිනිසුන් ඇතුව සිටි බව මොනවට හැඟේ. කොළඹ කොටුවේ පදිංචි සිටි ඕලන්දක්කාර මුළු පවුලක්ම එක් රාත්‍රියකදී ඒ ගෙදර නවත්වා ගෙන සිටි වහලුන් විසින් මරන ලද නිසා එවක් පටන් සියලුම මහලුන් රාත්‍රි කාලයේ කොළඹ බේරේ වැවේ මැද්දේ පිහිටි අඩදූවේ සිරකර තැබීම ලන්දේසීන්ගේ සිරිතක්ව තිබුණේ ය. ඒ කරණ කොට ගෙන එම පියස ස්ලේව් අයිලන්ඩ් යන නාමයෙන් ව්‍යවහාරයට පැමිණියේ ය. යනු පර්ගියුසන් මහතා විසින් ලංකාව සම්බන්ධ ලියන ලද පොතක සඳහන් කර තිබේ.

වර්ෂ 1844 දී කැමල් උතුමාණන් වහන්සේ විසින් අභිනව ව්‍යවස්ථාවක් පණවා අතිශය දරුණු අමනුෂ්‍ය ක්‍රියාවක් බඳු වූ මෙම වහල් මෙහෙ ගැනීම නැමති සාපය ලංකා භූමියෙන් සමුලොද්ධරණය කිරීමෙන් දූරිභූත කරන ලදී, බැන්ක් ඔප් සිලොන් යන නමින් පළමුවෙන්ම මුදල් භාණ්ඩාගාරයක් ලංකාවේ විවෘත කරන ලද්දේ මේ උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලයේ දිය. එවකට නීතිදායක මන්ත්‍රි සභාවේ නිල නොලත් යුරෝපීය මන්ත්‍රීවරයෙක් වූ අර්මිටේජ් මහතා එහි අධ්‍යක්ෂ කෙනෙක්ව ක්‍රියා කෙළේ ය. වංචකයන් කෙරෙන් ප්‍රවේසම් මදිව කටයුතු කිරීම නිසා මේ බැංකුව වැඩිකල් නොඉක්ම වාම වසාදමන සිදුවිය. ඒ වෙනුවට පසු කලක දී වස්තු භංගත්වය ලැබූ ඕරියැන්ටල් බැන්කිං කෝපොරේෂන් නම් වෙනත් මුදල් භාණ්ඩාගාරයක් ඉදිරිපත්විය. වර්ෂ 1845 හේ දී ලංකාවේ රාජකීය ආසියාතික සමාගම පිහිටුවන ලදී. වර්ෂ 1847 තේ අප්‍රියෙල් මස 13 වෙනි දින කැමල් උතුමාණන් වහන්සේ සර් ජේම්ස් එමර්සන් ටැනන්ට් තුමාට ලංකාණ්ඩුව බාරදී සියරටට පිටත්ව ගියේ ය. වර්ෂ 1847 තේ මැයි මස 23 වෙනි දින වන තුරු එමර්සන්තුමා ලංකාණ්ඩු ධූරයෙහි වැඩ බැලුවේ ය.

## වෛකවුන්ට් ටොරින්ටන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය
## ක්‍රි. ව.1847-1850

වර්ෂ1847 ක් වූ මැයි මස 23 වෙනි දින ටොරින්ටන් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරයට පත්විය. මෙතුමා වැඩි පොහොසත් කමක් නැති තරුණ වියෙහි පිහිටි වංශාධිපති පවුලකට අයත් කෙනෙකි. මුන් වහන්සේ එංගලන්තයේ රාජ මාලිගයෙහි ගෘහස්ථ නිලයක් සහ දුම්රිය සමාගමක අධ්‍යක්ෂ ධූරයක් දැරුවා පමණක් මුත්, මීට පෙර දේශපාලනය පිළිබඳ කිසිම අත්දැකීමක් මෙතුමාට නොතිබුණුණේ ය. වික්ටෝරියා අග්‍ර රාජිනියගේ විවාහ මංගල්‍යයේ දී ඒ උත්තමියගේ ස්වාමිපුරුෂයා වූ ඇල්බට්

Non-Commercial Distribution

කුමාරයා එංගලන්තයට කැඳවා ගෙන එන ලද්දේ මෙතුමා විසින් ය. එංගලන්ත ආණ්ඩුවේ උසස් ධානාන්තර වල නියුක්තව සිටි ස්වකීය බලසම්පන්න ඥාතීන් විසින් ආණ්ඩක්‍රම ගැන කිසිම පලපුරුද්දක් නොමැති මෙතුමාට ප්‍රත්‍යුපකාර සැලකීම් වශයෙන් ලංකාණ්ඩුකාර ධූරයට තෝරා ගන්නා ලදැයි දැන ගෙන තිබේ. ටොරිංටන් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරය භාරගත් කාලයේ පටන් ක්‍රම ක්‍රමයෙන් ආණ්ඩුව කෙරෙහි උඩරට වැසියන්ගේ සිත් කලකිරෙන්ට වන. බලු බදු ආදී අලුත් බදු නියම කිරිම සිංහල ජනයා කෙරෙහි නොසැලකිලිවන්ත ක්‍රියා කිරීම යුරෝපීයයන්ට අමුතු උපකාර කිරීම රටේ දුශ්චරිත පැතිරි යනු බලා තුෂ්ණිම්භූත වීම මහනුවර, ගිවිසුමට ප්‍රතිවිරුද්ධ ලෙස බෞද්ධ ශාසනික කර්තව්‍ය වලදී ආණ්ඩුව මගින් අවහිරකම් පෑම යන මේ ආදී කරුණු හේතු කොට ගෙන වැසියන්ගේ රාජපාක්ෂික භාවය අතුරුදහන්වීමට කරණ විය.

මේ අතර සර් එමර්සන් ටැනන්ට්තුමා විසින් රටේ පතුරුවා හරින ලද වැසියන්ගේ ඉඩම් කඩම්වල වටිනාකම් සහ ආදායම් වල ප්‍රමාණයක් සටහන් කිරීමේ ක්‍රම පත්‍ර හෙවත් පෝර්ම කඩදාසි කරණ කොට ගන නූගත් මිනිසුන්ගේ සිත් තුළ බලවත් සැකයක් සහ භීතියක් ද ඇති විය. අන්තිමේ දී ශ්‍රමණවරුන් හා ස්වදේශික මුලාදෑන් විසින් පොලඹවන ලදුව මාතලේ සහ කුරුණෑගලත් අවට ජනයා සිංහල ඔටුන්නට හිමිකම් කියන්නෙක් පෙරමුණට තබා ගෙන කැරැල්ලක් උපදවා බලාත්කාරකමක් කිරීමට පටන් ගත්තේ ය. ඉංග්‍රීසි ආණ්ඩුවට මේ බැව් සැලවූ වහාම සුළු හේවා කණ්ඩායම් කීපයක් විත් ඔබ මොබ හැසිරෙමින් සිටි කැරළිකාරයන් සියල්ලෝ ම නිරායාසයෙන් පලවා හරින ලදී. මේ සටන් .. කැරලිකාර පක්ෂයෙන් හතළිස් දෙනෙක් මාරාත්තම වූහ. මෙසේ අපරීක්ෂාකාරි ලෙස ක්‍රියා කිරීමෙන් ආණ්ඩුව විසින් කෝපයට පමුණුවනු ලැබූ නූගත් මිනිසුන් කොටසකගේ සාහසික ක්‍රියාවක් වැඩි අපහසුවක් නොවිඳ සහනයට පත් කල පසු ටොරිංටන් උතුමාණන් වහන්සේ කිසිම අවශ්‍ය බවක් නැතිවද කෝලාහල පැවතුණ සියලුම පළාත් බොහෝ මාස ගණනක් මුළුල්ලේ මාර්ෂල් ලෝ නම් යුද්ධ නීතියට යටත් කොට තැබීමෙන් අහිංසක වැසියන් බොහෝ දෙනෙකුට අප්‍රමාණ වධ බන්ධනාදි අයුතු හිංසා පීඩා විඳීමට සලස්වන ලද්දේ ය. මේ ක්‍රියා පරිපාටිය වනාහි ටොරිංටන් උතුමාණන්ගේ අවාසනාවන් වැටීමට හේතු භූත විය. එතුමාගේ නීතිවේ දී අනුශාසකයෙක් වූ එච්. සී. සැල්බි මහතා යුද්ධ නීතිය පැණවීම ගැන ඉඳුරාම විරුද්ධව සිටි නුමුත් එයින් කිසි සඵල යක් නොවීය. නායක විනිශ්චයකාර ධූරන්ධර සර් අන්තෝනි ඔලිපන්ට් තුමා විසින් කැරළිකාර මූලිකයන්ගේ නඩු විභාග කොට ඔවුන් මරණීය දණ්ඩනයට යටත් කොට ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ දයාන්ති ක්ෂමායට සුදුස බව දක්වන ලදී, එසේ කිරිම ගැන

Non-Commercial Distribution

උතුමාණන් වහන්සේ ස්වකීය අප්‍රසන්න බව නායක විනිශ්චයකාරතුමා කෙරෙහි දක්වූයේය. දූරදර්ශක ඥාන විරහිත වූ මේ ආණ්ඩුකාර තෙමේ බොහෝ විට නුවණ පරිදි අනුන්ගේ බසට නැමී ක්‍රියා කල නෙකේ විය. උසස් වීමෙහි අපේක්‍ෂක වූ උපා දක්ෂ මෙතුමාගේ සහකාර අනුශාසකයන් වූ සර් එමර්සල් ටැනන්ට් සහ පිලිසප් වුඩ් හවුස් නමැති නිල ධාරින්ගේ සන්නාහයක් බඳු අත්පත්වනු ලැබ සිටියේ ය. ඒ නිලධාරීන් දෙදෙන විසින් තම තමන්ගේ ස්වාධිනව භාවය අභිප්‍රේතව කණවන ලද ආවාටයෙහි ටොරිංටන් සාමි නොදනුවත්වම අදූ වැටින. උන් වහන්සේ ගේ ආණ්ඩු ක්‍රමය ගැන ලංකාවේ සිටි ස්වදේශීන් මෙන් මස යුරෝපාකාර යොද් එකාකාරම සතුටු නුවූහ. මේ විසූ ජනක්ෂභාන අවස්ථාවේ සිලෝන් ඔබ්සර්වර් නම් ප්‍රවෘත්ති පත්‍රයෙහි අයිතිකාරයා වූ සී. එලියට් දොස්තර් මහතා විසින් ලංකාණ්ඩුවේ පවතින දූර්නීක අධම ස්වභාව තන්වූ නියා එංගලන්තයේ රාජමන්ත්‍රණ සභාවට දන්වනු ලැබ, ඒ ගැන විභාගයක් පවත්වා ටොරිංටන් සාමිද, සර් එමර්සන් ටැනන්ට් තුමා ද, වුඩ්හවුස් මහතා ද, ඔවුනොවුන්ගේ නිලතල වලින් පහ කරනු ලැබ, වර්ෂ 1850 හේ ඔක්තෝබර් මාසයේ දී සිය රටට කැඳවා ගන්නා ලදහ.

සර් එමර්සන් ටැනන්ට්තුමගෙන් හිස් වූ කොලොනියල් සෙක්‍රතාරිස් ධූරයට ඔඩිවර් ජැනරල් තැන්පත් සර් චාර්ල්ස් මැකාර්තිතුමා පත් කරන ලද්දේ ය. මේ කාලයේ ඔබ්සර්වර් පත්‍රය වෙනුවෙන් ගාල්ලේ සිට කොළඹට පණිවුඩ පත් ගෙන ඒමට කැරියර්පිජන්ස්නම් අසුන් ගෙනයන පරෙවියන් කොටසක් පුරුදු කර තිබුණේ ය. වෛකවුන්ට් හෙවත් ලෝර්ඩ් ටොරිංටන් උතුමාණන් වහන්සේ ආණ්ඩුකාර ධූරයෙන් ඉවත් කොට එංගලන්තයට කැඳවනු ලැබීම පළමුවෙන්ම කොළඹට සැලවූයේ. යථොක්ත සන්දේශ භාරක පක්ෂියෙක් විසින් ගෙනෙන ලද පණිවුඩ පුවතකින් ය. ටොරිංටන් ලංකාණ්ඩුකාර උතුමාණෝ සිය රටට සපැමිණියායින් පසු වික්ටෝරියා මහාරාජිනියගේ මාලිගාවෙහි ගෘහස්ථ තනතුරක යෙදී අප්‍රසිද්ධ ලෙස ජීවිතය ගත කළේ යයි සඳහන් වේ.

Non-Commercial Distribution

# සර් ජෝර්ජ් ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය - ක්‍රි. ව.1850-1855

ටොරිංටන් සාමි ලංකාව අත්හැර ගියාට පසු ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ ළඟා වෙනතුරු කොලෝනියල් සෙක්‍රතාරිස් ධූරයට අලුත පත් වෙන ලද සර් චාර්ල්ස් මැකාර්තිතුමා වර්ෂ 1850 හේ ඔක්තෝබර් මස 18 වෙනි දින සිට නොවැම්බර් මස 27 වෙනි දින දක්වා ආණ්ඩුකාරධූරයෙහි වැඩ බැළුවේ. වර්ෂ 1850 වූ නොවැම්බර් මස 27 වෙනි දින සර් ජෝර්ජ් ඇන්ඩසන් උතුමාණන් වහන්සේ ලංකාවට උපගත විය. මේ උතුමාණන් වහන්සේගේ දේහ ශක්තිය රෝගාතුර බැවින් දුර්වල පැවති නිසා රටට අවශ්‍යමය කටයුතු කවරේදැයි පරීක්ෂාකර බැලීමට ප්‍රදේශ සංචාරණය කිරිම එතුමාට අපොහොසත් විය. මේ කාලයේ කෝපි වැවීම හා වෙළඳාමත් අති සීඝ්‍රව දියුණු විය. රටේ අභිවර්ධන වෙසෙසින් උද්දීපනය වූ මේ කාලයෙහි මතු දියුණුව සඳහා උවමනා කරන මංමාවත් සහ අනිකුත් කටයුතු සම්බන්ධව ආණ්ඩුවේ උපෙක්ෂාව ගැන විශේෂයෙන්ම යූරෝපීය වැවිලි කරුවෝ උනන්දු ව ක්‍රියා කරන්ට සැරසුණෝ ය. වර්ෂ 1854 ක් වු පෙබරවාරි මාසයේ දී දූනට බල සම්පන්න ලෙස ක්‍රියා කරන්නා වූ වතුකාරයන්ගේ සංගමය පිහිටුවන ලද්දේ ය. ආදායම සහ වියදම එකිනෙකට සමානවන පරිදි ආණ්ඩු ක්‍රමය ගෙන යන ලෙස එංගලන්තය ආණ්ඩුව විසින් තද බල ආඥාවක් ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේට එවන ලද්දේ ය. එබැවින් රටේ දියුණුව සඳහා කළයුතු සමහර වියදම් අඩුකරන්ටත් අත්හිටවන්ටත් සිදුවිය. මේ උතුමාණන් වහන්සේට වැසියන්ගේ අප්‍රසාදය ලැබීමට ඒ කාරණය හේතුවක් වූයේ ය. දක්ෂයෙක් උවත් අවිචාර බුද්ධියකින් යුත් ස්වකීය මතා වලම්බනයෙහි ස්ථිර පිහිටීමක් ඇති මිනින්දොරු අධ්‍යක්ෂ කෙනෙකුගේ උපදෙස් අනුව ක්‍රියාකිරීමෙන් මේ දිවයිනට අනාගතයෙහි විපුලතර අභිවෘද්ධියක් ලැබිය හැකි මුඩු බිම ඇන්ඩ ර්සන් උතුමාණන් වහන්සේ විසින් නොවිකුණන නවත්වනු ලැබ තිබේ.

වර්ෂ 1815 දී තුන්වෙනි ජෝර්ජ් මහරජාණන් වෙනුවෙන් උඩරට පළාත් බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේගේ භාරයට ගත් දින පටන් මඟුල් මඩුවේ දී අත්සන් කරන ලද ගිවිසුම් පත්‍රයේ පස්වෙනි වගන්තියේ ප්‍රකාර මහනුවර දන්ත ධාතු මන්දිරය මේතාක් ඉංග්‍රිසි ආණ්ඩුවේ පාලනය පිට පැවැත්තේ ය. නුමුත් මේ ආණ්ඩු කාලයේ අවසාන වර්ෂයේ දී ඒ වග කීමෙන් ආණ්ඩුව අස් වී දළාදා වහන්සේ ද සිද්ධ ස්ථාන සහ ඊට අයත් මහාර්ග වස්තුවත් සහ නුවර ප්‍රධාන සංඝයාට සහ දිය නිලමේටත් භාර දෙන ලදහ. වර්ෂ 1854 දී සීමා සහිත මර්කන්ටයිල් බැංකුව කොළඹ පිහිටුවන ලදී. වර්ෂ 1855 ක් වූ ජනවාරි මස 18 වෙනි දින ඇන්ඩඑර්සන් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුව කොලෝනියල් සෙක්‍රතාරිස් උන්තාන් සේට භාරදී සිය දෙස්බලා ගමන් ගත් හ.

Non-Commercial Distribution

# සර් හෙන්රි ජෝර්ජ් වෝර්ඩ් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව.1855-1860

සර් හෙන්රි ජොර්ජ් වෝර්ඩ් උතුමාණන් වහන්සේ ගේ ලංකා ගමනය වනතුරු සාරමසක් පමණ කාලයක් සර් චාර්ල්ස් පස්ටින් මැකාර්ති උන්නාසේ උපණ්ඩුකාරධුරයෙහි නියුක්තව ලංකාණ්ඩුවේ වැඩ බැලුවේ ය. මෙයින් විසි වසකට පමණ පසු ලංකාවේ මුතුපර වලින් බෙල්ලන් කැඩිය හැකි බලාපොරොත්තුවක් මේ කාලයෙහි ඇති විය. සර් හෙන්රි ජෝර්ජ් වොර්ඩ් උතුමාණෝ මෙම සූර මාය වූ දිවයිනේ පාංශු ස්පර්ශය කරනවා හා සමගම ලංකා ජනතාවගේ ශ්‍රී සමෘද්ධිමත් කාලය උදා වූයේ යයි නිශ්චය කළ හැකි මෙතුමා කොළඹට පැමිණ දෙමසක් ඇතුළත එනම් වර්ෂ 1855 හේ ජූලි මස 4 වෙනි දින නීතිදායක මන්ත්‍රණ සභාවේ මෙතුමාගේ පළමුවෙනි සභාව වාරය විවෘත කරන ලදී. එහි දී මෙතුමා විසින් පළමුවෙන්ම කරන ලද චිත්තාකර්ෂණීය ව්‍යක්ත කථාව හේතු කොට ගෙන ලංකවාසීන්ගේ සිත් සතන් එකහෙලා ප්‍රබෝධයට පැමිණියේ ය. ඒ කථාවේ දී මෙතුමා විසින් ලංකා ජනතාවගේ අනාගතාභිවෘද්දිය සඳහා ඉෂ්ට කිරීමට ගිවිස ගත් සියල්ල වැඩිකල් අතික්‍රාන්ත නොවී සිද්ධ කරන ලද්දේ ය. සූක්ෂම බුද්ධිය හා චිත්ත ධෛර්යයත් කරණ කොට ගෙන මේ උතුමාණන් වහන්සේ මීට පෙර ලංකාවට වර්ණනා විෂයාන්තික්‍රාන්ත ප්‍රයෝජනවයත් වැඩ රාශියක් කර දුන් සර් ඇඩ්වර්ඩ් බාර්න්ස් ලංකේශ්වරයාණන්ට සමාන භාවයෙහි තිබිය හැකි සේ හඟිනු ලැබේ. නුමුත් බාන්ස් උතුමාණන් වහන්සේ කෙරෙහි අප්‍රකට වූ දුර්ලභ ගුණාංග සමූහයන් මෙතුමා වෙත විද්‍යාමාන විය. සර් හෙන්රි ජෝර්ජ් වෝර්ඩ්තුමාගේ ආණ්ඩු සමයේ දී බුද්ධාගමේ කටයුතු ගැන ආණ්ඩුවේ පැවති සම්බන්ධතාවය සම්පූර්ණයෙන් අත්හැර දමන ලද්දේ ය. ලංකාවේ කෘෂි කර්මය දියුණු කරලීම පිණිස නටබුන්ව තුබූ වැව් කීපයක් මෙතුමා විසින් ප්‍රකෘතිමත් කරවන ලද්දේ ය. මේ හැර අලුතෙන් මංමාවත් කීපයක්ම සාදවාලී මෙන් යුරෝපාකාරයෙන්ට ස්වදේශීන්ටත් තම තමන්ගේ වැවිලි කර්මාන්ත, ගොවිකම් වෙළදාම් ආදිය පහසුවෙන් කර ගැනීමට මාර්ගය පාදාලීමෙන් බලවත් ආධාර ලැබුණේ ය. කටුගස් තොට, නාවල පිටිය, තෙගල් දෙණිය , පින්ඔය සහ කිතුල් ගල යන ස්ථාන වල පාලම් පහක් මෙතුමා විසින් සාදවන ලදී. දිවයින වටේ යාත්‍රා කිරීමට ආණ්ඩුව ගණනේ පර්ල් නමැති දුම් නැව තැබීමෙන් උතුරු සහ නැගෙනහිර පළාත් හා දකුණු සහ බස්නාහිර පළාත් අතරේ වෙළදාම සහ ගනු දෙනු කර ගැනීම් සම්බන්ධ බලවත් ප්‍රතිෂ්ඨාධාරයක් ඇති විය. දකුණු පලාතේ අමුණු අලුත් වැඩියා කිරීම සඳහා පවුන් 25,000 ක් වෙන් කරන ලද්දේ ය.

Non-Commercial Distribution

වර්ෂ 1858 ක් වූ අගෝස්තු මස 3 වෙනි දින මෙතුමා විසින් කොළඹ පටන් මහනුවර දක්වා තැනීමට අදහස් කරන ලද ධූමරථ මාර්ගයේ පළමුවෙනි පිඩැල්ල කොළඹ මරදානේ මංසන්ධි ස්ථානයේ දී ස්වහස්තයෙන් කපා හල බව කියා තිබේ. උඩරට වැස්සන්ගේ කසාද සම්බන්ධ අලුත් ව්‍යවස්ථාවක් වර්ෂ 1859 යේ දී මෙතුමා විසින් පණවන ලද නුමුත් එය ඔවුන්ගේ ජමමික ගති වලට ක්‍රියානුරූප නොවන හෙයින් දස අවුරුද්දකට පසු එහි සමහර වගන්ති වෙනස් කරනලදී. උඩරට විවාහ පිළිබඳ කථාවක දී ස්ත්‍රී පක්ෂය විසින් බහු පුරුෂ සංගමයෙහි නිතරවීම වනාහි නීතිවිරෝධි අති නින්දිත ක්‍රියාවකැයි මෙතුමා විසින් ප්‍රකාශ කර තිබේ. පැන්සයේ තැපැල් මුද්දර නියමය වලංගුවීම හා කොළඹ සහ ගාල්ලේ අතරේ විදුලිකම්බියක් දැමීමත් මේ උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලයේ දී සිද්ධි වයි. මේ ලකිසුරාණන් පුදුම ශරීර ශක්තියක් ඇතුව තිබුණ බව හා එතුමා සංචාරණය නොකළ එකම පළාතකුදු ලංකාවේ නැති බවද ප්‍රකාශ විය. මේ ආණ්ඩුකාරතුමාට ප්‍රථමයෙන් ලංකාව ආණ්ඩුකළ ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ සැකසුරුවම් කමින් රැස් කර තිබුණ ආණ්ඩුවේ භාණ්ඩාගාරයේ මුදල් වලින් ද, මුතු පර වලින් ලැබුණ ආදායමින් ද, රාජසන්තක ඉඩම් විකිණීමෙන් ලැබුණ මුදලින් ද, වෙනත් අවුරුදු පතා ලැබුණ බලාපොරොත්තු නූන තරම් ආදයම් වලින්ද මේ කාලයේ ආණ්ඩුවේ මුදල් භාණ්ඩාගාරය අතිශයින් සමෘද්ධිමත් භාවයක රඳා තිබුණේ ය. වර්ෂ 1860 ක් වූ ජූනි මස 30 වෙනි දින වෝර්ඩ් උතුමාණන් වහන්සේ මද්‍රාසියේ ආණ්ඩුකාර ධූරයට පත්ව ඉන්දියාවට ගියේය. එදින යුද්ධ සේනාධිපති මේජර් ජනරල් හෙන්රි ප්‍රේඩ්‍රික් ලොකයර්තුමා උපාණ්ඩුකාර තැනමෙන් ලංකාඩුව භාර ගත්තේ ය. මෙයින් මසකට පසු එතුමා ද ආබාධිත වීමෙන් සිය රටට යන්ට ගියේය. එවක් පටන් දෙමස් විසිඑක දවසක් අභිනව ආණ්ඩුකාරතුමා පැමිණෙන තුරු කර්නල් චාර්ල්ස් ඇඩ්ටන් විල්කින්සන් තුමා ලංකාව ආණ්ඩු කෙළේ ය.

Non-Commercial Distribution

# සර් චාර්ල්ස් ජස්ටින් මැකාර්ති උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය

## ක්‍රි. ව.1860-1863

ලංකේශ්වරව සිටි ටොරිංටන්සාමිගේ ඔඩිටර් ජනරල් තැනමෙන් සිටි, ලංකාණ්ඩුකාර ධූරයෙහි දෙවරක්ම නියුක්තව ක්‍රියා කල සර් චාර්ල්ස් ජස්ටින් මැකාර්ති උතුමාණන් වහන්සේ වර්ෂ 1860 ක් වූ අගෝස්තු මස 4 වෙනි දින ලංකාවේ ආණ්ඩුකාරයාමෙන් පත් කරනු ලැබ එම අවුරුද්දේම ඔක්තෝබර් මස 22 වෙනි දින ලක්දිවයිනට සැපැමිණියේ ය. එතුමාගේ ආණ්ඩු කාලයේ දී විවාද සහිතව පැවතුණේ ප්‍රධාන කාරණය නම් :- කොළම සිට මහනුවර දක්වා තැනීමට ආරම්භ කරන ලද ධූම රථ මාර්ගයක් විය. එය ආණ්ඩුව සන්තක දුම්රිය මාර්ගයක් කරගත යුතු ද එසේ නොව රේල්වේ කොම්පැනියකට පැවරිය යුතු ද යන්න ගැන නීතිදායක මන්ත්‍රණ සභාවේ විවාද කොට ඒ ප්‍රශ්නය තීරණය කිරිමට විශේෂ සුළු සභාවයකට භාර දෙන ලදී. යථොක්ත සභාව විසින් දුම්රිය මාර්ගයේ අයිති වාසිකම ආණ්ඩුව තබාගත යුතු යයි සම්මත කරන ලද්දේ ය. මේ ප්‍රඥාවන්ත තීන්දුව හේතු කොට ගෙන වර්ෂයක් පාසා වාරි ප්‍රවාහයක් මෙන් විශාල ආදායමක් උපදවන මේ මාර්ගය ආණ්ඩුවට හිමිවිය. යථොක්ත දුම්රිය මාර්ගය තනාදීමට පවුන් 22,14,000 ක් රේල් වේ කොම්පැනියක් විසින් ඉල්වන ලද්ද නුමුත් පසුව එය ආණ්ඩුවේ පරිපාලනය යටතේ තැනවීමෙන් වියදම් වූ ගණන පවුන් 12,85,000 ක් පමණකි. තවද රිපන් නමැති දුම්නැවෙන් ලංකාවේ සිට එංගලන්තයට පිටත්ව ගිය යුද්ධ සේනාධිපති ලොකර්යර් තුමාද, කොළඹ රෝමානු කතෝලික බිෂොප් පදවිය දරු බ්‍රැව් සාමිද සුප්‍රසිද්ධ පෘථිවි ශාස්ත්‍රඥවරයෙක් වූ ආකාර්ය කැලාර්ට් මහතා ද යන තිදෙන මුහුදු ගමනේ දී කාලක්ෂය කළෝය යන දුක්ඛදායක ප්‍රවෘත්තිය වර්ස 1860 ටේ අවශාන භාගෙයේ දී ලංකාවට දැන ගන්ට ලැබුණේ ය.

මැකාර්ති උතුමාණන් වහන්සේගේ ආණ්ඩුකාලයේ දී ඉඩම් ලියා පදිංචි කර ගැනීම ඉඩම් බෙදා වෙනස් කිරීම සහ විවාහ සම්බන්ධවත් අණ පණත් තුනක් පණවන ලද්දී ය. වර්ෂ 1862 කේ දී ලංකාලෝකය නම් පළමුවෙනි සිංහල පත්‍රය ගාල්ලේ ආරම්භ කරන ලද්දේ ය. නුමුත් රටේ පරිචය නොවූ මේ ක්‍රමය නිසා දායක පිරිසගේ අධෛර්මත් භාවයෙන් එම පත්‍රය නොබෝකලකින් අත් හිටවීමට සිද්ධ විය. ඊට පසු වර්ෂ 1862 කේ දී ලක්මිණි පහණ ද 1863 නේ දී ලක්රිවි කරණ ද සුප්‍රසිද්ධ පණ්ඩිතවරු දෙදෙනෙකුගේ කතෘවයෙන් පටන් ගන්නා ලදි.

Non-Commercial Distribution

මැකාර්ති උතුමාණන් වහන්සේ වනාහි නානා ශාස්ත්‍රධාරී ව්‍යක්ත පණ්ඩිවරයෙකි. මේ කාලය තුලදී එතුමා ගිලන් බවට පැමිණීමෙන් වර්ෂ 1863 දී විශ්‍රාමය පිණිස අවසර ලබා ගෙන යුරෝපයට ගොස් සිට වර්ෂ 1864 දී බැල්ජියම් ප්‍රදේශයෙහි වූ ස්පානගරයේ දී කතාශේෂ බවට පැමිණියේ ය. වර්ෂ 1863 ක් වූ දෙසැම්බර් මස පළමුවෙනි දින පටන් 1865 ක් වූ මැයි මස පසළොස්වෙනි දින දක්වා මේජර් ජනරල් ජේම්ස් ඕබ්‍රයින් උත්තාසේ උපාණ්ඩුකාර තැනමෙන් මෙම දිවයින ආණ්ඩු කෙළේ ය. මෙතුමාගේ ආණ්ඩු කිරීමේ කාලය ලඝු වූවත් එය වියවුල් සහිතව පැවැත්තේ ය. ලංකාවේ යුද්ධ හමුදාවේ නඩත්තුව සඳහා වර්ෂයක් පාසා පොදු ආදායමෙන් විශාල මුදලක් වෙන් කිරීම ගැන යූරෝපාකාර සහ සිංහල සියලුම නිලනොලත් මන්ත්‍රීවරු විරුද්ධ වී නීතිදායක මන්ත්‍රණ සභාවේ විවාද සහිතව තර්ක කොට එයිනුදු සහනයක් නුවූයෙන් ඔව්හු ස්වකීය මන්ත්‍රි ධූරවලින් ඉල්ලා අස්වූවෝ ය. මේ අයුතු බලාත්කාර අය කිරීම ගැන ලක්වැස්සෝ එක හෙලා නොමනාපයට පැමිණියේ ය. කොළඹ සහ මහනුවරත් ප්‍රසිද්ධ රැස්වීම පවත්වා වර්ෂ 1865 හේ ජනවාරි මාසේ දී එවකට ප්‍රදේශභාර මහ අමාත්‍ය ධූරය දරූ අති ගෞරවාර්හි ඇජ්වර්ඩ්කාඩ් වැල් තුමාට අයදුම් පතක් වන ලදහ. ලංකාවේ පළමු වෙනි වරට විශේෂ දුම්රියක් දුවවන ලද්දේ වර්ෂ 1864 රේ දෙසැම්බර් මස 27 වෙනි දිනය දීය. මේ වනාහි දෙවෙනි ලියපෝ ල්ඩ් නමින් බැල්ජියමේ රජ බවට පැමිණි පබ්බෑන්ට්හී ආදිපාදයාණන් රැගෙන කොළඹ සිට අඹේපුස්ස දක්වා දුවන ලද විශේෂ ධූමරථයත් වන්නීය. ඊළඟ අවුරුද්දේ මාර්තු මාසේ දී කොළඹ පමණක් ජන ලේඛනය ගන්නා ලදී. ඊළඟ අවුරුද්දේ කොළඹ ගෙවල් 9,887 ක් තිබෙන බව හා පදිංචිකාරයන් 5, 664 දෙනෙක් සිටින බවත් දූන ගන්ට ලැබුණේ ය.

## සර් හර්කිව්ලස් ජෝර්ජ් රොබර්ට් රොබින්සන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව.1865-1872

වර්ෂ 1865 හේ මාර්තු මාසේ දී රොබින්සන් උතුමාණන් වහන්සේ උපාණ්ඩුකාර ධූරයට පත් විය. එම අවුරුද්දේ මැයි මස 16 වෙනි දින එතුමා ලංකාණ්ඩුකාරයා හැටියට දිව්රවනු ලැබුවේ ය. යුද්ධ හමුදාවේ වියදම පිණිස බරපතල මුදලක් අය කිරීම නිසා නීතිදායක මන්ත්‍රණ සභාවෙන් ඉල්ලා අස්වෙන ලද දක්ෂ විචක්ෂණ මන්ත්‍රී වරයන් වෙනුවට මේ කාලයේ තෘණ කලාපයන් බඳු පඹයන් වැනි දුර්වල මිනිසුන් තෝරා ගනු ලැබ සිටියෝ ය. අස් වෙන ලද මන්ත්‍රිවරු වනාහි වර්තමානයෙහි පවා සොයා ගැනීමට දුර්ලභ රාජ්‍ය පරිපාලක නීතියෙහි විසාරද බුද්ධිමත්

Non-Commercial Distribution

වාක්චතුර්ය සම්පන්න භවත්හු වන්නා හ. ඒ උතුමාන්ගේ ප්‍රධානියා වූ ජෝර්ජ් වෝල් මහතා විසින් වර්ෂ 1865 ක් වූ මැයි මස 16 වෙනි දින ආණ්ඩු ක්‍රමය සම්බන්ධව සිලෝන් ලිග් නමැති සංගමයක් පිහිටුවන ලදී. යථෝක්ත සගමය මගින් එංගලන්තය ආණ්ඩුවට කාරණ දක්වා සිටීමෙන් යුද්ධ හමුදාවේ මුදල බොහෝ දුරට අඩුකරනු ලැබුවා පමණක් නොව, නීතිදායක මන්ත්‍රණ සභාවට මන්ත්‍රීන් තේරීමේ දී ඊට සහභාගීවීමට පිළිවන්කම සහ නානාප්‍රකාර වියදම් සඳහා කොටස් වශයෙන් ආණ්ඩුවේ මුදල් අවුරුදු පතා වෙන් කරන විට ඊට මැදහත්ව ක්‍රියා කිරීමේ බලයත් ලාංකියන්ට දෙන ලද්දේය. ලංකාණ්ඩුවේ කටයුතු පිළිබඳ පරීක්ෂණයක් කිරීමට පාර්ලිමේන්තුවේ සාමාජිකයන් ගෙන් යුත් සභාවක් පත් කරන ලෙස යථෝක්ත සංගමය විසින් ප්‍රදේශ භාර මහාමාත්‍ය තැන්පත් අති ගෞරවාර්හි ඇඩ්වර්ඩ් කාඩ්වැල් තුමා ගෙන් ඉල්වන ලද්දේවී නුමුත් රොබින්සන් උතුමාණ වහන්සේ සහ ස්වකීය නීතිවේදි අනුශාසකයෙක් වූ සර් රිචර්ඩ් මෝර්ගන්තුමාගේත් ඊට පැවති විරුද්ධතාවය නිසා ඒ අයදීම ප්‍රතික්ෂේප කරනු ලැබීය. රොබින්සන් උතුමාණන් වහන්සේ බොහෝ ප්‍රස්තාවයක් හිදී සංගමයට විපක්ෂව ක්‍රියා කිරීම ලංකවාසී උගත් ජනයාගේ අප්‍රසාදයට හේතු පියත පළමුවෙන් වර්ෂ 1865 හේ දී කොළඹ මහ මහනුවරටත් ඊට පසු ගාල්ලේත් නාගරික සභා ප්‍රතිෂ්ඨාපනය කීරීම වෝල් මහතා විසින් පිහිටුවන ලද සංගමේ ව්‍යාපාරයන්හි ප්‍රතිඵලයයි කිව හැකි වේ. රොබින්සන් උතුමාණන් වහතසේ ආණ්ඩු ක්‍රමය පිළිබඳව ඇතැම් ප්‍රස්තාවන්හි දී ජන ප්‍රධානින්ගේ අදහස් වලට නොනැමී ක්‍රියා කරනලද්දේ වී නුමුත්, සාමාන්‍යයෙන් ලංකාවාසී මහජනායගේ සුභ සිද්ධිය අරයා උන්නදු භාවයෙන් වැදගත් කටයුතු රාශියක් කළ උතුමෙකි. වර්ෂ 1867 දි කොළඹ සහ මහනුවරත් අතරේ දුම්රිය ගමනාගමනය ආරම්භකරන ලදී, මෙයින් ඇති වූ පහසුකම් හේතු කොට ගෙන උඩරට පළාතේ කෝපී වැවීම විශාලව හා සීඝ්‍ර ලෙස කර ගෙන යාමෙන් ආණ්ඩුවේ භාණ්ඩාගාරයට මහත් මුදල් ගණන් එකතු වෙන්ට වන. ඒ කාරණයෙන් ධෛර්යට පැමිණි මෙතුමා උඩරට දුම්රිය මාර්ගය ගම්පළ සහ ක්‍රමයෙන් නාවල පිටිය දක්වාද සැතැප්ම දහ හතකන් දීර්ඝ කරනලදී. වර්ෂ 1869 යේ දී යුරෝපීන් විසින් පමණක් වවන ලද කෝපි වතුවල ප්‍රමාණය අක්කර 1,760000 ක් විය. මේ වර්ෂයේ දී කොළඹ වරාය සුරක්ෂිත කරනු පිණිස රළවේග වළකාලීමට බැඳි බ්‍රෙක් වෝටර් නම් මුහුදු ප්‍රකාරය බැඳීමට මේ උතුමාණන් වහන්සේ විසින් යෝජනා කරන ලද්දේ ය. වර්ෂ 1868 වේ ස්වල්ප කාලයකට නිවාඩු ලබා ගෙන රොබින්සන් උතුමාණන් වහන්සේ එංගලන්තයට ගියේය. ඒ කාලයේ දී මේජර් ජනරල් ස්ටඩ් හෝම් හොඩ්සන්තුමා ලංකාණ්ඩුකාර ධූරයෙහි වැඩ බැලුවේ ය. මේ වැඩ බැලීමට පත් ආණ්ඩුකාරතුමා විසින් මහනුවර පිහිටුවන ලද හෙන්රි වෝර්ඩ් උතුමාණන් වහන්සේ ගේ ප්‍රතිමාරූපය ප්‍රකාශයට

Non-Commercial Distribution

පමුණුවන ලදී. මේ උත්සව අවස්ථාවේ දී ජෝර්ජ් වොල් මහතා විසින් පිහිටුවන ලද ලංකා එක්සත් සංගම යේ සභිකයන් විසින් රොබින්සන් උතුමාණන් වහන්සෙසෙගේ ආණ්ඩු ක්‍රමයට ආදර්ශයක් පානු පිණිස ප්‍රීති උද්ඝෝෂණයක් පවත්වන ලදී. වර්ෂ 1869 යේදී යුද්ධ හමුදාවට බැරැක්ක නම් වූ හේවා මඩම් තනන පිණිස කොළඹ ඕලන්දක්කාරයන්ගේ කොටුබැම්ම බිඳ හෙලීමට පටන් ගන්නා ලද්දේ ය. මේ අවුරුද්දේ දී කොළඹ මදුරාසි බැංකුව පිහිටුවන ලදී. ඉගැන්වීමේ කටයුතු කිරීම පිණිස පත් කර තිබුණ සැන්ට්‍රල් ස්කූල් කොමිෂන් නම් සභාව අත්හිටවන ලදුව ඒ වෙනුවට ප්‍රසිද්ධ ඉගැන්වීමේ අධ්‍යක්ෂ යන නමින් නිලධාරියෙක් පත් කරන ලද්දේ ය. වර්ෂ 1870 වේ දී කොළඹ වෛද්‍ය ශාස්ත්‍ර ශාලාව පිහිටුවන ලදී. එහි ආරම්භක අධ්‍යක්ෂක තැන ප්‍රධාන සිවිල් වෛද්‍ය මුලාදෑනි තැනමෙන් කලක් වැඩබැලූ දොස්තර ලෝස් මහත්මයා බව දත යුතු ය. පාඨ ශාලා පිළිබඳ දූනට පවත්වා සාමාන්‍ය ව්‍යවස්ථාව වර්ෂ 1869 යේ දී වලංගු කරන ලදී. වර්ෂ 1870 වේදී වික්ටෝරියා මහරාජිනින්ගේ ද්වීතිය පුත්‍ර ඇඩින්බර්ග්හි ආදිපාදයාණෝ ප්‍රදේශ සංචරණය පිණිස යන ගමන් ලංකාවට ද සම්ප්‍රාප්ත වූයේ ය. ලක්වැස්සන් විසින් එතුමා මහත් ගෞරවයෙන් පිළිගනු ලැබ, එතුමාගේ ප්‍රීති ආස්වාදය සඳහා ආණ්ඩුව විසින් ලබුගම් කන්දේ ඇත්ගාල් කිරීමක් ද පවත්වන ලද්දේ ය. සාමාන්‍යයෙන් හෙළදිව් වැස්සන්ගේ හිතෙෂි යෙක් වු පරෝපකාරි වැඩ රාශියක කර තිබෙන චාර්ල්ස් හෙන්රි ද සොයිසා මන්ත්‍රීතුමා විසින් යථොක්ත ආදිපාදයාණන් වහන්සේට රාත්‍රි භෝජනයකින් ඇල්ප්‍රෙඩ් හවුස් නම් සිය නිවසේ දී සංග්‍රහයක් කරන ලදී. වර්ෂ 1824 දී බාර්න්ස් උතුමාණන් වහන්සේ ගේ ආණ්ඩු කාලයේ දී ලංකාවේ ජනගහනය ගණන් ගනු ලැබීය. ඒ කාලයේ දී වැසියෝ 8,51,400 දෙනෙක් සිටියෝ ය. නුමුත් මේ ආණ්ඩුකාරතුමාගේ කාලය තුළ වර්ෂ 1871 දී ආරම්භ කරනු ලැබූ දසවසකට වරක් බැගින් ක්‍රමානුකූලව ජනලේඛන සටහන් කිරීමේ හැටියට ඒ වර්ෂයේ දී දිවයිනේ 24,03,766 දෙනෙක් විසූ බව කියා තිබේ.

තවද මේ වර්ෂයේ දී සුලු වියවුල් බේරා ගැනීම පිණිස ලක් දිව නොයෙක් පළාත් වල පෞරාණික ක්‍රමයන්ට අනුව ගම්සභා පිහිටුවන ලදී. වර්ෂ 1872 කේ දී රුපියල් ශත ව්‍යයහාරය මෙහි වලංගු විය වර්ෂ 1872 කේ ජනවාරි මස 4 වෙනි දින රොබින්සන් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරයෙන් අස්ව ඕස්ත්‍රෙලියාවේ නිව් සවුත් වේල්ස් නම් රටේ ආණ්ඩුකාරකමට පත්ව ගියේ ය. එවක් පටන් අභිනව ආණ්ඩුකාර තුමා පැමිණෙන තුරු හෙන්රි ජේම්ස් අර්වින් උන්නාසේ උපාණ්ඩුකාර තැනමෙන් දෙමසක් ලංකාව ආණ්ඩු කෙළේ ය.

Non-Commercial Distribution

# අති ගෞරවාර්ථ සර් විලියම් හෙන්රි ග්‍රැගරි උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව.1872-1877

වර්ෂ 1872 කේ මාර්තු මස 4 වෙනි දින ඉතා ගරු කටයුතු සර් විලියම් හෙන්රි ග්‍රැගරි උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාරකමට පත්විය අයිරිෂ් ජාතික ශාස්ත්‍රඥයෙක් වූ මෙතුමාගේ ලංකාගමනය හෙළිදිවි වැස්සන්ගේ භාග්‍ය සම්පන්න වූ කාලයෙහි ප්‍රාරම්භය වූයේ ය. මෙතුමා මෙහි උපගතවීමට ප්‍රථම එංගලන්තයේ මහ ජනමන්ත්‍රී සභාවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්ව සිටි බැවි මෙතුමාට දේශපාලනය සම්බන්ධව මනා පටුත්වයක් ඇතිව තිබුණේ ය. බ්‍රිතාන්‍ය අග්‍ර රාජ්‍යයට අයත් ප්‍රදේශයක වැසියන්ගේ සිත් දිනා ගත හැකි ආණ්ඩුකාරයෙකුට සතුව තිබිය යුතු සියලුම ගුණාංග මෙතුමා කෙරහි විද්‍යාමාන විය. මෙතුමා විසින් නුවර කලාපීය ප්‍රදේශය උතුරු මධ්‍යම පළාත යන නමින් වෙන්කොට එහි ඒජන්ත ධූරයට පසු කාලයක දී සයිප්‍රස් නම් දිවයිනෙහි ආණ්ඩුකාරයාමෙන් පත්ව ගිය ජේද්‍රික් ඩික්සන් මහතා පත් කරනලද්දේ ය. ශිෂ්ටාචාර උගත් ලෝකයා අතරේ විෂ්මය එලවන සුළු වූ දූනට ජීර්ණ භාවයට පත්ව තිබෙන අද්භූත ගොඩනැගිලි රාශියකින් ප්‍රතිමණ්ඩිත සෞගත මයිකයන්ගේ සුද්ධ නගරය වූ අනුරාධපුරය මේ අභිනව පළාතේ අගනුවර කරන ලදී. ක්‍රිස්තු වර්ෂයට අවුරුදු 437 කට පෙර පණ්ඩුකාභය මහරජතුමා ස්වකීය රාජධානිය කොට ගෙන විසූ මෙම අනුරාධපුර නම් ශ්‍රේෂ්ඨ නගරයට පෙර පැවති අලංකාරය සහ තේජසත් ප්‍රකෘතිමත් ස්වභාවයකට ගෙන ඊමට ග්‍රැගරි උතුමාණන් වහන්සේ විසින් කටයුතු ආරම්භ කරන ලදී. මෙම නගරයේ අත්‍යාලංකෘත කර්මාන්තයක් තිබුණ, මීට ශත වර්ෂ පසළොසකට පමණ ප්‍රථම ධාතු සේන නරේන්ද්‍රයාණන් විසින් කරවන ලද කලා වැව සහ යෝධ ඇළ මේ උතුමාණන් වහන්සේ විසින් පවුන් 40,000 ක් පමණ වියදම් කොට ප්‍රකෘතිමත් කරවන ලද්දේ ය. ලංකාවේ සාරවත් භූමිය කෝපි වැවීමට වඩා තේ වැවීමට යෝග්‍ය බවද, ලයිබීරියන් කෝපි ඉන්දියා රබර්, සිංකෝනා කොකෝවා, සහ තේ ආදී ගස් වර්ග වැවීමෙන් මේ ද්වීපයේ සමෘද්ධත්ව අතිශයින් දියුණු කළ හැකි බවද මේ උතුමාණන් වහන්සේ මෙහි පැමිණි අමන්ද කාලයකින්ම මොනවට අවබෝද විය මෙකී වැවිලි වර්ග වැවීමට මෙතුමා වැසියන්ට බොහෝ සෙයින් අනුබල දෙන ලද්දේ ය. උන් වහන්සේ ලංකාවට පැමිණි වර්සයේ දී මෙහි අක්කර 500 ක් පමණ සිංකෝනා වවා තිබුණ නමුත්, 1877 දී එතුමා ලංකාවෙන් ඉවත්ව යන විට වවා නිම වූ සිංකෝනා වතු වල ප්‍රමාණය අක්කර 6,000 පමණ වියයි කියා තිබේ. ජාපනය, ත්‍රිකණාමලය ආදී පළාත් වලට අතුරු පාරවල්

Non-Commercial Distribution

දෑමීමට සහ බන්ධනාගාරවල සනීපාරක්ෂාව සඳහාත් පොදු ආදායමින් මහ මුදලක් මෙතුමා විසින් වියදම් කරන ලද්දේ ය. කොළඹ කෞතුකාරගාරය ගොඩ නැගීම කොළඹ නගරය ගෑස් එළියෙන් ආලෝක කිරිම කලුතර දක්වා මුහුදුබඩ ධූමරථ මාර්ගය ආරම්භ කිරීම යනාදිය මේ උතුමාණන් වහන්සේ ගේ ආණ්ඩු කාලයේ දී සිද්ධ විය. මේ ලකිසුරුතුමා විසින් පෞරාණික ශිලා ලේඛනයන් ඉංග්‍රීසියෙන් පිටපත් කොට තැබීම ගැන සහ ප්‍රාචීන භාෂාවන්ගේ අභිවර්ධනය සඳහාත් මහත් පරිශ්‍රමයක් දරන ලදී.

වර්ෂ 1873 නේ දි ත්‍රිපිටක වාර්ශවරාචාර්ය සිප් කඩුවේ ශ්‍රි සුමංගල මහානයක ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් ලෝක ප්‍රසිද්ධ විද්‍යෝදය පිරිවෙන නමින් මහා ප්‍රාචින විද්‍යාලය ද, වර්ෂ 1875 හේ දී රත්මලානේ ශ්‍රි ධර්මාලෝක ස්ථිවරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ද පිහිටුවන ලදී. මේ පිරිවෙන් දෙක කරණ කොට ගෙන පෙරදිග භාෂා ශාස්ත්‍ර සම්බන්ධ ලංකාවේ මහත් දියුණුවක් ඇති විය. ස්වර්ගස්ථ වී වදාළ පිරිවෙණාධිපති මාහිමියන් වහන්සේගේ විද්‍යෝදය ලෙව් සසුන් දෙකටම ඇති වූ අර්ථ සිද්ධී ප්‍රමාණ කළ නොහෙයි උන්වහන්සේ ගෙන් ශාස්ත්‍ර ග්‍රහණය ලැබූ ගිහි පැවිදි ශිෂ්‍යයෝ දහස් ගණන් වෙති ප්‍රව්‍රජිත ශිෂ්‍යයෝ ඒ ඒ ස්ථාන වල ශාඛා පිරිවෙන් පිහිටුවා ලෝක ශාසන සංග්‍රහයෙහි නියුක්තව සිටින්නෝ ය.

තවද වර්ෂ 1875 හේ දෙසැම්බර් මස පළමුවෙනි දින නැසී ගිය සත්වෙනි ඇඩ්වර්ඩ් මහාරාජොත්තමයාණන් වහන්සේ වේල්ස්හි කුමාර පදවිය දරන කාලයේ දී ලංකාවට සම්ප්‍රප්ත විය. ඒ ප්‍රස්තාවයේ දී කොළඹ සහ මහනුවරත් උන්වහන්සේ පිළිගැනීමේ දී මහත් උත්සව පවත්වන ලදි. මේ රාජකුමාරයාණන් විසින් කොළඹ වරායේ බ්‍රේක්වෝටර් නම් මුහුදු ප්‍රාකාර බැම්මේ මුල් ගල තබන ලද්දේ ය. ලබුගම කන්දේ සිට කොළඹ වතුර සැපයීමේ ජල වල කර්මාන්ත මේ ආණ්ඩුකාරතුමා විසින් ආරම්භ කරන ලද්දකි. ලංකාව බ්‍රිතාන්‍ය ආණ්ඩුවට අත්පත් වූවාට පසු ඉතාමත්ම විශාල ආදායම ලැබුණේ වර්ෂ 1877 දීය. ඉන් කොටසක් රටේ අභිවෘද්ධිය සඳහා මංමාවත් සහ පාලම් ආදිය තැනීම පිණිස මේ උතුමාණන් වහන්සේ විසින් වියදම් කරන ලදී. ආණ්ඩුවේ නිලධාරීන් ගේ වැන්දඹු ස්ත්‍රීන්ට ද අනාථ දරුවන්ටද පින්පඩි ගෙවීමේ අරමුදල මෙතුමා විසින් ක්‍රමානුකූලය ආරම්භ කරන ලදී.

වර්ෂ 1877 ක් වූ මැයි මස 09 වෙනි දින ග්‍රෑගරි උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරයෙන් අහක්ව සියරට බලා නික්මින. ඊට පසු අභිනව ආණ්ඩුකාර ලොංඩන් උතුමාණ් වහන්සේ පැමිණෙන තුරු සී. ඇම්. ජී.

Non-Commercial Distribution

උපාධි නාමාධාරී ගරු කටයුතු ආතර් හෝ ඒටන් බරව් උතුමාණෝ උපාණ්ඩුකාරයා මෙන් රට ආණ්ඩු කෙළේ ය. ග්‍රැගරි උතුමානණ් වහන්සේ විසින් මෙම දිවයිනට කරන ලද අනේක විධ ප්‍රයෝජනයත් වැඩ රාශිය ගැන කෘතඥ භාවය සමරණය කරනු සඳහා උන්වහන්සේ ගේ ප්‍රතිමා රූපය කොළඹ කෞතුකාගාරය ඉදිරිපිට ලංකාවාසීන්ගේ වියදමින් පිහිටුවන ලදී.

## සර් ජේම්ස් රොබර්ට් ලොංඩන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව.1877-1883

සර් ජේම්ස් රොබර්ට් ලොංඩන් උතුමාණන් වහන්සේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ මෙහෙවර නමැති හිණිමගේ පහළම අඩියේ සිට ක්‍රමයෙන් උසස් බවට පැමිණි උතුමෙකි. එතුමා වර්ෂ 1877 තේ සැප්තැම්බර් මස 2වෙනි දින ගාල්ලට ගොඩබැස 4 වෙනි දින ලංකාවේආණ්ඩුකාරයාමෙන් දිව්රවනු ලැබුවේ ය. මේඋතුමාණන් වහන්සේ ගේ ආණ්ඩුකාලයේ දී කොළ රෝගය සෑදීමෙන් කෝපිවතු විනාශ වෙන්ට පටන් ගෙන රටේ මහත් පරිහානියක් ඇති විය. එහෙත් මේ ආණ්ඩුකාරතුමා විසින් තේ, සිංකෝනා සහ කොකෝවා යනාදී වර්ග මෙහි වවන්ට සැලැස්වීමෙන් කෝපිවතු පාළුවීමෙන් වූ පාඩුව බොහෝ දුරට පිරිමැසී ගියේ ය. මේ උතුමාණන්න් වහන්සේ විසින් කොළඹ කුරුඳු වත්තේ රුපියල් 6,00,000 වියදමින් විශාල උන්මත්තකාරෝ ශ්‍යාලාවක් පිහිටුවනලදී. ඊට වඩා රටට අවශ්‍යමය කර්මාන්ත තිබියදී ඒ ගැන සැලකිමක් නොකොට යථොක්ත උන්මත්ත ශාලාවසැදිවීම ගැන ඇතැම් බුද්ධිමතුන් විසින් එතුමාට දෝෂාරෝපණය කරනලදි. වර්ෂ 1878 වේ දී ලංකාවේ සිවිල් නිල ධෘරීන්ගේ පඩි වැඩි කරනලදී. ඒ කරණ කොට ගෙන ලංකාණ්ඩුකාර යාණන්ගේ වැටුප් ද අවුරුද්දකට රුපියල් අ10,000 ක් වැඩි විය. ලංකාවේ සිංහල ජනයා වෙනුවෙන් නීතිදායක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රී ධූරයක් දැරුවා වූ ද, පූර්වාපරදිග භාෂාවන් පිළිබඳ විශාරදෙ පටුත්වයක් ඇති කවීශ්වරයෙක් හා ග්‍රන්ථ කර්තෘවරයෙක් වූ ද ගරු කටයුතු ජේම්ස් ද අල්විස් අද්වකාත් තුමා වර්ෂ 1878 වේ ජුලි මස 8 වෙනි දින කථාශේෂභාවොප ගත විය.

Non-Commercial Distribution

වර්ෂ 1879 යේ දී ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක තැන්පත් චාර්ල්ස් බ්‍රෑස් මහතා විසින් සම්පාදනය කරන ලද ආණ්ඩුවෙන් ආධාර ලබන පාඨශාලා සම්බන්ධ ව්‍යයස්ථා පොතක් ආණ්ඩුවට පිළිගන්වන ලද්දේ ය. වර්ෂ 1881 කේ දී ලොංඩන් උතුමාණන් වහන්සේ ගේ ප්‍රතිෂ්ඨාධාරය හා වේල්ස්හි රාජකුමාරයාණන්ගේ ගෞරවාර්හි කර්නල් පදවිය යටතේ ද ලංකාවේ වොලන්ටියර් යුද්ධ හමුදාව පිහිටු වන ලදී. මේ ආණ්ඩු කාලයේ දී නාවල පිටියේ සිට නානුඔය දක්වාද මහනුවර සිට මාතලේ දක්වාද, පානදුරේ සිට කළුතර දක්වා ද දුම්රිය මාර්ගය දීර්ඝ කරන ලද්දේ ය. වර්ෂ 1881 කේ දී ගන්නා ලද ජනලේඛනයේ හැටියට මේ දිවයිනේ ජනගහන 27,05,576 දෙනෙක් පදිංචිකාරයෝ සිටියාහ. මේම් ජනලේඛන දෙක සන්සන්දනය කර බලන විට මේ කාලයේ පදිංචිකාරයෝ 3,52,953 දෙනෙක් දස අවුරුද්ද ඇතුළත වැඩිවී සිටි බැව් පෙනේ. වර්ෂ 1881 කේ දී නීතිදායක මන්ත්‍රණ සභාවෙන් පණවන ලද ව්‍යවස්ථාවකින් එංගලන්තය සභාවේ බිෂෝප්තුමාට සහ සමහර දේවගැතිවරුන්ටත් ආණ්ඩුවෙන් පඩි ගෙවීම නවත්වනලදී, මේ වර්ෂයේ දී සීමාසහිත නැෂනල් බැන්කුව පිහිටුවන ලද්දේ ය.

තවද මිසර දේශය කැරැල්ලට සම්බන්ධ වූ අරාබිපාෂා සහ තවත් කැරලිකරුවෝ කීපදෙනෙක් වර්ෂ 1883 නේ දී හිරභාරයේ ගෙනවුත් ලංකාවේ නවත්වනු ලැබුවෝය. ඔවුන් අතුරෙන් කීපදෙනෙක් මෙහිදී නැසීගියහ. මේ අවුරුද්දේ පාස්කු ඉරිදා දවසේ කොළඹ කොටහේනේ පිහිටි දීපදුත්තමාරාම විහාර ස්ථානයට ගෙන එන ලද බෞද්ධ පෙළහරක් සම්බන්ධව බුද්ධාගම්කාරයන් සහ රෝමානු කතෝලිකයන් අතරේත් බලවත් කෝලහාලයක් ආරම්භ විය. ඒ ගැන ප්‍රස්තාවෝචිත නියා ආණ්ඩුව යුහුසුළුව කටයුතු කිරීමෙන් දෙපක්ෂය අතරේ සාමය ඇති කරවා එම අරගලය වැඩිදුර පැතිරයානොදී සංසිඳවන ලද්දේ ය.

වර්ෂ 1833 ක් වූ ජූලි මස 14 වෙනි දින ලොංඩන් උතුමානණ් වහන්සේ ආණ්ඩුකාර ධූරයෙන් අස්ව සියරට ගියේ ය. එවක් පටන් අභිනව ආණ්ඩුකාරතුමා පැමිණෙනතුරු සර් ජෝන් ඩග්ලස්තුමා ලංකාවේ උපාණ්ඩුකාර තැනමෙන් ක්‍රියා කෙළේ ය.

Non-Commercial Distribution

# වංශාධිපති සර් ආතර් හැමිල්ටන් ගෝර්ඩන් (බැරන්ස්ටෑනන්මෝර්) උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය

## ක්‍රි. ව.1883-1890

වර්ෂ 1883 නේ දෙසැම්බර් මස තුන් වෙනි දින, ජී. සී. ඇම්, ජී. ඩී. සී. ඇල්, ජේ, පී. යන උපාධි නාමාධාරීවංශාධිපති සර් ආතර් හැමිල්ටන් ගෝර්ඩන් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුව භාර ගත්තේ ය. මේ අභිනව ආණ්ඩුකාරතුමා එංගලන්තයේ කලක් අග්‍රාමාත්‍ය ධූරය දැරූ ඇබර්ඩීන් හී සිටුතුමා ගේ සිව්වෙනි පුත්‍රයා විය. කේම්බ්‍රිජ් හී ට්‍රිනිටි කොලේජියේ ශාස්ත්‍ර ග්‍රහණය කොට සමර්ථ බවට පැමිණීමෙන් ඇම්. ඒ යන ශාස්ත්‍රධාරි පණ්ඩිත නාමය ද, ඉන් අනතුරුව ඩී. සී. ඇල්. යන පට බැඳි නාමය ද ලැබූ ශාස්ත්‍රඥවරයෙකි. මේ උතුමා කලක් එංගලන්තයේ මහ මාත්‍යව සිටි ලෝක ප්‍රසිද්ධ ගලැඩ්ස්ටන් තුමාගේ රහස් ලේකම් තැනමෙන් හා 1861 කේ දී ඇමෙරිකා වේ නිව් බ්‍රන්ස්වික් පළාතේ උපාණ්ඩුකාර ධූරය ද ඉන්පසු ට්‍රිනිඩෑඩ් දූපතේ ද මොරීෂස් දූපතේ ද පීජි දිවයින් වල ද වරින් වර ආණ්ඩුකාරධූරයට පත්ව ක්‍රියා කළ මහොත්තමයෙකි. මේ උතුමාණන් වහන්සේ විසින් ලංකාරක්ෂක යුද්ධ හමුදාවේ නඩත්තුව සඳහා වර්ෂයක් පාසා ලංකාවෙන් ගෙවිය යුතුව තිබුණ මුදල වූ රුපියල් දශ ලක්ෂය රුපියල් හය ලක්ෂය දක්වා අඩු කරවා ගන්නා ලදි, මෙතුමා මෙහි උපගත වූ නොබෝ කලකින් ඕරියැන්ටල් බැන්කුවේ වස්තු භංගත්වය සිද්ධ විය. ඒ ප්‍රස්තාවයෙ දී ස්ථානොචිත ප්‍රඥා සම්පන්න මේ උතුමාණෝ අභාවයට පත් වූ ඒ බැන්කුවේ නෝට්ටුවල මුදල් ආණ්ඩුව විසින් ගෙවන්ට නිර්භීත ලෙස භාර ගැනීමෙන්, ඒ කාලයේ ලක්වැස්සන් අතර හට ගෙන තිබුණ භීතිය සහ චංචලයත් සම්පූර්ණයෙන් දූරිභූත විය. ඉන්පසු මුදල් නෝට්ටු ආණ්ඩුවේ වගකිම පිට නිකුත් කරනු ලැබීමෙන් අවුරුද්දකට රුපියල් දෙලක්ෂයක් ආදායමක් ආණ්ඩුවට ලැබුණේ ය. මෙතුමා ලංකාවේ ආණ්ඩු කළ අවුරුදු හයහමාර ඇතුළත නීතිදායක මන්ත්‍රණ සභාව විසින් ආඥා පණත් එකසිය හැටතුනක් පණවන ලද්දේ ය. ඒවා අතුරෙන් වර්ෂ 1886 යේ දී පණවන ලද මොහම්මත්කාරයන්ගේ බහු ස්ත්‍රී විවාහ ආඥා පණත ගැන සහ 1889 යේ දී වලංගු බවට පැමිණි විහාර දේවාල ගම් සම්බන්ධ අණ පණත ගැනත් රටේ ක්‍රිස්තු භක්තික උගතුන් අතර විරුද්ධ මත ඇති වූහ. එක පුරුෂයෙකුට බොහෝ ස්ත්‍රීන් සේවනය පිණිස විවාහයට අවකාශ දීමත්, එමෙන්ම බුද්ධාගම ලැදිව ක්‍රියා කිරීමත් ක්‍රිස්තියානි ආණ්ඩුවකට යුතු නොවන බැව් ඔව්හු ප්‍රකාශ කළෝ ය.

Non-Commercial Distribution

තවද සර්වඥයන් වහන්සේගේ උත්පත්තිය සිද්ධ වූ බෞද්ධයන්ගේ වෛශාඛ පෞරාණී දිනය හින්දු සාංවත්සර දිනය සහ මහමදාගම්කාරයන්ගේ හජ්ජි පෙරනාල් උත්සව දිනයත් මේ උතුමාණන් වහන්සේ විසින් ආණ්ඩුවේ විවේක දවස් සංඛ්‍යාවට ගණන්ගනු ලැබීමට නියම කරන ලදී, බුද්ධාගම්කාරයන්ගේ විවාහ සිදු කිරීමට බෞද්ධ විවාහ ලේකම්වරු පත් කරන ලද්දේත් මුන්වහන්සේගේ ආණ්ඩු කාලයේ දී ය. කෘෂි කර්මාන්තය දියුණු කිරීම පිණිස ජරාවාසව තිබුණ වැව් පොකුණු ආදිය ප්‍රකෘතිමත් කිරිමට හා මංමාවත් පාලම් ආදිය සෑදිමත් විශාල මුදලක් වියදම් කිරීම ද, එසේම එසේම බෙන්තොට දක්වා මුහුදු බඩ දුම්රිය මාර්ගය දීර්ඝ කිරිම සහ නානුඔයේ සිට හපුතලේ දක්වා දුම්රිය මාර්ගය ආරම්භ කිරීමත් මේ ආණ්ඩු කාලයේ දී සිද්ධ විය.

වර්ෂ 1886 යේදී මධ්‍යම පළාතෙන් කොටස් වෙන් කොට ඌව පළාත යන නමින් ද, වර්ෂ 1889 යේ දී බස්නාහිර පළාතට සම්බන්ධ කොට තිබුණ පුරාණ සබරගමු දිසාව සහ කෑගල්ල පළාත ඉන් වෙන් කොට සබරගමු පළාත යන නමින් ද අභිනව පළාත් දෙකක් ගෝර්ඩන් උතුමාණන් වහන්සේ විසින් නියම කරන ලදි, කොළඹ බ්‍රේක්වෝටර් නම් මුහුදු ප්‍රාකාරය ගොඩ නැඟීමේ ගාම්භීර කර්මාන්තය මේ ආණ්ඩුවේ දී නිමාවට පැමිණියේ ය. එවක් පටන් කොළඹ වරායට ලෝකයේ සෑම දිග් භාග වල පිහිටි ප්‍රදේශ වලින්ම නැව් පැමිණෙන්ට වීමෙන් එය පූර්ව දිග නෞකා තීර්යන් අතුරෙන් අතිශය ප්‍රමුඛ ස්ථානය ලෙස ප්‍රකට භාවයට පැමිණියහ.

වර්ෂ 1889 යේ දී නීතිදායක මන්ත්‍රණ සභාවට උඩරට වැස්සන් සහ මොහම්මදිකයන් වෙනුවෙන් මන්ත්‍රිවරු දෙදෙනෙක් ද අතිරේක වශයෙන් නිලලත් මන්ත්‍රින් දෙදෙනෙක් ද පත් කරන ලද්දෝ ය. ලංකා ද්වීපෙයහි වූ පෞරාණික කර්මාන්ත ප්‍රතිසංස්කාරණයට හා සංස්රක්ෂණය පිණිසත් මේ උතුමාණන් වහන්සේ විසින් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවක් පිහිටුවන ලදී, ලංකාව පිළිබඳ පණ්ඩිත සම්භාවනීය ඓතිහාසික පාළි ග්‍රන්ථයක් වූ "මහාවංශය" නම් ප්‍රකරණයේ, ගරු කටයුතු ජෝර්ජ් ටර්නර් මහතා විසින් කරන ලද ඉංග්‍රීසි පරිවර්තනයෙහි ශේෂව තිබුණ කොටස සම්පූර්ණ කිරීමට කථාශෙෂභාවොපගත සත්දත් ඇල්. සී. විජයසිංහ මුදලි මන්ත්‍රිශ්වරයාණන්ට ආණ්ඩුව විසින් පවරන ලද්දේත් මෙසමයේදී ය. ඉන්දියාවේ පවත්නා පිළිවෙළට අනුව ක්‍රිමිනල් නඩු සම්බන්ධ දණ්ඩ නීතියක් සහ ක්‍රිමිනල් නඩු විසඳීම් ක්‍රම පිළිබඳ ව්‍යවස්ථාවකුත් මේ ආණ්ඩුවේදී වලංගුවට පැමිණියහ. "දී සිලෝන් ලීග්" නම් "ලංකා ජාතික සංගම" යේ ආයාචනාව පරිදි ස්වදේශිකයන්ට උසස් නිලතල ලබා ගැනීමට හැකිවන පිණිස සිවිල් නිලධාරීන්ගේ පහත් පංතිකයක් මේ උතුමාණන්වහන්සේ විසින් ඇති කරන ලදී.

Non-Commercial Distribution

වර්ෂ 1887 ක්වූ ජූනි මස 28 වෙනි දින වික්ටෝරියා අග්‍ර රාජිනියගේ සිංහාසනාරූඪවීමේ පණස්වෙනි සංවත්සරික මංගල්‍යය හෙවත් ජුබිලි උත්සවය ලංකාවේ අත්‍යාලංකාර පරිද්දෙන් පවත්වන ලදී. වර්ෂ 1889 යේදී ගෝර්ඩන් උතුමාණන්වහන්සේගේ ප්‍රිය භාර්‍යාව වූ රාකෙල් ගෝර්ඩන් මැතිනියගේ දුඃඛදායක මරණය සිද්ධ විය. දැනට කොළඹ රාජමන්දිරයට යාබදව උතුරින් පිහිටි "ගෝර්ඩන් ගාර්ඩන්ස්" නමැති ප්‍රියදර්ශනීය උද්‍යානය පවත්නාතුරු ගෝර්ඩන් උතුමාණන් වහන්සේගේ සහ එම ආර්‍යාවගේත් නාමයන් සිහිපත්වනු ලැබේ. මේ උතුමාණන් වහන්සේ විසින් සාමාන්‍යයෙන් ලංකාවාසීන්ට විපුලඵලදායි වැඩ රාශියක්ම ඉෂ්ට කරන ලද්දේ වී නුමුත්, උන්වහන්සේගේ ආශ්‍රයට පැමිණි ඇතැම් ස්වදේශික ආත්මාර්ථකාමී මානාධික නිලධාරීන්ගේ බස් වලට යම් යම් ප්‍රස්තා වල දී කන් යොමු කිරීමෙන් ලංකාවේ සමහර පංති වල ජනයා උන්වහන්සේ කෙරෙහි බෙහෙවින් කල කිරීමට පත්ව සිටි බැව් කියත්.

වර්ෂ 1890 වේ මුල් භාගයේදී ගෝර්ඩන් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරය උපාණ්ඩුකාර නොරල් වෝකර් තුමාට තාවකාලික වශයෙන් භාරදී ලංකාවෙන් නික්ම ගියේය.

## සර් ආතර් ඇලිබැන්ක් හැව්ලොක් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව.1890-1895

වර්ෂ 1890 ක් වූ මැයි මස 28 වෙනි දින සර් ආතර් ඇලිබැන්ක් හැව්ලොක් කේ. සී. ඇම්. ජී. සී. ඇම්. ජී. ජී. සී. ඓ. ඊ උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුකාර ධූරයට පත් විය. මෙතුමා වනාහි එංගලන්තයේ දෙවෙනි කර්නල් ධූරයක් දැරූ ඩබ්ලිව්. හැව්ලොක් උතුමාගේ තුන්වෙනි පුත්‍රයා විය. දේශපාලනය පිළිබඳ මනා පරිචය ඇති මේ තෙමේ ලංකාවට පැමිණීමට ප්‍රථම නොයෙකුත් උසස් තනතුරු දැරූ කෙනෙකි. මෙතුමා වර්ෂ 1862 කෙන් දිලයිට් ඉන්පන්ට්‍රි නම් යුද්ධ හමුදාවේ ධූරයකට පත්ව සිට 1871 කේ දී සරු ඩබ්ලිව්. නොරිස්තුමා ගේ දුහිතෘවූ ඇන් මැතිනිය විවාහ කොට ගත්තේ ය. 1873 නේ දී මොරිෂස් නම් දිවයිනේ ආණ්ඩුකාරයාණ්ගේ රහස් ලේකම් තැන මෙන් ද, 1875 හේ දී පී. ජී. නම් දූපත්හි නීති විධායක මන්ත්‍රී සභාවේ සාමාජිකයෙකු මෙන්ද, 1878 ටේ දී ශාන්ත ලූසියාවේ ආණ්ඩුකාර තැන මෙන්ද, 1881 කේ දී, බටහිර අප්‍රිකාවේ ඉංග්‍රිසීන්ට අයිති ප්‍රදේශයේ ආණ්ඩුකාර ධූරයට ද පත් කරනු ලැබ ඒ ඒ තනතුරු වල කර්තව්‍ය දක්ෂ

Non-Commercial Distribution

පක්ෂ ලෙස ඉෂ්ට කරන ලද්දේ ය. තවද එම අවුරුද්දේම අප්‍රියෙල් මාසේ දී ඉංග්‍රීසි ආණ්ඩුව හා ප්‍රන්ස ආණ්ඩුවත් අතරේ බටහිර අප්‍රිකාවේ මුහුදු කර පළාත පිළිබඳ හටගත් වියවුල අතරේ බටහිර අප්‍රිකාවේ මුහුදු කර පළාත පිළිබඳ හටගත් වියවුල බේරා ගැනීමට පිණිස කොමසාරිස් තැන මෙන් පත් කර යවනු ලැබූ සර් ඒ. මැමින්තුමාට ආධාරකාරයෙකු මෙන් පැරිස් නගරයට පිටත් කර යවනු ලැබීය. එම වර්ෂයේම දෙසැම්බර් මාසයේ දී ලයිබීරියාවට වික්ටෝරියා මහරාජිනිගේ කොන්සල් තැන මෙන් පත් කර යවනු ලැබුවේ ය. 1882 කේ දී සෙයිරාලියෝන් සහ ලයිබීරියාවත් අතරේ දේශ සීමා පිළිබඳ හට ගෙන තිබුණ වියවුල විභාග කොට සංසිදිමකට පමුණු වන ලද්දේ ය. 1884 රේ දී ට්‍රිනිඩෑඩ් හී ආණ්ඩුකාර ධූරයට ද 1885 හේ දී නැටාල් පළාතේ ආණ්ඩුකාර ධූරයට ද, 1887 තේ දී සුලු රටේ ආණ්ඩුකාර ධූරයට ද පත් කරනු ලැබුවේ ය. වර්ෂ 1889 යේ දීවාල් වෙළඳාම නැති කර දමනු සඳහා එක්සත් යුරෝපීය මහ සභාවේ සාමාජිකයකු මෙන්ද බැඳී ක්‍රියා කර තිබේ. මෙසේ දේශපාලනය ගැන යහපත් අවබෝධයක් ඇති මෙතුමා ලංකේශ්වර බවට පැමිණ මෙහි එළඹීම හෙලිදිව් වැස්සන්ගේ බලවත් වාසනාවක් බැව් නොඅනුමාන ය.

පෙර සිංහල නරපතින් කැල පටන් හුවංදිරම් බද්ද නමින් ලංකා ගොවිතැනෙන් ආණ්ඩුවට බද්දක් අය කීරීම නියමව පැවැත්තේ ය. එහෙත් කලින් කල රාජ්‍ය පිළිබඳ හටගත් වියවුල් හේතු කොට ගෙන කෙත්වත් පාලනය බෙහෙවින් පිරිහීමට පැමිණ තිබුණේ ය. මේ නිසා පාරාමුඛව සිටි ගොවියන් ගෙන් ඉංග්‍රීසි ආණ්ඩුවට අයබඳු ගැනීම නිසා බොහෝ වාර වලදි යථොක්ත බද්ද ගෙවා ගැනීමට අපොහොසත් වීමෙන් දුප්පත් ග්‍රාමිකයන්ගේ කුඹුරු සහ වතු පිටින් ආණ්ඩුව විසින් විකුණන ලද ඉන් පීඩාවට පත් අයවලුන්ගේ සංඛාව අපමණ ය. ගෝර්ඩන් උතුමාණන් වහන්සේ ගේ ආණ්ඩු කාලයේ දී මේ වී බද්ද කරණ කොට ගෙන වලපණේ පළාතේ හටගත් දුර්භික්ෂයක් නිසා අනාථභාවයට පත් ගම්වැස්සෝ බොහෝ දෙනෙක් නුවර එළියේ කිසිම ආවරණයක් නැති ශිතාධික තැනිතලා මත්තෙහි ක්ෂුධාවෙන් මිය ගියේ යයි කියා තිබේ.

ලක් වැස්සන්ගේ ප්‍රධානාහාර ද්‍රව්‍යය වූ වීයෙන් බද්දක් අය කිරීමේ අයෝග්‍යතාවය කීපවරක්ම ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් සමග ජන හිත සංගම් වලින් යවන ලද අයදුම් පත් වලින් ද පෙන්වා දුන් නුමුත් ගෝර්ඩන්තුමාණන් වහන්සේ සහිත මීට පෙර සිටි ආණ්ඩුකාරයෝ සමහරෙක් එය අහක් කිරීමට එකහෙලා විරුද්ධ වූහ. එහෙත් හැව්ලෝක් උතුමාණන් වහන්සේ මෙහි පැමිණි නොබෝ කලකින් වී වලින් බද්දක් අය කිරීමට නුසුදුසු බැව් එතුමාට මනාසේ ප්‍රත්‍යක්ෂ විය. මේ ගැන ආණ්ඩුවේ ඇතැම් නිලධාරීන්ගේ

Non-Commercial Distribution

විරුධත්වය පවා ගරු නොකොට ආණ්ඩුකාරතුමා විසින් වර්ෂ 1893 නේදී ප්‍රදේශ භාර මහාමාත්‍ය තැන වූ නවින් පෝර්ජ් සාමිට මේ සම්බන්ධ විස්තර ලියා යවා වී බඳු ආඥා පණත නිෂ්ප්‍රබා කරවන ලද්දේ ය. මේක කර්ශ වූ බද්ද අහක් කරවා ගැනීමට බොහෝ කලක සිට නොපසුබස්නා වීර්යකින් උනන්දුව ක්‍රියා කළේ ලංකාවාසීන්ගේ අසාහය කල්‍යාණ මිත්‍රයෙක්වූ දී සිලෝන් ඉන්ඩිපැන්ඩන්ට් නම් පත්‍රයේ ප්‍රධාන කතෘව සිටි ජෝර්ජ් වොල් මහතා බව කිය යුතු ය. පරාර්ථකාමී උතුමෙක් වූ ඒ මහතාගේ ප්‍රශංසනීය ව්‍යාපාරය ගැන එතුමාට කොබ්ඩන් ක්ලබ් නම් සමාගම ගණනනේ ස්වර්ණමය පදක්කමක් ප්‍රදානය කරන ලදී, හැව්ලොක් උතුමාණන් වහන්සේ ආණ්ඩු කාලයේ දී බෙන්තර පටන් ගාල්ල දක්වා ද, පසු මාතර දක්වා ද මුහුදු බඩ දුම්රිය මර්ගය දීර්ඝ කරන ලදී, 1894 රේ පෙබරවාරි මස 14 වෙනි දින පොල් ගහ වෙල සිට කුරුණෑගල දක්වා ශාඛා දුම්රිය මාර්යක් දෑ එම අවුරුද්දේ සැප්තැම්බර් මස 3 වෙනි දින කඳුකර දුම්රිය මාර්ගය බණ්ඩාරවෙල දක්වා ද විවෘත කරන ලද්දේ ය.

වර්ෂ 1892 කේ දී හත්වෙනි ඇඩ්වර්ඩ් මහ රජගුමාගේ දෙටුපුත් කුමරු වූ කලැරැන්ස්හි ආදිපාදොත්තමයාගේ මරණය සිද්ධ විය. අනාගතයෙහි ස්වකීය රජු මෙන් සලකනු ලැබීමට සිටි මේ කුමරහුගේ අකාල අභාව ප්‍රාප්තිය ගැන ලක් වැස්සෝ බෙහෙවින් ශෝක සන්තාපයෙහි ගැලුණ හූය. මේ වර්ෂයේ දී චාර්ටර්ඩ් බැන්කුව සහ හොංකොං සහ ෂැංහෙයි බැන්කුවත් කොළඹ පිහිටු වන ලදී, වර්ෂ 1895 හේ මැයි මස 24 වෙනි දින කොළඹ අසල කැළණී ගගේ තනන ලද නාගුළුමස් තොට වික්ටෝරියා පාලම නම් අයෝම සේතු බන්ධයේ වැඩ නිම වූයේය. ඒ හෙයින් වර්ෂ 1824 රේ දී ජනරල් බාර්න්ස් උතුමාණන් වහන්සේ විසින් එහි විවෘත කර තිබුණ පාරු පාලම අහක් කරවන ලද්දේ ය. වර්ෂ 1894 රේ අවශාන බාගයේ දී කොළඹ වරාය වඩා සුරක්ෂිත කරනු පිණිස උතුරු දෙසින් තවත් සිලාමය මුහුදු ප්‍රාකාරයක් බැඳිමට ආරම්භ කොට එහි අත්තිවාරමේ මුල් ගල හැව්ලොක් උතුමාණන් වහන්සේ විසින් තැන්පත් කරන ලද්දේ ය. වර්ෂ 1892 කේ දී ඇමෙරිකාවේ එක්සත් ජනපදයෙහි වූ චිකාගෝ නුවර පවත්වන ලද සමස්ත ලෝක ප්‍රදර්ශනයට නියෝජිතයන් හා බඩු බාහිරාදියත් යැවීමෙන් ලංකාණ්ඩුව සහභාගීව ක්‍රියා කෙළේ ය. වර්ෂ 1893 නේ දී ලක්දිව පස්වසක් මුළුල්ලෙහි හිත වැඩ දායකව ක්‍රියා කල සත්දත් අති ගෞරවාර්බ් විලියම් හෙන්රි ග්‍රෑගරි උතුමාගේ සහ එමෙන්ම ලංකාවට ප්‍රයෝජනවත් වැඩ රාශියක් කරදුන් බොහේ කාලයක් බස්නාහිර පළාතේ ඒජන්ත ධූරය දැරූ සර්. සී. පී. ලෙයාර්ඩඩ් මැතිතුමාගේත් මළ අසුන් අසා ලක් වැසියෝ අතිශයින් ශෝක ප්‍රාප්ත වූහ. වර්ෂ 1895 හේ මුල් භාගයේ දී ආබාධීත ස්ත්‍රීන් සඳහා කොළඹ බොරැල්ලේ පිහිටුවා තිබෙන

Non-Commercial Distribution

ලේඩි හැව්ලොක් හොස් පිටල් නම් හැව්ලොක් ආර්යාවගේ නමින් පිහිටි ආරෝග්‍ය ශාලාවේ අත්තිවාරම් ගල මේ උතුමාණන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලදී. මෙම වර්ෂයේ අගෝස්තු මාසේ දී දැනට රාජ මන්දිරටය අභිමුඛව පිහිටි අභිනව මහ තැපැල් කන්තෝරුවේ ගොඩනැගිල්ලේ වැඩ නිමවී, එහි කටයුතු කිරීම පටන් ගන්නා ලදි, හැව්ලොක් උතුමාණෝ කිසිම පක්ෂ භජනයක් හෝ වර්ණ භේදයක් හෝ නොසලකා සකල ලංකාවාසීන්ටම වැඩදායක වනපරිදි පස්හවුරුදු පස්මසක් ප්‍රමුඛ අවංකාශයකින් යුක්තව ලංකාව ආණ්ඩු කෙළේ ය. එපමණකුදු නොව ලංකාවේ අවශේෂ යුරෝපීය නිලධාරීන් විසින් ආදර්ශයට ගත යුතු පිරිසිදු වූ ශික්ෂිත ජීවිතයක් ද මෙහිදී ගත කරන ලද්දේ ය. වර්ෂ 1895 ක් වූ සැප්තැම්බර් මාසේදී එතුමා ස්වධූරයෙන් තුරන්ව මදුරාසියේ ආණ්ඩුකාර ධූරය ලැබ ලංකාවෙන් නික්ම ගියේය. එවක් පටන් අභිනව ආණ්ඩුකාරතුමාගේ සම්ප්‍රාප්තිය දක්වා උපාණ්ඩුකාර සර් ඇජ්වයවර්ජ් නොරල් වෝකර් ලංකාණ්ඩු ධූරයෙහි නියුක්ත විය.

## අති ගෞරවාහී සර් ජෝසප් වැස්ට් රිජ්වේ උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව. 1896-1903

අති ගෞරවාහී ශ්‍රීමත් ජෝසප් වැස්ට් රිජ්වේ ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ වර්ෂ 1896 ක් වූ පෙබරවාරි මස 10 වෙනි දින මෙහි පැමිණ ලංකාණ්ඩුකාර ධූරය භාර ගත්තේ ය. මෙතුමා වනාහි ගෞරවාහී ජෝසප් රිජ්වේ දේවගැති තුමා ගේ පුත්‍රයෙකි. මෙතුමා මෙහි උපගතවීමට පෙර නොයෙකුත් උසස් තනතුරු වල නියුක්තව දීර්ඝ කාලයක් බ්‍රිතාන්‍ය කිරීටයට ආචාර සම්පන්නව සේවය කල මහොත්තමයෙකි. මෙතුමා වර්ෂ 1844 දී ඉපිද ක්‍රමයෙන් වයස් ප්‍රාප්තව ඉගෙනීමාදියෙන් ලබන ලද විශේෂ ශාස්ත්‍ර ඥානයක් ඇත්තේ වර්ෂ 1860 වේ ජනවාරි මස පළමුවෙනි දින යුද්ධ හමුදාවට බැඳුණේ ය. 1862 කේ දී යුද්ධ හමුදාවේ ලැප්ටිනන්ට් ධූරයට ද 1869 යේ දී කැප්ටන් ධූරයට ද 1881 කේ දී කර්නල් ධූරයට ද මෙසේ පිළිවෙළින් පත්ව සිට, 1889 යේ දී අගොස්තු මස ස්වකීය රාජකාර්යෙන් ඉල්ලා අස්වූයේ ය. තවද වර්ෂ 1884 රේ දී අප්ගැනිස්ටෑන් අවකන් රටේ දේශ සීමාව පිළිබඳ වියවුල නිශ්චය කිරීමට පත් වූ සභාවේ සහකාරික බවට ද පත් කරන ලද්දේ ය. 1885 හේ කේ. ශී. ඇස්. ඓ. යන උපාධි නාමයද 1891 යේ දී කේ. සී. බී. යන තානාන්තරයද ලද්දේ ය. 1893 නේදී මොරොක්කෝහි සුල්තන් රජු වෙත බ්‍රිතාන්‍ය තානාපතියෙකු මෙන් පත් කර යවනු ලැබීය. එම වර්ෂයේ නොවැම්බර් මස 30 වෙනි දින අයිල් ඔප් මෑන් නම් දිවයිනේ උපාණ්ඩුකාර ධූරයට පත් කරනු ලැබ සිට මෙහි

Non-Commercial Distribution

පැමිණියේ ය. මෙතුමා ලෝක ප්‍රසිද්ධ යුද්ධ දක්ෂයෙක් වූ රොබර්ට් සාමි යටතේ ඉන්දියාවේ යුද්ධ කීපයකටම ගොස් නිර්භීත ලෙස ක්‍රියා කිරීමෙන් පැසසුම් ලැබූ උතුමෙකි. ආණ්ඩු ක්‍රමය පිළිබඳ මේ තරම් මනා අවබෝධයක් ඇති මෙතුමා ලංකාණ්ඩු ධූරයට පත්වීම අනාගතයෙහි ලංකාවාසීන්ට යසඉසුරු සම්පත් ලැබීමේ පූර්ව නිමිත්තක් බැව් සලකන ලදී.

මේ උතුමා ලංකාව ආණ්ඩුකරන්ට භාරගත් පසු දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම, වැව් අමුණු ප්‍රකෘතිමත් කරවීම, වෙළඳාම් දියුණු කර හැරීම ගොවි කර්මාන්ත සහ වැවිල්ලත් වර්ග කිරීම යනාදි කටයුතු රාශියක් ලංකාභිවෘද්ධිය සඳහා ආරම්භ කෙළේ ය. මේ උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුව භාරගත් නොබෝ කලකින් බොම්බායේ ඉතා භයානක ලෙස සීඝ්‍රව පැතිරී ගිය මහමාරිය නම් ජනපද රෝගය ලංකාවට ද බෝ වූයේ ය. යථෝක්ත මාරක බාධය පැතිර යාම වළකනු පිණිස ලංකාන්ඩුව විසින් යොදන ලද ස්වාස්ථ්‍යානුකූල විශිෂ්ට වූ වෛද්‍ය පිළිවෙත් හේතු කොටය වැඩි දුර පැතිරයා නොදී නවතා ගනු ලැබූහ. මේ ආණ්ඩුකාරතුමා විසින් කරන ලද මාහැඟි ප්‍රතිසංස්කාරණය නම්, ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක තුමා එක්ව අධ්‍යාපනය සම්බන්ධ කටයුතු වල සංවිධානය පිණිස විශේෂ සභාවක් පත් කිරීම වේ. වර්ෂ 1896 යේ ජනවාරි මාසයේ දී සෞඛ්‍ය රක්ෂණය සඳහා කසල ආදී අපවිත්‍ර දේ කර හැරීමට කොළඹ නගරය අවට දිය අගල් දැමීම සම්බන්ධ වාර්ථාවක් පිළියෙළ කිරීම පිණිස ප්‍රදේශ භාර මහමාත්‍යතුමා විසින් මැනර්ජ් මහතා මෙහි එවන ලදී. අලංකාණ්ඩුවේ සහ එංගලන්ත ආණ්ඩුවේත් සම වූ වියදමින් රන් පවුන් 3,18,00 ක් වියදම් කොට නැව් අලුත් වැඩියා කිරීම පිණිස නෞකා තටාකයක් කොළඹ වරායට නුදුරුව තැනීමට ගෙනන ලද යෝජනාවක් මෙම අවුරුදදේදී නීතියදායක මන්ත්‍රණ සභාව විසින් පිළිගන්නා ලදී. වර්ෂ 1897 තේ ජූනි මාසයේ දී වික්ටෝරියා මහාරාජිනීන් වහන්සේ සිංහාසනා රූඪ වී හැට වර්ෂයක් සම්පූර්ණවීමේ ප්‍රීත්‍ය උත්සවය සඳහා අත්‍යාලංකාරයෙන් පවත් වන ලද දියමන්ති ජුබිලි මංගල්‍යට ලක් වැස්සෝ ද මහත් උත්සව පැවැත්වීමෙන් සහභාගි වූවෝ ය. මේ ජුබලි මංගල්‍යය සඳහා ලංකාණ්ඩුව විසින් ස්වදේශික වැදගත් උගත් ප්‍රභූ මහතුන් කීප දෙනෙක් නියෝජිතයක් වශයෙන් එංගලන්තට යවනු ලැබූ හ.

ඒ මහතුන්ගෙන් කීප දෙනෙක් නම් :- ශ්‍රී ලංකාවේ මහ මුදලි ධූරන් ධර රජකුමරුන් කඩු කැරලු වංශාධිපති ඩොන් සොලොමාන් ඩයස් බණ්ඩාරනායක මන්ත්‍රීශ්වරයාණෝ සමාදාන විනිශ්චයකාරධූරන්ථර ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා රජ වාසල මුදලි මැතිතුමා ඇඩ්මන්. ආර්. ගුණරත්න අතපත්තු මුදලි මැතිතුමා ශ්‍රිමත් පොන්නම්බලම් රාමනාදන් මැතිතුමා ඒ.

Non-Commercial Distribution

ඩී. ඒ සෙනෙවිරත්න අද්වකාත් මැතිතුමා කොබ්බෑකඩුවේ දිශාපතිතුමා නුගවෙල රටේ මැතිතුමා පාණ බොක්කේ රටේ මැතිතුමා සහ සේනාපතිරාජා අද්වකාත් මහතා ආදිහූ වෙත්. ලංකිකයන් වෙනුවෙන් නීතිදායක මන්ත්‍රණ සභාව වෙනුවෙන්ද, නාගරික සභාව වෙනුවෙන්ද, වෙළඳ සමිතිය වෙනුවෙන ද ලංකාවෙන් යවන ලද ශුභා සිංසන පත්‍ර මෙහි නියෝජිත උතුමන් විසින් මහරාජිනියට පිළිගන්වන ලදි. ස්වදේශිකයෙක් වූ මේජර් ආර්. එච්. මෝර්ගන් අද්වකාත් මහතා යටතේ වොලන්ටියර් හේවා කණ්ඩායමක් සහ අශ්වාරෝහක හේවා කණ්ඩාමකුත් එංගන්තයේ ජුබිලි මහ පෙළහර සමග ගමන් කිරීමට ලංකාවෙන් යවන ලදහ.

වර්ෂ 1896 යේ දී සියම් මහරජතුමා ද, 1900 යේ දී පර්ෂියාවේ රජතුමාගේ ඔටුන්න හිමි පුත්‍රයා වූ හෙන්රි කුමාරයා ද, ලංකාවට පැමිණියෝ ය. මෙම වර්ෂයේ දී සැන්ට් පෝසප් කොලේජ් නම් වූ රෝමානු කතෝලික අග්‍ර පාඨ ශාලාව කොළඹ ඩාර්ලි රෝඩ් නම් වීථියෙහි පිහිටු වන ලදී. වර්ෂ 1902 කේ මාර්තු මාසේ 10 වෙනි දින යාපනේ දුම්රිය මාර්ගයේ අනුරාධපුරය දක්වා මුලභාගය මගීන්ගේ ගමනාගමනය සඳහ විවෘත කරන ලදී,

තවද රිජ්වේ උතුමාණන් වහන්සේ විසින් ගොවි කර්මාන්තය ලංකාවේ වඩා සමෘද්ධිමත්භාවයට ගෙන ඊම පිණිස, ශාස්ත්‍රඥයන්ගෙන් යුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක් පිහිටුවා පේරාදෙනියේ රෝයල් බොටැනිකල් ගාර්ඩන්ස් නම් වූ රාජකීය උද්භිද විද්‍යෝද්‍යානය ප්‍රකෘති මත් කරවන ලදී. මේ අභිනව දෙපාර්තමේන්තුව සහ උද්‍යාන පාලක නිලධාරී මණ්ඩලය ලවා පොදු ජනයාගෙ ශුභසිද්ධිය සඳහා කාලානුරූප ලෙස කෘෂිකර්මාන්තය සම්බන්ධ සාරවත් ලියවිලි අන්තර්ගත පත්‍රිකා සහ ඉංග්‍රීසි සහ සිංහල යන උභය භාෂා වලින් ගොවිකම සඟරාද නිකුත් කරනවන්ට සලස් වන ලදී.

වර්ෂ 1899 යේ ජනවාරි මාසයේ දී කොළඹ වීථිවල විදුලි රථ ගමන් කරවීමට පටන් ගන්නා ලද්දේ ය. මේ අවුරුද්දේ මේ මාසයේ දීම විශාල බුරුම වන්දනා පිරිසක් සිංහාසනයෙන් පහ කරනු ලැබූ තිබෝ නම් බුරුම රජුගේ දූ කුමරිය හා කැටුව මහනුවර දළදා මන්දිරයට පූජා කිරීම පිණිස ඉතා මා හැඟි මුතු මැණික් ගල්වා නිම වන ලද ස්වර්ණමය ධාතු කරඬුවක් රැගෙන බුරුමයේ සිට මෙහි පැමිණියා හ. මේ අවුරුද්දේ පෙබරවාරි මාසේදී ද ජූලි මාසේ දී ද මිසර දේශයේ සිට ලංකාවට පිටවහල් කරනු ලැබ සිටි කැරළිකරුවූ ටුල්බා පාෂා සහ මොහම්මද් සාමි යන දෙදෙන එංගලන්තය ආණ්ඩුවෙන් ක්ෂමාව ලැබ සියරටට ගියෝ ය. කැරැල්ලේ මූලිකයා වූ අරාබි පාෂාටත ඔහුගේ පවුලටත් වර්ෂ 1901 කේ සැප්තැම්බර් මාසේදී අන්තිම කොට සමාවදී මිසරයට ආපසු යන්ට අවකාශ දෙනලදී.

Non-Commercial Distribution

වර්ෂ 1899 යේ නොවැම්බර් මස 13 වෙනි දින ලෝක විනාශය සිදු වන්නේ යයි නවීන අනාගත වක්තෘන් විසින් කරන ලද මිත්‍යා ප්‍රකාශයක් හේතු කොට ගෙන අස්ථාන භීතියක් බොහෝ දෙනෙකු කෙරෙහි ඇති වූහ. ආගම ධර්මයට ඉඳුරාම ප්‍රතිපක්ෂවූ මේ ආනගත කිම විශ්වාස කළ සැම දෙනාම තම තමන්ගේ සමයානුකූල සුශීල ගුණ ධර්මයන්හි අඛණ්ඩව පිහිටා ක්‍රියා කිරීමෙන් මේ වර්ෂය වෙන අවුරුදු වලට වඩා ලංකාවට ශ්‍රී සමෘද්ධි සම්පන්න කාලයක් උදා වූයේ ය. ලංකාවේ මිණිරන් වෙළඳාම ඉතා උසස් ස්වභාවයකට පත්වීමෙන් බොහෝ දෙන ධනාඪ්‍ය බවට පැමිණියේත් මේ වර්ෂයේ දී ය.

තවද රිජ්වේ උතුමාණන් ගේ ආණ්ඩු සමයේ දී දකුණු අප්‍රිකාවේ බූවර් යුද්ධය ප්‍රාරම්භ විය. බූවර්වරුන්ට විරුද්ධව සංග්‍රාමයේ යොදවනු පිණිස වර්ෂ 1900 ක් වූ පෙබරවාරි මස පළමුවෙනි දින යුරෝපීන්ගෙන් යුත් අශ්වාරෝහක වොලන්ටියර් යුද්ධ හමුදාවක් සහ වර්ෂ 1902 කේ අප්‍රියෙල් මස 22 දින භටයන් සිය දෙනෙකුගෙන් යුත් බාල යුද්ධ කණ්ඩායමකුත් ලංකාණ්ඩුවේ වියදමින් දකුණු අප්‍රිකාවට පිටත් කොට යවන ලද්දෝ ය. වර්ෂ 1900 යේ පටන් 1903 දක්වා වරින් වර එවන ලද බූවර් ජාතික යුද්ධ හිරකරුවන් 5000 ක් පමණ මෙම දිවයිනේ දියතලාවේ සහ රාගම කඳවුරුවල හිරභාරයේ නැවතී සිටියෝ ය.

වර්ෂ 1900 ක් වූ ජනවාරි මස 31 වෙනි දින, වික්ටෝරියා රාජාධි රාජිනීන් වහන්සේගේ දියමන්ති ජුබිලි උත්සවය සිහිපත්විම සඳහා පරාර්ථකාමී සහගුණවත් මහා ධනවතෙක් වූ ජේ. ඩබ්ලිව්. චාර්ල්ස් ද සොයිසා මැතිතුමාගේ පරිත්‍යාගයකින් සාදන ලද කොළඹ ක්ෂුද්‍ර ප්‍රාණී පරීක්ෂක ශාලාව රිජ්වේ ලංකාශ්වරයාණන් විසින් විවෘත කරන ලදී, එම අවුරුද්දේ යථොක්ත උත්සවය නිමිත්ත කොට ගෙන මහනුවර ගොඩ නගන ලද වික්ටෝරියා කොමැමොරේෂන් බිල්ඩින්ග්ස් නම් මහාරාජිනිය සිහිවීමේ ගොඩනැගිල්ල සහ ලංකාවේ සමෘද්ධි වර්ධනය පිණිස ද වීර්යයෙන් යහපත් වැඩ රාශියක් කර තිබෙන පර්ගියුසන් සහ ජෝර්ජ් වෝල් මහත්වරු සිහිපත් වීමට තනන ලද පර්ගියුසන් මැමෝරියල් ශාලාව සහ ජෝර්ජ් වෝල් පුස්තකාලයත් විවෘත කරන ලද්දාහු ය.

කොළඹ නගරයේ ස්වාස්ථ්‍ය වර්ධනය සඳහා මැන්සර්ජ් මහතා විසින් කසල වාරි මාර්ග තැනීම පිළිබඳව පිළියෙළ කරන ලද වාර්තාව ගැන කල්පනා කිරීමට කොමිෂන් සභාවක් වර්ෂ 1900 යේ දී පත් කරන ලදී. එම අවුරුද්දේ දී කර්මාන්ත සම්බන්ධ විශේෂ දෙපාර්තමේන්තුවක් ද පිහිටු වන ලදී. මේ කාලයේ ඉන්දියාවේ දුර්භික්ෂ භයක් ඇති වූයෙන් ඉන් පීඩිත

Non-Commercial Distribution

වූවන්ට සහායෝපකාර පිණිස ලක්වැසි පොදු ජනයා විසින් සම්මා දම් වශයෙන් රුපියල් 2,10,000 ක් එකතු කරනු ලැබ එහි යවන ලදී.

වර්ෂ 1901 ක් වූ ජනවාරි මස 21 වෙනි දින වික්ටෝරියා රාජාධි රාජිනීණ් වහන්සේගේ පරලෝක ප්‍රාප්තිය සිද්ධ වීමෙන් ඒ උත්තමියගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර වූ වේල්ස්හි කුමාරයාණෝ, හත්වෙනි ඇඩ්වර්ඩ් යන නාමයෙන් රාජ්‍ය ප්‍රාප්ත විය. නෛක පුණ්‍ය ශ්‍රීන් විරාජමාන ව ඒකූනාශිති වර්ෂයක් එංගලන්තය සහ ඊට අයත් අවශේෂ ප්‍රදේශත් දශ රාජධර්ම අකොප්‍ය කොට ආණ්ඩු කළා වූ මේ රාජෝත්තමියගේ ජන්මාන්තර ගතවීම සිහිපත් කොට ඒ උත්තමියට ස්වර්ගය ආශිර්වාද අයැද ලංකාවේ නොයෙක් පළාත් වල ක්‍රිස්තියානි දේව ස්ථානයන්හි දේව මෙහෙයන් පවත්වන ලදී, බෞද්ධයෝ අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්මයන් මෙනෙහි කිරීමෙන් බෞද්ධ විහාර ස්ථාන වල අනේක විධ පුණ්‍ය කර්මයන් කොට අනිත්‍යභාව ප්‍රාප්ත රාජනියට පින් අනුමෝදන් කරවූවෝ ය. මේ වර්ෂයේ අප්‍රියෙල් මාසේ දී වේල්ස්හි කුමරු සහ කුමරිත් (පස්වෙනි ජෝර්ජ් රජතුමා සහ මේරි බිසවත්) දේශ සංචාරයණය කරන අතර ලංකාවට ද සම්ප්‍රාප්ත වූහ. ලංකාවාසීන් විසින් මේ රාජකීය යුවල මහෝත්සව පැවැත්වීමෙන් ගෞරවාරදයෙන් පිළිගනු ලැබූහ.

තවද ශ්‍රේෂ්ඨාධිකරණයට සිව්වෙනි විනිශ්චකාරයකු පත්කිරීමද, රත්රන් පවුමක් රුපියල් පසළොසකට මිල නියම කිරීමට ද බදු සම්න්ධ බදු සම්බන්ධ විභාගයක් පැවැත්වීමට කොමිෂන් සභාවක් පත් කිරීම ද මේ වර්ෂයේ දී සිදු වන අනිකුදු වැදගත් කාරණ මෙන් සැලකිය යුතු ය.

වර්ෂ 1902 කේ ජනවාරි මාසේ දී රිජ්වේ උතුමාණන් වහන්සේගේ ආරාධනාවෙන් ලංකාවේ මුතුපරවල් සමෘද්ධි කරනු පිණිස අනුශාසකයෙක් වශයෙන් ශ්‍රාස්ත්‍රචාර්ය හර්මැන් මහතා මෙහි කැඳවනු ලැබී ය. ස්වර්ගස්ථ වූ වික්ටෝරියා මහරාජනීන් වහන්සේ සිහිපත් වීම පිණිස නයනාරෝග්‍ය ශාලාවක් කොළඹ පිහිටුවීම ගැන සාකච්ඡා කර ගැනීමට මෙම වර්ෂයේ මාර්තු මස 17 වෙනි දින රිජ්වේ උතුමාණන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් නීතිදායක මන්ත්‍රණ ශාලාවේ දී ප්‍රසිද්ධ සභා රැස්වීමක් පවත් වන ලදී. වර්ෂ 1902 කේ මැයි මාසේ දී, එංගලන්ත සභාවේ බිෂොප් පදවිය බොහෝ කාලයක් මෙහි දරමින් සිටියා වූ ද, මගධරට සහ ලංකාවෙන් පැවති බුද්ධාගම යන ග්‍රන්ථයේ කතෘ වූ ද අති ගෞරාවර්හි ආචාර්ව කොපල්ස්ටන් තුමා කල්කාටාවේ අග්‍රබිෂොප් තනතුරුට පත්වීමෙන් සිදු වූ පුරප්පාඩුවට වර්ෂ 1903 ක් වූ අගෝස්තු මස 30 වෙනි දින ස්වකීය සහෝදර ගරු කටයුතු ඒ. ඊ. කොපල්ස්ටන් දේවගැති තුමා පත් වූයේය. මෙම අවුරුද්දේ මැයි මස 8

Non-Commercial Distribution

වෙනි දින නීතිදායක මන්ත්‍රණ සභාවේ රැස්වීමෙක් පළමු වෙනි වරට මහනුවර රාජමන්දිරයෙහි පවත්වන ලද්දේ ය. රිජ්වේ උතුමාණන් වහන්සේ ගේ තද ඇල්මක්ව පැවති ලංකාවේ මුතුපරවල් බැලීමට නීතිදායක මන්ත්‍රණ ස්භාවේ මන්ත්‍රිවරු සහ එංගලන්තයේ සිට මෙහි ආගන්තුකව අවුත් සිටි සහත් වරු කීපදෙනෙකුත් එතුමා විසින් කැඳවා ගෙන යන ලදී.

වර්ෂ 1903 ක් වු අගොස්තු මස 6 වෙනි දින වික්ටෝරියා මහාරාජිනිය සිහිපත්වීම සඳහා ගොඩ නැගීමට අදහස් කරනු ලැබූ නයනාරෝග්‍ය ශාලාවේ අත්තිවාරමේ මුල්ගල රිජ්වේ ආර්යාව විසින් ස්ථාපනය කරන ලදී, මෙම වර්ෂයේ අවශාන භාගයේ දී නානුඔයේ සිට නුවර එළියට ද, කොළඹ සිට යටියන්තොටට ද පටු දුම්රිය මාර්ග දෙකක් විවෘත කරන ලදහ.

වර්ෂ 1901 ක්වු ජූනි මස 24 වෙනි දින කොළඹ කප්පිත්තාවත්තේ පිහිටි මහනුගේ නම් ස්වකීය වලව්වේ දී සිංහල මුදුන් මල් කඩක් බඳු සර් හැරී දියෙස් උතුමාණෝ අවරුදු සැත්තෑනවයක් ආයු වළදා කථාශේෂ බවට පැමිණියේය. එංගලන්තයට ගොස් ශාස්ත්‍රෝද්ග්‍රහණය කොට වර්ෂ 1847 කදී බැරිස්ටර් නම් අධිනීතිඥ නාමය ලබා ගත් පළමුවෙනි ආසියාතිකයා මෙතුමා විය. මෙතුමා එංගලන්තයේ සිට ලංකාවට හැරී ආවට පසු ශ්‍රෂ්ඨාධිකරණයෙහි දක්ෂ නීතිඥයෙක් මෙන් වැඩ කෙළේ ය. වර්ෂ 1865 දී මෙතුමා නීතිදායක මන්ත්‍රණසභාවේ සිංහල මන්ත්‍රී ධූරයට පත්ව ලෝක ප්‍රසිද්ධ ලෝරැන්ස් අද්වකාත්තුමා ජෝර්ජ් වෝල් මහතා සහ කැපර් මහතා ආදී ජනහිත නිලනොලත් මන්ත්‍රිවරයන් සමග එක්ව රට වාසීන් කෙරෙහි දයානුකම්පාවෙන් ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා උද්යෝගයෙන් ක්‍රියා කෙළේ ය. වර්ෂ 1875 හේ දී ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාවේ විනිශ්චයකාර ධූරයකට මෙතුමා පත් කරනුලැබීය. සිංහලයෙක් විසින් ඊට පෙර කිසි කලක නොලත් ඒ ගරු ස්ථානාන්තරයෙන් කටයුතු ඉතා දක්ෂාකාරයෙන් හා නිර්භීත ලෙස ද ඉෂ්ට කරමින් මෙතුමා ආණ්ඩුව සහ වැසියාත් එකහෙළා සතුටු කළේ ය. මෙතුමා දෙවරක්ම නායක විනිශ්චයකාර ධූරයෙහි වැඩ බලා තිබේ. මෙතුමා සතළොස් වසක් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විනිශ්චකාරයෙක් මෙන් කටයුතු කළ ඉක්බිති වර්ෂ 1892 කේ දී විශ්‍රාම වැටුප් ලැබීමට නියමවීමෙන් ස්වකීය ධූරයෙන් අස්ව, ජීවිතයේ අපරභාගයේ දී නිදහස් කාලයක් ගත කරනු පිණිස වැවිලි කර්මාන්තයෙහි නියුක්ත විය. මෙතුමා විසින් රටට සහ ආණ්ඩුවටත් කරනලද යහපත් අර්ථදායි වැඩ සලකා ස්වර්ගස්ථ වූ වික්ටෝරියා මහාරාජනීන්වහන්සේ විසින් මෙතුමා නෛට් යන උසස් නාමය දෙවා වදාරන ලද්දේ ය. සිංහල රාජධානිය බ්‍රිතාන්‍ය කිරීටයට යටත් වුවාට පසු මෙම ගරු නාමය පළමුවෙන්ම ලැබූ සිංහලයා මේ උතුමා ය.

Non-Commercial Distribution

රිජ්වේ උතුමාණන් වහන්සේගේ මෙහෙයීම පරිදි මුඩුබිම් සම්බන්ධ ආඥා පණත වර්ෂ 1897 තේ දී පණවන ලදී, යම් යම් ඉඩම් වලට වැසියන්ගේ ඇති අයිතිවාසිකම් විභාග කොට බේරුම් කිරීමට විශේෂ මුලාදෑණියෙක් ද පත් කරන ලද්දේ ය. එසේ වුවත් යථොක්ත ආඥා පණතට විරුද්ධව රටේ මහත් කැළඹීමක් සහ විරුද්ධතාවයක් ද ඇති විය. එය නිෂ්ප්‍රභා කරන ලෙස අයැද වැදගත් කරුණු විස්තර වශයෙන් දක්වන ලද අයදුම් පත්‍රයක් ලක්වැසියන් විසින් එංගලන්ත ආණ්ඩුවට ඔප්පු කරන ලදී. මෙයින් ලක්වැසියාට පැමිණිය හැකි අනල්ප වු ගැහැට ගැන සඳහන් කොට ලියන ලද ඒ අයදුම්පතේ ඉල්ලීම ඉෂ්ඨ කර දීමට ඊට අවුරුදු අටකට පෙර ලංකාව ආණ්ඩු කළ ගෝර්ඩන් උතුමාණන් වහන්සේ ද බොහෝ දුරට උත්සාහ කර තිබේ. මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේ ද බෙහෙවින් වාද විවාද ඇති විය. එසේ වුවද රිජ්වේ උතුමාණන් වහන්සේගේ අභිමතාර්ථය වූ පරිදි එය නො වෙනස්ව ස්ථිර කරනු ලැබ අද දක්වාත් ලංකාවේ වලංගුව පවත්නේ ය.

සර් වැස්ට් රිජ්වේ උතුමාණන් වහන්ස් සත් හවුරුදු නවමසක් පමණ කාලයක් ලංකාව ආණ්ඩු කොට වර්ෂ 1903 නේ නොවැම්බර් මස 18 වෙනි දින ස්වකීය ධුරය ඇඩ්වර්ඩ් ඉම්තර්න් කොලොනනියල් සෙක්‍රතාරිස් උන්නාන්සේට භාර කොට සිය රටට නික්ම ගියේ ය.

Non-Commercial Distribution

# සර් හෙන්රි ආතර් බෙල්ක් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව. 1903-1907

වර්ෂ 1903 ක් වූ දෙසැම්බර් මස තෙවෙනි දින, බෙල්ක් උතුමාණන් වහන්සේ ලංකාද්වීපාධිශ්වරව මෙහි උපගත විය. මෙතුමා මෙහි පැමිණීමට පෙර බහමා දූපත් වලද නිව් පවුන්ඩ් ලන්ඩ් රටේ ද, ජැමෙයිකා දූපතේ ද හොංකොං නම් රටේ ද ආණ්ඩුකාර ධූරයෙහි නියුක්තව කටයුතු කළ උතුමෙකි. මේ ආණ්ඩුකාරතුමා මෙහි පැමිණි අමන්ද කාලයකින් ගොවි කර්මාන්තය දියුණු කිරීමේ කර්තව්‍යයන් පිළිබඳ අවශ්‍ය වූ කටයුතු ගැන උනන්දුව ක්‍රියා කෙළේය. කෘෂිකර්මාන්ත අධ්‍යයනය පිළිබඳ සමාගමක් කොළඹ පිහිටුවා ආණ්ඩුවේ දිශාපතින්ගේ හා කෝරළ මුදලිවරුන්ගේ ත් ප්‍රධානත්වය ඇතුව එහි ශාඛා සමාගම් ප්‍රත්‍යන්ත ග්‍රාමයන්හි ඇති කරන ලදී. වර්ෂ 1904 ක් වූ ජූනි මස ලංකාණ්ඩුවේ මහසෙක්‍රතාරිස් තැන්පත් සර් ඇඩ්වර්ඩ් ඉම්තර්න්තුමා පීජි නම් දිවයිනේ ආණ්ඩුකාර ධූරය ලැබ ලංකාවෙන් අස්වී ගියෙන්, සිස් වූ එම ධුරයට වරක් ලංකාවේ සිවිල් නිලධාරියෙක්ව ක්‍රියා කළ ඒ. ඇම්. ඇෂ්මෝර් මහතා පත් විය. මෙතුමා ආබාධිතවීමෙන් වර්ෂ 1906 යේ දී කාලයාත්‍රා කරනලදී. වර්ෂ 1904 රේ දි මරිච්චිකඩෙ මුතුපර වලින් මුතු බෙල්ලන් නෙලීම පටන් ගනු ලැබී ය, කඩන ලද මුතු බෙල්ලන් අලෙවි කිරීමෙන් රුපියල් 1,54,695 ක් ආණ්ඩුවට ආදායම් වූයේය. මුතු බෙල්ලන් සම්බන්ධව මේසා විශාල ආදායමක් එක වර්ෂයක් තුළ මීට පෙර කවර කලකවත් ආණ්ඩුවට ලැබී නොමැති ය. රිජ්වේ උතුමාණන් වහන්සේ ලංකාණ්ඩුව භාරදී සිය රටට ගියාට පසු ලංකාවේ මුතුපර වල් එංගලන්තයේ සමාගමකට අවුරුදු ගණනකට එකවිටම බදු දීමට ප්‍රදේශභාර මන්ත්‍රී තුමා කැමති විය. ඒ යෝජනාවට ලංකාණ්ඩුව විසින් ද නීතිදායක මන්ත්‍රණ සභාවෙන් කිසිත් නොවිමසා අනුබල දෙන ලද්දේ ය. බද්ද ලිවීම සම්බන්ධ සියලු කටයුතු නිම වූ පසු බෙල්ක් උතුමාණණ් වහන්සේ කිසි විස්තරයක් නොදක්වා බදු දෙන බව සඳහන් වූ කාරණය පමණක් නීතිදායක මන්ත්‍රණ සභාවේ සාමනාය රැස්වීමක දී එළිදරව් කරන ලද්දේ ය. ලංකා වට ලැබෙන විශේෂ ආදායම් පක්ෂයට හානි පමුණුවන මේ මුතුපරවල් බදු දීමේ ක්‍රියාව ගැන නිල නොලත් සියලුම මන්ත්‍රීවරු එකහෙලා තදින් විරුද්ධ වූහ. එහෙත් සංඛ්‍යාවෙන් වැඩි ගණනක් ඇති ආණ්ඩු පාක්ෂි ගත නිලලත් මන්ත්‍රිවරු සියල්ලෝම බදුදීමට එකඟව ඡන්දය කෙළෙන් ඒ සම්බන්ධව ගෙනෙන ලද යෝජනාව ස්ථිර විය. ලංකාවේ ආණ්ඩුකාර ධූරය දරූ රිජ්වේ උතුමාණන් වහන්සේ බද්ද ගත් සමාගම හා සම්බන්ධයක් ඇති බැව් දැනගන්ට ලැබීමෙන් ද, 1904 රේ අවුරුද්දේ දී මුතුපර වලින්

Non-Commercial Distribution

ලංකාණ්ඩුවට ලැබුණු බලවත් ආදායම ගැන සලකා බලා ද මේ අගතිගාමී තණ්හාමාධික නොමනා ක්‍රියාව හේතු කොට ගෙන මහජනයා අතර අතිශය සංවේග ස්වභාවයක් ජනිත විය. මේ අකතීව්‍ය වූ අමාර්ගගාමී ක්‍රියාව ගැන රාජ මන්ත්‍රණ සභාවේ නානාප්‍රකාර ප්‍රශ්න හට ගැනීමෙන් දීර්ඝ කාලයක් විවාද පැවතුණේ ය. නුමුත් ලාංකික මහාජනයාගේ සිත් රිදීමට පමුණුවා දැඩිලෝභ මුල්ව ගනු ලැබූ මේ සාපලත් බද්ද කළුරිය කරන තාක් එකම අවුරුද්දකදීවත් යථොක්ත සමාගමහට මුතුපර වලින් කිසිම ප්‍රයෝනයක් ලබන්ට නොහැකි විය. මෙයින් ප්‍රඥා සාගර දූර දර්ශී වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරන ලද තණ්හාය ජායතො සොකො (තෘෂ්ණාවෙන් ශෝකය උපදින්නේ ය) යන සම්බුද්ධ භාෂිතය ප්‍රත්‍යක්ෂවත් නීම ය.

මේ උතුමාණන් වහන්සේ ගේ ආණ්ඩු කාලයේ දී අනුරාධපුරය සිට යාපනය දක්වාද නුවර එළියේ සිට උඩ පුස්සැල්ලාව දක්වාද දුම්රිය මාර්ග දීර්ඝකරන ලදී, ඒ කාලයේ ද රබර් වැවීම සඳහා වු යුරෝපීය සමාගම් කීපයක් සෑදී ඒ වැවිල්ල විශාල ලෙස කරන්ට පටන් ගනු බැලී ය. ඒ අතර ස්වදේශික ධනවතුන්ගේ ද මහත් උනන්දු ස්වභාවයක් ඇති වයි. වර්ෂ 1905 හේ දී ලංකාවේ සිවිල් නිලධාරීන්ගේද ආණ්ඩුවේ ලිපිකරුවන්ගේ ද වැටුප් වැඩි කිරීම ට මුදලක් වෙන්කරන ලදී. ඒ මුදලෙන් දෙකෙන් කොටසකට වඩා ප්‍රයෝජන යූරෝපීය නිලධාරීන් සඳහා වූ බැවින් එ ඒ ගැන තත්විජානටය කළ ප්‍රභූ ජනයා අතර විරුද්ධතාවනයක් ඇතිවී කොළඹ ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වා ප්‍රදේශභාර මහලේකම් තුමට අයදුම්පතක් යැවීමට සභාව සම්මත්යෙන් නියම කරගන්නා ලදී.

තවද මහනුවර ට්‍රිනිටි කොලේජ් නම් අග්‍ර පාඨ ශාලාවේ ත්‍යාග ප්‍රදෝනෝසවයක දී සිංහලයන් තුළ ආණ්ඩුවේ උසස් තනතුරු දැරීමට උවමනා ගුණාංගයන් වූ ඍජුභාවය හා ගරුත්වයත් අප්‍රකට යයි ලංකාණ්ඩුවේ මහලේකම් තැන වූ ඇෂ්මෝඑර් මහතා විසින් කරන ලද කථාව දී ප්‍රකාශ විය. සාමාන්‍ය සිංහල ජනයා කෙරෙහි අපරීක්ෂාකාරීව අරෝපණය කරන ලද මේ අස්ථාන පරිභවය ගැන උගත් සිංහල මහතුන් අතර බලවත් කැළඹීමක් මහටගෙන ප්‍රසිද්ධ රැස්වීම් වලදී වාග් නොවන ලිපි වලිනුත් ඇෂ්මෝඑර් මහතාට චෝදනා කරනලදි. මේ කාලයේ දී එතුමාට ඇපැන්ඩිසයිටිස් නම් කීටරුපානු බන්ධ පිළිබඳ ආබාධයක් වැළදී මාරාත්ම කර වූයෙන් යථොක්ත අරගලය එයින්ම සංසිඳමට පැමිණියේය.

ලංකාණ්ඩුකාර බෙල්ක් උතුමාණන් වහන්සේ වර්ෂ 1907 ක් වූ ජූලි මස 10 වෙනි දින ස්වකීය ධූරයෙන් අස්ව සියරට බලා ගියේය.

Non-Commercial Distribution

# සර් හෙන්රි මැක්කැලම් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය ක්‍රි. ව. 1907-1912

බෙල්ක් උතුමාණන් වහන්සේගේ නික්ම යාමෙන් පසු අභිනව ලංකේශ්වරයාණන් ප්‍රවිෂ්ට වනතුරු මහලේකම් තැනපත් සර් හියු කලිපොඩිතුමා ආණ්ඩු කාර ධූරයෙහි කටයුතු කෙළේ ය. වර්ෂ 1907 අගොස්තු මස 24 වෙනි දින සර් හෙන්රි මැක්කැලම් උතුමාණන් වහන්සේ ස්වකීය ආර්යාව සහ පිරිසත් කැටුව ලක්දිවට සම්ප්‍රාප්තව ලංකාණ්ඩුකාර පදවිය භාර ගත්තේ ය.

මේ කාලයේ මුඩු බිම් සම්බන්ධ ආඥාපණතට විරුද්ධව ලක්වැසියන් අතර බලවත් උද්ඝෝෂණයක් පැවතුණේ ය. ඒ අඥාපණත යටතේ වැවිලි රහිත ඉඩම් නිරවුල් කරදීමේ ක්‍රමය ගැන දෝෂාරෝපණය කොට මහජනතාවගෙන් යුත් විශාල රැස්වීමක් වර්ෂ 1907 ක් වූ ඔක්තෝබර් මස 05 වෙනි දින කුරුණෑගල දී පවත්වන ලද නුමුත් ඉන් කිසියම් අර්ථ සිද්ධයක් නොලැබිණ. මිහින්තලා විහාර භූමියෙන් විශාල ප්‍රදේශයක් ද යථොක්ත ආඥා පණතට යටත් කර ගැනීමට ආණ්ඩු විසින් දරණ ලද ප්‍රයත්නය ගැන ආණ්ඩුව හා බෞද්ධයන් අතර තදබල සට්ටනයක් ඇති විය. ඉක්බිති වර්ෂ 1911 ක්වූ නොබැම්බර් මස 25 වෙනි දින මිහින්තලා විහාරාධිපති කුඹුක්වැවේ රේවත සහ වීරපොකුණේ ගුණරත්න යන ස්වාමීන් වහන්සේලා දෙනම සහ මුඩු බිම් දෙපාර්තමෙන්තුවේ ප්‍රධාන මහතාත් අතරේ සාමදාන බේරීමක් නිශ්චය කර ගනිමින් අක්කර 97 ක් පමණ බුද්ධාගම පිළිබඳ වැඩ ගැන සහ පුරාණ දේවල් සම්බන්ධ වැඩ ගැනත් වෙන්කොට පැවැත්විමට දෙපක්ෂයේ කැමැත්ත පිට තීණ්දු කර ගන්නා ලදී.

වර්ෂ 1909 ක් වූ ජනවාරි මාසේ දි අනුරාධපුරයේ අටමස්ථානයේ සීමා සම්බන්ධව බොහෝ කලක සිට විවාද සහිතව පැවති ප්‍රශ්නය ද විසඳා බේරුම් කරන ලදි. ථූපාරාම දාගැබට උතුරු දිශාවෙන් අක්කරයක් ද, මිරිසවැටි දාගැබට බස්නාහිර දිශාවෙන් අක්කරයක් ද, අභය ගිරි දාගැබට උතුරු දිශාවෙන් අක්කරයක් ද යනාදී වශයෙන් සුලු ඉඩම් කැබෙලි තුනක් පමණක් එකී සිද්ධස්ථාන වලට අයිති හැටියට මායිම් ලකුණු කොට මහජනයාගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කරන ලදි, තීරණය කරන ලද මේ පිළිවෙළ යහපත් යයි රටේ මහත් තැන් ආදී නිලධරයන්ගෙන් යුත් අටමස්ථාන සභාව විසින් ඒත්තු ගන්නා ලද නුමුත් සාමාන්‍ය බෞද්ධ ජනයා ඊට කිසිසේත් එකඟනුවූහ.

Non-Commercial Distribution

සිරස් ඡේදනය කොට දාස කෙල්ලක් මැරීම ගැන මීගොමුව අසල තලාහේන නමැති ගමේ ධනවත් පවුලක සිංහල ස්ත්‍රීන් දෙදෙනෙකුට සහ තවත් දාස කොලුවෙකුටත් විරුද්ධව පවරා තිබුණ 'සංවේග ජනක මිනී මැරුම් නඩුව වර්ෂ 1907 තේ නොවැම්බර් මාසේ දී දස දවසක් මුළුල්ලෙහි වුඩ් රැන්ටන් විනිශ්චයකාරතුමා විසින් කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විභාග කොට විත්තිකාර ස්ත්‍රීන් දෙදෙන සහ කොලුවාත් එල්ලා මරාදැමීමට තීන්දුව දෙන ලදි, එහෙත් ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් මරණීය දඬුවම අහක් කොට ඒ වෙනුවට ස්ත්‍රීන් දෙදෙන විසි අවුරුද්ද බැගින් බරපතල වැඩ ඇතුව හිරේ සිටීමදට කොලුවා මග්ගොන චරිත ශෝධන බන්ධනාගාරයෙහි නවත්වා සිටීමට ද නියම කරන ලද්දේ ය.

වර්ෂ 1908 ක් වූ අප්‍රියෙල් මස 29 වෙනි දින බෙල්ක් ආර්යාව සිහිපත්වීම පිණිස තනන ලද ලංකාධූම නෞකා සමාගමට අයිති ලේඩිබෙල්ක් නැමති නෞකාව මාස්පතා දිවයින වටේ යාත්‍රා කිරීම සඳහා යුරෝපයේ සිට කොළඹ වරායට පැමිණියේ ය. වර්ෂ 1908 ක් වූ නොවැම්බර් මස 9 වෙනි දින මීගමු දුම්රිය මාර්ගය රාගම සිට ජා ඇල දක්වා ද, ඊළඟ අවුරුද්දේ දෙසැම්බර් මස 1 වෙනි දින ජාඇල සිට මීගොමුව දක්වා ද මගීන්ගේ ගමනාගමනයට පමුණුවන ලදී, වර්ෂ 1912 ක් වු ජනවාරි මස 15 වෙනි දින රත්නපුරේ දුම්රිය මාර්ගය අවිස්සාවේල්ලේ සිට කුරුවිට දක්වා විවෘත කිරීම ද සිදු විය. ලංකා දුම්රිය මාර්ගය ඉන්දියාව හා සම්බන්ධ කිරීමේ ක්‍රමය ගැන වර්ස 1908 ක් වු නොවැම්බර් මාසයෙ දී මැක්කැලම් උතුමාණන් වහන්සේ සහ මදුරාසියේ ආණ්ඩුකාරතුමා අතරේත් පාම්බන් ප්‍රදේශයෙහි දී සාකච්ඡාවක් පවත්වන ලද්දේ ය.

වර්ෂ 1909 ක් වු ජූනි මස 3 වෙනි දින සහ වර්ෂ 1911 ක් වූ ජූනි මස 29 වෙනි දිනත් මැක්කැලම් උතුමාණන් වහන්සේ දෙවරක්ම නිවාඩු පිට එංගලන්තයට ගියේ ය. මේ දෙවතාවේ ම මහලේකම් තැන්පත් හියු කලිපෝඩ්තුමා ලංකාණ්ඩුකාර ධූරයෙහි වැඩ බැලුවේ ය. වර්ෂ 1910 යේ මැද භාගයේ දී හියුකලිපෝඩ්තුමා ද නිවාඩු පිට එංගලන්තයට ගොස් සැප්තැම්බර් මාසේ දී ප්‍රබන්ධ සහ නාට්‍ය කථාවන්හි සුප්‍රසිද්ධ කතෘ වරියක් වූ හෙන්රි දලා පැස්ටුර්නම් වැන්දඹු නෝනාමහත්මිය සමග විවාහ වී එතුමී සමග වර්ෂ 1911 ක් වු ජනවාරි මස 22 වෙනි දින නැවතත් ලාංකාවට පැමිණ ස්වකීය ධූරයෙහි වැඩ භාරගත්තේ ය. වර්ෂ 1912 ක් වූ සැප්තැම්බර් මස 20 වෙනි දින එතුමා ගෝල්ඩ් කොස්ට් නම් ප්‍රදේශයෙහි ආණ්ඩුකාර ධූරයට පත් කරනු ලැබ ස්වකීය ආර්යාවන් සමග ලංකා වෙන් නික්ම ගියේය.

Non-Commercial Distribution

මැක්ලම් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලයේ දී ලංකාණ්ඩුවේ සැලකිය යුතු උසස් නිලධාරීන් දෙදෙනක් ජන්මාන්තර ගත වූහ. වර්ෂ 1908 ක් වූ දෙසැම්බර් මස 1 වෙනි දින කාරකමන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙක් වූ මුදල් භාණ්ඩාගරික තැන්පත් ගරු කටයුතු එච්. සී. නිකල්තුමා ජ්වරාබාධයකින් කාල ක්‍රියා කෙළේ ය. සෞඛ්‍ය වර්ධනය සඳහා ප්‍රංශයට ගොස් සිටි ආණ්ඩුවේ දක්ෂ විචක්‍ෂණ නීතිඥ නිලධාරියෙක් වූ සී. ඇම් ප්‍රනාන්දු මැතිතුමා වර්ෂ 1909 ක් වූ ජුනි මස 8 වෙනි දින බැසියර්ස් නම් ප්‍රදේශයෙහි දී කථා ශේෂබවට පත් වූයෙන් ඖෂධ වර්ග බහාලීමෙන් සුරක්ෂිත කරන ලද එතුමාගේ මෘත දේහය තැන්පත් කිරිම සඳහා එම මස 28 වෙනි දින කොළඹට ගෙනන ලදි.

වර්ෂ 1909 ක් වු ජූලි මස 27 වෙනි දින ශාස්ත්‍රාචාර්ය සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ බ්‍රාහ්මණ පඬිතුමා බෞද්ධ න්‍යාය ධර්මයන් ප්‍රගුණ කිරීම පිණිස ඉන්දියානු ආණ්ඩුව විසින් ලංකාවේ ප්‍රාචින භාෂා සම්බන්ධ මහා ශාස්ත්‍ර ශාලාව වූ විද්‍යෝදය පිරිවෙණට එවන ලද්දේ ය. අභිනව සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැන මෙන් පත් කරන ලද ලංකාවේ උසස් සිවිල් නිලධාරියෙක් වූ බී. හෝර්ස්බර්ග් මහතාට උපදෙස්දීම පිණිස සුරාබදු කටයුතු ගැන මනා පරිචයක් ඇති ආර්. ඇම් තර්ලි මහතා එම වර්ෂයේ සැප්තැම්බර් මස 15 වෙනි දින සිට කලකට පමණක් ඉන්දියාවේ ආණ්ඩුවෙන් ඉල්ලා ගන්නා ලදී. එම වර්ෂයේ ඔක්තෝබර් මස 1 වෙනි දින සිට වැඩ ගැනීම සම්බන්ධ අභිනව ආඥාපණත වලංගු විය. 3 ආණ්ඩුවේ රක්ෂා වල නියුක්ත වූවන් ණය නොගෙවීම නිසා ණයකාරයා හිරේට යවනු ලබන්ට බැරි හැටියට වගන්තියක් එකී අණපණතේ ඇතිවීම ගැන මුදල් පොලියට දෙන නාඩු කෝට්ට හෙට්ටි ජනයා කුපිත වී ඊට විරුද්ධව අයදුම් පත්‍ර ආණ්ඩුවට ඔප්පු කළ නුමුත් ඔවුන්ගේ උත්සාහය නිෂ්ඵල විය.

වර්ෂ 1910 යේ මුල පටන් තැපැල් මුද්දර විකිණීමට අවසර පත්‍ර ඕනෑ කිරිමේ නියමය අවලංගු කිරීම සහ ශත 5 හේ අභිනව කුඩා ලෝහ කාසියක් භාවිතා වට පැමිණවීමත් සිද්ධ විය. මෙම අවුරුද්දේ ජනවාරි මස 15 වෙනි දින පටන් හැලීගේ ධූමකේතුව ලංකා නභස්තලයෙහි දෘශ්‍යමාන විය. මේ අශුභ නිමිත්ත පහළ වී නොබෝ කලකට පසු එනම් මැයි මස 7 වෙනි දින හත්වෙනි ඈඩ්වර්ඩ් මහාරාජොත්තමයාණන්ගේ මරණය සිද්ධවීම කරණ කොට ගෙන මුළු ලංකාද්විපයට ශෝක ජනක කාලයක් පැමිණියේ ය. මැයි මස 9 වෙනි දින වේල්ස්හි කුමාරයා පස්වෙනි ජෝර්ජ් යන නාමයෙන් අධිරාජ්‍යයේ මහරජාණන් හැටියට ප්‍රකාශ කරන ලද්දේ ය.

Non-Commercial Distribution

වර්ෂ 1910 ක් වූ ඔක්තෝබර් මස 1 වෙනි දින පටන් අබින් සම්බන්ධ අලුත් ආඥාපණත වලංගු විය. මේ ආඥා පණතින් අබින් විකිණීමට අවසරදීම සම්පූර්ණයෙන් අහක් කොට ඒ වෙනුවට ලියා පදිංචි කරන ලද අබින් පාවිච්චි කරන්නන්ට ද වෛද්‍යවරයන්ට ද ආණ්ඩුව මගින් ප්‍රමාණ සහිතව අබින් සැපයීම සලස්වන ලදී.

වර්ෂ 1911 අප්‍රියෙල් මස 29 වෙනි දින කොළඹ විද්‍යෝදය විද්‍යාලධිපති කොළඹ නවකෝරළේත් ශ්‍රී පාදස්ථානයේත් ප්‍රධාන සංඝනායක ධූරන්ධර සිප්කඩුවේ ශ්‍රී සුමංගලාභිධාන මාහිමියාණන් වහන්සේ ස්වර්ගස්ථවී වදාළ සේක. වර්තමාන කාලයේ පවත්නා අනල්ප වූ ධර්ම ශාස්ත්‍ර දියුණුව මේ මහාස්ථවිර ස්වාමිපාදයන් නිසාමයයයි පිළි ගත් කාරණයකි. මුන් වහන්සේ කෙරෙහි නොයෙක් රටවල පණ්ඩිතජනයාත් රාජ රාජ මහා මාත්‍යදිනුත් දක්වන ලද ගෞරවය අප්‍රමාණ ය. මුන් වහන්සේ ගේ මෘත දේහය සම්බන්ධ ආදහාන කෘත්‍යය ලක්දිව තුල අවුරුදු 200 යකින් මෙදතුරේ සිද්ධ නොවූ තරම් අත්‍යාලංකාර එකක් විය. 1911 මැයි 3 වෙනි දින කොළඹ කණත්තේ ශුසාන භූමියේ දී සිද්ධ කරන ලද එම ආදහන මංගලෝත්සවය පිණිස පැමිණි ජනයාගේ සංඛ්‍යාව 75,000 කට අධික වූ ලක්දිව උසස් නිලධාරීන් ආදී ගිහි ප්‍රභූන් ද නිකායත්‍රයේ උසස් ස්ථවිර පාදයන් වහන්සේලා ද පැමිණීමෙන් පවත් වන ලද ආදාහන මංගල්‍යයෙන්ම සිප්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන් වහන්සේ ලෝක වාසීන්ට කෙතරම් ප්‍රයෝජනවත් කෙනෙක් ව වැඩ විසූ සේක් දැයි ඔප්පු විය.

වර්ෂ 1911 ක් වූ නොවැම්බර් මස 15 වෙනි දින ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ සුලු ප්‍රතිසංස්කරණයක් සිදු විය. ඒ ප්‍රතිසංස්කරණයෙන් සිංහල සහ ද්‍රවිඩ ජනයාට එක් මන්ත්‍රි කෙනෙක් ද බර්ගර් ජාතික යන්ට එක් මන්ත්‍රි කෙනෙක් ද, ස්වකිය ඡන්දයෙන් තෝරා ගනු ලබන්ට වරප්‍රසාදයක් දෙන ලද්දේ ය. ඊට අනුකූලව සිංහල සහ ද්‍රවිඩ ජනයාටත් උගත් මන්ත්‍රී තැනමෙන් පොන්නම්බලම් රාමනාථන් මහතාද බර්ගර්වරුන්ගේ මන්ත්‍රි තැනමෙන් හැක්ටර් වැන්කුයිලැන් බර්ග් මහතා ද පළමුරෙවනි වරට තෝරාගන්නා ලදි.

වර්ෂ 1912 ක් වූ මැයි මස 31 වෙනි දින ව්‍යවස්ථාදායක මන්ත්‍රණසභාවේ සම්මතයෙන් සුරාබදු ආඥාපණත ස්ථිරවිය. මේ ආඥාපනත පැණවීමේ දී මන්ත්‍රීන් අතර තදබල විවාද ඇතිවූහ. ආණ්ඩුව පක්ෂයෙන් මහලේකම් තැන්පත් ක්ලිෆඩ්තුමා විසින් කරන ලද දීඝී ව්‍යක්ත කථාවට දෙපැයකුත් කාලයක් පමණ කාලය ගතවිය.

Non-Commercial Distribution

මේ පිළිබඳව ලක්වැස්සන්ගේ බලවත් අප්‍රසන්න භාවය පවතිද්දීම රට මුළුල්ලේ රා අරක්කු මඩම් පිහිටුවීමට සම්මතකර ගැනීමේ දී පාතරට සිංහලයන් වෙනුවෙන් මන්ත්‍රණසභාවේ පෙණීසිටි සර් සලමොන් ක්‍රිස්ටෝපල් උභයශේඛර නයිට්තුමාද ආණ්ඩුව පක්‍ෂය ගනිමින් කරන ලද "රා වනාහී ආදම්ගේ බීර ළඟ බීරය"ය යන වාක්‍යොක්තිය හේතු කොටගෙන රටවාසීන් කෙරෙන් එතුමා අප්‍රසන්නය ලබාගත්තේය; කොළඹ අමද්‍යප සභාව නමින් සමාගමක් ඩී. ඇස්. සේනානායක මුදලි තුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ආනන්‍දශාස්ත්‍රශාලාවේදී ආරම්භ කරන ලදී. ඒ සභාවට ලක්දිව උගත් ජනහිතකාමී සියලු දෙනාම සම්බන්ධ වූ එබඳු අමද්‍යප සමාගම් මුළු ලක්දිව සෑම තැනම පිහිටුවන ලදී. ඒ වර්‍ෂය තුළම අභිනව පිහිටුවන ලද රාමඩම් සියල්ලම පාහේ වසා දැම්මවීමට තරම් මේ සමාගම් සමත්වූ බැවින් මහාජන බලය ලක් වැස්සන්ට හොඳින් අවබෝධවීම සර් හෙන්රි මැක්කැලම් ආණ්ඩුකාර තුමාගේ සුරාබඳු ව්‍යවස්ථාව හේතුභූත විය. මෙම වර්‍ෂයේ අවසාන භාගයේ දී කොළඹ නගරයෙහි ගණිකා මඩම් නැතිකර දැමීම ගැන ජෝන්කොවන් නමැති යුරෝපීය මහතෙක් මහත් පරිශ්‍රමයක් දැරුවේය. මේ හේතුකොටගෙන නිශාචරීන්ගේ වීථිසංචාරණයෙන් ඇතිවූ අශෝභන දර්‍ශනය බෙහෙවින් හීනවිය. පරාර්‍ථකාමී ද සොයිසා පවුලේ පුත්‍රයෙක් වූ ජේ. ඇස්. වෝල්ටර් ද සොයිසා මහතා විසින් රුපියල් 50,000 ක් නයනාරෝග්‍ය ශාලාවේ දියුණුව සඳහා පරිත්‍යාග කිරීම හේතුකොටගෙන රෝගීන් වැඩිදෙනෙකුට එහි විශ්‍රාම ගෙන ප්‍රතිකාර ගැනීම හැකිවිය.

වර්‍ෂ 1912 ක්වූ දෙසැම්බර් මස 5 වෙනි දින සර් හැන්රි මැක්කලම් උතුමාණන් වහන්සේ ශරීරාබාධ නිසා ලංකා ආණ්ඩකාරධූරයෙන් අහක් වූයේය.

## සර් රොබට් චාමර්ස් උතුමාණනවහන්සේගේ ආණ්ඩුකාලය
## (ක්‍රිːවː 1913 - 1916)

සර් හෙන්රි මැක්කලම් උතුමාණන්වහන්සේ රෝගාතුර වී එංගලන්තයට පිටත්වගියාට පසු මහසෙක්‍රතාරිස් තැන්පත් රෙජිනෝල්ඩ් ස්ටබ්ස් උතුමාණෝ දසමසක් පමණ ලංකාණ්ඩුකාර ධූරයෙහි වැඩ බැලූහ. සර් රොබට් චාමර්ස් උතුමාණන්වහන්සේ ලංකේශ්වර පදවියට ස්ථිරලෙස පත්වී, වර්‍ෂ 1913 ක් වූ ඔක්තෝබර් මස 18 වෙනි දින ලංකාවට සම්ප්‍රාප්ත වූහ. එතුමා කෙරෙහි පාළි භාෂාව සම්බන්ධ මනා පටුත්‍වයක් විද්‍යමානය යන ආරංචිය දැනගත් ලක්වැසි බෞද්ධයන්ගේ සිත්හී එතුමාගේ පත් වීම

Non-Commercial Distribution

ගැන විශේෂ ප්‍රීතියක් ඇතිවිය. එතුමා ලංකාවට ගොඩබට්ටු දිනයෙහි චණ්ඩ ලෙස වර්ෂාධාරානිපතනය වීම ද කොටුව තුළ "ඉලැක්ට්‍රික්" නම් විදුලි ආලෝක වත් පහන් නිවීයාම ද, බලවත් ජලගැල්ම පැවතීම ද ජනයාට එතුමා ගේ මතු ආණ්ඩුකාලය සම්බන්ධ අශුභ නිමිතින් පහළවූවාක් මෙන් බොහෝ පීඩා ඇතිවූහ.

එතුමා ලංකාණ්ඩුව භාරගෙන වැඩි කාලයක් ගතවෙන්ට ප්‍රථම අපමණ වියවුල් හටගැනීමට ප්‍රධාන හේතුවක් වූ ගම්පළ වලහගොඩ දේවාලය සම්බන්ධ අති ප්‍රසිද්ධ නඩුව ආරම්භ විය. මේ දේවාලයේ අවුරුදු පතා පවත්වන පෙරහැර මේතාක් කිසිම අවහිරයක් නොමැතිව කරගෙන එමින් තිබුණේය. නුමුත් අලුත් අඹගමුවීදියේ යෝනක පල්ලියක් තනන්ට යෙදුන බැවින් ඒ පල්ලිය අසලින් පෙර හැර ගමන් කරන කල හේවිසි ගැසීම නවත්වන ලෙස තහනමක් මධ්‍යම පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් කරන ලදී. ඊට විරුද්ධව අලාභය ඉල්ලා නඩුවක් වලහගොඩ දේවාලයේ බස්නායක නිලමේ විසින් මහනුවර දිස්ත්‍රික් උසාවියේ පවරනු ලැබ එය ශාස්ත්‍රාචාර්ය පෝල් ඊ. පීරිස් විනිශ්චයකාරතුමන් විසින් කීපදිනක් විභාග කොට පැමිණිල්ලේ වාසියට නඩුතීන්දුව දෙන ලදී. එම තීන්දුව ඇපෑලේදී ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාව විසින් වෙනස් කරනු ලැබ එංගලන්තයේ ප්‍රිවිකවුන්සල් නම් අධිකරණ සභාවට ඇපෑල්ගන්නා ලද්දේය. ඇපෑල රඳා තිබෙන අතරතුර චාමර්ස් උතුමාණන්වහන්සේගෙන් පසු ලංකාණ්ඩුකාරධූරය දරූ කථාශෛෂභාවොපගත සර් ජෝන් ඇන්ඩර්සන් උන්නාන්සේ විසින් සාමදානබේරීමක් කරමින් පුරාණ සිරිතලෙසටම අවසරගැනීමක් නොමැතිව පෙරහැර පැවැත්වීමට ඉඩදෙන ලදී.

වර්ෂ 1914 ක් වූ අගොස්තු මස 4 වෙනි දින යුරෝපීය මහා යුද්ධය ආරම්භ වීමෙන් ලංකාවේ බොහෝ කාලයක් වෙළඳාමෙහි නියුක්තව සිටි පෲඩැන්බර්ග් ආදී ජර්මන් මහතුන් සහ ජර්මන් භික්ෂූන් වහන්සේත් යුද්ධනියමයේ ප්‍රකාර පළමුව දියතලාවේ සිරභාරයේ තබා සිට ලංකාවේ සිංහල සහ යෝනක අරගලය ඇති වූ විට ඔව්හු ඕස්ට්‍රේලියාවට පිට වහල් කර හරින ලද්දාහු ය. මේ යුද්ධය සඳහා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය වෙනුවෙන් සටන් කිරීමට ලංකාවෙන් ද ස්වදේශික භටයෝ බොහෝ දෙනෙක් වරින් වර රණ භූමියට පිටත්ව ගියෝ ය. එසේ පිටත්ව ගිය භටයෝ කීප දෙනෙක් යුද්ධ භූමියේ ජීවිතක්ෂයට පත් වූවාහු ය. චාමර්ස් උතුමාණණ් වහන්සේ ගේ පුත්‍රයන් දෙනෙක් ද තුවාල ලැබීමෙන් මළාහු ය.

යූරෝපිය මහ සංග්‍රාමය කරණ කොට ගෙන ලක් වැසියන් අනේක විධ පීඩාවන්ට භාජන වී සිටිනා තර වර්ෂ 1915 ක් වූ මැයි මස 28 වෙනි දින ලංකාවේ ද එක්තරා විනාශදායක බලවත් සට්ටනයක් ඇති වූයේ ය.

Non-Commercial Distribution

වෙසක් මස පුරපසළොස්වක් දිනය වූ මේ දවසේ මහනුවර පවත්වන ලද බුදුගුණප්‍රකාශිත කැරොල් නම් සංගීත කණ්ඩායමකට යෝනක ජනයා විසින් හිරිහැර කරනලදී. ඉන් කෝපයට පත් බෞද්ධයෝ ද යෝනකයන්ගෙන් පලි ගැනීමට පටන් ගත්තෝ ය. මහනුවරින් හට ගත් මේකුඩා ගිනිරොද නොබෝ දවසක දී එකම වහ්නිස්කන්ධයක් වී මුළු ලංකාද්වීපයම ඉන් දැවෙන්ට වන කොළඹ කැරළි කෝළහලය මරදානේ ඇතැම් දුම්රියකරුවන් විසින් ආරම්භ කරන ලදී, ඔවුන් අතුරෙන් 28 දෙනෙක් අල්වා කිසිම නඩු විභාගයක් නොමැතිව මඩකලපුවට පිට වහල් කර යවන ලද්දාහු ය. ආගමික කෘත්‍යයක් කරණ කොට ගෙන හට ගත් මේ කෝළාහලය යෝනකයන් සහ සිංහලයන් යන දෙපක්ෂය අතර ජාතික හබයක් වී පසුව එය ඇතැම් චෞරයන් විසින් ආත්මාර්ථය සඳහා ආයුධයක් කර ගන්නා ලදී, යෝනක මනුෂ්‍යයන්ගේ කඩ පාස්පු ආදිය ආණ්ඩුවේ නිලධාරීන් බලාසිටිය දී පොඩි කර දමා එහි බඩු කොල්ල කන ලදී. 1915 ක් වූ ජූනි මස 8 වෙනි දින චාමර්ස් උතුමාණන් වහන්සේ විසින් වර්ෂ 1818 ටෙ වෙල්ලස්සේ කෝලාහලයෙන් පසු මාර්ෂල්ලෝ නම් යුද්ධ නීතිය දෙවෙනි වරට ප්‍රකාශ කරන ලදී. කැරළි කෝළහල වල මූලිකයන් මෙන් කල්පනා කරන ලද කීප දෙනෙක් යුද්ධාධිකරණ සභාවක් විසින් විනිශ්චය කරනු ලැබ මරණීය දඬුවමට සහ හිර අඩස්සියේ සිටීමට ද පත් කරන ලද්හු ය. සයිමන් විජය සේකර සහ ඇඩ්මන් හේවාවිතාරණ යන මහත්වරු ජාපනේ හිර ගෙදරදී මිය ගියෝ ය. ඩී. එච්. පේද්‍රිස් සහ සමරසිංහ යන මහත්වරු වෙඩි තබා මර ලද්දාහු ය. තවත් අහිංසක බොහෝ දෙනෙක් යුරෝපීය වතුකාරයන් විසින් කිසිම නඩුවක් නොවිමසා වෙඩි තබා ජීවිතක්ෂයට පත් කරන ලද්දා හු ය. යෝනක ජනයාට කරන ලද අලාභ හානි වලට වන්දි ගෙවීම පිණිස වර්ෂ 1915 හේ 23 වෙනි ආඥාපණත ව්‍යයස්ථාදායක මන්ත්‍රණ සභාව විසින් පණවන ලද්දේ ය. ලංකා ඉතිහාසයේ සඳහන් කළ යුතු වැදගත් කාරණයක් නම් මේ සඳහා පවත්වන ලද ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ රැස්වීම මධ්‍යම රාත්‍රි වනතුරු පැවැත්වීමේ මේ රැස්වීමේ දී සිංහලයන් වෙනුවෙන් කාරණ ගෙන හැර දැක් වූ ලංකික උගත් මන්ත්‍රී තැන වූ ගරු කටයුතු රාමනාථන්තුමාගේ කථාවට සත්පැයක කාලය ගත විය. සිංහලන්ට කරන ලද වැරදි ගැන පරීක්ෂා කිරීමට රෝයල් කොමිෂන් නම් ස්භාවක් පත් කරන ලෙස කරන ලද ඉල්ලීම ප්‍රදේශ භාර මහා මන්ත්‍රීතුමා ප්‍රතික්ෂේප කෙළේ ය. සිංහල ජනයා වෙනුවෙන් පාර්ලිමේන්තුවට කාරණ දක්වා සිටීම පිණිස ඊ. ඩබ්ලිව්. ප්‍රේරා සහ ඩී. බී. ජයතිලක යන මහතුන් එංගලන්තයට පිටත්ව ගියෝ ය.

මේ උතුමාණන් වහන්සේගේ කාලයේ දී කරනලද වැදගත් කර්මාන්තයක් නම් චාමර්ස් ග්‍රැනරීස් නම් ධාන්‍යගබඩා විවෘත කිරීම වේ.

Non-Commercial Distribution

එසේම මේ උතුමාණන්වහන්සේ විසින් පපචසූදනී නම් විනය අටුවාව මුද්‍රණය කරවා ප්‍රකෘශයට පමුණු වන ලදහ.

සිංහල ජනයා මහත් කැළඹීමට පත්ව මේ සිටි මේ ප්‍රස්තාවයේ දී එංගලන්තාණ්ඩුව විසින් චාමර්ස් උතුමාණණ් වහන්සේ වර්ෂ 1916 යේ මුල භාගයේ දී ලංකාණ්ඩුකාරධූරයෙන් පහකොට එංගලන්තයට කැඳවන ලද්දේ ය. එවක් පටන් සර් ජෝන් ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ ලංකාණ්ඩකුර ධූරයට ස්ථිර ලෙස පවත්වනතුරු මහසෙක්‍රතාරිස් තැන්පත් ස්ටබ්ස්තුමා ලංකාණ්ඩුකාර ධූයෙහි වැඩ බැලුවේ ය.

# සිංහල සහ යෝනක අරගලය නොහොත් ලංකාවේ සිංහල සහ මරක්කල මිනිසුන් අතර වර්ෂ 1915 වේ දී සිදු වූ බරපතල කෝලාහලය සහ එහි සාහසික ප්‍රතිඵල.

මෙම කෝලාහලය හට ගැනීමට ඇති වූ ප්‍රධාන හේතු කවරේ ද යනු පළමුකොට මෙහි සැකෙවින් විස්තර කරනු ලැබේ. ලංකාවේ ජනගහනයෙන් ඉතා වැඩි කොටස එහි මුල් පදිංචිකාර යන් වූ සිංහල මනුෂ්‍යයෝ ය. ඔවුන්ගේ සංඛ්‍යාව 27,14,614 දෙනෙකි. ඒ ගණනින් 24,74,170 දෙනෙක් බුද්ධාගම අදහන්නෝ ය. ඉතිරි අය ක්‍රිස්තු භක්තිකයෝ ය. සිංහල මිනිසුන්ට වඩා පසු කාලයක මෙහි පදිංචි වූවන් ගෙන් පැවතෙන ද්‍රවිඩ ජාතික මනුෂ්‍යයෝ 5,28,024 දෙනෙක් වෙත්. ඔවුන් අතුරෙන් වැඩි දෙනා හින්දු ආගම අදහන්නෝ ය. ඔව්හු බොහෝ සෙයින් ලංකාවේ උතුරු නැගෙනහිර යන පළාත්වල පදිංචිව සිටිත්. යෝනක ජාතියට අයත් මරක්කල මිනිස්සු වනාහි ඉන් පසු වෙළදාම සඳහා මෙහි පැමිණ පලමු කොට මුහුදුබඩ පළාත් වල පදිංචි වූවන් ගෙන් පැවතෙන් නෝ වෙති. ඔවුන් ද ලංකාවේ චිරස්ථිත ජනසංඛ්‍යාවට ගණන් ගනු ලැබේ. ලංකාවේ මුදල් භාණ්ඩාගාර පිහිටෙව් පසු මුදල් පොළි කිරීමෙන් සහ හාල් ආදි ආහාර ද්‍රව්‍ය විකිණීමෙනුත් වස්තු උපයන පිණිස ඉන්දියාවේ සිට අවුත් නාටු කොට්ටහෙට්ටි මිනිසුන් කොටසක් ද මෙහි පදිංචිව සිටිත් ඔව්හු සියලු දෙනාම ශිව භක්තිකයෝ ය. පුරාණයෙහි ආණ්ඩුව යටතේ ජා රෙජමේන්තු වලට බැඳි සිටි හේවායින් ගෙන් බෝවෙන මලයි නොහොත්

මේ වනාහී වර්‍ෂ 1911 හේදී ගන්නා ලද ජනලෙඛනයේ ප්‍රකාරයි

Non-Commercial Distribution

ජාවර්ගයේ මනුෂ්‍ය කොටසක් ද සිටිත්. ඉතා මෑතදී වෙළඳාම පිණිස පශ්චිම ඉන්දියාවේ සිට බෝරා වර්ගයේ මිනිසුන් කොටසක් ද දකුණු ඉන්දියාවේ මලබාර් රට සිට හම්බයෝ යයි නම් ලත් ජනසමූහයක් ද, අධික පොළියට මුදල් ණයට දී වස්තු උපයන ඇප්ගන්ජාතික ස්වල් දෙනෙක් ද පැමිණ ලංකාව ඔවුන්ගේ වාසභූමිය කර ගත්තෝ ය. මරක්කල ජා, බෝරා, හම්බ,ඇප්ගන් යන මේ පඤ්ච වර්ගික මනුෂ්‍යයෝ සියලු දෙනාම මහමදාගම් කාරයෝ ය. ඔවුන්ගේ මුළු සංඛ්‍යාව 28363 ක් ය.

මේ පරිච්ඡේදයේ මාතෘකා වූ සිංහල සහ යෝනක අරගලය නිපදවිමේ මූලිකයෝ හම්බංකාර මනුෂ්‍යයන් බව නිසැකව ඒත්තු ගැනීමට කරුණු රාශියක් තිබේ. සාමාන්‍යයෙන්ම හම්බංකාරයන්ගේ ක්‍රියා පරිපාටිය සිංහල ජනතාවගේ අප්‍රසාදයට හේතුව පැවතින ඒ කාරණය සත්‍යයක්ම බව ලංකාවේ උසස් සිවිල් නිලධාරියෙක් වූ ඊබී. ඩෙන්හැම් මහතා විසින් ලියන ලද 1911 හේ අවුරුද්දේ ජන ලේඛන වාර්තාවේ වාක්‍යයකින් ඔප්පු වේ. හේ මෙසේයි. මධ්‍යම ශතවර්ෂයන් හි ද යුදෙව්වන් කෙරෙහි යුරෝපාවාසීන් තුළ යම් කිසි අප්‍රසන්න තාවක් පැවතියේ ද, එමෙන්ම කවුඩුලීලාවෙන් ගම් නියම්ගම් පාසා සෑම තැනම පැතිරී වාසය කරන හම්බයන් කෙරෙහිත් එබඳු අසතුටක් ලංකාවේ චිරස්ථිත පදිංචි කාරයන් තුළ ද පවත්නේ ය යනුයි.

හම්බයන්ගේ කොල්ලකාර දුෂ්ටගති ගැන දත් පසළොස් වර්ෂයක් මුළුල්ලෙහි ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රී ධූරයක් දරූ ශ්‍රීමත් ඇස්. සී. උභයශේඛර මැතිතුමා විසින් කෘෂිකර්ම බැංකු වල කාරක සභාව ඉදිරියෙහි දෙන ලද සාක්ෂිකය දී මෙසේ ප්‍රකාශකර තිබේ. සාමන්‍යයෙන්ම හම්බයෝ වනාහි නිත්‍ය පදිංචිකාරයන්ට පීඩා කරන සුලු වූ ආගන්තුක මිනිසුන් කොටසක් ය. ඔව්හු සුලු මුදලක් රැගෙන මෙහි විත් ක්‍රම ක්‍රමයෙන් වැසියන්ගේ ඉඩම් අයිතිකර ගනිත්. විල්සන් බල්ගාව අසල මගේ මෙහෙකරුවෙකුට අයිති රුපියල් 2,000 ක් පමණ අගනා ඉඩම් කැබලි කීපයක් රුපියල් තුනකට මිලයට ගත හැකි වීබුසල් දෙකක් ණයට දීමෙන් හම්බන්කාර මිනිහෙක් අයිති කර ගන්ට කළ හැකි කෛරාටික ක්‍රියාවන් ගැන මම දනිමි. කල්යාම කදී වී බුසල් දෙකේ මුදල පොළිත් සමග රුපියල් 250 ට නැංගේ ය. රටේ මහත්මයා රුපියල් 250 හම්බයාට ගෙවා ඉඩම් ගෙවා ඉඩම් බේරා ගත්තේ ය යනුයි. වර්ෂ 1914 වේ අප්‍රියෙල් මාසේ දී මහනුවර රාජමන්දිරයෙහි දී ලංකාණ්ඩුකාරධූරය දරූ ශ්‍රීමත් රොබට් චාමර්ස් උතුමාණණ් වහන්සේ ඉදිරියෙහි බැද්දෙවල මහතා විසින් කරන



Non-Commercial Distribution

ලද කථාවක දී හම්බයෝ වැසියන්ගේ ඉඩම් කොල්ලකන පරිදි මොනවට විස්තර කර තිබේ. මේ විදේශිකකයන්ගේ කොල්ලකාර ගති වලට වඩා ඔවුන්ගේ අශික්ෂිත දුශ්චරිත ක්‍රියා ශිලාචාර මනුෂ්‍යන්ට නුරුස්නා ලෙස පවත්නේ ය. වර්ෂ 1914 දී යූරෝපීය මහා සංග්‍රාමය ආරම්භ වූ කෙණෙහිම හම්බයින්ගේ ආපණ ශාලාවන්හි ආහාර ද්‍රව්‍ය හේතු රහිතව මිල වැඩි කිරීමෙන් ඔව්හු අසරණයන් මහත් ව්‍යසනයට පත් කළෝ ය. ඇතැම් ප්‍රස්තාවන්හි දී ඔවුන්ගේ මේ සාහසික ක්‍රියා මැඩ පැවැත්වීමට ආණ්ඩු වේ මුළාදෑනීන් පවා මැදහත්වෙන්ට සිදු විය.

මෙසේ අයථාක්‍රමයෙන් හම්බයන්ගේ ධනය සහ ජනසංඛ්‍යාවත් වර්ධනයවේගන එන අතර ඔවුන්ට දේශාධිපතියන්වීමේ ගර්විතාභිලාෂයක් ඇතිවී ඔව්හු බෞද්ධයන්ගේත් හින්දූවරුන්ගේත් ආගමානුකූල කෘත්‍යයන්ට පවා බාධා පමුණුවන්ට ආරම්භ කළෝය. මේ ආරම්භයෙහි විෂබීජය මේ විදේශික හම්බකංර මනුෂ්‍යයන් විසින් මීට අවුරුදු 800 කට පමණ ප්‍රථම සිංහල නරපති තුමෙකු විසින් පිහිටුවන ලද ගම්පළ වහල ගොඩ දේවාල භූමියෙහි රෝපණය කරන ලදී. එම බීජයෙන් උද්ගත විශාල වෘක්ෂයෙන් හටගත් ඵල අපරීක්ෂක ලෙස ආඝ්‍රාණය සහ අනුභව කිරීමෙනුත් බොහෝ අයවලුන්ට පැමිණෙන ලද අනේක විධ විපත්ති රාශිය තද නත්රව විස්තර කරනු ලැබේ.

## ගම්පළ පෙරහැර

දැනට ගම්පළයයි ව්‍යවහාර කරනු ලබන නගරය දස සතරවෙහි ශත වර්ෂයේ දී මේ දිවයින ආණ්ඩු කළා වූ සතරවෙනි භුවනෙකබාහු මහරජාණන් කලැ ගංගාසිරි පුර යන නාමයෙන් ප්‍රසිද්ධව පැවතුණා ය. එවක් පටන් රාජණ්ඩු කීපයක් මුළුල්ලෙහි මේ නගරය ලංකාවේ අග්‍රරාජධානි ය ලෙස සලකන ලද්දී ය. ඒ කාලයෙහි බෞද්ධයන්ගේ වන්දමානාදි ය සඳහා හෙනකන්ද බිසෝ බණ්ඩාර මහේසිකා උත්තමියගේ ශාරීරික ධාතු ස්ථාපිත කිරීමෙන් ඒ නගරයෙහි තනන ලද වලහගොඩ දේවාලය පූජනීය සිද්ධ ස්ථානයක් වූවා ය. එවක් පටන් අද දක්වාත් වර්ෂයක් පාසා ඇසළ පසළොස්වක පැමිණෙන මාසයෙහි යථොක්ත දේවාලය සම්බන්ධව බෝතලාපිටියේ පාරුතොට නම් ස්ථානයේ දිය කැපීමේ මංගල්‍යය පිළිබඳ වැ අලංකෘත පෙරහැරක් පවත්වා ගත යාම චාරිත්‍ර ධර්මයක් විය. ඇම්බැක්ක, වෑගිරිය ගඩලා දෙණිය, ගණේගොඩ යන මේ දේවාලවල පෙරහැර ද මේ හා සම්බන්ධ වේ. වර්ෂ 1815 දී මෙම දිවයින බ්‍රිතාන්‍ය ධ්වජයට යටත් කර ගත් ප්‍රස්තාවේ දී බෞද්ධාගමේ විහාර දේවාල පිළබඳ පැවති සියලු සිරිත්

Non-Commercial Distribution

විරිත් අඛණ්ඩව ආරක්ෂා කර දෙන ලෙස එංගලන්තයේ මහ රජතුමා වෙනුවෙන් බ්‍රවුන්රිග් උතුමානන් වහන්සේ විසින් අත්සන් කර සිංහල ජනාධිපතීන්ට දෙන ලද වගන්ති දස සතරකින් යුත් ගිවිසුම් පත්‍රයෙහි එක් වගන්තියකින් පොරොන්දු වී තිබේ. එසේ ද වුවත් මෑත කාලයෙහි අනිකු දු බෞද්ධ හින්දු පෙරහැරවලට මෙන්ම මේ පෙරහැර පැවත්වීම ට ද වර්ෂයක් 0පාසා පළාතේ ප්‍රධාන මුලාදෑනි තැන ගෙන් මහනුවර ඒජන්තතුමාගෙන් අවසර පත්‍රයක් ලබා ගැනීමට නියෝගයක් ඇති විය. වලහගොඩ ද්වාලවල භාරකාරයෝ ද ඒ නියෝග පිළිපදිමින් ආණ්ඩුවෙන් කිසි තහනමක් නොමැතිව නියම වූ අවසරය ලබාගනිමින් අවුරුදු කීපයක්ම පෙරහැර පවත්වා ගෙන ආවෝ ය. නුමුත් වර්ෂ 1912 දි පෙරහැර පැවැත්වීමට අවසර පත්‍රය දීම සම්බන්ධව තදබල සට්ටනයක් ඇති විය. එය හට ගන්නා ලද්දේ හම්බන්කාරයන් විසින් මහනුවර ඒජන්තතුමාට දෙන ලද අයදුම් පතක් හේතු කොට ගෙන ය. වලහ ගොඩ දේවාලයේ අවුරුදු පතා පවත්වන පෙරහැර එහි සිට ගම්පළ අඹගොමුවේ වීදිය පසු කොට ගංගාතිලක විහාරයට යාම සිරිතක්ව තිබුණේ ය. දූනට අවුරුදු තිහකට පමණ ප්‍රථම හම්බන්කාරයන් විසින් එම වීථියේ ඔවුන්ගේ පල්ලියක් තනවන ලදී, එම පල්ලියේ දෙකෙළවරට යාර සියයක් ඇතින් පෙරහැරේ හේවිසි සහ අනිකුත් තූර්‍යනාද නවත්වන්ට සැලැස්වීම එකී පෙත්සමේ සඳහන් කළ ඔවුන් ගේ චෝදනාව විය. මේ ආයාචනාවය පිළිබඳ අතිශයින් සැලකිය යුතු කාරණයක් තිබේ. පෙරහැර ගමන්කරන්නා වූ මාර්ගයේ ලංකාවේ මරක්කල මිනිසුන් විසින් සිංහල රජ කාලයේ ගොඩනගන ලද තවත් පුරාණ මොහම්මත් පල්ලියක් තිබේ. හම්බ්යින්ට වඩා ලංකාවේ පෞරාණික පදිංචිකාරයන් වූ ඔවුන්ට වලහගොඩ දේවාල පෙරහැර ඔවුන්ගේ ආගමානුකූල කෘත්‍යයන්ට බාධාවක් පැවතියේ නම් පෙරහැරේ තූර්‍ය නාද ඔවුනගේ දේවස්ථානය අසලදීත් නවත්වා ගෙන යාමට මහනුවර ඒජන්තතුමාට ආයාචනාවක් කිරීම ඔවුන්ගේ යුතු කමක්ව තිබුණේ ය. ඔවුන්ගේ නිශ්ශබ්දතාවයෙන් ද හම්බන්කාර ජනයා තමන් පිටට ආරූඪකර ගැනීම අදහස් කරන ලද සෛවරී එඩිතරගතිය මොනවට ප්‍රකාශ වේ. මේ පෙරහැර පිළිබඳ පැවති පෞරාණික විධිවිධාන සහ චාරිත්‍රධර්මතාත් හම්බයින්ගේ විරුද්ධතාවයේ නිසාර ස්වභාවත් තර්කානුකූලව විස්තර කර දෙමින් බෞද්ධ විහාර දේවාල ආඥාපණත යටතේ උඩරට සභාපති තැන වූ ද මහනුවර දළදා මාලිගාවේ දිවඩන නලමේ ද වූ ද පී. බී. නුගවෙල මහතා විසින් මධ්‍යම පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා වූ සැක්ස්ටන් මහතා වෙත ලියවිලි කීපයක්ම යවන ලදී. එහෙත් ඒ ලියවිලි කිසිවක් තණපතකුදු පමණ නොසලකා මේ දිවයින තමන්ගේ පාලනයට ගන්නා විට ඉංග්‍රීසි ආණ්ඩුව විසින් අත්සන් කර දෙන ලද ගිවිසුම් පත්‍රය නොවටිනා කඩදාසි කැබෙල්ල මෙන් සලකා සැක්ස්ටන් මහතා විදේශික හම්බයන් ස්වල්ප

Non-Commercial Distribution

දෙනෙකුගේ ආත්මාර්ථකාමී එඩිතර ඉල්ලීමට කන් යොමුකරීමෙන් ශතවර්ෂ අටක් මුළුල්ලෙහි බෞද්ධයන් විසින් අඛණ්ඩව පවත්වා ගෙන ආ වලහගොඩ දේවාල පෙරහැර සිරිත් ප්‍රකාර පැවැත්වීමට බාධා පැමිණෙව්වේ ය. ඒ වලහ ගොඩ දේවාල පෙරහැරේ හේවිසි ගැසීම්, බෙරවැයීම් සහ වෙනත් තූර්යනාද පැවැත්වීම් කවර ආගමක ද උවත් පූජනීය ස්ථානයකට යාර 100 කට ඈතදී නැවැත්විය යුතු යයි යන නියමයක් ද ඒ පෙරහැර හම්බන්කාරයන්ගේ මහමද්පල්ලිය පිහිටුවා තිබෙන අඹගොමුවේ වීථියෙන් ගමන් කිරීම ගැන තහනමක් ද ආණ්ඩුව විසින් කෙළේ ය. මේ තහනම කරණ කොට ගෙන ලංකාවේ වලහගොඩ දේවාලය පිළිබඳ අතිසංවේග ජනක නඩුව ආරම්භ විය. එම නඩුව එවකට මහනුවර දිස්ත්‍රික් නඩුකාර තැන්පත් ඇම්. ඒ. ඇල්. ඇල්. ඩී. යන විශිෂ්ටතර උපාධ්‍යය නාමධාරි පෝල්. ඊ. පීරිස් මන්ත්‍රීවරයාණන් විසින් කිප දිනක් මුළුල්ලෙහි ඉතා තීක්ෂණ ලෙස විසඳනු ලැබ අතී දීර්ඝ නඩු තීන්දුවකින් බෞද්ධයන්ගේ වාසියට නිශ්චය කරන ලදහ. එහෙත් එම නඩුව තීන්දුව ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාව විසින් වෙනස් කරන ලදී. මන්දෝත්සාහයට නොපැමිණි බෞද්ධ පක්ෂයේ පැමිණිලිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නඩු තීන්දුවට විරුද්ධව එංගලන්තයේ ප්‍රිවිකවුන්ස්ල් නම් රාජකීය නීතිඥ මන්ත්‍රණ අධිකරණ සභාවෙන් දෙවෙනි විනිශ්චයක් අයැද සිටින ලද්දේ ය. එම ඇපෑල එංගලන්තයෙහි රඳනා අතර එවකට ලංකාණ්ඩුකාරධූරය දරූ කථාශේෂභාවොපගත සම්භාවණීවය ශ්‍රීමත් ජොන් ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ විසින් පෞරාණික සිරිත් වලට අනුව වලහගොඩ දේවාල පෙරහැර වීථී සංචාරණය කිරීමට අවසරය දීමෙන් සහ දෙපක්ෂය සමගි කරවීමෙනුත් මේ ඛේදජනක අරගලය සංසිඳීවීමට පමුණූ වන ලදී.

දනට අවුරුදු 35 හක පමණ කාලයේ සිට ගෞතම බුදුරජාණන් වහන්සේගේ උත්පත්ති දිනානුසමරණය කිරීම පිණිස ලංකාවේ නොයෙක් පළාත්වල බෞද්ධාගම් කාරයන් විසින් වෙසක් පසළොස්වක දින බුදුගුණ ප්‍රකාශිත ගීතිකා ගායනා කණ්ඩායම් හෙවත් වෙසක් කැරෝල් පවත්වා ගෙන එති. එබඳු කැරොල් එකක් වර්ෂ 1915 හේ අවුරුද්දේ මහනුවර පැවැත්වීමට බෞද්ධ සමාගමක් විසින් පොලීසියෙන් සිරිත් ප්‍රකාර අවසර ඉල්ලන ලදී. මීට ප්‍රථම අවුරුදු වල පොලීසිය විසින් දෙන ලද අවසර පත්‍ර වල කර තිබුණ නියමය නම් කවර පූජනීය ස්ථානයක උවත් ආගමානුකූල කෘත්‍යයන් පවත්වන කාලය තුල ඒ ස්ථානයට යාර සියයක් ඇතදී තූර්‍ය්‍යනාද නැවැත් විය යුතු බවය. එහෙත් මේ අවුරුද්දේ නිකුත් කරන ලද අවසර පත්‍රයේ ඊට වඩා විශේෂ වෙනසක් ඇතිවිය. එනම් මහමදාගම් කාරයන්ගේ පල්ලියකට යාර සියයක් ඇතදි තූර්ය නාද නැවැත්විය යුතුය යන අතිරේක වාක්‍යක් ඊට ගළපා තිබීම ය. වර්ෂ 1915 හේ අවුරුද්දේ මැයි මස 28 වෙනි

Non-Commercial Distribution

දින අවසර ලත් මේ කැරොල් කණ්ඩායම බර කරත්ත දෙකකින් මහනුවර කාසල් හිල් වීථියට සමීපව යන විට කුරේ ඉන්ස්පැක්ටර් මහතා විසින් ගීතිකාකරුවන්ගෙන් සහ තූර්ය වාදකයන් ගෙන් යුත් බර කරත්ත දෙක එම වීථියේ ගමන් කිරීම තහනම් කොට දෙපසකට හරවා යවන ලදී. එවිට ඒ සන්ධියේ සිට යාර 120ක් පමණ ඈතින් පිහිටි යෝනක පල්ලියේ රැස්ව සිටි මරක්කලයෝ කැරොල් කරුවන්ටහූ කියමින් සරදම් කරන්ට පටන් ගත්තෝ ය. මේ අපහාස සහිත විහිලු ඉවසා ගත නොහැකිව පළමුවෙන් හරවා යවන ලද කරත්තේ සිටි කණ්ඩායම එය ආපසු හරවා ගෙන යෝනක පල්ලිය දෙසට ගමන් කළේ ය. එකෙණෙහිම කැරොල් කණ්ඩායම පසු පස්සේ ගමන් කළ බෞද්ධයන්ට මරක්කලයෝ ගල්ගසන්ට පටනේ ගත්තෝ ය. මේ චණ්ඩ ක්‍රියාවෙන් උදහසට පමුණුවනු ලැබූ බෞද්ධ සෙනග පල්ලිය තුළට වැදී එහි ලාම්පු සහ අරුමෝසම් බඩු බාහිරාදියත් පොඩි කෙළේ ය. සමහරු මරක්කල කඩවලට වැද අලාභ හානි කළෝය. මේ කලහය හේතු කොට ගෙන දෙපාර්ශවේ කිසිවෙකුට වැඩි බර පතල තුවාලයක් සිද්ධ නොවී ය. වැඩි වේලාවක් යන්ට ප්‍රථම කුරේ ඉන්ස්පැක්ටර් මහතා පොලිස් භටයින් රංචුවක් සමග කෝළාහල සිදුවෙන ස්ථානයට එළඹ කලහකරුවන් විසිර හැරියේ ය. මේ කලහයට සම්බන්ධ වූවහයි සංඥා ලැබූ බොහෝ දෙනෙක් සිරභාරයට ගෙන විසි අට දෙනෙකුට විරුද්ධ නඩු පවරන ලදී, දන්ත ධාතු මන්දිරය බිඳ හෙළිමට කොළඹ සිට යෝනක පිරිසක් එන්නිය යන ප්‍රවෘත්තියක් පතළවීයාමෙන් පසුවදා සවස අවට ගම් වලින් රාශි ගණන් බුද්ධාගම්කාර ජනයා මහනුවරට රැස්වෙන්ට පටන් ගත්තෝ ය. මැයි මස 29 වෙනි දින රාත්‍රී දුම්රියෙන් කොළඹ සිට මහනුවර දක්වා ගමන් කළ හම්බයන් කණ්ඩායමක් ආණ්ඩුව විසින් කඩු ගන්නාවේ දී බස්වා නතර කෙර වූ බැවින් යථොක්ත ආරංචියේ යම් කිසි සත්‍යයක් තිබෙන්ට ඇතැයි සිතිය හැක. මෙදින රෑ හම්බයෙක් විසින් සොල්දරයක සිට පාරේ ගමන් කළ අහිංසක සිංහල ගැටයෙක් වෙඩිතබා මරණ ලදී යන පුවත පසු දින උදෑසන දනගන්ට ලැබීමෙන් මහත් කලබල ඇති විය. සොල්දර ගෙය සහ වෙඩිල්ල තැබූ හම්බයාත් හොඳින් දනගත් නුමුත් ආණ්ඩුව මිනී මැරීමේ අපරාධය ගැන තුෂ්ණිම්භූතව පොලීසිය උත්සාහ නොගැනීම හේතු කොට ගෙන උදහසට පත් ඇතැම් සිංහලයෝ මැයි මස 30 වෙනි දින රාත්‍රියේ මරක්කලයින්ගේ සහ හම්බයින්ගේත් කඩ බිඳ බඩු බාහිරාදියා සුණු විසුණු කරන්ට පටන් ගත්තෝ ය. විලියම් දුනුවිලදිසාමැතිතුමා ප්‍රධාන කොට ඇති බෞද්ධාගම්කාරයන් ගෙන් සහ ක්‍රිස්තියානිකාරයෙන්ගෙන් ද ද්‍රවිඩ සහ මහමත් ජාතිකයන් ගෙන් ද යුත් ප්‍රභූ පිරිසක් මධ්‍යම පළාතේ ඒජන්තුමා සහ පොලීසියේ ඉන්ස්පැක්ටර් ජනරල් තුමාත් සම්භවී සිංහලයන්ගේ පැමිණිලි අසා ඔවුන් කෙරෙහි යුක්තිය ඉටු කරලීමට පොරොන්දු උනොත් කෝලාහලකාරයෝ විසිරී යනවා ඇතැයි දනුම් දුන්නේ ය. නුමුත්

Non-Commercial Distribution

අවස්ථාදායි ලෙස කරන ලද ඒ ඥාණවන්ත යෝජනාවේ ප්‍රකාර නගර ශාලාව අවට රැස් වී සිට හෘද වේදනාවට පත් සිංහල සෙනග ඉදිරියට ගොස් ඔවුන් අස්වසාලීමෙන් සහනය කරනුයෙහෙකැයි යන මෘදු කල්පණාවක් යථෝක්ත නිලධාරීන් දෙදෙනා කෙරෙහි විද්‍යමාන නු වූහ. ඉක්බිති වීථියේ සංසුන් ලෙස ගමන් කළ ආණ්ඩුවේ සිංහල ලිපිකරුවෙකුට යෝනකයෙකු විසින් පිහියකින් ඇන තුවාල කරන ලද්දේ යයි යන ආරංචියක් ලැබී සිංහලයෝ ඒ සාහසික ක්‍රියාව සිදු කරන ලද ස්ථාන යට වහ වහා දුවන්ට පටන් ගත්තෝ ය. එහි දී යෝනකයන් සහ සිංහලයන් අතර සටනක් ඇති වී සිංහල සහ මරක්කල මිනිස්සු හතර දෙනෙක් ජීවිතක්ෂයට පැමිණියහ. මේ කෝලාහලය සංසිඳවීමට පොලීසියේ ඉන්ස්පැක්ටර් ජනරල් තැන වූ ඩව්බිගින් මහතා පන්ජාබි හේවායන් ටික දෙනෙකුත් සමග පැමිණි කඩිණමින් කෝළහලකාරයන් භයින් ත්‍රස්ථව විසිරී යාමෙන් පළමු පරිදි මුළු නගරයේ සමාදාන නිශ්චයව ස්වභාවයක් ඇති විය. මේ ක්‍රියාව පොලීසියේ ඉන්ස්පැක්ටර් ජනරල්තුමා විසින් ඊට පැය 48 කට ප්‍රථම කරන ලද්දේ වී නම් ලංකාවේ නොයෙක් දිසාවන්හි විදුලියක් බඳු වේගයෙන් පැතිරී ගිය මේ මහා වහ්නිස්කන්ධයාගේ සම්භවයට හේතු වූ මේ භයානක ගිනි පුපුර එකෙණෙහිම නිර්වාණය කළ හැකිව තිබුණේ ය.

වෙසක් පොහෝ දින ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඳීමට මහනුවර දළදා මාලිගාවට පිට පළාත් වලින් ගිය වන්දනාකරුවන්ගෙන් යථෝක්ත කෝලාහලය සම්බන්ධ නානා ප්‍රකාර ආරංචි රටේ සෑම තැනම වහ වහා පැතිරෙන්ට පටන් ගත්තේ ය. මේ කාලයේ ජර්මනියට පක්ෂව මහ මදාගම්කාර ජාතියක් වූ තුර්කිවරු ඉංග්‍රීසින් සමග යුද්ධයට එළඹී සිටි බැවින් ඔවුන්ගේ ලබධිකයන් වූ ලංකාවේ මරක්කලයින්ට හිංසා පීඩා කිරීමට ලංකාණ්ඩුව අනුබල දෙන්නේ ය යන මුළා හැඟීමක් සමහරුන් තුළ ඇති විය. ජර්මන් මහා යුද්ධය ආරම්භ වූ කඩිණමින් ලංකාවේ හම්බන්කාර සහ මරක්කල වෙළෙන්දෝ කිසිම කරුණක් නොමැතිව ඔවුන්ගේ වෙළඳ ශාලා වල ද්‍රව්‍යයන්ගේ මිල ගණන් වැඩි කරන්ට පටන් ගත් බව මීට ප්‍රථම සඳහන් කරන ලද්දේ ය. කොළඹ දුම්රිය කර්මාන්ත ශාලාව ඉදිරිපිට පිහිටුවා තිබුන හම්බන්කාරයෙකුගේ කඩය තේ වතුර මිල වැඩි කොට විකිණීම ගැන දුම්රිය කම්කරු සමහරෙකු සහ කඩකාරයාත් අතර වර්ෂ 1915 ක් වූ මැයි මස 31 වෙනි දින කටුක වූ තද බල කථාවක් ඇති විය. ගම්පළ පෙළහැර සමබන්ධව සහ ස්වල්ප දිනකට ප්‍රථම මහනුවර වෙසක් කැරොල් එක පිළිබඳවත් හම්බන්කාරයන් විසින් සිංහල බෞද්ධයන්ට කරන ලද බලවත් අයුතුකම් මේ කම්කරුවන්ට සිහිපත්වීමෙන් විෂසෝරයන් මෙන් උරණයට පත් වූවාහු වීථිය අද්දර රැස් කර තිබන ගල් ගොඩකින් ගල් රැ ගෙන තේ වතුර කඩේට ගසන්ට පටන් ගත්තෝ ය. වැඩි වේලාවක් ගත

Non-Commercial Distribution

වෙන්ට ප්‍රථම ඔව්හු හම්බන්කාරයන්ගෙ යාබද කඩ හතරක් පොඩි කළෝ ය. දුම්රිය කර්මාන්ත ශාලාවේ මධ්‍යහ්න කාලයේ වැඩ පටන් ගැනීමට නලා ශබ්දය ඇති වූ කඩිණමින් කම්කරුවෝ කෝලාහලය නවත්වා කම්හලට ඇතුල් වූවෝ ය. මේ අරගලය සිදු වූ ස්ථානයට කොළඹ මහ පොලීසියේ සිට දුර ප්‍රමාණය යාර සියයක් පමණ ඇත. එහෙත් මෙතරම් සාහසික ක්‍රියාවක් මැඩ පැවැත්වීමට හෝ කෝලාහලකාරයින් ඇල්ලීමට එකම පොලිස් භටයක් වත් කිසිම උත්සාහයන් නොකෙළේ ය. කඩ හතර පොඩි කිරීම කලින් අදහස් නොකොට හදිස්සියෙන් කරන ලද්දක් බව සිතන්ට බොහෝ කරුණු තිබේ. සවස් භාගයේ දුම්රිය කර්මාන්ත ශාලාවේ දොරටු යතුරුලා වසා එහි මුරතබා ආණ්ඩුව විසින් නාගරික සභාවේ මන්ත්‍රිවරු කැඳවා ඔවුන් ලවා කම්කරුවන්ට අනු ශාසනාවක් කරවන ලදී. ජනාදිපතියන් වූ ප්‍රභූ මන්ත්‍රීවරු කීප පොළක් තමන්ගේ දෙපතුල් සමීපයට එළඹ කෝලහල නොකරන ලෙස තමන්ට ආයාදනා කීමෙන් තමන් විසින් ආණ්ඩුව පවා භීතියට පමුණුවන වික්‍රම්විත ක්‍රියාවක් කරන ලද්දේ වනැයි යන අහංකාර පරවශ හැඟීමක් කම්කරුවන්ගේ සිත් තුළ ජනිත වූවාට කිසිම අනුමානයක් තිබුණ බැවින් කම්කරුවන්ට ඔවුනොවුන්ගේ වාස ස්ථාන වලට යාම නොහැකි විය. මේ කම්කරුවෝ බොහෝ දෙනෙක් බම්බලපිටිය, දෙහිවල, ගල්කිස්ස, මොරටුව ආදී පළාත් වල පදිංචිකාරයෝ ය. මුහුදු බඩ දෙසට ගමන් කරන අන්තිම දුම්රිය පිටත් වූවාට පසු කම්හලේ දොරටු විවෘත කරන ලදී. කම්කරුවන්ට තමන්ගේ නිවාස කරා යාමට නොහැකි වූයෙන් ඔව්හු ජාත්‍යලයක් මුදුන් පත් කොට අඬහැර පවත්වමින් මරදානේ යෝනකයින්ගේ කඩ වලට නැවතත් ගල් ගසන්ට පටන් ගත්තෝ ය. මේ නීති විරෝධි චණ්ඩ ක්‍රියාව නැවැත්වීමට කිසිවෙක් මැදහත් නූණේ ය. කඩ දෙකකට අළාබ හානි කළාට පසු පොලිස් භටයෝ දෙදෙනෙක් පැමිණ කෝලාහලකාරයන්ගේ සමහරෙකු අල්ලා අසළ පොළිසියට ගෙන ගියෝ ය. කෝලහලකාරයන්ගේ සමහර කම්කරුවෝ පසු පස්සේ ගොස් ඔවුන්ගේ මිත්‍රයන් නිදහස් කරන හරින ලෙස පොලිස් නිලධාරීන්ගෙන් ඉල්ලා සිටියෝ ය. නිලධාරිහු භයට පැමිණියාක් මෙන් යථොක්ත එඩිතර ඉල්ලීම ඉතා විස්මිත ලෙස ඉෂ්ට කළෝ ය ඉන්පසු පොලීසියේ දුර්වල ගතිය කෝලහලකරුවනට මනාසේ අවබෝධ වීමෙන් ඔවුන්ගේ සිත් බෙහෙවින් ගර්වත වූහ. නොබෝ වේලාවක දී කොළඹ නගරයේ රැකී රක්ෂාවක් නොමැතිව කුසීත නියා කාලක්ෂය කරමින් තන්හි තන්හි හැසිරෙන පාදඩයෝ සහ නිත්‍ය සාපරාදික යෝත් කෝලාහලකාරයන්ට එකතු වූහ. පලිගැනීමක් වශයෙන් නගරයේ මරක්කලයින්ගෙන් සහ හම්බයින් ගෙන් ගහනවූ ප්‍රදේශ දෙකක කඩ සියල්ලම කලහකරුවන් විසින් ගල් මුගුරු ආදියෙන් ගසා කඩන ලදී. ඉක්බිති වස්තු තණ්හාවෙන් ඔවුන් පසු පස්සේ ගමන් කළ චෞරයන් විසින් කඩවල බඩුබාහිරාදිය සිත් සේ පහැර ගන්නා

Non-Commercial Distribution

ලදහ. පොලීසියේ උපේක්ෂාව දුටු කෝලාහලකාරයෝ ද තක්කඩිද ජූනිමස 1 වෙනි දින කණ්ඩායම් වලට බෙදී ගොස් පිටකාටුවේ සහ නගරයේ අනිත් පළාත් වලත් යෝනකයින්ගේ කඩ බිඳ බඩු කොල්ලකෑමෙහි රිසිසේ නියුක්ත වූහ. මෙකල් යුද්ධා යුද සන්නද්ධ අශ්වා රෝහක සහා පාබල නගරා රක්ෂක යොත් පොලිසි භටයෝත් වීථි සංචාරණයට පටන් ගත් නුමුත් ඔවුන්ගෙන් කිසි බාධාවක් නො මැතිව කඩ සාප්පු කැඩීමේත් මංකොල්ල කෑමේත් ක්‍රියා නිරායාස යෙන් කර ගෙන යන ලදී. චෞර ස්ත්‍රීන් සහ කුඩා ළමෝ පවා සමාදානය ආරක්ෂා කිරීමට එවන ලද මේ රාජපුරුෂයන්ගේ ඇස් හමුවේ කඩ සාප්පු වලට වැද ප්‍රසිද්ධියේම බඩු බාහිරාදිය තමන්ගේ දෙපල මෙන් ඉවත් කර ගෙන ගියේ ය. නිලධාරීන්ගේ නිශ්චල ගතිය දුටු කාරණ තේරුම් ඇති බුද්ධමතුන් තුළ පවා මේ සාහසික ක්‍රියාවන් ආණ්ඩුවේ අනුබලය පිට කරත්ය යන විශ්වාසයක් ඇති විය. මරක්කලයින්ට කවර හිංසාවක් කරන ලද්දේ වී නුමුත් ආණ්ඩුවෙන් ඊට විරුද්ධයක් නොමැතිව යන ආරංචිය ලංකාවේ නගර වල සහ පිටිසර බද ගම් නියම් ගම් වලත් විදුලි බලයෙන් මෙන් පැතිරී ගියේ ය. එය සාමන්‍යයෙන්ම ඒ ඒ පළාත් වල වසන මංපහරන හොරුන්ටත් ගෙවල් උමංකන තක්කඩින්ටත් තුෂ්ටිදායක ආරංචියක් විය. මංකොල්ල කෑමට එබඳු මැහැඟි ප්‍රස්ථාවක් ඔවුන්ට කිසි කලක නොලැබෙන බව කල්පනාවට ගෙන ඔව්හු තම තමන්ගේ ගම් අසළ පිහිටි මරක්කලයන්ගේත් හම්බයන්ගේත් කඩ සාප්පු සහ ගෙවල් බිඳ එහි තිබුණ රෙදි, පිළි, මුදල් සහ අනිකුත් ද්‍රව්‍යත් සිත් සේ පැහැර ගත්තෝ ය. මේ අතර සංවේග ජනක නානා ප්‍රකාර අසත්‍ය ආරංචි රටේ සෑම දිග්භාගයන්හි පැතිරෙන්ට වන. ඒ ආරංචි ඇසූ සමාදානයට හිතැති ධර්මිෂ්ඨ සිංහල බෞද්ධයන්ගේ ද ක්‍රිස්තු භක්තිකයන්ගේ ද සිත් පවා චංචල විය. සමහර මරක්කල මිනිසුන් විසින් තම ගෙවල මෙහෙ කිරිම පිණිස නවත්වා ගෙන සිටින සිංහල ඉංග්‍රිසීන්ට ආරක්ෂිත අඩන් තේට්ටම් කොට ඔවුන් දූෂ්‍ය කරන ලද්දේ යන ආරංචියක් ද පැතුරුණේ ය. මහනුවර දන්තධාතු මන්දිරය සහ කොට හේනේ සාන්ත ලූසියා ආසන දෙව් මැදුරත් යෝනකයන් විසින් ඩයින මයිට් වෙඩි දමා පුපුරවා විනාශ කරන ලදැයි යන ආරංචියක් තන්හි තන්හි පැතිරී ගියේ ය. එලෙසම ඇතැම් බෞද්ධ මංසන්ධි ස්ථානත් ක්‍රිස්තියානි පල්ලිත් බිඳ හෙලා දැමීමට මරක්කලයින් සහ හම්බයෝ රංචු ගැසි එන්නෝ ය යන ආරංචිය ඇසීමෙන් අහිංසක බෞද්ධ සහ ක්‍රිස්තියානි ජනයා තමන්ගේ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනිමට එහි රැස්වෙන්ට පටන් ගත්තෝ ය. එහෙත් එකී ස්ථාන වලට පැමිණි චෞරයන්ගේ අදහස ආගමාලය නොව වස්තු ආලය බව ප්‍රත්‍යක්ෂ විය. ඔව්හු අවංක අදහස් ඇති වැදගත් ප්‍රභූ ජනයාට මුවා වී ඔවුන්ගේ කොල්ල කෑමෙහි වැඩේ නොකඩව කර ගෙන ගියෝ ය.

Non-Commercial Distribution

අන්තිමේ දී කැරළිකාරයන්ට වෙඩි තැබීමටත් බයිනෙත්තු වලින් ඇනීමටත් ආණ්ඩුව විසින් ආඥා කරන ලදි. මේ ආඥාව ඉෂ්ට කරන්ට පටන් ගත් කෙණෙහිම කැරලීකාරයන් ඔබ මොබ විසිරී යාමෙන් කෝලාහලය සංසිඳ ගියේ ය. මහනුවර කැරළි කෝලහලය තෙදිනකට වැඩි කාලයක් නොපැවතුණේ ය. පන්ජාබ් හේවායන් ඉදිරියට පැමිණි කඩිණමින් කලහකාරයන් පැන දිව් බව ඉහත සඳහන් කරන ලදී, හතළිස් අට පැයක් ඇතුළත කොළඹ කෝලාහල සියල්ලම සංසිඳි ගියේ ය. පිට පළාත් වලට ද ජූනි මස 5 වෙනි දිනට ප්‍රථම පෙර පැවති නිශ්චල ස්වභාව ඇති විය. යෝනකයන් ආරක්ෂා කොට වැරදි කරුවන්ට දඬුවම් පැමිණවීම ආණ්ඩුවේ ස්ථිර අදහස බැව් හොඳින් දැන ගත් පසු කිසිම සිංහලයෙක් කිසිම සාහසික ක්‍රියාවක් නොකෙළේ ය.

ඇතැම් කෝලාහලකාරයෝ භයින් ත්‍රස්තව පිටිසරබද පළාත්වලට ගොස් සැඟවුණෝ ය. යටත් පිරිසෙයින් මේ ශෝක ජනක කැරළි කෝලාහලය පටන් ගෙන සතිය අතික්‍රාන්තවීමට ප්‍රථම මුළු ලංකාවේ සෑම දිශාවලට පෙර තිබුණටත් වඩා සාම්භාවය ඇති වුයේ ය. නොයෙක් පළාත් වල කෝලාහල සංසිඳවීමට එහි වැසි ජන ප්‍රධාන උගත් සිංහල ප්‍රභූ මහතුන් කීප පළක් බලවත් පරිශ්‍රම දැරූ බව සාක්ෂි සහිතව දැන ගන්ට තිබේ. සමහරු මංකොල්ලකාරයන්ගෙන් තමන්ට පැමිණිය හැකි හිංසා පීඩා ගැන පවා නොසලකා මරක්කලයින්ගේත් හම්බයින්ගේත් බඩු බාහිරාදිය ස්වකීය ප්‍රවේශමට ගෙන ඔවුන් තමන්ගේ ගෙවල රහසේ නවත්වා ගෙන ඔවුන්ට ආහාර පානාදියෙන් සංග්‍රහ කරමින් ආරක්ෂා කළෝ ය. මේ කෝලාහලයේදී කිසිම කලහකරුවෙක් පොලිස් භටයකුට හෝ අන්කිසි ආණ්ඩුවේ නිලධාරියෙකුට හෝ කිසි පීඩාවක් නොකිරීම විශේෂයෙන් සැලකිය යුතු කාරණයකි. මේ අර ගලය ආණ්ඩුවට විරුද්ධව උපදවන ලද කුමන්ත්‍රණයක්වත් නැගිටීමක් වත් නොවන බව මෙයින් පැහැදිලි ලෙස ප්‍රත්‍යක්ෂ වන්නේ ය. කෝලාහලය වේගවත්ව පැවතුණ ස්ථාන අසලින් ගමන් කළ එකම යූරෝපීය ලංසි ද්‍රවිඩ යන ජාතියකුට කලහකරුවන්ගෙන් කිසිම හිරුහැරයක් නොලැබුණේ ය. මහහමදාගම් කාරයන් වූ ජාබෝරා යන මොහුද සාමාන්‍යයෙන් කව්රුත් පාහේ තුරුස්නා ඇප්ගන් ජාතික මනුෂ්‍යයෝද නිරුපද්‍රව විසූහ. සටන පළමුවෙන්ම ආරම්භ කරන ලද්දේ සිංහලයන්ට එඩිතර අහංකාර ගති පෙන් වූ හම්බයන්ට පමණක් විරුද්ධව ය. එහෙත් මෙරට උපන් මරක්කල මිනිස්සු සමහර දෙනෙක් හම්බයන්ට ආධාර කිරීම හේතු කොට ගෙන කෝලාහලයෙහි නියුක්ත සිංහලයෝ ඔවුන්ට ද හිංසා පීඩා කරන්ට වන්නෝ ය. මේ කෝලාහලය සම්බන්ධ වර්ෂ 1916 යේ ජනවාරි මාසයේ දී නිකුත් කරන ලද යූරෝපීය වැවිලිකරු සමිතියේ ප්ලෑන්ටිං ගැසට් නම් සඟරාවේ කතෘ වක්‍යයක මෙසේ දක්වා තිබේ.

Non-Commercial Distribution

සැබවින්ම කලහකරුවන් වැඩි දෙනෙකුගේ පරමාර්ථය තිබුණේ යෝනකයන්ට පහරදීම මිස අනිකක් නොවේ. ආණ්ඩුව තුර්කිය සමග යුද්ධක දවටී සිටි හෙයින් තුර්කින්ගේ ලබද්ධීය අදහන යෝනකයන්ට විරුද්ධව ක්‍රියා කිරීම ආණ්ඩුවට කරන්නා වූ මෙහෙවරක් යයි ඔව්හු විශ්වාස කළෝ ය. ලංකාව රාජද්‍රෝහින්ගෙන් යුත් රටක් නොවේ. පසුගිය කාලයේ ස්වදේශික ප්‍රවෘත්ති පත්‍ර වල ආණ්ඩුවට විරුද්ධව පළ කරන ලද එය කලඹ වන ලියවිලි ගැන උගත් ලාංකිකයෝ වැඩි සැලකිල්ලක් නොකළෝ ය. එහෙත් ඒ ලියවිලි කරණ කොට ගෙන රටේ පැවතුණ නොසන්සුන් ස්වභාව බෞද්ධයන්ගේ පෙරහැරවල් නවත්වන්ට උත්සාහය කිරීමෙන් යෝනක මනුෂ්‍යයෝ වැඩි දියුණු කළෝ ය. බෞද්ධ පෙරහැරවල් බෞද්ධයන්ගේ ආගමානුකූල කෘත්‍ය වල අවශ්‍යයෙන්ම උවමනා කරන දේවල් ය. යෝනකයන්ගේ මේ සාහසික ක්‍රියාවෙන් ඔවුන් විසින් බෞද්ධයන්ගේ ආගමට පළමුවෙන්ම පහර දෙන ලද්දේ ය. ලංකාවේ සිටින යෝනකයෝ රුෂියාවේ පදිංචි යුදෙව්වන්ට වඩා ක්‍රියා පරිපාටියෙන් කිසි වෙනසක් නුවූහ. ඔවුන් බොහෝ දෙනෙක් සිංහලයන්ගේ දේපල අයිති කර ගැනීමට අනේක කපට් උපාය යෙදී මෙන් යත්න කෙරෙත්. සිංහල ගොවියන්ට හිංසා පිඩා ද පමුණුවත්. යුක්තා යුක්ති නොසලකා චිරස්ථිත ජනයා කෙරෙහි ඊර්ෂ්‍යා කරන මේ විදේශිකයෝ එනම් මොහම්මදිකයෝ බුද්ධාගමට විරුද්ධව මෙකැල ඔවුන්ගේ හිසි එසෙව්වෝ ය. පූජ්‍ය ස්ථාන කරා එලඹෙන වන්දනාකාරයන්ට නොමිලයේ සංග්‍රහ කිරීමට සිරිත් ප්‍රකාර මහනුවර පවත්වන දන්ශාලා තැනිම, නාගරික සභාව ලවා නැවැත්වීමට ඔවහු උත්සාහ කළෝ ය. මෑත කාලයේ මහනුවර වීථියක් අද්දර ඔවුන්ගේ පල්ලියක් ගොඩ නගා ඒ පල්ලිය අසළින් බෞද්ධ පෙරහැරවල් ගමනාගමනය කිරීම තහනම් කිරිම ඔවුන්ගේ ආශාව විය. කෝලාහල සියල්ලම ප්‍රධාන කාරණ තුනක් නිසා හට ගන්නා ලදැයි කිව හැක.

පළමුවෙනි කාරණය නම් :- යෝනකයන්ගේ එඩිතර අහංකාර ගතිය චිරස්ථිය ලංකාකිකයන්ගේ අප්‍රෂන්නයට හේතු වූ බව ය. දෙවෙනි කාරණය නම් :- යෝනකයන් කෙරෙහි සිංහලයන්ගේ සිත් දූෂ්‍ය කරවන පරිදි ඇතම් ස්වදේශික පුවත් පත් වල වාක්‍ය පළ වීම ය. තෙවෙනි කාරණය නම් :- අන්‍යයන්ගේ වස්තු පැහැර ගැනීමේ ඇති බලවත් තෘෂ්ණාවය යන මේ යි. නුමුත් මේ අරබයා හටගත් හටගත් කලහය කිසිසේත් බ්‍රිතාන්‍ය කිරීටයට විරුද්ධ යොමු කරන ලද්දක් නොවන බව ඒකාන්ත සත්‍යයක් ය. මේ කලහය අතිශ්‍ය වේගවත්ව පැවති කොළඹ පිටකොටුවේ ද අනිකුදු ප්‍රත්‍යන්ත ග්‍රාමයන්හිද ආණ්ඩුවේ ඉංග්‍රීසී නිලධාරිහු හැසුරුණ නුමුත් ඔවුන්ට

Non-Commercial Distribution

කලහකරුවන්ගෙන් කිසිම පීඩාවක් නොලැබීම ඊට වැදගත් සාක්ෂ්‍යයකි. කලහකාර මූලකයන්ට කොපොද ගත විමට සෑහෙන වැදගත් කාරණ නොයෙක් කෙරෙහි සිදු වී තිබෙව බැව් ඇත්තකි.

යුරෝපීය වැවිලිකාර සංගමය වෙනුවෙන් යුරෝපීය උගත් මහතෙකු විසින්ම පළ කරන ලද අපක්ෂවාදී කතුවැකියෙන්ම සිංහල සහ යෝනක අරගලයෙහි සම්භවයට හේතු ප්‍රත්‍යය කවරේදැයි යනු බුද්ධි සම්පන්න කවරෙකුට වුව ද බාධා රහිතව නිශ්චයකට පැමිණීම මේ නයින් සුකරවේ. එහෙත් මේ අරගලය නිපදවීමට ස්වදේශිය පත්‍ර මාර්ගයෙන් අනුබල ලද්දේ ය යන අස්ථාන දෝෂා රෝපණය විඥයන්ගේ මතානුගත නොවේම ය.

## ආණ්ඩුවේ උදාසීන බව

මේ කෝලාහලය සියැසින් නැරඹූ අපක්ෂවාදි අයත් මහතුන් වැඩි දෙනෙකුගේ මතය නම්, කලහ ආරම්භයේ දීම ආණ්ඩුව යුහුසුලු ලෙස ක්‍රියා කරන ලද්දේ නම්, එය හටගත් ක්ෂණයෙන්ම නිරායාසයෙන් මැඩ පැවැත්වීමට හැකිව තිබුණ බව ය. වර්ෂ 1919 යේ අගෝස්තු මස 11 වෙනි දින ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ රැස්වීමක දී යුරෝපීය නාගරික මන්ත්‍රී තැන වූ ගරු කටයුතු හැරී ක්‍රිසි මහතා මෙයාකාරයෙන් ප්‍රකාශ කර තිබේ.

කෝලාහල සංසිඳවීමට පළමුවෙන් යවන ලද නගරා රක්ෂකයන්ගේ අත් වල තිබුණේ බැටන් නම් මුගුරු පමණක් ය. මේ දූර්වල ස්වභාවය හේතු කොට ගෙන කලහකරුවන් විසින් සිද්ධ කරන ලද ජීවිත විනාශ හා දේපල හානින් වැළැක්වීමට ඔවුන්ට නොහැකි විය. පරිශුද්ධාශයක් ඇති උදාර චරිත විලාසයෙන් යුත් හැරී ක්‍රිසි මහතා වනාහි ලංකාවේ අවුරුදු බොහෝ ගණනක් පදිංචිව සිටි කීර්ති ධර නීතිඥවේදියෙකි. එතුමා විසින් උතුමාණන් වහන්සේ සහිත මන්ත්‍රී මණ්ඩලයා ඉදිරිපිට දීනර්භීත ලෙස ලංකාණ්ඩුව කෙරෙහි ආරෝපණය කර තිබේ. එවකට ලංකාණ්ඩුකාරධූරය දැරූ ස්ර් රොබර්ට් චාමරස් උතුමාණන් වහන්සේ විසින් මේ අරගලය සම්බන්ධ වැ මුළා බවට පැමිණ වැරදි මතයක් ප්‍රකශ කර තිබේ. එනම් මහරජතුමාගේ යටත් වැසියන් පද්ධතියක් එබඳු වූ තවත් පද්ධතියක වැසියන්ට පහර දුන් බව කවර අන්දමකින් වත් ප්‍රචන්න කළ නොහෙන කාරණයකි. පහරදුන් අය සිංහල බෞද්ධයෝ වෙත්. ඉන් පිඩාවට පැමිණියෝ සාමග්‍රි සම්පන්න භාවයෙහි පිහිටි මොහම්මදිකයෝ ය යනුයි.

Non-Commercial Distribution

කරුණු සිදු වී තිබෙන අයුරු කල්පනා කර බැලූ විට මේ හැඟීම අතිශය සදොස් බව පෙණේ. පළමුවෙනි වෙඩිල්ල මහනුවර දී හම්බයෙකු විසින් ගෙයක උඩු මහලේ සිට සිංහලයෙකුට තබන ලද්දේ ය යන ප්‍රධාන කාරණය එසේ නොවේ යයි කිසිවෙකුට කියන්ට නොපිළිවන. එමෙන්ම පළමුවෙනි අවිපහර හම්බයෙකු විසින් එම නගරවාසී සිංහලයෙකු කෙරෙහි යොමු කරන ලද්දේ ය යන කියමන ද පිළිගත යුතු ය. අති පුරාණයෙහි පටන් පවත්වා ගෙන එන බෞද්ධයන්ගේ වෛශාඛ දානශාලා විවෘත කිරීම වැළැක්වීමට නාගරික සභාව මගින් උත්සාහ කරන ලද්දේත් හම්බන්කාර ජනයාම ය. පොලිස් ආඥාවට කීකරුව සංසුන් ලෙස ගමන් කළ මහනුවර වෛශාඛ සංගීතකරයන් කෙරෙහි උසුළුවිසුළු පා කෝපකරවීමෙන් අරගලයක් හටගැනෙව්වේත් හම්බයෝ ම ය. මේ ආදී කාරණා වලින් සිංහල බෞද්ධයෝ කුපිතකරවා කෝලාහල නිපදෙව් අය නම් යෝනකයන්ම බව අතැඹුලක්සේ ප්‍රත්‍යක්ෂ වන්නේ මය. ලංකාවේ සිදු වූ මේ කැරළි කෝලාහල හේතු කොට ගෙන මනුෂ්‍ය ජීවිත හා අවයව ද දේපල ද විනාශ වීමට කාරණය වුයේ පොලීසියේ දුර්වලකම හා චාමර්ස් ආණ්ඩුකාරතුමාගේ ඥාණ ශක්තිය හා චිත්ත ධෛර්යත් චපල ස්වභාවයක පැවතීම බව ඉන්දියාවේ සුප්‍රසිද්ධ ඉංග්‍රීසි අධිනීතිඥවර යෙක් වූ අර්ඩ්ලි නෝර්ටන් මහතා විසින් එළිදරව් කොට තිබේ.

තවද ලංකාවේ තොරතුරු සම්බන්ධ විසාරද දැනිමක් ඇති කලක් නීතීදායක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීධුරයක් ද දැරූ ප්‍රැන්සිස් බැවන් මහතා විසින් චාමර්ස් ආණ්ඩුකාරතුමාගේ සිය රට ගමනේ දී එතුමා ශුභ ප්‍රර්ථනා කරමින් යවන ලද ලිපියක මෙසේ දක්වා තිබේඃ-

කෝලාහලය ආරම්භ වූ විට ඒ බව ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ නිල නොලත් මන්ත්‍රීවරයෙක් තමුන්නාන්සේට දැන් වූ කල තමුන්නාසේ විසින් ඒ කාරණය ලඝු කොට සලකනු ලද්දේ ය යන කියමන සත්‍යයක් නම්, රාජ්‍ය සේවයෙහි එක් පද්ධතියක පමණක් ක්‍රියා කිරීමට තමුන්නාසේ තුළ ඇති චතුරභාවය ප්‍රදේශයක් සඵලමත් ලෙස ආණ්ඩු කිරීමට බාධාවක්ව පවතින්නේ යයි හඟීම් යනුයි.

ඉන්දියාවේ නානා ලබ්ධිකයන් අතර ඔවුනොවුන්ගේ ආගම් සම්බන්ධව සට්ටනයන් නිරන්තරයෙන්ම සිදුවෙත්. වර්ෂ 1911 හේ දී කල්කටාවේ මර්වාරි ජාතික ශිව භක්තිකයන් සහ මහමදාගම්කාරයන් අතරේ අරගලයක් ඇති විය. එවකට සිටි ඉන්දියාවේ අග්‍ර ආණ්ඩුකාරතුමා දෙපක්ෂයේ ජන ප්‍රධානීන් උන්වහන්සේ ගේ අබිමුවට කැඳවා යුක්තා යුක්ති විචාරණයෙන් සාමදාන සාකච්ඡාවක් පවත්වා ඔවුනොවුන්ගේ භේද

Non-Commercial Distribution

සාම්භාවයට පමුණුවා ඒ වියවුල සහනය කෙළේ ය. වර්ෂ 1914 ජේදී අරානම් වූ පළාතක ආගම් කෝලාහලයක් ආරම්භ වූ කෙණෙහිම එහි අණ්ඩුකාරතුමා කලහ පවතින ස්ථාන කරා එළඹ කෝලාහලකරු වන්ට අවවාදනුශාසනා කිරීමෙන් ඔවුන් සමාදාන කරවා විසුරුවා හැරියේ ය. වර්ණ භේද, ජාතිභේද, ආගම් භේදා දිය හේතු කොට ගෙන කලින් කල රට වැසියන් අතර අසමගිකම් හා විරුද්ධතාව ඇතිවීම ස්වභාවකි. නුමුත් යථොක්ත විරුද්ධතාවන් පැතිරවා නොදී මනුෂ්‍ය ජීවිත හා දේපලාදියත් සංරක්ෂණය කර ගැනිම රටේ සමාදනය ආරක්ෂා කරන දේශපාලනයෙහි නියුක්ත වූවන්ගේ යුතුකමකි. එසේ නොව රටේ කෝලහාල පැතිර යනු බලා ආණ්ඩුවේ නිලධාරීන් උදාසීන භාවයෙන් සිටීම හේතු කොට ගෙන යම් යම් විනාශයන් සිදුවී ද, එබඳු විනාශයන් අයට හා ස්වකීය කතීව්‍යන් නිසියාකාර ඉෂ්ට නොකාළ වූ ආණ්ඩුවේ යටකී නිලධාරීන්ටත් දඬුවම් පැමිණවීම සර්ව සාධාරණ ඉංග්‍රීසි ආණ්ඩුවේ නීතියක්ව පවත්නේ ය. වර්ෂ 1780 වේ දී සිදු වූ ගෝර්ඩන් රයිට්ස් නම් කැරළි කෝලාහල වර්ෂ 1831 කේ දී සිදු වූ බ්‍රිස්ටල් රයිට්ස් නම් කැරළි කෝලාහල සම්බන්ධවත් සිය යුතුකම් නොසලකා හැරීම ගැන ලන්ඩන්හි නගරාධිපතියාටත් බ්‍රිස්ටල්හි නගරාධි පාදයාණන්ටත් විරුද්ධව නඩු විභාග කොට දෝෂා රෝපණය කරලු ලැබූ එක එක වගන්තිය ගැන රත්පවොත් සියය බැගින් එතුමන්ට දඩ ගසන ලද්දේ ය.

කාරණා මෙසේ වුවත් එවකට සිටි අපේ ලකිසුරුතුමා අගනුවර සිදුවෙන බලවත් කෝලාහලය දැනගන්ට ලැබුණට පසුත් සැතැප්ම 74 ක් දුර වූ මහනුවර නවාතැනින් අස් වූයේ නොවෙයි. තව ද මහනුවර වැසි සිංහල ද්‍රවිඩ, ලන්සි සහ මහමත් ජාතික කීපදෙනෙක් උඩරට රදලමහතෙකු ප්‍රධාන කොට ගෙන ආණ්ඩුවේ ඒජන්ත තැන සම්මුඛ වී කලහකාරී සමූහයාට අවවාද කොට ඔවුන්ගේ පැමිණිලි විභාග කරන බවට පොරොන්දු වී ඔවුන් විසුරුවා හරින ලෙස ඒ නිලධාරී තැනට ආයාචනා කළ නුමුත්, එතුමා එසේ කිරීමට නොසතුටු විය. එසේ කරන ලද්දේ කෝලාහලය සංසිඳීමට පැමිණෙන බව යථොක්ත නියෝජිත පිරිස විසින් කරන ලද සහතිකයෙන් ද ඔවුන්ගේ ඉල්ලීම ඉෂ්ට කිරීමට එතුමා පොළඹවනු නොහැකි විය.

වෙසක් කැරොල් කණ්ඩායම සහ යෝනකයන් අතරේත් කාසල්හිල් වීථියේ දී නොඅනුමානව කෝලාහලයක් සිදු වන බව මහ නුවර පොලිස් නිලධාරීන් කලින් දැන සිටි බව හැඟේ. නුමුත් රෝග ව්‍යපශමනය පිණිස ප්‍රතිකාර කරනවාට වඩා රෝගය සෑදීම වළකාලනු යෙහෙකැයි යන අතෝපදේශයට පයින් ගසන්නාක් මෙන් ඔව්හු කලහ පැතිර යනු බලා එය සංසිඳවීමට සැලකිලි වන්තව ක්‍රියා නොකලෝ ය. කෝලහලය සිදු වෙන

Non-Commercial Distribution

වේලාවේ දී විරුද්ධකාර දෙපක්ෂයේ ම කලහකරුවන් දාහකට අඩු නොවන ගණනක් අතරේ එකම ඉන්ස්පැක්ටර් කෙනෙක්ද , එකම සැරයන් කෙනෙක් ද කොස්තපල්වරු තිදෙනෙක් ද පමණක් සිටීමෙන්, පොලීසිය විසින් යොදන ලද ආරක්ෂාවේ ප්‍රමාණය මෙයින් යසරඟට ඔප්පුවේ.

තවද අගොස්තු මස 11 වෙනි දින මාර්ෂල් ලෝ නම් සංග්‍රාමික නීතිය ක්‍රියා කරවන ලාංකික මන්ත්‍රී තැන වූ උගත් රාමනාදන් මහතා ව්‍යවස්ථා දායක මන්ත්‍රණ සභාවේ දී කථා කරමින් මෙසේ කිවේ ය.

කැරලි කෝලාහලය සිද්ධ වන විට කොළඹ සිටියේ එකම පොලිස් සුපිරින්ටැන්ඩන්ට් කෙනෙක් පමණකි. කොළඹ නැවතී සිටි කොස්තපල්වරු 674 දෙනා ගෙන් 180 දෙනෙක් ඒ කාලයේ මහ නුවරට ගොස් සිටියෝ ය. පොලීසියේ ඉන්ස්පැක්ටර් ජනරල් තුමා ද සොල්දාදුවන් කණ්ඩායමකුත් සමග මහනුවරට ගොස් සිටියේ ය. ඉන්ස්පැක්ටර් ජනරල්තුමා සමහ උපසුපිරින්ටැන්ඩන්ට්වරු තිදෙනාත් කොළඹ සිටියාහු නම් මේ කලහය කලින් වළකාලීමට හැකිව තිබුණ බව සත්තක ය. මේ අවස්ථාවේ දී කොළඹ සිටි පොලිස් මුලාදෑනීන් ගේ ද, මුර කිරීමෙහි යෙදී සිටි කොස්තපලුන්ගේ ද සිහි මුළාවට ගොස් තිබේ. පොලිස් මුලාදෑනීන් ගේ නොසැලකිලිවන්තභාවයේ ප්‍රයෝජනය අපරාධ ක්‍රියාවන් කිරීමෙහි නිරත වූවන් හා ක්ෂුධාවෙන් පෙලඹීම් සිටි දිළින්දන් විසිනුත් භුක්ති විඳ තිබේ.

පොලිස් හමුදාව පාලනය කරන මුලාදෑනි නගරයේ නැවති සිට කැරළි කරුවන්ටත් මංකොල්ලකාරයන්ටත් විරුද්ධව සුදුසු පරිදි පොලීසියේ අයවලුන් නිසි කලට ක්‍රියා කරවීමට සලස්වනු ලැබුවා හුනම් මේ බලවත් සාපරාධීක කලහය ආම්භයේ දේම නිරායාසයෙන්ම මැඩ පවත්වන්ට හැකිව තිබුණේ ය. පොලිෂිය ස්ථානෝචිත බුද්ධි රහිතව අප්‍රවේසම් ලෙස ක්‍රියා කිරීමෙන් අතිශය දරුණු විපත් රාශියක් සිදු වෙන්ට ඉඩ හැරීම ඛේදජනකය යනුයි. එම සභාවේ දී හැරී ක්‍රීෂි මහතා කථා කරමින් මෙසේ කීවේ ය. පොලිස් භටයෝ සුලු මුලාදෑනි තිදෙනෙක් යටත් මුර කරමින් සිටියෝ ය. නගරයේ හාත්පස කෝලාහල කිරීම් බඩු කොල්ල කා ගැනීමේ සහ මිනිමැරීම් සිදු වන විට කොස්තපලුන් බැටන් පොලු පමණක් රැගෙන වීථි වල සංචාරණය කෙළෝ ය. මමත් ඔබ මොබ සක්මන් කරන්නා වූන් විසිරුවා හරිනු නොලබන්නේ මක් නිසාදැයි කොස්තපලුන්ගෙන් ඇසූ විට, එසේ කිරීමට ඔවුන්ට ආඥාවක් ලැබී නැතැයි යන උත්තර දුන්නෝ ය. එය ඇත්තක් නුමුත් මෙබඳු අන්තරාදායක ප්‍රස්ථාවයක දී පොලිසිය මෙසේ මන්දෝත්සාහිව ක්‍රියා කෙළේ ය යනු විශ්වාස කිරීම පවා උගහයට ය පළමුවෙන් කොළඹ කෝලාහල ඉපදෙව් දුම්රිය කරම්කරුවන්ගෙන්

Non-Commercial Distribution

සමහරෙකු පොලීසිය විසින් අල්වා හිරභාරය ගෙන නැවත ඔවුන්ගේ සහචරයන්ගේ විධානයට කීකරුව කලහකරුවන් නිදහස් කර හැරීමෙන් පොලිස් මුලාදීනින්ගේ බියසුලු ගතිය සහ ඒ අකටයුතු ක්‍රියාවෙන් කැරළි කරුවන්ගේ සිත් ධෛර්ය වී කෝලාහලය බර පතල වූ අන්දමත් කදිමට හැඟේ. මේ අන්දමේ සාවද්‍ය ක්‍රියා පිට පළාත් වලට ද සිදු වී තිබේ. කළුතර පොලිස් උප සුපිරින්ටැන්ඩන්ට් තැන වූ බැන්ක්ස් මහතා පානදුරේ සිර භාරයට ගන්නා ලද කෝලාහලකායන්සර දෙනෙක් ඔවුන්ගේ සමාගම්කාරයෝ තර්ජනය පෙරටු ඉල්ලීමට කීකරුව නිදහස් කර හරින ලද්දේ ය. තවත් පළාත පොලිස් ඉන්සැපැකන්ටර් කෙනෙකු හා ස්වදේශිත ප්‍රධාන මුළාදෑනියෙකු විසින් අල්වා ගත් කලහකාරී කිපදෙනෙක් අවශේෂි කැරළිකාරයන්ටයින් මුදවා හරින ලද්දෝ ය. කොළඹ නාගරික සභාවේ මන්ත්‍රී ධූරයක් දරන අධිනීතිඥ ඇප් ආර් සේනානාක මහතා විසින් කරන ලද ප්‍රකාශයෙන් පොලිස් හමුදාව පිළිබඳ මරදානේ ප්‍රධාන ස්ථානයේ පැවති ව්‍යකුල ස්වභාවය සහ තැනි ගැනීමත් මොනවට පැහැදිලි වේ. ඒ මහතා මෙසේ කියයි.

සිංහලයන් සහ යෝනයකන් අතර හටගත් කැරැල්ල බරපතල ස්වභාවකට හැරී තිබෙන බැව් මට දැනගන්ට ලැබී මම ජූනි මස 1 වෙනි දින උදේ 10 යට පමණ මගේ මෝටර් රථයෙන් මරදානේ මහ පොළිසියට ගොස් කෝලාහලය සංසිඳවීමට ආණ්ඩුවට මගේ උදව් දෙන්නට කැමති බව කීවෙමි. මම එහි යන අතර කෝලාහල මැඩ පැවැත්වීමට හෝ අපරාදකරුවන් ඇල්වීමට හෝ කිසිම උත්සාහයක් නොකර තිබෙන බැව් අවබෝධව විස්මයට පැමිණියෙමි. පොලීසියට හැතැප්මයක් පමණ තුදුරු ස්ථාන වල පිහිටි කඩ සාප්පු ආදිය පොලිස් භටයන් ඉදිරිපිට කඩා බඩු පැහැර ගන්නා මම දිටිමි. පොලිසියේ ඉන්ස්පැක්ටර් ජැනරල්තුමා කොයි බදැයි විභාග කළ විට එතුමා කොළඹ නැති බව මට දැන ගන්ට ලැබුණේ ය. පොලිස් සුපරින්ටැන්ඩන්ට් ඇල්ටන් ඩෝර්ප් මහතා දැක කැරළි කෝලාහල මැඩ පැවැත්වීමට පොලසීයට ආධාර කරන්ට මා සතුටු බැව් ප්‍රකාශ කෙළෙමි. ඊට මට ලැබුණ පිළිතුර නම් පොලිස් ඉන්ස්පැක්ටර් ජනරල්තුමා කොයිබදැයි නොදන්න බවත් මේ කාරණය ගැන ක්‍රියා පරිපාටියෙහි යෙදවිය යුතු පරිදි අරබයා යම් කිසි විධානයක් උන්නැහේට ලැබී නැති බවත් ය. මීට මඳ වේලාවකට පසු ඒ සැන්ට් වී ජයවර්ධන ඇල් එච් ද අල්විස් එච්ස් විජය වර්ධන යන අද්වකාත් මහත්වරුන් ද පැමිණ කෝලාහල සංසිධවීමට හර්ස් ඩෝප් කණ්ඩායමේ නගරා රක්ෂක කණ්ඩායමේ මෙහෙවර දීමට කථා කළේ ය. ඇල්ඩන් ඩෝප් මහතා අපට මෙන්ම ඒ මහත්තුන්ටත් පෙරකි පිළිතුරම දුන්නේ ය. මේ දවස් වල මොරටුව පානදුරේ වේයන්ගොඩ යන ස්ථාන වලින් සහ වෙනත් නොයෙක්

Non-Commercial Distribution

පළාත් වලින් ද මහ පොලීසියෙන් ආධාර අයැද විදුලි පණිවුඩ රාශියක්ම ලැබුන නුමුත් ඉන් එකක් ගැනවත් කිසිම සැලකිල්ලක් කරනු නොලැබූහ.

විස්තර කළ නොහෙන පරිදි පොලිසිය මෙසේ දුර්වල ස්වභාවයක් දක්වා සිටිනු කල කෝලහලකාරයෝ කඩ සාප්පු ආදිය කැඩීමේ වැඩේ බාධා රහිතව යුහුසුලුව කර ගෙන ගියේ ය. වල් ඌරන් මෙන්, අනුන්ගෙන් යැපී කුසිත ලෙස කාලක්ෂෙපය කරමින් සිටි බාල තරුණ මහලු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ අය කලහකවරුවන් විසින් කඩන ලද කඩසාප්පු වල බඩු බාහිරාදිය උනුන් රිසි සේ පැහැර ගෙන ගියෝ ය.

## යුද්ධ නීතිය ප්‍රකාශ කිරීම.

කැරළි කෝලාහල වල වේගවත් ස්වභාව බොහෝ දුරට සංසිඳී ගිය පසු වර්ෂ 1915 ක්වූ ජූනි මස මැද භාගයේ දි උතුරු සහ නැගෙනහිර පළාත් හැර ලංකාවේ අනිකුදු සියලුම පලාත් වල මාර්ෂල් ලෝ නම් යුද්ධ නිතිය ප්‍රකාශ කරන ලදි. සාමාන්‍යයෙන් මේ යුද්ධ නීතිය ප්‍රකාශ කරනු ලබන්නේ ආණ්ඩු විපර්යා කිරීම් වශයෙන් කැරළි ගසන දාමරිකයන් කෙරෙහි පමණක් බව මිට අවුරුදු 97 කට පෙර සර් රොබර්ට් බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ ගේ ආණ්ඩු කාලයේ දී වෙල්ලස්සේ කැරැල්ල අරබයා මුළු සිංහලේ පළාත ඊට යටතේ කර තැබීමෙන් හැඟේ. එබඳු කිසිම අවශ්‍යතාවයක් නොමැතිව පණවන ලද මෙම රෞද්‍ර සංග්‍රාමික නීතිය තෙමසක් මුළුල්ලෙහි අප්‍රවේශම් ලෙස ක්‍රියා කරවීමෙන් අහිංසක ලක් වැසි බොහෝ දෙනෙකුට අපමණ හිරිහැර සහ නොමඳ වූ අලාභ හානි ද සිදු විය. ස්වදේශික ධනවතුන්ට අයිති මෝටර්රථ යුධ හමුදාවේද පොලීසියේ ද නිලධාරීන් විසින් ආණ්ඩුවේ දේපළ මෙන් බලාත්කාරයෙන් රැගෙන ඔවුනොවුන්ගේ සඤ්චාරණයන්හි යොදවන ලදී. මේ කාරණය ගැන සී. ඊ. ඒ. ඩයස් මහතා විසින් කොළඹ දිස්ත්‍රික් උසාවියේ පවරන ලද නඩුවෙන් (රාජාපරාධකාරයන් බවට නොපැමිණ සිටිනතාක් වෙන) කොයිම කාරණයකදීවුවත් වැසියාගේ දේපල නොමිළයේ භුක්තිවිඳීමට ආණ්ඩුවට කිසිම අයිතිවාසිකමක් නැති බව මොනවට පැහැදිලි විය. යුද්ධ නීතිය පැවති කාලයේ තමාගේ මෝටර් රථය පාවිච්චි කිරීම ගැන සහ ඊට අලාභ හානි කිරිම ගැනත් යථොක්ත මහතා විසින් ආණ්ඩුවෙන් වන්දි ඉල්ලා ගෙනෙන ලද ඒ නඩුව අන්තිමේ දී එංගලන්තයේ ප්‍රිවිකවුන්සල් නම් ශ්‍රේෂ්ඨ විනිශ්වය සභාව විසින් විසඳනු ලැබ පැමිණිලි පක්ෂයේ වාසියට තීන්දුව දෙන ලදී. යුද්ධ නීතිය පැවති කාළයේ පන්ජාබ් රෙජිමේන්තුවේ ඉන්දියානු

Non-Commercial Distribution

ජාතික හේවායෝ ද, වතුකාරයන්ගේ අත් තුවක්කු හමුදාවේ යූරෝපීය නිලධාරිහු ද, පොලීසියේ මුළාදෑනිවරු ද දිලිසෙන කඩු තුවක්කු ගත් අත් ඇතිව ලක්දිව නොයෙක් පළාත් වල මෝටර් රථ වලින් සංචාරණය කරමින් ඇතැම් සිංහල ස්ත්‍රී පුරුෂයන්ට නානා ප්‍රකාර ශාරීරික තාඩන පීඩනාදිය සිදු කළෝ ය. කලහකරුවන් මෙන් සැක කරනු ලැබූ නිර්දෝෂ සිංහල මිනිසුන් කීප දෙනෙක් ද කෙතක පත් නෙලමින් සිටි අහිංසක ස්ත්‍රියක් ද කිසිම නඩු විභාගයක් නොමැතිව වෙඩි තබා මරන ලද්දාහු ය. ව්‍යාධ පුරුෂයන්ගේ ක්‍රියානුරූප මේ සාහසික ක්‍රියාවල් බෙහෙවින් සිදු කරන ලද්දේ කෑගලු දිස්ත්‍රික්කයේ ය. සොල්දාදුවන්ගේ බයිනෙත්තු ප්‍රහාර ලැබීමෙන් සමහරෙක් ජීවිතක්ෂයට පැමිණියා හු ය. ගඩලා දෙණි දේවාලයේ බස්නායක නිලමේ වූ වල්ගම්පායේ රදල මහතා එසේ මරු මුවට පත් වූවන් අතුරෙන් කෙනෙකි. ඔහුගේ මරණය ගැන පෙලීසියේ ප්‍රධාන නිලධාරි තැන වූ ඩව්බිගින් මහතා කෙරෙහි බලවත් දෝෂා රෝපණීය රාවයක් රටේ සැම තැනම වාගේ ඇති විය. ආනථ මරණයෙන් කෙළවර වූ යථොක්ත නිලමේගේ භාර්යාව විසින් තම ස්වාමිපුරුෂයාගේ ජීවිත හානි කිරීම ගැන ආණ්ඩුවෙන් වන්දි ඉල්ලා මහනුවර දිස්ත්‍රික් ශාලාව් ගෙනන ලද නඩුව පිලික්ස් ඩයස් විනිශ්චයකාරතුමා විසින් කීප දිනක් මුළුල්ලෙහි විභාග කොට නිෂ්ප්‍රභා කරන ලදී. කලහ මූලිකයන් මෙන් චෝදනා කරනු ලැබූ වන්ගේ නඩු යුද්ධාධිකරණ මණ්ඩලය විසින් ද අවශේෂ කලහකරුවන්ගේ නඩු විශේෂ ලෙස පත් කරන ලද කොමසාරිස්වරුන් විසින් ද විභාග කරන ලද්දා හු ය. යුද්ධාරිකරණය තීන් බොහොමයක්ම මරණීය දඬුවම සහ ජීවිතාන්තය දක්වා බරපතල වැඩ ඇතුව හිර අඩස්සි කිරීමත් වූහ. මරණීය දඬුවමට පැමිණෙව් පොලිස් පරීක්ෂකයෝ වූ සමරසිංහ මහතා සහ නගරාරක්ෂක හමුදාවේ මුලාදෑණියෙක් වූ පේද්‍රිස් මහතාත් වෙඩි තබා ජීවිතක්ෂයට පමුණු වන ලද බවත්, දිවි තිබෙන තුරු බන්ධනාගාර ගත කල ඇඩ්මන් හේවා විතාරණ මහතා සහ සයිමන් විජය ශේඛර මහතාත් බන්ධනාගාරයේ දී වැළඳි ජවරා බාධයකින් ජන්මාන්තර ගත වූ බවත් මෙහි ඉහත දක්වන ලද්දේ ය. කොළඹ නගරයේ කලහ ඉපදෙව් අයවලුන් මෙන් සැක කරනු ලැබූ දුම්රිය කම්කරුවන් කීප දෙනෙක් නඩු මගට නොපමුණුවා උතුමාණන් වහන්සේගේ නියෝග පිට මඩකලපුවට පිටවහල් කර යවන ලදී,

තවද මහජන ක්ෂෝභයට හේතු වන ආකාර නීති විරෝධි වාක්‍ය පළ කිරීම ගැන සිංහල පත්‍ර සහ සඟරා කතෘවරුන් කීප දෙනෙක් ට විරුද්ධව ගෙනන ලද නඩු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු තිදෙනෙකු විසින් විභාග කරනු ලැබ ඇතැම් අය වැරදි කාරයන් බවට නිශ්චය කරනු ලැබීමෙන් දඬුවම් ලබන ලද්දාහු ය.

Non-Commercial Distribution

ලක්වැසි සිංහල ජනයා ඝොර වූ යුද්ධ නීතියට කැප වී මෙසේ අතිභයංකර තත්වයක සිටිනා තර, සිංහල ජනතාවට සිදු වී තිබෙන බලවත් විපත සැලකොට එංගලන්ත ආණ්ඩුවෙන් සැනසීමක් ලබන අටියෙන් ප්‍රදේශ භාර මන්ත්‍රීතුමාට අයදුම් පතක් ඔප්පු කිරීම සඳහා ප්‍රභූ මහතුන්ගෙන් යවුත් සිංහල මහජන සභාවක් කොළඹ පබ්ලික් හෝල් නම් ශාලාවේ පවත්වන ලද්දී ය. ඒ සභාවේ වැඩ සමාප්ත වෙන්ට ප්‍රථමයෙන් එහිදී යුද්ධ නීතිය පැණවීම හේතු කොට ගෙන ලාංකිකයන් කෙරේ එළඹ සිටි අතිශය භයංකාර ස්වභාවය ගැන චිත්තා හිරමණය වන තර්කානුකූල ව්‍යාක්ත කථාවක් කළ වෛද ්‍යචාර්ය සලමොන් ප්‍රනාන්දු මහතාගේ අති සංවේග ජනක මරණය හදිසියෙන් සිදු විය. චාමර්ස් ආණ්ඩුකාරයාණෝ අකාලයෙහි එංගලන්තයට කැඳවනු ලැබීමත්, ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ විශේෂ බල ඇතිව ලංකාණ්ඩුකාර ධූරයට පත් කර එවීමත් මේ සභාවේ කටයුතු වලින් ලත් ප්‍රතිඵලයක් මෙන් සැලකිය හැකි ය.

# සර් ජෝන් ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩු කාලය
## ක්‍රි. ව. 1916-1918

සර් රොබට් චාමර්ස්තුමාගෙන් පසු මහ සෙක්‍රතාරිස් තැන්පත් රෙජිනෝල්ඩ් ඇඩ්වර්ඩ් ස්ටබ්ස්තුමා ලංකාණ්ඩුකාර ධූරයෙහි ද, ආදායම් පාලක අධ්‍යක්ෂ තැන්පත් ඒ. ඇස්. පැග්ඩන් මහතා මහසෙක්‍රතාරිස් ධූරයෙහි ද කලක් වැඩ බැලුවෝ ය.

ලක්දිව මොහම් මදිකයන් සහ බෞද්ධයන් අතර හටගත් දබරයේ භයානක ප්‍රතිඵලකරණ කොට ගෙන හෙළදිව් වැස්සන් අනේක ප්‍රකාර ව්‍යසනයන්ට භාජනය සිටි මේ අවිස්ථාවේ දී ඔවුන්ගේ චෛතසික පීඩනයෙන් ඇති වූ දුර්භාග්‍ය භාවය නිරාකරණය කරනු පිණිස මෙන් සර් ජෝන් ඇන්ඩර්සන් උතුමාණෝ ලංකේෂ්වර පදවියට පත්ව වර්ෂ 1916 ක් වූ අප්‍රියෙල් මස 15 වෙනිදින මෙම දිවයිනට උපගත වූහ.

එංගලන්තයේ මහාරාජෝත්තමයාණන් වහන්සේගේ විශේෂානුඥාව පිට පත් කරනු ලැබූ මේ ලංකිසුරුතුමා ලංකා භූමිය ස්පර්ශ කළ දින පටන් ශාන්ති ප්‍රදානය පිණිස අපක්ෂවාදී නිර්වාපණය කොට ඔවුන්ට ශාන්ති ප්‍රදනාය

Non-Commercial Distribution

පිණිස අපක්ෂපාදී පරීක්ෂණයකින් දූරදර්ශක ඥාණයකින් උනන්දුව ක්‍රියාරම්භ කෙළේ ය.

චාමර්ස් උතුමාණන්වහන්සේගේ කාලයේ දී තෙමසකට වැඩි කලක් පැවති "මාර්ෂල් ලෝ" නම් සංග්‍රාමික නීතිය යටතේ නඩු විසඳා දිවිහිමි දක්වා ද අති දීඝී කාලවලට ද බන්ධනාගාරවල දමා සාපරාධිකයන් මෙන් ගණන් ගනු ලැබ සිටි බොහෝ දෙනෙක් ඇන්ඩර්සන් උතුමාණන් විසින් දගගෙවලින් මුදාහරින ලද්දාහුය. ඇතැම් අය ගෙන් අය කරන ලද රුපියල් දස දහස් ගණන් බර පතල දඩමුදල් ඔවුන්ට ආපසු ගෙවීමට ද ආඥා කරන ලද්දේ ය.

කෑගළු දිස්ත්‍රික්කයේ ද වෙනත් කීප පළාතක ද සිංහලයන් කිසිම නඩු විභාගයක් නැතුව වතුකාරයන්ගේ පාබල හේවා හමුදාවේ මුළා දැතීන් සහ "පන්ජාබ්" හේවා කණ්ඩායම් භටයන් විසිනුත් වෙඩිතබා මැරීම ගැන විභාග කිරීම පිණිස මේ උතුමාණන් වහන්සේ විසින් ගෞරවාහි චුඩ්රැන්ටන් සහ ස්නයිදර් යන ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විනිශ්චයකාර උතුමාන් දෙදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් කොමිෂන් සභාවක් (බලයත් කාරක සභාවක්) මේ සඳහා විශේෂයෙන් පත් කරන ලද්දේ ය. ඒ සභාවේ වාතාව උතුමාණන් වහන්සේ මනා පරීක්ෂණයකින් යුක්තව කියවා බලා "සුවිනීත ඉංග්‍රීසි ජනයා විසින් අතිශය පිළිකුල් කරනු ලබන යථොක්ත සාහසික ක්‍රියා වල ප්‍රධානයන් මෙන් හැඟී ගිය බේලි, බේන්ස් සහ සංලෝ නමැති ඉංග්‍රීසි වැවිලිකරුවන් තිදෙන ඔවුන්ගේ හමුදාවෙන් පහ කොට ඔවුන් කෙරෙහි ප්‍රදානය කරන තිබුණ "ජේ. පී." "යු. පී. ඇම්." ආදී ගරු තනතුරු සියල්ලම ප්‍රතිබාහණය කරන ලදී. මේ දණ්ඩනය ගැන මුසපත් ඇතැම් යුරෝපීය ජනයා වැඩි දුරටත් කණස්සල්ලට ද උදහසට ද පත්ව එංගලන්ත සභාවේ කොපල්ස්ටන් බිෂොප්තුමාගේ ප්‍රධානත්වයෙන් එංගලන්ත ආණ්ඩුවේ ප්‍රදේශ භාර මන්ත්‍රීතුමා වෙත ලංකේෂ්වරයාණන්ගේ යථොක්ත නියමයට විරුද්ධව කරුණු දක්වා ආයාචනා පත්‍රයක් ඔප්පු කළේය; එසේ ද වුවත් එතුමා යථොක්ත අයදුම්පත ප්‍රතික්ෂේප කොට ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ විසින් පණවන ලද දඩුවම වැඩිදුරටත් ස්ථිර කරන ලද්දේ ය.

මේ කාලයේ දී ගම්පළ වලහගොඩ දේවාලේ පෙරහර නඩුව එංගලන්තයේ "ප්‍රිවිකවුන්සල්" නම් රාජ නීතිඥ මන්ත්‍රණාධිකරණ සභාව ඉදිරියෙහි විභාගයට තබා තිබුණේ ය. ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ ඒ ගැන අපේක්ෂාවක් නොකොට ගම්පළට ගොස් එහි සිංහල සහ මොහම්මදික ජනාධිපතීන් රැස්කරවා එම දෙපක්ෂය අතර සමාදාන යක්

Non-Commercial Distribution

පවත්වනු ලැබ, පුරාතනමෙන් බාධා රහිතව පෙරහර ගමනා ගමනය පිණිස අවසර දෙවාවදාළේ ය.

ස්ථානෝචිත බුද්ධිමත් මේ සත්කෘත්‍යය හේතු කොට ගෙන ඇපැල් නඩු විභාගය අත්හිටවනු ලැබුවා පමණකුදු නොව අනාගතයෙහි බොහෝ වියවුල් හට ගැනීමට හේතුවක්ව පැවතිය හැකි බලවත් උප ද්‍රවයක් ද යථා කාලයෙහි නිරාකරණය වූයේ ය.

වෂී 1917 තේ මැද භාගයේ දී ඇන්ඩර්සන් නම් ශ්‍රේෂ්ඨ ගුණ සම්පන්න ආණ්ඩුකාර උතුමාණන් වහනසේ "ඇපැන්ඩිසයිටිස්" නම් කීටරූපාන්‍ත බන්ධය පිළිබඳ ආබාධයක් වැළඳ රෝගාතුර වූයෙන් ඊට ප්‍රතිකාර වශයෙන් දෙවරක්ම ශල්‍යකර්ම කරන ලද නමුත් ඉන් කිසි පහසුවක් නොලැබ වෂී 1918 ක්වූ මාර්තු මස 24 වෙනි දින නුවර එළියේ රාජ මන්දිරයේදී අනිත්‍යභාවොපගත වූහ. පසුදින එතුමාගේ මෘත දේහය විශේෂ දුම්රියකින් කොළඹ රජ මැදුරට ගෙන එනු ලැබ, දෙහ නික්ෂෙපණ කෘත්‍යය ශ්‍රුසාන භූමියේ දී අත්‍යලංකාර පරිද්දෙන් සිද්ධ කරන ලද්දේ ය.

ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ කෙරෙහි විද්‍යමාන වූ විශිෂ්ට ගුණ ධර්ම රාශිය හේතු කොට ගෙන උන්වහන්සේගේ සදගුණ සඥශීත කීර්ති දේහය අද දක්වාත් ස්වදේශිකයන් විසින් අත්‍යාදර ගෞරවයෙන් සමරණය කරනු ලබයි.

## සර් විලියම් හෙන්රි මැනිං උතුමාණන් වහන්සේගේ වර්තමාන ආණ්ඩු කාලය (ක්‍රි.ව. 1918 වේ පටන්)

ඇන්ඩර්සන් උතුමාණන්වහන්සේගේ අභාවප්‍රාප්තියෙන් අනතුරුව මහසෙක්‍රතාරිස් තැන්පත් ගෞරවාහී රෙජිනෝල්ඩ් ස්ටබ්ස්තුමා ලංකාණ්ඩුකාරධූරයෙහි ද, ආදායම් පාලක ඒ. ඇස්. පැග්ඩන් මහතා මහසෙක්‍රතාරිස්ධූරයෙහි ද කටයුතු 1918 ක්වූ මාර්තු මස 25 වෙනි දින පටන් සමසක් පමණ කාලයක් ඉෂ්ට කළෝය.

වෂී 1918 ක්වූ සැප්තැම්බර් මස 11 වෙනි දින සර් විලියම් හෙන්රි මැනිං උතුමාණන් වහන්සේ මෙම දිවයිනට උපගතව ලංකාණ්ඩුකාර ධූරය භාර ගත්හ. එතුමා විසින් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ පළමුවෙන්ම කරන ලද කථාවේ දී යුරෝපීය මහා යුද්ධයේ කෙළවර දක්ම ඉතා ආසන්න

Non-Commercial Distribution

බව ප්‍රකාශ කරන ලදී. යථොක්ත අනාගත වාක්‍යය පරිදි වර්‍ෂ 1918 ක් වූ නොවැම්බර් මස 11 වෙනි දින ලෝක ඉතිහාසයේ අන්තර්ගත විය යුතු ලක්‍ෂ සංඛ්‍යාත ජනයා මාරාත්මක බවට පැමිණි අති ඝොර වූ මේ මහා සංග්‍රාමය සමාදාන ගිවිසුමකින් නිෂ්ඨාවට පැමිණි යේය. යුධ සාමදානය නිමිත්ත කොට ගෙන වර්‍ෂ 1919 ක් වූ ජූලි මස 19 වෙනි ශනි දින ආණ්ඩුවේ නියමය පරිදි ලක්දිව එකම මංගල්‍ය ගෘහයක් මෙන් නොයෙක් පළාත්වල නානා විධ ප්‍රීත්‍යුත්සව පවත්වන ලදී. මෙදින බන්ධනාගාර වල සිටි හිරකරුවන් බොහෝ දෙනෙක් ගෙවලින් මුදාහරින ලද්දාහුය. එසේම ඇන්ඩර්සන් උතුමාණන් වහන්සේ විසින් ගරු තිල වලින් පහ කරනු ලැබ සිටි බේලි, බේන්ස් සහ සංලෝ නමැති යුරෝපීය වැවිලිකරුවෝ මැනිං උතුමාණන් වහනසේ විසින් නැවතද සිය තනතුරු වලට පත් කරන ලද්දෝ ය. මේ ගරු තිල ආපසු ප්‍රදානය කිරීම ගැන චෝදනා කරමින් ඉංග්‍රිසි සහ සිංහල ස්වදේශික ප්‍රවෘත්ති පත්‍ර වල උදෙසාෂණයක් ඇති වූවා පමණක් නොව මේ ක්‍රියාව ගැන ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ ලංකාවේ මන්ත්‍රි තැන වූ ගරු පී. රාමනාදන් නයිට්තුමා ප්‍රශ්න කර සිටියේ ය.

**වර්‍ෂ 1918** වේ අවුරුද්දේ ලක්දිව බොහෝ පළාත් වල "ඉන්ෆ්ලුඅන්සා" නැමති දරුණු ප්‍රතිශ්‍යා රෝගයද, වර්‍ෂ 1919 යේ අවුරුද්දේ කතරගම කොලරා රෝගයද, එසේම මහනුවර "මහමාරි" නම් බලවත් වසංගතයද පැතිර පැවතීමෙන් එයින් පීඩිත වූ බොහෝ දෙනෙක් මිය ගියෝ ය. වර්‍ෂ 1921 කේ අවුරුද්දේ ජූනි මාසේදී අතීසාර රෝගය වැළඳීමෙන් තෙල්දෙණි පළාත්වාසී බොහෝ දෙන ජීවිතක්‍ෂයට පැමිණියාහු ය.

තවද වර්‍ෂ 1919 යේ සහ 1920 සේත් ඉන්දියාව සහ බුරුමය ආදී පිට රටවල සිට ලක්දිවට ගෙනෙනු ලබන සහල් වල ප්‍රමාණය ඉතා අඩු වීම සහ එහි මිල ගණන් බොහෝ සෙයින් අධිකවීම නිසාත් මෙම දිවයිනේ බර පතල සහල් දුර්භික්ෂයක් ඇති විය. මෙයින් විපතට පත් වූවෝ වැඩි කොටසක් දුගී ජනයා වූහ. නොපුරුදු වන එල බුදීමෙන් ද කැලෑ කොළ සහ අල වර්ග ආදිය තම්බා කෑමෙන්ද වෙනත් රූක්ෂා භාර වර්ග සෙවීමෙන්ද අනේක ආබාධයන්ට ගොදුරුවී මොව්හු බොහෝ දෙනෙක් ජීවිතක්ෂයට පවා පැමිණියාහු ය. මෙ දුර්භික්ෂය සහනය කරනු පිණිස ආණ්ඩුව විසින්

---

යුරෝපීය මහාසංග්‍රාමයෙන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය විජය ග්‍රහණය කිරීම සහ ලක්දිවින් යුධ භූමියට පැමිණ මාරාත්මක වූ භේවායන් සිහිපත් කරනු පිණිසත් එංගලන්තයේ දක්‍ෂ ශිල්පියෙක්වූ සර් ඇඩ්වින් ලටියන්ස් මහතා විසින් සකස් කරන ලද යුද්ධ ජයස්තම්භයේ ප්‍රති රූපය පිළිබඳ සැලැස්ම දැනට මෙහි පමුණුවා තිබේ; මෙම ජයස්තම්භය කොළඹ "ගෝල් ෆේස්" පිට්ටනියට අයත් භූමිභාගයක ගොඩ නැගීමට යෝජන කර තිබේ.

Non-Commercial Distribution

සියම් දේශයේ අග නුවරින් බැන්කෝ සහල් මිලයට ගෙන වරින් වර වෙළඳුන්ට විකුණන ලදී. සහල් මිල පාලනය කිරීම පිණිස ද එය ප්‍රමාණ සහිතව සාධාරණ ලෙස සියල්ලන්ටම බෙදා විකිණීම ගැන ද ආණ්ඩුව විසින් ආඥා පණ වන ලදී. කොළඹ නගරයේ තන්හි තන්හි නගර වැසියන්ට සහල් විවෘත කරන ලදි. පිට පළාත් වල ඒජනත්නතවරු කෙරෙහි හිතෛෂීව ක්‍රියා කරන ලද්දේ නුමුත් ආත්මාර්ථකාමී ඇතැම් නිලධාරීහු ද, එමෙන්ම සමහර කෙරාටික දුෂ්ට වෙළෙන්දෝ ද, අනේක කපට ක්‍රීයාවෙන් කෑම හානිය හේතු කොට ගෙන මරබියෙන් සිටි අතිශය ඛේද ජනක මේ ප්‍රස්තාවය තම තමන් ධනාඪ්‍යවීමේ සාභිලාෂීව අයථා ක්‍රමයෙන් මුදල් උපායීමේ මාර්ගයක් කර ගත්තෝ ය.

ලක් වැසියාගේ ප්‍රධාන ආහාරය වූ සහල් සම්බන්ධව පැමිණි මේ බලවත් ව්‍යසනය කරණ කොට ගෙන කදිම ආදර්ශමත් පාඩමක් ලක් වැස්සන් ඉගෙන ගනු ලැබීමෙන් මෙරට වී ගොවිතැන වඩ වඩා දියුණු කිරීමේ අවශ්‍ය කතාව ස්වදේශීන්ට මනාසේ අවබෝධ විය. කෘෂි කර්මාන්තය සඳහා ලක්දිව නොයෙක් පළාත්වල රාජ සන්තක ඉඩම් බොහොමයක් ඉතා පහසු විධි විධාන පිට ආණ්ඩුව විසින් ගම් වැසියන්ට පවරා දෙන ලදී. අනුරාධපුරය මින්නේරිය, මඩකලපුව, තිස්ස මහාරාමය ආදී පලාත් වල අක්කර දහස් ගණන් වෙල්යායවල් ධනවත් ප්‍රභූ මහතුන් සහ සමාගම් විසින් ආණ්ඩුවෙන් මිලයට ගෙන මෙකල ඒවා සාරවත් ධාන්‍යක්ෂේත්‍රමෙන් යොදවනු ලැබ තිබේ. ආහාර නිෂ්පාදනය පිණිස විශේෂ දෙපාර්තමේන්තුවක් ඇජ්. ජේ. සමිත් මහතාගේ ප්‍රධානත්වය සිට ආණ්ඩුව විසින් ද ආරම්භ කරන ලද නුමුත් යම් යම් කරුණු හේතු කොට ගෙන එය අත්හිටු වන ලදී.

වර්ෂ 1919 ක් වූ අප්‍රියෙල් මස 5 වෙනි දින මහසෙක්‍රතාරිස් තැන්පත් රෙජිනෝල්ඩ් ඇඩ්වර්ඩ් සටබ්ස්තුමා හොංකොං ප්‍රදේශයෙහි ආණ්ඩුකාර ධූරයට පත්ව ලංකාව අත්හැර ගියෝ ය. එවක් පටන් වර්ෂ 1919 ක් වූ ඔක්තෝබර් මස 20 වෙනි දින සර් ග්‍රේම් තොම්සන්තුමා මහසෙක්‍රතාරිස් ධුරයේ වැඩ ස්ථිර ලෙස භාර ගන්නා තුරු ආදායම් පාලක ඒ. ඇස්. පැග්ඩන් මහතා එහි කටයුතු කෙළේ ය. වර්ෂ 1920 සේ නොවැම්බර් මාසේ දී ලංකාණ්ඩුවේ අධ්‍යාපන මණ්ඩලයෙහි අධ්‍යක්ෂ තැන මෙන් ශාස්ත්‍රාභිවෘද්ධිය සඳහා ප්‍රශංසනීය උත්කෘෂ්ට මෙහෙයක් ඊෂ්ට කළා වූ ද කලක් ආහාර පාලක දෙපාර්තමේන්තුවේ කටයුතු මොනවට සිදු කළා වූ ද සදගුණවත් කීර්තිධර සිවිල් නිලධාරියෙක් වූ ඉ. බී. ඩෙන්හැම් මහතා මුරිෂස් නම් දිවයිනේ මහසෙක්‍රතාරිස් තැන මෙන් පත්ව ගියේ ය.

වර්ෂ 1919 යේ දී ලංකාවේ ව්‍යවස්ථාදායක සහ කාරක මන්ත්‍රණ සභාවන්ගේ ප්‍රති සංස්කරණයක් ඇති කරලීම පිණිස ලංකා මහාජන සංගමය

Non-Commercial Distribution

විසින් යෝජනා පද්ධතියක් ආණ්ඩුව ඉදිරියට පමුණු වන ලදී. ඒ පිළිබඳ රහස් වර්තාවක් ලංකාණ්ඩුව විසින් ප්‍රදේශ භාර මහා මන්ත්‍රීතුමා වෙත යවන ලද්දේ ය. මේ කාරණය සම්බන්ධව යථෝක්ත මන්ත්‍රී තැන වූ මිල්නර්සාමි සමග සාකච්ඡාවක් පැවැත්වීම පිණිස මැනිං උතුමාණන් වහන්සේ වර්ෂ 1920 ක් වූ මාර්තු මස 6 වෙනි දින එංගලන්තයට පිටත්ව ගියේ ය. ඉක්බිති උතුමාණන් වහන්සේ එම අවුරුද්දේ සැප්තැම්බර් මස 12 වෙනි දින නැවත ලංකාවට හැරී එනතුරු හය මාසයක් පමණ කාලයක් සර් ග්‍රෙම් තොම්සන්තුමා ආණ්ඩුකාර ධූරයෙහි ද, බී. හෝර්ස් බර්ග් මහතා මහසෙක්‍රතාරිස් ධූරයෙහි ද වැඩ බැලුවෝ ය.

මේ කාලයේ ලංකා මහාජන සංගමයේ විධායක සභාවට අයත් ශ්‍රීමත් පොන්නම්බලම් අරුනාසලම් ජේම්ස් පීරිස් ඇප් ආර් සේනානායක එච් ජේ. සී. ප්‍රේරා ඩී. බී. ජයතිලක සන්ද්‍රසේගර යනාදි මහතුන්ගෙන් යුත් නියෝජිත පිරිසක් ප්‍රතිසංස්කාරණය පිළිබඳ කරුණු මිල්නර්සාමිට ගෙන හැර දක්වා සිටීම සඳහා එංගලන්තයට ගොස් සිටියේ ය. මිල්නර්සාමි සමග කරන ලද සාකච්ඡාවේ දී ආදි නිරතව සිටියේ ය. එඩ්. ජේ සී. ප්‍රේරා මහතා මේ නියෝජිත පිරිසෙහි ප්‍රධාන කථිකතුමා මෙන් ක්‍රියා කෙළේ ය. එහෙත් නියෝජිත පිරිසේ අභිමතාර්තවයන් බලාපොරොත්තු වූ පරිදි සාර්ථක නොවී ඔව්හු ලංකාවට හැරී ආවෝ ය.

වර්ෂ 1919 යේ අගෝස්තු මාසේ දී ආණ්ඩුවේ නිලධාරීන් සහිත මෙහෙකරුවන්ගේ සහ විශ්‍රම වැටුප් ලබන්නන්ගේත් පඩි වැඩි කරන ලදී. මේ අවුරුද්දේ ගැලවීම් හමුදාව විසින් කොළඹ නගරයේ පාදඩව කුසීතභාවයෙන් කල්යන වන්නන් වැඩ වල යොදවීම සඳහා මෝදර පරණ හිර ගෙදර කර්මාන්ත ශාලාවක් පිහිටු වන ලද්දේ ය.

වර්ෂ 1920 සේ අවසාන භාගයේ දී ප්‍රදේශ භාර මන්ත්‍රීතුමාගේ අනුමතය පිට මන්ත්‍රණ සභාවෙන්ගේ ප්‍රතිසංස්කරණයක් සහ අභිනව සභාරීති ක්‍රමයක් ද ලංකාණ්ඩුව විසින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී. එහි සභාරීති වලින් මන්ත්‍රීවරුන්ට කථා පැවැත්වීමට අවසරලත් කාලය ඉතා ලුහුඩු ලෙස සීමා කරමින් ආණ්ඩුකාරතුමාට සෛවරී බලයක් පවරා තිබුණේ ය. ඇතැම් උඩරට සිංහල ජනාධිපතින් විසින් ලංකා ජාතික මහ සංගමයේ අදහස් වලට විරුද්ධව ක්‍රියා කිරීමේ අනිෂ්ට විපාකයන් වශයෙන් මන්ත්‍රී තේරීම ගැන ඡන්දය දීමට උඩරට සිංහල ජනයා ඇතුළත් නොකරන ලදී. යථෝක්ත අභිනව ප්‍රතිසංස්කරණයන්ට ද එසේම සභා රීති වලට ද සාමාන්‍යයෙන් ලක් වැසියෝ එකහෙලා විරුද්ධ වූහ. ඒ සම්බන්ධවය මන්ත්‍රීන් තේරීම ගැන ඡන්දය දිමට කිසිවෙක් ඉදිරියට නොපැමිණි මෙන්

Non-Commercial Distribution

සහයෝගතා වර්ජනය කිරීමට ලංකා ජාතික මහාසංගමය විසින් යෝජනාවක් කරන ලද්දේ ය. යථෝක්ත සම්මතය පරිදි බොහෝ දෙනෙක් ක්‍රියා කිරීමට සරසී සිටිනා තර මැනිං උතුමාණන් වහන්සේ ලංකා ජාතික මහා සංගමයේ ප්‍රධානීන් කැඳවා අවුරුද්දක් ගත වූ විට නැවතත් වඩා යෝග්‍ය ප්‍රතිසංස්කරණයක් කර දෙන ලෙසට සහ අමනොඥයයි වැටහෙන සභා රීතින් ඉවත් කරවා දෙන ලෙසටත් පොරොන්දු වී සාම්භාවයක් ඇති කර වූයේ ය.

වර්ෂ 1920 සේ ජූනි මාසයේ දී අභිනව ව්‍යවස්ථාදායක සහ කාරක මන්ත්‍රණ සභාවත් පිහිටු වන ලදී. මේ ප්‍රතිසංස්කරණය හේතු කොට ගෙන සිංහල සහ ද්‍රවිඩ ජනයාට ජාති වශයෙන් නොව පළාත් වශයෙන් මන්ත්‍රීන් තේරීමට ඡන්දය දීමට බලය පැවරී තිබේ. බස්නාහිර පළාතට මන්ත්‍රීවරු දෙදෙනෙක් ද, අනිත් පළාතට අවට මන්ත්‍රීවරු අට දෙනෙක් ද, කොළඹ නගරයට මන්ත්‍රී කෙනෙක් ද යනාදි වශයෙන් ඡන්දය දීමෙන් ව්‍යවස්ථා මන්ත්‍රණ සභාවට මන්ත්‍රීන් තෝරා යවනු ලැබේ. තවත් නිල නොලත් මන්ත්‍රීවරු ස්වල්ප දෙනෙක් පත් කිරීමට උතුමාණන් වහන්සේට බලය තබා ගෙන තිබේ. පහතරට වැවිලිකරු සමිතියට ද මන්ත්‍රී කෙනෙක් තෝරා යැවීමට බලය දී තිබේ. ප්‍රසිද්ධ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක තැන ද කෘෂි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනද, විහාර දේවාලගම් සම්බන්ධ ආඥා පණතේ කොමසාරිස් තැන ද ව්‍යවයස්ථාදායක මන්ත්‍රණ සභාවේ අමුතු පත් කරන ලද නිල ලත් වැඩිමනක් මන්ත්‍රීවරුවෙත්. කාරක මන්ත්‍රණ සභාවට නිල නොලත් මන්ත්‍රීවරුන් ගණනක් පත් කර ගැනීමට ද අභිනව ප්‍රතිසංස්කරණයෙන් උතුමානණ් වහන්සේට බලය දී තිබේ.

වර්ෂ 1921 කේ මාර්තු මස 18 වෙනි දින සිරිත් ප්‍රකාර දශ වර්ෂයකට වරක් බැගින් පිළියෙළ කරන මෙම දිවයිනේ ජන ලේඛනයට කරුනු සොයා සම්පාදනය කරන ලදී. මේ ලේඛනයේ අන්දමට යුද්ධ හමුදාවට අයිති ජන සංඛ්‍යාව අත්හැර බලන විට මෙම දිවයිනේ මුලු ජන ගහණය 44,98,999 දෙනෙක් බව පෙනේ. වර්ෂ 1911 හේ දී ගන්නා ලද ලේඛන යට වඩා 3,92,649 දෙනෙක් පසු ගිය දස අවුරුද්ද තුළ වැඩි වී තිබේ. ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාවන් සසඳා බලන කල්හි පශ්චිම දිග රට වල මෙන් නොව ස්ත්‍රී පක්ෂයේ අඩුකම හා පුරුෂ පක්ෂයේ බහුලත්වයක් ප්‍රකාශ වේ. මේ ජන ලේඛනයේ හැටියට ලංකාවේ ජන සංඛ්‍යාවේ එක් එක් දහසකට ස්ත්‍රීන් 472 හා පුරුෂයන් 528 දෙනෙක් ද වෙති. අක්ෂර ශික්ෂණය ලැබූ ජනයාගේ ගණන 1911 දී 26% ක් ව තුබූ නුමහුත් 1921 කේදී 32% දක්වා වර්ධනය වී තිබේ. මේ කාරණයෙන් අධ්‍යාපන කෘත්‍ය සම්බන්ධව ඉකුත් වූ ද වර්ෂය තුළ ලක්දිව තුෂ්ටිදායක ප්‍රබෝධයක් පැවති බැව් සවුල වන්නේ ය.

Non-Commercial Distribution

පළාත් ආණ්ඩු ක්‍රමය පිළිබඳ වර්ෂ 1920 සේ අංක 11 දරණ ආඥා පණත එම වර්ෂයේ පෙබරවාරි මස 25 වෙනි දින ව්‍යවස්ථාදායක මන්ත්‍රන සභාවේ සම්මතය ඇතුව ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ස්ථිර කොට පණ වන ලද්දේ ය. එම ආඥා පණතට අනුව වර්ෂ 1922 කේ මුල් භාගයේ දී යාපනේ මාතලේ සහ මීගොමුවේත් කවුන්සල් සභා තුනක් පිහිටුවීමට මෙකල ආම්භකර තිබේ. මොරටුව පානදුරේ අම්බලම්ගොඩ ආදී නගර වල එකී කවුන්සල් සභා පිහිටුවීම ගැන එහි ඇතැම් නගරවාසීහු විරුද්ධතාවක් දක්වා සිටිත්.

කොමසාරිස් සභාවක වාර්තාවක අනුව විහාර දේවාලගම් සම්බන්ධව ආඥා පණත ප්‍රතිසංස්කරණය කොට අමුතු ආඥා පණතක් වර්ෂ 1921 කේ දී ආණ්ඩුව විසින් පිළියෙළ කොට ප්‍රකාශයට පමුණු වන ලද නුමුත් ඊට බෞද්ධ ගෘහස්ථ ප්‍රව්‍රජිත බොහෝ දෙනෙක් විරුද්ධ වූ බැවින් එය අත් හැර දමන ලද්දේ ය.

පස්වෙනි ජෝර්ජ් මහරාජණන්ගේ උත්පත්ති දිනය නිමිත්ත කොට ගෙන වර්ෂ 1921 කේ ජුනි මස 3 වෙනි දින රාජකිය නීතිඥයෙක් සහ ව්‍යවස්ථාදායකන මන්ත්‍රණ සභාවේ පැරණි මන්ත්‍රිවරයෙක් වූ ගරු පී රාමනාථන් මහතාට නයිට් නමැති වංශාධිපති පදවිය ද ශ්‍රෙෂ්ඨ පද්ධතියේ සිවිල් නිලධාරියෙක් වූ බී. හෝර්සබර්ග් මහතාට සී.ඇම්.ජී. යන ගෞරවාර්තව අක්ෂරත්‍රය ද මහ රජතුමාණන් දෙවා වදාරණ ලද්දේ ය.

වර්ෂ 1920 සේ දෙසැම්බර් මාසේ දී එංගලන්තෙයේ සිට මෙම දිවයිනට පැමිණි සප්ටන් ජෝන්ස් මැතිනිය හා ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේත් අතර විවාහ මංගල්‍ය කොළ රාංහන්දියේ දී විශාල ප්‍රභූ පිරිසක් ඉදිරියෙහි බස්නාහිර පළාතේ ඒජන්ත තැන්පත් ගරු. ජේ ජී ප්‍රෙසස්ර් මහතාවිසින් නීත්‍යානුකූලව සිද්ධ කරනලද්දේ ය. මෙකල මැතිං ආර්යාව නමින් ප්‍රසිද්ධ මේ මැතිනියගේ ප්‍රදානත්වයනේ මහත් මුදලක් ලක්දිව නොයෙක් පළාත් වලින් එකතු කොට රත්මලානේ පිහිටි අන්ධ බිහිරි ගොළු බාලයින්ගේ පාසැලට පරිත්‍යාග කරන ලදී. ස්වදේශිකයන්ගේ ප්‍රසිද්ධ කටයුතු වලට ධෛර්ය ද සීම් වශයෙන් එළඹ ක්‍රියා කිරීමෙන් හා අනිකුත් කරුණා හරිත ගති වලිනුත් මෙතුම් යහපත් උත්තමාවක් ය.

ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ සිද්ධාර්ථ කුමාරා වස්ථව පිළිබඳ ජීවන චරිතය ප්‍රතිරූප චිත්‍ර වස්ත්‍රයන්ට නගා ලංකාවෙහි දක්වීමට වර්ෂ 1920 සේ ජූනි මාසේ දී යුරෝපයේ සිට මෙහි පැමිණි ආචාර්ය අර්නස්ට් ඇස්ඩේල් මහතා සහ සිය පිරිස විසින් ආරම්භයක් කරන ලදී. ක්‍රීඩා සහගත

Non-Commercial Distribution

මේ ප්‍රදර්ශණය බුද්ධ අගෞරවයක් ලෙස සැලකූ බෞද්ධ භික්ෂාකාමී ප්‍රව්‍රජිත උතුමන් සහ ගෘහස්ත ප්‍රභූන් කිහිප දෙනෙක් විසින් පෙන්වන ලද විරුද්ධත්වය නිසා ස්වකීය අභිමතාර්ථව ඉෂ්ට කර ගත නොහැකි ඔව්හු ආපසු හැරී සියරට බලා ගියෝ ය.

මහනුවර ශ්‍රී දන්ත ධාතුමන්දිරයෙහි ශබ්ද පූජාවල් පවත්වන වේලාවල් වෙනස් කිරීමට සහ අඩු කිරීමටත් ගරු ඩබ්ලිව්. ඇල්. කින්ඩර්ස්ලි මධ්‍යම පළාතේ ඒජන්තතුමාගේ ප්‍රධානවත්වයෙන් වර්ෂ 1921 කේ අප්‍රියෙල් මස 28 වෙනි දින මහනුවර කච්චේරියේ රැස්වීමක් පවත්වන ලද්දේ ය. මහනුවර අස්ගිරි මල්වතු උයන උභය විහාරයන්හි මහා නායක ස්ථිවර යන්වහන්සේලා දෙනම ප්‍රමුඛ කොට ඇති සාමාන්‍ය බෞද්ධ ජනයා මේ යෝජනාවට එකහෙලා විරුද්ධ වූ බැවින් එය නිෂ්ප්‍රභා විය.

වර්ෂ 1921 කේ අවුරුද්දේ දී ලංකාණ්ඩුවේ ප්‍රතිෂ්ඨාධාරය ඇතිව මෙම දිවයිනේ ආදර්ශවත් මාහැඟි ප්‍රදර්ශණ තුනක් පවත්වන ලදී. ගොවි කර්මාන්තය සහ හස්ත කර්මාන්තය සම්බන්ධ ප්‍රදර්ශණයක් පස් දුන් කෝරළයට අයත් අගලවත්තනම් ප්‍රදේශයෙහි ජූනි මස 25 වෙනි දින මහසෙක්‍රතාරිස් ධූරන්ධර සර් ග්‍රෙම් තොම්සන්තුමා විසින් විවෘත කරන ලද්දෝ ය. එබඳු තවත් ප්‍රදර්ශණයක් රයිගම් කෝරළේ හොරණ නම් ග්‍රාමයෙහි ජූලි මස 23 වෙනි දින බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්ත තැන වූ ජේ. ජී. ෆ්‍රේසර් මහතා විසින් විවෘත කරන ලද්දේ ය. මේ දෙකටම වඩා අනර්ඝ පුෂ්ප ප්‍රදර්ශණයක් හෙනරත් ගොඩ පළාතේ ගම්පළ නමැති ප්‍රදේශයෙහි අගෝස්තු මස 4 වෙනි දින පවත්වනු ලැබීය. මේ ප්‍රදර්ශණයට පැමිණි ලංකාණ්ඩුකාර මැනිං උතුමාණන් වහන්සේ විසින් ස්වකීය ආර්යාවගේ නමින් හෙනරත්ගොඩ ගොඩනගන්ට අදහස් කරන ලද ලේඩිමැනිං ආරෝග්‍ය ශාලාවේ මුල්ගල තැබීම හා ගම්පහ විභාෂා පාඨ ශාලාව ද විවාත කිරීමත් සිද්ධ කරන ලදී.

මැනිං උතුමාණන් වහන්සේ විසින් පේරාදෙණියේ උෂ්ණ කලාපිත කෘෂිකර්ම විද්‍යාලය විවෘත කිරීම ද මැනිං ආර්යාව විසින් කෘෂි කර්මාන්තය පිළිබඳ විභාගයෙන් සමර්ත වූ ශිෂ්‍යන්ට තෑගි බෙදාදීමට ද මෙහම අවුරුද්දේ සැපැත්ම්බර් මාසේ දී උත්සවාකාරයෙන් ඉෂ්ට කරන ලදි.

මෙම අවුරද්දේ ඔක්තෝබර් මාසේදී ඇටර්නි ජනරල්තුමා විසින් අභිනව ව්‍යවස්ථා කිහිපයක් ස්ථිර කිරීම පිණිස ව්‍යවස්ථායක මන්ත්‍රි සභාව ඉදිරියට ගෙණෙන ලදී. ඉන් එකක් නම් 1889 යේ අධිකරණ ශාලා පිළිබඳ ආඥා පණත වැඩි දුරටත් ප්‍රතිසංස්කරණය කිරීම හා ඒකාබද්ධ කිරීම සඳහා

Non-Commercial Distribution

සාදන ලද ව්‍යවස්ථාවේ. ඉන් ශ්‍රේෂ්ඨාධිකරණයට පස්වෙනි විනිශ්චයකාරය පත් කිරීම බලය දෙන ලද්දේ ය. තවත් වැදගත් ව්‍යවස්ථාවක් නම් 1876 යේ අංක 15 දරණ විවාහ වූවන්ගේ අයිති වාසිකම් පිළිබඳ ආඥා පණත අලුත් වැඩියා කිරීමට සහ ඒකා බද්ධ කිරීමටත් සාදන ලද්දකි. මේ අභිනව ව්‍යවස්ථාවෙන් විවාහක ස්ත්‍රීන්ගේ දේපල ගැන පළමු තිබුණට වඩා මහත් නිදහසක් ඔවුන්ට දී තිබේ. බොහෝ කලක සිට දෝෂා රෝපණීය රාවයකින් දූෂිතව පැවති කම්කරුවන්ගේ ව්‍යවස්ථාව ද බොහෝ දුරට සංශෝධනය කොට අභිනව ව්‍යවස්ථාවකින් එය ප්‍රතිසංස්කරණයට පමුණුවා තිබේ. අභිනව ව්‍යවස්ථාවකින් වර්ෂ 1921 ක් වූ අගොස්තු මස 16 වෙනි දින මහනුවර අස්ගිරි විහාරයේ ගෞවාර්හි අඹගස්වැවේ ශ්‍රී ධර්මපාල රත්න ජෝති මහනායක ස්ථවිරයන් වහන්සේ ස්වර්ගස්ථ වී වදාළේ ය.

මෙම වර්ෂයේ නොවැම්බර් මස 9 වෙනි දින ඇමෙරිකාවේ අමද්‍යප වීර පුරුෂයා වූ පූසි පුට් ජෝන්සන් මහතා කොළඹට පැමුණුවා විට මෙම දිවයිනේ අමද්‍යප මෙහෙයෙහි නියුක්ත මහත් සමූහයක් විසින් එතුමා ගරු බුහුමන් කිරීමෙන් පිළි ගන්නා ලද්දේ ය. එදින උදය කාලයෙහි ඒ මහතා විශාල පිරිසක් ඉදිරියෙහි නායක විනිශ්චකාර ධූරන්ධර සර් ඇන්ටන් බර්ට්‍රැම්තුමාගේ ප්‍රධානත්වය ඇතිව නීති ශිෂ්‍යයන්ගේ අලුත් කඩේ විද්‍යාලයෙහි පවත් වන ලද රැස්වීමක දී මද්‍යපානය මූලොත්පාඨනය කර හැරීම සම්බන්ධව විසිතුරු කථාවක් කෙළේ ය. සමස්ත ලෝකය එකම අමද්‍ය ගෘහයක් කරුණු පිණිස පුදුම වූ උට්ඨාන වීයර්‍යකින් යුක්තව බොහෝ අවුරුදු ගණනක සිට මද්‍යපානයට විරුද්ධව සටන් කරන මේ ජන හිත නිරත ශ්‍රෙෂ්ඨ පුරුෂයාගේ ලංකා භූමණ්ඩල ප්‍රවේශනය නිමිත්ත කොට ගෙන එදින සවස ඇජ්. ආර්. සේනානායක බැරිස්ටර් මහතාගේ කුරුඳු වත්තේ ග්‍රාස්මියර් නම් නිවසෙහි ප්‍රිය සම්භාෂණයක් පවත්වන ලද්දේ ය. එදින රාත්‍රියෙහි එතුමා විසින් මරදානේ ටවර්හෝල් නම් ශාලවේ දී මද්‍යපානයෙහි ආදීනව සහ මද්‍යපානය නිසා දුක් අඳුරේ ගැලී වසන මනුෂ්‍යයා එයින් මුදවාලීම අරබයා විචක්ෂණෞප දේශාන්තිව චිත්තාභිරමණීය ව්‍යක්ත කථාවක් කරන ලදී. ජොන්ස් මහතා ලක්දිව නැවතී සිටි දවස් ස්වල්පයක ඇතුළක දී ජාපනය, අනුරාධපුරය අත්තනගල්ල මහනුවර ගාල්ල ආදී පළාත් වලට පැමිණ මද්‍යපාන මෙම දිවයිනෙන් සම්පූර්ණයෙන් ඉවත් කර දැමීම සම්බන්ධව ප්‍රශස්ත කථා කීපයක් පැවැත් වූයේ ය. මහ නුවරදී අමද්‍යාප මෙහෙයවීම නියුක්ත වුවන් විසින් එතුමාට රාත්‍රී භෝජනයකින් සංග්‍රහ කරන ලදී.

පුසිපුට් ජෝන්ස්න් මහතාගේ සම්ප්‍රප්තියෙන් කල්‍යාමක දී හටගත් හැකි ඉෂ්ටාර්ථධිදායක ප්‍රතිපලයක ශුභ නිමිත්තක් වශයෙන් එතුමා ලංකාවේ

Non-Commercial Distribution

නැවතී සිටියදීම නොවැම්බර් මස 10 වෙනි දින පවත්වන ලද ව්‍යවස්ථාව මන්ත්‍රන සභාවේ රැස්වීමේ දී උතුරු පළාත වෙනුවෙන් පෙනී සිටින ගරු දොරේසාමි මන්ත්‍රීතුමා විසින් කලක දී මද්‍යපානය ඖෂධයක් පිණිස හැර සේවනය කිරීම ලංකාවාසීන්ට සම්පූර්ණයෙන් තහනම් කිරීමේ පරමාර්ථය පිට ලංකාණ්ඩුව විසින් ක්‍රමානුකූල පිළිවෙළක් ඇති කළ යුතු යයි යන යෝජනාවක් ගෙනෙන ලදී. මේ යෝජනාවට විරුද්ධව ඇටෝර්නි ජනරල්තුමා ද ආදායම් පාලක රෝස් බර්ග් මහතා ද සර් පොන්නම්බලම් රාමනාථන් මන්ත්‍රීතුමා ද කතා කළෝ ය. විවාදය අවසානයේ ලංකාණ්ඩුකාර මැනිං උතුමාණන් වහන්සේ මේ කාරණයේ දී වැසියන්ගේ අදහසට එකඟව ක්‍රියාකරන්ට ආණ්ඩුව සතුටු බැව් කියමින් නිල නොලත් මන්ත්‍රීන්ගෙන් පමණක් ඡන්දය විමසුවේ ය. එවිට මන්ත්‍රීවරු 10 දෙනෙක් එකඟව ද, 9 දෙනෙක් විරුද්ධව ද ඡන්දය දීමෙන් යෝජනාව ස්ථිර විය.

## වේල්ස්හි කුමාරයාණන්ගේ ලංකාගමන.

ශ්‍රී ලංකා ඉතිහාසය පිළිබඳ වෘත්තාන්තර කථා අවසාන භාගයට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙහි මෞලිමාලලංකාරයෙන් විරාජමානව වැඩ වාසය කරන දශ දික්හි පතළ තේජෝමය කීර්ති කදම්බයක් ඇති ආර්ය වංශොද භූත පස්වෙනි ජෝර්ජ් නම් නාග රාජවරාණන වහන්සේ ගේ ජ්‍යේෂ්ඨ පුත්‍ර භූත ඇඩ්වර්ඩ් ඇල්බර්ට් ක්‍රිස්ටියන් ජෝර්ජ් ඇන්ඩෘන් පැටරික් ඩේවිඩ් යන නාමොප ලක්ෂිත වේල්ස්හි ජන පදධීශ්වර යන කුමාරෝත්තමයණන් සිරිලකට උපගත වීම සම්බන්ධ ප්‍රවෘත්තිය අනාගත පරමාපරායාත ජනයාගේ විජානය පිණිස සංක්ෂේප වශයෙන් ග්‍රන්ථා රූඪ කර තැබීම අවකාශ ලැබීම විශේෂයෙන් හෙළ දිව් වැසි චිරස්ථිත ජනයාගේ ජනනයට ද ඉංග්‍රීසි ඔටුන්න ආහ්ලාද කෙරෙහි ශත වර්ෂාධික කාලයක පටන් ඔවුන් තුල අවිනිශ්චිතව පැවති එන අව්‍යාජ රාජපාක්ෂික භාවය හැඟවීමට ද හේතුව පවත්වා බව දත යුතු වේ.

වර්තමාන ලෝකයේ අති විශාල අග්‍ර රාජ්‍ය වූ මහා බ්‍රිතාන්‍යයෙහි කිරීටය හිමිව අටවෙනි ඇඩ්වර්ඩ් නම් නමින් රාජ්‍ය ශ්‍රී භුක්ති විඳීමට වාසනා ගුණ සම්පන්න ඇති මෙම මහොත්තම කුමාරයාණෝ වර්ෂ 1922 ක් වූ මාර්තු මස 21 වෙනි කුජ දින මේ ශ්‍රී ලංකා භූමණ්ඩලාවතීර්ණවීම බ්‍රිතාන්‍ය ආඥා චක්‍රයට යටත්ව වසන හෙළිදිව් වැස්සන් ඉංග්‍රීසි රජ පවුල කෙරෙහි විද්‍යාමාන භක්තිද්‍යාදර හා කෘතඥ භාවය ද ඒ හේතුවින්ජනිත ආමන්දනය ද ප්‍රකාශ කිරීමට සුදුසු අවස්ථාවක් වූයෙන් එදින මුළු ලක් ජනගහණයෙන්

Non-Commercial Distribution

යුත් සෑම පළාත්හි නානා ප්‍රකාර උත්සව පැවැත්වීමෙන් මෙම දිවයින එකම මංගල්‍ය ගෘහයක් මෙන් වූවා ය.

මෙම රාජකීය ආගන්තුක උත්තමයාණන්ගේ ලංකා තරණයට මාස ගණනක පෙර සිට එතුමන් ගරු බුහුමන් පෙරදැරිව පිළිගැනීම පිණිස ලංකාණ්ඩුව ප්‍රමුඛ කොට ඇති මහ ජනයා විසින් ලංකාවේ නොයෙක් පළාත්හි විවිධාකාර කටයුතු පිළියෙල කරන ලදී. යථොක්ත දින පෙරවරු 10 ට රිනෞන් නම් යුද්ධ නෞකාවෙන් කුමාරයාණෝ පිරිවර කැටුව කොළඹට ගොඩ බටුයේය. මේ වේලෙහි එතුමාණන්ට ආචාර වශයෙන් ගොඩින් සහ යුද්ධ නැව් වලිනුත් තබන ලද කාලතුවක්තු වෙඩිමුර කන් බිරි කරවමින් මහීගර්ජනාවක් මෙන් පැවතිණ. මෙතුමානණ් වරායේ පාලමට සම්ප්‍රාප්ත වූ කල්හි ලංකාණ්ඩුකාරතුමා සහ ප්‍රධාන ප්‍රභූ පිරිසක් ද විසින් ගෞරවාදරයෙන් පිළිගනු ලැබීය. ඉක්බිති ලංකාණ්ඩුකාරතුමා විසින් ආරාධිතව ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්තුමා විසින් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ ශුභාශිංසන පත්‍රය පළමු කොට කියවා කුමාරයාණන්ට ඔප්පු කරන ලද්දේ ය. එසේම කොළඹ නාගරික සභාව ස්වදේශික ජන ප්‍රධානීන්ගේ සමිතිය යුරෝපීය වෙළඳ සමිතිය, පහත රට ද්‍රව්‍ය සම්පාදක සමිතිය, යුරෝපිය සංගමය යන කාර්ය මණ්ඩලයන් විසින් ශුභාශිංසන පත්‍ර කියවා කුමාරයාණන්ට පිළිගන්වන ලදී. ඊට කුමාරයානණ් විසින් සුදුසු පිළිතුරු දෙන ලද්දේ ය. ඉක්බිති කුමාර තෙමේ ලංකේශ්වරයාණන් සමග මෝටර් රථයට නැඟ උසස් නිලධාරින් විසින් පිරිවරනු ලැබ කොළඹ නගර ප්‍රදක්ෂණාවේ නියුක්ත විය. මේ අවස්ථාවෙහි උත්තම කුමාර සන්දර්ශනයෙහි ලෝල්ව වීථි උභය පාශ්වයෙහි උරෙන් උර පැහැර ගැවසී සිටි මහා ජනයාගේ ඔල්වර හඬ ප්‍රචණ්ඩව වායු වේගයක් හමන කලමෙන් උසස්ව පැවැත්තේ ය. එසේම තන්හි තන්හි නංවන ලද ධජ පතාකයනේ සැදි සිටි අලංකාර තොරන් මහවේ දෙපස ඇති වූ මාලා කර්ම ලතා කර්මාදිය කරණ කොට ගෙන එදින කොළඹ නගරය බෙහෙවින් මහත් ශ්‍රී ශෝභාවක් ඉසිලීය. කුමාරයානණ් නගර ප්‍රදක්ශිණ කරන කල්හි කොළඹ සහ ඒ අවට පාඨ ශාලාවන්හි දහස් ගණන් ශිෂ්‍ය සමූහයා කණ්ඩායම් වශයෙන් බෙදී ප්‍රසිද්ධ මංසන්ධීය වල නැවත සිට ප්‍රීති ඝෝෂා පැවැත් වූහ. මෙසේ පැය තුන් කාලක් පමණ නගරයේ ප්‍රසිද්ධ වීථි සංචාරණය කළ පසු පූර්ව භාග 11.15 ට කුමාරයාණෝ කොටුවේ රාජ මන්දියරට සම්ප්‍රාප්තව අපරභාග 1 ට අප්‍රසිද්ධ ලෙස අතුරුපස වැළඳුවේ ය. මෙදින සන්ධ්‍යා සමයේදී රජ වාසල උද්‍යාන ප්‍රිය සම්භාෂණයක් පවත්වන ලදී. මේ උත්සවයේ දී මාල දිවයිනේ සුල්තන්තුමා විසින් එවන ලද ශුභාශංසන පත්‍රයක් ඒ රජ පවුලේ කුමාරෙක් විසින් කියවා වේල්ස්හි කුමාරොත්තමයාණන් ට පිළිගන්වනු ලැබී ය.

Non-Commercial Distribution

පසු දින එනම් මාර්තු මස 22 වෙනි දින පෙරවරු 11 ට ලාංකිකයන් ගෙන් යුත් ලංකා පාබල හමුදාවේ භටයන්ට යුධ භටයන්ට හමුදාවේ විශේෂ සිරිත් විරිත් අනුව කුමාරයාණන් විසින් රාජකීය ධජයක් පරිත්‍යාග කරන ලදී . එම අවස්ථාවේ දී සිංහලයෙක් වූ ටී. ජී. ජයවර්ධන මහතා ලැප්ටිනන්ට් කර්නල් කෙනෙකුගේ ආයිත්තමින් සැරසී යථොක්ත හමුදාවේ සේනාධිපතිව පෙණී සිටීම ද, කුමාර තෙමේත් එම හමුදාවේම කර්නල් කෙනෙකුගේ විලාසයෙන් සැරසී සිට චිත්තා කර්ෂණීය ව්‍යක්ත කථාවක් කරනු ලැබීම ද පැරණි හෙළිදිව් දින ගණනාගේ යුද්ධකාමී වීර සූර භාවය හා ජාතින් දින ස්මරණය පිණිස වෙහෙසින් හේතු විය. තවද මෙදින අපරාග සමයේ දී ආරක්ෂක භටයන් ගෙන් පිරිවරනු නොලැබ අප්‍රසිද්ධ වේශයෙන් කොළඹ හැව්ලොක් රේස් කෝර්ස් නම් අශ්ව ධාවන පිට්ටනියට පැමිණ පෝලෝ නමැති අශ්වා රෝහකය පන්දු ක්‍රීඩාවෙහි බොහෝ වේලායෙදී සිටියේ ය. කුමාරයා ලංකාවට සම්ප්‍රාප්ත වූ දින රාත්‍රියෙහි කොළඹ ගෝල්පේස් පිට්ටෙනියේ අලංකාර ගිනි කෙළි ප්‍රදර්ශනයක් ද රාජ මන්දිරයේ බාල් නම් නෘත්‍යුත් ස්වයක් ද පවත්වන ලද්දේ ය.

## කුමාරයාණන්ගේ කඳුකර ගමන.

මාර්තු මස 23 වෙනි දින උදය නවයට පමණ විශේෂ ලෙස පිළියෙල කරන ලද රාජකීය දුම්රියකින් කුමාරයාණෝ ලංකාවේ කඳුකර අගනුවර වූ පැරණි සිංහල නරපතීන් කලැ සෙංකඩගල පුර නමින් ප්‍රකට මහනුවරට පිටත්ව ගියේ ය. කොළඹ කොටුවේ සිට මහනුවර දක්වා ඇති අලංකාර ලෙස සරසන ලද සියලු දුම්රිය ස්ථාන වල අතුරු සිදුරු නැතිව රැස්වී සිටි දහස් ගණන් මහා ජනයා විසින් දුම්රිය ගමන් කරනා අතර කුමාරයාණන්ට ඔල්වර හඬ දෙන ලදී. මහනුවරට ළඟා වූ විට එහිදී මධ්‍යම පළාතේ දිශාපතිතුමා වූ වෝන් මන්ත්‍රීවරයා සහිත ප්‍රභූ සමූයක් විසින් කුමාරයාන් ආචාර සම්පන්නව පළත් ඉක්බිති මහනුවර නාගරික සභාව විසින් කුමාරයාණන්ට ශුභාශංසන පත්‍රයක් කියවා ඔප්පු කරන ලද්දේ ය. තද නතරව වික්ටෝරියා අනුස්මරණ ශාලාවේ දී තවත් ශුභාශංසන පත්‍රයක් වැවිලි කරු සමිතිය විසින් පිළිගන්වනු ලැබූ පසු කුමාර තෙමේ ද යථොක්ත ශුභාශංසන පත්‍ර දෙකටම ප්‍රස්තාවෝචිත පිළිතුරු දෙවා වදාළේ ය. ඉක්බිති කුමාරයාණන් මහනුවර රාජ මන්දිරයට ළඟා වී ලංකාණ්ඩුකාරතුමා සහ සිය පිරිසත් සමග සවස 4.30 ට අතුරු පස වැළඳූ පසු මන්දිර උද්යෝනයෙහි ප්‍රිය සම්භාෂණ රැස්වීමක් පවත්වන ලදදේ ය. මේ ප්‍රස්තාවයේ දී යුද්ධ සේවයට ගොස් හැරී ඇවිත් සිටින කොළඹ උත්සවයට නොපැමිණි භටන් 300 ක් පමණ ද සංග්‍රාහිත කාන්තාවන් 50 ක් ද කුමාරයාට හඳුන්වා දෙන

Non-Commercial Distribution

ලදී. ප්‍රිය සම්භාෂණයෙන් අනතුරුව කුමාරයාණෝ පුරාණ සිංහල රජවරුන්ගේ මන්ත්‍රණ ශාලාව වූ අලංකාරයෙන් සරසන ලද මඟුල් මඩුවට ඇතුල් වූහ. එහි දී උඩරට රදලවරු විසින් කුමාරයාණන්ට ශුභාශංසන පත්‍රයක් පිළිගන්වන ලද්දේ ය. ඊට කුමාරයාණෝ සුදුසු පිළිතුරු දුන්හ.

මෙදින රාත්‍රි 10 ට පමණ කුමාරයාණෝ ශ්‍රී දන්ත ධාතු මන්දිරයට ප්‍රවිෂ්ට වූ කල දළාදා වහන්සේ එතුමානණ්ට දක්වනු ලැබුවේ ය. ඇතුන් 150 කින් පමණ යුත් ප්‍රිය දර්ශණිය පෙරහැරක් කුමාරයාට ආචාර වශයෙන් මහනුවර වීථි සංචාරණය කෙළේ ය. දළදා මාලිගාවේදී අස්ගිරි මල්වතු යන උභය විහාරාධිවාසි මහා නායක තෙරුන් වහන්සේලා වෙනුවෙන් ශුභාශිර්වාද පත්‍ර දෙකක් කියවා පිළිගන්වන ලදී. කුමාරයා ද ඊට වෙන් වෙන් වශයෙන් යෝග්‍ය පිළිතුරු දෙවා වදාළහ.

පසු දින පැය 24 පූර්වාහ්න සමයේ දී කුමාරයාණෝ පේරාදෙණියේ කුසුමෝද්‍යානයට උපගතව එතුමාන්ගේ ලංකා තරණය සිහිපත්වීම සඳහා ස්වහස්තයෙන්ම උද්‍යාන භූමියේ මුනමල්ගසක් රෝපණය කරන ලද්දේ ය. ඉක්බිති පේරාදෙණීයේ අලුත් දුම්රිය ස්ථානයේදී පිරිස් සහිත වූ කුමර තෙමේ රාජකීය දුම්රියට නැඟී අපරභාග 12.30 ට පමණ කොළඹට ආපසු පැමිණ රජ වාසලට සම්ප්‍රාප්ත වූහ. මෙදින සවස් භාගයේ කුමාරයාණන්ගේ නමින් කොළඹ හැව්ලොක් අශ්ව ධාවන භූමි භාගයේ අසුන් විහිදීමේ තරඟ ක්‍රීඩාවක් පවත් වන ලද්දේ ය. කුමාරයාගේ ත්‍යාගය උදෙසා විහිදුවන ලද අසුන් දහසය දෙනා අතුරෙන් සිංහල මහතුන් දෙපළකට අයිති ටිම්බෝ නමැති අශ්වයාට ත්‍යාග හිමි විය. 25 වෙනි දින උදය 10.30 ට පමණ කුමාරයාණෝ ප්‍රබල සම්පන්න රිනෞන් නමැති යුද්ධ නෞකාවෙන් ජපන් රට බලා නික්මගියෝ ය.

සිංහල මහාවංශය පිළිබඳ
උප ග්‍රන්ථය නිමි.

Non-Commercial Distribution

# රාජ්‍ය පාලනය

1925 දක්වා සර් විලියම් හෙන්රි මැනිං උතුමා ලංකාවේ ආණ්ඩුකාර පදවිය හෙබවී ය.

මෙම වකවානුව තුළ 1922 දී 37 දෙනකු ගෙන් යුත් ව්‍යවස්ථාදායක සභාවක් පත් කළහ. පළමු වනවරට නිලලත් මන්ත්‍රී සංඛ්‍යාව අඩු වී නිල නොලත් මන්ත්‍රී සංඛ්‍යාව වැඩි වූයේ මේ අවධියේ ය. බස්නාහිර පළාතට මන්ත්‍රීවරු තිදෙනෙක් ද එක් පළාතකට එක් අයකු බැගින් පළාත් අටට මන්ත්‍රීවරු අට දෙනෙක් ද තේරී පත් වූහ. එහෙත් නියෝජිත ආණ්ඩු ක්‍රමයක් දක්නට තුබුණා මිස ක්‍රියාත්මක නොවී ය. සිංහලයන් මේ තත්වයෙන් තෘප්තිමක් නොවූ නිසා 1924 දී මන්ත්‍රිවරුන් සංඛ්‍යාව 49 ක් කළහ. මන්ත්‍රීවරු විසිතුන් දෙනෙක් පළාත් ඡන්දයෙන් තේරී පත් වූහ. මෙකළ පැවතියේ සීමිත ඡන්ද බලයකි. මෙකල ඡන්ද බලය හිමි වූයේ

**වසරකට රුපියල් 600 ක ආදායමක් ලැබීම**
**රුපියල් 1600 ක වටිනාකම තිබීම.**
**නාගරික දිස්ත්‍රික් සභා තුළ රු.400 ක බදු මුදලක් ලැබීම.**
**පළාත්බදව රුපියල් 200ක බදු මුදලක් ලැබීම යන සුදුසුකම් තුබුනු අයට පමණි.**

1925 අප්‍රියෙල් මාසයේ දී මැනිං ආණ්ඩුකාර තුමාගේ ධූර කාලය අවසන් විය. උහුගෙන් පසුව සර් හියු ක්ලිපඩ් උතුමා 1925 දෙසැම්බරයේ දී ලංකාන්ඩුකාර ධූරයේ වැඩ භාරගනී.

1927 දී ගම් කාර්ය සභා කාර්ය මණ්ඩලයක් පත් කරමින් ගම්බද පාලන තන්ත්‍රය ක්‍රමවත් කළේත්, ලංකාවේ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයක් සඳහා කොමිසන් සභාවක් පත්කළ යුතු යයි එංගලන්ත ආණ්ඩුවට යෝජනා කර නිර්දේශ කළේත් සර් හියු ක්ලිපර්ඩ් ආණ්ඩුකාර තුමා ය.

ඔහුගේ කාලය වසර දෙකකට සීමා විය. උහුගෙන් පසුව 1927 අගෝස්තු මාසයේ දී සර් හර්බට් ජේම්ස් ස්ටැන්ලි උතුමා ලංකාන්ඩුකාර ධූරයෙහි රාජකාරි භාර ගත්තේ ය.

1927 නොවැම්බර් 12 දින ලංකාවට සුදුසු ආණ්ඩු ක්‍රමයක් යෝජනා කිරීම සඳහා ඩොනමෝර් සාමිවරයාගේ ප්‍රධානත්වයෙන් කොමිෂන් සභාවක් ලංකාවට ආයේ ය. සර් මැතිව් නාදත් වෛද්‍ය ඩ්‍රමන් ෂීල්ස්

Non-Commercial Distribution

සර් ජොෆ්‍රි බට්ලට් කොමිසමේ අනෙක් සාමාජිකයෝ වූහ. 1928 ජනවාරි යේ දී ඔව්හු ආපසු ගියහ.

1927 නොවැම්බර් මාසයේ දී ඉන්දියාවේ ජන නායකයකු වූ මහාත්මා ගාන්ධි තුමා ශ්‍රී ලංකාවට පැමිණ එතුමාගේ කදාර් රෙදි ව්‍යාපාරය පිළිබඳව දේශන කීපයක් පැවැත්වී ය.

වර්තමාන ජනාධිපති ලේකම් කාර්යාලය වන පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල විවෘත කළේ සර් හර්බට් ජේම්ස් ස්ටැන්ලි ආණ්ඩු කාලයේ දී ය.

1931 අප්‍රේල් 11 වන දින සර් ග්‍රීම් තොම්සන් උතුමා ලංකාවේ ආණ්ඩුකාර ධූරයට පත්ව ආයේ ය.

1931 අප්‍රියෙල් 15 වන දින නව රාජ්‍ය මන්ත්‍රණ සභාව පිළිබඳ ආඥාපණත ප්‍රසිද්ධ කළේ ය. 1931 අප්‍රියෙල් 17 වන දින, මෙතෙක් පැවැති ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව විසුරුවා හළ අතර 1931 ජූනි මස 13 වන දින සිට 26 වන දින දක්වා නව රාජ්‍ය මන්ත්‍රණ සභාවට නියෝජිතයන් තෝරා පත් කිරීමේ ඡන්ද විමසීම සිදු කළේ ය. 1931 ජූලි 10 වන දින රාජ්‍ය මන්ත්‍රණ සභාව විවෘත කරන ලදහ.

**1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ**
**සර්වජන ඡන්ද බලය ලැබීම**
**රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීම**
**විධායක කාරක සභා ක්‍රමයක් ඇති කිරීම**
**රජයේ කටයුතු රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු යටතේ තැබීම**
**ආණ්ඩුකාර තුමාගේ බලතල සංශෝධනය කිරීම**

යන කරුණු ඉටු විය. ඩොනමෝර් කොමිසමේ මූලික යෝජනා සියල්ලක්ම ලංකා රාජ්‍ය පාලන ඉතිහාසයේ ඓතිහාසික වටිනාකමකින් යුත් සංසිද්ධීන් ය.

පසු ගිය වකවානුවේ පැවති තත්ත්වයේ අධ්‍යාපන සුදුසුකම් වත්කම් පිළිබඳ සුදුසුකම් ආදිය කිසිවක් නොසලකා, බරපතල අපරාධකාරයන් ද, සිහිවිකල් වූ අයද අත්හැර, අවුරුදු 21 ඉහළ අනෙක් සියලු ස්ත්‍රී පුරුෂයන්ට ඡන්ද බලය ප්‍රදානය කළේ ය. මෙය ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගින් ලත් විශිෂ්ඨ දායාදයකි. බ්‍රිතාන්‍ය යටත් විජිතයන්

Non-Commercial Distribution

ගෙන් පළමුවම සර්ව ජන ඡන්ද බලය ලැබුනේ ලංකාවට ය. ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පවත් වන ලද්දේ මැතිවරණ දෙකක් පමණි. 1931 සහ 1936 දී ය. 1931 දී ඡන්ද දායකයන් ලක්ෂ 15 කට මදක් වැඩි විය. 1936 දී ලක්ෂ 25 කට ආසන්න ඡන්දදායක පිරිසක් සිටියහ. සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමත් සමගම ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙන් සිදු වූ අනෙක් වෙනස නම් මෙතෙක් කල් ජනවාර්ගික පදනම යටතේ තෝරා ගත් නියෝජිතයන් වෙනුවට ප්‍රදේශීය නියෝජන ක්‍රමයක් අනුව මන්ත්‍රීවරුන් තෝරා පත් කිරීමයි.

රාජ්‍ය මන්ත්‍රණ සභාවක් ලංකා වාසීන්ට ලැබුනේ මේ මගිනි. ඒ ඒ ප්‍රදේශ වලින් තේරී පත්වුණු මන්ත්‍රීවරුන් 50 ක ගෙන්ද, ආණ්ඩුකාරතුමන් විසින් පත් කරනු ලබන සුළු ජාතීන් නියෝජිතයන් 08 දෙනෙකුගෙන් ද රාජ්‍ය නිලධාරීන් තිදෙනකුගෙන් ද, 61 දෙනකුගෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාව සැදුම් ලද්දේ ය. නිලධාරීන් තිදෙන මහා ලේකම්, මුදල් ලේකම්, නීති ලේකම් යන තිදෙන වූහ.

1931 රාජාඥාවේ 72 වැනි වගන්තියෙන් දිවයින සාමය-මනා පැවැත්ම හා පාලනය සම්බන්ධයෙන් ව්‍යවස්ථා පැනවීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවට බලය හිමි වූව ද ආණ්ඩුකාර තුමාගේ බලතල මගින් එය සීමා සහිත කළේ ය.

ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් ලංකාවට හඳුන්වා දුන් අනෙක් වැදගත් ප්‍රති සංස්කරණය නම් විධායක කාරක සභා ක්‍රමයයි. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පළමු වන රැස්වීමේ දීම සියළුම මන්ත්‍රීවරුන් රහස් ඡන්දයෙන් සමාන වන සේ විධායක කාරක සභා හතකට බෙදා වෙන් කරනු ලැබී ය. එම විධායක කාරක සභා හත නම්,

ස්වදේශ කටයුතු කෘෂිකර්ම හා ඉඩම්
පළාත් පාලනය
සෞඛ්‍ය
කම්කරු කර්මාන්ත හා වාණිජ්‍යය
අධ්‍යාපනය
තැපැල් හා ප්‍රසිද්ධ වැඩ වේ.

මේ සෑම කාරක සභාවක්ම රැස් වී තම කාරක සභාව සඳහා සභාපතිවරයකු තෝරා ගත්හ. මේ සභාපතිවරු පසු කලෙක ඇමතිවරු වශයෙන් නම් ලදහ. අමාත්‍ය මණ්ඩලයේ අනෙක් සාමාජික වූයේ රාජ්‍ය

Non-Commercial Distribution

නිලධාරීන් තිදෙනා ය. ඔවුන් පත් කරන ලද්දේ ආණ්ඩුකාරයා විසිනි. ඔවුන් අතරින් වඩාත් වැදගත් රාජ්‍ය නිලධාරියා වන මහා ලේකම්වරයා ආමාත්‍ය මණ්ඩලයේ මුලසුන ගත්තේ ය. අමාත්‍ය මණ්ඩලයේ සභාපතිවරයා ඔහු විය.

ඩොනමෝර් ව්‍යවස්ථාව එවකට පැවැති ව්‍යයස්ථාදායක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ විට එයට පක්ෂව ඡන්ද 19 ක් ලැබිණ. විපක්ෂ ඡන්ද 17 ක් ලැබුණි නව ව්‍යවස්ථාව සම්මත වූයේ වැඩි ඡන්ද දෙකකින් පමණි.

සර්වජන ඡන්ද ක්‍රමය ප්‍රදානය කිරීම පිළිබඳව විශාල පිරිසක් විරුද්ධ වූහ. 1931 දී නව ව්‍යවස්ථාව යටතේ මැතිවරණය පැවැත්වී ය. මෙම මැතිවරණය උතුරු කරයේ ලාංකික ද්‍රවිඩ ජනතාව විසින් වර්ජනය කරන ලදී. මේ හෙයින් යාපනය අර්ධ ද්වීපයට අයත් ආසන හතරකට මන්ත්‍රීවරු පත් නොවූහ. 1936 මැතිවරණය ඔව්හු ඉදිරිපත් වූහ. 1931 අමාත්‍ය මණ්ඩලය සම්පූර්ණයෙන්ම සිංහල විය.

ඩොනමෝර් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව පළාත් නවයක් වසයෙන් බෙදී තුබුණු දිවයින පළාත් පහකට ද පංති පහකට බෙදා තිබුණු ලංකා සිවිල් සේවය පංති තුනකට ද සීමා කළේ ය.

1933 සැප්තැම්බර් මාසයේ දී සර් ග්‍රීම් තොම්සන් ආණ්ඩුකාර තුමා ආපසු ගියේ ය.

1933 දෙසැම්බරයේ දී සර් රෙජිනෝල්ඩ් ස්ටබ්ස් උතුමා ලංකාණ්ඩුකාර ධූරයට පත්ව ආයේ ය.

1935 දෙසැම්බර් 07 වන දින පළමු වන රාජ්‍ය මන්ත්‍රණ සභාව විසුරුවා හැරියේ ය.

1936 දී දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා නියෝජිතයන් තෝරා ගැනීම සඳහා මැතිවරණය පැවැත්වී ය.

1935 දෙසැම්බර් 18 වන දින ලංකාවේ පැරණිතම ප්‍රථම දේශපාලන පක්ෂය පිහිටු විය. ලංකාව අධිරාජ්‍යයෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වූ ස්වාධීන සෛවරී ලංකාවක් බවට පත්කිරීමේ පූර්ණ නිදහස් සටන මෙහෙයවීම මෙම පක්ෂයේ පරමාර්ථය විය. එය ලංකා සම සමාජ පක්ෂය නම් විය.

Non-Commercial Distribution

1936 මාර්තු 19 වන දින රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා දෙවැනි මහා මැතිවරණය පැවැත්වී ය. මෙම මැතිවරණයේ දී සිංහලයන් 39 දෙනෙක් ද, ද්‍රවිඩයන් අට දෙනෙක් ද, ඉන්දියානුවන් දෙදෙනෙක් ද, යුරෝපී ජාතිකයෙක් ද, තේරී පත් විය. ඩොනමෝර් සාමිවරයා බලාපොරොත්තු නොවූ පරිදි දේශපාලන පක්ෂයකින් මන්ත්‍රීවරු දෙදෙනෙක් දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්ව ආහ.

ඒ ලංකා සම සමාජ පක්ෂයෙන් ආචාර්ය ඇන් ඇම් පෙරේරා සහ පිලිප් ගුණවර්ධන මහත්වරුන් ය.

මෙම රාජ්‍ය මන්ත්‍රණ සභාව යුද්ධයේ හේතුවෙන් දසවසරක් කටයුතු ගෙන ගියහ.

දෙවැනි රාජ්‍ය මන්ත්‍රන සභා යුගයේ දී පත් වූ කාරකසභා සභාපති වරුන් වූයේ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක ඩී. ඇස් සේනානායක සී. ඩබ්ලිව් ඩබ්ලිව් කන්නන්ගර ජේ. ඇල්. කොතලාවල, ඩබ්ලිව් ඒ. සිල්වා ජී. සී. ඇස් කොරයා ඇස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක යන මහත්වරුන් ය. මේ හත් දෙන ඇමතිවරු වශයෙන් ක්‍රියා කළහ.

1937 ජූලි මස අගදී ස්ටබ්ස් ආණ්ඩුකාරතුමා සියරට බලා ගිය අතර සර් ඇන්ඩෲ කොල්ඩ්කොට් උතුමා ලංකාණ්ඩුකාර ධූරයට පත් ව ආයේ ය.

1937 දී බ්‍රෙස්ගාර්ඩල් සිද්ධිය ඇති විය. මාක් ඇන්තනි ලිස්ටර් බ්‍රෙක්ගාර්ඩ්ල් 1912 සැප්තැම්බර් 10 වනදා ලන්ඩන් නුවරදී ඉපිද, 1936 අප්‍රේල් 4 වනදා ලංකාවට පැමිණ උඩරට වතුකරයේ මඩොල්කැලේ වතුයායේ උප වතු පාලකයකු වශයෙන් සේවය කළේ ය. ඔහු වතු කම්කරුවන්ගේ නිදහස සඳහා ලංකා සම සමාජ පක්ෂය සමග ඒකාබද්ධව ක්‍රියා කෙළේ ය. 1937 අප්‍රේල් 24 වනදා ඔහු ලංකාවෙන් පිට විය යුතු යයි ස්ටබ්ස් ආණ්ඩුකාර තුමා පිටුවහල් කිරීමේ නියෝගය පැනවී ය. 1937 මැයි 14 වනදා මේ පිළිබඳ දීර්ඝ විවාදයක් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දී ඇති විය. බ්‍රෙස් ගාර්ඩල් පිටුවහල් කිරීමේ ආණ්ඩුකාරයාගේ නියෝගයට විරුද්ධව ලංකා සම සමාජ පක්ෂය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කළහ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව වූයේ ආණ්ඩුකාරයාගේ නියෝගය නීත්‍යානුකූල නොවන බවයි. මේ පිළිබඳව රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දී විවාදයේ දී වඩාත් පැහැදිලි වූ කරුණ නම් දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ දී සභාපති වරු (ඇමතිවරු) කටයුතු කළේ තම

Non-Commercial Distribution

කාරක සභාවේ අනුමැතිය නිර්දේශය ලබා ගැනීමෙන් පසුව නොවන බවයි. පොලිස්පති මේ අවස්ථාවේ ප්‍රකාශ කළේ විධායක කාරක සභාවේ අනුමැතිය නැතිව ඇමති වරයා නිලධාරීන්ට නියෝග නිකුත් කළ බවයි.

ස්වාධීන රාජ්‍ය සේවයක් ලංකාවට හඳුන්වා දුන්නේ ඩොනමෝර් කොමසාරිස් වරුන් විසිනි. රාජ්‍ය සේවකයන් පත් කිරීම උසස් කිරීම මාරු කිරීම සේවයෙන් පහ කිරීමේ බලතල ආණ්ඩුකාරයාට පැවරිණ. 1931 පළමුවරට පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිසන් සභාව සමන්විත වූයේ රාජ්‍ය නිලධාරීන් තුන්දෙනා ගෙනි. එහෙත් රාජ්‍ය නිලධාරීන් විසින් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කාරක සභා තීරණයන් ප්‍රතික්ෂේප කළේ කලාතුරකිනි. රාජ්‍ය සේවය ලාංකික කිරීමේ ප්‍රතිපත්තිය සකස් වූයේ මෙම වකවානුවේ ය. 1940 වන විට සිවිල් සේවයෙන් සියයට හැට හතරක් ලාංකික නිලධාරීහු වූහ. සිවිල් සේවය ලාංකික වීමත් සමගම පරිපාලන සේවාවන් තුල සිංහලයන්ගේ නියෝජ්‍යය වැඩි විය.

ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ අඩු පාඩු විග්‍රහ කරමින් ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ පියවර වශයෙන් ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව තමන්ගේ ම අදහස් ඇතුළත් යෝජනා කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට 1937 දී අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත. විධායක කාරක සභා ක්‍රමය විවේචනය කළ ඔව්හු කැබිනට් ක්‍රමයක් පිළිබඳ අදහස ඉදිරිපත් කළහ. ආණ්ඩුකාර තුමාගේ යෝජනාව වූයේ ඩොනමෝර් ව්‍යවස්ථාව අසාර්ථක වී ඇති හෙයින් වෙනම කොමිෂන් සභාවක් පත් කළ යුතු බවයි. මේ සඳහා නිර්දේශ කීපයක් සර් ඇන්ඩෘ කෝල්ඩ්කොට් ආණ්ඩුකාරතුමා ඉදිරිපත් කර ඇත.

1939 දී දෙවන ලෝක මහා සංග්‍රාමය ආරම්භ විය. ජර්මනියේ ආඥාදායක හර් හිට්ලර් පෝලන්තයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීමෙන් දෙවෙන ලෝක යුද්ධය ආරම්භ විය. එක්සත් ජනපද රාජ්‍යය (බ්‍රිතාන්‍යය) ඇමෙරිකා එක්සත් ජනපදය සෝවියට් රුසියාව මිත්‍ර පක්ෂය වූ අතර ජර්මනිය ස්පාඤ්ඤය ජපානය සතුරු පක්ෂය විය. ලංකාව බ්‍රිතාන්‍යයටත් විජිතයක් වූයෙන් ලංකාවද යුද (කඳවුරක්) මධ්‍ය ස්ථානයක් විය.

දෙවෙනි රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නිලකාලය අවසන්ව තුන්වන මැතිවරණය පැවැත්වීමට කාලපරිච්ඡේදය සම්පූර්ණ වූව ද රාජ්‍ය මන්ත්‍රන සභාව විසුරුවා නොහරිණ බවත් මැතිවරණය කල් තබන බවත් 1941 ජූනි 15 වන දින නිකුත් කළ රජයේ නිවේදනයින් ප්‍රකාශ විණ. පළමුව වසර දෙකකට කල්තැබූ මැතිවරණය පසුව යුද්ධය අවසන් වන තෙක්

Non-Commercial Distribution

කල් තැබී ය. යුද්ධ කාර්යය සම්බන්ධයෙන් අධිරාජ්‍ය ආණ්ඩුවට සහාය දීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කළහ. එහෙත් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි සම සමාජ මන්ත්‍රිවරු අධිරාජ්‍ය යුද්ධයට විරුද්ධ වූහ. මෙසේ විරුද්ධ වීම නිසා ලංකා සම සමාජ පක්ෂය තහනම් කළ අතර ආචාර්ය ඇන්. ඇම් පෙරේරා ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා පිලිප් ගුණවර්ධන එඩ්මන් සමරක් කොඩි යන නායකයන් සිරභාරයට ගත්හ. තහනම් කළ පක්ෂයේ අනෙක් සාමාජිකයෝ ඉන්දියාවට පැන ගොස් ඉන්දියාවේ ස්වරාජ්‍ය සටනට සහාය දුන්හ.

1944 දි ශ්‍රිමත් ඇන්ඩෘ කොල්ඩ්කොට් තුමා සිය රට ගියෙන් ශ්‍රීමත් හෙන්රි මන්ක් මේසන් මුවර් තුමා ලංකාණ්ඩුකාර ධුරයට පත්ව ආයේ ය. නිදහස් ලංකවේ ප්‍රථම අග්‍රාන්ඩුකාරයා වුයේ ද එතුමා ය.

යුද්ධය අවසානවීමත් සමග ලංකාවට සුදුසු ආණ්ඩු ක්‍රමයක් යෝජනා කරන ලෙස නියමකර සොල්බරි කොමිෂන් සභාව 1944 දෙසැම්බර් 19 වන දින ලංකාවට එවී ය. සොල්බරි සාමි, ශ්‍රිමත් ජේ. ඇප් රීස් හා ඇප් ජේ. බරෝස් මහත්වරු මෙම කොමිෂන් සභවට ඇතුළත් වූහ. 1945 අප්‍රියෙල් 7 වන දින දක්වා ලංකාවෙහි රැඳුනු කොමිෂන් සභාව විවිධ සංවිධානයන්ගෙන් ද ජනයාගෙන් ද සාක්ෂි විභාග කළ හ. 1945 ජූලි 11 වන දින කොමිෂන් සභා වාර්තාව භාර දුන්හ. අභ්‍යන්තර කටයුතු සම්බන්ධ වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ඔවුන්ගේ යෝජනාව විය. එහෙත් ඩොමිනියන් තත්වය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම වැදගත් සිද්ධියකි. මේ පිළිබඳව බ්‍රිතාන්‍ය ආණ්ඩුව කියා සිටියේ යථා කාළයේ දී ලංකාවට ඩොමිනියන් තත්වය ලබා දෙන ලබයි.

සොල්බරි ව්‍යවස්ථා යෝජනා ඇතුළත් ධවල පත්‍රිකාව 1945 නොවැම්බර් මාසයේ දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාකච්ඡා විය. ඡන්ද 51 ක් පක්ෂව ද ඡන්ද තුනක් විරුද්ධව ද ලැබීමෙන් සම්මත විය. සෝල්බරි යෝජනා පදනම් කරන තවත් නව ව්‍යයස්ථාව 1946 මැයි 15 වන දින නීතිගත විය.

ඩොමිනියන් තත්ත්වය ලබා ගැනීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව සමග තව දුරටත් සාකච්ඡා කළ යුතුය යන්න අමාත්‍ය මණ්ඩලයේ අදහස විය. ඩී. ඇස් සේනානායක මහතා මේ පිළිබඳව සන්දේශයන් යටත් විජිත භාර ලේකම් තුමාට යැවී ය. බ්‍රිතාන්‍යයේ කැඳවීම අනුව ඩී. ඇස්. සේනානායක මහතා එහි ගිය අතර ඔලිවර් ගුණතිලක මහාතා සාකච්ඡා මෙහෙය විය. ඉන්දියාවට ඩොමිනියන් තත්වය ප්‍රදානය කිරීමටත් බුරුමයට

Non-Commercial Distribution

ස්වරාජ්‍යය දීමටත් බ්‍රිතාන්‍ය ආණ්ඩුව තීරණය කළ අතර ලංකාව එයින් බැහැර කිරීම පහත සඳහන් හේතූන් අනුව සාධාරණ නොවන බව ඩී.ඇස් සේනානායක මහතාගේ මතය විය.

ජපන් ආක්‍රමණය ප්‍රථම වරට සාර්ථක ලෙස ලංකාවේ දී මැඩ පැවැත්වීම අග්නි දිග ආසියාවේ යුද්ධ සංවිධානයට හා නැගෙනහිර ඉන්දීය නාවික හමුදාවට ප්‍රධාන කාර්යාලය ලංකාව විසින් සැපයීම එක්සත් මිත්‍ර පාක්ෂිකයන් විසින් ප්‍රයෝජනයට ගැණුන අමු රබර් වලින් සියයට අනූවක්ම ලංකාව විසින් සැපයීම යුද්ධෝපකරණ නිෂ්පාදනයේ දී අවශ්‍ය මිනිරන් ලංකාව විසින් සැපයීම.

මේ සියල්ලටමත් වඩා මෙරට මාක්ස්වාදී වාමාංශික පක්ෂ පූර්න ස්වරාජ්‍ය සටන් පාඨය පදනම් කර ගෙන උද්ඝෝෂණ අරගල කිරීම තරුණ භික්ෂු පරපුර ඔවුනට සහාය දීම ආදී හේතූන් නිසා ලංකාවට ඩොමිනියන් තත්වය දිය යුතු බව ඔහුගේ තර්ක විය.

ලංකාවට ඩොමීනියන් තත්වය දීමට පෙර විදේශ කටයුතු හා ආරක්ෂක කටයුතු පිළිබඳව ගිවිසුම් දෙක ද, රාජ්‍ය සේවා නිලධාරීන් පිළිබඳව සියළු වගකීම් ලංකාණ්ඩුවට පවරමින් තවත් ගිවිසුමක් ද බ්‍රිතාන්‍ය ආණ්ඩුව ලංකා ආණ්ඩුවත් සමග 1947 නොවැම්බර් 11 වනදා අත්සන් කරන ලදහ. මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ලංකා ස්වාධීන පණත බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. 1947 දෙසැම්බර් 10 වන දින ලංකා ස්වාධීනතා පණත රාජකීය අනුමතිය ලද්දේ ය.

1947 ලංකා ස්වාධීනතා පණතෙහි 4-2 කොටස අනුව 1948 පෙබරවාරි 4 වන දිනට පෙර බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් යටත් විජිත කෙරෙහි සම්මත කරනු ලබන නීති රීති ලංකාව කෙරෙහි බලපානු ලැබූ වද, ඒවා සංශෝධනය කිරීමේ හෝ අහෝසි කිරීමේ බලය ලංකාණ්ඩුවට ලැබිණ. 1947 ලංකා ස්වාධිනතා පණතේ 1 කොටස් අනුව ලංකාව පිළිබඳව නීති රීති පැනවීමේ බලය බ්‍රිතාන්‍ය ආණ්ඩුව සතු වුවද එය කරනු ලබන්නේ ලංකාවේ ඉල්ලීම හා කැමැත්ත පදනම් කර ගෙනය. එම පණතෙහි 1 කොටස අනුව එම නීතිරීති සංශෝධනය කිරීමේ හෝ අහෝසි කිරීමේ බලය ලංකාණ්ඩුව සතු විය. හේතු යුක්තීන් මෙසේ වුව ද ආරක්ෂක හා විදේශ කටයුතු සම්බන්ධ ගිවිසුම් දෙකකින් පූර්ණ ස්වරාජ්‍ය සංකල්පයට හානියක් සිදු වූයේ ය යන්න විද්වත් මතයයි.

Non-Commercial Distribution

අභාවයට යන රාජ්‍ය මන්ත්‍රන සභාවේ විශේෂ සැසි වාරයක් 1947 ජූනි 18 වන දින ආණ්ඩුකාර තුමන් විසින් කැඳවන ලදී. 1947 ජූලි 4 වන දින රාජ්‍ය මන්ත්‍රණ සභාව විසිරුවා හැරියේ ය.

සොල්බරි කොමිසමින් යෝජිත ව්‍යවස්ථාව මූලික වශයෙන් ඇමතිවරුන්ගේ 1944 කෙටුම්පත පදනම් කර ගත්තක් විය. 1946 ලංකා ව්‍යවස්ථා පණතේ 7 වගන්තිය අනුව දිවයිනේ පාර්ලිමේන්තුව සමන්විත වන්නේ මහ රජින උත්තර මන්ත්‍රණ සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යන ආයතන තුන ඒකාබද්ධ වීමෙනි. 1947 ලංකා ස්වාධීනතා පණතින් මහ රැජින නියෝජනය කළ ආණ්ඩුකාරයාගේ තත්ත්වය වෙනස් වී ඒ වෙනුවට අග්‍රාණ්ඩුකාරධූරය ඇති කරන ලදී.

සොල්බරි කොමිසන් සභාව ඉදිරිපත් කළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව උත්තර මන්ත්‍රී මණ්ඩලය, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යනුවෙන් මන්ත්‍රී මණ්ඩල දෙකක් විය. ප්‍රාථමික මන්ත්‍රී මණ්ඩලය නියෝජිත මන්ත්‍රීවරුන් 101 දෙනෙක් වූහ. එයින් 95 දෙනෙක් ඡන්ද කොට්ඨාශ වලින් මහජන ඡන්දයෙන් තෝරාපත් කර ගත්හ. ඉතිරි 6 දෙනා අග්‍රාන්ඩුකාර තුමන් විසින් පත් කරන ලදී. එසේ පත් කරන්නේ ඡන්දයෙන් නියෝජනය නොවුණු සුළු ජාතීන් වෙනුවෙනි. ප්‍රාථමික මන්ත්‍රී මණ්ඩලයේ නිල කාලය වසර 5 කි.

උත්තර මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරු 30 දෙනෙක් වූහ. එයින් 15 දෙනෙක් ප්‍රාථමික මණ්ඩලයේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තේරී පත් කරනු ලබති. ඉතිරි 15 දෙනා අග්‍රාන්ඩුකාර තුමා විසින් පත් කරන ලදී. උත්තර මන්ත්‍රී මණ්ඩලයේ නිලකාලය වසර නවයකි. එහෙත් උත්තර මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකක්, දහදෙනෙක් සෑම අවුරුදු තුනකටම වරක් අස්විය යුතුය.

මුළු දිවයින පළාත් අනුව ආසන 95 ට බෙදා වෙන් කරන ලදී.

| | |
|---|---|
| බස්නාහිර පළාත | 20 |
| මධ්‍යම පළාත | 15 |
| දකුණු පළාත | 12 |
| උතුරු පළාත | 9 |
| නැගෙනහිර පළාත | 7 |
| උතුරු මැද පළාත | 5 |

Non-Commercial Distribution

| | | |
|---|---|---|
| වයඹ පළාත | 10 | |
| සබරගමු පළාත | 10 | |
| ඌව පළාත | 7 | යනුවෙනි. |

ජනගහනයෙන් සෑම 70000 කටම එක මන්ත්‍රීවරයෙක් නියෝජනය වන පරිද්දෙන් ද, ප්‍රදේශය වශයෙන් විශාල ජනගහනය අඩු පළාත්වල ඡන්ද දායකයන් 10,000 කට එක් මන්ත්‍රීවරයකු ලැබෙන ආකාරයෙන් ද මැතිවරණ ආසන බෙදා තිබිණ.

සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ පිහිටු වන පළමුවන නියෝජිත මන්ත්‍රී මන්ඩලයට මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ පළමුවන ඡන්ද විමසීම 1947 ජූලි 23 වන දින සිට 47 අගෝස්තු 20 දක්වා කාලය තුල දින 9 ක් තුළ දී පැවැත්විය.

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය දේශපාලන පක්ෂ ක්‍රමය මත පදනම්ව පැවති නිසාත්, වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් ඇති පක්ෂයේ නායකයා අගමැති වන නිසාත් දේශපාලන පක්ෂ පිහිටුවීම කෙරෙහි දේශපාලනඥයෝ උනන්දු වූහ. ලංකා ජාතික සංගමය සිංහල මහා සභාව (ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බන්ඩාරනායක) ලංකා මුස්ලිම් සභාව (දොස්තර ඇම්. සී. ඇම්. කලීල්) යන සංවිධාන තුන ඒකාබද්ධ වී 1946 සැප්තැම්බර් මාසයේ දී ඩී. ඇස්. සේනානායක මහතාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය පිහිටුවා ගත්හ.

මැතිවරණයෙන් පසුව කිසිම පක්ෂයකට තනිව ආණ්ඩුවක් පිහිටුවීමට නුපුළුවන් තත්ත්වයක් උදාවිය. පක්ෂ අනුව ලබා ගත් ආසන සංඛ්‍යාව මෙසේ ය.

| | |
|---|---|
| එක්සත් ජාතික පක්ෂය ආසන | 42 |
| ස්වාධීන මන්ත්‍රීවරු | 21 |
| ලංකා සම සමාජ පක්ෂය | 10 |
| බෝල්ෂෙවික් ලෙනින්ස්ට් පක්ෂය | 5 |
| කොමියුනිස්ට් පක්ෂය | 3 |
| ද්‍රවිඩ සංගමය | 7 |
| ලංකා ඉන්දියානු සංගමය | 6 |
| කම්කරු පක්ෂය | 1 |
| | = 95 |

Non-Commercial Distribution

මෙම දේශපාලන බෙදීම මධ්‍යයේ ඩී. ඇස්. සේනානායක මහතා ස්වාධීන මන්ත්‍රීවරු පිරිසක්ද, ද්‍රවිඩ සංගමය ද, කම්කරු පක්ෂය ද ඒකාබද්ධ කර ගනිමින් ආණ්ඩුව පිහිටුවී ය. ඒ අනුව ලංකාවේ පළමු වන (පාර්ලිමේන්තුව) ආණ්ඩුවද හවුල් ආණ්ඩුවක් විය.

ලංකාවේ වාමාංශික පක්ෂ මේ වන විට බලගතු වෘත්තිය සමිති ව්‍යාපාරයක් ආරම්භ කර තිබුණි. 1946 අග භාගයේ දීත් 1947 මුල් භාගයේ දීත් මහා වැඩ වර්ජන දෙකක් සාර්ථක ලෙස නිමා කර සිටියහ. එම කම්කරු පන්තියේ සහාය ද තරුණ භික්ෂු පරපුරේ සහාය ද වාමාංශයට ලැබිණ. නායකමාහිමිවරුන්ගේ සහාය එ.ජා. පක්ෂයට ලැබිණ.

නිදහස පිළිබඳ 1948 ආඥාපණතින් පසුව ලංකා ඩොමීනියන් රාජ්‍ය ගේ පළමුවන පාර්ලිමේන්තුව 1948 පෙබරවාරි 4 වනදා කොළඹ ටොරිං ටන් පෙදෙසේ නිදහස් චතුරශ්‍රයේ දී ග්ලෝස්ටර් ආදිපාදයාණන් විසින් උත්සවාකාරයෙන් සිදු කරන ලදී. පාර්ලිමේන්තුවේ ප්‍රථම සැසිවාරය උත්සවාකාරයෙන් විධිමත් ලෙස විවෘත කෙරුනේ 1948 පෙබරවාරි 10 වැනිදා ය.

ආශ්‍රිත පොත පත 01 මහාවංශය නූතන යුගය. නන්දදේව විජේසේකර

ලංකාවේ අපරදිග පාලන යුගය ලයනල් ලොකුලියන
ලංකා ඉතිහාසය ඇස්. ජී. පෙරේරා පියතුමා
බටහිර ජාතීන් යටතේ ලංකාව හොරස් පෙරේරා
බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාව ජී.සී. මැන් දිස්

Non-Commercial Distribution

# බුදු සමය

1932.12.27 වන දින රුවන්වැලි චෛත්‍ය වර්ධන සමිතිය මගින් ප්‍රතිසංස්කරණය කරන ලද රුවන්වැලි මහා ථූපයේ ධාතු නිධන් කිරීමේ උත්සවය පැවැත්වී ය.

දඹදිව බුද්ධගයාව හින්දු පාලනයෙන් නිදහස් කර බෞද්ධ පාලනයට පවරා ගැනීම සඳහා ඉන්දියාවේ ඇසැම්බිලි මන්ත්‍රී මණ්ඩලයට බුරුම මන්ත්‍රීන් පිරිසක් විසින් බුද්ධගයා පණත නමින් පණතක් 1935 දී ඉදිරිපත් කළේ ය. මෙම පණතට ඉන්දියා ආණ්ඩුවේ අනුමැතිය ලබා ගැනීමට ලංකාණ්ඩුව විසින් ද ක්‍රියා කළ යුතුයයි යන යෝජනාවක් 1935 මාර්තු 28 වන දින මාතර මන්ත්‍රී ජී. කේ. ඩබ්ලිව් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන ලදුව ඒකච්ඡන්දයෙන් සම්මත විය. මේ සම්බන්ධව ඉන්දියාවේ වගකිව යුත්තන් සමග සාකච්ඡා කිරීමට ලංකා නියෝජිත පිරිසක් 1937 දෙසැම්බර් 11 වන දින ඉන්දියාවට ගියහ. පූජ්‍ය නාරද හිමි. දොස්තර කැසියස් ඒ පෙරේරා (පසුව කස්සප හිමි) ඒ. රත්නායක නීල් හේවා විතාරණ හැරිස් රත්වත්තේ මෙම නියෝජිත පිරිසට අයත් වූහ.

1865 අංක 19 දරණ පොලිස් ව්‍යවස්ථාවේ 90 වන වගන්තිය මගින් නියම කර ඇති පෙරහැරවල් හා ආගමික උත්සව සඳහා බෙරවාදනයට අවසර ලබා ගත යුතුයයි යන නියමය අවලංගු කරන ලෙස ඉල්ලා 25000 කගේ අත්සන් වලින් යුත් පෙත්සමක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට මේ යුගයේ දී ඉදිරිපත් කළේ ය.

1935 වර්ෂයේ දී විද්‍යාලංකාර පිරිවෙන මගින් ත්‍රිපිටක පරීක්ෂා විභාගය ද 1936 පටන් විද්‍යෝදය පිරිවෙන මගින් ත්‍රිපිටක ධර්ම පරීක්ෂණය නම් විභාගය ද පවත්වා සහතික පත්‍ර ප්‍රදානයට කටයුතු කරන ලදී.

විද්‍යෝදය පිරිවෙණාධිපති පණ්ඩිත ශිරෝමණී කහවේ ශ්‍රී රතනසාර නායක මාහිමියන් වහන්සේ 1935 වර්ෂයේ දී අපවත් වූහ.

1935 අගෝස්තු 21 වනදා මලබාර් දේශයට ධර්ම ප්‍රචාරය සඳහා ධර්මදූත පිරිසක් වැඩම කරවා ඇත. ජය ශ්‍රී මහා බෝධියේ අංකුරයක් ද මලබාර් රටට වැඩම වන ලදී.

ආනන්ද බෝධියේ ශාඛාංකුරයක් එච්. ශ්‍රී. නිශ්ශංක මහතා විසින් ලබා ගෙන සල්ගල ආරණ්‍ය සේනාසනයේ රෝපණය කරන ලද්දේ ද 1935 දී ය.

Non-Commercial Distribution

1935 වර්ෂයේ අප්‍රේල් 19 වන දින අනුරාධපුරයේ මහා ථූපයේ ස්වර්ණාමලී චෛත්‍යයේ දේවතා කොටුවේ ධාතු නිධානෝත්සවය පවත්වන ලදී. චෛත්‍ය වර්ධන සමිතිය මගින් පුරා සතියක පරිත්‍රාණ ධර්ම දේශනා පින්කම් ද පවත්වන ලදහ.

1936 වර්ෂයේ දී චීන ජාතික මහායානික භික්ෂූන් වහන්සේලා පස් නමක් ලංකාවට පැමිණ ලංකාවේ දී ථේරවාදය පිළිගෙන පැවිද්ද ලබා ගත්හ. මෙම ගමනේ දී අවුරුදු දහසක් පැරණි චීන බසින් ලියවුණ බෞද්ධ ත්‍රිපිටකයේ පිටපත් ලංකාවට පරිත්‍යාග කළේ ය. උන්වහන්සේලා ආපසු යන ගමනේ දී ජය ශ්‍රී මහා බෝධියේ අංකුරයක් ලබා ගෙන ගොස් ෂැංහයි නුවරදී රෝපණය කර ඇත. මෙම වර්ෂයේම ජර්මන් ජාතිකයෙක් ද මෙරටට පැමිණ ථේරවාදය පිළිගෙන පැවිද්ද ලබා ගත්හ.

වර්ෂ 1936 පැවැත්වුණු බෞද්ධ සමිති සම්මේලනයේ 18 වන සම්මේලනයේ දී භික්ෂූන් වහන්සේලා වැටුප් පිට ආණ්ඩුවේ සේවයට පත් නොකරගත යුතු යයි යෝජනාවක් සම්මත කළේ ය.

ප්‍රථමවරට භික්ෂූන් වහන්සේ නමක් කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධියක් ලබා ගත්තේ 1937 වර්ෂයේ දී ය.

1938 වර්ෂය සඳහා මස්කඩ බඳුදීමේ දී වෙසක් පොහොය දින යේ මස් කඩ වසා තැබිය යුතුය යන නියෝගයක් පැනවීමට ගාලු නගර සභාව 1937 දී සම්මත කළේ ය.

ශ්‍රී පාදස්ථානයට ලැබෙන පුණ්‍යාධාර මුදල් වැය කොට ත්‍රිපිටකය සිංහලයට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ යෝජනාවක් 1937 දී බෞද්ධ විහාර දේවාල ගම් පිළිබඳ උපදේශක සභාව යෝජනා කළේ ය. නායක ස්වාමින් වහන්සේලා හය නමක් මීට අනුමතිය දුන්හ.

ලාංකිය භික්ෂු සංඝයාගේ පාලනය සඳහා විනය නීති වලට විරුද්ධ නොවන පරිදි විධිමත් පාලන ක්‍රමයක් සකස් කොට එය ආණ්ඩුව මගින් ස්ථිර කරවා ගත යුතුය යන යෝජනාවක් 1937 දී කැළණි රජ මහා විහාරයේ දී පවත්වන ලද භික්ෂු සම්මේලනයේ තුන්වන සංවත්සර රැස්වීමේ දී තීරණය විය. තුන් නිකායේ භික්ෂූන් වහන්සේලා මෙයට සහභාගී වුවත් තුන් නිකායට එකම පාලන තන්ත්‍රයක් යටතට ගැනීම අසීරු විය. එහෙත් මෙම සම්මේලනයේ වෙනත් තීරණ අනුව ඌව භික්ෂු සම්මේලනය මගින් 1941 වනවිට දිනපතා පාසැල් හයක් ද, දහම්

Non-Commercial Distribution

පාසැල් තිස් දෙකක් ද, පේශ කර්ම පාඨශාලා දෙකක් ද, ග්‍රාමාරක්ෂක සමිති දහ හතරක් ද පිහිටුවන ලදහ.

පොළොන්නරුවේ පබළු වෙහෙර රන්කොත් වෙහෙර කිරි වෙහෙර හා ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමා ලංකාවේ පුරාවිද්‍යා අධිකාරිය මගින් ප්‍රතිසංස්කරණය කර අවසන් කළේ 1938 අවුරුද්දේ ය.

ක්‍රිස්තියානි ප්‍රන්සිස්කන් නිකායේ පූජකවරයකුව සිටි වැන් ඇම් සෙයිස්ට් නම් ඕලන්ද ජාතික පියතුමා 1938 දී ලංකාවට පැමිණ විද්‍යෝදය පිරිවෙන් දී බුද්ධ ශාසනයෙහි පැවිද්ද ලබාගත්හ.

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ ප්‍රතිසංස්කරණ කටයුතු 1939 දී ආරම්භ කර 1942 දී අවසන් කළේ ය.

වේතන සහිත රජයේ සේවයට භික්ෂූන් පත් කිරීම වහාම නැවැත්විය යුතුය යන යෝජනාවක් දකුණු කොළඹ මන්ත්‍රී ඒ. ඊ. ගුණසිංහ මහතා විසින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට 1939 දී යෝජනා කළේ ය. එවකට සිටි අස්ගිරි මල්වතු මහා නායක හිමිවරු ද භික්ෂූන් වහන්සේලා ද මෙම යෝජනාවට දැඩි විරෝධය පළ කළහ.

වෙසෙක් පෝය දිනය කොළඹ නගරයෙහි සත්ත්ව ඝාතනය නැවැත්වීමට වර්ෂ 1939 දී කොළඹ නගර සභාව තීරණය කළහ.

1939 නොවැම්බර් 23 වන දින අනුරාධපුර මහා ථූපයේ (රුවන් වැලි මහ සෑයේ) ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කොට කොත් පැළඳවීම උත්සවකාරයෙන් සිදු කරන ලදහ. මහථූපයේ කොත මත පැළඳවීම සඳහා බුරුම රට බෞද්ධ ජනතාව විසින් පරිත්‍යාග කළ අඟල් 32 ක් උසැති පළිඟුමය චූඩා මාණික්‍ය 1940 මාර්තු 04 වන දින ලංකාවට වැඩම වන ලදී, කොළඹ මකුටාරාමයේ (බුරුම පන්සලේ ) චූඩා මාණික්‍යය තැන්පත් කර සති කීපයක් මහජන ප්‍රදර්ශනයට අවස්ථාව සලසා දුන්හ.

චූඩා මාණික්‍යය සමග භික්ෂූන් සිව් නමක් ද, මහා ථූපයේ කොත් කැරැල්ලේ රන් ආලේප කිරීම සඳහා බුරුම ජාතික ශිල්පීන් පිරිසක් ද ලංකාවට පැමිණියහ. 1940 ජූනි 17 වන දින චූඩා මාණික්‍ය රත්නය පළඳවන ලද මහාථූපය විවෘත කරන ලද්දේ 1940 ජූනි 19 දිනය.

Non-Commercial Distribution

චීනයේ බෞද්ධනායකයකු වූ තායිෂු ස්ථවිරයන් වහන්සේ තවත් භික්ෂූන් සත් නමක් සමග සංචාරයක් සඳහා 1940 දී ලංකාවට සැපත් වූහ.

ඉන්දියාවේ හිල්සා ස්තූපය කැනීමේ දී ලැබී එංගලන්තයට වැඩම වූ සර්වඥ ධාතූන් වහන්සේලා කීප නමක් ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමාගේ මැදිහත් වීමෙන් ලංකාවට වැඩමවා විද්‍යාලංකාර පිරිවනේ තැන්පත් කළහ.

1940 ඔක්තෝම්බර් 25 වන දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් මධ්‍යම කඳුකරයේ බටහිර ප්‍රදේශය ශ්‍රී පාද අභය භූමිය ලෙස නිවේදනය කරන ලදී.

විද්‍යාලංකාර පරිවෙනාධිපති ලුණුපොකුණේ ශ්‍රී ධර්ම නන්ද නායක හිමියන්ට සහ විද්‍යෝදය පිරිවෙනාධිපති බද්දේගම ශ්‍රී පිරත්න ස්වාමීන්ද්‍රයන් වහන්සේට 1942 ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවයේ දී සාහිත්‍ය චක්‍රවර්ති යන ගෞරව උපාධිය පිරිනමන ලදහ.

ක්‍රිස්තු වර්ෂ 1942 දී කොළඹ ලංකා විශ්ව විද්‍යාලය මගින් විද්‍යා විශාරද නමින් උපාධි පාඨ මාලාවක් ඇති කළහ. මෙම පාඨමාලාව හැදෑරූ භික්ෂූන් වහන්සේලා 26 නමක් අතුරෙන් පස්නමක් ශ්‍රීපාද ස්ථානයේ අරමුදලින් ශිෂ්‍යත්ව පහක් පිරිනැමූහ.

ප්‍රථම වරට භික්ෂූන් වහන්සේ නමක් මන්ත්‍රී ධූර පේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වූයේ 1943 වර්ෂයේ දී ය. ඒ කොළඹ නගර සභාවේ මන්ත්‍රී ධූරයක් සඳහා ය.

රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ දී බෞද්ධාගමික කටයුතු පිළිබඳව යම් කාර්යයක් කළේ ස්වදේශ කටයුතු භාර කාරක සභාව යි. මේ කාරක සභාවේ සභාපති වූයේ ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයකු මෙන්ම බෞද්ධයකු ද වූ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමා ය. රාජ්‍ය ලේඛනයක භික්ෂූන් වහන්සේ නමකගේ නමක් යොදන විට නමට අගින් ස්ථවිර යනුවෙන් ද, නායක භික්ෂුවක් ගැන යොදන විට නායක ස්ථවිර කියා ද යොදන ලෙස නියම කරන ලද්දේ මෙම ස්වදේශ කටයුතු භාර කාරක සභාවයි. මෙතෙක් කලක් භික්ෂුවකගේ නම යොදන විට රාජ්‍ය ලේඛන වලද යොදා ඇත්තේ උන්නාන්සේ යන පදයයි.

Non-Commercial Distribution

1940 දශකය බෞද්ධ පාඨශාලා පිහිටුවීම පිළිබඳ දියුණුවක් දැකිය හැකි ය. පන්නිපිටියේ ධර්මපාල විද්‍යාලය නුගේගොඩ අනුලා විද්‍යාලය මාතර රෝහණ විද්‍යාලය මීගමුවේ හරිශ්චන්ද්‍ර විද්‍යාලය ගම්පහ රත්නාවලී විද්‍යාලය කෑගල්ලේ උසස් ඉංග්‍රීසි විද්‍යාල මේ දශකය තුළ බෞද්ධ සංවිධානය මගින් පිහිටුවන ලද ප්‍රධාන පෙළේ පාඨශාලාවන් ය.

බෞද්ධ අධ්‍යාපනික කටයුතු දියුණු කිරිමට මල්වතු අස්ගිරි මහානායක මාහිමි වරුන් ද ආණ්ඩුකාරතුමන් ද ඒකාබද්ධ රුපියල් දශ ලක්ෂයක අරමුදලක් පිහිටුවීමේ උත්සව සභාවක් 1939 දී පැවත්වී ය.

විදේශීය රටවල ධර්ම ප්‍රචාරය කිරීම සඳහා ලාංකික ගිහි පැවිදි ජනනායකයෝ පරිශ්‍රමයක් ගත් කාලයයි. භික්ෂූන්ට හින්දි බෙංගාලි භාෂා උගැන්වීම ද පිරිවෙන් වල ආරම්භ කළහ. දකුණු බැංගලෝර් නගරයේ බෞද්ධ විහාරයක් තැනීමට ද කටයුතු කළහ. කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාරවිල ධම්ම රත්න ස්වාමීන්ද්‍රවරුන් 25නමක් ද සර් ඩී.බී. ජයතිලක ශ්‍රීමතුන් ප්‍රධාන ගිහි පිරිසක් ද මෙම සද් ව්‍යාපාරයෙහි යෙදුණි.

ලංකාවේ බුදු සමය නිසි තැනලා ගැනීමට නැත්නම් පෙර සිංහල රජවරුන් දවස බුද්ධාගම තිබුණු තත්වය ලබා ගැනීමට භික්ෂූන් වහන්සේලා ද විවිධ බෞද්ධ සමාගම් ද විවිධ ව්‍යාපාර ගෙන ගියහ. ලංකාවට නිදහස ලැබෙන විට බුද්ධාගම ද නිසි තැන ලැබෙනු ඇතැයි භික්ෂූන් වහන්සේලා ද බෞද්ධාගමික සංවිධාන ද මහත් සේ බලාපොරොත්තු වූහ. විදේශීය පාලනත්‍රය මුළුල්ලේම ක්‍රිස්තියානි ආගම විශේෂ වරප්‍රසාද ලත්හ. රාජ්‍යය බුදු දහම සම්බන්ධයෙන් ඈත් වී තිබිණි. දිවයිනට නිදහස ලැබීමේ දෝංකාරය දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසුව ඇති විය. නිදහස ලැබීමේ මූලික අඩිතාලම වූයේ 1946 ලංකා රාජ්‍ය සභා ආඥා පණත යි. මහත් බලාපොරොත්තු තබා තිබූ බෞද්ධයන්ගේ බලාපොරොත්තු බිඳ වැටුණි. ලංකා රාජ්‍ය සභා ආඥා පණතේ 29 (2) වගන්තියේ ඇතුළත් ආගම් සහ ආගමික ආයතන පිළිබඳ වගන්තිය මේ තත්වය උදා කළේ ය. 29 වන වගන්තියේ මෙසේ සඳහන් විය. 29(1) මේ ආඥා පණතේ බලතල වලට යටත්ව දිවයිනේ සාමය-ශාන්තිය හා මනාපාලනය සඳහා නීති පැනවීමේ බලය පාර්ලිමේන්තුවට පැවරේ.

(2) කිසිම ආගමක් රිසි සේ ඇදහීම නිදහසට බාධා කිරීම හෝ අවහිර කිරීම හෝ කිසි ජාතියක හෝ ආගමික ජනයාට විඳින්නට සිදු නොවන අවහිරකම් වලට හෝ බාධා වලට අන් කිසිම ජාතියක හෝ ආගමක ජනයාට විඳින්නට සැලැස්වීම.

Non-Commercial Distribution

අනෙක් ජාතිවල හෝ ආගම් වල ජනයාට නුදුන් වරප්‍රසාදයක් හෝ ලාභයක් කිසිදු ජාතියක හෝ ආගමක ජනයාට දීම.

ඒ ආගම පාලනය කරන අධිකාරී බලයේ කැමැත්ත නොගෙන කිසිදු ආගමික ආයතනයක නීති සංස්ථාව වෙනස් කිරීම.

ඉදින් ආගමික ආයතනයක් නීති ගත කළ ආයතනයක් වශයෙන් තිබේ නම් එබඳු වෙනස්කම් පාලන අධිකාරීන්ගේ ඉල්ලීමක් නැතිව කළ නොහැකි බව, (ලංකා රාජ්‍ය සභා ආඥා පණත)

මෙම වගන්ති වලින් ඉටු වූයේ ක්‍රිස්තියානි ආගමට එතෙක් ලබා තිබූ බලතල වරප්‍රසාද එසේම රැක ගැනීමට ඉඩ තිබීමයි. අනෙක් ආගම් වලට කිසිදු සහනයක් වරප්‍රසාදයක් ලබා ගත නොහැකි පරිදි රාජ්‍ය පාලන ක්ෂේත්‍රයෙන් බැහැර වීම යි. බුදු දහම දිවයිනේ බහුතරයේ ආගම වූවත් එය රාජ්‍ය ප්‍රමුඛත්වයට පත්විය නොහැකි පරිද්දෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන්ම නීතිගත කොට තිබිණ.

එය වූ කලි බහුතර බෞද්ධ ජනයාගේ බලාපොරොත්තු කඩවීමක් විය.

බුදු සමයට රාජ්‍ය ප්‍රමුඛත්වය නොලැබෙන පරිද්දෙනුත්, ක්‍රිස්තියානි ආගමේ නීති ගත තත්ත්වය තව දුරටත් තහවුරු වන පරිද්දෙනුත් විශේෂ බල පෑමක් සේ මෙසේ සිදු වූයේ ලංකා කතෝලික සභාවේ බලපෑමෙන් යයි පිළිගැනී ඇත.

බුදු සමයේ මෙන්ම බෞද්ධ ජනයාගේ තත්ත්වය බෙහෙවින් පරිහානියට පත් කළ මෙම ලංකා රාජ්‍ය සභා ආඥා පණතට එවකට සිටි මැති ඇමතිවරුන් පක්ෂ වූ අතර මෙරට පැවැති වාමාංශික ව්‍යාපාරය විරුද්ධ විය.

අධ්‍යාපන අමාත්‍ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මහතා නිදහස් අධ්‍යාපන පණත රාජ්‍ය මන්ත්‍රන සභාවට ඉදිරිපත් කළේ මෙම වකවාවනුවේ ය. එම පණතට එවකට සිටී ප්‍රභූ මැති ඇමතිවරු විරුද්ධ වූ අතර වාමාංශිකයෝ නිදහස් අධ්‍යාපන පණතට පක්ෂ වූහ.

මෙම කාලය තුළ උද්ගත වූ මෙවැනි හේතූන් කීපයක් නිසා ස්වකීය අරමුණු ඉටු කර ගැනීමේ පාලක පක්ෂයට වඩා සම සමාජ

Non-Commercial Distribution

කොමියුනිට් වාමාංශික පක්ෂ වලට පොදු ජනයාගේ ද භික්ෂූන් වහන්සේලාගේ ද නැඹුරුවක් ඇති වීම විශේෂ සිද්ධියක් විය.

දේශාලන ක්ෂේත්‍රයෙහි භික්ෂුන්ගේ කාර්ය භාරය කුමක් විය යුතු ද යන්න පිළිබඳව ද මහත් විවාදාත්මක ආන්දෝලනයක් රට පුරා උද්ගත විය. මේ විවාද මධ්‍යයේ විද්‍යාලංකර ප්‍රකාශනය 1946 පෙබරවාරි 13 වන දින නිකුත් විය. එම ප්‍රකාශනයෙන් කියවුනේ දේශපාලනයට සම්බන්ධ වූව ද මහජන සුභ සාධනය සමාජ සේවය සඳහා යෙදීම ඉදිරිපත් වීම භික්ෂුන්ගේ යුතුකම බවයි. භික්ෂු ජීවිතයට කැලැල් නොවන පරිදි අපේ රට වැසියාගේ යහපතට හේතු වන යම් වැඩ පිළිවෙළක් වේ නම් එහි තම දේශපාලනය හෝ කුමක් වේවා එහි යෙදීම භික්ෂූන් වහන්සේට සුදුසුම යයි විද්‍යාලංකාර ප්‍රකාශනයේ සඳහන් විය. ආචාර්ය වල්පොල රාහුල හාමුදුරුවන්ගේ භික්ෂුව ගේ උරුමය නම් ඓතිහාසික ග්‍රන්ථය නිකුත් වූයේ මේ අරගලයත් සමගය.

තුන් නිකායේම මහානායක හිමිවරු භික්ෂු දේශපාලනයට විරුද්ධව ආඥා නිකුත් කළහ. ගම් සභා නගර සභා රාජ්‍ය මන්ත්‍රණ සභාවට සභික ධූර සඳහා කිසිම භික්ෂු නමක් ඉදිරිපත් නොවිය යුතු යයි ද එසේ ඉදිරිපත් වන භික්ෂුවක් අශ්‍රමණයකු කොට සලකා තම සඟ පරපුරින් එලවා දමන බව මල්වතු මහා නාහිමියන්ගේ (රඹුක්වැල්ලේ ශ්‍රී ධර්මරක්ෂිත සෝභිත) ආඥාවෙහි සඳහන් විය. භික්ෂුන් වහන්සේ දේශපාලනයෙන් ඈත් විය යුතු බව අමරපුර නිකාය වෙනුවෙන් පැලැනේ සිරි වජිරඥාණ, ධර්ම කීර්ති ශ්‍රී උදම්මිට ධම්ම රක්ඛිත නායක මාහිමිවරු ආඥා පැන වූහ.

ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහා නායක කරතොට ශ්‍රී ඉන්ද සාර නායක මාහිමියන්ගේ ආඥාවෙහි සඳහන් වූයේ භික්ෂූන් වහන්සේලාට අවම වසයෙන් ඡන්ද දායකු වසයෙන් ලියා පදිංචි වීමත් තහනම් කිරීමයි.

භික්ෂු දේශපාලනයට විරුද්ධ ව ලංකා බෞද්ධ සම්මේලනය 1946 මාර්තු 31 වන දා කැළණි රජ මහාවිහාරයේ ගිහි පැවිදි මහා සම්මේලනයක් පවත්වා යෝජනා රැසක් සම්මත කළහ. එයින් එක් යෝජනාවක් වූයේ ඡන්දය දායකයන් වශයෙන් ලියා පදිංචිවීමක් වත් භික්ෂුන් විසින් නොකළ යුතු බවයි.

මෙයට පිළිතුරු වශයෙන් 1946 ජූනි 29 වනදා කොළඹදී එක්සත් භික්ෂු බල මණ්ඩලයේ රැස්වීමක් පවත්වා මහා නායක මාහිමි වරුන්ගේ

Non-Commercial Distribution

ද, බෞද්ධ සම්මේලනයේ ද ආඥා සහ යෝජනා විවේචනයට ලක් කළහ. ඩොමිනියන් තත්වයේ ආණ්ඩුවක් ලංකාවට අනවශ්‍ය බවත් පූර්ණ ස්වතන්ත්‍ර භාවයෙන් යුත් ස්වාධීන රාජ්‍යයක් ලංකාවට අවශ්‍ය බවත් , නිදහස් අධ්‍යාපන පණත සම්මත කොට ක්‍රියාත්මක කළ යුතු බවත් එක්සත් භික්ෂු බල මණ්ඩලයේ යෝජනාවන් විය. ඩී. ඇස් සේනානායක ඇස් ඩබ්ලිව් ආර් ඩී බන්ඩාරනායක ආදීහු එක් පිලක් වූ අතර තරුණ භික්ෂූන්ගේ පිලට ආචාර්ය ඒ. පී. ද සොයිසා විජයා නන්ද දහනායක ආදී රජ්‍ය මන්ත්‍රීවරු වූහ.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට පමණක් නොව දේශිය පාලක පංතියට ද එරෙහිව භික්ෂූන් වහන්සේලා හඩක් නැගූ ප්‍රථම අවස්ථාව මෙය විය. ඒ අනුව ලංකා එක්සත් භික්ෂු බල මණ්ඩලයේ බිහිවීම ශාසන ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම අවස්ථාවකි.

1948 පෙබරවාරි 04 වන ද ලංකාවට ඩොමිනයන් තත්වයේ ආණ්ඩු ක්‍රමයක් ලැබිණ. එහි ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූයේ ඩී. ඇස්. සේනානායක මහතා ය. තරුණ භික්ෂූන්ගේ දේශපාලන මත වලට විරුද්ධ වූ නායක ස්වාමීන් වහන්සේලා පිරිසක් බුද්ධ ශාසනයේ දියුණුව උදෙස් රාජ්‍ය ආරක්ෂාව හා අනුග්‍රහය ලබා ගැනීම පිණිස අග්‍රාමාත්‍ය ඩී. ඇස්. සේනානායක මහතා සමග සාකච්ඡාවට කීපයක් පැවැත් වීය. අවසානයේ දී අගමැතිවරයා කීවේ බුදු සසුනට රාජ්‍ය ආරක්ෂාව අනුග්‍රහය අනවශ්‍ය බවත්, එය රැක ගැනිම ගිහි පැවිදි බෞද්ධයන් විසින් පෞද්ගලිකව කළ යුතු බවත් ය.

මෙම සාකච්ඡාවෙන් පසුව සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ සභාපති මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා අගමැතිවරයා වෙත සන්දේශයක් යවමින් බුදු සසුනේ උන්නතිය සඳහා රජය මැදිහත් විය යුතු බව ද, බුදු සමයේ දියුණුව උදෙසා, කුමක් කටයුතුදැයි පරීක්ෂා කිරීම සඳහා බෞද්ධ තොරතුරු සෙවීමේ කොමිෂන් සභාවක් පත් කරන ලෙස ද ඉල්ලා සිටියේ ය. අගමැති වරයාගේ පිළිතුර වූයේ ලංකා රාජසභා ආඥා පණතේ සොල්බරි ව්‍යයස්ථාවේ 29 වන වගන්තිය නිසා එවැන්නක් කළ නොහැකි බවයි. එම අරගලය මෙයින් කලකට පසු බැවේ ය.

දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් වීම නිසා සාමකාමී කාලයක් උදා විය. දෙවැනි ලෝක මහා යුද්ධය නිසා තාවකාලිකව නවතා තිබුණ දළදා පෙරහැර 1946 දී නැවත ආරම්භ විය.

Non-Commercial Distribution

කැළණි රජ මහා විහාරයේ අභිනව ප්‍රතිමා මන්දිරය 1946.12.28 වන දින විවෘත කළේ ය.

1947 මාර්තු 14 වන දා අග්‍ර ශ්‍රාවක ධාතූන් ලංකාවට වැඩමනා දින 27 ක් පුරා ධාතු ප්‍රදර්ශනයක් පැවැත්වීය.

වසර 800කට පසුව ඉන්දියාවේ බුද්ධගයා ශුද්ධ භූමියෙහි වෙසක් උත්සවය පැවැත් වූයේ 1947 වෙසක් පුර පසළොස්වක දිනයේ ය. පූජ්‍ය නාරද ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් එහි වැඩමවූ භික්ෂූන් වහන්සේලා සිංහල චෛත්‍යය විවෘත කිරීමට ද සහභාගී වූහ. මෙ උත්සවයේ දී ශ්‍රී මහා බෝධි අංකුර දෙකක් නේපාලයට වැඩම වූහ.

Non-Commercial Distribution

# අධ්‍යාපනය

1920 අංක 01 දරණ ආඥාපනතින් දිවයිනේ අධ්‍යාපනය පිළිබඳව කටයුතු කිරීමට අධ්‍යාපනය මණ්ඩලයක් පත් කරන ලදී. අධ්‍යාපන ඇමතිවරයෙක් ලංකාවට ලැබුනේ 1931 දී ය. 1931 දී ලැබුණ නව ආණ්ඩු ක්‍රමය යටතේ පිහිට වූ රාජ්‍ය මන්ත්‍රණ සභාව විධායක කමිටු හතකට බෙදුන අතර ඉන් එකක් අධ්‍යාපන විධායක කමිටුව විය. එහි සාමාජිකයක් වූවෝ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර එච්. ඩබ්ලිව් අමරසූරිය ඩබ්ලිව් ටී. බී. කරලියද්ද. ඒ රත්නායක ජී. ආර් සොයිසා ජී.ඊ. මඩවල සහ ඇස්. ඒ වික්‍රම සිංහ යන රාජ්‍ය මන්ත්‍රිවරුන් වෙති. 1931 ජූලි 09 වනදා මෙම අධ්‍යාපන කාරක සභාව රැස් වී එහි සභාපතිවරයා ලෙස සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා තෝරා පත් කර ගත්හ. ඔහු අධ්‍යාපන ඇමතිවරයා විය. පළමුවන වරට මහජන මන්ත්‍රීවරයකු අධ්‍යාපන ඇමතිවරයා විය.

ඇමතිවරයකු යටතේ විධායක කාරක සභාවක් පත් කළද අධ්‍යාපනය ක්‍රියාත්මක වූයේ ද්වන්ද පාලනයක් යටතේ ය. අධ්‍යාපන පරිපාලනය අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම, අධ්‍යාපන කාරක සභාවට අවශ්‍ය විය. මේ වන විට අධ්‍යාපනය රජයේ කාර්යයක් නොව ආගමික සංස්ථා මගින් පවත්වා ගෙන යන කාර්යයක් විය. හැරත් අධ්‍යාපන කාරක මණ්ඩලය රජයට වග කියන ආයතනයක් නොවී ය. මේ හේතු නිසා මෙය අසීරු කරුණක් විය.

1932 ජූනි හත්වන දින රාජය මන්ත්‍රී ජී. ආර් ද සොයිසා මන්ත්‍රීතුමා 1920 අංක 01 දරණ ආඥා පණතින් පිහිට වූ අධ්‍යාපන මණ්ලයේ බලතල අහොසි කරන ලෙස යෝජනා කළේ ය. එහෙත් එය එදින ඉටු නොවිණ. මෙය ඉටු කළ හැකි වූයේ 1939 අංක තිස් එක දරණ පණතින් අධ්‍යාපන මණ්ඩල උපදේශක මණ්ඩලයක් බවට පත් කිරීමෙනි. 1931 සර්වජන ඡන්ද ක්‍රමය මෙරටට ලැබෙන විට මෙරටට අකුරු කියවන්න දන්නා අය හිටියේ සියයට විස්සක් පමණි. මේ නිසා වැඩිහිටි අධ්‍යාපනයක අවශ්‍යතාවය දැනෙන්නට විය.

1931 සිට 1939 දක්වා අධ්‍යාපන අවස්ථා සුලභ කිරීම ගුරුවරුන් සඳහා මාසික වැටුප් ක්‍රමයක් සකස් කිරීම දිසා අධ්‍යාපන කමිටු සංශෝධනය කිරීම ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමයක් ඇරඹීම පාසැල් සෞඛ්‍ය සේවයක් ඇරඹීම වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයක් ආරම්භ කිරීම යන මේවා සිදු විය.

1932 දී කන්නන්ගර ඇමතිවරයා විසින් ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. හන්දේස්ස ග්‍රාමීය අධ්‍යාපන පාසැල පළමුවරට

Non-Commercial Distribution

ආරම්භ කළේය. ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය යන්නෙන් අදහස් කළේ පාසැලේ වැඩ හැකිතාක් දුරට ගම් වැසියන්ගේ රැකියා වලට සම්බන්ධ කිරීම ය. පාසැල් සිසුන් වැඩි වශයෙන් ගොවීන් හෝ ශිල්පීන් බවට පත් කිරීම මෙහි සැලසුම විය. සතියේ දින පහෙන් එක් දිනක් සෞඛ්‍ය වැඩ ද දින දෙකක් පරිසරයට අවබෝධයට ද අනෙත් දින දෙක වෘත්තීය පුහුණුවකට ද ග්‍රාමීය පාසැල් වල ක්‍රමය විය.

ගුරුවරුන් සුලභ කිරීම අධ්‍යාපන අවස්ථා සුළභ කිරීම ක්ෂණිකව කළ නොහැකි බැවින් දෙවරු පාසැල් ක්‍රමය නමින් හැඳින් වූ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළේ ය.

1934.35 අය වැය යෝජනා ක්‍රමයේ සිට ආධාර ලබන පාසැල් වල ගුරුවරුන්ට ද කෙළින්ම රජයෙන් මාසික වැටුප් ගෙවීම ආරම්භ කළේය.

ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය යටතේ වැඩිහිටියන්ට ඉගැන්වීමේ ක්‍රමයක් ආරම්භ කළ අතර වතු පාසැල් සඳහා නව නීති රීති 1939 අංක 31 දරණ ආඥා පණතින් පැනවීය.

1939 වර්ෂය වන විට පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ පාසැල් 262 ක් මගින් පාසැල් ශිෂ්‍යන් 65000 ට පමණ අධ්‍යාපනය ලබා දෙමින් පැවතිණ.

එහෙත් 4000 ක් පමණ බෞද්ධ දරුවන් කිසිම අධ්‍යාපනයක් නොලබමින් සිටියහ. සෑම දරුවකුටම අධ්‍යාපනය ලබා දීම සඳහා රැ පියල් දශලක්ෂයක අර මුදලක් පිහිටුවීම සඳහා මල්වතු අස්ගිරි මහානායක හාමුදුරුවරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සව සභාවක් පැවැත්විණ.

පන්නිපිටියේ ධර්මපාල විද්‍යලය නුගේගොඩ අනුලා විද්‍යාලය මාතර රෝහණ විද්‍යාලය 1941 දී ද, මීගමුවේ හරිශම් චන්ද්‍ර විද්‍යාලය ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලය කෑගල්ලේ උසස් ඉංග්‍රීසි විද්‍යාලය 1942 දී ද පිහිටු වන ලදී. මේ වන විටත් විශ්ව විද්‍යාලය ප්‍රවේශ විභාගයට ශිෂ්‍යන් ඉදිරිපත් කිරීමට අවසර ලැබී තිබුනේ එකම බෞද්ධ විද්‍යාලයකට පමනි.

1941 මැයි 31 වන දින අධ්‍යාපන විශේෂ කාරක සභාව ප්‍රථම වරට රැස්වීය. මෙම විශේෂ කාරක සභාවේ වාර්තාව 1943 නොවැම්බර් මාසයේ දී නිකුත් විය.

Non-Commercial Distribution

රජය මගින් කෙලින්ම පාලනය වන පාසැල් ද, ඒ ඒ ආගමික සමාගම් මගින් පවත්වනු ලබන ආගමික පාසැල් ද, එකට ගමන් කළ යුතු යයි ද එකම විෂය ධාරාවක් අනුව පත්වා ගෙන යා යුතු යයි ද මෙම කොමිෂම තීරණය කළේ ය. මෙම යෝජනා ක්‍රම අනුව ප්‍රාථමික හා පශ්චාත් ප්‍රාථමික පාසැල් යනුවෙන් පාසැල් දෙවර්ගයක් ඇති විය. පස්වැන්නෙන් ඉහළට වයස ශිෂ්‍යයයන්ට තුන් වර්ෂයක් පශ්චාත් ප්‍රථමික පාසැල් වලට යා යුතු විය.

විශ්ව විද්‍යාලය හා වෘත්තීය අධ්‍යාපනයට සුදුසුකම් ඇති කරවන ද්විතීය පාඨශාලා කාර්මික පාඨශාලාවට සුදුසු කරවන ජ්‍යෙෂ්ඨ පාඨ ශාලා කෘෂිකර්ම හා වාණිජ පාඨ ශාලාවනට සුදුසුකම් ඇති කරවන ප්‍රායෝගික පාඨ ශාලා යනුවෙන් පාසැල් තුන් වර්ගයක් ද යෝජනා කළේ ය. නිදහස් අධ්‍යාපනය මෙම කොමිෂන් සභාව මගින් යෝජනා කරන ලද්දකි. 1945 න් පසුව මේ යෝජනා වලින් සමහර එක් ක්‍රියාත්මක කරන ලදී.

අධ්‍යාපනයේ මාධ්‍යයෙන් බෞද්ධ හා හින්දු ළමයින් ක්‍රිස්තියානි කිරීමේ ව්‍යාපාරය ක්‍රිස්තියානි මීසම මගින් පවත්වා ගෙන යාම නිසා විවිධ මතිමතාන්තර ජනතාව තුළ ඇති විය. මේ පිළිබඳ සොයා බැලීමට පත් කරන ලද අධ්‍යාපන කොමිෂමේ වාර්තාව 1943 නිකුත් විය. ආගමික ආයතන මගින් පාලනය වන පාසැල් වල උගෙන ගන්නා අන්‍ය ආගමික ළමයින්ට ඒ ඒ ළමයින්ගේ ආගම් උගැන්විය යුතු යැයි කොමිෂන් වාර්තාවේ නිර්දේශ කර තිබුණි. එහෙත් ක්‍රිස්තියානි මීසමට අයත් පාසැල්වල බෞද්ධාගම හෝ හින්දු ආගම උගැන්වීම ප්‍රතික්ෂේප කළහ.

1947 අංක 26 දරණ අධ්‍යාපන පනතක් නැවත නිකුත් විය. මෙම ආඥා පණතින් රජයේ හෝ ආධාර ලබන පාසලක කිසියම් ආගමකට අයත් ළමයින් 15 ට වැඩි ගණනක් සිටී නම් ඒ ළමයින්ගේ දෙමව්පියන්ගේ ආගම ධර්මය එම ආගමට අයත් ගුරුවරයකු ලවා ඉගැන්විය යුතු යයි නීති පැනවීය. 1947 අංක 26 දරණ පනතින් පනවනු ලැබූ විධි විධාන නිසා උපකෘත පාඨ ශාලා පිහිටුවීම නැවතුණ අතර අළුත් පාසැල් ඇති කිරීම රජයේම කාර්යයක් විය. 1948 වන විට නිදහස් අධ්‍යාපන පණත පල දරා තිබුණි. නිදහස උදාවීමත් සමග නිදහස් අධ්‍යාපනයේ ආලෝකය ද සමස්ත ජනතාවට ලැබිණ.

ලංකා අධ්‍යාපනයේ කේන්ද්‍ර ස්ථානයක් වූ විද්‍යාලංකාර පරිවෙනාධිපති ලණු පාකුණේ ශ්‍රී ධර්මා නන්ද නායක ස්වාමීන්ද්‍රයානන් අපවත් වූ හෙයින් කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක ස්වාමීන්ද්‍රයන් පරිවෙනාධිපති ධූරයට පත් වූහ.

Non-Commercial Distribution

# කෘෂිකර්මය

1931 දී දේශපාලන බලය මහජන නියෝජිතයන් අතට යම්කිසි ප්‍රමාණයකින් පත්වීම ලංකාවේ ආර්ථිකය හැඩ ගැස්වීමට ප්‍රබල ආයුධ යක් විය. එක්දහස් අටසිය ගණන්වල සිටම ලංකාවේ කෘෂිකර්මය පරිහානියට පත්විය. 1920 ගණන් වන විට රාජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය මෙම ගම්බද ගොවි ජනතාවට හානි කරවන අතර ධනවාදී ව්‍යාපාරිකයන්ට වාසි වන්නක් විය. මේ නිසා ගොවි ජනතාවට රජයේ ඉඩම් ලබා දීමෙන් සහනයක් සැලසිය යුතු විය. 1920 ගණන් වලදී මඩකලපුව දිසාපති සිටි බ්‍රෙක් මහතා ඒ ප්‍රදේශයේ ආණ්ඩුවේ ඉඩම් ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට බෙදුදීමේ ක්‍රමයක් ආරම්භ කළේ ය. මඩකලපු දිස්ත්‍රික්කයේ මේ ක්‍රමය සාර්ථකව අත්හදා බැලීමෙන් පසුව 1925 දී මාතර දිස්ත්‍රික්කයට ද පසුව හම්බන්තොට දිස්ත්‍රික්කයට ද ව්‍යාප්ත කරන ලදී.

1927 පත්වුණු ඉඩම් කොමිසම බ්‍රේන් මහතාගේ ගොවිජන ඉඩම් ප්‍රතිපත්තිය අනුමත කළේ ය. රජයේ නව ඉඩම් ප්‍රතිපත්තිය විය යුත්තේ සමාජ ප්‍රවර්ගයක් වශයෙන් ගොවි ජනතාව ආරක්ෂා කිරීම යන මතය කොමිසම පිළිගත්හ. හියු ක්ලිපඩ් ආණ්ඩුකාරතුමා ද මේ මතය පිළි ගත්හ.

1931 දී ව්‍යවස්ථාදායක සභාව අභාවයට යාමට පෙර ඉඩම් නිරාකරණ ආඥා පණත සම්මත කරන ලදී. මේ ආඥාපණත වැදගත් වන්නේ හේන් ගොවිතැන් අරබයා මෙතෙක් කල් පවත්වා ගෙන එන ලද ඉඩම් ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් වෙනස් කරන ලද නිසා ය. 1935 දී ඉඩම් සංවර්ධනය ආඥාපණත පණවන ලදී. ඒ මගින් සිදු කරන ලද්දේ එතෙක් කල් ඉඩම් කොමිසමේ මගින් ගෙන තිබුණු නිර්දේශයන් විධිමත් ලෙස නීති ගත කිරීමයි. 1933 මින්නේරිය ව්‍යාපාරය ආරම්භ කිරීමත් සමග ගොවිජන පදවල පදිංචියට යන්නවුන්ට රජය මගින් සැපයුණු සේවා වඩාත් පුළුල් කෙරිණ. ඉඩම් හෙළි කිරීමේ කටයුත්ත සඳහා සම්පූර්ණ වියදම ගෙවීමත් පදිංචියට යාමෙන් පසුව අවුරුදු තුනක් ගතවන තෙක් ජල බද්දෙන් නිදහස් කිරීමත් අළුත් ආධාර වූයේ ය. කෘෂි කර්මය පිළිබඳ කටයුතු සම්පාදනයේ දී කෘෂිකර්මය පිළිබඳ විධායක කමිටුවට අයත් විය.

1931 න් පසුව ආහාර නිෂ්පාදනය මුල් තැනක් ගත් හෙයින් වී ගොවිතැන දියුණු කිරීම වැදගත් විය. 1929 ඇති වූ ආර්ථික පරිහානියක් රැකී රක්ෂා හිඟයක් මෙයට බෙහෙවින් බල පෑවේ ය. 1945 දී වී ගොවිතැන

Non-Commercial Distribution

අක්කර 9,13,239 ක් වූ අතර 1952 වන විට 10850011 ක් විය. වී ගොවිතැන සඳහා යොදා ගත් අක්කර ප්‍රමාණය වැඩි වූ බව පැහැදිලි ය. එහෙත් වී ගොවිතැන සුළු වගා ස්වරූපයක් ගත් බව පැහැදිලි ය. වී ගොවිතැන සඳහා යටට වී තුබුණු ඉඩම් ප්‍රමාණයෙන් 64% ක් අක්කරයට අඩු ඉඩම් වූ අතර සියයට තිස් දෙකක් අක්කර භාගයට අඩු ඉඩම් ය.

මීට අමතරව ඉඩම් බුක්ති විඳීමේ ක්‍රම ද විවිධ විය. කුඹුරු ඉඩම් සුළු පරිමාණ කට්ටි වලට බෙදී තිබීම වී නිෂ්පාදනය කෙරෙහි බල පෑ අතර ඉඩම් හිමියන් ඉඩම් හිමි ගොවියන් අඳේ ගොවියන් හා කෘෂිකර්මික කම්කරුවන් යන ආකාරයට පැවැති ශ්‍රම බෙදීම ද වී නිෂ්පාදනය කෙරෙහි බලපෑවේ ය. පොදු වශයෙන් ඉඩම් හිඟය ඉඩම් පංගු ක්‍රමය නොදියුණු ගොවිතැන් ක්‍රම ග්‍රාමීය ණය ප්‍රශ්නය අඩු නිෂ්පාදනය යන මූලික ලක්ෂණයන් ගෙන් ලංකාවේ පරිභෝජන කෘෂිකර්මය සමන්විත විය.

1928 වන තෙක් ඉඩම් ප්‍රතිපත්තියේ පදනම වූයේ මූල ධර්මයන් තුනක් මත ය. ඉඩම් රජයේ දේපල බවත් ඉඩම් බෙදාදීම පිණිස ඉඩම් අවශ්‍ය ජනයා විසින් ඉල්ලුම් කළ යුතු බවත් රජයෙන් ලබා ගන්නා ගන්නා ඉඩම් සඳහා ගෙවිය යුතු බවත් ය. 1935 දී ඉඩම් සංවර්ධන පණත සම්මත වීමෙන් පසුව රජයේ ඉඩම් මැන බෙදා දිය යුත්තේ ගම් පුළුල් කිරීම ග්‍රාමීය අවශ්‍යතාවයන් ජනපද ව්‍යාපාර කැලෑ සඳහා ඉඩම් වෙන් කිරීම, මහජන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් වෙන් කිරීම මධ්‍යම පංතියට හා අන් අයට ඉඩම් ලබා දීම යන කාර්යයන් සඳහා විය යුතු යයි සම්මත කළේ ය. ඉඩම් වල පදිංචි කිරීමේ පණත 1931 දී ක්‍රියාත්මක වීමෙන් පසුව 1932 ගම් 1714 ක් ද 1934 දී ගම් 1644 ක් ද, වූ අතර 1934 වන විට ඉඩම් අක්කර 50000 ක් ගොවි ජනයා අතර බෙදා අවසන් කළහ.

ඉඩම් වල ගැමියන් පදිංචි කරවීමේ කටයුතු භාරව ක්‍රියා කිරීම පිණිස වෙනම දෙපාර්තමේන්තුවක් ද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවක් ද, එම කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට උපදේශක කමිටු ක්‍රමයක් ද සකස් කරන ලදී.

ලංකාවේ කෘෂි කර්ම ක්ෂේත්‍රය පුළුල් වූ ආකාර පිළිබඳව බලන විට එය මාර්ග කීපයක් ඔස්සේ විකාශනය වූ බව පැහැදිලි ය. රජයේ ඉඩම් ප්‍රතිපත්තිය ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම වාරි කර්මාන්ත සංවර්ධනය හා ජනපද ව්‍යාපාර පිහිටුවීම එම මාර්ගයන් හා ප්‍රතිපත්ති වේ.

යටත් විජිත පාලන යුගයේ දී අපනයන කෘෂිකර්මය කෙරෙහි දක්වූ විශේෂ අවධානය පරිභෝජන කෘෂිකර්මය කෙරෙහි යොමු නො කළේ

Non-Commercial Distribution

ය. එයින් වී ගොවි තැනට හානියක් විය. වතු කරය වර්ධනය වූ අකාරයට වී ගොවිතැන වර්ධනයක් නොලැබී ය. එයට හේතුව වාරිමාර්ග ප්‍රතිසංස්කරණය නොකිරීම යි.

1900 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවක් ආරම්බ කළ ද එහි ප්‍රගතිය සැලකිය යුතු අන්දමින් සිදු නොවී ය. 1929 දී වී ගොවි තැන අක්කර 798314 කට සීමා විය. 1938 වන විට වී ගොවිතැන සඳහා යොදා ගත් ප්‍රමාණය අක්කර 850000 ක් විය. 1946 දී 913239 ක් විය. එහෙත් මේ මගින් ලත් වී අස්වැන්න වී නිෂ්පාදනය කරනු ලබන අනෙක් රටවල් සමග සන්සන්දනය කරන විට සැලකිය යුතු වර්ධනයක් යයි කිව නො හැක. වතු කරයෙන් උපයා ගනු ලැබූ ධනය උපයෝගී කර ගනිමින් ධනවත් වූ මධ්‍යම පංතික ගැමියන් වි ගොවිතැන සඳහා යොදා ගත් ඉඩම් මිළ දී ගෙන එම ධනවත් ව්‍යාපාරිකයන් එමඉඩම් මහා පරිමාණයෙන් සංවර්ධනය නොකර අඳේ ක්‍රමයට හෝ කුලී ක්‍රමයට ගොවිතැන් කිරීමට ගැමියන් යොදා ගැනීම නිසා මේ ප්‍රශ්නය තවත් අවුල් විය. එයින් ද හානියක් වූයේ නිෂ්පාදනයට යි.

වාරිමාර්ග සංවර්ධනය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක් වූයේ 1947 පසු වය. වාරිමාර්ග සංවර්ධනය තුලින් කුඹුරු අක්කර 90000 න් වගා කිරීම එක් අරමුණක් විය. 1950 දී පමණ කුඩා වාරිමාර්ග 90 ක් පමණ සංවර්ධනයට පියවර ගත්හ. කෘෂි කර්මික කටයුතු වල දී සහාය වීමට දිසා කෘෂි කර්ම කමිටු හා කෘෂිකාර්මික හා නිෂ්පාදන සමූපකාර සමිති පිහිට වූහ.

වැඩි වන ජනගහණයට විසඳුමක් වශයෙන් එනම් වැඩිවන ජනගහණයට ඉඩම් සැපයීමේ පරමාර්ථයෙන් ජනපද ව්‍යාපාරයට මුල් තැනක් දුන් බව පැහැදලි ය. වගා කළ හැකි ඉඩම් තිස් ලක්ෂයක් පමණ තිබීම නිසා ජනපද ව්‍යාපාර ක්‍රමය වැදගත් විය. එහෙත් ජනපද ව්‍යාපාර ආරම්භ කිරීම ආර්ථික හා සමාජ සාධකයක් මෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ වෙනස්වීම් වල බලපෑමක් බව වැඩි දෙනාගේ පිළි ගැනීම යි. 1930 පමණ වන විට ජනපද ව්‍යාපාර ප්‍රතිපත්තිය අනුක්‍රමයෙන් සකස් විය.

ප්‍රථමයෙන් ආරම්භ කරන ලද ජන පද ව්‍යාපාර ලෙස සැලකෙන්නේ මින්නේරිය කාගම හා තබ්බෝව ජනපද ව්‍යාපාරයි. ජනපද ව්‍යාපාර ක්‍රමය ව්‍යාප්ත වීමට පටන් ගත්තේ වාරිමාර්ග ක්‍රම සංවර්ධනය කිරීමත් සමග ය. අක්කර 50000 ක් වගා කළ හැකි ආකාරයට මිනිපේ කාගම පරාක්‍රම සමුද්‍රය ඇළහැර මින්නේරිය දේවහුව කන්දේ ඇළ හා බත්මැඩිල්ල යන ව්‍යාපාරයන් සංවර්ධනය කිරීම ආරම්භ කළේ 1931 න් පසුව ය. 1939 1945 වකවානු තුළ දී ජනපද ව්‍යාපාර යටතේ ඉඩම්

Non-Commercial Distribution

අක්කර 13,500ක් වගා කිරීමට සැළැස්වී ය. 1935-1950 වසර පහළොව තුළ දී ගොවීන් 60000 ක් පමණ පදිංචි කරවන ලදහ.

ජනපද ව්‍යාපාර වල පදිංචියට බොහෝ සෙයින් තෙත් කලාපයේ ගොවීන් වියලි කලාපයට ගෙන ගියහ. ඔවුනට මුලින් ගොඩින් අක්කර පහක් ද මඩින් අක්කර තුනක් ද ලබා දුන්හ. කලක් ගත වීමෙන් පසුව ගොඩ ඉඩම් අක්කර තුන දක්වා පහත බස්සන ලදී. අතීතයේ තෙත් කලාපයේ බලපෑ ඉඩම් හිඟය අද ජනපද ව්‍යාපාර වල බලපා යි. ඒ ජනගහනය වර්ධනය වීමත් ඉඩම් සීමා විමක් නිසා ය. ඉඩම් සංවර්ධනය පණත ක්‍රියාත්මක වූ අවධියේ පදිංචි කරවන ලද පවුල් සංඛ්‍යාව 203926 ක් වූ අතර තවත් පවුල් 10345 ක් රජය විසින් පවරා ගනු ලැබූ විශාල වතුවල පදිංචි කර වූහ. ඉඩම් ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී ජනපද ව්‍යාපාර ප්‍රතිපත්තියේ බලාපොරොත්තු වූයේ ඉඩම් හිමි ස්වයං පෝෂිත ගැමි පංතියක් බිහි කිරීම වුව ද අද දක්වා එය සාර්ථක වී නොමැත. වසර 25 ක් තුළදී බෙදා දෙන ලද අක්කර 50000 ක ප්‍රමාණයෙන් ජාතික ආදායම වර්ධනය සඳහා එතරම් සහායක් නොලැබිණ.

ජනපද ව්‍යාපාර ඇසුරෙන් විශාලතම ජනපද සංවර්ධනය වූයේ ගල්ඔය ව්‍යාපාරයයි. එය බහු කාර්ය සංවර්ධනය ව්‍යාපාරයක් විය. 1949 දී ගල් ඔය සංවර්ධන මංඩල පණත සම්මත විය. ගල්ඔය අවට පෙදෙස වී ගොවිතැන සඳහා සකස් කර වසර 10 ක් තුළ දී ගොවි පවුල් 25000 ක් පදිංචි කිරීමෙහි අරමුණ විය. තවද සතුන් ඇති කිරීම සීනි නිෂ්පාදනය ජල විදුලිය නිෂ්පාදනය සහ වෙනත් කර්මාන්ත ඇති කිරීම ගල් ඔය සංවර්ධනය මණ්ඩලයේ කාර්යයන් විය. මුල් වසර තුන තුළ අති විශාල දියුණුවක් ලැබිණ. 1953 අග භාගය වන විට පවුල් 3565 ක් පදිංචි කරවන ලදහ.

කෘෂි කර්ම ක්ෂේත්‍රය තුළ ප්‍රාග්ධන හිඟය පිළිබඳ ප්‍රශ්නය විසඳීම පිණිසත් ගොවියන් දිරි ගැන්වීම පිණිසත් ක්‍රියා මාර්ග ගෙන ඇත. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සමූපකාර සමිති මගින් ග්‍රාමීය මට්ටමේ ණය සැපයිම ආරම්භ කිරීම ඉන් එකකි. 1948 දී කෘෂි කාර්මික නිෂ්පාදන සමිති අලෙවි සමූපකාර සමිති ආරම්භ කිරිම නිසා සත්ව පාලනය සඳහා ණය ලබා ගැනීමට හැකි විය. 1952 දී කෘෂිකාර්මික ණය සැපයීම ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ වගකීම විය. මෙසේ ගොවීන්ට ප්‍රාග්ධනය සැපයීම සඳහා විධි විධාන සැලසූ අතර ගොවියන් දිරිගැන්විම පිණිසත් ගොවිතැන ඵලදායි රැකියාවක් කිරීම පිණිසත් සහතික මිළ ක්‍රම 1948 දී ආරම්භ කළේ ය. වී කුරක්කන් මුං ඇට ඉරිඟු මෙනේරි කෝපි මිරිස් ගම්මිරිස් රතු ලූණු ආදී ද්‍රව්‍ය කෙරෙහි සහතික මිළ ක්‍රමය ක්‍රියාත්මක

Non-Commercial Distribution

විය. සහතික මිළ ක්‍රමය යටතේ ගොවි නිෂ්පාදනයක් මිළට ගනු ලැබුවේ කෘෂිකාර්මික නිෂ්පාදන හා අලෙවි සමූපකාර සමිති මගිනි. මේ නිසා ගොවීන්ට ආර්ථික වශයෙන් වාසිදායක තත්ත්වයක් උදා වූ අතර ගොවි නිෂ්පාදන අලෙවි කිරීමට තිබූ අපහසුව මග හැරිණ.

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා යොදා ගනු ලැබූ ඉඩම් ප්‍රතිපත්තිය ජනපද ව්‍යාපාර ආදී ප්‍රතිපත්ති එදා පැවැති ගැටළු වලට කිසියම් විසඳුමක් වූ ද 2003 අද වන විට එය අසාර්ථක බැව් පෙනේ. ගොවි ජනපද වල අද ඉඩම් හිඟය බලපායි. ජනපද ව්‍යාපාර වෙනත් ගැටළු මතු කර ඇත. 1931 පටන්ම කෘෂිකර්මය මහජන ඇමතිවරයකු සටනේ පැවතිණ. අද දක්වා සහල් අතින ස්වයං පෝෂිත බවත් ලංකාව තුළ නැත.

කෘෂිකර්මය අදත් සිදු වන්නේ සම්ප්‍රදායානුකූල ක්‍රමයට ය. එය කාර්මීකරණයන් සිදු වී නැත. විද්‍යාත්මක හා තාක්ෂණික අංශ වලින් පර්යේෂණ සිදු වී නැත. ශස්‍ය මාරුව වැනි ක්‍රම ආරම්භ වී නැත. අද වන විටත් කෘෂිකර්මය රදා පවතින්නේ ගතානුගතික යැපුම් කෘෂිකර්මයක් තත්ත්වයේ ය.

ආශ්‍රිත පොත්

මහාවංශ තුන්වනයුගය - නන්දදේව විජේසේකර
බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාව -
අපරදිග පාලන යුග - ලයනල් ලොකුලියන
මහාමාත්‍ය ඩී. ඇස්. සේනානායක චරිතය - සංස්කෘතික දෙපාර්තමේන්තුව
මහවැලි වංශය 3 කාණ්ඩය
ලංකා අධ්‍යාපන ඉතිහාසය ජයසේන බුත්පිටිය.

Non-Commercial Distribution

# භාෂා සාහිත්‍යය

පාලක පක්ෂයේ හැම දෙයක්ම පාලිතයන් (පාලනය කරනු ලබන්නන්) විසින් උසස් කොට සළකනු ලබන්නේ යයි පිළිගැනීමක් ඇත. 1815 බ්‍රිතාන්‍යයින් ලංකාව යටත් කර ගැනීමෙන් පසුව ඔවුන්ගේ භාෂාව වන ඉංග්‍රීසි භාෂාව ලංකාවේ පාලන භාෂාව හෙවත් රාජ්‍ය භාෂාව විය. ඉංග්‍රීසි පාසැල් කීපයක් විවෘත කළ ඔව්හු ලාංකිකයන්ට ඉංග්‍රීසි ඉගෙනීමට සැලැස්වූහ. ලංකාව ඉංග්‍රීසියෙන් ආණ්ඩු කිරීමට අවශ්‍ය නිලධාරීන්, ලිපිකරුවන්, භාෂා පරිවර්තකයින් පුහුණු කිරීම මෙහි පරමාර්ථය විය. මේ හෙයින් මෙතෙක් ලංකාවේ භාවිතා කළ භාෂාව වූ සිංහල භාෂාව පරිහානියට පටන් ගත්හ. මෙසේ යටපත් වූ සිංහල භාෂාවට නැති වූ තැන නැවත ලබා දීමට අවශ්‍ය යයි කිසියම් හඬක් නැගුණේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට මෙරට වැස්සන්ගේ නියෝජිතයන් වැඩියෙන් පත්වන්නට පටන් ගැනීමෙන් පසුවය. 1931 පිහිටවූ රාජ්‍ය මන්ත්‍රණ සභා ආණ්ඩු ක්‍රමයෙන් පසුව සිංහල භාෂාව පිළිබඳ අදහස් යෝජනා මතු වන්නට විය.

ශ්‍රී ලංකා මහා ගුරු සංගමයේ 1929 වර්ෂයේ සංවත්සර මහා සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ උප ශීර්ෂය යටතේ මහජන මතයක් ගොඩනැගීමේ අභිලාෂයෙන් කරුණු දක්වා තිබුණි. 1935 වන විට සිංහල භාෂා සටනක් මෙහෙයවීමේ අභිලාෂයෙන් ඔව්හු දස පණතක් ඉදිරිපත් කර ඇත.

මෙය මෙසේ තිබියදී 1932 පෙබරවාරි මස 9 වනදා රාජ්‍යමන්ත්‍රී ජී. කේ. ඩබ්ලිව්. පෙරේරා මහතා, "රාජ්‍ය මන්ත්‍රණ සභාවේ විවාදයක් පවත්නා විට කිසියම් මන්ත්‍රීවරයකුට සිංහලෙන් හෝ දෙමලෙන් කථා කිරීමට අවසර ඉල්ලීමට පුළුවන." යනුවෙන් යෝජනාවක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළේය. එහෙත් එය සභා සම්මත වූයේ නැත. 1932 ජූලි 5 වන දා මෙම මන්ත්‍රී තුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවට යෝජනාවක් කල් දුන්නේය. සිවිල් සේවයට හා ලිපිකාර සේවයට බඳවා ගැනීමේදීත්, උසස් වීම් ලබා දීමේදීත් පොලිස් නඩුකාර පදවි හා උසස් විනිශ්චයකරුවන් පත් කිරීමේ දීත් සිංහල හා දෙමළ පදවි හා උසස් විනිශ්චයකරුවන් පත් කිරීමේ දීත් සිංහල හා දෙමළ දන්නා උදවිය පත් කළ යුතු බවත්, අපරාධ නඩු විභාගවල දී ස්වභාෂාවෙන් (සිංහල දෙමළ) කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතු බවත් එම යෝජනාවේ සඳහන් විය.

ඉක්බිති 1936 ජූලි 23 වැනි දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ලංකා සම සමාජ පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනා පහත සඳහන් යෝජනාව රාජ්‍ය

Non-Commercial Distribution

මන්ත්‍රණ සභාව කල් දුන්නේය. ස්වභාෂා හෝ ඉංග්‍රීසි හෝ හෙඳින් නොදත් පොලිස් භටයන් මා සාජන්ට් වරුන් පොලිසියට කරණ පැමිණිලි සටහන් කර ගැනීමේ දී කරණ වැරදි නිසා සාධාරණය ඉටු වීමට බාධා ඇතිවීම සලකා බලන මේ සභාව එබඳු පැමිණිලි පොලිසියට කරන භාෂා වෙන්ම සටහන් කර ගත යුතු යයි අදහස් කරයි.

ප්‍රශ්න හා උත්තර එක් බසකට පරිවර්තනය කර නැවත ආපසු පරිවර්තනය කිරීමේ දී ඇතිවන වැරදි නිසා සිදුවන දුෂ්කරතා හා අසාධාරණය ගැන සලකා බලන මෙම සභාව දිවයිනේ නාගරික හා පොලිස් උසාවි වල නඩු ඇසීම ස්වභාෂාවෙන් (සිංහල - දෙමළ) කළ යුතුයයි අදහස් කරයි. මෙම යෝජනාව 1939 පෙබරවාරි 9 වන දින වැඩි ඡන්ද 11 කින් සම්මත වූයෙන් සවභාෂා හඬ රට පුරා පැතිර ගියේය. මෙයින් සැලකිය යුතු තරම් වෙනසක් රටේ ඇති නුවූවත් රාජ්‍ය භාෂා ප්‍රශ්නයේ වැදගත් අවස්ථාවක් විය.

1943 ජුනි 22 වන ද කැළණි මන්ත්‍රී ජේ. ආර්. ජයවර්ධන මහතා පහත සඳහන් යෝජනාවක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළේය. වර්ෂ ගණනක් ඇතුළත දී සිංහලය රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනීමේ අරමුණින්

1. එම භාෂාව සියළු පාඨශාලාවල අධ්‍යාපන මාධ්‍යය කළ යුතුය.
2. සියලු පොදු විභාග වල සිංහලය අනිවාර්ය විෂයයක් කළ යුතුය.
3. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කටයුතු සිංහලයෙන් ද කිරීමට ඉඩ සැලසෙන පරිදි ව්‍යවස්ථා සම්පාදනය කළ යුතුය.
4. අන් භාෂා වලින් රචිත සැලකිය යුතු ග්‍රන්ථ සිංහල භාෂාවට පරිවර්තනය කිරීම පිණිස තෝරා ගැනීමට ද, පරිවර්තනය කිරීම සඳහා කොමිෂන් සභාවක් පත් කළ යුතුය.
5. ඉංග්‍රීසියෙන් සිංහල භාෂාවට සංක්‍රමණය විම සම්බන්ධ ගත යුතු පියවර පිළිබඳ වාර්තා කිරීම සඳහා කොමිෂන් සභාවක් පත් කළ යුතුය.

යනුවෙන් මේ සභාවේ අදහසයි.

මෙම යෝජනාවට සංශෝධනයක් ත්‍රිකුණාමලය - මඩකලපුව මන්ත්‍රී වි. නල්ලයියා මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

මෙහි "සිංහල" යන පදය යොදන සියලු තන්හි එයට පසුව "සහ දෙමළ" යන පදය යෙදිය යුතුය යන්න එම සංශෝධනයයි. මෙම සංශෝධිත

Non-Commercial Distribution

යෝජනාව පක්ෂව ඡන්ද 27 ක් ද විරුද්ධව ඡන්ද දෙකක් ද ලැබීමෙන් සභා සම්මත විය."

අධ්‍යාපනය පිළිබඳ විධායක කමිටුව 1944 මැයි මාසයේ දී රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කළේය.

1. ප්‍රාථමික පාඨශාලා, අධ්‍යාපන මාධ්‍යය ස්වභාෂාව විය යුතුය.
2. මූලික පශ්චාත් ප්‍රාථමික පංතිවල අධ්‍යාපන මාධ්‍යය ස්වභාෂා විය යුතුය නොහොත් ද්විභාෂාමය විය යුතුය.
3. ඉහළ පශ්චාත් ප්‍රාථමික පන්තිවල අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ විය යුතුය. නොඑසේනම් ද්විභාෂාමය විය යුතුය. දීර්ඝ විවාදයකින් පසුව සම්මත වූයේ මෙසේය.
    1. ප්‍රාථමික පාඨශාලා අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි විය යුතුය.
    2. මූලික පශ්චාත් ප්‍රාථමික පංති වල අධ්‍යාපනය මාධ්‍යය ස්වභාෂාව විය යුතුය නොහොත් ද්විභාෂාමය විය යුතුය.
    3. ඉහළ පශ්චාත් - ප්‍රාථමික පංතිවල අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ විය යුතුය යනුවෙනි.

අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව දැරූ තැන වෙනස් වූයේ වත්, සිංහලට හිමිවිය යුතු තැන ලැබුණේවත් නැත.

1946 දී රාජ්‍ය මන්ත්‍රණ සභා කමිටුවක් විසින් පහත දක්වන නිර්දේශ ප්‍රකාශයට පත් කළහ.

මෙතෙක් රාජ්‍ය පාලන කටයුතු වල ඉංග්‍රීසි භාෂාව දරූ තැන 1957 ජනවාරි 1 දින සිට සිංහල හා දෙමළ භාෂා ද්වයට හිමිවේ.

නිලධාරීන්ට ගුරුවරුන්ට සහ ග්‍රන්ථ සම්පාදක පිරිසට අවශ්‍ය පුහුණුව දිය යුතුය. ග්‍රන්ථ පරිවර්ථනය හා සම්පාදනය පිණිස කාර්යාංශයක් පිහිටුවිය යුතුය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතුය.

1946 දී ජාතික ගුරු සංගමයට අයත් නියෝජිත පිරිසක් ඩී. ඇස් සේනානායක මහතා හමුවී ජාතික භාෂාව රජයේ භාෂාව බවට පත් කරන්නැයි ඉල්ලා සිටියහ. අදහස පිළිගත් එතුමා එය ක්‍රියාත්මක කිරීමට බොහෝ කලක් ගත විය හැකි යයි දැන්වීය.

නිදහස උදාවීගෙන එන මේ සමයේ වැඩි දෙනාගේ අවධානය ඒ දෙසට යොමුවිය. එහෙත් සිංහල, දෙමළ ස්වභාෂාවන් රාජ්‍ය භාෂා තත්ත්වයට පත් කිරීමට ලංකා ස්වාධීනතා පනතවත් ප්‍රයෝජනයට නොගත්හ.

Non-Commercial Distribution

සිංහල භාෂා පෝෂණයෙහි අග්‍රගණ්‍ය පඬිවරයකු වූ මුනිදාස කුමාරණතුංග මහතා සිංහල රාජ්‍ය භාෂාව විය යුතු යයි 1935 සිට හඬ නැගුවා පමණක් නොව සිංහල භාෂා පෝෂණය සඳහා ග්‍රන්ථ සමූහයක් සම්පාදනය කළේය. එතුමාගේ පළමුවන ව්‍යාකරණ ග්‍රන්ථය "ක්‍රියා විවරණය" යි එය 1935 දී පළ කළේය. 1937 දී ඔහුගේ විශාලතම ව්‍යාකරණ ග්‍රන්ථය වන "ව්‍යාකරණ විවරණය" පළවිය. එය විශිෂ්ඨ ශාස්ත්‍රීය ගවේෂණයක ප්‍රතිඵලයකි.

මහාචාර්ය ගයිගර් විසින් 1938 දී ලියා පළකරන ලද "සිංහල භාෂාවේ ව්‍යාකරණය" යන ග්‍රන්ථය සම්භාවනීය ග්‍රන්ථයකි. ගයිගර් ගේ සම්භාව්‍ය මේ ග්‍රන්ථය පිළිබඳව එකම විවේචනය මුනිදාස කුමාරණතුංග මහතා විසින් ලියන ලදී. සිංහල භාෂාව පිළිබඳව පාරිශුද්ධ වාදී භාෂා ව්‍යාපාරයක් බිහි කරමින් පිය සමර - හෙළමියැසිය - දරු නැළවිල්ල - හත්පණ - මගුල්කෑම - ආදී ග්‍රන්ථ රාශියක් ලියමින් ද පැරණි සාහිත්‍ය ග්‍රන්ථ මුවදෙව්දා වත - සසදා වත ආදී පැරණි ග්‍රන්ථ රාශියක් සංශෝධනය කරමින් ද සිට 1944 මාර්තු 2 වන දා පරලෝ සපත් විය.

පාඨශාලා පිරිවෙන් ආදී ආයතනවල සිංහල භාෂාව උගැන්වීම සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ කීපයක් මේ කාලයේ ලියැවිණ. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමිවරුන් විසින් ලියන ලද සිදත් සඟරා විස්තර සන්න, තියඩෝර් ජී පෙරේරා පියතුමගේ සිංහල භාෂාව, ජොහැන්නස් මුදලිතුමාගේ සිංහල ව්‍යාකාරණ - වේරගම පුංචිබණ්ඩාර සන්නස්ගලගේ පද නීතිය, එයින් කීපයකි. සිංහලයේ උපත පිළිබඳව වැදගත් පර්යේෂණාත්මක ග්‍රන්ත කීපයක් ද මෙකලට අයත්ය. ඩබ්ලිව් එෆ්. ගුණවර්ධන මුදලිතුමාගේ සිද්ධාන්ත පරීක්ෂණය. ගයිගර්ගේ සිංහල භාෂා ව්‍යාකරණය ඒ අතරින් උසස් යයි සම්මතය. මේ ලියවිලි වලින් දක්වා ඇති පරිදි සිංහල භාෂාව වයඹ දිග හා ඊසාන ඉන්දියානු භාෂා පදනම් කරගෙන ද්‍රවිඩ භාෂාව සහ ආශ්‍රයක් ඇති වි පරිණාමයට පත් වූ භාෂාවකි. මෙම කාලය සිංහල ශබ්ද කෝශ පිළිබඳව ද උනන්දුවක් දැක්වූ වකවානුවකි. මහාචාර්ය විල්හෙල්ම් ගයිගර්, මහාචාර්ය හෙල්මර් ස්මිත්, විද්වතුන්ගේ අධ්‍යක්ෂණයෙන් ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතාගේ ප්‍රධාන කර්තෘත්වයෙන් බිහිවූ සිංහල ශබ්ද කෝෂයේ ප්‍රථම භාගය මෙහි ප්‍රථම පියවරය.

Non-Commercial Distribution

## ආර්ථික තත්ත්වය හා පන්ති සමාජය

යටත් විජිත ඒ තත්ත්වයෙන්ම දිගුකලක් පවත්වාගෙන යාමට නම් එම යටත්විජිත වල පැවති සාම්ප්‍රදායික ආර්ථිකය වෙනස් කළ යුතුයයි බ්‍රිතාන්‍ය රජය තීන්දු කළහ. ඒ අනුව දිවයිනේ කෝපි - සින්කෝනා - තේ - රබර් ආදී වැවිලි වගා ආරම්භ කළහ. මේ වැවිලි කර්මාන්ත බිහිකළේ ස්වයං පෝෂිත අර්ථ ක්‍රමය තුරන් වී අපනයන වැවිලි ආර්ථිකය එක්දහස් නවසිය තිස් ගණන් වන විට සම්පූර්ණ වී තිබිණ. වැවිලි ආර්ථිකයේ දියුණුවීමත් සමඟම දුම්රිය ප්‍රවාහණය ද ඒ සඳහා දුම්රිය මාර්ග පද්ධතියක් ද ඇති විය. ක්‍රිස්තියානි මිෂනාරිවරුන් විසින් අධ්‍යාපනය පැත්තෙන් මේ රටේ දියුණුවයයි ළමයින්ට උගන්වන ලදහ.

1933 වන විට තේ අක්කර 5,50,000 ක් විය. 1938 - 1943 කාලය තුළ තවත් තේ අක්කර 2783 ක් වගා කළ අතර, 1948 වන විට රබර් අක්කර ප්‍රමාණය 65511 ක් විය. 1934 දී පනවන ලද රබර් පිළිබඳ ජාත්‍යන්තර රෙගුලාසි 1938 දී අවලංගු විය. රබර් නැවත වගා කිරීමේ පණත සම්මත කරනු ලැබීය. 1943 දී රබර් වගා හිමියන් දිරි ගැන්වීම සඳහා සහනාධාර පණතක් සම්මත කළහ. එයින් පසුව රබර් අක්කර 18239 ක් නැවත වගා කරන ලදී.

පොල් වගාව සම්පූර්ණයෙන් ලාංකිකයන් සතු වගාවක් විය. 1946 වන විට පොල් වගාව අක්කර 10,75,000 ක් විය. 1948 දී පොල් වගාව පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළක් රජය මගින් ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵල වශයෙන් තවත් අක්කර 18000 ක් පමණ අලුතින් පොල් වගාව ආරම්භ කිරීමට හැකිවිය.

කොකෝවා - කෝපි - දුම්කොළ - කුරුඳු යන මේවා සුළු අපනයන බෝග වශයෙන් වගා කළහ. 1932 දී කර්මාන්ත හා වාණිජ්‍ය කාර්මික අංශයක් ඇතිකරන ලද නමුත් ඉන් සාර්ථක ප්‍රතිඵල නොලැබිණ. 1933 දී කෘෂි කර්ම හා ඉඩම් කටයුතු භාර විධායක කමිටුව අනුරාධපුරයේ හාල් මෝලක් ඇති කිරීමට යෝජනා කළත් පුද්ගලික වී මෝල් සමඟ රජය තරඟ නොකළ යුතුය යන මතයක් ගොඩ නැඟීම නිසා එම අදහස ව්‍යර්ථ විය.

1934 - 35 කාලය තුළ කර්මාන්ත පිළිබඳ උපදේශකයකු ඉන්දියාවෙන් ගෙන්වා ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වාර්තාවක් ලබාගත්තේය.

Non-Commercial Distribution

සිමෙන්ති - සබන් - පිඟන් භාණ්ඩ - අත් යන්ත්‍ර රෙදි - සීනි - පළතුරු ටින් කිරීම ආදී කර්මාන්ත රාශියක් ආරම්භ කිරීමට රජයෙන් ආධාර අවශ්‍ය බව පෙන්වීය. ගම්බද ජනතාවට අතිරේක ආදායම් සැපයීම සඳහා හා ගෘහ කර්මාන්ත සංවර්ධනය කළ යුතු බව ද පිළිගත්හ. කොහු භාණ්ඩ නිෂ්පාදනය සඳහා රජයේ කර්මාන්ත ශාලාවක් 1938 දී පිහිටුවීය. 1937 දී පණවන ලද පණතක් මගින් කර්මාන්ත හිමියන් අතර කොටස් ක්‍රමයට ගිණිකූරු නිෂ්පාදන බෙදා දී ඇත. කර්මාන්ත නගා සිටුවීමේ අදහසින් කෘෂිකාර්මික හා කාර්මික ණය සමායතනය නමින් ආයෝජන බැංකුවක් 1934 දී පිහිටිවීය. 1940 - 44 අතර කාලය තුළ ඇසිටික් ඇසිඩ් - වානේ කම්බි, පිඟන් භාණ්ඩ, රබර් භාණ්ඩ, කඩදාසි, සබන්, සුවඳ විලවුන් නිෂ්පාදනය කරන කර්මාන්ත කීපයක් බිහිවිය. 1942 වන විට කර්මාන්ත පාඨශාලා 166 ක් වැඩ පොළවල් 88 ක්, කර්මාන්ත මධ්‍යස්ථාන 449 ක් රටෙහි බිහිව තිබුණි.

මේ කර්මාන්ත මෙසේ බිහි වූ අතර රා කර්මාන්තය - අරක්කු කර්මාන්ත - විනාකිරි කර්මාන්ත ආදිය ද දියුණු විය. මිනිරන් පතල් හෑරීමේ කර්මාන්තය ද දියුණු විය.

කෝපි වැවීමේ ව්‍යාපාරයට සහභාගීවූවෝ වෙළඳාම - බදු මුට්ටු ගෙනයාම, කොන්ත්‍රාත් වැඩ ආදියෙන් විශාල ධනයක් රැස්කර ගත්හ. ක්‍රමයෙන් සිය ජීවන තත්ත්වය දියුණු කර ගත් ඔව්හු පැරණි සමාජ ධර්ම කෙරෙහි භක්තියක් නොදැක්වූහ. ඉංග්‍රීසි අධ්‍යාපනයේ පැතිරීම, ගමන් බිමන් යාමේ පහසුව ඇතිව කොළඹ සිට රටේ සෑම තැනකටම වාගේ මහා මාර්ග පද්ධතිය දියුණු වීම. දුම්රිය සේවය ඇතිවීම ආදිය ද නිසා ඔවුන්ගේ ගති පැවතුම් ද වෙනස් විය. මේ අනුව අරක්කු වෙළඳාම තුලින් මුදල් ප්‍රාග්ධනය එක්රැස් කරගත් පිරිස ද, පොල්, තේ, රබර් වතු හිමියන් ද බ්‍රිතාන්‍යයින්ගෙන් ඉඩ කඩම් ත්‍යාග ලත් උදවිය ද, බ්‍රිතානින්ට සේවය කිරීම නිසා මුදලි මුහන්දිරම් ආරච්චි ආදී තනතුරු ලාභීහුද, බ්‍රිතාන්‍ය හා ඉන්දියානු වෙළඳුන්ට පහත් වුවද, ලාංකික වෙළෙන්දෝ ද ආදී පිරිස් ලංකා සමාජයේ ඇතිවීම නිසා ලංකාවේ ධනපති පංතිය බිහිවිය. ලංකාවේ ධනපති පන්තිය යුරෝපයේ මෙන් කාර්මික ධනපති පන්තියත් නොව වතු වගාව නිසා ඇති වූ ඉඩම් හිමි ධනපති පන්තිය විය. මේ ධනපති පන්තියේ දරුවන් එංගලන්තය ආදී රටවලට ගොස් උසස් අධ්‍යාපනය ලබා වෛද්‍ය ඉංජිනේරු නීතිඥ ආදි උපාධි ලබා ලංකාවට ආහ. ලංකාවේ අධ්‍යාපනය දියුණුවීම නිසා පරිපාලන නිළධාරීන්, ගුරුවරුන් රාජ්‍ය සේවකයන් ආදී වශයෙන් එකතු වූ කොටස් තුලින් මාධ්‍යම පන්තිය පහළ විය.

Non-Commercial Distribution

ඉන්දීය සම්භවයක් ඇතිව ලංකාවේ වතුවල වැඩ සඳහා ගෙන්වන ලද කම්කරුවන්, වරාය දුම්රිය සහ මහා මාර්ග වල සේවය කළ පිරිස්, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සේවය කළ සිංහල - ද්‍රවිඩ - මලයාලි කම්කරුවන්, පළාත් පාලන ආයතන සෞඛ්‍ය අංශයේ සේවය කළ බොහෝ සෙයින් ද්‍රවිඩ කම්කරුවන්, බස් කොන්දොස්තරවරු හා රියදුරන් ආදී කොටස් සංයුක්ත වීමෙන් මෙරට කම්කරු පන්තිය බිහිවිය.

සමහර සිංහල පුවත්පත් කුල භේදය ඉස්මතු කළ ද 1936 වාමාංශික ව්‍යාපාරය මෙරට බිහිවීමෙන් පසුව පෙනී යන්නේ කුල භේදයට වඩා බලගතු අන්දමින් පන්තිභේදය ඉස්මතු වූ බවයි. 1936 සිට 1947, 1948 දක්වා විහිදී ගිය වෘත්තිය සමිති සටන් ව්‍යාපාරය තුළින් මෙය දිස්වේ. ලංකාවේ කම්කරු පන්තියේ සටන්කාමීත්වය මැන බැලූ සමහර දෙනා ලංකාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් වෙන්වී පූර්ණ ස්වාධීනත්වය දිනා ගන්නේ කම්කරු පන්තිය විසින් යයි අදහස් කර තිබුණි.

පන්ති සටන් ව්‍යාපාරය කෙතරම් දියුණුව පැවැතිය ද 1948 දී මෙරට ධනපති පන්තිය විසින් ලංකාවට නිදහස දිනා ගන්නා ලදී.

Non-Commercial Distribution

# GLOSSARY - ග්‍රන්ථිපද විවරණය

## අ.

**අග සව් යුවල** *c. n. m.* අග්‍රශ්‍රාවක දෙනම, බුදුන්ගේ ප්‍රධාන ශිෂ්‍ය දෙනම, P. අග්ග සාවකයුග, Sk. අග්‍රශ්‍රාවකයුග. The two chief disciples of Buddha; අග chief, සව් disciple, යුවල pair or two.

**අඟුල්** *m.* ඉරුණු වස්ත්‍රයකට ගළපන කැබැල්ල (දෙරේ අගුල), P. අග්ගල, Sk. අර්ගල. A patch (bolt).

**අටපිරිකර** *c. n. m.* මහණුන්නාන්සේ කෙනෙකුට ඕනෑකරණ පරිෂ්කාර අට; එනම් පාත්‍රය, සිවුරු තුන, පටිය, පිහිය, ඉඳිකටුව, පෙරහන්කඩ යන මේයි. P. අට්ඨ, පරික්ඛාර, Sk. අෂ්ටපරිෂ්කාර. The eight articles constituting the personal property of a Buddhist priest, viz., a bowl, three robes, a belt or girdle, a knife, a needle, and a water-strainer ; අට eight, පිරිකර article.

**අඩාල** *par. a.* කොටසක් කොට නැවැත්තු. නිම නොකළාවූ, P. විප්පකත, Sk. විප්‍රකෘත. Half done, incomplete.

**අතික්‍රාන්ත** Sk. *par. a.* ඉක්ම ගියාවූ, පසුවූ, P. අතික්කන්ත, අතීත Passed, beyond.

**අතිරේක** P. Sk. *a.* වැඩි, ඉතිරි. More, remainder.

**අත්‍යර්ථ** Sk. *nt.* අතිසය, P. අච්චත්ථ. More, excess.

**අදියර** *m.* පරිච්ඡේදය, P. Sk. අධිකාර, පරිච්ඡේද. Chapter, section.

**අහෝමය, අහෝ** *int.* අහෝ, ඛේදයකි, P. Sk. හන්ත, හා Oh! alas !

**අධිකරණ** P. Sk. කාරණය, නඩුව. Affair, a suit in court, a matter for adjudication.

**අධිෂ්ඨාන,** Sk. *nt.* නියම කරගැන්ම. සපීරලෙස සිතාගැන්ම, P. අධිට්ඨාන ditermination, Resolution. See ඉටන්.

**අධිෂ්ඨිත** Sk. *par. a.* උසස්ව සිට, එළඹ සිටි, පැමිනි, අධිපතිවැ සිටි, P. අධිට්ඨිත (He who) presided, approached ; අධි over, ස්ථා to stand.

**අනන්ත** P. Sk. *m.* අනන්ත නම් නාග රාජයා. The king of snakes, called Ananta, *a.* අන්තයක් නැති, කොණක් නැති. Endless, infinite; අන් not, අන්ත end.

**අනිස** *a.* නිත්‍ය නොවූ, සදාකාලික නොවූ, P. අනිච්ච, Sk. අනිත්‍ය. Transient, evanescent, non-eternal ; අ not නිස eternal.

**අනාථ** P. Sk. *a.* ස්වාමී රහිත, අසරණවූ. Without a protector, helpless, without a master ; අ not, නාථ master.

**අනාපත්ති** P. *c. n. f.* වරදට නොපැමිනීම. Sk. අනාප්‍රාප්ති. Not falling into, or abstaining from sin or offence ; අන් for, න not, ආපත්ති falling.

**අනුසස්නා** *par. a.* අවවාද කරන, P. අනුසාසන්ත, Sk. අනුශාසත්. Advising, admonishing, counselling.

**අන්තරාය විශෝධන** Sk. *c. n. m.* උපද්‍රව වැළැක්වීම, උවදුරු නැතිකිරීම, P. අන්තරාය විසොධන. Prevention of danger ; අන්තරාය danger, විශොධන prevention.

Non-Commercial Distribution

අන්තොසීමා P. *c. n. f.* සීමාවතුළ, Sk. අන්තශ්ශිම. Within the boundary, within the precincts; අන්තො inside, සීමා limit.

අන්ධසේනාපති P. *c. n. m.* අන්ධසේනාවට අධිපතියා, වඩිග සේනාවේ අධිපතියා, A general in an Àndra army.

අපථ්‍යකාරින් Sk. *a.* අහිත ක්‍රියා කරන්නාවූ, P. අහිතකාරී. Doing what is improper or unlawful, lawless.

අපාශ්‍රය Sk. *a.* සේත්තුවීමට යෝග්‍ය, P. අපස්සය. Fit to lean against.

අපේක්ෂා Sk. *f.* බලාපොරොත්තුව, සෙවීම, P. අපෙක්ඛා Hope, consideration අබිදත් *m.* නාමය, P. Sk. අභිධාන. Name.

අභිභවන P. Sk. *nt.* මැඩපැවැත්වීම, යටහත් කිරීම, නින්ද කිරීම. Subju- gation, overcoming.

අභිඥ Sk. *f.* විශේෂයෙන් දන්නා නුවන, ශ්‍රේෂ්ඨ නුවණ; (අභිඥලාභියෙකුට) 1 ඉඬිවිධ, 2. දිබ්බසොත, 3 පරචිත්තවිජානන, 4 පුබ්බෙනිවාසානුස්සති. 5 දිබ්බචක්ඛුයයි අභිඥ පසයි; රහත්කෙනෙකුට ආසව ක්ඛයඥාණයත් සමග අභිඥ සයකි. High knowledge, supernatural knowledge or faculty. There are five abhijnas possessed by an Ascetic, viz., different magical powers, the diving hearing,* the knowledge of the thoughts of others, the knowledge of conditions of former existences, and the divine sight.† In addition to the above five abhijñas an Arhat possesses Àsavakkhaya ñàna, or the knowledge which enables to destroy sins.

අභිෂේක Sk. *prop. n. m.* පිළිමවහන්සේකෙනෙකුට නමක්, *c. n. m.* පැන් හිස වැගිරවීම, රාජ්‍යයට පත්කිරීම පිණිස අභිෂේක නමින් පැන් හිස වැගිරවීම, අබිසෙව්, P. අභිෂේක. Name of an ancient image, anointing the head with water to create king.

අභ්‍යන්තර Sk. *n. a.* ඇතුළ, P. අබ්භන්තර (එක මිම්මක්) ඇතුළත්වූ. internal, inside (a certain measure), inner, enclosed; අභි-අන්තර.

අමූල්‍ය Sk. *a.* මිලකළ නොහැකි, P. අමූලිය, invaluable, intestimable ; අ not, මූල්‍ය valuable.

අය ගම් *c. n. m.* ප්‍රයෝජන උපදින ගම්, P. භෝග ගාම, Sk. භොගග්‍රාම. Villages from which income is derived ; අය tax, ගම් village.

අයෝමය P. Sk. *a.* යකඩින් කරනලද, යකඩින් නිමවනලද. Made of iron.

අරක් *f.* රැකවරණ. P. ආරක්ඛා, Sk. ආරක්ෂා. Protection, *acc. plu.* අරකුන්.

අරමන *prop. n.* රටක නමක්, රාමඤ්ඤරට, P. රාමඤ්ඤ, Sk. රාමණ්‍ය. Nmae of a country called Ramaññ (Rangun).

අරි-මග *c. n. m.* උත්තම මාර්ගය, P. අරියමග්ග, Sk. ආර්‍යමාර්ග. Venerable path, religious path.

අවනත P. Sk. *par. a.* නැමුනු, නමස්කාර කළාවූ. Bent, bowed down.

අවස *m.* ආවාසය, විහාරය, P. Sk. ආවාස. House, vihara, Buddhist temple.

අවි *m.* කඩු ආදී ආයුධ, P. Sk. ආයුධ. Weapon, such as a sowrd.

---

* Literally, divine ear. † Literally, divne eye.

Non-Commercial Distribution

අවුර *tr. imp. second per. sing.* වසව, ආවරණය කරව, P. අවර, Sk. ආවෘණෙහි. Covered, screen ; from අවුරම්.

අවුරා *p. par.* වසා, සිර කොට, P. අවරුජ්ඣිය, අවරුජ්ඣිය, Sk. අවරුද්ධ්‍ය. Having covered, having closed.

අශේෂ Sk. *a.* අයලු, අවශේෂයක් නැති, P. අසෙස, All, all-pervading, without remainder.

අශ්ව නාවිකපුත්‍ර Sk. *c. n. m.* අශ්වයන් වෙළෙඳම ගෙනයන නැවේ නැවියාගේ පුතා, P. අස්සනාවිකපුත්ත, Son of a dealer in horses, who is also the master of the vessai in which the horses are conveyed ; අශ්ව, horse, නාවික pilot, පුත්‍ර son.

අස්වසා *pas. par.* සනසා, සන්සිඳුවා, බිය නැති කොට, P. අස්සාසෙත්වා, Sk. අශ්වාස්‍ය. Having comforted, having soothed, having appeased, having (therefcre) encouraged.

අසිග්‍රාහක *c. n. m.* කඩු ගන්නා, කඩුදරන නිලමේ. Sk. අශිග්‍රාහක. Swordbearer. අසි. sword, ග්‍රාහක bearer.

අසුන් *m.* හස්න, ආසන, P. සාසන, ආසන, Sk. ශාසන, ආසන A message, a letter, a seat; also the *acc. plu.* of අස්, a horse.

අංයුවල *c. n. m.* අංදෙක, P. සිංගයුග, Sk. සෘංඛයුග. Pair of horns ; අඟ horn යුවල pair.

## ආ.

ආක්‍රොශ Sk. *m.* හැවීම, සාපය, P. අක්කොස, Curse, accusation, abuse.

ආකීර්ණ Sk. *par. a.* ගැවසුනු, P. ආකිණ්ණ. Scattered over, strewed.

ආචාර්‍ය්‍යවාද Sk. *c. n. m* ආචාර්‍ය්‍යවරයන්ගේ කථා හෝ ඉගැන්නුම්, P. ආචරියවාද. Doctrines of teachers or professors.

ආපත්ති P. *f.* දෙසකට පැමිණීම, Sk. ආප්‍රාප්ති. Falling into a crime, sin or an offence.

ආයතන-පදවි *c. n. m.* විහාරස්ථානවලට ප්‍රධාන තනතුරු, P. Sk. ආයතනපද. Incumbency of or superiority over a monastery.

ආයාචනා P. Sk. *f.* යාච්ඤා, අයදුම. Asking, begging, prayer, request.

ආරාමික P. Sk. *m.* ආරාමයෙහි නියුක්තයා, ආරාමයෙහි කටයුතුකාරයා. One who manages the affairs of an Arãma, or a monastic establishment.

ආවසථ P. Sk. *n. m.* නවාතැන්ගේ, අම්බලම. A resthouse, a lodging room.

ආවාස P. Sk. *m.* අවස, වාසස්ථාන. A dwelling. See අවස.

ආස්තරණ Sk. *m. nt.* ඇතිරිලි, P. අත්ථරණ, Sheets put on beds.

ආසෙවිත P. Sk. *p. par. a.* නිතර සේවනය කරනලද. Served constantly, associated frequently.

ආහාර-ක්ෂය Sk. *c. n. m.* ආහාර අඩුවීම, ආහාර අඩුකිරීම. Diminution or want of food.

Non-Commercial Distribution

## ඇ.

ඇණවී *tr. p. third per. sing.* ආඥ කෙළේයි, නියෝග කෙළේයි, P. ආණපෙසි ආණපයි, Sk. ආඥපයත්. Commanded, ordered.

ඇණවූ *p. par. a.* අණ කළ, ආඥ කරනලද, P. ආණත්ත, Sk. ආඥප්ත. Comanded, ordered.

ඇත්කුඹු *c. n. m.* ඇතාගේ හිසමත්තේ ගුලිය, P. හත්ථිකුම්භ, Sk. හස්තිකුම්භ The frontal globe on the upper part of the forehead of an elephant.

ඇත්මුළු *c. n. m.* හස්තිසමූහයා, P. හස්තියූථ, Sk. හත්ථියූථ. Herd of elephants ; ඇත් elephant, මුළු herd ; *acc. sing.* ඇත්මුල.

ඇතොවුර *m.* රජහුගේ අන්තඃපුරවැසි ස්ත්‍රීජනයා, P. ඔරොධ, අන්තොපුර, අන්තෙපුර, අන්තොපුරික, Sk. අන්තඃපුර. The harem.

ඇවෑම *m.* ඉක්මයාම, මරණින් පසු P. අච්චය, Sk. අත්‍යය. Passing away, after death.

ඇවිරී *tr. p. third per. sing.* ආවරණය කෙළේය. වැසී, P. ආවරී, වාරෙසී Sk. අවාරීත්. Covered.

## ඈ.

ඈපා *c. n. m.* ආදිපාද පදවිය, ආදිපාදයා, රජහට දෙවැනිව රජවීමට යෝග්‍යව වසන කුමාරයා. Dukedom, heir - apparent ; ඈ first, md පා post.

## ඉ.

ඉක්බිති *adv. or an inc. par.* නැවත, ඊට අනතුරුව, ඒ ළඟට, P. Sk. අථ. After, afterwards, then.

ඉටන් *m.* අධිෂ්ඨානය, මෙසේ වේවයි නියමකිරීම, මෙසේ කෙරෙමියි නියම කර ගැන්ම, P. අධිට්ඨාන, Resolution, determination.

ඉදුහ *f.* සෘද්ධිය, පුදුම ක්‍රියා කරන්ට පුළුවන් බව, සමර්ථතාව, P. ඉද්ධි, Sk. සද්ධි. Having the power performing miracles superhumnan power, power.

## ඊ.

ඊ-බඳ *a.* එහි බැඳුනු ඊට සම්බන්ධ P. තම්බද්ධ, තද්බද්ධ Jorned with, attached to, connected with.

## උ.

උකකුටයී P. *f.* උසස්කොට කෑගැසීම, Sk. උත්ක්‍රොශ. A loud crying.

උණු-ලොම් *c. n. m.* ඌර්ණරෝමය, බුදුන්ගේ නලළේ තිබුණු රෝමය, Hair on the forehad of Budhdha between the brows.

Non-Commercial Distribution

උත්තුඞ්ග P. Sk. *a* උසස්, බලවත්, බහුල P. උස්සන්න. High, powerful.

උත්සන්න-භාව Sk. *c. n. m.* උසස්, වැඩිබව, බහුලබව P. උස්සන්නතා, Superiority, abundance, a large quantity.

උදාර Sk. *a.* මහත්වූ, ඍජුවූ, උසස්වූ, ත්‍යාගී, P. උළාර, Great, upright, honest. high liberal.

උද්ඝොෂණ Sk. *f. nt.* උසස් කොට ශබ්ද කිරීම, හඬ ගැසීම, P. උග්ඝොසන. Making a loud noise.

උන්නාද P. Sk. *m.* උසස් කොට හඬ ගැසීම. A loud cry.

උපගත P. Sk. *par. a.* ළඟට පැමිණි, එළැඹි. (He who has) come near, arrived at, approached.

උපද්‍රැත Sk. *par. a.* උපද්‍රව ඇතිවූ, P. උපද්දුත. Dangerous, portentous.

උපපද-නාම P. *c.n. nt.* නාමයට පූර්වයෙන් එකතුවෙන නාමය, Sk. උපපද නමාත්, An epithet added or prefixed to a name, a surname.

උපභොග P. Sk. *a. n.* ප්‍රයොජන ගතයුතුයි, ප්‍රයෝජන වියයුතු වස්තුව, Proper to be enjoyed, fit to be used, enjoyment.

උපලාලන P. Sk. *nt.* නැළවීම, සාමය, සතුටු කිරීම. Lulling, act of pleasing.

උපසුම්භ *pro. n.* පිළිමයක නම, Name of an ancient image.

උපහාර P. Sk. *m.* පූජාව, පුදපෙළහර, උත්සවය Offering, festivity.

උපස්තම්භ Sk. *n. a.* උපකාරක, බල දෙන්නාවූ P. උපත්ථම්භ, උපත්ථම්භක Assisting, affording power.

උපස්තම්භක-භාව Sk. *c. n. m.* උපකාර කරනබව, පිටිවහල්බව, P. උපත්ථම්භක භාව. Assistance, rare help ; උපස්තම්භක assistant, භාව nature.

උපේක්ෂා Sk. *f.* සතුටු නොසතුටු දෙක අතර පැවැත්ම, P. උපෙක්ඛා, Indifference, mediocrity.

උපේත P. Sk. *p. par.* යුක්ත, සමග පවත්නා. Connected, joined.

උල්ලඞ්ඝන P. Sk. *nt.* උඩින් පැනීම, හැරදැමීම, වැරදීම. Leaping over, leaving, mistake.

උළෙල *a.* උසස්ව කම්පිත වන, P. Sk. *a.* උළෙලාල. Greatly agitating.

උවටන් *m.* උපස්ථාන, ළඟ හැසිරීම, P. උපට්ඨාන, Sk. උපස්ථාන. Attention, hospitality.

උවරණ and උවාරණ, *m.* උපකරණ, ඕනෑකරණ දේ, මෙවලම් P. Sk. උපකරණ. Necessary instruments used in any work.

## ඌ

ඌර්ණ-රොම Sk. *c. n. nt.* බුදුන්ගේ නළළේ හටගත් ලෝමය මකුළුහුයක් සමාන ලොමය, P. උණ්ණලොම. A hair as thin as the thread of a spider, a hair on the forehead of Buddha. See. උණුලොම්.

Non-Commercial Distribution

## එ.

එකඩවස් *c.n.m.* එක්හවුරුදු හමාසයක්, P. දියඩ්ඪවස්ස, Sk. අධ්‍යර්ධවර්‍ෂ. One year and a half ; එක් one, අඩ half, වස් year.

එකපදික-මාර්ග Sk. *c. n. m.* එක මිනිසෙකු විසින්ම පයින් යායුතු මාර්ගය, කීප දෙනෙක් විසින් හරස්ව පෙළගැසී යන්ට නුපුළුවන් මාර්ගය, A road over which one man only can pass a narrow footpath.

එකායන-මාර්ග Sk. *m.* එකම මාර්ගයවූ මාර්ගය, එකම ගමනවූ මාර්ගය, සතිපට්ඨාන. The only path to Magga or salvation, as taught in Buddhism.

එකාවැල් *c. n. f.* එකාවලිය, කර ලන මාලයක්, P. Sk. එකාවලී. A necklace of pearls; එක one, වැල් necklace.

එක්-කඳ-හොරු *c. n. f.* එක කඳෙන් සාදනලද ඔරු, P. එකදෙණිනාවා, Sk. එකද්‍රෝණිනෞ. A boat made of a single trunk ; එක් one, කඳ timber, or oval basin, හොරු boat.

එලවූහ *tr. p. third per. plu.* පිළිගැන්වූහ. දුන්හ, ගෙණැත් දුන්හ. P. උපනාමෙ සුං, ආහරුං, Sk. උපාහෘත. They brought, they gave.

එලු දළද වංශ *c. n. m.* සිංහල දං ෂට්‍රාධාතු වංශය, P. සීහල දඨාධාතු වංස. History of the Tooth-relic of Buddha, written in Sinhalese.

## ඓ.

ඓශ්වර්‍ය්‍ය සෞභාග්‍යලක්ෂ්මී Sk. *c. n. f.* ඉසුරුමත්බව හා යහපත් හේතුවේ ශ්‍රීදේවී, P. ඉස්සරියසොභග්ගලක්ඛී, The goddess of prosperity and good fortune; ඓශ්වර්‍ය්‍ය power, prosperity, සෞභාග්‍ය good fortune, ලක්ෂ්මී goddess of beauty.

## ඔ.

ඔකාවස් *c. n. m.* ඔක්කාකවංසය, P. ඔක්කාක කුල, ඔක්කාකවංස, Sk. ඉක්ෂ්වාකු වංශ. A race named Okkáka; ඔකා a name, වස් race.

ඔත්තප්ප P. *nt.* පවට බිය, Sk. උපත්‍රපා. Fear to commit sin.

ඔර *m.* ලය, උරය, P. උර, Sk. උරස්. The breast, the bosom, the heart.

ඔරවැඩු *a.* ළයෙහි හිඳුවා වර්ධනය කළ, ලැපැත්තේ හිඳුවා වැඩූ (පුත්‍රයෙක්), P. ඔරස, උරසිවඩ්ඪිත, Sk. ඖරස. Legitimate.

## ක

කටන්ධකාර *pro. n.* විහාරයක නමක්, Name of a temple or vihára.

කඩරොද *pro. n.* ස්ථානයක නමක්, අනුරාධපුරයේ නැගෙනහිර දිසාවේ දනව්වක්. P. Khandaráji, a village or district to the east of Anurádhapura.

කනිටු *a.n.* බාල, බාල සහෝදරයා, P. කනිට්ඨ, Sk. කනිෂ්ඨ. Younger, younger brother.

Non-Commercial Distribution

කතිකා P. *f.* නියමකරගැණීම, පොරොන්දු, සම්මතය. Determination, consent, promise.

කථාශෙෂ Sk. a. කථාව පමණක් ඉතිරී, වචනයක් පමණක් ඉතිරී, P. කථාසෙස, Reserving only conversation or speech, reserving only a word.

කදුගල් *c. n. m.* පළිඟුගල්, P. කාචසම, Sk. කාචශමන්, කාමණි. Crystal quartz; කදු glass, ගල් stone.

කන්වයින් *m.* හිසතබන කොට්ටය, P. බිම්බොහන, උපධාන, Sk. ශිරොධාන. Pillow.

කඹුරු *m.* කර්මාරය, යකඩවැඩ කරන්නා, P. කම්මාර, Sk. කර්මාර. Blacksmith.

කම්වූපරිද්දෙන් *ad.* කර්මයවූ ලෙස, කුසල් අකුසල් කළසේ, P. යථාකම්මං, Sk. යථාකර්ම. According to merits and demerits.

කරුණගුණයොග P. Sk. *c. n. m.* දයාගුණයෙන් යෙදීම, කරුණගුණයෙන් යුක්ත වීම. Endued with mercy ; කරුණ, mercy, ගුණ. quality or virtue, යොග endued, attached.

කලාවැව් *c. n. f.* කලා නම් වැව, P. Sk. කාලවාපි. A lake called Kalá

කල්පාන්තවාතසංක්ෂොභ Sk. *c. n. m.* කල්පාවසානයෙහි හටගන්නා වාතයෙන් චඤ්චලවීම, P. යුගාන්තවාතසංඛොභ. Shaking by the wind, blown at the end of an æon; කල්ප æon, අන්ත end, වාත wind, සංක්ෂොභ shaking.

කවද *m.* සන්නාහ, සැට්ට, P. Sk. කවච. Armour.

කස්ලොහො *c. n.* කාංශ්‍යලොහ, ලෝකඩ, P. කාංසලෝහ. Bell-metal.

කසුබ්ගිරි *prop. n.* කන්දක නම, P. කස්සපගිරි, Sk. කාශ්‍යපගිරි, විහාරයකටද නම්. Name of a mountain, also a vihára by that name.

කහවණු *c. n. m.* මාසක විස්සක් බර රන් කාසියක්, මාසකයක් හුනිදඇට දෙකේ බරයි. P. කහාපණ, Sk. කර්ෂ, කර්ෂපණ. A gold coin of the weight of 20 másakás ; කහ weight of twenty másakás, පණ coin.

කිස *m.* කටයුත්ත, P. කිච්ච, Sk. කෘත්‍ය. Duty, service.

කිස්දෙවුන්-මල් *c. n. m.* බාල සහෝදරයා, කුසධොවනය කළ සහෝදරයා, P. කණිට්ඨ, කණිට්ඨභාතු, Sk. කනිෂ්ඨභ්‍රාතෘ. The last born, the youngest brother.

කුන්ද-ලතා P. Sk. *c. n.* කොඳවැල්, වෑකොඳවැල්. A creeper, *Jasminum multiflorum.*

කුමාරසේන P. Sk. *pro. n.* ක්ෂත්‍රියෙකුගේ නමක්. කිසිතැනක මහාවංසයෙහි කඳ කුමරහට මේ නම කියනලදී. Name of a prince; this name is applied to Skandakumára in some places in the *Mahawaṇsa.*

කෘතහස්ත Sk. *a.* අතපුරුදුවූ, P. කතහත්ථ, Experienced, practised, skilful; කෘත done, හස්ත hand.

කෙහෙදවස් *c. n.* See කෙස්දවස්.

කෙස්දනා *c. n.* කේශධාතු නායක, කේශධාතු නායක නම් තනතුරු ලත් තැනැත්තා, P. කෙසධාතුනායක, One who is a appointed to the office Késadhátu náyaka; කෙස් hair, ද relic, නා chief.



Non-Commercial Distribution

කෙස්-දා-වස් *pro. n.* පොතක නම, P. කෙසධාතුවංස, Sk. කෙශධාතුවංශ. A book which treats about the Hair-relic of Buddha.

කෙස්-පුඩු *c. n. m.* හිසකෙස්පිඩු, පිළිමරූපවල හිසෙහි කරණලද හිසකෙස් ආකාර, P. කෙසපිණ්ඩ Sk. කෙශපිණ්ඩ. Formation of hair on the heads of images.

කෙළින් *m.* කඨිනචීවර, කෙළින් සිවුරු (සෘජු ඇදනැති), P. කඨින. Robe obtained in the month of Kártika, cloth for a robe offered to Buddhist priests.

කෙළෙඹි *m.* පවුලක අධිපතියෙක්, P. කුටුම්බික, Sk. කුටිම්බික. Chief of a family.

කොඬොල් *m.* කුණ්ඩලාභරණ, P. Sk. කුණ්ඩල, An ear-ring.

කෝ-වේ *c. n. f.* කුඩා වීදිය, P. ඛුද්දවීථි, Sk. ක්‍ෂුද්‍රවීථි. Small Street.

ක්‍රමාගත Sk. *par. a.* පිළිවෙළින් ආවාවූ, P. කමාගත. Descended in succession.

කැදැලි. *m.* කූඩුව, පක්ෂීන්ගේ කූඩුව, P. කුලාව, කුලාවක, Sk. කුලායක. Nest.

කැපසරුප් *n.* කැපඇති සුදුසු, P. කප්පියසාරුප්ප, Sk. කල්‍ප්‍යසාරූප්‍ය. Proper and resembling ; කැප proper, appropriate, or fit, සරුප් resembling.

කැවුම්-මිල *c. n. m.* කැවුම් ගැනීමට මුදල, P. පූවමූල, පූවමූලධන, Sk. පූපමූල්‍ය. Money for cakes.

කැළි කිපිලි *c. n. m.* කැලිසිත්තන් හා කුහුඹු, P. කුනථකිපලලක, Black ants and another kind of ants; කැළි black ant, කිපිලි white ant.

## ග.

ගණකනායක P. Sk. *c. n. m.* සමූහයක ප්‍රධානයා. වර්ගයක ප්‍රධානයා, ගණිතකාරයන්ගේ ප්‍රධානයා. Chief of a multitude, or of a class, or mathematicians: ගණක multitude, නායක Chief.

ගණනපථාතික්‍රාන්ත *par. a.* ගණන්මාර්ගය ඉක්මවූ, ගණන්කරන්ට නොහැකිවූ, අසංඛ්‍යවූ, P. සංඛාතීත, ගණනපථාතික්කන්ත, Innumerable, numberless, exceeding all numbers, beyond nonillion ; ගණන. number, පථ path, අතික්‍රාන්ත passed.

ගණපූරක P. Sk. *c. n. m.* සමූහය පුරවන අය, බුඬාගමේ යම් විනය කර්මයන් සතර නමින් අඩුනුවූ සංඝයා විසින් කරන්ට යුතුයයි නියම නම් ඒ පොහෝකිරීම් ආදිය චාතුර්වර්ගික කර්මයි, ඊට ගණපූරක සතරනමයි, පවාරණදි යමක් පස්නමකින් අඩුනැති සංඝයා විසින් කටයුතුනම් ඒ පඤ්චවර්ගික කර්මයි, ඊට ගණපූරක පස් නමයි, මේ ආදි ක්‍රමයෙන් දත යුතුයි. Quorum, complete number for a ceremony.

Non-Commercial Distribution

ගල්-පිළීකඩ *c. n. m.* ගලින් කරනලද පිල, P. සීලවෙදිකා, Sk. ශෛලවෙදිකා. A verandah built of stones.

ගුත්හල්මලු *pro. n. m.* රුහුණ තිබෙන එක් දනව්වක්, A district in Ruhuna ; *nom. acc. sing.* ගුත්හල්මඩුල්ල.

ගුම් *m.* ඝෝෂාව, P. ඝොස, Sk. ඝොෂ. Noise.

ගොකන්-සමුදුර *c. n. m.* ගොකණ්ණ නම් මුහුද, ලංකාවේ නැගෙනහිර මඩකලපුව ලඟ මුහුද, P. ගොකණ්ණසමුද්‍ද, Sk. ගොණ්ණසමුද්‍ර. Sea called Gokarna.

ගෝනැස් *c. n. f.* වකුටුකර කපා සැදූ පරාල, P. Sk. ගොපානසී, Rafters in curved form ; ගෝ rays, පන clear, සී bind.

ගොපන P. Sk. *nt.* ආරක්ෂාකිරීම, සංගා තැබීම. Protection, concealment.

ඝනාවාස P. Sk. *a.* ඝනවූ ගෙවල් ඇත්තාවූ Having houses close to each other.

## ච.

චඞ්ක්‍රමණමාලක Sk. *c. n. nt. m.* සක්මන්මලුව, P. චඞ්කමණ මාලක, A yard made for a covered walk or cloister; චඞ්ක්‍රමණ walking up and down, මාලක yard.

චණ්ඩ P. Sk. *a.* සැඩ, කුළු, නපුරු. Passionate, wrathful.

චණ්ඩසත්ව Sk. *c. n.* ක්‍රෑර සත්වයා, P. චණ්ඩසත්ත. A cruel animal.

චතුස්සඞ්ග්‍රහවස්තු Sk. *c. n. nt.* දාන, ප්‍රියවචන. අත්ථචරියා. සමානා තමතා, යන රජදරුවන්ගේ සඞ්ග්‍රහවස්තු සතර. P. චතුස්සඞ්ගහවත්ථු. Four chief moral virtues of princes, viz., almsgiving, affability, promoting the prospertiy of others, and loving others as ourselves.

චරියා P. *f.* සිරිත, හැසිරීම, පිළිපැදීම, Sk. චර්‍ය්‍යා. Conduct, habit, character.

චතුර්දිශික Sk. *a.* සතර දිගින් පැමිනි. P. චාද්දිසික. Come or arrived from the four quarters.

චෝදනා P. Sk. *f.* මෙහෙයීම, දෙස්කීම, නියෝගකිරීම. Inviting accusation, command.

## ඡ.

ඡත්‍රග්‍රාහකනායක Sk. *c. n. m.* රජහුගේ කුඩදරන්නන්ගේ ප්‍රධානයා. P. ඡත්ත ගාහක නායක. Chief of umbrella bearers to the king ; ඡත්ත umbrella, ගාහක bearer, නායක chief, principal.

ඡිද්‍ර Sk. *nt.* සිදුර, ඡිද්‍ද. Hole or vacuity.

## ජ.

ජල-මාතිකා P. *c. n. f.* දියබස්නා මොව්ඇළ. A chief canal.

ජල සම්පාත P. Sk. *c. n. m.* දියබැස වැටීම, දියබස්නාව, දියපීල්ල. A waterfall. falling of water into a lake.

Non-Commercial Distribution

ජලාවරණ P. Sk. *c. n. nt.* ජලය වැළැක්වීම, ජල නැවැත්වීම, ජල වැසීම. Stopping water ; ජල water, ආවරණ stopping.

ජානපදික P. Sk. *a.* ජනපදවාසී Inhabitants of a Province.

ජීර්ණප්‍රතිසංස්කරණ Sk. *c. n. nt.* දිරාගිය දේ නැවත හරිගැස්සීම, P. ජිණ්ණපටිසංඛරණ. Repairing ; ජීර්ණ decayed, broken, ප්‍රතිසංස්කරණ repairing.

ජීර්ණවිශෝධන Sk. *c. n. nt.* දිරාගියතැන් ශුද්ධකිරීම නොහොත් හරිගැස්සීම. Repairing broken or decayed places.

ජීව-ග්‍රාහ Sk. *c. n. m.* දිවිසහිතව අල්වාගැනීම, P. ජීවග්ගාහ, ජීවගාහ Taking captive, taking or apprehending alive.

## ඤ.

ඤාණෝදය P. *pro. n.* පොතක නමක්. ධම්මසඞ්ගනිප්‍රකරණයට කළ අටුවාවක්. A commentary to the Dhammasangani of Abhidhamma pitaka.

## ඩ.

ඩසිනු *m.* දෂ්ටකිරීම, P. දංසන, Sk. දංශන. Biting, act of biting.

## ත.

තක්ඇඹුල් *prop. n.* විහාරයක නම, P. තක්කම්බිල, Name of a temple at Anurádapura.

තත්පර Sk. *a.* ඇලුනු, එහි ඇලුනු, P. තප්පර, Attached to.

තද්වංශික Sk. *a.* ඒ වංශයෙහි උපන්නාවූ, P. තබ්බංසික. One born of his race.

තද්විධාන Sk. *c. n. nt.* ඔහුගේ අණ, ඒ නියෝගය, P. තබ්බිධාන, තස්සාණ. His command, or that rule, his ordinance, or that ordinance: තද් that, විධාන ordinance.

තරවජ *prop. n.* තරවජ නම් මනුෂ්‍යකුලයක්, තරහල්. The goldsmith caste.

තහවුරු *a.* ස්ථිර, අතිශයින් ස්ථිර, P. ථිර, ථිරතර, Sk. ස්ථිර, ස්ථිරතර. Firm, firmer, steady, steadier.

තුන්-නිකා *c. n. m.* නිකායතුන, සමාගම්තුන P. නිකායත්තය, Sk. නිකායත්‍රය. Three sects.

තුන්-බෑ *c. n. m..* තුන්සහෝදර, P. තෙභාතික, Sk. ත්‍රෛභ්‍රාතෘක. Three brothers.

තුන්-සිවුරු *c. n. m.* අඳනය, පොරවණය, මහසිවුර නොහොත් දෙපටසිවුර යන සිවුරු තුන, P. තිචීවර, Three robes, viz. inner robe, covering robe,and chief robe.

තුඹු-පත් *c. n. nt.* ඊයම්පත්, P. තිපුපත්ත. A leaf of lead.

තුලාබර *c. n. m..* තරාදියෙන් කරනලද බර. එක තට්ටුවක තමන් නැගී අනික් තට්ටුවේ රන් ආදිය දමා කිරා යාචකයන්ට දෙන දනය. Weight, weiged in balance, which is equivalent to the weight of oneself in one side of the balance, and in the other gold or some other thing given to the beggars ; තුල balance, බර weight.

Non-Commercial Distribution

තුලාරූඪ Sk. *a.* උඩ අත්බැඳ පයේ බර එල්ලා වධදීම කරනලද, තරාදි දීම කරන ලද. Tortured by suspending by the hands and hanging weight on the feet; P. තුලාරූළ්හ.

තුසවැටි *prop. n.* අනුරාධපුරේ ගමක නමක්. Name of a village at Anurádhapura.

තෙප් *m.* අනිනා ආයුධයක්, තෙබ, ලන්සය, P. සත්ති, Sk. ශක්ති A weapon to pierce with, a lance.

තෙරඹ *prop. n.* මිහින්තලේ තිබෙන අඹතලාවට නමක්, මිහිඳු තෙරුන්නාන්සේ වැඩසිටිය ඉඩමක්, P. ථෙරම්බ. Name of a place in Mihintala, a place where Mahinda Thera lived.

තෙරවස *c. n.* ස්ථවිර වංශය, මහාවිහාර වංශය, P. ථෙරවංස. Race of the priests of Mahávihára at Anurádhapura.

තෙරවසද *a.* ස්ථවිරවංශයෙහි ඇතිවූ, P. ථෙරවංසජ, Of the race of theras.

තෝතැනි *f.* ජලය දරාසිටින භූමිය, වෘක්ෂය වට ගැටියක් බැඳ ජලය නැවතී සිටීමට සාදනලද භූමිය, P. ආලවාල. A watery ground, baisn round the food of a tree.

## ථ.

ථෙරියවාදික *prop. n.* මහාවිහාර පරම්පරාවේ භික්ෂූන්ට නමක්, Name of the succession of priests of the Mahāvihāra sect.

## ද.

දකුණු-දෙස *c. n. m.* දකුණුරට, දක්ෂිණදෙශය, P. දක්ඛිණදෙස, Sk. දක්ෂිණදෙශ. Southern Province.

දණ්ඩීස්සර *prop n.* දනයක නමක්, Name of an almsgiving of Hindus.

දණ්ඩනාථ P. Sk. *c. n. m.* දඬුවම්කිරීමේ ප්‍රධාන අමාත්‍යයා, දණ්ඩනායකයා. A magistrate or chief. criminal officer ; දණ්ඩ punishment, නාථ chief.

දම්-සඟුනු *prop. n.* අභිධම්මපිටකේ ධම්මසඞගනී නම්වූ පළමුවෙනි පොත. First book of Abhidharmapitaka called Dhammasangani.

දළකඩකම් *c. n. m.* ඇත්දත්වලින් කරනලද කර්ම. P. දන්තකණ්ඩකම්ම, දන්ත කම්ම, දන්තසිප්ප, Sk. දන්තශිල්ප. Work done in ivory; දළ tooth or ivory, කඩ piece, කම් art.

දළසිව් *prop. n.* එක් අමාත්‍යයකුගේ නමක්, P. දඨාසීව. Name of a minister.

දශරාජධර්ම *c. n. m.* රජදරුවන්ගේ ගුණධර්ම දශය, එනම් — දන, සීල, පරිත්‍යාග, ඍජු බව, මෘදුබව, තපස, අක්‍රොධ, අවිහිංසා, ක්ෂාන්තිය, අවිරුඬබව. The ten moral virtues belonging to royalty, viz., almsgiving, observance of religious precepts, liberality, uprightness, compassion, addicted to religious au terities, of mild temper, tenderness, patience, and peacefulness.

Non-Commercial Distribution

දස් *m.* දශය, මෙහෙකරුවා (දක්‍ෂ), P. දස, Sk. දශ. Servant, slave, active.

දසඅකුසල් *c. n. m.* අකුශලක්‍රියා දශය, ඒනම්—ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාචා, ඵරුසාවාච, සම්ඵප්‍රලාප, අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි, P. දසාපුඤ්ඤ, Sk. දශාපුණ්‍ය. Ten demerits, viz., killing. stealing, adultery, lying, slander, contumelious speech, vain talk, coveting another's property, envy, and heterodoxy; දස ten, අකුසල් demerits

දහම්-කම් *c. n.* ධර්මකර්මය, නිර්දෝෂකර්මය. P. ධම්මකම්ම, Sk. ධර්මකර්මන්. Moral act, good action.

දහම්ද *prop. n.* පොතක නම, P. ධම්මධාතු, දහම් ධාතුයයිද කියත්. A book called Dhammadhátu, in Páli.

දය පසභූති *prop. n.* එක රජකෙනෙකුටද ඇමතියෙකුටද නම්. Name of a king and a minister.

දනමාන P. Sk. *c. n. nt.* දීම හා පිදීම, දීම හා නම්බුකිරීම. Giving and respecting ; දන giving, මාන respecting.

දමරික P. *m.* කැරලිකාරයා, රාජ්‍යය පතමින් රජහට විරුඬව දබර කරන්නා. Rebel, one who aims at the kingdom and fights against the king, a competitor for the throne.

දික්-හඟලා-පුටු *c. n. m.* දිඟුපා ඇති පුටුව, සනීප පුටුව, P. ආනන්දි. An easy chair.

දියබරණ *c. n. m.* දිය නයා, P. දෙඩ්ඩුභ, Water-snake ; දිය water, අබරණ ornament.

දිවිහිමියෙන් *adv.* ජීවිතාන්තය දක්වා, P. යාවජීවං, Sk. යාවජ්ජීවම්. To the end of life, as long as life lasts.

දිවෙල් *m.* ජීවිකාව, පඩිය, P. Sk. ජීවිකා. Batta, salary, pay.

දිශාව්‍යවස්ථාන Sk. *c. n. nt.* දිසාවන් වෙන්කිරීම, දිසා වෙන්කොට දැනගැන්ම. Knowing the direction of districts ; දිසා quarter or district, ව්‍යවස්ථාන knowing.

දීපවංස P. *c. n. m.* ලංකාවේ කථා ලියූ පුරාණ පොත. The book in which the ancient history of Ceylon was written ; දීප island, වංස race.

දුර්ග Sk. *nt.* යාම දුෂ්කරවූ ස්ථානය, බලකොටුව, P. දුග්ග. An impassable place, fortress, rampart.

දුර් නීතික Sk. *a.* නපුරු නීති ඇත්තාවූ, අයහපත් නඩු ඇත්තාවූ, P. දුන්නීතික. Unlawful, having bad laws.

දුර්මන්ත්‍රී Sk. *a.* දුෂ්ට මන්ත්‍රණකාරීවූ, දුෂ්ට අමාත්‍යවූ, P. දුම්මන්තී, Being a wicked counsellor, wicked minister.

දුර්වාර Sk. *a.* නොවැළකියහැක්කාවූ, P. දුබ්බාර, Unavoidable.

Non-Commercial Distribution

# න.

නට *a.* නැසුනාවූ, නැතිවූ, දිරාගියාවූ, P. නට්ඨ, Sk. නෂ්ට. Dead, lost, disppeared, decayed, ruined.

නන්දිවාපී P. Sk. *c. n.* නන්දි නම් වැව Lake called Nandi ; නන්දි a name, so-called, වාපි. lake.

නදී P. Sk. *m. f.* ඔය, ගඟ. River.

නය P. Sk. *m.* ක්‍රමය, පිළිවෙළ. Order, manner.

නය දත්නාවූ *par. a.* ක්‍රම දත්නාවූ, P. නයඤ්ඤූ, Sk. නයඥ. Knowing ways or order.

නවකම් *c. n. m.* අභිනව කර්ම අලුත් වැඩ, P. නවකම්ම, Sk. නවකර්ම. New work ; නව, new, කම් work.

නහනු-මුර *c. n. m.* ස්නානවාරය, P. සිනාන, සිනානවාර. Bath, time of bathing.

නහමක් *adv.* ප්‍රතිෂෙධය, එපා, නෑ, P. Sk. මා. Do not, no, not.

නාගදිවයින *prop. n.* පාම්බේ ළඟ තිබෙන සුළු දිවයිනක්, P. Sk. නාගදීප. A small island near the Paumben passage.

නානාපුෂ්ප Sk. *c. n. nt.* නානාප්‍රකාර, මල් නොයෙක් මල්, P. නානාපුප්ඵ, Various flowers.

නා-රජ *c. n. m.* නාගාධිපතියා, මහානාගයා, (හස්තිරාජයා chief elephant), P. Sk. නාගරාජ. King of snakes, chief of snakes.

නාහල් *prop. n.* විහාරයක නමක්, P. නාගසාල, Name of a temple.

නිකාය P. Sk. *m.* සමාගම, සමූහය. (ගෙය) Sect, society (home).

නිමිතිගල් *c. n. m.* සලකුණට තැබූ ගල, සීමාබන්ධනයෙහි සීමාවේ සලකුණු පිණිස තැබූ ගල, P. නිමිත්තසිලා, Sk. නිමිත්තශිලා. A stone or rock placed for a sign of limit of sacred place; නිමිති sign, ගල් stone or rock. Gal is derived form Tamil "kallu," fyY.

නිමිත්ත P. Sk. *c. n. m.* නිමිත්ත, හේතු. Fate, sign of luck.

නිමිත්ත- පාඨක P. Sk. *c. n. m.* නිමිති කියන්නා. Fortune - teller.

නියැලුනේ *par. a.* නිරන්තරයෙන් ඇලුනේ, Sk. P. නිරත. Incessantly adhered or attached to.

නිවට *m. and a.* නිගණ්ඨයා, නග්නවූ තාපස විශේෂයක්, P. නිගණ්ඨ, Sk. නිර්ග්‍රන්ථ. A naked person, a naked hermit. *a.* අසමර්ථ, නොපොහොසත්. Not clever, not rich.

නිස්සන්තාප P. Sk. *a.* තැවිලි නැති, දුක්නැති. Painless, want of sorrow.

නිෂ්කණ්ටක Sk. *a.* කටුනැති, සතුරන් නැති, P. නික්කණ්ටක. Not having thorns, not having enemies.

නොකැපි-ගුණ *c. n. m.* අකම්ප්‍යවූ ගුණ, චංචලනැති ගුණ, P. අකම්පගුණ, Unchanged virtue.

නොවඳ *a.* වඳනොවූ, හිස්නොවූ, P. අවඤ්ඣ, Sk. අවන්ධ්‍ය. Not void, not barren, not empty.

න්‍යාය Sk. *m.* නීතිය, යුක්තිය, ගොතම ඍෂීන් විසින් කරනලද න්‍යායශාස්ත්‍රය, P. P. ඤාය, නය. Law, logic, justice, nyáya philosophy of Gótama.

Non-Commercial Distribution

# ප.

**පත්තනික්කුජ්ජන** p. පාත්‍රය යටිකුරුකිරීම, ශ්‍රද්ධා නැතිව භික්ෂූන්ට අලාභාදිය කරන දයකයෙකුගෙන් දන් නොපිළිගැනීම පිණිස සඞ්ඝයා විසින් කටයුතු කර්මය, ඔහුගේ දෙරට පිඩුපිණිස ගියකලට දන් ගෙණවොත් එතැනදී පාත්‍රය වැසීමකරණ පිණිස නියමකිරීම. Overturning the bowl into which alms are received by a Buddhist priest, which is an action doen by priests in order that they may not receive alms from an unfaithful person who causes loss, &c., to the priests ; order to overturn te bowl if he were to bring him alms when the priest goes to this house.

**පිරියම්** *m.* හාත්පසින් කටයුතු ක්‍රියා. The whole duty; Sk. පරිකර්මන්, P. පරිකම්ම, පිරි *prep.* around, කම් action.

**පිරිවෙන්** *m.* කීපදෙනෙක් වසන විහාරගෙයක්, මහණුන්නාන්සේලා උගන්වන ගෙයක්, තවුස් නවාතැනක්, P. Sk. පරිවෙණ. A residenceof piests, a school of priests, a lodge, an inn.

**පිළව්** *m.* පැටියා, කුරුලුපැටියා, P. Sk. පෝතක. A young one, a young bird.

**පිළි-කඩ** *c. n. m.* පිල, ගෙයි ප්‍රමුඛයෙහි උස්කොට බැඳ පිරියම්කළ බිම. P. Sk. වෙදිකා, අජර. A quadrangular verandah.

**පිළි-මිණි** *c. n. m.* ස්ඵටික, පළිඟු Crystal, white gem.

**පිළිරූ** *m.* ප්‍රතිමාව, පිළිමය, P. පිටිබිම්බ, පටිමා, Sk. ප්‍රතිබිම්බ. Picture.

**පිළු** *m.* දෙපය කොරා, P. පීඨගුල, Sk. පඞ්ගු. Cripple.

**පීටා,** *p. par.* ප්‍රතිෂ්ඨිතව, පිහිටාලා P. ඨපෙත්වා, පතිට්ඨාපෙත්වා Sk. සථපෙත්වා. Having placed.

**පීවරබාහ** P. Sk. *c. n.* පිරුණුවූ බාහු, සම්පූර්ණ බාහු. බාහු නම් හස්තයේ වැල මිටෙන් උඩ කැබෙල්ලයි. Complete arm.

**පුණ්‍යපරායණ** Sk. *a.* පිණෙහි අතිසයින් ඇලුනු, P. පුඤ්ඤපරායන. Inclined to perform meritorious sactions, adhering to merits.

**පුණුපොහෝ** *c. n. f.* පුරපසළොස්වක, පසළොස්වක පෝය, P. පුණ්ණමී, පුණ්ණමාසි, Sk. පෞර්ණමාසී. full moon ; පුණු full, පොහෝ time of fasting.

**පුතුදරාදි** Sk. *c. n.* දරු අඹු ආදි, P. පුත්තදරාදි. Children, wives, &c.; පුතු child, දර wife, ආදි etcetera.

**පුදමින්** *pr. par.* ගරුකරමින්, P. මානෙන්තො, from. පුදම්. Offering, respecting.

**පුරස්සර** P. *pr. par.* පෙරටුව යන, ඉදිරිපිට යන්නාවූ, Sk. පුරඃසර. Going before, preceded by, attended with.

**පුලු** *m.* හබලපෙති, P. පුථුකා, Sk. පෘථුක. Flattended fried grain.

**පුස්තකාලය** Sk. *c. n.* පොත්ගේ, P. පොත්ථකාලය, Library. (පුස්තක book, ආලය house.)

**පූර්වභොග** Sk. *c. n.* පළමුවූ භොගය, P. පුබ්බභොග, Former enjoyment ; පූර්ව. former, භොග enjoyment.

**පූර්වපර** Sk. *e. prop. n. or a.* පෙරපසු, P. පුබ්බාපර, Before and after

Non-Commercial Distribution

පෙත්-මග *c. n.* පඩක්තිමාර්ග, පදමාර්ග. Footpath.

පෙරහර *m.* රැකවරණ, ආරක්‍ෂාකිරීමේ උපකරණ, අනුග්‍රහය, ගැබපෙරහර යනාදි තන්හි මෙනි. උත්සවයටද කියත්, Sk. පරිහාර, පරිහරණ. Protection, favour, a festival.

පෙළ *m.* පාළිය, බුඬදේසනාව. Pàli sermon of Buddha.

පෙළහර *m.* ප්‍රාතිහාර්‍ය්‍ය, පුදුම ක්‍රියා කිරීම, P. පාටිහාරිය, Sk. ප්‍රාතිහාර්‍ය්‍ය. A miracle, a wonder, an unusual occurrence.

පෙහෙවස් *m.* උපොසථසීලය, පොහෝද රකිණ සීලය, P. පොකඛරණි පාල. Pond-keeper.

පොකුණුපල් *a.* පුෂ්කරණි පාලක. පොකුණු රැකවරණ කරන්නාවූ, P. පොකඛරාණි පාල, Pond-keeper.

පොරෝණ *m.* පොරවන වස්ත්‍රය, P. පාරුපණ, පාපුරණ. A covering cloth.

පොල්-කබල් *c. n.* පොල්ගෙඩියේ කබල හෝ කටුව, P. නාළිකෙරකපාල, Sk. නාරිකෙලකපාල. Coconut shell.

පොහෝකරුණු *m.* පොහොය කිරීම, P. උපොසථකම්ම, A ceremony observed by Buddhist priests at full and new moon days.

ප්‍රකර්ෂවාද, Sk. *c. n.* උසස්වාද, P. පවාද, පකඨවාද. Great controversy, great speech.

ප්‍රතාප-ගුණ Sk. *c. n. m.* දඬුවම්කිරීමෙන් හටගත් තේජොගුණය, P. පතාපගුණ. Dignity acquired by inflicting pain or punishment.

ප්‍රතිබාහණ Sk. *nt.* මැඩපැවැත්වීම, වැළැක්වීම, P. පටිබාහණ, Subjugation, defeat, hindracnce.

ප්‍රතිසංස්කරණ Sk. *nt.* නැවත හරිගැස්සීම, කැඩුනු බිඳුනු තැන් හරිගැස්සීම, P. පටිසංඛරණ, Reformation, reparation.

ප්‍රතික්‍රමණ-ශාලා Sk. *c. n.* එකතුවෙන සාලාව, P. පටික්කමණ සාලා. An assembly hall.

ප්‍රත්‍යෙක-භොග Sk. *c. n.* වෙන්වූ භොග, වෙනවෙනම ගතයුතු ප්‍රයෝජන බෙද බුක්තිවිඳීම, P. පච්චෙකභොග, To possoss separately or in shares.

ප්‍රවෙශ Sk. *nt. m.* ඇතුල්වීම, වැදීම, P. පවෙස. Entering, going in.

ප්‍රසූතිමන්දි Sk. *c. n.nt.* වදනගේ, සත්‍රීන් දරුවන් ප්‍රසූතකිරීමේ ගේ, P. සූතිඝර, සූතිකාඝර. A part of a house appropriated for tthe lying-in of women, especially ; ප්‍රසූති a lying - in for a woman, මන්දිර house.

පැදකුණු *m.* ප්‍රදක්ෂිණව, දකුණට කරකැවී නමස්කාර කිරීම. Turning to the right side and worshipping.

පැමිනි-(ණි) *p. par.* ප්‍රාප්තවූ සම්ප්‍රාප්තවූ, P. පත්ත, සම්පත්ත Approached, reached.

පැලවී, පැලවිය *v. pt. third per. sing.* පහකළේය, පැන්නුයේය, P. පලාපයි. Drove, sent out.

Non-Commercial Distribution

## ඵ.

ඵලපුෂ්පධාරින් Sk. *par. a.* ගෙඩි හා මල් දරන්නාවූ P. ඵලපුප්ඵධාරී. Bearing fruits and flowers ; ඵල fruit, පුෂ්ඵ flower, ධාරින්, bearing, *nom. sing.* ධාරී.

## බ.

බත්වස *c. n. m.* බත්පරමපරාව, දනපර මපරාව, P. භත්තවංස, Sk. භක්තවංශ. Succession of meal ; බත් boiled rico or meal, වස succession, order.

බර *n.* තුලා විස්සක්, පලම් 2,000 P. භාර. Weight o two thousand palams.

බලත් *m.* මුලාදෑනියා, ආරක්ෂාකාරය, P. බලත්ථ. Officer, keeper, guardian ; *nom. and acc. sing.* බලත්‍ථා.

බවසුව *c. n.* සංසාරේ සැප, P. Sk. භවසුඛ, Happiness or pleasure of transmigraiton ; බව transmigration, සුව happiness.

බහලාන්‍ධකාර Sk. *c. n. m.* ඝනවූ අඳුර, ගනඳුර, P. බහලන්‍ධකාර, අන්‍ධතතම. Thick darkness.

බලඇනි *c. n. m.* බලසෙන් සෙනායුඬ, P. Sk. බලානීක. War, army of the war; බල powerful, ඇනි army, or warlike soldier.

බාගිය *par. a.* භයට පැමිණි, බියවූ P. Sk. භීත. Fearful, afraid; බා fear, ගිය gone.

බික්සඟ *c. n. m.* භික්‍ෂුසඞසයා, P. භිකඛුසඞඝ, Sk. භික්‍ෂුසඞඝ. Priesthood, a general multitude of Buddhist priests.

බිරිඳු *f.* භාය්‍ර්‍යාව, P. භාරියා, Wife consort ; *nom. and acc. sing.* බිරින්ද.

බිලි-තටු *c. n. m.* බලියේ තටුව, බලිපූජාවේ මැස්ස. An altar on which offerings are made ot gods or devils.

බිහිසුණු *a.* බියඑලවන, භයඋපදවන, P. විභීසණ, භිසණ, භීම, භයානක, භෙරව, Sk. විභීෂණ, භීෂණ, භීම, භයානක, භෛරව. Terrific, formidable, causing fear.

බුදී *v. pr. third per. sing.* අනුභව කෙරේ, P. භුඤ්ජති, (He) eats.

බුන්වෙරලැති *a.* බිඳුනාවූ වෙරල ඇති, P. භින්නවෙල, Having the shore broken up, having the shore overflowed.

බුහුනනි *f.* සහොදරි, නැගනී, P. Sk. භගිනී. Sister, younger sister.

බෙහෙවින් *adv.* බොහෝ සෙයින්, P. භිය්‍යො, බහුසො, Sk. භූයස්, භූයසා. Mostly.

බෝ-පුද *c. n. m.* බොධිවෘක්‍ෂයට කටයුතු පූජා, P. Sk. බොධිපූජා. Offering made to a Bó tree ; බෝ name of a sacred tree, පුද offering.

බ්‍රහමවිහාර භාවනා Sk. *c. n. f.* ශ්‍රෙෂ්ඨවූ නොහොත් බ්‍රහ්මයාගේ විහරණ බඳු භාවනා. ඒ මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්‍ෂා කියා සතරකි. Noble meditation, consisting of kindness, mercy, well-wishing, and neutrality.

බැහැර *m.* පිට, පිටත, P. බාහිර, බහි, Sk. බහිර්භාග, බහිස්. Out, outside.

බෑ *m.* සහෝදරයා, P. භාතු, Sk. භ්‍රාතෘ. Brother.

Non-Commercial Distribution

## භ

**භට** P. Sk. යුඬකාරයා. Solider.

**භවිෂ්‍යත්කාල** Sk. *c. n.* මතු පැමිනෙණ කාල, P. ආයතිකාල. Future time, futurity; භවිෂ්‍යත් future, කාල time.

**භාවිනී** P. Sk. *a.* මත්තෙහි වන්නාවූ, අනාගතයෙහි වන්නාවූ Future, time to come.

**භාෂ්‍යරස** Sk. *c. n.* කියයුතු කථාවේ රස, P. භසසරස, Taste or beauty of the speech to be related.

**භින්දිපාලාග්‍ර** Sk. *c. n. nt.* භින්දි-පාල-අග්‍ර, අතින් දමාගසන සිදුරු ඇති ආයුධයේ අග, P. භෙණ්ඩිවාගග, කනයගග. The end of a hollow weapon thrown by the hand.

**භින්නමාතෘක** Sk. *a.* වෙනස්වූ මව් ඇති, උත්තම වංශයක පියා නිසා හීන ජාතියක මව් ඇතිව උපන්, P. භින්නමාතුක. Born of a low-caste mother whose husband is of a high caste.

**භිනෙනාරුළීප** Sk. *prop. n.* එක් දූගොඩැල්ලක නමක්, භිනෙනාරුදීප. Name of an island or hilly place.

**භ්‍රාතෘඝාතක** Sk. *c. n. m.* සහෝදරයා මැරූ තැනැත්තා, බෑමැරූ, P. භාතුඝාතක, Brother-killer ; භ්‍රාතෘ brother, ඝාතක killer ; fratricide.

## ම.

**මංමුලා** *a.* මාර්‍ගය දැනගන්ට නොහැකිවූ, මග නොදත්තාවූ, P. මගගමුළ්හ, Sk. මාර්‍ග මූඪ. Unable to know the way, to mislead, to go astray.

**මකුහමු** *prop. n.* සත්කෝරළේ ගමක්, මකුහමුව. A village in Seven Kórałés.

**මත්-බමර-කැල** *c. n. m.* මත්වූ මීමැසි සමූහයා, P. මත්තභමරසෙණි, Sk. මත්ත භ්‍රමරශ්‍රෙණි Multitude of intoxicated bees.

**මන්** *m.* මානය, සිත, ප්‍රමාණය, P. මාන. Pride, mind, proportion.

**මන්ධාතු** P. Sk. *prop. n.* ප්‍රථම කල්පයෙහි සක්විතිරජව විසූ අසඞ්ඛ්‍ය ආයුස ඇති රජෙකුගේ නම. කාමභොගීන් අතුරෙන් මන්ධාතුරජ අග්‍රප්‍රාප්තයයි කියන ලදී. The name of a universal monarch, who lived an asankhya years or innumerable number of years in a former kalpa.

**මනොරථ** P. Sk. *m.* සිතේ අදහස, සිතේ ප්‍රාර්ථනාව, Notion, thought, expectation, wish.

**මමත්‍ව** Sk. *n.* මමය මාගේයයි සිතාගත් බව, අධික සෙනහයථ ආලය, P. මමත්තථ මමතා. The interest or affection entertained for other objects from considering them as belonging to or connected with oneself.

**මයිල්** *m.* මාමා, P. Sk. මාතුල. Maternal uncle.

**මයිල්-පිත්** *c. n. m.* මාමාගේ පුතා, P. මාතුලපුත්ත, The son of a maternal uncle.

**මයෙත්** *prop. n.* වැවක නමක්, P. මයෙත්ති, Name of a lake.

Non-Commercial Distribution

මලය P. Sk. *m.* කන්ද, කඳුරට, Hill, hilly country.

මලයරජ තනතුර *c. n. m.* මලයරාජස්ථානාන්තරය, කඳුරට, රජකම, P. මලය, Sk. රාජට්ඨාන, මලයරාජ ඨානන්තර, Sk. මලයාරාජස්ථානාන්තර Situation or post of the king or chief of the hilly country of Ceylon ; මලය hill, රජ king or chief, තනතුරු situation or post.

මලයරට *c. n. m.* කඳුරට, P. මලයරට්ඨ, Sk. මලයාරාෂ්ට්‍ර. Hilly country ; මලය hill, රට country.

මලසුන්ගේ *c. n. m.* මල්ආසන ඇති ගේ, P. පුප්ඵාසනඝර Sk. පුෂ්පාසන ගෘහ. Literally, flower-seat-house ; the house in which flowers are offered to Buddha. මල්-අසුන්-ගේ.

මහ-ඇපා *c. n. m.* මහාදිපාද, ඔටුනු නොපලන් ප්‍රධාන රාජකුමාරයෙක්. P. Sk. මහාදිපාද. Archduke.

මහනිකා *c. n. m.* මහ නිකාය, මහාවිහාර සමාගම, P. මහානිකාය. Chief sect ; මහ chief, නිකා sect.

මහපන්දිව *prop. n.* මහාපාණදීපක නම්වූ දූව, An island called Mahapandiva.

මහ-පව් *c. n. m.* මහාපර්වත, P. මහාපබ්බත. Great mountain.

මහ-ලියන *c. n. m.* ප්‍රධානවූ ලියන ඇමතියා, P. Sk. මහාලේඛක. A chief clerk or secretary ; මහ chief or great, ලියන clerk or secretary ; *nom. acc. sing.* මහලියන්නා.

මහ-වේ *f.* මහවීථිය, P. Sk. මහාවීථි. Large street.

මහ-සැණකෙළි *c. n. m.* මහත්වූ උත්සවය, මහපෙළහර, P. මහුස්සව, Sk. මහොත්සව A great festivity.

මහර්ෂි Sk. *c. n. m.* සර්වඥ, මුනිඳු, P. මහෙසි. Great sage, Buddha ; මහ great ඍෂි sage.

මහාධිට්ඨාන Sk. *c. n. nt.* මහඉටන්. See මහ and අධිෂ්ඨාන.

මහාපාළි P. *c. n. m.* මහපෙළ නම් දනසාලාව. A hall called Mahápáli, where alms are distributed.

මහාප්‍රයාස Sk. *c. n. m.* මහත්වූ උත්සාහය, මහත් ප්‍රයත්නය, මහත් වෙහෙස (මහත් අඥානතාව). Great effort high energy, great pain (great ignorance) ; මහත් great, ප්‍රයාස effort.

මහළුකම්ලත් *a.* උපසම්පද කර්මය ලද්දවූ. He who received Buddhist ordination.

මාගධ නිරුකති Sk. *c. n. f.* පාළියේ නිරුක්තිය, පාළිභාෂාව, P. මාගධ නිරුත්ති, Páli philogoy, Páli language ; මාගධ Páli, නිරුත්ති phiology.

මාවුල් *m.* මෙට්ටය, ගුදිරිය, P. භිසි, Mattress.

මාළුසිවුරු *c. n. m.* දිරූ සිවුරු, P. ජිණ්ණචීවර, පුරානචීවර Old robes ; මාළු. old, සිවුරු robes.

මිණිකොඬොල් *c. n. m.* මාණික්‍යකුණ්ඩලාභරණ, P. Sk. මණිකුණ්ඩල. An ear-ring. mounted with a gem ; මිණි gem, කොඬොල් ear-ring.

මිත්‍ර-සන්‍ථව Sk. *c. n. m.* මිත්‍රතාවෙන් සමාගම කිරීම, මිත්‍රතාවෙන් බැඳීම, P. මිත්තසන්ථව. Friendship, association.

මිරිසවැටි *prop. n.* විහාරයක නමක්, P. මරිචවට්ටි, Name of a temple.

Non-Commercial Distribution

**මිසදිටු** *c. n. f.* වරදවූ ඇදහිල්ල, වරදවූ ලබ්ධිය, P. මිච්ඡාදිට්ඨි, Sk. මිථ්‍යාදෘෂ්ටි. Heathenism, false faith : මිස false, දිටු vision or knowledge.

**මිහිපල්** *c. n. m.* රජ, පෘථිවිපාලයා, P. Sk. මහීපාල. A king, monarch. sovereign; මිහි earth, පල් protector, preserver.

**මීමුතු** *c. n. m.* මුත්තාගේ පියා P. පපිතාමහ, Sk. ප්‍රපිතාමහ. Grandfather's father ; මී great, මුතු grandfather, from මහමුතු

**මීසම් මුවා** *a.* මීහරක්සමින් කළාවූ, P. මහිසචම්මමය, Sk. මහිසචර්ම්මය. Made of the skins of buffaloes.

**මුඛමාත්‍ර** Sk. *a.* ආරම්භය පමණ, ස්වල්ප. Commencement only, few.

**මුඩු-සෙවෙනි-ගේ** *c. n. m.* උඩ සෙවිල්ලක් නැති ගේ, සඳළුසහිත ගේ, P. හම්මිය, මුණ්ඩච්ඡද, Sk. හර්ම්‍ය. A house without a roof, a palace.

**මුනීශ්වර** Sk. *a. c. n.* තපාසවීන්ට අධිපතිවූ, සර්වඥ, P. මුනිස්සර, Chief of sages, Buddha ; මුනි sage, ඊශ්වර chief.

**මුවවස්** *c. n. m.* මුඛවාස, මුඛය සුවඳකරන ද්‍රව්‍ය, P. මුඛවාස. Perfume for the mouth ; මුව mouth, වස් perfume.

**මූඪගර්භ** Sk. *c. n. m.* මුළාගැබ, සරස්ව වැටුන ගර්භය, P. මූළ්හගබ්භ. Difficult delivery ; a dead fetus, මූඪ, wrong, out of right place (as the fetus in delivery), abortive ; ගර්භ, a fetus or embryo.

**මූලශුද්ධි** Sk. *c. n. f.* මුලින් ශුද්ධකිරීම හෝ ශුද්ධවීම, P. මූලසුද්ධි. Purity from the beginning ; මූල beginning, ශුද්ධි purity.

**මෙහෙණි** *f.* ශ්‍රමණි, භික්ෂුණි, P. සමණි, භික්ඛුණි. A priestess, nun.

**මෙහෙයි** *p. third sing.* යැවී, නියෝග කළේ, P. නියොජෙසි, Sk. නියොජයත්. Sent, ordered.

**මෙහෙයම්** *p. first sing.* නියොග කරම්, යවම්, P. නියොජෙමි, Sk. නියොජයාමි. I cause, I command or order.

**මොනවට** *adv.* මනාකොට, P. සම්මා, සු, සුන්දරං Prettily, beautifully.

**මොනෙය්‍ය ගුණ** P *c. n. nt.* සෘෂීන්ගේ ස්වභාව ගුණ, මුනිගුණ, P. මෞනෙයගුණ. Virtue of sagehood, sage virtue ; මොනෙය්‍ය sagehood, ගුණ virtue.

**මෞලි-මඞ්ගල** Sk. *c. n. nt.* ඔටුනුපළඳින මගුල, P. මොලිමඞ්ගල, A royal function or coronation festival.

## ය.

**යටි** *f.* යෂ්ටි, දිග මනින ලීය, P. යට්ඨි, Sk. යෂ්ටි A staff, a stick used for measuring length ; *abl.* යටියෙන්.

**යහඬු** *c. n. m.* යකඩින් කළ අඬු, P. අයොසණ්ඩාස, අයොසණ්ඩාසක Iron tool, iron pincer ; ය iron, හඬු tool.

**යහලු** *m.* මිත්‍රයා, යාලුවා, P. සඛ, සහායථ මිත්තථ, Sk. සඛි, සහාය. Friend.

**යුද-කිස** *c. n. m.* යුද්ධකෘත්‍ය, P. යුජ්ඣ, යුද්ධකිච්ච. Act of waging war.

**යුද-පැටි-වනු** *c. n. m.* යුද්ධාරම්භ වීම, යුද්ධයක් කරන්ට පටන් ගැන්ම, P. Sk. යුද්ධාරම්භ, Act of commencing war.

**යුද්ධක්ෂම** Sk. *a.* යුද්ධයෙහි දක්ෂවූ, යුද කරණු හැකිවූ, P. යුද්ධක්ඛම, Expert in war.

Non-Commercial Distribution

යුද්ධොපකරණ P. Sk. *c. n. nt.* යුඬයට ඕනෑවූ දේ, ආයුධාදිය Weapons for war. යුඬ war or battle, උපකරණ weapon, instrument, tool.

යොදුන් *m.* යොජන, රියන් 7 යටයී 1, යටයී 20 උසභ 1, උසභ 80 ගාවුත 1, ගාවුත 4 යොජන 1, මේ පාළි අභිධානප්පදීපිකාවේ පෙනෙන යොජන (යොදුන්) යන ගණනේ ප්‍රමාණයි. ලීලාවතියේ පෙනෙන පරිද්දෙන් රියන් 4 දණ්ඩ 1, දණ්ඩ 1, දණ්ඩ 2,000 ක්‍රොශ 1, ක්‍රොශ 4 යොජන 1. A measure of distance equal to 4 koses, which, at 8,000 cubits a kos, will be exactly nine miles.

## ර

රජබොජුන් *c. n. m.* රජුන්ගේ ආහාරය, P. Sk. රාජභොජන. Royal food ; රජ king or prince, බොජුන් food.

රජය *m.* රාජ්‍යය, රජහට අයිති රට, රජ බව, P. රජ්ජ, Sk. රාජ්‍ය. A kingdom, sovereignty.

රජරට *c. n. m.* මහරජහට අයිති රට, P. රාජරට්ඨ. Sk. රාජරාෂ්ට්‍ර. The country belonging to the supreme king or superior ; රජ king, රට cuntry.

රණබිම් *c. n. f.* යුඬකරණ ස්ථානය, P. Sk. රණභූමි Battlefield ; රණ war, බිම් ground, place.

රණ-භෙරි P. Sk. *c. n. m. f.* යුදබෙර, යුඬය පිණිස ශබ්ද කරණ බෙර. A tomtom beaten to proclaim war.

රතන Sk. *nt.* රුවන, මැණික, සිත් අලවන වසතුව, මහ අගය ඇති වසතුව, අස මාන වසතුව, P. රතන. A jewel, gem, attractive thing, valuable thing, anything best of its kind.

රන්සත් *c. n. m.* සවණීයෙන් කළ ඡත්‍රය, රන්කුඩය, P. සුවණ්ණච්ඡත්ත, සොණ්ණච්ඡත්ත, Sk. සවණීච්ඡත්‍ර. Golden umbrella ; රන් gold, සත් umbrella.

රසාස්වාද Sk. *c. n. m.* රස ලෙවීම, රස විඳීම, P. රසස්සාද, Sweet tasting ; රස sweet, ආස්වාද tasting.

රස්වළලු *c. n. m.* රශ්මිමණ්ඩල, පිළිමයේ රැස්වලල්ල, P. රංසිවලය. Halo; රස් rays, වලලු ring.

රාජ-භාග P. Sk. *c. n. m.* රජහට අයත් කොටස, Portion belonging to royalty.

රාජ-රාෂ්ට්‍ර Sk. *c. n. m. nt.* මහරජහට අයිති රට, P. රාජරට්ඨ. The country belonging to the supreme king.

රාජර්ඬි Sk. *c. n. f.* රජහුගේ බලය, රජහුගේ ඓශ්වර්‍ය්‍ය P. රාජිඬි, Royal power, power or prosperity of the king ; රාජ king, ඍඬි power or prosperity.

Non-Commercial Distribution

රාජායතන-ධාතු-ගෘහ Sk. *c. n. nt.* රාජායතන වෘක්ෂ නොහොත් කිරිපලුරුක සමීපයෙහිවූ දාගේ, P. රාජායතන ධාතුගෙහ, A buddhist pagoda near a sacred tree named Rájáyatana.

රාජ්‍යක්ෂම Sk. *a.* රාජ්‍යය කිරීමෙහි පොහොසත්, P. රජ්ජක්ඛම, රජ්ජයොග්ග Able to reign.

රාජ්‍ය-ප්‍රතිෂ්ඨා Sk. *c. n. f.* රාජ්‍යය පිහිටීම, රාජ්‍යයට ප්‍රතිෂ්ඨාව, P. රජ්ජපතිට්ඨා. To establish a kingdom, to found a kingdom, help to upon a throne.

රාජ්‍ය-සාධන Sk. *c. n. m.* රාජ්‍ය සිඬ කිරීම. P. රජ්ජසාධන, Adminis- tration of government.

රිටිගල *prop. n.* බිම්තැන්නේ පර්වතයක නම, P. රිට්ඨපබ්බත. Name of a rock in Bintenna.

රිදී-සුඹුළු *c. n. m.* රිදියෙන් කළ දරණුව හො වලල්ල, P. රජතචුම්බට. A large ring over which chatties are placed, or chatty-holder made of silver.

රුවන්-සුත් *m.* රතනසූත්‍රය, P. රතනසුත්ත, A sermon of Buddha called the "Gem," which was preached to Livvhavi princes ; literally, the gem of preaching.

රුහුණු-කැමි *c. n. m.* රුහුණුරට කම්කරුවා, P. රොහණකම්මී, රොහණකම්මික. Sk. රොහණකර්මින්. Servant of Ruhuna district.

රෙහෙර-දක-වාර P. *c. n. m.* රෙහෙර නම් ජලවාරය. රෙහෙර නම් ජලධාරාවයි. එයින් වාරයේ ලැබෙන ජලය. Water from a canal called Rahera.

රැජින *f.* මෙහෙසි, රාජ්ඥී, P. රාජිනි. Queen.

## ල.

ලහබත් *c. n. m.* සලාකබත්, නම් ඇදීමෙන්, බෙදියයුතු බත්. Food given as alms to the priests by drawing tickets.

ලාභග්‍රාම Sk. *c. n. m.* ලාභ උපදින ගම, P. ලාභගාම, A village where profit is obtained.

ලාවණ්‍ය Sk. *nt.* රූපසෙභාව, P. ලාවණ්ණ, Beauty.

ලාහෙලා *adv.* වහා, බලාත්කාරයෙන්, P. සහසා. Quickly, by force.

ලීලා P. Sk. *f.* සෙල්ලම. Play, sport.

ලෙව්-සසුන් *c. n. m.* ලෝකය හා ආගම, P. ලොකසාසන, Sk. ලොකශාසන. World and religion.

ලොව් *a.* ලෝකයට අයිතිවූ, P. ලොකියා. Worldly.

ලොහොසැල *c. n. f.* ලෝහ සැලිය, ලොහොතලිය, P. Sk. ලොහවාටි. Metal boiler ; ලෝහො metal, සැල boiler or pot.

ලොහො-හොරු *f.* ලෝහයෙන් කළ ඔරු, P. ලොහනාවා, ලොහදෙණි, Sk. ලොහනෞ, ලොහද්‍රොණි. A boat made of metal.

ලැම්ඩි *c. n. m.* හෘදයමණ්ඩය, උරය, ලය, P. හදයමණ්ඩ, Sk. හෘදයමණ්ඩ. Bosom, heart (*inst. abl.* ලැමඩියෙන්) ; ලැ heart, මිඩි dish.

Non-Commercial Distribution

# ව.

වක්තෘ Sk. *m.* කථාකාරයා, දක්ෂ කථිකයා, P. වත්තු, *nom. sing.* වක්තා. Speaker, fluent speaker, orator.

වටුකරපිටි *prop. n.* ගමක නමක්, P. වට්ටකාකාරපිට්ඨි, A village called Vatukara piti.

වනසෙනසුන් *c. n.* වනයෙහි වාසස්ථානය, ආරණ්‍යයෙහි ඇඳ, P. පන්ථසෙනාසන, ආරඤ්ඤසෙනාසන. Residence in a forest, a bed in a forest ; වන forest, සෙනසුන් bed or residence.

වම්මනු *m.* වැමැරීම, P. Sk. වමන, Vomiting, throwing up.

වර්ගික Sk. *a. and n.* සමානයන්ගේ සමූහ ඇති, සමානයන්ගේ සමූහයෙහි වූ One who has a class, individual of a class.

වර්ජිත, වර්ජිත Sk. *p. par a.* තොරවූ, වෙන්වූ (පීඩාකරණලද, නසනලද), P. වජ්ජිත. Left, separated, abandoned.

වර්තී Sk. *p. par. from* වර්තීන්, පවත්නා, වැටෙන, P. වත්ති. Existing, continuing.

වල්ලභ P. Sk. *m.* ස්වාමියා, ස්වාමිපුරුෂයා. Consort, husband.

වස *m.* වංශය, කුලය, P. වංස, Sk. වංශ. Race, lineage, family. *Nom. acc. and loc. sing.* වස.

වස් *m.* වර්ෂය, අවුරුද්ද, P. වස්ස, Sk. වර්ෂ. Era, year.

වසිටු *prop. m.* වශිෂ්ට ඍෂියා, P. වසිඨ, වාසෙඨ, Sk. වශිෂ්ට Name of a sage.

වසිත්ම. වසිනා කල්හි, වැසි වසින කල්හි, P. වස්සන්තෙ Sk. වර්ෂති. During rain (verb of duration).

වාදකටව් *a. c. n.* වාක කරණු කැමතිවූ. වාද කරන්ට ආශා ඇතිවූ P. වාදත්ථී, Wishing to controverse ; වාද controversy, කට to do, අවි wishing.

විකෘතබුද්ධි Sk. *a.* වෙනස් කරනලද නුවණ ඇති, නපුරු දැනුම් ඇති, P. විබුද්ධි, විබුද්ධික, විකටබුද්ධි. Changed in mind, enraged, having an unsettled mind.

විජම්-පෙළ *f.* අභිධර්ම පාළිය, අභිධර්මය, P. අභිධම්මපාළි, අභිධම්ම. Higher doctrine of Buddha.

විජය-සැණ-කෙළි *c. n.* ජයගැනීමේ උත්සවය, ජය නිසා, සතුටුවන වෙන සෙල්ලම, P. විජ යුස්සව, Sk. විජයොත්සව. Festival of victory.

විදහන් *m.* නියොගය, විධානය, P. විධාන, Rule, precept, ordinance.

විදු. *f.* විද්‍යාව, දැනගැන්ම, P. විජ්ජා, Science, learning, knowledge.

විදුරු-වලලු *c. n. m.* වජ්‍රවලය, දියමන්ති වලල්ල, P. වජිරවලය, Diamond bracelet; විදුරු diamond, වලළු bracelet ; *nom. acc. sing.* විදුරු වළල්ල.

විදුරු-සුඹුළු *c. n. m.* වජ්‍රයෙන් කළ දරණුව, දියමන්ති දරණුව, P. වජිරචුම්බට. A round thing like a ring, set with diamonds.

විදුලි-උපමා *a.* විදුලියට සමාන, P. විජ්ජුපම, Destruction, loss, annihilation.

විධ්වංසන Sk. *nt.* වැනසීම, P. විද්ධංසන, විධමන. Destruction, loss, annihilation.

Non-Commercial Distribution

**විපිළිසර** *a.* කලකිරුණ, පසුතැවිලි ඇති, P. විප්පටිසාර, Discontented, repenting.

**විරාජමාන** P. Sk. *par. a.* බබළන්නාවූ, බබළමින්. Shining, glittering.

**විරූප** P. Sk. *a.* දුර්වර්ණවූ, විකාර රූප ඇත්තාවූ, Ugly, deformed.

**විලක්කු** *m.* දඹුවැටපහන, පන්දම, P. උක්කා, Sk. උල්කා (රේඛාකාරයෙන් අහසින් වැටෙන තේජස් පිණ්ඩය). A torch, a firebrand.

**විලොමවර්තීන්** Sk. *par. a.* විරුද්ධව පවත්නාවූ, වෙනස්ව පවත්නාවූ, P. විලොම වත්ති. Reverse, opposite course, lying opposite.

**විවස** *a.* යහපත්නූවූ, කීකරු නුවූ, වහල් නුවූ. Not subject to any one, free disobedient.

**විවිධ** P. Sk. *a.* නානාප්‍රකාර නොයෙක් ආකාර. Various, multiform.

**විවෙක** P. Sk. *m.* වෙන්වීම, සමූහයාගෙන් වෙන්වීම, වෙන්කොට දැනගැනීම, තත්වූ පරිද්දෙන් වස්තු ස්වරූපය වෙන්කිරීම. Separation, separating or going away from the people, knowing in detail.

**විසාරද** P. Sk. *a.* බියරහිත, පැකුළුම් නැති. Bold, confident, fearless.

**විරශ්‍රීදෙවී** Sk. *c. n. f.* වියර්වන්තයාගේ සොභා නැමැති දිව්‍යාඞ්ගනාව, P. වීරසිරී. Goddess of beauty and industry ; වීර hero, ශ්‍රී beauty, දෙවී goddess.

**වෙදහල්** *c. n.* වෛද්‍යශාලාව, ආරොග්‍යශාලාව, P. වෙජ්ජශාලා, Sk. වෛද්‍යශාලා. A hospital ; වෙද physician, හල් hall.

**වෙරළුමිණි** *c. n. m.* වෛදූර්‍ය්‍ය මාණික්‍ය, වෛඩූර්‍ය්‍යයයිද කියත්. ව්‍යවහාර කථායෙහි "වෛරොඩි," P. වෙළුරියමණි, A gem of a dark colour, the lapis lazuli, cat's-eye ; වෙරළු lapis lazuli, මිණි gem.

**වෙලෙවි** *a or. adv.* ඉක්මන්, වහා, ඉක්මනින්, P. වෙගෙන, (සෙමින් slowly) Quickly.

**වෙස්-වළා** *p. par.* වෙසය වළක්වා, වෙස් මාරු කොට, P. (වෙසං වාරෙත්වා) අඤ්ඤත. Having changed the form.

**වෙසඟකෙළි** *c. n. f.* වෙසක් මසේ සෙල්ලම, P. වෙශාඛකීළා, Play in the month Wesak, part of April and May.

**වෛතුල්‍ය-වාදීන්** Sk. *c. n. m.* බුද්ධාගමේ ධර්ම වරදවා ව්‍යවහාර කරන සමාගමක මහණුන්නාන්සේලා, P. වෙතුල්ලවාදී, A sect of Buddhist priests who misinterpret the doctrines of their religion, and conduct themselves accordingly.

**වෛරින්** Sk. *m.* සතුරා, P. වෙරී. Enemy.

**ව්‍රත** Sk. *nt.* පින් සිද්ධකරගන්නා පිණිස කරගත් නියමයක්, P. වත. A vow, any meritorious act of devotion.

**වැටුප්** *m.* වියදම (පහන්), P. වට්ට, Sk. වර්තන Batta, nourishment (Jamp).

**වැටේ** *pr. thrid. sing.* P. පවතී, පවත්තති, Sk. ප්‍රවර්තතෙ. Prevails.

**වැව්දිය තහවුරු** *c. n. m.* වැව්වල ජල සපීරබැව්, P. වාපිජලපීරතා, පීරොදික වාපිතා, Sk. වාපිජලපීරිතා. Firmness of the lake water ; වැව් lake, දිය water, තහවුරු firmness.

Non-Commercial Distribution

## ශ.

**ශරණීභ** Sk. *a.* පිහිටට සුදුසු, පිහිට වියහැකි. P. සරණරහ. Protectable, able to preserve, able to defend.

**ශාන්තිපද** Sk. *c. n. nt.* නිර්වාණය, නිවණ, P. සන්තිපද. Nirvana, the highest happiness which Buddhists expect ; ශාන්ති quiet, පද course.

**ශාරීරික** Sk. *a.* කයට අයිති, කයෙහි පැවති, P. සාරීරික. Bodily, corporeal.

**ශාසන-සංවෘධි-විධාන** Sk. *c. n. nt.* ආගම වඩන කිරීමේ විධානය, P. සාසනසංවුඩි විධාන. The command to propagate religion.

**ශෞණ්ඩ** Sk. *a.* ලොල්වූ, ආබහිවූ, P. සොණ්ඩ. Fond, covetous, desirous.

**ශෞර්‍ය්‍යභාවොපලක්ෂිත** Sk. *part. a.* සූරබැවින් යුක්ත, P. සූරභාවොපලක්ඛිත. Heroic.

## ස.

**සංගායනා** P. Sk. *f.* සංගීති, සමූහයා එකතුව කියනලද පාඩම. Chanting together, repeated or recited by multitudes together, rehearsing.

**සක්මන්-මලු** *c. n. m.* See චඞ්ක්‍රමණමාලක.

**සක්-සෙනෙවි** *c. n. m.* සඞ්ඛ නම් සෙනාපතියා, P. සඞ්ඛසෙනාපති. A general called Sankha.

**සඟරම්** *c. n. m.* සංඝයා වසන ආරාමය, සංඝයාගේ නිවාසස්ථානය, P. Sk. සංඝාරාම, A monastery, *nom. acc. and voc. sing.* සඟරම. සඟ multitude of priests ; අරම් residence or garden.

**රසාස්වාද** Sk. *c. n. m.* රස ලෙවීම, රස විඳීම, P. රසස්සාද, Sweet tasting ; රස sweet, ආස්වාද tasting.

**සංග්‍රහවස්තු** Sk. *c. n. nt.* රජවරුන් ජනයාට සංග්‍රහ කරන ස්ථාන හෝ කරුණු. ඒ නම්, දන, ප්‍රියවචන, අර්ථචර්‍ය්‍යා, සමානාත්මතා. Duties of kings towards their subjects, viz., almsgiving, kind words, doing good to others, doing to others as one would that others should do to him.

**සංග්‍රාම** Sk. *m.* යුද්ධය, සටන, P. සංගාම. War, battle.

**සජ්ජිත** P. Sk. *p. part. a.* සැදුනු, සැරසුනු. Made, formed, ready.

**සත්** *m.* ඡත්‍රය, කුඩය, P. ඡත්ත. Parasol, umbrella.

**සඳලු** *f.* චන්ද්‍රාලොකය පිහිටි තැන උඩුමහල් ගෙයි සෙවිලිනැතිව තිබෙන බරාඳය, සඳපහන වැටෙන සාලාව, P. චන්දසාලා, චන්දිකාසාල, Sk. චන්ද්‍රශාලා. An open room on the upper storey of a house.

**සන්නද්ධ** P. Sk. *p. par. a.* සන්නාහ ඇන්දවූ. Armed, mailed.

**සන්නාහ** P. Sk. *m.* චර්මය, සැට්ටය, ආයුධ පහර නොවදින පිණිස නම් ආදියෙන් සාද ඇඟ ලන සැට්ටය. Armour.

**සම්මූඪ** Sk. *a.* මුළාවූ, ඉතාමුළාවූ, සිහිනැති, P. සම්මූළ්හ. Ignorant, senseless, gone astray, strayed entirely.

**සමණීභාතු** *prop. n.* වංසයක නමක්. Name of a race or tribe.

Non-Commercial Distribution

**සමර්පණ** Sk. *nt.* පැමිණවීම, මනාකොට පැමිණවීම, P. සමප්පන. Appointment.

**සමවැටුම්** *c. n. m.* සමවූ පැවැත්ම, සැමදෙනාට එකාකාර පැවැත්ම, P. සමවුත්ති, Sk. සම්වෘත්ති, Equal conduct; සම equal, වැටුම්, conduct ; treat all alike.

**සමානමාතෘක** Sk. *a.* සමානවූ මව් ඇති, පියාගේ වංශයට සමාන වංශයෙහි උපන් මව් ඇති, P. සමානමාතික. Having a mother of the same caste as that of the father.

**සව්ාභරණ** Sk. *c. n. nt.* සියලු ආභරණ, P. සබ්බාභරණ, All ornaments ; සව් all, ආභරණ ornament.

**සලකම්** *c. n. m.* ශෛලකම්, ගලින්කරණලද කර්මාන්ත, P. සිලාකම්ම. Thing made of stone ; සල stone, කම් action or work.

**සලපා** *c. n. m.* ශෛලපාත්‍රය, ගල්පාත්‍රය, P. සිලාපත්ත. Stone bowl ; සල stone, පා bowl.

**සලමෙවන්** *prop. n.* සිලාමෙඝවණ්ණ යන පාළි නාමය සිංහලට බිඳුනු සැටි, රජකෙනෙකුගේ නමයි. Name of a king, derived from páli, silámeghawaṇṇa.

**සහගැබින්** *adv.* ගර්භය සමග, කුසදරුවා සමග, P. සගබ්භං, සහ ගබ්භෙන Sk. සගර්භම්. Pregnant, big with child.

**සහායිකා** P. Sk. *f.* යෙහෙළී, උපකාරකාරී. A female companian.

**සාකල්‍ය** Sk. *nt.* සියල්ලේ සවභාව, සියල්ල, P. සාකල්ල. The whole, entire.

**සාගලී** P. *prop. n.* භික්ෂු සමාගමක නිමක්, ජේතවනවිහාර සමාගමට නමක්. A name of a society of priests, name of the society of priests in Jétawana-vihára.

**සාන්‍දෘෂ්ටික-ඵල** Sk. *c. n. nt.* මොලොව ලැබෙන ඵලය, P. සන්දිට්ඨික ඵල. Worldly reward, secular gain.

**සාමාන්ත** P. Sk. *m.* රජකෙනෙක් යටතේ වසන එක් දනව්වක අධිපතියෙක්. A chief of a district or province subject to a king.

**සාමාදි** P. Sk. *a.* සාමය ආදි, රජදරුවන්ගේ ; භෙද, දණ්ඩ, සාම, දාන යන සතර උපායෙන් එකක්වූ සාමය ආදීවූ, මිත්‍රකිරීම ප්‍රිය කථාදියෙන් නැලවීම ආදීවූ. Speaking kindly or tenderly, reconciliation, &c.

**සාහසික** P. Sk. *a.* බලාත්කාර කාරන්නාවූ, දරුණුවූ, කෲරවූ. Bold, rash, cruel.

**සාහසික-ක්‍රියා** P. Sk. *c. n. f.* බලාත්කාර ක්‍රියා, දරුණු ක්‍රියා. Cruel act.

## සි.

**සිටුනා** *c. n. m.* සිටානන්ගේ ප්‍රධානයා, P. සෙට්ඨිනායක, ශ්‍රෙෂ්ඨිනායක. Chief of barons ; සිටු baron, නා chief.

**සිත්තම්** *c. n. m.* චිත්‍රකර්මය, විසිතුරු කර්මාන්තය, සිතියම, P. චිත්තකම්ම, Sk. චිත්‍රකර්මන්. The art of painting ; සිත් painting, කම් art.

**සිද්ධි** P. Sk. *f.* සිදුවීම, ලැබීම. Fulfilment, occurrence, completion.

**සියපදවි** *c. n. f.* තමන් අයත් තනතුරු, සවකීය ස්ථානය, P. සපදවි, Sk. සවපද. One's, own post ; සිය own, පදවි post.

Non-Commercial Distribution

**සියවත්** *c. n. m.* සවකීය වසත්‍රය P. සකවත්‍ථ, Sk. සවවසත්‍ර (සවකීය වසතු, සවකීය මුහුන. One's own cloth or dress (one's own wealth, one's own face) ; සිය own, වත් cloth (wealth, face) ; *dat. and gen. sing.* සියවතට.
**සිරි** P. Sk. *f.* සෝභාව, ඉසුර, සමපත. Beauty, prosperity, wealth.
**සිරි** *m. f.* කුඩා කඩුව, පිහිය. Dagger, knife ; *acc. sing.* සිරිය.
**සිරිපිටි-ගම** *c. n. m.* සිරිපිටිය, නම්වූ ගම, P. සිරිපටඨිගාම. Village called Siripiti.
**සිලාකාල** P. *prop. n.* රාජකුමාරයෙකුගේ නම. Name of a prince.
**සිවුඋපා** *c. n. m.* රජදරුවන්ගේ සතර උපාය. එනම් - භෙද, දණ්ඩ, සාම, දන යන මෙයි, P. චතුරොපාය, Sk. චතුරුපාය. Four expedients of a king, viz., causing dissension, chastisement, conciliation, and gift ; සිවු four, උපා expedient.
**සිවු-පස** *c. n. m.* ප්‍රත්‍යය සතර, P. චතුපච්චය, The four necessaries of a Buddhist priest, viz., yellow robe, alms, sick diet, residence. ;
**සිවුමැලි** *a.* සුකුමාර, ඉතා මොළොක්, P. Sk. සුකුමාර, Very tender or delicate.
**සිවුසඟරාවත්** *c. n. m.* චතුසසඞග්‍රහ වසතු, සඞග්‍රහ වසතු සතර, P. චතුසසඞගහ වත්‍ථු. Four kinds of assistance; සිව් four, සඟරා assistance ; වත් thing. See සඞග්‍රහවසතු.
**සුංකම්** *m.* අයබදු P. සුඞක, කර Sk. ශුලක. Tool, tax, custom.
**සුණුවම්** *c. n. m.* සුණුවලින් කරනලද කර්‍මාන්ත, P. සුධාකමම, Sk. සුධාකර්‍මන්. Work of chunam or brick ; a thing made of chunam or brick ; සුණු chunam, කම් work.
**සුපරිමණ්ඩල** P. Sk. *a.* හාත්පසින් යහපත් මණ්ඩල ඇති. Perfectly spreading, round, upright, not crooked.
**සුප්‍රතිෂ්ඨිති** Sk. *c. n. f.* යහපත්ලෙස පිහිටීම, සථිරලෙස පිහිටීම, P. සුපපතිඨිති. Situation, perfect situation ; සු good, ප්‍රතිෂ්ඨිති straying.
**සුවිභක්ත** Sk. *part. a.* මනාකොට බෙදනලද, හොඳට බෙදූ, P. සුවිභත්ත. Well divided.
**සුරත** P. Sk. *n. a.* සත්‍රී පුරුෂයන් දෙදෙනාගේ ඇලීම, මෛථුනසඞගමය, ඉතා ඇලුනු. Choabitation, extremely attached.
**සුරාපායි** P. *a.* රා බොන්නාවූ, Sk. සුරාපායින්. Drinking today, drunkard.
**සුසාළිස්** from සිවුසාළිස් *c. n. f.* සතළිස් සතර, P. චතුකාළීස, Sk. චතුශ්චත්‍වාරිංශත්. Forty-four ; සු four, සාළිස් forty.
**සුසිල්වත්** *a.* අතිශයින් සිල් ඇති, යහපත් සිල් ඇති, P. සුසීල, Sk. සුශීල. Most, Meritiorious, virtuous.
**සූප** P. Sk. යුස අඩුකොට පිසනලද ව්‍යඤජනය. Curry perpared without gravy.
**සූරසමමත** P. Sk. *a.* සූරයයි දක්‍ෂයයි ජනයන් විසින් සමමත කරනලද, Known as a hero or brave soldier.
**සෙනෙවි** *c. n. m.* සෙනාවේ අධිපතියා, P. Sk. සේනාපති. Master or general සෙන් army, වි protector or පති chief.
**සෙල්මුවා** *a.* ශෛලමය, ගලින් කළ, P. සිලාමය. Stony, made of stone.
**සොරොවූ** *f.* දිය බස්නා කානුව, Sk. ප්‍රණලිකාව. P. පණාළිකා. A drain.

Non-Commercial Distribution

**සඨිති** Sk. *f.* සිටීම, පිහිටීම, P. ඨිති. Stay, standing, being fixed or stationary, from root සථා, to stay, to be.

**සැඩපවන්** *c. n. m.* චණ්ඩවාතය, තද සුලඟ. P. Sk. චණ්ඩවාත, චණ්ඩමාරුත. A gale ; සැඩ strong, පවන් wind.

**සැණකෙළි** *c. n. f.* උත්සව, P. ඡණ, ඡණකීළා. Festival.

**සැත්** *m.* චෛත්‍යය, මුදුනේ කුඩය, ඡත්‍රය. Umbrella on the top of a pagoda. umbrella.

**සැලෙනසුලු** *a.* චංචලවෙන සවභාව ඇති. Having the quality of shaking. unsteady.

**සෑ** *m.* චෛත්‍යය, පූජනීය සථානය, දගැබ, P. චෙතිය. A place for offering, dagoba ; *acc. sing.* සෑය.

**සෑඅඹතල** *prop. n.* මිහින්තලේ චෛත්‍යය තිබෙන අඹතල, P. චෙතියමබඣල, Sk. චෛත්‍යාමබසථල. A place at Mihintale where there is a Thupa.

**සෑ-ගිරි** *c. n. m.* චෛත්‍යයක් තිබෙන පර්වතයක්, P. චෙතියගිරි, Sk. චෛත්‍ය ගිරි. A rock where there is a place of worship ; or *prop. n.* Chetiya pabbata.

**සෑ-තැන්** *c. n. m.* චෛත්‍යසථානය, දගැප් පිහිටි තැන්, P. චෙතියඨාන. A place where there is a chaitya ; සෑ chaitya, තන් place *loc.* සෑතන්හී

**සෑ-සතර-බඳ** *a.* රත්නමාලික, අභයගිරි, ජේතවන, මරිචවට්ටි යන මේ චෛත්‍ය සතර සමබනධවූ, P. චතුචෙතිය බඬ. Belonging to the four chaityas ; සෑ chaitya, සතර four, බඳ belonging.

## හ.

**හදරා** *p. par.* සජ්ඣායනා කොට, කියා *from* හදරමි, P. සජ්ඣායිත්‍වා. Having repeated or recited.

**හදළ** *par a.* කියනලද, දෙසනා කරණලද, P. කථිත. Spoken, what was been preached or recited.

**හාත්පස** *conji.* හැමදෙසින්, හැමදෙස, අවට, P. සමනතා. Sk. සමනතාත්, සමනත තස්. All around, on every side, on all sides.

**හිතේසී** P. *a.* වැඩකැමති, අභිවෘධි සොයන්නාවූ, Sk. හිතෛෂීන්. Generous, looking for advancement.

**හිරි** P. *f.* ලැජ්ජාව, ලජ්ජාව, Sk. හ්‍රී. Shame, bashfulness.

**හුදකලාව** *a.* තනි, තනිවූ, P. Sk. එක, එකක. Without any one, alone, only.

**හුදු** *a.* ශුඬ, අමිශ්‍ර, P. සුඬ. Pure, not mixed.

**හොවන්නේ** *pr. part.* (causative form) සයනය කරවනු ලබන, සයනය කරවන, P. සායාපියමාන. Sk. ශායියමාන. Causing to sleep.

**හොළී** *prop. n.* සොළීරට උපන් අය, P. චොලිය. One born in the Chola country.

**හදෑරවී** *v. p. third sing.* (causative form) සජඣායනා කරවී, පාඩම කියවී, P. සජඣාපෙසි. Caused to repeat, *from* හදරමි.

*Non-Commercial Distribution*

# ABBREVIATIONS OF THE GLOSSARY

| | | | |
|---|---|---|---|
| *a.* | Adjective. | P. | Páli. |
| *abl.* | Ablative. | *p.* | Past. |
| *acc.* | Accusative. | *p. par.* | Past participle. |
| *adv.* | Adverb. | *par* | Participle. |
| *c. n.* | Compound noun. | *par. a.* | Participle adjective |
| *f.* | Feminine | *per.* | Person. |
| *gen.* | Genitive. | *plu.* | Plural. |
| *imp.* | Imperative | *pr.* | Present. |
| *int.* | Interjection. | *prop. n.* | Proper name. |
| *inst.* | Instrumental | Sk. | Sanskrit. |
| *m.* | Masculine | *sing.* | Singular. |
| *n.* | Noun. | *tr.* | Transitive. |
| *nt.* | Neuper | | |

*Non-Commercial Distribution*